සිතියම් සහිත

සද්ධර්මාදස නම් වූ

# සිංහල මිලින්දප්‍රශ්නය

(ගැටපද විවරණ සහිත යි)

---

මහනුවර උපොසිත පුෂ්පාරාම මහාවිහාරවාසී වූ

**හීනටිකුඹුරේ සුමංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

වි සි න්

**පාළිමිලිඳුපඤ්හය පෙරළීමෙන්**

විරචිත යි.

---

විද්‍යොදය පිරිවෙණෙහි ආචාර්ය

**ගලගම පණ්ඩිත ශරණඞකර**

ස්ථවිරපාදයන් වහන්සේ විසින්

ලිපි දොෂාපහරණයෙන් ප්‍රතිසංස්කෘත යි.

---

ශ්‍රී බු. ව. 2514

ක්‍රි. ව. 1970

*Non-Commercial Distribution*

# සංඥාපනය

**මිලින්ද** නම් රජ කෙනෙකුන් විසින් නහන ලද උභතොකොටික වූ ප්‍රශ්නයන්ට **නාගසෙන** නම් රහත්තෙරකෙනෙකුන් වහන්සේ විසින් දෙන ලද ධර්මානුකූල පිළිතුරු සංග්‍රහ කොට **මිලින්ද පඤ්හ** කරණ ලද පාලිග්‍රන්ථය **මිලින්ද පඤ්හ** ය යි ප්‍රසිද්ධ ය. මේ ග්‍රන්ථයට අයත් වන්නේ පාලිසාහිත්‍යයෙහි ඉතා ශ්‍රෙෂ්ඨස්ථානයකි. මෙහි රචනා විලාසය අතිශය මනොඥ ය. එය මෙයින් අපෙක්ෂා කළ අර්ථයට ඉතාමත් උචිත ය. මෙයින් ප්‍රකට වන **මිලිඳුරජතුමාගේ** ප්‍රශ්න විචාරණශක්තිය පරදින්නේ **නාගසෙන** තෙරුන්ගේ ප්‍රශ්න විසර්ජනශක්තියට පමණකි. ඒ දෙදෙනාගේ ඒ ශක්ති දෙක ම අතිශයාශ්චර්‍ය්‍යාවහ ය. තර්කයෙහි අතිශය දක්ෂ වූ **නාගසෙන** තෙරුන් වහන්සේ පරවාදමර්ථනය සඳහා තර්කශාස්ත්‍රයට වඩා අලංකාර ශාස්ත්‍රය ම යෙදූහ. බොහෝ විට ස්වකීයමතයන් ස්ඵුට කිරීමට උන්වහන්සේ උපමාවන්ගේ හා නිදර්ශනයන්ගේ ද පිහිට සෙවූහ. තැනට නිසි උපමානිදර්ශනයන් දක්වීමෙහි උන්වහන්සේ තුළ වූ ශක්තිය අද්විතීය ය. සිවුපිළිසිඹියා පත් රහත් කෙනෙකුන් තුළ මිස අනෙක් කෙනෙකුන් තුළ නො පිහිටන ධර්මප්‍රතිභානයක් **මිලින්දපඤ්හයෙහි** බොහෝ තැනින් ප්‍රකට වේ.

මිලිඳුරජතුමා හා නාගසෙනතෙරුන් වහන්සේ ද මනස්කල්පිත පුද්ගලයන් නො වන බව මතු දක්වෙන කරුණුවලින් ඔප්පු වෙයි. ඒ දෙදෙනා අතර සිදු වූ, මේ ග්‍රන්ථයෙහි දක්වූ, සංවාදය ද තුවූවක් නො වේ.

**මිලින්දපඤ්හ රචනා කාලය**

එහෙත් ඒ සංවාදයට අනතුරු ව ම එය ග්‍රන්ථාරූඪ වූයේ ය යි කීමට මේ පොතෙහි මුල ම යෙදී තිබෙන ''තං යථානුසූයතෙ'' යන පාඨය ඉඩ නො දෙයි. ඒ පාඨයෙන් හැඟෙන්නේ ඒ සංවාදය සිදු වීමෙන් කලකට පසු ශ්‍රැතිපරම්පරාවෙන් ලද කරුණු සංග්‍රහ කොට මිලින්දපඤ්හය කළ බව යි. පාළි අටුවාවන්හි කීප පළක ම මිලින්දපඤ්හයෙන් උපුටාගත් පාඨ ඇතත් ඒ පාඨ දූන් අප අතට පැමිණ තිබෙන මිලින්දපඤ්හයෙහි පාඨයන් හා හැම ලෙසින් ම සමාන නො වන බව මතු දක්වෙන නිදර්ශනයන්ගෙන් ඔප්පු වේ.

සුමංගලවිලාසිනියෙහි අම්බට්ඨසුත්තවණ්ණනාවෙහි මිලින්දපඤ්හයෙන් උද්ධරණය කළ—

**'''අතිදුක්කරං භන්තෙ නාගසෙන භගවතා කතන්ති.' 'කිං මහාරජාති. 'මහාජනෙන හිරිකරණොකාසං බ්‍රහ්මායුබ්‍රාහ්මණස්ස අන්තෙවාසිඋත්තරස්ස ච බාවරිස්ස අන්තෙවාසීනං සොළස බ්‍රාහ්මණානං ච සෙලස්ස බ්‍රාහ්මණස්ස අන්තෙවාසීනං තිසතමාණවානඤ්ච දස්සෙසි භන්තෙ'ති. 'න මහාරාජ භගවා**

*Non-Commercial Distribution*

**ගුය්හං දස්සෙසි. ජිව්හං භගවා දස්සෙසි. ඉද්ධියා අභිසඞ්ඛරිත්වා නිවාසනනිවත්ථං කායබන්ධනබද්ධං චීවරපාරුතං ඡායාරූපමත්තං දස්සෙසි මහාරාජා' ති. 'ඡායාරූපෙ දිට්ඨෙ සති දිට්ඨො යෙව නනු භන්තෙ'ති. 'තිට්ඨතෙතං මහාරාජ, හදයරූපං දිස්වා බුජ්ඣනකසත්තො භවෙය්‍ය, හදයමංසං නීහරිත්වා දස්සෙය්‍ය සම්මාසම්බුද්ධො'ති. 'කල්ලොසි'[1] භන්තෙ නාගසෙනා'ති''.**

යන මේ පාඨය පපඤ්චසූදනියෙහි බ්‍රහ්මායුසුත්තවණ්ණනාවෙහි ද, සුත්තනිපාතට්ඨකථාවෙහි සෙලසුත්තවර්ණනාවෙහි ද දක්නා ලැබේ. ඒ පොත්හි ලෙඛකප්‍රමාදයෙන් වූ විසදෘශපාඨ පෙණෙතත් එය මෙහි දී සැලකිය යුතු නො වේ.

මේ පාඨය හා අර්ථයෙන් සමාන වන මිලින්දපඤ්හපාඨය මෙසේ යි–

**' ''දුක්කරං භන්තෙ නාගසෙන භගවතා කතං, යං එකස්සපි අදස්සනීයං තං දස්සෙතබ්බන්'ති. 'න මහාරාජ භගවා ගුය්හං දස්සෙසි. ඉද්ධියා පන ඡායං දස්සෙසී'ති. ඡායාය හි භන්තෙ දිට්ඨාය දිට්ඨායෙව හොති ගුය්හං යං දිස්වා නිබ්බිජ්ඣතොති................................යදි මහාරාජ කොචි භගවතො හදයං දිස්වා බුජ්ඣෙය්‍ය තස්සපි භගවා යොගෙන හදයං දස්සෙය්‍ය''.** (මුද්‍රිත මිලින්දපඤ්හයෙහි 134 පිටුව).

අටුවාවන්හි එන යථොක්ත පාඨය හා මේ මිලින්දපඤ්හපාඨය ද අසමාන ය යි කාට වුවත් පැහැදිලි වේ. මිලින්ද පඤ්හයෙහි වත්ථගුය්හනිදස්සන පඤ්හයෙහි මුල එක ම සෙලබ්‍රාහ්මණයා පමණක් සඳහන් වතත් අටුවා පාඨයෙහි තවත් නම් ද සඳහන් වේ.

මනොරථපූරණියෙහි පස්වන වර්ගයෙහි අටවැනි සූත්‍රවර්ණනා වෙහි මිලින්දපඤ්හයෙන් උද්ධෘත—

**'' 'භන්තෙ නාගසෙන එකස්මිං අච්ඡරාක්ඛණෙ පවත්තිත චිත්තසඞ්ඛාරා සචෙ රූපිනො අස්සු, කීව මහාරාසී භවෙය්‍යා'ති. වාහසතානං ඛො මහාරාජ වීහීනං අඩ්ඪචූළං ච වාහා වීහි-සත්තම්මණානි ද්වෙ ච තුම්බා එකච්ඡරාක්ඛණෙ පවත්තිතස්ස චිත්තස්ස සඞ්ඛම්පි න උපෙන්ති. කලම්පි න උපෙන්ති. කලභාගම්පි න උපෙන්තී'ති.''**

යන පාඨය මිලින්දපඤ්හයෙහි එන්නේ බොහෝ අඩුපාඩු සහිත ව ය. මේ පාඨයෙහි මුල ම පෙණෙන මිලිඳුරජුගේ ප්‍රශ්නය මිලින්දපඤ්හයෙහි නො පෙණේ. ඊට මුලින් ඌනත්වයක් ඇති බව හැඟේ.

මිලින්දපඤ්හ පාඨය මෙසේ යි:—

**'' '(නත්ථි හි භන්තෙ නාගසෙන බුද්ධො අසබ්බඤ්ඤූ, යදි තස්ස පරියෙසනාය, සබ්බඤ්ඤුතඤ්ඤාණං හොතීති.)...............**

1. 'කුසලොසි' සුමංගල විලාසිනී පපඤ්චසූදනී අටුවාවන්හි පෙණේ.

Non-Commercial Distribution

> ......(මෙතැන ඌනතාවයක් තිබේ). **වාහසතං ඛො මහාරාජ වීහීනං අඩ්ඪචූළං ච වාහා වීහිසත්තම්මණානී වෙ ච තුම්බා එකච්ඡරාක්ඛණෙ පවත්ත චිත්තස්ස එත්තකා වීහී ලක්ඛං (?) ඨපියමානෙ පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍යුං''** (මිලින්දපඤ්හ 81 වන පිටුව).

මෙහි අවසානභාගය ද අටුවාවෙහි පෙණෙන පාඨය හා අසමාන ය.

සුමංගලවිලාසිනියෙහි මහාපරිනිබ්බාණසුත්තවණ්ණනාවෙහි පෙණෙන-

> **''භන්තෙ නාගසෙන කතමං බුද්ධකං? කතමං අනුබුද්ධකන්ති? දුක්කටං මහාරාජ බුද්ධකං. දුබ්භාසිතං අනුබුද්ධකං''**

යන පාඨය මිලින්ද්දපඤ්හයෙහි (114) වන පිටුවෙහි)

> **''කතමානි තානි බුද්ධකානි සික්ඛාපදානි? කතමානි අනුබුද්ධකානි සික්ඛාපදානී'ති දුක්කටං මහරාජ බුද්ධකසික්ඛාපදං දුබ්භාසිතං අනුබුද්ධකසික්ඛාපදං''.**

යන ලෙසින් පෙණේ.

මෙ සංසන්දයෙන් පැහැදිලි වන්නේ අටුවාඇදුරු බුදුගොස්තෙරණු-වන් දුන් තිබෙන **මිලින්දපඤ්හය** නුදුටු බව යි. දුන් තිබෙන මිලින්ද පඤ්හය අටුවා කිරීමෙන් පසු කාලයක කළ බව එයින් ම ඔප්පු වේ. මෙ මිලින්දපඤ්හය රචනා කළ කාලය පිළිබඳ ව මීට වැඩි දෙයක් කිය නො හැකි ය.

අටුවා ලියන කාලයෙහි දුන් තිබෙන මිලින්දපඤ්හය නො තිබුනු බවත්, එහෙත් අනෙක් මිලින්දප්‍රශ්නයක් පැවැති බවත් යට දක් වූ කරුණු

**මිලින්දපඤ්හයෙහි මූල**

වලින් තීරණය කර ගත හැකි ය. ඒ පුරාතන මිලින්දප්‍රශ්නය කිනම් භාෂාවකින් ලියා තුබුනේ දැයි නිශ්චය කිරීමට ප්‍රමාණවත් සාක්ෂ්‍ය දුර්ලභ ය. එහෙත් මෙහි ප්‍රාරම්භ පාඨය වූ **''තං යථානුසූයතෙ''** යන්න සංස්කෘතරචනාවෙක්හි මුහුණුවර දක්වන්නකි. එය ''තද්‍යථානු-ශ්‍රූයතෙ'' යන සංස්කෘතපාඨයෙහි පාලිපරිවර්තනය යි. එහෙයින් වර්තමාන පාළිමිලින්දපඤ්හයට මුල් වූයේ සංස්කෘතභාෂාවෙන් ලියා තුබුනු මිලින්දප්‍රශ්නයෙකැ යි අනුමාන කට හැකි ය.

'අටුවාචාරීන් වහන්සේ සංස්කෘතග්‍රන්ථයකින් කරුණු ගණිත් ද?' යනු දුන් නැඟිය හැකි ප්‍රශ්නයකි. 'ඔවු' යනු ඊට දිය හැකි කෙටි පිළිතුර යි. ග්‍රන්ථයෙහි භාෂාව කුමක් වුවත් එහි ඇතුළත් කරුණු බුද්ධ වචනයන්ට අවිරුද්ධ නම්, ස්වමතයන් ස්ථිර කිරීමට ඉවහල් වේ නම්, ඒබඳු කරුණු ගෙණ පෙළබසට නඟා දක්වීම අටුවාචාරීන් වහන්සේට නුපුරුදු වූවක් නො වේ. ස්වනිකායිකයෙකු නො වූ ද මහාකවි අශ්වගොෂ තෙරුන්ගේ පොත්වලින් ගත් කරුණු බුදුගොස්තෙරුන්ගේ අටුවා පොත්හි පෙණෙන බව අපි දනිමු.

*Non-Commercial Distribution*

ඒ මූලය වූ සංස්කෘතමිලින්දප්‍රශ්නය පචා සංවාදයෙන් කලක් ගත වූ පසු කළ බව සිතිය හැකි ය.

අටුවා ඇදුරු බුද්ධගොස්තෙරණුවෝ සිය ගත්වලට නොයෙක් ගත් වලින් කරුණු ගත්හ. එහෙත් ඒ කරුණු ගත් ගත්වල නම් හෝ ගත්
කතුවරුන්ගේ නම් හෝ බොහෝ
බුද්ධගොස්තෙරුන් නාගසෙනතෙරුන්ට විට නො දක්වූහ. සුමංගල
ගරු කළ තරම විලාසිනියෙහි නිකාය ශබ්දර්ථ
දක්වීමෙහි දී **පාණිනීයයෙහි**
තුන්වන අධ්‍යායයෙහි තුන්වන පාදයෙහි 41 වන සූත්‍රවෘත්තියෙන් 'චික්ඛල්ලිකනිකාය' යන්න ගෙණ දක්වමින් එය ලොකව්‍යවහාරයෙන් ගත් සාධකයකැ යි කීහ. **පාණිනීයයෙහි** නම වත් නො දක්වූහ. **මනොරථපූරණියෙහි** (හේවාවිතාරණ මුද්‍රණයෙහි 451 වන පිටුවෙහි) ජනපද විතර්කය විස්තර කිරීමෙහි දී දක් වූ ''අසුකො ජනපදෙ ඛෙමො සුභික්ඛො'' යන්න මහාකවි **අශ්වඝොෂතෙරුන්ගේ සෞන්දරනන්දකාව්‍යයෙහි** පසළොස් වැනි සර්ගයෙහි 42 වන ශ්ලෝකයෙහි ප්‍රථමාර්ධය වූ ''අසෞ ක්ෂෙමො ජනපදඃ සුභික්ෂොසාවසෞ ශිවඃ'' යන්නෙහි පාලිපරිවර්තනය වූ නමුත් ඒ බවක් නො කීහ.

මෙලෙසින් නම් නො කියා නොයෙක් පොත්වලින් කරුණු ගත් අටුවාචාරීන් වහන්සේ **නාගසෙනතෙරුන්ට** දක්වූ ගෞරවය ඉතා මහත් ය. උන්වහන්සේ බොහෝවිට නම් දක්වූ **සීහලට්ඨකථා** ආදි පැරණි අටුවාවන්ට ද වඩා මිලින්දප්‍රශ්නයට ගරු කළහ. උන්වහන්සේ **සුමංගල විලාසිනියෙහි** දී හා **පපඤ්චසූදනියෙහි** දී ද යථොක්ත ''අතිදුක්කරං'' යනාදි මිලින්දපඤ්හපාඨය උද්ධරණය කරද්දී ''කිමෙත්ථ අඤ්ඤෙන වත්තබ්බං, වුත්තමෙතං නාගසෙනත්ථෙරෙනෙව මිලින්දරඤ්ඤා පුට්ඨෙන'' (=මෙහි ලා අනෙකෙකු විසින් කිය යුතු කිම? මිලිඳුරජු විසින් විචාළ නාගසෙනතෙරුන් විසින් ම මෙය කියන ලදී) යි කියමින් නාගසෙන වචන අතිශය ප්‍රාමාණිකත්වයෙන් හා මහාපදෙශත්වයෙන් ද සැලකූහ. **සුත්තනිපාතට්ඨකථාව** මෙහි දී මේ පාඨයෙහි ''අඤ්ඤෙන'' (=අනෙකෙකු විසින්) යන්න ''අම්හෙහි'' (=අප විසින්) යි යෙදුනේ ය. අටුවාචාරීන් වහන්සේ විසින් මිලින්දප්‍රශ්නය එතරම් ගුරුස්ථානයෙහි ලා සලකන ලද්දේ නම් අන්‍යයන් ගැණ කියනුම කිම?

ලක්දිව සිංහල ග්‍රන්ථකර්තෘවරයෝ ද, මිලින්දපඤ්හය අමතක නො කළහ. ඉතාමත් පැරණි වූ මිලින්දප්‍රශ්න සිංහල පරිවර්තනයක් අපට
දූන් නැතත් එබන්දක් නො වූයේ ය යි කිය නො
සිහල ගත්කතුවරු හැකි ය. කුරුණෑගල රාජ්‍යසමයෙහි නැතහොත්
ඊට ආසන්න කාලයෙක්හි කරණ ලද සද්ධර්ම
රත්නාවලියෙහි හා ජයවර්ධනපුර රාජ්‍ය කාලයෙහි කළ සද්ධර්ම

*Non-Commercial Distribution*

රත්නාකරයෙහි ද මිලින්දප්‍රශ්නයෙහි සංක්ෂෙපයක් අන්තර්ගත ය. ‘මිලිඳු’ නාමය සිංහල කවීන්ගේ සිහියෙන් ඉවත් නො වූ බව **පැරකුම්බා සිරිතෙහි** 72 වන කවෙහි—

“පැනය කියන විසඳන කලැ **මිලිඳුනිරිඳු** සඳිසිවාද”

යන පාදයෙන් ඔප්පු වේ.

**රක්ඛිතතල**

**හිමාලයෙහි** වූ ‘රක්ඛිතතල’ නම් පර්වතයක් මිලින්දපඤ්හයෙහි සඳහන් වේ. මේ නාමය අනෙක් පාළි පොතක දුටු බවක් අපට මතක නැත. සිංහල පොත්හි හිමාලයෙහි වූ රක්ගල්තලක් නම් සඳහන් වේ. ඒ ‘රක්ගල්තල’ යන්න සඳහා එහි සැබෑ අර්ථය නො සලකා මේ ‘රක්ඛිතතල’ යන වචනය පාළි මිලින්දපඤ්හයෙහි යෙදුනේ නම්, මේ පාළිමිලින්දපඤ්හයට වඩා පැරණි වූ සිංහල මිලින්දප්‍රශ්නයක් තුබුනු බවත් එය ද බලමින් පාළිමිලින්දපඤ්හය ලියූ බවත් සිතිය හැකි ය. ‘රක්’ යනු ‘මනඃශිලා’ නම් උපධාතුවිශෙෂයට සිංහල නාමයකි. ‘මනොසිලාතල’ යන්න සිංහලයට පෙරළූ පැරණි ගත්කතුවරු ‘රක්ගල්තල’ යි යෙදූහ. ‘රක්ගල්තල’ යන්නෙහි ඇති ඒ අර්ථය නො දත්තෙකු අතින් එය ‘රක්ඛිතතල’ යි පාළියට පෙරළීමට බැරි බවක් නො මැති යි. පාළිමහාබොධිවංශකර්තෘ ආදි ශ්‍රෙෂ්ඨ උගතුන් අතින් ද මෙ බඳු වැරදි වූ බව පෙණෙන හෙයින් මෙය ද නො විය හැක්කක් නො වේ.

**මිලින්දපඤ්හයෙහි ඇතුළත් කරුණු**

මිලින්දපඤ්හයෙහි මුල මිලිඳුරජුගේ හා නාගසෙනතෙරුන්ගේ ද පූර්වජන්ම ප්‍රවෘත්තිය හා මිලිඳුරජතුමා පණ්ඩිත ය යි ප්‍රසිද්ධ ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා එළඹ ප්‍රශ්න විචාරා ඔවුන් පැරද වූ පරිදිත්, රහතුන් වහන්සේ දෙව්ලොවට වැඩ මිනිස් ලොව ඉපද මිලිඳුරජු දමනය කර සසුන්වැඩ වඩන මෙන් **මහාසෙන** දිව්‍යපුත්‍රයන්ට ආරාධනා කළ පරිදි හා එය පිළිගත් ඒ දෙව්පුතු මිනිස්ලොව ඉපද නාගසෙන නම් ව එකලට පැවැති ශාස්ත්‍රයන් ඉගෙණ එහි හරයක් නො දක බුද්ධධර්මයෙහි පැහැද මහණ ව සිවුපිළිසිඹියා පත් රහත් වූ පරිදිත්, පසු ව මිලිඳුරජු හමු ව ඔහු පහදවාගත් අයුරුත් ප්‍රකාශිත ය. ඊලහට මිලිඳුරජුගේ ප්‍රශ්නරාශියක් හා නාගසෙනතෙරුන් වහන්සේ ඊට දුන් පිළිතුරුත් එයි. අවසානයෙහි යොගාවචරයෙකුට අවශ්‍ය කරුණු රාශියක් ඇතුළත් ය. ඒ කරුණු අසා පැහැදුනු මිලිඳුරජතුමා සිය නමින් මහාවිහාරයක් කරවා නාගසෙන තෙරුන් වහන්සේට පුද, පසු ව සිය වැඩිමහලු පුත් කුමරුන්ට රාජ්‍යය භාර කර පැවිදි ව රහත් වූ බවත් දක් වූ කථාවෙන් පොත අවසන් වෙයි.

**සාධකපාඨ**

ත්‍රිපිටකයෙහි නොයෙක් තැනින් උපුටා ගත් ගද්‍යපද්‍යසාධක පාඨ රාශියක් මිලින්දපඤ්හයෙහි ඇතුළත් වෙයි. **මිලින්ද-පඤ්හය** ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කළ **රෙස් ඩෙවිඩ්ස්**

*Non-Commercial Distribution*

පඬිතුමා තමාගේ පොතේ සංඥපනයෙහි ඒ සියල්ල සැකෙවින් දක්වා එයින් සමහරක් පෙණෙන මුල්තැන් ද සඳහන් කරයි. මූල්තැන් සොයා ගත නො හැකි වූ පාඨයන්හි දී ඒ බව ද දක්වයි. එතුමා විසින් සොයා ගත නො හැකි ය යි දැක්වූ පාඨයන්ගෙන් සමහරක් තිබෙන මූල්තැන් සොයා ගැණීම එතරම් අපහසු නො වේ. එහෙත් සමහර පාඨ තිබෙන මුල් තැන් සොයා ගැණීම ඉතාමත් අපහසු ය. සිංහල, සියම්, බුරුම අකුරුවලින් මුද්‍රිත බොහෝ ත්‍රිපිටකග්‍රන්ථයන්හි ක්‍රමානුකූල සූචි පත්‍ර, අනුක්‍රමණිකා ආදිය නොමැති වීමත්, ඉංග්‍රීසි අකුරෙන් මුද්‍රිත පොත්හි තිබෙන ඒ සූචිපත්‍ර ආදියෙහි අසම්පූර්ණත්වයක් ඒ අපහසු බවට ප්‍රධාන හෙතුව ය යි කිය හැකි ය. මිලින්දපඤ්හයෙහි බුදුරජානන් වහන්සේ විසින් හා ශ්‍රාවක ශ්‍රාවිකාවන් විසින් ද දෙසූ සේ දැක්වූ සමහර පාඨ ක්‍රමානු-කූල පරීක්ෂණයක් කළත් වර්තමාන ත්‍රිපිටක පාළියෙන් සොයා ගත නො හැකි ය යනු සමහරුන්ගේ අදහසකි. ඒ අදහස සත්‍ය වුවොත් මිලින්ද පඤ්හයෙහි සංස්කෘත මූලකත්වය තහවුරු වෙයි.

වර්තමාන **මිලින්දපඤ්හය** අසම්පූර්ණ ය යනු එහි ම අවසානයෙහි දැක්වේ. සම්පූර්ණ **මිලින්දපඤ්හයෙහි** ප්‍රශ්න තුන්සිය හතරක් ඇතුළත් විය යුතු නමුත් එයින් දෙසාළිසක් ම මේ **පාළිමිලින්දපඤ්හ** **ඌනතා** යෙහි නැති බව සඳහන් වෙයි. ඒ ඌනත්වය කෙසේ වූයේ දැ යි නිශ්චය වශයෙන් නො කිය හැකි ය. බොහෝ සංස්කෘත ප්‍රාකෘත බෞද්ධ ග්‍රන්ථ විනාශ වී ගිය බව අපි දනිමු. මිලින්ද ප්‍රශ්නය ද එසේ විනාශයට ලං ව පැවැති අවස්ථාවක ඉතිරි ව තුබුනු කොටස පාළියට නැඟීමෙන් මේ මිලින්දපඤ්හය සකස් කළ බව සලක-නොත් ඒ ඌනත්වයට හෙතුව කුමක් දැ යි සිතා ගත හැකි ය.

**මිලින්දපඤ්හයෙහි** සඳහන් පුද්ගලනාම රාශියකි. ඒ එක් එක් නාමයක් ගැණ විවරණ ලියන්නට සැරසුනොත් මේ සංඥපනය අතිශය දීර්ඝ විය හැකි ය. එහෙයින් මෙහි අවශ්‍යයෙන් විවරණය **මිලින්දපඤ්හයෙහි** කළ යුතු මිලිඳු, නාගසෙන ආදි නම් කීපයක් **සඳහන් පුද්ගලයෝ** පිළිබඳ ව සංක්ෂිප්ත විවරණ ලියන්ට අදහස් කරමු. **රෙස් ඩෙවිඩ්ස්** පඬිතුමාගේ මිලින්දප්‍රශ්න ඉංග්‍රීසි පරිවර්තන සංඥපනයෙහි හා **කේම්බ්‍රිජ්විශ්වවිද්‍යාලය** මගින් සම්පාදනය කළ ඉන්දියාඉතිහාසයෙහි ද මිලිඳුරජු පිළිබඳ ව මේ තාක් සොයා ගත හැකි වූ විස්තරය ඇතුළත් වෙයි. ඒ අනු ව ඒ රජතුමා පිළිබඳ විස්තරය දැක්වීම අපට අපහසු නො වන බව ඒ පඬිතුමාට හා ඒ ඉතිහාසකර්තෘවරයාට ද ස්තුතිපූර්වක ව සඳහන් කරමු.

**මිලිඳුරජතුමා** මනස්කල්පිත පුද්ගලයෙකු නො වන බව යට දැක්වීමු. මිලින්දපඤ්හයෙහි සඳහන් පරිදි ඒ රජතුමා **'අලසන්ද'** නම් දිවයිනෙහි **කලසි** නම් ග්‍රාමයෙහි උපන්නෙකි. **සාගලපුරය** රාජධානිය **මිලිඳු රජ** කොට ගෙණ විශාල ප්‍රදෙශයක් පාලනය කළ යොන් රජෙකි.

*Non-Commercial Distribution*

'අලසන්ද' යනු ඇලැක්සැණ්ඩර් නම් ග්‍රීක් රජුට අයත් ව පැවැති ඇලැක්සැණ්ඩරියා නම් ප්‍රදෙශයට යෙදූ මාගධිකනාමය යි. ඒ අලසන්දව දිවයිනකැ යි මෙහි දක්වේ. කාබුල්නදියෙහි අතුගංගා වූ චේනාබ්, රාවී යන නදී දෙක අතර පිහිටි හෙයින් ඒ නමින් ප්‍රසිද්ධ වූ බව සිතා ගත හැකි ය. ශාකලද්වීප යනු ද මීට ම අනික් නමකි. අලසන්දදිවයින සාගලපුරයේ සිට යොදුන් දෙසියයකින් ඈත පිහිටි බව මේ පොතෙහි සඳහන් වේ.

කලසිග්‍රාමය ගැණ අනික් තැනක සඳහන් නො වේ. දැනට ඉන්දියාවෙන් සොයා ගෙණ තිබෙන නානාවිධ පැරණි ග්‍රීක් කාසි අතර 'කරිසි' යන නගර නාමයක් සඳහන් එකක් ද තිබේ. ඒ කාසිය වාත්තු කරවන ලද්දේ ක්‍රිස්තුත්පත්තියට අවුරුදු 180 කට පෙර ඉයුක්‍රටිඩෙස් (Eukratides) නම් රජෙකු විසිනි. මේ කාසියෙහි සඳහන් කරිසිනගරය හා මිලින්දපඤ්හයෙහි සඳහන් කලසිග්‍රාමයත් එකක් ම විය හැක්කැ යි යුරෝපීය පඬිවරු සලකති.

සාගලපුරය බෞද්ධසාහිත්‍යයෙහි සුප්‍රසිද්ධ ය. පුරාතනයෙහි දඹදිව ධනවත් පවුල්වල තරුණයන්ට රූපසම්පන්න භාර්යාවන් සැපයුවේ මද්‍රරට සාගලපුරය ය යනු **කුසජාතක, මහාකස්සපචරිත** ආදියෙන් ඔප්පු වෙයි. සාගලපුරය හා කාශ්මීරදෙශයත් අතර දූරප්‍රමාණය දෙළොස් යොදුනකැ යි මිලින්දපඤ්හයෙහි දක්වේ. වර්තමාන පංජාබදෙශයෙහි සියල්කොට්නගරය පුරාණ සාගලනගරය ලෙස සැලකේ. 'සියල්' යන්න 'සාගල' යන්නෙන් ආවකි. මේ 'කොට්' යන්න හා සිංහල 'කොටු' යන්න ද සමාන ප්‍රභව ඇති එකාර්ථවත් ශබ්ද ය.

මිලිඳුරජතුමා යෝනයෙකු බව මෙහි සඳහන් වෙයි. 'යොන' යනු ද 'යවන' යනු ද සමානාර්ථ ය. ඒ නම් දෙක ම ව්‍යවහාර වූයේ ඉන්දියාවෙන් බටහිරදිග පිහිටි රටවල වැසියන් උදෙසා ය. විශෙෂයෙන් ග්‍රීක් ජාතිකයෝ ඒ නාමයෙන් දඹදිව වැසියන් අතර ප්‍රසිද්ධ වූහ. එහෙයින් මිලිඳුරජතුමා ග්‍රීක්ජාතිකයෙකු විය යුතු ය.

බැක්ට්‍රියාවේ සිටි ග්‍රීක්රජුන්ගේ නම් අතර 'මිනැණ්ඩර්' යන නමක් ද දක්නා ලැබේ. මේ රජුගේ නාමය දරණ කාසි වර්ග දෙවිස්සක් බස්නාහිරින් කාබුල්නුවර ද නැගෙනහිරින් මථුරාව ද උතුරෙන් කාශ්මීරය ද තෙක් වූ ඉතා විශාල ප්‍රදෙශයෙක තැනින් තැන තිබී දැනට සොයා ගෙණ තිබේ. ඒ කාසිවල එක් පැත්තක යම්කිසි රූපසටහනක් ද ග්‍රීක්භාෂා වාක්‍යයන් ද අනික් පැත්තෙහි ඛරොස්ති අක්ෂරවලින් වූ—

1. **'මහාරාජස ත්‍රාතරස මෙනන්ද්‍රස''**
   (ආරක්ෂක වූ මෙනන්ද්‍ර මහරජුගේ)
2. **''මහාරාජස ධාර්මිකස මෙනන්ද්‍රස''**
   (ධාර්මික වූ මෙනන්ද්‍ර මහරජුගේ)

යනාදි දෙශභාෂාමය පාඨයක් ද පෙණේ. මේ කාසිවල පෙණෙන 'මෙනැන්ඩ්‍රො' 'මෙනන්ද්‍ර' යන නාමයන් සංස්කෘත භාෂානුරූප තේ

*Non-Commercial Distribution*

සකස් කිරීමෙන් 'මිලින්ද' යන නම නිපදවා තිබෙන බව යුරෝපයේ පඬිවරු කියති.

එක් කාසියක පමණක් පෙණෙන චක්‍රලක්ෂණය ධර්මාශොකරජතුමාගේ ද ලකුණක් වූ ධර්මචක්‍රලක්ෂණය විය හැකි ය යි ද, බෞද්ධ ය යි නිශ්චය කර කිය හැකි අනික් ලකුණක් ඒ කාසිවල නැතැයි ද 'ධාර්මික' යන විශෙෂණය අබෞද්ධ නරෙන්ද්‍රයන්ට පවා යෙදිය හැක්කැයි ද කියමින් රෙස් ඩෙවිඩ්ස් පඬිතුමා මිලිඳුරජතුමාගේ බෞද්ධත්වය ගැණ සැක කරයි. එහෙත් බැක්ට්‍රියාවේ ජනයා මෙන් ම රජවරුන් ද බෞද්ධයන් වූ බව ඒ මහතා ම අනික් තැනක දී කියයි.

මිලිඳුරජතුමා බුද්ධශාසනයෙහි පැවිදි ව රහත් වූ බව මිලින්දප්‍රශ්නයෙහි සඳහන් වේ. මිලිඳුරජතුමා කලුරිය කළ පසු එතුමාගේ ශරීරය ආදහන කළ බවත් එතුමාගේ ශරීරධාතු ලබා ගැණීම සඳහා බොහෝ නගරයන් තරහ කළ බවත්, ශරීරධාතු බෙදු ගැණීමකට ඒ නගරයන් එකඟ වීමෙන් ආරාවුල අවසන් වූ බවත්, ධාතු ලබා ගත් නගරයන් ස්තූප තැනවූ බවත් ප්ලුටාර්ච (Plutarch) නම් ග්‍රන්ථකර්තෘවරයාගේ ග්‍රන්ථයෙක්හි සඳහන් වේ. මේ කථාව ද මිලින්දප්‍රශ්නයෙහි දැක්වූ ප්‍රවෘත්තිය සත්‍යයක් ලෙස තීරණය කිරීමට සාක්ෂ්‍යයකි.

**තවත් ග්‍රීක් නාම**

මිලිඳුරජුගේ ඇමතියන් වූ **දෙවමන්ත්‍රිය, අනන්තකාය, මංකුර, සබ්බදින්න** යන සතරදෙනෙකුන් ගැණ ද මේ පොතෙහි සඳහන් වෙයි. ඔවුන් ද නිසැක ලෙස ම යවනයන් විය යුතු ය. එහෙයින් ඔවුන්ගේ නම් ද යවනනාම විය යුතු ය. **'දෙවමන්ත්‍රිය'** යන්න **'ඩෙමෙට්‍රියොස්'** (Demetrios) යන නමට ද **'අනන්තකාය'** යන්න **'අන්තියෝචොස්'** (Antiochos) යන නමට ද සමාන ය යි **රෙස් ඩෙවිඩ්ස්** පඬිතුමා දක්වමින් 'සබ්බදින්න' 'මංකුර' යන දෙකට ප්‍රභව වූ ග්‍රීක් නාම කීම අපහසු ය යි ද කියයි.

**නාගසෙන**

**නාගසෙන**තෙරුන් පිළිබඳ සම්පූර්ණ විස්තරය මේ පොතෙහි ම ඇතුළත් වෙයි. පුරාතන සංස්කෘත බෞද්ධ ග්‍රන්ථයන්හි නාගසෙන නාමය නො පෙණෙන හෙයින් මෙය මිලින්දප්‍රශ්න කර්තෘහු විසින් නිපදවා යොදන ලද්දක් විය හැක්කැ යි සමහර යුරෝපීය පඬිවරු සිතති. ඒ මතය වැරදි ය. පුරාණ සංසස්කෘත බෞද්ධ ග්‍රන්ථයන්ගෙන් වර්තමාන පණ්ඩිතලොකයට ලැබී තිබෙන්නේ ස්වල්පයකි. ඒ පොත් ටිකෙහි සඳහන් නුවූ තරමින් නාගසෙන නම් තෙර කෙනෙකුන් ලොකයෙහි ඇති නුවූ සේ සිතීම යුතු නො වේ. අටුවාචාරීන්වහන්සේ නාගසෙන නාමය අමතක නො කළහ. ඊට මහත් බුහුමනක් දැක්වූහ. මෑත කාලයේ දී ද **නාගසෙන** නම් තෙර කෙනෙකුන් සිටි බව **හංසසන්දෙශයෙන්** පෙණේ.

බුද්ධකාලයෙහි **දඹදිව** සිටි **පූරණකස්සප, මක්ඛලිගොසාල, නිගණ්ඨනාතපුත්ත, සඤ්ජයබෙල්ලට්ඨිපුත්ත, අජිතකෙසකම්බල, කකුධකච්චායන**

Non-Commercial Distribution

යන සදෙන ද මිලිඳුරජුගේ කාලයෙහිත් සිටි සේ මේ පොතෙහි සඳහන් වේ. මෙයින් බුද්ධකාලයෙහි සිටි සදෙන ම මිලිඳුරාජ කාලයෙහිත් සිටි සේ පිළිගැනීම යුතු නො වේ. ඒ ෂට්ශාස්තෘවරයන් විසින් ඇති කළ සමයයන්හි (=ආගම්වල) එකල සිටි ප්‍රධානයන් ඒ ප්‍රථමයන්ගේ නම්වලින් ම හැඳින්වූ සේ සැලකීම යොග්‍ය ය.

**ෂට්ශාස්තෘහු**

මේ සිංහල මිලින්ද ප්‍රශ්නය ලියන ලද්දේ **කීර්ති ශ්‍රී රාජසිංහ** රජතුමාගේ කාලයෙහි **මහනුවර මල්වතු විහාරයේ** වැඩ සිටි **සීනවිකුඹුරේ සුමංගල** නම් තෙරුන් වහන්සේ විසිනි. ඒ පිළිබඳ විස්තර මේ පොතෙහි මුල හා අග ද සඳහන් වෙයි.

**මිලින්දපඤ්හයෙහි සිංහල පරිවර්තනය**

පාළි මිලින්දපඤ්හය පෙරළා ඒ සුමංගල තෙරුන් වහන්සේ විසින් කළ සිංහල මිලින්දප්‍රශ්නයට උන්වහන්සේ විසින් තබන ලද නාමය **'සද්ධර්මාදස'** යන්න යි. 'සදහම් කැඩපත' යනු එහි තේරුමයි.

**සද්ධර්මාදස**

සුමංගල තෙරුන්වහන්සේ දීඝනිකායාදි පාළිපොත් කියවූ උගතෙකු බව මේ පොතෙන් හැඟේ. නොයෙක් තැන පාළිමිලින්දපඤ්හයෙහි නො ආ විස්තර අනික් පොත්වලින් ගෙණ මීට එකතු කරණ ලද නමුත් සමහර තන්හි දී මිලින්දපඤ්හ පාඨයන් මෙන් ම අනික් පොත්වලින් ගත් පාඨ ද වරදවා පරිවර්තනය කළ බව පෙනේ. සිංහල වාක්‍යරචනා රීති උල්ලංඝනය කළ තැන් මෙහි ඉතා සුලභ ය. සංස්කෘතභාෂාව නො දන පාළිවචන සංස්කෘත කරන්ට සැරසීමෙන් අපභ්‍රංශවචන නො මඳ බොහෝ තැන පාළිවචන ම යොද තිබීම ප්‍රශංසාර්හ ය.

**මෙහි තත්ත්වය**

පුරාතන පැවැති අතිශය දීප්තිමත් ශාස්ත්‍රාලොකය අතුරුදහන් වීමෙන් පසු වර්තමාන ශාස්ත්‍රාලොකයේ ප්‍රාරම්භ අරුණසමය වූ ඒ කාලයෙහි ස්වකීය ශක්තිය නො සලකා මේ ප්‍රශස්තධර්මග්‍රන්ථය සිංහල භාෂාවට පරිවර්තනය කරන්ට සැරසුනු ඒ සුමංගල ස්වාමීන්ද්‍රයන්වහන්සේගේ වීරත්වයට වර්තමාන සිංහලයන් අතිශයින් ගරු බුහුමන් කළ යුතුයි.

මිලින්දප්‍රශ්නය සිංහලයට පරිවර්තනය කළ ද පටන් ම වාගේ උවසු උවැසියන්ට ප්‍රිය වූ පොතක් වී ය. අදත් ගම්බද ගෙවල්හි ආදරයෙන් කියවනු ලබන පොත් අතුරෙන් මේ පොත ද එකකි.

**ජනප්‍රියත්වය**

මේ පොත පළමුවරට මුද්‍රණයෙන් ප්‍රකාශයට පැමිණියේ ක්‍රිස්තු -වර්ෂ 1878 හි දී ය. මෙය එද ''ප්‍රසිද්ධ මොහොට්ටිවත්තේගුණානන්ද උන්නාන්සේගේ ආධාර ඇති ව පණ්ඩිත ස්ථවිරයන් වහන්සේලා කීපනමක් ලවා ශුද්ධ කරවා'' ගත් බව ඒ පොතෙහි ''දැන්වීමෙහි'' සඳහන් වෙයි. එය ''අච්චු ගස්වා ප්‍රසිද්ධ කරන්ට යෙදුනේ:—

**මුද්‍රණය**

Non-Commercial Distribution

කොළඹ පදින්චි කරෝලිස් පීරිස් අප්පුහාමි ද,
,, ආබ්‍රහම් ලිවේරා අප්පුහාමි ද,
,, එවිස් මැන්දිස් අප්පුහාමි ද,
,, නන්දිරිස් මෙන්දිස් අමරසේකර අප්පුහාමි ද,
,, චාර්ලිස් අර්නෝලිස් මැන්දිස්
විජයරත්න අමරසේකර අප්පුහාමි ද

යන පස් දෙනා විසින් ශ්‍රී බුද්ධවර්ෂ 2420 වන්නේ ඇසළමස පුර පසළොස්වක් රිවිදින කොළඹ දී ය.''

ඊට පසු ව කොළඹ පස්වන හරස් වීදියේ ශ්‍රීභාරතී යන්ත්‍රාලය හා පොත් වෙළඳ හල ද හිමි ව සිටි **යූ. පී. ඒකනායක** මහතා විසින් භදන්තාචාර්ය **තෙල්වත්තේ ශ්‍රී අමරවංශ** මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගේ ද උපකාර ඇති ව සකස් කොට මුද්‍රණය කරවා 1928 ජනවාරි මස ප්‍රකාශ කළ මිලින්දප්‍රශ්නයක් ද තිබේ.

**මේ සංස්කරණය**

මේ පොත සංස්කරණය කර දෙන්ට ය යි කොළඹ වේල්ල වීදියේ රත්නාකර පොත් වෙළඳ හල හිමි **ජී. පී. ඩී. ගේබ්‍රියෙල්** මහතා අපට ආරාධනා කර සිටියේ ය. ඒ සඳහා ගත කිරීමට තරම් කාලයක් අපට නැති හෙයින් අපි එය **විද්‍යොදය** පිරිවෙණෙහි ආචාර්යවරයෙකු වූ **ගලගම පණ්ඩිත ශරණංකර** ස්ථවිර නමට පැවරීමු. ඒ ස්ථවිර නම විසින් විද්‍යොදය පිරිවෙණෙහි ශිෂ්‍ය වූ **කිනිගම ඤාණතිලක, විතාරන්දෙනියේ පඤ්ඤාකිත්ති පිටකටුවන සුමනසිරි, අගලවත්තේ සංඝරතන** යන භික්ෂූන්ගේ ද උපකාර ඇති ව සකස් කරණ ලද බවත්, ප්‍රථම සංස්කරණයන්හි වූ වැරදි රාශියක් ශුද්ධ කළ බවත් අපි දනිමු.

**වාක්‍ය මැද අංක**

මේ සංස්කරණයෙහි වාක්‍ය මැද වරහන් ඇතුළ අංක වගයක් යෙදී තිබෙන බව පෙණේ. එය අපේ නියමයෙන් කරණ ලද්දකි. ඒ අංකයන්ගෙන් දක්වන්නේ **යූ. පී. ඒකනායක** මහතාගේ පොතෙහි පිටුවල අංක ය. අපේ **ශ්‍රී සුමංගල ශබ්දකෝෂයට** වචන සැපයූ එක් පොතක් නම් **ඒකනායක** මහතාගේ ඒ **මිලින්දප්‍රශ්නය** යි. මිලින්දප්‍රශ්නයෙන් ගත් වචන දක්වීමේදී ඒ පොතෙහි පිටුවල අංක දක්වීමු. මේ පොත පරිශීලනය කරණ අයට ඒ වචනය යෙදුනු වාක්‍යයන් බලා ගැණීමට වුවමනා වූ විට වැඩි අපහසුවක් නැති ව බලා ගත හැකි වීම එයින් ලැබෙන ප්‍රයොජනය යි. මේ පොතෙහි එක් එක් පිටුවෙහි මුදුනෙහි ද ඒ පිටුවෙහි ඇතුළත් කොටස අඩංගු වන ඒකනායක මහතාගේ පොතෙහි පිටුවෙහි හෝ පිටුවල අංක දක්වන ලදී.

මීට, **වැලිවිටියේ සොරත ස්ථවිර.**

ශ්‍රී බු. ව. 2499 / ක්‍රි. ව. 1955 අගෝස්තු මස 1 දින
විද්‍යොදය පිරිවෙණේ දී ය.

Non-Commercial Distribution

# සූචිපත්‍රය


| | පිට |
|---|---|
| බාහිර කථා | 1 |
| පූර්වයොගප්‍රශ්නය | 30 |
| දෙවෙනි වර්ගය | 47 |
| තුන්වන වර්ගය | 59 |
| සතරවන වර්ගය | 73 |
| පස්වන වර්ගය | 81 |
| සවැනි වර්ගය | 85 |
| සත්වන වර්ගය | 91 |
| පෘච්ඡා විසර්ජනා | 102 |
| මෙණ්ඩක ප්‍රශ්නය | 105 |
| ආවර්ජනා ප්‍රතිබද්ධ ප්‍රශ්නය | 120 |
| දෙවදත්ත ප්‍රව්‍රජ්‍යා ප්‍රශ්නය | 128 |
| විශ්වන්තර පෘථිවිකම්පා ප්‍රශ්නය | 135 |
| සිවිරාජ ප්‍රශ්නය | 143 |
| ගර්භාවක්‍රාන්ති ප්‍රශ්නය | 147 |
| ශාසනායුඃ ප්‍රශ්නය | 158 |
| කර්මක්ෂය ප්‍රශ්නය | 164 |
| විවෙකගුණ ප්‍රශ්නය | 169 |
| ත්‍රිමාසායුඃ පරිච්ඡෙද ප්‍රශ්නය | 172 |
| ශික්ෂා සමූහනන ප්‍රශ්නය | 175 |
| ආචාර්ය මුෂ්ටි ප්‍රශ්නය | 177 |
| මරණභය ප්‍රශ්නය | 179 |
| පිරිත් ප්‍රශ්නය | 184 |
| ප්‍රත්‍යයලාභ ප්‍රශ්නය | 189 |
| අනාපත්ති ප්‍රශ්නය | 193 |
| පිරිස් පරිහරණ ප්‍රශ්නය | 195 |
| අභෙද්‍ය පිරිස් ප්‍රශ්නය | 196 |
| ශ්‍රෙෂ්ඨධර්ම ප්‍රශ්නය | 198 |
| උණුලේ නිර්ගත ප්‍රශ්නය | 201 |
| සෙල ප්‍රශ්නය | 211 |
| මොඝපුරිසවාද ප්‍රශ්නය | 217 |
| අචෙතනවෘක්ෂ ප්‍රශ්නය | 219 |
| චුන්දභත්ත ප්‍රශ්නය | 221 |
| ආමිසපූජා ප්‍රතික්ෂෙප ප්‍රශ්නය | 227 |
| පපටිකා පතිත ප්‍රශ්නය | 230 |
| ශ්‍රමණ විනිශ්චය ප්‍රශ්නය | 233 |
| උබ්බිල්ලාවිත ප්‍රශ්නය | 235 |
| අහිංසා නිග්‍රහ ප්‍රශ්නය | 236 |
| සංඝ පනාමිත ප්‍රශ්නය | 238 |
| මෞද්ගල්‍යායන ඍද්ධි විභාග ප්‍රශ්නය | 243 |
| විනය ප්‍රතිච්ඡන්න ප්‍රශ්නය | 245 |
| මුසාවාද පාරාජිකා ප්‍රශ්නය | 248 |
| කාලවිලොකන ප්‍රශ්නය | 250 |
| මරණ සමුච්ඡෙද ප්‍රශ්නය | 252 |
| මෙත්තානිසංස ප්‍රශ්නය | 256 |
| කුශලාකුශලකාරී විශෙෂ ප්‍රශ්නය | 264 |
| අමරාදේවී ප්‍රශ්නය | 276 |
| අර්හත් නිර්භය ප්‍රශ්නය | 279 |
| සර්වඥනුමාන ප්‍රශ්නය | 281 |
| සෙනාසන ප්‍රශ්නය | 283 |
| උදරසංයත ප්‍රශ්නය | 285 |
| බක්කුලත්ථෙර ප්‍රශ්නය | 287 |
| නිර්වාණමාර්ග ප්‍රශ්නය | 292 |
| ලොමසකාශ්‍යප ප්‍රශ්නය | 294 |
| ජොතිපාල මාණවක ප්‍රශ්නය | 298 |
| ඝටීකාරාවාස ප්‍රශ්නය | 300 |
| බ්‍රාහ්මණරාජ ප්‍රශ්නය | 302 |
| සර්වඥගොචර ප්‍රශ්නය | 305 |
| බ්‍රහ්මාරාධනා ප්‍රශ්නය | 316 |
| ගුරුවිරහිත ප්‍රශ්නය | 320 |
| එකබුද්ධධාරණී ප්‍රශ්නය | 322 |
| සංඝ පූජනීය ප්‍රශ්නය | 326 |
| ප්‍රව්‍රජ්‍යාවිශෙෂ ප්‍රශ්නය | 332 |
| දුෂ්කරක්‍රියා ප්‍රශ්නය | 334 |
| සීරළු ප්‍රශ්නය | 341 |
| එකවෙදනා ප්‍රශ්නය | 349 |


*Non-Commercial Distribution*

| | පිට |
|---|---|
| ගෘහස්ථපාරාජිකා ප්‍රශ්නය | 351 |
| ශ්‍රමණදුශ්ශීල ප්‍රශ්නය | 354 |
| උදකප්‍රාණි ප්‍රශ්නය | 356 |

| | |
|---|---|
| නිෂ්ප්‍රපඤ්ච ප්‍රශ්නය | 360 |
| ද්වෛගති ප්‍රශ්නය | 363 |
| අසම්මෝහ ප්‍රශ්නය | 364 |
| සිංහනාද ප්‍රශ්නය | 368 |
| නිර්වාණවිමතිච්ඡේදන ප්‍රශ්නය | 369 |
| නිර්වාණාකාශෝපමා ප්‍රශ්නය | 373 |
| යක්ෂ ප්‍රශ්නය | 374 |
| සර්වඥඍෂි ප්‍රශ්නය | 375 |
| සූර්යොපක්ලෙශ ප්‍රශ්නය | 376 |
| ක්‍රූරප්‍රභා ප්‍රශ්නය | 378 |

| | |
|---|---|
| පුත්‍රදන ප්‍රශ්නය | 379 |
| ඥානපරිපාක ප්‍රශ්නය | 409 |
| පුණ්‍යාධිකතර ප්‍රශ්නය | 416 |
| ඥාතිප්‍රේත පින්පෙත් ප්‍රශ්නය | 421 |
| මහාස්වප්න ප්‍රශ්නය | 425 |

| | පිට |
|---|---|
| අකාලමරණ ප්‍රශ්නය | 429 |
| චෛත්‍ය ප්‍රාතිහාර්ය ප්‍රශ්නය | 437 |
| නිර්වාණාභව්‍ය ප්‍රශ්නය | 439 |
| නිර්වාණ සාත ප්‍රශ්නය | 442 |
| නිර්වාණ අරූප ප්‍රශ්නය | 444 |
| නිර්වාණ සාක්ෂාත් කරණ ප්‍රශ්නය | 452 |
| නිර්වාණසිද්ධි ප්‍රශ්නය | 456 |

| | |
|---|---|
| මහාඅනුමාන ප්‍රශ්නය | 459 |
| ධුතංගානිසංස ප්‍රශ්නය | 490 |

| | |
|---|---|
| යෝගිකථා ප්‍රශ්නය ප්‍රථම වර්ගය | 513 |
| ,, ද්විතීය වර්ගය | 526 |
| ,, තෘතීය වර්ගය | 535 |
| ,, චතුර්ථ වර්ගය | 550 |
| ,, පඤ්චම වර්ගය | 566 |
| ,, සවන වර්ගය | 575 |
| ඉස්සාස ප්‍රශ්නය | 584 |
| නිගමනය | 591 |
| ගැටපද විවරණය | 595 |


*Non-Commercial Distribution*

## සිතියම් සහිත

# මිලින්ද ප්‍රශ්නය

**නමො තසස භගවතො අරහතො සමමාසමබුදධසස**

ශ්‍රී සද්ධර්මවරචක්‍රවර්ති වූ අප තිලෝගුරු භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධසර්වඥරාජොත්තමයානන් වහන්සේ සකල සත්වයන් කෙරෙහි පතළා වූ මහාකරුණාවෙන් සාරාසංඛ්‍යකල්ප ලක්ෂයක් මුළුල්ලෙහි සමත්‍රිංශත්පාරමීධර්මයන් පූරණය කොට වජ්‍රාසනා-රූඪ ව වැඩ හිඳ පස්මරුන් පරාජය කොට ලොවුතුරා බුදු ව පන්සාළිස් හවුරුද්දක් මුළුල්ලෙහි කළ මනා සියලු ම බුද්ධකෘත්‍යයන් කොට නිමවා අශීතිවර්ෂයෙහි **වෙසග** පුර **විසා** නැකත ලත් **අඟහරුවාද** දවස් **කුසිනාරා** නුවර **මල්ලරජුන්ගේ** ශාලවනොද්‍යානයෙහි වූ පිරිනිවන්මඤ්චකයෙහි වැඩ හිඳ, මතු පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි පවත්නා බුද්ධශාසනය බලා වදරා සකලශාසනාභිවෘද්ධිවර්ධනය පිණිස ලොව පහළ වන **මොග්ගලි පුත්තතිස්සත්ථෙර, මහාමහින්දදි** යතීන්ද්‍රයන් හා **ධර්මාශොක, තිෂ්‍ය, දුටුගැමුණු** ආදි වූ නරෙන්ද්‍රයන් ද දක වදළ පරිද්දෙන් ම,

''මෙතැන් පටන් පන්සියයක් හවුරුදු අතික්‍රාන්ත වූ කල වජ්‍රොපම වූ තීක්ෂණ නුවණින් යුත් **මිලිඳු** නම් රජෙක් වෙයි. එදවස් සංස්කාර[1] විකාර ලක්ෂණ නිර්වාණ ප්‍රඥප්ති යන බුද්ධවිෂය වූ පඤ්චවිධඥෙයමණ්ඩලයෙහි අනුත්තරත්වය දැනීමෙන් හා දිව්‍යචක්ෂුරභිඥානය, දිව්‍යශ්‍රොත්‍රඥානය, පූර්වෙනිවාසානුස්මෘතිඥානය, පරචිත්තවිජානනඥානය, ඍද්ධිප්‍රභෙදගත ඥානය, ආශ්‍රවක්ෂයකරඥානය යන ෂඩභිඥලාභිත්වයෙන් හා (යුක්ත), අර්ථ ධර්ම නිරුක්ති ප්‍රතිභාන යන සිවුපිළිසිඹියායෙහි නො පැකිල පවත්නා ප්‍රඥාවාක්පටුත්වයක් ඇති ප්‍රඥාසෙනාධිපති වූ **නාගසෙන** නම් තෙරණු කෙනෙක් වෙති. ඔහු දෙදෙන මා විසින් යම් ධර්මවිනයයක් සූක්ෂ්ම කොට දෙශනා කරණ ලද ද, ඒ ධර්මවිනය ප්‍රශ්න ඇසීම් විසඳීම් උපමාදර්ශන යුක්ති වශයෙන් ගෙණ ඇර දක්වා නිර්ජට නිර්ගුම්බ කොට අර්ථ විභජනය කෙරෙති'' යි. කියා දක වදරණ ලද්ද වූ ඒ **මිලිඳු** නම් මහරජානෝ සකල නගරාංගශ්‍රී සමෘද්ධියෙන් උතුම් වූ **සාගල** නම් පුරයෙහි දී මහාසමුද්‍රය කරා **(2)** පැමිණි **ගංගා** නම් නදිය යම් සේ ද, එපරිද්දෙන් **නාගසෙන** ස්ථවිරයන් වහන්සේ කරා පැමිණියාහ.

---

1. සර්වසංස්කාර

*Non-Commercial Distribution*

ඒ මිලිඳු මහරජානෝ මොහාන්ධකාරය දුරු කරන්නා වූ ප්‍රඥ නැමැති ගිනිසුළ දරන්නා වූ විශෙෂවිචිත්‍රධර්මකථා ඇති **නාගසෙන** ස්ථවිරයන් වහන්සේ කරා පැමිණ අතිසූක්ෂ්මස්ථානාස්ථානගත වූ අනෙකප්‍රකාර වූ ප්‍රශ්නයන් විචාළහ. ඒ ගම්භීරාර්ථයෙන් යුක්ත වූ හෘදයංගම වූ කර්ණරසායන වූ ලොමහර්ෂණය කරන්නා වූ අද්භූත වූ අභිධර්මවිනය දෙක්හි බැස ගැන්ම ඇත්තා වූ සකවාද පරවාදදී දහසක් සූත්‍රසමූහයෙන් නිමියා වූ මහරජහු විචාළ ප්‍රශ්නකථාවෝ ද **නාගසෙන** ස්ථවිරයන් වහන්සේගේ විසඳීම් කථාවෝ ද යන මේ පෘච්ඡා-විසර්ජනද්වයෙන් යුක්ත වූ උපමා විසින් නය විසින් කියන ලද්ද වූ **නාගසෙනකථා** තොමෝ ඉතා විචිත්‍ර මැ යි. එබැවින් ඒ විසිතුරු ප්‍රශ්නකථාවෙහි ප්‍රඥව පිහිටුවා චිත්තසන්තානය ප්‍රසන්න කොට ගෙණ කාංක්ෂාස්ථානයන් ප්‍රදලනය කරන්නා වූ අති සූක්ෂ්ම වූ ප්‍රශ්නයන් ශ්‍රවණය කළ මැනැව. සිත්හි සකසා ධාරණය කට යුත්තේ ය. එයින් කිහ:—

> **“මිලින්දො නාම සො රාජා සාගලායං පුරුත්තමෙ,**
> **උපගඤ්ඡි නාගසේනං ගඞ්ගාව යථ සාගරං**
> **ආසජ්ජ රාජා චිත්‍රකථිං උක්කාධාරං තමොනුදං,**
> **අපුච්ඡි නිපුණෙ පඤ්හෙ ඨානාඨානගතෙ පුථූ.**
> **පුච්ඡාවිස්සජ්ජනා චෙව ගම්භීරත්ථූපනිස්සිතා,**
> **හදයඞ්ගමා කණ්ණසුඛා අබ්භුතා ලොමහංසනා.**
> **අභිධම්මවිනයොගාළ්හා සුත්තජාලසමත්ථිතා,**
> **නාගසේනකථා චිත්‍රා ඔපම්මෙහි නයෙහි ච.**
> **තත්ථ ඤාණං පණීධාය හාසයිත්වාන මානසං,**
> **සුණොථ නිපුණෙ පඤ්හෙ කඞ්ඛාඨාන විදාලනෙ”යි.**

ඒ ප්‍රශ්නකථාව යම් පරිද්දෙකින් පාලික්‍රමය නො වරදවා විස්තර වශයෙන් අසනු ලැබේ ද, එපරිද්දෙන් දක්වනු ලැබේ.

**යොනක** නම් දෙශයෙහි නදීපර්වතයෙන් ශොභමාන වූ රමණීය භූමිප්‍රදේශයන්ගේ විභාග ඇති, ආරාමොද්‍යානොපවනවාපිපුෂ්කරණියෙන් යුක්ත වූ, ශිශිරජලධාරානදීපර්වතාරණ්‍යයෙන් සිත්කලු වූ, නගරකාරකශාස්ත්‍ර දන්නා බහුශ්‍රැතයන් විසින් නිර්මිත කරණ ලද්ද වූ, නසන ලද ප්‍රතිපක්ෂපසමිතුරන් ඇති, පරශත්‍රැපීඩාවක් නැත්තා වූ, විවිධ විචිත්‍රදෘඪඅට්ටාලවාසල්දෙරටු ඇති, ප්‍රවර ඉතා මහත් වාසල් හා තොරන් ඇති, ගම්භිර වූ දියඅගලින් හා ශ්වෙතවර්ණප්‍රාකාරපංක්තියෙන් වට කරණ ලද අන්තඃපුර ඇති, මනා කොට බෙද කරණ ලද වීථි සතරමංසන්ධි චතුෂ්කොණවීථි හා ත්‍රිකොණවීථි ඇති, මනා ව සදන ලද අනෙකප්‍රකාරවර භාණ්ඩපරිපූරිත අතුරුසල්පිල් ඇති, අනෙකප්‍රකාර දනශාලා සියගණනින් ශොභමාන වූ, **හිමගිරිශිඛරයාගේ** සුවාසූදහසක් පර්වතකූටයන් වැනි වරභවනශතසහස්‍රයෙන් ප්‍රතිමණ්ඩිත වූ, හස්ත්‍යශ්වරථපත්ති යන චතුරංගිණි

*Non-Commercial Distribution*

සෙනාවෙන් **(3)** සමාකුල වූ, රූපකල්‍යාණාදි වූ සර්වලක්ෂණසම්පන්න ස්ත්‍රීපුරුෂ සමූහයා විසින් හැසිරෙණ ලද්ද වූ, ආකීර්ණ වූ මානුසික ජනයන් ඇත්තා වූ, ප්‍රචුර වූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍රයන් ඇති, අනෙකප්‍රකාර ශ්‍රමණබ්‍රාහ්මණයන්ගෙන් හා සභ්‍යජනයන්ගෙන් ඝට්ටිත වූ, අනෙකප්‍රකාරවිද්‍යාවත් නරවීරයන් විසින් සෙවනය කරණ ලද්ද වූ, කාසිකකොටුම්බරාදි නානාදෙශානීත අනෙකප්‍රකාරවස්ත්‍රාපණයෙන් සම්පූර්ණ වූ, මනා ව ප්‍රසාරිත යහපත් බොහෝ පුෂ්පගන්ධාපණගන්ධ-යෙන් සුගන්ධිත වූ, සකලජනයන් විසින් ප්‍රාර්ථනීය වූ බොහෝ රත්න ජාතීන් පිරී තිබෙන්නා වූ චතුර්දිශාභිමුඛ කොට මනා ව සදන ලද සල්පිල් ඇති, පවිත්‍රශිලී වූ කක්ෂපුටවණිග්ජනසමූහයා විසින් නිති හැසිරෙණ ලද්ද වූ, මාසකරජතස්වර්ණලොහශිලා යන පඤ්චප්‍රකාර වූ වස්තුවෙන් සම්පූර්ණ වූ, මහත් සාරධන නිධානගත ව බබළන්නා වූ ගෘහපංක්ති ඇති, බොහෝ ධනධාන්‍යද්‍රව්‍යොපකරණයන් ඇත්තා වූ, සම්පූර්ණ වූ ස්වර්ණභාණ්ඩාගාරයන් ඇති, බොහෝ වූ ආහාරපානවර්ගයන් ඇත්තා වූ අනෙකප්‍රකාර වූ ඛාද්‍යභොජ්‍යලෙය්‍යපෙය්‍යසායනීයයන් ඇති, **උතුරුකුරු** දිවයින සෙයින් යහපත් ශස්‍යයන් ඇති, නානා දෙශවාසිවණිග්ජනයන්ගේ වස්තුපුටයන් භෙදනය කරන්නා වූ, **වෛශ්‍රවණ** නම් දිව්‍යරාජයාගේ **ආලකමන්ද** නම් දිව්‍යපුරය වැනි වූ, **යොනකයන්ගේ** **සාගලපුර** නම් නුවරෙක් ඇත.

ඒ **සාගලපුර** නම් නගරප්‍රවරයෙහි සිට මුළුසක්වළ නියපිටින් ගණුත් සමර්ථ වූ, හිරුසඳු දෙඅතින් වසා ගණුත් සමර්ථ වූ, **මහකෙලනාගරාජයා** විජිනිපත්‍රය කොට ගණුත් සමර්ථ වූ මහරහතන් වහන්සේ විසින් ඒ **මිලිඳු** **නාගසෙන** යන ප්‍රඥාසාගරයන් දෙදෙනාගේ පූර්වයොගය හා සර්වඥ විෂයානුකූල කොට විසඳූ ප්‍රශ්නකථාව නො පිරිහෙළා ප්‍රකරණාරූඪ කොට තබන ලද්දේ ය. අපි මෙ තැන්හි අනන්තසර්වඥශාසනප්‍රතිෂ්ඨා ධාරභූත වූ, **ශ්‍රීලංකාද්වීප**මධ්‍යයෙහි සමස්තරිපුඅවිලංඝනීය වූ, නදීපර්වත ශෛලකන්දරවනගහනයෙන් සුරක්ෂිත වූ පරික්ෂෙප ඇති, අසුරසංග්‍රාම-යෙහි දු නො පසුබස්නා ක්‍රූරතරසංග්‍රාමාවරයන් හා හස්ත්‍යශ්වරථ පත්ති යන චතුරංගසෙනාසමෘද්ධි ඇති, අනෙක රජතස්වර්ණවස්ත්‍රා භරණ හා නානාදෙශාගත අනෙකවස්ත්‍රපුටයන් මුඤ්චනයෙන් ඝිඤ්චනය කොට ක්‍රයවික්‍රය කරණ නොයෙක් සල්පිල් ඇති, මනොහර සුරහනන් හා සදෘශ නරහනන් හා නොයෙක් සුලභාන්නපානාදී ඛාද්‍ය විකෘති ඇති, අනෙකරාජකෘත්‍යසංවිධානයෙහි දක්ෂවිචක්ෂණ **අංගම්මනාඛ්‍ය** ග්‍රාමවරාභිජාත **දිවාකරවික්‍රමසිංහරාජපක්ෂාවරනාමධෙයයක්** ඇති අග්‍රසෙනාධිපතීන් හා නොයෙක් අමාත්‍යරත්න ඇති, සර්වශාස්ත්‍රාර්ණව පාරගත ගරුතර **අන්තරග්‍රාම** නිවාසී **භණ්ඩාර** **රාජගුරුවිද්‍යාරත්න** පණ්ඩිතාචාර්යොත්තමයානන් හා ජ්‍යොතිර්ඥගණකාදි නොයෙක් විද්වජ්ජනයන් ඇති, ප්‍රවරසුන්දරාතිගම්භීරධීරසාරගුණයෙන් යුක්ත වූ පෘථිවීශ්වරද්‍රුමෙන්ද්‍රරාජයා සරා සිටි ස්වර්ණාංකුරද්වයයක් හා සාදෘශ්‍ය වූ

*Non-Commercial Distribution*

සර්වලොකශාසනාධාරභූත වූ යුවරාජොත්තමශ්‍රීශොභා ඇති, අමරමන්දිර ප්‍රතිභාගවරභවන ශතසහස්‍රයෙන් (4) සැදුම්ලත් **විජයොත්ප්‍රාසාදය** වැනි **ශ්‍රීදන්තධාතුමන්දිරයෙන්** ශොභමාන වූ, සකලනගරාංගශ්‍රීසමෘද්ධි සම්පන්න **ශ්‍රීවර්ධනපුරයට** ආසන්නයෙහි වූ **ඉන්ද්‍රොපෙන්ද්‍රහිරණ්‍යගර්භ**ප්‍රභෘති–ෙනෙක සුරාසුරනිෂෙවිතසකලශාසනශ්‍රීභාරධාරි**ශරණංකරාභිධානසංඝරාජ** ධුරන්ධරොත්තමයානන් වහන්සේ ප්‍රමුඛ වූ නවාංගශාස්තෘශාසන ප්‍රගුණධාරණවිවරණවිභජනඋත්තානීකරණයෙහි විශදඥනගති ඇති **දරම්පිටිපළ ධර්මරක්ෂිත** මහානායකස්ථවිරයන් හා **මධුරසතීර්ථග්‍රාම** නිවාසි **ධම්මක්ඛන්ධාභිධාන** අනුනායකස්ථවිරයන් හා පිටකත්‍රයධාරී වූ නොයෙක් යතීශ්වරයන්හට ද නිවාසස්ථාන වූ **පොෂථාරාමමහාවිහාර**යෙහි සිට ඒ පූර්වප්‍රශ්නකථාව සිහල බසින් අර්ථවිවරණය කරම්හ. කාගෙ ආරාධනායෙන් කරණු ලැබේ ද? යත්:—

**මහාසම්මතපරම්පරානුයාතශුද්ධසූර්යවංශාභිජාතපරමබොධිසත්වාතාර** සමස්තගුණගණාභරණවිභූෂිත වූ **කීර්තිශ්‍රීරාජසිංහ** භූපාලොත්තමයානො[1] ශ්‍රීශුද්ධ බුද්ධවර්ෂයෙන් දෙදස් දෙසිය අනුවැනි වර්ෂයෙහි රාජ්‍යශ්‍රී පදප්‍රාප්ත ව දශරාජධර්මයෙන් රාජ්‍යය[2] කෙරෙමින් පරමබෞද්ධාගමධාරි ගෘහස්ථප්‍රව්‍රජිතසජ්ජනයන්ගෙන් අමෘතශ්‍රීප්‍රදයක වූ සුගතාගම අසා ප්‍රසන්න ව 'සර්වඥශාසනාභිවෘද්ධිවර්ධනය කෙරෙමි' යි යන කරුණාද්-ධ්‍යාශයයෙන් මනොහර වෛඩූර්‍යමුක්තාමාණික්‍යාදී වරධන සහිත මහාමාත්‍යයන් දෙශාන්තරයෙහි යවා **උපාලිස්ථවිර** ප්‍රමුඛ වූ අතිරෙක දශවර්ගිකමහාසංඝයා **සියාම්දෙශයෙන්** ගෙන්වා අනන්තපූජොත්සව පවත්වා **ලක්දිව්වැසි** සියදහස්ගණන් මහණපැවිදි උපසම්පද කරවා සකල **ලංකාද්වීපයෙහි** සමස්තාරිෂ්ටපාපාන්ධකාරය විධ්වංසනය කෙරමින් ජිනශාසන[3] ප්‍රදීපය දීප්තිමත් කොට පිටකත්‍රයධාරී මහාසංඝයා ලවා බුද්ධ වචනය හදරවා ශ්‍රවණ ප්‍රගුණධාරණයෙන් බහුශ්‍රැත ව(?) සර්වඥරාජොත්-තමයානන් වහන්සේගේ ශීලසමාධිප්‍රඥවිමුක්තිවිමුක්තිඥනදර්ශනාදි අරූපකායදර්ශනයෙහි ආදසතලයක් හා සදෘශ වූ සූන්දරතරධර්මකථා ඇති **මිලින්දප්‍රශ්නය** නම් පාලිප්‍රකරණයක් ඇසුම් ගෙණ අනාගතයෙහි පහළ වන රාජරාජමහාමාත්‍යාදීන්ගේ ශ්‍රද්ධාප්‍රඥ දෙක විශද කරවනු පිණිස දුරනුබොධ වූ පාලිභාෂාව පෙරළා **හෙලදිව්බසින්** අර්ථවිවරණය කරණු කැමැත්තෝ වූහ.[4] ලොකශාසනාධාර, නෛකරාජෙභකුම්භ ප්‍රදලනෛකකණ්ඨීරවෙන්ද්‍රශ්‍රීමත් මෙම **කීර්තිශ්‍රීරාජසිංහ** පෘථිවීශ්වර නරෙන්ද්‍රොත්තමයානන්ගේ ආරාධනාවෙන් අර්ථ විවරණය කරණු ලැබේ. ඒ ශ්‍රොතෘජනමනඃප්‍රසාදජනක වූ ධර්ම කථාවෙන් **මිලිඳු නාගසෙන** යන දෙදෙනාගේ පූර්වකුශලකර්මය හා ප්‍රශ්නකථාව ෂට්ප්‍රකාරයකට බෙද කිය යුතු යි. හේ මෙ සේ මැ යි:— පූර්වයොගය, මිලිඳුපැනය, ලක්ෂණප්‍රශ්නය, මෙණ්ඩකප්‍රශ්නය, අනුමානප්‍රශ්නය, ඖපම්මකථා ප්‍රශ්නය යි. එහි මිලිඳු පැන 'ලක්ෂණප්‍රශ්නය, විමතිච්ඡෙදනප්‍රශ්නය' යි

1. භූපාලොත්තමයානන් 2. රාජ්‍යශ්‍රී 3. ජිනානුශාසන 4. කැමැත්තා වූ

Non-Commercial Distribution

කියා විවිධ වේ. මෙණ්ඩකප්‍රශ්නය ද 'මහාවර්ගය, යොගිකථාප්‍රශ්නය' යි කියා විවිධ වේ. 'පූර්වයොගය' යන්නෙන් ඔවුන්ගේ පෙර කළ කුශල කර්මය කියන ලදී. කේ කෙසේ ද යත්?:—

**(5)** යට ගිය දවස **කාශ්‍යප** නම් භාග්‍යවත් බුදුරජානන්වහන්සේගේ බුද්ධශාසනය පවත්නා කල්හි ගංගාවක් සමීපයෙහි එක් මහාවිහාරයෙක් වූයේ ය. ඒ විහාරයෙහි බොහෝ භික්ෂුසංඝයා වහන්සේ වැඩ වසනසේක. ඒ වෙහෙර වසන වත්පිළිවෙත් පුරණ ශීලාචාරාදිගුණසම්පන්නභික්ෂූන් වහන්සේලා උදය නැගී සිට කුරු මුසුන් ගෙණ බුදුගුණ ආවර්ජනා කෙරෙමින් මළුව හැමද කැලි කසළ එකතු කෙරෙති. ඉක්බිති එක් භික්ෂු කෙනකුන් වහන්සේ එක් සාමණේරනමකට කියන සේක් ''එම්බා සාමණේරය, මෙසේ අව මැනැව. මේ හැමදපු කැලිකසළ දමව'' යි කී සේක. ඒ සාමණේරයෝ එබස් නො ඇසූ කෙනෙකුන් සේ යනසේක. ඒ තෙරුන්වහන්සේ දෙවෙනි තුන්වැනිවත් 'කුණු දමව' යි කිය දී ත් නො ඇසූකන් ව යනසේක් ම ය. එසේ හෙයින් ඒ භික්ෂූන්වහන්සේ 'මේ නො කීකරු සාමණේරකෙනෙකැ'යි කිපී හික්මවනු පිණිස මුසුන්මිටින් පහරක් දුන්සේක. පහර කෑ ඉක්බිති හයින් තැති ගෙණ ඒ හෙරණුන්දෑ හඬහඬා කීකරුතැනක් සේ කුණු ලහට ගොස් උක්කුටිකයෙන් හිඳ කරකැවී පහර දුන් තැනැත්තන් වහන්සේගේ මුහුණ යටැසින් බලබලා කුණුගොඩ උකා ගෙණ ගොස් බැහැර දමමින් පතනසේක් ''මේ කුණු දැමුවා වූ කුශලකර්මයෙන් යම් තාක් මම නිවණට පැමිණෙම් ද, ඒ තාක් කල් මේ අතරතුරෙහි උපනුපන් ජාතියෙහි මධ්‍යාහ්නසූර්යමණ්ඩලය මෙන් මහෙශාඛ්‍ය වෙම්ව යි, මහත් වූ තෙජස් ඇති වෙම්ව'' යි කියා පළමු වන ප්‍රාර්ථනාව පැතූසේක. කුණු දමා පැන් නාන පිණිස ගංතොටට ගොස් ගංගාවෙහි ගර්ගර යන[1] අනුකරණය පවත්වන්නාවූ[2] රළවේගය දැක නැවත පතනසේක් ''යම් තාක් මම නිර්වාණයට පැමිණෙම් ද, ඒ තාක් කල් මේ අතරතුරෙහි උපනුපන් තැන මේ ක්ෂය නො වන රළවේගය මෙන් ක්ෂය නො වන්නා වූ ස්ථානොත්පත්තිකප්‍රඥා ඇති වෙම්ව යි, ක්ෂය නො වන්නා වූ ප්‍රඥාව ඇති වෙම්ව'' යි කියා දෙවනුවත් ප්‍රාර්ථනා කළසේක. මෙසේ සසංස්කාරිකකුශලචිත්තයෙන් ප්‍රාර්ථනා කොට උන් කල්හි මළුව හැමදි ඒ භික්ෂූන් වහන්සේ ද මුස්න මුසුන්හල තබා ජලස්නානය පිණිස ගංතොටට යනසේක් සාමණේරයන්දෑගේ ප්‍රාර්ථනාව අසා, ''මේ සාමණේර තෙම මා විසින් ප්‍රයොග කරණ ලදු ව කුණු දැමූ පමණෙකින් මෙසේ ප්‍රාර්ථනා කෙරෙයි. කුණු දැම්මෙව්වා වූ මට කුමක් සිද්ධ නො වේ දැ'' යි සිතා උන්වහන්සේත් ප්‍රාර්ථනා කරණ සේක් ''යම් තාක් මම නිර්වාණයට පැමිණෙම් ද, ඒ තාක් කල් අතරතුරෙහි උපනුපන් තන්හි මේ ගඟ[3] රළ වේගය මෙන් ක්ෂය නො වන්නා වූ අප්‍රමාණ වූ ප්‍රඥාවෙන් යුක්ත වෙම්ව යි. මොහු විසින් විචාළ විචාළ සියලු ම ප්‍රශ්නකථාවන් නිරවුල් කරන්ට— වෙළුම් හරණට—සමර්ථ වෙම්ව'' යි කියා ප්‍රාර්ථනා කළසේක.

1. ගර්ගරාවය, 'ඌමිවෙගං ගග්ගරායමානං' - පාළි 2. පවත්නා වූ 3. ගංගා

*Non-Commercial Distribution*

මෙසේ ප්‍රාර්ථනා කළා වූ ඒ භික්ෂු සාමණෙර දෙදෙනා වහන්සේ දිව්‍යලොකයෙහි ද මනුෂ්‍යලොකයෙහි ද සැරිසරන්නාහු එක් බුද්ධාන්තරයක් ගෙවූහ[1]. නැවත ඔවුන් දෙදෙනා වහන්සේගෙන් සාමණෙරතෙම ජම්බුද්වීපයෙහි යොන්රට **සාගල** නම් නුවර **මිලිඳු** නම් **(6)** රජ වී ය. ඒ රජතෙම ඉතා පණ්ඩිත ය. ව්‍යක්ත ය. ප්‍රඥාවත් ය. සියලු කටයුත්තෙහි දක්ෂ ය. අතීතානාගතවර්තමාන වූ ස්වකීය මන්ත්‍රණයොගවිධානක්‍රියාවන් කරණ කල්හි පරීක්ෂා කොට ම කරණසුලු ය. එතෙකුත් නො වෙයි. ඒ රජහු විසින් බොහෝ වූ ශිල්පශාස්ත්‍රයෝ උගන්නා ලද්දහු වෙති. හේ කවර ශාස්ත්‍රයෙක් ද? යත්:— වෙදශාස්ත්‍රය, ස්මෘතිශාස්ත්‍රය, ගණනය, කාමශාස්ත්‍රය, නීතිශාස්ත්‍රය, වෛශෙෂිකය, ගණිතය, ගාන්ධර්වය, වෛද්‍යකය, චතුර්වේදය, පුරාණය, ඉතිහාසය, ජ්‍යොතිර්ඥනය, ඉන්ද්‍රජාලය, හෙතුය, මන්ත්‍රණය, යුද්ධය, ඡන්දෙලක්ෂණය, ඇඟිල්ලෙන් ඇල්වීමය (?) යන අද්‍යශ්‍යාංජනාදිවංවාශාස්ත්‍රයන්හි හා එකුන්විසි ශාස්ත්‍ර වචනයකින් වාදරොපණය කරණ එකුන්විසිවාදීන් විසින් ඉක්මවිය නො හැකි වූයේ ය. නො ඉවසිය හැකි තෙජස් ඇති වූයේ ය. බොහෝ වූ නොයෙක් තීර්ථකයන්ට අග්‍රය යි කියනු ලැබෙයි. සියලු ජම්බුද්වීපයෙහි **මිලිඳු**රජහු හා සදෘශ වූ බලයෙන්[2] ජවයෙන් ශූරභාවයෙන් ප්‍රඥවෙන් කිසිවෙක් නො ම ඇති වී ය. සකලසම්පත්තියෙන් ආඪ්‍ය වි ය. මහත් ධන ඇත්තේ ය. අනන්ත වූ බාලවාහන ඇත්තේ යි.

මෙසේ අපමණ වූ ශ්‍රීසමෘද්ධියෙන් රාජ්‍යය[3] කරණ **මිලිඳු** මහරජානන් එක් දවසක් අනන්තබලවාහනයෙන් යුත් චතුරංගිණී සෙනාව ගණන් බලා සෙනාසන්නිපාතය දක්නා කැමැති ව නුවරින් නික්ම ගොස් නුවරින් පිටත මහළුලිකතරක දී සෙනාව ගණන් කරවා, කථාවාදයෙන් වාද කරන්නා වූ ලොකායතවිතණ්ඩශාස්ත්‍ර ජනසල්ලාපප්‍රවෘත්ති ඇති, කොතුහල නම් විපරීතදෘෂ්ටියෙන් යුක්ත වූ ඒ **මිලිඳු** නම් මහරජතෙම සූර්යදෙවියා බලා ඉතා දහවල් බැවින් අමාත්‍යයන්ට ආමන්ත්‍රණය කොට, ‘‘සගයෙනි, සවස්වන්ට තව බොහෝ වේලා ය. දූන් ම නුවරට ගොස් කුමක් කරමෝ ද? මා හා සමග කථා කරන්ට හැකිවූ, මාගේ කාංක්ෂා දුරු කරන්ට සමර්ථ වූ, සංඝසමූහයන් ඇති, ගණපිරිස් ඇති, ගණාචාර්ය වූ, නොහොත් රහත්ඵලය සම්‍යක්සම්බුද්ධත්වය ලොවට හඟවා වසන්නා වූ, යම්කිසි පණ්ඩිත වූ ශ්‍රමණකෙනෙක් හෝ බ්‍රාහ්මණකෙනෙක් හෝ ඇද්ද?’’ යි විචාළේ ය. මෙසේ කී කල පන්සීයක් යොන්ඇමැතියෝ **මිලිඳු** නම් රජහට මෙපවත් දූන්වූහ:— ‘‘දෙවයන් වහන්ස, මෙලොව බුදුකම් කරණ ශාස්තෘහු සදෙනෙක් ඇත. **පූරණ කාශ්‍යප ය, මක්ඛලිගොසාල ය, නිගණ්ඨනාතපුත්‍ර ය, සංජයබෙල්ලට්ඨිපුත්‍ර ය, අජිතකෙසකම්බල ය, කකුදකාත්‍යායනය** යන ඒ සදෙනා වහන්සේ සංඝප්‍රධානසේක. ගණ ප්‍රධානසේක. ගණාචාර්යසේක. සියල්ල දන්නාසේක. යස පිරිවර

1. ගෙවා 2. යම් මේ බලයෙන් 3. රාජ්‍යශ්‍රී

Non-Commercial Distribution

ඇතිසේක. තීර්ථකසේක. බොහෝ ජනයාට සාධුසම්මත වූ සිද්ධස්ථානයන් වැනිසේක. දේවයන් වහන්ස, නුඹවහන්සේ වැඩක් කැමැති සේක් වී නම් ඒ ශාස්තෲන් කරා වැඩ වදළ මැනැව. ඔවුන්ගෙන් ප්‍රශ්න අසා වදළ මැනැව. කාංක්ෂාවන් දුරු කොට ගත මැනැවැ'' යි දැන්වූහ.

මෙසේ කී ඉක්බිත්තෙන් ඒ මිලිඳු රජ්ජුරුවෝ පන්සියක් යොන් ඇමැතියන් විසින් පිරිවරණ ලදු ව අසුන් යෙදූ උතුම් රථවාහනයකට පැන නැඟී **පූරණකාශ්‍යපයා** යම් තැනෙක්හි ද, එතැනට ගියහ. ගොස් පූරණකාශ්‍යපයා (7) හා සමග සතුටු ව නැවත නැවැතත් සමගි සතුටු විය යුතු වූ නැවැත නැවැතත් සිහි කට යුතු වූ කථාසල්ලාපයන් කොට නිමවා එකත්පසෙක සිටියාහ. එකත්පස් ව උන්නා වූ මිලිඳු රජ්ජුරුවෝ පූරණකාශ්‍යපයා හට මෙසේ කීහ:— ''ස්වාමීනි, කාශ්‍යපයානන් වහන්ස, මේ ලොකය කවරෙක් රක්ෂා කෙරේ ද?'' යි විචාළහ. ''මහරජානෙනි, මෙ සත්ව ලොකයා මහාපෘථිවිය රක්ෂා කරන්නේ ය'' යි කී ය. ''එසේ වී නම්, ස්වාමීනි, කාශ්‍යපයානන් වහන්ස, මහාපෘථිවිය සත්වලොකයා රකී නම්, නැවැත කුමක් නිසා අවීචිමහානරකයට යන්නා වූ සත්වයෝ පොළොව ඉක්ම යන්නාහු ද? සමහර කෙනෙක් පොළොව පළාගෙණත් යන්නාහු ය. පොළොව සතුන් රකී නම්, අවීචියට යන්නාවුන් නො රක්නේ කුමක් නිසා ද?''යි විචාළහ. මෙසේ මිලිඳු මහාරජානන් කී කල **පූරණකාශ්‍යප** නම් බුදුබැව්සොරාතෝ පිටිකර පහරක් කැවා සේ ඇස් උඩ ඉඳුවා ගෙණ උගුරෙහි ගත් රළු කැවිල්ලක් සේ ගිලපියන්ටත් නො හැකි වූහ.[1] වමාරන්ටත් නො හැකි වූහ.[1] පක්ෂ බිඳුනු පක්ෂියකු සේ පත්තක්ඛන්ධ ව දන්නා බණක් නැති බැවින් තුෂ්ණීම්භූත ව තමහට ම නින්ද බෙණෙමින් අවිද්‍යාධ්‍යානයට සමවැදුනාක් මෙන් කර බා ගෙණ හුන්නාහ. ඒ විකාරය දුටුවා වූ මිලිඳු මහරජානෝ ''අනේ! මොහු දන්නා බණෙක් නැත. ලොව රවටන මහසොරෙකැ'' යි මහාකොපී ව පලා ගියහ.

නැවැතත් මිලිඳුමහරජානෝ **මක්ඛලිගොසාලයන්** කරා ගොස් පන්සියයක් ඇමැතියන් සමග එකත්පසෙක හිඳ ආදර දක්වා **මක්ඛලිගොසාලයා** හට මෙ මතු කියන ප්‍රශ්නකථාව කීහ:— ''ස්වාමීනි, මක්ඛලිගොසාලයෙනි, කුශලාකුශලකර්මයෝ නම් ඇති දෙයෙක් ද? සුචරිත දුශ්චරිත කර්මයන්ගේ ඵලවිපාකයෙක් ඇද්ද?'' යි විචාළහ. එකල මක්ඛලිගොසාලතෙම තමාගේ අඥනතායෙහි මහත්ත්වය හඟවන්නා සේ [2]ගර්විත ව කියනුයේ ''මහරජානෙනි, කුමක් කියනනියා ද? කුශලාකුශල කර්මයෝ නම් නැත. සුකෘතදුෂ්කෘතකර්මයන්ගේ ඉෂ්ටානිෂ්ටඵලවිපාකයෙක් නම් නැත. මහරජානෙනි, මේ ලොකයෙහි යම් කෙනෙක් රජ වූවාහු ද, ඔහු නැවැතත් පරලොවට ගොසිනුත් රජ ම වෙති. යම් කෙනෙක් බ්‍රාහ්මණ වූවාහු ද, වෙළෙඳ වූවාහු ද, ගොවි වූවාහු ද, චණ්ඩාල වූවාහු ද, මල්පර (?) ආදී කුණු දමන්නාහු ද, ඔහු නැවැත පරලොවට ගොසිනුත්

1. වී ය. 2. ගර්හිත

Non-Commercial Distribution

බ්‍රාහ්මණවෙළෙඳගොවිචණ්ඩාලපුක්කුස ව උපදනාහු වෙති. එසේ හෙයින් කුශලාකුශලකර්මයන්ගෙන් කුමන ප්‍රයෝජනයෙක් දැ?'' යි කීයේ ය. මෙසේ මක්ඛලිගොසාලයන් කී බස් අසා මිලිඳු මහරජානෝ කියන්නාහු ''ඉදින්, ස්වාමීනි, මක්ඛලිගොසාලයෙනි, මේ ලොකයෙහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණවෛශ්‍යශුද්‍රචණ්ඩාල පුක්කුසයෝ පරලොවට ගොසිනුත් රජ බමුණු වෙළෙඳගොවිචණ්ඩාල පුක්කුස ව ම උපදනාහු වෙත් නම්, කුශලා-කුශලකර්මයන්ගෙන් කමෙක් නැත. එසේ හෙයින්, ස්වාමීනි, මක්ඛලි ගොසාලයෙනි, යම් කෙනෙක් මේ ලෝකයෙහි දී අත් කපන ලද්දාහු දැ, පරලොවට ගොසිනුත් ඔහු නැවැතත් අත් සිඳිනා ලද්දාහු ම වෙති. යම් කෙනෙක් පා සිඳුනා ලද්දාහු ද, ඔහු පා සිඳුනා ලද්දාහු ම වෙති. යම් කෙනෙක් කන්නාසා සිඳිනා ලද්දාහු ද, ඔහු කන්නාසා සිඳින ලද්දාහු ම වෙති'' යි කීහ. මෙසේ **මිලිඳු** මහරජානන් කීකල්හි **(8) මක්ඛලිගොසාලයා** කිසිවක් කියා ගත නො හී තුෂ්ණීම්භූත ව හුන්නේ ය.

එකල **මිලිඳු**මහරජානෝ කියන්නාහු:— ''එම්බා **මක්ඛලිගොසාල**යෙනි, නුඹ පළමු කොට ම 'මහරජ, ඇසුව මනා ප්‍රශ්නයක් මාගෙන් නො විචාළ කල අනික් කියන්නෝ කවුරු දැ?'' යි මහත් වූ ගර්විතය කෙළේ මේ බණ කියාපියන්ට ද? නුඹගේ ශාස්තෘකමෙහි තත්ත්වය මට හොඳින් ම හැඟින. නුඹගේ තෙල අයා ගත් කටින් කියන බණ නුඹ සේ අඥාන භෞතහීනලාමකයන්ට මුත් අප වැන්නන්ට කියන තරම් බණෙක් නො වෙයි. අහෝ! බඩක් නිසා බොරුවෙන් ලොවක් නසන නියා ය'' යි මහත් කොපි ව හුන් පළින් නැඟිට ඔබමොබ[1] බලන **මිලිඳු**රජහට නැවැත මෙබඳු වූ සිතිවිල්ලක් ව, තමන්ගේ පන්සියයක් පමණ යොන් ඇමැතියන්ට ආමන්ත්‍රණය කොට, **''තුච්ඡො වත භො ජම්බුදීපො පලාපො වත භො ජම්බුදීපො''** යනාදීන් ''එම්බා ඇමැතියෙනි, මේ සියලු දඹදිව මා හා සමග කථා කරන්නට මාගේ කාංක්ෂා විනොදනය කරන්නට සමර්ථ වූ යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නැත. ව්‍යක්තතරපණ්ඩිතයක්හු නැති බැවින් සියලු දඹදිව එකාන්තයෙන් ම සිස් වූයේ ය. 'පින්වත්නි, පණ්ඩිත ගොචර වූ බසක් අසන්නට නැති බැවින් එකාන්තයෙන් ම සියලු දඹදිව බොල් වී ය'' යි කියා සිතා නැවත **මිලිඳු** රජ්ජුරුවෝ අමාත්‍යයන්ට ආමන්ත්‍රණය කොට ''පින්වත්නි, චන්ද්‍රකාන්තියෙන් බබළන්නා වූ රාත්‍රිතොමෝ එකාන්තයෙන් ම සිත්කලු වූවා ය. කිමෙක් ද? අද ප්‍රශ්න අසන්නට ශ්‍රමණයකු කරා හෝ බ්‍රාහ්මණයකු කරා හෝ එළඹෙමු ද? කවරෙක් මා හා සමග කථා කරන්නට කාංක්ෂා දුරු කරන්ට හැකි වේ දැ?'' යි කීහ.

මෙසේ **මිලිඳු** මහරජානන් කී කල අමාත්‍යයෝ තුෂ්ණීම්භූත ව රජ්ජුරුවන්ගේ මුහුණ බලබලා සිටියාහු ය. එවිට මිලිඳු මහරජානෝ සිවුරඟසෙනඟ පිරිවරා රථවාහනයකට පැන නැඟී නුවරට වැඩ තමන්ගේ ඇතුළුමාලිගාවට වන්හ.

1 ඔබිනොබ

Non-Commercial Distribution

එසමයෙහි වනාහි **සාගලපුරනුවර** දෙළොස්අවුරුද්දක් මුළුල්ලෙහි ශ්‍රමණබ්‍රාහ්මණගෘහපතිපණ්ඩිතවරුන්ගෙන් ශූන්‍ය වූයේ ය. යම් තෙනක ශ්‍රමණබ්‍රාහ්මණගෘහපතිපණ්ඩිතවරයෝ වාසය කරන්නාහු ය යි කියා ඇසුයේ වී නම් රජ්ජුරුවෝ එතැනට ගොස් ඔවුන් අතින් ප්‍රශ්න අසන්නාහ. ඒ සියලු පණ්ඩිතවරු ප්‍රශ්න විසඳීමෙන් රජ්ජුරුවන් සිත් ගෙණ ගිවිස්වා ගන්ට නො හැකි වූවාහු ඒ නුවර හැර යම් දිසාභාගයකට හෝ යනු කැමැතියාහු නම් ඒ දිසාභාගයට හෝ යන්නාහු ය. යම් කෙනෙක් අනික් දිසාවකට නො යන්නාහු ද, ඒ සියලුදෙන ම කුමක් වුවත් ඒ නුවර ම තුෂ්ණීම්භූත ව සිටින්නාහු ය. භික්ෂූන් වහන්සේලා බොහෝ සෙයින් **හිමාලයට** ම වඩනාසේක්ලා ය.

එසමයෙහි වනාහි සියක්කොටියක් රහතන් වහන්සේ හිමාලයෙහි **රක්ඛිතතල** නම් පර්වතයෙහි වසනසේක. ඉක්බිති ආයුෂ්මත් වූ **අස්සගුත්ත** නම් මහතෙරුන් වහන්සේ ''තුච්ඡො වත භො ජම්බුදීපො'' යනාදීන් කියන්නා වූ **මිලිඳුමහරජ්ජුරුවන්ගේ** වචනය දිව්‍යශ්‍රොත්‍රධාතුවෙන් අසා **යුගන්ධරපර්වත** මුදුනට භික්ෂුසංඝයා රැස් (9) කරවා ''ඇවැත්නි, මිලිඳු රජ්ජුරුවන් සමග කථා කරන්ට, කාංක්ෂාවිනොදනය කරන්නට බල ඇති කිසි භික්ෂුනමක් මේ මැද ඇද්ද?'' යි කියා කෙළසියයක් භික්ෂූන් ගෙන් විචාළසේක. මෙසේ විචාළ කල සියක්කොටියක් පමණ මහ රහතුන් වහන්සේ කිසිවක් නො වදරා වැඩ හුන්සේක. දෙවෙනි වත් තුන්වැනි වත් විචාළ දීත් තුෂ්ණීම්භූත වූවාහු ය. ඉක්බිති ආයුෂ්මත් වූ අස්සගුත්තමහතෙරුන් වහන්සේ භික්ෂුසංඝයාට මෙසේ කීසේක:— ''ඇවැත්නි, **තවුතිසා භවනයෙහි වෛජයන්තප්‍රාසාදයට** පූර්වදිග්භාගයෙන් කෙතුමතී නම් විමානයෙක් ඇත. ඒ විමානයෙහි **මහාසෙන** නම් දිව්‍ය පුත්‍රයෙක් වෙසෙයි. හෙතෙම ඒ මිලිඳුරජ්ජුරුවන් හා සමඟ කථා කරන්නට ද, කාංක්ෂා විනොදනය කරන්නට ද, පූර්වවාසනාබලයෙන් සමර්ථ වන්නේ ය'' යි වදළසේක.

ඉක්බිති ඒ ඇසූ කෙළසියයක් රහතුන් වහන්සේ **යුගන්ධර පර්වත** යෙන් අන්තර්ධාන ව **ශක්‍රභවනයෙහි** පහළ ව පෙළ සැදී වඩනට පටන් ගත්සේක. **ශක්‍රදෙවෙන්ද්‍රතෙම** ඒ භික්ෂූන් දුටුයේ ය. දුරින් ම වඩින්නා දැක මහත් වූ ආදරයෙන් පෙරමගට ගොස් පසඟ පිහිටුවා වැඳ සංඝනායක වූ ආයුෂ්මත් **අස්සගුත්ත**මහතෙරුන් වහන්සේ යම් තැනක ද, එතැනට එළඹියේ ය. එළඹ ආයුෂ්මත් වූ අස්සගුත්තමහතෙරුන් වහන්සේට අභිවාදනය කොට එකත්පස් ව සිටියේ ය. එකත්පස් ව සිටියා වූ **ශක්‍ර දෙවෙන්ද්‍රතෙම** ආයුෂ්මත් **අස්සගුත්ත**මහතෙරුන් වහන්සේට මේ වචනය සැලකෙළේ ය. ''ස්වාමීනි, දෙව්ලොවට පැමිණ වදළ භික්ෂුසංඝ තෙමේ ඉතා මහත්සේක. සංඝයා වහන්සේට මම කැපකරු ආරාමිකයෙක්මි. කවර දෙයකින් ප්‍රයෝජන ද? මා විසින් කළ මනා දෙය කවරේ දැ?'' යි විචාළේ ය. මෙසේ විචාළ ඉක්බිති ආයුෂ්මත් **අස්සගුත්ත** මහතෙරුන්

වහන්සේ **ශක්‍රදෙවේන්ද්‍ර**යන්ට මෙපවත් කීසේක: ''මහරජානෙනි, ජම්බුද්වීපයෙහි **සාගලපුර**නුවර වසන **මිලිඳු** නම් මෙම රජ්ජුරුවෝ දුරාසද වූ දුප්පසහ වූ වාදයෙන් යුක්තයහ. බොහෝ වූ තීර්ථකයන්ට අග්‍ර ය යි කියනු ලැබෙයි. ඒ රජතෙම භික්ෂුසංඝයා කරා එළඹ දෘෂ්ටිවාදයෙන් ප්‍රශ්න අසා භික්ෂුසංඝයා වෙහෙසන්නේ ය'' යි වදාළසේක.

එකල නැවත ශක්‍රදෙවේන්ද්‍රතෙම ආයුෂ්මත් වූ අස්සගුත්ත මහ තෙරුන් වහන්සේට මෙ පවත් කියේ ය:— ''ස්වාමීනි, **මිලිඳු** නම් වූ රජ්ජුරුවෝ මේ **තවුතිසා** දෙව්ලොවින් චුත ව ගොස් මිනිසුන් කෙරෙහි **සාගලපුර**නුවර උපන්නෝ ය. 'ස්වාමීනි, **කෙතුමතී** නම් විමානයෙහි වනාහි **මහාසෙන** නම් දිව්‍යපුත්‍රතෙම වෙසෙයි. ඒ **මහාසෙන** දිව්‍යපුත්‍රතෙම ඒ **මිලිඳු** රජ්ජුරුවන් හා සමඟ කථා කරන්නට ද, කාංක්ෂා විනොදනය කරන්නට ද සමර්ථ වන්නේ ය. එසේ හෙයින් ඒ දිව්‍යපුත්‍රයානන්ට මිනිස් ලොව උපදනා පිණිස අපි යාච්ඤා කර සිටුම්හ'' යි කියා නැවැත ශක්‍රදෙවේන්ද්‍රතෙම භික්ෂුසංඝයා පෙරටු කොට ගෙණ **කෙතුමතී** නම් විමානය කරා ගොස් **මහාසෙන** දිව්‍යපුත්‍රයා දෑතින් අල්වා වැළඳ ගෙණ සිට මෙ පවත් දන්වූයේ ය:— ''පින්වත් වූ නිදුකානෙනි, භික්ෂු සංඝයාවහන්සේ තොප මනුෂ්‍යලොකොත්පත්තිය පිණිස යාච්ඤා කර සිටිනාසේකැ''යි, කියේ ය. **(10)** එබස් අසා **මහාසෙන** දිව්‍යපුත්‍රතෙම කියනුයේ—''ස්වාමීනි. මට කෘෂිවාණිජ්‍යාදි කර්ම බහුල වූ මනුෂ්‍යලොකයෙන් ප්‍රයොජන නැත, මනුෂ්‍යලොකය ඉතා තියුණු වූ දුක් ඇත්තේ ය. එසේ හෙයින්, ස්වාමීනි, මම මේ දිව්‍යලොකයෙහි දී මතුමත්තෙහි දිව්‍යලොකොත්පත්තික ව දිවසැපත් වළඳා බණ අසා රහත් ව පිරිනිවන් පාමි'' යි කියේ ය. දෙවෙනි වත් තුන්වැනි වත් ශක්‍රදෙවේන්ද්‍රයා යාච්ඤා කර සිටි කල්හි **මහාසෙන** දිව්‍යපුත්‍රතෙම මෙසේ කියේ ය:— ''අනේ! **ශක්‍ර** ස්වාමීනි, මට කර්ම බහුල වූ මනුෂ්‍යලොකයෙන් ප්‍රයෝජන නැත. මනුෂ්‍යලොකය බලවත් දුක් ඇත්තේ ය. **ශක්‍ර**ස්වාමීනි, මම මේ දිව්‍යලොකයෙහි දී ම මතු මත්තෙහි උත්පත්තික ව ඇවිද පිරිනිවන් පාමි'' යි කියේ ය.

ඉක්බිත්තෙන් ආයුෂ්මත් **අස්සගුත්ත**මහතෙරුන් වහන්සේ **මහාසෙන** දිව්‍යපුත්‍රයාට මේ කාරණය වදාළසේක:— ''එම්බා නිදුක් වූ මහාසෙනදිව්‍යරාජයානෙනි, මේ සදිව්‍යලොකය සහිත වූ මනුෂ්‍යලොකය නො හැර ම දිවැසින් බලන්නා වූ අපි **මිලිඳු** රජ්ජුරුවන්ගේ නපුරු වූ වාදය බිඳ හැර බුද්ධශාසනයට සංග්‍රහ කරන්නට සමර්ථ කෙනෙකුන් තොප හැර නුදුටුම්හ.[1] එහෙයින් නිදුකානෙනි, භික්ෂුසංඝයා වහන්සේ තොපට යාච්ඤා කර සිටිනා සේක. සත්පුරුෂයානෙනි, ඉතා යහපත. මනුෂ්‍යලොකයෙහි ඉපද දශබලධාරිසර්වඥයන් වහන්සේගේ ශාසනය පන්දහසක් හවුරුදු නිරවුල් ව පවත්නා ලෙසට ආධාර ව ශාසනයට බලේ ලා දුන මැනැවැ'' යි වදාළසේක. මෙසේ මහතෙරුන් වහන්සේ වදාළ කල්හි **මහා**

1. අන් කිසි කෙනෙක් නුදුටුම්හ.

Non-Commercial Distribution

**සෙනදිව්‍යපුත්‍රතෙම** ''මම වනාහි **මිලිඳු** රජ්ජුරුවන්ගේ වාදය බිඳ බුද්ධ ශාසනයට බලේ ලන්නට සමර්ථ වන්නෙමි'' යි කියා තුටුපහටු වූ ඔද වැඩියා වූ ප්‍රීති සිත් ඇති ව ''සාධු ස්වාමීනි, මනුෂ්‍යලොකයෙහි උපදිමි'' යි කියා ප්‍රතිඥ දුන්නේ ය. ඉන් පසු ඒ කෙළසියයක් රහතුන් වහන්සේ දිව්‍යලොකයෙහි දී ඒ කටයුත්ත තීරණය කොට ගෙණ තවුතිසාදිව්‍ය ලොකයෙහි දී අන්තර්ධාන ව **හිමාලයපර්වතයෙහි** **රක්ඛිතතල** නම් ගල් තලායෙහි පහළ වූවාහු ය.

මෙසේ වැඩ වදළ ඉක්බිත්තෙන් ආයුෂ්මත් **අස්සගුත්ත** මහතෙරුන් වහන්සේ භික්ෂුසංඝයාට මෙපවත් වදළසේක. ''ඇවැත්නි, මේ සංඝයා අතුරෙහි භික්ෂූන්ගේ සන්නිපාතයට නො පැමිණියා වූ කිසි නමෙක් ඇද්ද?'' යි කියා විචාළසේක. මෙසේ විචාළ කල්හි අන්‍යතර භික්ෂූන් වහන්සේ නමක් ආයුෂ්මත් **අස්සගුත්ත** මහතෙරුන් වහන්සේට මේ කාරණය කීසේක:— ''ඇත; ස්වාමීනි, ආයුෂ්මත් **රොහණ** මහතෙරුන් වහන්සේ මෙයින් සත්වැනි දවස්හි **හිමාලය** පර්වතයට වැඩ නිරොධ-සමාපත්තියට සමවන්සේක. උන්වහන්සේගේ සමීපයට දූත නමක් හැර වදළ මැනැවැ'' යි දැන්වූසේක. එකල ආයුෂ්මත් **රොහණ** ස්ථවිරයන් වහන්සේ ද ඒ ක්ෂණයෙහි ම නිරොධසමාපත්තියෙන් නැගී, ''මහාසංඝ තෙම මා දක්නා කැමැති සේකැ'' යි කියා දුක උන් තැනින් (නැඟිට) ඍද්ධියෙන්[1] **හිමවත්**පර්වතයෙන් අන්තර්ධාන ව රක්ඛිතතලයට රැස් ව සිටි කෙළසියයක් රහතුන්ගේ පෙරට පහළ වූසේක.

ඉක්බිත්තෙන් ආයුෂ්මත් **අස්සගුත්ත**මහතෙරුන් වහන්සේ **(11)**
ආයුෂ්මත් **රොහණ** ස්ථවිරයන්ට මෙපවත් කීසේක:— ''කිමෙක් ද, ඇවැත්නි, **රොහණ** ස්ථවිරයෙනි, බුද්ධශාසනය පසු බැස විනාශ වන කල්හි සංඝයා විසින් කළ මනා කට යුතු නුදුටුයෙහි දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, ඒ බව මා විසින් සිහි නො කරණ ලද්දේ ය'' යි කී සේක. ''එසේ වී නම්, ඇවැත්නි, **රොහණ** ස්ථවිරයෙනි, ඒ වැරැද්දට දඬුවම් කරව'' යි කීසේක. ''ස්වාමීනි, කවර දඬුවමක් කෙරෙම් දැ?'' යි විචාළ සේක. 'ඇවැත්නි, රොහණ ස්ථවිරයෙනි, **හිමාලයපර්වතය** අසල **කජංගල** නම් බ්‍රාහ්මණගමෙක් ඇත. ඒ බමුණුගම මහත් ධනසම්පත් ඇති **සොනුත්තර** නම් බ්‍රාහ්මණයෙක් වෙසෙයි. ඔහුගේ බැමිණියන් කුස **නාගසෙන** නම් බ්‍රාහ්මණකුමාරයෙක් උපදනේ ය. එහෙයින් ඇවැත්නි, **රොහණ** ස්ථවිරයෙනි, තෙපි දශමාසාධික වූ සත්හවුරුද්දක් ඒ බමුණු ගෙදරට පිඩු පිණිස යව. පිඩු පිණිස ගොස් **නාගසෙන** කුමාරයා සත් හවුරුදු වූ කල ගිහිගෙයින් ගෙණ හැර මහණ කළ මැනැව. ඒ කුමාරයා පැවිදි වූ කල්හි මේ දඬුවමින් මිදෙන්නෙහි ය'' යි කීසේක. එබසට ආයුෂ්මත් වූ **රොහණ** මහතෙරුන් වහන්සේ ද 'යහපතැ' යි කියා පිළිගත් සේක.

---

1. උන් තැනින් ඍද්ධි වෙමින්

*Non-Commercial Distribution*

**මහාසෙන** නම් වූ දිව්‍යපුත්‍රයානෝ දෙවුලොවින් චුත ව **සොණුත්තර** නම් බ්‍රාහ්මණයාගේ භාර්යාවන් කුස පිළිසිඳ ගත්තාහ. පිළිසිඳ ගැණීම හා සමඟ ආශ්චර්යාද්භූත වූ ධර්මයෝ තුන් දෙනෙක් පහළ වූහ. කවර ආශ්චර්යධර්මයෙක් ද? යතහොත්— සියලු ආයුධ භාණ්ඩයෝ දිලිහි ගියාහු ය. අග්‍රශස්‍යයෝ පැසී ගියාහු ය. මහාමේඝය මනා ව වර්ෂා කෙළේ ය.

ආයුෂ්මත් **රොහණ** මහතෙරුන් වහන්සේ ද ඔහුගේ ප්‍රතිසන්ධි ග්‍රහණය පටන් දසමසක් අධික වූ සත්හවුරුද්දක් මුළුල්ලෙහි ඒ බමුණු ගෙදරට පිඩු පිණිස වඩිනාසේක් එක් දවසක වත් සැන්දක් පමණ බතක් වත් කෙණෙස්සක් පමණ කැඳ වත් බැස වැඳීමක් වත් අත නගා වැඳීමක් වත් ආදරගෞරව කට යුත්තක් වත් නො ලත්සේක. නැවැත කුමක් ලත්සේක් ද? යත්:— ආක්‍රොෂ පරිභව ම ලත්සේක. 'ස්වාමීනි, බොහෝ කල් සිටිනාහ' යි වචන මාත්‍රයකුත් කියන්නා වූ කෙනෙක් නො වූහ. දශමාසයක් අධික වූ සත්හවුරුද්දක් ඇවෑමෙන් එක්දවසක් ගෙයින් දෙරට කර පෙවූ කෙල්ලක් මඳක් කරුණා උපදවා නපුරුසිත් හැර 'වහන්ස, අරුණු ය'යි යන වචනයෙන් කිසිවක් නො ලබනබව හඟවා කී වචන මාත්‍රයක් ලත්සේක. **රොහණ**තෙරුන් වහන්සේත් එබසට සතුටු ආකාර දක්වා වඩනට පටන් ගත්සේක.

එදවස් **සොණුත්තර** නම් බමුණු ද පිටත කිසියම් කර්මාන්තයකට ගොස් එනුයේ පෙර මග දී ප්‍රසන්නාකාරයෙන් වඩනා තෙරුන් වහන්සේ දැක ''කිමෙක් ද? 'පින්වත් මහණ, අපගේ ගෙට ගියෙහි ද?'' යි විචාළේ ය. ''එසේ ය බ්‍රාහ්මණයෙනි, ගියම්හ'' යි වදාළසේක. 'කිසි දෙයක් ලදු ද?'' යි විචාළේ ය. ''එසේ ය; බ්‍රාහ්මණයෙනි, ලදුම්හ'' යි වදාළසේක. එකල ඒ බ්‍රාහ්මණයා නො සතුටුව වහා ගෙට ගොස් කථා කොට ''මෙතැනට පිඩු සිඟා ආ ඒ පැවිද්දහට කිසිවක් දුන්නු ද?'' යි විචාළේ ය. ඒ අසා ගෙයි සිටියෝ අපි කිසිවක් නුදුම්හ'' යි කීහ. ඒ අසා බ්‍රාහ්මණතෙම ''අහෝ! මේ ශ්‍රමණයෝ බොරු **(12)** නො කියම්හ යි ලොව රවටන්නාහ. කිසිවක් නුදුන් අපගෙන් 'ලද්දෙමි' යි මහබොරුවක් කීහ'' යි දෙවෙනි දවස් ''අද ශ්‍රමණයාහට මුසාවාදයෙන් නිග්‍රහ කෙරෙමි'' යි කියා සරද්වාරයෙහි ම බලා සිටියේ ය. තෙරුන් වහන්සේ ද දෙවෙනි දවස් බ්‍රාහ්මණයාගේ ගෘහ ද්වාරයට සම්ප්‍රාප්ත වූසේක. බ්‍රාහ්මණතෙම තෙරුන් වහන්සේ දකිමින් ම මෙසේ කීයේ ය:— ''මහණ, තෙපි ඊයේ දවස අපගේ ගෙයි දී කිසිවක් නො ලැබුයේ ම ලදුම්හ යි බොරු කීවහු ය. ශ්‍රමණ වූ තොපට මුසාවාද කිම වටී ද?'' යි කියා මුසාවාදයෙන් නිග්‍රහ කෙළේ ය.

එකල තෙරුන් වහන්සේ වදරණසේක් ''බ්‍රාහ්මණය, අපි තොපගේ ගෙයි දශමාසාධික වූ සත්හවුරුද්දක් හැමදවස් ම සිඟා 'අරුණු ය'[1] යන වචනමාත්‍රයකුදු නො ලැබ ඊයේ දවස් **'අතිච්ඡථ භන්තෙ'** යන වචන

1. අරුණු පමණක්

*Non-Commercial Distribution*

මාත්‍රයක් ලදුම්හ. නැවත මේ වචන සංග්‍රහ මාත්‍රය පිණිස මෙසේ 'ලදුම්හ'යි කී බසක් මිස බොරු නො කීම්හ'' යි වදාළසේක.

ඒ අසා බ්‍රාහ්මණතෙම සිතනුයේ මේ සත්පුරුෂගුණ ඇති ශ්‍රමණයෝ වචන පටිසන්ථාරමාත්‍රයකුදු ලැබ මහජනයා මධ්‍යයෙහි 'ලදුම්හ' යි ප්‍රශංසා කෙරෙති. එසේ කල කන දෙයක් වත් භොජනයක් වත් අනික් කිසිදෙයක් වත් ලැබ කෙසේ නම් ප්‍රශංසා නො කෙරෙද් ද?'' යි කියා පැහැද තමහට ප්‍රයෝජන පිණිස පිළියෙල කරණ ලද බතින් බත්සැන්දක් හා ඊට සැහෙන ව්‍යඤ්ජනයක් දෙවා මේ අද දුන් ආහාර පමණක් ම හැම දවස් ම නුඹ වහන්සේ අප ගෙන් ලබා වදාළ මැනැවැ'' යි කියා ආරාධනා කෙළේ ය.

නැවත ඒ බ්‍රාහ්මණතෙම දවස් පතා එළඹෙන්නා වූ තෙරුන් වහන්සේගේ ඉන්ද්‍රියසංයමාදී වූ ඉරියාපථය දැක බොහෝ සෙයින් පැහැද තෙරුන් වහන්සේට නිරන්තරයෙන් තමාගේ ගෙයි දී ම ආහාර වළඳන පිණිස යාච්ඤා කර සිටියේ ය. තෙරුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසා දවසින් දවස භක්තකෘත්‍යය කොට වඩිමින් මඳක් මඳක් ඕහට බුදුබණ කියකියා වඩනාසේක. ඒ බ්‍රාහ්මණභාර්යාවෝ ද දසමස් ඇවෑමෙන් පුත්‍රයකු වැදූහ. ඕහට **'නාගසෙන'** ය යි නම් වී ය. ඒ තෙම අනුක්‍රමයෙන් වැඩෙමින් සත්හැවිරිදි වී ය. ඉක්බිති **නාගසෙන**කුමාරයාගේ පියානෝ නාගසෙන කුමාරයාහට මෙපවත් කීහ:— ''දරුව, නාගසෙනයෙනි, මේ බ්‍රාහ්මණගොත්‍රයෙහි උගත මනා ශික්ෂාවන් උගණුව'' යි කීහ. ''පියානන් වහන්ස, මේ බ්‍රාහ්මණගොත්‍රයෙහි ශික්ෂාවෝ නම් කවරහු ද?'' යි විචාළේ ය. ''දරුව, නාගසෙනයෙනි; වෙදයෝ වනාහි තුන් දෙනෙක. ඒ වෙදත්‍රය ශික්ෂා නම් වෙයි. අවශෙෂ වූ ශිල්පයෝ ශිල්ප නම් වෙති'' යි කීහ. 'එසේ වී නම් පියානෙනි, උගන්නෙමි'' යි කීයේ ය.

ඉක්බිති **සොණුත්තර** නම් බ්‍රාහ්මණයානෝ ද අකුරු කරවන්නා වූ ආචාර්යබ්‍රාහ්මණයක්හට ගුරුපඬුරු පිණිස දහසක් කහවණු දෙවා ඇතුළු ප්‍රාසාදයෙහි වූ එක් ගෙයක එක්අතෙක ඇඳක් පණවා දී ගුරුවර බ්‍රාහ්මණයා හට මෙසේ කී ය:— ''බ්‍රාහ්මණය, තෙපි මේ මාගේ පුත්‍රයාහට මන්ත්‍රයන් හදරව'' යි කීහ. ''එසේ නම්, ශිෂ්‍යපුත්‍රය, මන්ත්‍රයන් උගණුව'' යි කියා ගුරුබ්‍රාහ්මණතෙම මන්ත්‍ර හදරවන්නේ ය. **නාගසෙනකුමාරයා** විසින් එක්වරක් කියවා ගත් පමණකින් ම ත්‍රිවෙදංගයෝ හෘදයංගත **(13)** කරණ ලදහ. වාචුග්ගත කරණ ලදහ. මනා කොට ම ධාරණය කරණ ලදහ. මනා ව ව්‍යවස්ථා කාරණ ලදහ. මනා කොට ම සිත්හි කරණ ලද්දහු යි. එකවරක් කියවා ගත් පමණෙකින් ම වෙදත්‍රයෙහි ද, නිඝණ්ටු ශාස්ත්‍ර සහිත වූ කාව්‍යාලංකාරයෙහි ද, ඉතිහාසය පස්වැනි කොට ඇති සාක්ෂරප්‍රභෙදය යි කියන ලද ඡන්දශ්ශාස්ත්‍රයෙහි[1] ද ප්‍රඥාචක්ෂුස පහළ වූයේ ය. එසේ හෙයින් පද නම් ග්‍රන්ථවිශෙෂය වූ ශබ්දශාස්ත්‍රය දන්නේ ය. ව්‍යාකරණශාස්ත්‍රය දන්නේ ය. දෙළොස්දහසක් ග්‍රන්ථ ඇති ලොකායතමහාපුරුෂලක්ෂණ

1. මෙතැන පරිවර්තනය වැරදි ය.

Non-Commercial Distribution

ශාස්ත්‍රය දැනීමෙහි ද අනූන ව සම්පූර්ණ වූ ශිල්ප ඇත්තේ වී ය. ඉක්බිති නාගසෙන කුමාරතෙම තමාගේ පියානන්ට මෙපවත් කී ය[1]:—''පියානෙනි, මේ අපගේ බ්‍රාහ්මණගොත්‍රයෙහි මීට වඩා උගත යුතු ශිල්පයෝ ඇද්ද? නොහොත් මෙපමණෙක් ද?'' යි විචාළේ ය. ''දරුව, නාගසෙනයෙනි, අපගේ මේ බ්‍රාහ්මණගොත්‍රයෙහි මීට වඩා උගත මනා ශිල්පශාස්ත්‍රයෙක් නැත. ශික්ෂණය කට යුතු වූ ශිල්පයෝ මෙපමණෙක් ම ය'' යි කීයේ ය. ඒ අසා නැවත නාගසෙන කුමාරයෝ තමාගේ ගුරුවරබ්‍රාහ්මණයාහට තමාගේ පාඩම් දී සමු ගෙණ ප්‍රවරප්‍රාසාදයට නැගී පූර්වවාසනාබලයෙන් මෙහෙයන ලද සිත් ඇති ව රහොගත ව විවෙකයෙන් යුක්ත ව හිඳ තමන් උගත් ශිල්පශාස්ත්‍රයාගේ ආදිමධ්‍යපරියොසානය නුවණින් සලකා බලමින් ආදියෙහි වත් මධ්‍යයෙහි වත් කෙළවර වත් මඳකුත් සාරත්වයක් නො දැක ''තුච්ඡා වත භො ඉමෙ වෙද, පලාපා වත භො ඉමෙ වෙද'' යනාදීන් ''මා උගත් වෙදශාස්ත්‍රයෝ අසාර ය. නිස්සාර ය'' යි කලකිරී විපිළිසර ව නො සතුටු වූවාහ. එසමයෙහි වනාහි ආයුෂ්මත් වූ **රොහණ** ස්ථවිරයන් වහන්සේ **වත්තනිය** නම් සෙනාසනයෙහි වැඩ හුන්සේක් නාගසෙන කුමාරයාගේ විතර්කය පර සිත් දන්නා නුවණින් දැක සකසා හැඳ පෙරෙව කයින් සිවුරු හා අතින් පාත්‍රය ගෙණ **වත්තනිය** නම් සෙනාසනයෙන් අන්තර්ධාන ව **කජංගල** නම් බ්‍රාහ්මණගම පෙරටු ව පහළ වූසේක.

නාගසෙනකුමාරතෙමේ ද තමන්ගේ වහසල්දෙරකඩ සිටියේ[2] ආයුෂ්මත් **රොහණ**ස්ථවිරයන් වහන්සේ දුටුයේ ම ය. දුරින් ම එන්නා දැක සතුටු ව ඔද වැඩියා වූ සිත් ඇති ව ප්‍රමුදිත ව ප්‍රීතිසොම්නස් උපදවා ''මේ ප්‍රව්‍රජිතයන් වහන්සේ වත් කිසි සාරදෙයක් දන්නාසේක් වී නම් ඉතා යෙහෙකැ'' යි සිතා ආයුෂ්මත් වූ **රොහණ** ස්ථවිරයන් වහන්සේ යම් තැනක ද, එතැනට ගියේ ය. ගොස් ආයුෂ්මත් **රොහණ**තෙරුන් වහන්සේට මෙපවත් කීයේ ය. ''ශ්‍රෙෂ්ඨයානෙනි, මෙබඳු වූ හිස මුඩු ව කාෂායවස්ත්‍ර හඳනා වූ තෙපි කවුරුද?'' යි විචාළේ ය. ''දරුව, මම නම් ප්‍රව්‍රජිතයෙමි'' යි වදළහ. ''ශ්‍රෙෂ්ඨයානෙනි, නුඹවහන්සේ කුමක් කරණ කොට ගෙණ ප්‍රව්‍රජිත නම් වනසේක් ද?'' යි විචාළේ ය. ''දරුව, පව්ටු වූ ක්ලේශමලයන් පලවාපියන්නට පැවිදි වීමි. එහෙයින්, දරුව, මම ප්‍රව්‍රජිත නම් වීමි'' යි වදළසේක. ''නිදුකානන්වහන්ස, නුඹවහන්සේගේ හිසකේ යම් සේ සෙස්සවුන්ගේ මෙන් දික් නො වී ලුහුඬු වන්ට කාරණ කවරේ ද?' යි විචාළේ ය. ඒ අසා වදාරණසේක් ''දරුව, දික් වූ හිසකේ දැරීමෙන් සොළොස්පළිබොධ කෙනෙකුන් දැක හිසකේ රැවුල කපා හැර පැවිදි වීමි'' යි. ඒ සොළස නම් කවරේ ද? දික්හිසකේ ඇති කල (14) අලංකාර කරවන පළිබොධය, සැරහෙන පළිබොධය, තෙල් ගාන පළිබොධය, ඉස්සෝධන පළිබොධය, මල් පලඳින පළිබොධය, සුවඳ ගල්වන පළිබොධය, දුම් ආදියෙන් සුවඳ කවන පළිබොධය, අරළුසුණු ගල්වන පළිබොධය, නෙල්ලි අඹරා ගාන පළිබොධය, තෙලින් රඳන[3] පළිබොධය,

1. කීහ 2. සිටිනුයේ 3. තෙලියෙන් රෙදෙන

Non-Commercial Distribution

බඳින පළිබොධය, පණාවෙන් පිරණ පළිබොධය, අන්දම් තිබීම් පළිබොධය[1] අවුල් හරිණ පළිබොධය, උකුණන් හරිණ පළිබොධය යන මේ පසළොස් පළිබොධ හා 'හිසකේ වැගිර ගිය කල සෝක කෙරෙති. ක්ලාන්ත වෙති. හඬති. ලෙහි පැහැර හඬති. සිහි මුළාබවට පැමිණෙති යන මේ මහා පළිබොධය ද යන සොළොස් පළිබොධයන් වැලඳ සිටියා වූ මනුෂ්‍යයෝ අතිසුඛුම සියලු ම ශිල්පශාස්ත්‍රයන් නසන්නාහු ය'' යි වදළසේක. ''එසේ ය, නිදුකානන්වහන්ස, හඳනා පොරෝණා වස්ත්‍රයෝත් නුඹගේ යම් සේ සෙස්සවුන්ගේ 'මෙන් නො වෙති. ඊට කාරණ කවරේ ද?'' යි විචාළේ ය. ''දරුව, එයිත් කියමි යි, ගිහීන් විසින් පැලඳිය යුතු වූ සියල්ලන් විසින් කැමැති වන්නා වූ යහපත් වූ වස්ත්‍රයෝ පඤ්චකාම නිශ්‍රිත ය, එහෙයින්, දරුව, යම්කිසි භයක් උපදී නම්, වස්ත්‍ර නිසා උපදනාහ. ඒ භය කාෂායවස්ත්‍ර හඳනාහට නො වෙයි. ඒ නිසා මාගේ වස්ත්‍රයෝත් සෙස්සන්ගේ යම්සේ ද එසේ නො වෙති'' යි වදළසේක.

ඒ අසා මඳක් සතුටු ව කියනුයේ ''නිදුකානන් වහන්ස, නුඹවහන්සේ ශිල්පශාස්ත්‍ර නම් දෙයක් දන්නාසේක් ද?'' යි විචාළේ ය. ''එසේ ය, දරුව, මම ශිල්පශාස්ත්‍රත් දනිමි. ලොකයෙහි උතුම් වූ යම් මන්ත්‍රයෙක් ඇද්ද? ඒ මන්ත්‍රයත් දනිමි'' යි වදළසේක. ''නිදුකානන් වහන්ස, ඒ උතුම් වූ මන්ත්‍රය මටත් දෙන්නට පුළුවන් ද?'' යි විචාළේ ය. ''එසේ ය, දරුව, පුළුවනැ'' යි වදළසේක. ''එසේ වී නම් මට මන්ත්‍රය දුන මැනැවැ'' යි යාච්ඤා කොට සිටියේ ය. ''දරුව, දූන් ශිල්ප දෙන්ට කල් නො වෙයි. ඇතුළු ගෙදරට පිඬු පිණිස ආම්හ'' යි වදළසේක.

ඉක්බිති නාගසෙනකුමාරයෝ ආයුෂ්මත් රොහණතෙරුන් වහන්සේගේ අතින් පාත්‍රය ගෙණ ගෙට වඩා ගෙණවුත් ප්‍රණීත වූ ඛාද්‍යභොජ්‍ය ආහාරයන් ස්වහස්තයෙන් ම වළඳවා පෙරළත්ත කොට වැඩිවැඩියෙනුත් වළඳවා, ඉක්බිති පාත්‍රයෙන් ඉවත් කරණ ලද අත් ඇති ආයුෂ්මත් රොහණ තෙරුන් වහන්සේට මෙපවත් කීහ:— ''නිදුකානෙනි, මට දූන් ඉතින් උතුම් වූ මන්ත්‍රය දුන මැනැවැ'' යි කියා ඉල්වූයේ ය. එබසට තෙරුන් වහන්සේ කියනසේක් ''එම්බා දරුව, තෙපි යම් දවසෙක අප සේ ම නිෂ්පලිබොධ වෙමින් මවුපියන් අනුදන්වා ගිවිස්වා ගෙණ මා විසින් ගත් ප්‍රවූජිත වෙශය ගන්නහු ද, ඒ දවස් තොපට මන්ත්‍රය දෙමි'' යි වදළසේක. ඉක්බිති නාගසෙනකුමාරයෝ ද මැනියන් පියානන් කරා ගොස් ''අම්ම, පියානෙනි, මේ මහණුන් වහන්සේ ලොකයෙහි උතුම් වූ යම් මන්ත්‍රයෙක් ඇද්ද, ඒ මන්ත්‍රය දනිමි යි කියනසේක. තමන් ලඟ පැවිදි නුවූවක්හට නො ම දෙන සේක. මම උන්වහන්සේ ලඟ පැවිදි ව මන්ත්‍රය උගන්නෙමි'' යි කීහ. මෙසේ කී නැවත ඔහුගේ මවු පියෝ සිතන්නාහු— 'අපගේ පුත්‍රයා පැවිදි වෙලා වත් ඒ උතුම් වූ මන්ත්‍රය ගෙණ පසු ව සිවුරු හැර එන්නේ ය'යි සිතා, ''පුත්‍රය, මන්ත්‍රය ගණුව'' යි කියා අවසර දුන්නාහු ය. ඉක්බිති **(15)** **රොහණ** තෙරුන් වහන්සේ **නාගසෙනකුමාරයා** කැඳවා ගෙණ යම්

1. එක් පළිබොධයෙක

*Non-Commercial Distribution*

තැනක **වත්තනිය** නම් සෙනාසනය ද, යම් තැනක **විජම්භවස්තුව ද**, එතැනට එළඹීසේක. එළඹ **විජම්භවස්තුවෙහි** වූ සෙනාසනයෙහි එක්රැයක් වැස දෙවෙනි දවස් **රක්ඛිතතලය** යම් තැනෙක්හි ද, එතැන්හි එළඹිසේක. එතැන්හි එළඹ එහි වසන කෙළසියයක් රහතුන් මධ්‍යයෙහි **නාගසෙන** කුමාරයා පැවිදි කළ සේක. පැවිදිවූ ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේ වනාහි ආයුෂ්මත් **රොහණ** තෙරුන් වහන්සේට මෙපවත් කීසේක:— ''ස්වාමීනි, නුඹ වහන්සේගේ මහණවෙශය මා විසින් ගන්නා ලද්දේ ය. දැන් මට උතුම් මන්ත්‍රය දුන මැනව'' යි කීසේක.

ඉක්බිති ආයුෂ්මත් **රොහණ** ස්ථවිරයන් වහන්සේ සිතනසේක් ''මම වනාහි **නාගසෙනසාමණේරයා** පළමු කොට සූත්‍රාන්ත ධර්මයෙහි හෝ අභිධර්මයෙහි හෝ කවර ධර්මයෙක්හි හික්මවම්දෝ හො?'' යි සිතා ''මේ **නාගසෙනයෝ** පණ්ඩිතයෝය, සැප සේ ම අභිධර්මපිටකය උගන්නට සමර්ථ වන්නෝ ය'' යි දැන පළමුකොට ම අභිධර්මයෙහි හික්මවා ලූසේක. ආයුෂ්මත් වූ **නාගසෙන** සාමණේරයානෝ ද, අභිධර්මයට පටන් ගෙණ **''කුසලා ධම්මා, අකුසලා ධම්මා, අව්‍යාකතා ධම්මා''** යනාදීන් තිකදුක ප්‍රතිමණ්ඩිත වූ **ධම්මසංගණිප්‍රකරණය** ද, ඛන්ධවිභංගාදී වූ අටළොස් විභංගයෙන් ප්‍රතිමණ්ඩිත වූ **විභංගප්‍රකරණය** ද, **''සංගහො අසංගහො''** යනාදීන් තුදුස් ආකාරයකින් විභාග කළා වූ **ධාතුකථාප්‍රකරණය** ද, ඛන්ධක ප්‍රඥප්තිය, ආයතනප්‍රඥප්තිය යනාදීන් ෂඩ් ආකාරයකින් විභාග කළා වූ **පුද්ගලප්‍රඥප්තිය** ද, සකවාදයෙහි පන්සියයක් සූත්‍ර ද, පරවාදයෙහි පන් සියයක් සූත්‍ර ද යි මෙසේ සූත්‍රදහසක් එක් කොට විභාග කළා වූ **කථාවස්තු** ප්‍රකරණය ද, මූලයමක ඛන්ධයමක ය යි යනාදීන් දශප්‍රකාරයකින් විභාග කළා වූ **යමකප්‍රකරණය** ද, හෙතුප්‍රත්‍යය, ආරම්මණප්‍රත්‍යය ය යි යනාදීන් සූවිසිආකාරයකින් විභාග කළා වූ **පට්ඨානප්‍රකරණය** ද යි මෙසේ සියලු ම ඒ අභිධර්මපිටකය එක වරක් වදළා වූ පමණකින් ම එකාක්ෂරයකුත් නො පිරිහෙළා වණපොත් කොට අර්ථයන් ඉගෙණ ගෙණ ගුරුන්වහන්-සේට කියනසේක්:— ''ස්වාමීනි, වැඩ සිටිය මැනව. නැවැත නො කියවන්න. මෙපමණකින් ම මම නුඹ වහන්සේට වණපොත් දෙමි'' යි කීසේක. එබස් අසා ගුරුන් වහන්සේ කියනසේක් **''නාගසෙනයෙනි,** කෙළසියයක් රහතන් මධ්‍යයෙහි නො බා ව ම පිරිවහාපියන්නට හැකි ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, පිරිවහාපියන්නට හැක්කෙමි'' යි කියා නැවත ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේ යම් තැනක කෙළසියයක් රහතුන් වහන්සේ වසනසේක් ද, එතැනට එළඹීසේක. එළඹ දැක නමස්කාර කොට කෙළසියයක් රහතුන් වහන්සේට මෙපවත් දැන්වූසේක. ''ස්වාමීනි, මම වනාහි **''කුසලා ධම්මා, අකුසලා ධම්මා, අව්‍යාකතා ධම්මා''** ය යි කියා එක දවස් එක විටක් කියෙව්වා වූ මේ පදත්‍රයෙහි සියලු ම ඒ අභිධර්මපිටකය ප්‍රක්ෂෙප කොට බහා ලා විස්තරවශයෙන් ම පිරිවහා වණපොත් දෙමි'' යි කීසේක. ඒ අසා මහරහතන් වහන්සේ ''සාධු සාධු, **නාගසෙනයෙනි,** පාඩම් හදරව'' යි වදළසේක.

Non-Commercial Distribution

ඉක්බිති ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේ අවසර ගෙණ **(16)** සත් මසකින් සප්තප්‍රකරණය විස්තරවශයෙන් ම වණපොත් දී මහරහතුන් වහන්සේට ඇස්වූ[1] සේක. ඒ ක්ෂණයෙහි ම **මහපොළොව** සතසහස්‍රාරාව-යෙන් ගුගුරා කම්පා වී ය. සදෙවුලොව දෙවියෝ සාධුකාර දුන්හ. පසළොස් බඹලොව බ්‍රහ්මසෙනාව අත්පොළසන් දුන්හ. දිව්‍යසඳුන්සුණු වසින්ට පටන් ගත. දිව්‍යමදරාමල් වර්ෂා කළාහුය. ඒ ආශ්චර්යය දුටු මහරහතුන් වහන්සේ නොයෙක් ස්තුතිපූජා කළාහු ය. ඉන් පසු මැත භාගයෙහි කෙළ සියයක් රහතුන් වහන්සේ එක් ව සම්පූර්ණ වූ විසිවයස් ඇති ආයුෂ්මත් **නාගසෙනසාමණේරයන් රක්ඛිත** නම් තලයෙහි දී උපසම්පද කළාහු ය. උපසම්පද වූ ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේ වනාහි එදවස් රාත්‍රියගේ ඇවෑමෙන් උදය කාලයෙහි සකසා හැඳ පාසිවුරු ගෙණ උපාධ්‍යායයන් වහන්සේ හා සමඟ ඇතුළු ගමට පිඩු පිණිස වඩනාසේක්, මෙබඳු වූ සිතිවිල්ලක් ඉපදවූසේක:— ''මාගේ උපාධ්‍යායයන් වහන්සේ අවශෙෂ වූ බුද්ධවචනයන් තබා ලදරු වූ මා පළමු කොට ම අතිගම්භීර වූ අභිධර්ම-යෙහි හික්මවා ලූසේක. එබැවින් මාගේ උපාධ්‍යායයන් වහන්සේ ඒකාන්තයෙන් ම ගැඹුරු වූ නුවණින් සිස් වූසේක. මාගේ උපාධ්‍යාය-යන් වහන්සේ ඒකාන්තයෙන් ම අඥනාසේකැ'' යි සිතූසේක.

ඉක්බිත්තෙන් ආයුෂ්මත් **රොහණස්ථවිරයන්** වහන්සේ ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේගේ සිතිවිල්ල සිතින් සිත පිරිසිඳ දක්නා ඥාණයෙන් දැක ආයුෂ්මත් **නාගසෙනයන්ට** මෙපවත් කීසේක:— ''**නාගසෙනයෙනි**, තොප වැනි අයට සුදුසු නො වන සිතිවිල්ලක් සිතුවහුය. **නාගසෙනයෙනි**, මේ සිතිවිල්ල සිතන්ට තොපට සුදුසු නැතැ''යි වදාළසේක. එබස් අසා නැවැත ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේට මෙබඳු සිතිවිල්ලෙක් විය:— ''මාගේ සිත උපන් විතර්කය යම් තැනෙක නම්, එතැන ම මාගේ උපාධ්‍යායයන් වහන්සේ සිතින් සිත පිරිසිඳ දැන වදරණසේක. එහෙයින් පින්වත් වූ මාගේ උපාධ්‍යායයන් වහන්සේ ඒකාන්තයෙන් ම ආශ්චර්යවත් වූසේක. පින්වත් වූ මාගේ උපාධ්‍යායයන් වහන්සේ ඒකාන්තයෙන් ම අද්භූත වූසේක. මාගේ උපාධ්‍යායයන් වහන්සේ ඒකාන්තයෙන් ම පණ්ඩිත වූසේක. එබැවින් මම උපාධ්‍යායයන් වහන්සේ ක්ෂමා කරවා ගත්තෙම් වීම් නම්, ඉතා යෙහෙකැ'' යි සිතා නැවැත ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේ දෙහොත් මුදුනෙහි තබා ගෙණ ආදරයෙන් නැමී සිට ආයුෂ්මත් වූ **රොහණ** ස්ථවිරයන් වහන්සේට මෙපවත් සැළකළසේක:— ''අනේ! ස්වාමීනි, නො දැන සිතුවා වූ මට ක්ෂමා කර වදාළ මැනැව. නැවැත මෙබඳු සිතක් නො සිතමි'' යි සැළ කළසේක. ඉක්බිති ආයුෂ්මත් **රොහණස්ථවිරයන්** වහන්සේ ආයුෂ්මත් **නාගසෙනනමට** මෙපවත් කීසේක. ''**නාගසෙනයෙනි**, මෙපමණකින් තොපට මම ක්ෂමා නො කරමි. 'එම්බා **නාගසෙනයෙනි**, **සාගල** නම් නුවරෙක් ඇත. එහි **මිලිඳු** නම් රජෙක් රාජ්‍යය කරන්නේ ය. ඒ රජ දෘෂ්ටි

1 ඇස්සවූ.



Non-Commercial Distribution

වාදයෙන් ප්‍රශ්න අසා භික්ෂුසංඝයා වෙහෙසන්නේ ය. ඉදින් තෙපි ඒ නුවරට ගොස් ඒ රජ්ජුරුවන් දමනය කොට පහදවන්නහු වූ නම්, එසේ කල මම තොපට ක්ෂමා කෙරෙමී'' යි වදළසේක. ''ස්වාමීනි, වැඩ සිටිය මැනැව. එක ම **මිලිඳුරජකු** තබා 'ඉදින් ස්වාමීනි, සකල **ජම්බුද්වීපයෙහි** සියලු ම **(17)** රජදරුවෝ මා කරා අවුත් මාගෙන් ප්‍රශ්න විචාළාහු නම්, ඒ සියල්ල ම විසඳා සම්ප්‍රදලනය කෙරෙමි' යි ඊට සැකයක් නො කොට, ස්වාමීනි, මට ක්ෂමා කළ මැනැවැ'' යි කියාත් ''ක්ෂමා නො කෙරෙමී'' යි කී කල්හි එසේ වී නම් ''ස්වාමීනි, වස් වසන කලත් ලං විය. මේ තුන් මාසය කවුරුන් ලඟ වසම් දැ?'' යි කීසේක.

''**නාගසෙනයෙනි**, මේ වනාහි ආයුෂ්මත් **අස්සගුත්ත** මහතෙරුන් වහන්සේ **වත්තනිය** නම් සෙනාසනයෙහි වැඩ වසනසේක, යව. තෙපි, **නාගසෙනයෙනි**, ආයුෂ්මත් **අස්සගුත්ත** තෙරුන් වහන්සේ යම් තැනෙක ද, එතැනට එළඹෙව. සමීප ව ගොස් මාගේ වචනයෙන් ආයුෂ්මත් **අස්සගුත්ත**මහතෙරුන් වහන්සේගේ පාදද්වන්දවය මස්තකයෙන් වඳුව. එසේ වැඳ මෙසේ ද කියව:— ''ස්වාමීනි, මාගේ උපාධ්‍යායයන් වහන්සේ ඔබ වහන්සේගේ පාදද්වන්දවය සිරසින් වන්දනා කෙරෙති. නිරොගිබව ද නිදුක්බව ද ශරීරයාගේ ලඝුකපරිවර්තනය ද ශරිරබල ද ශරීරයාගේ සැප විහරණය ද විචාරණසේක. මේ තුන්මස ඔබවහන්සේගේ සමීපයෙහි වසන්නට මා එවූසේකැ.'' යි කියා 'තොපගේ උපාධ්‍යායයෝ 'කවුරු නම් දැ?' යි විචාළ කල්හි ''ස්වාමීනි, **රොහණ** ස්ථවිර නමැ'' යි කියව. 'මම කිනම් දැ?' යි විචාළ කල්හි මෙසේ කියව. 'මාගේ උපාධ්‍යායයන් වහන්සේ ස්වාමීනි, ඔබගේ නම දන්නාසේකැ' යි කියව'' යි වදළ කල්හි 'එසේ ය වහන්සැ' යි කියා ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේ ආයුෂ්මත් **රොහණස්ථවිරයන්** පසඟ පිහිටුවා වැඳ පැදකුණු කොට පාසිවුරු ගෙණ අනුපූර්වයෙන් ම සැරිසරණ සේක්, යම් තැනෙක **වත්තනිය** නම් සෙනාසනය වී ද, යම් තැනෙක ආයුෂ්මත් **අස්සගුත්ත**තෙරුන් වහන්සේ වසන සේක් ද, එතැන්හි එළඹීසේක. එළඹ ආයුෂ්මත් **අස්සගුත්තස්ථවිරයන්** වහන්සේට පසඟ පිහිටුවා වැඳ එකත්පසෙක සිටිසේක. එකත්පසෙක සිටියා වූ ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේ ආයුෂ්මත් **අස්සගුත්ත** ස්ථවිරයන් වහන්සේට මෙපවත් කීසේක:— 'ස්වාමීනි, මාගේ උපාධ්‍යායයන් වහන්සේ නුඹ වහන්සේගේ පාදද්වන්ද්වය මස්තකයෙන් වඳනාසේක. මෙසේ ද කියන සේක:— නීරෝගිබව ද නිදුක්බව ද ශරීරයාගේ සැහැල්ලුබව ද ශරීරයාගේ බල ඇති බව ද ශරීරයාගේ සැපවිහරණය ද විචාරව'' යි කීසේක. 'ස්වාමීනි, උපාධ්‍යායයන් වහන්සේ මා මේ තුන් මාසය ඔබවහන්සේගේ සමීපයෙහි වසන්නට එවූසේකැ'' යි දැන්වූසේක.

ඉක්බිති ආයුෂ්මත් **අස්සගුත්ත** තෙරුන් වහන්සේ ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේට මෙපවත් කීසේක. ''තෙපි කිනම් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, මම නාගසෙන නම් වීමි'' යි කීසේක. ''තොපගේ උපාධ්‍යායයෝ කිනම් දැ?'' යි විචාළසේක. 'ස්වාමීනි, මාගේ උපාධ්‍යායයෝ

**රොහණ** ස්ථවිර නම් වනසේකැ'' යි කීසේක. ''මම කවුරු නම් වෙම් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, මාගේ උපාධ්‍යායයන් වහන්සේ නුඹ වහන්සේගේ නම දන වදරණසේකැ'' යි කීසේක. ''යහපත නාග-සෙනයෙනි, පාසිවුරු තැන්පත් කොට තබව'' යි වදළසේක. ''යහපත ස්වාමීනි'' යි කියා පාසිවුරු තැන්පත් කොට තබා එදවස් සැතැපී දෙවෙනි දවස් උදෑසන්හි ම පිරිවෙණ වට හැමද මුව සෝදන දිය හා දැහැටි ගෙණ ගොස් ලඟ තැබූසේක. **(18)** **අස්සගුත්ත**තෙරණුවෝ ද, ඇමදපු මළුව නැවැත ඇමැදිසේක. ඒ වතුර දමා වෙනින් පැන් ගෙණ වදළසේක. ඒ දැහැටි ඉවත් කොට වෙනින් දැහැටි ගෙණ වදළසේක. **නාගසෙනයන්** වහන්සේ සමඟ ඉදිරි පසු කථාවකුත් නො කළසේක. මෙසේ සත්දවසක් පරීක්ෂා කොට සත්වැනි දවස් නැවැතත් ආ තොරතුරු විචාරා නැවැතත් ඒ නාගසෙනයන් වහන්සේ විසින් එලෙස ම කී කල්හි වස් වසන දවසත් එදවස් ම වූ හෙයින් උන්වහන්සේටත් වස් විසීමට අවසර දුන්සේක.

එසමයෙහි වනාහි මහත් ධනභොගසාරයෙන් හා ශ්‍රද්ධාශීල ගුණයෙන් මහත් වූ එක්තරා මහාඋපාසිකාවක්තොමෝ ආයුෂ්මත් **අස්සගුත්ත** තෙරුන් වහන්සේට තිස්හවුරුද්දක් පමණ උපස්ථාන කළා ය. නැවැත ඒ මහාඋපාසිකාතොමෝ එවස් තුන්මාසයෙහිත් උපකාර කොට තුන් මාසයාගේ ඇවෑමෙන් ආයුෂ්මත් **අස්සගුත්ත**තෙරුන් වහන්සේ යම් තැනෙක වසනසේක් ද, එතැනට එළඹියා ය. එසේ එළඹ ආයුෂ්මත් අස්සගුත්ත තෙරුන් වහන්සේට මෙපවත් සැලකළා ය:— ''ස්වාමීනි, පියානන් වහන්ස, නුඹ වහන්සේගේ සමීපයෙහි වෙනත් භික්ෂු නමෙක් ඇද්දෝ හෝ?'' යි විචාළා ය. ''මහාඋපාසිකාවෙනි, අප ලඟ **නාගසෙන** නම් භික්ෂුනමෙක් ඇතැ'' යි වදළසේක. ''එසේ වීනම් පියානෙනි, අස්ස-ගුත්ත ස්ථවිරයන් වහන්ස, සෙට දවසට මාගෙන් බත් නාගසෙනයන් වහන්සේ සමඟ ස්වාමීන් වහන්සේ ඉවසා වදළ මැනව'' යි ආරාධනා කළා ය. එකල ආයුෂ්මත් අස්සගුත්ත තෙරුන් වහන්සේ තුෂ්ණීම් භාවයෙන් ඉවසූසේක.

ඉක්බිති ආයුෂ්මත් **අස්සගුත්ත**තෙරුන් වහන්සේ එදවස් රාත්‍රියගේ ඇවෑමෙන් පූර්වාහ්නසමයෙහි හැඳ පෙරව කයින් සිවුරු හා අතින් පාත්‍රය ගෙණ පසුමහණ කොට කැඳවා ගෙණ යන්නා වූ ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ හා සමග යම් තැනෙක මහාඋපාසිකාවගේ නිවෙසනය ද, එතැනට වැඩිසේක. එසේ වැඩ, පණවන ලද ආසනයෙහි වැඩ උන්සේක. ඉක්බිති ඒ මහාඋපාසිකාතොමෝ ආයුෂ්මත් **අස්සගුත්ත** තෙරුන් වහන්සේ ද ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේ ද ප්‍රණීත වූ ඛාද්‍යභොජ්‍ය ආහාරයෙන් ස්වහස්තයෙන් ම වැළඳවූවා ය. පෙරැත්ත කොට වැළඳ-වූවා ය. වළඳා ඉක්බිති ආයුෂ්මත් **අස්සගුත්ත** මහතෙරුන් වහන්සේ වැළඳූ[1] පාත්‍රයෙන් ඉවත් කරණ ලද අත් ඇති ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේට මෙපවත් කීසේක:— ''නාගසෙනයෙනි, තෙපි මහාඋපාසිකාවට

1. වැළඳවූවා

Non-Commercial Distribution

අනුමෝදනා කරව'' යි මේ වචනය කියා ආසනයෙන් නැඟිට විහාරයට වැඩිසේක. නැවැත ඒ මහාඋපාසිකාවෝ ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේට මෙපවත් කීවාහු ය: ''පියානෙනි, නාගසෙනයන් වහන්ස, මම වනාහි ඉතා මැහැල්ලමි[1]. ගම්භීර වූ ධර්මකථාවකින් මට අනුමෝදනා කර වදාළ මැනැවැ'' යි සැළකළාහ. ඉක්බිත්තෙන් ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ ඒ මහාඋපාසිකාවන්ට ගම්භීර වූ ලොකොත්තර වූ ශූන්‍යතා ප්‍රතිසංයුක්ත වූ අභිධර්මකථාවෙන් අනුමෝදනා කළසේක. ඉක්බිති ඒ මහාඋපාසිකාවෝ ද ඒ උන් ආසනයෙහි ම 'යම්කිසි සමුදයධර්මකෙනෙක් ඇද්ද ඒ සියල්ල ම නිරොධධර්මයායි' දන්නා වූ කෙලෙස්රජස් නැත්තා වූ පහ වූ ක්ලේශමලය ඇති ශ්‍රොතාපත්තිමාර්ගඥානය පහළ ව **(19)** නිවන් දුක්කාහ.

ආයුෂ්මත් වූ නාගසෙනයන් වහන්සේත් ඒ මහාඋපාසිකාවට අනුමෝදනා කොට තමන් දෙසූ ධර්මය ප්‍රත්‍යවෙක්ෂා කොට විදර්ශනා වඩා ඒ ආසනයෙහි ම හිඳ සෝවාන්ඵලයෙහි පිහිටිසේක. ඉක්බිත්තෙන් ආයුෂ්මත් **අස්සගුත්ත** මහතෙරුන්වහන්සේ තමන්ගේ වෙහෙර මණ්ඩලමාළකයෙහි උන්සේක්, දෙදෙනාගේ ම නිර්වාණධර්මප්‍රතිලාභය දිවැසින් දුක වදරා ''සාධු, සාධු, නාගසෙනයෙනි, එක ම හීසැරයෙන් ම ශරීරයෝ දෙදෙනෙක් විදිනා ලදහ'' යි කියා සාධුකාර පැවැත්වූසේක. ඒ අසා නොයෙක් දහස්ගණන් දෙවතාවෝ ද සාධුකාර පැවැත්වූහ. ඉක්බිති ආයුෂ්මත් වූ නාගසෙනයන් වහන්සේ වැඩ උන් ආසනයෙන් නැඟී සිට යම් තැනෙක ආයුෂ්මත් **අස්සගුත්ත**තෙරුන් වහන්සේ වසනසේක් ද, එතැනට වැඩිසේක. එසේ වැඩ ආයුෂ්මත් **අස්සගුත්ත** තෙරුන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව සිටිසේක. එකත්පස් ව සිටියා වූ ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේට ආයුෂ්මත් **අස්සගුත්ත** තෙරුන් වහන්සේ මෙපවත් කීසේක:— ''නාගසෙනයෙනි, තෙපි **පැළලුප්නුවරට** යව. පැළලුප් නුවර **අසොකාරාමයෙහි** ආයුෂ්මත් **ධම්මරක්ඛිත** ස්ථවිරයෝ වෙසෙති. ඔවුන්ගේ සමීපයෙහි දී බුද්ධවචනයන් උගණුව'' යි වදාළසේක. ''ස්වාමීනි. මෙතැන් පටන් **පැළලුප්නුවර** කොතෙක් දුර ද?'' යි විචාළසේක. ''නාගසෙනයෙනි, සියක්යොදුනෙකැ'' යි වදාළසේක. ''ස්වාමීනි, මාර්ගය ඉතා දුර ය. අන්තර්මාර්ගයෙහි භික්ෂාව දුර්ලභ ය. මම කෙසේ යෙම් ද?'' යි කීසේක. ''නාගසෙනයෙනි, අන්තර්මාර්ගයෙහි තොපට දවස් පතා නොයෙක් සූප හා අනෙක ව්‍යංජනයෙන් යුක්ත වූ කාළකභාවය දුරුවීමෙන් පිරිසිදු වූ සුවඳහැල්සාලෙන් කළ භොජනය ම පිණ්ඩපාතය ලැබෙයි. තෙපි යව'' යි වදාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්සැ'' යි කියා ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ ආයුෂ්මත් අස්සගුත්තතෙරුන් වහන්සේ වැඳ පැදකුණු කොට පාසිවුරු ගෙණ යම් දිසාභාගයෙක්හි පැළලුප්නුවර වීද, ඒ දිසාභාගයෙන් සැරිසරා වැඩිසේක.

---

1. මහල්ලෙමි

*Non-Commercial Distribution*

එසමයෙහි වනාහි වෙළෙඳාමෙහි ගොස් එන්නා වූ **පාටලීපුත්තක** සිටානෝ බඩු පිරූ ගැල්පන්සියයක් ගෙන්වා ගෙණ පැළලුප්නුවරට යන මාර්ගයට පැමිණියාහු ය. ඒ **පාටලීපුත්තක** සිටානෝ දුරින් ම එන්නා වූ ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේ දුටුවෝ ම ය. දැක පන්සියයක් ගැල් පොරොත්තු කොට යම් තැනෙක ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ ද, එතනට ගියෝ ය. ගොස් ආයුෂ්මත් නාගසෙනයන් අභිවාදනය කොට ''ස්වාමිදරුවන්වහන්ස, කොතැන්හි වඩනාසේක් දැ?'' යි විචාළෝ ය. ''ගෘහපතිය, **පැළලුප්නුවරට** යම්හ'' යි වදාළසේක. ''යහපත ස්වාමීනි, අපිත් පැළලුප්නුවරට යම්හ. අප හා සමඟ සැප සේ වැඩිය මැනැවැ'' යි ආරාධනා කොට කැඳවා ගෙණ යෙමින් නැවත **පාටලීපුත්තක** සිටානෝ ආයුෂ්මත් වූ **නාගසෙන** ස්ථවිරයන් වහන්සේගේ ඊර්යාපථයෙහි පැහැද ආයුෂ්මත් වූ නාගසෙනයන් වහන්සේට ප්‍රණීත වූ ඛාද්‍යභොජ්‍යාහාරයෙන් ස්වහස්තයෙන් ම වළඳවා සම්ප්‍රවාරණය කොට වළඳවා ආයුෂ්මත් **(20)** නාගසෙනයන් වහන්සේ වැළඳූ පාත්‍රයෙන් ඉවත් කරණ ලද අත් ඇති ව වළඳා ඉක්බිති වූ කල්හි සිටානෝත් අන්‍යතරනීචාසනයක් ගෙණ එකත්පසෙක හුන්නාහ. එකත්පස් ව හුන්නා වූ **පැළලුප්නුවර** සිටානෝ ආයුෂ්මත් නාගසෙන ස්ථවිරයන් වහන්සේට මෙපවත් කීහ:— ''ස්වාමිපුත්‍රයාණෙනි, තෙපි කවර නම් වන්නහු දැ?'' යි විචාළෝ ය. ''ගෘහපතියෙනි, මම නාගසෙන නමැ'' යි කීසේක. ''ස්වාමිපුත්‍රයාණෙනි, තෙපි බුද්ධවචනය නම් ධර්මයක් දන්නාසේක් දැ?'' යි විචාළෝ ය. ''ගෘහපතියෙනි, මම අභිධර්මපදයන් මඳක් දනිමි'' යි කීසේක. ''ස්වාමිපුත්‍රයාණෙනි, අපට වූයේ මහාලාභයෙක. 'ස්වාමිදරුවාණෙනි, අප ලද්දේ යහපත් ලාභයෙක. 'ස්වාමිදරුවාණෙනි, මමත් පෙර අභිධර්මය ඇසූ උපාසකයෙක්මි. 'ස්වාමිදරුවාණෙනි, නුඹවහන්සේත් අභිධර්මය දන්නාසේක. 'ස්වාමිදරුවාණෙනි, අභිධර්මපදයන් වදාළ මැනැවැ'' යි ආරාධනා කළෝය. ඉක්බිති ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ **පාටලීපුතත්ක** සිටානන්ට අභිධර්මය දෙශනා කළසේක. දෙශනා කරණ කල්හි ම ධර්මයෙහි ම සිත ගියා වූ පාටලීපුත්තක සිටානන්ට යම් කිසි උත්පත්තිකරධර්මයෙකනෙක් ඇද්ද, ඒ සියලු ම තෘෂ්ණා ධර්මය නිරුද්ධස්වභාව වන්නේ ය යි **දන්නා** වූ පහ වූ රාගරජස් ඇති දුරු වූ ක්ලේශමල ඇති නිර්වාණධර්මය දක්නා දිව ඇස් පහළ ව සොවාන් වූහ.

ඉක්බිති **පාටලීපුත්තකසිටානෝ** පන්සියයක් පමණ ගැල් ඉදිරියෙහි ගමන් කරවා තෙමේ පසුපස්සෙහි යනුවෝ[1] පැළලුප් නුවරට නුදුරු තෙන දෙමංසන්ධියෙක සිට ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේට මෙපවත් සැළකළෝ ය. ''ස්වාමිදරු වූ නාගසෙනයෙනි, **අසෝකාරාමයට** යන මාර්ගය මේ මඟ ය'' යි කියා මඳක් තැන් ගොස් තමාගේ රක්ත කම්බිලිය පූජා කරණු කැමැති ව කියනුවෝ[2] ''ස්වාමිදරුවාණෙනි, මාගේ මේ රක්තකම්බිලිය දිගින් සොළොස් රියන ය. පළලින් අටරියන ය. ''ස්වාමි

1. යනුයේ 2. කියනුයේ

Non-Commercial Distribution

දරුවාණෙනි, මට අනුකම්පා උපදවා මේ රක්තකම්බිලිය පිළිගෙණ වදළ මැනැවැ'' යි කියා පූජා කළෝ ය. ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ අනුකම්පා උපදවා ඒ රක්තකම්බිලිය පිළිගත්සේක. ඉක්බිති පාටලිපුත්‍රක සිටාණෝ සන්තොස වූහ. ඔද වැඩියා වූ සිත් ඇති ව ප්‍රමුදිත වූ හෘදයෙන් යුක්ත ව ප්‍රීතිසොම්නස් උපදවා ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේට ආදරයෙන් පසඟ පිහිටුවා වැඳ ප්‍රදක්ෂිණා කොට අවසර ගෙණ ගියෝ ය. ඉක්බිත්තෙන් ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ **අශෝකාරාමය** යම් තැනක ද, ආයුෂ්මත් **ධම්මරක්ඛිත** තෙරුන් වහන්සේ යම් තැනෙක ද, එතැනට එළඹිසේක. එසේ එළඹ ආයුෂ්මත් **ධම්මරක්ඛිත** තෙරුන් වහන්සේට අභිවාදනය කොට තමන් ආ කාරණය කියා ආයුෂ්මත් ධම්මරක්ඛිතතෙරුන් වහන්සේ සමීපයෙහි ත්‍රිපිටකබුද්ධවචනයන් එකොද්දෙශයෙන් ම තුන්මාසයකින් ව්‍යඤ්ජනවශයෙන් නිමවා ඉගෙණ නැවැත තුන්මාසයකින් අර්ථවශයෙන් මෙනෙහි කළසේක. ඉක්බිති ආයුෂ්මත් **ධම්මරක්ඛිත** ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේට මෙපවත් කීසේක. ''එම්බා නාගසෙනයෙනි, යම් සේ ගවපාලයා ගවයන් රක්ෂා කෙරේ ද, පඤ්චගොරසය අනික් සෙස්සෝ අනුභව **(21)** කෙරෙද් ද, එපරිද්දෙන් ම නාගසෙනයෙනි, තෙපි ත්‍රිපිටකබුද්ධවචනය ඉගෙණ සමර්ථ ව ධරන්නහු වූ නමුත් ශ්‍රාමණ්‍යගුණයාගෙ අර්ථරසයට භාගී නො වන්නහු ය'' යි වදළසේක. ''ස්වාමීනි, ඒ කුමක් වේවයි, නුඹවහන්සේ මට ඉගැන්නු මේ ධර්මය විචරකින් ම පමණ. අර්ථරසය උගන්වන්ට වෙහෙස නො වන්නැ'' යි කියා එදවස් රාත්‍රිභාගයෙහි ම උගත්තා වූ ධර්මයාගෙ අර්ථරසය ආස්වාදනය කෙරෙමින් එම රාත්‍රිභාගයෙහි ම සිවුපිළිසිඹියා හා සමග රහත්ඵලයට පැමිණිසේක. ආයුෂ්මත් වූ නාගසේනයන් වහන්සේ චතුස්සත්‍යය ප්‍රතිවෙධය හා සමග ම සියලූ දෙවියෝ ම සාධුකාර දුන්හ. මහපොළොව ගුගුරා පැන නැංගේ ය. මහා බ්‍රහ්මයෝ සතුටින් පැන නැඟී අත් පොළසන් දුන්හ. දිව්‍යසඳුන්සුණු හා පරසතුමදුරා පුෂ්පයෝ මුළුලොව සුවඳ කෙරෙමින් අහසින් වර්ෂා කළාහු ය.

එසමයෙහි වනාහි කෙළසියයක් පමණ රහතන් වහන්සේ **හිමාලය** පර්වතයෙහි **රක්ඛිත** නම් තලයට රැස් ව හිඳ ''අපි සියලුදෙනා වහන්සේ ම **නාගසෙනයන්** දක්නා කැමැතියම්හ. එහෙයින් නාගසෙන ස්ථවිරයෝ එනසේක්වා'' යි කියා ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේගේ සමීපයට දූතනමක් හැරියසේක්ලා ය. ඉක්බිති ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ දූතයාගෙ වචනය අසා අශෝකාරාමයෙන් අන්තර්ධාන ව හිමාලය පර්වතයෙහි රක්ඛිත තලයෙහි සිටි කෙළසියයක් රහතුන් වහන්සේගේ ඉදිරියෙහි පහළ වූසේක. ඉක්බිති කෙළසියයක් පමණ රහතුන් වහන්සේ ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේට මෙපවත් කීසේක්ලා ය. ''නාගසෙන

*Non-Commercial Distribution*

යෙනි, මේ වනාහි මිලිඳුරජ්ජුරුවෝ දෘෂ්ටිවාදප්‍රතිවාදයෙන් ප්‍රශ්න විචාරා භික්ෂුසංඝයා වෙහෙසන්නෝ ය. නාගසෙනයෙනි, යහපත, තෙපි ගොස් මිලිඳුරජ්ජුරුවන් දමනය කරව'' යි වදළාහු ය.

එකල නාගසෙනයන්වහන්සේ කියනසේක් ''ස්වාමීනි, හැම දෙනා වහන්සේ ඊට උත්සාහ නො කොට වැඩහුන මැනැව. එක ම මිලිඳුරජෙකු තබා, 'ඉදින් ස්වාමීනි, සකල ජම්බුද්වීපයෙහි රජහු අවුත් මා අතින් ප්‍රශ්න විචාළාහු නමුත් ඒ සියලු ප්‍රශ්න විසඳා සම්ප්‍රදලනය කෙරෙමි. 'ස්වාමීනි, ඔබවහන්සේලා හැම දෙනා ම අසම්භීත ව සාගලපුරනුවරට වැඩ වදළ මැනැවැ'' යි කීසේක. ඉක්බිති මහාථෙරභික්ෂූන් වහන්සේ ගොස් සාගලපුර නුවර කාසායවස්ත්‍රයෙන් බබුළුවා ක්ෂීණාශ්‍රවසෘෂිවරයන්ගේ ගමනාගමන යෙන් ජනිත වූ චීවරවාතයෙන් ප්‍රතිවාතය කළාහු ය. එසමයෙහි වනාහි ආයුෂ්මත් ආයුපාල නම් මහතෙරුන් වහන්සේ සංඛෙය්‍ය නම් පිරිවෙණ වසනසේක.

ඉක්බිති මිලිඳුරජ්ජුරුවෝ අමාත්‍යයන්ට මෙපවත් කීහ:— ''පින්වත්නි, චන්ද්‍රකාන්තියෙන් යුක්ත වූ රාත්‍රිතොමෝ එකාන්තයෙන් ම සිත්කලු ය. කිමෙක් ද? අද රෑ සාකච්ඡා කරණු පිණිස ප්‍රශ්න අසනු පිණිස ශ්‍රමණයකු කරා හෝ බ්‍රාහ්මණයකු කරා හෝ එළඹෙමු ද? කවර කෙනෙක් මා හා සමග කථා කරන්නට කාංක්ෂාවිනොදනය කරන්නට හැකි[1] වෙත් දැ?''යි විචාළහ. මෙසේ කී (22) කල්හි පන්සියයක් යොන්අමාත්‍යයෝ මිලිඳු රජ්ජුරුවන්ට මෙපවත් කීවාහු ය:— ''මහරජ්ජුරුවෙනි, පිටකත්‍රය දන්නා බුද්ධාගම දන්නා බහුශ්‍රැත වූ ආයුපාල නම් තෙරණු කෙනෙක් ඇත. ඒ ආයුපාල නම් තෙරුන් වහන්සේ දැන් මේ ප්‍රස්තාවයට සංඛෙය්‍ය නම් පිරිවෙණ වසනසේක. 'දෙවයන් වහන්ස, නුඹ වහන්සේ වැඩ වදළ මැනව. ආයුෂ්මත් ආයුපාලස්ථවිරයන් අතින් ප්‍රශ්න අසා වදළ මැනැව''යි කීවාහු ය. ''එසේ වී නම්, සගයෙනි, ඒ පින්වත්හට අප එන පවත් කියව'' යි කීහ. ඉක්බිති නෙමිත්තක නම් යොන්ඇමතිතෙම ආයුෂ්මත් ආයුපාලතෙරුන් වහන්සේ සමීපයට ගොස් ''ස්වාමීන් වහන්ස, මිලිඳු රජජුරුවෝ ආයුෂ්මත් ආයුපාලයන් වහන්සේ දක්නා කැමැතිසේකැ'' යි කියවයි කියා දූතයෙකු හැරියෝ ය. එකල ආයුෂ්මත් ආයුපාලයන් වහන්සේ දූතයාගේ වචනය අසා මෙසේ කීසේක:— ''එසේ වී නම් රජ එන්ව'' යි වදළසේක.

ඉක්බිති මිලිඳුරජ්ජුරුවෝ පන්සියයක් යොන්ඇමැතියන් පිරිවරා උතුම් රථවාහනයකට පැන නැඟී සංඛෙය්‍ය නම් පිරිවෙණ යම් තැනෙක ද, ආයුෂ්මත් ආයුපාල ස්ථවිරයෝ යම් තැනෙක ද, එතැනට එළඹියාහ. එසේ එළඹ ආයුෂ්මත් වූ ආයුපාල ස්ථවිරයන් හා සමඟ සතුටු වූහ. සමඟ සතුටු විය යුතු වූ සිහි කට යුතු වූ කථා කොට නිමවා එකත්පසෙක හුන්නාහ. එකත්පසෙක උන්නා වූ මිලිඳුරජ්ජුරුවෝ ආයුෂ්මත් ආයුපාල

1. වේ

Non-Commercial Distribution

ස්ථවිරයන් වහන්සේට මෙපවත් කීහ:— "වහන්ස, ආයුපාල ස්ථවිරයෙනි, නුඹවහන්සේලාගේ ප්‍රව්‍රජ්‍යාව කවර අර්ථයක් පිණිස ද? නුඹ වහන්සේලාගේ මේ මහණ වීමෙහි උතුම් පර්මාර්ථය කවරේ ද?' යි විචාළෝ ය. තෙරුන් වහන්සේ ඒ අසා 'මහරජානෙනි, අපගේ ප්‍රව්‍රජ්‍යාව ධර්මයේ හැසිර නිවන් දක්නා පිණිස ය" යි වදළසේක. "ස්වාමීන් වහන්ස, ධර්මචර්යා ශමචර්යාවෙන් යුක්ත වූ කිසි ගෘහස්ථ කෙනෙකුත් ඇද් ද?" යි විචාළෝ ය. "එසේ ය, මහරජානෙනි, ධර්මචාරී ශමචාරී වූ ගෘහස්ථයෝත් ඇත. මහරජ, අප භාග්‍යවත් තිලෝගුරු බුදුන් විසින් **බරණැස්** නුවරෙහි වූ **මිගදය** නම් වූ **ඉසිපතනාරාමයෙහි** දී **ධර්මචක්‍රසූත්‍රය** දෙශනා කරණ කල්හි අටළොස්කෝටියක් බ්‍රහ්මයන්ට ධර්මාභිසමය වූයේ ය. දෙවතාවන්ගේ ධර්මාභිසමය වනාහි ගණනපථය අතික්‍රාන්ත වූයේ ය. ඒ සියල්ලෝ ම ගෘහස්ථ වූවෝ ම ය. ප්‍රව්‍රජිතයෝ නො වෙති. නැවත ද, මහරජානනි, අනිකකුත් ගෙණ හැර දක්වමි— අප භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ විසින් **මහාසමයසූත්‍රාන්තය** දෙශනා කරණ කල්හි ද, **මහාමංගලසූත්‍රාන්තය** දෙශනා කරණ කල්හි ද, **සමචිත්ත පරියායසූත්‍රාන්තය** දෙශනා කරණ කල්හි ද, **රාහුලොවාදසූත්‍රාන්තය** දෙශනා කරණ කල්හි ද, **පරාභවසූත්‍රාන්තය** දෙශනා කරණ කල්හි ද ගණනපථය අතික්‍රාන්ත වූ දෙවතාවුන්ට ධර්මාභිසමය වූයේ ය. ඒ සියල්ලෝ ම ගෘහස්ථ වූවෝ ම ය. ප්‍රව්‍රජිත වූවෝ නො වෙති" යි වදළ සේක.

"එසේ වී නම, වහන්ස, **ආයුපාලස්ථවිරයෙනි**, නුඹවහන්සේලාගේ ප්‍රව්‍රජ්‍යාව නිරර්ථකය. කිසි ප්‍රයෝජනයෙක් නැත. පෙර කළා වූ අකුශල කර්මයාගේ විපාකයෙන් ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ හිසරවුළු මුඩු කොට[1] ගෙණ විචිත්‍රවස්ත්‍ර හැර එකවර්ණපිළී ගෙණ අගමුල සිඳ බිඳ කපා ගොතා පඩු පොවා වර්ණ විනාශ **(23)** කොට ගෙණ හැඳ නොයෙක් ඥතිමිත්‍ර අඹුදරුග්‍රාමක්ෂේත්‍රධනධාන්‍යාදී ඓශ්වර්ය සම්පත් හැර පැවිදි වෙති. තෙළෙස් ධූතාංගයන් ද පරිහරණය කෙරෙති. 'වහන්ස, ආයුපාල ස්ථවිර යෙනි, එකාසනිකංගය පුරණ යම් ඒ භික්ෂුකෙනෙක් ඇද් ද, ඒ භික්ෂූන් වහන්සේලා ද එකාන්තයෙන් ම පූර්වජාතියෙහි අනුන්ගේ වස්තු සොරා ගත් සොරු ය. උන්වහන්සේලා අනුන්ගේ වස්තු ඒ උදුරා ගෙණ අකුශල කර්මයාගේ විපාකයෙන් දුන් මේ ජාතියෙහි එකාසනික වන්නාහ. අකුශලකර්මයෙන් කලින් කලට වළඳන්ට නො ලැබෙති. එක් වේලක ම වළඳති. එපමණෙක මුත් ඔවුන්ගේ ශීලයෙක් නම් නැත. තපසෙක් නම් නැත. බ්‍රහ්මචර්යාවකුදු නැතැ" යි කීහ. තව ද "පින්වත් ආයුපාලයන් වහන්ස, යම් ඒ භික්ෂු කෙනෙක් වනාහි අබ්භොකාසිකංගය පුරන්නාහු ද, ඒ භික්ෂූහු ඒකාන්තයෙන් ම පූර්වජාතියෙහි ගම් පැහැර ගෙවල් ගිනි ලා සත්වයන්ට වෙහෙස දුන් සොරු ය.[2] ඔවුහු අනුන්ගේ ගෙවල් නසා දමා ඒ අකුසලකර්මයාගේ විපාකයෙන් මේ ජාතියෙහි අබ්භොකාසිකංගය

1. මුඩුව 2. සොරානෝ

Non-Commercial Distribution

පුරන්නාහු වෙති. තමන් කළ අකුශලකර්මයෙන් සෙනාසනයන් පරිභොග කරන්නට නො ලබන්නාහු වෙති. එපමණක් මිස ඔවුන්ට ශීලයෙක් නම් නැත. තපසෙක් නම් නැත. බ්‍රහ්මචර්යයෙක් නම් නැතැ'' යි කීහ. ''තව ද, ස්වාමීනි, **ආයුපාල** ස්ථවිරයෙනි, නිදි වර්ජිත කරණ නෙසජ්ජික නම් යම් ඒ භික්ෂුකෙනෙක් ඇද්ද, ඒ භික්ෂූහු එකාන්තයෙන් ම පූර්ව ජාතියෙහි මං පහරණ සොරු [1]ය. ඔවුන් මහ යන එන්නන් අල්වා ගෙණ අඩු බඩු කොල්ල කමින් ඔවුන්ට රුදවල් නිදි වැද්ද නො දී ගස් බැඳ හිඳුවා ඒ අකුශලකර්මවිපාකයෙන් මේ ජාතියෙහි ඔහු නිදි නො ලැබ නෙසජ්ජික වන්නාහු වෙති. සයනයක පිට තබා සයනය කරන්නට නො ලැබෙති. ඒ මිසක් ඔවුන්ගේ ශීලයෙක් නම් නැත. තපසෙක් නම් නැත. ශ්‍රෙෂ්ඨ චර්යාවෙක් නම් නැතැ'' යි කීහ. මෙසේ මිලිඳුරජ්ජුරුවන් කී කල්හි ආයුෂ්මත් **ආයුපාල**ස්ථවිරයන් වහන්සේ සිතනසේක් ''මේ රජ බණ අසන්ට අවුත් අසන බණ තබා අනික් මහක යෙයි. මේ නිසා රජහට බණ කීමෙන් ප්‍රයෝජන කිම් ද?'' යි කිසිවක් නො වදරා තුෂ්ණීම්භූත ව වැඩ හුන්සේක.

ඉක්බිති පන්සියයක් යොන්අමාත්‍යයෝ තෙරුන්වහන්සේ තුෂ්ණීම්භූත ව හිඳිනා දැක මිලිඳුරජ්ජුරුවන්ට මෙපවත් කීවාහු ය ''දෙවයන් වහන්ස, තෙරුන් වහන්සේ පණ්ඩිතසේක. එතෙකුදු වුවත් අවිසාරද බැවින් කිසිවක් වදරන්නේ නැතැ'' යි කීවාහු ය. ඉක්බිති මිලිඳුරජ්ජුරුවෝ ආයුෂ්මත් **ආයුපාල**තෙරුන් වහන්සේ තුෂ්ණීම්භූත ව හුන්නා දැක අත්පොළසන් දී ඔල්වර හඬ ගසා පිරිවරා හුන් යොන්ඇමතියන්ට මෙපවත් කීහ:— ''එම්බා සගයෙනි, මේ සකල **ජම්බුද්වීප**යෙහි පණ්ඩිතයෙක්[2] නැත. එබැවින් එකාන්තයෙන් ම සිස් ව ගියේ ය. 'එම්බා සගයෙනි, මේ සකලජම්බුද්වීපය පණ්ඩිතගොචර වූ අර්ථරසයක් අසන්නට නැති බැවින් එකාන්තයෙන් ම ප්‍රලාප විය. යම් කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මා හා සමහ කථා කරන්නට— කාංක්ෂා විනොදනය කරන්නට— හැකි වේ ද, එබඳු කෙනෙක් නැතැ'' යි කීහ. අමාත්‍යයෝ කිසිවක් නො කියා උන්හ. ඉක්බිති **(24)** ඒ සියලු ම අමාත්‍යපිරිස දෙස නැවැත නැවැත්[3] බලන්නා වූ මිලිඳුරජහට අභීත ව කිසි සැකයක් නැති ව හුන් යොන්අමාත්‍යයන් දැක මෙබඳු සිතෙක් වූයේ ය. ''යම් කාරණයකින් මේ යොන්අමාත්‍යයෝ කිසි සැකයක් නැති ව උන්නාහු ද, ඒ කාරණයෙන් යමෙක් මා හා සමහ කථා කරන්නට සමර්ථ වේ ද, එබඳු වූ අනික් කිසි පණ්ඩිත වූ භික්ෂූන් වහන්සේ නමක් එකාන්තයෙන් සැක නැති ව ම ඇතැ'' යි සිතමින් රජතෙමේ මහත් වූ අභිමානයෙන් පෙරළා රාජභවනයට ම ගියේ ය.

එසමයෙහි වනාහි සංඝනායක වූ ගණනායක වූ ගණාචාර්ය වූ ලොක ප්‍රසිද්ධ වූ කීර්ති ඇත්තා වූ බොහෝ ජනයා විසින් යහපත් කෙනෙකැ යි සම්මත කරණ ලද්ද වූ පණ්ඩිතත්වයට පැමිණියා වූ ව්‍යක්ත වූ මහත්

1. සොරනෝ 2. පණ්ඩිතයක්හු 3. ඔහිතොබ

Non-Commercial Distribution

ප්‍රඥව ඇත්තා වූ දක්ෂ වූ විශෙෂයෙන් අවබොධ කරණ ලද ප්‍රඥව ඇත්තා වූ විශෙෂයෙන් භාවිත වූ ප්‍රඥව ඇත්තා වූ ලෞකිකලොකොත්තරගුණ ධර්මයෙහි හික්මුනා වූ විශාරද වූ බහුශ්‍රැත වූ පිටකත්‍රයධාරි වූ සියලු අර්ථයන්ගෙ කෙළවරට පැමිණියා වූ අවබොධ කරණ ලද ප්‍රඥාවිශෙෂ ඇත්තා වූ එකශ්‍රැතියෙන් සිතට නැඟුනු ආගම ඇත්තා වූ පැමිණෙන ලද ප්‍රතිසම්භිදප්‍රඥව ඇත්තා වූ නවාංගශාස්තෘශාසනපර්යාප්තිධර වූ සර්වඥ වචනයෙහි කෙළ පැමිණියා වූ ධර්මාර්ථදෙශනාප්‍රතිවෙධයෙහි දක්ෂ වූ ක්ෂය නො වන විසිතුරු වූ වැටහෙන ප්‍රඥව ඇත්තා වූ චිත්‍රකථික වූ මනොඥ වූ වාක්කරණයෙන් යුක්ත වූ අන්‍යදෘෂ්ටිකවාදියකු විසින් ලංවිය නො හැක්කා වූ අන්‍යදෘෂ්ටිකයකු විසින් මැඩ ගත නො හැක්කා වූ අන්‍ය දෘෂ්ටිකයකු විසින් උත්තරයක් කිය නො හැක්කා වූ සමුද්‍රය මෙන් කිසි කෙනකුන් විසින් ආවරණයක් කළ නො හැක්කා වූ කිසිවකු විසින් අධිගතගුණයෙන් චලක්වා ගත නො හැක්කා වූ මහාසාගරය මෙන් කැලඹිය නො හැක්කා වූ මහාමෙරුරාජයා මෙන් නිශ්චල වූ තදංගාදීන් පහ කරණ ලද ක්ලේශයුද්ධ ඇත්තා වූ මොහාන්ධකාරය දුරු කරන්නා වූ ප්‍රඥාලොකය ලොවට ප්‍රකාශ කරන්නා වූ මහාකථීශ්වර වූ අන්‍යගණ ජ්‍යෙෂ්ඨසමූහයන්ගෙ වාද මථනය කරන්නා වූ අන්‍යතීර්ථකයන්ගෙ අහංකාරය මර්දනය කරන්නා වූ භික්ෂුභික්ෂුණී උපාසකඋපාසිකා රාජ රාජමහාමාත්‍යයන් විසින් සත්කාර කරණ ලද්ද වූ ගෞරව කරණ ලද්ද වූ සිතින් ආදර කරණ ලද්ද වූ යථාශක්තීන් පුදන ලද්ද වූ සත්කාර කරණ ලද්ද වූ චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්‍රත්‍යයභෛෂජ්‍ය පරිෂ්කාරයන් ලාභී වූ ලාභයෙන් හා යශසින් අග්‍රප්‍රාප්ත වූ ශ්‍රමණගණයා විසින් පිරිවරණ ලද්ද වූ ආයුෂ්මත් **නාගසේනස්ථවිරයන්** වහන්සේ ඥනාභිවෘද්ධි ඇත්තා වූ අසා දූරීමෙන් යුක්ත වූ නුවණැත්තවුන්ට මෙලෝ පරලෝ වැඩ දක්වමින් නවාංගසර්වඥශාසනය නමැති රත්නය ගෙණ හැර දක්වමින් උතුම් වූ නිර්වාණධර්මය දක්වා වදරමින් සද්ධර්ම නමැති ප්‍රදීපය නගා දරමින් සද්ධර්ම නමැති යාගස්තම්භය ඔසොවමින් සද්ධර්ම නමැති මහාදනය දෙමින් සද්ධර්මධ්වජය උසස් කොට නගමින් සද්ධර්මජයපතාකය නභා කෙළවමින් සද්ධර්ම නමැති ජයසංඛය ඌර්ධ්ව කොට අල්ලා පිඹිමින් සද්ධර්ම නමැති ජයබෙරය **(25)** ගසමින් අභිතසිංහනාද ඥනගර්ජිතය ගර්ජනා කෙරෙමින් මධුරස්වරගර්ජනා නමැති ශ්‍රෙෂ්ඨ වූ මෙඝගර්ජනාවෙන් යුක්ත වූ උතුම් වූ ප්‍රඥ නමැති විජ්ජුල්ලතාවෙන් චලදනා ලද්ද වූ කරුණා නමැති සිසිරජලයෙන් හරිත වූ මහත් වූ සද්ධර්මාමෘතවර්ෂාවෙන් සියලු ලෝකයා මනා කොට සන්තර්පනය කෙරෙමින් ග්‍රාමනිගමරාජ ධානියෙහි සැරිසරා වඩනාසේක් අනුක්‍රමයෙන් ගොස් **සාගල** නම් නුවරට පැමිණිසේක.

එහි වනාහි ආයුෂ්මත් **නාගසෙනස්ථවිරයානෝ** අසූදහසක් පමණ භික්ෂුසංඝයා වහන්සේ හා සමඟ **සංඛෙය්‍ය** නම් පිරිවෙණෙහි වාසය කරණසේක. එහෙයින් ඒ බව හඟවන පූර්වාර්යයන් විසින් කියන ලදී:—

*Non-Commercial Distribution*

''බහුස්සුතො චිත්‍රකථී–නිපුණො ච විසාරදො,
සාමයිකො ච කුසලො–පටිභාණො ච කොවිදො.

තෙ ච තෙපිටකා භික්ඛූ–පඤ්චනෙකායිකාපි ච,
චතුනෙකායිකා චෙව–නාගසෙනං පුරක්ඛරුං.

ගම්භීරපඤ්ඤො මෙධාවී–මග්ගාමග්ගස්ස කොවිදො,
උත්තමත්ථං අනුප්පත්තො–නාගසෙනො විසාරදො.

තෙහි භික්ඛූහි පරිවුතො–නිපුණෙහි සච්චවාදිහි,
චරන්තො ගාමනිගමං–සාගලං උපසංකමි.

සංඛෙය්‍ය පරිවෙණස්මිං–නාගසෙනො තදා වසී,
කථෙසි සො මනුස්සෙහි–පබ්බතෙ කෙසරී යථා'' යි.

මෙසේ යථෝක්ත ගුණානුභාවයෙන් යුක්ත ව අභීතකෙශර සිංහ රාජයකු මෙන් වැඩ වසන කල්හි ඉක්බිති එක් දවසක් **මිලිඳුරජ්ජුරුවෝ** යොන්අමාත්‍යයන්ට ආමන්ත්‍රණය කොට මෙපවත් කීහ. ''එම්බා සගයෙනි, මා හා සමඟ කථා කරන්නට මාගේ කාංක්ෂා විනෝදනය කරන්නට යමෙක් සමර්ථ ද, එබඳු අනික් පණ්ඩිත වූ භික්ෂුවෙක්[1] ඇද් ද?'' යි විචාළහ. ඉක්බිති ඒ අසා **දෙවමන්ත්‍රී** නම් අමාත්‍යයා **මිලිඳුරජහට** මෙ කාරණය කියේ ය. ''දේවයන් වහන්ස, නුඹ වහන්සේ මඳක් කල් ඉවසුව මැනව. 'දෙවයන් වහන්ස, නුඹ වහන්සේ මඳක් කල් වැඩහුන මැනැව. දේවයන් වහන්ස, පණ්ඩිත වූ ව්‍යක්ත වූ ප්‍රඥාවත් වූ නුවණින් ම සුශික්ෂිත වූ විශාරද වූ බහුශ්‍රැත වූ චිත්‍රකථික වූ සූන්දර වූ විදර්ශනා නුවණින් යුක්ත වූ අර්ථධර්මනිරුක්තිප්‍රතිභාන යන සිවුපිළිසිඹියායෙහි පාරප්‍රාප්ත වූ **නාගසෙන** නම් ස්ථවිරනමෙක් ඇත. උන් වහන්සේ දැන් **සංඛෙය්‍ය** නම් පිරිවෙණ වසන සේක. දෙවයන් වහන්ස, නුඹ වහන්සේ වැඩ වදළ මැනැව. **නාගසෙන** නම් ආයුෂ්මතුන් වහන්සේ අතින් ප්‍රශ්න ඇසුව මැනැව. උන්වහන්සේ නුඹ වහන්සේ හා සමඟ කථා කරන්නට කාංක්ෂා විනෝදනය කරන්නට සමර්ථ වනසේකැ'' යි කියේ ය. ඉක්බිති **මිලිඳුරජ** **නාගසෙන** ය යි යන ශබ්දය අසමින් ම යුහු ව ම භය වූයේ ම ය. තැති ගැන්ම වූයේ ම ය. ලොමුදහ ගැන්ම වූයේ ය. ඇඟින් ඩා සෙල වී තැති ගෙණ සිටත් රාජධෛර්යය **(26)** උපදවා ගෙණ නැවැත මිලිඳුරජ **දෙව-මන්ත්‍රී** නම් අමාත්‍යයාහට මෙපවත් කී ය. ''එම්බල සගය, **නාගසෙන** භික්ෂු මා හා සමඟ කථා කරන්නට සමර්ථ ද?'' යි විචාළේ ය. ''කිමෙක් ද දෙවයන් වහන්ස, **ඉන්ද්‍රයමවරුණකුවෙරප්‍රජාපති සුයාමසන්තුසිත** ලොක පාලයන් හා ද පීතෘ[2] වූ මහාබ්‍රහ්මයා සමඟ ද කථා කරන්නට සමර්ථ වන සේක. මනුෂ්‍ය වූවන් සමඟ කථා කිරීම කියනු ම කවරේ ද?'' යි කීයේ ය.

---

1. භික්ෂුවක්හු 2. පිතා පිතෘ

Non-Commercial Distribution

ඒ අසා නැවත මිලිඳු රජ්ජුරුවෝ **දෙවමන්ත්‍රියාහට** මෙපවත් කීහ:— ''එසේ වී නම්, **දෙවමන්ත්‍රිය,** තෝ ඒ පින්වතුන් වහන්සේගේ සන්තිකයට දූතයකු හරුව'' යි කීහ. 'එසේ ය, දෙවයන් වහන්ස' යි කියා **දෙවමන්ත්‍රි** නම් අමාත්‍යයා ''ස්වාමීනි, **මිලිඳුරජ්ජුරුවෝ** ආයුෂ්මතුන් වහන්සේ දක්නා කැමැති සේක'' යි කියා ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේගේ සමීපයට දූතයකු පිටත් කෙළේ ය. එකල ආයුෂ්මත් නාගසෙන ස්ථවිරයෝ ද එපරිද්දෙන් ම එසේ වී නම්, මහරජතෙමේ එන සේ මැනැවැ'' යි වදළසේක. ඉක්බිති මිලිඳුරජ්ජුරුවෝ පන්සියයක් යොන් ඇමතියන් විසින් පිරිවරණ ලදුව සෛන්ධවයන් යෙදූ උතුම් රථවාහනයකට පැන නැගී මහත් වූ බලසෙනාව හා සමඟ යම් තැනෙක **සංඛෙය්‍ය** නම් පිරිවෙණ වී ද, යම් තැනෙක ආයුෂ්මත් **නාගසෙනස්ථවිරයන්** වහන්සේ වැඩ වසනසේක් ද, එතැන්හි එළඹියාහ. එසමයෙහි වනාහි ආයුෂ්මත් **නාගසෙනස්ථවිරයානෝ** අසූදහසක් පමණ භික්ෂුසංඝයා හා සමඟ මණ්ඩලමාළකයෙහි වෘත්තාකාරයෙන් වැඩහුන්සේක. එකල මිලිඳු රජ්ජුරුවෝ ආයුෂ්මත් නාගසෙන ස්ථවිරයන් වහන්සේගේ සංඝපිරිස දුර දී ම දුටුවෝ ම ය. දැක **දෙවමන්ත්‍රියාට** මෙපවත් කීහ:— ''**දෙවමන්ත්‍රිය** මේ මහත් වූ පිරිස කාගේ ද?'' යි විචාළහ. දෙවමන්ත්‍රියා ඒ අසා ''දෙවයන් වහන්ස, ආයුෂ්මත් **නාගසෙනස්ථවිරයන්** වහන්සේගේ පිරිස ය'' යි කීයේ ය.

ඉක්බිති මිලිඳුරජ ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේගේ පිරිස දුර දී ම දැක භය වූයේ ම ය. තැති ගැන්ම වූයේ ම ය. ඇඟ ඩා සෙල වී ලොමු දහ ගත්තේ ම ය. ඉක්බිති **මිලිඳුරජ්ජුරුවෝ** කහවෙසණුන් විසින් පිරිවැරූ ඇතකු මෙන් ද, ගුරුළුන් විසින් පිරිවැරූ නයකු මෙන් ද, පිඹුරන් විසින් පිරිවැරූ සිගාලයකු මෙන් ද, මීගොනුන් විසින් පිරිවැරූ වලසකු මෙන් ද, නයකු ලුහුබැඳ ගත් මැඩියකු මෙන් ද, දිවියකු ලුහුබැඳ ගත් මුවෙකු මෙන් ද, අහිගුණ්ඨකයකු අතට පැමිණි නයකු මෙන් ද, බළලෙකු ලඟට පැමිණි මීයකු මෙන් ද, යකැදුරකු සමීපයට පැමිණි ප්‍රෙතයකු මෙන් ද, රාහුමුඛයට පැමිණි චන්ද්‍රයා මෙන් ද, පෙලාන්තරගත නයකු මෙන් ද, මැදිරියකට පැමිණි පක්ෂියකු මෙන් ද, දැලට පැමිණි මසකු මෙන් ද, ව්‍යාඝ්‍රාදීන් වසන වනයකට ප්‍රවිෂ්ට වූ පුරුෂයකු මෙන් ද, වෙසමුණිරජහට අපරාධ කළ යකකු මෙන් ද, ආයු පිරිහුනු දිව්‍යපුත්‍රයකු මෙන් ද, භය වෙමින් උද්වෙගයට පැමිණෙමින්, සිත් තැවෙමින්, සිත කලකිරී ලොමු දහ ගෙණ මුළා වූ සිත් ඇති ව, දෙම්නස් වූ සිත් ඇතිව, භ්‍රාන්ත වූ සිත් ඇති ව, පෙරළී ගියා වූ වික්ෂිප්ත සිත් ඇති ව කට කෙළ සිඳී ''මේ මාගේ පිරිවර ජනයෝ මට නින්ද නො කෙරෙත්ව'' යි සිතා රාජාභිමානයෙන් ධෛර්යය උපදවා ගෙණ දෙවමන්ත්‍රියාහට මෙපවත් කීහ. **(27)** ''**දෙවමන්ත්‍රිය,** ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ මේ ය යි කියා මට නො කියව. නො කියන ලද්ද වූ මම නාගසෙනයන් වහන්සේ දැක හැඳින ගණිමි'' යි කීහ. ''යහපත දෙවයන් වහන්ස, නුඹවහන්සේ ම හැඳින වදළ මැනැවැ''යි කීයේ ය.

එසමයෙහි වනාහි ආයුෂ්මත් නාගසෙන ස්ථවිරයන් වහන්සේ ඒ භික්ෂූන්ගේ පිරිසෙහි ඉදිරි පිටින් හුන් සතළිස්දහසක් භික්ෂූන් වහන්සේලාට බාලතර වූසේක. පසු ලා හුන් සතළිස්දහසක් භික්ෂූන් වහන්සේලාට වැඩිමහලු වූ සේක. එකල නැවැත මිලිඳු රජ්ජුරුවෝ ඒ සියලු ම භික්ෂු පිරිස ඉදිරියේ හිඳ පස්සෙහිත් මධ්‍යයෙහිනුත් ඉදිරියෙනුත් ඔබිනොබ විමසා බලමින් පහව ගිය ලොමු දහ ගැණුම් ඇති ව දුරු ව ගිය භයශාරද්‍ය යන් ඇති ව දුරු වූ භයභෛරව ඇති කෙසරසිංහරාජයකු මෙන් භික්ෂුසංඝයා මධ්‍යයෙහි වැඩ හුන්නා වූ ආයුෂ්මත් නාගසෙන ස්ථවිරයන් වහන්සේ දුරින් ම දුටුවෝ ම ය. දූක ආකාරයෙන් ම ''මෙතැන මේ වැඩ හිඳිනේ නාගසෙනයන්වහන්සේ ය'' යි කියා දූන ගත්තෝ ය.

ඉක්බිති මිලිඳුරජ්ජුරුවෝ දෙවමන්ත්‍රියාට මෙපවත් කීහ. ''දෙව මන්ත්‍රිය, ආයුෂ්මත් නාගසෙනයෝ මූන් වහන්සේ දූ?'' යි විචාළහ. ''එසේ ය. මහරජානන් වහන්ස, නාගසෙනයන්දෑ මූන්වහන්සේ ම ය. ''මහරජානෙනි, නුඹ වහන්සේ නාගසෙනයන් වහන්සේ දූන ගත්සේක. ඒ බව යහපතැ'' යි කියා ප්‍රශංසා කෙළේ ය. ඉක්බිත්තෙන් ''කා විසිනුත් නො කියන ලද්ද වූ මා විසින් ම නාගසෙනයන්වහන්සේ දූන ගන්නා ලද්දේ ය'' යි කියා සතුටු වූහ. ඉක්බිති මිලිඳුරජහට ආයුෂ්මත් නාගසෙනයන්වහන්සේ දකිමින් ම භය වූයේ ම ය. තැති ගැන්ම වූයේ ම ය. ලොමු දහ ගැන්ම වූයේ ම ය. එකල රජ්ජුරුවෝ පසළොස්චරණධර්ම-යෙන් සම්පන්න වූ ඉන්ද්‍රියදමනාදි වූ උත්තමදමනයෙහි ද යහපත් සෙයින් දමනය වූ නාගසෙනයන්දෑ දූක මේ වචනය කීහ. ''පෙර බොහෝ වූ අර්ථධර්මකථිකයෝ මා විසින් දක්නා ලද්දෝ ය. අර්ථධර්මප්‍රශ්න සාකච්ඡාවට බටුවා වූ අයත් බොහෝ දෙනෙක. එතෙකුදු වුවත් අද මට උපන් තැති ගැන්ම යම් සේ ද, එබඳු වූ භයක් පෙර නුවූයේ ය. යම් ප්‍රකාරයකින් මාගේ චිත්තය එකඟ ව නො සිටියේ ද, එපරිද්දෙනුත් අද මට පරාජය වෙයි. නාගසෙනයන් වහන්සේට ම ජය වෙයි. සැක නැතැ'' යි සිතුවේ ය. එහෙයින් ඒ බව හඟවන පූර්වාචාර්යයන් විසින් කියන ලදී:—

**''චරණෙනචෙව සම්පන්නං–සුදන්තං උත්තමෙ දමෙ,**
**දිස්වා රාජා නාගසෙනං–ඉදං වචනමබ්‍රවි.**

**කථිකා මයා බහූ දිට්ඨා–සාකච්ඡා ඔසටා බහූ,**
**න තාදිසං භයං ආසි–අජ්ජ තාසො යථා මම.**

**නිස්සංසයං පරාජයො–මම අජ්ජ භවිස්සති,**
**ජයො ච නාගසෙනස්ස–යථා චිත්තං න සණ්ඨිතං''යි.**

**සකලජනමනොනන්දනීය වූ මේ මිලිඳුපැන නම් වූ**
**ශ්‍රී සද්ධර්මාදසයෙහි බාහිරකථාව කියා නිමවන ලදී.**

*Non-Commercial Distribution*

# පූර්වයොගප්‍රශ්නය යි.

**(28)** ඉක්බිති මිලිඳු රජ්ජුරුවෝ චතුරංගිණීසේනාව පිරිවරා ගෙණ යම් තැනෙක ආයුෂ්මත් **නාගසෙනස්ථවිරයන්** වහන්සේ වැඩ වසන සේක් ද, එතැන්හි එළඹියාහ. එසේ එළඹ ආයුෂ්මත් වූ නාගසෙන ස්ථවිරයන් වහන්සේ හා සමග සතුටු වූහ. සමඟ සතුටු විය යුතු වූ සිහි කට යුතු වූ කථාව කොට නිමවා එකත්පසෙක හුන්නාහ. ආයුෂ්මත් නාගසෙනස්ථවිරයෝ ද පිළිසඳර කථාවෙන් ම **මිලිඳු** රජ්ජුරුවන්ගේ සිත් ගෙණ වැඩ සිටිසේක. ඉක්බිති එකත්පස් ව හුන්නා වූ මිලිඳුරජ්ජුරුවෝ ආයුෂ්මත් නාගසෙනස්ථවිරයන්ට මෙපවත් කීහ. ''ස්වාමීනි, පින්වතුන් වහන්සේ කෙසේ දැනෙත්[1] ද? නුඹ වහන්සේ කවර නම් වූ[2] ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, මම නාගසෙනය'' යි දැනෙමි[3]. මහරජානෙනි, සබ්‍රහ්මචාරීන් වහන්සේලා මට 'නාගසෙන' ය යි කියති. තව ද නම් තබන්නා වූ දෙමවුපියෝ 'නාගසෙනය ' යි කියා හෝ 'සූරසෙන' ය යි කියා හෝ 'වීරසෙන' ය යි කියා හෝ 'සිංහසෙන' ය යි කියා හෝ නම් කෙරෙති. තවද මහරජානෙනි, යම් මේ 'නාගසෙන' ය යි කියා සැලකිය යුතු වූ සංඥාමාත්‍ර වූ ප්‍රඥප්තිව්‍යවහාරය නාමමාත්‍රයෙක. මෙහි 'නාගසෙන' ය යි කියා පුද්ගලයෙක් නො ලැබෙන්නේ[4] ය'' යි කීසේක. ඒ අසා ඉක්බිති මිලිඳු රජ්ජුරුවෝ මෙසේ කීහ:— 'මේ සභායෙහි රැස් ව සිටිනා පන්සියයක් පින්වත් යොන්අමාත්‍යයෝ ද අසූදහසක් පමණ භික්ෂු සංඝයා වහන්සේ ද මාගේ වචනය ඇසුව මැනැව. මේ **නාගසෙනයන්** වහන්සේ මෙහි 'නාගසෙන' ය යි කියා පුද්ගලයෙක් නො ලැබෙන්නේ[4] ය යි මෙසේ කීසේක. ඒ වචනයට සතුටු වන්නට යහපත් ද?'' යි සියල්ලන්ට ම අස්වා කීහ.

නැවත **මිලිඳු** රජ්ජුරුවෝ ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේට මෙපවත් කීහ:— ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉදින් පුද්ගලයෙක් නො ලැබේ නම්, කවරෙක් දැන් නුඹ වහන්සේට සිවුරු අහරසෙනසුන් ගිලන්පසබෙහෙත්පිරිකර දේ ද? කවරෙක් ඒ දුන් සිවුපසය අනුභව කෙරේ ද? කවරෙක් සිල් රකී ද? කවරෙක් භාවනාවෙහි යෙදේ ද? කවරෙක් මාර්ගඵලනිර්වාණය සිද්ධ කෙරේ ද? කවරෙක් ප්‍රාණඝාත කෙරේ ද? කවරෙක් නුදුන් වස්තුව ගණී ද? කවරෙක් පඤ්චකාමයෙහි පරදරයෙහි හැසිරේ ද? කවරෙක් බොරු කියා ද? කවරෙක් සුරාපානය කෙරේ ද? කවරෙක් පඤ්චානන්තරිය කර්මය කෙරේ ද? ඒ නිසා කුසල් නැත. අකුසල් නැත. කුශලාකුශලකර්මයන් කරණ කෙරෙණ හෝ කරවන කෙනෙක් හෝ නැත. කුශලාකුශලකර්මයන්ගේ ආනිසංසයත් නැත. විපාකත් නැත. එහෙයින් 'නාගසෙනයන් වහන්ස, යමෙක් නුඹ වහන්සේ මරා ද, ඔහට ප්‍රාණඝාතඅකුශලය නැත. 'නාගසෙනස්වාමීනි, නුඹ වහන්සේටත් ගුරුහු නැත. උපාධ්‍යාය කෙනෙකුත් නැත. උපසම්පද–

1 දැනේ. 2. වී, 3. දන්වමි 4. ලබන්නේ.

Non-Commercial Distribution

වක් නැත. ''මහරජ, මට සබ්‍රහ්මචාරීන් වහන්සේලා නාගසෙන ය යි කියා වදරණසේකැ' යි කියා යමක් නුඹ වහන්සේ කීසේක් ද, මෙහි නාගසෙන වූයේ කවරෙක් ද? කිමෙක් ද? 'ස්වාමීනි, හිසකේ නාගසෙන දූ?'' යි කීහ. 'නැත, මහරජානෙනි,'' ''ලෝමයෝ නාගසෙන දූ?'' යි කීහ. 'නැත, මහරජානෙනි.'' **(29)** ''එසේ වී නම්, නියපොතු දත් සම් මස් නහර ඇට ඇටමිදුලු වකුගඩු හෘදයමාංස අක්මාව දලබුව බඩදිව පපුව බඩවැල අතුනුබහන උදරය මලය පිත් සෙම් සැරව ලේ ඩහදිය මේදතෙල් කඳුළු වුරුණුතෙල් කෙළ සොටු සඳමිදුලු මූත්‍ර මස්තකයෙහි වූ හිස්මුල් නාගසෙන දූ?'' යි කීහ. ''නැත, මහරජානෙනි'' වදළසේක. ''කිමෙක් ද, ස්වාමීනි, එසේ වී නම් රූපය නාගසෙන දූ?'' යි කීහ. 'නැත, මහ රජානෙනි.'' ''වේදනාව නාගසෙන දූ?'' යි කීහ. ''නැත මහරජානෙනි.'' ''සංඥව නාගසෙන දූ?'' යි කීහ. ''නැත මහරජානෙනි.'' ''සංස්කාරය නාගසෙන දූ?'' යි කීහ. ''නැත මහරජානෙනි,'' ''විඥනය නාගසෙන දූ?'' යී කීහ. ''නැත මහරජානෙනි.'' ''කිමෙක්ද? ස්වාමීනි, රූප වේදනා සංඥ සංස්කාර විඥන යන පස්කඳ නාගසෙන දූ?'' යි විචාළෝ ය. ''නැත මහරජානෙනි'' වදළසේක. ''කිමෙක් ද? ස්වාමීනි, රූප වේදනා සංඥ සංස්කාර විඥනය යන පස හැර නාගසෙන වනසේක් දූ?'' යි විචාළෝ ය. ''නැත, මහරජානෙනි'' යි වදළසේක. ''කිමෙක් ද? 'ස්වාමීනි, මම නුඹ වහන්සේ අතින් විචාරන්නෙමි, නාගසෙන කෙනකුන් නො දක්නෙමි. 'ස්වාමීනි, ශබ්දය නාගසෙන වී ද? නුඹ වහන්සේ කී මේ වචනයෙහි වනාහි නාගසෙන වූයේ කවරෙක් ද? 'ස්වාමීනි, නුඹ වහන්සේ වචනාර්ථයෙන් සිස් වූ නාගසෙනයෙමි යි කියා මුසාවාදයක් කීසේක. නාගසෙන කෙනෙක් නැතැ'' යි කීහ.

ඉක්බිති ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ මිලිඳු රජ්ජුරුවන්ට මෙපවත් කීසේක:— ''මහරජ, තෙපි වනාහි රාජසුඛමාල වූවහු ය. අත්‍යන්තයෙන් ම සිවුමැලි ය. 'මහරජානෙනි, මධ්‍යාහ්න වේලෙහි අව්වෙන් වියලි රත් වූ උණුවැලි ඇත්තා වූ ක්‍රෑර වූ භූමියෙහි ගල්බොරළු කැබැලිති වැලි මිරිකා ගෙණ පයින් එන්නා වූ ඒ තොපගේ පාදයෝ රුද ගණිති. ශරීරය ක්ලාන්ත වෙයි. සිත කැලඹෙයි. දුක් සහ ගියා වූ කාය විඤ්ඤාණය උපදනේ ය. එහෙයින් කිමෙක් ද? තෙපි පයින් ම ආවහු ද? නොහොත් වාහනයක නැඟී ගෙණ ආවහු දූ?'' යි විචාළසේක. 'ස්වාමීනි, මම පයින් නො ආයෙමි. රථයෙන් මම ආයෙමි'' යි කීහ. ''මහරජ තෙපි ඉදින් රථයෙන් ආවහු නම්, රථය මට කියා දෙව. කිමෙක් ද? 'මහරජ, රථඉස රථය දූ?'' යි විචාළසේක. ''නැත ස්වාමීනි,'' කීහ. ''රථඅකුර රථයදූ'' යි විචාළසේක. ''නැත ස්වාමීනි'' යි කීහ. ''රථචක්‍රය රථය දූ?'' යි විචාළසේක. ''නැත ස්වාමීනි'' යි කීහ. ''රථපඤ්ජරය රථය දූ?'' යි විචාළසේක. ''නැත ස්වාමීනි'' යි කීහ. ''රථදණ්ඩකය රථය දූ?'' යි විචාළසේක. ''නැත ස්වාමීනි.'' ''වියදණ්ඩ රථය ද?'' නැත ස්වාමීනි.'' ''රථරැහැන රථය ද?'' ''නැත ස්වාමීනි'' යි කීහ. ''කෙවිට්ලිය

Non-Commercial Distribution

රථය ද?'' යි විචාළසේක. ''නැත ස්වාමීනි'' යි කීහ. ''කිමෙක් ද? මහ රජ, රථඉස රථඅකුර රථචක්‍රය රථපඤ්ජරය රථදණ්ඩ වියරැණ කෙවිට යන මේ සියල්ල ම රථය ද?'' විචාළසේක. ''නැත ස්වාමීනි.'' ''කිමෙක් ද? මහරජානෙනි, රථඉස රථඅකුර රථචක්‍රය රථපඤ්ජරය රථදණ්ඩ රථවිය රථරැණ රථකෙවිට හැර රථය ද?'' යි විචාළසේක. ''නැත ස්වාමීනි'' යි කීහ.

''එම්බා, මහරජානෙනි, මම තොප අතින් නැඟී ආ රථය විචාරන්නෙම් රථයක් නො දක්නෙමි. ශබ්දය ම මහරජානෙනි, රථය වී ද? තොප මේ කී වචනයෙහි රථය කවරේ ද? මහරජ, තෙපි බොරු වූ මුසාවාදයක් කීහු ය. ඇති රථයෙක් නැත. මහරජ, තෙපි සකල (30) ජම්බුද්වීපයෙහි අග්‍රරාජතනතුරට පැමිණියහු. තෙපි වනාහි කවුරුන්ට භය ගෙණ කුමක් පිණිස මෙසේ බොරු කියවු ද? අහෝ! මෙතැන්හි රැස් වූ පන්සියයක් පමණ පින්වත් යොන්ඇමැතියන් හා මහසෙනහත් අසූදහසක් පමණ මහාසංඝයා වහන්සේත් මාගේ වචනය ඇසුව මැනැව. මේ මිලිඳුරජ 'රථයෙන් මම ආයේ වීමි' යි මෙසේ කීයේ ය. දූන් මා විසින් ''මහරජ, ඉදින් තෙපි රථයකින් ආවහු වූ නම්, රථය මට කිව මැනැවැ' යි කියන ලද්දුයේ ම රථයෙක නමක් නැවත නො දක්වයි. ඒ කාරණයට[1] සන්තොස වන්නට යහපත් ද?'' යි වදාළසේක.

නාගසෙන ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළ කල්හි අතිප්‍රසන්න වූ පන්සියයක් යොන් අමාත්‍යයෝ ආයුෂ්මත් නාගසෙන ස්ථවිරයන් වහන්සේට සාධුකාර දී මිලිඳුරජ්ජුරුවන්ට මේ වචනය කීවාහු ය:— ''දෙවයන් වහන්ස, මෙතෙක් දවස් කථාවට නිසි පණ්ඩිතකෙනෙකුන් නො ලත්සේක. අද දූන් නුඹ වහන්සේ බලා නොයිඳ සමර්ථසේක් වී නම් තෙල වචනයට උත්තර දී කථා කර වදාළ මැනැවැ'' යි කීවාහු ය. ඒ අසා ඉක්බිති මිලිඳු රජ්ජුරුවෝ ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේට මෙපවත් කීහ:— ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මම බොරු කීවා නො වෙමි. රථ හිස නිසාත්—රථඅකුර නිසාත්—රථචක්‍රය නිසාත් — රථමැඳුර නිසාත්—රථදණ්ඩකය නිසාත්—රථවිය නිසාත්—රථරැණ නිසාත්—කැවිට නිසාත්—මේ හැම එක් වූ කල රථය කියා සංඛ්‍යා, සංඥ, ප්‍රඥප්තිය ව්‍යවහාරය, නාමය යි කියා පවත්නේ ය'' යි කීහ.

ඒ අසා නාගසෙන තෙරුන් වහන්සේ ''මහරජානෙනි, තොප කී රථයෙහි දූන් පූර්වාපරවිරොධයක් නැත. තෙපි රථය ඉඳුරා ම දන්නාහු[2] ම ය. මහරජානෙනි, එපරිද්දෙන් ම මාගෙත් හිසකේ නිසාත්—ලොමයන් නිසාත්—(දත් ආදි වූ) හිස්මුල් නිසාත්—රූපය නිසාත්—වෙදනාව නිසාත්—සංඥව නිසාත්—සංස්කාරය නිසාත්—විඥනය නිසාත්—මේ හැම එක්වූ කල ''නාගසෙන ය'' යි කියා සංඛ්‍යා, සංඥ, ප්‍රඥප්ති, ව්‍යවහාර වූ නාග සෙන නාමමාත්‍රයක් පවත්නේ ය. පරමාර්ථවශයෙන් වනාහි මෙහි

1. කාරණාවට 2. දනිත්

Non-Commercial Distribution



මිලිඳු රජතුමා නාගසෙන තෙරුන් වහන්සේගෙන් ප්‍රශ්න ඇසීම. (30 පිටුව)

Non-Commercial Distribution

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, නුඹ වහන්සේ මා හා සමග කථා කරණ සේක් ද?'' යි කීහ. ''මහරජාණෙනි, ඉදින් තෙපි පණ්ඩිත වාදයෙන් කථා කරවූ නම්, මමත් කථා කෙරෙමි'' යි ඉදින් රාජවාදයෙන් කථා කරවූ නම්, මම කථා නො කෙරෙමි'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පණ්ඩිතයෝ කෙසේ කථා කෙරෙද් ද?'' යි විචාළෝ ය. ''මහරජාණෙනි, පණ්ඩිත වරුන්ගේ කථාවෙහි ගම්භීරාර්ථ ඇති තද පද ගෙණ රැහැනින් වෙළන්-නාක් මෙන් වෙහස දී ආවෙඨනයත් කරණු ලැබෙයි. තද ගැට මුදන්නාක් මෙන් නො හැඟෙන අර්ථයන් තෙමේ ම තෝරා දෙමින් නිර්වෙඨනයත් කරණු ලැබෙයි. තමන් විචාළ අර්ථ ප්‍රශ්න තෝරා ලිය නො හෙන කල නැවැත නැවැතත් විචාරමින් නිග්‍රහත් කරණු ලැබෙයි. එකට එක කිරීමෙන් ප්‍රතිකර්මත් කරණු ලැබෙයි. තමන් දන්නා ශාස්ත්‍රවිශෙෂය දක්වමින් ප්‍රතිවිශෙෂයත් කරණු ලැබෙයි.[1] තමන් ම උසස් කරන්නාක් මෙන් ප්‍රති-වෙධයත් කරණු ලැබෙයි. එකල්හි ද පණ්ඩිතයෝ නො කිපෙති. මහ රජාණෙනි, මෙසෙයින් පණ්ඩිතවරු කථා කෙරෙති'' යි වදාළසේක.

''ස්වාමීනි, රජහු කෙසේ කථා කෙරෙද් ද?'' යි කීහ. ''මහරජාණෙනි, රජහු වනාහි කථා කරණ කල එක වස්තුවක් මේ ලෙස ය යි කියා දන්වති. යම් කෙනෙක් ඒ කාරණය වරදවා කීවෝ නම් 'මොහුට දඩුවම් පණවවු' කියා ඔහට දඩුවම් කරන්නට ආඥ කෙරෙති. ''මහරජාණෙනි, රජදරුවෝ මෙසේ කථා කෙරෙති'' යි වදාළසේක. 'එසේ වී නම්, ස්වාමීනි, මම පණ්ඩිත වාදයෙන් කථා කෙරෙමි. **(32)** රාජවාදයෙන් කථා නො කෙරෙමි. පින්වතුන් වහන්සේ සැක නො කොට කථා කළ මැනැව. යම් සේ භික්ෂූන් වහන්සේ නමක් හා සමහ හෝ සාමණේර නමක් උපාසක ආරාමික කෙනෙකුන් සමහ හෝ කථා කරණසේක් ද, එපරිද්දෙන් ම කිසි සැකයක් නැතු ව පින්වතුන් වහන්සේ කථා කළ මැනැව. මා රජ ය යි සිතා භය නො ගෙණ වදාළ මැනැවැ'' යි කීහ. ''යහපත මහරජාණෙනි,' යි කියා තෙරුන් වහන්සේ සම්මුඛයෙහි ම ඉවසූසේක.

එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්නයක් අසමි'' යි කීහ. ''මහරජ, විචාරව'' යි වදාළසේක. ''ස්වාමීනි, මා විසින් ප්‍රශ්නය අසන ලද්දේ ය'' යි කීහ. ''මා විසින් ප්‍රශ්නය විසඳන ලද්දේ ය''යි වදාළසේක. ''ස්වාමීනි, නුඹ වහන්සේ විසින් විසඳන ලද්දේ කිමෙක් ද?''යි කීහ. ''මහරජ, තොප විසින් විචාළේ කිමෙක් ද?'' යි වදාළසේක. ඉක්බිති මිලිඳු රජහට මෙබඳු කල්පනාවෙක් වී ය:— මේ මහණුන්නාන්සේ පණ්ඩිත වූසේක. මා හා සමහ කථා කරන්ට සමර්ථසේක. මා විසින් ද බොහෝ වූ කාරණයෝත් ඇසිය යුත්තාහු වෙති. යම්තාක් ඒ කාරණයෝ[2] තව ම නො අසන ලද්දාහු ම වෙති. එතෙකුදු වුවත් හිරු අස්තංගත වී ය.

1. ලැබෙති  2. කාරණාවෝ

*Non-Commercial Distribution*

එසේ හෙයින් මම හෙට දවස්හි මාගේ ඇතුළුරජගෙයි දී කථා කෙළෙම් වීම් නම්, ඉතා යෙහෙකැ''යි සිතා නැවැත මිලිඳුරජ්ජුරුවෝ **දෙවමන්ත්‍රියාට** මෙපවත් කීහ.[1]

''**දෙවමන්ත්‍රිය**, අද සවස් වි ය. එසේ හෙයින් තොප සෙට දවස්හි ඇතුළුරජගෙයි දී රජ්ජුරුවන් සමහ කථාසල්ලාපය වන්නේය'' යි කියා පින්වතුන් වහන්සේට කියව'' යි කියා මේ වචනය කියා **මිලිඳුරජ්ජුරුවෝ** හුන් ආසනයෙන් නැඟී සිට **නාගසෙන** තෙරුන් වහන්සේට ආමන්ත්‍රණය කොට සමු ගෙණ අශ්වවාහනයකට පැන නැඟී **නාගසෙන** ය'' යි කියා සජ්ඣායනා කෙරෙමින් ගියාහ. ඉක්බිති ''**දෙවමන්ත්‍රියා** ආයුෂ්මත් **නාගසෙනයන්** වහන්සේට මෙපවත් කීයේ ය:— ''ස්වාමීනි, අපගේ මිලිඳු රජ්ජුරුවෝ සෙට් දවස ඇතුළු රජගෙයි දී කථා කිරීම වන්නේ ය යි කියා මෙසේ සැළකරන්නට කීසේකැ'' යි කීයේ ය. තෙරුන් වහන්සේ ද 'යහපතැ' යි කියා ඉවසූසේක.

ඉක්බිත්තෙන් එදවස් රාත්‍රියගේ ඇවෑමෙන් **දෙවමන්ත්‍රි** නම් අමාත්‍යයා ද **අනන්තකාය** නම් අමාත්‍යයා ද, **මංකුර** නම් අමාත්‍යයා ද, **සබ්බදින්න** නම් අමාත්‍යයා ද යන සතරදෙන යම් රජගෙයක **මිලිඳු** රජ වෙසේ ද, එතැනට එළඹියෝ ය. එසේ එළඹ **මිලිඳුරජහට** මෙපවත් කිවූ ය: ''දෙවයන් වහන්ස, අද රජගෙයි දී වැළඳීමට හවත් **නාගසෙනයන්** වහන්සේ එනසේක් දෝහො?'' යි විචාළෝ ය. ''එසේ ය, දත් වැළඳීමට වැඩිය මැනැවැ යි කියා ආරාධනා කරව'' යි කීහ. ''ස්වාමීනි, කොපමණ වූ සංඝයා සමහ වඩනාසේක් ද?'' යි විචාළෝ ය. ''යම් පමණ සංඝයා කැඳවා ගෙණ වඩින්ට කැමැති නම් එපමණ සංඝයා සමහ වැඩිය මැනැවැයි කියා ආරාධනා කරව'' යි කීහ. නැවතත් **සබ්බදින්නයා** ''දේවයන් වහන්ස, දසනමක් හා සමහ වැඩිය මැනැවැ යි කියා ආරාධනා කෙරෙම් ද?'' යි කී ය. දෙවනු රජ්ජුරුවෝ ''යම් පමණ සංඝයා උන්වහන්සේට අභිප්‍රාය නම් එපමණ සංඝයා හා සමහ වැඩිය මැනැවැ යි **(33)** කියා ආරාධනා කරව'' යි කීහ. **සබ්බදින්නයා** දෙවනුත් ''දේවයන් වහන්ස, දසනමක් සමහ වඩින්ට ආරාධනා කෙරෙම් ද?'' යි කී ය. රජ්ජුරුවෝ තුන්වෙනුවත් ''යම් පමණ සංඝයා කැඳවා ගෙණ වඩින්නට උන්වහන්සේ කැමැති නම්, එපමණ වූ සංඝයා සමහ වැඩිය මැනැවැ යි කියා ආරාධනා කරව'' යි කීහ.

එකල **සබ්බදින්න** නම් අමාත්‍යයානෝ, ''අසූදහසක් පමණ මහා සංඝයා වහන්සේ රජගෙට රැස් වූ කල දූන් අමුතු දනක් සරහා පියන්ට කල් නැති හෙයින් දනොපකරණය කෙසේ දෝ හො?'' යි රජුගේ සිත් කෙසේ දෝහො?'' යි පරීක්ෂා කරණු පිණිස තුන්වැනිවත් ''දෙවයන් වහන්ස, දසනමක් හා සමහ වැඩිය මැනැව යි කියා ආරාධනා කෙරෙම් ද?'' යි කීහ. එබසට රජ්ජුරුවෝ කියන්නාහු ''සියලු ම දනොපකරණ

1. කීසේක

Non-Commercial Distribution

පිළියෙල කරණ ලද්දේ ය. එබැවින් යම්පමණ සංඝයා උන්වහන්සේට කැමැති නම් එපමණ සංඝයා හා සමඟ වඩින්ට ආරාධනා කරව' යි කියා මම කියමි. 'එම්බා සගයෙනි, මේ **සබ්බදින්න** අමාත්‍යයා මා හා සමඟ අනික් ප්‍රකාරයකින් කථා කරන්නේ ය. කිමෙක් ද? අපි අසූදහසක් පමණ භික්ෂූන් වහන්සේලාට ආහාර දන් දෙන්ට අසමර්ථමෝ ද?'' යි මෙසේ මිලිඳු රජ්ජුරුවන් කී කල්හි **සබ්බදින්නයා** නිස්තේජස්ක ව ඉවත් විය. ඉක්බිති **දෙවමන්ත්‍රි** නම් අමාත්‍යයා ද **අනන්තකාය** නම් අමාත්‍යයා ද, **මංකුර** නම් අමාත්‍යයා ද යන තුන්දෙන රජ්ජුරුවන් වැඳ අවසර ගෙණ යම් **සංඛෙය්‍ය** නම් පිරිවෙණක ආයුෂ්මත් නාගසෙන ස්ථවිරයන් වහන්සේ වැඩ වසනසේක් ද, එතැනට එළඹියාහු ය. එසේ එළඹ ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේට මෙපවත් කීවාහු ය:— ''ස්වාමීනි, අපගේ මිලිඳුරජ්ජුරුවෝ **නාගසෙනයන්** වහන්සේ යම් පමණ සංඝයා කැඳවා ගෙණ වඩින්ට කැමතිසේක් නම්, එපමණ සංඝයා හා සමඟ රජගෙට වළඳන්ට එනසේක්වා''යි මෙසේ කියා අප ආරාධනාවට එවූසේකැ'' යි කියා ආරාධනා කළෝ ය.

ඉක්බිති ආයුෂ්මත් **නාගසෙනස්ථවිරයන්** වහන්සේ උදය කාලයෙහි සකස් කොට හැඳ පෙරෙව කයින් සිවුරු හා අතින් පාත්‍රය ගෙණ අසූදහසක් පමණ සංඝයා හා සමග **සාගල්නුවර** කරා වැඩිසේක. ඉක්බිති **අනන්තකාය** නම් අමාත්‍යයා ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ නිසා කැටු ව ම යෙමින් ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේට මෙපවත් කීයේ ය:— 'ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, ''**නාගසෙන ය**' යි කියා යම් මෙ නමක් කියම් ද, මෙකී නාමයෙහි නාගසෙන වූයේ කවරේ ද?'' යි කී ය. එකල තෙරුන් වහන්සේ ''මෙහි වනාහි තෙපි කවරෙක් 'නාගසෙනය. ය යි කියා සිතන්නාහු ද?'' යි කීසේක. ''ස්වාමීනි, අභ්‍යන්තරයෙහි යම් ඒ ජීව වූ ප්‍රාණවාතය ප්‍රවෙශ වේ ද, පිටතට නික්මේ ද, ඒ වාතය තෙම 'නාගසෙන' ය යි කියා සිතමි'' යි කී ය. ''**අනන්තකායයෙනි**, ඉදින් වනාහි මේ ප්‍රාණවාතය නික්ම ගොස් ප්‍රවෙශ නො වූයේ වී නම් ප්‍රවෙශ ව හෝ නික්මුනේ වී නම් ඒ පුරුෂතෙම ජීවත් වේ ද?'' යි විචාළසේක. 'නැත, ස්වාමීනි,' යි කී ය. ''මෙ නුවර සංඛනාද කරන්නා වූ යම් කෙනෙක් සක් පිඹිති. ඔවුන්ගේ පිඹපු වාතය නැවත ප්‍රවෙශ වේ ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කී ය. මෙ නුවර වස් කුලල් ආදිය පිඹින්නා වූ යම් කෙනෙක් වස් කුලල් ආදිය පිඹිති. ඔවුන්ගේ ඒ **(34)** පිඹපු වාතය නැවත ප්‍රවෙශ වේ ද?'' යි විචාළසේක. ''නැත'' ස්වාමීනි, යි කිය. ''මෙ නුවර අඟෙන් කළ සොරණෑ ආදිය පිඹින්නා වූ යම් කිසි කෙනෙක් ශෘංග පිඹිති. ඔවුන්ගේ ඒ පිඹිපු වාතය නැවත ප්‍රවෙශ වේ ද?'' යි විචාළසේක. ''නැත. ස්වාමීනි'' යි කී ය, ''හේ කිමෙක් ද? කුමන කාරණයක් පිණිස ඒ සංඛ වංශ ශෘංග ධමකයෝ නො මියෙන්නාහු ද?'' යි විචාළසේක. ස්වාමීනි, නුඹ වහන්සේ වැනි ප්‍රාඥ[1] වාදීන් සමග කථා කරන්නට මම

1. ප්‍රඥ

*Non-Commercial Distribution*

සමර්ථ නො වෙමි. ''ස්වාමීනි, මනා කොට මට වැටහෙන ලෙසට අර්ථ වදාළ මැනැවැ'' යි ආරාධනා කෙළේ ය. ''**අනන්තකායයෙනි**, මේ අභ්‍යන්තරගත වාතයතෙම ජීවිතය නො වෙයි. ආශ්වාසප්‍රශ්වාසයෝ නම් වෙති. මේ ආශ්වාසප්‍රශ්වාසයෝ කායසංස්කාරයෝ ය'' යි කියා තෙරුන් වහන්සේ අභිධර්මකථාවක් කර වදාළසේක. එකල **අනන්තකාය** නම් අමාත්‍යයා අතිප්‍රසන්න ව තමාගේ උපාසකභාවය දන්වමින් කැටි ව ගියේ ය.

මෙසේ **අනන්තකාය** නම් අමාත්‍යයා පහදවමින් නැවත ආයුෂ්මත් **නාගසෙන** ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක මිලිඳුරජහුගේ නිවෙසනය ද, එතැන්හි එළඹිසේක. එසේ එළඹ පණවන ලද දීර්ඝාසනයෙහි අසූදහසක් පමණ රහතුන් සමඟ වැඩ සිටිසේක.

ඉක්බිති මිලිඳු රජානෝ අසූදහසක් පිරිවර සහිත වූ ආයුෂ්මත් **නාගසෙන** ස්ථවිරයන් ප්‍රණීත වූ ඛාද්‍යභොජ්‍යආහාරයෙන් ස්වහස්තයෙන් වළඳවා නැවැත නැවැතත් පෙරැත්ත කොට වළඳවා පස්පලවතින් යුත් දූහැත් පුද එකෙක භික්ෂුනමක්හට එකෙක පිළී සහළ බැගින් අසූදහසක් මහසඟනට අසූදහසක් පිළීකට්ටු අච්ඡාදනය පිණිස පූජා කොට ආයුෂ්මත් නාගසෙන ස්ථවිරයන් තුන්සිවුරකින් අච්ඡාදනය කරවා ආයුෂ්මත් නාගසෙන ස්ථවිරයන්ට මෙපවත් කී හ:— ''ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, දස නමක් සමග මෙහි වැඩ හුන මැනැව. අවශෙෂ සංඝයා වහන්සේ වෙහෙරට වඩනාසේක්ව'' යි කීහ.

ඉක්බිති මිලිඳු මහරජානෝ ආයුෂ්මත් **නාගසෙනස්ථවිරයන්** වහන්සේ වළඳා ඉක්බිති පාත්‍රය ඉවත් කොට පාත්‍රයෙන් පහ කරණ ලද අත් ඇති ව වැඩහුන් බව දැන එක්තරා නීචාසනයක් ගෙණ එකත්පස් ව හුන්නාහ. එකත්පසෙක හුන්නා වූ මිලිඳු රජානෝ ආයුෂ්මත් **නාගසෙනස්ථවිරයන්** වහන්සේට මෙපවත් කිහු:— ''ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, කවර ලෙසකින් අපගේ කථාසල්ලාපය යුතු වේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, අපි අර්ථයෙන් ප්‍රයොජන කැමැතියම්හ. එබැවින් අර්ථයෙන් ම අපගේ කථාසල්ලාපය යුක්ත වෙයි වදාළසේක. එකල මිලිඳු මහරජානෝ ''ස්වාමීනි, නාගසෙනස්ථවිරයන් වහන්ස, නුඹ වහන්සේලාගේ ප්‍රව්‍රජ්‍යාව කවර අර්ථයක් පිණිස ද? නුඹවහන්සේලාගේ පරමාර්ථය කවරේ දැ?'' යි කීහ. එකල තෙරුන් වහන්සේ ''කිමෙක් ද? මහරජානෙනි, මේ වර්තමාන වූ දුක්ඛය නිරුද්ධ වේ ද, අනික් දුකක් නූපදී ද, මහරජානෙනි, අපගේ ප්‍රව්‍රජ්‍යාව මේ අර්ථය පිණිස ය. තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් කිසිවක් නො ගෙණ අනුපාදිශෙෂපරිනිර්වාණය අපගේ පරමාර්ථය' යි වදාළසේක. ''කිමෙක් ද? ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙලොව සියල්ලෝ ම මෙම අර්ථය පිණිස ම පැවිදි **(35)** වන්නාහු දැ?'' යි විචාළෝ ය. නැත මහරජානෙනි, කිසිකෙනෙක් මෙම අර්ථය පිණිස පැවිදි වෙති. සමහර කෙනෙක් රාජභයින් පැවිදි වෙති. කිසි කෙනෙක් සොරභයින් පැවිදි වෙති.

කිසි කෙනෙක් නය දී ගත නො හැකි ව මහණ වෙති. සමහර කෙනෙක් ජීවිකාව පිණිස පැවිදි වෙති. යම් කෙනෙක් මනා කොට පැවිදි වෙද් ද, ඔහු මෙම අර්ථය පිණිස පැවිදි වන්නාහු ය'' යි වදාළසේක. ''ස්වාමීනි, නුඹවහන්සේ මෙම අර්ථය පිණිස පැවිදි වූසේක් ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, මම ලදරුකම ඇත්තේ ම පැවිදිවන[1] ලද්දෙමි. 'මෙනම් අර්ථය පිණිස පැවිදි වෙමි' යි කියා නො දත්තෙමි.[2] එතෙකුදු වුවත් මේ ශ්‍රමණ වූ ශාක්‍යපුත්‍රයෝ පණ්ඩිතයෝ ය. උන්වහන්සේලා මා ශික්ෂණය කරණසේක්ලා ය යි කියා මට මේ ආකාර සිතෙක් වූයේ ය. ඒ මම උන් වහන්සේලා විසින් ශික්ෂණය කරණ ලද්දෙමි. 'මෙ නම් අර්ථය පිණිස ප්‍රව්‍රජ්‍යාව වන්නේ ය'' යි කියා දන්නෙමි. ප්‍රයොජනය ද දක්නෙමි'' වදාළසේක. ඒ අසා මිලිඳුමහරජානෝ ''ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, වදාළ ලෙස යහපත් වී ය'' යි කියා ප්‍රශංසා කළෝ ය.

නැවතත් මිලිඳු මහරජානෝ ''ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, කාලක්‍රියා කරණ ලදු ව නො පිළිසිඳ ගන්නේ ය යි යන කිසිවෙක් ඇද්ද?'' යි කීහ. ''මහරජ, කිසිවෙක් පිළිසිඳ ගන්නේ ය. කිසිවෙක් නො පිළිසිඳ ගන්නේ ය'' යි කියා තෙරුන් වහන්සේ වදාළසේක. ''කවරෙක් පිළිසිඳ ගණී ද? කවරෙක් නො පිළිසිඳ ගණීද?'' යි කීහ. ''මහරජ, ක්ලේශ සහිත වූ සත්වතෙම පිළිසිඳ ගන්නේ ය. නික්ලේශී වූ සත්වතෙම නො පිළිසිඳ ගන්නේ ය'' යි වදාළසේක. ''ස්වාමීනි, නුඹ වහන්සේ මතු පිළිසිඳ ගන්නාසේක් ද?'' යි කීය. ''මහරජානෙනි, ඉදින් උපාදන සහිත[1] වීම් නම්, පිළිසිඳ ගන්නෙමි, ඉදින් උපාදනයන් නැත්තේ වීම් නම්, නො පිළිසිඳ ගන්නෙමි' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, වදාළ පරිදි අතිමනොඥ වී ය'' යි ප්‍රශංසා කළෝ ය. ''ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, යමෙක් නො පිළිසිඳ ගන්නේ වී නම්, කිමෙක් ද? ඒ පුරුෂතෙම යොනිසො මනස්කාරය කරණ කොට ගෙණ නො පිළිසිඳ ගන්නේ ද?'' යි කියා රජ්ජුරුවෝ විචාළාහ. ''මහරජානෙනි, යොනිසො මනස්කාරයෙන් ද ප්‍රඥාවෙන් ද අනිකුත් කුශලධර්මයෙන් ද?'' යි වදාළසේක. ''එසේ වී නම්, ස්වාමීනි, යොනිසො මනස්කාරය ම ප්‍රඥාව ද?'' යි කීහ. ''නැත, මහරජ. මනස්කාරය අනිකෙක. ප්‍රඥාතොම අනිකක. මහරජ, අජෙළක ගව, මහිස, ඔටු, බැටළු යන මොවුන්ටත් ආභොගමනස්කාරය ඇත. ප්‍රඥාව වනාහි ඔවුන්ට නැතැ'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, විසඳා වදාළ නියාව ඉතා මනොඥ වී ය'' යි කියා ප්‍රශංසා කළෝ ය.

''ස්වාමීනි, මනස්කාරය කුමන ලක්ෂණ ද? ප්‍රඥාතොමෝ කුමන ලක්ෂණ ද'' යි රජ්ජුරුවෝ කීහ. 'මහරජ, මනස්කාරය ඌහන ලක්ෂණ ය යි කියන ලද දැඩි කොට ගැන්ම ස්වභාව කොට ඇත්තේ ය. ප්‍රඥාව ඡෙදනලක්ෂණය ''යි කීසේක. ඒ දැඩි කොට ගැන්ම ලක්ෂණ වූ මනස්-කාරය කෙසේ ද? ඡෙදනලක්ෂණ වූ ප්‍රඥාව කෙසේ ද? උපමාවක් කර

1. පැවිදි වන 2. දන්නෙමි

Non-Commercial Distribution

වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජ, තෙපි යවලාවකයන් දන්නාහුදැයි විචාළසේක. ''එසේ ය. ස්වාමීනි දනිමි'' යි කීහ. ''මහරජ, යව නම් වූ ශස්‍යජාතිය කපන්නා වූ **(36)** යවලාවකයෝ යව කෙසේ කපන්නාහු දැ?'' යි කීසේක. ''ස්වාමීනි, වම් අතින් යව අහුර අල්වා ගෙණ දකුණතින් දැකැත්ත ගෙණ ශස්‍යයන් කපන්නාහු ය'' යි කීහ. ''මහරජ, යම් සේ යව ලාවකතෙම වම් අතින් යව අහුර අල්වා ගෙණ දකුණතින් දැකැත්ත අල්වා ගෙණ දැකැත්තෙන් යව කපන්නේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම නිවන් පිණිස ව්‍යායාම කරණ යොගාවචරතෙම මනස්කාරයෙන් සිත අල්වා ගෙණ ප්‍රඥා නමැති දැකැත්තෙන් කෙලෙස් නමැති සොරුන් සිඳින්නේ ය. මහරජ, මෙසේ මනස්කාරය ඌහන ලක්ෂණ වන්නේ ය. ප්‍රඥාව මෙසේ ඡේදන ලක්ෂණ වන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්නය විසඳා වදාළ නියාව[1] ඉතා යහපත. ඉතා මනොඥ වි ය'' යි කියා ප්‍රශංසා කළෝ ය.

''ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, අනිකුත් කුශලධර්මයෙනුත් නො පිළිසිඳ ගැණීම වන්නේ ය යි කියා යම් මේ වචනයක් වදාළ සේක් ද, ඒ කුශලධර්මයෝ කවුරුදැ?'' යි කියා රජ්ජුරුවෝ විචාළෝ ය. ''මහරජානෙනි, ශීල ය, ශ්‍රද්ධාව, වීර්යය, සිහිය, සමාධි ය යන මේ ඒ කුශලධර්මයෝ ය'' යි කීසේක. ''ස්වාමීනි, ශීලය කවර ලක්ෂණ දැ?'' යි කීහ. ''මහරජානෙනි, ශීලය ප්‍රතිෂ්ඨාන ලක්ෂණ වන්නේ ය. සියලු ම කුශලධර්මයන්ට ද ඉන්ද්‍රිය, බල, බොජ්ඣංග, මාර්ග, සතිපට්ඨාන, සම්‍යක්ප්‍රධාන, ඍද්ධිපාද, ධ්‍යාන, විමොක්ෂ, සමාධි, සමාපත්තීන්ට ද ශීලය ම ප්‍රතිෂ්ඨා වන්නේ ය. මහරජානෙනි, ශීලයෙහි පිහිටියහුගේ සියලු ම කුශලධර්මයෝ නො පිරිහෙන්නාහු ය'' යි කීසේක. ''ස්වාමීනි, උපමාවක් කර වදාළ මැනවැ'' යි කීහ. ''මහරජානෙනි, යම්කිසි බීජගාම භූතගාම කෙනෙක් වෘද්ධියට පතළ වීමට විපුලභාවයට යම් සේ පැමිණෙද් ද, ඒ මේ සියලු ම බීජගාම භූතගාමයෝ පෘථිවිය නිසා ම පෘථිවියෙහි පිහිටා ම මෙසේ වෘද්ධියට පතළ වීමට විපුලභාවයට පැමිණෙන්නාහ. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගාවචරතෙම ශීලය නිසා ම ශීලයෙහි පිහිටා සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන පඤ්චෙන්ද්‍රියයන් වඩන්නේ ය'' යි වදාළසේක.

''නැවතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් කිසි කෙනෙකුන් ශරීරබලයෙන් කට යුතු වූ කර්මාන්තයෝ යම් පරිද්දෙකින් කරණු ලැබෙද් ද, ඒ සියලු ම බලයෙන් කට යුතු කර්මාන්තයෝ පෘථිවිය නිසා ම මේ පෘථිවියෙහි පිහිටා ම මෙපරිද්දෙන් ම කරණු ලැබෙති. මහරජ, එපරිද්දෙන් ම යොගාවචර තෙම ශීලය නිසා ද ශීලයෙහි ම පිහිටා සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන **(37)** මේ පඤ්චෙන්ද්‍රියයන් වඩන්නේ ය'' යි කියා වදාළසේක.

1. නියාව ඉතා දක්ෂ ය

*Non-Commercial Distribution*

"ස්වාමීනි, නවත් නැවැතත් උපමාවක් කර වදළ මැනැවැ" යි කීහ. "මහරජානෙනි, යම් සේ නුවරක් මවනු කැමැත්තා වූ නුවර වඩ්ඪකි පුද්ගලතෙම පළමු කොට නුවර කරණ ස්ථානය පිරිසිදු කොට කණු කටු පහරවා භූමිය සම කරවා එයින් මෑත භාගයෙහි සතර වීථි, සතර මං සන්ධි ආදිය පරිච්ඡෙද වශයෙන් බෙද යහපත් නුවරක් මවන්නේ ය. මහරජ, එපරිද්දෙන් යොගාවචරතෙම ශීලය නිසා ම ශීලයෙහි පිහිටා අශ්‍රද්ධාව මැඩ පවත්වා ප්‍රධානත්වයට ගිය හෙයින් සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන මේ පඤ්චේන්ද්‍රියයන් වඩන්නේ ය" යි වදළසේක.

"ස්වාමීනි, නවත් උපමාවක් කර වදළ මැනැවැ" යි කීහ. "මහරජානෙනි, යම් සේ පිනුම්කාර පුරුෂතෙම තමා ශිල්ප දක්වනු කැමති වූයේ පෘථිවිය සාරවා හෝ කොටා ගල්කැට කැබිලිති කටු දුරු කරවා භූමිය සම කරවා මෘදු වූ භූමියෙහි ශිල්ප දක්වන්නේ ය. මහරජ, එපරිද්දෙන් ම නිවන් සොයන යොගාවචරතෙම ශීලය නිසා ශීලයෙහි ම පිහිටා සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන මේ පඤ්චේන්ද්‍රියයන් වඩන්නේ ය. මහරජ, අප භාග්‍යවත් වූ සුගතතථාගතයන් වහන්සේ විසිනුත් මෙම කාරණය[1] වදාරණ ලදී:—

**"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො-චිත්තං පඤ්ඤඤ්ච භාවයං,**
**ආතාපී නිපකො භික්ඛු-සො ඉමං විජටයෙ ජටං.**
**අයං පතිට්ඨා ධරණීව පාණිනං-ඉදං ච මූලං කුසලාභිවුඩ්ඪියා,**
**මුඛඤ්චිදං සබ්බජිනානුසාසනෙ-යො සීලක්ඛන්ධො**
**වරපාති මොක්ඛියො"යි**

යනුවෙන් "සප්‍රාඥ වූ යම් මනුෂ්‍යජනයෙක්තෙම ශීලයෙහි පිහිටා චිත්තය හා ප්‍රඥව වඩවමින් කෙලෙස් තවන වීර්යයෙන් යුක්ත වූයේ ද, ඒ ප්‍රඥවත් මහණතෙම මේ තෘෂ්ණා නමැති අවුල හරින්නේ ය" යි යනු ද, "උතුම් වූ යම් ප්‍රාතිමොක්ෂශීලස්කන්ධයෙක් ඇද් ද, ඒ මේ ශීලස්කන්ධය සකල ප්‍රාණීන්ට මහපොළාව මෙන් නිවන් පතන උත්තමයන්ට ප්‍රතිෂ්ඨාධාර වන්නේ ය. සියලු ම කුශලාභිවෘද්ධියට මේ ශීලය ම මූල කාරණා වන්නේ ය. සියලු සර්වඥවරයන්ගේ අනුශාසනයෙහි මේ ශීලය ම ප්‍රධාන වන්නේ ය" යි කියා මේ ජිනදෙශනාවකුත් ගෙණ හැර දක්වා වදළසේක. ඒ අසා "නාගසෙන ස්ථවිරයන් වහන්ස, ඉතා යහපත. දක්ෂ වූ සේකැ"යි කියා ප්‍රශංසා කළෝ ය.

මිලිඳු මහරජානෝ නැවතත් "ස්වාමීනි, නාගසෙන ස්ථවිරයානෙනි' ශ්‍රද්ධාව කවර ලක්ෂණ ද?" යි කීහ. "මහරජානෙනි, ශ්‍රද්ධාව සම්ප්‍රසාදන ලක්ෂණ ද, සම්පක්ඛන්දන [2]ලක්ෂණ ද, වෙ" යි වදළසේක. "ස්වාමීනි, සම්ප්‍රසාදන ලක්ෂණ වූ ශ්‍රද්ධාව කෙසේ ද?" යි කීහ. "මහරජානෙනි, උපදනා වූ ශ්‍රද්ධාතොමෝ පඤ්චනීවරණයන් ඔබා මැඩ පවත්නේ ය.

1. කාරණාවූ 2. සම්පක්ඛන්ධන

Non-Commercial Distribution

නීවරණයන් කෙරෙන් මිදුනා වූ සිත ප්‍රසන්න ව විශෙෂයෙන් ප්‍රසන්න ව නො කැලඹෙන ලද්දේ වෙයි. මහරජ, සම්ප්‍රසාදනලක්ෂණ වූ ශ්‍රද්ධාව මෙබඳු ය'' යි වදාළසේක. ''ස්වාමීනි, උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ.

''මහරජාණෙනි, යම් සේ චක්‍රවර්ත්තිරජ්ජුරුවෝ චතුරංගිණී සෙනාව හා සමඟ දීර්ඝ වූ මාර්ගයට පැමිණෙමින් ස්වල්ප වූ ජලය ඇති ඇළකඳුරකින් හෝ එතෙර වන්නාහු නම්, ඒ ස්වල්ප වූ ජලය හස්තිසේනාව ගෙන් ද, අශ්වසෙනාවගෙන් ද, රථ සෙනාවගෙන් ද, පාබලසෙනා වගෙන් ද, ඔබිනොබ කැලඹෙමින් ක්ෂුභිත වන්නේ ය. බොර වන්නේය. මඩත් දියත් එකට ලෙළ දෙන්නේ ය. ජලය හා කලල්මඩගෝරු වන්නේ ය. ඒ ස්වල්ප වූ ඇළකඳුරෙන් එතෙර වූ චක්‍රවර්ති රජ්ජුරුවෝ, 'සගයෙනි, පැන් ගෙණෙව්. පානය කෙරෙමි' යි කියා මනුෂ්‍යයන්ට අණවා කියන්නෝ ය. රජහුගේ ද පැන් පහදවන්නා වූ මාණික්‍යරත්න යෙක් ඇති වන්නේ ය. 'එසේ ය. දෙවයන් වහන්සැ' යි කියා මනුෂ්‍යයෝ චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ වචනය අසා ඒ උදකප්‍රසාදක වූ මාණික්‍ය (38) රත්නය ගෝරුමඩදියෙහි දමුවාහු නම්, ජලයෙහි ඒ මාණක්‍යය දමූ කල්හි ම දියසක් දියසෙවෙල් දියපරඬලා පහ වන්නේ ය. මඩ සිඳී ගිලී යන්නේ ය. ජලය ද බොර නැති ව අතිප්‍රසන්න ව පැහැදීම වන්නේ ය. එයින් පැන් ගෙණ චක්‍රවර්ත්ති රජහට, 'දෙවයන් වහන්ස, පැන් පානය කරණ සේක්ව' යි කියා පැන් ළඟට ගෙණ ගොස් පිරිනමන්නාහු ය.[1] ''මහරජාණෙනි, බොර වූ ජලය යම් සේ ද, එපරිද්දෙන් සිත දත යුතු ය. පැන් පහදවන්නට ගිය ඒ මනුෂ්‍යයෝ යම් සේ ද, එපරිද්දෙන් නිවන් සොයන යොගාවචරතෙම දත යුතු ය. දියසක්, දියසෙවෙල්, දියපරඬලා බොරමඩ යම් සේ ද, එපරිද්දෙන් ක්ලේෂයෝ දත යුත්තාහ. උදකප්‍රසාදක වූ මාණික්‍යය යම් සේ ද, එපරිද්දෙන් ශ්‍රද්ධාව දත යුතු ය. යම් සේ උදක ප්‍රසාදක වූ මාණික්‍යරත්නය ජලයෙහි ප්‍රක්ෂේප කළ මාත්‍රයෙහි ම දියසක්, දියසෙවෙල්, දියපරඬලා පහව යේ ද, මඩ සිඳී ගියේ ද, බොර නැති ව අති ප්‍රසන්න ව ජලය නිර්මල වේ ද, මහරජාණෙනි, එපරිද්දෙන් ම උපදනා වූ ශ්‍රද්ධාතොමෝ පංචනීවරණයන් මැඩ පවත්නේ ය. එහෙයින් පඤ්ච නීවරණයන් කෙරෙන් මිදුනා වූ කිසි කැලඹීමක් නැත්තා වූ අතිප්‍රසන්න වූ සිත නිර්මල වන්නේ ය. 'මහරජාණෙනි, සම්ප්‍රසාදනලක්ෂණ වූ ශ්‍රද්ධාව මෙබඳු ය'' යි වදාළසේක.

''ස්වාමීනි, සම්පක්ඛන්දනලක්ෂණ වූ ශ්‍රද්ධාව කෙසේ ද?'' යි කීහ. ''මහරජාණෙනි, යම් සේ යොගාවචරතෙම අනික් අයගේ සිත ක්ලේශයන්ගෙන් මිදුනුබව දැන ශ්‍රොතාපත්තිඵලයට හෝ සකෘදගාමිඵලයට හෝ අනාගාමිඵලයට හෝ අර්හත්ඵලයට හෝ තෙමේත් පැමිණෙන්නේ අප්‍රාප්ත වූ ගුණයට ප්‍රාප්තිය පිණිස ද, නො පැමිණියා වූ ගුණයට පැමිණීම

1. පිරිනමන්නාහු වෙද්ද

Non-Commercial Distribution

පිණිස ද, සිද්ධ නො කළ ගුණයාගේ සිද්ධ කිරීම පිණිස ද, වීර්ය කරන්නේ ය. මහරජ, සම්පක්ඛන්දනලක්ෂණ ශ්‍රද්ධාතොමෝ මෙබඳුය'' යි වදාළසේක.

''ස්වාමීනි, උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ මහාපර්වතමුදුනෙක මහාමෙසයක් විශෙෂයෙන් වස්නේ වී නම්, ඒ වර්ෂාජලය යම් සේ මිටි දිසාවට පැතිර ගෙණ පර්වත කඳුරැලි, පෑලීවිවර, අතුපතු වසා පිරී ගෙණ ගොස් ගහ පිරෙන්නේ ය. ඒ මහාජලධාරා තොමෝ දෙගංඉවුරු හාත්පසින් තළවමින් යන්නේ වේ ද, නැවැත මහාජනසමූහයා අවුත් බලා හිඳ ඒ ගංගාවගේ උස නැති බවක් හෝ ගැඹුරු බවක් හෝ නො දැන භීත වෙමින් භය වෙමින් ගංතොටෙහි සිටින්නේ ය. නැවත අන්‍යතර පුරුෂයෙක් අවුත් තමාගේ ශක්තියත් බලයත් හාත්පසින් විමසා බලමින් දැඩි කොට අමුඩය ගසා බැඳ ගෙණ දියට පැන එතෙර වූයේ නම්, එතෙර වූ ඒ පුරුෂයා දැක මහාජනසමූහයාත් එතෙර වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගාවචරතෙම සෙස්සන්ගේ චිත්තය ක්ලේශයන්ගෙන් මිදුනු බව දැක සෝවාන් ඵලයට හෝ සකෘදගාමිඵලයට හෝ අනාගාමිඵලයට හෝ රහත්ඵලයට හෝ තෙමෙත් පැමිණෙන්නේ ය. අප්‍රාප්ත වූ අධිගමයාගේ ප්‍රාප්තිය පිණිස ද, නො පැමිණි අධිගමයාගේ පැමිණීම පිණිස ද, සිද්ධ නො කළ අධිගමයාගේ සිද්ධ කිරීම පිණිස ද, අධික වූ වීර්යය කරන්නේ ය. මහරජානෙනි, සම්පක්ඛන්දනලක්ෂණ වූ ශ්‍රද්ධා **(39)** තොමෝ මෙබඳු වන්නේ ය. මහරජානෙනි, අනන්ත වූ භාග්‍ය ඇති අප බුදුරජානන් වහන්සේ විසින් මේ කාරණය උතුම් වූ සංයුත්සඟියෙහි වදාරණ ලදී.

**''සද්ධාය තරතී ඔඝං–අප්පමාදෙන අණ්ණවං,**
**විරියෙන දුක්ඛං අච්චෙති–පඤ්ඤාය පරිසුජ්ඣති.''**

යනුවෙන් ''ශ්‍රද්ධාව කරණ කොට ගෙණ කාමෞඝාදිචතුර්විධඕඝයෙන් එතෙර වන්නේ ය. අප්‍රමාදය කරණ කොට ගෙණ සංසාර මහාර්ණවයෙන් එතෙර වන්නේ ය. වීර්ය කරණ කොට ගෙණ සියලු දුක් දුරු කරන්නේ ය. ප්‍රඥාව කරණ කොට ගෙණ ක්ලේශයන්ගෙන් පිරිසිදු වන්නේ ය'' යි කියා මෙසේ ශ්‍රීමුඛපාලියකුදු ගෙණ හැර දක්වා වදාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනස්ථවිරයන් වහන්ස, ප්‍රශ්න විසඳීමෙහි අතිදක්ෂ වූ සේකැ'' යි ප්‍රශංසා කළහ.

රජ්ජුරුවෝ නැවතත් ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, වීර්යය කවර ලක්ෂණ ද?'' යි කීහ. ''මහරජානෙනි, වීර්යය උපස්තම්භනලක්ෂණ වන්නේ ය. වීර්යය ආධාර වූවා වූ සියලු කුශලධර්මයෝ නො පිරිහෙන්නාහු ය'' යි වදාළසේක. ''ස්වාමීනි, උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, පුරුෂයෙක්තෙම තමාගේ ගෙය එක් අතකට නැමී වැටෙන කල්හි යම් සේ අනික් කරුවකින් ආධාර කරන්නේ වේ ද, මෙසේ උපස්තම්භනය ඇති කල ඒ වැටෙන ගෙය නො වැටෙන්නේ ය.

Non-Commercial Distribution

මහරජාණෙනි, එපරිද්දෙන් ම වීර්යය උපස්තම්භනලක්ෂණ වන්නේ ය. වීර්යයෙන් උපස්තම්භිත වූ සියලු කුශලධර්මයෝ නො පිරිහෙන්නාහු ය'' යි කීසේක.

''ස්වාමීනි, නැවතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජාණෙනි, යම් සේ මහත් වූ සෙනාසමූහයක් ඉතා මඳ වූ සෙනාවක් මැඩ පවත්වා ජය ගන්නේ වී නම්, එයින් රජ ඒ ඉතා මඳ වූ පිරිස හා සමඟ ඔවුනොවුන් සිහි කරන්නේ වී නම්, අනුබල හරින්නේ වී නම්, ඒ ආධාරය නිසා අල්ප වූ සෙනාව මහත් සේනාව මැඩ පවත්වා ජය ගන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම වීර්යය උපස්තම්භනලක්ෂණ වන්නේ ය. වීර්යය උපස්තම්භනය වුවා වූ සියලු කුශලධර්මයෝ නො පිරිහෙන්නාහ. මහරජාණෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් මෙම කාරණය වදාරණ ලදී:—

**''විරියවා ඛො භික්ඛවේ අරියසාවකො අකුසලං පජහති. කුසලං භාවෙති. සාවජ්ජං පජහති. අනවජ්ජං භාවෙති. සුද්ධමත්තානං පරිහරති.''**

යනුවෙන් ''මහණෙනි, වීර්ය ඇත්තා වූ ආර්යශ්‍රාවකතෙම සියලු අකුශල ධර්මයන් දුරු කෙරෙයි. කුශලධර්මයන් භාවිත කෙරෙයි. සාවද්‍ය ධර්මයන් දුරු කෙරෙයි. නිරවද්‍යධර්මයන් සිත්හි ලා වඩයි. ක්ලේශයන් කෙරෙන් පිරිසිදු වූ ආත්මය පරිහරණය කෙරෙ'' යි කියා වදාළා වූ බුදු බණක් දක්වා ලූසේක. එකල ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉතා දක්ෂ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සිහිය කවර ලක්ෂණ ද?'' යි කීහ. ''මහරජාණෙනි, සිහිය සම්ප්‍රයුක්තධර්මයන්
**(40)** සිහි කරවීම ස්වභාව කොට ඇති අපිලාපන ලක්ෂණ ද, උපගණ්හන ලක්ෂණ ද වෙ'' යි කීසේක. ''ස්වාමීනි, අපිලාපනලක්ෂණ වූ සිහිය කෙසේ ද?'' යි කීහ. ''මහරජාණෙනි, උපදනා වූ සිහිතොම 'මේ සතර සතිපට්ඨානයෝ ය, මේ සතරසම්‍යක්ප්‍රධානයෝ ය, මේ සතරසෘද්ධි පාදයෝ ය, මේ පඤ්චේන්ද්‍රියෝ ය, මේ පඤ්චබලයෝ ය, මේ සප්ත බොද්ධ්‍යංගයෝ ය, මේ අෂ්ටාංගිකමාර්ග ය, මේ සමථභාවනා ය, මේ විදර්ශනා ය, මේ අෂ්ටවිද්‍යා ය, මේ පඤ්චවිමුක්ති ය'' යි කියා කුශලාකුශල සාවද්‍යානවද්‍ය හීනප්‍රණීත කෘෂ්ණශුක්ල ප්‍රතිභාගධර්මයන් අරමුණු කර වන්නේ ය. එහෙයින් යොගාවචරතෙම සෙවිතව්‍යධර්මයන් සෙවනය කෙරෙයි. අසෙවිතව්‍යධර්මයන් සෙවනය නොකෙරෙයි. භජනය කළ මනා වූ ධර්මයන් භජනය කෙරෙයි. භජනය නො කළ මනා වූ ධර්මයන් භජනය නො කරන්නේ ය. මහරජාණෙනි, අපිලාපනලක්ෂණ වූ ස්මෘතිතොම මෙබඳු ය'' යි කීසේක.

''ස්වාමීනි, තවත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහ රජාණෙනි, යම් සේ චක්‍රවර්තිරජහුගේ භාණ්ඩාගාරිකතෙම චක්‍රවර්තිරජහට

Non-Commercial Distribution

උදය සවස යස පිරිවර සිහි කරවන්නේ ද, 'දේවයන් වහන්ස, ඔබගේ මෙපමණ හස්තිසේනාව ය, මෙපමණ අශ්වසෙනාව ය, මෙපමණ රථ සේනාව ය, මෙපමණ පාබලසේනාව ය, රත්රන් මෙපමණ ය, කහවණු මෙපමණ ය, මෙපමණ වස්තුව ය, ඒ සියල්ල ම දෙවයන් වහන්සේ සිහියට ගෙණ වදළ මැනැවැ'' යි කියා රජහට වස්තුසංඥ කරවන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම උපදින්නා වූ සිහිතොමෝ 'මොවුහු සතර සතිපට්ඨානයෝ ය, මොවුහු සතරසම්‍යක්ප්‍රධානයෝ ය, මොවුහු සතර ඍද්ධිපාදයෝ ය, මොවුහු පඤ්චේන්ද්‍රියයෝ ය, මොවුහු පඤ්චබලයෝ ය, සප්තබොධ්‍යංගයෝ නම් මොවුහු ය, මේ ආර්යඅෂ්ටාංගිකමාර්ගය ය, මේ සමථය ය, මේ විපස්සනා ය, මේ අෂ්ටවිද්‍යා ය, මේ පඤ්චවිමුත්තිය'යි කියා සියලු කුශලාකුශල සාවද්‍යානවද්‍ය හීනප්‍රණීත කෘෂ්ණශුක්ලප්‍රතිභාග ධර්මයන් යොගාවචරයාහට සංඥ කරවන්නේ ය. එහෙයින් යොගාවචර තෙම සෙවනය කට යුතු වූ ධර්මයන් සේවනය කරන්නේ ය. සේවනය නො කට යුතු ධර්මයන් සේවනය නො කරන්නේ ය. භාවිත[1] කළ මනා ධර්මයන් භාවිත කරන්නේ ය. භාවිත නො කළ මනා ධර්මයන් භාවිත නො කරන්නේ ය. මහරජානෙනි, අපිලාපනලක්ෂණ වූ සිහිතොමෝ මෙබඳු ය'' යි වදළසේක.

''ස්වාමීනි, උපගණ්හනලක්ෂණ වූ සිහිතොමෝ කෙසේ ද?'' යි කීහ. ''මහරජානෙනි, සිහි උපදිමින් 'මේ ධර්මයෝ අවිරුද්ධයෝ ය, මේ ධර්මයෝ බොහෝ උපකාරයෝ ය, මේ ධර්මයෝ නිවණට අනුපකාරයෝ ය' යි කියා හිතාහිතධර්මයන්ගේ ගතින් මනා කොට සොයන්නේ ය. ඒ කාරණයෙන් යොගාවචර භික්ෂූන් වහන්සේ විරුද්ධධර්මයන් පහ කරන්නාහ. අවිරුද්ධධර්මයන් ළං කරන්නාහ.[2] අනුපකාරධර්මයන් දුරු කරන්නාහ.[3] උපකාරී වූ ධර්මයන් ළං කරන්නාහ.[4] මහරජ, උපගණ්හනලක්ෂණ වූ සිහිතොමෝ මෙබඳු ය'' යි කීසේක.

''ස්වාමීනි, මීට ම උපමාවක් කර වදළ මැනවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ චක්‍රවර්තිරජ්ජුරුවෙන්ගේ පිරිස්පරිනායකරත්නය තෙම 'මොවුහු රජ්ජුරුවන්ට අවිරුද්ධයෝ ය, මොවුහු විරුද්ධයෝ ය, මොවුහු උපකාර ඇත්තෝ ය, මොවුහු අනුපකාරයෝ ය' යි **(41)** කියා රජ්ජුරුවන්ට හිතාහිතජනයන් දන්නේ ය. එහෙයින් අහිතයන් පහ කරන්නේ ය. හිතෙසින් සමීපයට ගන්නේ ය. අනුපකාරයන් පහ කරන්නේ ය. උපකාරජනයන් ළං කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම උපදනා වූ සිහිතොම 'මේ ධර්මයෝ හිතයෝ ය, මේ ධර්මයෝ අහිතයෝ ය, මේ ධර්මයෝ අනුපකාරීහු ය' යි කියා හිතාහිතධර්මයන්, ගතින් මනා කොට සොයන්නේ ය. ඒ කාරණයෙන් යොගාවචරතෙම අහිත ධර්මයන් පහ කරන්නේ ය. හිතධර්මයන් සමීපයට ගන්නේ ය. අනුපකාරීධර්මයන් ළං විය නො දෙන්නේ ය. උපකාරී ධර්මයන් සිතට ළං කොට ගන්නේ ය. මහරජානෙනි, උපගණ්හනලක්ෂණ වූ සිහිතොම මෙබඳු ය'' යි වදරමින්

1. භාවිතා 2. ළං කරන්නේ ය 3. දූර කරන්නේ ය ළංකරන්නේ ය.

*Non-Commercial Distribution*

''මහරජ, අප භාග්‍යවත් ත්‍රෛතලවශවර්තීන් වහන්සේ විසින් ද ''මහණෙනි මෙම සිහිතොම සර්වාර්ථසිද්ධියට කාරණ වන්නේ ය යි කියමි යි කියා මේ කාරණය වදරණ ලදැ'' යි කියා වදළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, අතිදක්ෂසේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

රජ්ජුරුවෝ ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, සමාධිය කවර ලක්ෂණ දැ?'' යි කීහ. ''මහරජානෙනි, සමාධිය ප්‍රමුඛ ලක්ෂණ වන්නේ ය. යම් කිසි කුශලධර්මකෙනෙක් ඇද් ද, ඒ සියලු කුශලධර්මයෝ සමාධිය ප්‍රමුඛ කොට ඇත්තාහු වෙති. සමාධියට මීට් වන්නාහු වෙති. සමාධියට අනු ව යන්නාහු වෙති. සමාධියට නැමී සිටින්නාහු වෙති'' යි කීසේක. ''ස්වාමීනි, උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ උඩුමාලකූටාගාරයාගේ යම්කිසි ගොනැස් කෙනෙක් ඇද් ද, ඒ සියල්ලෝ ම කූටයට මීට් ව කූටයට ම නැමී බැස කූටයට ම සන්ධිය වැද ගියාහු වෙද් ද? ඒ ගොපානසීන්ට කූටය ම අග්‍රය යි කියනු ලැබෙයි. 'මහරජානෙනි, එපරිද්දෙන් ම යම්කිසි කුශලධර්මකෙනෙක් ඇද් ද, ඒ සියලු ධර්මයෝ සමාධිය ප්‍රමුඛ කොට ඇත්තාහු වෙති. සමාධියට නිම්න වූවාහු වෙති. සමාධියට පොන වූවාහු වෙති. සමාධියට නැමී සිටියාහු වෙති'' යි වදළසේක.

''ස්වාමීනි, නැවතත් උපමාවක් කර වදළ මැනව'' යි කීහ. මහරජානෙනි, යම් සේ කිසි රජෙක් චතුරංගිණීසේනාව හා සමඟ සංග්‍රාමයට බස්නේ වේ ද, හස්ත්‍යශ්වරථපත්ති යන සියලු සේනාව ම ඒ රජ්ජුරුවන් ප්‍රමුඛ කොට ඇත්තාහු වෙති. ඒ රජ්ජුරුවන්ට ම නිම්න වන්නාහු ම ය. ඒ රජහට ම ඔනත වන්නාහු ම ය. ඒ රජහු පබ්භාර කොට ම ඇත්තාහු වෙති. ඒ රජ්ජුරුවන් ම පිරිවරන්නාහු ම ය. මහරජ එපරිද්දෙන් ම යම්කිසි කුශලධර්මකෙනෙක් ඇද් ද? සියලු ම ඒ ධර්මයෝ සමාධියට නිම්න ව සමාධියට ඔනත ව, සමාධියට පබ්භාර ව, සමාධිය ප්‍රමුඛ කොට ඇත්තාහු වෙති. ''මහරජානෙනි, එපරිද්දෙන් ම සමාධිය ප්‍රමුඛ ලක්ෂණ වන්නේ ය. ''මහරජානෙනි, අප භාග්‍යවත් ත්‍රෛලොක්‍යස්වාමීන් වහන්සේ විසිනුත් 'මහණෙනි, සමාධිය භාවිත කරවු. සමාධියෙන් සන්හුන්නා වූ පුරුෂතෙම තත් වූ පරිද්දෙන් සියලුගුණධර්මයන් විශෙෂයෙන් දැන ගන්නේ ය' යි කියා මේ කාරණය වදරණ ලදැ'' යි වදළසේක. එකල අතිප්‍රසන්න වූ රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, දක්ෂ වූ සේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

රජ්ජුරුවෝ නැවතත් ''නාගසෙන ස්වාමීනි, ප්‍රඥාව කවර (42)
ලක්ෂණ දැ?'' යි කීහ. ''මහරජ, මා විසින් පළමුවෙන් ම ප්‍රඥාව ඡෙදන ලක්ෂණ ය යි කියන ලද්දේ නො වේ ද? එතෙකුදු වුවත් ප්‍රඥාව ඔභාසන ලක්ෂණ ය'' යි කීසේක. ''ස්වාමීනි, ඔභාසන ලක්ෂණ වූ ප්‍රඥාව කෙසේ දැ?'' යි කීහ. ''මහරජානෙනි, උපදින්නා වූ ප්‍රඥතොමෝ අවිද්‍යාන්ධ-

Non-Commercial Distribution

කාරය දුරු කෙරෙයි. අෂ්ටවිද්‍යා නමැති ඔභාසය උපදවයි. ඤාණා-ලොකය පහළ කෙරෙයි. චතුරාර්යසත්‍ය ධර්මයන් ප්‍රකාශ කෙරෙයි. එහෙයින් යොගාවචරතෙම පඤ්චස්කන්ධය අනිත්‍ය ය යි කියා හෝ, දුකැ යි කියා හෝ, අනාත්ම ය යි කියා හෝ, සම්‍යක්ප්‍රඥාවෙන් දක්නේ ය''යි වදාළසේක. ''ස්වාමීනි, උපමාවක් කර වදාළ මැනව'' යි කීහ. ''මහරජාණෙනි, පුරුෂයෙක් යම් සේ සනාන්ධකාරයෙහි ගෙට පානක් ප්‍රවෙශ කෙරේ ද, ගෙට ප්‍රවිෂ්ට වූ ප්‍රදීපයතෙම අන්ධකාරය දුරු කෙරේ ද, ඔභාසය උපදවා ද, ආලොකය පහළ කෙරේ ද, අනෙකප්‍රකාර වූ රූපයන් ප්‍රකාශ කෙරේ ද, මහරජාණෙනි, එපරිද්දෙන් උපදනා වූ ප්‍රඥාතොමෝ අවිද්‍යාන්ධකාරය විධ්වංසනය කෙරෙයි. අෂ්ටවිද්‍යාවභාසය උපදවයි. ඤාණාලොකය පහළ කෙරෙයි. චතුරාර්යසත්‍යයන් ප්‍රකට කෙරෙයි. ඒ කාරණයෙන් යොගාවචරතෙම අනිත්‍යය යි කියා හෝ දුකැ යි කියා හෝ අනාත්මය යි කියා හෝ චතුස්සත්‍යධර්මයන් දක්නා සම්‍යක්ප්‍රඥාවෙන් විශෙෂධර්මයන් දක්නේ ය. ''මහරජාණෙනි, ඔභාසනලක්ෂණ වූ ප්‍රඥා තොමෝ මෙබඳු ය'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්න විසඳීමෙහි අතිදක්ෂ වූ සේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නානා ආකාර වූවා වූ මේ සද්ධින්ද්‍රියාදී ධර්මයෝ එක ම අර්ථයක් සිද්ධ කෙරෙද් ද?'' යි කීහ. ''එසේ ම ය; මහරජාණෙනි, නානාප්‍රකාර වූවා වූ මේ සද්ධින්ද්‍රියාදී ධර්මයෝ එක ම අර්ථයක් සිද්ධ කෙරෙති. සකලක්ලේශ-යන් නසන්නාහු ය'' යි කීසේක. ''ස්වාමීනි, නානාප්‍රකාර වූවා වූ මේ සද්ධින්ද්‍රියාදීධර්මයෝ එක ම අර්ථයක් කෙසේ නම් සිද්ධ කෙරෙද් ද? ක්ලේශයන් නසන්නාහු ද? ඊටත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජාණෙනි, නානාප්‍රකාර වූ හස්ත්‍යශ්වරථපත්ති යන චතුරංගිණී සේනාව යම් සේ එක ම අර්ථයක් සිද්ධ කෙරේ ද, සංග්‍රාමභූමියෙහි පර සේනාව මැඩ පවත්වා ජය ගන්නාහු වෙද් ද, ''මහරජාණෙනි, එපරිද්-දෙන් ම නානාප්‍රකාර වූවා වූ මේ සද්ධින්ද්‍රියාදීධර්මයෝ එක ම අර්ථයක් සිද්ධ කෙරෙති. සකලක්ලේශයන් විනාශ කෙරෙති'' යි වදාළසේක. ඒ අසා ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

ප්‍රථමවර්ගය නිමි

# දෙවෙනි වර්ගය

තවත් ප්‍රශ්නයක් අසනු කැමැති වූ මිලිඳු රජ්ජුරුවෝ ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, යමෙක් මවුකුසින් උපදනේ ය. ඒ උපන්නා වූ සත්වතෙම මියන තැන් දක්වා ඔහු ම වේ ද? නොහොත් අනික් ආකාර කෙනෙක් ද?'' යි කීහ. තෙරුන් වහන්සේ ඒ අසා ''ඔහුත් නො වෙති යි. අනිකෙකුත් නො වෙති'' යි කීසේක. ''ස්වාමීනි, උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, ඒ කුමක් සිතෙන්නෙහි ද? යම් කලෙක තෙපි තරුණ වූ **(43)** කුඩා වූ බලිසයනය කරන්නා වූ ළදරු වූහු[1] ද, දූන් තෙපි ඒ ළදරුවා ම ද? මහත් කෙනෙක් ද?'' යි විචාළසේක. ''නැත ස්වාමීනි, ළදරුවූ තරුණවූ කුඩාවූ යමෙක් උත්තානසෙය්‍යක වී ද, ඒ තෙම අනික් කෙනෙක. දූන් මම මහත් වූ අනික් කෙනෙකැ''යි කීහ. ''මහරජානෙනි, මෙසේ ඇති කල්හි මැනිකෙනෙකැ'යි කියාත් නො වන්නේ ය. පියාන කෙනෙකැ යි කියාත් නො වන්නේ ය. ආචාර්ය කෙනෙකැ යි කියාත් නො වන්නේ ය. ශිල්ප දන්නා කෙනෙකැ යි කියාත් නො වන්නේ ය. සිල්වත් කෙනෙකැ යි කියාත් නො වන්නේ ය. ප්‍රඥාවත් කෙනෙකැ යි කියාත් නො වන්නේ ය. කිමෙක් ද? මහරජානෙනි, දිවැසට විෂය වන අතිසියුම් තලතෙල්බින්දු ප්‍රමාණ වූ ප්‍රතිසන්ධි චිත්තය හටගන්නා කලලරූපයට මැනියෝ අනික් ආකාර කෙනෙක. මස් සේදූ දියත්තක් වැනි වූ අර්බුදඅවස්ථාවට මැනියෝ අනික් කෙනෙක. ලතුදියත්තක් වැනි වූ පෙසිඅවස්ථාවට මැනියෝ අනික් ආකාර කෙනෙක. මුරුතමල්කැකුළක් වැනි වූ ඝන අවස්ථාවට මැනියෝ අනික් ආකාර කෙනෙක. දැත් දෙපා හිස බෙරී වැදූ බිලිඳුහට මැනියෝ අනික් කෙනෙක. මහත් ව ගියාහට මැනියෝ අනික් කෙනෙක. අනික් කෙනෙක් ශිල්ප උගණිති. අනිකෙකු උගන්නා ලද්දේ වෙයි. අනිකෙක් පවිටුකම් කෙරෙයි. අනිකෙක්හුගේ හස්තපාදදිය කපන්නාහු ය'' යි කීසේක. ''නැත ස්වාමීනි'' යි කියමින් ''ස්වාමීන් වහන්ස, නුඹ වහන්සේ වනාහි මෙසේ යමෙකු කී කල්හි කුමක් කියනසේක් ද?'' යි විචාළාහ. එකල තෙරුන් වහන්සේ ''මහරජානෙනි, තරුණ වූ බාල වූ උත්තාන ව සයනය කරන්නා වූත් මම් ම ය. දූන් මහත් වූයේත් මම් ම ය. මේ ශරීරය නිසා ම ඒ කලලරූපය යනාදි වූ ඒ සියල්ල ම එකට ම සංගෘහීතවී[2] ය'' යි කීසේක.

''ස්වාමීනි, උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, කිසියම් පුරුෂයෙක් යම් සේ ප්‍රදීපයක් දල්වන්නේ ය. කිමෙක් ද? ඒ ප්‍රදීපය සියලු ම රාත්‍රිය මුළුල්ලෙහි ඇවිළේ ද?'' යි විචාළසේක. ''එසේ ය; ස්වාමීනි, රාත්‍රිය මුළුල්ලෙහි ම ඇවිළෙන්නේ ය'' යි කීහ. ''කිමෙක් ද මහරජානෙනි, පෙරයමහි යම් ගිනිදළුවෙක් ඇද්ද, මධ්‍යමයාමයෙහිත් එම ගිනිදළුව ම ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මධ්‍යම යාමයෙහි යම් ගිනිදළුවෙක් ඇද්ද, පශ්චිම යාමයෙහිත් එම ගිනිදළුව ම

1. වූයේ වී 2. වූවාහු

Non-Commercial Distribution

දැ?'' යි විචාළසේක. ''නැත ස්වාමීනි'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, පෙරයමෙහි ඒ ප්‍රදීපය අනිකෙක් වී ද? මැදුයමෙහි ප්‍රදීපය අනිකෙක් වී ද? පශ්චිමයාමයෙහි ප්‍රදීපය අනිකෙක් දැ?'' යි විචාළසේක. ''නැත ස්වාමීනි යි ඒ පෙරයම පාන නිසා ම සර්වරාත්‍රිය මුළුල්ලෙහි ම පාන ඇවුළුනේ ය'' යි කීහ. මහරජානෙනි, එපරිද්දෙන් ම ධර්මසන්තතිය නිසා පවත්නේ ය. අනික් කෙනෙක් උපදනාහ. අනික් කෙනෙක් කාලක්‍රියා කරන්නාහ. ඉදිරිපසු නැති ව පවත්නා දෙයක් මෙන් සිතට හැඟෙන්නේය. ඒ කාරණයෙන් උපන්නෙත් ඟේ නො වෙයි. අනිකෙකුත් නො වෙයි. පශ්චිම වූ විඥානසංග්‍රහයට යන්නේ ය'' යි කීසේක.

''ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ දෝනා ලද්ද වූ කිරි රැයක් ඉකුත් වූ කාලාන්තරයකින් දීකිරි වන්නේ ය. ඒ දීකිරෙන් වෙඬරු වන්නේ ය. වෙඬුරෙන් තෙල් පරිවර්තනය **(44)** වන්නේ ය. මහරජානෙනි, යමෙක් වනාහි 'යමක් කිරි නම්, ඒ කිරි ම දීකිරි ම ය. ඒ කිරි ම වෙඬරු ය. ඒ කිරි ම තෙල් ය' යි කියා මෙසේ කියා නම් මහරජානෙනි, කියන්නා වූ ඒ පුරුෂ තෙම මනා කොට ම ඇත්තක් ම කියන්නේ දැ? යි විචාළසේක. ''නැත, ස්වාමීනි, ඒ කිරි ම නිසා ක්‍රමයෙන් තෙල් භට ගත්තේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම ධර්මසන්තතිය භට ගන්නේ ය. අනිකෙක් උපදනේ ය. අනිකෙක් නිරුද්ධ වන්නේ ය. ඉදිරිපසු නො වූවාක් මෙන් සිතට උපදනේ ය. ඒ කාරණයෙන් උපන්නෙත් ඟේ නො වෙයි. අනිකෙකුත් නො වෙයි. පශ්චිම වූ විඥානසංග්‍රහයට යන්නේ ය'' යි වදාළසේක. එකල ''ස්වාමීනි, නාගසෙනස්ථවිරයන් වහන්ස, අතිදක්ෂ වූසේක. අතිසමර්ථ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළෝ ය.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසේනයන් වහන්ස, යමෙක් තෙම ප්‍රතිසන්ධිවශයෙන් නො උපදී ද? එතෙම මතු නො උපදනෙම් යි කියා දන්නේ දැ?'' යි කීහ. ''එසේ ය, මහරජානෙනි, යමෙක් නො පිළිසිඳ ගණීද, හෙතෙම නො පිළිසිඳ ගණිමි යි කියා දන්නේ ය'' යි කීහ. ''ස්වාමීනි, කෙසේ දනේ දැ?'' යි කීහ. ''මහරජානෙනි, පිළිසිඳ ගැණීම පිණිස යම් කාරණයක් ඇද් ද? යම් ප්‍රත්‍යයයක් ඇද් ද? ඒ හෙතුවගේ ඒ ප්‍රත්‍යයයාගේ වැළකීමෙන් හෙතෙම නො පිළිසිඳ ගණිමි යි කියා දන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ සී සා වපුරණ ගෘහපතියෙක් සීසා වපුට ගොවිතැන් කොට ධාන්‍යාගාරය පුරවන්නේ ය. ඒ ගෘහපතියා එයින් මෑත කාලයෙහි සීයකුත් නො ම සාන්නේ ය. වියකුත් නො වපුරවන්නේ ය. යම් පරිද්දෙකින් පළමුවෙන් රැස් කළ ධාන්‍යය ම අනුභව කරන්නේ හෝ කාට කාටත් බෙද දෙන්නේ හෝ කැමැති දෙයක් කරන්නේ ය. ''මහරජානෙනි, ඒ කස්සකගෘහපතිතෙම මාගේ ධාන්‍යාගාරය නො පිරෙන්නේ ය'' යි කියා දන්නේ දැ?'' යි විචාළසේක. ''එසේ ය ස්වාමීනි, ඔහු දන්නෝ ය'' යි

1. භටගන්නේ

Non-Commercial Distribution

කීහ. ''කෙසේ දනී දැ?'' යි කීසේක. ''ස්වාමීනි, ධාන්‍යාගාරයාගේ [1]පරිපූර්ණත්වය පිණිස යම් හෙතුවක් ඇද් ද? යම් ප්‍රත්‍යයයක් ඇද් ද? ඒ හෙතුප්‍රත්‍යය සන්හිඳීම පිණිස ගියබව හෙතු කොට ගෙණ මාගේ ධාන්‍යාගාරය නො පිරෙන්නේ ය'' යි කියා දන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම පිළිසිඳ ගැණීම පිණිස යම් හෙතුවක් ඇද් ද, යම් ප්‍රත්‍යයයක් ඇද් ද, ඒ හේතුවගේ ඒ ප්‍රත්‍යයයාගේ සන්හිඳීම හේතු කොට ගෙණ හෙතෙම සසර නො පිළිසිඳ ගණිමි යි කියා දන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිසමර්ථ සේක, අතිදක්ෂසේකැ''යි කියා ප්‍රශංසා කළෝ ය.

රජ්ජුරුවෝ නැවතත් ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, යමෙකුට ඥානය උපන්නේ නම් ඔහට ප්‍රඥව උපන්නා දැ'' යි කීහ, ''එසේ ය, මහරජානෙනි, යමෙකුට ඥානය උපන්නේ වී නම්, ඔහට ප්‍රඥව උපන්නා ය'' යි කීසේක. ''කිමෙක් ද, ස්වාමීනි, යමක් ඥානය නම් ප්‍රඥවත් ඕ ම දැ'' යි කීහ. ''එසේ ය, මහරජානෙනි, යමක් ඥානය වී නම් ප්‍රඥවත් ඕ ම ය'' යි කීසේක. ''ස්වාමීනි, යමෙකුට ඒ ඥානය ම ඒ ප්‍රඥව ම උපන්නේ වී නම්, කිමෙක් ද? පුරුෂතෙම මුළාබවට පැමිණේ ද? නොහොත් නො මුළාවේ දැ?'' යි කීහ. ''මහරජානෙනි, කිසි තැනෙක මුළා වෙයි. **(45)** කිසි තැනෙක නො මුළා වන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, කොතැන්හි මුළා වේ ද? කොතැන්හි මුළා නො වේ දැ?'' යි විචාළාහ. ''මහරජානෙනි, පූර්වයෙහි තමන් නො දක්නා ලද ශිල්පස්ථානයෙහි ද, පෙර නො ගිය දිසාභාගයෙහි ද, පෙර නො අසන ලද්ද වූ චිත්තවිභාගප්‍රඥප්තියෙහි ද, මුළාබවට පැමිණෙන්නේ ය'' යි වදළසේක. ''කොතැන්හි මුළා නො වන්නේ දැ?'' යි කීහ. ''මහරජානෙනි, යමක් වනාහි ඒ ප්‍රඥවෙන් අනිත්‍යය යි කියා හෝ දුකැ යි කියා හෝ අනාත්මය යි කියා හෝ කරණ ලදද, එහි මුළා නො වන්නේ ය'' යි වදළසේක. ''ස්වාමීනි, ඔහුගේ මොහය කොතැන ගියේ දැ'' යි කීහ. ''මහරජානෙනි, ඥානය උපන් මාත්‍රයෙහි ම මොහය එතැන්හි ම නිරුද්ධ වන්නේ ය'' යි කීසේක.

''ස්වාමීනි, උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක් අන්ධකාරයෙහි ගෙයි ප්‍රදීපයක් නගන්නේ වේ ද, එයින් අන්ධකාරය නිරුද්ධ වන්නේ ය. ආලොකය පහළ වන්නේ ය. ''මහරජානෙනි, එපරිද්දෙන් ම ඥානය උපන් මාත්‍රයෙහි ම මොහය එතැන්හි ම නැති වන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, ප්‍රඥව කොතැන්හි ගියේ දැ?'' යි කීහ. ''මහරජානෙනි, ප්‍රඥවත් ස්වකීය කෘත්‍යය කොට එහි ම නිරුද්ධ වන්නේ ය. යමෙක් වනාහි ඒ ප්‍රඥවෙන් අනිත්‍යය යි කියා හෝ, දුකැ යි කියා හෝ, අනාත්මය යි කියා හෝ, කරණ ලද ද, ඒ කටයුත්ත නිරුද්ධ නො වන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රඥතොමෝ ස්වකීය කෘත්‍යය කොට එහි ම නිරුද්ධ වන්නේ ය. යමක් වනාහි ඒ ප්‍රඥවෙන් අනිත්‍යය යි කියා හෝ දුකැ යි කියා හෝ,

1. **පරිපූරණය**



*Non-Commercial Distribution*

අනාත්මය යි කියා හෝ, කරණ ලද ද ඒ කළ කෘත්‍යය නිරුද්ධ නො වන්නේ ය යි කියා යම් මේ වචනයක් වදළසේක් ද, ඒ කාරණයට උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම්සේ ඓශ්වර්යයෙන් මහත් වූ යම් පුරුෂයෙක් රාත්‍රියෙහි ලියමනක් යවනු කැමැති වූයේ ලිපිකාරයකු ගෙන්වා පහන දල්වා ලියමනක් ලියවන්නේ ය. ලියමන ලිවූ කල්හි ප්‍රදීපය නිවෙන්නේ ය. ප්‍රදීපය නිවූ කල්හිත් ලෙඛනය විනාස නො වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ප්‍රඥතොමෝ ස්වකීය කෘත්‍යයය කොට එහි ම නිරුද්ධ වන්නේ ය. ඒ ප්‍රඥවෙන් අනිත්‍යය යි කියා හෝ දුකැ යි කියා හෝ අනාත්මය යි කියා යමක් කරණ ලද ද, ඒ කළ කී කටයුත්ත නිරුද්ධ නො වන්නේ ය'' යි කීසේක.

''ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ පුරත්ථිමජනපදෙයහි මනුෂ්‍යයෝ ඇවිළගත් ගින්නක් නිවන්නට ගෙයක් ගෙයක් පාසා පැන් සටවල් පසක් පසක් බැගින් තබන්නාහු වෙති. ගේ ගිනිගත් කල්හි ඒ පැන්කළගෙඩිපස ම ගෘහයාගේ මත්තෙහි නමන්නාහු ය. එකල ගිනි නිවී යන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, නැවැත ඒ පැන් ගෙණවුත් සට කෘත්‍යය කරම්හ යි කියා ඒ මනුෂ්‍යයන්ට මෙබඳු වූ සිතෙක් වේ ද?'' යි කීසේක. ''නැත, ස්වාමීනි, ඒ කළගෙඩිවලින් කටයුතු එතෙක් ම ය. ඒ පැන් කළවලින් කම් කිම් ද?'' යි කීහ. ''මහරජානෙනි, පැන් කළපස යම් සේ ද? එපරිද්දෙන් සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන පඤ්චේන්ද්‍රියයෝ දත යුත්තාහු ය. ඒ ගම මනුෂ්‍යයෝ යම් සේ ද, එපරිද්දෙන් යොගාවචරතෙම දත යුතු ය. ඇවිළ ගත් ගිනි යම් සේ ද, එපරිද්දෙන් ක්ලේශයෝ **(46)** දත යුත්තාහු ය. යම් සේ පැන්කළ පසකින් ගිනි නිවන ලද්දේ වේ ද, එපරිද්දෙන් ශ්‍රද්ධාදීපඤ්චේන්ද්‍රියයන් විසින් ක්ලේශයෝ නිවනු ලැබෙති. නිවන ලද ක්ලේශයෝ නැවැත නැවැත සම්භව නො වෙත් ම ය. ''මහරජානෙනි, එපරිද්දෙන් ම ප්‍රඥතොමෝ ස්වකීයකෘත්‍යය කොට එහි ම නිරුද්ධ වන්නේ ය. ඒ ප්‍රඥවෙන් අනිත්‍යය යි කියා හෝ දුකැ යි කියා හෝ අනාත්ම ය යි කියා හෝ යමක් කරණ ලද ද, ඒ කට යුත්ත නිරුද්ධ නො වන්නේ ය'' යි කීසේක.

''ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ වෛද්‍යාචාර්යයා පස්මුල්බෙහෙත් ගෙණ ගිලනා කරා ගොස් ඒ පස්මුල් බෙහෙත් අඹරා ගිලනාට පොවන්නේ ය. ඒ බෙහෙතින් පැමිණි දෝෂයෝ හැරී ගියාහු වූ නම්, කිමෙක් ද, මහරජානෙනි, නැවත ඒ පස්මුල්බෙහෙතින් ඖෂධ ක්‍රියා කෙරෙම්' යි කියා ඒ වෛද්‍යාචාර්යයාට මෙබඳු සිතෙක් වේ ද'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි. ඒ මුල්බෙහෙතින් කට යුතු එතෙක් ම ය. ඒ මුල්බෙහෙතින් කිම් ද?'' යි කීහ. ''මහරජානෙනි, පස්මුල්බෙහෙත් යම් සේ ද, එපරිද්දෙන් ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥ යන පඤ්චේන්ද්‍රියයෝ දත යුත්තාහු ය. වෛද්‍යාචාර්යතෙම යම් සේ ද, එපරිද්දෙන් ම යොගාවචරතෙම දත යුත්තේ ය.

Non-Commercial Distribution

ව්‍යාධිය යම් සේ ද, එපරිද්දෙන් ම ක්ලේශයෝ දත යුත්තාහු ය. ව්‍යාධි[1]ත වූ පුරුෂතෙම යම් සේ ද එපරිද්දෙන් ම පෘථග්ජනතෙම දත යුතු ය. යම් සේ පඤ්චමූලබෙහෙතින් ගිලානයාගේ රොගයෝ නසන ලද්දාහු ද, රොගය නැසුනු කල්හි ගිලානතෙම අරොගී වේ ද, එපරිද්දෙන් පඤ්චේන්ද්‍රියයන් විසින් ක්ලේශයෝ නසනු ලැබෙත්. නස්නා ලද ක්ලේශයෝ නැවත නූපදනාහු වෙති. "මහරජානෙනි, එපරිද්දෙන් ම ප්‍රඥතොම ස්වකීය කෘත්‍යය කොට එහි ම නිරුද්ධ වන්නේ ය. ඒ ප්‍රඥවෙන් අනිත්‍යය යි කියා හෝ දුකැ යි කියා හෝ අනාත්මය යි කියා හෝ යමක් කරණ ලද ද, ඒ කළ කෘත්‍යය නිරුද්ධ නො වන්නේ ය" යි වදළසේක.

"ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදළ මැනැවැ" යි කීහ. "මහ රජානෙනි, යම් සේ සංග්‍රාමාවචර වූ යොධයෙක්තෙම ශරපසක් ගෙණ සතුරුසේනාව ජය ගන්නට යුද්ධයට බස්නේ ය. සංග්‍රාමයට ගියා වූ යොධයා ඒ ශරපස ම ක්ෂිපනය කරන්නේ ය. ඒ ශරපසින් සතුරුසේනාව බිඳී ගියාහු වූ නම්, කිමෙක් ද, 'මහරජානෙනි, නැවැත ඒ ශරපසින් ශරකෘත්‍යය කෙරෙමි යි කියා ඒ සංග්‍රාමාවචර යොධයාහට මෙබඳු සිතෙක් වේ දැ?" යි විචාළසේක. "නැත, ස්වාමීනි, ඒ ශරපසින් කට යුතු එපමණින් නිමියේ ය. නැවැත ඒ ශරපසින් ප්‍රයෝජන කිම් දැ?" යි කීහ. මහරජා නෙනි, ඒ ශරපස යම් සේ ද, එපරිද්දෙන් ම, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන පඤ්චේන්ද්‍රියයෝ දත යුත්තාහු ය. සංග්‍රාමාවචර වූ යොධතෙම යම් සේ ද, එසේ ම යොගාවචරතෙම දත යුතු ය. සතුරුසේනාව යම් සේ ද, එමෙන් ක්ලේශයෝ දත යුත්තාහු ය. යම් සේ ශරපසින් සතුරුසේනාව බිඳුනාහු වෙත් ද, එපරිද්දෙන් ම පඤ්චේන්ද්‍රිය-යන් විසින් ක්ලේශයෝ බිඳුනා ලද්දාහු වෙති. බිඳුනා වූ ක්ලේශයෝ නැවැත නො උපදනාහු වෙති. "මහරජානෙනි, එපරිද්දෙන් ම ප්‍රඥව ස්වකීය කෘත්‍යය කොට එහි ම නිරුද්ධ වන්නේ ය. ඒ ප්‍රඥාවෙන් යමක් වනාහි අනිත්‍යය යි කියා හෝ දුඃඛය යි කියා **(47)** හෝ අනාත්මය යි කියා හෝ කරණ ලද ද, ඒ දාන ශීල භාවනාදි කෘත්‍යය නිරුද්ධ නො වන්නේ ය"යි වදළසේක. ඒ අසා "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිදක්ෂ වූ සේකැ" යි කියා ප්‍රශංසා කළෝ ය.

නැවතත් මිලිඳුරජ්ජුරුවෝ "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමෙක්තෙම ප්‍රතිසන්ධි වශයෙන් සසර නො පිළිසිඳ ගණී ද, ඒ පුරුෂතෙම කිසියම් දුක්ඛවේදනාවක් විඳී දැ?" යි කීහ. එකල තෙරුන් වහන්සේ "මහරජ, කිසිවක් විඳින්නේ ය. කිසිවක් නො විඳින්නේ ය" යි කීසේක. "විඳින්නේ කවරක් ද? නො විඳින්නේ කවරක් දැ" යි කීහ. "මහරජා නෙනි, කායික වූ වේදනාව විඳින්නේ ය. චෛතසික වූ වේදනාව නො විඳින්නේ ය" යි කී සේක. "ස්වාමීනි, කායික වූ වේදනාව විඳින්නේ කෙසේ ද? චෛතසික වූ වේදනාව නො විඳින්නේ කෙසේ දැ" යි කීහ. "මහරජානෙනි, කායික වූ දුක්ඛවේදනාවගේ උත්පත්තිය පිණිස පවත්නා

1. ව්‍යාධි

වූ යම් හෙතුවෙක් ඇද් ද, යම් ප්‍රත්‍යයෙක් ඇද් ද, ඒ හෙතුවගේ ඒ ප්‍රත්‍යයයාගේ නො වැළැක්ම වූ බැවින් කායිකදුක්ඛවේදනාව විඳින්නේ ය. චෛතසිකදුක්ඛවේදනාවගේ උත්පත්තිය පිණිස පවත්නා වූ යම් හෙතුවෙක් ඇද් ද? යම් ප්‍රත්‍යයයෙක් ඇද් ද? ඒ හෙතුවගේ ඒ ප්‍රත්‍යයයාගේ වැළකීමෙන් චෛතසික වූ දුක්ඛවේදනාව නො විඳින්නේ ය. ''මහරජාණෙනි, අප භාග්‍යවත් වූ ත්‍රෛලොක්‍යස්වාමීන් වහන්සේ විසිනුත් යමෙක් තෙම කායික වූ එක් වේදනාවක් විඳින්නේ ය. චෛතසික වූ වේදනාව නො විඳින්නේ ය' යි යනාදීන් මෙම කාරණය වදරණ ලද'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් ඒ යොගාවචරයෙක්තෙම කායික දුක්ඛවේදනාව විඳී ද, ඒ තෙම කුමක් නිසා පිරිනිවන් නො පාන්නේ ද?''යි කීහ. ''මහරජාණෙනි, රහත් වූවාහට අනුසයයෙක් හෝ ක්‍රොධයෙක් හෝ නැත්තේ ය. නුවණින් අගතැන් පැමිණියා වූ රහතුන් වහන්සේලා ආයුෂය නො ගෙවූනු හෙයින් නො පැසුනා වූ තමන් නැසීම් වසයෙන් නො ම හෙළන සේක් ම ය. ආයුෂයාගේ පරිපාකය ම ඉවසා බලා හිඳිති. මහරජාණෙනි, සද්ධර්මසෙනාධිපති වූ **ශාරීපුත්‍ර** නම් මහතෙරසාමීන් වහන්සේ විසින් ද මෙම කාරණය වදරණ ලද්දේ ය. පරවැඩ කිරීමෙහි කුලී නො ලැබ හිඳින බැළ මෙහෙකරුවෙක් යම් සේ ද, එමෙන් මරණයටත් සතුටු නො වෙමි. මාගේ ජීවත් ව ඉඳීමටත් සතුටු නො වෙමි. ආයුෂ කාලය ම කැමැත්තෙමි. තව ද අර්ථානර්ථ දැනගන්න සම්ප්‍රජානන ප්‍රඥාවෙන් යුක්ත වූ එසේ ම සිහියෙන් යුක්ත වූ මම මරණයටත් සතුටු නො වෙමි. ආයුෂයාගේ ජීවිතයටත් සතුටු නො වෙමි. ආයුෂය ගෙවන කාලය ම කැමැත්තෙමි'' යි වදළ මේ ශ්‍රාවකගාථා දක්වා ලූසේක.

**''නාභිනන්‍දාමි මරණං – නාභිනන්‍දාමි ජීවිතං,**
**කාලඤ්ච පතිකංඛාමි – නිබ්බිසං භතකො යථා.**
**නාභිනන්‍දාමි මරණං – නාභිනන්‍දාමි ජීවිතං,**
**කාලඤ්ච පතිකංඛාමි – සම්පජානො පතිස්සතො''** යි

එකල මිලිඳු රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් **(48)** වහන්ස, සුඛවේදනාතොමෝ කුසල් ද? අකුසල් ද? අව්‍යාකෘත ද?'' යි කීහ. ''මහරජාණෙනි, කුසලත් වන්නේ ය. අකුසලත් වන්නේ ය. අව්‍යාකෘත ද වන්නේ ය'' යි කීසේක. ''ඉදින්, ස්වාමීනි, කුසල් වී නම්, දුක් නො වන්නේ ය. ඉදින් දුක් වී නම්, කුසල් නො වන්නේ ය. ඒ සුඛවේදනාව කුසල් වී නම්, කුසල් ම ය. අකුසල් වී නම් අකුසල් ම ය. කුසලුත් දුක්ඛයත් දෙක එකට නො උපදනේ ය'' යි කීහ. 'මහරජාණෙනි, හේ තෙපි කුමක් සිතන්නහු ද? මේ ලොකයෙහි පුරුෂයෙකුගේ හස්තතලයෙහි දවසක් මුළුල්ලෙහි රත් වූ යකඩගුළියක් තබන්නේ වී නම්, දෙවෙනි හස්ත තලයෙහි හිමාලයෙහි වූ සීතපිඩක් ගෙණ තබන්නේ වී නම්, කිමෙක් ද,

Non-Commercial Distribution

මහරජානෙනි, ඒ දෙක-ම දවන්නාහු දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි. ඒ දෙක ම හස්තතලයන් දවන්නාහු ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජ, ඒ සීතපිඩත් යකඩපිඩත් දෙක ම උෂ්ණ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''කිමෙක් ද මහරජ, එසේ වී නම්, එදෙක ම සීතල දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''එසේ වී නම්, ''මහරජ, තොප කී වාදයෙහි නිග්‍රහ වූ බව දැන ගණුව. ඉදින් උෂ්ණය ම දවන්නේ වී නම් ඒ දෙක ම උෂ්ණ වන්නේ ය. එකාරණයෙන් සුඛවේදනාව කුසලුත් දුක්ඛයත් දෙක එකට උපදනේ ය යි කී වචනය සැබැව. ඉදින් සීතපිඩ ම දවන්නේ වී නම්, ඒ දෙක ම ත් සීත නො වන්නේ ය. ඒ කාරණයෙනුත් කුසලුත් දුක්ඛයත් දෙක ම එකට නො උපදනේ ය'' යි කී වචනය සැබැව. මහරජ, කුමක් නිසා ඒ දෙක ම දවන්නාහු ද? එදෙක මත් උෂ්ණ නො වන්නේ ය. ඒ දෙක ම සීතල ත් නො වන්නේ ය. එකක් උෂ්ණ ය. එකක් සීතල ය. ඒ දෙක ම ත් හස්තයන් දවන්නාහු වෙති. ඒ කාරණයෙන් කුශලයත් දුක්ඛයත් දෙක එකට නො උපදනේ ය'' යි කී වචනය සැබෑ වන නියාව දැ?'' යි කීසේක. එකල රජ්ජුරුවෝ 'අනේ! ස්වාමීනි, වජ්‍රොපම වූ තීක්ෂණ වූ ප්‍රඥාවෙන් යුක්ත වූ නුඹවහන්සේ වැනි ශ්‍රෙෂ්ඨවාදීන් හා සමග කථා කරන්නට මම අසමර්ථයෙමි. යහපත් කොට අර්ථ වදාළ මැනැවැ'' ආරාධනා කළහ.

එකල තෙරුන් වහන්සේ අභිධර්මයෙන් යුක්ත වූ ධර්මකථාවෙන් මිලිඳුරජ්ජුරුවන්ට චිත්තවිභාගය අවබොධ කර වදාළසේක. ''මහරජානෙනි, ලොකාමිසය යි කියන ලද පඤ්චකාමසම්පත්තිය අනුභව කරණ පෘථග්ජනතෙම තමන් ලද්ද වූ චක්ඛුවිඤ්ඤෙයාය වූ යහපත් වූ රූපයෙහි හෝ නුමුළා ව ලැබීමට නියත වූ රූපයෙහි හෝ කරණ ලද ගෙහනිශ්‍රිත වූ සන්තොසසිතෙක. එසේ ම සොතවිඤ්ඤෙයාය වූ ශබ්දයෙහි උපදනා සන්තොසසිතෙක. ඝාණවිඤ්ඤෙයාය වූ සුගන්ධයෙහි උපදනා සන්තොස සිතෙක. ජිව්හා විඤ්ඤෙයාය වූ රසයෙහි උපදනා සන්තොසසිතෙක. කාය විඤ්ඤෙයාය වූ ස්පර්ශයෙහි උපදනා සන්තොසසිතෙක. මනොවිඤ්ඤෙයාය වූ සිතිවිල්ලෙහි උපදනා සන්තොසසිතෙකැ' යි කියා ගෙහනිශ්‍රිත වූ සොම්නස්චිත්තයෝ සදෙනෙක. මෙකී චක්ඛුවිඤ්ඤෙයාය වූ රූපාදි සවැදෑරුම් වූ සම්පත්තීන්ගේ නො ලත් සැපත් නො ලැබීමෙන් හෝ ලත් සැපත් පිරිහීමෙන් හෝ ගෘහස්ථයාට උපදනා ගෙහනිශ්‍රිත වූ දෙම්නස්සිත් සදෙනෙක. චක්ඛුවිඤ්ඤෙයාය වූ රූපාදී මෙකී සවැදෑරුම් සම්පත්තීන්ගේ ආදීනවය නො දන සකුරුපිඩෙහි නිලීන ව වසන මැස්සකු මෙන් පඤ්ච කාමසැපත් **(49)** ස්ථිරයක් මෙන් සිතා මධ්‍යස්ථාකාරයෙන් පවත්නා ගෙහනිශ්‍රිත උපෙක්ෂාචිත්තයෝ සදෙනෙක. චක්ඛුවිඤ්ඤෙයාය වූ රූපය සොතවිඤ්ඤෙයාය වූ ශබ්දදි සවැදෑරුම් වූ සම්පත්තින් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය, නස්නා ස්වභාව ධර්මයෝ ය යි කියා සම්‍යක්ප්‍රඥාවෙන් බලා ප්‍රථමධ්‍යානවිදර්ශනාදිගුණයට පැමිණියාහට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් උපදනා සොම්නස් චිත්තයෝ සදෙනෙක. ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ,

Non-Commercial Distribution

පඤ්චමධ්‍යාන අර්හත්ඵලයට උත්සාහ කොට නො ලැබ කවර දවසක ලැබේ දෝ හෝ යි කියා උපදනා වූ නෛෂ්ක්‍රම්‍යදෞර්මනස්චිත්තයෝ සදෙනෙක. චක්ෂුර්ද්වාරාදිෂඩායතනයන්ට යහපත් වූ රූපාදියක් පැමිණි කල එහි නො ඇලීමෙන් හා අනිෂ්ටයකත් අදූෂණ ව විදර්ශනාඥානයෙන් යුක්ත වූ නෛෂ්ක්‍රම්‍යඋපෙක්ෂාචිත්තයෝ සදෙනෙකැ යි කියා මේ චක්‍රයෝ සදෙන අතීතයටත් සොම්නස් දෙම්නස් උපෙක්ෂා වේදනා වශයෙන් සතිස්වැදෑරුම් වෙති. අනාගතයටත් සතිස්වැදෑරුම් වූ වේදනාකෙනෙක් වෙති. වර්තමානකාලයටත් සතිස්වැදෑරුම් වූ වේදනා කෙනෙක් වෙති. ඒ සියලූ ම චිත්තවිශෙෂය එකට සංඥකොට එකට බහාලමින් එක්සිය අටක් වේදනාචිත්තයෝ වන්නාහු ය'' යි කියා සර්වඥසූර්යදිව්‍යරාජයාගේ දෙශනාරශ්මිකදම්බය දක්වා ලූසේක. එකල මිලිඳු රජ්ජුරුවෝ අති ප්‍රසන්න ව ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිදක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, උත්පත්ති වශයෙන් කවරෙක් පිළිසිඳ ගණිද්ද?'' යි කීහ. ඒ අසා තෙරුන් වහන්සේ ''මහරජානෙනි, නාමරූපදෙක පිළිසිඳ ගන්නේ ය'' යි කීසේක. ''කිමෙක් ද?, මේ ජාතියෙහි නාමරූපදෙක ම අනික් තැනකත් පිළිසිඳ ගන්නේ දූ?'' යි කීහ. ''මහරජානෙනි, මේ සිතත් ඇඟත් දෙක ම මතු පිළිසිඳ ගන්නේ නො වෙයි. මහරජානෙනි, මේ සිතත් ඇඟත් කරණ කොට ගෙණ යහපත් වූ පව්ටු වූ හෝ කර්මයක් කෙරේ ද, ඒ කර්මයෙන් අනික් නාමරූපයක් පිළිසිඳ ගන්නේ ය'' යි කීසේක. ''ඉදින් ස්වාමීනි, මේ සිතත් ඇඟත් දෙක ම අනික් තැනක නො උපදී නම්, ඒ සත්වතෙම පාපකර්මයෙන් මිදෙන ලද්දේ ම වන්නේ නො වේ දූ?'' යි කීහ. එවිට තෙරුන් වහන්සේ ''ඇයි, මහරජ, ඉදින් නො පිළිසිඳ ගන්නේ වී නම්, පාපකර්මයෙන් මිදුනේ වන්නේ ය. යම් හෙයකින් පිළිසිඳ ගණී නම්, එකාරණයෙන් පාපකර්මයෙන් නො මිදුනේ ය'' යි කීසේක.

''ස්වාමීනි, උපමාවක් කරන්නැ'' යි කීහ. ''මහරජානෙනි, කිසියම් පුරුෂයෙක් අනික් පුරුෂයෙකුගේ අඹ සොරා ගෙණ යන්නේ ය. එකල අඹ ස්වාමියා අඹ සොර පුරුෂයා අල්වා ගෙණ ගොස් ''දෙවයන් වහන්ස, මේ පුරුෂයා විසින් මාගේ අඹ සොරකම් කරණ ලද්දේ ය'' යි කියා රජ්ජුරුවන්ට දක්වූයේ වී නම්, ඒ සොරතෙම 'අනේ! ස්වාමීනි, මම මොහුගේ අඹ සොරකම් නො කෙළෙම්. මොහු විසින් රොපනය කරණ ලද යම් අඹපල කෙනෙක් ඇද් ද, ඒ අඹ වෙන ය. මා විසින් ගන්නා ලද අඹ අනිකෙක. මම දණ්ඩනයට ප්‍රාප්ත නො වෙමි'' යි මෙසේ කියා නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ පුරුෂතෙම දණ්ඩප්‍රාප්ත වේ දූ?'' යි විචාළසේක. ''එසේ ය; ස්වාමීනි, දණ්ඩප්‍රාප්ත වන්නේ ය'' යි කීහ. ''කවර කාරණයකින් දූ?'' යි විචාළසේක. ''ඇයි **(50)** ස්වාමීනි, ඒ පුරුෂතෙම මෙසේ කියන්නේ වී නමුත්, පළමුවෙන් රොපණය කළ අඹ ප්‍රවෘත්ති නො සලකා එයින් පසු ව පල ගත් අඹ කරණ කොට ගෙණ ඒ පුරුෂතෙම

දණ්ඩන ප්‍රාප්ත වන්නේ ය'' යි කිහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මේ නාමරූපය කරණ කොට ගෙණ යහපත් වූ හෝ පවිටු වූ හෝ කර්මයක් කෙරේ ද, ඒ කර්මය කරණ කොට ගෙණ අනික් නාමරූපයක් පිළිසිඳ ගන්නේ ය. එහෙයින් පාපකර්මයෙන් නො මිදූනේ ය'' යි කීසේක.

''ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කිහ. ''මහරජානෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක් අනික් පුරුෂයෙකුගේ ඇල්වී සොරකම් කෙළේ වී නම්, ඒත් යථොක්ත ක්‍රමයෙන් දත යුත්තේ ය. උක්දඬු සොරකම් කෙළේ වී නම්, ඒත් ආම්‍රොපමාව මෙන් දත යුත්තේ ය. ''මහරජානෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක් තෙම හෙමන්තකාලයෙහි ගිනි දල්වා ගිනි තැප නො නිවා ගියේ වී නම්, නැවත ඒ ගිනි අනික් පුරුෂයෙකුගේ පැසෙන පූදින කුඹුරක් හෝ ඟේනක් හෝ දවා ගියේ වී නම්, ක්ෂේත්‍රස්වාමියා ඒ පුරුෂයා අල්වා ගෙණ රජගෙට ගොස් 'දෙවයන් වහන්ස, මේ පුරුෂයා විසින් මාගේ ක්ෂේත්‍රය දවන ලද්දේ ය' යි කියා රජ්ජුරුවන්ට දැක්වූයේ වී නම්, එකල ඒ පුරුෂතෙම 'අනේ! ස්වාමීනි, මම මොහුගේ කෙත නො දැවූයෙමි. මා විසින් යම් ගින්නක් නො නිවන ලද ද, ඒ ගින්න අනිකෙක, යම් ගින්නකින් මොහුගේ කෙත දවන ලද ද, ඒ ගින්න අනිකෙක. එහෙයින් මම අපරාධ ප්‍රාප්ත නො වෙමි' යි මෙසේ කියන්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ පුරුෂතෙම දණ්ඩප්‍රාප්ත වේ දැ?'' යි විචාළසේක. ''එසේ ය ස්වාමීනි, දණ්ඩප්‍රාප්ත වන්නේ ය'' යි කීහ. කවර කාරණයකින් දැ?'' යි විචාළසේක. ''ඇයි, ස්වාමීනි, ඒ පුරුෂ තෙම මෙසේ කීයේ වී නමුත් පළමුවෙන් දල්වා තැපපු ගිනි යැලකීමට නො ගෙණ පසු ව එයින් ම ඇවිළී ආ ගිනි කරණ කොට ගෙණ ඒ පුරුෂ තෙම දණ්ඩන ප්‍රාප්ත වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මේ නාමරූපයෙන් යහපත් වූ කුශලයක් හෝ පවිටු වූ අකුශලයක් හෝ (යන) යම් කර්මයක් කෙරේ ද, ඒ කර්මයෙන් අනික් නාමරූපයක් පිළිසිඳ ගන්නේ ය. ඒ කාරණයෙන් පාපකර්මයෙන් නො මිදෙන්නේ ය'' යි කීසේක.

''ස්වාමීනි, නැවතත් විශෙෂ වූ උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක්තෙම ප්‍රදීපයක් ගෙණ උඩුමාලට නැගී බත් අනුභව කරන්නේ ය. එකල ඒ ප්‍රදීපය තෙල් සහ ඇවිලෙමින් ගිනි නැඟී තෘණසෙවෙනි දවන්නේ ය. තෘණසෙවෙනි ද දවා ඟෙය දවන්නේ ය. ගෙය දවමින් ගමේ සමීප ගෙවල් දවන්නේ ය. එකල ගමේ ජනයෝ ඒ පුරුෂයා අල්වා ගෙණ 'එම්බල පුරුෂය, තෝ කුමක් පිණිස අපගේ ගම පිළිස්සූයෙහි දැ?''යි මෙසේ කීවාහු නම්, ඒ පුරුෂතෙම පින්වත්නි, මම තොපගේ ගම නො දැවූයෙමි. මම යම් ප්‍රදීපයක්හුගේ ආලොකයකින් අනුභව කෙළෙම් ද, ඒ ප්‍රදීපාග්නිය අනිකෙක. යම් ගින්නකින් ග්‍රාමය දවන ලද ද, ඒ පසු ඇවුළුනු ගින්න අනිකෙකැ' යි කියා නම්, ඒ මනුෂ්‍යයෝ විවාද කෙරෙමින් 'මහාජ, තොපගේ, සමීපයට ආවාහු වූ නම්, මහරජ, තෙපි කාට අර්ථ ධරමින් නඩු කියන්නාහු දැ?'' යි විචාළ

Non-Commercial Distribution

සේක. ''ස්වාමීනි; ග්‍රාමජනයාහට නඩු කෙරෙමි'' යි කීහ. ''හේ කුමක් නිසා දැ?'' යි විචාළසේක. (51) ඒ පුරුෂතෙම මේ ආකාරයෙන් කෙසේ කියන්නේ වී නමුත්, කිමෙක් ද, ඒ ප්‍රදීපාග්නියෙන් ම ඒ ග්‍රාමයත් දැවූ ගිනි උපන්නේ ය'' යි කීහ. ''මහරජාණෙනි, එපරිද්දෙන් ම කිසිසේත් මරණාන්තිම වූ නාමරූපය අනිකෙක. ප්‍රතිසන්ධියෙහි උපදනා නාමරූපය අනිකෙක. එසේ නමුත් ඒ මරණාසන්න වූ නාමරූපයෙන් ම ඒ ප්‍රතිසන්ධි නාමරූපය උපදනේ ය. ඒ කාරණයෙන් පව්වූ වූ ,අකුශලකර්මයෙන් නො මිදෙන ලද්දේ ය'' යි කීසේක.

''ස්වාමීනි, තවත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජාණෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක්තෙම ලදරු වූ කුමාරිකාවක් තමාට සරණ ගෙණ යන පිණිස නියම කොට ගෙණ ජීවත් වීමට වැටුප් දී ගියේ වී නම්, ඕ[1] තොමෝ මැතභාගයෙහි මහත් ව වයස් ප්‍රාප්ත වූවා ය. ඉක්බිති වෙනින් පුරුෂයෙක් වැටුප් දී සරණමඟුල් කෙළේ වී නම්, අනික් පළමු පුරුෂයා අවුත් 'එම්බල පුරුෂය, තෝ කුමක් පිණිස මාගේ භාර්යාව සරණ ගෙණ ගියෙහි දැ?' යි මෙසේ කීයේ වී නම්, ඒ අළුත් පුරුෂයා 'මම තාගේ භාර්යාවක් නො ගෙණායෙමි. තා විසින් යම් ස්ත්‍රියක් නියම කරණ ලද ද, වැටුප් දෙන ලද ද, ලදරු වූ තරුණ වූ ඒ ලදැරිතොම වෙනින් ස්ත්‍රියක. මා විසින් යම් ස්ත්‍රියක් නියම කරණ ලද ද, වැටුප් දෙන ලද ද, යෞවන වයසට පැමිණියා වූ වැඩී මහත් වූ මේ ස්ත්‍රීතොම වෙනින් ස්ත්‍රියක' යි මේ ආකාර කියන්නේ වී නම්, ඒ දෙදෙනා විවාද කෙරෙමින් තොපගේ සමීප-යට ආවාහු වූ නම්, මහරජාණෙනි, තෙපි ඒ දෙදෙනාගෙන් කාට අර්ථ සාධමින් නඩු සාදන්නහු දැ?'' යි විචාළසේක ''ස්වාමීනි, පළමු පුරුෂයාට නඩු සාදමි'' යි කීහ. ''කවර කාරණයකින් දැ?'' යි විචාළසේක ''ඒ පුරුෂ තෙම මේ ආකාර කෙසේ කීයේ වී නමුත්, කිමෙක් ද, ඒ ලදැරිතොම ලදරු ද පටන් ක්‍රමයෙන් ම මහත් ව උපන්නී නො වේ දැ?'' යි කීහ. ''මහරජාණෙනි, එපරිද්දෙන් ම කෙසේ නමුත් මරණාන්ත වූ නාමරූපය යි කියන ලද චිත්තචෛතසිකයන් හා අටළොස් වැදෑරුම් වූ රූප ය යි කියන ලද මේ නාමරූපය අනිකෙක. ප්‍රතිසන්ධියෙහි පිළිසිඳිනා නාමරූපය අනිකෙක. එතෙකුදු වූවත් ඒ මරණාන්තිම වූ නාමරූපයෙන් ම ඒ ප්‍රතිසන්ධියෙහි උපදනා නාමරූපය උපදනා ලද්දේ ය. ඒ කාරණයෙන් පාපකර්මයෙන් නො මිදෙන ලද්දේ ය'' යි කීසේක.

''ස්වාමීනි, නැවතත් විසිතුරු වූ උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජාණෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක් ගවපාලයෙකුගේ අතින් කිරිකළයක් මිල දී ගෙණ ඔහුගේ අත ම තබා සෙට ගෙණ යෙමි'' යි කියා ගියේ වී නම්, දෙවෙනි දවස් ඒ කිරි දීකිරි වූයේ ය. එකල ඔහු අවුත් 'මාගේ කිරිකළය දෙව' යි මෙසේ කියන්නේ වී නම්, ඒ ගවපාලයා දීකිරි දක්වා දෙන්නේ ය. අනික් පුරුෂයා 'මම තාගේ අතින් මේ දීකිරි මිල දී නො ගත්තෙමි. මාගේ කිරිකළය ම දෙව' යි මෙසේ කියා නම් ඒ ගවපාල

1. ඈ

Non-Commercial Distribution

පුරුෂතෙම 'එම්බල, තාගේ කිරි දීකිරි වූ බව නො දන්නෙහි ද?'' යි මෙසේ කියන්නේ වී නම් විවාද ඇත්තා වූ ඒ දෙදෙනා තොපගේ සමීපයට ආවාහු වූ නම්, ''මහරජානෙනි, තෙපි කවරෙකුහට හිතාර්ථය ධරන්නාහු ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ගවපාලයාහට ය'' යි කීහ. ''කුමක් පිණිස ද'' යි විචාළසේක. ''ඒ පුරුෂතෙම මේ ආකාර කෙසේ කියන්නේ වී නමුත් කිමෙක් ද (52) ඒ දීකිරි එම කිරෙන් ම උපන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම කෙසේ නමුත් මරණාන්තිම වූ චිත්තය හා රූපය අනිකෙක. ප්‍රතිසන්ධියෙහි වන චිත්තය හා අතිසුඛුම වූ කලල රූපය අනිකෙක. එතෙකුදු වුවත් ඒ ආත්මභාවය පළමු ආත්මභාවය නිසා ම උපන්නේ ය. එහෙයින් පාපාදිකර්මයෙන් ආත්මය නො මිදුනේ ය'' යි කියා වදාළසේක. එකල මිලිඳුරජ්ජුරුවෝ අතිප්‍රසන්න ව 'ස්වාමීනි, නාගසෙනස්ථවිරයන් වහන්ස, අතිදක්ෂ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ නැවැත පිළිසිඳීම වශයෙන් උපදනාසේක් ද?'' යි කීහ. ''මහ රජානෙනි, ඒ ඇසූ දෙයින් කම් කිම් ද? එපමණෙක් ම ය. මහරජ, ඉදින් උපාදනසහිත වීම් නම්, පිළිසිඳ ගණිමි. ඉදින් අනුපාදන වීම් නම් නො පිළිසිඳ ගන්නෙමි' යි කියා පළමු කොට ම මා විසින් කියන ලද්දේ නො වේ ද?'' යි කීසේක. ''උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක් රජක්හට අධික වූ රාජකෘත්‍ය කරන්නේ වී නම්, සන්තුෂ්ට වූ රජ්ජුරුවෝ ඕහට ඊශ්වර වූ තනතුරු දෙන්නාහු ය. ඒ අමාත්‍යතෙම ඒ ප්‍රධාන වූ තනතුර කරණ කොට ගෙණ පඤ්චකාම සම්පත්තියෙන් සමප්පිත ව සමංගිභූත ව හැසිරෙන්නේ ය. ඉදින් ඒ අමාත්‍යතෙම ''රජ්ජුරුවෝ මට මදකුත් උපකාරයක් නො කරණ සේකැ'යි කියා මහජනයාට කියන්නේ වී නම්, කිමෙක්ද, මහරජානෙනි, ඒ අමාත්‍යපුරුෂතෙම යුක්තකාරී වේ ද?'' යි විචාළසේක. ''නැත. ස්වාමීනි, රජ්ජුරුවෝ තව කුමක් කෙරෙද් ද? එලෙස කීම සුදුසු නැතැ''යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම පළමුවෙන් අසන ලද මේ වචන-යෙන් තොපට කම් කිම්ද? ඉදින් හරවා ගත නො හැක්කා වූ කාමතෘෂ්ණාදි වූ උපාදන සහිත වීම් නම් පිළිසිඳ ගණිමි. ඉදින් කාමතෘෂ්ණාදීන් පහ කිරීමෙන් අනුපාදන වීම් නම්, සසර නො පිළිසිඳ ගන්නෙමි' යි කියා මා විසින් පළමු කොට ම කියන ලද නො වේ ද?'' යි කීසේක. එකල ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නාම රූපය '' යි කියා යම් මේ වචනයක් වදළසේක් ද? එහි නාමය කවරේ ද? රූපය කවරේ ද?'' යි කීහ. ''මහරජානෙනි, ඒ නාමරූපයෙහි යමක් ඔළාරික වී ද, ඒ මේ රූපය රූප නම් වෙයි. ඒ නාමරූපයෙහි යම් සුඛුම වූ චිත්තචෛතසිකධර්මකෙනෙක් ඇද්ද, ඒ මේ නාමය නම් වෙ'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කවර කාරණයකින් සිත ම වෙන ම පිළිසිඳ නො ගණී ද? රූපය ම වෙන ම නො උපදී ද?'' යි විචාළෝ ය.

Non-Commercial Distribution

''මහරජානෙනි, මේ රූපාරූපධර්මයෝ මලුත් සුවඳත් මෙන් ඔවුනොවුන් ආශ්‍රය කොට ඇත්තාහු ය. උපදනා කල එකට ම උපදනාහු[1] ය'' යි කීසේක.

''ස්වාමීනි, උපමාවකුත් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ කිකිළියකගේ කලල ය යි කියන ලද ආපෝසාරුව නො වන්නේ වී නම් බීජයත් නො වන්නේ ය. ඒ කිකිළියගේ කුක්ෂියෙහි යම් කලලයක් ඇද් ද, යම් බිජුකබලක් ඇද් ද, ඒ දෙක ම ඔවුනොවුන් ආශ්‍රය කොට ඇත්තාහු ය. ඒ දෙදෙනාගේ එකට ම උත්පත්තිය වන්නේ ය. එපරිද්දෙන් ම මහරජානෙනි, ඉදින් ඒ **(53)** රූපාරූපධර්මයෙහි නාමය නො වන්නේ වී නම්, රූපයත් නො වන්නේ ය. එහි යමක් නාමය වේ ද, යමක් රූපය වේ ද, ඒ දෙදෙන ම අඤ්ඤමඤ්ඤූපනිස්සිත වූවාහු ය. ඒ දෙදෙනාගේ එකට ම ඉපදීම වන්නේ ය. මෙසේ මේ නාමරූපය අනන්ත වූ දීර්ඝකාලයක් මුළුල්ලෙහි පුරුදු වන ලදූ'' යි වදාළසේක. එකල ඒ අසා සාධුකාර දෙමින් ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිදක්ෂ වූසේකැ''යි කියා ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දීර්ඝ කාල ය'' යි කියා යම් මේ වචනයක් වදාළසේක් ද, ඒ මේ අද්ධානය නම් කවරේ දූ?'' යි කීහ. ''මහරජානෙනි, අතීතකාලය අනාගතකාලය වර්තමානකාලය යන මේ අද්ධානය නම් වෙ'' යි කීසේක. ''කිමෙක් ද, ස්වාමීනි, කාලයතෙම ඇත්තේම දූ?'' යි කීහ. ''මහරජානෙනි, කිසි අද්ධානයක් ඇත. කිසි අද්ධානයක් නැතැ'' යි කීසේක. ''ස්වාමීනි, ඇති කාලය කවරේ ද? නැති කාලය කවරේ දූ?'' යි කීහ. ''මහරජානෙනි, සංසාරොත්පත්තිය කරවන්නා වූ යම් ඒ සංස්කාරධර්මකෙනෙක් අතීත ව ගියාහු ද, පහ ව ගියාහු ද, විපරීත ව ගියාහු ද, ඔවුන්ගේ ඒ කාලයතෙම නැත්තේ ය. විපාක දෙමින් සිටින්නා වූ යම් ධර්මකෙනෙක් ඇද් ද, විපාක දීම පිණිස සිටින්නා වූ යම් ධර්මකෙනෙක් ඇද් ද, ඒ ධර්මයන්ගේ හා යම් ධර්මයෙක් අනික් ජාතියෙක්හි ප්‍රතිසන්ධිය දෙන්නේ වේ ද, මේ කී ධර්මයන්ගේ ඒ කාලයතෙම ඇත්තේ ය. කාලක්‍රියා කරණ ලද්දූ වූ යම් සත්වකෙනෙක් අනික් තෙනක උපදනා ලද්දහු වූ නම් ඒ කාලය ඇත්තේ ම ය. කාලක්‍රියා කරණ ලද්ද වූ යම් සත්වකෙනෙක් අනික් තැනක නො උපදිනා ලද්දහු වූ නම්, ඒ කාලය නැත්තේ ම ය. යම් සත්වකෙනෙක් පිරිනිවන් පානා ලද්දහු ද, ඒ සත්වයෝ පිරිනිවී බැවින් ඔවුන්ගේ ඒ කාලය ද නැතැ'' යි කියා වදාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළ හ.

**සකලජනමනොනන්දනීය වූ මේ මිලින්දප්‍රශ්න නම් වූ ශ්‍රීසද්ධර්මාදසයෙහි ද්විතීයවර්ගය නිමි.**

---

1. උපදනේ

*Non-Commercial Distribution*

# තුන්වන වර්ගය

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතීත කාලයට මුල් කවරේ ද? අනාගතකාලයට මුල් කවරේ ද? වර්තමාන කාලයට මුල් කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජාණෙනි, අතීතකාලයට ද අනාගතකාලයට ද ප්‍රත්‍යුත්පන්නකාලයට ද ඇස වසා බැඳි කඩක් මෙන් මුළා කොට චතුස්සත්‍යධර්මයන් දක්ක නො දෙන හෙයින් අවිද්‍යා නම් වූ මොහය මුල් වන්නේ ය. නො වින්ද යුතු වූ කායදුශ්චරිතාදිය විඳින බැවින් ද වින්ද යුතු වූ කායසුචරිතාදිය නො විඳින බැවින් ද පඤ්ච ස්කන්ධයන්ගේ රාශිගතභාවය දක්ක නො දෙන බැවින් ද, ෂඩායතන-යන්ගේ චක්ෂුර්විඥානාදීන් පවත්වන ස්වභාවය දක්ක නො දෙන බැවින් ද, අෂ්ටාදශධාතුන්ගේ ශූන්‍යතාව දක්ක නො දෙන බැවින් ද, චක්ෂුරාදි ෂඩින්ද්‍රියයන්ගේ ආධිපත්‍යය දක්ක නො දෙන බැවින් ද, කෙළවරක් නැති සංසාරයෙහි ලා සත්වයා සියලු ම භව යොනි ගති ස්ථිති සත්වාවාස-යෙහි උපදවන **(54)** බැවින් ද, අවිද්‍යා නම් වූ මොහය හෙතු කොට ගෙණ එකුන්තිසක් පමණ කුශලාකුශලචිත්තයෝ උපදිති. ඒ කුශලාකුශලසිත් හෙතු කොට ගෙණ ප්‍රතිසන්ධිවිඥාන ය යි කියන ලද එකුන්විස්සක් පමණ පිළිසිඳ ගන්නා චිත්තයෝ පහළ වෙති. ඒ ප්‍රතිසන්ධිචිත්තයන් හෙතු කොට ගෙණ නාමරූපය යි කියන ලද පඤ්චස්කන්ධයෝ පහළ වෙති. ඒ පඤ්ච ස්කන්ධයන් හෙතු කොට ගෙණ ඇස් කන් නාසාදී වූ කාය මන[1] යන ෂඩ්විධ ආයතනයෝ පහළ වෙති. ඒ චක්ඛායතනාදීන් හෙතු කොට ගෙණ බාහිර වූ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය, ධර්ම යන ෂඩ්විධ වූ ස්පර්ශයෝ පහළ වෙති. ඒ ස්පර්ශයන් හෙතු කොට ගෙණ දුක් සැප උපෙක්ෂා වීම ය යි කියන ලද ත්‍රිවිධවේදනාවෝ පහළ වෙති. ඒ සුඛදුඃඛොපෙක්ෂා ය යි කියන ලද වේදනාව කරණ කොට ගෙණ කාමතෘෂ්ණාදී වූ එක්සිය අටක් පමණ තෘෂ්ණාවෝ පහළ වෙති. ඒ ආශාව හෙතු කොට ගෙණ කාමූපාදනාදි චතුර්විධඋපාදනය වන්නේ ය. ඒ අරමුණු දැඩි කොට ගැණීම හෙතු කොට ගෙණ ත්‍රිවිධ වූ භවය වන්නේ ය. ඒ භවය හෙතු කොට ගෙණ ජාති - ඉපදීම වන්නේ ය. ඉපදීම හෙතු කොට ගෙණ රූපාදීන්ගේ මුහු කිරීම ය යි කියන ලද ජරාව ද, රූපාදීන්ගේ බිඳීම ය යි කියන ලද මරණය ද, නැසුනු දෙයට ශොක කිරීම ද, ඊට ම හැඬීම ද, දුක් වීම ද, දොම්නස් වීම ද, සිත් තැවුල් ද යන මෙතෙක් දෙය වන්නාහු ය. මහරජ, මෙසේ සියලු ම කාලත්‍රයාගේ පූර්වකෙළවර නො පැණෙ'' යි වදළසේක. ඒ අසා ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිදක්ෂ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

මීට ම උපමාවක් අසනු කැමැති වූ රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, පූර්වකෙළවර නො පෙණෙ'' යි කියා යම් මේ වචනයක් වදළසේක් ද, ඊට උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජාණෙනි, යම් සේ පුරුෂයෙක් කුඩාබිජුඇටක් පෘථිවියෙහි රොපණය කරන්නේ ය.

1. මනො

Non-Commercial Distribution

එයින් දලුව නැඟී ක්‍රමයෙන් වෘද්ධියට මහත් වීමට විපුලත්වයට පැමිණ ඵල දෙන්නේ ය. ඒ ඵලයෙන් බිජු ගෙණ නැවැතත් රොපණය කරන්නේ ය. එයින් දළු නැඟී ක්‍රමයෙන් වෘද්ධියට මහත් වීමට විපුලත්ව-යට පැමිණ ඵල දෙන්නේ ය. මෙසේ මේ සන්තතියගේ කෙළවරක් ඇද්ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මේ කාලයාගේත් පූර්වකෙළවර නො පෙණේ'' යි කියා වදළසේක. ''ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ කිකිළියගේ බීජයක් වේ ද, ඒ බීජයෙන් කිකිළියක් වේ ද, ඒ කිකිළියගේ නැවත බීජයෙක් වේ ද, මෙසේ මෙම ක්‍රමයෙන් කෙළවරෙක් ඇද්ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මේ කාලයාගේ පූර්වකෙළවර නො පෙණේ'' යි කියා වදළසේක.

''ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. එකල තෙරුන් වහන්සේ භූමියෙහි චක්‍ර-චළල්ලක් මෙන් කව සුද්ධ ඉරක් ලියා ''මහරජ, මේ චක්‍රයාගේ අක්මුල්කෙළවරක් ඇද්ද?'' යි මිලිඳුරජහට මෙසේ කීසේක. ''ස්වාමීනි, එසේ නැතැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අප භාග්‍යවත් වූ **අනන්තබුද්ධින්** වහන්සේ විසින් මේ ප්‍රතීත්‍යසමුත්පාදචක්‍රය වදරණ ලද්දේ ය. ආධ්‍යාත්මික වූ ඇස නිසාත් බාහිර වූ රූපය නිසාත් චක්ෂුර්විඥානය උපදනේ ය. **(55)** මේ තුන්දෙනාගේ එකතු වීමෙන් ස්පර්ශය වන්නේ ය. ස්පර්ශප්‍රත්‍යයෙන් ත්‍රිවිධ වූ වේදනාව වන්නේ ය. වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව හට ගන්නේ ය. ඒ තෘෂ්ණා ප්‍රත්‍යය හෙතු කොට ගෙණ කර්මය සම්පාදනය කිරීම වන්නේ ය. කර්මයෙන් ඉක්බිති ව නැවැතත් ඇස කරණ කොට ගෙණ චක්ෂුර්විඥනය උපදනේ ය. මෙසේ මේ පටිපාටියගේ කෙළවරෙක් ඇද් ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''කණ නිසාත් ශබ්දය නිසාත් ශ්‍රොත විඥනය උපදනේ ය. එසේ ම නාසය නිසාත් ගන්ධය නිසාත් ඝ්‍රාණවිඥනය උපදනේ ය. දිව නිසාත් රස නිසාත් ජිහ්වාවිඥනය උපදනේ ය. කය නිසාත් බාහිරරූපය නිසාත් කායවිඥනය උපදනේ ය. එසේ ම මනස නිසාත් ධර්මචින්තාවන් නිසාත් මනොවිඥනය උපදනේ ය. මේ තුන් දෙනාගේ එකතුවීමෙන් ස්පර්ශය වන්නේ ය. ඒ ස්පර්ශප්‍රත්‍යයෙන් විඳීම වන්නේ ය. ඒ වේදනාප්‍රත්‍යයෙන් ආලය වන්නේ ය. ඒ තෘෂ්ණා හෙතු කොට ගෙණ ඒ ඒ කට යුතු කර්මය වන්නේ ය. ඒ කර්මයෙන් නැවැතත් මනසාදිය උපදනේ ය. මෙසේ කල මේ පිළිවෙළගේ අන්තයෙක් ඇද්ද?''යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මේ කාලයාගේ පූර්වකෙළවර නො පෙණේ'' යි කියා වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිසමර්ථසේක. අතිදක්ෂ වූසේකැ''යි කියා ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පූර්ව කෙළවරක් නො පෙණේන්නේ ය යි කියා යම් මේ වචනයක් වදළසේක් ද,

ඒ පූර්වකෙළවර කවරේ දැ?'' යි විචාළහ. ''මහරජාණෙනි, යම් ඒ අතීත වූ කාලයෙක් ඇද්ද, ඒ මේ පූර්ව කෙළවරය'' යි වදාළ සේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පූර්වකෙළවර නො පෙණෙ යි කියා යම් මේ වචනයක් වදාළසේක් ද, ස්වාමීනි, කිමෙක් ද, සියලු ම පූර්ව කෙළවර නො පෙණේ දැ' යි විචාළෝ ය. ''මහරජාණෙනි, කිසිවක් පෙණෙ යි, කිසිවක් නො පෙණෙ යි'' වදාළසේක. ''ස්වාමීනි, කවරක් පෙණේ ද? කවරක් නො පෙණේ දැ?'' යි විචාළෝ ය. ''මහරජාණෙනි, මීට පළමුවෙන් සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාර අවිද්‍යාව නො වූයේ ය'' යි කියා මෙබඳු වූ පූර්වකෙළවර නො පෙණෙන්නේ ය. යමක් නො වී වේ ද, ඉපද විනාස වේ ද, මෙබඳු වූ පූර්වකෙළවර පෙණෙන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමක් නො වී ම උපදී නම්, ඉපද විනාස වූයේ නම්, ඉදින් ඒ මේ කාරණය දෙකෙළවර සිඳිනු ලද්දේ නැස්මට යන්නේ නො වේ දැ?'' යි කීහ. ''මහරජාණෙනි, ඉදින් දෙකෙළවර සිඳින ලද අවිද්‍යාව නැස්මට යන්නේ ය'' යි වදාළසේක. ''දෙකෙළවර සිඳින ලද්දු වූ අවිද්‍යාව වඩන්නට හැකි වේ දැ?'' යි විචාළෝ ය. ''එසේ ය. දෙකෙළවර සිඳුනු අවිද්‍යාවත් වඩන්නට හැක්කැ'' යි වදාළසේක. ''ස්වාමීනි, මම මේ කාරණය නො විචාරමි. කෙළවර පටන් වඩන්නට හැකි වේ දැ'' යි කීහ. ''එසේ ය, කෙළවර පටන් වඩන්නට හැකි වන්නේ ය'' යි කීසේක. ''උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. තෙරුන් වහන්සේ මිලිඳු රජහට වෘක්ෂොපමාවක් කර වදාළසේක. ''සියලු ම සංසාරදුක් සමූහයාගේ උපදවාලීමට ස්කන්ධධර්මයෝ බිජුඇට වන්නාහු ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවැතත් (56) රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම්කිසි සංස්කාරධර්මකෙනෙක් උපදින්නාහු ද, එබඳු ධර්මකෙනෙක් ඇද් දැ?'' යි විචාළසේක. ''එසේ ය, මහරජාණෙනි, උපදින්නා වූ යම් සංස්කාරධර්මකෙනෙක් ඇතැ'' යි වදාළසේක. ''ස්වාමීනි, ඒ ධර්මයෝ කවුරු දැ?'' යි කීහ. ''මහරජාණෙනි, ඇස ඇති කල්හි ද රූපය ඇති කල්හි ද චක්ෂුර්විඥානය වන්නේ ය. චක්ෂුර්විඥානය ඇති කල්හි චක්ෂුඃස්පර්ශය වන්නේ ය. චක්ෂුඃස්පර්ශය ඇති කල්හි විඳීම වන්නේ ය. වේදනාව ඇති කල්හි ආලය වන්නේ ය. තෘෂ්ණාව ඇති කල්හි ගැණීම වන්නේ ය. උපාදානය ඇති කල්හි භවය වන්නේ ය. ඒ භවය ඇති කල්හි ජාති-ඉපදීම වන්නේ ය. ඒ ජාතිය ඇති කල්හි ම මහලු ව ජරාපත් වීම ද ශරීරභෙදයෙන් නැසීම ද සෝකකිරීම ද දුක් වීම ද දොම්නස් වීම ද සිත් තැවුලි දැ යි යන මේ ධර්මයෝ වෙති. මෙසේ මේ සියලු ම දුක්ඛරාශියගේ ඉපදීම ද වන්නේ ය. ''මහරජාණෙනි, ඇස නැති කල්හි ද රූපය නැති කල්හි ද චක්ෂුර්විඥානය නො වන්නේ ය. චක්ෂුර්විඥානය නැති කල්හි චක්ෂුඃස්පර්ශය නො වන්නේ ය. චක්ෂුඃස්පර්ශය නැති කල්හි වේදනාව නො වන්නේ ය. වේදනාව නැති කල්හි තෘෂ්ණාව නො වන්නේ ය.

Non-Commercial Distribution

තණ්හාව නැති කල්හි උපාදානය නො වන්නේ ය. උපාදානය නැති කල්හි භවය නො වන්නේ ය. භවය නැති කල්හි ජාති-ඉපදීම නො වන්නේ ය. ජාතිය නැති කල්හි ජරා මරණ සෝක හැඬීම් දුක් දොම්නස් සිත් තැවුලි දැ'යි යන මේ ධර්මයෝ නො උපදනාහු වෙති. මෙසේ මේ සියලු ම දුක් පිඩක් වැනි වූ ශරීරයාගේ හා දුක්ඛයාගේ නිරුද්ධ වීම වන්නේ ය'' යි වදාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අති දක්ෂ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, යම්කිසි සංස්කාරධර්මකෙනෙක් නො වන්නා වූත් උපදිද් ද, එබඳු ධර්මකෙනෙක් ඇද් දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, නො වන්නා වූ යම් කිසි සංස්-කාරධර්මකෙනෙක් නැත. මහරජානෙනි, වන්නා වූ ම සංස්කාරධර්මයෝ උපදනාහු ය'' යි වදාළසේක. ''උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. මහරජානෙනි, ඒ කුමක් සිතන්නාහු ද? යම් තැනෙක්හි තෙපි හිඳින්නාහු ද, එතන්හි ම මේ තොපගේ රාජගෘහය නො වන්නා වූ දෙයක් උපන්නේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, මේ ගෘහයෙහි නො වන්නා වූ කිසිවක්හට නැති වන්නා වූ දේ ම උපන්නේ ය. ස්වාමීනි, මේ ලී දඬු වනාන්තරයෙහි උපන්නාහු ය. මේ ගෙට ගත් මැටි පෘථිවියෙහි වූයේ ය. එසේ වුවත් ස්ත්‍රීන්ගේත් පුරුෂයන්ගේත් තත්කෘත්‍යසාධක වූ ව්‍යායාමයෙන් මෙසේ මෙබඳු වූ මේ රාජගෘහය උපන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්-දෙන් ම නො වන්නා වූ යම්කිසි සංස්කාරධර්මකෙනෙක් උපදිද් ද, එබඳු ධර්මකෙනෙක් නැත. වන්නා වූ ම සියලු සංස්කාරධර්මයෝ උපදනාහු ය'' යි වදාළසේක.

''නැවැතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ කිසියම් බීජගාමභූතගාම කෙනෙක් පෘථිවියෙහි පිහිටුවන ලද්දාහු වූ නම්, අනුක්‍රමයෙන් වෘද්ධියට මහත් වීමට විපුලත්වයට පැමිණෙමින් මල් හා ඵල ගෙණ දෙන්නාහු වෙද් ද, ඒ වෘක්ෂයෝ නො වන්නාහු වූවාහු නො වෙති. වන්නා වූ ම ඒ වෘක්ෂයෝ වූවාහු ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම නො වන්නා වූ කිසි යම් සංස්කාරධර්ම කෙනෙක් උපදිද් ද, එබඳු ධර්ම **(57)** කෙනෙක් නැත. වන්නා ම වූ ඒ සංස්කාරධර්මයෝ උපදින්නාහු ය'' යි කීසේක.

''නැවැතත් උපමාවක් කර වදාළ මැනව'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ කුම්භකාරයා පොළොවින් මැටි නහා ගෙණ නානා ප්‍රකාර භාජන කෙරෙයි. ඒ භාජනවල් නො වන්නාහු වූවාහු නො වෙති. වන්නාහු ම උපන්නාහු ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නො වන්නා වූ යම් කිසි සංස්කාරධර්මකෙනෙක් නැත. වන්නා ම වූ සංස්කාරධර්මයෝ උපදින්-නාහු ය'' යි වදාළසේක.

*Non-Commercial Distribution*

''නැවැතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ වීණාවෙහි පත්‍රය [1]නැත් නම්, සම නො වී නම්, ඔරුව නො වී නම්, වීණාලීය නො වී නම්, තත්වෙළුම් නො වී නම්, තත් නො වූ නම්, කොණය නො වී නම්, පුරුෂයාගේ තත්කෘත්‍යසාධකව්‍යායාම නො වී නම්, ශබ්දය උපදී ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, යම් හෙයකින් වීණාවෙහි පත්‍රය වී නම්, සම වී නම්, ඔරුව වී නම්, වීණා දණ්ඩ වී නම්, තත්වෙළන ලීය වී නම්, තත් වූවාහු වූ නම්, කඹය වී නම්, පුරුෂයාගේ තත් කෘත්‍යසාධකව්‍යායාම වී නම්, ශබ්දය උපදී ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, ශබ්දය උපදනේ ය'' යි කීහ. එපරිද්දෙන් ම, ''මහරජානෙනි, යම් කිසි සංස්කාරධර්මකෙනෙක් නො වන්නාහු වෙද් ද, එසේ නැත. වන්නා වූ ම සංස්කාරයෝ උපදිති'' යි කීසේක.

''නැවැතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ ගිනි ගාන යට ලීය නො වී නම්, මතු ලීය නො වී නම්, එ ම ලී මැද අදින යොත නො වී නම්, උතුරු ලීය නො වී නම්, වස්ත්‍ර කඩ නො වී නම්, පුරුෂයාගේ එම කෘත්‍ය සාධක වූ ව්‍යායාම නො වී නම්, ගිනි උපදී ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, යම් හෙයකින් ගිනිගාන ලී දෙක වූ නම්, උතුරු ලීය වී නම්, රෙදිකඩ වී නම්, පුරුෂයාගේ තත්කෘත්‍යසාධක වූ ව්‍යායාම වී නම්, ඒ ගිනි උපදී ද?''යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, ගිනි උපදී ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම නො වන්නා වූ යම් කිසි සංස්කාරකෙනෙක් උපදිද් ද, එසේ නැත. වන්නා වූ ම සංස්කාරයෝ උපදින්නාහු ය'' යි කීසේක.

''නැවැතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ ජොතිපාසාණය නො වී නම්, සූර්යතාපය නො වී නම්, ගොම වැරටි නො වී නම්, හේ ගිනි උපදී ද?'' යි විචාළසේක. නැත; ස්වාමීනි''යි කීහ. ''මහරජානෙනි, යම් හෙයකින් ජොතිපාසාණය වී නම්, ආතපයත් වී නම්, ගොමවැරටිත් වී නම්, අග්නි උපදී ද?'' යි විචාළසේක. ''එසේ ය; ස්වාමීනි, අග්නි උපදනේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම නො වන්නා වූ යම් කිසි සංස්කාරකෙනෙක් උපදිද් ද, එසේ නැත. වන්නා වූ ම සංස්කාරයෝ උපදින්නාහු ය'' යි කීසේක.

''නැවැතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ ආදසය නො වී නම්, ආලොකය නො වී නම්, මුහුණ නො වී නම්, ආත්මභාවය සදෘශ වූ අන්‍යරූපයක් උපදී ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, යම් හෙයකින් ආදසයත් වී නම්, ආලෝකයත් වී නම්, මුහුණත් වී නම්, තමන් වැනි ශරීරයක් පෙණේ ද?''යි විචාළසේක. ''එසේ ය; ස්වාමීනි, උපදනේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම නො වන්නා වූ යම් කිසි සංස්කාරධර්මකෙනෙක් උපදිද් ද,

1. නැත්තම්

Non-Commercial Distribution

එසේ නැත. වන්නා වූ ම සංස්කාරයෝ උපදනාහු ය'' යි (58) වදළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්න විසඳීමෙහි දක්ෂ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, වෙදගු ඇද් ද? ලැබේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, මේ තොප කී වෙදගු නම් කවුරු ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, අභ්‍යන්තරයෙහි යම් ප්‍රාණජීවයෙක්තෙම ඇසින් රූපය දකී ද, කණින් ශබ්දය අසා ද, නාසයෙන් සුවඳ ආඝ්‍රාණය කෙරේ ද, දිවින් රසාස්වාදය කෙරේ ද? ශරීරයෙන් ස්ප්‍රෂ්ටව්‍යය ස්පර්ශ කෙරේ ද, සිතින් ධර්මචින්තාවන් දැන ගණී ද, යම් සේ මේ ප්‍රාසාදයෙහි සිටින්නා වූ අපි යම් යම් කවුළු දෙරකින් බලන්නට කැමැත්තමෝ ද, ඒ ඒ කවුළුදෙරින් බලමු. පූර්වදිගට වූ, කවුළුදෙරිනුත් බලම්හ. පශ්චිමදිසාවෙහි වාතපානයෙනුත් බලම්හ. උත්තරදිශාවෙහි කවුළුවෙනුත් බලම්හ. දක්ෂිණදිශාවෙහි කවුළුවෙනුත් බලම්හ. එපරිද්දෙන් ම, ස්වාමීනි, අභ්‍යන්තරයෙහි මේ ප්‍රාණජීවයතෙම චක්ෂුර්ද්වාරාදි යම් යම් ද්වාරයකින් බලන්නට කැමැති නම්, ඒ ඒ ද්වාරයෙන් බලන්නේ ය'' යි කීහ. එකල තෙරුන් වහන්සේ කියනසේක්, ''මහරජානෙනි, ඒ ෂඩ්ද්වාරය මමත් කියමි. තෙපි ඒ මනා කොට ම අසවු. මනා ව ම සිතට ගණිවු. ඉදින් අභ්‍යන්තරයෙහි වූ ජීවයතෙම ඇස කරණ කොට ගෙණ රූපය දකී නම්, යම් සේ මේ ප්‍රාසාදයෙහි හුන්නා වූ අපි යම් යම් කවුළුව කින් බලන්නට කැමැත්තමෝ නම්, ඒ ඒ කවුළුවෙන් රූපය ම දකුම්හ. පූර්වදිග්වාතපානයෙනුත් රූපය ම දකුම්හ. පශ්චිම වාතපානයෙනුත් රූපය ම දකුම්හ. උතුරුදිගවාතපානයෙනුත් රූපය ම දකුම්හ. දකුණු වාතපානයෙනුත් රූපය ම දකුම්හ. මෙසේ ම අභ්‍යන්තරයෙහි වූ මේ ප්‍රාණ ජීවය විසින් ඇස කරණ කොට ගෙණ රූපය ම දක්ක යුතු ය. සොතයෙනුත් රූපය ම දක්ක යුතු ය. නාසයෙනුත් රූපය ම දක්ක යුතු ය. දිවෙනුත් රූපය ම දක්ක යුතු ය. ශරීරයෙනුත් රූපය ම දක්ක යුතු ය. සිතිනුත් රූපය ම දක්ක යුතු ය. ඇසිනුත් ශබ්දය ම ඇසිය යුතු ය. කණිනුත් ශබ්දය ම ඇසිය යුතු ය. නාසයෙනුත් ශබ්දය ම ඇසිය යුතු ය. දිවෙනුත් ශබ්දය ම ඇසිය යුතු ය. ශරීරයෙනුත් ශබ්දය ම ඇසිය යුතු ය. සිතිනුත් ශබ්දය ම ඇසිය යුතු ය. ඇසිනුත් ගන්ධය ම ආඝ්‍රාණය කට යුතු ය. කණෙනුත් ගන්ධය ම ආඝ්‍රාණය කට යුතු ය. දිවෙනුත් ගන්ධය ම ආඝ්‍රාණය කට යුතු ය. කයිනුත් ගන්ධය ම ආඝ්‍රාණය කට යුතු ය. සිතිනුත් ගන්ධය ම ආඝ්‍රාණය කට යුතු ය. ඇසිනුත් රසය ම සායනය කට යුතු ය. සොතයෙනුත් රසය ම සායනය කට යුතු ය. නාසයෙනුත් රසය ම සායනය කට යුතු ය. කයිනුත් රසය ම සායනය කට යුතු ය. සිතිනුත් රසය ම සායනය කට යුතු ය. ඇසිනුත් ස්ප්‍රෂ්ටව්‍යය ම ස්පර්ශ කට යුතු ය. කණෙනුත් ස්ප්‍රෂ්ටව්‍යය ම කට යුතු ය. නාසයෙනුත් ස්ප්‍රෂ්ටව්‍යය ම ස්පර්ශ කට යුතු ය. දිවෙනුත් ස්ප්‍රෂ්ටව්‍යය ම ස්පර්ශ කට යුතු ය. සිතිනුත් ස්ප්‍රෂ්ටව්‍යය ම ස්පර්ශය කට යුතු ය. ඇසිනුත් ධර්මචින්තාව ම දැන ගත

Non-Commercial Distribution

යුතු ය. කණෙනුත් ධර්මචින්තාව ම දැන ගත යුතු ය. නාසයෙනුත් ධර්මචින්තාව ම දැන ගත යුතු ය. දිවෙනුත් ධර්මචින්තාව ම දැන ගත යුතු ය. ශරීරයෙනුත් ධර්මචින්තාව ම දැන ගත යුතු වේ දැ?'' යි විචාළ සේක. ''එසේ නැත; ස්වාමීනි'' යි කීහ.

''මහරජානෙනි, තොපගේ පූර්වවචනයෙන් **(59)** පශ්චිමවචනය ද පශ්චිමවචනයෙන් පූර්වවචනය ද එකිනෙකට නො යෙදෙයි. සම නො වෙයි. 'මහරජානෙනි, යම් සේ වනාහි මෙතැන්හි ප්‍රාසාදයෙහි හුන්නා වූ අපි මේ දැල්කවුළුදෙරවල් හැරිකල්හි මහත් වූ අවකාශයෙන් පිටතට මුහුණ පොවා සැප සේ ම රූපයන් දකුම්හ. එපරිද්දෙන් ම මේ අභ්‍යන්තරයෙහි වූ ප්‍රාණජීවයෙනුත් චක්ෂුර්ද්වාරය හැරිය කල්හි මහත් වූ අවකාශ යෙන් සැප සේ ම රූපයන් දක්ක යුතු ය. සොතද්වාරය හැරිය කල්හි ඝාණද්වාරය හැරිය කල්හි ජිව්හාද්වාරය හැරිය කල්හි කායද්වාරය හැරිය කල්හි මහත් වූ අවකාශයෙන් සැප සේ ම ශබ්දය ඇසිය යුතු ය. ගන්ධයන් ආඝ්‍රාණය කට යුතු ය. රසයන් සායනය කට යුතු ය. ස්ප්‍රෂ්ටව්‍යයන් ස්පර්ශය කට යුතු වූයේ වේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, එසේ නැතැ'' යි කීහ. ''මහරජානෙනි, තොපගේ පූර්වවචනය හා පශ්චිම-වචනයන් පශ්චිමවචනය හා පූර්වවචනයත් දෙක ඔබිනොබ යෙදේ ද, 'මහරජානෙනි, යම් හෙයකින් වනාහි මේ **දින්න** නම් අමාත්‍යතෙම මේ උන්තැනින් නික්ම ගොස් දෙරටුවෙහි පිටත සිටින්නේ වී නම්, මහරජානෙනි, තෙපි මේ **දින්නයා** මෙයින් නික්ම ගොස් දෙරටුවෙහි පිටත සිටින්නේ ය යි කියා දන්නහු දැ?'' යි විචාළසේක. ''එසේ ය; ස්වාමීනි, දනිමි'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ වනාහි මේ **දින්නයා** ඇතුළු රජගෙට අවුත් තොපගේ ඉදිරිපිට සිටියේ වී නම්, මහරජ, තෙපි මේ **දින්නයා** ඇතුළු රජගෙට ප්‍රවෙශ ව මාගේ ඉදිරිපිට සිටියේ ය යි කියා දන්නහු දැ?'' යි විචාළසේක. ''එසේ ය; ස්වාමීනි, දනිමි'' යි කීහ.

''මහරජානෙනි, එපරිද්දෙන් ම අභ්‍යන්තරයෙහි වූ ඒ ප්‍රාණජීවය තෙම දිවෙහි රසය තිබූ කල්හි ඇඹුල්බව හෝ ලුණුබව හෝ තිත්ත බව හෝ කටුකබව හෝ කසටබව හෝ මධුරබව හෝ දන්නේ දැ?'' යි විචාළ සේක. ''එසේ ය; ස්වාමීනි, දනී ය'' යි කීහ. ''ඒ අම්බිලාදිරසය ඇතුළු බඩට ප්‍රවිෂ්ට වූ කල්හිත් අම්බිලත්වය ලවණත්වය තික්තභාවය කටුක භාවය කසටභාවය මධුරත්වය හෝ දනෙනේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි,' යි කීහ. ''මහරජානෙනි, තොපගේ පූර්වවචනයෙන් පශ්චිම වචනය හෝ පශ්චිමවචනයෙන් පූර්වවචනය හෝ දෙක එකට අවිරුද්ධ ව නො යෙදෙයි. ''මහරජ; යම් සේ කිසියම් පුරුෂයෙක් මීපැණි කළසියයක් ගෙන්වා මහත් වූ මීපැණිඔරුවක් පුරවා, පුරුෂයකුගේ මුඛය අයා ගත නො දී හොඳින් වසා බැඳ මීපැණි ඔරුවෙහි එබුයේ වී නම්, මහරජ, ඒ පුරුෂතෙම මීපැණි මධුරබවක් හෝ අමධුරබවක් හෝ දනී දැ?'' යි විචාළ සේක. ''ස්වාමීනි, කිසි රසයක් නො දන්නේ ම ය'' යි කීහ. ''කුමන කාරණයකින් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, ඔහුගේ මුඛයෙහි මධුරත්වය



Non-Commercial Distribution

ප්‍රවිෂ්ට නො වූ හෙයිනැ'' යි කීහ. ''මහරජානෙනි, තොපගේ පූර්ව වචනයෙන් හෝ පශ්චිමවචනය පසු ව කී වචනයෙන් හෝ පූර්වවචනය ඔබිනොබ නො යෙදෙන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, මම නුඹ වහන්සේ වැනි වූ තිලකවාදීන් සමග කථා කරන්නට නො හැක්කෙමි. මනා කොට මට අර්ථ වදළ මැනැවැ'' යි කීහ. එකල තෙරුන් වහන්සේ අභිධර්මයෙන් යුක්ත වූ කථාවෙන් මිලිඳුරජ්ජුරුවන්ට චිත්තවිභාගය අවබෝධ කරවා වදළසේක.

''මෙහි මහරජානෙනි, ඇස නිසාත් රූපය නිසාත් චක්ෂුර්විඥනය උපදනේ ය. ඒ විඥ්ඤාණය සහ උපන්නා වූ ස්පර්ශ වෙදනා සංඥ චෙතනා එකාග්‍රතා ජීවිතෙන්ද්‍රිය **(60)** මනස්කාර ය යි මෙසේ මේ යථොක්ත චෛතසිකධර්මයෝ ප්‍රත්‍යය වශයෙන් උපදින්නාහු ය. මේ ශරීරාභ්‍යන්තරයෙහි වෙදගු නම් ජීවයෙක්[1] නො ලැබෙයි. තව ද, මහරජ, සොතය නිසාත් ශබ්දය නිසාත් සොතවිඥ්ඤාණය උපදනේ ය. එසේ ම ඝාණය නිසා ත් ජිව්හාව නිසා ත් කය නිසා ත් මනස නිසා ත් ධර්මචින්තාවල් නිසා ත් මනොවිඥ්ඤාණය උපදනේ ය. ඒ මනොවිඥ්ඤාණය සහ උපන්නා වූ ස්පර්ශ වෙදනා ව ය, සංඥව ය, චේතනාව ය, එකාග්‍රතාව ය, ජීවිතෙන්ද්‍රිය ය, මනස්කාරය යි මෙසේ යථොක්ත වූ ධර්මයෝ ප්‍රත්‍යයවශයෙන් උපදනාහු වෙති. එසේ මිසක් මේ රූපාභ්‍යන්තරයෙහි ඇස ආදියෙන් රූපාදිය බලන්නා වූ තොප කී වෙදගු නම් ජීවකෙනෙක් නො ලැබෙති' යි කියා වදළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිදක්ෂ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් වස්තුවක චක්ෂුර්විඥනය උපදනේ වී නම්, එහි ම මනොවිඥ්ඤාණයත් උපදනේ දැ?'' යි කීහ. ''එසේ ය, මහරජ, යම් තැනෙක චක්ෂුර්විඥනය උපදනේ වී නම්, එහි ම මනොවිඥ්ඤාණයත් උපදනේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පළමු කොට චක්ෂුර්විඥනය උපදී ද? පසු ව මනොවිඥ්ඤාණය උපදනේ ද? නොහොත් මනොවිඥ්ඤාණය පළමු කොට උපදනේ ද? පසු ව චක්ෂුර්විඥනය උපදනේ දැ?'' යි කීහ. ''මහරජ, පළමු කොට චක්ෂුර්විඥනය උපදනේ ය. පසු ව මනො විඥ්ඤාණය උපදින්නේ ය'' යි කීසේක. ''කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, චක්ෂුර්විඥනය මනොවිඥ්ඤාණයට 'මම යම් තැනෙක උපදිම් නම්, තෙපිත් එතැන්හි උපදුව' යි කියා අණවා[2] කියා ද? නොහොත් මනොවිඥ්ඤාණය චක්ඛුවිඥ්ඤාණයට 'තෙපි යම් තැනෙක උපදිවූ නම්, මමත් එතැන ම උපදින්නෙමි' යි කියා අණවා[2] කථා කර ගන්නේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ඔවුන්ගේ ඔවුනොවුන් හා එබඳු කථා සල්ලාපයක් නැතැ'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් තැනෙක චක්ඛුවිඥ්ඤාණය උපදනේ වී නම් එතන්හි මනෝ-

1. ජීවකෙනෙකුන් 2. ඇණවා

Non-Commercial Distribution

විඤ්ඤාණයත් කෙසේ උපදී ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, මනොවිඤ්ඤාණය නින්න බැවින් ද ද්වාර බැවින් ද පුරුදු බැවින් ද සමග හැසුරුණු බැවින් ද එසේ උපදනේ ය'' යි වදළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නින්න බැවින් යම් තැනෙක චක්ෂුර්විඥනය උපදනේ වී නම්, එතැන ම මනොවිඤ්ඤාණයත් කෙසේ උපදී ද? ඊට උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජ, හේ කුමක් සිතන්නෙහි ද? වැසි වස්නා කල්හි කවර තැනකින් උදකය යේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, යම් අතකින් මිටි නම්, ඒ අතින් යන්නේ ය'' යි කීහ. ''නැවැත අනික් සමයෙක වැසි වස්නේ වී නම් කවර තැනකින් ඒ අළුත් වැසිවතුර යේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, යම් තැනකින් පළමුව වතුර ගියේ ද, ඒ අළුත්වතුරත් ඒ අතින් ම යන්නේ ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජ, පළමු වතුර පසු වතුරට මම යම් අතකින් යෙම් ද, තෝත් එතැනින් ම යව'' යි කියා ඇණවූ වේ ද? නොහොත් පසු වතුර පළමු වතුරට තෙපි යම් තැනකින් ගියාහු නම් මමත් එතැනින් ම යෙමි'' යි කියා අණවා[1] කථා කර ගත්තේ දැ?'' යී විචාළසේක. ''නැත ස්වාමීනි, ඔවුන්ගේ ඔවුනොවුන් හා (61) කර ගත් වචනයෙක් නැත. බිම මිටි බැවින් ම යන්නාහු ය'' යි කීහ. ''එපරිද්දෙන් ම මහරජානෙනි, යම් තැනැක චක්ෂුර්විඥනය උපදනේ වී නම්, එතැන ම මනොවිඥනයත් නින්න බැවින් උපදනේ ය. චක්ෂුර්විඥනය මනොවිඥනයට 'මම යම් තැනෙක උපදිම් ද, තෙපිත් එතැන උපදුව'' යි කියා අණවන්නේත් නො වෙයි. නොහොත් මනොවිඥනය චක්ෂුර්විඥනයට 'තෙපි යම් තැනෙක උපදිවූ නම්, මමත් එතැන උපදිමි'' යි කියා නො ම අණවන්නේ ය. ඔවුන්ගේ ඔවුනොවුන් හා කථාවකුත් නැත්තේ ය. නින්න බැවින් ම උපදනාහු ය'' යි වදළසේක

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කෙසේ නම් ද්වාර බැවින් යම් තැනෙක චක්ෂුර්විඥනය උපදී නම් එතැන ම මනොවිඥනයත් උපදී ද? ඊට උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, හේ කුමක් නම් සිතන්නහු ද? රජ්ජුරුවන්ගේ බලවත් ප්‍රාකාර තොරණ පන්ති ඇති ප්‍රත්‍යන්තනුවරෙක්හි එක ම වාසල් දොරෙක් වී නම්, එයින් පුරුෂයෙක් නික්ම යනු කැමති වූයේ වී නම්, කොතැනින් නික්ම යේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, ඒ දොරටුවෙන් නික්ම යන්නේ ය'' යි කීහ. ''නැවැත අනික් පුරුෂයෙක් නික්ම යනු කැමති වූයේ වී නම්, කවර තැනකින් නික්ම යේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, යම් තැනකින් පළමු පුරුෂයා නික්ම ගියේ ද, ඒ දෙවෙනි පුරුෂයාත් එතැනින් ම නික්ම යන්නේ ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, පළමු පුරුෂයා පසු ව ගිය පුරුෂයාහට 'මම යම් තැනකින් යන්නෙම් ද, තෙපිත් එතැනින් ම යව' යි කියා අණවා කීයේ වේ ද? නොහොත් පසු ව ගිය පුරුෂයා පළමු පුරුෂයාට 'තෙපි යම් තැනකින් ගියාහු නම්, මමත් ඒ මගින් යෙමි'' යි කියා කීයේ දැ?' යි

1. ඇණවා

Non-Commercial Distribution

විචාළසේක. ''එසේ නැත, ස්වාමීනි, ඔවුනොවුන් හා ඔවුන්ගේ කථාවෙක් නැත. යන්නට නිසි දෙර බැවින් යන්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් තැනක චක්ෂුර්විඥනය උපදනේ නම්, එතැන ම මනොවිඥනයත් ද්වාර බැවින් උපදනේ ය. 'මම යම් තැනක උපදිම් ද, තෙපිත් එතැන ම උපදුව' යි කියා චක්ෂුර්විඥනය මනොවිඥනයට අණ වන්නේ නො වෙයි. නොහොත් 'යම් තැනක තෙපි උපදිවු නම්, මමත් එතැන ම උපදිම්' යි කියා මනොවිඥනය චක්ෂුර්විඥනයට අණවා කියන්නේත් නො වෙයි. ඔවුනොවුන් හා ඔවුන්ගේ වචනයකුත් නැත්තේ ය. ද්වාර බැවින් ම උපදනාහු ය'' යි වදාළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් තැනෙක චක්ෂුර්විඥනය උපදී නම්, එතැන ම මනොවිඥනයත් කෙසේ නම් පුරුදු බැවින් උපදී ද? ඊට උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජ, හේ කුමක් සිතන්-නෙහි ද? පළමු කොට එක් ගැලක් යන්නේ ද, නැවැත යන දෙවෙනි ගැල කවර මගකින් යේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, යම් මගකින් පළමු ගැල ගියේ ද, ඒ දෙවෙනි ගැලත් එම මාර්ගයෙන් ම යන්නේ ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, 'යම් මගකින් මම යෙම් ද, තෙපිත් ඒ මගින් ම යව'යි කියා පළමු ගැල පසු ගැලට කියන්නේ ද, එසේ නැත්නම් පසුව යන ගැල 'තෙපි යම් මගකින් යන්නහු නම්, මමත් ඒ මගින් ම යන්නෙමි'යි කියා පළමු වූ ගැලට අණවා කියන්නේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, ඔවුන්ගේ ඔවුනොවුන් හා අකථාව ම ය. පුරුදු බැවින් යන්නාහු ය'' යි **(62)** කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම චක්ෂුර්විඥනය හා පුරුදු බැවින් යම් තැනෙක චක්ෂුර්විඥනය උපදියි නම්, එතැන්හි මනොවිඥනයත් උපදනේ ය. 'යම් තැනෙක මම උපදිම් ද, තෙපිත් එතැන්හි උපදුව' යි කියා චක්ෂුර්විඥනය මනොවිඥනයට නො ම අණ-වන්නේ ය. නොහොත් 'යම් තැනෙක තෙපි උපදින්නහු නම්, මමත් එතැන්හි උපදිම්' යි කියා මනොවිඥනය චක්ෂුර්විඥනයට නො ම අණ-වන්නේ ය. ඔවුන්ගේ ඔවුනොවුන් හා අකථාව ම ය. බොහෝ කලක් පුරුදු බැවින් උපදනාහු ය'' යි වදාළසේක.

''ස්වාමීනි, නාගසේනයන් වහන්ස, කෙසේ නම් සමග හැසුරුණු බැවින් චක්ෂුර්විඥනය යම් තැනෙක උපදී ද, එතැන ම මනොවිඥනයත් උපදනේ ද? ඊටත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජා-නෙනි, යම් සේ ඇඟිලිපුරුක්හි අල්වා ගෙණ සංඥ කොට කියන හස්ත මුද්‍රශාස්ත්‍රය, අච්ඡිද්‍ර වූ ගණන් ශාස්ත්‍රය, ක්ෂේත්‍රවෘක්ෂ විලොකනය කොට ඵලප්‍රමාණය කියන්නා වූ සංඛ්‍යාශාස්ත්‍රය, අක්ෂරලෙඛනශාස්ත්‍රය, උගන්නා ශිල්පස්ථානයෙහි අළුත උගන්නා ආදිකර්මිකයාහට මුළා වීම වන්නේ ය. නැවැත මැත භාගයෙහි පරීක්ෂා කිරිමෙන් හැසුරුණු බැවින් නුමුළා වීම වන්නේ ය. එපරිද්දෙන් ම ''මහරජ, එක් ව හැසුරුණු බැවින් යම් තැනෙක චක්ෂුර්විඥනය උපදී ද? එතැන්හි මනොවිඥනයත්

Non-Commercial Distribution

උපදනේ ය. 'යම් තැනක මම උපදිම් ද, තෙපිත් එතැන උපදුව' යි කියා චක්ෂුර්විඥානය මනොවිඥානයට නො ම අණවන්නේ ය. නොහොත් 'යම් තැනෙක තෙපි උපදින්නහු නම්, මමත් එතැන උපදිම්' යි කියා මනොවිඥානය චක්ෂුර්විඥානයට නො ම අණවන්නේ ය. ඔවුන්ගේ ඔවුනොවුන් හා අකථාව ම ය. සමග හැසුරුණු බැවින් උපදනාහු ය'' යි වදළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් තැනෙක සොතවිඤ්ඤාණය උපදනේ වී නම් එතැන මනොවිඤ්ඤාණයත් උපදනේ වේ දැ'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජ, චක්ෂුර්විඥානයෙහි කී ලෙසින් ම දත යුතු ය'' යි වදළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඝාණවිඤ්ඤාණය යම් තැනෙක උපදී ද, ජිව්හාවිඤ්ඤාණය යම් තැනෙක උපදී ද, කායවිඤ්ඤාණය යම් තැනෙක උපදී ද, එතැන්හි මනොවිඤ්ඤාණයත් උපදී දැ'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජානෙනි, යම් තැනෙක කායවිඤ්ඤාණය උපදී නම්, මනොවිඤ්ඤාණයත් එතැන ම උපදනේ ය'' යි වදළසේක. ''කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පළමු කොට කායවිඤ්ඤාණය උපදී ද? පසු ව මනොවිඤ්ඤාණය උපදී ද? නොහොත් මනොවිඤ්ඤාණය පළමු කොට උපදී ද? පසුව කායවිඤ්ඤාණය උපදී දැ'' යි කීහ. ''නැත, මහරජානෙනි, කීසේක. ''එසේ වී නම්, මනොවිඤ්ඤාණය කායවිඤ්ඤාණයට තෙපි පළමු කොට උපදුව, මම පසු ව උපදිමි'' යි කීයේ දැ?'' යි විචාළෝ ය. ''නැත, මහරජානෙනි, ඔවුන්ගේ ඔවුනොවුන් හා එබඳු කථාවෙක් නැත. අකථාව ය. බොහෝ කලක් එකට ම හැසුරුණු බැවින් මෙසේ උපදනේ ය'' යි වදළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිදක්ෂ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මනොවිඤ්ඤාණය යම් තැනෙක උපදනේ වී නම්, වේදනාවත් උපදනේ ද?''යි කීහ. ''එසේ ය, මහරජ, යම් තැනෙක මනොවිඤ්ඤාණය උපදනේ වී නම්, **(63)** එතැන ස්පර්ශයත් උපදනේ ය. එතැන වේදනාවත් උපදනේ ය. එතැන සංඥාවත් උපදනේ ය. චේතනාවත් උපදනේ ය. විතර්කයත් උපදනේ ය. විචාරයත් උපදනේ ය. ස්පර්ශප්‍රධාන වූ සියලු ධර්මයෝත් එතැන්හි උපදනාහු ය'' යි වදළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ස්පර්ශය කවර ලක්ෂණ ද?''යි කීහ. ''මහරජ, ස්පර්ශය ඵුසනලක්ෂණය'' යි කීසේක. ''උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ මෙණ්ඩක නම් බැටළුවෝ දෙදෙනෙක් පොර ගසන්නාහු වූ නම්, ඔවුන් අතුරෙන් එක බැටළුවෙක් යම් සේ ද, එසේ ම චක්ඛුස දත යුතු ය. දෙවෙනි මෙණ්ඩකයා යම් සේ ද, එපරිද්දෙන් ම රූපය දත යුතු ය. ඔවුන්ගේ එකට ඇනීම යම් සේ ද,

එපරිද්දෙන් ස්පර්ශය දත යුතු ය'' යි කීසේක. ''නැවැතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ දෙඅත් එකට තළන්නාහු වූ නම්, එයින් එක් අල්ලක් යම් සේ ද, එපරිද්දෙන් චක්ෂුස දත යුතු ය. දෙවැනි අල්ල යම් සේ ද, එපරිද්දෙන් ඇසට පෙණෙන රූපය දත යුතු ය. ඔවුන්ගේ එකතුව සංඝට්ටනය යම් සේ ද, එපරිද්දෙන් ස්පර්ශය දත යුතු ය'' යි කීසේක. ''නවත් නැවැත උපමාවක් කර වදළ මැනැවැ''යි කීහ. ''මහරජානෙනි, යම් සේ සම්ම නම් තාලම් දෙකක් එකට ගසන්නාහු වූ නම්, එයින් එක් තාලම්පටක් යම් සේ ද? එපරිද්දෙන් ඇස දත යුතු ය. දෙවෙනි තාලම්පට යම් සේ ද? එපරිද්දෙන් රූපය දත යුතු ය. ඔවුන්ගේ එක් වීම යම් සේ ද? එපරිද්දෙන් ස්පර්ශය දත යුතු ය'' යි වදළසේක. ''සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, වේදනාව කවර ලක්ෂණ දූ?'' යි කීහ. ''මහරජානෙනි, වේදනාව විඳින ලක්ෂණ ද වෙයි. අනුභව කරණ ලක්ෂණ ද වෙයි. කීසේක. ''උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක් රජක්හට අධික වූ දස්කමක් කෙළේ වී නම්, ඒ පුරුෂයාහට රජ්ජුරුවෝ සතුටු ව අධිකාරම[1] තනතුරු දෙන්නෝ ය. ඒ පුරුෂතෙම අධිකාරම් තනතුර කරණ කොට ගෙණ පංචකාමසම්පත්තියෙන් සමප්පිතව සමංගීභූත ව හැසිරෙන්නේ ය. ඕහට මෙබඳු සිතක් වන්නේ ය:—'මා විසින් වනාහි පෙර රජ්ජුරුවන්ට රාජකෘත්‍යය දස්කම් කරණ ලද්දේ ය. ඒ මට රජ්ජුරුවෝ සතුටු ව අධිකාරම්[1](තනතුර) දුන්සේක. ඒ මම ඒ කාරණයෙන් මෙබඳු වූ මේ සැප වේදනාව විඳිමි'යි සතුටු වන්නේ ය. තවද ''මහරජානෙනි, යම් සේ කිසි යම පුරුෂයෙක්තෙම ත්‍රිවිධකුශලකෘත්‍යය කොට ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සුගති නම් වූ ස්වර්ගලොකයෙහි උපන්නේ වී නම්, ඒ දිව්‍යපුත්‍රතෙම එහි දිව්‍යමය වූ පඤ්චකාමසම්පත්තියෙන් සම්පප්පිත ව සමංගීභූත ව හැසිරෙන්නේ ය. ඕහට මෙබඳු සිතෙක් වන්නේ ය: මම වනාහි මීට පෙර කුශලධර්මය කෙළෙමි. ඒ මම ඒ කාරණයෙන් මෙබඳු වූ මේ දිව්‍යමය වූ සැපවේදනාව අනුභව කෙරෙමි යි කියා සතුටු වන්නේ ය. ''මහරජානෙනි, එපරිද්දෙන් ම වේදනාව වෙදයිත ලක්ෂණ ද අනුභව කරණ ලක්ෂණ ද වෙ''යි කියා වදළසේක. ''යහපත; ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිදක්ෂ වූ සේකැ''යි ස්තුති කළහ.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සංඥතොමෝ කවර ලක්ෂණ දූ?'' යි කීහ. ''මහරජානෙනි, සංඥතොමෝ සංජානන(**64**) ලක්ෂණය''යි කීසේක. ''කුමක් හැඳින ගණී දූ?''යි කීහ ''නිල්පැහැයත් හඳුනන්නේය. රන්වන් පැහැයත් හඳුනන්නේ ය. රතුපැහැයත් හඳුනන්නේ ය. සුදු පැහැයත් හඳුනන්නේ ය. මාංජිෂ්ඨකවර්ණයත් හැඳින ගන්නේ ය.

1. අධිකරණ

''මහරජානෙනි, මෙපරිද්දෙන් ම සංඥතොම සංජානනලක්ෂණ ය''යි කීසේක. ''උපමාවකුත් කර වදළ මැනැවැ''යි කීහ. ''මහරජානෙනි, යම් සේ රජ්ජුරුවන්ගේ භාණ්ඩාගාරිකයා අරමුදල්ගෙට ගොස් නීල පීත ලොහිත ඕදත මාංජිෂ්ඨ ලක්ෂණ වූ රාජපරිභොග වූ වස්ත්‍රාභරණාදිරූපයන් දැක හැඳින ගන්නේ ය. ''මහරජානෙනි,එපරිද්දෙන් ම සංඥතොමෝ, සංජානන ලක්ෂණ ය''යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූ සේකැ''යි ස්තුති කළහ.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, චේතනාතොමෝ කවර ලක්ෂණ ද ?''යි කීහ. ''මහරජානෙනි,සිතන ලක්ෂණ ද මනා කොට කරණ ලක්ෂණ ද වෙ''යි කීසේක. ''ස්වාමීනි,උපමාවක්කර වදළ මැනැවැ''යි කීහ. ''මහරජානෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක්තෙම විෂයක් කොට ගෙණ තෙමේත් පානය කරන්නේ ය. සෙස්සන්ටත් පානය කරවන්නේ වී නම්, ඒ විෂය තැනූ පුරුෂ තෙමේත් දුකට පැමිණෙන්නේය. විෂය බුත්[1] සෙස්සෝත් දුකට පැමිණෙන්නාහු ය. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මේ ලොකයෙහි සමහර පුද්ගලයෙක්තෙම ප්‍රාණඝාතාදී වූ අනෙකප්‍රකාර අකුශලකර්මයන් සිතින් සිතා ඒ පාපයෙන් ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සැපතින් පහ වූ දුර්ගති නම් වූ නැවත නැවත වැටී පැසෙන්නා වූ සැප ආස්වාදයකුදු නැති නරකයෙහි උපදින්නේ ය. යම් කිසි කෙනෙක් ඔහුගේ වචනයෙහි හික්මුනාහු නම් වෙද් ද, ඔහුත් ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සැපතින් පහ වූ බැවින් අපාය නම් වූ දුකට ම පිහිට බැවින් දුර්ගති නම් වූ විවස ව වැටෙන බැවින් විනිපාත නම් වූ නරකයෙහි උපදනාහු වෙති. ''මහරජානෙනි, යම් සේ වනාහි කිසියම් පුරුෂයෙක් තෙම ගිතෙල් වෙඬරු මධු ශර්කරා තෛලාදී නොයෙක් රසයන් එක් කොට රසයක් තනා තෙමේත් පානය කරන්නේ ය. සෙස්සන්ටත් පානය කරවන්නේ වී නම් ඒ රසය තනා ගත් එතෙමේත් සුවපත් වන්නේ ය. ඒ රසය බීපු සෙස්සෝත් සුවපත් වන්නාහු ය. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මේ ලොකයෙහි සමහර පුද්ගලයෙක්තෙම දනශීලාදී වූ අනෙක ප්‍රකාර වූ කුශලකර්මයන් සිතින් සිතා ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සුන්දර වූ ගමන් ඇති සැපයෙන් අග්‍ර වූ ස්වර්ගලොකයෙහි සැප සේ ම උපදනේ ය. යම්කිසි කෙනෙක් ඔහුගේ වචනයෙහි හික්මුනාහු වෙද් ද, ඔහු ද ශරීරභෙදයෙන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාත ස්වර්ග ලොකයෙහි උපදනාහු ය. ''මහරජානෙනි, එපරිද්දෙන් ම චේතනාතොම චේතයිත ලක්ෂණ ද වෙයි. අභිසංඛරණ ලක්ෂණ ද වෙ'' යි වදළසේක. එකල ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිදක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, විඤ්ඤාණය කවර ලක්ෂණ ද''යි කීහ. ''මහරජානෙනි, විඥනය දැන ගන්නා ලක්ෂණය'' යි කීසේක.

1. බුන්

Non-Commercial Distribution

''ස්වාමීනි, උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ නුවර රක්ෂාවෙහි නියුක්ත වූ පුරුෂතෙම නුවර මධ්‍යයෙහි වූ සතරමංසන්ධියෙහි සිටිමින් **(65)** පූර්වදිශාභාගයෙන් එන්නා වූ පුරුෂයාත් දක්නේ ය. දකුණුදිශාභාගයෙන් එන්නා වූ පුරුෂයාත් දක්නේ ය. පශ්චිම දිශාභාගයෙන් එන්නා වූ පුරුෂයාත් දක්නේ ය. උත්තරදිශාභාගයෙන් එන්නා වූ පුරුෂයාත් දක්නේ ය. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මේ ලෝකයෙහි පුරුෂතෙම ඇසින් යම් රූපයක් දකී ද, ඒ දුටු රූපය විඤ්ඤාණයෙන් දැන ගන්නේ ය. සොතයෙන් යම් ශබ්දයක් අසා ද, ඒ ඇසූ ශබ්දය සොතවිඤ්ඤාණයෙන් දැන ගන්නේ ය. නාසයෙන් යම් සුගන්ධාදියක් ආඝ්‍රාණය කෙරේ ද, ඒ ගන්ධය ඝාණවිඤ්ඤාණයෙන් දැන ගන්නේ ය. දිවින් යම් රසයක් ආස්වාද කෙරේ ද, ඒ රසය ජිව්හාවිඤ්ඤාණයෙන් දැන ගන්නේ ය. ශරීරයෙන් යම් ස්පර්ශයක් ස්පර්ශ කෙරේ ද, ඒ ස්පර්ශය කායවිඤ්ඤාණයෙන් දැන ගන්නේ ය. සිතින් යම් ධර්මචින්තාවක් දැන ගණී ද, ඒ සිතිවිලි මනොවිඤ්ඤාණයෙන් දැන ගන්නේ ය. ''මහරජානෙනි, එපරිද්දෙන් ම විඤ්ඤාණය විජානනලක්ෂණ වන්නේ ය'' යි වදාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ''දක්ෂ වූසේකැ''යි ස්තුති කළහ.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, විතර්කය කවර ලක්ෂණ ද?'' යි කීහ. ''මහරජානෙනි, විතර්කය පිහිටන ලක්ෂණය'' යි කීසේක. ''උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ වඩුවා මනා කොට සැහැ කොටා විද කරණ ලද දැවය වුවමනා සන්ධියෙහි පිහිටුවා ද, එපරිද්දෙන් ම මහරජානෙනි, විතර්කය පිහිටන ලක්ෂණය''යි කීසේක. ''සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි කීහ.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, විචාරයතෙම කවර ලක්ෂණ ද?'' යි කීහ. ''මහරජානෙනි, විචාරයතෙම නැවත නැවත මාර්ජන ලක්ෂණ ය'' යි කීසේක. ''ස්වාමීනි, උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ ලීයෙන් ගසන ලද ලොහොතළිය පසු ව අනුරාවය කෙරේ ද, අනු ව පිහිටා ද, මහරජානෙනි, යම් සේ ආකොටනය ද එපරිද්දෙන් ම විතර්කය දත යුතු ය, අනුරාවය යම් සේ ද, එපරිද්දෙන් විචාරය දත යුතු ය'' යි වදාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්න විසඳීමෙහි දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

**සකලජනමනොනන්දනීය වූ මේ මිලින්දප්‍රශ්න නම් වූ ශ්‍රීසද්ධර්මාදසයෙහි තෘතීය වර්ගය නිමියේ ය.**

---

*Non-Commercial Distribution*

# සතර වැනි වර්‍ගය.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒකී භාවයට ගියා වූ ස්පර්ශාදි මේ යථොක්ත ධර්මයන්ගේ නානා කරණයන් වෙන් වෙන් කොට බෙද 'මේ ස්පර්ශය, මේ වේදනාවය, මේ සංඥාවය, මේ චෙතනාවය, මේ විඥානය, මේ විතර්කය, මේ විචාරය' යි කියා දක්වන්නට හැකි වේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ඒකීභාවයට ගියා වූ මේ ධර්මයන්ගේ 'මේ ස්පර්ශය, මේ වේදනාවය, මේ සංඥාවය, මේ චේතනාවය, මේ විඥානය, මේ විතර්කය, මේ විචාරය' යි කියා 'නානාකරණයන් දක්වා අභවන්නට නො හැක්කේ ය'' යි කීසේක.

''උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම්සේ රජ්ජුරුවන්ගේ රස කරණ අරක්කැමිතෙම **(66)** යම් [1]මසක් හෝ රසයක් හෝ කරන්නේ වී නම්, හෙතෙම ඒ රසයෙහි දීකිරිත්, ප්‍රක්ෂෙප කරන්නේ ය. ලුණුත් ප්‍රක්ෂෙප කරන්නේ ය. ඉඟුරුත් බහා ලන්නේ ය. දුරුත් බහා ලන්නේ ය. මිරිසුත් බහා ලන්නේ ය. සෙසු ප්‍රකාර වූත් රසවත් දෙය බහා ලන්නේ ය. මෙසේ රසවත් කොට සඳ රජහට පිරිනමාලූ කල්හි රජ්ජුරුවෝ ඕහට 'එම්බල පුරුෂය, මට මේ දීකිරෙහි රස ගෙණ දෙව. ලවණයාගේ රස ගෙණ දෙව. ශෘංගවෙරයාගේ රසය මට ගෙණ දෙව. දුරුරසය මට ගෙණ දෙව. මිරිස්රසය මට ගෙණ දෙව. මෙහි බහාලූ සියල්ලෙහි ම රසයන් මට ගෙණ දෙව' යි මෙසේ කියන්නේ වී නම්, මහරජානෙනි, එක ම රසභාවයට ගියා වූ ඒ රසයන්ගේ රසය වෙන් වෙන් කොට ඇඹුල් බව හෝ තික්ත බව හෝ කටුක බව හෝ කසට බව හෝ මධුර බව හෝ ගෙණ හැර දෙන්ට හැකි වේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ඒකීභාවයට ගියා වූ ඒ රසයෙන් රසය ඇඹුල්බවක් වත් ලුණු බවක් වත් තික්තබවක් වත් කටුක බවක් වත් කසට බවක් වත් මධුරබවක් වත් වෙන් වෙන් කොට ගෙණ හැර දෙන්ට නො හැකි වන්නේ ය. එතෙකුදු වුවත් ස්වකීය ස්වකීය වූ ලක්ෂණයෙන් ම වැටහෙන්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම ඒකීභාවයට ගියා වූ මේ ස්පර්ශාදි ධර්මයන්ගේ ස්පර්ශය නම් මේ[2] ය, වේදනාව නම් මෝ ය, සංඥා නම් මෝ ය, චේතනාව නම් මෝය, විඥානය නම් මේ[2]ය, විතර්කය නම් මේ[2]ය, විචාරය නම් මේ[2] ය'' යි කියා නානාකරණයන් වෙන් වෙන් කොට දක්වා හභවන්නට නො හැකි වන්නේ ය. එසේ නමුත් ස්වකීය ස්වකීය ලක්ෂණයෙන් වැටහෙන්නාහු ය'' යි වදළසේක. එකල ''කල්ලොසි භන්තෙ නාගසෙන'' යි කියා ස්තුති කළහ.

නාගසෙනතෙරුන් වහන්සේත් සිතනසේක්:— ''මේ රජහු විසින් බොහෝ ප්‍රශ්නයෝ අසන ලද්දහු ය. මා විසිනුත් ස්වල්පතර ප්‍රශ්නයක් විචාළ මැනැවැ'' යි සිතා ''මහරජානෙනි, ලුණු චක්ෂුර්විඥෙය ද?'' යි

1. ඉස්මක්—සමහර පොත්හි  2. මෝ

Non-Commercial Distribution

විචාළසේක. ‘‘එසේ ය, ස්වාමීනි, ලුණු ඇසට දැනෙන්නේ ය’’ යි කීහ. ‘‘මහරජානෙනි, මනා කොට ම සිත් එලවා දැන ගණුව’’ යි කීසේක. ‘‘ස්වාමීනි, කිමෙක් ද? ලුණු ජිව්හාවිඤ්ඤෙයයා දැ?’’ යි කීහ. ‘‘එසේ ය, මහරජානෙනි, දිවට දැනෙන්නේ ය’’ යි කීසේක. ‘‘ස්වාමීනි, කිමෙක් ද? සියලු ම ලුණුජාතිය දිවෙන් ම දැන ගන්නේ දැ?’’ යි කීහ. ‘‘එසේය මහජානෙනි, සියලු ම ලුණු දිවෙන් ම දැන ගන්නේ ය’’ යි කීසේක. ‘‘ඉදින් ස්වාමීනි, සියලු ම ලුණු දිවෙන් ම දැන ගන්නේ වී නම්, කුමක් පිණිස වෘෂභයෝ ඒ ලුණු ගැලින් ගෙණ එන්නාහු ද? ලුණු ම ගෙණා යුතු නො වේ දැ?’’ යි කීහ. ‘‘මහරජානෙනි, ගැල් ගොන් ආදිය නැති ව ලුණු පමණක් ගෙණ එන්නට නො හැක්කේ ය. මෙකී ධර්මයෝ ලුණු ගෝණි යනාදී වශයෙන් එකී භාවයට ගියාහු ය. හැසිරීම නානාත්වයට ගියාහු ය. ලුණු භාරභාවය වන්නේ ය. ‘මහරජානෙනි, ලුණු තරාදියෙන් කිරන්නට හැකි වේ දැ’’ යි විචාළසේක. ‘‘එසේ ය, ස්වාමීනි, ලුණු කිරන්නට හැකි වන්නේ ය’’ යි කීහ. ‘‘මහරජානෙනි, එසේ ලුණු තරාදියෙන් කිරා පියන්නට නො හැක්කේ ය. ලවණයාගේ භාරභාවය තරාදියෙන් කිරණු ලබන්නේ ය’’ යි කීසේක. එකල රජ්ජුරුවෝ, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්න විසඳීමෙහි දක්ෂ වූසේකැ’’ යි ස්තුති කළහ.

**සකලජනමනොනන්දනීය වූ මිලින්දප්‍රශ්න නම් වූ**
**මේ සද්ධර්මාදසයෙහි මිලින්දරාජ නාගසේන**
**මහාප්‍රශ්නයෝ නිමියාහු යි.**

---

**(67)** නැවැතත් රජ්ජුරුවෝ ‘‘ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් මේ පඤ්චායතනකෙනෙක් ඇද් ද, කිමෙක් ද, චක්ඛායතනාදි ඒ පඤ්චායතනයෝ ඔවුනොවුන්ගේ නොයෙක් කර්මයෙන් උපන්නාහු ද? නොහොත් එක ම කර්මයෙකින් උපන්නාහු දැ?’’ යි කීහ. ‘‘මහරජානෙනි, ඔවුනොවුන්ගේ නොයෙක් කර්මයෙන් උපන්නාහු ය. එක ම කර්මයකින් නො උපන්හ’’ යි කීසේක. ‘‘උපමාවක් කර වදළ මැනැවැ’’යි කීහ. ‘‘මහරජානෙනි, හේ කුමක් සිතන්නහු ද? එක ම කෙතක මහවී හැල්වී ආදි වූ බිජු පස්වර්ගයක් වපුරණ ලද්දේ වී නම්, ඒ නොයෙක් බීජයන් වැඩී පැසෙන කල වර්ග ජාති ලෙසින් වෙන් වෙන් ව නොයෙක් ඵල උපදින්නාහු දැ?’’ යි විචාළසේක. ‘‘එසේ ය, ස්වාමීනි, ඒ ඒ ජාති ලෙසින් ම ඒ ඒ ඵල උපදින්නාහු ය’’ යි කීහ. ‘‘මහරජානෙනි, එපරිද්දෙන් ම යම් මේ පඤ්චායතනකෙනෙක් ඇද් ද, ඒ ආයතනයෝ ඔවුනොවුන්ගේ නොයෙක් කර්මයෙන් ම උපන්නාහු ය. එක ම කර්මයකින් නූපන්හ’’ යි වදළසේක. ‘‘ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ’’ යි ස්තුති කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ‘‘ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කවර කාරණයකින් සියලු මනුෂ්‍යයෝ එක සම නො වන්නාහු ද? සමහර

Non-Commercial Distribution

ඇතැම් කෙනෙක් මන්දායුෂ්කයෝ ය. අනෙක් කෙනෙක් දීර්ඝායුෂ්කයෝ ය. සමහර කෙනෙක් බොහෝ ආබාධ ඇත්තාහ. සමහර කෙනෙක් අල්පාබාධ වූහ. සමහර කෙනෙක් දුර්වර්ණ ඇත්තාහ. සමහර කෙනෙක් යහපත් වූ වර්ණ ඇත්තාහු ය. සමහර කෙනෙක් අල්පෙශාඛ්‍ය වෙති. සමහර කෙනෙක් මහෙශාඛ්‍යයෝ ය. සමහර කෙනෙක් මන්දභොගිහ. සමහර කෙනෙක් මහත් භොග ඇත්තාහ. සමහර කෙනෙක් හීනකුල ඇත්තාහ. සමහර කෙනෙක් මහත් වංශ ඇත්තාහ. සමහර කෙනෙක් ස්වල්ප නුවණ ඇත්තාහ. සමහර කෙනෙක් මහත් ප්‍රඥාව ඇත්තාහු ය'' යි කීහ. එකල තෙරුන් වහන්සේ ''මහරජානෙනි, කුමක් පිණිස වනාහි සියලු ම වෘක්ෂයෝ එකසම නො වන්නාහු ද? අන්‍යවෘක්ෂකෙනෙක් ඇඹුල් රස ඇත්තාහ. අන්‍යවෘක්ෂකෙනෙක් ලවණරස ඇත්තාහ. අන්‍යවෘක්ෂ කෙනෙක් තික්තරස ඇත්තාහ. අන්‍යවෘක්ෂකෙනෙක් කටුකරස ඇත්තාහ. අන්‍යවෘක්ෂකෙනෙක් කසටරස ඇත්තාහ. අන්‍යවෘක්ෂකෙනෙක් මධුර රස ඇත්තාහු ය''යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, බීජජාතීන්ගේ වෙන් වෙන් කාරණාවෙනැ'යි සිතමි'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම කුශලාකුශලකර්මයන්ගේ නානාකරණයෙන් සියලු ම මනුෂ්‍යයෝ එකසම නො වූහ. සමහර කෙනෙක් මන්දායුෂ්කයෝ ය. සමහර කෙනෙක් දීර්ඝායුෂ්කයෝ ය. සමහර කෙනෙක් බොහෝ වූ රෝගාබාධ ඇත්තාහ. සමහර කෙනෙක් අල්පාබාධ ඇත්තාහ. සමහර කෙනෙක් දුර්වර්ණ වූහ. සමහර කෙනෙක් යහපත්වර්ණ ඇත්තාහු ය. සමහර කෙනෙක් අල්පෙශාඛ්‍ය වූහ. සමහර කෙනෙක් මහෙශාඛ්‍ය වූහ. අනික් කෙනෙක් අල්ප භොගී වූහ. අන්‍ය වූ කෙනෙක් මහාභොගී වූහ. සමහර කෙනෙක් නීච කුලීන වූහ. සමහර කෙනෙක් මහාකුලීන වූහ. අන්‍යකෙනෙක් දුෂ්ප්‍රාඥ වූහ. අන්‍යකෙනෙක් ප්‍රඥාවත් වූහ. මහරජානෙනි, අප භාග්‍යවත් වූ සර්වඥරාජොත්තමනයානන්වහන්සේ විසින් සුභ නම් මාණවකයාහට 'මානවකය, සත්වයෝ කර්මය ම ස්වකීය කොට **(68)** ඇත්තාහ. කර්මය ම දායාදය කොට ඇත්තාහ. කර්මය ම උත්පත්ති කොට ඇත්තාහ. කර්මය ම බන්ධු කොට ඇත්තාහ. තමන් කළ කර්මය ම පිළිසරණ කොට ඇත්තාහ. කර්මයතෙම මේ හීනප්‍රණීතභාවය පිණිස සකල සත්වයන් විභජනය කරන්නේ ය'' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය' යි කියා මේ ශ්‍රීමුඛපාලිය ගෙණ හැර දක්වා ලූසේක. එකල රජ්ජුරුවෝ අතිප්‍රසන්න ව ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිදක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ 'කිමෙක් ද, මහරජ, මේ වර්තමාන වූ දුක්ඛය නිරුද්ධ වේ ද, අනික් අනාගත වූ දුකක් නො උපදී ද, මෙම අර්ථය පිණිස අපගේ ප්‍රව්‍රජ්‍යාව වන්නේ ය' යි කියා කීසේක් නො වේ ද? කිමෙක් ද? පළමු කොට වීර්ය කිරීමෙන් ද? නොහොත් සම්ප්‍රාප්ත වූ කාලයෙහි වීර්ය කට යුතු දැ?'' යි කීහ. එකල තෙරුන් වහන්සේ කියනසේක්:— ''මහරජානෙනි, සම්ප්‍රාප්තකාලයෙහි කරණ ලද වීර්යතෙම අකර්තව්‍ය වන්නේ ය. පළමු

Non-Commercial Distribution

කොට ම කරණ ලද වීර්ය ම කර්තව්‍ය වන්නේ ය'' යි කීසේක. ''උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, හේ කුමක් නම් සිතන්නහු ද? යම් කලෙක තෙපි පැන් පිපාසිත වන්නහු වූ නම්, එකල තෙපි 'පැන් පානය කෙරෙමි' යි කියා ළිඳක් කොටවන්නහු ද? පොකුණක් සාරවන්නහු දෑ?'' යි විචාළසේක. ''නැත; ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම සම්ප්‍රාප්ත කල්හි වීර්ය අකර්තව්‍ය වන්නේ ය. පළමු කොට ම කරණ ලද වීර්ය ම කර්තව්‍ය වන්නේ ය'' යි කීසේක. ''නැවතත් උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, හේ කුමක් සිතන්නහු ද? යම් කලෙක තෙපි ක්ෂුධාවෙන් පීඩිත වන්නහු වූ නම් එකල්හි තෙපි 'බත් අනුභව කෙරෙමි' යි සිතා කුඹුරක් සාවා පියන්නහු ද? ඇල් රොපණය කරවන්නහු ද? ධාන්‍යජාති ගෙන්වා රැස් කරන්නහු දෑ'' යි විචාළසේක. ''නැත; ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම සම්ප්‍රාප්ත කල්හි ව්‍යායාමය අකර්තව්‍යය වන්නේ ය. පළමු කොට කරණ ලද ව්‍යායාමය කෘත්‍යසාධක වන්නේ ය'' යි කීසේක. ''නැවැතත් උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, හේ කුමක් සිතන්නහු ද? යම් කලෙක තොපට සංග්‍රාමයක් පැමිණියේ වී නම් එකල්හි තෙපි නුවර වට දියඅගළ කරවන්නහු ද? ප්‍රාකාරය කරවන්නහු ද? දෙරටුව කරවන්නහු ද? මුරපැල කරවන්නහු ද? ධාන්‍යජාතීන් ගෙන්වා රැස් කරන්නහු ද? ඒ යුද්ධයට යන දවස්හි තෙපි ඇතුන් නැඟීමෙහි හික්මෙන්නහු ද? අශ්වශිල්පයෙහි හික්මෙන්නහු ද? රථ නැඟීමෙහි හික්මෙන්නහු ද? ධනුශ්ශිල්පයෙහි හික්මෙන්නහු ද? ඛඩ්ගමුෂ්ටිග්‍රහණයෙහි හික්මෙන්නහු ද?' දෑ?'' යි විචාළසේක. ''නැත; ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම 'අනුපාදනිර්වාණය සම්ප්‍රාප්ත කල්හි වීර්ය කෙරෙමි' යි සිතා කල් යවා කරණ ව්‍යායාමය අකර්තව්‍ය වන්නේ ය. පළමු කොට ම කරණ ලද ව්‍යායාමය කෘත්‍යසාධක වන්නේ ය. මහරජානෙනි, මෙම කාරණය අප භාග්‍යවතුන් වහන්සේ විසින් ද වදරණ ලදී:—

**(69)''පටිගච්චෙව නං කයිරා-යං ජඤ්ඤා හිතමත්තනො,**
**න සාකටිකචින්තාය-මන්තා ධීරො පරක්කමෙ.**

**''යථා සාකටිකො නාම[1]-සමං හිත්වා මහාපථං,**
**විසමං මග්ගමාරුය්හ-අක්ඛච්ඡින්නො'ව ඣායති.**

**''එවං ධම්මා අපක්කම්ම-අධම්මමනුවත්තිය,**
**මන්දො මච්චුමුඛං පත්තො-අක්ඛච්ඡින්නො'ව සොචති''[2]**

යනාදීන් යම් බඳු වූ අනුපාදනිර්වාණය ලැබීමට පළමු කොට ම තමහට යම් වැඩක් දන්නා වූ මන්ත්‍රණශක්තියෙන් යුක්ත වූ ප්‍රඥවත් පුරුෂතෙම අනුන් විසින් සිහි කරවන සාකටිකචිත්තය[3] බලා නො හිඳ ඒ අනුපාද-

1. 'පන්ථං'-සංයුත්තනිකාය 2. 'ඣායති'-සං:නි 3. මෙහි පරිවර්තනය වැරදිය

Non-Commercial Distribution

නිර්වාණයට වීර්ය කරන්නේ ය. යම් සේ ගැල් පදනා සාකටික නම් පුරුෂතෙම සම වූ මහාමාර්ගය හැර විසම වූ මාර්ගයට ගැල නහා පැමිණ ගැලෙහි අකුර බිඳමින් චිත්තවික්ෂෙපයට පැමිණෙන්නේ වන්නේ ද, එපරිද්දෙන් ම නුවණ මඳ අඥනතෙම කුශලධර්මය කෙරෙන් පහ ව අධර්මයෙහි හැසිර මරුමුඛයට පැමිණෙමින් ගැලෙහි අකුර බිඳී ශොක පත් වූ පුරුෂයා මෙන් ශොක කරන්නේ ය'' යි මෙසේ කී කල්හි රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ලොව ප්‍රකෘතිගින්නට වඩා නිරයෙහි ගිනි මහත් භයානක වන්නේ ය. ප්‍රකෘති ගින්නෙහි කුඩා ගල්කැටයක් බහා ලමින් දවසක් මුළුල්ලෙහිත් උෂ්ණයෙන් පිඹ දවනු ලබන්නේ විනාශයට නො යන්නේ ය. නරකාග්නියෙහි බහා ලන ලද්දවූ මහත් වූ උඩුමහල්ගෙයක් පමණ ගලක් වී නමුත් ක්ෂණය කින් විනාශයට යන්නේ ය යි නුඹ වහන්සේ කියනසේක. ඒ මේ වචනය නො අදහමි. මෙසේ ද වනාහි ඒ නරකයෙහි උපන්නා වූ යම් සත්ව කෙනෙක් ඇද් ද, ඒ නිරිසත්වයෝ නොයෙක් වර්ෂසහස්‍රයෙහි නිරයෙහි පැසෙමින් විනාශයට නො යන්නෝ ය යි කියාත් නුඹවහන්සේ කියන සේක. ඒ වචනයත් මම නො අදහමි'' යි කීහ. එකල තෙරුන් වහන්සේ කියනසේක්, ''මහරජානෙනි, තෙපි කුමක් සිතන්නහු ද? යම් ඒ දැතිමෝර[1] කෙනෙක් කිඹුල්ධෙනු කෙනෙක් කැස්බිනිකෙනෙක් මොනරධෙනුකෙනෙක් පරෙවිධෙනු කෙනෙක් ඇද් ද, කිමෙක් ද? ඒ තිරිසන්ධෙනුහු කර්කශ වූ ගල් හා බොරළුගල් කන්නාහු දැ?'' යි විචාළසේක. ''එසේ ය; ස්වාමීනි, කන්නාහු ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජ, ඒ බොරළුගල් ආදිය ඔවුන්ගේ කුක්ෂියෙහිදී උදරාභ්‍යන්තරගත ව විනාශයට ජීර්ණභාවයට යන්නාහුදැ?''යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, විනාශයට යන්නාහු ය'' යි කීහ. ''ඔවුන්ගේ කුක්ෂියෙහි යම් දරුගැබක් ඇද්ද, ඒ දරුගැබත් විනාශයට යේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''කවර කාරණය කින් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, කර්මය අධික බැවින් දරුගැබ විනාශයට නො යන්නේ ය යි සිතමි'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම කර්මය අධික බැවින් නිරිසත්වයෝ අනෙකවර්ෂකොටිසහස්‍රයෙහි නරකයෙහි පැසෙන්නාහු විනාශයට නො යෙති. එහි ම උපදිති. එහි ම වැඩෙති. එහි ම මියෙති. මහරජානෙනි, අප භාග්‍යවත් වූ ත්‍රිභුවනාචාර්යයන් වහන්සේ විසින් **(70)** මෙම කාරණය වදරණ ලද්දේ ය. 'මහරජානෙනි, යම්තාක් කල් ඒ පාපකර්මය විනාශ නො වේ ද, ඒ තාක් කල් ඒ නිරිසත්වතෙම කාලක්‍රියා නො කරන්නේ ය' යි වදාළසේකැ'' යි කියා ශ්‍රීමුඛපාලිය ගෙණ හැර දක්වා ලූසේක.

1. මෝරුන්

*Non-Commercial Distribution*

ඒ අසා, රජ්ජුරුවෝ ''ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, හේ තෙපි කුමක් සිතන්නහු ද? යම් ඒ සිංහධෙනුකෙනෙක් ඇද් ද, ව්‍යාඝ්‍රධෙනු දිවිධෙනු සුනඛධෙනු කෙනෙක් ඇද් ද, කිමෙක් ද? ඔවුහු කර්කශ වූ මිනීඇට හා මස් අනුභව කරන්නහු ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, මිනීඇට ආදිය අනුභව කරන්-නාහු ය'' යි කීහ. ''කිමෙක් ද, ඔවුන්ගේ කුක්ෂියෙහි උදරාභ්‍යන්තරයට ගියා වූ ඒ අස්ථිආදිය විනාශයට-ජීර්ණභාවයට යන්නාහු දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, විනාශයට යන්නාහු ය'' යි කීහ. ''ඔවුන්ගේ කුක්ෂියෙහි යම් දරුගැබක් ඇද් ද, ඒ දරුගැබත් විනාශ ව යේ දැ යි විචාළසේක. ''නැත; ස්වාමීනි'' යි කීහ. ''හේ කවර කාරණයෙකින් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, කර්මය අධික හෙයින් දරුගැබ විනාශයට නො යන්නේ ය යි සිතමි'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම කර්මය බලවත් බැවින් නිරාදුක් විඳින නිරිසත්වයෝ අනෙකවර්ෂශත සහස්‍රයෙහි නරකයෙහි පැසෙන්නාහු විනාශයට නො යන්නාහු ය'' යි කීසේක. ''ස්වාමීනි, නැවැතත් බොහෝ සේ උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, හේ තෙපි කුමක් සිතවු ද? තොපගේ මේ යොනකදෙසයෙහි උපන් යම් ඒ යොනකසුඛුමාලිනී කෙනෙක් ඇද් ද ක්ෂත්‍රියසුඛුමාලිනී කෙනෙක් ඇද් ද, බ්‍රාහ්මණසුඛුමාලිනී කෙනෙක් ඇද් ද, ගෘහපතිසුඛුමාලිනී කෙනෙක් ඇද් ද, කිමෙක් ද? ඒ ස්ත්‍රීහු කර්කශ වූ කැවිලි ආදිය හා මස් ආදිය අනුභව, කරන්නාහු දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, අනුභව කරන්නාහු ය'' යි කීහ. ''කිමෙක් ද[1] ඒ ස්ත්‍රීන්ගේ කුක්ෂියෙහි උදරාභ්‍යන්තරයට ගියා වූ ඒ කැවිලි ආදිය දිරා විනාශයට යන්නේ දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, විනාශයට යන්නේ ය'' යි කීහ. ''ඒ ස්ත්‍රීන්ගේ ගර්භයෙහි යම් දරුගැබක් ඇද් ද, ඒ දරුගැබත් විනාශයට යේ දැ?'' යි විචාළසේක. නැත, ස්වාමීනි,'' යි කීහ. ''කවර කාරණයකින් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, 'කර්මය අධික බැවින් විනාශයට නො යන්නේ ය' යි සිතමි'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම කර්මය අධික බැවින් නරකයෙහි වසන නිරිසත්හු අනෙකවර්ෂශතසහස්‍රයෙහි නිරයෙහි පැසෙන්නාහු විනාශයට නො යන්නාහු ය. එහි ම උපදිති. එහි ම වැඩෙති. එහි ම වධයෙන් මියෙති. මහරජානෙනි, මෙම කාරණය අප භාග්‍යවත් වූ අචින්තෙය්‍යරූපීන් වහන්සේ විසින් **'සො න තාව කාලං කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්තිහොති'** යි යනුවෙන් මෙසේ වදාරණ ලදැ'' යි කියා සද්ධර්ම සාක්ෂියක් ගෙණ හැර දක්වා වදාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මිහිරි කොට කියන ප්‍රශ්නකථාවෙහි දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

1. කිමෙක්ද වනාහි

Non-Commercial Distribution

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මේ මහා පෘථිවිය ජලයෙහි පිහිටන ලද්දේ ය. ඒ ජලය වාතයෙහි පිහිටන ලද්දේ ය. වාතයතෙම යට අජටාකාශයෙහි පිහිටන ලද්දේ ය' යි කියා නුඹ වහන්සේ කියනසේක. මම මේ වචනයත් නො අදහමි'' යි කීහ. **(71)** එකල තෙරුන් වහන්සේ ධබරාවකින් පැන් ගෙණ ''මහරජානෙනි, යම් සේ මේ වතුර වාතයෙහි ධරණ ලද ද, එපරිද්දෙන් ම ඒ ජලපොළෝ සංඛ්‍යාත වූ ඒ මහවතුරත් මහත් වූ වාතයෙන් ධරණ ලද්දේ ය'' යි කියා මිලිඳු රජ්ජුරුවන්ට අවබොධකරවා වදාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නිරොධ ය යි කියන ලද සර්වසංස්කාරප්‍රවෘත්තිධර්මයන්ගේ නිරුද්ධ කිරීම නිර්වාණය ද?'' යි කීහ. ''එසේ ය, මහරජානෙනි, නිරුද්ධිය නිර්වාණය''යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නිරොධය නිර්වාණය වූයේ කෙසේ ද?'' යි කීහ. ''මහරජානෙනි, මහත් වූ ක්ලේශයන් ඇති බැවින් පෘථග්ජන නම් වූ සියලු ම අඥාන පෘථග්ජනයෝ වනාහි අනාදිමත් සසර බොහෝ කරණ හෙයින් ආයතන නම් වූ ඒ අධ්‍යාත්මිකබාහිරායතනයෙහි විශෙෂයෙන් ම සතුටු වෙති. විශෙෂයෙන් ම ගුණ කියති. එහි ම බැස සිටිති. චක්ඛායතන රූපායතනාදී ද්වාදශායතන නමැති මහඋදකසොත යෙන් සංසාරමුහුදට ගෙණ යනු ලැබෙති. ජාති ජරා මරණ සොකයෙන් හා හැඬීමෙන් දුක්දෙම්නසින් උපායාසයෙන් නො මිදෙති, එහෙයින් සියලු ම සංසාරදුක්ඛයෙන් නො මිදෙන ලද්දහු ය යි කියමි. මහරජානෙනි, රූප ශබ්දදියෙහි දෙෂ ඇසීමෙන් ශ්‍රැතවත් වූ ආර්යශ්‍රාවකතෙම වනාහි ආධ්‍යාත්මිකබාහිරායතනයන් කෙරෙහි සන්තොෂ නො වන්නේ ය. කිසි ගුණයක් නො කියන්නේ ය. ආයතනයෙහි බැස නො සිටින්නේ ය. ඒ චක්ෂුරාදි ද්වාදශායතනයන්හට සන්තොෂ නො වන්නා වූ එහි ගුණ නො කියන්නා වූ එහි බැස නො සිටින්නා වූ ඒ ආර්යශ්‍රාවකයාගේ කාම තෘෂ්ණාදි වූ අෂ්ටොත්තරශතප්‍රභෙද වූ තෘෂ්ණාව නිරුද්ධ වන්නේ ය. ඒ තෘෂ්ණා නිරොධය හෙතු කොට ගෙණ උපාදන ය යි කියන ලද කිඹුලා කටින් ඩැහැ ගත් දෙයක් හරවා ගත නො හැක්කා සේ, යම්කිසි කා විසිනුත් කියා හරවා ගත නො හැක්කා වූ පඤ්චකාම, මිත්‍ථ්‍යාදෘෂ්ටි, ගොශීලාදි බාහිරශීලය, ආත්මය ඇතැ යි කියා ගැණීම ය යන මෙහි අරමුණු දැඩි කොට ගැණීම නිරුද්ධ වන්නේ ය. ඒ කාමූපදනය, දිට්ඨූ-පාදනය, සීලබ්බතූපාදනය, අත්තවාදූපාදනය යන චතුර්විධ වූ උපාදන-යන්ගේ නිරොධය හෙතු කොට ගෙණ කාමභවාදි ත්‍රිවිධභවයාගේ නිරුද්ධිය වන්නේ ය. ඒ ත්‍රිවිධභවයාගේ නිරොධය හෙතු කොට ගෙණ දිව්‍යබ්‍රහ්මමනුෂ්‍යාදි උත්පත්ති ජාතියාගේ නිරුද්ධිය වන්නේ ය. ඒ ජාති යෙහි නිරොධය හෙතු කොට ගෙණ ජරා මරණ සොක හැඬීම හා දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ නිරුඬ වෙති. මෙසේ මේ සියලු ම සංසාර දුඃඛසමූහයාගේ නිරුඬත්වය වන්නේ ය. මහරජානෙනි, මෙසේ වනාහි

Non-Commercial Distribution

සර්වසංස්කාරප්‍රවෘත්තිධර්මයන්ගේ නිරොධයතෙම නිර්වාණ ය,'' යි වදළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අති දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සියලු ම සත්වයෝ නිර්වාණය ලබන්නාහු දැ?'' යි කීහ. ''මහරජානෙනි, සියලු සත්වයෝ ම නිර්වාණය නො ලබති. එතෙකුදු වුවත් මහරජානෙනි, යමෙක් මනා කොට පිළිපදිමින් දැන ගත යුතු ධර්මයන් දැන ගණී ද, (72) පරිඥ්ඥෙයය වූ දුඃඛසත්‍යධර්මයන් දුකැ යි කියා දැන ගණී ද, දුරු කළ මනා වූ සමුදයසත්‍යධර්මයන් දුරු කෙරේ ද, භාවිත කළ මනා වූ මාර්ග සත්‍යධර්මයන් භාවිත කෙරේ ද, සාක්ෂාත් කළ යුතු වූ නිරොධසත්‍ය ධර්මයන් සිද්ධ කෙරේ ද, ඒ උත්තම පුරුෂතෙම නිර්වාණසම්පත්තිය ලබන්නේ ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමෙක් නිර්වාණය නො ලබා නම්, ඒ පුරුෂතෙම නිර්වාණය සැප ය යි කියා දනී දැ?'' යි විචාළහ. ''එසේ ය; මහරජානෙනි, යමෙක්තෙම නිර්වාණය නො ලබා ද, ඒ පුරුෂතෙම නිර්වාණය සැප ඇතැ යි කියා දන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නිවන් නො ලබන්නා වූ පුරුෂතෙම 'නිර්වාණය සැප ඇතැ' යි කියා කෙසේ දනී දැ?'' යි කීහ. මහරජානෙනි, හේ කුමක් සිතන්නහු ද? යම් කෙනෙකුන්ගේ කන් නාසා හස්ත පාද සිඳිනා නො ලද්දේ වී නම්, මහරජානෙනි, නො සිඳිනා ලද හස්තපාදයන් ඇති ඒ සත්වයෝ අත් පා කැපීම දුක්ඛවෙදනා ඇතැ යි කියා දන්නාහු දැ?'' යි විචාළසේක. ''එසේ ය; ස්වාමීනි, දනිති'' යි කීහ. ''කෙසේ දනිද් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, අත් පා කපන ලද්ද වූ සෙසු සත්වයන්ගේ හැඬීම් හා විලාපශබ්දයන් අසා 'අත් පා කැපීම ඉතා දුකැ' යි කියා දන්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කෙනෙකුන් විසින් අමෘතමහානිර්වාණය දක්නා ලද ද, ඔවුන්ගේ උදන ප්‍රීතිවාක්‍ය ශබ්දයන් අසා 'නිර්වාණය සැප ඇතැ' යි කියා දනිති'' යි වදළ සේක. එකල රජ්ජුරුවෝ ''කල්ලොසි භන්තෙ නාගසෙන'' යි ස්තුති කළහ.

**සකලජනමනොනන්දනීය වූ මේ මිලින්දප්‍රශ්න නම් වූ ශ්‍රීසද්ධර්මාදසයෙහි සතරවන වර්ගය නිමියේ ය.**

---

*Non-Commercial Distribution*

# පස්වන වර්ගය

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, නුඹ වහන්සේ විසින් සර්වඥ වූ බුදුවරතෙම දක්නා ලද්දේ දැ?'' යි කීහ. ''නැත, මහරජානෙනි,' යි කීසේක. ''එසේ වී නම් නුඹවහන්සේගේ ආචාර්යයන් වහන්සේ විසින් බුදුවරතෙම දක්නා ලද්දේ දැ?'' යි කීහ. ''නැත, මහරජානෙනි,'' කීසේක. ''එසේ වී නම් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'සර්වඥතෙම නැතැ'' යි කීහ. ''කිමෙක් ද? මහරජානෙනි, හිමාලයෙහි වූ **ඌහා** නම් ගංගාව තොප විසින් දක්නා ලද්දේ දැ?'' යි කීසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. නැවැත තොපගේ පියානන් විසින් **ඌහා** නදිය දක්නා ලද්දේ දැ?'' යි කීසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''එසේ වී නම්,'මහරජානෙනි, '**ඌහා** නම් ගංගාතොම නැතැ'' යි කීසේක. ''ඇත, ස්වාමීනි, එනම් ගංගාවක් කිසි සේත් මා විසින් **ඌහා** නදිය නුදුටුයේ නමුත් මාගේ පියානන් විසින් ඌහා නදිය නො දක්නා ලද්දේ වී නමුත් එතෙකුදු වුවත් ඌහා නදීතොම ඇතැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම කිසිසේත් මා විසින් භාග්‍යවතුන් වහන්සේ නො දක්නා ලද්දේ වී නමුත්, මාගේ ආචාර්යයන් වහන්සේ විසින් භාග්‍යවතුන් වහන්සේ නො දක්නා ලද්දේ වී නමුත්, එතෙකුදු වුවත් භාග්‍යවත් වූ බුදුරජානන් **(73)** වහන්සේ ඇතැ'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''කල්ලොසි භන්තෙ නාගසෙන'' යි කියා සතුටු වූහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, සර්වඥයන් වහන්සේ නිරුත්තර වූසේක් දැ?'' යි කීහ. ''එසේ ය, මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ නිරුත්තර වූසේකැ'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පෙර නුදුටුවා වූ සර්වඥයන් වහන්සේ 'නිරුත්තර වූසේකැ' යි කියා නුඹ වහන්සේ කෙසේ දන්නාසේක් දැ?'' යි විචාළහ. ''මහරජානෙනි, හේ තෙපි කුමක් නම් සිතන්නහු ද? යම් කෙනෙකුන් විසින් මහාසමුද්‍රයතෙම පෙර නො දක්නා ලද්දේ වී නම්, මහරජානෙනි, මහාසමුද්‍රය වනාහි මහත් වූයේ ය. ගම්හිර වූයේ ය. අප්‍රමාණ වූයේ ය. බැස එතෙර විය නො හැක්කේ ය. යම් තැනෙක්හි මේ පඤ්චමහා ගංගාවෝ නිරන්තරයෙන් සමාගමයට පැමිණෙද් ද, ඒ නදීහු කවරහු ද? **''ගංගා ය, යමුනා ය, අචිරවතී ය, සරභූ ය, මහී ය** යන මේ පඤ්චමහා ගංගාවෝ ඒ මුහුද කරා පැමිණෙති. එසේ නමුත් ඒ මහාසමුද්‍රයාගේ ඌන බවක් හෝ පිරෙණබවක් හෝ නො ම දැනෙන්නේ ය. නො පෙණෙන්-නේ ය' යි කියා සමුද්‍රය නුදුටු ඒ ජනයෝ දනිද් දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, දනිති'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම පිරිනිවියා වූ මහානුභාව සම්පන්න වූ ශ්‍රාවකයන් වහන්සේලා දැක අප භාග්‍යවත් බුදුරජානන් වහන්සේ අනුත්තර වූසේකැ යි කියා දනිමි'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අති දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.



Non-Commercial Distribution

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, සර්වඥයන් වහන්සේ නිරුත්තර වූසේකැ යි කියා දැන ගන්ට හැකි වේ දැ?'' යි කීහ. ''එසේ ය, මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ නිරුත්තර වූසේකැ යි කියා දැන ගන්ට හැකි වන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සර්වඥයන් වහන්සේ අනුත්තර වූසේකැ'' යි කියා කෙසේ නම් දැන ගන්ට හැකි වේදැ?'' යි කීහ. ''මහරජානෙනි, පෙර වූ දෙයක් කියමි:— පළමු තිස්ස නම් තෙරණු කෙනෙක් මේ නුවර ලියනාචාර්ය වූසේක. දැන් කාලක්‍රියා කරණ ලද ඕහට බොහෝ වූ අවුරුදු ගණනක් ඉකුත් විය. ඒ තෙරුන් වහන්සේ කෙසේ දැනෙන්නාහු දැ'' යි විචාළසේක. ''ස්වාමීනි, උන්වහන්සේගේ අකුරු ලියමන කරණ කොට ගෙණ දැන ගණුමහ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යමෙක්තෙම ධර්මය දකී නම්, ඒ පුරුෂතෙම 'භාග්‍යවත් බුදුරජානන් වහන්සේ නිරුත්තර වූසේකැ' යි කියා දන්නේ ය. ''මහරජානෙනි, ධර්මය වනාහි අප භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණ ලද්දේ ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, නුඹ වහන්සේ විසින් සද්ධර්මයතෙම දක්නා ලද්දේ දැ?'' යි කීහ. ''මහරජානෙනි, නො දක්නා ලද මාර්ගයෙක් වී නම් කෙසේ හැසිරෙණු ලැබේ ද? බුදුරජානන් වහන්සේ විසින් දෙශනා කරණ ලද **නෙන්ති** නම් වූ විනය ධර්මදෙශනායෙහි ද, බුදුන් විසින් පණවන ලද ශික්ෂාපදප්‍රඥප්ති යෙහි ද ශ්‍රාවකයන් විසින් දිවිහිමියෙන් හැසිරිය යුතු නො වේ දැ'' යි කීසේක, එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, මේ ආත්මභාවය අන් තැනකට යන්නේත් නැත. අන් තැනක **(74)** උපදින්නේත් ඇද්දැ?'' යි කීහ. ''එසේ ය, මහරජානෙනි, අන් තැනකට යන්නේත් නැත. අන් තැනක උපදිනවාත් ඇතැ'' යි වදාළසේක. ''ස්වාමීනි, 'අන් තැනකට නො යන්නේත් අන් තැනක උපදින්නේත් කෙසේ දැ' යි උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ කිසි යම් පුරුෂයෙක් තෙම ප්‍රදීපයකින් ප්‍රදීපයක් දල්වා ගත්තේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ ප්‍රදීපය අනික් ප්‍රදීපය කෙරෙන් නික්ම ආයේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මේ කය යන්නේත් නැත. අන් තැනක උපදිනවාත් ඇතැ''යි කීසේක. ''ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, ළදරු වයස් ඇත්තා වූ තෙපි ශාස්ත්‍ර උගන්නා වූ ශ්ලෝකාචාර්යන්ගේ සමීපයෙහි කිසියම් ශ්ලෝකයක් උගන්නා ලද්දේ නො වේ ද? ඒ දන්නහු දැ?'' යි විචාළසේක. ''එසේ ය; ස්වාමීනි, දන්නෙමි'' යි කීහ. 'කිමෙක් ද? මහරජානෙනි, ඒ ශ්ලොකයතෙම ගුරුන් කෙරෙන් නික්ම

*Non-Commercial Distribution*

ආයේ ද?'' යි විචාළසේක. ''නැත; ස්වාමීනි'' යි කීහ. ''මහරජාණෙනි, එපරිද්දෙන් ම මේ ආත්මභාවය අන් තැනකට යන්නේත් නො වෙයි. අන් තැනක ප්‍රතිසන්ධිග්‍රහණය කරන්නේත් ඇතැ'' යි වදළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, වෙදගු නම් ආත්ම සංඛ්‍යාත ප්‍රාණජීවයෙක් ලැබේ දැ'' යි විචාළෝ ය. එකල තෙරුන් වහන්සේ ''මහරජාණෙනි, පරමාර්ථ වශයෙන් වනාහි වෙදගු නම් ආත්මකෙනෙක් නො ලැබෙති'' යි කීසේක. එවිටත් රජ්ජුරුවෝ **කල්ලොසි භන්තෙ නාගසෙන''යි** කියා ස්තුති කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, යම් සත්වයෙක්තෙම මේ නාමරූපශරීරයෙන් අනික් ශරීරයකට යේ ද, එබඳු වූ කිසි සත්වයෙක් ඇද් දැ?'' යි කීහ. ''නැත මහරජාණෙනි,'' කීසේක. ''ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ශරීරයෙන් අනික් ශරීරයකට යන්නා වූ සත්වයෙක් නැත් නම්, සත්වතෙම පාපකර්මයෙන් මිදෙන ලද්දේ වන්නේ නො වේ දැ?'' යි කීහ. ''එසේ ය, මහරජාණෙනි, ඉදින් අනික් තැනක නො පිළිසිඳ ගන්නේ වී නම් පාපකර්මයෙන් මිදෙන ලද්දේ වෙයි. මහරජාණෙනි, යම් හෙයකින් අනික් තැනක පිළිසිඳ ගන්නේ ද, එහෙයින් අකුශල කර්මයෙන් නො මිදෙන ලදැ'' යි කීසේක. ''උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජාණෙනි, යම් සේ කිසි යම් පුරුෂයෙක් තෙම අන්‍යතරපුරුෂයෙකුගේ අඹ සොරකම් කෙළේ වී නම්, කිමෙක් ද, ඒ පුරුෂතෙම වධප්‍රාප්ත වේ දැ?'' යි විචාළ සේක. ''එසේ ය, ස්වාමීනි, වධප්‍රාප්ත වන්නේ ය'' යි කීහ. ''මහරජාණෙනි, ඒ අඹ ස්වාමියා විසින් යම් අඹබීජකෙනෙක් රොපණය කරණ ලද ද, ඒ අඹබීජයන් ඒ අඹ සොර පුරුෂතෙම නො ම සොරකම් කෙළේ ය. කුමක් නිසා වධප්‍රාප්ත වන්නේ දැ?'' යි විචාළසේක. ''හැයි, ස්වාමීනි, ඒ පෙර රොපණය කළ අඹඇට නිසා ඒ පසු ව පල ගත් අඹ උපන්නේ ය. ඒ නිසා සොරතෙම වධප්‍රාප්ත වන්නේ ය'' යි කීහ. ''මහරජාණෙනි, එපරිද්දෙන් ම මේ නාමරූපයෙන් ශොභන වූ කුශලයක් හෝ අශොභන වූ අකුශලයක් හෝ යම් කර්මයක් කෙළේ වී නම්, ඒ කර්මයෙන් අනික් නාමරූපයක් **(75)** පිළිසිඳ ගන්නේ ය. එසේ හෙයින් පාපකර්මයෙන් නො මිදෙන ලද්දේ ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''කල්ලොසි භන්තෙ නාගසෙන'' යි කියා ස්තුති කළහ.

තවත් ප්‍රශ්නයක් අසනු කැමති රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ නාමරූපයෙන් කුශලකර්මයක් හෝ අකුශලකර්මයක් හෝ කරණ ලද ද, ඒ කුශලාකුශලකර්මයෝ කො තැන්හි සිටින්නාහු දැ?'' යි විචාළෝ ය. ''මහරජාණෙනි, ඒ කුශලාකුශලකර්මයෝ පහ ව නො යන්නාහු ඡායාව මෙන් කැටු ව ම යන්නාහු ය'' යි කීසේක. ''ස්වාමීනි,

Non-Commercial Distribution

ඒ කුශලාකුශලකර්මයෝ වනාහි මෙතැන්හි හෝ මෙතැන්හි හෝ සිටින්-නාහු ය'' යි කියා දක්වන්නට හැකි වේ ද?'' යි කීහ. ''මහරජානෙනි, ඒ කුශලාකුශලකර්මයෝ මෙතැන්හි හෝ මෙතැන්හි හෝ සිටින්නාහු ය'' යි කියා දක්වන්නට නො හැක්කේ ය'' යි කීසේක. ''උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, හේ තෙපි කුමක් නම් සිතන්නහු ද? නො හට ගත් ඵල ඇති යම් මේ වෘක්ෂජාතියෙක් ඇද් ද, ඔවුන්ගේ ඵලයෝ මේ මේ තැන ඇතැ යි කියා ඒ හට නො ගත් ඵලයන් දක්වන්නට හැකි වේ ද?'' යි කීසේක. ''ස්වාමීනි, එසේ නො හැක්කේ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම නො සිඳී පවත්නා සංසාරවෘත්ති සංඛ්‍යාත සන්තතියෙහි ඒ කුශලාකුශලකර්මයෝ මෙතැන මෙතැන සිටින්නාහු ය යි කියා ඒ කුශලාකුශලකර්මයන් දක්වන්නට නො හැක්කේ ය'' යි වදාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමෙක් යම් තැනෙක උපදනේ වී නම් එතෙම 'මම උපදිමි' යි කියා දන්නේ ද?'' යි කීහ. ''එසේ ය, මහරජානෙනි, යමෙක් උපදනේ වී නම්, එතෙම 'මම උපදිමි' යි කියා දන්නේ ය'' යි කීසේක. ''උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ සිසා ගොවිතැන් කරණ ගෘහපතියෙක් තෙම පෘථිවියෙහි වී වපුට යහපත් කොට වැසි වස්නා කල්හි ධාන්‍ය සංඛ්‍යාත වී උපදනේ ය යි කියා දනි ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, දන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යමෙක් උපදනේ වී නම්, එතෙම 'මම උපදින්නෙමී' යි කියා දන්නේ ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි කියා ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සර්වඥයන් වහන්සේ ඇත්තාහු ම ද?'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ ඇතැ'' යි කීසේක. එසේ වී නම ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේගේ සර්වඥයන් වහන්සේ මේ මේ තැන හිඳිනාසේකැයි කියා මට දක්වා පියන්නට හැකි වේ ද?'' යි කීහ. ''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ අනුපාදිශෙෂ වූ නිර්වාණධාතුවෙන් පිරිනිවන් පා වදාළසේක. භාග්‍යවතුන් වහන්සේ මෙතැන මෙතැන ය යි කියා දක්වන්නට නො පිළිවනැ'' යි කීසේක. ''උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, හේ කුමක් සිතන්නහු ද? දිලියෙමින් ඇවිළෙන්නා වූ මහත් වූ අග්නිස්කන්ධයාගේ විනාසයට ගියා වූ යම් ගිනිදළුවක් ඇද් ද, ඒ මුදුන් ගිනිදළුව මෙතැන හෝ මෙතැන හෝ සිටින්නේ ය යි කියා දක්වන්නට හැකි වේ ද?'' යි
**(76)** විචාළසේක. ''නො හැක්ක ස්වාමීනි, ඒ ගිනිදළුව නිරුද්ධ ව අදර්ශනයට —එනම් පුවත නැති බවට යන ලද්'' යි කීහ. ''මහරජානෙනි,

Non-Commercial Distribution

එපරිද්දෙන් ම අප භාග්‍යවතුන් වහන්සේ අනුපාදිශෙෂ වූ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදළසේක. සංසාර නමැති අස්තගිරිපර්වතය ගෙවා වැඩි සේක. භාග්‍යවත් සර්වඥයන් වහන්සේ 'මෙතැන මෙතැනය'යි කියා දක්වන්නට නො හැක්කේ ය. මහරජානෙනි, චතුර්වෛශාරද්‍ය ඥනාදි වූ ධර්මකාය කරණ කොට ගෙණ වනාහි භාග්‍යවතුන් වහන්සේ ය යි කියා දක්වන්නට හැකි වන්නේ ය. මහරජානෙනි, සද්ධර්මය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණ ලද්දේ ය'' යි කීසේක. ඒ අසා රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිදක්ෂ වූසේකැ''යි කියා ස්තුති කළහ.

**සකලජනමනොනන්දනීය වූ මේ මිලින්දප්‍රශ්න නම් වූ ශ්‍රීසද්ධර්මාදසයෙහි පස්වන වර්ගය නිමියේ ය.**

---

# සවැනි වර්ගය

නැවැතත් රජ්ජුරුවෝ 'ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මහණුන් වහන්සේලාට ශරීරය ප්‍රිය ඇද් ද?''යි කීහ. ''මහරජානෙනි, මහණුන් වහන්සේලාට ශරීරය ප්‍රිය නැතැ''යි කීසේක. ''එසේ වී නම්, ස්වාමීනි, කුමක් පිණිස මහණුන් වහන්සේලා තෘෂ්ණාවශයෙන් බැස සිටිනසේක් ලා ද? 'මම ය මාගේ ය' යි කියා මමත්වය කරණසේක් ලා දූ ?'' යි කීහ. ''කිමෙක් ද,මහරජානෙනි, කිසියම්[1] දවසක දී සංග්‍රාමයට ගියා වූ තොපට හීපහරක් වදින්නේ ඇද්ද?''යි විචාළසේක. ''එසේ ය. ස්වාමීනි, හීපහරක් වදින්නේත් ඇතැ''යි කීහ. ''කිමෙක් ද මහරජානෙනි, හීය වැදුනු ඒ වණයතෙම යම් ආලෙපනබෙහෙතකින් ආලෙපනයත් කරණ ලැබේ ද. තෛලයෙනුත් ගානු ලැබේ ද? සියුම් මොළොක් වූ වස්ත්‍රකඩිනුත් වෙළනු ලැබේ දූ?''යි විචාළසේක. ''එසේය, ස්වාමීනි, ඒ වණය ආලෙපයෙනුත් ආලෙප කරණ ලැබෙයි. තෙලිනුත් ගානු ලැබෙයි. සියුම් මොළොක් වූ වස්ත්‍රකඩිනුත් වෙළනු ලබන්නේ ය''යි කීහ. කිමෙක් ද, මහරජානෙනි, ආලෙපබෙහෙතින් ආලෙපනය කරණු ලබන්නා වූ තෙලින් ගානු ලබන්නා වූ සියුම් මොළොක් වූ වස්ත්‍රකඩිනුත් වෙළනු ලබන්නා වූ ඒ වණයතෙම තොපට ප්‍රිය ඇද් දූ?'' යි විචාළසේක. ''අනේ! ස්වාමීනි, වණය මට ප්‍රිය නැත. එතෙකුදු වුවත් මාංසයාගේ නැගීම පිණිස ආලෙපනයෙන් ආලෙපය කරණු ලැබෙයි. තෙලිනුත් ගානු ලැබෙයි. සියුම් වූ මොළෙක් වූ වස්ත්‍රකඩින් වෙළනු ලබන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මහණුන් වහන්සේලාට ශරීරය ප්‍රිය නො වන්නේ ය. එසේ නමුත් ශරීරාලයට නො බස්නා ලද්ද වූ මහණුන් වහන්සේලා බ්‍රහ්මචරියානුග්‍රහය පිණිස ශරීරය පරිහරණය කෙරෙති. මහරජානෙනි, එතෙකුදු වුවත් භාග්‍යවත් වූ අප බුදුරජානන් වහන්සේ විසින් ''ශරීරය නම් අසාධ්‍ය වූ වණයකට බඳු වූ උපමා ඇත්තේ

---

1. කවර

Non-Commercial Distribution

ය'යි වදරණ ලදදේ ය. ඒ වදළ අවවාදය කරණ කොට ගෙණ ශරීරාලයට නො බස්නා ලද මහණුන් වහන්සේලා මේ ශරීරය වණයක් මෙන් සිතා (77) ආහාර බෙහෙත් ආදිය දෙමින් පරිහරණය කරණසේක් ලා ය. මහරජානෙනි, අප භාග්‍යවත් වූ ලොවුතුරා බුදුන් විසින් මෙම කාරණය වදරණ ලද්දේය:—

> "අල්ල චම්මපටිච්ඡන්නො – නවද්වාරො මහාවණො,
> සමන්තතො පග්ඝරති – අසුචි පූතිගන්ධියො" යි

යනුවෙන් මේ ශරීරය නම් අල්ලචර්මය යි කියන ලද තෙත් වූ කුණු සමින් වැසී තිබෙන්නේ ය. සෙම් සොටු මල මූත්‍ර කන්කුණු ඇස්කබ නිති වැහෙන නවද්වාරයක් ඇත්තේ ය. පිළියම් කොට සුවපත් කළ නො හැකි බැවින් අසාධ්‍යමහවණයක් වැනි වූයේ ය. නුවණැත්තන් විසින් පිළිකුල් කට යුතු බැවින් අසූචිපිඩක් වැනි වූයේ ය. නිති පැතිරෙන්නා වූ දුර්ගන්ධ ඇත්තේ ය. හාත්පසින් නොයෙක් කුණු වැගිරෙන්නේ ය'' යි කියා මේ ජිනදෙසනාව දක්වා වදළසේක. එකළ රජ්ජුරුවෝ "ස්වාමීනි නාගසෙනයන් වහන්ස, අතිදක්ෂ වූසේකැ''යි ස්තුති කළහ.

''නැවතත් රජ්ජුරුවෝ "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, බුදුරජානන් වහන්සේ සියල්ල ම දන වදළසේක් ද? සියල්ල ම දක්නා සේක් දැ'' යි විචාළෝ ය. "එසේ ය, මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ සියල්ල ම දක්නාසේකැ'' යි කීසේක. "එසේ වී නම්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කුමක් පිණිස තමන්ගේ ශ්‍රාවකයන්ට අනුපූර්ව යෙන් ම වරදක් දුටු විට ම ශික්ෂාපද පණවා වදරණසේක් ද? පළමු කොට ම ශික්ෂාපද පණවන්ට නපුරු දැ'' යි කීහ. "මහරජානෙනි, තොපගේ වනාහි මේ නුවර යම් කිසි වෛද්‍යාචාර්යකෙනෙක් ඇද් ද, ඒ තෙම මේ සියලු පෘථිවියෙහි ඇති සියලු ම බෙහෙත් ජාතීන් දනී දැ?'' විචාළසේක. "එසේ ය, ස්වාමීනි, එබඳු වෙදෙක් ඇතැ'' යි කීහ. "කිමෙක් ද? මහරජා නෙනි, ඒ වෛද්‍යාචාර්යයා ගිලන්කමක් සම්ප්‍රාප්ත කල්හි බෙහෙත් පොවන්නේ ද? නොහොත් රොගයක් සම්ප්‍රාප්ත කල්හි බෙහෙත් පොවා දැ?'' යි විචාළසේක. "ස්වාමීනි, ගිලන්කමක් සම්ප්‍රාප්ත කාලයෙහි බෙහෙත් පොවන්නේ ය. අසම්ප්‍රාප්තකාලයෙහි බෙහෙත් නො කරන් නේ ය'' යි කීහ. "එපරිද්දෙන් ම, මහරජානෙනි, අප භාග්‍යවත් සර්වඥයන් වහන්සේ සියල්ල ම දක්නාසේක. දුශ්ශීලාදීනවයක් නැති කාලයෙහි ශ්‍රාවකයන්ට ශික්ෂාපද නො පණවන සේක. අසාරුප්‍යකෘත්‍යයක් සම්ප්‍රාප්ත කල්හි ශ්‍රාවකයන්ට ශික්ෂාපද 'දිවිහිමියෙන් ම ව්‍යතික්‍රමණය නො කට යුතු ය' යි කියා පණවා වදරණසේකැ'' යි කීසේක. එකල රජ්ජුරුවෝ "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

Non-Commercial Distribution

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, බුදුරජානන් වහන්සේ සුප්‍රතිෂ්ඨිතපාදතාදි වූ දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් සමන්විත වූසේක් ද? චිත්‍රාංගුලිතාදි වූ අසූවක් පමණ අනුව්‍යඤ්ජනයෙන් රඤ්ජිත ව සැරහුනුසේක් ද? ස්වර්ණවර්ණ වූසේක් ද? විශෙෂයෙන් ඔප් නැගූ දඹ රත්රන්රූපයක් සෙයින් රජස් නො ඇලෙන ප්‍රසන්න වූ ඡවිය ඇතිසේක් ද? රන් පර්වතයක් වටා සිටි දෙව්දුනුපෙළක්සෙයින් නිති බබළන සරියන් බ්‍යාමප්‍රභාමණ්ඩලයක් ඇතිසේක් ද? ''යි කීහ. ''එසේ ය, මහරජානෙනි, අප භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සියලු ම දෙව්මිනිසුන් විසින් 'මෙබඳු ලක්ෂණයෙන් යුක්ත වූ **(78)** පුරුෂතෙම ලොවුතුරා බුදු වෙයි' කියා දැන ගන්නා වූ ද්වාත්‍රිංශත්වරමහාපුරුෂලක්ෂණයෙන් සමන්නාගත වූසේක. ඒ දෙතිස්මහාපුරුෂලක්ෂණයන් අනු ව පවත්නා හෙයින් අනුලක්ෂණය යි කියන ලද චිත්‍රාංගුලිවට්ටාංගුලිතාදි වූ අසූවක් පමණ අනුව්‍යඤ්ජනලක්ෂණයෙන් වලඳනා ලද්ද වූසේක. දිවිදළින් ඔප් නහා ගුරුපිරියම් කළ ඝන රන්රුවක් සෙයින් ස්වර්ණවර්ණ වූසේක. එසේ ම ස්වර්ණසන්නිභත්ත ව ඇතිසේක. නිති දිලෙන බ්‍යාමප්‍රභාමණ්ඩලයක් ඇතිසේකැ'' යි කීසේක. ''ස්වාමීනි, හේ කිමෙක් ද? ඒ බුදු වූ **සිද්ධාර්ථ**කුමාරයන්ගේ මවුපියෝත් දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් සමන්නාගත වූවාහු ද? අසූඅනුව්‍යංජන ලක්ෂණයෙන් වලඳනා ලද්දෝ වූවාහු ද? ස්වර්ණවර්ණයෙන් යුක්ත වූවාහු ද? කඤ්චනසන්නිභත්ත ව ඇත්තාහු ද? බ්‍යාමප්‍රභාව ඇත්තාහු දැ?''යි විචාළෝ ය. ''නැත, මහරජානෙනි, යි කීසේක. ''ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, මෙසේ ඇති කල්හිත් දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් සමන්නාගත වූ අසූඅනුව්‍යඤ්ජනයෙන් යුක්ත ස්වර්ණවර්ණ ඇත්තා වූ රජස් නො ඇලෙන රන්වන් ඡවි ඇත්තා වූ බ්‍යාමප්‍රභා ඇත්තා වූ බුදුරජ තෙම උපදිනසේක් ද? කිමෙක් ද, පුත්‍රතෙම මැනියන්ට සදෘශ ව හෝ වන්නේ ය. මාතෘපක්ෂ ව හෝ උපදනේ ය. පියානන් සදෘශ ව හෝ පුත්‍රතෙම උපදනේ ය. පිතෘපක්ෂයෙහි නෑකෙනෙකුන් සදෘශ හෝ වන්නේ නො වේ දැ?'' යි කීහ. එකල තෙරුන් වහන්සේ ''මහරජානෙනි, සියක්පෙති ඇති කිසියම් පියුම්ජාතියෙක් ඇද් දැ?'' යි කීසේක. ''එසේ ය, ස්වාමීනි, ඇතැ'' යි කීහ. ''මහරජානෙනි, ඒ පදුමයාගේ උත්පත්තිය කො තැන්හි සම්භව වේ දැ'' යි විචාළසේක. ''ස්වාමීනි, කර්දමයෙහි උපදනේ ය. ජලය මත්තෙහි පිපෙනු ලබන්නේ ය'' යි කීහ. ''කිමෙක් ද, ''මහරජානෙනි, ඒ පද්මය වර්ණයෙන් හෝ ගන්ධයෙන් හෝ රසයෙන් හෝ මඩ හා සදෘශ වේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. එසේ වී නම් වර්ණයෙන් හෝ ගන්ධයෙන් හෝ රසයෙන් හෝ වතුර හා සදෘශ වේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අප භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් සමන්නාගත වූසේක. අසූඅනුව්‍යංජනලක්ෂණයෙන් රංජිත වූසේක. ස්වර්ණවර්ණ වූසේක. නෙළුම්පතෙහි දිය නො ඇලෙන්නා සේ රජස් නො ඇලෙන කඤ්චනසන්නිභත්ත ව ඇති වූසේක. බ්‍යාමප්‍රභා ඇති වූසේක. උන්වහන්සේගේ දෙමවුපියන් දෙතිස්මහා

පුරුෂලක්ෂණයෙන් සමන්නාගත වූයේත් නැත. අසූඅනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් රංජිත වූයේත් නැත. ස්වර්ණවර්ණ වූයේත් නැත. කනක වන් මනා ඡවි ඇති වූයේත් නැතැ'' යි කීසේක. එවිට රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ''යි කියා ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, බුදුරජානන් වහන්සේ බ්‍රහ්මචාරී වූසේක් දූ?'' යි කීහ. ''එසේ ය, මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මචාරී වූසේකැ'' යි කීසේක. ''එසේ වී නම් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'බුදුරජතෙම මහාබ්‍රහ්මයාගේ ශිෂ්‍යයෙක් වූසේකැ' යි සිතමි'' යි කීහ. ''මහරජානෙනි, තොපගේ වනාහි ප්‍රධාන වූ මංගල **(79)** හස්තියෙක් ඇති වී දූ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, මාගේ එබඳු ඇතෙක් ඇතැ'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, ඒ හස්තියා යම්කිසි දවසක කුඤ්චනාද කෙරේ දූ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, කුඤ්චනාදය කරන්නේ ය'' යි කීහ. ''එසේ වී නම් 'මහරජානෙනි, තොපගේ ඒ මංගලහස්තියා කොස්លිහිණි-යන්ගේ ශිෂ්‍යයා දූ'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, ඒ මහාබ්‍රහ්මයා සබුද්ධික වී ද? අබුද්ධික දූ'' යි විචාළසේක. ''ස්වාමීනි, බුද්ධි සහිත වූයේ ය'' යි කීහ. ''නුවණ ඇති කාරණයෙන් මහරජානෙනි, ඒ බ්‍රහ්මයා අනන්ත වූ බුද්ධි ඇති අප භාග්‍යවතුන් වහන්සේගේ ශිෂ්‍යයා ය'' යි වදළසේක, එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, උප-සම්පදාව සුන්දර වූ යහපත් දෙයක් දූ'' යි කීහ. ''එසේ ය, මහරජානෙනි, උපසම්පදාව සුන්දර වූ යහපත් දෙයකැ'' යි කීසේක. ''ස්වාමීනි, බුදු රජානන් වහන්සේට උපසම්පදාව ඇද් ද? නොහොත් නැද් දූ?'' යි කීහ. ''මහරජානෙනි, අප භාග්‍යවත් බුදුරජානන් වහන්සේ බොධිවෘක්ෂමූලයෙහි වූ වජ්‍රාසනයෙහි දී සර්වඥතාඥනය ලැබීම හා සමග ම උපසම්පන්න වූසේක. මහරජානෙනි, යම් සේ ශ්‍රාවකයන්ට භාග්‍යවතුන් වහන්සේ ශික්ෂාපද දිවිහිමියෙන් ව්‍යතික්‍රමණය නො කට යුතු ය යි කියා පණවා වදරණසේක් ද, එසේ අප භාග්‍යවතුන් වහන්සේට අනික් කෙනෙකුන් විසින් දෙන ලද්ද වූ උපසම්පදාවෙක් නම් නැතැ'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමෙක් මවුන් නැසුනු කල්හි ප්‍රෙමයෙන් හඬන්නේ ය. යමෙක් බණ අසා සද්ධර්ම ප්‍රෙමයෙන් හඬන්නේ ය. ඒ හඬන්නා වූ දෙදෙනාගෙන් කාගේ කඳුළු ඒ හඬන ලෙඩට බෙහෙත් පිණිස වේ ද? කාගේ කඳුළු බෙහෙත් පිණිස නො වේ දූ?'' යි කීහ. ''මහරජානෙනි, ඒ දෙදෙනාගෙන් එකෙක්හුගේ කඳුළු රාග ද්වේෂ මොහ වශයෙන් මල සහිත වූ උෂ්ණ ඇත්තේ ය.

එකෙක්හුගේ කඳුළු ප්‍රීති සොම්නස් වසයෙන් නිර්මල වූ සීතලගුණය ඇත්තේ ය. මහරජානෙනි, යම් කඳුළක් වනාහි සීතලගුණය ඇත්තේ ද, ඒ කඳුළු හැඩීම වළකන්නට බෙහෙත් පිණිස වන්නේ ය. යම් කඳුළක් උෂ්ණ ඇත්තේ වේ ද, සසර බොහෝ කරණ බවක් මුත් එය බෙහෙත් පිණිස නො වන්නේ ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, රාග සහිත සත්වයාගේන් පහ වූ රාග ඇති සත්වයාගේන් වෙනස් වූ කාරණය කවරේ ද?'' යි කිහ. ''මහරජානෙනි, එකෙක් අජ්ඣෝසිත වූයේ ය. එකෙක් අනජ්ඣෝසිත වූයේ ය'' යි කීසේක. ''ස්වාමීනි, මේ අජ්ඣෝසිතය අනජ්ඣෝසිතය යි කියා වදළ නාමයෝ කවරහු ද?'' යි කීහ. ''මහරජානෙනි, ඒ සරාග වීතරාග දෙදෙනාගෙන් එක්කෙනෙක් ජීවිකාවෘත්තියෙහි ප්‍රයොජන කැමැත්තාහ. එක්කෙනෙක් ජීවිකාවෘත්තියෙහි ප්‍රයොජන නො කැමැත්තාහ'' යි කීසේක. ''ස්වාමීනි, මම මෙබඳු වූ දෙයක් දක්නෙමි. යම් සරාගී පුද්ගලයෙක් ඇද් ද, යම් වීතරාගී පුද්ගලයෙක් **(80)** ඇද් ද, මේ සියලු දෙන ම ඛාදනීය දෙයක් හෝ භෝජනීය දෙයක් හෝ සොභන වූ යහපත් දෙයක් ම සිතින් කැමැති වන්නාහ. දෙදෙනාගෙන් කවරෙක් වත් නපුරු දෙයක් කැමැති නො වන්නේ ය'' යි කිහ. ''මහ රජානෙනි, අවීතරාගීය යි කියන ලද නො පහ වූ රාග ඇති පුද්ගලතෙම තික්තකටුකාදිරසයන්ගේ වෙනස දන්නේ වේ ද, එබඳු රසයන් කෙරෙහි රසතෘෂ්ණාවෙන් ඇලී මධුර වූ භොජනය අනුභව කරන්නේ ය. වීතරාගී වූ පුද්ගලතෙම වනාහි තික්තකටුකාදිරසයන්ගේ වෙනස දන්නේ ද, එබඳු රසයන් කෙරෙහි රසතෘෂ්ණාවෙන් ඇලී භොජනය නො ම අනුභව කරන්නේ ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රඥතොම කවර තැනෙක්හි වාසය කරා ද?'' යි කිහ. ''මහරජානෙනි, කොතැනකත් වසන තැනෙක් නැතැ'' යි කීසේක. 'එසේ වී නම්, ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, ප්‍රඥතොම නැද් ද?'' යි කීහ. ''මහරජානෙනි, වාතය කොතැන්හි වාසය කරන්නේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, වාතය කොතැනකත් වසන්නේ නැතැ'' යි කීහ. ''මහරජානෙනි, එසේ වී නම් වාතය නැද් ද?'' යි විචාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ සංසාරය යි කියා යම් මේ වචනයක් වදළසේක් ද, ඒ සංසාරය නම් කවරේ ද?'' යි කිහ. ''මහරජානෙනි, මේ ලොකයෙහි ඉපද මෙලොව දී නස්නේ ය. මෙලොව දී නසිමින් අනික් තැනක උපදනේ ය. එතැන උපදිමින් එතැන දී ම නස්නේ ය. එතැන්හි නසිමින් අනික්

Non-Commercial Distribution

තැනක උපදනේ ය. ''මහරජානෙනි, සංසාරය නම් මෙසේ වන්නේ ය''යි කීසේක. ''ස්වාමීනි, උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක්තෙම ඉදුනු අඹඵලයක් අනුභව කොට අඹඇටය රොපණය කරන්නේ වී නම්, එයින් මහත් වූ අඹරුකක් ඉපිද ක්‍රමයෙන් වැඩී අඹඵල දෙන්නේ වී නම්, නැවැතත් ඒ පුරුෂයා එයිනුත් පැසුනු අඹයක් අනුභව කොට අඹඇටයක් රොපණය කරන්නේ වී නම්, එයිනුත් මහත් වූ, අඹරුකක් වැඩී ඉපිද අඹඵලයන් දෙන්නේ වී නම්, මෙසේ මෙම ක්‍රමයෙන් මේ අඹවෘක්ෂයන්ගේ නීන්දූ කෙළවරෙක් නො පෙණෙන්නේ ය. 'මහරජානෙනි, එපරිද්දෙන් ම මෙලොව උපදිමින් මෙලොව දී ම නස්නේ ය. මෙලොව දී නසිමින් අනික් තැනක උපදනේ ය. එතැන උපදිමින් එතැන දී ම නස්නේ ය. එතැන දී නසිමින් අනික් තැනක උපදනේ ය. මහරජානෙනි, සංසාරය මෙසේ වන්නේ ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ''යි ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතීත වූ බොහෝ කාලයකින් ඈත කරණ ලද්ද වූ කට යුත්ත කවරකින් සිහි වේ දැ?'' යි කීහ. ''මහරජානෙනි, සිහියෙන් සිහිවන්නේ ය'' යි කීසේක. ''එසේ ද? ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, චිත්තයෙන් සිහි කරන්නේ ය. සිහියෙන් සිහි කරන්නේ නො වෙ'' යි කීහ. ''මහරජානෙනි, තෙපි කිසියම් කට යුත්තක් නො කොට සිහි මුළා වූ දෙයක් විශෙෂයෙන් දනු දැ'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, මට සිහි මුළා වූ **(81)** දේත් ඇතැ'' යි කීහ. ''කිමෙක් ද? මහරජානෙනි, තෙපි ඒ සමයෙහි සිත් නැති ව අචිත්තක වූවහු දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, අචිත්තක නො වූයෙමි. එසමයෙහි සිහිය නො වූයේ ය'' යි කීහ. එකල ''මහරජානෙනි, තෙපි කුමක් පිණිස මෙසේ අතීතකෘත්‍යය චිත්තයෙන් සිහි කරන්නේ ය. සිහියෙන් සිහි නො වන්නේ ය යි කීවහු දැ?'' යි විචාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ''යි ස්තුති කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සියලු ම සිහිතොම මනා වූ නුවණින් දැනීමෙන් උපදනේ ද? නොහොත් අනුන් විසින් සිහි කරවන්නා වූ කටුම්කාසිහියෙන් උපදනේ දැ?'' යි කීහ. ''මහරජානෙනි, මනා වූ නුවණින් දැනීමෙනුත් සිහි උපදනේ ය. කටුම්කා නම් වූත් සිහි උපදනේ ය'' යි කීසේක. ''එසේ වී නම්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ සියලු ම සිහිය මනා ව ම දන්නාහු නො වෙද් ද? කටුම්කා නම් සිහි නැතැ'' යි කීහ. ''මහරජානෙනි, ඉදින් කටුම්කා නම් සිහිය නැත් නම් ශිල්පාචාරීන්ගේ කර්මාන්තයෙහි හෝ ශිල්පායතන යෙහි හෝ විද්‍යායතනයෙහි හෝ ශිෂ්‍යයන්ට සිහි කරවා උගන්වන්නා වූ මදකුත් කළ මනා දෙයක් නම් නැත්තේ ය. ඒ ආචාර්යවරයෝ ද නිරර්ථක වෙති. ''මහරජානෙනි, යම් හෙයකින් වනාහි අනුන් විසින්

සිහි කරවා ලූ කල උපදනා වූ කටුම්කා සිහිතොම ඇත්තේ වී නම්, එහෙයින් ශිල්පාචාරීන්ගේ කර්මායතනයෙහි හෝ ශිල්පායතනයෙහි හෝ විද්‍යාස්ථානයෙහි හෝ කළ මනා කට යුතුත් ඇත්තේ ය. ආචාර්ය වරයන්ගෙන් ශිෂ්‍යයන්ට ප්‍රයොජන ද ඇතැ'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

**සකලජනමනොනන්දනීය වූ මිලින්දප්‍රශ්න නම් වූ**
**මේ ශ්‍රීසද්ධර්මාදසයෙහි සවන වර්ගය නිමියේ ය.**

---

# සත්වන වර්ගය

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කොපමණ ආකාරයකින් සිහි උපදනේ දැ?'' යි කීහ. ''මහරජානෙනි, සොළොස් ආකාරයකින් සිහි උපදනේ ය'' යි කීසේක. ''කවර සොළොස් ආකාරයකින් දැ?'' යි කීහ. ''මහරජානෙනි, මනා ව දැනීමෙනුත් සිහි උපදනේ ය. කටුම්කායෙනුත් සිහි උපදනේ ය. ඔළාරික වූ විඤ්ඤාණ වසයෙනුත් සිහි උපදනේ ය. හිතවිඤ්ඤාණ වසයෙනුත් සිහි උපදනේ ය. අහිතවිඤ්ඤාණ වසයෙනුත් සිහි උපදනේ ය. සභාගනිමිත්ත වශයෙනුත් සිහි උපදනේ ය. විසභාගනිමිත්ත වසයෙනුත් සිහි උපදනේ ය. කථාභිඤ්ඤාණ වසයෙනුත් සිහි උපදනේ ය. ලක්ෂණ වසයෙනුත් සිහි උපදනේ ය. සරණවසයෙනුත් සිහි උපදනේ ය. මුද්‍රාවසයෙනුත් සිහි උපදනේ ය. ගණන් වසයෙනුත් සිහි උපදනේ ය. ධාරණ වසයෙනුත් සිහි උපදනේ ය. භාවනා වසයෙනුත් සිහි උපදනේ ය. පොත්ථකනිබන්ධ වසයෙනුත් සිහි උපදනේ ය. උපනිඃක්ෂෙප වසයෙනුත් සිහි උපදනේ ය. අනුභූත වසයෙනුත් සිහි උපදනේ ය'' යි කීසේක.

''කෙසේ නම් මනා ව දැනීමෙන් සිහි උපදනේ දැ?'' යි කීහ. මහරජානෙනි, ආයුෂ්මත් වූ **ආනන්ද** ස්ථවිරයන් වහන්සේ ද **ඛුජ්ජුත්තරා** නම් උපාසිකාවෝ ද වෙනත් යම් කිසි අනික් කෙනෙක් ජාතිස්මරණනුවණ ඇත්තාහු අතීත ජාතිය **(82)** සිහි කරන්නාහ. මෙසේ අභිජානන වසයෙන් සිහි උපදනේ ය. කටුම්කා නම් සිහිය කෙසේ නම් උපදනේ දැ?'' යි යත හොත්:— යමෙක්තෙම ප්‍රකෘතියෙන් ම සිහි මුළාකාරී වී නම්, ඔහට සිහි කරවනු පිණිස සෙසු අන්‍යජනයෝ ''එම්බල තට මෙබඳු දෙයක් සිහි ඇද් ද? නැද් දැ? යි සිහි කරව'' යි කියා නිබන්ධනය කෙරෙති. මෙසේ කටුම්කා සිහි උපදනේ ය. කෙසේ නම් ඔළාරිකවිඤ්ඤාණ වසයෙන් සිහි උපදනේ දැ?'' යි යත හොත්:— යම් දවසෙක රාජ්‍යසම්පත්තියෙහි හෝ අභිෂෙකයට පැමිණියේ වේ ද, සෝවාන් ඵලයට හෝ පැමිණියේ වේ ද, මෙසේ ඔළාරිකවිඤ්ඤාණ වසයෙන් සිහි උපදනේ ය. කෙසේ නම් හිතවිඤ්ඤාණ වසයෙන් සිහි උපදනේ ද? යත හොත්:— යම් තැනක දී සුඛිත වන ලද්දේ වී නම්, 'මෙනම් ස්ථානයෙහි දී මෙසේ සුඛිත වන ලද්දෙම්'යි

Non-Commercial Distribution

කියා සිහි උපදනේ ය. මෙසේ හිතවිඤ්ඤාණ වසයෙන් සිහි උපදනේ ය. අහිතවිඤ්ඤාණ වසයෙන් සිහි උපදෙන් කෙසේ ද? යි යත හොත්:— යම් තැනක දී දුඃඛිත වන ලද්දේ වී නම්, 'මෙනම් ස්ථානයේ දී මෙසේ දුඃඛිත වන ලද්දෙමි' යි කියා සිහි කරන්නේ ය. මෙසේ අහිතවිඤ්ඤාණ වසයෙන් සිහි උපදනේ ය. සභාගනිමිත්ත වසයෙන් සිහි උපදනේ කෙසේ ද? යි යත හොත්:— යම් දිසාවක දී පුද්ගලකෙනෙකුන් දැක තමාගේ මෑනියන් හෝ පියානන් හෝ සහෝදරයකු නැගනියක හෝ සිහි කරන්නේ ය. ඔටුවෙකු හෝ ගොනෙකු හෝ ගද්‍රභයෙකු හෝ දැක රූපවර්ණාදීන් එබඳු වූ වෙනින් ඔටුවෙකු හෝ ගොනෙකු හෝ කොටළුවෙකු හෝ සිහි කරන්නේ ය. මෙසේ සභාගනිමිත්තවසයෙන් සිහි උපදනේ ය. විසභාග නිමිත්ත වසයෙන් සිහි උපදනේ කෙසේ ද? යි යත හොත්:— අසවලාගේ නම් වර්ණය මෙබඳු වූයේ ය. ශබ්දය මෙබඳු වූයේ ය. ගන්ධය මෙබඳු වූයේ ය. රසය මෙබඳු වූයේ ය. ස්පර්ශය මෙබඳු වූයේ ය යි කියා මෙසේ විසභාගනිමිත්ත වසයෙන් සිහි උපදනේ ය. කථාවිඤ්ඤාණ වසයෙන් සිහි උපදනේ කෙසේ ද? යි යත හොත්:— යමෙක්තෙම ප්‍රකෘතියෙන් ම මුළා සිහි ඇත්තේ වේ ද, ඔහට සෙසු ජනයෝ සිහි කරවති. ඒ කාරණයෙන් ඒ පුරුෂතෙම සිහි කරන්නේ ය. මෙසේ කථාභිඤ්ඤාණ වශයෙන් සිහි උපදනේ ය. ලක්ෂණ වසයෙන් සිහි උපදනේ කෙසේ ද? යි යත හොත්:— යමෙක්තෙම ගොනුන්ගේ ලකුණෙන් දැන ගන්නේ ය. මෙසේ ලක්ෂණ වසයෙන් සිහි උපදනේ ය. සරණ වසයෙන් සිහි උපදනේ කෙසේ ද? යි යත හොත්:—යමෙක්තෙම ප්‍රකෘතියෙන්ම මුට්ඨස්සතික වේ ද? ඔහට යමෙක්තෙම 'පින්වත, සිහි කරව' පින්වත, සිහිකරව' යි කිය කියා නැවත නැවතත් සිහි කරවන්නේ ය. මෙසේ පිහිට වසයෙන් සිහි උපදනේ ය. මුද්‍රා වසයෙන් සිහි උපදනේ කෙසේ ද? යි යත හොත්:— ලියමනෙහි ශික්ෂිත වූ බැවින් මේ අක්ෂරයට අනතුරු ව මේ අකුර කට යුතු ය යි කියා දැන ගන්නේ ය. මෙසේ මුද්‍රා වසයෙන් සිහි උපදනේ ය. ගණන් වසයෙන් සිහි උපදනේ කෙසේ ද? යි යත හොත්:—ගණනෙහි ශික්ෂිත බැවින් ගණන් කාරයෝ බොහෝ සේ ගණන් කෙරෙති. මෙසේ ගණන් වසයෙන් සිහි උපදනේ ය. ධාරණ වසයෙන් සිහි උපදනේ කෙසේ ද? යි යත හොත්:—ප්‍රගුණධාරණශක්තියෙහි ශික්ෂිත වූ බැවින් ධාරණබහුශ්‍රැතයෝ **(83)** බොහෝ සෙයින් ධාරණය කෙරෙති. මෙසේ ධාරණ වශයෙන් සිහි උපදනේ ය. භාවනාවසයෙන් සිහි උපදනේ කෙසේ ද? යි යත හොත්:—මේ ශාසනයෙහි භික්ෂුතෙම අනෙකප්‍රකාර වූ පූර්වෙනිවාස-අතීතජාති දක්නා නුවණ ලදින් සිහි කරන්නේ ය. ඒ කවරේ ද? එක ම ජාතියෙක, ජාතිදෙකෙක, ජාති තුණෙක, සතරෙක, පසෙක, දසයෙක, ජාතිසියයෙක, දහසෙක, ලක්ෂයෙක යනාදීන් නොයෙක් ජාති දැක 'අසවල් තැන උපන්නෙමි. එයින් මිය අසවල් තැන උපන්නෙමි' යනාදීන් මෙසේ සුන්දර වූ ආකාර ඇති ගොත්‍රනාමාදි උද්දෙස සහිත වූ පෙර විසූ කඳපිළිවෙළ සිහි කරන්නේ ය. මෙසේ භාවනා වසයෙන් සිහි

*Non-Commercial Distribution*

උපදනේ ය. පොත්ථකනිබන්ධන වසයෙන් සිහි උපදනේ කෙසේ දැ? යි යත හොත්:— ධාර්මික වූ රජදරුවෝ පූර්වරාජ්‍යානුශාසනාව සිහි කෙරෙමින් 'පූර්වලිඛිත රාජ ධාර්මික වූ එක් පොතක් ඇත් නම් ගෙණෙව'යි කියා ගෙන්වා බලා ඒ පොත කරණ කොට ගෙණ සිහි කෙරෙති. මෙසේ පොත්ථකනිබන්ධක වසයෙන් සිහි උපදනේ ය. උපනිඃක්ෂෙපණ වසයෙන් සිහි උපදනේ කෙසේ දැ? යි යත හොත්:— ලඟ තුබූ භාණ්ඩයක් දැක සිහි කරන්නේ ය. මෙසේ උපනිඃක්ෂෙපණ වසයෙන් සිහි උපදනේ ය. අනුභූත වසයෙන් සිහි උපදනේ කෙසේ දැ? යි යත හොත්:— දුටු බැවින් රූපය සිහි කරන්නේ ය. ඇසූ බැවින් ශබ්දය සිහි කරන්නේ ය. ආඝ්‍රාණය කළ බැවින් ගන්ධය සිහි කරන්නේ ය. සායනය කළ බැවින් රසය සිහි කරන්නේ ය. ස්පර්ශය වූ බැවින් ස්පර්ශය සිහි කරන්නේ ය. විඥ්ඥාත බැවින් ධර්මචින්තාව සිහි කරන්නේ ය. මෙසේ අනුභූත වසයෙන් සිහි තොම උපදනේ ය. මහරජානෙනි, මේ යථොක්ත වූ සොළොස් ආකාරයෙන් සිහි උපදනේ ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි කියා ස්තුති කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ 'යමෙක් සියක් අවුරුදු මුලුල්ලෙහි ප්‍රාණඝාතඅකුශලකර්මය කරන්නේ වී නම්, මරණකාලයෙහි බුද්ධගතාසතිය යි කියන ලද එක වරක් බුදුනුසිහි[1] ලැබුයේ වී නම්, ඒ පුරුෂතෙම දිව්‍යලොකයෙහි උපදින්නේ ය' යි කියා මෙසේ කියනසේක. මේ වචනය මම නො අදහමි. 'එක් වරක් කළ ප්‍රාණාතිපාතඅකුශලයෙන් නරකයෙහි උපදනේ ය' යි මෙසේ ද වනාහි කියනසේක. මේ වචනයත් මම නො අදහමි'' යි කීහ. ''මහරජානෙනි, ඉහ් තෙපි කුමක් සිතන්නහු ද? ඉතා කුඩා වූ ගලක් වී නමුත් නැවෙන් මිස උදක මත්තෙහි ඉල්පා යේ දැ?'' යි විචාළසේක. ''නැත; ස්වාමීනි'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, පාසාන-ගල් වලින් වාහ නම් වූ යාළවල් සියයක් නැවට නහන ලද්දේ වී නම්, ජලයෙහි එගොඩට ඉල්පා යේ දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, ඉල්පෙන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, නැව යම් සේ ද, එපරිද්දෙන් ම කුශලකර්මයෝ දත යුත්තාහ'' යි වදාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූ සේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කිමෙක් ද, නුඹවහන්සේ අතීත වූ දුක්ඛයාගේ දුරු කිරීම පිණිස ව්‍යායාම කරණසේක් දැ?'' යි කීහ. ''නැත, මහරජානෙනි,'' යි කීසේක. ''කිමෙක් ද, අනාගත[2] වූ දුක්ඛයාගේ ප්‍රහාණය පිණිස ව්‍යායාම කරණ සේක් දැ?'' යි කීහ. ''නැත **(84)** මහරජානෙනි, 'යි කීසේක. ''කිමෙක් ද, ස්වාමීනි, වර්තමාන වූ දුක්ඛයාගේ ප්‍රහාණය පිණිස ව්‍යායාම කරණසේක් දැ?'' යි කීහ. ''නැත, මහරජානෙනි'' යි කීසේක. ''ඉදින් ස්වාමීනි, නුඹ වහන්සේ අතීත වූ දුඃඛයාගේ ප්‍රහාණය පිණිසත් ව්‍යායාම නො කරණ

1. බුදුන් සිහි 2. වනාහි අනාගත

Non-Commercial Distribution

සේක් නම්, අනාගත වූ දුඃඛයාගේ දුරු කිරීම පිණිසත් ව්‍යායාම නො කරණසේක් නම්, වර්තමාන වූ දුඃඛයාගේ ප්‍රහාණය පිණිසත් ව්‍යායාම නො කරණසේක් නම්, නැවැත කුමක් පිණිස මෙසේ ව්‍යායාම කරණ සේක් දැ?'' යි කීහ. එකල තෙරුන් වහන්සේ ''කිමෙක් ද, මහරජානෙනි, මේ දුක් නිරුද්ධ වේ ද? අනික් දුකක් නො උපදී ද? මේ අර්ථය පිණිස අපි ව්‍යායාම කරම්හ'' යි කීසේක. ''ස්වාමීනි, .නාගසෙනයන් වහන්ස, අනාගත වූ දුඃඛයක් ඇද්දැ?'' යි කීහ. ''නැත, මහරජානෙනි'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ ඉතා විශෙෂ වූ පණ්ඩිතත්වයෙන් යුක්ත වූසේක. යම්බඳු වූ නුඹ වහන්සේ නැත්තා වූ දුඃඛයන්ගේ ප්‍රහාණය පිණිස ව්‍යායාම කරණ සේක් දැ?'' යි කීහ. ''මහරජානෙනි, තොපට සතුරු වූ පසමිතුරු වූ-කිසි ප්‍රතිවිරුද්ධරජ්ජුරු කෙනෙක් ඇද් ද, ඒ රජ්ජුරුවෝ තොප හා යුද්ධයට සැරහී පටන් ගත්තාහු වෙද් දැ'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, එසේ යුද්ධයට එන රජ දරුවෝ ඇතැ'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, එකල්හි තෙපි නුවර වටා දිය අගළ මඩ අගළ කොටවා පියන්නහු ද? ප්‍රාකාරය බන්දවා පියන්-නහු ද? වාසලදෙරටුව කරවා පියන්නහු ද? මුරපැල් අටල්ල කරවා පියන්නහු ද? ධාන්‍යජාතීන් ගෙන්වා රැස් කරවා පියන්නහු දැ?'' යි විචාළ සේක. ''නැත, ස්වාමීනි, ඊට පළමුවෙන් ම ඒ දිය අගළ ආදිය පිළියෙළ කරණ ලද්දේ වන්නේ ය'' යි කීහ.

''කිමෙක් ද, මහරජානෙනි, තෙපි එදවස්හි ම ඇතුන් නැඟීමෙහි ශික්ෂණය වන්නහු ද? අසුන් නැඟීමෙහි හික්මෙන්නහු ද? රථ නැඟීමෙහි හික්මෙන්නහු ද? ධනුශ්ශිල්පයෙහි හික්මෙන්නහු ද? කඩුමිටි සරමෙහි හික්මෙන්නහු දැ? ''යි විචාළසේක. ''නැත, ස්වාමීනි, ඊට පළමුවෙන් ම ඒ ඇතුන් නැඟීම් ආදිය ශික්ෂිත වන ලද්දේ වන්නේ ය'' යි කීහ. ''මහ රජානෙනි, කුමක් පිණිස දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, අනාගත වූ භය දුරු කරණු පිණිස ය'' යි කීහ. ''කිමෙක් ද? මහරජානෙනි, අනාගත වූ භය ය යි කියා භයෙක් ඇද් දැ?'' යි විචාළසේක. ''නැත; ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, තෙපි වනාහි ඉතා විශෙෂ වූ පණ්ඩිතත්වයෙන් යුක්ත වූවහු ය. යම්බඳු වූ තෙපි අනාගත වූ භයයන්ගේ ප්‍රතිබාහනය පිණිස යුද්ධයට වුවමනා දෙය සම්පාදනය කරන්නෝ වවු දැ?'' යි කීසේක.

''ස්වාමීනි, උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, හේ තෙපි කුමක් නම් සිතන්නහු ද? යම් දවසෙක තෙපි පිපාසිත වන්නහු වී නාම, එදවස් තෙපි 'පැන් පානය කෙරෙමි' යි කියා ලිඳක් සාරවා පියන්-නහු ද? පොකුණක් සාරවන්නහු ද? විලක් සාරවන්නහු දැ?'' යි විචාළ සේක. ''නැත, ස්වාමීනි, පළමු කොට ම ඒ ලින්පොකුණු ආදිය පිළියෙල කරණු ලබන්නේ වෙයි'' කීහ. ''කුමක් පිණිස දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, අනාගත වූ පිපාසාවන්ගේ ප්‍රතිබාහනය පිණිස පිළියෙල කරණ ලද්දේ වෙ'' යි කීහ. ''මහරජානෙනි, අනාගත වූ පැන් පිපාසාවෙක් ඇද් දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි,

Non-Commercial Distribution

තෙපි වනාහි ඉතා විශේෂ වූ පණ්ඩිතත්වයෙන් (85) යුක්ත වූවහු ය.'' යම්බඳු වූ තෙපි අනාගත වූ පැන් පිපාසායයාගේ ප්‍රතිබාහනය පිණිස ඒ කූපාදිය සම්පාදනය කරන්නාහු වේ ද?'' යි කීසේක.

''ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, ඒ තෙපි කුමක් නම් සිතන්නහු ද? යම් දවසෙක තෙපි ක්ෂුධාවෙන් පිඩිත වූවහු නම්වූ, එකල්හි තෙපි බත් අනුභව කෙරෙම් යි සිතා කෙතක් සාවන්නහු ද? ඇල් වපුරන්නහු ද?'' යි විචාළසේක. ''නැත; ස්වාමීනි, පළමු කොට ම ඒ සීසෑම් ආදිය සම්පාදනය කරණ ලද්දේ ය'' යි කීහ. ''කුමක් පිණිස ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, අනාගත වූ ක්ෂුධාවන්ගේ දුරු කිරීම පිණිස ය'' යි කීහ. ''මහරජානෙනි, අනාගත වූ ක්ෂුධාගින්නෙක් ඇද් ද?'' යි විචාළසේක. ''නැත; ස්වාමීනි'' යි කීහ. ''එසේ වී නම්, මහරජානෙනි, තෙපි වනාහි ඉතා විශෙෂ වූ පණ්ඩිතත්වයෙන් යුක්ත වූවහු ය. යම්බඳු වූ තෙපි අවිද්‍යමාන වූ අනාගතක්ෂුධාවන්ගේ ප්‍රතිබාහනය පිණිස ක්ෂෙත්‍ර කසනාදීන් සම්පාදනය කරන්නහු ද?'' යි විචාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ස්තුති කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ මනුෂ්‍ය ලොකයෙහි පටන් මුදුන් කෙළවර බ්‍රහ්මලොකය කොපමණ දුර ද?'' යි කීහ. ''මහරජානෙනි, මේ මනුෂ්‍යලොකයට බ්‍රහ්මලොකය ඉතා දුර ය. උඩුමහල්ගැබගෙයක් පමණ ගලක් ඒ බඹලොවින් පාත හෙළන ලද්දේ වී නම්, එක ම රැයකුත් දහවලින් සතළිස්අටදහක් යොදුන් පාත බසිමින්, සාරමසකින් පොළෝතලයෙහි පිහිටන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ 'යම් සේ බලවත් වූ පුරුෂයෙක් වක් කළ අතක් දික් කෙරේ ද? දික් කළ අතක් වක් කෙරේ ද? එපරිද්දෙන් ම මනොවශීප්‍රාප්ත වූ ඍද්ධිමත් භික්ෂූන් වහන්සේ මේ දඹදිව දී අන්තර්ධාන වෙමින් බ්‍රහ්මලොකයෙහි පහළ වන්නෝ ය' යි කියා මෙසේ කියනසේක් නො වේ ද? මේ වචනය මම නො අදහමි. මෙසේ අතිශීඝ්‍ර ව ඒ තාක් බොහෝ යොදුන් සියදහස්ගණනක් කෙසේ යේ ද?'' යි කීහ. එකල තෙරුන් වහන්සේ ''මහරජානෙනි, තොපගේ වනාහි ජාතභූමිය කොතැන්හි ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, **අලසන්ද** නම් දීපයෙක් ඇත. ඒ **අලසන්දයෙහි** මම උපන්නෙමි'' යි කීහ. ''මහරජානෙනි, මෙයින් **අලසන්දව** කොපමණ දුර වේ ද?'' යි කීසේක. ''ස්වාමීනි, දෙසියයක් යොදුන් පමණ දුර ඇතැ'' යි කීහ. ''මහරජානෙනි, තෙපි ඒ අලසන්දයෙහි දී කිසියම් කට යුත්තක් කොට දූන් සිහි කරණ ලද්දෝ වූ නම්, මනා කොට ම දනු ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, සිහි කරන්නෙමි'' යි කීහ. ''මහරජානෙනි, තෙපි දූන් ඉතා කඩිනමින් දෙසියයක් පමණ යොදුන් ගියාහු ද?'' යි විචාළසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූ සේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමෙක් තෙම මේ **සාගලපුරයෙහි** දී කාලක්‍රියා කොට බ්‍රහ්මලොකයෙහි උපදින්නෝ ය. යමෙක්තෙම මෙහි දී කාලක්‍රියා කෙරෙමින් **කාශ්මීරදෙශයෙහි** උපදින්නෝ ය. ඒ දෙදෙනාගෙන් කවරෙක් බොහෝ කලකින් උපදී ද? කවරෙක් ශීඝ්‍රතර ව උපදී ද?'' යි කීහ. ''මහරජානෙනි, එක සමව ම උපදනාහු ය'' යි කීසේක. උපමාවක් **(86)** කර වදළ මැනැවැ'' යි කීහ. මහරජානෙනි, ''තොපගේ වනාහි උපන් නුවර කොතැන්හි දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, **කලසි** නම් ග්‍රාමයෙක් ඇත. එහි මම උපන්නෙමි''යි කීහ. ''මහරජානෙනි, ඒ **කලසි** ගම මෙයින් කොපමණ දුර වේ දැ?''යි විචාළසේක. ''ස්වාමීනි, දෙසියයක් පමණ යොදුන් වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, මෙයින් **කාශ්මීරදෙශය** කොපමණ දුර දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, දෙළොස් යොදුනෙකැ'' යි කීහ. ''මහරජානෙනි, තෙපි අතිකඩිනමින් ඒ **කලසි** ග්‍රාමය සිතව'' යි කීසේක. ''ස්වාමීනි, සිතන ලද්දේ ය'' යි කීහ. ''මහරජානෙනි, තෙපි වහා ම **කාශ්මීරය** සිතව'' යි කීසේක. ''ස්වාමීනි, සිතන ලද්දේ ය'' යි කීහ. ''මහරජානෙනි, කවරෙක් වනාහි බොහෝ කලකින් සිතන ලද ද? කවරෙක් ශීඝ්‍රතර ව සිතන ලද දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, එකසම ව ම සිතමි''යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යමෙක් මෙහි කාලක්‍රියා කෙරෙමින් බ්‍රහ්මලොකයෙහි උපදින්නේ වේ ද, යමෙක් මෙහි කාලක්‍රියා කෙරෙමින් කාශ්මීරයෙහි උපදින්නේ වේ ද, ඒ දෙදෙන ම එකසම ව උපදින්නාහු ය''යි කීසේක.

''ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, කුමක් සිතන්නාහු ද? පක්ෂීහු දෙදෙනෙක් ආකාශයෙන් යන්නාහු වූ නම්, ඒ දෙදෙනා අතුරෙන් එක් පක්ෂියෙක් බොහෝ උස් රුකෙක ඇවිත් හිඳිනේ ය. එකෙක් මිටි රුකෙක ඇවිත් හිඳිනේ ය. එකවර ම වසා සිටියා වූ ඔවුන්ගෙන් කාගේ ඡායාව පළමු කොට පෘථිවියෙහි පිහිටන්නේ වේ ද? කවරක්හුගේ ඡායාව බොහෝ වේලාවකින් පෘථිවියෙහි පිහිටන්නේ වේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, එක සමාන මැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යමෙක් මෙහි කාලක්‍රියා කෙරෙමින් බ්‍රහ්මලොකයෙහි උපදින්නේ වේ ද, යමෙක් මෙහි කාලක්‍රියා කෙරෙමින් කාශ්මීරයෙහි උපදින්නේ වේ ද, ඒ දෙදෙන ම එක සමාන ව ම උපදින්නාහු'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සර්වඥ බොධියට අංග වූ බොධ්‍යංගයෝ කොපමණ දැ?'' යි කීහ. ''මහරජානෙනි, බුදු වන මහොත්තමයන්ට අංග වූ බොධ්‍යංගයෝ සද්දෙනෙකැ''යි කීසේක. ''ස්වාමීනි, කොපමණ බොධ්‍යංගධර්ම කෙනෙකුන් කරණ කොට ගෙණ බුදු වන්නේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, එක ම බොධ්‍යංගයකින් බුදු වන්නේ ය. කවර බොධ්‍යංගයකින් ද? යත්:—

"ධර්මවිචයබොධ්‍යංගය යි කියන ලද ප්‍රඥාබොධ්‍යංගයෙන් බුදු වන්නේ ය"යි කීසේක. "එසේ වී නම් ස්වාමීනි, කුමක් පිණිස සප්තබොධ්‍යංග ධර්ම කෙනෙකැ යි කියනු ලබන්නාහු ද?" යි විචාළෝ ය. "මහරජානෙනි, ඒ කුමක් සිතන්නහු ද? ඛඩ්ගය කොපුවෙහි බහාලමින් අල්වා ගෙණ කැපිය යුතු දෙයක් හස්තයෙන් කපා පියන්නට හැකි වේ ද?" යි විචාළසේක. "ස්වාමීනි, එසේ නො හැක්කැ" යි කීහ. "මහරජානෙනි, එපරිද්දෙන් ම ප්‍රඥාවිචයබොධ්‍යංගය හැර ඉතිරි ෂඩ්බොධ්‍යංගයෙන් බුදු විය නො හැක්කේ ය" යි කීසේක. එකල රජ්ජුරුවෝ "ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, දක්ෂ වූසේකැ" යි ස්තුති කළහ.

**(87)** නැවතත් රජ්ජුරුවෝ "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ලෝකවාසී සත්වතෙම කුශලයක් හෝ අකුශලයක් හෝ කළ කල කවරක් බොහෝ වේ ද?" යි කීහ. "මහරජානෙනි, කුසල් බොහෝ වන්නේ ය. අකුසල් ඉතා මඳ වන්නේ ය" යි කීසේක. "කවර කාරණයකින් ද?"යි කීහ. "මහරජානෙනි, අකුසල් කෙරෙමින් 'මා විසින් පාපකර්මය කරණ ලදැ' යි කියා විපිළිසර වන්නේ ය. ඒ කාරණයෙන් අකුසල් නො වඩින්නේ ය. මහරජානෙනි, පිණක් කෙරෙමින් සන්තොස මුත් විපිළිසර නො වන්නේ ය. විපිළිසර නො වන්නාහට සන්තොස උපදින්නේ ය. ප්‍රමුදිත වූවහුට ප්‍රීති උපදනේ ය. ප්‍රීතිසිත් ඇත්තාහට ශරීරය සන්හිඳෙන්නේ ය. සන්හිඳුනා වූ ශරීර ඇත්තේ සැප විඳින්නේ ය. සුඛිත වූවහුගේ සිත එකඟ වන්නේ ය. සිත එකඟ ව සන්හිඳුනා වූ පුරුෂතෙම තත් වූ පරිද්දෙන් කුසලානිසංසය ඇතැ' යි කියා දැන ගන්නේ ය. ඒ කාරණයෙන් කුසල් වඩින්නේ ය. 'මහරජානෙනි, සිඳුනා වූ හස්තපාදයන් ඇති එක්තරා පුරුෂයෙක් අතීතයෙහි බුදුකෙනෙකුන් වහන්සේට එක් මහනෙල් මල් අහුරක් පුද ඒකානුකල්පයක් මුළුල්ලෙහි අපා දුකකට නො පැමිණියේ ය. මහරජානෙනි, මෙම කාරණයෙනුත් කුසල් බොහෝ ය යි අකුසල් ඉතා මඳ ය" යි කීසේක. එකල රජ්ජුරුවෝ "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස දක්ෂ වූසේකැ" යි ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමෙක් තෙම දැන දැන පව්කම් කරන්නේ ය. යමෙක්තෙම නො දැන පාපකර්ම කරන්නේ ය. අකුසල් බොහෝ කවරක්හට ද?" යි කීහ. එකල තෙරුන්වහන්සේ "මහරජානෙනි, යමෙක් තෙම නො දැන අකුසල් කරන්නේ වී නම්, ඕහට අකුසල් බොහෝ ය" යි කීසේක. "එසේ ද? ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අපගේ රාජකුමාරයෙක් හෝ රාජ මහාමාත්‍යයෙක් හෝ දැන පව්ටුකර්මයක් කෙළේ වී නම්, ඕහට අපි ද්විගුණයක් දඬුවම් පණවම්හ" යි කීහ. "මහරජානෙනි, ගේ තෙපි කුමක් නම් සිතන්නහු ද? ගිනි ගෙණ දිලියෙන්නා වූ හාත්පසින් ගිනි ගෙණ දිලියෙන්නා වූ ගිනි ම කඳක් සෙයින් සජොතිභූත වූ එහෙයින් ම රත් වූ යකඩගුළියක් එකෙක් නො දැන අල්වන්නේ වී නම්, එකෙක් දැන දැන



*Non-Commercial Distribution*

අල්වන්නේ වී නම්, ඒ දෙදෙනාගෙන් කවරෙකු බලවත් කොට දවන්නේ වේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, යමෙක්තෙම නො දැන අල්වා ගන්නේ වී නම්, බලවත් කොට ඔහු දවන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන්ම යමෙක් නො දැන අකුසලකර්මයෙක් කරන්නේ වී නම්, ඕහට අකුසල් බොහෝ ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ මානුසික වූ ශරීරදෙහයෙන් **උතුරුකුරුදිවයිනට** හෝ යන්නේ වේ ද, බ්‍රහ්මලොකයට හෝ යන්නේ වේ ද, දෙව්ලොවට හෝ යන්නේ වේ ද, අනික් දීපයකට හෝ යන්නේ වේ ද, එබඳු වූ කිසිවෙක් ඇද් ද?'' යි කීහ. ''මහරජානෙනි, යමෙක් මේ සතරමහාභූතික වූ ශරීරයෙන් උතුරු කුරුදිවයිනට යන්නේ වේ ද? බ්‍රහ්මලොකයට යන්නේ වේ ද? දෙව්ලොවට යන්නේ වේ ද? අනික් දිවයිනකට යන්නේ වේ ද? එබඳු කෙනෙක් ඇතැ''යි කීසේක. ස්වාමීනි, නාගසෙනයන් **(88)** වහන්ස, මේ සතර මහාභූතික වූ ශරීරයෙන් උතුරුකුරුදිවයිනට හෝ බඹලොවට හෝ දෙව්ලොවට හෝ අනික් දිවයිනකට හෝ කෙසේ නම් යන්නේ වේ ද?'' යි කීහ. ''මහරජානෙනි, තෙපි මේ පෘථිවියෙහි පටන් වියතක් හෝ රියනක් හෝ අහසට ලංඝනය කොට ගියබවක් මනා ව දනු දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, දනිමි. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මම වනාහි අටරියනක් උස අහසට සැප සේ පනින්නෙමි'' යි කීහ. ''මහරජානෙනි, තෙපි අට රියනක් තැන් කෙසේ පනින්නහු දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, මම වනාහි 'මෙතැන්හි දී උඩ පනිමි' යි කියා සිත් උපදවන්නෙමි. චිත්තුප්පාදය හා සමග ම මාගේ ශරීරය සැහැල්ලු ව අහසට යන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම චිත්තයාගේ වශීප්‍රාප්ත වූ ඍද්ධිමත් භික්ෂූන්වහන්සේ කය සිතට නගා ගෙණ අදුව්‍ය වූ සිත වශයෙන් ම ආකාශයට යන්නාහ'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූ සේකැ'' යි ස්තුති කළහ.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සියක් යොදුන් දිග ඇති අස්ථි ඇතැ යි කියා නුඹ වහන්සේ මෙසේ කියනසේක. එපමණ සියක්යොදුන් වූ වෘක්ෂයකුත් නැති කල සියක් යොදුන් දිග වූ අස්ථිහු කොයින් ඇති වෙද් දැ?'' යි කීහ. ''මහරජානෙනි, හේ නුඹ කුමක් නම් සිතන්නෙහි ද? මහාසමුද්‍රයෙහි පන්සියයක්යොදුන් දිග ඇති මත්ස්‍යජාතීහු ඇතැ යි කියා නුඹ විසින් අසන ලද්දේ දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, අසන ලද්දේ ය'' යි කීහ. ''මහරජානෙනි, පන් සියයක් යොදුන් දිග ඇත්තා වූ **ආනන්ද** නම් මත්ස්‍යයාගේ අස්ථිහු සියක් යොදුන් දිග වන්නාහු නො වෙද් දැ?'' යි කීසේක. එවිට රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

*Non-Commercial Distribution*

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ආශ්වාස ප්‍රශ්වාසයන් නිරුද්ධ කරන්නට හැකි වන්නේ ය' යි කියා නුඹ වහන්සේ මෙසේ කියනසේක් නො වෙද් දූ?'' යි කීහ. ''එසේ ය, මහරජානෙනි, ආශ්වාසප්‍රශ්වාසයන් නිරුද්ධ කරන්නට හැකි වන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ආශ්වාසප්‍රශ්වාස නම් නාසාවාතය. නිරුද්ධ කරන්නට කෙසේ නම් හැකි වේ දූ?'' යි කීහ. ''මහරජානෙනි, ඒ කුමක් සිතන්නාහු ද? තොප විසින් කිසිවෙක් කාකස්වර සෙයින් ගොරවමින් නිද්‍රා කරණ බවක් අසන ලද්දේ දූ? යි කීසේක. ''එසේ ය, ස්වාමීනි, අසන ලද්දේ ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, ඒ කාකච්ඡශබ්දය ශරීරය නැමූ[1] කල්හි තොර[2] වන්නේ දූ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, කය නැමූ[1] කල්හි ම තොර[2] වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි ඒ කාකච්ඡශබ්දය නම් ප්‍රථමධ්‍යානකායවිවෙකාදි ගුණධර්මයට නො පැමිණි බැවින් අභාවිතකාය ඇත්තා වූ විශුද්ධප්‍රාතිමොක්ෂ ශීල මාර්ගශීලාදිගුණධර්මයට නො පැමිණි බැවින් අභාවිත සිල් ඇත්තා වූ ධ්‍යානවිමොක්ෂචිත්තෛකාග්‍රතාදි ගුණධර්මයකට නො පැමිණි බැවින් අභාවිතචිත්තයන් ඇත්තා වූ සමථවිදර්ශනාදි මාර්ගඥනයාගේ වැඩීමක් නැති බැවින් අභාවිතප්‍රඥවෙන් යුක්ත වූ පෘථග්ජනසත්වයාගේ ශරීරය නැමූ[1] කල්හි තොර වන්නේ ය.[2] කිමෙක් ද? ප්‍රථමධ්‍යාන කායවිවෙකාදි ගුණධර්මයට පැමිණීමෙන් යුක්ත හෙයින් භාවිත **(89)** කාය ඇත්තා වූ විශුද්ධිප්‍රාතිමොක්ෂශීලමාර්ගශීලාදිගුණධර්මයන්ගේ වැඩීමෙන් යුක්ත හෙයින් භාවිතශීලයෙන් යුක්ත වූ එකාන්ත සුන්දර වූ ධ්‍යානවිමොක්ෂාදි ගුණධර්මයන්ගේ වැඩීමෙන් යුක්ත හෙයින් භාවිතචිත්තයෙන් යුක්ත වූ සමථවිදර්ශනාදි ගුණධර්මයන්ගේ වැඩීමෙන් යුක්ත හෙයින් භාවිත පටිභානයෙන් යුක්ත වූ උපෙක්ෂාස්මෘතිපාරිශුද්ධි ඇති චතුර්ථධ්‍යානයට සමවැදුනාහුගේ ආශ්වාසප්‍රශ්වාසයෝ නිරුද්ධ වන්නාහු ය?'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ''යි ස්තුති කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සමුද්‍රය සමුද්‍රය යි කියති. කවර කාරණයකින් ජලය සමුද්‍රය යි කියනු ලැබේ ද?''යි කීහ. එකල තෙරුන් වහන්සේ මහරජානෙනි, ඒ සමුද්‍රයෙහි යම් පමණ ලුණු වී ද, එපමණ උදකය වන්නේ ය. එහෙයින් සමුද්‍රය යි කියනු ලබන්නේ ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කවර කාරණයකින් මහාසමුද්‍රයතෙම එක ම රස වූ ලවණරස වී දූ?'' යි කීහ. ''මහරජානෙනි, උදකයාගේ මිහිරිගුණය වඩබාග්නියෙන් දවා කැකැරවී බොහෝ කාලයක් සිටි බැවින් වනාහි මහාසමුද්‍රයතෙම එක ම රස -වූ

---

1. නො මළ    2. ගොර

Non-Commercial Distribution

ලවණරස වී ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි කියා ස්තුති කළහ.

නැවැතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සියලු ම සියුම් දෙය සිඳින්නට හැකි වේ දැ?'' යි කීහ. එසේ ය, මහරජාණෙනි, සියලු ම සියුම් දෙය සිඳින්නට හැකි වන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, සියලු ම සියුම් දෙය නම් කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජාණෙනි, අරූපී වූ චිත්තචෛතසිකධර්මය වනාහි සියල්ලට වඩා අතිසුඹුම වන්නේ ය. මහරජාණෙනි, සියලු ම රූපාරූපධර්මයෝ සියුම් නො වෙති. මහරජාණෙනි, සුඹුම ය යි කියා හෝ දළ ය යි කියා හෝ රූපාරූපධර්මයන්ට මේ පරියායවචනයෙක. ඡේදනය කට යුතු වූ යම්කිසි ධර්මකෙනෙක් ඇත් නම්, ඒ සියලු ම ධර්මයන් ලෞකිකලොකොත්තර වූ ප්‍රඥාවෙන් සිඳ—ඡේදනය කොට හරින්නේ ය. ප්‍රඥාවෙන් සිඳීමට වඩා දෙවෙනි කාරණයෙක් නැතැ'' යි කීසේක. එකල රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේකැ'' යි ප්‍රශංසා කළහ.

නැවැතත් රජ්ජුරුවෝ පණ්ඩිතජනහෘදයානන්දකර වූ ධීර ගොචර අභිධර්මප්‍රශ්නයක් විචාරණුවෝ:—

**''භන්තෙ, නාගසෙන, විඤ්ඤාණන්ති වා පඤ්ඤාති වා භූතස්මිං ජීවො'ති වා ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච? උදාහු එකත්ථා ව්‍යඤ්ජනමෙව නානන්ති? විජානනලක්ඛණං මහාරාජ? විඤ්ඤාණං, පජානන[1]ලක්ඛණා පඤ්ඤා, භූතස්මිං ජීවො න උපලබ්භතී ති, යදි ජීවො න උපලබ්භති, අථ කො[2] චරහි චක්ඛුනා රූපං පස්සති? සොතෙන සද්දං සුණාති? ඝාණෙන ගන්ධං ඝායති? ජිව්හාය රසං සායති? කායෙන ඵොට්ඨබ්බං(90) ඵුසති? මනසා ධම්මං විජානාතී ති. ථෙරො ආහ. යදි ජීවො චක්ඛුනා රූපං පස්සති-පෙ-මනසා ධම්මං විජානාති, සො ජීවො චක්ඛුවාරෙ උප්පාටිතෙ මහන්තෙන ආකාසෙන බහිමුඛො[3] සුට්ඨුතරං රූපං පස්සෙය්‍ය, සොතෙ උප්පාටිතෙ-ඝාණෙ උප්පාටිතෙ-ජිව්හාය උප්පාටිතාය-කායෙ උප්පාටිතෙ මහන්තෙන ආකාසෙන සුට්ඨුතරං සද්දං සුණෙය්‍ය, ගන්ධං ඝායෙය්‍ය, රසං සායෙය්‍ය, ඵොට්ඨබ්බං ඵුසෙය්‍යා'ති න හි භන්තෙ? තෙන හි මහාරාජ, භූතස්මිං ජීවො න උපලබ්භතී'ති. කල්ලොසි භන්තෙ නාගසෙනා'ති.**

**ථෙරො ආහ–දුක්කරං මහාරජ, භගවතා කතන්ති, කිම්පන භන්තෙ නාගසෙන භගවතා දුක්කරං කතන්ති–දුක්කරං මහාරාජ, භගවතා කතං ඉමෙසං අරූපීනං චිත්ත චෙතසිකානං එකාරම්මණෙ වත්තමානානං වවත්ථානං අක්ඛාතං අයං ඵස්සො, අයං වෙදනා, අයං සඤ්ඤා, අයං චෙතනා, ඉදං චිත්තන්ති. ඕපම්මං කරොහීති. යථා මහාරාජ, කොචිදෙව**

1. පජානන 2. චො 3. බහිමුඛෙ

Non-Commercial Distribution

**පුරිසො නාවාය මහාසමුද්දං අජ්ඣොගාහෙත්වා හත්ථපුටෙන උදකං ගහෙත්වා ජිව්හාය සායිත්වා ජානෙය්‍ය නු ඛො මහාරාජ, සො පුරිසො 'ඉදං ගඞ්ගාය උදකං' 'ඉදං යමුනාය උදකං' 'ඉදං අචිරවතියා උදකං' 'ඉදං සරභුයා උදකං' ඉදං මහියා උදකන්ති, දුක්කරං භන්තෙ ජානිතුන්ති. තතො දුක්කරතරං ඛො මහාරාජ භගවතා කතං. ඉමෙසං අරූපීනං චිත්තචෙතසිකානං ධම්මානං එකාරම්මණෙ වත්තමානානං ව්‍යවත්ථානං අක්ඛාතං– අයං ඵස්සො, අයං වෙදනා, අයං සඤ්ඤා, අයං චෙතනා, ඉදං චිත්තන්ති. සුට්ඨු භන්තෙ'ති. රාජා අබ්භානුමොදී'.**

යනුවෙන් ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, විඥ්ඥාණ ය යි කියා හෝ ප්‍රඥව ය යි කියා හෝ සතරමහාභූතයන් වසයෙන් උපන්නා වූ රූපයෙහි ජීවිත ය යි කියා හෝ දක්වන මේ ධර්මයෝ නානාර්ථ ඇත්තාහු ම ද? නානාර්ථ වැලඳ ගන්නාහු ම ද? නොහොත් එක ම අර්ථයක් වූවාහු ද? අර්ථ වැලඳ ගැණීම පමණක් ම නානා අර්ථ වී දූ?'' යි කීහ. ''මහරජානෙනි, විඥ්ඥාණය රන්මසු දූක හැඳින ප්‍රයොජනය දන්නා ග්‍රාමික පුරුෂයකු මෙන් අරමුණු දූන ගැන්ම ලක්ෂණ කොට ඇත්තේ ය. රන්මසු දූක හැඳින ප්‍රයොජන හා හොඳ නො හොඳ අගය දන්නා ස්වර්ණකාරයෙකු මෙන් ප්‍රඥව විශෙෂයෙන් ම අරමුණු දූන ගැන්ම ලක්ෂණ කොට ඇත්තේ ය. සතරමහාභූත වූ රූපයෙහි ඇතුළ හිඳ කවන පොවන ගමන් කරවන 'ජීව' නම් ආත්මකෙනෙකුන් නො ලබන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, ඉදින් 'ජීව' නම් වූ ආත්මකෙනෙක් නො ලැබෙත් නම්, නැවත අන් කවරෙක් ඇසින් නීලපීතාදී රූපයන් දකී ද? සොතයෙන් ශබ්දයන් අසා ද? නාසයෙන් සුවඳ ආඝ්‍රාණය කෙරේ ද? දිවින් රසය සායනය කෙරේ ද? ශරීරයෙන් සට්ටනය-ස්පර්ශය කෙරේ ද? සිතින් ධර්මචින්තාව දූන ගණී ද?''යි කීහ. එකල තෙරුන් වහන්සේ කියනසේක්, ''මහරජානෙනි, ඉදින් තොප කියන ආත්මජීවයතෙම චක්ෂුරාදීන් රූපාදිය හා සිතින් චින්තයන් (91) දූන ගන්නේ වී නම්, ඒ ජීව නම් ආත්මයතෙම චක්ෂු ද්වාරය උපුටා හැරිය කල්හි මහත් වූ ඒ අවකාශයෙන් පිටතට කරණ ලද මුහුණ ඇත්තේ සැප සේ ම නීලපීතාදිරූපයන් දක්නේ ද? සොතය උපුටා හැරිය කල්හි, ඝ්‍රාණය, උපුටා හැරිය කල්හි, ජිව්හාව උපුටා හැරිය කල්හි, ශරීරය උපුටා හැරිය කල්හි මහත් වූ ඒ අවකාශ ස්ථානයෙන් සැප සේ ම ශබ්දයන් අසන්නේ ද? ගන්ධය ආඝ්‍රාණය කරන්නේ ද? රසය සායනය කරන්නේ ද? ස්ප්‍රෂ්ටව්‍යය ස්පර්ශය කරන්නේ වේ දූ'' යි විචාළසේක. ''නැත; ස්වාමීනි, ඒ කෙසේ දූ?'' යි කීහ. ''මහරජානෙනි, ඒ කාරණ-යෙන් සතරමහාභූත වූ මේ ශරීරයෙහි ඇතුළත්හි හිඳ කවන පොවන යන එන නොයෙකුත් දෑ කරණ ජීව නම් ආත්මකෙනෙකුන් නො ලබන්නේ ය''යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දක්ෂ වූසේක'' යි කීහ.

*Non-Commercial Distribution*

එකල තෙරුන් වහන්සේ ''මහරජානෙනි, 'අනන්තජින' නම් අප භාග්‍යවතුන් වහන්සේ විසින් ඉතා දුෂ්කර දෙයක් දෙශනා කරණ ලදැ''යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේගේ වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් කුමක් අතිදුෂ්කර කොට දෙශනා කරණ ලද්දේ ද?'' යි කීහ. ''මහරජානෙනි, අප සුගත තථාගතයන් වහන්සේ විසින් 'ස්පර්ශය නම් මේ ය. ත්‍රිවිධවෙදනාව නම් මෝ ය. සංඥව නම් මෝ ය. චෙතනාව නම් මෝ ය. චිත්තය නම් මේ ය' යි කියා එක අරමුණෙහි පවත්නා වූ අරූපි වූ මේ චිත්තචෛතසිකධර්මයන්ගේ ව්‍යවස්ථානය කියන ලද්දේ ය. ඉතා දුෂ්කර දෙයක් දෙශනා කර වදරණ ලද්දේ ය'' යි කීසේක. ''ස්වාමීනි, අරූපි ඒ ධර්මයන්ගේ අවබොධය දුෂ්කරබවට උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක් නැවින් මහාසමුද්‍රමධ්‍යයට පැමිණ හස්ත පුටයෙන් වතුර ගෙණ දිවින් ලෙව බලන්නේ ය. මහරජානෙනි, ඒ පුරුෂතෙම 'මේ ගංගා නම් ගඟේ වතුර ය. මේ යමුනා නම් ගඟේ වතුර ය. මේ අචිරවතී නම් ගඟේ වතුර ය. මේ සරභූ නම් ගඟේ වතුර ය. මේ මහී නම් ගඟේ වතුර ය' යි කියා දැන ගන්නේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, එසේ දැන ගන්නට ඉතා දුෂ්කර ය'' යි කීහ. ''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් ඊටත් වඩා අතිදුෂ්කර කොට 'මේ ස්පර්ශය, මේ වෙදනාවය, මේ සංඥවය, මේ චෙතනාවය, මේ චිත්තය' යි කියා එක ම අරමුණෙහි පවත්නා වූ මේ අරූපි වූ චිත්තචෛතසිකධර්මයන්ගේ ව්‍යවස්ථානය කියන ලද්දේ ය. දුෂ්කර කොට දෙශනා කර වදරණ ලද්දේ ය'' යි කීසේක. එකල පරරාජවාරණමෘගෙන්ද්‍රභූත වූ මිලිඳු මහරජානෝ දෙහොත් මුදුන් දී ''සාධු! සාධු!! ස්වාමීනි, කවීශ්වරතිලක ප්‍රඥසාගරප්‍රශ්නගණ්ඨිභෙදක වූ මාගේ ස්වාමීනි, ප්‍රශ්න විසඳා ධර්ම දෙශනා කර වදළ නියාව ඉතා මනොඥ ය, ප්‍රවර ය, ශ්‍රෙෂ්ඨ ය'' යි කියා අනුමොදන් වූහ.

**සකලජනමනොනන්දනිය වූ මේ මිලින්දප්‍රශ්න නම් වූ**
**ශ්‍රීසද්ධර්මාදසයෙහි සත්වන වර්ගය නිමියේ ය.**

---

# පෘච්ඡා විසජ්ජනා

ඉක්බිති සුන්දරගුණනිධාන අමිතප්‍රඥසාගර වූ නාගසෙන තෙරුන් වහන්සේ ''මහරජානෙනි, තෙපි දැන් මේ වෙලාව දන්නහු දැ'' යි විචාළ සේක. **(92)** ''එසේ ය; ස්වාමීනි, **සම්පතිකා** නම් වූ දැන් මේ වෙලාව දනිමි. ප්‍රථමයාමය අතික්‍රාන්ත වී ය. මධ්‍යමයාමය පවත්නේ ය. සියදහස් ගණන් **උක්කා** නම් දණ්ඩප්‍රදීප දීප්තිමත් වනු ලැබෙති. රජක්හට දිය යුතු රාජගෞරව භාණ්ඩවශයෙන් උස්සිත සතර මහාධ්වජයන් ගත් අණවන ලද්ද වූ සාමාන්‍ය මහාසෙනාව ආරාමය කරා යනු ලැබෙ'' යි කීහ. එවිට අවට පිරිවරා හුන් පන්සියයක් **යොනක** මහාමාත්‍යයෝ ද මිලිඳුරජහට දෙහොත් නඟා ''ස්වාමීනි, දෙවයන් වහන්ස, මේ භික්ෂූන් වහන්සේ ඉතා

*Non-Commercial Distribution*

පණ්ඩිතසේක. ඉතා දක්ෂ වූසේකැ'' යි කියා රජහට මෙසේ කීවාහු ය. එවිට රජ්ජුරුවෝ ද ''එසේ ය, සගයෙනි, තෙරුන් වහන්සේ පණ්ඩිත වූසේක. මෙබඳු වූ ආචාර්යකෙනෙකුත් වෙත් නම්, මා වැනි වූ අන්තෙ-වාසිකකෙනෙකුත් වෙත් නම් නොබෝ කලකින් ම නුවණැති සත්වතෙම ලොකොත්තරධර්මය අවබොධ කොට දැන ගන්නේ ය'' යි කීහ. ඒ **නාගසෙන** තෙරුන් වහන්සේගේ ප්‍රශ්න ව්‍යාකරණයෙන් සන්තොෂ වූ රජ්ජුරුවෝ ලක්ෂයක් වටනා රත්නකම්බිලියකින් නාගසෙන තෙරුන් වහන්සේට පූජා කොට ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'අද පටන් නුඹ වහන්සේට දවස් පතා එසියඅටක් බත් දෙන සේ පණවමි. මෙ ඇතුළුනුවරෙහි නුඹවහන්සේට යම්කිසි කැපදෙයක් ඇත් නම්, එයිනුත් ආරාධනා කෙරෙමි'' යි කීහ. ''මහරජානෙනි, ජීවත් විය හෙමි'' යි කියා හේ ප්‍රතික්ෂෙප කළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹවහන්සේ ජීවත් වනසේක. ඒ බව මමත් දනිමි. එසේ නමුත් තමනුත් රැක්ක මැනැව. මාත් රක්ෂා කළ මැනැව. තමන් කෙසේ රක්ෂා කරන්නේ ද? යි කිව හොත්:—**නාගසෙන** තෙරුන් වහන්සේ **මිලිඳු** රජ්ජුරුවන් පහදවා ලූසේක. කිසියම් 'ප්‍රත්‍යයපූජාවක් නො ලත් සේකැ' යි කියා පරාපවාදයෙක් පැමිණ ආයේ වී නම්, සුදුසු නො වන්නේ ය. මෙසේ තමන් රක්ෂා කළ මැනැව. කෙසේ මා රක්ෂා කරන්නේ ද? යි යත හොත්:—'මිලිඳුරජ්ජුරුවෝ බුද්ධශාසනයෙහි ප්‍රසන්න වූහ. ප්‍රසන්න වූ ආකාරයක් නො කරන්නාහ' යි කියා පරාප-වාදයෙක් පැමිණ ආයේ වී නම් සුදුසු නො වන්නේ ය. මෙසේ මාත් රක්ෂා කළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, තොපගේ යථොක්ත වූ ඒ අභිප්‍රාය එසේ ම වේව'' යි කියා ඉවසූසේක. රජ්ජුරුවෝ ද තමන් ගෘහවාසයෙහි කලකිරී වසනබව හඟවනුවෝ ''ස්වාමීනි, යම් සේ මෘග රාජ වූ සිංහතෙම ස්වර්ණමැදිරියක ලවා පොෂ්‍ය කරන්නේ වී නමුත්, එයින් පිටතට මුහුණ කොට වනයට පැන දුවන සිත ම ඇති වේ ද, එපරිද්-දෙන් ම, ස්වාමීනි, මම කිසිසේත් ගිහිගෙයි වාසය කෙරෙම් ද, එයින් පිටත පැන යන මුහුණ ඇති ව ම සිටින්නෙමි. ඉදින්, ස්වාමීනි, මම ගිහිගෙයින් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදි වීම් නම්, බොහෝ කාලයක් ජීවත් නො වන්නෙමි. මට සතුරෝ බොහෝ ය'' යි සැලකළහ.

ඉක්බිති ආයුෂ්මත් නාගසෙන ස්ථවිරයන් වහන්සේ මිලිඳු රජ්ජුරු වන්ගෙන් විචාළ තාක් ප්‍රශ්න විසඳා වැඩ හුන් ආසනයෙන් නැඟිට සංඝාරාමයට වැඩිසේක. ආයුෂ්මත් වූ නාගසෙනයන් වහන්සේ වෙහෙරට වැඩි නොබෝ කාලයෙහි මිලිඳු රජහට ''මා විසින් කුමක් විචාරණ ලද ද? **(93)** භාග්‍යවතුන් වහන්සේ විසින් කුමක් විසර්ජනය කරණ ලද්දේ දැ?''යි කියා මෙබඳු සිතෙක් විය. ඉක්බිති මිලිඳු රජහට ''මා විසින් සියල්ල ම යහපත් කොට විචාරණ ලද්දේ ය. භාග්‍යවතුන් වහන්සේ විසිනුත් සියල්ල ම යහපත් කොට ම විසඳන ලද්දේ ය'' යි කියා මෙබඳු සිතෙක් වූයේ ය. සංඝාරාමයට ගියා වූ ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේටත්

''මිලිඳු රජහු විසින් කුමක් විචාරණ ලද ද? මා විසින් කුමක් විසඳන ලද්දේ දැ?'' යි කියා මෙබඳු වූ සිතෙක් වූයේ ය. ඉක්බිති ආයුෂ්මත් වූ නාගසෙනයන් වහන්සේට ''මිලිඳු රජහු විසින් සියල්ල ම යහපත් කොට විචාරණ ලද්දේ ය. මා විසිනුත් සියල්ල ම යහපත් කොට විසඳන ලද්දේ ය'' යි කියා මෙබඳු වූ සිතෙක් වූයේ ය.

ඉක්බිති ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේ ඒ රාත්‍රියගේ ඇවෑමෙන් පූර්වාහ්නසමයෙහි සකස් කොට හැඳ පෙරෙව පාසිවුරු ගෙණ එසියඅට දෙනෙකුන් වහන්සේ හා සමග යම් තැනෙක මිලිඳුරජ්ජුරුවන්ගේ නිවෙසනය වී ද, එතැන්හි එළඹිසේක. එසේ එළඹ ප්‍රඥප්තාසනයෙහි හැමදෙනා වහන්සේ හා සමග වැඩසිටිසේක. ඉක්බිති මිලිඳුරජ්ජුරුවෝ ආයුෂ්මත් නාගසෙනයන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටියා වූ මිලිඳු රජ්ජුරුවෝ ආයුෂ්මත් නාගසෙන ස්ථවිරයන් වහන්සේට මේ වචනය කීහ:—

''ස්වාමීනි, පින්වතුන් වහන්ස, නුඹ වහන්සේට මෙබඳු වූ ආකාරයක් නො වේවා; 'නාගසෙන තෙරණුවන් රජ වූ මා විසින් වෙහෙසා ගම්භීර වූ ප්‍රශ්න විචාරණ ලද්දේ ය' යි කියා එම ප්‍රීතිසොම්නසින් ඒ රෑයේ රාත්‍ර්‍යවශෙෂය නිද්‍රා කෙළේ ය යි කියා නුඹ වහන්සේ විසින් මෙබඳු ආකාරයක් නො දත යුතු ය. ස්වාමීනි, මට ඒ රෑයේ රාත්‍ර්‍යවශෙෂය 'මා විසින් කුමක් විචාරණ ලද ද? පින්වතුන් වහන්සේ විසින් කුමක් විසඳන ලද්දේ දැ?' යි කියා ද 'මා විසින් සියල්ල ම යහපත් කොට විචාරණ ලද්දේ ය. පින්වතුන් වහන්සේ විසිනුත් සියල්ල ම යහපත් කොට විසඳා වදරණ ලද්දේ ය' යි කියා මෙබඳු වූ ආකාර වූයේ ය. මෙසේ සිතසිතා නිද්‍රා කෙළෙමි'' යි කීහ. නාගසෙන තෙරුන් වහන්සේත් මෙසේ කීසේක:— 'මිලිඳු රජ්ජුරුවන්ගේ ප්‍රශ්න මා විසින් නො පැකිල ම විසඳන ලද්දේ ය යි කියා එම ප්‍රීතිසොම්නසින් ම ඒ ඉතිරි රාත්‍ර්‍යවශෙෂය කල් යැවූයේ ය' යි කියා මෙසේ ''මහරජානෙනි, තොපට නො වේවා. මේ ආකාර තොප විසින් නො දත යුත්තේ ය. මහරජානෙනි, ඒ මට රාත්‍රිභාගය 'මිලිඳු රජ්ජුරුවන් විසින් කුමක් අසන ලද ද? මා විසින් කුමක් විසඳන ලද ද? මිලිඳු රජ්ජුරුවන් විසින් සියල්ල ම යහපත් කොට ම විචාරණ ලද්දේ ය. මා විසිනුත් සියල්ල ම යහපත් කොට විසඳන ලද්දේ ය' යි කියා මෙබඳු ආකාර සිතෙක් වූයේ ය'' යි කීසේක. මෙසේ සියලු ම අනර්ථ පාපයන් කෙරෙන් විරත බැවින් නාග නම් වූ නාගසෙන-මිලිඳු යන ඒ මහානාගයෝ දෙදෙන ඔවුනොවුන්ගේ සුභාෂිතවචනය යහපත් කොට අනුමෝදන් වූවාහු ය.

**සකලජනමනොනන්දනීය වූ මේ ශ්‍රීසද්ධර්මාදසයෙහි**
**මිලින්දප්‍රශ්නයන්ගේ පෘච්ඡා-විසර්ජනාවෝ**
**සමාප්ත කරණ ලදහ.**

Non-Commercial Distribution

# මෙණ්ඩකප්‍රශ්නය

**(94)** තවද, **මෙණ්ඩක** නම් ප්‍රශ්නයෙහි ප්‍රාරම්භය දක්වන්නා වූ සියලු ම සමයකථාර්ථයන් දක්නා වූ සියලු ම තර්කශාස්ත්‍රය දන්නා වූ සියලු දෘෂ්ටිවාදීන් මර්දනය කරණ විශෙෂප්‍රඥව ඇත්තා වූ සියලු කුශලාකුශලධර්මයන්ගේ විපාක දැනීම හා ස්ථානොචිතප්‍රඥව ඇත්තා වූ සතර සංග්‍රහවස්තුවෙන් ජනරඤ්ජනය කරන්නා වූ මිලිඳු නම් නරෙන්ද්‍රතෙම තීක්ෂ්ණ වූ ප්‍රශ්න විචාරා නාගසෙන ස්ථවිරයන් වහන්සේගේ ප්‍රඥව භෙද කරණු පිණිස නාගසෙන ස්ථවිරයන් වහන්සේ කරා තර්කවාදයෙන් එළඹියේ ය. ඒ යතීන්ද්‍රයානන්ගේ ඡායාවෙහි නො හැර ම වාසය කෙරෙමින් ඇසූ අර්ථ නැවත නැවතත් කාංක්ෂාස්ථාන පසිඳ විචාරමින් විශෙෂයෙන් විභාග කොට දක්නා ලද අවබොධ වූ ප්‍රඥව ඇති ව ඒ මිලිඳු මහරජානෝ සියලු දෙව්මිනිසුන් කෙරෙහි ප්‍රසිද්ධ වූහ.

එහෙයින් තුන්වෙනි දවස් රාත්‍රිභාගයෙහි රහොගත ව හිඳ '**පාරාජික පචිත්ති චූලමහානිද්දේස සුලුවග මහවග පරිවාරය** හා **මංගල රතන නාලක තුවටක සූත්‍ර** යන **සූත්‍ර** නම් වූ යම් බුද්ධවචනකෙනෙක් ඇද් ද, **සංයුත්තනිකායෙහි** සගාථකවර්ගය ඇතුළු වූ සියලු ම සගාථ **සූත්‍රගෙය්‍ය** ධර්මකෙනෙක් ඇද් ද, සියලු ම **අභිධර්මපිටකය** හා **නිර්ගාථකසූත්‍ර** හා ඉතිරි අෂ්ටාංගයට හා නො වන **වෙය්‍යාකරණ** නම් යම් බුද්ධවචන කෙනෙක් ඇද්ද, **දම්පියා ථෙරථෙරීගාථා** හා **සූත්‍රනිපාතයෙහි** සූත්‍ර නම් නො වන සුද්ධිකගාථාධර්මයන් ඇතුළු වූ **ගාථා** නම් ධර්මකෙනෙක් ඇද්ද, සොමනස්සඥාණමයිකගාථාපටිසංයුත්ත වූ දෙයාසූවක් පමණ **උදන** සූත්‍රාන්තධර්මකෙනෙක් ඇද්ද, සූත්‍රදශාතිරෙකශතප්‍රමාණ වූ **ඉතිවුත්තක** නම් ධර්මකෙනෙක් ඇද්ද, **අපන්නකාදි** පන්සියපණස් **ජාතකධර්ම** කෙනෙක් ඇද්ද, මහණෙනි, **ආනන්දස්ථවිරයන්** කෙරෙහි මේ ආශ්චර්ය අද්භූත වූ ධර්මයෝ සතරදෙනෙක' යනාදීන් වදළ වූ **අද්භූතධර්ම** කෙනෙක් ඇද්ද, **චූලමහාවෙදල්ල සම්මාදිට්ඨි ශක්‍රප්‍රශ්න සංඛාරභාජනිය මහාපුණ්ණම** සූත්‍රාදි වූ සූසැට ප්‍රමාණ **වෙදල්ලසූත්‍රාන්ත** ධර්මකෙනෙක් ඇද්ද, යන මේ **සූත්‍රගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදන ඉතිවුත්තක ජාතකාද්භූත වෙදල්ල** යන නවාංග වූ ශාස්තෘශාසනය තමාගේ නුවණින් විමසා බලා අනුමාර්ජනය කෙරෙමින් අනාගතයෙහි අල්පබුද්ධීන් විසින් අවුල් හැර මුදා ලිය නො හැක්කා වූ එහෙයින් ම දෘෂ්ටිවාදීන් විසින් කරණ නිග්‍රහ සහිත වූ **මෙණ්ඩක** නම් ප්‍රශ්නයන් දුටහ. ''ධර්මරාජයාගේ ශාසනයෙහි පර්යායයෙන් වදළ ධර්මයෝත් ඇත. යම් යම් දෙයක් උදෙසා වදළ ධර්මයෝත් ඇත. ස්වභාවයෙන් වදළ ධර්මයෝත් ඇත. දෙසනාවෝත් ඇත. ඒ ඒ ධර්මයන්ගේ අර්ථය නත් වූ පරිද්දෙන්

*Non-Commercial Distribution*

නො දැනීම කරණ කොට ගෙණ අනාගතකාලයෙහි දී ඒ මෙණ්ඩක නම් සර්වඥවචනයෙහි අන්‍ය දෘෂ්ටිවාදීන්ගේ විග්‍රහයකුදු වන්නේ වී නම නපුර. එබැවින් මම චිත්‍රකථික වූ නාගසෙන ස්ථවිරයන් පහදවා ගෙණ මෙණ්ඩක නම් ගැටළු අවුල් සිඳ හරිමි. ඒ නාගසෙන ස්ථවිරයන් විසින් දක්වන ලද නිරවුල් මාර්ගයෙන් අනාගතයෙහි ධර්මකථිකයෝ අර්ථ ධර්ම ලොවට දක්වති' සිතූහ. **(95)** එසේ හෙයින් කියන ලදී:—

**''හස්සප්පවෙදී වෙතණ්ඩී-අනුබුද්ධි විචක්ඛණො,**
**මිලින්දො නාම භෙදාය-නාගසෙනමුපාගමි.**

**වසන්තො තස්ස ඡායාය-පරිපුච්ඡන්තො පුනප්පුනං,**
**පභින්නබුද්ධි හුත්වාන-සොපි ආසීති පාකටො.**

**නවඞ්ගං අනුමජ්ජන්තො-රත්තිභාගෙ රහොගතො,**
**අද්දක්ඛි නිපුණෙ පඤ්හෙ-දුන්නිවෙඨෙ සනිග්ගහෙ.**

**පරියායභාසිතං අත්ථි-අත්ථි සන්ධාය භාසිතං,**
**සභාවභාසිතං අත්ථි-ධම්මරාජස්ස සාසනෙ.**

**තෙසං අත්ථං අවිඤ්ඤාය-මෙණ්ඩකෙ ජිනභාසිතෙ,**
**අනාගතම්හි අද්ධානෙ-විග්ගහො තත්ථ හෙස්සති.**

**හන්දකථිං පසාදෙත්වා-ඡෙජ්ජාපෙස්සාමි මෙණ්ඩකෙ,**
**තස්ස නිද්දිට්ඨමග්ගෙන-'නිද්දිසන්ති අනාගතෙ'' ති.**

මෙසේ සිතා ඉක්බිති මිලිඳුමහරජානෝ රාත්‍රියගේ ඇවෑමෙන් අරුණු නැඟුනු කල්හි ඉස් සෝධා නහාපියා සිරසෙහි අත් තබා වැඳ ගෙණ අතීතානාගතවර්තමානකාලත්‍රයයෙහි වූ සියලුම සර්වඥවරයන් සිහි කොට ''අද මෙයින් මතු සත්දවසක් මුළුල්ලෙහි අටගුණයක් සමාදන් ව මා විසින් තපස්හි හැසිරිය යුතු වන්නේ ය. පුරුදු කරණ ලද තපස් ඇත්තා වූ ඒ මම මාගේ නාගසෙනාචාරීන් වහන්සේගේ සිත් ගෙණ සිට හිස මුඩු වූ ශ්‍රමණ වෙශධාරීන්ට ම සුදුසු වූ රහස් කථාවක් බැවින් මෙණ්ඩක නම් වූ **මෙණ්ඩක ප්‍රශ්නයන්** විචාරමි'' යි සිතා **අෂ්ටව්‍රතපද** කෙනෙකුන් සමාදන් වූහ.

ඉක්බිති මිලිඳුමහරජානෝ ප්‍රකෘතිවස්ත්‍රද්වය හැර සියලු රාජාභරණ ද ගලවා තබා කහවන් කසාපිළී හැඳ කුඩා මොට තුප්පියක් ශීර්ෂයෙහි වසා ගෙණ මුනිභාවයට පැමිණ අෂ්ටවිධ වූ ගුණධර්මයන් සමාදන් වෙමින් ''මේ සද්දවස මුළුල්ලෙහි මා විසින් රාජ්‍යාර්ථය අනුශාසනා නො කට යුතු ය. රාගසංහිත වූ චිත්තය නො ඉපද විය යුතු ය. ද්වේෂසංහිත වූ සිතක් නො ඉපද විය යුතු ය. මොහසංහිත වූ සිතක් නො ඉපද විය

Non-Commercial Distribution

යුත්තේ ය. දසකර්මකර පුරුෂජනයා කෙරෙහිත් යටත් වූ වෘත්ති ඇති විය යුතු ය. කායිකවාචසිකය රක්ක යුතු ය. හාත්පසින් චක්ෂුරාදී ෂඩායතනයෝ රක්ෂා කට යුත්තාහු ය. මෛත්‍රීභාවනායෙහි චිත්තය ප්‍රක්ෂෙප කට යුත්තේ ය යි මෙකී අටගුණයක් සමාදන් ව ඉටා ගෙණ ඒ අටගුණයෙහි ම සිත පිහිටුවා ගෙණ නුවරින් පිටතට නොයික්ම සත් දවසක් කල් යවා අටවැනි දවස් රාත්‍රියගේ ඇවෑමෙන් පළමු කොට ම පෙරවරු භක්තකෘත්‍යය කොට වියදඬු පමණ දුර බලන යටිකුරු කළ ඇස් ඇති ව පමණ දූන කියන කථා ඇති ව මනා ව සන්සුන් ඉරියාපථයෙන් සන්තොස වූ ඔදවැඩියා වූ අතිප්‍රසන්න වූ අවික්ෂිප්තචිත්තයෙන් නාගසෙන තෙරුන් වහන්සේ කරා එළඹ තෙරුන් වහන්සේගේ පාදද්වන්දය උත්තමාංගයෙන් වැඳ එකත්පසෙක සිට මේ වචනය සැලකළහ:—

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ හා සමග මා විසින් මන්ත්‍රණය කට යුතු වූ **(96)** කිසියම් අර්ථයෙක් ඇත. ඒ මන්ත්‍රණයෙහි අන්කිසි තුන්වැනි කෙනෙකුන් නො කැමැත්තෙමි. ජනශූන්‍ය වූ විවේක ආරණ්‍යක වූ අෂ්ටාංගයෙන් යුක්ත වූ ශ්‍රමණසාරූප්‍ය වූ අවකාශයෙක් ඇද්ද, එතැන්හි ප්‍රශ්නයතෙම විචාළ යුතු වන්නේ ය. ඒ මන්ත්‍රණයෙහි මට විචාළ දෙයක් නො සැංගිය යුතු ය. රහසක් නො කට යුත්තේ ය. ශාසනයෙහි රහස්බණ අසන්නට මම සුදුස්සෙමි. යහපත් වූ මන්ත්‍රණය පත්[1] කල්හි උපමායෙනුත්[2] ඒ අර්ථය පරීක්ෂා කට යුත්තේ ය. යම් ප්‍රකාරයකින් කෙසේ දූ? යි කිව හොත්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් සේ මහාපෘථිවිතොම නිඃක්ෂෙප කට යුතු දෙයක් පැමිණි කල්හි නිඃක්ෂෙපයට සුදුසු වේ ද, එපරිද්දෙන් ම, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, රහස්ධර්මයන් අසන්නට මම සුදුස්සෙමි. යහපත් වූ මන්ත්‍රණයක් පැමිණි කල්හි (යි)'' ඒ කථාව කරණු පිණිස ගුරුන් වහන්සේ හා සමග ජනවිවික්ත වූ වනයකට ප්‍රවිෂ්ට ව මෙලෙස කීහ:—

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ලොකයෙහි මන්ත්‍රණය කරණු කැමති පුරුෂයා විසින් අටතැනක් හැරිය යුතු වෙති. ඒ අටස්ථානයෙහි දී නුවණැති පුරුෂතෙම යහපත් අර්ථයක් මන්ත්‍රණය නො කරන්නේ ය. එහි මන්ත්‍රණය කළ අර්ථය ලිස්වා[3] යන්නේ ය. සිද්ධ නො වන්නේ ය. ඒ ස්ථානයෝ කවරහු ද? විෂමස්ථානයය හැරිය යුතු ය. ජනසභාව[4] හැරිය යුත්තේ ය. අතිවාතස්ථානය හැරිය යුත්තේ ය. ප්‍රතිච්ඡන්නස්ථානය හැරිය යුත්තේ ය. දෙවාලයස්ථානය හැරිය යුත්තේ ය. යන මාර්ගය හැරිය යුත්තේ ය. චංක්‍රමණය හැරිය යුත්තේ ය. පැන්තොට හැරිය යුත්තේ ය. මෙකී අටතැන් හැරිය යුත්තාහු ය'' යි කීහ. එකල තෙරුන් වහන්සේ ''මහරජානෙනි, විෂමස්ථාන සහ අතිවාත පටිච්ඡන්න දෙවස්ථානමාර්ග චංක්‍රමණ උදකතීර්ථකයෙහි කවර දෙෂයෙක් දූ?'' යි විචාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, විෂමස්ථානයෙහි දී මන්ත්‍රණය කළ අර්ථය විසිරෙන්නේ ය. ඉපිල යන්නේ ය. නැමී

1. උගත් උපගතෙ–පාලි 2. උපායෙනුත් 3. ලෙස්වා 4. සභායං පාලි (භය සහිත ස්ථානය)

Non-Commercial Distribution

යන්නේ ය. සම්භව නො වන්නේ ය. ජනසභාවෙහි සිත කෝල වන්නේ ය. සිත කෝල ව අර්ථය මනා කොට නො ම දක්නේ ය. මහා වාතස්ථානයෙහි දී කියන ශබ්දය ප්‍රකාශ ව නො ඇසෙන්නේ වෙයි. ප්‍රතිච්ඡන්නස්ථානයෙහි සෙස්සෝ රහස් අසා සමීපයෙහි සිටිති. දෙවස්ථානයෙහි දී මන්ත්‍රණය කළ අර්ථය ගරුකභාවයට පිරිනැමෙයි. මාර්ග යෙහි දී මන්ත්‍රණය කළ අර්ථය තුච්ඡ වන්නේ ය. චංක්‍රමණයේ චඤ්චල වන්නේ ය. උදකතීර්ථයෙහි සියල්ලන්ට ප්‍රකට වන්නේ ය'' යි කීහ. ඒ බව මෙහි ගාථාවෙන් දැක්වීම වන්නේ ය:—

**''විසමං සභයං අතිවාතො–පටිච්ඡන්නං දෙවනිස්සිතං,**
**පන්‍ථො ච සංකමො තිත්‍ථං–අට්ඨෙතෙ පරිවජ්ජයෙ''යි.**

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මන්ත්‍රණය කරන්නා වූ මේ පුද්ගලයෝ අටදෙනෙක් මන්ත්‍රණය කළ අර්ථය විනාස කෙරෙති. ඒ අටදෙන කවරු ද?[1] රාගචරිතයා ය, ද්වේෂචරිතයා ය, මොහචරිතයා ය, මානචරිතයා ය, ලුබ්ධයා ය, අලසයා ය, එකචින්ති ය, අඥනයා ය යන මේ පුද්ගලයෝ අටදෙන මන්ත්‍රණය කළ අර්ථය විනාස කරන්නාහු ය''යි කීහ. ඒ අසා තෙරුන් වහන්සේ ''මහරජානෙනි, ඔවුන්ගේ දෙෂ කවරේ ද?'' යි විචාළසේක. **(97)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, රාගචරිත තෙම නිරන්තරයෙන් ම රාගය සිතසිතා කල් යැවීම් වසයෙන් මන්ත්‍රණය කළ අර්ථය නසා ගන්නේ ය. ද්වේෂචරිතතෙම නිරන්තරයෙන් අනුන් කෙරෙහි ක්‍රොධ කිරීම් වසයෙන් මන්ත්‍රණය කළ අර්ථය නසා ගන්නේ ය. මොහචරිතතෙම තමන් මුළා වීම් වසයෙන් මන්ත්‍රණය කර ගත් අර්ථය නසා ගන්නේ ය, මානචරිතතෙම තමාගේ මානය කරණ කොට ගෙණ මන්ත්‍රණය කර ගත් අර්ථය නසා ගන්නේ ය, ලොභිපුරුෂතෙම තමාගේ ලොභ වසයෙන් මන්ත්‍රණය කර ගත් අර්ථයන් නසා ගන්නේ ය, අලසයා තමාගේ අලසතාවෙන් මන්ත්‍රණය කර ගත් අර්ථය නසා ගන්නේ ය. එකචින්ති පුරුෂයා තමාගේ සිත පස්සෙහි දුවන එකචින්තිතාවෙන් මන්ත්‍රණය කර ගත් අර්ථයන් නසා ගන්නේ ය. බාලයා තමාගේ කිසිවක් නො දන්නා අඥනතාවෙන් මන්ත්‍රණය කර ගත් අර්ථයන් නසා ගන්නේය. ඒ බව මෙහි ගාථාවෙන් දැක්වීම වන්නේ යි.

**''රත්තො දුට්ඨො ච මූළ්හො ච–මානී ලුද්ධො තථාලසො,**
**එකචින්තී ච බාලො ච–එතෙ අත්‍ථවිනාසකා'' යි.**

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ පුද්ගලයෝ නවදෙනෙක් මන්ත්‍රණය කරණ ලද රහස පහළ කෙරෙමින් හැසිරෙති. ධාරණය නො කෙරෙති. ඒ නවදෙන කවරු[1] ද? රාගචරිතයා ය, ද්වේෂචරිතයා ය, මොහ චරිතයා ය, භීරුකයා ය, ආමිසගරුකයා ය, ස්ත්‍රී ය, සුරාසොණ්ඩයා ය,

1. කවරේ

Non-Commercial Distribution

පණ්ඩකයා ය, ලදරුවා ය'' යි කීහ. ඒ අසා තෙරුන්වහන්සේ ''මහරජාණෙනි, ඔවුන්ගේ දෙෂ කවරේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, රාගචරිතතෙම රාගයෙහි ව්‍යාවෘත ව රාගවසයෙන් මන්ත්‍රණය කළ රහස පහළ කෙරෙමින් හැසිරෙන්නේ ය. රහස් කොට ධාරණය නො කරන්නේ ය. ද්වෙෂිපුද්ගලතෙම ද්වෙෂවශයෙන් මන්ත්‍රණය කළ රහස පහළ කෙරෙමින් හැසිරෙන්නේ ය. ධාරණ නො කරන්නේ ය. මොහී වූ මූළා තැනැත්තේ මොහවසයෙන් මන්ත්‍රණය කළ රහස් පහළ කොට හැසිරෙන්නේ ය. ධාරණය නො කරන්නේ ය. භයබහුල පුරුෂතෙම භීරුක බහුලතාවෙන් මන්ත්‍රණය කළ රහස් පහළ කෙරෙමින් හැසිරෙන්නේ ය. ධාරණය නො කරන්නේ ය. පිළිබත් ආදි ආමිස ගරුකතෙම ආමිසලාභය හෙතුකොට ගෙණ මන්ත්‍රණය කළ රහස් පහළ කෙරෙමින් හැසිරෙන්නේ ය. ධාරණය නො කරන්නේ ය, ස්ත්‍රීතොම ස්වල්ප ව වහා සිත පෙරළෙන බැවින් මන්ත්‍රණය කළ රහස් පහළ කොට හැසිරෙන්නී ය. ධාරණය නො කරන්නී ය. සුරාසොණ්ඩයා සුරාපානයෙහි ලොල් බැවින් මන්ත්‍රණය කළ රහස් පහළ කරන්නේ ය. ධාරණය නො කරන්නේ ය. පණ්ඩකයා ඔහුගේ නොයෙක් අංගවිකාර ඇති බැවින් මන්ත්‍රණය කළ රහස පහළ කෙරෙමින් හැසිරෙන්නේ ය. ධාරණය නො කරන්නේ ය. ලදරුතෙම ඔහුගේ චපලතාවෙන් මන්ත්‍රණය කළ රහස් පහළ කෙරෙමින් හැසිරෙන්නේ ය. රහස් කොට ධාරණය නො කරන්නේ ය. වහා පෙරළෙන **(98)** සිත් ඇත්තා වූ චලිත වූ චපල වූ මේ යථොක්ත වූ නවවිධ වූ පුද්ගලකෙනෙක් වෙති. ලොකයෙහි මොවුන් විසින් මන්ත්‍රණය කළ රහස් කථාවෙක් ඇත් නම්, වහා ම ප්‍රකාශ වන්නේ ය. ඒ බව මෙහි ගාථාවෙන් දැක්වීම වන්නේ ය:—

> **''රත්තො දුට්ඨො ච මූළ්හො ච–භීරු ආමිසචක්ඛුකො,**
> **ඉත්ථිසොණ්ඩො පණ්ඩකො ච–නවමො භවති දාරකො**
> **නවෙතෙ පුග්ගලා ලොකෙ–ඉත්තරා චලිතා චලා,**
> **එතෙහි මන්තිතං ගුය්හං–ඛිප්පං භවති පාකටං'' යි.**

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අටකාරණයකින් ප්‍රඥතොම වැටහෙන්නේ ය. මුහු කිරීමට යන්නේ ය. කවර අටකාරණයකින් ද? යත්:— වයස් පැමිණීමෙන් නුවණ පිරිනැමෙන්නේ ය. මුහු කිරීමට යන්නේ ය. යස පිරිවර පැමිණීමෙනුත් නුවණ පිරිනැමෙන්නේ ය. පරිපාකයට යන්නේ ය. නැවත නැවත ඇසීමෙනුත් නුවණ පිරිනැමෙන්නේ ය. මුහු කිරීමට යන්නේ ය. ගුරුන් කෙරෙහි වාසය කිරීමෙන් නුවණ පිරිනැමෙන්නේ ය. මුහු කිරීමට යන්නේ ය. යොනිසොමනස්කාරය කරණ කොට ගෙණ නුවණ පිරිනැමෙන්නේ ය. මුහු කිරීමට යන්නේ ය. ඔවුනොවුන් හා සාකච්ඡා කිරීමෙන් නුවණ වැටහෙන්නේ ය. මුහු කිරීමට යන්නේ ය. ස්නෙහ ඇත්තවුන් සෙවනය කිරීමෙනුත් නුවණ වැටහෙන්නේ ය. මුහු කිරීමට යන්නේ ය. [1]තුණුරුවන් පවත්නා පතිරූපදෙස

1 කවරේ

Non-Commercial Distribution

වාසයෙනුත් නුවණ වැටහෙන්නේ ය. මුහු කිරීමට යන්නේ ය. ඒ බව මෙහි ගාථාවෙනුත් දක්වීම වන්නේ ය.

> **“වයෙන යසපුච්ඡාහි-තිත්ථවාසෙන යොනිසො,**
> **සාකච්ඡාසෙනසංසෙවා-පතිරූපවාසෙන ච**
> **එතානි අට්ඨඨානානි-බුද්ධිවිසදකාරකා,**
> **යෙසං එතානි සම්භොන්ති-තෙසං බුද්ධි පබුජ්ඣති”** යි.

“මේ අටකාරණයෝ ප්‍රඥාවිශදකාරණයෝ ය. ගෘහස්ථ ප්‍රව්‍රජිත යම්කිසි කෙනෙකුන්ට මේ අටකාරණයෝ සම්භව වන්නාහු නම් ඔවුන්ගේ ප්‍රඥාව ශුද්ධියට යන්නේ ය” යි කීහ. නැවතත් “ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ භූමිභාගය අෂ්ටවිධ වූ මන්ත්‍රණදෙෂයෙන් දුරු වන ලද්දේ ය. මම ද මේ ලොකයෙහි උතුම් වූ මන්ත්‍රණ සහායෙක්මි. රහස් රක්ෂාකර ද වීමි. මම යම් තාක් ජීවත් වෙම් ද? ඒ තාක් කල් නුඹ වදළ රහසක් නො හැර රක්ෂා කෙරෙමි. අටකාරණයෙනුත් මාගේ නුවණ වැටහීමට යන ලද්දේ ය. දැන් මේ ප්‍රස්තාවට මනා කොට පිළිපදිමින් වසන්නා වූ මා වැනි අන්තෙවාසිකයෙක් දුර්ලභ වන්නේ ය. අන්තෙවාසිකයා කෙරෙහි පැවැත්ත යුතු වූ ආචාර්යවර්යන්ගේ යම් පස්විසි ආචාර්ය ගුණකෙනෙක් ඇද්ද, ඒ ගුණධර්මවලින් ආචාර්යවරයන් වහන්සේ විසින් යහපත් කොට පිළිපැද්ද යුත්තේ ය. ඒ පස්විසි ගුණ[1] කවරේ ද? යත්:— ස්වාමීනි, මේ බුද්ධශාසනයෙහි—

(99) **“ආචාරියෙන අන්තෙවාසිම්හි සතතං සමිතං ආරක්ඛා උපට්ඨපෙතබ්බා. අසෙවනසෙවනා ජානිතබ්බා. පමත්තාප්පමත්තතා ජානිතබ්බා. සෙය්‍යාවකාසො ජානිතබ්බො ගෙලඤ්ඤං ජානිතබ්බං. භොජනං ලද්ධාලද්ධං ජානිතබ්බං. විසෙසො ජානිතබ්බො. පත්තගතං සංවිභජිතබ්බං. අස්සාසෙතබ්බො මා භායි අත්ථො තෙ අභික්කමතී’ති ඉමිනා පුග්ගලෙන පටිචරතී ති පටිචාරො ජානිතබ්බො. ගාමෙ පටිචාරො ජානිතබ්බො. විහාරෙ පටිචාරො ජානිතබ්බො. න තෙන සහ සල්ලාපො කාතබ්බො. ඡිද්දං දිස්වා අධිවාසෙතබ්බං. සක්කච්චකාරිනා භවිතබ්බං. අඛණ්ඩකාරිනා භවිතබ්බං. අරහස්සකාරිනා භවිතබ්බං. නිරවසෙසකාරිනා භවිතබ්බං. ‘කථංජානෙම්මං[2] සිප්පෙසූති ජනකචිත්තං උපට්ඨපෙතබ්බං. ‘කථං අයං න පරිහායෙය්‍යා‘ති වඩ්ඪිචිත්තං උපට්ඨපෙතබ්බං. බලවං ඉමං කරොමි සික්ඛා බලෙනා’ති චිත්තං උපට්ඨපෙතබ්බං. මෙත්තචිත්තං උපට්ඨපෙතබ්බං. ආපදාසු න විජහිතබ්බං. කරණීයෙ නප්පමජ්ජිතබ්බං. ඛලිතෙ ධම්මෙන පග්ගහෙතබ්බො’ති. ඉමෙ ඛො භන්තෙ, පඤ්චවීසති ආචරියස්ස ආචරියගුණා. තෙහි ගුණෙහි මයි සම්මා පටිපජ්ජස්සු.”**

---

1. ගුණයෝ 2. ජනෙම්මං

*Non-Commercial Distribution*

යනුවෙන් "ගුරුවරයා විසින් අන්තෙවාසිකයා කෙරෙහි නිරන්තරයෙන් යහපත් කොට ආරක්ෂා තැබිය යුත්තේ ය. අසෙවනාසෙවනයෝ දත ගත යුත්තාහු ය. ප්‍රමාද අප්‍රමාදයෝ දත යුත්තාහ. නිද්‍රාවකාශය දත යුත්තේ ය. ගිලන්බව දත යුත්තේ ය. භොජනය ලත් නො ලත්බව දත යුතු ය. ශ්‍රද්ධා වීර්ය බහුශ්‍රැතතාදී පුද්ගලවිශෙෂය දත යුත්තේ ය. පාත්‍රයට ලත් දෙයක් වත් බෙද දිය යුත්තේ ය. භය නො ගණුව, තොපට අර්ථ ඉගෙණීම වැඩී යන්නේ ය" යි කියා අස්වසාලිය[1] යුත්තේ ය. මෙනම් පුද්ගලයා හා හැසිරෙන්නේ ය' යි කියා හැසිරීම දත යුත්තේ ය. ග්‍රාමයෙහි හැසිරීම දත යුත්තේ ය. විහාරයෙහි හැසිරීම දත යුත්තේ ය. ඒ අන්තෙවාසිකයා හා සමග කවර වෙලායෙහිත් සල්ලාප නො කට යුත්තේ ය. අන්තෙවාසිකයාගේ සිදුරක් දුක නො කිපී ඉවසිය යුත්තේ ය. කරණ සත්කාරයක් සකස් කොට ම කරවන සුලු විය යුත්තේ ය. උගන්වන ශාස්ත්‍රධර්මයන්ගේ අඩාළ නො කිරීමෙන් හා කරණ සත්කාරයෙන් ම අඛණ්ඩකාරී විය යුත්තේ ය. රහස් කාරි නො විය යුත්තේ ය. නිරවශෙසකාරී නො විය යුත්තේ ය. 'කවර උපායෙකින් මොහු ශිල්පෙයහි උපදවම් දෝ හෝ?' යි කියා ජනක චිත්තය ඉපද විය යුත්තේ ය. 'කෙසේ නම් මොහු ශීලාදිගුණයෙන් නො පිරිහෙත් දෝ හෝ?' යි කියා වර්ධන චිත්තය ඉපද විය යුත්තේ ය. මොහු' ශික්ෂාබලයෙන් බලවත් කෙරෙමි'යි කියා චිත්තය උපදවා ලිය යුත්තේ ය. මෛත්‍රීචිත්තය උපදවා ලිය යුත්තේ ය. ආපදර්ථයක් පැමිණි කල්හි නො හැරිය යුත්තේ ය. කිසි කට යුතු කෘත්‍යයක් පැමිණි කල්හි 'මට කිම් ද?' යි කියා ප්‍රමාද නො විය යුත්තේ ය. ඛලිත ව සිත චඤ්චල වූ කල්හි ධර්මයෙන් සංග්‍රහ කට යුත්තේ ය. ස්වාමීන් වහන්ස, මේ යථොක්ත වූ පස්විසිගුණයෝ ආචාර්ය වරයාගේ ආචාර්ය ගුණයෝ ය. ඒ ගුණයෙන් මා **(100)** කෙරෙහි යහපත් කොට පිළිපැද වදළ මැනැව. තවද, ස්වාමීනි, මට කාංක්ෂාවක් උපන්නේ ය. සර්වඥභාෂිත වූ මෙණ්ඩක නම් ප්‍රශ්නධර්මයෝ ඇත. අනාගත කාලයෙහි ඒ ධර්ම දෙශනාවෙහි දෘෂ්ටිවාදීන්ගේ කලහවිග්‍රහයෙක් උපදින්නේ ය. ඒ අනාගතකාලයෙහි නුඹ වහන්සේ වැනි වූ අතුල්‍යබුද්ධීන් වහන්සේලා දුර්ලභ වන්නාහු ය. එහෙයින් පරවාදීන්ට නිග්‍රහ කරණු පිණිස මාගේ ඒ ප්‍රශ්නධර්මදෙශනාවන් කෙරෙහි ලා ප්‍රඥ ඇස පිරිසිදු කොට දෙවා වදළ මැනැවැ" යි කියා ආරාධනා කළහ.

එකල්හි පරවාදීහකුම්භවිදරණකෙශරීන්ද්‍රභූත වූ මාගේ නාගසෙන ථෙරසාමීන් වහන්සේ "යහපත, මහරජානෙනි," යි කියා එපවත් පිළිගෙණ තුණුරුවන් ආශ්‍රය කරණ උපාසකයාගේ උපාසකගුණදසයක් දක්වා වදළසේක:—

**"දස ඉමෙ, මහාරාජ, උපාසකස්ස උපාසකගුණා. කතමෙ දස, ඉධ, මහාරාජ, උපාසකො සංඝෙන සමානසුඛදුක්ඛො හොති. ධම්මාධිපතෙය්‍යො හොති. යථාබලං සංවිභාගරතො හොති. ජිනසාසනපරිහානිං දිස්වා අභිවඩ්ඪියා වායමති.**

1. අස්වාලිය

Non-Commercial Distribution

**සම්මාදිට්ඨිකො හොති. අපගතකොතුහලමඞ්ගලිකො ජීවිත හෙතුපි න අඤ්ඤං සත්ථාරං උද්දිසති. කායිකං වාචසි-කඤ්චස්ස 'රක්ඛිතං හොති. සමග්ගාරාමො හොති. සමග්ගරතො, අනුසූයකො හොති. න ච කුහනවසෙන සාසනෙ චරති. බුද්ධං සරණං ගතො හොති. ධම්මං සරණං ගතො හොති. සංඝං සරණං ගතො හොති. ඉමෙ ඛො මහාරාජ, දස උපාසකස්ස උපාසක ගුණා'' යි**

යනුවෙන් ''මහරජානෙනි, උපාසකයාගේ උපාසකගුණයෝ මේ දශයෙක. දශය කවරේ ද?— මහරජානෙනි, මේ බුද්ධශාසනයෙහි උපාසකතෙම සංඝයා වහන්සේ හා සමාන වූ සුවදුක් කැමති වේ ද, සද්ධර්මය ම අධිපති[1] කොට ඇත් තේ වේ ද, යථා ශක්තියෙන් පූජා විභාගයෙහි ඇලී වසන්නේ වේ ද, සර්වඥශාසනයාගේ පිරිහීම දක අභිවෘද්ධිය පිණිස වීර්ය කරන්නේ ය. සම්‍යක් ප්‍රතිපත්තියෙහි හැසිරීමෙන් සම්‍යග්දෘෂ්ටික වේ ද, පහ කරණ ලද කොතුහලමංගලික නම් විපරීත දෘෂ්ටිව්‍රතසමාදනාදි මංගල ක්‍රියාවන් ඇත්තේ දිවිහිමියෙනුත් අන්‍යශාස්තෘ කෙනෙකුන් පිහිට ය යි නො කියන්නේ ය. ඔහු විසින් කායිකය හා වාචසිකය රක්ෂා කරණ ලද්දේ වේ ද, සාමග්‍රීතායෙහි කැමැත්තේ වේ ද, සාමග්‍රීතායෙහි ඇලුනේ වේ ද, ඊර්ෂ්‍යා නො කරණ සුලු වේ ද, වඤ්චා වසයෙන් ශාසනයෙහි නො හැසිරේ ද, බුදුන් සරණ ගියේ වේ ද, දහම් සරණ ගියේ වේද, සඟ සරණ ගියේ වේ ද, මහරජානෙනි, මෙකී දසගුණයෝ උපාසකයාගේ උපාසකගුණයෝ නම් වෙති. ඒ සියලු ම ගුණයෝ තොප කෙරෙහි විද්‍යමාන ව පවතිත්. තොපට ඒ ඒ උපාසකගුණගණාංගය යුක්ත ය. අනුච්ඡවික ය. සුදුසු ය.

''තෙපි යම් සර්වඥශාසනය පිරිහීමක් දක අභිවෘද්ධියක් කැමැත්-තෝ ය. 'යහපත, තොපට අවකාශ කෙරෙමි' යි තෙපි මාගෙන් සැප සේ ම විචාරව'' යි වදාළසේක.

ඉක්බිති කරණ ලද අවකාශ ඇති මිලිඳුමහරජානෝ ගුරු වූ **(101)** නාගසෙන ස්ථවිරයන්ගේ ශ්‍රීපාදද්වන්දයෙහි වැඳ වැටී තමාගේ හිස මස්තකයෙහි අඤ්ජලිය කොට වැඳ ගෙණ මෙපවත් සැලකළහ:—

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ අන්‍යලබ්ධිමත් තීර්ථකයෝ මේ ආකාර කියන්නාහු ය:— 'ඉදින් සර්වඥතෙම ලොකයා කරණ පූජාව ඉවසනසේක් වී නම්, ක්ලේශපරිනිර්වාණයෙන් පිරිනිවන් නො පෑසේක. සර්වඥතෙම ලොකයා හා සංයුක්තසේක. භවයට ඇතුළත් වූසේක. ලොකයා කෙරෙහි ලොකයා හා සාධාරණ වූසේක. එහෙයින් ඒ සර්වඥ යාහට කරණ ලද පූජා සත්කාරයතෙම වඳ වන්නේ ය. සිස් වන්නේ ය. නිෂ්ඵල වන්නේ ය. ඉදින් ක්ලෙශයන් කෙරෙන් මිදී පිරිනිවන් පෑ වදාළ සේක් වී නම්, ලොකයා හා අමිශ්‍ර වූසේක. සියලුම භවයන් විසින් හරණ

1. ආධිපත්‍ය

Non-Commercial Distribution

ලද වූ සේක. ඒ සර්වඥයාහට පූජාසත්කාරයක් උපදින්නේ වී නම්, පිරිනිවන් පැ වදළ සර්වඥතෙම ඒ පූජාව මඳකුත් නො ඉවසනසේක. නො ඉවසන්නා වූ අප්‍රාණීසර්වඥයාහට කරණ ලද පූජා සත්කාරයතෙම සිස් වන්නේ ය. වඳ වන්නේ ය. අඵල වන්නේ ය. නිෂ්ඵල වන්නේ ය'යි කියත්. ස්වාමීනි, මේ දෙකෙළෙවරක් ඇති උභතොකොටික ප්‍රශ්නයෙක. අසම්ප්‍රාප්ත වූ අර්හත්ඵල සිත් ඇත්තවුන්ට මේ ප්‍රශ්නයතෙම විෂය නො වන්නේ ය. ප්‍රඥ මහත්ත්වයෙන් මහත් වූ නුඹ වහන්සේ වැනි මහතුන් වහන්සේලාට ම මේ ප්‍රශ්නයතෙම විසඳා කීම විෂය වන්නේ ය. මේ දෘෂ්ටිජාලය බිඳ වදළ මැනැව. නුඹ වහන්සේට ම මේ ප්‍රශ්නයතෙම සම්ප්‍රාප්ත වූයේ ය. පරවාදයන්ට නිග්‍රහ කරණු පිණිස මතු අනාගතයෙහි වසන සර්වඥපුත්‍රයන්ට ප්‍රඥඇසක් දෙවා වදළ මැනැවැ'' යි කීහ.

එකල අලාමක ඥාණ ගති ඇති නාගසෙන තෙරුන් වහන්සේ වදරණ සේක්:— ''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ අනුපාද නිර්වාණධාතුවෙන් පිරිනිවන් පා වදළසේක. ඒ පිරිනිවි භාග්‍යවතුන් වහන්සේ පූජාසත්කාර නො ඉවසනසේක. ප්‍රථමබොධිමූලයෙහි දී ම තථාගතයන් වහන්සේගේ ආලය කොට ගන්නා ආසාතොම ප්‍රහීණ වන ලද්දී ය. දූන් වනාහි අනුපාදිශෙෂනිර්වාණධාතුවෙන් පිරිනිවන් පැ වදළ බුදුරජානන් වහන්සේගේ ඉවසීමක් නැතිබව කියනු ම කවරේ ද? මහරජානෙනි, මෙම කාරණය සාරී නම් බ්‍රාහ්මණදේවීන්ගේ පුත්‍ර වූ සද්ධර්ම-සේනාධිපති වූ අග්‍රශ්‍රාවක වූ මහාතෙර සාමීන් වහන්සේ විසින් වදරණ ලද්දේ ය. 'සදිව්‍යමනුෂ්‍යයන් විසින් අසමසම වූ සර්වඥ වරයෝ පුදනු ලබන්නාහු ය. ඒ සර්වඥවරයෝ ඒ පූජාසත්කාරය ආලයක් කොට නො ඉවසති. අනන්ත වූ බුදුවරයන්ගේ මේ ධර්මතාවකැ'' යි වදළසේක.

**''පූජියන්තා[1] අසමසමා-සදෙවමානුසෙහි තෙ,**
**න සාදියන්ති සක්කාරං-බුද්ධානං එස ධම්මතා''** යි.

ඒ අසා මිලිඳු මහරජානෝ කියන්නාහු:— ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පුත්‍රතෙම හෝ පියානන්ගේ ගුණ කියන්නේ ය. පියානෝ හෝ තමාගේ පුත්‍රයන්ගේ ගුණ කියන්නාහ. පරවාදයන්ගේ නිග්‍රහයට මේ බව කාරණයක් නො වන්නේ ය. සැරියුත් මහතෙරුන් වහන්සේ කී මේ කාරණය බුදුන් කෙරෙහි ප්‍රීතියෙන් කළ ප්‍රසාදය ප්‍රකාශ කිරීම නම් වන්නේ ය. **(102)** වහා ම නුඹ වහන්සේ මට ඒ උභතොකොටිකප්‍රශ්න-යෙහි ලා ස්වකීය වූ ශාසනවාදයාගේ ප්‍රතිෂ්ඨාව පිණිසත් දෘෂ්ටිජාලයාගේ දහ හැරීම පිණිසත් අනික් කාරණයක් මනා කොට වදළ මැනැවැ'' යි කීහ. එකල ප්‍රවරගණීන්ද්‍ර ගම්භීරධීසාගර[2] පාරප්‍රාප්ත වූ නාගසෙන ථෙර ස්වාමීන් වහන්සේ කියන සේක්:—

1. පූජයන්ති 2 ධීර සාගර



Non-Commercial Distribution

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ වදළසේක. භාග්‍යවතුන් වහන්සේ ලොකයාගේ පූජාසත්කාරයත් නො ඉවසනසේක. නො ඉවසන්නා වූ ම තථාගතයන් වහන්සේගේ ශාරීරික පාරිභොගික වූ ධාතුරත්නය දිව්‍යමනුෂ්‍යයෝ ප්‍රතිෂ්ඨා කොට ගෙණ තථාගතයන් වහන්සේගේ බුද්ධඥාන නමැති රත්නය අරමුණු කොට ගෙණ මනා කොට ප්‍රතිපත්තිය සෙවනය කරන්නාහු ත්‍රිවිධ වූ සම්පත්තීන් ම ලබන්-නාහු ය. 'මහරජානෙනි, යම් සේ මහත් වූ මහගිනිකඳෙක් දිලියෙමින් ඇවිළ තෙමේ නිවී ගියේ වී නම්, කිමෙක් ද, ''මහරජානෙනි, ඒ මහා අග්නිස්කන්ධයතෙම තෘණ කාෂ්ඨ කඩ පෙනෙලි ආසාවෙන් ඉවසන්නේ වේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ඒ මහාඅග්නිස්කන්ධයතෙම ඇවිළෙමින් සිටත් තෘණ කාෂ්ඨ උපාදනයන් ආසාවකින් නො ඉවසන් නෝ ය. කිමෙක් ද, එසේ කල නිවී ගියා වූ උපශාන්ත වූ අචෙතන ඒ ගිනිකඳ තෘණාදිය ඉවසන්නෝ වේ ද.

''මහරජානෙනි, එහි වනාහි ගිනිකඳ නිරුද්ධ ව නිවී උපශාන්ත වූ කල්හි ලොකයෙහි අග්නි ශූන්‍ය වේ ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, කාෂ්ඨය, අග්නියගේ ඉපදීමට කාරණ වන්නේ ය. ගැණීම වන්නේ ය. ගිනි කැමැත්තා වූ යම් කිසි මනුෂ්‍යකෙනෙක් ඇද් ද, ඒ මනුෂ්‍යයෝ තමන්ගේ ශක්තිබල වීර්යයෙන් ම, තමා තුළ වූ පුරුෂ-කාරයෙන් ද, කාෂ්ඨය මථනය කොට ගිනි උපදවා ගෙණ ඒ ගින්නෙන් කට යුතු වූ කර්මාන්තයන් කරන්නාහු ය'' යි කීහ.

''මහරජානෙනි, එසේ වී නම්, නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේට කරණ ලද අධිකාර නම් වූ පූජාසත්කාරයතෙම වඳ වන්නේ ය. සිස් වන්නේ ය. නිෂ්ඵල වන්නේ ය යි කියන්නා වූ මිත්‍ථ්‍යාදෘෂ්ටීන්ගේ වචනය මිථ්‍යා වන්නේ ය. තුච්ඡ වන්නේ ය. සිස් වන්නේ ය. මහරජා නෙනි, යම් සේ මහත් වූ අග්නිස්කන්ධයතෙම දිලියෙමින් ඇවිළෙන්-නේ වේ ද එපරිද්දෙන් ම අප භාග්‍යවතුන් වහන්සේ දශසහශ්‍රීලොක ධාතුයෙහි අනන්ත වූ බුද්ධශ්‍රීන් දිලිහුනුසේක. මහරජානෙනි, යම් සේ අග්නිස්කන්ධයතෙම දිලිහී ගොස් නිවී ගියේ වේ ද, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ දශසහශ්‍රීලොකධාතුයෙහි බුද්ධශ්‍රීයෙන් දිලියෙමින් අනුපාදිසෙස වූ නිර්වාණධාතුවෙන් පිරිනිවන් පෑ වදළසේක. මහරජා නෙනි, යම් සේ නිවී ගියා වූ මහාඅග්නිස්කන්ධයතෙම තෘණ කාෂ්ඨ නො ඉවසා ද, එපරිද්දෙන් ම ලොකයාහට හිත වැඩ කැමැත්තා වූ තථාගතයන් වහන්සේ ඉවසන ආසාතොම ප්‍රහීණ වූවා ය. උපශාන්ත වූවා ය. මහ රජානෙනි, යම් සේ ගිනි කැමැති මනුෂ්‍යයෝ නිවී ගියාවූ අග්නිස්කන්ධයෙහි උපාදන නම් ගැණීමක් නැති කල්හි තමන්ගේ ථාමබලවීර්යයෙන් තමා තුළ වූ පුරුෂකාරයෙන්[2] ගිනි ගානා කාෂ්ඨ මථනය කොට ගිනි උපදවා ඒ ගින්නෙන් කට යුතු වූ කර්මාන්තයන් කරන්නාහු ය. (103) එපරිද්-

1 ඊට සතුරුවූ පවවත්ත පුරිෂකාර-පාළි

2 කාෂ්ඨයට සතුරු වූ පුරුෂාකාරයෙන් 'පච්චවත්ත පුරිස කාරෙන'–පාළි

Non-Commercial Distribution

දෙන් ම දිව්‍යමනුෂ්‍යයෝ ද පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේගේ ධාතුරත්නය ප්‍රතිෂ්ඨා කොට ගෙණ තථාගතයන් වහන්සේගේ ඥනරත්නය අරමුණු කොට ගෙණ මනා කොට ම ප්‍රතිපත්තිය සෙවනය කරන්නාහු ය. ත්‍රිවිධ වූ දිව්‍යමනුෂ්‍යනිර්වාණසම්පත් ලබන්නාහු ය. මහරජානෙනි, මේ කාරණයෙනුත් පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේට කරණ ලද අධිකාරයතෙම අවඳ වන්නේ ය. අනන්තඵල දෙන බැවින් සඵල වන්නේ ය.

''මහරජානෙනි, අනිකුදු ඉතිරි කාරණයක් ඇත. යම් කාරණයකින් පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේට කරණ ලද සත්කාරයතෙම අවඳ වේ ද, සඵල වේ ද, ඒ කාරණයත් ඇසුව මැනැව. මහරජානෙනි, යම් සේ මහත් වූ වාතයතෙම නොයෙක් වෘක්ෂලතාදිය තළවා වැතිර ගොස් වළක්නේ වී නම්, කිමෙක් ද? මහරජානෙනි, ඒ වැළකුනා වූ වාතයතෙම නැවත ඉපදවීමක් ආසාවකින් ඉවසා ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, වැළකුනා වූ වාතයාගේ නැවත උත්පත්තිය පිණිස ආභොගයෙක් හෝ මනස්කාරයෙක් හෝ නැත්තේ ය. ඊට කාරණා කවරේ ද? යත්:— ඒ වායොධාතුතෙම සිත් නැත්තේ ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, වැළකුනා වූ ඒ වාතයාගේ නැවත වාතය[1] යි යන සංඥව නැති වේ ද'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, තල්වැට විධූපනාදීහු ඒ වාතයාගේ උත්පත්තියට ප්‍රත්‍යය වන්නාහු ය. උෂ්ණයෙන් තැවුනා වූ පරිළාහයෙන් පීළිත වූවා වූ යම්කිසි මනුෂ්‍ය කෙනෙක් ඇද් ද, ඒ මනුෂ්‍යයෝ තාලවණ්ටයකින් හෝ සතරැස් පවන් පතකින් හෝ තමන් ශක්තිබලවීර්යයෙන් ප්‍රත්‍යාත්මපුරුෂකාර[2]යෙන් වාතය උපදවා ගෙණ ඒ වාතයෙන් උෂ්ණය නිවන්නාහු ය. පරිළාහය ව්‍යුපශමනය කරන්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ කාරණයෙන් 'නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේට කරණ ලද සත්කාරයතෙම වඳ වන්නේ ය. නිෂ්ඵල වන්නේ ය' යි කියන්නා වූ මිථ්‍යාදෘෂ්ටීන්ගේ වචනය මිථ්‍යා වන්නේ ය. බොරු වන්නේ ය.

''මහරජානෙනි, යම් සේ මහත් වූ මහවාතයතෙම හමා පැතිර ගියේ වේ ද, එපරිද්දෙන් ම අප භාග්‍යවතුන් වහන්සේ දශසහශ්‍රීලොකධාතුවෙහි ශීතල මධුරතර ශාන්ත සුඛුම මෛත්‍රිවාතයෙන් පැතිර[3] වදළසේක. මහරජානෙනි, යම් සේ මහත් වූ වාතය තෙම පැතිර ගොස් වැළැක්කේ වේ ද, එපරිද්දෙන් ම අප භාග්‍යවතුන් වහන්සේ සීතලමධුරතරශාන්ත ප්‍රණීතසුඛුම මෛත්‍රිවාතයෙන් තුන් ලෝ පතුරුවා හමා අනුපාදිශෙස වූ නිර්වාණධාතුවෙන් පිරිනිවුනුසේක. මහරජානෙනි, යම් සේ වැළකුනා වූ වාතය තෙම නැවත ඉපදීමක් නො ඉවසා ද, එපරිද්දෙන් ම ලොකහිත වූ සර්වඥයන් වහන්සේගේ සාදියනාතොම ප්‍රහීණ වූවා ය. ව්‍යුපශාන්ත වූවා ය. මහරජානෙනි, යම් සේ ඒ මනුෂ්‍යයෝ උෂ්ණාභිතප්ත වූ ද, පරිළාහ ප්‍රපීඩිත වූ ද, එපරිද්දෙන් ම දිව්‍යමනුෂ්‍යයෝ රාගද්වෙෂමොහත්‍රිවිධාග්නි

1. වාතය යි කියා සංඥව වැටහේ 2. උෂ්ණාදියට සතුරු පුරුෂාකාර 3. පතුරුවා

Non-Commercial Distribution

සන්තාප පරිදහ ප්‍රපීඩිත වූවාහු ය. යම් සේ තාලවණ්ටය හා විධූපන නම් සිවුරුස් පවන්පත් ආදිය වාතයාගේ ඉපදීම පිණිස ප්‍රත්‍යයෝ වෙද් ද, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේගේ ශාරීරික පාරිභොගික ධාතු රත්නය ද (104) සර්වඥතාඥනරත්නය ද ත්‍රිවිධසම්පත්තීන්ගේ ප්‍රතිලාභය පිණිස ප්‍රත්‍යය වන්නේ ය. යම් සේ උෂ්ණාභිතප්ත ග්‍රීෂ්ම ප්‍රපීඩිත වූ මනුෂ්‍යයෝ තාලවණ්ටයෙන් හෝ විධූපනයෙන් හෝ වාතය උපදවා උෂ්ණය නිවා ගණිද් ද, පරිළාහව්‍යුපශමනය කෙරෙද් ද, එපරිද්දෙන් ම දිව්‍යමනුෂ්‍යයෝ පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේගේ ධාතුරත්නය ද ඥනරත්නය ද යථා ශක්තීන් පුදා කුසල් උපදවා ගෙණ ඒ කුසලයෙන් රාගද්වෙෂමොහත්‍රිවිධාග්නිසන්තාප උෂ්ණය නිර්වාපණය කෙරෙති. පරිළාහය ව්‍යුපශමනය කෙරෙති. මහරජානෙනි, මේ කාරණයෙනුත් පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේට කළ සත්කාරය අවඥ වන්නේ ය. සඵල වන්නේ ය.

''මහරජානෙනි, අනිකුත් ඉතිරි කාරණයක් ඇසුව මැනැව. පරවාදීන්ට නිග්‍රහ පිණිස ය. මහරජානෙනි, යම් සේ පුරුෂයෙක් භෙරිය ආකොටනය කොට ශබ්දය උපදවන්නේ ය. ඒ පුරුෂයා විසින් උපදවන ලද්දා වූ යම් භෙරිශබ්දයෙක් ඇද් ද, ඒ ශබ්දයතෙම අන්තර්ධාන වන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ බෙරශබ්දය නැවත උත්පාදනයක්[1] ඉවසන්නේ වේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, ඒ ශබ්දයතෙම අන්තරහිත වූයේ ය. ඒ ශබ්දයාගේ පුනරුත්පාදය පිණිස ආභොගයක් හෝ මනස්කාරයෙක් හෝ නැත්තේ ය. එකවරක් උපන්නා වූ භෙරි ශබ්දය අන්තර්ධාන වූ කල්හි ඒ භෙරිශබ්දය හාත්පසින් සිඳුනේ ම වෙයි. ස්වාමීනි, ශබ්දයාගේ ඉපදීම පිණිස භෙරිහු වනාහි ප්‍රත්‍යය වන්නාහ. නැවත පුරුෂතෙම කරුණක් ඇති කල්හි ආත්මජ වූ වීර්යයෙන් භෙරිය ආකොටනය කොට ශබ්දය උපදවන්නේය.' ''මහරජානෙනි, එපරිද්දෙන් ම අප භාග්‍යවත් වූ සර්වඥයන් වහන්සේ තමන්ගේ ශීලසමාධි ප්‍රඥ විමුක්ති විමුක්තිඥනදර්ශනයෙන් වැඩුනා වූ ධාතුරත්නය ද ධර්මවිනය ද අනුශාසනාව ද තමන් වැනි ශාස්තෘවක් කොට තබා වදරමින් තෙමේ අනුපාදිසෙස වූ නිර්වාණධාතුවෙන් පිරිනිවන් පෑ වදාළසේක. පිරිනිවියා වූ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සම්පත්ති ලාභයතෙම සිඳී ගියේ ය. සංසාරභවදුක්ඛයෙන් පීඩිත ව වෙහෙසුනා වූ සත්වයෝ ධාතුරත්නය ද, ධර්මවිනය ද, අනුශාසනාව ද ප්‍රත්‍යය කොට ගෙණ යථාශක්තීන් පුදා ත්‍රිවිධ වූ සම්පත් කැමැත්තාහු ඒ සම්පත්තීන් ලබන්නාහු ය. මහරජානෙනි, මෙම කාරණයෙනුත් පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේට පූජාසත්කාර වශයෙන් කරණ ලද අධිකාර කෘත්‍යතෙම අවඥ වන්නේ ය. සඵල වන්නේ ය. මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අනාගත කාලය දක්නා ලද්දේ ය. කථනය කරණ ලද්දේ ය. කියන ලද්දේ ය. සිහි කොට වදරණ ලද්දේ ය.

1. උපාදනයක්

Non-Commercial Distribution

**''සියා ඛො පනානන්ද තුම්හාකං එවමස්ස'අතීතසත්ථුකං පාවචනං,නත්ථි නො සත්ථා'ති. න ඛො පනෙතං ආනන්ද එවං දට්ඨබ්බං. යො වො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්ථා'' ති.**

**(105)** යනාදීන් ''ආනන්දයෙනි, තොපට වනාහි 'අතීත ශාස්තෘක වූ බුද්ධ වචනයක් ඇත. 'අපගේ ශාස්තෘන් වහන්සේ මෙකලට නැතැ' යි කියා මෙසේ සිතක් වන්නේ වේ ද, ආනන්දයෙනි, මේ කාරණය මෙසේ නො දත යුත්තේ ය. ආනන්දයෙනි, තොපට මා විසින් යම් ධර්මයෙක් විනයෙක් දෙශනා කරණ ලද ද, පණවන ලද්දේ වේ ද, ඒ ධර්මවිනයතෙම මාගේ ඇවෑමෙන් තොපට අනුශාසනා කරණ ලොවුතුරා ශාස්තෘකෙනෙකැ'' යි කියා වදළසේක. මේ කාරණයෙන්, මහරජානෙනි, පිරිනිවියාවූ කිසිවක් නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේට කරණ ලද්ද වූ පූජාසත්කාරය තෙම වඳ වන්නේ ය, නිෂ්ඵල වන්නේ ය යි කියන්නා වූ තීර්ථකයන්ගේ ඒ වචනය මිථ්‍යා වන්නේ ය. අභූත වන්නේ ය. මුසාවාද වන්නේ ය. විරුද්ධ වන්නේ ය, විපරීත වන්නේ ය, දුක් වන්නේ ය, දුඃඛවිපාක වන්නේ ය, අපායගමනීය[1] වන්නේ ය.

මහරජානෙනි, අනිකුත් ඉතිරි කාරණයක් ඇත. යම් කාරණයකින් පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේට කරණ ලද අධිකාරය තෙම අවඳ වේ ද, සඵල වේ ද, ඒ කාරණයත් ඇසුව මැනව. මහරජානෙනි, මේ මහාපෘථිවිතොම 'සියලු ම බීජජාතීහු මා කෙරෙහි හට ගණිත්ව' යි කියා ඉවසා ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, එසේ වී නම් කුමක් පිණිස ඒ බීජජාතීහු නො ඉවසන්නා වූ මහාපෘථිවියෙහි හට ගෙණ දෑඩි වූ මුලින් හා ඔබ්නොබ වැලඳි ජටාවෙන් ප්‍රතිෂ්ඨිත වූ කඳන් අරටු ශාඛාවෙන් හාත්පසින් විස්තීර්ණ ව පුෂ්පඵලධරයෝ වෙද් ද?'' යි විචාළසේක. 'ස්වාමීනි, මහා පෘථිවිතොම නො ඉවසන්නී වී නමුත් ඒ නොයෙක් බීජජාතීන්ට ප්‍රතිෂ්ඨා ධාර වන්නී ය. අංකුරයන්ගේ නැඟීම පිණිස ප්‍රත්‍යය දෙන්නී ය. ඒ බීජ ජාතීහු ඒ පෘථිවිප්‍රතිෂ්ඨාව කරණ කොට ගෙණ ඒ දෙන ප්‍රත්‍යය කරණ කොට ගෙණ හට ගෙණ දෑඩි වූ මූල ජටා ප්‍රතිෂ්ඨිත වූවාහු කඳන් අරටු ශාඛාවෙන් හාත්පසින් විස්තීර්ණ වූවාහු පුෂ්ඵපලධරයෝ වෙති''යි කීහ. ''මහ රජානෙනි, එසේ වී නම් ඉදින් 'නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේට කරණ ලද අධිකාරය වඳ වන්නේ ය, අඵල වන්නේ ය' යි කියා විරුද්ධ වූ ඒ මිත්‍ථ්‍යාවන් කියත් නම්, තීර්ථකයෝ තමන්ගේ ස්වකීය වූ මිත්‍ථ්‍යා වාදයෙහි පැරද්දහු වෙති. නස්නා ලද්දහු වෙති. මහරජානෙනි, යම් සේ මහාපෘථිවිය ද එපරිද්දෙන් තථාගත වූ අර්හත් සම්‍යක් සම්බුද්ධසර්වඥයන් වහන්සේ දත යුත්තේ ය. මහරජානෙනි, යම් සේ මහාපෘථිවිතොම කිසිවක් නො ඉවසා ද, එපරිද්දෙන් තථාගතයන් වහන්සේ කිසිවක් නො නො ඉවසනසේක. මහරජානෙනි, යම් සේ ඒ බීජජාතීහු පෘථිවිය නිසා

1. අපායගාමිනී

Non-Commercial Distribution

හට ගෙණ දළ්හ මූල ජටා ප්‍රතිෂ්ඨිතවූවාහු බන්ධ සාර ශාඛාවන් විස්තීර්ණ වූවාහු පුෂ්පඵලධරයෝ වෙද් ද, එපරිද්දෙන් දිව්‍යමනුෂ්‍යයෝ පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා ම වූ තථාගතයන් වහන්සේගේ ධාතුරත්නය හා ඥානරත්නය කරණ කොට ගෙණ පොළෝ යට එරා බැසී දූඩි වූ මූල් නමැති අලොභාද්වෙෂාමොහකුශලමූලයෙන් පිහිටන ලද්දහු ය. සමාධි නමැති වෘක්ෂස්කන්ධයන් හා සද්ධර්ම නමැති අරටු ඇති සතර සංවරශීල නමැති ශාඛාප්‍රශාඛාවෙන් විස්තාර ව පතළාහු ය. පඤ්චවිධවිමුක්ති නමැති පඤ්චවර්ණ (106) පුෂ්පයෙන් හා ශ්‍රාමණ්‍යමාර්ගඵල නමැති අමෘත ඵලධරයෝ වෙති. මහරජානෙනි, මෙම කාරණයෙනුත් පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා ම වූ තථාගතයන් වහන්සේට කරණ ලද අධිකාරය තෙම අවඳ වන්නේ ය, සඵල වන්නේ ය.

''මහරජානෙනි, අනිකුත් ඉතිරි කාරණයෙක් ඇත. යම් කාරණයකින් පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා ම වූ තථාගතයන් වහන්සේට කරණ ලද අධිකාරයතෙම අවඳ වේ ද, සඵල වේ ද, ඒ කාරණයත් ඇසුව මැනැව. මහරජානෙනි, ඔටුවෝ ය, වෘෂභයෝ ය, ගද්‍රභයෝ ය, එළුවෝ ය, ගවයෝ ය, මනුෂ්‍යයෝ ය යන මොවුහු තමන්ගේ ඇතුළු කුක්ෂියෙහි පණුවන්ගේ සම්භව වීම ආලය කොට ඉවසන්නාහු දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, ඒ පණුවෝ කුමක් පිණිස නො ඉවසන්නා වූ ඔවුන්ගේ ඇතුළු කුක්ෂියෙහි ම සම්භව ව ඉපද බොහෝ දරුමුනුබුරන් හා විපුලභාවයට පැමිණෙන්නාහු දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, අකුශලකර්මයාගේ බලවත් බැවින් නො ඉවසන්නා ම වූ ඒ සත්වයන්ගේ ශරීරය ඇතුළෙහි පණුවෝ හට ගෙණ බොහෝ දරුමුනුබුරන් හා විපුලභාවයට පැමිණෙන්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා ම වූ තථාගතයන් වහන්සේගේ ධාතුරත්නයාගේ ද බුද්ධඥානරත්නයාගේ ද බලවත් බැවින් තථාගතයන් වහන්සේ කෙරෙහි කරණ ලද අධිකාරය අවඳ වන්නේ ය. සඵල වන්නේ ය.

''මහරජානෙනි, අනිකුත් ඉතිරි කාරණයෙක් ඇත. යම් කාරණයකින් පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා ම වූ තථාගතයන් වහන්සේට කරණ ලද අධිකාරයතෙම අවඳ වේ ද, සඵල වේ ද, ඒ කාරණයත් ඇසුව මැනැව. මහරජානෙනි, මේ මනුෂ්‍යයෝ 'අටඅනූවක් පමණ රෝගයෝ අපගේ මේ ශරීරයෙහි උපදිත්ව' යි කියා කැමැති ව ඉවසන්නාහු දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, ඒ අටානූවක් පමණ රෝගයෝ කුමක් පිණිස නො ඉවසන්නා වූ ඒ මනුෂ්‍යයන්ගේ ශරීරයෙහි පතිත ව උපදින්නාහු දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, පූර්ව ජාතියෙහි කළ දුශ්චරිතයාගේ විපාකයෙන් රෝගයෝ උපදිති'' යි කීහ. ''මහරජානෙනි, ඉදින් පූර්වජාතියෙහි කරණ ලද අකුශලකර්මය මේ ආත්මයෙහි දී විඳීම වේ නම්, මහරජානෙනි, ඒ කාරණයෙනුත් පූර්ව

Non-Commercial Distribution

ජාතියෙහි කරණ ලද්ද වූත් මේ ජාතියෙහි කරණ ලද්ද වූත් කුශලාකුශල කර්මය අවඥ වන්නේ ය. සඵල වන්නේ ය. මහරජානෙනි, මෙම කාරණයෙනුත් පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා ම වූ තථාගතයන් වහන්සේට කරණ ලද අධිකාරය තෙම අවඥ වන්නේ ය. සඵල වන්නේ ය.

''මහරජානෙනි, '**නන්දක** නම් යක්ෂතෙම **සැරියුත්** මහතෙරුන් වහන්සේට අපසාදනය කොට අතින් පහරක් ගසා ඒ අකුශලකර්මයෙන් පෘථිවිය පළා ගෙණ අවීචියට ගියේ ය' යි කියා තොප විසින් අශ්‍රුතපූර්ව වී ද? අසන ලද්දේ දෑ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, අසන ලද්දේ ය. ලොකයෙහිත් මේ බව ප්‍රකට ය'' යි කීහ. ''කිමෙක් ද, මහ රජානෙනි, **සැරියුත්** මහතෙරුන් වහන්සේ **නන්දක** යක්ෂයාගේ මහා පෘථිවි ගැලීම කැමැති ව **(107)** ඉවසූසේක් දෑ?'' යි විචාළසේක. ''අනේ! ස්වාමීනි, දෙවියන් සහිත වූ ලොකය නැති ව අභාවයට යන්නේ වී නමුත් චන්ද්‍රසූර්යයෝ පෘථිවියෙහි වැටී යන්නාහු වූ නමුත්, මහමෙරුපර්වත රාජයා විසිර යන්නේ වී නමුත්, සැරියුත්මහතෙරුන් වහන්සේ අනුන්ට වන දුකක් සතුටින් නො ඉවසනසේක. ඊට කාරණ කවරේ ද? යත්:— යම් හෙතුවකින් **සැරියුත්** මහතෙරුන් වහන්සේ කිපෙනසේක් වී නම්, චිත්තදූෂණය වනසේක් වී නම්, ඒ කිපෙන කාරණය තෙම සැරියුත් මහ තෙරුන් වහන්සේ විසින් නසන ලද්දේ ය. අර්හත්මාර්ගශස්ත්‍රයෙන් සිඳ හරණ ලද්දේ ය. ස්වාමීනි, ඒ හේතුන් නසා හැරිය බැවින් සැරියුත් මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේගේ ජීවිතය නසන්නවුන් කෙරෙහිත් කොපයක් නො කරණසේකැ'' යි කීහ. ''ඉදින් මහරජානෙනි, **සැරියුත්** මහතෙරුන් වහන්සේ **නන්දක** නම් යක්ෂයාගේ පෘථිවියෙහි ගැලීයාම නො ඉවසූසේක් වී නම්, කුමක් පිණිස වනාහි **නන්දක** නම් යක්ෂතෙම පෘථිවියට ප්‍රවිෂ්ට වූයේ වී දෑ?'' යි විචාළසේක. ''ස්වාමීනි, මූ කළ අකුශල කර්මයාගේ බලවත් බැවිනැ'' යි කීහ. ''මහරජානෙනි, ඉදින් අකුශල කර්මයාගේ බලයෙන් **නන්දක** නම් යක්ෂතෙම පෘථිවියෙහි ගැලී ප්‍රවිෂ්ට වූයේ වී නම්, සිතින් නො ඉවසන්නාහටත් කරණ ලද අපරාධයතෙම අපායෙහි ම හෙළන බැවින් අවඥ වන්නේ ය. නොයෙක් දුක් විඳුවන බැවින් සඵල වන්නේ ය. මහරජානෙනි, එහෙයිනුත් කුශලකර්මයාගේ බලවත් බැවිනුත් නො ඉවසන්නාහටත් කරණ ලද අධිකාරයතෙම දෙව් ලොව උපදවන බැවින් අවඥ වන්නේ ය. නොයෙක් සැප විඳුවන බැවින් සඵල වන්නේ ය. මහරජානෙනි, මේ කාරණයෙනුත් පිරිනිවියා වූ කිසිවක් නො ඉවසන්නා වූ තථාගතයන් වහන්සේට කරණ ලද අධිකාරයතෙම අවඥ වන්නේ ය. සඵල වන්නේ ය.

''මහරජානෙනි, දැන් මේ බුද්ධොත්පාදයෙහි යම් මනුෂ්‍යකෙනෙක් පෘථිවියට ප්‍රවිෂ්ට වූවාහු ද, ඒ පොළව පළා ගෙණ අපායට ගියාහු කෙතෙක් දෙන ද? ඒ පෘථිවිප්‍රවිෂ්ට වූ කාරණයෙහි තොපගේ ඇසීමෙක් ඇද් දෑ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, මා විසින් අසන ලද්දේ ය'' යි කීහ.

''මහරජානෙනි, එසේ වී නම්, තෙපි මට අස්වා ලව'' යි කීසේක. ''ස්වාමීන් වහන්ස, **චිඤ්චාමාණවිකාවෝ** ය, **සුප්‍රබුද්ධශාක්‍යයෝ** ය, **දෙවදත්ත** තෙරණුවෝ ය, **නන්දක** නම් යක්ෂයා ය, **නන්දක** නම් මාණවකයා ය යන මේ පස්දෙන මහාපෘථිවිය ද පළාගෙණ අපායට ගියාහු ය'' යි කියා මා විසින් මෙම කාරණය අසන ලද්දේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ පස්දෙන කවර කෙනෙකුන් කෙරෙහි අපරාධ කළාහු දූ?'' යි විචාළසේක. ''ස්වාමීනි, බුදුන් කෙරෙහිත් ශ්‍රාවකයන් කෙරෙහිත් අපරාධ කළාහු ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ හෝ ශ්‍රාවකයන් වහන්සේලා හෝ මේ පස්දෙනාගේ මහාපෘථිවි ප්‍රවේශය ඉවසූවාහු දූ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, එසේ වී නම්, 'පිරිනිවන් පෑ වදළාවූ කිසිවක් නො ඉවසන්නා ම වූ තථාගත වූ අප බුදුරජානන් වහන්සේට තුන්ලෝවාසීන් විසින් කරණ ලද්දූ වූ පූජාසත්කාරයතෙම වඳ වන්නේ ය. සිස් වන්නේ ය. (108) අඵල වන්නේ ය'' යි කියා මෙසේ දෘෂ්ටිවාදයෙන් 'ඉදින් බුදුරජ තෙම ලොකයාගේ පූජාව ඉවසනසේක් නම් නිවන් නො දූක සත්ව ලොකයෙහි ම හිඳිනාසේක. ඔහට කළ පූජායෙන්[1] කම් කිම් ද? 'ඉදින් සත්වලොකයා කෙරෙන් මිදී නිවන් දූක්කසේක් නම්, ඒ සත්වලොකයෙහි නැති බැවින් නො ඉවසන බුදුරජහට කළ පූජායෙනුත්[1] කමෙක් නැතැ''යි කියා දෙකෙළවරක් අල්වා මේ උභතොකොටික ප්‍රශ්නය විචාළ මිලිඳු රජහට යම්සේ දඹ කනු කැමැති දෙහලිකපුරුෂයෙකුහට සියක් යොදුනක් උස ඇති අමෘතඵලහරිතමහාදඹවෘක්ෂය සොලවාලූ කලක් මෙන් තමන් වහන්සේගේ ශ්‍රුතාන්තබුද්ධින් අනෙකප්‍රකාර උපමා ගෙණ හැර දක්වා රජහුගේ දෘෂ්ටිය ප්‍රලය කොට විධ්වංසනය කර වදළසේක.

එකල මිලිඳු මහරජානෝ ප්‍රීතිවේගයෙන් පිණා ගොස් දෙහොත් මුදුනෙහි තබා ගෙණ ''සාධු! සාධු!! ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, නුඹ වහන්සේ විසින් මේ ගම්භිර වූ ප්‍රශ්නයතෙම යහපත් කොට අවබොධ කරවන ලද්දේ ය. ප්‍රකාශ කර වදරණ ලද්දේ ය. රක්ෂා කට යුතු වූ රහසක් ප්‍රකාශ කරණ ලද්දේ ය. දෘෂ්ටිගැටය බිඳ හරණ ලද්දේ ය. දෘෂ්ටිග්‍රහණය නො ගැන්ම කරණ ලද්දේ ය. එහෙයින් ප්‍රවරගණීන්ද්‍රභූත වූ නුඹ වහන්සේ කරා පැමිණ පරවාදයෝ නෂ්ට වූහ. මිථ්‍යාදෘෂ්ටිහු භග්න වූහ. අන්‍ය ලබ්ධි ගත් ලාමක වූ තීර්ථකයෝ හිරු දුටු කද්‍යෝපැණියන් සෙයින් නිෂ්ප්‍රභ වූවාහු ය'' යි කියා ප්‍රශංසා කළහ.

**පූජා අප්‍රතිග්‍රහණ ප්‍රශ්නය නිමි**

---

# ආවර්ජනාප්‍රතිබද්ධප්‍රශ්නය

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, බුදුරජානන් වහන්සේ සියල්ල දන්නාසේක් දූ?'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජා

1. පූජායෙහිත්

Non-Commercial Distribution

නෙනි, අප භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සියල්ල දන්නාසේක. එතෙකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥතාඥනදර්ශනය නිරන්තරයෙන් එළඹ සිටින්නේ නො වෙයි. භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥතාඥනය ආවර්ජනාව ප්‍රතිබද්ධ කොට ඇත්තේ ය. ඉදින් කැමැති දෙයක් ආවර්ජනා කොට බලා දැන වදරණසේකැ'' යි කීසේක. එහෙයින් ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, ඉදින් ඒ තථාගතයන් වහන්සේගේ සොයා දැනීමෙන් සර්වඥතාඥනය වේ නම්, බුදුරජතෙම අසර්වඥසේකැ'' යි කීහ. ''මහරජානෙනි, ඒ බුද්ධඥනය අප ලොවුතුරාබුදුන්ගේ අතිතීක්ෂ්ණ වූ චිත්තය අනු ව ම පවත්නේ ය. ඒ බව දක්වා පියන්නට ඉතා දුෂ්කර වන්නේ ය. එතෙකුදු වුවත් මඳකින් කියම්හ:—

''මහරජානෙනි, සතරනැළියක් ගන්නා ලාස්සෙන් වී තිස් දැමුණෙක් යාළෙක. එහි වී ඇට සකොටිතිස්තුන්ලක්ෂසැටදහසක් වන නියායෙන් බ්‍රීහින්ගේ එක්සිය පණස් යාළ සතමුණු දෙලාසෙක. මෙතෙක් වියෙහි වී ඇට එක අසුරුසනක් පමණ කාලයෙහි ප්‍රවෘත්ත ව පෙරළී උපදනා චිත්තයාගේ ගණනට ලක් තබන කල්හි ක්ෂයට ඌනත්වයට යන්නාහු ය. ඒ අසුරුසනක් කාලයෙහි මේ මේ සප්තවිධචිත්තයෝ ප්‍රවෘත්ත වන්නාහු වෙති. මහරජානෙනි, රාග සහිත වූ, ද්වේෂ සහිත වූ, මොහ සහිත වූ, ක්ලේශ සහිත වූ, මාර්ගඵලප්‍රතිලාභය **(109)** පිණිස නො වැඩූ ශරීර[1] ඇත්තා වූ ක්ලේශනිර්වාපණය පිණිස නො වැඩූ ශීලයන් ඇත්තා වූ, මාර්ගසමාධිය පිණිස චිත්තයාගේ වැඩීමක් නැත්තා වූ, විදර්ශනාප්‍රඥවගේ වැඩීමක් නැත්තා වූ යම් ඒ බාලපෘථග්ජනසත්වකෙනෙක් ඇද්ද, ඔවුන්ගේ ඒ ප්‍රථමචිත්තය ඉතා මඳ ව උපදනේ ය. ප්‍රමාද ව පවත්නේ ය.

ඊට කාරණා කවරේ ද?—සමථවිදර්ශනාභාවනාචිත්තයාගේ භාවිතාවක් නැති බැවිනි.

''මහරජානෙනි, යම් සේ හුණපඳුර හා ඔබිනොබ වැලඳ ගත්තා වූ හුණගැට වැඩීමෙන් විශාල වූ, හාත්පසින් විස්තීර්ණ වූ, ඔවුනොවුන් හා හිවී ගැවසී මැසෙන ලද්ද වූ, හුණශාඛා අවුලෙන් වැලඳ ගත්තා වූ කපා වැර ගසා අදින ලද්ද වූ, මහහුණවෘක්ෂයාගේ ඇදී එන ගමන දන්ධ වන්නේ ය. ප්‍රමාද වන්නේ ය. ගරුක වන්නේ ය. නො ඇදීම බලවත් වන්නේ ය. ඊට කාරණා කවරේ ද? යත්:- හුණ ගැටපත් ශාඛාවන්ගේ ඔබිනොබ ගෙතී මැහුණ බැවින් නො ඇදෙන්නේ ය.

''මහරජානෙනි, එපරිද්දෙන් ම රාග සහිත වූ, ද්වේෂ සහිත වූ, මොහ සහිත වූ, ක්ලේශ සහිත වූ, අභාවිතකාය ඇත්තා වූ, අභාවිතසිල් ඇත්තා වූ, අභාවිත චිත්තය ඇත්තා වූ, අභාවිත ප්‍රඥව ඇත්තා වූ, යම් ඒ බාල පෘථග්ජන සත්වකෙනෙක් ඇද් ද, ඔවුන්ගේ චිත්තය මඳ ව උපදනේ ය. පමා වන්නේ ය. කාරණා කවරේ ද? යත්:— ක්ලේශයන් විසින් චිත්තය වැලඳ ගැණීමෙන් වසා ගත් බැවින් පමා ව පවත්නේ ය. මේ පෘථග්ජන

1. 'අභාවිත කායා'-පාළි (''-නො වැඩූ නාමකාය ඇති'')

Non-Commercial Distribution

චිත්තය වන්නේ ය. ඒ සප්තවිධ වූ චිත්තයෙහි ලා මේ ද්විතීයචිත්තය බෙදීමට පැමිණෙන්නේ ය. මහරජාණෙනි, සෝවාන් වූ වසන ලද සතර අපායද්වාරයන් ඇත්තා වූ සම්‍යග්දෘෂ්ටියගේ වශීප්‍රාප්ත වූ සර්වඥනුශාසනාව දැන ගත්තා වූ යම් ඒ ප්‍රථමමාර්ගයට පැමිණි කෙනෙක් ඇද්ද, ඔවුන්ගේ චිත්තයතෙම 'මම ය මාගේ ය' යි ගන්නා සත්කායදෘෂ්ටිය ද, 'බුද්ධාදිඅටතන්හි' කාංක්ෂා කරණ විචිකිච්ඡාව ද, 'ශාසනයෙන් පිටත් බාහිරව්‍රතසමාදනාදියෙන් නිවන් ඇතැ' යි කියා ගන්නා වූ සීලබ්බතපරාමාසය ද, යන මේ ත්‍රිවිධ ස්ථානයෙහි ලැහැල්ලු ව ම උපදනේ ය. ලැහැල්ලු ව ම පවත්නේ ය. නො පැමිණියා වූ චතුර්මාර්ගඵලභූමියෙහි ගරුක ව උපදනේ ය. දන්ධ ව පවත්නේ ය. කාරණා කවරේ ද? යත්:— ත්‍රිවිධ ස්ථානයෙහි චිත්තයාගේ පිරිසිදු බැවින් හා මත්තෙහි උපදනා ක්ලේශයන්ගේ අප්‍රහීණ බැවින් දන්ධ ව පවත්නේ ය.

''මහරජාණෙනි, යම් සේ තුන් පුරුකක් ගැට කපා පිරිසිදු කරණ ලද්ද වූ මත්තෙහි ගණ්ඨිශාඛාජටාවෙන් වැලඳ ගත්තා වූ වැර ගසා අඳින ලද්ද වූ මහහුණවෘක්ෂයාගේ තුන් පුරුක යම් පමණ ද, එපමණ ලැහැල්ලු ව ඇදී එන්නේ ය. එයින් මත්තෙහි තද වන්නේ ය. ඊට කාරණා කවරේ ද? පාත පුරුක කපා පිරිසිදු කළ බැවින් හා මත්තෙහි ශාඛාජටායෙන් ජටිත වූ බැවින් මඳක් ඇදීම වන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම පිහිතාපායි වූ සම්‍යග්දෘෂ්ටියගේ වශීප්‍රාප්ත වූ සර්වඥනුශාසනාව විශෙෂයෙන් ම දන්නා වූ යම් ඒ සොතාපන්න වූ පුද්ගලකෙනෙක් ඇද්ද, උන්ගේ ඒ චිත්තයතෙම ත්‍රිවිධස්ථානයෙහි ලැහැල්ලු ව උපදනේ ය. ලැහැල්ලු ව පවත්නේ ය. මත්තෙහි අප්‍රාප්ත වූ භූමියෙහි ගරුක ව උපදනේ ය. දන්ධ ව පවත්නේ ය. කාරණා කවරේ ද? යත්:— සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසය **(110)** යන මේ තුන් තන්හි චිත්තය පිරිසිදු බැවින් ලැහැල්ලු ව ම පවත්නේ ය. මත්තෙහි ඉතිරි ව සිටි ක්ලේශයන්ගේ අප්‍රහීණ බැවින් පමා ව පවත්නේ ය. මේ දෙවෙනි චිත්තය නම් වන්නේ ය.

''ඒ සප්තවිධ චිත්තයෙහි ලා මේ තුන්වන චිත්තයතෙම බෙදීමට පැමිණෙන්නේ ය. මහරජාණෙනි, යම් කෙනෙකුන්ගේ රාග, ද්වෙෂ, මොහ අකුශලධර්මයෝ තුනී වූවාහු ද, වරක් මිනිස් ලොව ප්‍රතිසන්ධියට එන බැවින් සකෘදගාමී වූ යම් ඒ ආර්යපුද්ගලකෙනෙක් ඇද්ද, දෙළොස් වැදෑරුම් වූ ඒ සකෘදගාමීආර්යයන්ගේ සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාසය හා කාමරාගය ව්‍යාපාදය යන අකුශලයන්ගෙන් මිදුනා වූ ඒ සකෘදගාමී චිත්තය තෙම යථොක්ත වූ පඤ්චස්ථානයෙහි ලැහැල්ලු ව ම උපදනේ ය. ලැහැල්ලු ව පවත්නේ ය. මත්තෙහි වූ මාර්ගඵලභූමියෙහි ගරුක ව උපදනේ ය. දන්ධ ව පවත්නේ ය.

''ඊට කාරණා කවරේ ද? යත්:— මෙහි කී පංචස්ථානයෙහි සිත පිරිසිදු බැවින් හා මතු ඉතිරි ව සිටි ක්ලේශයන්ගේ අප්‍රහීණ බැවින.

Non-Commercial Distribution

''මහරජානෙනි, යම් සේ පස්පුරුකක් හුණගැට පිරිසිදු කරණ ලද්ද වූ ඉතිරි මතු ශාඛාජටාවෙන් ජටිත වූ බැවින් වැලඳ සිටින ලද්ද වූ, වැර ගසා අදින ලද්ද වූ, මහහුණවෘක්ෂයාගේ පස්පුරුක යම් පමණ ද, එපමණ ලැහැල්ලු ව ඇදී එන්නේ ය. එයින් මත්තෙහි තද වන්නේ ය. කාරණා කවරේ ද? යත්:— පාතභාගය පිරිසිදු බැවින් ඇදී එන්නේ ය. ඉතිරි වූ ඌර්ධ්වභාගය ශාඛා ජටාවෙන් ජටිත වූ බැවින් නො ඇදෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කෙනෙකුන්ගේ රාග, ද්වෙෂ, මොහයෝ තුනී වූවාහු ද, යම් ඒ සකෘදගාමී වූ කෙනෙක් ඇද්ද, ඔවුන්ගේ සකෘදගාමී ඵලචිත්තයතෙම පංචස්ථානයෙහි ලැහැල්ලු ව ම උපදින්නේ ය. ලැහැල්ලු ව ම පවත්නේ ය. ඉතිරි මතු භූමියෙහි ගරුක ව ම උපදනේ ය. දන්ධ ව පවත්නේ ය. කාරණා කිම? යත්— පංචස්ථානයෙහි චිත්තයාගේ පිරිසිදු බැවින් ලැහැල්ලු ව ම පවත්නේ ය. මත්තෙහි ඉතිරි ව සිටි ක්ලේශයන්ගේ අප්‍රහීණ බැවින් ඒ චිත්තය දන්ධ ව පවත්නේ ය. මේ තෘතීයචිත්තය නම් වන්නේ ය.

''ඒ සප්තවිධචිත්තයෙහි ලා මේ සතරවන චිත්තය බෙදීමට පැමිණෙන්නේ ය. මහරජානෙනි, කාමලොකයෙහි ප්‍රතිසන්ධියකට නො එන හෙයින් අනාගාමී වූ සතළිස්අටවැදෑරුම් වූ යම් අනාගාමී ආර්ය කෙනෙකුන්ගේ කාමලොකයෙහි ම යොදන්නා වූ පංචොරම්භාගීය සංයොජනයෝ ප්‍රහීණ වූවාහු ද, යම් ඒ අනාගාමී කෙනෙක් ඇද්ද? ඒ අනාගාමීන්ගේ ඒ මාර්ගඵලචිත්තය තෙම, යට කී සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස කාමරාග ව්‍යාපාදයන් හා මොවුන් ම සකලසත්වයන් සසර හා එක්කොට යොදන හෙයින් සංයොජන නම් වූ දිට්ඨිසංයොජනය විචිකිච්ඡාසංයොජනය සීලබ්බතපරාමාසසංයොජනය කාමරාගසංයොජනය පටිඝසංයොජනය යන මේ දශස්ථානයෙහි ලැහැල්ලුව ම උපදනේ ය. ලැහැල්ලු ව ම පවත්නේ ය. මතු රහත්භූමියෙහි සිත ගරුක ව උපදනේ ය. දන්ධ ව පවත්නේ ය.

''කාරණා කිම? යත්— මෙහි කී දශස්ථානයෙහි අනාගාමී චිත්තයාගේ පිරිසිදු බැවින් හා මත්තෙහි උපදනා ක්ලේශයන්ගේ අප්‍රහීණ බැවින. මහරජානෙනි, යම් සේ දසපුරුකක් ගැට කපා (111) පිරිසිදු කරණ ලද්ද වූ මහා ඌර්ධ්ව ශාඛාජටාවෙන් ජටිත වූ වැර ගසා ආකඩ්ඪනය කරණ ලද්ද වූ මහහුණවෘක්ෂයාගේ දසපුරුක යම් පමණ ද එපමණ ම ලැහැල්ලු ව ඇදී එන්නේ ය. එයින් මත්තෙහි තද වන්නේ ය. ඊට කාරණා කවරේ ද? යත්— හෙට්ඨා භාගය පිරිසිදු බැවින් හා ඌර්ධ්වභාගය ශාඛාජටායෙන් ජටිත වූ බැවින. මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කෙනෙකුන්ගේ පඤ්චොරම්භාගීය වූ සංයොජනයෝ ප්‍රහීණ වූවාහු ද, යම් ඒ අනාගාමී කෙනෙක් ඇද්ද, ඒ ආර්යපුද්ගලයන්ගේ ධර්මචක්ෂුස ය යි කියන ලද ඒ අනාගාමීඵලචිත්තයතෙම මෙහි කී දශස්ථානයෙහි ලැහැල්ලු ව ම උපදනේ ය. ලැහැල්ලු ව ම පවත්නේ ය. මතු රහත් භූමියෙහි ගරුක ව

Non-Commercial Distribution

උපදනේ ය. පමා ව පවත්නේ ය. කාරණ කවර? යත්— මෙහි කී දශ ස්ථානයෙහි අනාගාමිචිත්තයාගේ අත්‍යන්ත පරිශුද්ධ බැවින් ශීඝ්‍ර ව පවත්නේ ය. මත්තෙහි ඉතිරි ක්ලේශයන්ගේ අප්‍රහීණ බැවින් දන්ධ ව පවත්නේ ය. මේ සතරවන චිත්තය වන්නේ ය.

''ඒ සප්තවිධ වූ චිත්තයෙහි ලා මෙ පස්වැනි චිත්තය විභජනයට පැමිණෙන්නේ ය. මහරජානෙනි, චතුරාශ්‍රවයන් ක්ෂය කළා වූ ක්ලේශ මලය හැර අර්හත්ඥානය මුවහත් කරණ ලද්ද වූ ක්ලේශාමය වමනය කරණ ලද්ද වූ සසර වැස නිමවන ලද්ද වූ කට යුතු කාර්ය කොට නිමවන ලද්ද වූ ක්ලේශමහාභාරය බහා තබන ලද්ද වූ ස්වකීය වූ නිර්වාණාර්ථ සිද්ධියට පැමිණෙන ලද්ද වූ භවසංයොජනයන් ක්ෂය කරණ ලද්ද වූ පැමිණෙන ලද අර්ථ ධර්ම නිරුක්ති ප්‍රතිභාන යන සිවුපිළිසිඹියාවන් ඇත්තා වූ ශ්‍රාවකභූමියෙහි සම්පූර්ණතාවෙන් පරිශුද්ධභාවයට පැමිණියා වූ යම් ඒ රහතන් වහන්සේ කෙනෙක් ඇද් ද, ඒ රහතුන් වහන්සේලාගේ ඒ අර්හත්ඵලචිත්තයතෙම රූප රාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජාය යන පඤ්චවිධ වූ උද්ධම්භාගියසංයොජනයන් කෙරෙන් මිදී සකල ක්ලේශයන් නැසූ හෙයින් ශ්‍රාවකවිෂයෙහි ශීඝ්‍ර ව ම උපදනේ ය. ශීඝ්‍ර ව ම පවත්නේ ය. ප්‍රත්‍යෙකබුද්ධභූමියෙහි ගරුක ව උපදනේ ය. දන්ධ ව **(112)** පවත්නේ ය. කාරණ කවර? යත්— ශ්‍රාවකවිෂයෙහි පිරිසිදු බැවින් හා ප්‍රත්‍යෙකබුද්ධවිෂයෙහි සිත අපරිශුද්ධ බැවින. මහරජානෙනි, යම් සේ සියලු ම හුණපුරුක් ගැට සිඳ පිරිසිදු කරණ ලද්ද වූ අත ගසා අදින ලද්ද වූ මහාවංසනළයාගේ ඇදී එන ගමන ලහුක වන්නේ ය. ශීඝ්‍ර වන්නේ ය. අදන්ධ වන්නේ ය. නො පමා වන්නේ ය. ඊට කාරණ කවර? යත්— සියලු ම පුරුක් හා ගණ්ඨි පරිසුද්ධ බැවින් හා හුණවෘක්ෂයාගේ ඔබිනොබ ග්‍රහණයක් නැති බැවින් ඇදී එන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම චතුරාශ්‍රවයන් ක්ෂය කළා වූ ක්ලේශමලයන් පිරිසිදු කළා වූ ක්ලේශාමය වමනය කළා වූ බ්‍රහ්මචරියාව වැස නිම වූවා වූ කට යුතු කාර්ය කොට නිම වූවා වූ ක්ලේශභාරය බහා තැබුවා වූ ස්වකීයාර්ථයට පැමිණියා වූ භවසංයොජනයන් ක්ෂය කළා වූ සිවුපිළිසිඹියාවට පැමිණියා වූ ශ්‍රාවකභූමියෙහි පිරිසිදු වූ යම් ඒ රහතන් වහන්සේ කෙනෙක් ඇද්ද, ඒ රහතන් වහන්සේලාගේ අර්හත්ඵලචිත්තයතෙම ශ්‍රාවකවිෂයෙහි ලැහැල්ලු ව උපදනේ ය. ශීඝ්‍ර ව උපදනේ ය. ලැහැල්ලු ව පවත්නේ ය. ප්‍රත්‍යෙකබුද්ධභූමියෙහි ගරුක ව උපදනේ ය. දන්ධ ව පවත්නේ ය. කාරණ කවර? යත්— ශ්‍රාවක විෂයෙහි සිත පිරිසිදු බැවින් හා පසේබුදුවිෂයෙහි අපරිසුද්ධ බැවින් මෙසේ වන්නේ ය. මෙ පස්වන චිත්තය නම් වන්නේ ය.

ඒ සප්තවිධ චිත්තයෙහි ලා මේ සවන චිත්තය විභජනයට පැමිණෙන්නේ ය. මහරජානෙනි, අන්‍යොපදෙශවිරහිත ව තෙමේ ම බුදුවන හෙයින් ස්වයම්භූ වූ ආචාර්යකෙනෙකුන් නැත්තා වූ එකලා ව ම හැසිරෙණ කඟවෙසණුන් හා සදෘශ වූ එකලා ව හැසිරෙන්නා වූ තමන්ගේ

ස්වකීය ප්‍රත්‍යෙකබුද්ධවිෂයෙහි සුපරිසුද්ධ නිර්මල සිත් ඇත්තා වූ යම් ඒ ප්‍රත්‍යෙකබුද්ධකෙනෙක් ඇද් ද, ඒ පසේබුදුවරයන්ගේ ඒ චිත්තයතෙම චතුරාර්යසත්‍යඥනයෙහි හා ඒ චතුර්විධප්‍රතිසම්භිදඥනයෙහි පවත්නා හෙයින් තමන්ගේ විෂයෙහි ශීඝ්‍ර ව උපදනේ ය. සීඝ්‍ර ව පවත්නේ ය. සර්වඥබුද්ධභූමියෙහි ගරුක ව උපදනේ ය. දන්ධ ව පවත්නේ ය. කාරණා කවර? යත්— දුක්ඛෙඤාණාදී අටනුවණ ශ්‍රාවකයන්ටත් සාධාරණ වුවත් ප්‍රත්‍යෙකබුද්ධයන්ට විශෙෂයෙන් ම පිරිසිදු බැවින් තමන්ගේ විශෙෂයෙහි වහා පවත්නේ ය. සර්වඥගොචර වූ ඉන්ද්‍රියපරොපරියත්තෙඤාණය, සත්වයන්ගේ ආසයානුසයඤාණය, යමකපාටිහාරියඤාණය, මහාකරුණා සමාපත්තිඤාණය, සබ්බඤ්ඤුතඤාණය, අනාවරණඤාණය යන මේ සර්වඥබුද්ධවිෂයයාගේ මහත් බැවින් එහි දන්ධ ව පවත්නේ ය. මහරජානෙනි, යම් සේ පුරුෂයෙක්තෙම තමහට විෂය වූ උස නැති ස්වල්ප වූ ගංගාවකට රාත්‍රියෙහිත් දහවලුත් කැමති ලෙස අසම්භීත ව බස්නේ ය. නැවත අනික් කලෙක අතිගම්භීර වූ අතිවිස්තාර වූ බැස හිඳීමට කිසි ප්‍රතිෂ්ඨාවක් නැත්තා වූ පරතෙරක් නැත්තා වූ මහාසමුද්‍රය දැක භය වන්නේ ය. දන්ධ වන්නේ ය. එතෙර වන්නට නො හැකි වන්නේ ය. කාරණා කිම? යත්— ස්වකීය විෂයයාගේ පුරුදු බැවින් කුඩා ගඟින් එතර වන්නේ ය. මහාසමුද්‍රයාගේ මහත් බැවින් නො හැකි වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ස්වයම්භූ වූ අනාචාරී වූ එකචාරී වූ කගවෙසණුන් හා සදෘශ වූ තමන්ගේ විෂයෙහි පිරිසිදු නිර්මල සිත් ඇත්තා වූ යම් ඒ පසේබුදුවර කෙනෙක් ඇද්ද, ඔවුන් වහන්සේලාගේ ඒ චිත්තයතෙම තමන් වහන්සේලාගේ විෂයෙහි ම ශීඝ්‍ර ව උපදනේ ය. ශීඝ්‍ර ව පවත්නේ ය; සර්වඥබුද්ධභූමියෙහි ගරුක ව උපදනේ ය. දන්ධ ව පවත්නේ ය. කාරණා කවර යත්— ස්වකීයප්‍රත්‍යෙකබුද්ධවිෂයයාගේ පිරිසිදු බැවින් එහි ශීඝ්‍ර ව පවත්නේ ය. සර්වඥබුද්ධවිෂයයාගේ මහත් බැවින් එහි දන්ධ ව පවත්නේය, මේ සවන චිත්තය වන්නේ ය.

"ඒ සප්තවිධ වූ චිත්තයෙහි ලා මේ සත්වන චිත්තය විභජනයට පැමිණෙන්නේ ය. මහරජානෙනි, සියල්ල දත්තා වූ දසබලධාරී වූ බුද්ධත්වය, ආශ්‍රවක්ෂයකරඥන, අන්තරායකරධර්මය, නෛර්යාණික ධර්මය යන මේ චතුර්වෛශාරද්‍යයෙහි විශාරද වූ අෂ්ටාදශබුද්ධධර්මයෙන් සමන්වාගත වූ අනන්ත වූ ක්ලේශයන් ජය ගත් බැවින් 'අනන්ත ජින' නම් වූ අනෙකසෘද්ධිප්‍රාතිහාර්ය ඥනාර්ථධර්මයෙහි කිසිවෙකු විසින් ආවරණයක් කළ නො හැකි වන බැවින් අනාවරණඥනී වූ යම් ඒ සම්‍යක් සම්බුද්ධසර්වඥ බුදුවරකෙනෙක් ඇද් ද, ඒ ලොවුතුරා බුදුවරයන් වහන්සේලාගේ අචින්ත්‍යානොපමෙය්‍ය වූ ඒ සර්වඥචිත්තයතෙම දශබල (113) චතුර්වෛශාරද්‍ය තුදුස්බුද්ධඥනාදි වූ සර්වධර්මයෙහි ශීඝ්‍ර ව ම උපදනේ ය. ශීඝ්‍ර ව ම පවත්නේ ය. ඊට කාරණා කිම? යත්— සියලු ම දත මනා ධර්මයෙහි අත්‍යන්තයෙන් පිරිසිදු බැවින.

''කිමෙක් ද, මහරජානෙනි, දුහුලින් කළ සියුම් වස්ත්‍රයෙක්හි හෝ කපුයෙන් කළ සියුම් වස්ත්‍රයෙක්හි හෝ හිසකෙසෙන් කළ සියුම් වස්ත්‍රයෙක්හි හෝ මනා කොට හණ ගා මුවහත් තබන ලද්දා වූ පහ වූ මලයෙන් නිර්මල වූ ගැට නැති බැවින් නිග්ගණ්ඨි වූ සියුම් මුවහත් ඇත්තා වූ ඇද නො වූ වක් නො වූ කිසි කුටිලත්වයක් නැත්තා වූ දහසක් දෙන ඇද නගන දළ්හධනුවට ආරොපණය කරණ ලද්දා වූ මහත් වූ යොධභටයෙකු විසින් බලවත් කොට ඇද විදින ලද්දා වූ නාරාචය නම් අයොමයභිතලයාගේ වස්ත්‍රය කැපී නො ගොස් මඳ ව වදිනා බවෙක් හෝ විනිවිද නො ගොස් ඇලෙන ලග්නත්වයෙක් හෝ වේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''කුමක් නිසා දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, වස්ත්‍රයන්ගේ සියුම් බැවින් ද, නාරාචයාගේ සියුම් මුවහත් ඇති බැවින් ද විදින ලද සැරයාගේ බලවත් බැවින් දැ? යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම සියල්ල දත්තා වූ දශබලධාරී වූ චතුර්වෛශාරද්‍යවිශාරද වූ අෂ්ටාදශබුද්ධධර්මයෙන් සමන්වාගත වූ අනන්තජින නම් වූ අනාවරණඥානී වූ යම් ඒ සම්‍යක්සම්බුද්ධසර්වඥවර කෙනෙක් ඇද්ද, ඒ සර්වඥවරයන් වහන්සේලාගේ ඒ අත්‍යන්තනිර්මල සුබුම වූ සර්වඥ චිත්තයතෙම ඉන්ද්‍රියපරොපරියත්ත ආසයානුසය යමකපාටිහාරිය මහා කරුණාසමාපත්ති සබ්බඤ්ඤුත අනාවරණඤාණාදි සියල්ලෙහි ම අති ශීඝ්‍ර ව ම උපදනේ ය. අතිශීඝ්‍ර ව ම පවත්නේ ය. කාරණ කවර යත්— සර්වඥතාඥනයෙහි පිරිසිදු බැවින් මෙසේ පවත්නේ ය. මහරජානෙනි, මේ සත්වැනි වූ චිත්තය නම් වන්නේ ය.

''තවද, මහරජානෙනි, ඒ සප්තවිධ වූ චිත්තයෙහි සර්වඥවරයන්ගේ යම් මේ චිත්තයෙක් ඇද්ද, ඒ චිත්තය සවැදෑරුම් වූ චිත්තයන්ගේ ම පවත්නා ගණන් අතික්‍රාන්ත කොට අසංඛෙය්‍ය වූ ගුණයෙන් පිරිසිදු වූයේ ය. ශීඝ්‍ර ද වූයේ ය. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේගේ චිත්තය පිරිසිදු වී ද, ශීඝ්‍ර වී ද, මහරජානෙනි, එහෙයින් අප භාග්‍යවතුන් වහන්සේ යමකප්‍රාතිහාර්යය දක්වා වදාළසේක. මහරජානෙනි, යමකප්‍රාතිහාර්යයෙහි භාග්‍යවත් වූ බුදුවරයන් වහන්සේලාගේ චිත්තය මෙසේ ශීඝ්‍ර ව ම ප්‍රවෘත්ත වන්නේ ය යි කියා දත යුත්තේ ය. ඒ යමකප්‍රාතිහාර්යයෙහි ඉතිරි කාරණයක් කියන්නට නො හැකි වන්නේ ය. මහරජානෙනි, ඒ අනන්ත වූ යමකප්‍රාතිහාර්යයෝත් සර්වඥබුදුවරයන්ගේ චිත්තය නියාවට ගණනකට වත් — සංඛ්‍යාවකට වත් — කලාවකට වත් — කලාභාගයකටත් නො පැමිණෙන්නාහු ය.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥතාඥනය ආවර්ජනාප්‍රතිබද්ධ කොට ඇත්තේ ය. කැමැති දෙයක් ආවර්ජනා කොට බලා දැන වදාරණ සේක. මහරජානෙනි, යම් සේ පුරුෂයෙක්තෙම තමාගේ හස්තයෙහි තුබූ යම් දෙයක් දෙවෙනි හස්තයෙහි තබන්නේ වේ ද, විවෘත වූ මුඛයෙන් වචනයක් පිටත් කරන්නේ වේ ද, මුඛයට පැමිණි භොජනයක්
(114) ගිලින්නේ වේ ද, ඇසිපිය හෝ අරින්නේ වේ ද, ඇස ඇරපියා හෝ

Non-Commercial Distribution

උන්මීලනය කරන්නේ වේ ද, හකුළුවන ලද හෝ අතක් දික් කරන්නේ වී නම්, දික් කරණ ලද හෝ අතක් හකුළුවන්නේ වී නම්, මහරජානෙනි, මේ ඉතා කඩිනම් කාලයත් ඉතා පමා වන්නේ ය. අප භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥතාඥානය ඊටත් වඩා ශීඝ්‍රතර වන්නේ ය. අතිශීඝ්‍රතර වූ ආවර්ජනාව ආවර්ජනා කොට බලා කැමැති දෙයක් දන වදරණසේක. ආවර්ජනා විකල මාත්‍රයකින් ම ඒ භාග්‍යවත් වූ බුදුවරයන් වහන්සේලා එපමණින් ම අසර්වඥ නම් නො වන්නාහු ය'' යි කීසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ ආවර්ජනාව සොයා පරියෙ-සන්යෙන් කට යුතු දෙයක් නො වේ ද? එබැවින් මට නුඹවහන්සේ ඒ සර්වඥතාඥනයෙහි ලා අනික් කාරණයකින් අවබොධ කරවා වදාළ මැනව'' යි කීහ. ''එසේ වී නම්, මහරජානෙනි, යම් සේ මහාධන ඇත්තා වූ මහාභොග ඇත්තා වූ බොහෝ වූ රන්රිදී ද්‍රව්‍යොපකරණ ඇත්තා වූ බොහෝ වූ ධනධාන්‍යයන් ඇත්තා වූ සකලසම්පත්තියෙන් ආඪ්‍ය වූ පුරුෂයක්හුගේ බලොපි, කුම්භිපිඨරකොෂ්ඨ සංඛ්‍යාත බොහෝ භාජන ගත වූ ඇල්වී, යව, තණ්ඩුල, තල, මුං, උඳු, ඇතුළු වූ පුබ්බන්න අපරන්න සංඛ්‍යාත සප්තවිධ ධාන්‍යයන් හා ගිතෙල්, වෙඬරු, කිරි, දීකිරි, මීපැණි ආදිහු වූවාහු වී නම්, ඒ පුරුෂයාගේ ගෙදරට ද, බතට ද සුදුසු වූ බත් කනු කැමැත්තා වූ අමුත්තෙක් ආයේ වී නම්, ඒ ගෘහපතියාගේ ගෘහ යෙහි ද යම් භොජනයක් පිසන ලද ද, ඒ භොජනය නිෂ්ඨා වූයේ වී නම්, එකල අමුතුබත් දෙන පිණිස කුම්භී නම් වූ සැළියෙකින් සාල් ගෙණ බත් පිසන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ මහාභොගී වූ පුරුෂතෙම එපමණ වූ භොජනවිකලමාත්‍රයකින් ම නිර්ධනික වේ ද? දුගී නම් වේද ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ ගෘහයෙහිත්, ස්වාමීනි, අකාලයෙහි බත් නැති වන්නේ ය. ගෘහපතියාගේ ගෙයි කියනු ම කවරේ ද ?'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේගේ සර්වඥතාඥනය ආවර්ජනාවිකලමාත්‍රයක ආවර්ජනා කොට බලා කැමැති දෙයක් දන ගන්නේ ය.[1]

''යම් සේ වනාහි මහරජානෙනි, හට ගත් ඵල ඇත්තා වූ ඵලපොකුරු භාරයෙන් හරිත වූ එහෙයින් ඒ ඒ අතට නැමී තිබෙන්නා වූ අතුපතර ඇති ආම්‍රාදිවෘක්ෂයෙක් වී නම්, ඒ වෘක්ෂස්ථානයෙහි වැටුනා වූ කිසි ඵලයක් නො වන්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ සඵලවෘක්ෂය තෙම එපමණකින් වැටුනු ඵල නැති මාත්‍රයකින් ම අඵලවෘක්ෂ නම් වේ ද ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, ඒ වෘක්ෂඵලයෝ වැටීම ප්‍රතිබද්ධ කොට ඇත්තා හ. වැටුනු කල්හි කැමැත්තෙක් ලබන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේගේ සර්වඥතා ඥනය ආවර්ජනාව ප්‍රතිබද්ධ කොට ඇත්තේ ය. ඥනයෙන් ආවර්ජනා කොට බලා කැමැති දෙයක් දන වදරණසේකැ'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සර්වඥයන් වහන්සේ ආවර්ජනා කොට බලා

1. දන වදරණ සේක

Non-Commercial Distribution

කැමැති දෙයක් දන්න වදරණසේක් ද?'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ ආවර්ජනා කොට බලා කැමැති දෙයක් දන්න වදරණ සේක. යම් සේ, මහරජානෙනි, චක්‍රවර්තිරජ තෙම යම් දවසෙක (115) මට චක්‍රරත්නය පැමිණෙව යි කියා චක්‍රරත්නය සිහි කරන්නේ ය. සිහි කළ කල්හි චක්‍රරත්නය සමීප ව පැමිණෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම අප තිලෝගුරු තථාගතයන් වහන්සේ ආවර්ජනා කර වදරමින් කාලත්‍රයෙහි කැමැති දෙයක් දන්න වදරණසේකැ''යි කීසේක. එකල්හි අතිප්‍රසන්න වූ මිලිඳු මහරජානෝ ''ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, වදළ මේ කාරණය ඉතා දෘඪ ය. බුදුරජානන් වහන්සේ සියල්ල දන්න වදරණසේක. බුදුරජානන් වහන්සේ සර්වඥසේකැ යි කියා අපි පිළිගණුම්හ'' යි කීහ.

**ආවර්ජනාප්‍රතිබද්ධප්‍රශ්නය නිමි.**

---

# දෙවදත්තප්‍රව්‍රජ්‍යාප්‍රශ්නය

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දෙව දත්තයන් වහන්සේ කවුරුන් විසින් පැවිදි කරණ ලද්දේ ද?'' යි විචාළෝය ''මහරජානෙනි, භද්දිය කුමාරයෝ ය, අනුරුද්ධ කුමාරයෝ ය, ආනන්ද කුමාරයෝ ය, භගු කුමාරයෝ ය, කිම්බිල කුමාරයෝ ය, දෙවදත්ත කුමාරයෝ ය යන මේ උපාලි නම් කපුවානන් සත්වැනි කොට ඇති, ශාක්‍යකුමාරවරු සදෙන අප ලොවුතුරා ශාස්තෲන් වහන්සේ බුදු වූ කල්හි භාග්‍යවතුන් වහන්සේට සන්තොස උපදවමින් ශාක්‍යවංශයෙන් බුදුන්ට පසු ව මහණ වන්නාහු අපමණ වූ සැපත් හැර ගිහිගෙන් නික්මුනාහු ය. අප භාග්‍යවතුන් වහන්සේ ඒ සද්දෙනා මහණ කර වදළසේකැ''යි කීසේක. ''ස්වාමීනි, ඒ මහණ ව උපසම්පන්න වූ දෙවදත්තයන් වහන්සේ විසින් සංඝයා වහන්සේ භෙද කරණ ලද්දේ නො වේ ද?'' යි කීහ. ''එසේ ය මහරජානෙනි, මහණ ව උපසම්පන්න වූ දෙවදත්තයන් විසින් සංඝභෙද කර්මය කරණ ලද්දේ ය. ගෘහස්ථතෙම සංඝභෙදය කරන්නේ නො වෙයි. ශික්ෂ්‍යමාණාතොමෝ[1] සංඝභෙදය කරන්නේ නො වෙයි. සාමණෙර තෙම සංඝභෙදය කරන්නේ නො වෙයි. සාමණෙරි ද සංඝභෙදය කරන්නී නො වෙයි. සීලාදි එකාකාරගුණයෙන් ප්‍රකෘති වූ සුශීලසංඝයා හා සමග කරණ පොහෝපවාරණාදී සමානසංවාසය ඇත්තා වූ සමාන වූ එක සීමාවෙහි සිටියා වූ උපසම්පන්නභික්ෂුතෙම සංඝභෙදකර්මය කරන්නේ ය'' යි කීසේක.

''ස්වාමීනි, ඒ සංඝයා බිඳගෙණ එක සීමාවෙක වෙන ම පොහොය කළා වූ සංඝභෙදක පුරුෂතෙම කවර අකුශලකර්මයක් විඳී ද?'' යි විචාළහ. 'මහරජානෙනි, අවීචිමහානරකයෙහි කපක් මුළුල්ලෙහි

---

1. ශික්ෂ්‍යමාණ තෙමෙ

Non-Commercial Distribution

නො ගෙවී සිටින්නා වූ අකුශලකර්මයට පැමිණෙන්නේ ය'' යි කීසේක. ''කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දෙවදත්තයන් වහන්සේ පැවිදි ව සංඝභෙද කර්මය කොට කල්පයක් මුළුල්ලෙහි අවීචිමහානරක යෙහි පැසෙන්නේ ය යි කියා බුදුරජානන් වහන්සේ දන වදරණ සේක් ද'' යි විචාළහ.

''එසේ ය, මහරජානෙනි, දෙවදත්තයන් වහන්සේ මහණ ව සංඝ භෙදය කරන්නේ ය. සංඝභෙදය කොට කල්පයක් මුළුල්ලෙහි අවීචිමහා නරකයෙහි පැසෙන්නේ ය යි කියා අප තථාගතයන් වහන්සේ දන වදරණසේකැ'' යි කීසේක. ''ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දෙවදත්තයන් වහන්සේ මහණ ව සංඝභෙදය කරන්නේ ය. සංඝභෙදය කොට කල්පයක් මුළුල්ලෙහි අවීචි නම් මහානරකයෙහි **(116)** පැසෙන්නේ ය'' යි කියා බුදුරජානන් වහන්සේ දන්නාසේක් වී නම්, ඒ කාරණයෙන්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'බුදුරජානන් වහන්සේ සියලු සත්වයන් කෙරෙහි කරුණා ඇතිසේක. අනුකම්පා ඇතිසේක. හිතෙසිසේක. සියලු සත්වයන්ගේ අවැඩ දුරු කොට වැඩ උපදවනසේකැ' යි කියන්නා වූ යම් වචනයක් ඇද් ද, ඒ වචනය මිථ්‍යා වන්නේ ය. බොරු වන්නේ ය. ඉදින් ඒ දෙවදත්තයානන් අපායෙහි වැටෙන බව දිව්‍යඥානයෙන් නො දන මහණ කරවා වදළසේක් වී නම් ඒ කාරණයෙන් බුදුරජානන් වහන්සේ අසර්වඥසේක. සර්වඥතාඥනය ඇති සේක් වී නම්, සියලු සත්වයන් කෙරෙහි කරුණාව නැතිසේක. කරුණාව ඇතිසේක් නම්, දිව්‍යඥනය නැතිසේක. මේ උභතොකොටිකප්‍රශ්නයත් නුඹ වහන්සේට ම පැමිණියේ ය. මේ මහාඅවුල විජටනය කර වදළ මැනව. පරවාදයන් බිඳ හැර වදළ මැනැව. අනාගතකාලයෙහි නුඹ වහන්සේ හා සදෘශ වූ ප්‍රඥවත් භික්ෂූන් වහන්සේලා දුර්ලභ වන්නාහු ය. මේ උභතොකොටිකප්‍රශ්නයෙහි නුඹ වහන්සේගේ ප්‍රඥබලය ප්‍රකාශ කර වදළ මැනැවැ'' යි කීහ.

''මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ සකලසත්වයන් කෙරෙහි පතළා වූ කරුණාවත් ඇතිසේක. සර්වඥතාඥනයත් ඇතිසේක. මහ රජානෙනි, එහෙයින් ලොකාලොකදිවාකර වූ භාග්‍යවතුන් වහන්සේ මහාකරුණාව කරණ කොට ගෙණ සර්වඥතාඥනයෙන් දෙවදත්තයන් වහන්සේගේ ගතිය බලා වදරමින් අපරාපර්යය වූ අකුශලකර්මයන් රැස් කොට ගෙණ අනෙකකල්පකොටිශතසහස්‍රයක් මුළුල්ලෙහි නරකයෙන් නරකයට වැටීමෙන් වැටීමට යන්නා වූ ඒ දෙවදත්තයානන් දක වදළ සේක. මොහු විසින් කෙළවරක් නො කොට කරණ ලද්ද වූ අකුශල කර්මය මාගේ ශාසනයෙහි පැවිදි වූවාහට කෙළවර වන්නේ ය. පූර්ව අකුශලකර්මය නියාවට දුක් කෙළවර වන්නේ ය. පැවිදි නො වූයේ වී නමුත් මේ තුච්ඡ වූ පුරුෂතෙම කල්පයක් මුළුල්ලෙහි මහදුක් විඳුවන්නා වූ අකුශලකර්මයන් රැස් කරන්නේ ය යි කියා භාග්‍යවත් වූ සර්වඥයන් වහන්සේ සර්වඥතාඥනයෙන් දන කරුණාවෙන් ම දෙවදත්තයන් පැවිදි කර වදළසේකැ'' යි කීසේක.



Non-Commercial Distribution

ඒ අසා ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, බුදුරජානන් වහන්සේ සත්වයන්ට නොයෙක් වධ කොට තළා තෙලින් ඇඟ ආලේප කරණසේක. මහාප්‍රපාතයක ඔසවා දමා ගොඩ නගින්නට අත දෙනසේක. මරාදමා ජීවිතය සොයනසේක. අහෝ! කරුණාවක ලෙසක් බැලුව මැනැව. ඒ බුදුරජානන් වහන්සේ යමෙකුට සැප දෙනු කැමැතිසේක් වී නම්, පළමු කොට මහත් දුක් දී පසු ව සැපතෙහි පිහිටුවනසේකැ'' යි කීහ. 'මහරජානෙනි, තථාගතයන් වහන්සේ වධ කරන්නෝ වූ නමුත් සත්වයන්ට හිතසැප පිණිස ම ය. ප්‍රපාතයකින් හෙළන්නෝ වූ නමුත් සත්වයන්ට හිතසැප පිණිස ම ය. මරතත් සත්වයන්ට වැඩ පිණිස ම ය. මහරජානෙනි, වධ කොට වී නමුත් තථාගතයන් වහන්සේ සත්වයන්ට හිතවැඩ ම උපදවන සේක. ප්‍රපාතයකින් හෙළා දමා වී නමුත් සත්වයන්ට හිත වැඩ ම උපදවනසේක. මරාදමා වී නමුත්, සත්වයන්ට හිතවැඩ ම උපදවනසේක. මහරජානෙනි, යම් සේ දෙමවුපියෝ නම් වධ කොට තළාත් ගෙඩි දී ඔසවා දමාත් පුත්‍රයනට හිතවැඩ ම උපදවන්නාහු වෙති. මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් **(117)** වහන්සේත් සත්වයන්ට වධයක් කරතත් හිතවැඩ පිණිස ම ය. ඇද හෙළතත් සත්වයන්ට හිත වැඩ පිණිස ම ය. මරන්නේ වී නමුත් සත්වයන්ට හිතවැඩ පිණිස ම ය. මහරජානෙනි, තථාගතයන් වහන්සේ වධ කොට සත්වයන්ට හිත වැඩ ම උපදවනසේක. මරාපියාත් සත්වයන්ට හිතවැඩ ම උපදවනසේක. යම් යම් කාරණයකින් සත්වයන්ගේ ගුණ නුවණ පුණ්‍යඵල වැඩි වේ ද, ඒ ඒ කාරණයෙන් ඒ ඒ උපායෙන් සකලසත්වයන්ට හිතවැඩ ම උපද වනසේක. ඉදින් මහරජානෙනි, දෙවදත්තයන් වහන්සේ පැවිදි නො වූවෝ වූ නම් ගිහි ව වසමින් නරකයට පමුණුවන්නා වූ බොහෝ අකුශල කර්මයන් රැස් කොට අනෙකකල්පකොටිශතසහස්‍රයෙහි නරකයෙන් නරකයට විනිපාතයෙන් විනිපාතයට යෙමින් අප්‍රමාණ වූ බොහෝ දුක් විඳින්නේ ය. ඒ කාරණය භාග්‍යවත් සර්වඥයන් වහන්සේ දිව්‍යසින් දැන වදාරමින් 'මාගේ ශාසනයෙහි පැවිදි වූවාහට දුක් කෙළවර වන්නේ ය' යි කරුණාවෙන් දෙවදත්තයන් මහණ කර වදළසේක. මහණ කොට කරුණාවෙන් බලවත් වූ දුක් ලැහැල්ලු කළසේක. මහරජානෙනි, යම් සේ මහාධන යශශ්‍රීඥතිබලයෙන් බලවත් වූ පුරුෂයෙක් තෙම තමාගේ නෑකෙනෙකුන්ට හෝ මිත්‍රකෙනෙකුන්ට හෝ රජකෙනෙකුන්ගෙන් පැමිණියා වූ බලවත් දඬුවමක් දරන්නා දැක තමාගේ රජහට බොහෝ විශ්වාසභාවයෙන් හා උපායෙහි සමර්ථතාවෙන් මහත් වූ දණ්ඩනය මඳක් ලැහැල්ලු කෙරේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ බොහෝ කල්පකොටිශතසහස්‍රයක් මුළුල්ලෙහි නරකදුක් විඳින්නා වූ කාරණය දිව්‍යඥනයෙන් දැක දුක් කෙළවර කරණ කරුණාවෙන් දෙවදත්තකුමාරයානන් මහණ කොට ශීලසමාධිප්‍රඥවිමුක්තිබල සමර්ථභාවයෙන් මහත් වූ දුක් ලඝුකර වදළසේක. තවද, මහරජානෙනි, යම් සේ වනාහි අතිදක්ෂ වූ ශල්‍යකර්තෘ වූ වෙදෙක් මහත් වූ බලවත් වූ ව්‍යාධියක් ඖෂධලබයෙන් මඩවා ලැහැල්ලු කෙරේ ද, මහරජානෙනි,

එපරිද්දෙන් ම බොහෝ වූ කල්පකොටිශතසහස්‍රයක් මුළුල්ලෙහි දුක් විඳින්නා වූ දෙවදත්තකුමාරයන් භාග්‍යවතුන් වහන්සේ උපාය දැනීමෙන් මහණ කොට සකලසත්වයන් කෙරෙහි පහළා වූ මහාකරුණා බලයෙන් උපස්තම්භක වූ සද්ධර්මඖෂධබලයෙන් දුක් නමැති මහත් වූ ව්‍යාධිය ලැහැල්ලු කර වදාළසේක.

''කිමෙක් ද, මහරජානෙනි, ඒ භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ බොහෝ දුක් විඳින්නා වූ **දෙවදත්ත**කුමාරයාට විඳින දුක් ඉතා මඳ කෙරෙමින් මඳ වුවත් අකුශලයකට පැමිණිසේක් ද?'' යි විචාළසේක. ''අනේ! ස්වාමීන් වහන්ස, බුදුරජානන් වහන්සේ යටත් පිරිසෙයින් කිරිපිරක් දෙවනා කල් මාත්‍රයක් වත් මඳකුත් අපුණ්‍යයකට නො පැමිණි සේකැ'' යි කීහ. ''මහරජානෙනි, තෙපි වනාහි යම් කාරණයකින් භාග්‍යවතුන් වහන්සේ දෙවදත්ත කුමාරයා මහණ කළසේක් ද, ඒ මේ කාරණයත් අර්ථවශයෙන් පිළිගණුව. මහරජානෙනි, අනිකුත් ඉතිරි කාරණයෙක් ඇත. යම් කාරණයකින් භාග්‍යවතුන් වහන්සේ දෙවදත්ත කුමාරයා මහණ කළසේක් ද, ඒ කාරණයත් ඇසුව මැනැව.

''මහරජානෙනි, යම් සේ ආත්මාර්ථපරාර්ථවිනාශකරණයෙහි දක්ෂ වූ මං පැහැර උමං බිඳ ගම් පැහැර ගම්පෙරළි කරන්නා වූ සොරෙකු අල්වා බැඳ ගෙණ රාජපුරුෂයෝ රජ්ජුරුවන් **(118)** කරා ගොස් 'දෙවයන් වහන්ස, මේ සොර පුරුෂතෙම ඔබ වහන්සේගේ ආඥාචක්‍රයට විද්ධ ව හැසුරුණේ ය. මෝහට යම් වධයක් කරණු කැමැතිසේක් නම්, ඒ දඬුවම් පණවා වදාළ මැනැවැ' යි කියා රජ්ජුරුවන්ට දැක්වූවාහු වී නම්, සගයෙනි, එසේ වී නම්, මේ සොරා වදබෙර ගසා නුවරින් පිටත ගෙණ ගොස් ආඝාතනයෙහි දී ඉස කපා දමව්' කියා රජ්ජුරුවෝ ඔවුන්ට මෙසේ කීවාහු වූ නම්, එසේ ය, දෙවයන් වහන්ස, යි කියා ඒ පුරුෂයෝ රජ්ජුරුවන්ගේ වචනය අසා ඒ සොරා වදබෙර ගසා නුවරින් පිටත ගෙණ ගොස් මිනී මරණ ආඝාතනභූමියට පැමිණියාහු වී නම්, එකල රජ්ජුරුවන්ගේ සමීප යෙන් ලබන ලද වරප්‍රසාද ඇත්තා වූ ලබන ලද යශස්ධනභොග ඇත්තා වූ ඇදහිය යුතු වචන ඇත්තා වූ බලිවිනිශ්චිතකාර වූ රාජාභ්‍යන්තර වූ කිසියම් පුරුෂයෙක්තෙම මරණයට පැමිණියහු දුටුයේ ඉක්බිති ඒ රාජාභ්‍යන්තර පුරුෂතෙම මරන්ට සිටිත ඒ පුරුෂයාහට කරුණා කොට ඒ රාජපුරුෂයන්ට මෙසේ කියන්නේ ය. 'පින්වත්නි, තොපට මොහුගේ සීසච්ඡේදනය කිරීමෙන් කම් කිම් ද? එහෙයින්, පින්වත්නි, මොහුගේ අතක් හෝ පයක් හෝ කපා දමා නො මරා ජීවිතය රක්ෂා කරව්. මම රජ්ජුරුවන්ගේ සමීපයෙහි දී මොහු පිණිස වචන කථා කොට රජහට සැල කෙරෙමි' යි කියා ය.[1] ඒ අමාත්‍යපුරුෂයාගේ බලවත් ව කියන්නා වූ වචනය කරණ කොට ගෙණ ඒ ගම් රැකවල්ලු ඒ සොර පුරුෂයාගේ අතක් හෝ පයක් හෝ මඳක් කපා හැර ජීවිතය රක්ෂා කළාහු වී නම්,

1. කීයේ ය.

Non-Commercial Distribution

කිමෙක් ද? මහරජානෙනි, ඒ අමාත්‍යපුරුෂතෙම මේ සොරපුරුෂයාගේ හස්තච්ඡේදනය කරලීමෙන් ඔහට අනර්ථකාරී වූයේ දැ?'' යි විචාළසේක.

''ස්වාමීනි, ජීවිත දායක වූ ඒ පුරුෂතෙම ඒ සොරාහට ජීවිතදානය දුන් කල්හි ඒ සොරුහට කවර නම් උපකාරයක් නො කරණ ලද නම් ඇද් දැ?'' යි කීහ. ''ඒ සොරාගේ හස්තපාදච්ඡේදනයෙහි යම් දුක්ඛ වේදනාවක් ඇද් ද, ඒ දුක්ඛවේදනාවෙන් මඳකුත් අකුශලකර්මයකට ඒ දිවි දුන් පුරුෂතෙම පැමිණේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, ඒ සොරපුරුෂ තෙම තමා විසින් ම කර ගත් දෙයින් ම දුක්ඛවේදනාව විඳින්නේ ය. ජීවිත දායක වූ පුරුෂතෙම වනාහි මඳකුත් අකුශලයකට නො පැමිණෙන්නේ ය''යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ 'මාගේ ශාසනයෙහි මහණ වූ දෙවදත්තයාහට දුක් කෙළවර වන්නේ ය' යි කියා බුදුඇසින් දැක ඔහු කෙරෙහි කරුණාවෙන් **දෙවදත්ත** කුමාරයා පැවිදි කර වදාළසේක. මහරජානෙනි, දෙවදත්තයන් වහන්සේගේ දුක් කෙළවර ඇත්තේ ය. මහරජානෙනි, ඒ දෙව්දත් තෙරුන් වහන්සේ පූර්වවෛර-යෙන් බුදුන් හා විරුද්ධ ව 'බුදුන් මරා බුද්ධරාජ්‍යය ගණිමි' යි සිතා සංඝ භේදකර්මය කොට වෙන් ව සිට බුදුන් මරන්ට නොයෙක් උත්සාහ කොටත් බුදුන් මරා ගත නො හී පොළොව පැළී නරකයට යන දවස් බුදුන් ගුණ සිහි කෙරෙමින් මරණ කාලයෙහි:—

**''ඉමෙහි අට්ඨිහි තමග්ගපුග්ගලං**
**දේවාතිදේවං නරදම්ම සාරථිං,**
**සමන්තචක්ඛුං සතපුඤ්ඤලක්ඛණං**
**පාණේහි බුද්ධං සරණං උපෙමි.''**

**(119)** යන මේ ගාථාවෙන් 'සනරාමරලොකාග්‍රපුද්ගල වූ දෙවාති දෙව වූ, දමනය කළ යුතු වූ මනුෂ්‍යයන් තදංගවිනයාදියෙහි හික්මවා දමනය කරන්නා වූ, සියල්ල දක්නා සමන්තචක්ඛු නම් සර්වඥතාඥනයක් ඇත්තා වූ, ශතපුණ්‍යලක්ෂණයෙන් යුක්ත වූ,ඒ බුදුන් දිවිහිමියෙන් සරණට පැමිණෙමි. එහෙයින් ස්වාමීනි, මාගේ ලොවුතුරා බුදුරජානෙනි,(නුඹ වහන්සේ) නුඹ වහන්සේට අපරාධ කළ මා කෙරෙහි ද නුඹගේ අත ඇඟිලි කපා මරන්නට පැන්නු **අංගුලිමාල** මහසොරානන් කෙරෙහි ද, නුඹ ඇත මරන්නට පැන්නු **ධනපාලයා** කෙරෙහි ද, නුඹගේ ඖරසපුත්‍ර වූ **රාහුල** කුමාරයන් කෙරෙහි ද, මෙකී සතර තැන එකාකාර ව පවත්නා කරුණාවෙන් (යුක්තසේක.) ලොවුතුරා බුදු වූ නුඹට සුහුරුබඩු වීමි. අප **සුද්ධොදන** මහරජානන්ට බෑනා වීමි. මා නැගනියන් **යශොධරාවන්ට** වැඩි සිටියෙමි. **රාහුල** කුමරුවන්ට මයිලනු වීමි. ස්වාමීනි, මේ අට කාරණය කරණ කොට ගෙණ මා නරකදුකින් ගලවා ගෙණ වදාළ මැනැවැ'යි කියකියා පොළෝ ගිලෙමින් ම දිවි කෙළවර කොට බුදුන් සරණ ගියේ යි. මහරජානෙනි, මේ කල්පය සකොට්ඨාශයක් කොට බෙදූ කල්හි පළමු කොට්ඨාශය අතික්‍රාන්ත වූ කල්හි දෙවදත්තයන් වහන්සේ සංඝභෙදය

Non-Commercial Distribution

කළ සේක. එහෙයින් ඉතිරි පස්කොට්ඨාසයෙහි අවීචිනිරයෙහි පැයි ඒ අවීචියෙන් මිදී මතු සට්ඨිස්සර නම් පසේබුදු වන්නාහ. කිමෙක් ද, මහරජානෙනි, මෙසේ දුක් කෙළවර කළා වූ භාග්‍යවතුන් වහන්සේ දෙවදත්තයන් වහන්සේට කළ මනා කාරි වූ සේක් ද? නැද් ද?''යි විචාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ දෙවදත්ත තෙරණුවන්ට සියල්ල ම දෙවූසේක. තථාගතයන් වහන්සේ යම් ඒ දෙවදත්තයන් ප්‍රත්‍යෙකබොධියට පමුණුවා වදරණසේක් වී නම්, තථාගතයන් වහන්සේ දෙවදත්තයන්ට නො කරණ ලද්ද වූ කවර නම් උපකාරයෙක් ඇද්ද?''යි කීහ. ''මහරජානෙනි, දෙවදත්තයන් සංඝ භෙදය කොට නරකයෙහි යම් දුක්ඛවේදනාවක් විඳුනු ලබන්නේ වී නම් කිමෙක් ද, අප භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණයෙන් මඳකුත් අපුණ්‍යය කට පැමිණ වදරණසේක් දැ?''යි විචාළසේක. ''නැත, ස්වාමීනි, දෙවදත්තයෝ තමා විසින් ම කර ගත්තා වූ අකුශලකර්මයෙන් කල්පයක් නරකයෙහි පැසෙන්නාහ. ස්වාමීනි, දුක් කෙළවර කාරක වූ ශාස්තෘන් වහන්සේ මඳකුත් අපුණ්‍යයකට නො පැමිණිසේකැ''යි කීහ.

''මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ යම් කාරණයකින් දෙවදත්තයන් මහණ කළසේක් ද, ඒ මේ කාරණයත් තොප අර්ථ වශයෙන් සලකා පිළිගත මැනැව. මහරජානෙනි, තවත් ඉතිරි කාරණයක් ඇත. භාග්‍යවතුන් වහන්සේ යම් කාරණයකින් දෙවදත්තයන් මහණ කළ සේක් ද, ඒ කාරණයත් සකසා ඇසුව මැනැව. මහරජානෙනි, යම් සේ වෙදකමෙහි දක්ෂ වූ ශල්‍යකෘත වූ මහාවෛද්‍යාචාර්‍යයෙක්තෙම වාත පිත්ත ශ්ලෙෂ්ම සන්නිපාත ඍතුපරිවර්තනයකින් හෝ යම් කිසි විෂමපරිහරණඋපක්‍රමයකින් ජනිත වූ කකියන කුණුමස් දුර්ගන්ධ ඇත්තා වූ ඇතුළත්හි ඔඩු දක සිල්ව ගියාවූ නිති වැහෙන සැරව කුණුලෙයින් සම්පූර්ණ වූ අසාධ්‍ය වූ මහත් වණපිළිකාවක් දක මහත් වූ කරුණාව උපදවා ඒ වණය ව්‍යුපශමනය කරන්නේ වණමුහුණතෙහි කර්කශ තීක්ෂ්ණ කටුක තදකාරම් බෙහෙතින් ලිම්පනය(120) කරන්නේ ය. පැසවීමෙන් වුවමනා පමණකට පැසවා හැර වණය මෘදුභාවයට පැමිණි කල්හි තියුනු සැත්කටුවකින් දූමස්දළු කුණුමස් කපා හැර යකඩ කුරකින් ඔඩු කුරකින් ඔඩු ගත් තැන් පුළුස්සන්නේ ය. දැවී ගිය කල්හි ඊට සුදුසු වූ කාරම්බෙහෙත් දෙන්නේය. වණයෙහි මස් වැඩෙන පිණිස මිහිරිබෙහෙතින් ආලිම්පනය කරන්නේ ය. මෙසේ කිරීම[1] ඔහුගේ ව්‍යාධිය නීරෝගිභාවයට පැමිණීම පිණිස වන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, ශල්‍යකර්තෘ වූ ඒ වෛද්‍යාචාර්යතෙම අහිතසිතකින් බෙහෙතින් වණය ආලිම්පණය කෙළේ ද? ශස්ත්‍රයෙන් කැපුයේ ද? යකඩකුරකින් පිළිස්සුයේ ද? කාරම්බෙහෙත් දුන්නේ දැ?''යි විචාළසේක. ''නැත; ස්වාමීනි, හිතචිත්තයෙන් රොගීහට සැප කැමැත්තා වූ වෛද්‍යාචාර්යතෙම ඒ කට යුතු කරන්නේ ය'' යි කීහ. ''ඔහට වනාහි

1. කිරීමෙන්

Non-Commercial Distribution

බෙහෙත් ක්‍රියාකරණයෙන් උපන්නා වූ යම් දුක්ඛවේදනාවක් ඇද් ද, ඒ කාරණයෙන් ඒ ශල්‍යකර්තෘවෛද්‍යාචාර්යයා මදකුත් අකුශලයකට පැමිණේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, රොගීහට සැප කැමැත්තා වූ හිත සිත් ඇත්තා වූ ශල්‍යකර්තෘ වූ ඒ වෛද්‍යාචාර්යතෙම ඒ කට යුතු ම කරන්නේ ය. ඒ තෙම ඒ කාරණයෙන් කුමන පවකට පැමිණේ ද? ස්වාමීනි, ඒ ශල්‍යකර්තෘ වූ වෛද්‍යාචාර්යතෙම ස්වර්ගගාමී ව දෙව්ලොවට යන්නේ ය'' යි කීහ.

''මහරජානෙනි, එපරිද්දෙන් ම අප භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ දෙවදත්තයා දුකින් මුදනු පිණිස කරුණාවෙන් මහණකර වදාළ සේක. මහරජානෙනි, අනිකුත් ඉතිරි කාරණයක් ඇත. යම් කාරණයකින් භාග්‍යවතුන් වහන්සේ දෙවදත්තයා මහණ කර වදාළසේක් ද, ඒ කාරණයත් ඇසුව මැනැව. මහරජානෙනි, යම් සේ වළගොඩ නො බලා මග යන්නා වූ අලසකාරී පුරුෂයකු කටුවකින් ඇණෙන ලද්දේ වී නම්, නැවත ඒ මග යන්නා වූ අනික් පුරුෂයෙක් ඔබිනොබ හැරෙණ පෙරළෙන ඕහට හිත කැමැති ව සැප කැමැති ව කරුණා උපදවා වෙනින් සියුම් කටුවකින් හෝ ශස්ත්‍රමුණයකින් හෝ උල ඇනුනු තැන හාත්පසින් වට කපා පූයා වැහෙන්නා වූ ලෙහෙයෙන් යුක්ත වූ කටුව උපුටා හරින්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ පුරුෂතෙම අහිතකාමී ව ඒ කටුව උපුටා හරණේ[1] ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, ඕහට සැප කැමැත්තා වූ හිත කැමැත්තා වූ ඒ පුරුෂතෙම කටුව උපුටා හරින්නේ ය. ඉදින්, ස්වාමීනි, ඒ පුරුෂතෙම ඒ පය ඇනුනු කටුව නො හැරියේ වී නම්, ඔහු එයින් මරණයට හෝ පැමිණෙන්නේ ය. මරණය සමාන දුකට හෝ පැමිණෙන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අප තථාගත යන් වහන්සේ දෙවදත්තයන් සසරදුකින් මුදනු පිණිස කරුණාවෙන් ම මහණ කළසේක. ඉදින්, මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ දෙවදත්තයා මහණ නො කළසේක් වී නම්, කල්පකොටිශතසහස්‍රයක් මුළුල්ලෙහි භවපරම්පරාවෙන් දෙවදත්තයෝ නරකයෙහි පැසෙන්නාහ''යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගත වූ බුදුරජානන් වහන්සේ උදකස්‍රොතයෙන් පහළ බලා යන දෙවදත්තයන් උඩු ගහට හැර වදාළසේක. අමාර්ගයට පැමිණි දෙවදත්තයන් මාර්ගයට පමුණුවා වදාළසේක. ප්‍රපාතයෙක වැටුනා වූ **(121)** දෙවදත්තයාහට ප්‍රතිෂ්ඨාවක් දුන්සේක. විෂමස්ථානගත වූ දෙවදත්තයන් තථාගතයන් වහන්සේ සම වූ ක්ෂේමස්ථානයකට නහා වදාළසේක. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ වදාළා වූ මේ වචනාවයව කථාස්වරූපයන් හා මේ විසිතුරු වූ කාරණයන් නුඹ වහන්සේ හා සදෘශ වූ අතුල්‍යප්‍රඥාවතුන් වහන්සේලා හැර මඳ නුවණැති අනික් කෙනෙකුන් විසින් දක්වන්නට නො හැකි වන්නේ ය'' යි කියා ප්‍රශංසා කළහ.

**දෙවදත්ත ප්‍රව්‍රජ්‍යා ප්‍රශ්නය නිමි.**

1 හැරියේ

Non-Commercial Distribution

# විශ්වන්තර පෘථිවි කම්පා ප්‍රශ්නය

නැවතත් **මිලිඳුමහරජානෝ** "ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ විසින් 'මහණෙනි, මහත් වූ පෘථිවි චලනයාගේ පහළ වීම පිණිස වන්නා වූ මේ කාරණයෝ අටදෙනෙක. ප්‍රත්‍යයයෝ අටෙකැ' යි කියා මේ වචනය වදරණ ලද්දේ ය. මේ අවශෙෂ නො වූ සර්වප්‍රකාර වචනයෙක. මේ ඉතිරි නො වූ නිරවශෙෂ වචනයෙක. මේ ඉතිරි කාරණයක් නැති තීන්දු වචනයෙක. එහෙයින් මහත් වූ පෘථිවි චලනයාගේ පහළවීම පිණිස වන්නා වූ අනික් නව වැනි කාරණයෙක් නැත්තේ ය. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මහත් වූ පෘථිවි චලනයාගේ පහළ වීම පිණිස නවවැනි වූ අනික් කාරණයක් වන්නේ වී නම්, භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ ඒ කාරණයත් වදරණ සේක. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් හෙයකින් මහත් වූ පෘථිවිචලනයාගේ පහළ වීම පිණිස අනික් නවවැනි කාරණයෙක් නැත්තේ ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරණ ලද්දේ ය. ස්වාමීනි, **වෙස්සන්තර** රජ්ජුරුවන් විසින් පුත්‍රදනාදි මහාදනය දෙන කල්හි සත් වරක් 'මහාපෘථිවිය[1] කම්පිත වී ය' යි කියා වදළ යම් වචනයක් ඇත් නම්, මහත් වූ පෘථිවිචලනයාගේ පහළ වීම පිණිස ඒ මේ නව වැනි කාරණයෙක් මා විසින් දක්නා ලැබෙයි. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මහත් වූ පෘථිවිකම්පාවගේ පහළ වීම පිණිස අෂ්ටප්‍රත්‍යයයන් හා කාරණා අට නියම වී නම්, එයින් '**වෙස්සන්තර** නම් රජ්ජුරුවන් විසින් පුත්‍රදනාදි මහාදනය දෙන කල්හි සත්වරක් පෘථිවි කම්පාවී ය' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් වෙස්සන්තර රජ්ජුරුවන් විසින් පුත්‍රදනාදිමහාදනය දෙන කල්හි සත්වරෙක මහ පොළොව කම්පා වී ය යි වදළ වචනය සැබෑ වී නම්, එහෙයින් 'මහත් වූ පොළොව කම්පාව පහළ වීම පිණිස වන්නා වූ ප්‍රත්‍යය අටෙක, කාරණා අටෙක් ම ය' යි කියා වදළ ඒ වචනය හෝ බොරු වන්නේ ය. ජල පොළෝ සෙයින් අතිගම්භීර වූ ප්‍රඥඇසට ඝනාන්ධකාරය කරන්නා වූ හැරිය නො හැකි තද වෙළුමක් වැනි වූ සියක් වර පැළු අස්ලොම් අගක් මෙන් සුඛුම වූ ඒ මේ උභතොකොටිකප්‍රශ්නයතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ය. මේ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ වැනි වූ ප්‍රඥවතුන් වහන්සේලා හැර මඳ නුවණැති අනික් කෙනෙකුන් විසින් තෝරා විසඳා පියන්නට නො හැකි වන්නේ ය. ස්වාමීනි, ප්‍රඥවික්‍රමය බලව" යි කීහ.

**(122)** "මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මහත් වූ පෘථිවිකම්පාව පහළ වීම පිණිස මේ කාරණයෝ අටදෙනෙකැ'යි කියා මේ අටකාරණය වදරණ ලද්දේ ය. 'වෙස්සන්තර රජ්ජුරුවන් විසින් මහාදනය දෙන කල්හිත් සත්වරෙක මහාපෘථිවිතොම කම්පා වී ය' යි කියා වදළ කාරණයත් සැබෑ ම ය. ඒ කම්පා වීම වනාහි අකාලික ය.

1. පෘථිවිතොම

Non-Commercial Distribution

කිසිකලෙක උපදින දෙයෙක. අටකාරණයෙන් මිදුනේ ය. එහෙයින් අටකාරණය හා ගණනට නො ගන්නා ලද්දේ ය. මහරජානෙනි, යම් සේ ලොකයෙහි වස්සානිකය, හෙමන්තනිකය, පාවුස්සික ය යි මෙසයෝ තුන්දෙනෙක් ම ගණන් ගණිති. ඉදින් ඒ වර්ෂා තුණ හැර අනික් වර්ෂාවෙක් වසී නම්, ඒ වර්ෂාව ලොකසම්මත වූ මෙසයන් හා ගණනට නො ගන්නා ලැබෙයි. 'අකාල මෙසය' යි කියා සංඛ්‍යාවට යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම වෙස්සන්තරරජ්ජුරුවන් විසින් පුත්‍රාදීමහාදනය දෙන කල්හි සත්වරක් මහපෘථිවිය කම්පිත වී ය. මේ කාරණය කිසි කලෙක වන්නා වූ අකාලිකයෙක. අටකාරණයෙන් මිදුනේ ය. ඒ කාරණය අටකාරණයන් හා ගණන් නො ගන්නා ලැබෙයි. තවද, මහරජානෙනි, යම් සේ හිමාලය පර්වතයෙන් පන්සියයක් පමණ ගංගාවෝ වහින්නාහු ය. මහරජානෙනි, ඒ පන්සියයක් පමණ ගංගාවන්ගෙන් ගංගාදසයක් පමණ නදී සංඛ්‍යාවට ගණන් ගණිති. ඒ කවරේ ද? **ගංගා ය, යමුනා ය, අචිරවතී ය, සරභූ ය, මහී ය, සින්ධු ය, සරස්වතී ය, වෙත්‍රවතී ය, වීතංසා ය, චන්ද්‍රභාගා ය,** යන මේ දසය ලොකසම්මත ය. අවශෙෂ වූ ගංගාවෝ නදී සංඛ්‍යාවට ගණන් නො ගන්නා ලද්දහු ය.

''කාරණ කවරේ ද? යත්— ඒ දශනදීහු ප්‍රධාන ජලාශයයෝ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම වෙස්සන්තර රජ්ජුරුවන් විසින් මහදන දෙන කල්හි සත්වරක් මහාපෘථිවිතොම කම්පිත වූවා ද, මේ කම්පිත වූ කාරණය ද කිසි දවසක උපදින්නා වූ අකාලිකයෙක. අටකාරණයෙන් මිදුනේ ය. **වෙස්සන්තරජාතකයෙහි** යම් ඒ පොළෝ කම්පා වූ කාරණය අටකාරණයන් හා ගණන් නො ගන්නා ලැබෙයි. තවද, මහරජානෙනි, යම් සේ රජ්ජුරුවන්ගේ සියයක් හෝ දෙසියයක් හෝ පන්සියයක් හෝ අමාත්‍යයෝ වෙති. ඔවුන්ගෙන් ජනයෝ සදෙනෙක් ම අමාත්‍යගණනට ගණිනු ලැබෙති. ඒ කවුරු[1] ද? අග්‍රසෙනාපති ය, පුරොහිතයානෝ ය, ධර්මවිනිශ්චයමහාමාත්‍යයානෝ ය, භාණ්ඩාගාරිකයානෝ ය, රාජඡත්‍රය උසුලනුවානෝ ය, රාජඛඩ්ගය උසුලනුවානෝ ය, මොවුහු පමණක් ම අමාත්‍යගණනාවට ගණිනු ලැබෙති. කාරණ කවර? යත්— මේ සදෙනා රාජගුණයෙන් යුක්ත බැවින් ප්‍රධාන වෙති. අගණිත වූ අවශෙෂ සියල්ලෝ ම අමාත්‍යයෝ ය යි කියා සංඛ්‍යාවට යෙති, එපරිද්දෙන් ම මහරජානෙනි, වෙස්සන්තර රජ්ජුරුවන් විසින් මහාදනය දෙන කල්හි සත්වරක් ම මේ මහාපෘථිවිතොම කම්පිත වූවා ය. මේ කාරණය කිසි කලෙක උපදින්නා වූ අකාලිකයෙක. අටකාරණයෙන් මිදුනේ ය. ඒ කාරණය අටකාරණයන් හා නො ගණිනු ලැබෙයි. මහරජානෙනි, දුන් මේ **(123)** ගෞතමජින ශාසනයෙහි කෘතාධිකාරයන්ගේ දෘෂ්ටධර්මසුඛවෙදනීය වූ පුණ්‍යකර්මයක් අසන ලද්දේ ද, යම් කෙනෙකුන්ගේ කීර්ති තොම දිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි ඉතා උස් ව පැන නගින ලද ද, ඒ බවත් ඇසූයෙහි දැ?'' යි විචාළ සේක. ''එසේ ය, ස්වාමීනි, දුන් මේ ගෞතමජිනශාසනයෙහි කෘතාධි-

1. කවරේ

Non-Commercial Distribution

කාරයන් ඇත්තා වූ යම් කෙනෙකුන්ගේ දෘෂ්ටධර්මසුඛවේදනීය වූ යම් පුණ්‍යකර්මයක් වී ද, දිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි ඉතා උස් ව පැන නැංගා වූ කීර්තියක් ඇද් ද, ඒ බව මා විසින් අසන ලද්දේ ය. ඒ ජනයෝ සත් දෙනෙකැ'' යි කීහ. ''මහරජානෙනි, ඔහු කවුරු දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, **බිම්බිසාර** රජ්ජුරුවන්ට ගෙණ යන මල් අට නැළියකින් බුදුන් පුදු මහසැපත් ලැබූ **සුමන** නම් මාලාකාරයාතෝ ය. අඹුව හා තමමේත් වරින් වර පෙරව ගෙණ කලඑලි බලා යන එකසාටකය බණ අසා බුදුන්ට පුද එදවස් නොයෙක් සැප ලැබූ **එකසාටකබමුණානෝ ය,** බත්බැලයෙන් ජීවත් වෙමින් **සැරියුත්** මහතෙරුන් වහන්සේට දන් දී සිටුසැපත් ලැබූ **පූර්ණ** නම් බහුධනසිටාණෝ ය. කොමපිඩුතුණක් පැසෙක ලා ගෙණ මග යමින් ලොවුතුරා බුදුන්ට පුද එදවස් එම කුශලබලයෙන් **කොසොල්**රජහට අග්‍රමහෙසිකා තනතුරට පැමිණි **මාලාකාර දුවනියෝ** ය. රන්මසු දහසකට අගය වඩා මිලයට ඉල්ලූ තමන් කොණ්ඩය නො දී සිස් පා අතින් ගෙණ ගෙදරට පැමිණි **කසයින්**මහතෙරුන් ඇතුළු වූ සහ අටනමක් දක පිදිය යුතු වතක් නැත්තෙන් තමන් කොණ්ඩය කපා දී රන් මසුඅටක් ගෙණ එයින් දන් සපයා පිළිගන්වා සඟරුවන් දකුන් ම හිසකේ දික් ව ඒ කුශලබලයෙන් **උදේනි** නම් නරනිඳුන්හට අග්‍රමහෙසිකා තනතුරට පැමිණි **ගොපාලමාතා** නම් දුක්පත් සිටුදුවනියෝ ය. රොගාතුරනමක්හට කලවේ මස් කපා දන් දෙමින් මරණාසන්න ව බුදුන් දකුත් නීරොගී ව බණ අසා සොවාන් වූ **සුප්පියා** නම් උපාසිකාවෝ ය. කුඩුපුවක් ඉණ ලාගෙණ දියට යෙමින් බුදුන් දක කළය තබා බුදුන්ට කුඩුකැවුම පුද බණ අසා සෝවාන් වූ **පුණ්ණා** නම් දසින්දැ ය යන මේ සත්දෙන මෙ ම ජන්මයෙහි දෘෂ්ටධර්මසුඛවේදනීයකුශලකර්මයට පැමිණි සත්වයෝය. දිව්‍ය මනුෂ්‍යයන් කෙරෙහි මොවුන්ගේ කීර්තිගුණය ද ඉතා උස් ව පැනනැංගේ ය'' යි කීහ.

''මහරජානෙනි, හේ කිමෙක් ද? දන්-පින් කළ කෙනෙකුන් පරලොව ලබන ආනිසංස මුත් මෙලො ව ම ලබන ආනිසංසයක් ඇසුයේ ඇද් ද? මේත් එක් කාරණයක් කොට සිත්හි තබා ගත මැනැව. මහරජානෙනි, අනික් කෙනෙක් අතීත කාලයෙහි මානුසික වූ ශරීරදෙහයෙන් ම **ශක්‍ර** භවනයට ගියාහු ය යි කියා අසන ලද්දේ දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, මා විසින් ඔවුහු අසන ලද්දහු ය'' යි කීහ. ''මහරජානෙනි, ඔහු කවුරු කවුරු දැ?'' යි විචාළසේක. ස්වාමීනි, වීණාගාන්ධර්වයෙහි දක්ෂ වූ **ගුත්තිලපණ්ඩිතයෝ** ය. **සාධිනරජ්ජුරුවෝ** ය. **නිමිරජ්ජුරුවෝ** ය. **මහාමන්ධතුරජ්ජුරුවෝ ය** යන මේ සතරදෙන එම මනුෂ්‍යශරීරයෙන් ම ශක්‍රභවනයට ගියාහු ය යි කියා මා විසින් අසන ලද්දේ ය. බොහෝ ඈත කරණ ලද සුචරිතදුශ්චරිතය අසන ලද්දේ ය'' යි කීය.

''යහපත, මහරජානෙනි, තෙපි ඉතා අතීතයෙහි බොහෝ කාරණයන් අසා දන්නහු ය. මහරජානෙනි, 'අතීත කාලයෙහි හෝ වර්තමානකාලයෙහි හෝ මෙනම් ඇත්තහුගේ දනය දෙන කල්හි වරක් හෝ දෙවරක් හෝ තුන්වරක් හෝ මහාපෘථිවිය කම්පා වන ලද්' යි කියා තොප විසින් පෙර

අසන ලද්දේ දූ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' කීහ. ''මහරජානෙනි, **(124)** ආගමාධිගම පර්යාප්තිශ්‍රවණය හා ත්‍රිවිධ වූ ශික්ෂාබලය ද පූර්වාචාරීන්ගෙන් ඇසීමෙන් හා නැවත නැවතත් විචාරීමෙන් ගුරුන් ආශ්‍රයත් මට ඇත්තේ ය. එසේ උවත් මා විසිනුත් මෙනම් ඇත්තහුගේ දනය දෙන කල්හි වරක් හෝ දෙවරක් හෝ තුන්වරක් හෝ මහපොළොව කම්පිත වී ය යි කියා පෙර නො අසන ලද්දේ ය'' යි කීහ.

''මහරජානෙනි, **වෙස්සන්තර** නම් රාජශ්‍රේෂ්ඨයානන්ගේ දනප්‍රවරය තබා **කාශ්‍යප** නම් භාග්‍යවතුන් වහන්සේගේ ද ශාක්‍යමුනි වූ **ගෞතම** නම් භාග්‍යවතුන් වහන්සේගේ ද යන බුදුවරයන් දෙදෙනා වහන්සේලාගේ අතුරෙන් ගණනපථය අතික්‍රාන්ත වූ අනෙකවර්ෂකොටිගණනෙක් අතික්‍රාන්ත වී. ඒනාක් කාලය මුළුල්ලෙහිත් මෙ නම් තැනැත්තහුගේ දනය දෙන කල්හි වරක් හෝ දෙවරක් හෝ තුන් වරක් හෝ මහපොළොව කම්පා වී ය යි කියා මාගේත් ඇසීමෙක් නැත්තේ ය. මහරජානෙනි, එපමණ වූ වීර්යයකින් එපමණ වූ පරාක්‍රමයකින් මහපොළොව කම්පා නො වන්නේ ය. ගුණභාරහරිත ව කම්පිත වන්නේ ය. මහරජානෙනි, සියලු ම සුචි[1] ක්‍රියා ගුණභාරයෙන් හරිත වූ මහාපෘථිවිතොම ඒ ගුණය ධරන්නට නො හැකි ව සෙල වී යන්නී ය. කම්පා වන්නී ය. වෙවුලන්නී ය.

''මහරජානෙනි, යම් සේ බොහෝ බඩු පිරීමෙන් ඉතා බර බොහෝ වූ ගැල්සකටයාගේ ගැල්චක්‍රය මධ්‍යගතනාභිය ද කරකැවෙන්නා වූ චතුෂ්කයෝ ද කීරි නැඟී පැළෙති. ගැල්අකුර ද බිඳී යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම සියලු ම සුචි[1] ක්‍රියා ගුණභාරයෙන් හරිත වූ මහාපෘථිවිය බොධිසත්වයන් ධරන්නට නො හැකි ව චලිත වන්නී ය. කම්පා වන්නී ය. වෙවුලන්නී ය. මහරජානෙනි, යම් සේ වනාහි අනිලජලප්‍රවෙශයෙන් හාත්පසින් වැසී ගියා වූ වැඩුනා වූ මහාවර්ෂාජලභාරයෙන් හරිත වූ ගගන තලය මහත් වූ වාතයෙන් ඵුටිත[2] වන බැවින් මහත් නාද කරන්නේ ය. රාවය කරන්නේ ය. 'ගල ගල' යන ශබ්දයෙන් ගුගුරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම **වෙස්සන්තර** නම් මහරාජොත්තමයානන්ගේ මහත් වූ දනපාරමිතාබලයෙන් උත්සන්නභාරයෙන් හරිත වූ මහපොළෝ ධරන්නට නො හැකි ව සෙලවෙන්නේ ය. කම්පා වන්නේ ය. වෙවුලන්නේ ය.

''මහරජානෙනි, වෙස්සන්තර රජ්ජුරුවන්ගේ චිත්තය රාග වශයෙන් නො පැවැත්තේ ය. ද්වේෂ වශයෙන් නො පැවැත්තේ ය. මොහ වශයෙන් නො පැවැත්තේ ය, මාන වශයෙන් නො පැවැත්තේ ය, දෘෂ්ටි වශයෙන් නො පැවැත්තේ ය, විතර්ක වශයකිනුත් නො පැවැත්තේ ය. ක්ලේශ වශයෙකිනුත් නො පැවැත්තේ ය. 'රජ වූ මට සුදුසු ය' යි සිතා සුදුසු වශයකිනුත් නො පැවැත්තේ ය, නැවත කුමක් වශයෙන්[3] ද? යත්—

1. සුචච 2. පොථිත 3. කුමක් පිණිස

*Non-Commercial Distribution*

බොහෝ සෙයින් දානපාරමිතාව වශයෙන් පැවැත්තේ ය. 'කිමෙක් දෝ හෝ යි නො ආවා වූ යාචකයෝ මාගේ සමීපයට ධන ඉල්වා ආවාහු නම් මැනැව. ආවා වූ යාචකයෝ කැමැති පරිද්දෙන් ධන ලැබ සතුටු වනු ලැබෙත්ව' යි කියා නිරන්තරයෙන් දානයට ආදර කරණ සිත තබන ලද්දේ වෙයි.

''මහරජානෙනි, **වෙස්සන්තර** නම් මහරජානන්ගේ මානසය ඉන්ද්‍රිය දමනයෙහි ද, කායචිත්තශමනයෙහි ද, අධිවාසනක්ෂාන්තියෙහි ද, කාය වාචාසංවරයෙහි ද, ශීලගුණයෙහි ද, ව්‍රතසමාදනයෙහි ද, පරහට ක්‍රොධ නො කිරීමෙහි ද, හිංසා නො කිරීමෙහි ද, වාක්සත්‍යයෙහි ද, සුචි[1] භාව යෙහි ද, **(125)** යන මේ දශස්ථානයෙහි නිරන්තරයෙන් තබන ලද්දේ වෙයි. මහරජානෙනි, වෙස්සන්තර නම් මහරජානන්ගේ කාමෙසනා තොම ප්‍රහීණ වී ය. භවය සෙවීම සංහිඳී ගියේ ය. ශ්‍රෙෂ්ඨචර්යාව සෙවීමෙහි ම උත්සාහයට පැමිණියේ ය. මහරජානෙනි, වෙස්සන්තර නම් මහරජානන්ගේ ආත්මාරක්ෂාව ප්‍රහීණ වී ය. අනුන් රක්ෂා කිරීමෙහි උත්සාහයට පැමිණියේ ය. 'කිමෙක් ද? මේ සත්වයෝ සමගි වෙත්වා, නීරොගී වෙත්වා, සධනී වෙත්වා, දීර්ඝායුෂ්ක වෙත්ව' යි කියා මෙසේ බොහෝ සෙයින් ම සිත පවත්නේ ය.

''මහරජානෙනි, ඒ දානය දෙන්නා වූ වෙස්සන්තරමහාරජානෝ භව සම්පත්තිය පිණිස නො දෙන්නාහ. ධනසම්පත්තිය පිණිසත් නො දෙන්නාහ. තමහට දෙන දෙයක් තකාත් නො දෙන්නාහ. අනුන්ගේ සිත් ගන්නා පිණිසත් නො දෙන්නාහ. ආයු වඩන පිණිසත් නො දෙන්නාහ. වර්ණ ලබන පිණිසත් නො දෙන්නාහ. සැප ලබන පිණිසත් නො දෙන්නාහ. ශරීරබල ලබන පිණිසත් නො දෙන්නාහ. පිරිස්යස පිණිසත් නො දෙන්නාහ. පුතුන් ලබන පිණිසත් නො දෙන්නාහ. දූන් ලබන පිණිසත් නො දෙන්නාහ. අඹුවන් පිණිසත් නො දෙන්නාහ. නැවැත කුමක් පිණිස දෙනසේක් ද? යත්— සර්වඥතාඥනය පිණිස සර්වඥතාඥනරත්නය පිණිස මෙබඳු වූ අසදෘශ වූ මහත් අනුත්තරදාන ප්‍රවරයන් දුන්නාහු ය. සර්වඥතාඥනයට පැමිණ ද මේ ගාථාව වදාළසේක:—

**'ජාලිං කණ්හාජිනං ධීතං මද්දිදෙවිං පතිබ්බතං,**
**චජ්ජමානො න චින්තෙසිං-බොධියායෙව කාරණා' යි.**

යනු හෙයින් 'මහණෙනි, මා වෙස්සන්තර ව උපන්කල මේ සර්වඥබොධිය පිණිස ම මහත් වූ දානපරිත්‍යාග කරන්නා වූ මම් ගුණනුවණින් තුන්ලෝ අගනා **ජාලිය** කුමාරයන් හා **කෘෂ්ණජිනා** නම් දූහිතෘන් හා පවිත්‍රවිචිත්‍ර චාරිත්‍රපතිව්‍රතාධර්මයෙන් යුක්ත වූ මද්‍රිදෙවීන් ද ආලයක් කොට නො සිතීමි' යි කියා තුන්ලෝ විස්මය පත් කොට වදාළසේක. මහරජානෙනි, ඒ **වෙස්සන්තර** නම් මහරජානෝ ක්‍රොධ නො කිරීමෙන් ක්‍රොධය ජය ගන්නාහ, සත්පුරුෂගුණයෙන් අසත්පුරුෂයා ජය ගන්නාහ. තැගි දීමෙන්

1. සුචච

Non-Commercial Distribution

මසුරුසිත්කාරයා ජය ගන්නාහ, සත්‍යවචනයෙන් බොරු කියන පුද්ගලයා ජය ගන්නාහ. සියලු ම අකුශලධර්මය කුශලධර්මයෙන් ජය ගන්නාහ.

"මහරජානෙනි, මෙබඳු ප්‍රකාරයෙන් දන් දෙන්නා වූ කුශලධර්මයට පැමිණියා වූ පාරමිතාධර්මයාගේ මස්තකප්‍රාප්ත වූ ඒ වෙස්සන්තර නම් බුද්ධාංකුරයානන්ගේ අසදෘශ වූ දානනිස්සන්දඵල[1] වීර්යවිපුලතරවිහරණයෙන් යට අජටාකාශයෙහි පිහිටි නවලක්ෂසැටදහසක් යොදුන් පමණ ඝනය ඇති මහාවාතයෝ චලිත වන්නාහු ය. ඒ වාතයෝ සනිකසනික ව වරින් වර ඒ ඒ අතට ආකුලව්‍යාකුල වන්නාහු ය. එකල මේ පොළොව එක් ඇළයකට පාත් ව ඕනමනය වන්නී ය. එක් අතකට උස් ව උන්නමනය වන්නී ය. අපරාපර ව විශෙෂයෙන් විනමනය වන්නී ය. පොළෝතෙලෙහි කල් ගෙවී පත්‍ර වැටීමට පැමිණියා වූ වෘක්ෂයෝ ඇද වැටෙන්නාහ. 'මේ කිම හෝ?' යි භය ගෙණ වලාහකදෙවතාවෝ රාසි රාසි ව අහස්තලයෙහි ඒ ඒ අත දිවන්නාහු ය. රජසින් රැස් වූනා වූ **(126)** වාතයෝ අහස දුවන දෙවතාවන්ගේ ඇස් භයාගත නො දී ඉතා දරුණු වන්නාහු ය. ගගනතලය පීළනය කොට වාතයෝ හමන්නාහ. කඹුරු සමින් දුවන සුළං සෙයින් සියලු අහස්තලයෙහි වහා වහා 'ධම ධම' යන අනුක්‍රියාශබ්දයෙක්[2] වන්නාහ. මහත් වූ භයානක ශබ්දය පැතිරෙන්නේ ය. මෙසේ වාතය කුපිත වූ කල්හි සියලු ගංගා සමුද්‍ර ජලය සනිකසනික ව ම චලිත වන්නේ ය. උදකය චලිත වූ කල්හි මත්ස්‍ය ඉදිබු ආදීහු චලිත වන්නාහු ය. රැළපතර නිතර යුවල යුවල ව ජනිත වන්නාහ. ජලචර සකලසත්වයෝ තැති ගන්නාහ. සකලසමුද්‍රයතෙම ජල රැළ යුවලින් වැලඳ පවත්නේ ය. තොර නො වන රැළ නාදය පවත්නේ ය. ඝොර වූ දියබුබුල් නැගෙන්නාහු ය. සියලු ගං මුහුදුවල පෙණමාලාවෝ ඇති වන්නාහ. මහාසමුද්‍රය ඉතිරී යන්නේ ය. දිසාවෙන් දිසාවට වතුර දුවන්නේ ය. පටිසොත වූ සියලු ජලධාරාවෝ උඩුගහට යන්නාහ. අසුරගුරුළු නාග යක්ෂයෝ භය වන්නාහ. කළකිරෙන්නාහ. 'කිමෙක් දෝ හො? යි, කවරෙක් දෝ හො?' යි මහාසාගරය විපරිවර්තනය වන්නේ ය යි බියපත් සිත් ඇත්තාහු පැන දුවන්ට යන මං සොයන්නාහ. පෘථිවිසන්ධාරකමහා ජලධාරය චලිත ව ලෙලදුනු කල්හි මහාපෘථිවිය කම්පා වන්නේ ය. නාගයන් සහිත නාගභවනය හා සත්මුහුදු සහිත සාගරය විපරිවර්තනය වන්නේ ය. සිනෙරුපර්වතකූටශෛලශිඛරයතෙම ඒ ඒ අතට නැමෙන්නේ වෙයි. එකල මෙර මත්තෙහි පිහිටි සත්සියයක් යොදුන් උස ඇති වෛජයන්ත ප්‍රාසාදය මල්ඔටුන්නක් මෙන් ඒ ඒ අතට නැමෙන්නේ වෙයි. සර්ප මුගටි බළල් ශෘගාල බූරු මෘග පක්ෂීහු දෙම්නස්සිත් වන්නාහ. පින් මද අල්පෙශාඛ්‍යයක්ෂයෝ භයින් හඬන්නාහ. මහානුභාවසම්පන්න නිර්භීත මහෙශාඛ්‍යයක්ෂයෝ මහපොළොව කම්පා වන කල්හි 'මේ කුමන විස්මයෙක් දූ?' යි මහසිනා කරන්නාහ.

---

1. බල    2. ධමධමන ක්‍රියා ශබ්ද

Non-Commercial Distribution

''මහරජානෙනි, යම් සේ උදකයෙන් සම්පූර්ණ වූ තණ්ඩුලයෙන් ආකීර්ණ වූ ඉතා මහත් වූ මහාභාජනයක් මහත් උදුනකට පැමිණි කල්හි යටින් ගිනි ඇවිළෙමින් පළමු කොට භාජනය රත් කරන්නේ ය. රත් වූ භාජනය වතුර රත් කරන්නේ ය. රත් වූ වතුර සහල් රත් කරන්නේ ය. කකියා රත් වූ සහල් ඌර්ධව ච ඉල්පෙන්නේ ය. වහා නිමුජ්ජනය වන්නේ ය. බුබුල් ඉපදීම වන්නේ ය. පෙණමාලා ඉතිරෙන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම **වෙස්සන්තර** නම් මහරජානෝ ලොකයෙහි කිසිවකු විසින් දීපිය නො හැක්කා වූ යම් දනවස්තුවක් ආලය හැර දෙන සේක් ද, එකල්හි ඒ දනයාගේ ස්වභාවානිසංසයෙන් බොධිසත්වයන් දරන්නට නො හැක්කා වූ යට මහාවාතයෝ කුපිත වූහ. ඒ මහාවාතය කුපිත වූ කල්හි දියදබරාවක් සොලවා ලූ කලක් මෙන් සාරලක්ෂඅසූදහසක් යොදුන් ඝනය ඇති ජලපොළොව කම්පා වි ය. ජලපොළොව කම්පා වූ කල්හි දෙලක්ෂසතළිස්දහසක් යොදුන් ඝනය ඇති මේ පස්පොළොව කම්පා වි ය. මෙසේ එදවස් මහාවාතය ද, ජලපොළොව ද, පස්පොළොව ද යන මේ තුන්දෙන ම එක සිත් ඇත්තවුන් මෙන් වූහ.

''මහරජාණෙනි, යම් සේ **වෙස්සන්තර** මහරජ්ජුරුවන්ගේ මහත් වූ දනානුභාවයෙක් ඇද් ද, විපුල් ඵල[1] වීර්යයෙන් හා මහාදනානිසංසයෙන් **(127)** මෙබඳු වූ අනික් කෙනෙකුන්ගේ දනානුභාවයෙක් නැත්තේ ය. මහරජාණෙනි, යම් සේ භූමියෙහි බහුප්‍රකාර වූ මාණික්‍යයෝ ඇත්තාහු ය. ඒ කවරේ ද? ඉන්ද්‍රනීලය, මහානීලය, ජොතිරසය, වෛඩූර්යය, දිය මෙඬෙරිපුෂ්පය, මාරාපුෂ්පය, මනොහරය, සූර්යකාන්තය, චන්ද්‍රකාන්තය, වජිරය, ඛජ්ජොපනකය, පුෂ්පරාගය, ලොහිතංකය, මසාරගල්ලය යන මේ සියලු මාණික්‍යයන් ඉක්ම චක්‍රවර්තිමාණික්‍යරත්නය අග්‍ර ය යි කියනු ලැබෙයි. මහරජාණෙනි, **චක්‍රවර්ති** රජ්ජුරුවන්ගේ රත්න ප්‍රමාණ වූ මාණික්‍යරත්නය හාත්පසින් සතරගව්වක් ප්‍රමාණයෙහි ආලොක කරන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් මේ මහාපෘථිවිතලයෙහි යම්කිසි දනයක් ඇත්තේ වී නම්, නොහොත් බුදුන් දවස **කොසොල්** රජහුගේ අසදෘශදනය පරම ය. ශ්‍රෙෂ්ඨ ය, ඒ සියලු ම දනයන් ඉක්මවා වෙස්සන්තර රජ්ජුරුවන්ගේ මහාදනය අග්‍ර ය යි කියනු ලැබේ. මහරජාණෙනි, අප **වෙස්සන්තර** නම් මහරජානන් විසින් අටවැනි වයස්හි 'දිවි පුදමි' යි සිතූ ජීවිතදනය[2] ද, බමුණන්ට දුන් හස්තිදනය ද, තපසට යන දවස් 'මෙබඳු දෙව්පුරයක් වැනි රජසැපත් හැර යෙමි' යි සිතූ රාජ්‍ය දනය ද, **ජූජකයා**හට දුන් පුත්‍රදනය ද, **ශක්‍රබමුණා**හට දුන් **මද්‍රී**දනය ද, දෙරට නැරජ්ඝසනහ වනමැදට පැමිණි ද හැමගේ දුක් නිවා දුන් සාමග්‍රීදනය ද, **ජයතුරා** නම් තමන්ගේ නුවරට පැමිණි දවස් 'තවත් දන් දෙමි' යි සිතූ අතුල්‍යදනචෙතනාව ද යන මේ මහාදනයන් දෙන කල්හි සත්වරක් මහාපෘථිවිතොමෝ කම්පා වූ ය'' යි වදළසේක.

---

1. බල 2. දනයෙහි

Non-Commercial Distribution

එයින් කීහ:—

> **"ජීවිතොස්සජ්ජනෙ හත්ථි-දානෙ පුරවිලොකනෙ,**
> **පුත්තදානෙ මද්දිදානෙ-වණෙ ඤාතිසමාගමෙ**
> **ජෙතුත්තරම්හි සම්පතෙත-මෙදිනී කම්පිතා අහු" ති.**

මෙසේ නාගසෙන මහාථෙර සාමීන් විසින් "මහරජාණෙනි, පොළොව කම්පා වන අටකාරණයන් වදාරණ බුදුරජානන් වහන්සේ විසින් 'මහණෙනි, මහාවාතය වණ්වල වීමෙහි ද, මහානුභාවසම්පන්න වූ ශ්‍රමණබ්‍රාහ්මණයන් විසින් ආපොකසිණසමවත් සමවැදීමෙහි ද, මහා බොධිසත්වයන්ගේ මව්කුස ඉපදීමෙහි ද, බිහිවීමෙහි ද, බුදු වීමෙහි ද, දම්සක් දෙසීමෙහි ද, ආයුසංස්කාරහැරීමෙහි ද, පිරිනිවන්පෑමෙහි ද යන මේ අටතැන පොළෝ කම්පා වන්නේ ය' යි වදාළ අටකාරණයත් සැබෑ ම ය. 'වෙස්සන්තර මහදන් දෙන කල්හි සත්වරක් මහපොළොව කම්පා වූ ය'යි වදාළ කාරණයත් සැබෑ ම ය" යි කියා අනෙකකාරණොපමාවන් ගෙණහැර දක්වා වදාළ කල්හි අතිප්‍රසන්න වූ මිලිඳු මහරජානෝ දෙහොත් මුදුන් දී "සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සර්වඥබුදුවරයන් වහන්සේලාගේ ගුණය ඉතා ආශ්වර්ය වන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සර්වඥ බුදුවරයන් වහන්සේලාගේ පාරමීතාගුණ ධර්මය ඉතා අද්භූත වන්නේ ය. යම් කාරණයකින් මෙබඳු වූ ක්ෂාන්තියක් ඇත්තා වූ මෙබඳු වූ දානචෙතනාවක් ඇත්තා වූ මෙබඳු වූ අධිෂ්ඨානයක් ඇත්තා වූ, මෙබඳු වූ අභිප්‍රායක් ඇත්තා වූ, තථාගතයන් **(128)** වහන්සේ පෙර බොධිසත්ව වූසේක් ද, ලොකයා හා අසම වූසේක් ම ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, බොධිසත්වවරයන්ගේ පරාක්‍රමය දක්වා වදාරණ ලද්දේ ය. ජිනෙන්ද්‍රයානන් වහන්සේලාගේ පාරමිතාධර්මය ද බොහෝ සෙයින් ම දීප්තිමත් කොට දක්වන ලද්දේ ය. පළමු කොට ම බොධිසත්වචරියායෙහි හැසුරුණා වූ තථාගතයන් වහන්සේගේ ද දෙවියන් සහිත වූ ලොකයා කෙරෙහි ශ්‍රෙෂ්ඨභාවය දක්වා වදාරණ ලද්දේ ය. යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ජිනෙන්ද්‍රශාසනයට ස්තුති කරණ ලද්දේ ය. සර්වඥපාරමිතා බබුළුවන ලද්දේ ය. තීර්ථකයන්ගේ ද වාද ගණ්ඨි සිඳ හරණ ලද්දේ ය. පරාපවාදකුම්භස්ථලයන් බිඳහරිණ ලද්දේ ය. ගම්භීර වූ ප්‍රශ්නය ලැහැල්ලු කර වදාරණ ලද්දේ ය. ග්‍රහණය අග්‍රහණය කරණ ලද්දේ ය.[1] සර්වඥපුත්‍රයන්ගේ අභිවෘද්ධිය මනා කොට ම නුඹ වහන්සේ විසින් ලබන ලද්දේ ය. ප්‍රවර ගණීන්ද්‍රයානන් වහන්ස, නුඹ වහන්සේ වදාළ මේ කාරණය අපි ත් එසේ ම පිළිගණුම්හ " යි කීහ.

**වෙස්සන්තරපෘථිවිකම්පාප්‍රශ්නය නිමි.**

---

1. 'ගහනං අගහනං කතං' - පාළි. 'අවුල නිරවුල් කරණ ලදී' යනු අර්ථ යි.

Non-Commercial Distribution

# සිවිරාජ ප්‍රශ්නය

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'සිවි මහ රජානන් විසින් අන්ධ වූ යාචකයක්හට තමන්ගේ ඇස් දෙන ලද්දේ ය. නැවැත අන්ධ වූ ඒ සිවිරජහට දිවඇස් උපන්නේ ය' යි කියා මෙසේ නුඹ වහන්සේ කියනසේක. මේ වචනයත් වචනරසයට කසටක් මෙන් දූනෙන බැවින් කසට සහිත ය. පූර්වාපර විරොධයක් මෙන් දූනෙන බැවින් නිග්‍රහ සහිත ය. වැරැද්දක් මෙන් දූනෙන බැවින් දොෂ සහිත ය. දිවඇස් ඉපදීමට කාරණ වූ ඇස් නැසී ගිය කල්හි 'අහෙතුක වූ අවස්තුක අක්ෂිකූපයෙහි දිව ඇසගේ ඉපදීමෙක් නැතැ' යි කියා සූත්‍රධර්මයෙහි වදරණ ලද්දේ ය. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සිවිමහ රජානන් විසින් ඇස් ඉල්ලූ යාචකයාහට ඇස් දෙන ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'නැවැත දිව ඇස් උපන්නේ[1] ය' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් සිවිමහරජානන්ට දිවඇස් උපන්නේ වී නම්, ඒ කාරණයෙන් 'සිවිමහරජානන් විසින් ඇස් ඉල්ලූ යාචකයාහට ඇස් දෙන ලදැ' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය විසඳාලිය නො හැකි ග්‍රන්ථිස්ථානයෙනුත් ගණ්ඨිතර වූයේ ය. බලවත් වූ වාද විදීමෙනුත් අතිශයින් වාද විදීමෙක් වන්නේ ය. හැරිය නො හෙන බලවත් වූ අවුල් හෙයිනුත් අතිශයින් අවුලෙක් වන්නේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ය. පරවාදයන්ගේ ව්‍යුපශමනය කිරීම පිණිස හා නිග්‍රහය පිණිස ඒ ප්‍රශ්නයෙහි ආලය උපදවා වදළ මැනැවැ'' යි කීහ.

''මහරජානෙනි, සකලසිරිනිධාන වූ සිවි නම් මහරජානන් විසින් රජසැපතින් යුත් ජීවිතයෙහි ලොභයක් නො කොට දෙඇස පතා ආ අන්ධශක්‍රබමුණාහට තමන්ගේ දෙඇස උගුල්වා දෙන ලද්දේ ය. එහි තොප විමතියක් නො උපදවා ලුව මැනැව. නැවැතත් ඇස් දන් දුන් ප්‍රීතියෙන් දවස් ගණනක් ඉකුත් වූ කල සක්දෙවිඳුගේ සලස්න හුණු ව අවුත් 'බුද්ධාංකුරයානන් වහන්ස, නුඹ වහන්සේගේ ශරීරයට **(129)** වන වෙහෙස බලා අපි දෙව්ලොව සිට ආම්හ. එසේ වුවත් අනුන්ට ඇස් දෙන්ට නො හැක්කෙමු. නුඹ වහන්සේ දුන් දනබලයෙන් ම ඇස් ලැබුව මැනැවැ' යි කී කල්හි:—

**''භිය්‍යො මං ආවිසි පීති-සොමනස්සං අනප්පකං''**

යනාදීන් 'ඇස් දන් දුන්නෙන් මට බොහෝ වූ ප්‍රීතියෙක් ආවෙස වූයේ ය. අප්‍රමාණ වූ සොම්නස් උපන්නේ ය. මේ මාගේ සත්‍යානුභාවයෙන් මට දිව ඇස් ලැබෙව' යි කියා සත්‍යක්‍රියා කළ කල්හි ඝන බහල භිත්තිප්‍රාකාර පර්වතයන් විනිවිද ගෙණ සියක් යොදුන් තැන් දක්නා දිව ඇස් උපන්නේ ය.

1. ඇත්තේ

එයිත් තොප විමතියක් නො උපදව'' යි කීසේක. ''කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දිවැස් ඉපදීමට හේතු වූ ඇස නැසී ගිය කල්හි අහෙතුක වූ අවස්තුක වූ අක්ෂිකූපයෙහි දිවඇස උපන්නේ ද?'' යි විචාළහ. ''නැත, මහරජානෙනි,'' යි කීසේක. ''ස්වාමීනි, මෙහි කාරණා කවරේ ද? හෙතු නැසී ගිය කල්හි අහෙතුක වූ අවස්තුවෙහි යම් කාරණයකින් දිව ඇස් උපදනේ වී නම්, වහා ම මට එපමණ කාරණයකින් අවබොධ කර වදළ මැනැවැ'' යි කීහ.

''කිමෙක් ද මහරජානෙනි, ලොකයෙහි සත්‍යවාදීහු යම් සත්‍යයක් කරණ කොට ගෙණ සත්‍යක්‍රියා කෙරෙද් ද, එබඳු සත්‍ය නම් දෙයක් ඇද් ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, ලොකයෙහි සත්‍ය නම් දෙයක් ඇත්තේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සත්‍යවාදීහු සත්‍යයෙන් සත්‍යක්‍රියා කොට වැසි වස්වන්නාහු ය. ගිනි නිවන්නාහු ය. විෂ බස්වන්නාහු ය. අනිකුත් නානාප්‍රකාර කට යුතු කරන්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ කාරණයෙන් සිවිරජ්ජුරුවන්ගේ සත්‍යබලයෙන් දිව ඇස් උපන්නේ ය යි වදළ මේ කාරණය හා දෙක එකට යෙදෙන්නේ ය. සම වන්නේ ය. මහරජානෙනි, සත්‍යබලයෙන් අවස්තුවෙහි දිවැස් උපන්නේ ය. සත්‍යය ම ඒ දිවැස් ඉපදීමෙහි දිව්‍යචක්ෂුවගේ ඉපදීම පිණිස වස්තු වන්නේ ය. මහරජානෙනි, යම් සේ මහත් වූ මන්ත්‍රෞෂධ දන්නා යම්කිසි සිද්ධකෙනෙක් 'මහාමෙඝය වසීව' යි කියා සත්‍යගායනා කෙරෙති. ඔවුන්ගේ සත්‍යගායනාව හා සමග මහාමෙඝය වස්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, යම් හෙතුවකින් මහාමෙඝය වස්නේ ය යි ආකාශයෙහි වැස්සට හෙතුවක් රැස් වූයේ ඇද් ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, සත්‍යය ම එහි මහත් වූ මෙඝයාගේ වැසීම පිණිස කාරණා වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම ඒ සිවිරජ්ජුරුවන්ට දිවැස් ලබන ප්‍රකෘති හේතුවෙක් නැත්තේ ය. සත්‍යය ම එහි දිවැස් ඉපදීම පිණිස වස්තු වූයේ ය.

''තවද මහරජානෙනි, යම් සේ යම්කිසි සිඬකෙනෙක් ජ්වලිත ප්‍රජ්වලිත වූ මහගිනිකඳෙක් නො ද වළකීව යි කියා සත්‍යගායනා කෙරෙති. ඔවුන්ගේ සත්‍යගායනාව හා සමග ම ජ්වලිත ප්‍රජ්වලිත මහාවහ්නිස්කන්ධය ක්ෂණයකින් ම නිවෙන්නේය. කිමෙක් ද, මහරජානෙනි, ජ්වලිත ප්‍රජ්වලිත මහාවහ්නිස්කන්ධයතෙම යම් හේතුවකින් ක්ෂණයකින් වළක්නේ වේ ද, එබඳු රැස් ව තුබූ හේතුවෙක් ඒ ජ්වලිතප්‍රජ්වලිත මහගිනිකඳෙහි ඇද් ද?''යි විචාළ සේක. ''නැත, ස්වාමීනි, සත්‍යය ම එහි ඒ ජ්වලිත ප්‍රජ්වලිත වූ මහා **(130)** වහ්නිස්කන්ධයාගේ ක්ෂණයකින් ම වැළකීම පිණිස වස්තු වන්නේ ය''යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම ඒ සිවිරජ්ජුරුවන්ට දිවැස් ලබන ප්‍රකෘතිහෙතුවෙක් නැත්තේ ය. සත්‍යය ම මෙහි දිව්‍යචක්ෂුවගේ උත්පාදය පිණිස වස්තු වූයේ ය''යි කීසේක. ''මහරජානෙනි, යම් සේ කිසි සිඬකෙනෙක් වහා නැඟෙන හලාහලමහාවිෂයක් 'විෂ නැති ව මිහිරි බෙහෙත් වේව'යි කියා සත්‍යගායනා කරන්නාහ. ඔවුන්ගේ ඒ

සත්‍යානුගීතය හා සමග ම හලාහලවිෂය ක්ෂණයකින් ම අමෘතබෙහෙත් වන්නේය. කිමෙක් ද, මහරජානෙනි, හලාහලමහාවිෂය යම් හේතුවකින් ම ක්ෂණයකින් ම අමෘත බෙහෙත් වේ ද, ඒ හලාහලමහාවිෂයෙහි එක් ව තුබූ (එබඳු) හේතුවෙක් ඇද් ද?''යි විචාළසේක. ''නැත, ස්වාමීනි, සත්‍යය ම එහි හලාහලවිෂයාගේ ඇසිල්ලකින් ම නැසී යාම පිණිස හේතු වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම ප්‍රකෘතිහේතුවක් හැර සත්‍යය ම මෙහි දිවඇසගේ උත්පාදය පිණිස හේතු වූයේ ය.

තවද, මහරජානෙනි, චතුරාර්යසත්‍යධර්මයන්ගේ ප්‍රතිවෙධය පිණිස අනික් හෙතුවෙක් නැත. සත්‍යය ම හෙතු කොට ගෙණ නිවන් පතන්නාහු චතුරාර්‍ය්‍යසත්‍යධර්මයන් ප්‍රතිවෙධ කරන්නාහු ය. තවද මහරජානෙනි, **චීන** දෙශයෙහි **චීන** නම් රජෙක් ඇත. ඒ චීනරජ මහාසමුද්‍රයෙහි බිලි පූජා කරණු කැමැති වූයේ සාරමසක් සත්‍යක්‍රියා කොට ඔහුගේ සීහ නම් රථයෙන් ඇතුළු මහාසමුද්‍රයෙහි යොදුනක් තැන් යන්නේ ය. ඒ රථහිසට ඉදිරි ඉදිරියෙන් මහාජලස්කන්ධයතෙම ඉවත් වන්නේ ය. මුහුදින් ගොඩට නික්ම ගිය කල්හි නැවත ජලය ඔත්ථරණ ව හාවන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ මහාසමුද්‍රයතෙම දිව්‍යමනුෂ්‍යයන් සහිත වූ ලොකයා විසින් ප්‍රකෘතිශරීරබලයෙන් ඉක්මවාපියන්නට හැකි වේ ද''යි විචාළසේක. ''ස්වාමීනි, ඉතා කුඩා විලෙකත් ජලය දිව්‍යමනුෂ්‍යයන් සහිත වූ ලොකයා විසින් ප්‍රකෘතිශරීරබලයෙන් ඉවත් කරන්නට නො හැකි වන්නේ ය. මහාසමුද්‍රයෙහි ජලය බැරි බව කියනු ම කවරේ ද?''යි කීහ. ''මහරජානෙනි, මේ කාරණයෙනුත් සත්‍යබලය දත යුත්තේ ය. සත්‍යයෙන් නො පැමිණිය හැකි[1] යමක් ඇද් ද, එබඳු ස්ථානයක් නැත්තේ ය. තවද මහරජානෙනි, **පැළලුප්නුවරෙහි** වසන **ධර්මාශොක**මහරජානෝ එක් දවසක් සනෙගම ජානපද බල මහාඅමාත්‍යයන් විසින් පිරිවරමින් ගඟබඩ හිඳ පන්සියයක් යොදුන් ඇත්තා වූ සතරගව්වක් පළල ඇත්තා වූ නවසලිලයෙන් සම්පූර්ණ වූ සමතිත්තික වූ සමහරිත වූ දෙගොඩ තළා නිති වැහෙන්නා වූ **ගංගා** නම් මහානදිය දැක සිනා කෙරෙමින් සගයෙනි, මේ ගංහාව ඉහළට හරවන්නට සමර්ථ වූ යම් කිසිවෙක් ඇද් ද? යි කියා අමාත්‍යයන්ට මෙසේ කීහ. ඒ අසා අමාත්‍යයෝ 'දෙවයන් වහන්ස, ඉතා දුෂ්කර දෙයෙක. කවරක්හටත් නො හැකි දෙයෙකැ'යි කීවාහු ය. එකල්හි ඒ ගංහාව සමීපයෙහි සිටියා වූ **බින්දුමතී** නම් වෙශ්‍යාදූතොමෝ රජහු විසින් වනාහි 'මේ මහාගංහාව උඩුගහට හරවන්ට හැකි වෙ ද?' යි මෙසේ කියන ලද්ද වූ වචන ඇසුවා ය. ඒ අසා 'මම වනාහි **(131)** මාගේ රූපයෙන් ම ජීවත් වන්නා වූ අන්තිම ජීවිකා ඇත්තා වූ **පැළලුප්නුවරෙහි** වෙසී වූ මාගේ එතෙක් ම සත්‍යක්‍රියාව රජ්ජුරුවන් වහන්සේ බලා වදරණසේක්ව' යි ඇ මෙසේ කියා නැවත සත්‍යක්‍රියා කළා ය. ඇගේ සත්‍යක්‍රියාව හා සමග ම ක්ෂණයකින් ම ඒ මහාගංගාතොමෝ මහත් වූ මහාජනසමූහයා බලබලා හින්ද දී ම 'ගලගල'[2] ගිගුම් දෙමින්

1. යුතු    2. ගල ගලා



Non-Commercial Distribution

උඩුගහට ගලා යන්නට පටන් ගත්තා ය.[1] ඉක්බිති රජ්ජුරුවෝ මහා ගංගාවෙහි ආවෘත්තරළවේගයෙන් ජනිත වූ 'ගලගල'ශබ්දය අසා විස්මය පත් ව අශ්චාර්යාද්භූතව 'සගයෙනි, මේ මහාගංගාතොම උඩුගහට කවර කාරණයකින් හැරී යන්නී දැ?'යි මෙසේ අමාත්‍යයන්ගෙන් විචාළහ. ඒ අසා අමාත්‍යයෝ 'මහාරාජෝත්තමයානන් වහන්ස, **බින්දුමතී** නම් වෙශ්‍යාතොම ඔබ වහන්සේ වදළ වචනය අසා සත්‍යක්‍රියා කළා ය. ඇගේ සත්‍යක්‍රියාබලයෙන් මේ ගංගාතොම ඌර්ධවමුඛ ව සන්දනය වන්නී ය'යි දැන්නුහ. ඒ ඇසූ ඉක්බිති සංවේගයට පැමිණි හෘදයෙන් යුක්ත වූ රජ්ජුරුවෝ තෙමේ ම වහවහා ගණිකාව ලඟට ගොස් 'එම්බල, **බින්දුමතිය,** තී විසින් මේ ගංගාව සත්‍යක්‍රියාවෙන් උඩුගහට හරවන ලද්දේ සැබෑ දැ?'යි කියා ගණිකාව අතින් විචාළෝ ය. 'එසේ ය, දෙව ස්වාමීන් වහන්සැ' යි කීවා ය. රජ්ජුරුවෝ ඒ අසා 'එම්බල, තිට ඒ ගංගාව නවත්වා ලීමෙහි කුමන බලයෙක් ඇද් ද? කවරෙක් තිගේ වචනය සැබෑ ය යි කියා ගන්නේ ද? ඉතා ස්වල්ප වූ බලයකින් තී මහාගංගාව ප්‍රතිස්‍රොත කොට හරවා ලූවා දැ?' යි විචාළෝ ය.

ඒ අසා ඕ තොමෝත් නො බා[2] ම 'දෙවයන් වහන්ස, මම මාගේ සත්‍යබලයෙන් මේ මහාගංගාව උඩුගහට හරවා ලීමි' යි කීවා ය. එකල රජ්ජුරුවෝ 'එම්බල, චොරී වූ ධූර්ත වූ අසත්පුරුෂ වූ ලජ්ජාවිච්ඡේදනී වූ පාපී වූ ස්ත්‍රීසීමාව බිඳ පවත්නී වූ ඉක්ම ගිය ගුණසොභා ඇත්තී වූ, කාමාන්ධජනයන්ගේ වස්තු පැහැර ගන්නා වූ තිගේ කුමන සත්‍යබලයෙක් ඇද් දැ?' යි කීහ. ''ස්වාමීනි, දෙවයන් වහන්ස, මම එබඳු වූයෙත් සැබෑ ම ය. ස්වාමීනි, දෙවයන් වහන්ස, එබඳු වූ මාගේත් සත්‍යක්‍රියාවෙක් ඇත. යමක් කැමැත්තා වූ මම දෙවියන් සහිත වූ ලොකය පරිවර්තනය කෙරෙමි' යි කීය.[3] රජ්ජුරුවෝත් ඒ අසා 'තිගේ ඒ සත්‍යක්‍රියාව කවරෙක් වේ ද? වහා මට අස්වාලව' යි කීහ. 'මහාරාජෝත්තමයානන් වහන්ස, යම් ක්ෂත්‍රියෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශුද්‍රයෙක් හෝ අනික් කිසියම් කෙනෙක් හෝ මට ධනය දෙන්නේ නම් ඔවුන්ට එක සම ව උපකාර කෙරෙමි. රජකෙනෙකැ යි කියා විශෙෂයෙක් නැත්තේ ය. ශුද්‍ර කෙනෙකැ යි කියා ලාමක කොට සිතීමෙක් නැත්තේ ය. අනුනයයෙන් හා ක්‍රොධයෙන් මිදී ධනස්වාමියා කෙරෙහි හැසිරීමි' යි 'දෙවයන් වහන්ස, මම යම් සත්‍යක්‍රියාවකින් මේ මහාගංගාව ප්‍රතිස්‍රොතයට සන්දපනය කෙළෙම් ද, මෝතොම මාගේ සත්‍යක්‍රියාව ය' යි කීවා ය.

''මහරජානෙනි, මේ කාරණයෙනුත් සත්‍යධර්මයෙහි සිටියාහු මනාප වූ කිසි අර්ථයක් නො විඳින්නාහු ද? නැවැත මහරජානෙනි, සිවි මහරජානන් විසින් ඇස් ඉල්ලූ යාචකයාහට බුදුබව පතා ඇස් දන් දෙන ලද්දේ ම ය. නැවැත සත්‍යානුභාවයෙන් සාරසියයක් ගවු දුර පෙණෙන දිවඇස් උපදනා **(132)** ලද්දේ ම ය. ඒ දිවැස් ලැබීම සත්‍යක්‍රියානුභාවයෙන් ම ය. යමක් වනාහි 'මාංසචක්ෂුව නැයි ගිය කල්හි අහෙතුක වූ

1. ගත්තේ ය 2. නො බව 3. කීහ

Non-Commercial Distribution

අවස්තුයෙහි දිවඇසගේ උත්පාදයෙක් නැතැ' යි කියා සූත්‍රයෙහි වදරණ ලද්දේ ය. ඒ ඇස භාවනාමය දිවඇස් සඳහා වදරණ ලද්දේ ය. මහරජානෙනි, සිවිමහරජානන් දිවැස් ලැබූ මේ කාරණය මේ යථොක්තප්‍රකාරයෙන් සිත්හි දරා ගණුව'' යි වදළසේක.

''මෙසේ ඉදින්, ස්වාමීනි, සිවිමහරජානන් විසින් අන්ධ වූ බ්‍රාහ්මණයාහට ඇස් දන් දුන් බව සැබෑ වී නම්, 'දිවැස් ඉපදීමට වස්තු වූ ඇස නැසී ගිය කල්හි අවස්තුයෙහි දිවැස් නූපදනේ ය' යි කියා සූත්‍රධර්මයෙහි පෙනී තිබෙන්නේ ය. එහෙයින් අන්ධ වූ ඒ සිවිරජහට නැවත දිවැස් උපන්නේ ය යි කී වචනය බොරු වන්නේ ය. ඒ බව සැබෑ වී නම් 'සිවි රජ්ජුරුවෝ ඇස් දන් දුන්සේකැ'යි කී වචනය බොරු වන්නේ ය'' යි කියා මේ උභතොකොටිකප්‍රශ්නය විචාළ මිලිඳුරජහට ඒ කාරණා දෙක ම සැබෑ කොට වදළ කල්හි අතිප්‍රසන්න වූ ඒ මිලිඳු මහරජානෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉතා යහපත. ප්‍රශ්නයතෙම මනා ව නිර්වෙඨනය කරණ ලද්දේ ය. පරවාදීන්ගේ නිග්‍රහයතෙම මනා කොට ම දක්‍ක වදරණ ලද්දේ ය. සුමර්දිතවර්මයක් සෙයින් පරවාද මර්දනය කරණ ලද්දේ ය. නුඹ වහන්සේ වදළ මේ කාරණය අපි එපරිද්දෙන් ම පිළිගණුම්හ'' යි කීහ.

**සිවිරාජ ප්‍රශ්නය නිමි.**

---

# ගර්භාවක්‍රාන්තිප්‍රශ්නය

නැවතත් මිලිඳු මහරජානෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ විසින්:—

**''තිණ්ණං ඛො පන භික්ඛවෙ සන්නිපාතා ගබ්භස්ස අවක්කන්ති හොති. ඉධ මාතාපිතරො ච සන්නිපතිතා හොන්ති. මාතා ච උතුනී හොති. ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති. ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං සන්නිපාතා ගබ්භස්ස අවක්කන්ති හොති.''**

යනු හෙයින් 'කාරණා තුණක් එකතු වීමෙන් දරුඑලය හට ගන්නේ ය' යි කියා මේ කාරණය වදරණ ලද්දේ ය. මේ අශෙෂ වූ වචනයෙක. මේ නිරවශෙෂ වූ වචනයෙක. මේ අන්‍යාකරණයක් නැති වචනයෙක. මේ අරහස්වචනයෙක. සදිව්‍යමනුෂ්‍යයන් මධ්‍යයෙහි වැඩ හිඳ වදරණ ලද වචනයෙක. **සාමජාතකයෙහි දුකූලතාපසයන්** වහන්සේ විසින් **ශක්‍රයාගේ** ආරාධනාවෙන් **පාරිකා** නම් තපස්විනියගේ ලොහිතසෘතුවාරයෙහි නාභිය දක්ෂිණහස්තාංගුලියෙන් පරාමර්ශනය කරණ ලද්දේ ය. ඇගේ ඒ නාභි පරාමර්ශනයෙන් **සාමකුමාරයෝ** උපන්නාහ. අපගේ **මාතංගසෘෂින්** වහන්සේ විසිනුත් තමන්ගේ දක්ෂිණහස්තාංගුලියෙන් ලොහිතසෘතු

Non-Commercial Distribution

කාලයෙහි දිට්ඨමංගලිකා නම් බ්‍රාහ්මණකන්‍යාවගේ නාභිය පරාමර්ශනය කරණ ලද්දේ ය. ඒ නාභිපරාමර්ශනයෙන් ඇගේ කුක්ෂියෙහි මණ්ඩව්‍ය මාණවකයෝ උපන්හ. මේ දෙදෙනෙකුන්ගේ සන්නිපාතයෙන් දරු ගර්භයාගේ ඉපදීම දක්නා ලැබෙයි.

"ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, තුන්දෙනෙකුන්ගේ සන්නිපාතයෙන් ගර්භයාගේ අවක්‍රාන්තිය වන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය. **(133)** එහෙයින් 'සාම කුමාරයන්[1] හා මණ්ඩව්‍යමාණවකයෝත් යන දෙදෙන නාභිපරාමර්ශනයෙන් උපන්නාහ' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් 'සාමකුමාරයෝ ද, මණ්ඩව්‍යමාණවකයෝ ද යන දෙදෙන නාභිපරාමර්ශනයෙන් උපන්නාහ' යි කියා වදරණ ලද්දේ වී නම්, එහෙයින් 'මහණෙනි, තුන්දෙනෙකුන්ගේ සන්නිපාතයෙන් දරුගර්භයාගේ අවක්‍රාන්තිය වන්නේ ය' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ස්වාමීනි, මේ උභතොකොටිකප්‍රශ්නය තෙමේත් අතිගම්භිර වන්නේ ය. සියක්වර පැළු අස්ලොම්අගක් මෙන් අතිසියුම් වන්නේ ය. ප්‍රඥවතුන්ට ම විෂය වන්නේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹවහන්සේ කරා පැමිණියේ ය. විමති මහාපථය සිඳ හැර වදළ මැනැව. ප්‍රවරඥාණපජ්ජොතය දීප්තිමත් කොට ධරා වදළ මැනැවැ" යි කීහ.

"මහරජානෙනි, භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ විසින් 'මහණෙනි තුන්දෙනෙකුන්ගේ සන්නිපාත වීමෙන් ගර්භයාගේ අවක්‍රාන්තිය වන්නේ ය' යි මෙහි මාතෘපිතෘ දෙදෙන සන්නිපතිත වෙද් ද, මාතෘතොම උතුනී වේ ද, මාතෘගර්භයට පැමිණිය යුතු වූ සත්වයෙක් එළඹ සිටියේ වේ ද, මෙසේ තුන් දෙනෙකුන්ගේ සන්නිපාතයෙන් දරුගර්භයාගේ අවක්‍රාන්තිය වන්නේ ය' යි කියා දරුගැබට හෙතු වූ මේ කාරණා තුණ වදරණ ලද්දේ ත් සැබෑ ම ය. 'සාමකුමාරයෝ ය, මණ්ඩව්‍යකුමාරයෝ ය යන දෙදෙන නාභිපරාමර්ශනයෙන් උපන්නාහ' යි කියා වදරණ ලද්දේ ත් සැබෑ ම ය"යි කීසේක. "එහෙයින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් කාරණයකින් ප්‍රශ්නය මනා ව ම නිශ්වය වේ ද, එබඳු කාරණයකින් මට අවබොධ කර වදළ මැනැව" යි කීහ. "මහරජානෙනි, සංකිච්චකුමාරයෝ ය, ඉසිසිංගතාපසයෝ ය, කුමාරකාශ්‍යපතෙරණුවෝ ය යන ඒ තුන් දෙන මෙනම් කාරණයෙන් උපන්නාහ' යි කියා තොප විසින් වනාහි මීට පෙර අසන ලද්දේ ද?" යි විචාළසේක.

"එසේ ය, ස්වාමීනි, අසන ලද්දේ ය. ඔවුන්ගේ ජාති ඉතා උස් ව පැතිර ගියේ ය. මෘගධෙනුදෙදෙනෙක් තමන් දරුගැබ් ගන්නා සෘතු කාලයෙහි පළමු කොට ම තපස්වීන් දෙදෙනකුන්ගේ මුත්‍ර නික්මවන තැනට ගොස් සම්භව නම් කෙලෙස්කුණ සමග මුත්‍ර බුන්නාහු ය. ඒ මුත්‍ර

1. කුමාරයෝ

Non-Commercial Distribution

සහිත වූ සම්භවයෙන් සංකිච්චකුමාරයෝ ද, ඉසිසිංගතාපසයෝ ද යන දෙදෙන උපන්නාහ. 'භික්ෂුණීන්ගේ ආවාසයට ගියා වූ රාගයෙන් රත් වූ සිතින් භික්ෂුණියගේ අංගජාතය බලන්නා වූ උදයි ස්ථවිරයන්ගේ සම්භව නම් කෙලෙස් දෙෂය මිදී අවුත් සිවුරෙහි පතිත වී ය. නැවැත උදයි ස්ථවිරයානෝ ඒ භික්ෂුණියට 'යව, නැගනියෙනි, පැන් ගෙණෙව. අඳනය සෝදන්නෙමි' යි මෙසේ කීසේක. එවිට උදයි තෙරණුවන්ගේ පුරාණදුතියිකා වූ ඒ භික්ෂුණීතොමෝ පැන් ගෙණවුත් 'ආර්යයන් වහන්ස, ලහට ගෙණ අව මැනැව. අඳනය මම සෝදන්නෙමි' යි කියා ගෙණ අඳනය සෝද දෙමින් එහි තුබූ සම්භවයෙන් එක් භාගයක් මුඛයෙන් ගත්තේ ය. එක් භාගයක් අංගජාතයෙහි බහා ගත්තේ ය. එදවස් දරුගැබ් ගන්නා ඍතුකාලය හෙයින් එයින් කුමාරකාශ්‍යපතෙරණුවෝ උපන්සේකැ' යි **(134)** මේ කාරණය ලෝවැසිතෙම කියන්නේ ය'' යි කීහ.

''කිමෙක් ද, මහරජානෙනි, ඒ වචනය තෙපි අදහා ගන්නහු දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, එහි 'මේ කාරණයෙන් ද, කුමාර කාශ්‍යපයෝ උපන්සේකැ' යි කියා යම් කාරණයකින් අපි අදහන්නමෝ ද, එබඳු බලවත් වූ කාරණයක් අප ලදුම්හ'' යි කීහ. ''මහරජානෙනි, මෙහි තෙපි දුටු කාරණය කවරේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, මඩ මර්දනය කොට වප්[1]තනා ගොවිකර්මාන්තය කරණ ලද මඩෙහි වී යට වැටීම වහා ම යහපත් කොට පැළ වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ එසේ ය'' යි කීසේක. ''ස්වාමීනි, එපරිද්දෙන් ම දරුගැබ් ගන්නා ඍතු කාල ඇති ඒ භික්ෂුණීතොම තමන්ගේ රුධිරවේගය සිඳී ඉතා ශෙෂ ව ලොහිතධාතුව සිටි කල්හි මතා ව සිටි කලලයෙහි පුරුෂසම්භවය ගෙණ ඒ කලලයෙහි ප්‍රක්ෂෙප කළා ය. ඒ කාරණයෙන් ඇගේ දරුගර්භය පිහිටියේ ය. ඒ ගර්භ ප්‍රතිෂ්ඨානයෙහි ඔවුන්ගේ ගර්භොත්පාදය පිණිස මෙබඳු වූ කාරණය අපි දනුම්හ'' යි කීහ. ''මහරජානෙනි, 'සම්භවය යොනිප්‍රවෙශයෙනුත් ගර්භය පිහිටන්නේ ය' යි කියා තෙපි මෙකී කාරණය එසේ ම පිළිගන්නහු ද? මහරජානෙනි, තෙපි වනාහි කුමාරකාශ්‍යප ස්ථවිරයන්ගේ ගර්භාවක්‍රමණය සැබෑ කොට පිළිගන්නහු දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්සැ'' යි කීහ.

''යහපත, මහරජානෙනි, එක ම ප්‍රකාරයෙන් ගර්භාවක්‍රාන්තිය කියමින් මාගේ විෂයට පැමිණියාහු ය. මට අනුබල වූවහු ය. මහ රජානෙනි, මීට අනතුරු ව කී අර්ථයෙහි යම් ඒ මෘගධෙනූහු දෙදෙනෙක් මූත්‍ර පානය කොට දරුගැබ් ලද්දහු ද, ඔවුන්ගේ ගර්භාවක්‍රමණය තෙපි අදහන්නහු දැ?'' යි විචාළසේක. එසේ ය, ස්වාමීනි, මඳක් වත් යමක් අනුභව කරණ ලද ද, කඩා කන ලද ද, ලොහ කරණ ලද ද, ඒ සියල්ල ම කලලය කරා බස්නේ ය. ඒ ස්ථානයට පැමිණ වෘද්ධියට පැමිණෙන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් සේ යම්කිසි නදී නම්

1. වක්

Non-Commercial Distribution

කෙනෙක් ඇද් ද, ඒ සියලු ම ගංගාවෝ මහාසමුද්‍රය කරා යන්නාහු ය. තමන් නවත්නා ස්ථානයට ගියාහු වෘද්ධියට පැමිණෙන්නාහ. එපරිද්දෙන් ම, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මදක් වත් යම් අනුභව කළ දෙයෙක් ඇද් ද, පානය කළ දෙයෙක් ඇද් ද, කඩා කෑ දෙයෙක් ඇද් ද, ලොහ කළ දෙයෙක් ඇද් ද, ඒ සියල්ල ම කලලය කරා බස්නේ ය. ස්ථාන ගත ව වෘද්ධියට පැමිණෙන්නේ ය. ඒ කාරණයෙන් මම 'මුඛගත වීමෙනුත් ගර්භාවක්‍රාන්තිය වන්නේ ය' යි කියා අදහන්නෙමි'' යි කීහ. ''යහපත, මහරජානෙනි, මාගේ විෂයට ම ඉතා බලවත් කොට පැමිණියාහු ය. මුඛයෙන් පානය කිරීමෙනුත් සන්නිපාතද්වය වන්නේ ය. **සංකිච්ච** කුමාරයන්ගේ ද, **ඉසිසිංග**තාපසයන්ගේ ද, **කුමාරකාශ්‍යප**යානන් වහන්සේගේ ද, ගර්භාවක්‍රමණය සැබෑ කොට අදහා ගන්නහු ද?'' යි විචාළ සේක. ''එසේ ය, ස්වාමීනි, ඒ සන්නිපාතද්වය සන්නිපාතත්‍රයයට ඇතුළත් වන්නේ ය'' යි කීහ.

''මහරජානෙනි, **සාම**කුමාරයෝ ද, **මණ්ඩව්‍ය** මාණවකයෝ ද යන දෙදෙන සන්නිපාතත්‍රයෙහි ඇතුළත් වූහ. ඒ කාරණයෙන් උපන් හෙයින් එක කෘත්‍යයෝ ම ය. එහි පූර්වයෙහි පටන් කාරණය කියමි. මහරජානෙනි, **(135) දූකූල** නම් තාපසයෝ ද, **පාරිකා** නම් තපස්සිනීන්දෑ ද යන දෙදෙන ම බඹලොවින් අවුත් **බරනැස්** නුවර වැදිගම්හි ඉපිද දෙවුකුමරුවන් සෙයින් වැඩිවිය පැමිණි කල්හි ක්ලේශකාමයෙහි ඔවුන්ගේ ආලයක් නැතත් නෑයන් විසින් ඔවුන්ගේ රූපශ්‍රීය බලා දෙදෙනා ම ඔවුනොවුන්ට සෑහෙන්නාහු ය යි කියා ඔවුන්ගේ නො කැමැත්තෙන් ම සරණ පාවා දුන්හ. ඒ දෙදෙන එක විමනක වසන බ්‍රහ්මරාජයන් දෙදෙනෙකුන් මෙන් කිසි පවක් නො කොට කලක් ගිහි ගෙයි වැස ගෘහ වාසයෙහි කළකිරී ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව උතුම් වූ නිර්වාණාර්ථය සොයන්නා වූ විවේකසැපයෙහි ඇලුනා වූ ශීලාධිෂ්ඨාන ඇත්තා වූ ඒ දෙදෙන ම ආරණ්‍ය වාසී වූහ. ඔවුන්ගේ තපෝතෙජානුභාවයෙන් බ්‍රහ්මලොකය දක්වා තැති ගැන්නෙව්වාහු ය. එකල **ශක්‍රදෙවෙන්ද්‍ර**තෙම උදය සවස ඔවුන්ට උපස්ථානයට එන්නේ ය. ඒ **ශක්‍රදෙවෙන්ද්‍ර**තෙම ඔවුන් කෙරෙහි ගරුතර මෛත්‍රිය කරණ කොට ගෙණ 'වනයෙහි වසන ඔවුන්ට වන උපද්‍රවයෙක් ඇද්දෝ හො?'' යි බලමින් අනාගත කාලයෙහි දී ඒ දෙදෙනාගේ ඇස් අන්ධ වන බව දුටුයේ ය. දැක දෙහොත් මුදුන් දී නැමී සිට 'පින්වත්නි, මාගේ එක වචනයක් කර වදළ හොත් යහපත. එක ම පුත්‍රයෙකු උපදවාලුව මැනැව. ඒ පුත්‍රතෙම නුඹ වහන්සේලාට උපස්ථායක ද වන්නේ ය. අත් දී යන්ට ආලම්බන ද වන්නේ ය' යි ඒ තපස්වීන්ට මෙසේ කීයේ ය.

ඒ අසා තපස්වී දෙදෙන 'එම්බා ශක්‍රදෙවෙන්ද්‍රයෙනි, අපට එසේ නො කියව'' යි කියා ප්‍රතික්ෂේප කොට ඒ **ශක්‍රයන්**ගේ ඒ වචනය ඔවුහු නො පිළිගත්තාහු ය. එකල්හිත් ඔවුන් කෙරෙහි මහත් වූ අනුකම්පා

Non-Commercial Distribution

ඇත්තා වූ ඔවුන්ට අභිවෘද්ධි කැමැත්තා වූ ශක්‍රදෙවේන්ද්‍රතෙම දෙවතුවත් තුන්වතුවත් "පින්වත්නි, මාගේ එක වචනයක් කරව. එක ම පුත්‍රයෙකු උපදවා ලවව. එසේ නම් ඉතා යහපත. එතෙම නුඹ වහන්සේලාට උපස්ථායක වන්නේ ය. ආලම්බන ද වන්නේ ය" යි කියා මෙසේ ඒ තපස්වීන්ට කීයේ ය. දෙවතුවත් තුන්වතුවත් ඒ තපස්වීහු "එම්බා ශක්‍රදෙවේන්ද්‍රයෙනි, තෙපි අප අනර්ථයෙහි නො යොදලව. කෙතෙක් කල් ජීවත් වුවත් මේ ශරීරය කවර දවසෙක මරණින් බිඳී නො යේ ද? මැටි වළඳක් මෙන් භෙදනස්වභාව වූ මේ ශරීරය මරණින් බිඳී යේවා. මහාපෘථිවිය බිඳී නැති වන මුත් මහාමෙරුපර්වතය ඉපිල වැටෙන්නෙ වී නමුත් මහාආකාශය පැළී යේ නමුත්, චන්ද්‍ර සූර්යයෝ දෙදෙන පෘථිවියෙහි වැටෙන්නාහු වූ නමුත් අපි කෘමිගුථයක් වැනි ලොකධර්මය හා මිශ්‍ර නො වම්හ. තෙපි අපගේ සම්මුඛභාවයට අද පටන් නො එළඹෙව. අප කරා එළඹුනා වූ තොපගේ මේ විශ්වාසයතෙම දක්නා ලද්දේ ය. තෙපි අපට අනර්ථ වර දෙන කෙනෙකැ යි සිතම්හ" යි කියා දෙදෙන ම කීවාහු ය. මෙසේ කී ඉක්බිති ශක්‍රදෙවේන්ද්‍රතෙම ඔවුන්ගේ සිත් ගත නො හැකි ව ගරුගත ව ඇඳිලි බැඳ වැඳ ගෙණ 'ඉදින් මාගේ වචනය කරන්නට උත්සාහ නො කරණ සේක් නම් යම් දවසෙක තපස්සිනීන් වහන්සේ දරුගැබ් ගන්නා මල්වර ඇති ඍතුකාල ඇත්තී වේ ද, එකල්හි, ස්වාමීනි, නුඹවහන්සේ දක්ෂිණ හස්තාංගුලියෙන් නාභිය පරාමර්ශනය කර වදළ මැනැව. ඒ කාරණයෙන් ම ඕ තොමෝ දරුගර්භය ලබන්නී ය. ගර්භාවක්‍රාන්තිය පිණිස මේ බව නුඹ වහන්සේලාගේ සන්නිපාතය ම වන්නේ ය' යි කියා නැවැතත් **(136)** යාච්ඤා කර සිටියේ ය. එවිට **දුකුලතාපසයෝ** "එම්බා **කොසියගොත්‍රයෙහි** උපන් **ශක්‍රදෙවේන්ද්‍රයානෙනි**, ඒ වචනය කරන්නට හැක්කෙමි. එපමණකින් අපගේ තපස් නො බිඳෙන්නේ ය. තොපගේ අභිප්‍රාය එසේ ම වේව" යි කියා පිළිගත්තාහු ය. ඒ වේලාවට වනාහි ශක්‍රභවනයෙහි වැඩුනා වූ, කුශලමූලයන් ඇත්තා වූ ක්ෂය වූ ආයු ඇත්තා වූ ආයුඃක්ෂයට පැමිණියා වූ ඉදින් කැමැති නම් චක්‍රවර්තිවංශයෙහි හෝ කැමැති වෙන උත්පත්තියකට හෝ යන්නට සමර්ථ වූ දිව්‍යපුත්‍රයෙක් ඇත්තේ ය. ඉක්බිති ශක්‍රදෙවේන්ද්‍රතෙම වහා දෙව්ලොව කරා ගොස් ඒ දිව්‍යපුත්‍රයා ලඟට එළඹ මෙසේ කීයේ ය:—

"ශ්‍රෙෂ්ඨයානෙනි, මැත අව මැනැව, දෙදෙව්ලොවට අධිපති වූ මම යම් කරුණකින් තොපට උපස්ථානයට ආයෙම් ද, එහෙයින් තොපට මහත් වූ අර්ථසිද්ධියෙක් පැමිණියේ ය. තොපට මේ දිවසභාගය මනා කොට ම ප්‍රභාවත් ව ගියේ ය. රමණීය වූ අවකාශස්ථානයෙක තොපගේ වාසය කිරීම වන්නේ ය. තොපට ම සුදුසු වූ වංශයෙක ප්‍රතිසන්ධිග්‍රහණය වන්නේ ය. යහපත් වූ මාතෘපිතෘන් විසින් වර්ධනය කට යුතු වන්නේ ය. මිනිස්ලොවට යන පිණිස අව මැනව. මාගේ වචනය කරව" යි කියා යාච්ඤා කෙළේ ය. දෙවතුවත් තුන්වතුවත් යාච්ඤා කොට සිටියේ ය.

Non-Commercial Distribution

එකල දිව්‍යපුත්‍රතෙම සිරසෙහි අත තබා වැඳ ගෙණ අපගේ ''ශ්‍රෙෂ්ඨයානන් වහන්ස, නුඹ වහන්සේ යම් ගොත්‍රයක නැවැත නැවැත වහා ම ගුණ කියන සේක් ද? ඒ ගොත්‍රය කවරේ දූ?'' යි මෙසේ කීයේ ය.

''නිදුකානෙනි, සියලු පව්න් මිදී වසන **'දූකූල'** තාපසයෝ ද **'පාරිකා'** නම් තපස්සිනීන් වහන්දෑ ය'' යි කීහ. ශක්‍රයන්ගේ වචනය අසා සතුටු වූ ඒ දිව්‍යපුත්‍රතෙම ''යහපත, නිදුකානන් වහන්ස, නුඹ වහන්සේගේ යම් අභිප්‍රායක් ඇද් ද, ඒ අභිප්‍රාය එසේ ම වේව'' යි කියා පිළිගත්තේ ය, එසේ පිළිගෙණ ''අපගේ ශ්‍රෙෂ්ඨයානන් වහන්ස, කැමැත්තා වූ මම ප්‍රාර්ථිත වූ වංශයෙක උපදිම් යි සුපර්ණනාගාදීන් මෙන් අණ්ඩජයෙහි හෝ මනුෂ්‍ය ගවාදීන් මෙන් ජලාබුජයෙහි හෝ සංසෙදජයෙහි හෝ දෙවියන් මෙන් ඔපපාතිකයෙහි හෝ කවර යොනියෙක උපදිම් දූ?'' යි විචාළේ ය. 'නිදුකානෙනි, ජලාබුජ වූ මනුෂ්‍යයොනියෙහි උපදුව' යි කීයේ ය. ඉක්බිත්තෙන් ශක්‍රදෙවෙන්ද්‍රතෙම උත්පත්ති දවස ගණන් බලා අසවල් නම් දවසේ දී තපස්සිනීන් වහන්සේ දරු ගැබ ගන්නා මල්වර ඇති ව කිළි වන්නී ද, එදවස් 'ස්වාමීනි, නුඹ වහන්සේ දක්ෂිණහස්තාංගුලියෙන් නාභිය පරාමර්ශනය කර වදළ මැනැවැ' යි කියා **දූකූල** නම් තාපසයන්ට කීයේ ය.

''මිලිඳු මහරජානෙනි, එදවසෙහි දී ම තපස්සිනීතොම දරු ගැබ් ගන්නා මල්වර ඇති ව ඍතුකාල ඇති වූවා. දිව්‍යපුත්‍රතෙමේ ද ඒ ගර්භයෙහි ප්‍රතිසන්ධියට උපගත ව එළඹෙන ලද්දේ වී ය. තාපසයන් වහන්සේ ද දක්ෂිණහස්තාංගුලියෙන් තපස්සිනීයගේ නාභිය පරාමර්ශනය කළහ. මෙසේ ඒ ත්‍රිවිධසන්නිපාතයෝ වූවාහු ය. නාභිපරාමර්ශනයෙන් තපස්සිනීන්දැට රාගාස්වාදය උපන. ඒ තපස්සිනියගේ ඒ රාගයතෙම නාභි පරාමර්ශනය කළ සන්නිපාතය නිසා වී ය. තෙපි ඒ බව 'නුසුදුසු අධ්‍යාචාරය ම ය' යි කියා නො සිත ව. සතුටු ආකාරයෙන් සිනා පහළ කිරීමත් එක් සන්නිපාතයෙක. එසේ ම කථා කිරීමත් එක් සන්නිපාතයෙක. **(137)** සිතින් සිතා බැලීමත් එක් සන්නිපාතයෙක. රාගයාගේ උත්පාදය පිණිස පූර්වභාගභාවයෙන් ම හස්තාදිය ආමර්ශනය කිරීමෙන් සන්නිපාතය උපදනේ ය. මෙසේ සන්නිපාතයෙන් ගර්භප්‍රතිග්‍රහණය වන්නේ ය. මහරජානෙනි, අධ්‍යාචාර නම් සංසර්ගයක් නැති කල්හිත් පරාමර්ශනයෙන් ගර්භාවක්‍රාන්තිය වන්නේ ය. මහරජානෙනි, යම් සේ දිලිසෙමින් ඇවිළෙන්නා වූ ගිනි ආමර්ශනය නො කළ කල්හිත් සමීපයට පැමිණියහුගේ ශීත නසන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම අධ්‍යාචාරයක් නැති කල්හිත් පරාමර්ශනය පමණින් ම ගර්භාවක්‍රාන්තිය වන්නේ ය. මහරජානෙනි, කර්මවශයෙන් ද, ජාතිවශයෙන් ද, කුල වශයෙන් ද, ආයාචනවශයෙන් දූ යි කියා සතර ආකාරයකින් සත්වයන්ගේ ගර්භාවක්‍රාන්තිය වන්නේ ය. මෙකී සියලු ම සත්වයෝ තමන්ගේ කුශලාකුශලකර්මය ම භවය කොට ඇත්තාහු ය. කර්මය ම උත්පත්ති කාරණය කොට ඇත්තාහු ය.

Non-Commercial Distribution

''මහරජානෙනි, කුශලකර්මවශයෙන් සත්වයන්ගේ ගර්භාවක්‍රාන්තිය කෙසේ වේ ද? යත්:—මහරජානෙනි, බොහෝ සෙයින් ම වැඩුනා වූ කුශල මූලයන් ඇත්තා වූ සත්වයෝ ක්ෂත්‍රියමහාසාරකුලයෙහි හෝ බ්‍රාහ්මණ මහාසාරකුලයෙහි හෝ ගෘහපතිමහාසාරකුලයෙහි හෝ සදෙව්ලොව දෙවියන් කෙරෙහි හෝ **කුන්තපුත්‍රාදීන්** මෙන් මිනිසුන් කෙරෙහි ම හෝ අණ්ඩජයොනියෙහි හෝ මනුෂ්‍යාදීන් මෙන් ජලාබුජයොනියෙහි හෝ **පොක්ඛරසාත්‍යාදීන්** මෙන් සංසෙදජයොනියෙහි හෝ **අම්බපාලි ගණිකාදීන්** මෙන් ඕපපාතිකයොනියෙහි හෝ කැමැති තැනෙක උපදනාහ.

''පෙර **පැළලුප්** නුවර වසන වැද්දෙක් වනයෙහි ඇවිදිමින් කුන්ත නම් කිඳුරුදෙනුවක හා ලොකධර්මයෙහි හැසුරුණේ ය. ඒ කාරණයෙන් දරුගැබ පිහිටා කිඳුරුබීජ දෙකක් වැදූ ය. ක්‍රමයෙන් මෝරා කල් පැමිණි කල බිජුකබල් පළා ගෙණ මනුෂ්‍ය කුමරුවෝ දෙදෙනෙක් නික්මුනාහු ය. එයින් එක් කෙනෙක් **තිස්ස** නම් වූහ. එක්කෙනෙක් **සුමිත්ත** නම් වූහ. ඒ දෙදෙන තමන්ගේ ආකාර නොවන කිඳුරන්ගේ විකාර දැක සසර කළකිරී වසන්නාහු **මහාවරුණ** නම් තෙරුන් ලඟ පැවිදි ව රහත් වූහ.

''**පොක්ඛරසාතිය** බ්‍රාහ්මණතෙම පෙර **කාශ්‍යපබුදුන්** සමයෙහි වෙදත්‍රයෙහි කෙළ පැමිණ කාශ්‍යප නම් දශබලධාරීන් වහන්සේට මහදන් දෙමින් බණ අසා බොහෝ පින්කම් කොට දෙව්ලොව ඉපද අනන්ත වූ දිවසැපත් වළඳා මිනිස්ලොව උපදනා කැමැති වූයේ මාතුකුච්ඡිවාසය නම් අමෙධ්‍යනරකයක් සේ මහත් වූ දුක් වන්නේ ය යි සිතා **හිමවන්තප්‍රදෙශ** යෙහි මහවිලෙක පියුම් ගැබෙක්හි උපන්නේ ය. ඒ විල සමීපයෙහි වසන්නා වූ තපස්වී කෙනෙක් සද්දවසක් නො පිපී තිබෙන්නා වූ ඒ මහ නෙළුම්කැකුළ දැක නෙළා ගත්තාහ. එකෙණෙහි රජතමය ධවලච්ඡත්‍රයක් මෙන් ප්‍රබොධ විය. එහි රන්කුඩුවෙක රන්සුණු ආලෙප ව සිටි රිදී පිළිමයක් මෙන් පියුම්රේණු **පඤ්ජරයෙහි** සිටි ශ්වෙතවර්ණ කුමාරයන් දැක 'අහෝ! මොහු මහපින් ඇති කෙනෙකැ' යි සිතා පන්සලට ගෙණ ගොස් පොෂ්‍යය කෙරෙමින් සත්හවුරුදු වූ කල වෙදත්‍රය උගන්වා **කොසොල් රජහට** පාවා දුන්නාහ. රජ්ජුරුවෝ රූපය හා ශිල්පයත් දැක ප්‍රසන්න ව **උක්කට්ඨා** නම් මහනුවරක් **(138)** බ්‍රහ්මදායාදය කොට දුන්නාහ. ඒ බ්‍රාහ්මණයාගේ දෙපතුල් හස්තතල ඔෂ්ඨද්වය කුසුම්භපුෂ්පවර්ණයෙන් අතිමනොහර ය. කාලවර්ණශීර්ෂය ඉන්ද්‍රනීලමාණික්‍යයක් සේ බබළන්නේ ය. දළිඋවුල චන්ද්‍රමණ්ඩලය වටා සිටි කාලමෙඝරාජියක් වැන්නේ ය. දෙව්දුනු වැනි භෘයුග්මයෙන් හා තළල්තලය අඩසඳක් වැන්නේ ය. ශ්වෙතවර්ණ වූ ශරීරය කරණ කොට ගෙණ දෙව්ලොව පැන නැඟි රිදී තොරණක් මෙන් නිති බබළන්නේ ය. විද්‍යාවෙන්—පණ්ඩිතත්වයෙන් දඹදිවතෙලෙහි අග්‍රප්‍රාප්ත වී ය. එතෙම බුදුන් **උක්කට්ඨා** නම් ජනපදයට වැඩි සමයෙහි බණ අසා සෝවාන් වී ය.

*Non-Commercial Distribution*

''අම්බපාලි ගණිකාතොම මීට එක්තිස් වන කල්පයෙක සිඛී නම් බුදුන්ගේ භික්ෂුණීශාසනයෙහි උපසම්පද ව සිල රකිමින් දිනෙක බොහෝ වූ භික්ෂුණීන් හා සමග චෛත්‍යස්ථානයක් වැඳ පුද පැදකුණු කොට යන්නී ය.[1] පෙරටු ව ගිය රහත් මෙහෙණියක් යුහු ව කිබිසිමින් කෙළ පිඩක් චෛත්‍යාංගණයෙහි හෙළා නො දක ගියා ය. මෝ තොමෝ[2] පසු ව යමින් කෙළපිඩ දක කවර නම් වේසියක් මේ මළුයෙහි කෙළ දමා ගියා ද?'' යි කියා බිණුහ. බොහෝ කලක් සිල් රකිමින් මවුකුස්හි ඉපදීමට පිළිකුල් ව ඕපපාතිකභාවය පතමින් පින් කොටත් ආර්යාප-වාදඅකුශලය බලවත් බැවින් දෙව්ලොවින් නො ගොස් නරකයෙහි ඉපද අනන්ත වූ බොහෝ කාලයක් දුක්විඳ මිනිස්පියට පැමිණ ඉතා දුක්ඛිත ව දසදහසක් ජාතියෙහි වේසී වූහ. කාශ්‍යප බුදුන්ගේ ශාසනයෙහි දීත් බොහෝ පින් කොට දෙව්ලොව ඉපිද බොහෝ කාලයක් දිව්‍යශ්‍රීසම්පත් විඳ එයින් චුතව විශාලාමහනුවර රාජොද්‍යානයෙහි අඹරුකක් මුල සොළොස්හවුරුදු පිරුණු කෙනෙකුන් මෙන් ඕපපාතික ව දෙවහනක සේ පහළ වූහ. උද්‍යානපාලයා ඇ දක විස්මය පත් ව 'රාජභාණ්ඩයක් දක්නා ලද්දේ ය' යි කියා රජගෙට දිව ගෙණ ගොස් එපවත් කී ය. ඒ අසා රාජ කුමාරවරු සියදහසෙක් දිව අවුත් 'අප අපට සරණ මහුල් කරම්හ' යි කියා කලහ වැඩූහ. එකල ඇගේ ශෙෂ ව සිටි අකුශලකර්මයා විසින් චෝදනා කරණ ලද්ද වූ රාජකුමාරවරු 'අප හැමට සාධාරණ කොට මැ වේසී කරම්හ' යි කථා කොට අල්පසත්වපරිභොග නො වන න්‍යායෙන් දවස මසුරන් ලක්ෂයක් අගය වඩා වේසී කළාහු ය. මෝ තොමෝත් බුදුන් කෙරෙහි අතිප්‍රසන්න ව තමන්ට නිල වූ රාජොද්‍යානයෙහි මහාවිහාරයක් කරවා බුදුන් ප්‍රමුඛ වූ මහාසංඝයා වහන්සේට පූජා කොට මැත භාගයෙහි තමන්ගේ පුත්‍ර වූ විමලකොණ්ඩඤ්ඤ නම් මහතෙරුන් වහන්සේ කරා කොටියක් පමණ මහපිරිවර පිරිවරා ගෙණ රාජලීලාවෙන් ගොස් පැවිදි ව රහත් වූහ.

''මෙසේ පින්වත් සත්වයෝ කැමැති තැනෙක උපදනාහු ය. මහ රජානෙනි, යම් සේ සකල සම්පත්තියෙන් ආඪ්‍ය වූ මහත් ධන ඇත්තා වූ මහාභොග ඇත්තා වූ බොහෝ වූ රන්රිදී ඇත්තා වූ බොහෝ වූ වස්තූන් හා උපකරණයන් ඇත්තා වූ බොහෝ වූ ධනධාන්‍යයන් ඇත්තා වූ හිතෙසි වූ බොහෝ වූ නැපක්ෂයන් ඇත්තා වූ පුරුෂයෙක්තෙම, දසියක් හෝ දසයෙක් හෝ කෙතක් හෝ භූමිවස්තුවක් හෝ ගමක් හෝ සල්පිල් ඇති නියම්ගමක් හෝ ජනපදයක් හෝ සිතින් කැමැති වන ලද්ද වූ යම්කිසි වස්තුවක් **(139)** ඇද් ද, ඒ දසිග්‍රාමාදී වූ යම් කැමැති දෙයක් ද්විගුණත්‍රිගුණයක් වත් ධනය දී විකුණා ගන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම වැඩුනා වූ පුණ්‍ය හේතු ඇත්තා වූ සත්වයෝ ක්ෂත්‍රියමහාසාරකුලයෙහි හෝ බ්‍රාහ්මණ මහාසාරකුලයෙහි හෝ ගෘහපතිමහාසාරකුලයෙහි හෝ දෙවියන් කෙරෙහි

---

1. යන්නාහු   2. මැ තොමෝ

*Non-Commercial Distribution*

හෝ අණ්ඩජයෝනියෙහි හෝ ජලාබුජයොනියෙහි හෝ සංසෙදජ යොනියෙහි හෝ ඔපපාතිකයොනියෙහි හෝ යම් කැමැති යොනියෙක උපදනාහ. මෙසේ පුණ්‍යකර්මවශයෙන් සත්වයන්ගේ ගර්භාවක්‍රාන්තිය වන්නේ ය.

''කෙසේ නම් ජාති වශයෙන් සත්වයන්ගේ ගර්භාවක්‍රාන්තිය වේ ද? යත්— මහරජානෙනි, වාතය කරණ කොට ගෙණ කුක්කුටයන්ගේ ගර්භාවක්‍රාන්තිය වන්නේ ය. මේඝශබ්දය කරණ කොට ගෙණ කොකුන්ගේ ගර්භාවක්‍රාන්තිය වන්නේ ය. සියලු ම දෙවියෝ ගැබක නූපදනා හෙයින් අගර්භසෙය්‍යකයෝ ය. නිජ්ඣාමතණ්හිකප්‍රෙතයන් හා නරකයෙහි නිරි සත්වයෝත් ඔපපාතිකයෝ ම ය. මනුෂ්‍ය ගවාදීසත්වයෝ ම ගර්භසෙය්‍යකයෝ ය. ඔවුන්ගේ නානාප්‍රකාරයෙන් ගර්භාවක්‍රාන්තිය වන්නේ ය. මහරජානෙනි, යම් සේ මනුෂ්‍යයෝ නානාප්‍රකාරලක්ෂණයෙන් පොළොවෙහි හැසිරෙති. කිසි කෙනෙක් ඉදිරිපිටින් සකස් කොට වසා පිළී හඳිති. කිසි කෙනෙක් පසු අතින් සකස් කොට වසා පිළී හඳිති. කිසිකෙනෙක් පිළී නො හැඳ නග්න වෙති. කිසිකෙනෙක් ශ්වෙතපටධර ව මුඩු වෙති. කිසිකෙනෙක් ඔටුනු බඳනා ලද්දහු වෙති. කිසිකෙනෙක් හිස මුඩු ව කසාවස්ත්‍ර හඳනාහු වෙති. කිසිකෙනෙක් කසාවස්ත්‍ර හැඳ කොණ්ඩය බඳනා ලද්දහු වෙති. කිසිකෙනෙක් ජටාධර ව වැහැරිවීවරධරයෝ වෙති. කිසිකෙනෙක් දිවිසම් ආදිය අඳනාහු වෙති. කිසි කෙනෙක් ලනු ගොතා අඳින්නාහු ය. මේ සියලු මනුෂ්‍යයෝ ම නානාප්‍රකාරලක්ෂණයෙන් පොළෝතෙලෙහි හැසිරෙන්නාහු ය. මහරජානෙනි, එපරිද්දෙන් ම මනුෂ්‍ය ගව විහගාදී වූ ඒ සියලු සත්වයෝ ම ගර්භසෙය්‍යකයෝ ය. ඔවුන්ගේ නානා ආකාරයෙන් ගර්භාවක්‍රාන්තිය වන්නේ ය. මෙසේ ජාති වසයෙන් සත්වයන්ගේ ගර්භාවක්‍රාන්තිය වන්නේ ය.

''කෙසේ නම් කුලවශයෙන් සත්වයන්ගේ ගර්භාවක්‍රාන්තිය වේ ද? යත්— මහරජානෙනි, කුලය නම් අණ්ඩජය, ජලාබුජය, සංසෙදජය, ඔපපාතිකය යි කියා සතර කුලයෙක. ඉදින් මවුකුසකට පැමිණිය යුතු වූ සත්වයෙක් යම්කිසි තැනෙකින් අවුත් එහි අණ්ඩජකුලයෙහි උපදනේ ය. ඒ තෙම එහි අණ්ඩජ නම් වන්නේ ය. එසේ ම ජලාබුජකුලයෙහි උපන්නේ වී නම් ජලාබුජ වන්නේ ය. ස්වෙදජකුලයෙහි උපන්නේ වී නම් ස්වෙදජ වන්නේ ය. ඔපපාතිකකුලයෙහි උපන්නේ වී නම් ඒ තෙම ඔපපාතික වන්නේ ය. ඒ කුලවල එබඳු වූ ම සත්වයෝ වන්නාහු ය. මහරජානෙනි, යම් සේ හිමාලයෙහි වූ නෙරු නම් ස්වර්ණපර්වතය කරා යම්කිසි හංස අශ්ව මෘග පක්ෂි කෙනෙක් වාසයට පැමිණියාහු වූ නම්, ඒ සියල්ලෝ ම තමතමන්ගේ ස්වකීයවර්ණය හැර ස්වර්ණවර්ණ වන්නාහු ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යම්කිසි පැමිණිය යුතු සත්වයෙක් යම්කිසි තැනෙකින් අවුත් අණ්ඩජයොනියෙහි උත්පත්තියට පැමිණ තමාගේ ස්වභාවජාතිය හැර අණ්ඩජ වන්නේ ය. එසේ ම ජලාබුජයොනියට

ස්වේදජයොනියට ඔපපාතිකයොනියට පැමිණ ස්වභාවජාතිය හැර ඔපපාතික වන්නේ ය. මෙසේ කුලවශයෙන් සත්වයන්ගේ **(140)** ගර්භාවක්‍රාන්තිය වන්නේ ය.

''කෙසේ නම් ආයාචනවශයෙන් සත්වයන්ගේ ගර්භාවක්‍රාන්තිය වේ ද? යත්— මහරජානෙනි, මේ මනුෂ්‍යලොකයෙහි බොහෝ වූ වස්තූන් ඇත්තා වූ ශ්‍රද්ධාව ඇත්තා වූ රත්නත්‍රයෙහි ප්‍රසන්න වූ සීලවන්ත වූ යහපත් වූ කල්‍යාණගුණධර්මයන් ඇත්තා වූ තපොනිශ්ශ්‍රිත[1] වූ දරුවන් නැත්තා වූ කුලයෙක් වී නම් එකල වැඩුනා වූ කුශලහෙතූන් ඇත්තා වූ දිව්‍යපුත්‍රයෙක්තෙම දෙව්ලොවින් චුතවන ස්වභාව ඇත්තේ වී නම්, නැවැත **ශක්‍රදෙවෙන්ද්‍ර**තෙම ඒ ගොත්‍රයට අනුකම්පාවෙන් ඒ දිව්‍යපුත්‍රයා කරා ගොස් කැඳවා 'එම්බා නිදුකානෙනි, තෙපි මිනිස් ලොව උපන්නාහු නම්, ලොකයට මහත් අභිවෘද්ධි වන්නේ ය. ශාසනයට මහත් අභිවෘද්ධි වන්නේ ය. ලොකශාසන දෙකට ම මහත් අභිවෘද්ධි වන්නේ ය. මෙනම් ගොත්‍රයෙහි මහෙසිකාවන්ගේ කුක්ෂියෙහි උත්පත්තිය පිණිස ප්‍රාර්ථනා කරව' යි කියා යාච්ඤා කරන්නේ ය. ඒ **ශක්‍රයන්ගේ** ආරාධනාව හෙතු කොට ගෙණ ඒ දිව්‍යපුත්‍රතෙමේත් ශක්‍රයන් ගුණ කී ඒ වංශය ප්‍රාර්ථනා කොට උපදින්නේ ය. මහරජානෙනි, යම් සේ මනුෂ්‍යයෝ කුසල් කැමැත්තාහු මේ ශ්‍රමණයන් වහන්සේ අපගේ ගෘහයට වැඩපුසේක් නම් සියලු ම අපගේ කුලගොත්‍රයට සැප පැමිණීම වන්නේ ය යි සිතා ගෙණ භාවනා කරන්නා වූ ශ්‍රමණයන් වහන්සේ නමකට ආරාධනා කොට තමන්ගේ ගෙට පමුණුවා ගණිද් ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ශක්‍රදෙවෙන්ද්‍රතෙම ඒ ආයු ගෙවුනු දිව්‍යපුත්‍රයාහට ආරාධනා කොට ඒ පින්වත් ශ්‍රද්ධාවන්තකුලයට පමුණුවන්නේ ය. මෙසේ ආයාචන වශයෙන් සත්වයන්ගේ ගර්භාවක්‍රාන්තිය වන්නේ ය.

''මහරජානෙනි, **ශක්‍රදෙවෙන්ද්‍ර**යන් විසින් ආරාධනා කරණ ලද්ද වූ **සාමකුමාරයෝ පාරිකා** නම් තපස්සිනීන්දෑගේ කුක්ෂියට පැමිණියාහු ය. මහරජානෙනි, ඒ සාමකුමාරතෙමේ කරණ ලද බොහෝ පින් ඇත්තේ ය. තුන් දෙනෙකුන්ගේ චෙතොප්‍රණිධියෙහි උත්පත්තියට සමර්ථ වූ ශක්‍රයන් විසින් ආයාචනය කරණ ලද්ද වූ ඒ සාමකුමාරතෙම සිල්වත් වූ මනොඥ වූ ගුණධර්මයන් ඇත්තා වූ මාතෘපිතෘන් කෙරෙහි උපන්නේ ය. මහරජානෙනි, මේ මනුෂ්‍යලොකයෙහි උපායෙහි දක්ෂ වූ පුරුෂතෙම යහපත් කොට සී සා කොටන ලද සරු වූ ක්ෂේත්‍රයෙක මාවී ආදි වූ බීජයන් රොපණය කෙළේ වී නම්, කිමෙක් ද, වපුරණ ලද ඒ බීජයන්ට වන අන්තරායන් නැවත නැවතත් අභිවෘද්ධිය පිණිස දුරු කරණ කල්හි කිසි අන්තරායක් වේ ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, කිසි අන්තරායක් නැත්තා වූ නො නැසුනා වූ ඒ බීජයෝ ස්වාමීනි, වහා ම

1. තරනිශ්‍රිත

Non-Commercial Distribution

යහපත් සේ ම පැළවන්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම **සාමකුමාරයන්** වහන්සේ උත්පත්ත්‍යන්තරාවන්ගෙන් මිදී තුන් දෙනෙකුන්ගේ චිත්තප්‍රාර්ථනාවෙන් උපන්සේක.

''කිමෙක් ද, මහරජානෙනි, 'ඍෂීන්ට කරණ ලද චිත්තදූෂණයෙන් සකල සමෘද්ධියෙන් පිරුණා වූ අනන්තජනයන් සහිත වූ මහාජනපද නැසී යන ලද්' යි කියා තොප විසින් පෙර අසන ලද්දේ ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, පොළෝ තෙළෙහි **දණ්ඩකී** රජ්ජුරුවන් විසින් **කිසවච්ච** ඍෂීන්ට කළ අනාදරයෙන් මිනිසුන් සහිත රට නැසී අරණ්‍යගත වූ **දණ්ඩකාරණ්‍යය** ද පෙර **කලිඟුරට නාලිකෙර** රජ්ජුරුවන් පන්සියයක් **(141)** තපස්වීන් වහන්සේලාට 'අසූචි කව' යි නිග්‍රහ කොට මැරීමෙන් රට සහ නැසී ගියා වූ **කාලිංගාරණ්‍යය** ද එසේ ම, **මෙද්ධ්‍ය** නම් රට **මෙද්ධ්‍ය** නම් රජ්ජුරුවන් විසින් අහර වළඳමින් සිටි **මාතංගඍෂීන්** වහන්සේගේ හිස කප්පවා ලූ හෙයින් **මාතාංගාරණ්‍ය** නම් වූ **මෙද්ධ්‍යාරණ්‍යය** ද යන මේ සියලු ම අරණ්‍යයෝ තුන්දෙන මනුෂ්‍ය අපරිභොග ව අරණ්‍ය වන ලද්දහු ය.

''සියලු ම මේ ජනපදයන්හි ඍෂීන්ට කරණ ලද චිත්තප්‍රසාදයෙන් කිසි අභිවෘද්ධිධර්මයකුත් උපදී ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි,'' කීහ. ''මහරජානෙනි, එසේ වී නම්, **සාමකුමාරයෝ** මහාබලවත් වූ පින් ඇති තුන් දෙනකුන්ගේ චිත්තප්‍රසාදයෙන් උපන්සේක. **දුකූල** නම් ඍෂීන් විසින් නිර්මිත වූසේක. **ශක්‍රයන්** විසින් නිර්මිත වූසේක. පුණ්‍යමහිමයෙන් නිර්මිත වූ සේකැ'' යි කියා ''මහරජානෙනි, මෙසේ මේ කාරණය තෙපි සිත්හි ධරා ගණුව. මහරජානෙනි, මේ දිව්‍යපුත්‍රයෝ තුන්දෙනෙක් ශක්‍රදෙවෙන්ද්‍රයන් විසින් යාච්ඤා කර සිටින ලද්දහු කුලයෙහි උපන්නාහු ය. ඒ තුන්දෙන කවරේ ද? මෙකී **සාමකුමාරයෝ** ද **මහාපණාද** කුමාරයෝ ද **කුස** රජ්ජුරුවෝ ද යන මේ තුන්දෙනා ය. මේ තුන්දෙනාත් මහාබොධිසත්වයෝ ම ය'' යි වදාළසේක.

මෙසේ මිලිඳු මහරජානන් ''ස්වාමීනි, බුදුරජානන් වහන්සේ විසින් 'කාරණා තුණකින් දරුගැබ හට ගන්නේ ය' යි කියා වදාළ මේ කාරණය සැබෑ වී නම් 'නාභිය පිරිමැදීමෙන් සාමකුමාරයෝ උපන්හ' යි කියා වදාළ කාරණය බොරු වන්නේ ය. ඒ කාරණය සැබෑ වී නම් 'කාරණා තුණකින් දරුගැබ හට ගන්නේ ය' යි කියා වදාළ කාරණය බොරු වන්නේ ය'' යි කියා මේ උභතොකොටික ප්‍රශ්නය විචාළ කල්හි ''මහරජානෙනි, ඒ කාරණාදෙක ම සැබෑ ම ය'' යි කියා අනෙකවිචිත්‍රාකාර උපමාවන් ගෙණ හැර දක්වා වදාළ කල්හි අතිප්‍රසන්න වූ මිලිඳු මහරජානෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තුඹ වහන්සේ විසින් ගර්භාවක්‍රාන්තිය මට යහපත් කොට දක්වා වදරණ ලද්දේ ය. ඊට ම කාරණයෝ සුන්දර කොට කථනය කරණ ලද්දහු ය. ඝනාන්ධකාරයෙහි සතර රියන් ගෙයක

ප්‍රදීපසහස්‍රයක් දල් වූ කලක් මෙන් ආලොක කරණ ලද්දේ ය. මිථ්‍යාජටා විජටනය කරණ ලද්දේ ය. මිථ්‍යාදෘෂ්ටීන්ගේ පරවාදයෝ විශෙෂයෙන් පැහැර දමන ලද්දහ. මෙසේ නුඹ වහන්සේ වදළ මේ කාරණය මමත් එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**ගර්භාවක්‍රාන්තිප්‍රශ්නය නිමි.**

---

## ශාසනායුඃප්‍රශ්නය

නැවතත් මිලිඳු මහරජානෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ විසින් '**ආනන්ද**යෙනි, පන්සියයක් හවුරුදු මුළුල්ලෙහි දුන් අපගේ සද්ධර්මය පවත්නේ ය' යි කියා මේ කාරණය වදරණ ලද්දේ ය. නැවත ද පරිනිර්වාණසමයෙහි **සුභද්‍ර** නම් පරිබ්‍රාජකයන් විසින් ප්‍රශ්න අසන ලද්ද වූ භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ විසින් '**සුභද්‍ර**යෙනි, මාගේ ශාසනයෙහි මේ භික්ෂූහු මනා කොට වාසය කරන්නාහු වූ නම්, රහතුන්ගෙන් ලොකය අශූන්‍ය වන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය. මේ අශෙෂ වූ වචනයෙක. මේ නිරවශෙෂ වචනයෙක. අන්‍ය කාරණා විරහිත වූ **(142)** වචනයෙක. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ විසින් '**පඤ්චෙවදානි ආනන්ද වස්ස සතානි සද්ධම්මො ඨස්සති**''ති කියා වදරණ ලද්දේ වී නම්, ඒ හෙයින් ''**අසුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්සා**' ති කියා යම් වචනයක් වදරණ ලද ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් 'අසුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්සා' ති කියා වදරණ ලද්දේ වී නම්, එහෙයින් 'පඤ්චෙවදානි ආනන්ද වස්සසතානි සද්ධම්මො ඨස්සති' ති කියා වදළ ඒ වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටික ප්‍රශ්නයතෙමේත් අවුලෙනුත් අවුල්තර වූයේ ය. බලයෙනුත් බලවත්තර වූයේ ය. බලවත් ග්‍රන්ථිස්ථානයෙනුත් ග්‍රන්ථිතර වූයේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ම ය. මහා සාගරාභ්‍යන්තරයට පැමිණ දිය යට ඔබ මොබ ක්‍රීඩා කරණ මකර නම් මත්ස්‍යයකු මෙන් ඒ ගම්භීර වූ ප්‍රශ්න නමැති සාගරයෙහි ලා නුඹ වහන්සේගේ ප්‍රඥාබලවිස්ථාරය දක්වා වදළ මැනැව'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් **ආනන්ද**යෙනි, අපගේ දුන් මේ ප්‍රතිපත්තිසද්ධර්මය වර්ෂපන්සියයක් මුළුල්ලෙහි නො නැසී සිටින්නේ ය' යි කියා මේ කාරණයත් වදරණ ලද්දේ ය. නැවැත පරිනිර්වාණ සමයෙහි ද ප්‍රශ්න විචාල **සුභද්‍ර** නම් පරිබ්‍රාජකයා හට 'සුභද්‍රයෙනි, මාගේ ශාසනයෙහි මේ භික්ෂූහු දුස්සීලාදිනවයක් නැති ව මනා කොට වාසය කරන්නාහු වූ නම්, ලොකයතෙම රහතුන්ගෙන් අශූන්‍ය වන්නේ ය' යි කියාත් වදරණ ලද්දේ ය. මහරජානෙනි,

Non-Commercial Distribution

භාග්‍යවතුන් වහන්සේගේ ඒ වදාළ වචනය නානාර්ථ ද වන්නේ ය. නානා ව්‍යංජන ද වන්නේ ය. මේ ශාසනයාගේ ආයු පරිච්ඡේදය වන්නේ ය. මේ ප්‍රතිපත්තියගේ දක්වීම වන්නේ ය. ඒ කාරණයෝ දෙදෙනෙක් ම ඔවුනොවුන්ට දුරින් දුරු වන ලද්දහු ය. මහරජානෙනි, යම් සේ අහස පොළොව කෙරෙන් දුරින් දුරු වන ලද ද, නරකය ස්වර්ගය කෙරෙන් දුරින් දුරු වන ලද ද, කුශලධර්මය අකුශලධර්මය කෙරෙන් දුරින් දුරු වන ලද ද, කායචිත්තදුක්ඛය කායචිත්තසැපය කෙරෙන් දුරින් දුරු වන ලද ද, එපරිද්දෙන් ම මහරජානෙනි, ඒ කාරණයෝ දෙදෙන ඔවුනොවුන්ට දුරින් දුරු වන ලද්දහු ය. මහරජානෙනි, එතෙකුදු වුවත් තොපගේ විචාරීම සිස් නො වන්නේ ය. අර්ථරසය වශයෙන් තොපට සංසන්දනය කොට මම කියමි. 'පඤ්චෙවදානි ආනන්ද වස්සසතානි සද්ධම්මො ඨස්සති' යි කියා යම් වචනයක් භාග්‍යවතුන් වහන්සේ වදාළසේක් ද, ඒ වචනය ශාසනයාගේ නැසීම දක්වමින් ඉතිරි ව සිටි ශෙෂයත් පිරිසිඳ වදාළසේක. 'ආනන්දයෙනි, භික්ෂුණීහු ශාසනයෙහි පැවිදි නො වූවාහු වූ නම්, ශාසනයත් චිරස්ථායික වේ නම්, දහසක් හවුරුදු සද්ධර්මය සිටින්නේ ය. ආනන්දයෙනි, පන්සියයක් හවුරුදු දූන් මේ සද්ධර්මය සිටින්නේ ය'යි කියා වදාළසේක. කිමෙක් ද, මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදරමින් සද්ධර්මයාගේ අන්තර්ධානය හෝ කීසේක් ද? ප්‍රතිවෙධ ධර්මය හෝ වළක්වා වදාළසේක් දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ.

''මහරජානෙනි, අධිගමසද්ධර්මයාගේ විනාශය දක්වා වදරමින් ශෙෂ ව සිටි ශාසනයාගේ ආයුසයත් දක්වා වදරමින් පිරිසිඳ වදාළසේක. මහරජානෙනි, යම් සේ **(143)** නැසුනු අය ඇත්තා වූ පුරුෂයෙක්තෙම නො නැසී ශෙෂ ව සිටි සියල්ල ගෙණ මහජනයාහට 'පින්වත්නි, මාගේ මෙපමණ වූ බඩු නැසී ගියේ ය. ඉතිරි වූ බඩු මෙපමණ ය' යි කියා දක්වා කියන්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ ශාසනයාගේ විනාශය දක්වා වදරමින් 'ආනන්දයෙනි, පන්සියයක් හවුරුදු මුළුල්ලෙහි දූන් මාගේ ශාසනසද්ධර්මය පවත්නේ ය' යි කියා සියලු දිව්‍යමනුෂ්‍යයන්ට ඉතිරි වූ ශාසනායුඃශෙෂය වදාළසේක. මහරජානෙනි, සර්වලොකෙකාග්‍ර වූ භාග්‍යවතුන් වහන්සේ විසින් 'පඤ්චෙවදානි ආනන්ද වස්සසතානි සද්ධම්මො ඨස්සති' ති කියා මේ වචනයක් වදරණ ලද ද, ඒ ශාසනආයු පරිච්ඡෙදය වන්නේ ය. පිරිනිවන්පානා සමයෙහි සුභද්‍ර නම් පරිබ්‍රාජකයාහට ශ්‍රමණයන් දක්වා වදරමින් 'සුභද්‍රයෙනි, මාගේ මේ භික්ෂූහු මනා කොට වාසය කරන්නාහු වූ නම්, ලොකය රහතුන්ගෙන් අශූන්‍ය වන්නේ ය' යි කියා යමක් වදාළසේක් ද, මේ වදාළ දෙශනාතොමෝ නිර්මල වූ ශාසනප්‍රතිපත්තිය දක්වන්නී ය. මහරජානෙනි, තෙපි වනාහි 'ඒ ශාසනායුඃපරිච්ඡෙදයත් ප්‍රතිපත්ති දක්වීමත් දෙක එක ම අර්ථරසයකැ' යි සිත්හි කරන්නහු ද? ඉදින් වනාහි තොපගේ ඒ බව අසාපියන කැමැත්තෙක් ඇත්තේ වී නම්, එක අර්ථරසයක් කොට මම

*Non-Commercial Distribution*

කියමි. තෙපි අන්‍යවිහිත නො වූ සිතින් යුක්ත ව මනා කොට අසව. එපවත් සිත්හි කර ගණුව. මහරජානෙනි, මේ ලොකයෙහි සිසිරතර නවුන්ජලයෙන් සම්පූර්ණ වූ හාත්පසින් ඉතිරී යන්නා වූ ජලප්‍රමාණයෙන් පරිච්ඡින්න වූ හාත්පසින් වට කොට බඳන ලද වැවු බැම්මෙන් වට කරණ ලද්ද වූ විලෙක් වේ ද, ඒ තළාකයෙහි ජලය නො සිඳුනු කල්හි ම ඒ ජලය මත්තෙහි මහාමෙඝය ද කඩ නො වී අනු ව බැඳ ගණිමින් නැවැත නැවැතත් වර්ෂා කරන්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ තළාකයෙහි ජලය ක්ෂය වීමට විනාශ වීමට යේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, ඒ කුමන කාරණාවකින් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, මෙඝයාගේ අනුබන්ධන බැවිනැ'' යි කීහ.

''මහරජානෙනි, එපරිද්දෙන් ම සර්වඥශාසනවරසද්ධර්මතළාකය තෙම ආචාරසීල ගුණවන්ත ප්‍රතිපත්ති නමැති නිර්මල වූ නවුන්ජලයෙන් සම්පූර්ණ ව ඉතිරෙමින් යට අජටාකාශයෙන් පටන් මත්තෙන් භවාග්‍රය දක්වා සරස දසදහසක් සක්වළ අභිභවනය කෙරෙමින් සිටියේ ය. ඉදින් ඒ සර්වඥශාසනයෙහි බුද්ධපුත්‍රයෝ ආචාරසීල ගුණවන්ත ප්‍රතිපත්ති නමැති මහාමෙඝවර්ෂාව පසු පසුවත් අනුබන්ධනය කරන්නාහු වී නම්, මෙසේ මේ සර්වඥශාසනවර සද්ධර්මතළාකය බොහෝ වූ දීර්ඝකාලයක් මුළුල්ලෙහි සිටින්නේ ය. රහතුන්ගෙන් ද ලොකය සිස් නො වන්නේ ය. මේ අර්ථය සඳහා අප භාග්‍යවතුන් වහන්සේ විසින් **'සුභද්‍රයෙනි,** මාගේ මේ භික්ෂූහු මනා කොට ප්‍රතිපත්තියෙහි පිහිටා වාසය කරන්නාහු වූ නම්, රහතුන්ගෙන් ලොකය අශූන්‍ය වන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය. මහරජානෙනි, මේ ලොකයෙහි වනාහි දිලියෙමින් ඇවිළෙන්නා වූ මහ ගිනිකඳෙක, පසු පසුවත් වියළුනා වූ තෘණකාෂ්ට ගොමවැරටි උපාසංහරණයෙන් බහාලන්නා වූ නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ මහාගිනි කඳ නිවී යේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, නැවැත නැවැතත් ඒ ගිනි කඳ දිලියෙන්නේ ය. නැවැත නැවැතත් ප්‍රභාවත් වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම දශසහශ්‍රීලොකධාතුයෙහි **(144)** සර්වඥශාසනවරය ආචාරසීල ගුණවන්ත ප්‍රතිපත්තියෙන් දිලියෙන්නේ ය. ප්‍රභාවත් වන්නේ ය. ඉදින් වනාහි, මහරජානෙනි, එයින් මත්තෙහි බුද්ධ පුත්‍ර වූ ශ්‍රාවකයෝ සර්වඥබොධිය සිහි කරන්නා වූ විශුද්ධශ්‍රද්ධායෙන් හා ප්‍රධානක්ෂම වූ අල්පාබාධතායෙන් හා අමායාකාරහුත වූ අසඨතායෙන් හා අකුශලධර්මයන් දුරු කිරීම පිණිසත් කුශලධර්මයන් උපදවන පිණියත් පවත්නා අරබ්ධවීර්යයෙන් හා මනා කොට ම සියලු දුක් ක්ෂය කිරීම පිණිස පවත්නා වූ උදයත්ථගාමිනී ප්‍රඥවෙන් යුක්ත වීමෙන් හා යන මේ පඤ්චවිධ වූ ප්‍රධානියාංගයෙන් සමන්නාගත වූවාහු නිරන්තරයෙන් අප්‍රමාද ව වීර්ය කරන්නාහු ය. ත්‍රිවිධශික්ෂායෙහි ආලය උපදවා හික්මෙන්නාහු ය. චාරිත්‍රවාරිත්‍ර වශයෙන් විවිධ වූ ශීලය සම්පූර්ණ කොට පූරණය කරන්නාහු ය. මෙසේ ඇති කල මේ සර්වඥශාසනවරය බොහෝ සෙයින් වඩවඩා බොහෝ දීර්ඝකාලයක් මුළුල්ලෙහි නිර්මල ව

*Non-Commercial Distribution*

සිටින්නේ ය. රහතුන්ගෙන් ලොකය අශූන්‍ය වන්නේ ය. මෙම අර්ථය සඳහා අප භාග්‍යවතුන් වහන්සේ විසින් සුභද්‍රයෙනි, මාගේ ශාසනයෙහි මේ භික්ෂූහු මනා ව විහරණය කරන්නාහු වූ නම්, රහතුන්ගෙන් ලොකය අශූන්‍ය වන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය. තවද, මහරජානෙනි, මේ ලොකයෙහි වනාහි සිනිඳු සුමර්දිත ප්‍රභාවත් වූ යහපත් වූ කැඩපතක් මෘදු වූ සියුම් ගුරුචූර්ණයෙන් නැවත නැවැතත් මදින්නාහු වූ නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ කැඩපතෙහි මලකඩ මඩ රජස් කඳුළු උපදී ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, එකාන්තයෙන් ම කැඩපත නිර්මලතර වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම සර්වඥ ශාසනප්‍රවරය ප්‍රකෘතියෙන් ම අත්‍යන්ත නිර්මල ය. පහ වූ කෙලෙස්මල ඇත්තේ ය. පහ ව ගිය කෙලෙස් රජස් කඳුළු ඇත්තේ ය. ඉදින් බුද්ධපුත්‍ර වූ සංඝයා වහන්සේ ආචාරසීල ගුණවන්ත වූ ප්‍රතිපත්ති සල්ලෙඛධුතාංග ගුණයෙන් ඒ සර්වඥශාසනප්‍රවරය සල්ලෙඛනය කළාහු වූ නම්, මෙසේ කළ මේ ජිනශාසනප්‍රවරය බොහෝ දීර්ඝකාලයක් මුළුල්ලෙහි නිර්මල ව සිටින්නේ ය. රහතුන්ගෙන් ලොකය අශූන්‍ය වන්නේ ය. මෙම අර්ථය සඳහා භාග්‍යවතුන් වහන්සේ විසින් 'සුභද්‍රයෙනි, මාගේ ශාසනයෙහි මේ භික්ෂූහු මනා කොට ම ප්‍රතිපත්තියෙහි විහරණය කරන්නාහු වූ නම්, රහතුන්ගෙන් ලොකය සිස් නො වන්නේ ය'යි කියා පිරිනිවන් සමයෙහි වදරණ ලද්දේ ය. මහරජානෙනි, ශාස්තෘශාසනය ප්‍රතිපත්තිය ම මුල් කොට ඇත්තේ ය. ප්‍රතිපත්තිය ම සාර කොට ඇත්තේ ය. ප්‍රතිපත්තිය අන්තර්ධාන නො වූ කල්හි ම සිටින්නේ ය''යි කීසේක.

එවිට රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සඬර්මාන්තර්ධානය යි කියා යමක් නුඹ වහන්සේ කියනසේක් ද, ඒ සඬර්මාන්තර්ධානය කවරේ ද?''යි විචාළෝ ය. ''මහරජානෙනි, මේ ශාසනාන්තර්ධානයෝ තුන් දෙනෙක. ඒ තුන්දෙන කවරේ ද? අධිගමඅන්තර්ධානය, ප්‍රතිපත්තිඅන්තර්ධානය, ලිංගඅන්තර්ධානය යි, මහරජානෙනි, අධිගමඅන්තර්ධානය වූ කල්හි මනා ව පිළිපන්නාහටත් ධර්මාභිසමය නො වන්නේ ය. ප්‍රතිපත්තිය අන්තරහිත වූ කල්හි ශික්ෂාපදප්‍රඥප්තිය අන්තර්ධාන වන්නේ ය. මහණවෙස ම සිටින්නේ ය. මහණවෙස අන්තර්ධාන වූ කල්හි ශාසනායුඃප්‍රවෙණිය සිඳීම වන්නේ ය. මේ ත්‍රිවිධඅන්තර්ධානයෝ ය. මහරජානෙනි, තව ද, එම අන්තර්ධානයෝ **(145)** පර්‍යාප්ති ධාතු වශයෙන් පඤ්චවිධ වේ. එහි බුදුන් පිරිනිවී දහසක් හවුරුදු මුළුල්ලෙහි භික්ෂූහු සිවපිළිසිඹියායෙන් යුක්ත වූ රහත්ඵල උපදවති. කල් යාමෙන් එසේ නො හැකි ව ෂඩභිඥවෙන් යුක්ත වූ රහත් ඵල උපදවති. කල් යත් යත් එසේත් නො හැකි ව ත්‍රිවිද්‍යාවෙන් යුක්ත වූ රහත්ඵල උපදවති. මෙම ක්‍රමයෙන් පිරිහී ශුෂ්කවිදර්ශක වෙති. අනාගාමී වෙති. සකෘදගාමී වෙති. සෝවාන් වෙති. පශ්චිම සෝවාන්හුගේ ජීවිතක්ෂය වීමෙන් අධිගමය අන්තර්ධාන වෙයි.



Non-Commercial Distribution

''එකල භික්ෂූහු භාවනානුයොගයෙහි යෙදී වීර්ය කරත්. උපචාර අර්පණා කසිණාලොකමාත්‍රයකුදු නො ලැබ කුසීත ව 'අහෝ! මෙකලට අධිගමය පිරිහී ගියේ ය. අපි අකාරණයෙහි වීර්ය කරම්හ. කෙතෙක් වීර්ය කළත් අධිගමය නො ලැබේ ම ය' යි සිතා චතුපාරිසුද්ධිසීලය ම නිර්මල කොට රක්ෂා කෙරෙති. කල් යාමෙන් ඒ ශීල රක්ෂායෙහිත් ඔවුනොවුන්ගේ සාකච්ඡාවකුත් නැත්තෙන් කෞසීද්‍ය බහුල ව ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපද මර්දනය කරති. කල් යාමෙන් භය හැරී මහත් මහත් ශික්ෂාපද මර්දනය කෙරෙමින් සතරපාරාජිකාපත්තිය ම රක්ෂා කෙරෙති. අන්තිම භික්ෂුහුගේ ජීවිතය ක්ෂය වීමෙන් ප්‍රතිපත්තිය අන්තර්ධාන වන්නේ ය. අනාගත වූ කලියුගයෙහි රජදරුවෝ අධර්මිෂ්ඨ වෙති. ඒ දැක අමාත්‍යයෝ ද ජනපදවාසීහු ද අධර්මිෂ්ඨ වෙති. එකල වස්සවලාහකයෝ අසන්තොස ව කලට වැසි නො වස්වති. එකල මනුෂ්‍යයන්ගේ ශස්‍යඵලයන් අසම්ප්‍රාප්ත ව භික්ෂූන්ට සිවුපසය දෙන්ට අසමර්ථ වෙති. සිවුපසයෙන් ක්ලාන්ත වූ භික්ෂූහු ශිෂ්‍යයන්ට බුද්ධවචනය උගන්වන්ට අසමර්ථ වෙති. කල් යාමෙන් තුමූත් ධරන්නට අසමර්ථ ව සියලුම අටුවා හැර වදළ පාලිධර්මය ම ධරන්නාහු ය. කල් යාමෙන් සියලු ම පාලිධර්මය ධරන්නට අසමර්ථ වෙති. එකල ගම්භීරාර්ථ තද පද ඇති අභිධර්මපිටකය පිරිහෙයි. ඊට අනතුරු ව සූත්‍රපිටකයත් පිරිහෙයි. ශීලාචාරසම්පන්න වූ භික්ෂූහු විනයපිටකය ධරන්නාහ. ලාභසත්කාරකීර්තිප්‍රශංසාකාමී වූ භික්ෂූහු ජාතක ධරන්නාහු ය. කල් යාමෙන් සියලු ම ජාතකත් ධරන්නට අසමර්ථ ව පිරිහෙන්නේ ය. විනයපිටකයත් ක්‍රමයෙන් ම පිරිහෙන්නේ ය. යම් දවසෙක කලියුගයෙහි ධර්මිෂ්ඨ රජෙක් බණ අසනු කැමැති ව දහසින් බැඳි පියල්ලක් රන්සිවි ගෙයක නහා ඇත්කඳ පිට තබා 'බුදුන් දෙසූ බණින් සතරපදයකින් බණ කියා මේ සියලු ම වස්තුව ගණීවා' යි තුන්යලක් නුවර ප්‍රදක්ෂිණා කරවා බණ දන්නෙකු නො ලදින් මහාශොකී ව හඬන්නේ ය. එදවස් පර්යාප්තිය අන්තර්ධාන වන්නේ ය.

''අනාගතයෙහි භික්ෂූන්ගේ චීවරග්‍රහණ පාත්‍රග්‍රහණ හස්තපාදයන් හකුළුවා ලීම් දිග හැරීම් ඉදිරි පසු බැලීම් ප්‍රාසාදික නො වන්නේ ය. ලබු කබල් ගෙණ යන නිගණ්ඨශ්‍රාවකයන් සෙයින් භික්ෂූහු පාත්‍ර අග්‍රබාහුවෙන් හෝ ගෙණ ඇවිදිති. සහල්ලෙක හෝ තබා එල්වා ගෙණ හෝ ඇවිදිති. සිවුරු ද යහපත් කොට කපා ගොතා, පඬු පොවා නො හැඳ ඔටුවන්ගේ අස්ථිවර්ණ කොට ගෙණ හඳිති. කල් යාමෙන් කුඩා කහකඩක් හස්තයෙහි හෝ ග්‍රීවයෙහි හෝ හිසෙහි හෝ බැඳ ගෙණ 'අපි උපසම්පන්නයම්හ' යි කියා අඹුදරුවන් හා සමග කෘෂිවණික්කර්මාන්තයෙන් ජීවත් වෙති. ඒ කාසාවකණ්ඨ නම් දුස්සීලපව්ටූමහණුන්ට කුසල් පතා **(146)** සංඝගත කොට සිවුපසය දෙන්නාහු ය. ඒ දනය ද අසංඛෙය්‍ය අප්පමෙය්‍යානිසංස වන්නේ ය. කල් යාමෙන් ඒ දුස්සීලයෝ නානාවිධ කර්මාන්තයෙහි හැසිරෙන්නාහු 'මේ කුඩා කහකඩින් අපට කම් කිම් ද?' යි කියා කහකඩ දමා පියති. එදවස් මහණවේසය අන්තර්ධාන වන්නේ ය.

*Non-Commercial Distribution*

''මෙසේ, අධිගම, ප්‍රතිපත්ති, පර්යාප්තිය යි කියන ලද ත්‍රිවිධ ශාසනය හා ලිංගාන්තර්ධානය වූ කල්හි ශෙෂ ව සිටි ශාරීරිකධාතු ම පන්දහසක් හවුරුදු පවත්නේ ය. එකල සත්වයන්ගේ ශ්‍රද්ධා බුද්ධි මඳ වීමෙන් පූජාසත්කාර නො ලබන්නා වූ ධාතූන් වහන්සේ බුදුන්ගේ අධිෂ්ඨාන බලයෙන් පූජාසත්කාර ලැබෙන තැනට අහසින් වඩිති. කල් යාමෙන් හැම තැන ම පූජාසත්කාර නො ලැබෙයි. එකල බුදුන් ධරමාන කාලයෙහි ලෝවැඩ පිණිස විසිර පවත්නට අධිෂ්ඨාන කර වදළ හැම ධාතූන් වහන්සේ අධිෂ්ඨානබලයෙන් ලක්දිව **රුවන්වැලිමහසෑයට** වඩිති. එතැනින් **නාගදිවයින රාජායතන** නම් චෛත්‍යයට රැස් වෙති. එයින් **මහබෝමැඩ** කරා වඩිති. එකල දෙව්ලොවිනුත් නාලොවිනුත් මිනිස් ලොවිනුත් හැම ධාතුහුම බෝමැඩට රැස් වූ කල තුදුස්රියන් වජ්‍රාසනය පැන නැගෙයි. ඊමත්තෙහි බුදුන් බුදු වූ ද දුටු දිව්‍යබ්‍රහ්මයන්ට සන්තොස උපදවමින් සැබවී සිට එළි බැස වදළ කලක් මෙන් දෙළොස්රියන් බුදු වෙස් ගෙණ වැඩ සිටි කල්හි ඒ ධාතු බුද්ධශරීරයෙන් නීලපීතාදි වූ සවණක් ඝනබුදුරැස් විහිද බඹලොව දක්වා නැගී පැතිර ගෙණ අනන්තාපරිමාණ සක්වළට දිවන්නේ ය. ඒ දුක දිව්‍යබ්‍රහ්මනාගසුපර්ණයක්ෂරාක්ෂසාදීහු 'අහෝ! අප ලොවුතුරා බුදුන්ගේ ධාතුපරිනිර්වාණය අද දවස් වන්නේ ය'යි මහත් වූ සංවෙගයෙන් ක්ෂණයකින් දිව අවුත් අනෙකවිධ වූ පූජොත්සවයට පටන් ගණිති. එකල ධාතු බුද්ධරූප වහන්සේ ජීවමාන බුදුන් සෙයින් යමකප්‍රාතිහාර්ය කොට වැඩ සිටි කල්හි බුදුන්ගේ අධිෂ්ඨානයෙන් ඒ ශරීරයෙන් ගිනි නැගී බඹලොව දක්වා ගිනිදැල් නඟා හැම ධාතු ආදහනය කරන්නේ ය. එකල බුදුන් පිරිනිවී ද සෙයින් මුළුලොව මහා ශොක පත් වන්නේ ය. එදවස් ශාසනායුෂය ගෙවා ධාතු අන්තර්ධාන වන්නේ ය.

මෙසේ **නාගසෙනස්ථවිර** ස්වාමීන් වහන්සේ ''ඉදින් බුදුරජානන් වහන්සේ '**ආනන්දයෙනි**, මාගේ ශාසනය පන්සියයක් හවුරුදු පවත්නේ ය'යි කියා වදළ කාරණය සැබෑ වී නම්, '**සුභද්‍රයෙනි**, මාගේ භික්ෂූහු දුස්සිලාදීනවයක් නැති ව මනා ව වාසය කරන්නාහු වූ නම් රහතුන්ගෙන් ලොකය සිස් නො වන්නේ ය' යි කියා වදළ කාරණය බොරු වන්නේ ය'' යි කියා උභතොකොටිකප්‍රශ්නය විචාළ **මිලිඳුරජහට** ඒ කාරණා දෙක ම සැබෑ කොට වදළ කල්හි අතිප්‍රසන්න වූ මිලිඳු මහරජානෝ 'යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්නයතෙම මනා කොට ම අවබොධ කර වදරණ ලද්දේ ය. අර්ථගම්භිරය ලැහැල්ලු කරණ ලද්දේ ය. අර්ථගැටය බිඳින ලද්දේ ය. එහෙයින් ප්‍රවරගණීන්ද්‍රප්‍රධාන වූ නුඹ වහන්සේ කරා පැමිණ පරවාදීහු නෂ්ට වූහ. හග්න වූහ. නුඹ වහන්සේ විසින් නිෂ්ප්‍රභ කරණ ලද්දාහු ය'' යි කියා ස්තුති කළහ.

**ශාසනායුඃප්‍රශනය නිමි,**

Non-Commercial Distribution

# කම්මක්ඛයප්‍රශ්නය

**(147)** නැවැතත් මිලිඳුමහරජානෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගත වූ බුදුරජානන් වහන්සේ සියලු ම අකුසල් නසා සර්වඥතා-ඥනයට පැමිණ වදළසේක් ද? නොහොත් අකුසල් අවශෙෂයක් ඇති කල්හි සර්වඥතාඥනයට පැමිණ වදළසේක් දැ?'' යි විචාළෝ ය. ''මහ රජානෙනි, සියලු ම අකුසල් නසා භාග්‍යවතුන් වහන්සේ සර්වඥතාඥනයට පැමිණ වදළසේක. භාග්‍යවතුන් වහන්සේගේ ශෙෂ ව සිටි අකුශලයෙක් නැතැ'' යි කීසේක. ''කිමෙක් ද, ස්වාමීනි, තථාගතයන් වහන්සේගේ ශරීරයෙහි කිසියම් දුක්ඛවේදනාවෙක් උපන්නේත් ඇද් දැ?'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජානෙනි, රජගහනුවර දී භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයතෙම ගල්පතුරකින් වැදී ලේ පුරණ ලද්දේ ය. ලොහිත පක්ඛන්දිකා නම් ආබාධයෙක් උපන්නේ ය. ශරීරයෙහි ලේ වැඩී ව්‍යාප්ත වූ කල්හි ජීවකයන් විසින් විරෙචනය කරවන ලද්දේ ය. වාතාබාධය උපන් කල්හි උපස්ථායක තෙරුන් විසින් උෂ්ණොදකය වළඳවන ලද්දේ ය'' යි කීසේක.

''ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ සියලු ම අකුසල් නසා සර්වඥතාඥනයට පැමිණ වදළසේක් වූ නම්, ඒ කාරණයෙන් 'භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයතෙම සකලිකායෙන් වදින ලද්දේ ය. ලොහිතපක්ඛන්දිකා නම් ආබාධය උපන්නේ ය' යි කියා යම් වචනයක් කියන ලද ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේගේ ශ්‍රීපාදයතෙම ඉගිළ වැටුනු ගල් පතුරෙන් වැදෙන ලද්දේ වී නම්, ඒ ශරීරයෙහි ලොහිතපක්ඛන්දිකා ආබාධය ද උපන්නේ වී නම්, ඒ කාරණයෙන් 'තථාගතයන් වහන්සේ සියලු ම අකුසල් නසා සර්වඥතාඥනයට පැමිණ වදරණ ලද්දේ ය' යි කියන්නා වූ ඒ වචනය බොරු වන්නේ ය. ස්වාමීනි, කර්මයක් නැති ව විඳින්නා වූ දුක්ඛවේදනාවෙක් නැත්තේ ය. සියලු ම ඒ කායදුක්ඛවෙදනා විඳීම කර්මය ම මුල් කොට ඇත්තේ ය. කර්මයෙන් විඳිනු ලබන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය තෙමේත් නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් මේ ප්‍රශ්නය තෙම නිර්වාහය කට යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, සියලු ම ඒ දුක්ඛවේදනාව කර්මය මුල් කොට ඇත්තේ නො වෙයි. මහරජානෙනි, අට කාරණාවකින් දුක්ඛවේදනාවෝ උපදනාහු ය. යම් කාරණාවකින් ප්‍රචුර වූ සත්වයන් දුක්ඛවේදනාවෝ විඳිනු ලැබෙද් ද, ඒ කවර අට කාරණාවකින් ද? යත්:— මහරජානෙනි, මේ ලොකයෙහි යම් වාතසමුට්ඨාන වූත් ඇතැම් දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහ. මහරජානෙනි, පිත්තසමුට්ඨාන වූත් ඇතැම් දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහ. මහරජානෙනි, සෙම්හසමුට්ඨාන වූත් ඇතැම්

*Non-Commercial Distribution*

දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහ. මහරජාණෙනි, සන්නිපාත වූත් ඇතැම් දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහ. මහරජාණෙනි, ඍතු පෙරළීමෙනුත් ඇතැම් දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහ. මහරජාණෙනි, විසම පරිහාරජ වූත් ඇතැම් දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහ. මහරජාණෙනි, පරොපක්කමික වූත් ඇතැම් දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහ. මහරජාණෙනි, මෙලොව කර්මවිපාකජ වූත් ඇතැම් දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහ. මහරජාණෙනි, මේ යථොක්ත වූ අට කාරණාවෙන් බොහෝ වූ සත්වයන් දුක්ඛවෙදනාවෝ විඳිනු ලබති. ඒ දුක්ඛවෙදනායෙහි ලා කර්මයතෙම යම් ඒ සත්වකෙනෙකුන් මීරිකා පීළනය (148) කෙරේ ද, ඒ මේ සත්වයෝ 'කර්මය මිස අන්‍ය කාරණයක් නැතැ' යි කියා කාරණයන් ප්‍රතිබාහනය කරන්නාහු ය. ඒ මිත්‍ථ්‍යාවාදීන්ගේ ඒ වචනය බොරු වන්නේ ය'' යි කීසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් වාතිකාබාධයෙක් ඇද් ද, පිත්තිකාබාධයෙක් ඇද් ද, යම් සෙම්හිකාබාධයෙක් ඇද් ද, යම් සන්නිපාතිකාබාධයෙක් ඇද් ද, යම් උතුපරිණාමජ වූ ආබාධයෙක් ඇද් ද, යම් විසමපරිහාරජ වූ ආබාධයෙක් ඇද් ද, යම් ඔපක්කමිකාබාධයෙක් ඇද් ද, ඒ සියලු ම ආබාධයෝ කර්මසමුට්ඨානයෝ ම ය. පූර්වකර්මයෙන් ම ඒ සියලු ම ආබාධයෝ සම්භව වන්නාහු ය'' යි කීහ. ''මහරජාණෙනි, ඉදින් ඒ සියලු ම ආබාධයෝ කර්මයෙන් ම වන්නාහු වූ නම්, ඒ ආබාධයන්ගේ ලක්ෂණයෝ වනාහි කොට්ඨාස වසයෙන් නො වන්නාහු ය. මහරජාණෙනි, කිපෙන්නා වූ වාතයෝ වනාහි ශීතයෙන් ද, උෂ්ණයෙන් ද, ක්ෂුධායෙන් ද, පිපාසයෙන් ද, බොහෝ කොට කෑමෙන් ද, සිටීමෙන් ද, වීරිය වැඩීමෙන් ද, වෙගවත් ගමනින් ද, උපක්‍රමයෙන් ද, කර්මවිපාකයෙන් ද යි කියා දශප්‍රකාරයෙකින් කිපෙන්නාහ.[1] ඒ දශප්‍රකාරයන් අතුරෙන් කර්මවිපාකය හැර ශීතොෂ්ණාදී යම් නවවිධකාරණ කෙනෙක් ඇද් ද, ඒ නවවිධකාරණයෝ ඉකුත් වූ අතීතයෙහි නො උපදනාහ. අසම්ප්‍රාප්ත වූ අනාගතයෙහිත් නො උපදනාහ. මේ වර්තමාන වූ භවයෙහි ම උපදනාහු ය. එහෙයින් 'සියලු ම දුක්ඛවෙදනාවෝ කර්මයෙන් ම සම්භව වන්නාහු ය' යි කියා නො කිය යුත්තාහ.

''මහරජාණෙනි, කිපෙන්නා වූ පිත ශීතයෙන් ද, උෂ්ණයෙන් ද, විෂමභොජනයෙන් ද යි කියා ත්‍රිවිධාකාරයකින් කිපෙන්නේ ය. මහරජාණෙනි, කිපෙන්නා වූ සෙම ශීතයෙන් ද, උෂ්ණයෙන් ද, ආහාරපානයෙන් ද යන ත්‍රිවිධාකාරයෙන් කිපෙන්නේ ය. මහරජාණෙනි, යම් වාතයෙක් ඇද් ද, යම් පිතක් ඇද් ද, යම් සෙමක් ඇද් ද, ඒ ඒ කිපීම්වලින් කිපී මිශ්‍ර ව තමතමන්ගේ ස්වකීය ස්වකීය වෙදනාවට අදින්නේ ය. මහරජාණෙනි, උතුපරිණාමජ වූ වෙදනාව ඍතු පිරිනැමීමෙන් උපදනේ ය. විසමපරිහාරජ වූ වෙදනාව විෂමාහාරයෙන් උපදනේ ය. මහරජාණෙනි, ඔපක්ක-

1. කිපෙන්නේ ය

Non-Commercial Distribution

මික වූ වෙදනාව පරොපක්කමික වූ ක්‍රියාවෙන් වීමත් ඇත. පූර්වකර්ම විපාකයෙන් වීමත් ඇත. කර්මවිපාකජ වූ වෙදනාව පූර්ව කළ කර්මයෙන් ම උපදනේ ය. මහරජානෙනි, මෙසේ වනාහි කර්මවිපාකජ වූ ආබාධ ඉතා මඳ ය. අවශෙෂ වූ ආබාධ ඉතා බොහෝ ය. ඒ අනෙක ප්‍රකාර වූ ආබාධයෙහි විභාග නො දන්නා බාලයෝ 'සියලු ම ආබාධයෝ කර්මවිපාකජ ම ය' යි කියා වාතාබාධාදී සත ඉක්මවන්නාහු ය. ඒ කර්මය බුද්ධඥානය හැර සෙසු ඥානයකින් නියම කර ගන්ට නො හැකි වන්නේ ය මහරජානෙනි, යම් හෙයකින් වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයතෙම සකලිකාවෙන් වදිනා ලද්දේ වේ ද, ඒ දුක්ඛවෙදනාව වාතසමුට්ඨානය ද නො වන්නේ ය පිත්ත සමුට්ඨානය ද නො වන්නේ ය. ශ්ලේෂ්මායෙන් පැමිණියේත් නො වන්නේ ය. සන්නිපාතිකයකුත් නො වන්නේ ය. ඍතුපරිණාමජයකුත් නො වන්නේ ය විසමපරිහාරජයකුත් නො වන්නේ ය කර්මවිපාකජයකුත් නො වන්නේ ය. පරොපක්‍රමයෙන් වූ ඔපක්කමිකය ම ය.

මහරජානෙනි, **දෙවදත්තතෙම** වනාහි **සෙරිවාණිජජාතකයෙහි** පටන් බොහෝ සියදහස් ගණන් ජාතියෙහි තථාගතයන් වහන්සේ **(149)** කෙරෙහි වෛර බැඳ ආයේ ය. ඒ **දෙවදත්ත**තෙම මෙසමයෙහි ඒ වෛරයෙන් යෙදී බුදුන්ගේ නැකමත් ගුරුකමත් බුදුකමත් නො සලකා 'බුදුන් මරා බුද්ධරාජ්‍යය ගණිමි' යි සිතා නොයෙක් ව්‍යායාම කෙරෙමින් **ගිජ්ඣකූට**පර්වතය පස්සෙන් තෙමේ ම සොරා නැගී ගොස් මහත් වූ ඇත්බඳකටත් වඩා ගරුතර ගලක් යන්ත්‍ර මාරුවකින් ගෙණ ඒ ගල[1] සක්මන් කරණ ලොවුතුරා බුදුන්ගේ මස්තකයෙහි හෙළා මරමි සිතා මුදා ඇද හෙලි ය. එකල බිමින් වෙනින් මහගල් දෙකක් උස් ව අවුත් ඒ ගල තථාගතයන් වහන්සේ කරා නො පැමිණ කල්හි ම පිළිගත්තාහු ය. ඔවුන්ගේ වැදීමෙන් ගල් පතුරක් බිඳී ඉගිළ අවුත් බුදුන්ගේ ශ්‍රීපාදයෙහි වැටී ඉදුනු කෝවක්කාඵලයක් මෙන් ලේ උපදවා ලි ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේට උපන්නා වූ මේ වේදනාතොම කර්මවිපාකයෙන් නො ව අනුන්ගේ ක්‍රියාවකින් උපදනා ලද්දී ය. එයින් මත්තෙහි අනික් වේදනාවෙක් නැත්තේ ය.

''මහරජානෙනි, යම් සේ ක්ෂේත්‍රය නපුරු බැවින් හෝ බිජු නපුරු බැවින් හෝ බීජසංඛ්‍යාත වූ වී යහපත් සේ සම්භව නො වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේට මේ වේදනාතොම කර්මවිපාකයෙන් නො ව අන්‍ය වූ ක්‍රියාවෙන් උපදනා ලද්දී ය. එයින් මත්තෙහි අනික් වෙදනාවක් නැත්තේ ය. තව ද, මහරජානෙනි, යම් සේ ඇතුළුබඩ මන්දග්නි ආදීහු නපුරු බැවින් හෝ ආහාරය නපුරු බැවින් හෝ භොජනය විෂමයට යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම කර්ම විපාකයෙන් නො ව අන්‍ය වූ ක්‍රියාවෙන් භාග්‍යවතුන් වහන්සේට මේ

1. කුලාව

Non-Commercial Distribution

වෙදනාතොම උපදනා ලද්දී ය. එයින් මත්තෙහි අනික් වෙදනාවෙක් නැත්තේ ය. මහරජානෙනි, එතෙකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේට කර්මවිපාකජ වූ දුක්ඛවෙදනාවක් නැත්තේ ය. විෂමපරිහාරජ වූ වෙදනාව කුත් නැත්තේ ය. වාතසමුට්ඨානාදි අවශෙෂසමුට්ඨානා සයින් භාග්‍ය වතුන් වහන්සේට දුක්ඛවෙදනාව උපදනේ ය. ඒ දුක්ඛවෙදනායෙන් ද වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ජීවිතයෙන් තොර කරන්නට සමස්ත ලොකයෙහි කිසිවෙක්[1] නො හැක්කේ ය. මහරජානෙනි, මේ ආපොධාතු, තෙජොධාතු, වායොධාතු, පඨවිධාතු යන සතරින් උපන්නා වූ ශරීරයෙහි ඉෂ්ටශුභාශුභ වෙදනාවෝ නිපතිත වන්නාහ. මහරජානෙනි, මේ ලොක යෙහි අහස්හි දමන ලද කැටය මහාපෘථිවියෙහි වැටෙන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ කැටයතෙම පූර්ව කළ කර්මයෙන් මහාපෘථිවියෙහි වැටෙන්නේ ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, යම් හෙතුවකින් මහාපෘථිවිතොම කුසලාකුශලවිපාකය විඳින්නේ වේ ද, එබඳු වූ හෙතුවෙක් මහපොළොවෙහි නැත්තේ ය. ස්වාමීනි, වර්තමාන වූ අකර්මක හෙතුවෙන් ඒ කැටයතෙම මහාපෘථිවියෙහි වැටෙන්නේ ය'' යි කීහ. ''එසේ වී නම්, මහරජානෙනි, මහාපෘථිවිය යම් සේ ද, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ දත යුත්තේ ය. යම් සේ කැටයතෙම පූර්ව අකෘත කර්මයෙන් මහාපෘථිවියෙහි වැටන්නේ වේ ද, මහරජානෙනි, එපරිද් දෙන් ම පූර්ව අකෘතකර්මයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී පාදයෙහි සකලිකාව වැටෙන ලද්දී ය. මහරජානෙනි, මෙහි වනාහි මනුෂ්‍යයෝ මහා පෘථිවිය බිඳින්නාහු ය. සාරන්නාහු ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ මනුෂ්‍යයෝ පූර්ව කළ කර්මයෙන් **(150)** මහාපෘථිවිය බිඳින්නාහු ද? සාරන්නාහු ද'' යි විචාළසේක. ''නැත ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් ඒ සකලිකාවක් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි වැටෙන ලද්දී ද, ඒ සකලිකාතොම පූර්වයෙහි කළ කර්මයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී පාදයෙහි වැටෙන ලද නො වන්නී ය.

''මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේට යම් ලොහිතපක්ඛන්දිකාබාධයෙක් උපන්නේ වේ ද, ඒ ආබාධයතෙම පූර්ව කළ කර්මයෙකින් නො උපන්නේ ය.[2] සන්නිපාතිකයෙන් උපන්නේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේට යම්කිසි කායිකාබාධ කෙනෙක් උපදනා ලද්දාහු ද, ඒ ආබාධයෝ පෙර කර්මයකින් නො උපන්නාහ. වාතාදි මේ සමුට්ඨානයන් සදෙන අතුරෙන් එක්තරා සමුට්ඨානයකින් උපදනා ලද්දාහ. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ භාග්‍යවතුන් වහන්සේ විසින් සද්දහස්සත්සියදෙසැටසූත්‍රසමූහකෙනෙකුන් ප්‍රවරලාඤ්ජනය කොට තැබූවා වූ සංයුත්සඟියෙහි නිර්ගාථකසූත්‍රය හෙයින් වෙය්‍යාකරණ නම් වූ මොළියසීවක නම් සූත්‍රයෙහි වදරණ ලද්දේ ය.

1. කිසිවෙකුට  2. නො උපදවන්නේ ය

Non-Commercial Distribution

'**සීවක** නම් පරිබ්‍රාජකයානෙනි, මේ ලොකයෙහි පිත්තසමුට්ඨාන වූත් සමහර දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහු ය. '**සීවකයෙනි,** යම් ප්‍රකාරයකින් මේ ලොකයෙහි පිත්තසමුට්ඨාන වූ සමහර දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහු ය යි මෙම කාරණය තමා විසින් ම ත් දත යුත්තේ ය.' '**සීවකයෙනි,** යම් ප්‍රකාරයකින් මේ ලොකයෙහි පිත්තසමුට්ඨාන වූ සමහර දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහු ය' යි කියා මෙම කාරණය ලොකයා විසිනුත් සැබෑ කොට සම්මත කරණ ලද්දේ ය. **සීවකයෙනි,** ඒ දුක්ඛ වෙදනායෙහි මේ ලෝවැසි පුද්ගලතෙම යම් කිසි සැපක් හෝ දුකක් හෝ, දුක්සැප නො වන උපෙක්ෂාවක් හෝ විඳින්නේ වේ ද, ඒ සියල්ල ම පූර්වයෙහි කරණ ලද කුශලාකුශලකර්මහෙතුව ම ය යි කියා මෙබඳු දෘෂ්ටියක් ඇත්තා වූ මෙබඳු වාදයක් ඇත්තා වූ යම් ශ්‍රමණබ්‍රාහ්මණ කෙනෙක් ඇද් ද, ඒ මහණබමුණෝ යම් කාරණයක් තමන් විසිනුත් දන්නා ලද ද, ඒ කාරණාවත් දැනදැන ම ඉක්ම වන්නාහු ය. යම් කාරණයක් ලොකයෙහි සැබැව යි කියා දන්නා ලද ද, ඒ කාරණයත් ඉක්මවන්නාහු ය. එහෙයින් ඒ ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේ වචනය මිත්‍ථ්‍යා වන්නේ ය' යි කියමි. '**සීවකයෙනි,** මේ ලොකයෙහි ඇතැම් සෙම්හසමුට්ඨාන වූ දුක්ඛවෙදනා කෙනෙක් උපදනාහ. **සීවකයෙනි,** සමහර වාතසමුට්ඨාන වූත් වෙදනා කෙනෙක් උපදනාහ. **සීවකයෙනි,** සමහර සන්නිපාතික වෙදනා කෙනෙකුත් උපදනාහ. **සීවකනෙනි,** ඇතැම් ඍතුපරිණාමජ වූත් වෙදනා කෙනෙක් උපදනාහ. **සීවකයෙනි,** විසමපරිහරජ වූත් ඇතැම් වෙදනාකෙනෙක් උපදනාහ. **සීවකයෙනි,** පරොපක්කමික වූත් ඇතැම් වෙදනාකෙනෙක් උපදනාහ. **සීවකයෙනි,** මේ ලොකයෙහි කර්මාවිපාකජ වූත් ඇතැම් දුක්ඛවෙදනාකෙනෙක් උපදනාහු ය. **සීවකයෙනි,** මේ ලොකයෙහි යම් ප්‍රකාරයකින් කර්මවිපාකජ වූ ඇතැම් වෙදනාකෙනෙක් උපදින්නාහු ය'යි කියා මෙම කාරණය තමා විසිනුත් දත යුත්තේ ය. 'සීවකයෙනි, මේ ලොකයෙහි යම් ප්‍රකාරයකින් **(151)** කර්මවිපාකජ වූත් ඇතැම් වෙදනා කෙනෙක් උපදින්නාහු ය'' යි කියා මෙම කාරණය ලොකයා විසිනුත් සැබෑ කොට දන්නා ලද්දේ ය. '**සීවකයෙනි,** ඒ දුක්ඛවෙදනායෙහි මේ පුරුෂපුද්ගලතෙම යම් කිසි සැපතක් හෝ දුකක් හෝ දුක්සැප නො වන්නා වූ උපෙක්ෂාවක් හෝ විඳින්නේ වේ ද, ඒ සියල්ල ම පූර්වයෙහි කළ කුශලාකුශලහෙතුව ම ය' යි කියා මෙබඳු වූ වාදයක් ඇත්තා වූ මෙබඳු වූ දෘෂ්ටියක් ඇත්තා වූ යම් ශ්‍රමණබ්‍රාහ්මණ කෙනෙක් ඇද් ද, ඒ මහණබමුණෝ යම් වෙදනාවක් තමා විසිනුත් දන්නා ලද ද, ඒ කාරණයත් ඉක්මවීමෙන් අතිධාවනය කරන්නාහු ය. යම් දුක්ඛවෙදනාකාරණයක් ලොකයෙහිත් සත්‍යසම්මත වී ද, ඒ කාරණයත් ඉක්මවන්නාහු ය. එසේ හෙයින් ඒ මහණබමුණන්ගේ වචනය මිත්‍ථ්‍යා වන්නේ ය යි කියමි' යි මෙසේ මේ සූත්‍රය නිමවා වදළ කල්හි අතිප්‍රසන්න වූ **මොළිය සීවක** නම් සන්නාසියා 'ස්වාමීනි, ඒ දෘෂ්ටිවාදිහු කුමක් දනිද් ද? කටට ආවක් ම කියන්නාහ. ස්වාමීනි, ඔවුන්ගේ දෘෂ්ටිය හැරපීමි. මෙවක් පටන්

ලොවුතුරා බුදුන් සරණ යෙමි' යි කියා තුණුරුවන් සරණ ගියේ ය. මහරජානෙනි, මේ කාරණයෙන් ද සියලු ම දුක්ඛවෙදනාවෝ කර්මවිපාකජ නො වන්නාහ. මහරජානෙනි, කර්මක්ෂය කළා වූ භාග්‍යවතුන් වහන්සේ සියලු ම අකුශලකර්මයන් නසා සර්වඥතාඥනයට පැමිණිසේකැ යි කියා අප කී මේ කාරණය මෙපරිද්දෙන් ම සිත්හි ධරා ගණුව'' යි වදළසේක.

මෙසේ ''ඉදින් බුදුරජානන් වහන්සේ සියලු ම අකුශලකර්මයන් නසා බුදු වූ සේක් වූ නම්, 'ශ්‍රීපතුලෙහි ගල්පතුර වැදීමෙන් දුක්ඛවෙදනා උපන්නේ ය' යි කී වචනය බොරු වන්නේ ය. එපවත් සැබෑ වී නම්, 'සියලු ම අකුසල් නසා බුදු වූසේකැ' යි කියන වචනය බොරු වන්නේ ය''යි කියා මේ උභතොකොටික ප්‍රශ්නය විචාළ කල්හි ''මහරජානෙනි, සියලු ම අකුශලකර්මයන් නසා බුදු වූ කාරණයත් සැබෑ ම ය. අකර්මක වූ පරොපක්‍රමයකින් ශ්‍රීපතුලෙහි ගල්පතුර වැදීමෙන් වෙහෙස උපන් කාරණයත් සැබෑ ම ය'' යි කියා නොයෙක් කාරණායෙන් අභවා වදළ කල්හි අතිප්‍රසන්න වූ මිලිඳු මහරජානෝ ''සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ වදළ මේ කාරණය මෙ පරිද්දෙන් ම මමත් පිළිගත්තෙමි'' යි කීහ.

**කර්මක්ෂයප්‍රශ්නය නිමි.**

---

# විවෙකගුණප්‍රශ්නය

නැවතත් මිලිඳු රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේගේ යම්කිසි කට යුතු කෘත්‍යයෙක් ඇත් නම්, ඒ සියල්ල ම බොධිද්‍රැමමූලයෙහි දී ම නිෂ්ඨා කරණ ලද්දේ ය. තථාගතයන් වහන්සේට මත්තෙහි කළ මනා කට යුත්තක් හෝ කරණ ලද කර්මයාගේ පුරුදු කිරීමක් හෝ නැතැ යි කියා නුඹ වහන්සේ කියනසේක. මේ තුන් මාසයක් මුළුල්ලෙහි පාරිලෙය්‍යවනයෙහි විවෙකයෙන් වැඩහුන් කාරණයක් දක්නා ලැබෙයි. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේගේ යම් කිසි කට යුතු කෘත්‍යයෙක් ඇද් ද, ඒ සියල්ල ම බොධිමූලයෙහි දී ම **(152)** නිෂ්ඨා කරණ ලද්දේ වී නම්, තථාගතයන් වහන්සේගේ නැවත ඉතිරි කට යුත්තක් හෝ කරණ ලද කෘත්‍යයාගේ පුරුදු කිරීමක් හෝ නැත්තේ වී නම්, එහෙයින් තුන් මාසයක් විවෙක වූසේකැ' යි කියන්නා වූ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තුන්මාසයක් විවෙක වූසේක් නම්, එහෙයින් තථාගතයන් වහන්සේගේ යම්කිසි කට යුතු කෘත්‍යයෙක් ඇද්ද? ඒ සියල්ල ම බොධිමූලයෙහි දී ම නිෂ්ඨා කරණ ලද යි කියන්නා වූ ඒ වචනය හෝ බොරු වන්නේ ය සියලු ම කට යුතු කොට නිමවන ලද්ද වූ තථාගතයන් වහන්සේට නැවැත විවේක වීමක් නැත්තේ ය. කරන්ට කට යුතු ඇත්තා-හට ම විවෙකය වුව මනා වන්නේ ය. ව්‍යාධියක් ඇත්තාහට බෙහෙත්

Non-Commercial Distribution

කට යුතු වන්නේ ය. ව්‍යාධියක් නැත්තාහට බෙහෙතින් කම් කිම ද? ක්ෂුධාවෙන් පීඩිතයාහට ම භොජනයෙන් කට යුතු වන්නේ ය. ක්ෂුධාග්නියක් නැත්තාහට භොජනයෙන් කම් කිම් ද? ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, එපරිද්දෙන් ම කෘතකරණීයයාහට විවෙකවතක් නැත්තේ ය. සකරණීයයාහට ම පටිසල්ලාන නම් විවෙකය වුව මනා වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය තෙමේත් නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, තථාගතයන් වහන්සේ විසින් කට යුතු වූ යම් කිසි කෘත්‍යයෙක් ඇද් ද? ඒ සියල්ල ම බොධිමූලයෙහි දී ම නිෂ්ඨා කරණ[1] ලද්දේ ය. තථාගතයන් වහන්සේ විසින් මත්තෙහි කළ මනා කට යුත්තක් හෝ කරණ ලද කර්මයාගේ පුරුදු කිරීමක් හෝ නැත්තේ ය. එසේ වුවත් භාග්‍යවතුන් වහන්සේ තුන්මාසයක් පතිසල්ලීන ව වැඩ හුන්සේක. මහරජානෙනි, විවෙක ව සර්වඥතාඥනයට පැමිණියාහු ය. ඒ සර්වඥයෝ ඒ සුකෘතගුණය සිහි කරන්නාහු විවෙකය සේවනය කරන්නාහු ය. මහරජානෙනි, යම් සේ රජ්ජුරුවන්ගේ සමීපයෙන් ලබන ලද වරප්‍රසාද ඇත්තා වූ පුරුෂයෙක්තෙම ලබන ලද භොග ඇත්තේ ඒ සුකෘතගුණය සිහි කෙරෙමින් නැවැත නැවැතත් රජහට උපස්ථානයට එන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම සියලු ම තථාගතයන් වහන්සේලා විවේක ව සර්වඥතාඥනයට පැමිණියාහු ය. ඒ තථාගතයන් වහන්සේලා ඒ සුකෘත ගුණය සිහි කෙරෙමින් විවෙකය සෙවනය කරන්නාහු ය. තවද, මහරජානෙනි, යම් සේ රොගාතුර වූ එහෙයින් ම දුඃඛිත වූ බලවත් ගිලන්කම් ඇත්තා වූ පුරුෂයෙක්තෙම වෛද්‍යාචාර්යයකු සෙවනය කොට සුවයට පැමිණියේ සුකෘතගුණය සිහි කෙරෙමින් නැවැත නැවැතත් වෛද්‍යාචාර්යයා සෙවනය කරන්නේ ය. මහරජානෙනි, එපෙරිද්දෙන් ම සියලු ම තථාගතයෝ විවෙක වත් පුරා සර්වඥතාඥනයට පැමිණියාහු ය. ඒ සර්වඥවරයෝ ඒ සුකෘතගුණය සිහි කෙරෙමින් විවෙකය සෙවනය කරන්නාහු ය. මහරජානෙනි, යම් ගුණධර්ම කෙනෙකුන් දක්නා වූ තථාගතයෝ විවෙකය සෙවනය කෙරෙද්ද, ඒ මේ විවෙකගුණයෝ වනාහි විසිඅටවැදෑරුම් වන්නාහ.

**''කතමෙ අට්ඨවීසති? ඉධ මහාරාජ, පටිසල්ලානං පටිසල්ලීය මානං රක්ඛති. ආයුං වඩ්ඪෙති. බලං දෙති. වජ්ජං පිදහති. අයසමපනෙති. (153) යසමුපනෙති. අරතිං විනොදෙති. රතිමුපදහති. භයමපනෙති. වෙසාරජ්ජං කරොති. කොසජ්ජමපනෙති. වීරියමභිජනෙති. රාගමපනෙති. දොසමපනෙති. මොහමපනෙති. මානං නිහන්ති. විතක්කං භඤ්ජති. චිත්තං එකග්ගං කරොති. මානසං සෙනහයති. හාසං ජනෙති. ගරුකං කරොති. ලාභමුප්පාදයති. නමස්සියං**

1. නිෂ්ඨාවන

**කරොති. පීතිං පාපෙති. පාමොජ්ජං කරොති. සඞ්ඛාරානං සභාවං දස්සයති. භවපටිසන්ධිං උග්ඝාටෙති. සබ්බසාමඤ්ඤං දෙති. ඉමෙ ඛො මහාරාජ, අට්ඨවීසති පටිසල්ලාන ගුණා, යෙ ගුණෙ සමනුපස්සන්තා තථාගතා පටිසල්ලානං සෙවන්ති".**

"ඒ විසිඅටගුණය කවරේ ද? යත්:— මහරජානෙනි, මේ ශාසනයෙහි විවෙකයතෙම විවෙක වඩන්නවුන් රක්ෂා කරන්නේ ය. ආයු වඩන්නේ ය. ශරීරබලය දෙන්නේ ය. වරද වසන්නේ ය. අයස දුරු කරන්නේ ය. යසස ලං කරන්නේ ය. ශාසනයෙහි අරතිය දුරු කරන්නේ ය. ශාසනආලයෙහි පිහිටුවන්නේ ය. භය දුරු කරන්නේ ය. විශාරද කරන්නේ ය. කුසීතබව පහ කරන්නේ ය. වීර්ය උපදවන්නේ ය. රාගය පහ කරන්නේ ය. ද්වේෂය පහ කරන්නේ ය. මොහය පහ කරන්නේ ය. මානය නසන්නේ ය. විතර්කය මර්දනය කරන්නේ ය. සිත එකඟ කරන්නේ ය. මානස පිණවන්නේ ය. සතුටු උපදවන්නේ ය. ලොකයාහට මහත් කරන්නේ ය. ලාභය උපදවන්නේ ය. ලොකයාගේ නමස්කාරය කරවන්නේ ය. චිත්තප්‍රීතියට පමුණුවන්නේ ය. ප්‍රමොද්‍යය කරන්නේ ය. සංස්කාරයන්ගේ අනිත්‍ය ස්වභාවය දක්වන්නේ ය. සර්වභව ප්‍රතිසන්ධිය නසන්නේ ය. සියලු ම ශ්‍රාමණ්‍යගුණය ගෙණ දෙන්නේ ය. මහරජානෙනි, තථාගතයෝ යම් ගුණධර්ම කෙනෙකුන් දකිමින් විවෙකය සේවනය කෙරෙද් ද, ඒ මේ විවෙකගුණයෝ විසිඅටවැදෑරුම් වන්නාහ. මහරජානෙනි, එතෙකුදු වුවත් නිර්වාණසැපය හා සමාපත්තිරතිය අනුභව කරණු කැමැත්තා වූ තථාගතයන් වහන්සේලා විවෙකගුණය සේවනය කරන්නාහු ය. මහරජානෙනි, නිමවන ලද චිත්තසංකල්පනා ඇත්තා වූ තථාගතයන් වහන්සේලා සතරකාරණයකින් විවෙකය සේවනය කරන්නාහු ය. කවර සතර කාරණයකින් ද? යත්:— මහරජානෙනි. තථාගතයෝ විහාරඵාසුව පිණිසත් විවෙකය සේවනය කරන්නාහ, නිරවද්‍යගුණබහුලතාව පිණිසත් තථාගතයෝ විවෙකය සේවනය කරන්නාහු ය. සියලු ආර්යවීථි හෙයිනුත් තථාගතයන් වහන්සේලා විවෙකය සේවනය කරන්නාහු ය. සියලු ම අනන්තබුද්ධරවයන් විසින් ස්තුති ප්‍රශංසා වර්ණිත ප්‍රශස්ත කරණ ලද හෙයිනුත් තථාගතයන් වහන්සේලා විවෙකය සේවනය කරන්නාහු ය. මහරජානෙනි, මේ සතර කාරණයෙන් තථාගතයෝ විවෙකය සේවනය කරන්නාහු ය. මහරජානෙනි, මෙසේ වනාහි තථාගතයෝ විවෙකය සේවනය කරන්නාහ. කට යුතු ඇති බැවින් සෙවනය කරන්නේත් නො වෙයි. කරණ ලද කට යුතු පුරුදු කරණ පිණිස සේවනය කරන්නේත් නො වෙයි. එසේ වුවත් ගුණ විශෙෂය දක්නා බැවින් තථාගතයන් වහන්සේලා පතිසල්ලාන නම් විවෙකගුණය සේවනය කර වදරණසේක්ලා ය" යි කීසේක.

**(154)** මෙසේ ඉදින් බුදුරජානන් වහන්සේ බෝමුල දී ම සියලු ම කට යුතු නිමවා වදාළ බව සැබෑ වී නම්, 'තුන් මාසයක් විවේකවත් පිරූසේකැ' යි කී වචනය බොරු වන්නේ ය. ඒ බව සැබෑ වී නම්, 'බෝමුල දී ම සියලු ම කට යුතු නිමවා වදාළසේකැ' යි කී වචනය බොරු වන්නේ ය යි කියා උභතොකොටික ප්‍රශ්නය විචාළ රජහට ඒ කාරණා දෙක ම සැබෑ කොට වදාළ කල්හි අතිප්‍රසන්න වූ මිලිඳු මහරජානෝ ''සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ වදාළ මේ කාරණය එපරිද්දෙන් ම 'මමත් පිළිගන්නෙමි'' යි කීහ.

**විවේකගුණප්‍රශ්නය නිමි.**

---

# ත්‍රිමාසායුඃ පරිච්ඡෙදප්‍රශ්නය

නැවැතත් මිලිඳුමහරජානෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹගේ භාග්‍යවතුන් වහන්සේ විසින් **පරිනිර්වාණසූත්‍රයෙහි 'ආනන්දයෙනි,** තථාගතයන් විසින් සතරසෘද්ධිපාදයෝ සිත්හි ලා වඩන ලද්දහු ය. නැවත නැවතත් බහුලීකෘත කරණ ලද්දහු ය. යොදන ලද යානාවක් මෙන් පුරුදු කරණ ලද්දහු ය. ප්‍රතිෂ්ඨාධාර වූ ගෘහවාස්තුවක් මෙන් කරණ ලද්දහු ය. නැවත නැවතත් උපදවන ලද්දහු ය. යහපත් කොට පුරුදු කරණ ලද්දහු ය. මනා කොට ම පටන් ගන්නා ලද්දහු ය. ආනන්දයෙනි, තථාගතතෙමේ කැමැත්තේ වී නම් කල්පයක් හෝ කපින් අර්ධයක් හෝ සිටින්නේ ය' යි කියා මෙම කාරණය වදාරණ ලද්දේ ය. නැවත ද එම සූත්‍රයෙහි දී ම **මාර දිව්‍යපුත්‍රයාහට** 'එම්බල මාරය, තෝ තථාගතයානන්ගේ පිරිනිවන් පෑමට උත්සාහ නො කරව. තථාගතයෝ වූ කලී 'මෙයින් තුන් මාසයක්හුගේ ඇවෑමෙන් පිරිනිවන් පාන්නාහ' යි කියාත් වදාරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'ආනන්දයෙනි, තථාගතයන් විසින් වනාහි සතරසෘද්ධිපාදයෝ භාවිත බහුලීකෘත වශයෙන් පුරුදු කරණ ලද්දහු ය. **ආනන්දයෙනි,** 'තථාගතතෙමේ කැමැත්තේ වී නම් කල්පයක් හෝ කපින් අර්ධයක් හෝ සිටින්නේ ය' යි කියා වදාළ වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් තුන් මාසපරිච්ඡෙදය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් 'මෙයින් තුන් මාසයක්හුගේ ඇවෑමෙන් තථාගතතෙමේ පිරිනිවන් පාන්නේ ය' යි කියා වදාරණ ලද වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'ආනන්දයෙනි, තථාගතයන් විසින් සතර සෘද්ධිපාදයෝ භාවිත බහුලීකෘත කරණ ලද්දහු ය. ආනන්දයෙනි, 'තථාගතතෙමේ කැමැත්තේ වී නම් කපක් හෝ කපින් අර්ධයක් හෝ සිටින්නේ ය' යි කියා වදාළ වචනය බොරු වන්නේ ය. තථාගතයන් වහන්සේලාගේ අකාරණයෙහි ගර්ජනාවෙක් නැත්තේ ය. භාග්‍යවත් වූ බුදුවරයෝ නො සිස්වචන ඇත්තාහ. සත්‍යවචන ඇත්තාහ, දෙබස් නො වන වචන ඇත්තාහු ය. මේ උභතොකොටිකප්‍රශ්නය

Non-Commercial Distribution

තෙමේත් අතිගම්භීර වන්නේ ය. අතිසියුම් වන්නේ ය. නො සිතිය හැක්කේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ දෘෂ්ටිසමූහය බිඳ හැර වදළ මැනැව. එකාන්තයෙන් නියම කොට තබා වදළ මැනැව. පරවාදයන් බිඳහැර වදළ මැනැවැ'' යි කීහ.

**(155)** ''මහරජානෙනි, සුගත තථාගත වූ භාග්‍යවතුන් වහන්සේ විසින් 'ආනන්දයෙනි, සිතූ පැතූ තාක් සකලසමෘද්ධීන් සිද්ධ කරණ හෙයින් ඍද්ධි නම් වූ ඡන්දිද්ධිය වීරියිද්ධිය, චිත්තිද්ධිය, විමංසිද්ධිය යන සතරඍද්ධිපාදධර්මයෝ තථාගතයන් විසින් භාවිත කරණ ලද්දහු ය. බහුලීකෘත කරණ ලද්දහු ය. නැඟී යන්ට සැදූ යානාවක් මෙන් කරණ ලද්දහු ය. සර්වොපද්‍රවදෙෂ පහ කළ ගෘහවාස්තුවක් මෙන් කරණ ලද්දහු ය. අනු ව ම සිටින ලද්දහු ය. පුරුදු කරණ ලද්දහු ය. මනා කොට පටන් ගන්නා ලද්දහු ය. **ආනන්දයෙනි,** තථාගතතෙම කැමැත්තේ වී නම් කල්පයක් හෝ කපින් අර්ධයක් හෝ සිටින්නේ ය' යි කියා මෙම කාරණයත් වදරණ ලද්දේ ය. **'නිවන්පුර යෙමි'** යි කියා තුන්මාස පරිච්-ඡෙදයත් වදරණ ලද්දේ ය. ඒ වදළ කල්පය වනාහි තමන් වහන්සේගේ මනුෂ්‍යායුෂ්කල්පය වන්නේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ තථාගතබලය කීර්තනය කෙරෙමින් මෙසේ නො වදළසේක. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ ඍද්ධිබලය දක්වා වදරමින් 'ආනන්දයෙනි, තථාගතයන් විසින් සතරඍද්ධිපාදයෝ භාවිත කරණ ලද්දහු ය. (යනාදීන්) කපින් අර්ධයක් හෝ සිටින්නේ ය' යි කියා මෙසේ වදරණ ලද්දේ ය. මහරජානෙනි, යම් සේ රජ්ජුරුවන්ගේ ශීඝ්‍ර ගමන් ඇත්තා වූ වාතයට බඳු වූ ජව ඇති ආජානීයඅශ්වයෙක් ඇති වන්නේ වී නම්, රජ්ජුරුවෝ ඒ අශ්වයාගේ ජවබලය කියමින් නිගමග්‍රාමිකජනපද යොධභට බලප්‍රධානික බ්‍රාහ්මණ ගෘහපතික අමාත්‍යජනමධ්‍යයෙහි 'පින්වත්නි, මාගේ මේ උ ම් අශ්වතෙම කැමැත්තේ වී නම්, සමුද්‍රජලය කෙළවර කොට සියලු පෘථිවියෙහි හැසිර ඇසිල්ලෙකින් ම මෙහි එන්නේ ය' යි කියා මෙසේ කියන්නේ වී නම්, ඒ ශීඝ්‍ර වූ ජවගතිය ඒ පිරිසට නො ම දක්වන්නේ ය, ඒ අශ්වයාගේ ද ශීඝ්‍ර වූ ජවය ඇත්තේ ය. ඒ අශ්වතෙම ක්ෂණමාත්‍රයෙකින් ම සමුද්‍රජලය පර්යන්ත කොට පෘථිවි-යෙහි හැසිරෙන්නට සමර්ථ ද වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ ඍද්ධිබලය දක්වා වදරමින් මෙසේ වදළසේක. ඒ වදළ වචනයත් ත්‍රිවිද්‍යාධර වූ ෂඩභිඥධර වූ මහ රහතන් වහන්සේලාගේ ද නිර්මල ක්ෂීණාශ්‍රව වූ මහාසංඝයා වහන්සේගේ ද දිව්‍යබ්‍රහ්මමනුෂ්‍යයන්ගේ ද මධ්‍යයෙහි වැඩහිඳ,

**තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකථා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා ආකංඛමානො සො ආනන්ද, තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා.]**

යන මේ තෙපුල වදරණ ලද්දේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේගේ එබඳු වූ ඍද්ධිබලයක් ඇත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ ඍද්ධිබලයෙන් කල්පයක් හෝ කපින් අර්ධයක් හෝ වැඩ සිටින්ට සමර්ථ වනසේක. භාග්‍යවතුන් වහන්සේ ඒ ඍද්ධිබලය ඒ සතරාමර පිරිසට නො දක්කුසේක. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ සියලු ම භවයන් ගෙන් ප්‍රයෝජන නො කැමැතිසේක. තථාගතයන් වහන්සේ විසින් සියලු ම භවයෝ නින්ද කොට හරණ ලද්දහු ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙම කාරණය වදරණ ලද්දේය:—[1]

> **'සෙය්‍යථාපි භික්ඛවෙ අප්පමත්තකො'පි ගූථො දුග්ගන්ධො හොති, එවමෙව ඛො අහං භික්ඛවේ අප්පමත්තකම්පි භව න වණ්ණෙමි, අන්තමසො අච්ඡරාසංඝාතමත්තම්පි.'**

(156) යනුවෙන් ''මහරජානෙනි, යම් සේ අල්පමාත්‍ර වූත් ගූථය දුර්ගන්ධ වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම 'මම වනාහි යටත් පිරිසෙයින් අසුරුසනක් පමණවත් මඳකුත් භවය වර්ණනා නො කරමි' යි කියා වදාළසේක. කිමෙක් ද? මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ සියලු ම භව ගති චතුර්විධ සත්වයොනි අසුචි සම ව දක සෘද්ධිබලය පිණිස භවයෙහි ඡන්දරාගය කර වදරණ සේක් දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' කීහ. ''මහරජානෙනි, ඒ කාරණයෙන් සතරාමර ලොකස්වාමී වූ අප භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියගේ බලය කීර්තනය කර වදරමින් මෙබඳු අසදෘශ වූ සර්වඥසිංහනාදය කර වදාළසේක. මෙසේ 'ඉදින් ආනන්දය, තථාගතතෙමේ කැමැති නම් කල්පයක් හෝ කපින් අර්ධයක් හෝ සිටින්නේ ය' යි වදාළ වචනය සැබෑ වී නම්, 'තුන් මාසයකින් නිවන්පුර යෙමි' යි වදාළ වචනය බොරු වන්නේ ය. ඒ වචනය සැබෑ වී නම්, 'කල්පයක් හෝ කපින් අර්ධයක් හෝ සිටින්නේ ය' යි වදාළ වචනය බොරු වන්නේ ය'' යි කියා මේ උභතොකොටිකප්‍රශ්නය විචාළ කල ඒ කාරණා දෙක ම සැබෑ කොට සර්වඥ අභිප්‍රාය අභවා වදාළ කල්හි රජ්ජුරුවෝ අතිප්‍රසන්න ව ''සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹවහන්සේ වදාළ මේ කාරණය 'මමත් එසේ ම පිළිගත්තෙමි''යි කියා ස්තොත්‍ර කළහ.

**ත්‍රිමාසායුඃ පරිච්ඡේද ප්‍රශ්නය නිමි.**

---

**පරමබෞද්ධාගමධාරී සත්පුරුෂජනයන් හා මිථ්‍යාදෘෂ්ටීන්ගේ මෙණ්ඩකයුද්ධයක් මෙන් බලවත් වූ වාදයෙන් යුක්ත බැවින් මෙණ්ඩකප්‍රශ්න නම් වූ ශ්‍රී සද්ධර්ම-දසයෙහි ප්‍රථමවර්ගය නිමියේ ය.**

1. වදරණලද්දේ ය

*Non-Commercial Distribution*

# සිකඛංසමූහනන ප්‍රශ්නය.

නැවතත් **මිලිඳුමහරජානෝ** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මම සියල්ල දැන ම ධර්මදෙශනා කෙරෙමි, නො දැන දෙශනා නො කෙරෙමි' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. නැවත ද විනයප්‍රඥප්තියෙහි **'ආනන්දයෙනි,** සංඝතෙමේ කැමැත්තේ වී නම්, මාගේ ඇවෑමෙන් ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපදයන් සමූහනනය කෙරේව' යි කියා මෙසේ වදරණ ලද්දේ ය. කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපද නපුරු කොට පණවන ලද්දහු ද? නොහොත් අකාරණයෙහි නො දැන පණවා වදරණ ලද්දහු ද? භාග්‍යවතුන් වහන්සේ යම් කාරණයකින් තමන් වහන්සේ ඇවෑමෙන් ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපදයන් උද්ධරණය කරවා වදරණසේක. එහෙයින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් 'අභිඤ්ඤායාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි නො අනභිඤ්ඤාය' කියා මේ පාලිය වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'ආකංඛමානො ආනන්ද, සංඝො මමච්චයෙන ඛුද්දනු ඛුද්දකානි සික්ඛාපදනි සමූහන්තු' ය යි කියා යම් වදළ **(157)** වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් විනයප්‍රඥප්තියෙහි ලා 'ආනන්දයෙනි, සංඝතෙමේ කැමැත්තේ වී නම්, මාගේ ඇවෑමෙන් ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂා පදයන් නො රැක හරිව' යි කියා වදරණ ලද්දේ සැබෑ වී නම්, ඒ කාරණ යෙන් 'මහණෙනි, මම දැනදැන ම ධර්මය දෙශනා කෙරෙමි. නො දැන ධර්මය දෙශනා නො කෙරෙමි'යි කියා වදළ ඒ වචනය බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නයතෙම ඉතා සියුම් වන්නේ ය. අති සූක්ෂ්ම වන්නේ ය. ගම්භීර වන්නේ ය. අතිගම්භීර වන්නේ ය. සිතින් සිතාලිය නො හැක්කේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයෙහි ලා නුඹ වහන්සේගේ ප්‍රඥාබලවිස්තාරය දක්වා වදළ මැනවැ'' යි කීහ.

''මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මම සියල්ල දැන ගෙණ ම බණ කියමි. නො දැන නො කියමි' යි කියා මෙම වචනයත් වදරණ ලද්දේ ය. නැවැත විනයප්‍රඥප්තියෙහිත් 'ආනන්දයෙනි, සංඝතෙමේ කැමැත්තේ වී නම්, මාගේ ඇවෑමෙන් ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපද උගුළුවා හරිව' යි කියාත් මෙසේ වදරණ ලද්දේ ම ය. මහරජා නෙනි, ඒ වචනය වනාහි තථාගතයන් වහන්සේ 'මා විසින් එපා කරවනු ලබන්නා වූ මාගේ ශ්‍රාවකයෝ මා ඇවෑමෙන් ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපදයන් හරිද්දෝ හෝ? නොහොත් ගණිද්දෝ හො?' යි කියා භික්ෂූන් පරීක්ෂාකර වදරමින් වදළසේක. මහරජානෙනි, යම් සේ චක්‍රවර්ති මහරජානෝ තමන්ගේ පුත්‍රයන්ට මෙසේ කියන්නාහ:—

'දරුවෙනි, මේ වනාහි මුළු මහත් දඹදිව මහජනපදය සියලු දිසාවෙන් මහාසාගරය කෙළවර කොට ඇත්තේ ය. දරුවෙනි, එපමණ වූ බලයකින් දරන්නට දුෂ්කර වන්නේ ය. එහෙයින් දරුවෙනි, මැත අව මැනව. තෙපි මාගේ ඇවෑමෙන් අතිදූරස්ථ වූ ප්‍රත්‍යන්තමහාදෙශයන් හරුව' යි කීහු වූ නම්, කිමෙක් ද, මහරජාණෙනි, ඒ රාජකුමාරවරු පියරජ්ජුරුවන් ඇවෑමෙන් සියලු ජනපදයන් තමන්ගේ හස්තප්‍රාප්ත වූ කල්හි ඒ සියලු ප්‍රත්‍යන්තදෙශයන් හරින්නාහු දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, රජදරුවෝ ලුද්ධතරයෝ ය. රාජකුමාරයෝ රාජ්‍යලොභයෙන් ඊට වැඩියක් ජනපද ද්විගුණත්‍රිගුණයක් කඩා ගන්නාහු ය. කිමෙක් ද, ඒ කුමාරයෝ හස්තප්‍රාප්ත වූ ජනපද හරිද් ද?[1] මහරජාණෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ භික්ෂූන් පරීක්ෂාකර වදරමින් 'ආනන්දයෙනි, සංඝතෙමේ කැමැත්තේ වී නම්, මාගේ ඇවෑමෙන් ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂා පදයන් උගුළුවා හරීව' යි කියා මෙසේ වදාළසේක.

''මහරජාණෙනි, සියලු ම සංසාරදුඃඛයෙන් මිදීම පිණිස සර්වඥ පුත්‍රයන් වහන්සේලා ධර්මලොභයෙන් අනිකුත් ඉතිරි ශික්ෂාපද එසිය පණසක් රක්ෂා කළාහු ය. කිමෙක් ද, වනාහි ප්‍රකෘතියෙන් ම පණවා වදාළ ශික්ෂාපද හරිණසේක්ලා දැ?'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපද ය යි කියා යමක් වදාළසේක් ද, මේ වදාළ වචනයෙහි මේ ලෝවැසිතෙම මුළා වූයේ ය. කාංක්ෂා ඉපිද බලවත් වශයෙන් කාංක්ෂාවට පැමිණියේ ය. ඒ ක්ෂුද්‍රශික්ෂාපද කවරේ ද? අනුක්ෂුද්‍ර වූ ශික්ෂාපද කවරේ දැ?'' යි කීහ. ''මහරජාණෙනි, දුෂ්කටය කුඩා ශික්ෂාපදය, දුර්භාෂිතය අනුක්ෂුද්‍රශික්ෂා පදය. මේ **(158)** ශික්ෂාපද දෙක ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපදයෝ වන්නාහ. මහරජාණෙනි, ධර්මසංගායනා කළ **මහාකාශ්‍යපස්ථවිරාදී** වූ පූර්වමහාථෙර සාමීන් වහන්සේලා විසිනුත් මෙහි කාංක්ෂා උපදවන ලද්දේ ය.[2] උන් වහන්සේලා විසිනුත් සද්ධර්මස්ථිතිය පිණිස කළ සංගීතියෙහි දීත් එකක් කොට නින්දු නො කරණ ලද්දේ ය. කාලත්‍රයවර්ති වූ සියල්ල දත් භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ප්‍රශ්නයතෙම අනාගත කාලයෙහි වැටහෙන ආකාරය දැක වදරණ ලද්දේ ය'' යි කීසේක. ''සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සර්වඥයන් වහන්සේ, නුඹ වහන්සේ දැක වදාළසේක. බොහෝ කාලයක් සැඟවී තිබූ සර්වඥරහස අද දැන් ලොකයෙහි විවෘත කොට ප්‍රකාශ කර වදරණ ලද්දේ ය'' යි කියා ස්තුති කළහ.

**ශික්ෂාසමූහනන ප්‍රශ්නය නිමි.**

---

1. හරිද්දයි කීහ  2. ලද්දාහු ය

*Non-Commercial Distribution*

# ආචාර්‍යමුෂ්ටිප්‍රශ්නය

නැවතත් මිලිඳු මහරජානෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'ආනන්දය, තථාගතයාණන්ගේ ධර්මයෙහි ආචාර්යමුෂ්ටියෙක් නැත්තේ ය' යි කියා මේ වචනය වදරණ ලද්දේ ය. නැවැත ද මධ්‍යමනිකායවරයෙහි වූ මාලුංක්‍යොවාද සූත්‍රයෙහි මාලුංක්‍යපුත්‍ර නම් තෙරුන් වහන්සේ විසින් 'ස්වාමීන් වහන්ස, ලොකයතෙම ශාශ්වත ද? අශාශ්වත ද?' යනාදීන් දෘෂ්ටිගතිකවශයෙන් ප්‍රශ්න විචාරණ ලද්ද වූ භාග්‍යවතුන් වහන්සේ ඒ දෘෂ්ටි ප්‍රකාශ කොට නො වදළසේක. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ප්‍රශ්නය වනාහි අන්තදෙකක් ඇත්තේ ය. නො දනීමෙන් හෝ සැහවීමෙන් හෝ ඒකාන්තනිශ්‍රිත වන්නේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'ආනන්දයෙනි, තථාගතයානන්ගේ ධර්මයෙහි ආචාර්යමුෂ්ටි නම් ගුරු අඩක්කමෙක් නැතැ' යි කියා වදරණ ලද්දේ සැබෑ වී නම්, එහෙයින් මාලුංක්‍යපුත්‍ර නම් තෙරුන් වහන්සේට නො දන්මෙන් ප්‍රකාශ නො කරණ ලද්දේ ය. ඉදින් දනීමෙන් ප්‍රකාශ නො කරණ ලද්දේ වී නම්, එහෙයින් 'ආනන්දයෙනි, තථාගතයානන්ගේ ධර්මයෙහි ආචාර්යමුෂ්ටියෙක් නැතැ'යි කියා වදළ වචනය බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය තෙමේත් නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුතු ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'ආනන්දයෙනි, තථාගතයන් වහන්සේගේ සද්ධර්මයෙහි ආචාර්යමුෂ්ටියෙක් නැතැ' යි කියා මේ වචනයත් වදරණ ලද්දේ ම ය. මාලුංක්‍යපුත්‍රතෙරුන් වහන්සේ විසින් විචාරණ ලද ප්‍රශ්නයත් නො වදරණ ලද්දේ ය. එසේ නො වදළ බව ද නො දනීමෙනුත් නො වන්නේ ය. ගුය්හකරණයෙනුත් නො වන්නේ ය. මහරජානෙනි, ප්‍රශ්න ව්‍යාකරණයෝ මේ සතරෙක— කවර සතරෙක් ද? ඒකංසව්‍යාකරණීයප්‍රශ්නයෙක. විභජ්ජව්‍යාකරණීය ප්‍රශ්නයෙක. පටිපුච්ඡාව්‍යාකරණීය ප්‍රශ්නයෙක. ඨපනීයප්‍රශ්නයෙක.

''මහරජානෙනි, ඒකංසව්‍යාකරණීය වූ ප්‍රශ්නය කවරේ ද? යත්:— 'රූපය අනිත්‍යය' යි යනු ඒකංසව්‍යාකරණීය ප්‍රශ්නයෙක. 'වෙදනාව අනිත්‍යය' යි යනු ද, 'සංඥාව අනිත්‍යය' යි ද, 'සංස්කාරය අනිත්‍යය' යි යනු ද, 'විඥානය **(159)** අනිත්‍යය' යි යනු ද, ඒකංසව්‍යාකරණීයප්‍රශ්නයෙක. මේ ඒකංසව්‍යාකරණීයප්‍රශ්නය නම් වන්නේ ය.

''විභජ්ජව්‍යාකරණීය වූ ප්‍රශ්නය කවරේ ද? යත්—'රූපය වනාහි අනිත්‍යය දැ?' යි විචාරීම විභජ්ජව්‍යාකරණීයප්‍රශ්නයෙක. 'වෙදනාව වනාහි අනිත්‍යය දැ?' යි විචාරීම ද, 'සංඥාව වනාහි අනිත්‍යය දැ?' යි විචාරීම ද,



*Non-Commercial Distribution*

'සංස්කාරය අනිත්‍යය ද?' යි විචාරීම ද, 'විඥනය අනිත්‍යය ද?' යි විචාරීම ද, විභජ්ජව්‍යාකරණීය වූ ප්‍රශ්නයෙක. මේ විභජ්ජව්‍යාකරණීය වූ ප්‍රශ්නය වන්නේ ය.

'පටිපුච්ඡාව්‍යාකරණීය වූ ප්‍රශ්නය කවරේ ද?— 'කිමෙක්ද, ඇසින් සියල්ල ම දැන ගන්නේ ද?' යි විචාරීමෙක් ඇද් ද, මේ පටිපුච්ඡාව්‍යාකරණීය වූ ප්‍රශ්නය නම් වන්නේ ය.

''ඨපනීය වූ ප්‍රශ්නයතෙම කවරේ ද? යත්— 'ලොකය නිත්‍යය' යි කියා ශාශ්වතදෘෂ්ටි වශයෙන් විචාරීමත් ඨපනීය වූ ප්‍රශ්නයෙක. 'ලොකය තෙම අනිත්‍යය, මරණින් මත්තෙහි නැතැ' යි කියා උච්ඡෙදදෘෂ්ටි වශයෙන් විචාරීමත්, ඨපනීයප්‍රශ්නයෙක. කසිණාලොකයෙන් චක්‍රවාටය පර්‍ය්‍යන්ත කොට දැක 'ලොකය අන්තය' යි කියා ගන්නා වූ අන්තවාදදෘෂ්ටි වශයෙන් ප්‍රශ්න විචාරීමත් ඨපනීය වූ ප්‍රශ්නයෙක. 'කසිණාලොකයෙන් චක්‍රවාටය පරියන්ත කොට බොහෝ සක්වළවල් දැක ලොකය අනන්තය'යි කියා ගන්නාවූ අනන්තවාදදෘෂ්ටිවශයෙන් ප්‍රශ්න විචාරීමත් ඨපනීය ප්‍රශ්නයෙක. 'මේ ලොකය උඩින් යටින් කෙළවර ඇත. සරස අනන්ත ය' යි කියා දැක ගන්නා වූ අන්තානන්තවාදදෘෂ්ටිවශයෙන් ප්‍රශ්න විචාරීමත් ඨපනීය ප්‍රශ්නයෙක. 'මේ සත්වලොකය නොම අනන්ත ය. අනන්තත් නො වේ'යි කියා විතර්ක සිතීමෙන් වැටහුනු පමණකට ගන්නා වූ නෙවන්තනානන්තවාද වශයෙන් ප්‍රශ්න විචාරීමත් ඨපනීය ප්‍රශ්නයෙක. 'තං ජීවං තං සරීරං' යනුවෙන් 'ඒ ජීවිතය ම ඒ ශරීරය' යි කියා උච්ඡෙදදෘෂ්ටිවාදයෙන් ප්‍රශ්න විචාරීමත් ඨපනීය ප්‍රශ්නයෙක: 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං' යනුවෙන් 'ජීවිතය අනිකෙක. ශරීරය අනිකෙකැ'යි කියා ශාශ්වතවාදයෙන් ප්‍රශ්න විචාරීමත් ඨපනීයප්‍රශ්නයෙක. 'සත්වතෙම මරණින් මත්තෙහි වන්නේ ය' යි කියා හෝ, 'සත්වතෙම මරණින් මත්තෙහි නො වන්නේ ය' යි කියා හෝ 'සත්වතෙම මරණින් මත්තෙහි වන්නේත් ඇත. නො වන්නේත් ඇතැ' යි කියා හෝ 'සත්වතෙම මරණින් මත්තෙහි නො වන්නේ ය' යි කියා ද 'නො වන්නේ නො වේ' යි කියාද මෙසේ අමරාවික්ෂෙපිකදෘෂ්ටි වශයෙන් ප්‍රශ්න විචාරීමත් ඨපනීයප්‍රශ්නයෙක. මේ නො කියා හැකිය යුතු ප්‍රශ්නය නම් වන්නේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ මාලුංක්‍යපුත්‍ර නම් තෙරුන් වහන්සේට ඒ හැකිය යුතු ප්‍රශ්නය ප්‍රකාශ කොට නො වදළසේක. ප්‍රශ්නයතෙම කවර කාරණය කින් ඨපනීය විද? යත්– ඒ ප්‍රශ්නයාගේ දැක්වීමෙන් සසර දුක් නසන නිවන් පිණිස හෙතුයෙක් හෝ කාරණයෙක් හෝ නො ම ඇත්තේ ය. එහෙයින් ඒ ප්‍රශ්නය ඨපනීය වී ය. භාග්‍යවත් වූ අනන්ත බුදුවරයන් වහන්සේලාගේ අකාරණ වූ අහෙතුක වූ වචන කීමෙක් නැතැ'' යි කීසේක. ''සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තුඹ වහන්සේ වදළ මේ කාරණය එපරිද්දෙන් ම පිළිගත්තෙමි'' යි කීහ.

**ආචාර්යමුෂ්ටිප්‍රශ්නය නිමි.**

*Non-Commercial Distribution*

# මරණභයප්‍රශ්නය.

(160) නැවතත් මිලිඳුමහරජානෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**''සබෙබ තසනති දණඩසස–සබෙබ භායනති මච්චුනො,**
**අතතානං උපමං කතවා–න හනෙය්‍ය න ඝාතයෙ.''**

යන මේ ගාථාව වදරණ ලද්දේ ය. නැවත 'රහත්හු සියලු භය අතික්‍රාන්ත කළාහු ය' යි කියාත් වදරණ ලද්දේ ය. කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, රහතන් වහන්සේලා වධදණ්ඩ භයින් භය නො වන සේක් ලා ද? නරකයෙහි පවා ගිනි ගෙණ දිලියෙන්නා වූ සකලශරීරය හුණු වූ එසෙයින් ම රත් වූ විශෙෂයෙන් ම රත් වූ නිරිසත්වයෝ ගිනි ගෙණ දිලියෙන මහගිනි දැලින් යුක්ත වූ ඒ මහානරකයෙන් චුත වෙමින් මරණයට භය වන්නාහු ද? ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් 'සියලු සත්වයෝ ම වධදණ්ඩනයට තැති ගන්නාහු ය. සියලු සත්වයෝ ම මරණයට තැති ගන්නාහු ය. තමන් උපමා කොට ගෙණ අනුන්ට හිංසා නො කරන්නේ ය. අනුන් නො නසන්නේ ය' යි කියා වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'රහත්හු සියලු භය අතික්‍රාන්ත කළාහු ය' යි කියා යම් වචනයක් වදරණ ලද ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් 'රහත්හු සියලු ම භය අතික්‍රාන්ත කළාහු ය'යි කියා වදරණ ලද කාරණය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'සබ්බේ තසන්ති දණ්ඩස්ස සබ්බේ භායන්ති මච්චුනො' යනාදීන් වදළ වචනය බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නයත් නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය''යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'සබ්බේ තසන්ති දණ්ඩස්ස සබ්බේ භායන්ති මච්චුනො' යනාදි මේ වචනය රහතන් වහන්සේලා උදෙසා නො වදරණ ලද්දේ ය. ඒ වදළ කාරණයෙහි එක් නො කොට රහත්හු ඉතිරි කොට තබන ලද්දේ ය. රහත්හු විසින් භය වන කාරණය අත්‍යර්ථයෙන් නසන ලද්දේ ය. මහරජානෙනි, කෙලෙස් සහිත වූ යම් ඒ සත්වකෙනෙක් ඇද් ද, යම් සත්වකෙනෙකුන්ගේ බලවත් වූ 'මම ය, මගේ ය' යි ගන්න අත්තානුවාදදෘෂ්ටියෙක් ඇද් ද, යම් කෙනෙක් සැප දුක් දෙකෙහි උඩඟු වූ සිත් හා බැගෑපත් වූ සිත් ඇති වෙද් ද, ඒ පෘථග්ජනසත්වයන් උදෙසා භාග්‍යවතුන් වහන්සේ විසින් 'සියල්ලෝ ම වධදණ්ඩණයට උත්‍රාස වෙති. සියල්ලෝ ම මරණයට භය වෙති' කියා වදරණ ලද්දේ ය.

''මහරජානෙනි, රහතන් වහන්සේ විසින් දිව්‍යබ්‍රහ්මමනුෂ්‍ය නරකතිර්යක්ප්‍රෙතඅසුරකාය යන සියලු ම ගතීන් මුලොච්ඡින්නතාල වෘක්ෂයක් සෙයින් සිඳ හරණ ලද්දේ ය. චතුර්විධ යොනි විධ්වංසනය

Non-Commercial Distribution

කරණ ලද්දේ ය. ඒ ප්‍රතිසන්ධි විසින් නසන ලද්දේ ය. සන්ධි නො කළ හැකි ගල්කරුවක් මෙන් සියලු ජාතිය බිඳ හරණ ලද්දේ ය. සංසාරමහාපථය මනා කොට ම නසන ලද්දේ ය. සියලු ම භවාලය සිඳින ලද්දේ ය. සර්වසංස්කාරයෝ නසන ලද්දෝ ය. කුසල් අකුසල්[1] නසන ලද්දේ ය. නුනුවණ සංඛ්‍යාත අවිද්‍යාවත් නසන ලද්දී ය. සප්තවිඥනාධිෂ්ඨිතබීජය තපස්ගින්නෙන් බැඳ අබීජ කරණ ලද්දේ ය. එසේ ම සර්වක්ලේශයෝ දවන ලද්දෝ ය. ලොකධර්මය අතික්‍රාන්ත කරණ ලද්දේ ය. **(161)** එසේ හෙයින් රහතන් වහන්සේ සියලු ම භයින් භය නො වනසේක.

''මහරජානෙනි, මේ ලොකයෙහි රජ්ජුරුවන්ගේ රාජකෘත්‍යයයෙහි ඇලුනා වූ ලබන ලද යශස් ඇත්තා වූ රජහට විශ්වාස ඇත්තා වූ මහත් වූ ඓශ්වර්යස්ථානයෙහි තබන ලද්ද වූ මහාමාත්‍යයෝ සතරදෙනෙක් වන්නාහු වූ නම්, ඉක්බිති රජ්ජුරුවෝ කිසියම් කට යුත්තක් පැමිණි කල්හි 'සියල්ලෝ ම මාගේ මේ අය සංඛ්‍යාත වූ බලිකර්මාන්තය කෙරෙත්ව'යි කියා යම් තාක් තමන් විජිතයෙහි සියලු ජනයාහට අණවා[2] කියන්නාහු 'මහාමාත්‍යවරයෙනි, තෙපි සතරදෙන ඒ කට යුත්ත සාධා ලවවු' කීවාහු වූ නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ මහාමාත්‍යවරුන් සතරදෙනාට සෙස්සන්ට මෙන් බලිකර්මාන්තභයින් තැති ගැන්මෙක් උපදනේ ද?''යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, කවර කාරණයකින් ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, උත්තමස්ථානයෙහි රජහු විසින් ඔහු සතරදෙන තබන ලද්දහු ය. ඒ අමාත්‍යවරුන්ගේ බලිකර්මාන්තයෙක් නැත්තේ ය. ඒ සතරදෙන අතික්‍රාන්ත වූ බලිකර්මාන්ත ඇත්තෝ ය. අවශෙෂජනයන් උදෙසා රජහු විසින් 'සියල්ලෝ ම මාගේ බලි කර්මාන්තය කෙරත්ව' යි කියා අණවන[3] ලදූ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මේ වදළ වචනය භාග්‍යවතුන් වහන්සේ විසින් රහතුන් වහන්සේලා උදෙසා නො වදරණ ලද්දේ ය. ඒ වදළ කාරණයෙහි රහතුන් වහන්සේ නො ගැණ තබන ලද්දෝ ය.[4] රහතුන් වහන්සේ විසින් භය වන කාරණය නසන ලද්දේ ය. මහරජානෙනි, සක්ලේශික වූ යම් සත්වකෙනෙක් ඇද් ද, යම් සත්වකෙනෙකුන්ගේ බලවත් වූ සත්කායදෘෂ්ටිය ඇද් ද, යම් සත්වකෙනෙක් සැප දුක් දෙකෙහි උඩඟුසිත් තැවිලිසිත් ඇත්තාහු ද, ඒ සත්වයන් උදෙසා භාග්‍යවතුන් වහන්සේ විසින් 'සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙ භායන්ති මච්චුනො' යනාදිය වදරණ ලද්දේ ය. එහෙයින් රහතුන් වහන්සේ සියලු ම භයින් නො ම තැති ගන්නාසේකැ'' යි කීසේක.

එකල රජ්ජුරුවෝ ''අහෝ! ස්වාමීනි, 'නැළවිල්ලෙන් රවටන බිළිඳකු මෙන් මදකින් රවටන රජෙකැ' යි නො සිතන්න. දෙසැට දෘෂ්ටීන් ම දිවඅග ලෙලවා අගමුල විමසා තුච්ඡ කොට හැරපිමි. සුගතාගම සාර කොට ගෙණ පිටකත්‍රය ධරා මිත්‍ථ්‍යාවාදීන්ගේ මුඛ බන්ධනය කරණු

1. කුසල් 2. ඇණවා 3. ඇණ 4. ලද්දේ

Non-Commercial Distribution

පිණිස ඇදක් මෙන් පෙණෙන තැනෙක කාංක්ෂා සිඳ විචාරන්නෙමි. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ වදාළ වචනය 'සාවශෙෂ වචනයෙක් නො වන්නේ ය. 'සබ්බෙ තසන්ති' යනාදී මේ නිරවශෙෂවචනයෙක. ඒ වචනයෙහි ලා මට ඒ වචනය ප්‍රතිෂ්ඨා කරන්නට වෙනින් ඉතිරි කාරණයක් දක්වා වදාළ මැනවැ'' යි කීහ.

''මහරජානෙනි, මේ මනුෂ්‍යලොකයෙහි යම් ගමෙක ග්‍රාමස්වාමික පුරුෂතෙම 'පින්වත් වූ ග්‍රාමවිධානයෙහි ආණාපකයෙනි, මෙහි අව මැනව. මාගේ මේ ග්‍රාමයෙහි යම් පමණ ග්‍රාමිකජනකෙනෙක් ඇත් නම්, ඒ සියල්ල ම විගවිගහට මාගේ සමීපයට සන්නිපාත කරව' යි කියා ආණාපක නම් පණිවිඩකාරයාහට ඇණවූයේ වී නම් එපවත් ඇසූ විධාන යෙහි නියුක්ත වූ ඒ පුරුෂතෙම 'යහපත, ස්වාමීන් වහන්සැ' යි කියා එපවත් පිළිගෙණ දිව ගොස් ග්‍රාමමධ්‍යයෙහි සිට 'යම් පමණ මේ ග්‍රාමයෙහි ග්‍රාමිකකෙනෙක් ඇත් නම්, ඒ සියල්ලෝ ම ශීඝ්‍රශීඝ්‍ර ව අපගේ ස්වාමීන් **(162)** වහන්සේගේ සමීපයට සන්නිපතිත වෙත්ව' යි කියා තුන්වරක් මහත් කොට ශබ්දය අස්වා ලවන්නේ ය. එකල ඒ ග්‍රාමිකයෝ පණිවිඩ කාරයාගේ වචනයෙන් වහවහා සන්නිපතිත ව 'ස්වාමීන් වහන්ස, ගමේ සියල්ලෝ ම සන්නිපතිත වූහ. නුඹ වහන්සේ විසින් යමක් කට යුතු නම්, ඒ කට යුත්ත කර වදාළ මැනැවැ' යි කියා ග්‍රාමජ්‍යෙෂ්ඨයාහට කියන්නාහු ය. මහරජානෙනි, මෙසේ ඒ ග්‍රාමජ්‍යෙෂ්ඨපුරුෂතෙම ගෙවල් ඇති කුටිපුරුෂයන් සන්නිපාතය කරවමින් සියලු ම ග්‍රාමවාසීන්ට අණවන්නේ ය. ඒ අණවනු[1] ලබන්නා වූ ද සියල්ලෝ ම සන්නිපතිත නො වෙති. ගෙවලට හිමි කුටිපුරුෂයෝ ම රැස් වන්නාහුය. 'මාගේ ග්‍රාමයෙහි ගම්වාසීහු මෙපමණ ය' යි කියා ග්‍රාමජ්‍යෙෂ්ඨතෙමේ ද එසේ ම ඉවසන්නේ ය. සෙසුත් නො ආවා වූ ස්ත්‍රී පුරුෂ දසි දස බත් බැළ කර්මකාර ග්‍රාමික ගිලන් ගො මහිස තිරෙළු පලෙළු යන ප්‍රාණීහු බොහෝ දෙනෙක. 'සියල්ලෝ ම රැස් වෙත්ව' යි කියා කුටිපුරුෂයන් උදෙසා ම ආඥ කළ බැවින් යම් කෙනෙක් නො ආවාහු ද, ඒ සියලුදෙන කුටිපුරුෂසංඛ්‍යාවට නො ගණිනු ලද්දහු ය.

''මහරජානෙනි, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් මේ වචනය රහතුන් උදෙසා නො වදරණ ලද්දේ ය. ඒ වදාළ කාරණය රහතන් වහන්සේ නො වදරා තබන ලද්දේ ය. රහතන් වහන්සේ විසින් භය වන කාරණය නසන ලද්දේ ය. මහරජානෙනි, සක්ලෙශික වූ යම් ඒ සත්වකෙනෙක් ඇද් ද, යම් ඒ සත්වකෙනෙකුන්ගේ බලවත් වූ සත්කාය දෘෂ්ටිය ඇද් ද, යම් ඒ සත්වකෙනෙක් සැපදුක් දෙකෙහි උඩඟු වූ සිත් හා බැගෑ වූ සිත් ඇත්තාහු ද, එබඳු සත්වයන් උදෙසා භාග්‍යවතුන් වහන්සේ විසින් 'සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙ භායන්ති මච්චුනො' යනාදිය වදරණ ලද්දේ ය. ඒ හෙයින් රහතන් වහන්සේ සියලු භයින් තැති

1. ඇණවනු

Non-Commercial Distribution

නො ගන්නාසේක. මහරජානෙනි, සාවශෙෂ වූ අඩාළ වචනයත් ඇත. සාවශෙෂ වූ අඩාළ අර්ථත් ඇත. සාවශෙෂ වූ වචනයත් ඇත. නිරවශෙෂ වූ තීන්දු අර්ථත් ඇත. නිරවශෙෂ වූ වචනත් ඇත. සාවශෙෂ වූ අර්ථත් ඇත. නිරවශෙෂ වූ වචනත් ඇත. නිර්වශෙෂ වූ අර්ථත් ඇත. ඒ ඒ කාරණයෙන් අර්ථය පිළිගත යුත්තේ ය.

''මහරජානෙනි, ආහච්චපදයෙන් ද, රසයෙන් ද, ආචාර්යවංශයෙන් ද, අභිප්‍රායයෙන් ද, කාරණුත්තරියතායෙන් ද යන මේ පඤ්චප්‍රකාරයෙන් අර්ථ පිළිගත යුත්තේ ය. මහරජානෙනි, මෙහි 'ආහච්චපදය' යි කියා සූත්‍රය දක්වන ලද්දේ ය. රසය නම් සූත්‍රානුලොම ය. ආචාර්යවංශය නම් ආචාර්යවාදය යි. අභිප්‍රාය නම් අත්තනොමති ය. කාරණුත්තරියතාව නම් මේ සතරින් සම වන්නා වූ කාරණ ය. මහරජානෙනි, මේ පස්කාරණයෙන් අර්ථය පිළිගත යුත්තේ ය. මේසේ මෙ ප්‍රශ්නයතෙම මා විසින් මනා කොට විනිශ්චය කරණ ලද වන්නේ ය'' යි කීසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ එසේ ම වේවා. ඒ වදළ කාරණයෙහි රහතන් වහන්සේ ඉතිරි කොට තබන ලද වේවා. අවශෙෂ සත්වයෝ නැති ගණිත්වා. එසේ ම පිළිගන්නෙමි. නරකයෙහි වනාහි බලවත් වූ දුක් ඇත්තා වූ කර්කශ වූ වෙදනාව විඳින්නා වූ ජ්වලිත ප්‍රජ්වලිත සියලු ම අංගප්‍රත්‍යංගයන් ඇත්තා වූ නිති හඬන්නා වූ කරණ කට යුතු හඬින් හඬන්නා වූ **(163)** කඳුළු හෙළා හඬන්නා වූ විලාප කියා හඬන්නා වූ කෙළතොලු මූහුණු ඇත්තා වූ නො ඉවසිය හැකි බලවත් දුකින් මඩනා ලද්ද වූ කිසි රක්ෂාවක් නැත්තා වූ අසරණ වූ අසරණීයභූත වූ අපරීයන්ත ශොකාතුර වූ ආසන්න පශ්චිමනිරයාග්නි ම ඇත්තා වූ එකාන්ත ශොක පරායණ වූ උෂ්ණ තීක්ෂණ චණ්ඩකර සූර්යයාට බඳු වූ තෙජස් ඇත්තා වූ ඝොරභීමභයජනක නාදයෙන් ම මහාශබ්ද ඇත්තා වූ උඩින් යටින් සතර දිගින් නික්ම වැසෙන ලද ෂඩ්විධ වූ වහ්නිජ්වාලා මාලාවෙන් ආකුල වූ හාත්පසින් සියක් යොදුන් තැන් නිති පැතිරෙණ ගිනිදැල්වෙග ඇත්තා වූ දැඩි වූ සිත්තැවිලි ඇත්තා වූ නිරිසත්වයෝ මහානරකයෙන් චුත වෙමින් ,මරණයට භය වන්නාහු ද?'' යි විචාළෝ ය.

''එසේ ය, මහරජානෙනි, භය වෙත් ම ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නරකය එකාන්ත දුක්ඛවෙදනීය නො වේ ද? කුමක් පිණිස වනාහි ඒ නිරිසත්වයෝ එකාන්ත දුක්ඛවෙදනීය වූ නරකාදියෙන් දුකින් මිදී චුත වෙමින් මරණයට භය වෙද් ද, කිමෙක් ද? නරකයෙහි ආලය කරන්නාහු ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ඒ නිරිසත්වයෝ නරකයෙහි ආලය නො කරන්නාහ. ඒ නිරිසත්වයෝ නරකයෙන් මිදෙනු කැමැත්තාහු ය. මහරජානෙනි, ඒ නරකයෙන් චුත වන නිරිසත්වයන්ට යමක් කරණ කොට ගෙණ නැති ගැන්මෙක් උපදනේ ය යන මේ කාරණය මරණයාගේ අනන්තසත්ව භෙද්‍යය කරණ ආනුභාවයෙකැ'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'දුකින් මිදෙනු

Non-Commercial Distribution

කැමැත්තවුන්ගේ චුතියෙහි යම් තැති ගැන්මෙක් උපදනේ ය' යි වදළ මේ කාරණය මම නො අදහන්නෙමි. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ දුකින් මිදෙනු කැමැති සත්වයෝ යම් ප්‍රාර්ථනාවක් ලබද් ද, ඒ සතුටු උපදවන්නා වූ ස්ථානයෙක. කාරණයකින් මට අඟවා වදළ මැනැවැ''යි කීහ.

''මහරජානෙනි, 'මරණය' යි යන මේ කාරණය චතුස්සත්‍යධර්මයන් නො දුකි සත්වයන්ට භයජනකස්ථානයෙක. මෙහි මේ ලෝවැසිතෙම තැති ගන්නේ ය. චකිත වන්නේ ය. මහරජානෙනි, යමෙක් කෘෂ්ණ සර්පයාහට භය වන්නේ ද, එතෙම මරණයට භය වෙමින් කෘෂ්ණ සර්පයාහට භය වන්නේ ය. යමෙක් හස්තියාහට භය වන්නේ ද, සිංහයාහට, ව්‍යාඝ්‍රයාහට, දිවියාහට, වලස්හට, කරබාන වලස්හට, මහිසයක්හට, ගවයක්හට, වහ්නියට, උදකයට, කණුකටුවට භය වන්නේ ය. යමෙක් ශස්ත්‍රයට භය වන්නේ ද, ඒ තෙම මරණයට භය වෙමින් ශස්ත්‍රයට භය වන්නේ ය. මහරජානෙනි, ඒ මරණයාගේ වෙගභාවතෙජස වන්නේ ය. ඒ මරණයාගේ වෙගභාවතෙජසින් ක්ලෙශ සහිත සත්වයෝ මරණයට තැති ගන්නාහ. භය වන්නාහ. මහරජානෙනි, දුකින් මිදෙනු කැමැත්තාහු ද, නිරිසත්වයෝ මරණයට තැති ගණිති, භය වෙති. මහරජානෙනි, මේ ලොකයෙහි පුරුෂයක්හුගේ ශරීරයෙහි මේදතෙල් වැඩීමෙන් මේදගඩුවෙක් උපන්නේ වී නම්, ඒ රොගයෙන් දුක්ඛිත වූ ඒ පුරුෂතෙම උපද්‍රවයෙන් මිදෙනු කැමැති ව ගඩු විදින ශල්‍යකත්තෘ නම් වෙදකු කැඳවා ලවන්නේ ය. ශල්‍යකත්තෘ නම් ඒ වෛද්‍යාචාර්යතෙම ඔහුගේ වචනය පිළිගෙණ ඒ රොගයාගේ උද්ධරණය පිණිස වුව මනා උපකරණ ගෙන්වා ලඟ තබන්නේ ය. විදින ශස්ත්‍රය මුවහත් තීක්ෂ්ණය කරන්නේ ය. පුලුස්සන (164) යකඩකූරු ගින්නෙහි බහා ලන්නේ ය. කරලුණු අඹරණ ගලින් අඹරවන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ රොගාතුරයාහට සියුම් ශස්ත්‍රයෙන් සිඳීමෙන් යකඩකූරුවලින් දැවීමෙන් කාරලවණ ප්‍රවෙශයෙන් තැති ගැන්මෙක් උපදනේ ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, මෙසේ ඒ රොගයෙන් මිදෙනු කැමැත්තා වූ රොගාතුරයාහට පවා මරණවෙදනා භයින් තැති ගැන්ම උපදනේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නරකයෙන් මිදෙනු කැමැත්තා වූ නිරිසත්වයන්ටත් මරණභයින් තැති ගැන්ම උපදනේ ය. මහරජානෙනි, මේ ලොකයෙහි ප්‍රධානිකයාහට අපරාධික වූ පුරුෂයෙක්තෙම සංඛලිකබන්ධනයෙන් බඳින ලද්‍ද ව ගෘහගර්භයෙක බහාලන ලද්දේ සිරගෙයින් මිදී යනු කැමැති වන්නේ ය. ඒ මිදෙනු කැමැති පුරුෂයා මුදා හරිණු කැමැත්තා වූ ප්‍රධානිකපුරුෂතෙම ඔහු කැඳවන්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඊශ්වරාපරාධික පුරුෂයාහට 'කරණ ලද අපරාධ ඇත්තේ ම ය' යි කියා දන්නාහට ඊශ්වරයා දැකීමෙන් තැති ගැන්මෙක් උපදනේ ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, භය ඇතැ'' යි කීහ. ''මහරජානෙනි, මෙසේ වරදින් මිදී යනු කැමැත්තා වූ

Non-Commercial Distribution

ඒ ඊශ්වරාපරාධික පුරුෂයාහටත් ඊශ්වරභයින් සන්ත්‍රාසය උපදනේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නරකයෙන් මිදෙනු කැමැත්තා වූ නිරිසත්වයන්ට මරණභයින් සන්ත්‍රාසය උපදනේ ය.''

''**නාගසෙන ස්වාමීනි**, යම් කාරණයකින් මම අදහන්නෙම් ද, එබඳු වූ අනිකුත් ඉතිරි කාරණයක් වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, මේ ලොකයෙහි පුරුෂයෙක්තෙම දෂ්ට කළ කල සකල ශරීරය දරදණ්ඩක් මෙන් වන විෂ ඇත්තා වූ නයකු විසින් දෂ්ට කරණ ලද්දේ වී නම්, ඒ විෂ විකාරයෙන් ඒ පුරුෂතෙම වැටෙන්නේ ය, ඉපිල වැටෙන්නේ ය, බිම පෙරළෙන්නේ ය, ඔබිනොබ පෙරළෙන්නේ ය. නැවැත ඒ දූක අන්‍යතර පුරුෂයෙක් බලවත් වූ මන්ත්‍රපදයකින් දෂ්ටවිෂ ඇති ඒ ආශීවිෂයා අල්වා ගෙණවුත් නයා ලවා දෂ්ටවිෂය වූ ඒ නයිවිෂය උරවාලවන්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ විෂගත වූ පුරුෂයාහට සුව පිණිස ලහට ගෙණාවා වූ දෂ්ට විෂ ඇති සර්පයා කෙරෙහි සන්ත්‍රාස භයෙක් උපදනේ ද ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, භය උපදනේ ය'' යි කීහ. ''මහරජානෙනි, මෙසේ සුව පිණිසත් ලහට පැමිණියා වූ එබඳු වූ නාගයා කෙරෙහි විෂවෙග වූ ඒ පුරුෂයාහට සන්ත්‍රාසය උපදනේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නරකයෙන් මිදෙනු කැමැත්තා වූ නිරිසත්වයන්ටත් මරණ භයින් තැති ගැන්ම උපදනේ ය. මහරජානෙනි, සකල සත්වයන්ට ම මරණය අනිෂ්ට වන්නේ ය. එහෙයින් නිරිසත්වයෝ නරකයෙන් මිදෙනු කැමැති වුවත් මරණයට භය වන්නාහු ම ය'' යි කීසේක. එකල රජ්ජුරුවෝ සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ වදාළ මේ කාරණය මම එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

**මරණභය ප්‍රශ්නය නිමි.**

---

# පිරිත් ප්‍රශ්නය

නැවැතත් මිලිඳු මහරජානෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස. භාග්‍යවතුන් වහන්සේ විසින් 'න අන්තලික්ඛෙ' යනාදීන් 'යම් තැනෙක සිටියා වූ සත්වතෙම මරණමන්දෙන් මිදෙන්නේ වී නම්, එබඳු **(165)** භූමිප්‍රදෙශයක් ලොකයෙහි නැත්තේ ය. ආකාශයෙහිත් නැත්තේ ය. සමුද්‍රමධ්‍යයෙහිත් නැත්තේ ය, පර්වතයන්ගේ විවරයකට ප්‍රවිෂ්ට ව ද ගැලවී යාමක් නැත්තේ ය' යන මේ ගාථාව වදාරණ ලද්දේ ය. නැවතත් එම භාග්‍යවතුන් වහන්සේ විසින් පිරිත්ධර්ම කෙනෙක් ද වදාරණ ලද්දහ. ඒ කවරේ ද:— **රතනසූත්‍රය, ඛන්ධපිරිතය, මොරපිරිතය, ධජග්ගපිරිතය, ආටානාටියපිරිතය, අංගුලිමාලපිරිතය,** ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සත්වතෙම මරණින් මිදෙමි යි සිතා උඩ ආකාශයට ගොසිනුත් මහාසමුද්‍රමධ්‍යයට ගොසිනුත් ප්‍රාසාද ගෘහ ගල්ලෙන් භූමි ගුහා පර්වත

ගුහා පබ්භාරතැලි දදුරු[1] වෘක්ෂ බිල් විවර පර්වතාන්තරයට ගියේ ද, මරණපාසයෙන් නො මිදෙන්නේ ය. එහෙයින් පිරිත් කිරීම බොරු වන්නේ ය. ඉදින් පිරිත් කිරීමෙන් මරණපාසයෙන් මිදීමෙක් වේ නම් එයින් 'න අන්තලික්ඛෙ' යනාදීන් 'මරණපාසයෙන් නො මිදෙන්නේ ය'යි කියා වදළ ඒ වචනයත් බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය තෙමේත් ග්‍රන්ථියෙනුත් ගණ්ඨිතර ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**''න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ**
**න පබ්බතානං විවරං පවිස්ස,**
**න විජ්ජති සො ජගතිප්පදෙසො**
**යත්ථට්ඨිතො මුච්චෙය්‍ය මච්චුපාසා.''**

කියා මේ ගාථාවත් වදරණ ලද්දේ ය. නැවැතත් භාග්‍යවතුන් වහන්සේ විසින් ආරක්ෂා පිරිත්හු දෙසන ලද්දහ. ඒ වදළ පිරිත වනාහි සාවශෙෂායුෂ ඇත්තා වූ වයස්සම්පන්න වූ පහ වූ අකුශලකර්මාවරණය ඇත්තාහට ය. මහරජානෙනි, ක්ෂය වූ ආයුෂ ඇත්තාහට නො නැසී සිටීම පිණිස ක්‍රියාවෙක් හෝ උපක්‍රමයෙක් හෝ නැත්තේ ය. මහරජානෙනි, යම් සේ වියලි ගියා වූ දිරා ගියා වූ තෙත සිඳී ගියා වූ ජීවිතෙන්ද්‍රිය වැළකුනා වූ ගත වූ වෘක්ෂායුෂ ඇත්තා වූ මළා වූ වෘක්ෂයක්හට කළසියදහසෙකිනුත් පැන් වක්කරණ කල්හිත් තෙත්බවක් නිලිගත් පත්‍ර ඇතිබවක් හෝ නො වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම බෙහෙත් පිරිත්කරණයෙන් ක්ෂීණායුෂයාගේ සිටීම පිණිස ක්‍රියාවක් හෝ උපක්‍රමයෙක් හෝ නැත්තේ ය. මහරජානෙනි, සකල පෘථිවියෙහි යම් ඒ ඖෂධබෙහෙත් ජාතියෙක් ඇද් ද, ඒ සියලු ම බෙහෙත්හු ක්ෂීණායුෂ්කයාහට කෘත්‍යසාධක නො වන්නාහ. මහරජානෙනි, වයස් සම්පූර්ණ වූ පහ වූ අකුශලකර්මා-වරණ ඇත්තා වූ සාවශෙෂායුෂ ඇති පුරුෂයා පිරිත රකින්නේ ය. ගොපනය කරන්නේ ය. ඒ ආයු ඇත්තා උදෙසා ම භාග්‍යවතුන් වහන්සේ විසින් පිරිත්හු දෙශනා කරණ ලද්දහ.

''මහරජානෙනි, යම් සේ ගොවිතැන් කරණ කස්සකපුරුෂතෙම ධාන්‍ය පැසුනු කල්හි ශස්‍යකරල් මත කල්හි කුඹුරට උදක ප්‍රවේශය වළක්-වන්නේ ය. මේඝයෙන් උත්පත්ති කාරණ වූ[2] කරල් නො ගැන්මෙන් වයස් සම්පන්න වූ තරුණ වූ යම් ශෂ්‍යයෙක් ඇද් ද, ඒ ගොයම ජලය වැඩීමෙන් වැඩෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම, ක්ෂය වූ ආයුෂ ඇත්තාහට බෙහෙත් පිරිත් ක්‍රියාවෝ නො කොට තබන ලද්දහ. වළක්-වන ලද්දහ. වයස් සම්පන්න වූ සාවශෙෂායුෂ ඇත්තා වූ යම් **(166)** ඒ මනුෂ්‍ය කෙනෙක් ඇද් ද, ඔවුන් පිණිස පිරිත් බෙහෙත් වදරණ ලද්දේ ය.

1. දෙදුරු 2. 'තරුණං මෙඝසන්නිභං'–පාළි (–තරුණ වූ වැසිවලා කුළක් වැනි')

Non-Commercial Distribution

පිරිත් බෙහෙත් දෙකින් ඒ මනුෂ්‍යයෝ නො මිය රැකෙති. වඩිති'' යි කීසේක. ''ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, හීනායුෂ්කයා[1] නසින්නේ ය. සාවශෙෂායුෂ්කයා ජීවත් වන්නේ ය. එහෙයින් පරිත්ත භෛෂජ්‍යයෝ නිරර්ථක වන්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, තොප විසින් බෙහෙතින් නසන ලද්ද වූ කිසි රොගයෙක් දක්නා ලද්දේ දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, නොයෙක් සියගණනෙක් දක්නා ලද්දේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ කාරණයෙන් පරිත්තභෛෂජ්‍ය ක්‍රියාවෝ නිරර්ථක ය යි කී යම් වචනයක් ඇද් ද, තොපගේ ඒ වචනය බොරු වන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, වෙදවරුන්ගේ උපක්‍රමභෛෂජ්‍යපානාලෙපයෝ දක්නා ලැබෙති. ඒ වෙදවරුන්ගේ උපක්‍රම භෛෂජ්‍ය පානාලෙපයෙන් රෝගයෝ වළකින්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, පිරිතත් මෛත්‍රීපූර්වාංගම ව පවත්වන්නවුන්ගේ ශබ්දය පැතිරෙන්නේ ය. දිව වියලෙන්නේ ය. චිත්තය පෙරළෙන්නේ ය. නෙළුම්කැකුළක් වැනි හෘදයවස්තුව පෙළෙන්නේ ය. උගුර බැරැඩි වන්නේ ය. ඒ පිරිත් කියන්නවුන්ගේ පවත්වන ඒ උපක්‍රමයෙන් රෝගීන්ගේ සියලු ව්‍යාධිහු ව්‍යපශමනය වන්නේ ය. සර්වාන්තරායයෝ හිරු පැමිණි අඳුර මෙන් පහ වන්නාහ.

''මහරජානෙනි, විෂ විනාස කරන්නා වූ මන්ත්‍රපදයකින් විෂය බස්වන ලද්ද වූ විෂ සන්හිඳුවන ලද්ද වූ ඌර්ධ්වාධොභාගයෙහි ඖෂධජලයෙන් තෙමන ලද්ද වූ නයකු විසින් දෂ්ට කරණ ලද්ද වූ කිසිවෙක් තොප විසින් දක්නා ලද්දේ ඇද් දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, අද දූන් දක්වාත් ඒ විෂ බස්වන කාරිය ලොකයෙහි පවත්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ කාරණයෙන් පිරිත් බෙහෙත් ක්‍රියාවෝ නිරර්ථක ය යි කියන්නා වූ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. මහරජානෙනි, කරණ ලද පිරිත් ආරක්ෂාව ඇති පුරුෂයා දෂ්ට කරණු කැමැත්තා වූ නාගයා දෂ්ට නො කරන්නේ ය. විවෘත කළ මුඛය පියා ගන්නේ ය. සොරුන් විසින් තළන්නට ඔසවා ගත් මුගුරු පවා නො පැමිණෙන්නේ ය. ඒ සොරු මුගුරු දමා ළහට අවුත් ප්‍රිය කෙරෙති. කුපිත වූ හස්තිනාග තෙම ළහට දිව අවුත් වළකින්නේ ය. දිලියෙන මහාවහ්නිස්කන්ධය පවා ළහට පැමිණ නිමෙන්නේ ය. නො දූන අනුභව කරණ ලද බලවත් වූ විෂය පවා අමෘතබෙහෙත් වන්නේ ය. ආහාරාර්ථය පිණිස හෝ ශරීරයෙහි ව්‍යාප්ත වන්නේ ය. නසනු කැමැත්තා වූ වරදකරුවෝ ළහට අවුත් දසබ්වට[2] පැමිණෙති. පයින් මඩින ලද පාසය නො ඇසිරෙන්නේ ය. මහරජානෙනි, **මයූරජාතකයෙහි** 'කරණ ලද පිරිත් ඇති මයූරයාගේ පයට සත්සියයක් හවුරුදු මුළුල්ලෙහි වැදිතෙම පාසය පමුණුවන්නට නො හැකි වූයේ ය. නො කරණ ලද පිරිත් ඇති මයූරයාගේ පාදයට එදවස්හි ම පාසය පමුණුවාලුයේ ය' යි කියා තොප විසින් පෙර අසන ලද්දේ දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, අසන ලද්දේ ය. ඒ ශබ්දය දෙවියන්

1. හීනායුෂයා 2. දසව

Non-Commercial Distribution

සහිත වූ ලොකයෙහි ඉතා උස් ව නැංගේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ කාරණයෙනුත් පිරිත් බෙහෙත් ක්‍රියාවෝ නිරර්ථක ය යි කියන්නා වූ යම් **(167)** වචනයක් ඇද් ද, ඒ තොපගේ වචනය බොරු වන්නේ ය.''

''තවද, මහරජානෙනි, **දනව** නම් රාක්ෂසතෙම මනා වූ රූපශ්‍රී ඇති තරුණ කුමාරිකාවක් අල්වා ගෙණ, භාර්යා කොට රක්ෂා කෙරෙමින් කරඬුවෙක ලා ගිල බඩෙහි තබා ගෙණ ඇවිදින්නේ ය. දිනෙක කුමාරිකාව නහවා සුවඳින් මලින් සරසා විල්තෙරක හිඳුවා තෙමේත් විලට බැස පැන් සනහා ගොඩ නැඟී කරඬුව ගිල බඩලා ගෙණ දිවස් ඇති තපස්විකෙනෙකුන් ලඟට ගොස් වැඳ එකත්පස් ව උන්නේ ය. විල් තෙර හුන් කුමාරිකාවෝ අහසින් යන විද්‍යාධරයකු දැක අත වනා ගෙන්වා ගෙණ කරඬුවට වැද පිළී පෙරෙව ගෙණ උන්හ. එකල දනවයාගේ මුඛයෙන් කරඬුව සහ ප්‍රවෙශ වූ විද්‍යාධරතෙම ඈ හා සමග අභිරතිය කරන්නේ ය. ඔවුන් දුටු තපස්වීන් වහන්සේ 'තෙපි තුන්දෙන කොතැන්හි සිට අවු දැ' යි විචාරා 'අහෝ තපස්විහු උම්මත්තක ව දෙඩන නියා දෝ හො?' යි කියා විපිළිසර උපන් දනවයාහට 'තා බඩ කරඬුවෙක් ඇත. එහි ගැණු කෙනෙක් ඇත. ඇ විද්‍යාධරයකු හා වසන්නී ය. වහා තා දිවි රැකෙන උපායයක් කරව' යි කියා වදරණ ලද්ද වූ ඒ දනව නම් රාක්ෂස තෙම 'අහෝ මඳකින් විද්‍යාධරයා කඩුවෙන් මා බඩ කපා ගිය' යි කියා යම් දවසක දැන ගත්තේ ද, ඒ හෙයින් [1]සංවෙගරූප ව භයින් තැති ගෙණ එතැන්හි ම කරඬුව වමනය කොට ඒ කරඬුයෙහි **වායුස්සපුත්‍ර** නම් විද්‍යා-ධරයා හා සමග ඇලී සිටියා වූ පවිත්‍රමාලාධාරී වූ තමාගේ භාර්යාව දුටුයේ ය. දැක මරණ භයින් වෙවුලා අඹුව කෙරෙහි කලකිරී ඈ මිනිස්පථයට හැර සැප සේ හැසුරුණේ ය. ඒ බව දක්වා වදරණ ලොවුතුරා බුදුන් විසින්:—

**'සංවිග්ගරූපො ඉසිනා වියාකතො**
**සො දානවො තත්ථ සමුග්ගමුග්ගිලි,**
**අද්දක්ඛි භරියං සුචිමාලධාරිණිං**
**වායුස්ස පුත්තෙන සහා තහිං රතං' යි**

(වදරණ ලදී)

'කරඬුව විවෘත කිරීම හා සමග ම 'විද්‍යාධරතෙම අසු නො වී යම් කැමැති අතකින් ගියේ ය' යි කියා, මහරජ, තොප විසින් අසන ලද්දේ දැ'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, අසන ලද්දේ ය, ඒ ශබ්දය ද දෙවියන් සහිත වූ ලොකයෙහි ඉතා උස් ව පැන නැංගේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ විද්‍යාධරතෙම තමාගේ මන්ත්‍රපිරිත් බලයෙන් ග්‍රහණයෙන් මිදුනේ නො වේ දැ'' යි විචාළසේක. ''එසේ ය; ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, ඒ කාරණයෙන් සර්වඥපිරිත්බලය ඇතැ'' යි වදළසේක.

1. 'යද සො දානවො අඤ්ඤාසි අථ'—පාළි (-යම්විටක ඒ දනවතෙමේ දැන ගත්තේ ද එවිට)

Non-Commercial Distribution

''තවද, මහරජානෙනි, අනිකුදු විද්‍යාධරයෙක් බරණැස් රජ්ජුරුවන්ගේ අන්තඃපුරයෙහි මහෙසිකාවක හා සමග දූෂ්‍යය කෙරෙමින් ග්‍රහණප්‍රාප්ත වූයේ මන්ත්‍රබලයෙන් ම ඇසිල්ලකින් අදර්ශනයට ගියේ ය යි කියා තොප විසින් පෙර අසන ලද්දේ ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, අසන ලද්දේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ විද්‍යාධරතෙම මන්ත්‍ර පිරිත්බලයෙන් ග්‍රහණයෙන් මිදුනේ නො වේ ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, මිදුනේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ කාරණයෙන් ද සර්වඥපිරිත්බලය ඇතැ'' යි කීසේක.

**(168)** ''කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සියල්ලන් ම පිරිත රක්ෂා කරා ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ඇතැම් කෙනෙකුන් රක්ෂා කරන්නේ ය, ඇතැම් කෙනෙකුන් රක්ෂා නො කරන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, එහෙයින් පිරිත සියල්ලන්ට සාධාරණ ව සර්වාර්ථික නො වන්නේ ය'' යි කීහ. ''කිමෙක් ද, මහ රජානෙනි, භොජනය සියල්ලන්ගේ ම ජීවිතය රක්ෂා කරන්නේ ද'' යි විචාළසේක. ''ස්වාමීනි, සමහර කෙනෙකුගේ ජීවිතය රක්ෂා කරන් නේ ය, සමහර කෙනෙකුන්ගේ ජීවිතය රක්ෂා නො කරන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඊට කාරණ කවරේ ද'' යි විචාළසේක. ''ස්වාමීනි, යම් හෙයකින් ඒ භොජනය සමහර කෙනෙක් බොහෝ අනුභව කොට අජීර්ණ ව විසූචිකා නම් අතීසාරයෙන් නසින්නාහු ය'' යි කීහ. ''මහරජා නෙනි, ඒ කාරණයෙන් භොජනය සියල්ලවුන්ගේ ජීවිතය රක්ෂා නො කරන්නේ ද'' යි විචාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, බොහෝ කොට කෑමෙන් හෝ ජඨරාග්නිය දූර්වල බැවින් හෝ කාරණ දෙකකින් භොජනය ජීවිතය නසන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ආයු දෙන්නා වූ භොජනය නපුරු උපචාරයෙන් ජීවිතය ගන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම පිරිත සමහර කෙනෙකුන් රක්ෂා කරන්නේ ය. සමහර කෙනෙකුන් රක්ෂා නො කරන්නේ ය. මහරජානෙනි, අකුශලකර්මාවරණයෙන් ද රාගාදී වූ ක්ලේශාවරණයෙන් ද නො ඇදහීමෙන් ද යන තුන් කාරණයකින් පිරිත සත්වයන් නො රකින්නේ ය. මහරජානෙනි, සකල සත්වයන් ම නො හැර ම රක්ෂා කරන්නා වූ පිරිත තමා විසින් ම කර ගත් දෙයින් ආරක්ෂාව දුරු කරන්නේ ය. මහරජානෙනි, යම් සේ මෑනියෝ බඩට පැමිණියා වූ පුත්‍රයා හිත වූ උපචාරයෙන් පොෂ්‍ය කරන්නාහු ය. දසමසකින් වදන්-නාහු ය. වද අසූචි මල මූත්‍ර කෙල සොටු පහ කරන්නාහු ය. එසේ කොට උත්තම ප්‍රවර සුගන්ධය වෙර ගාන්නාහු ය. අනුන්ගේ පුත්‍රයන් ආක්‍රොශ කරණ කල්හි ද, හස්තාදියෙන් තළන කල්හි ද කම්පා වූ සිතින් බලයෙන් අල්වා ඇද ගෙණ ගොස් 'මේ පැටියෝ මා දරුහට තැළුව බැන්හ' යි කියා ඔවුන්ගේ දනුමැතියන් ලඟට පමුණුවන්නාහු ය. ඉදින් ඇගේ පුත්‍රතෙම අපරාධයක් කොට වෙරල ඉක්මවන ලද වී නම්, එ කල ඕ තොමෝ

Non-Commercial Distribution

පුත්‍රයාහට දඬු මුගුරු දණ්ඩමිටි ආදියෙන් තළන්නී ය.[1] නැවැත පොථනය කරන්නේ ය. කිමෙක් ද? මහරජානෙනි, ඒ පුත්‍රයාගේ මැනියෝ ආකඩ්ඪන පරිකඩ්ඪනය ග්‍රහණය ස්වාමියන්ගේ සමීපයට ගෙණ යාම කරන්ට ලබන්නී දැ'' යි විචාළසේක. ''ස්වාමීනි, එසේ නැතැ''යි කීහ. ''මහරජානෙනි, කවර කාරණයකින් දැ'' යි විචාළසේක. ''ස්වාමීනි, තමාගේ පුත්‍රතෙම කළ අපරාධයෙනැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම සත්වයන්ගේ ආරක්ෂාපිරිත තමන්ගේ අපරාධයෙන් විරුද්ධය කරන්නේ ය'' යි වදළසේක.

එකල රජ්ජුරුවෝ අතිප්‍රසන්න ව ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ගණීවරප්‍රවර වූ නුඹ වහන්සේ කරා පැමිණි ප්‍රශ්නයතෙම නුඹවහන්සේ විසින් මනා කොට විනිශ්චය කරණ ලද්දේ ය. විමතිග්‍රහණය නො ගැන්ම කරණ ලද්දේ ය. විමති අන්ධකාරයෙහි ඥාණාලොකය කරණ ලද්දේ ය. දෘෂ්ටිද්‍රල විනිර්වෙඨනය කරණ ලද්දේ ය'' යි ස්තුති කළහ.

පිරිත් ප්‍රශ්නය යි.

---

# ප්‍රත්‍යයලාභප්‍රශ්නය.

නැවතත් රජ්ජුරුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'තථාගතයන් වහන්සේ චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයන්[2] ලාභීසේකැ' යි කියා නුඹ වහන්සේ වදරණසේක. නැවත ද, 'තථාගතයන් වහන්සේ **පඤ්චසාල** නම් බ්‍රාහ්මණ ගමට පිඬු පිණිස වැඩ කිසිදෙයක් නො ලැබ සේදූ සිස් පාත්‍රයෙන් ම නික්මුනුසේකැ' යි කියාත් වදරණසේක. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය බෙහෙත් පරිෂ්කාරයන් ලාභී වූසේක් වී නම්, එහෙයින් '**පඤ්චසාල** නම් බමුණුගමට පිඬු පිණිස වැඩ කිසිවක් නො ලැබ ම සේදූ පාත්‍රයෙන් ම නික්මුනු සේකැ'යි කියන්නා වූ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් පඤ්චසාල නම් බමුණුගමට පිඬු පිණිස වැඩ කිසිවක් නො ලැබ ම සේදූ පාත්‍රයෙන් ම නික්මුනුසේක් වී නම්, එහෙයින් 'තථාගතයන් වහන්සේ චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය බෙහෙත් පරිෂ්කාරයන් ලාභී සේකැ' යි කියන්නා වූ ඒ වචනය බොරු වන්නේ ය. මේත් අතිශයින් ම මහත් වූ උභතොකොටිකප්‍රශ්නයෙක. අල්පබුද්ධීන් විසින් නිර්වෙඨනය කළ නො හැක්කේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

---

1. තලන්නේ ය  2. පරිෂ්කාරයන්ගෙන්

*Non-Commercial Distribution*

''මහරජානෙනි, තථාගතයන් වහන්සේ චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාරයන් ලාභීසේක. පඤ්චසාල නම් බ්‍රාහ්මණ ගමට පිඩු පිණිස වැඩ කිසි ම දෙයක් නො ලැබ යම් සේ සේදූ පාත්‍රයෙන් ම නික්ම වැඩිසේක. ඒ කාරණය වනාහි පවිටු වූ මාරයාගේ කාරණයෙනැ'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ කාරණයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් ගණනපථය අතික්‍රාන්ත වූ කල්පඅසංඛ්‍යයක් මුළුල්ලෙහි රැස් කර වදළ කුශලසම්භාරය කිමෙක් ද, එදවස් නිෂ්ඵා වී ද? දූන් මෙසමයෙහි මඳ කුශලයකින් දෙව්ලොව නැඟුනා වූ පවිටු වූ මාරයා විසින් ඒ අනන්තකල්ප නිචිත කුශල බලවේගවාසය, කිමෙක් ද, යට කොට වසන ලද වී ද? එහෙයින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ කාරණයෙහි කුශලයට වඩාත් අකුශලය බලවතර වන්නේ ය යි කියා හෝ බුද්ධබලයට වඩා මාරබලය බලවතර නම් වන්නේ ය යි කියා හෝ මේ විවිධ ස්ථානයෙහි විරුද්ධවාදය පැමිණෙන්නේ ය. එහෙයින් වෘක්ෂයාගේ මුලට වඩා අග භාරතර වන්නේ ය. සම්ප්‍රකීර්ණ වූ සියලු ගුණයට වඩා පාපිබව බලවතර වන්නේ ය'' යි කීහ.

''මහරජානෙනි. එපමණකින් ම කුශලකර්මයට වඩා අකුශලකර්මය බලවතර නම් නො වන්නේ ය. බුද්ධබලයට වඩාත් මාරබලය බලවතර නම් නො වන්නේ ය. එතෙකුදු වුවත් මෙහි කාරණයක් සැලකිය යුත්තේ ය. මහරජානෙනි, යම් සේ පුරුෂයෙක් තෙම චක්‍රවර්ති රජ්ජුරුවන්ට මීපැණි හෝ මීපිඩු හෝ අනිකක් හෝ රාජපඬුරක් ගෙණ එන්නේ වී නම්, රජ්ජුරුවන්ගේ දෙරටුපාලයා 'ඕහට කිසිවක් ලැබේ දෝ හො' යි සිතා ඊර්ෂ්‍යාවෙන් 'පින්වත, රජ්ජුරුවන් දක්නට මේ කල නො වන්නේ ය. එහෙයින් පින්වත, තාගේ පඬුර ගෙණ තට රජ්ජුරුවෝ 'නො කාලේ ආයේ දූ' යි කියා දඬුවම් කරණසේක. ඊට පළමුවෙන් වහ වහා නවතුව' යි කියා මෙසේ කියන්නේ ය. එකල ඒ පුරුෂතෙම දණ්ඩනභයින් තැතිගෙණ කලකිරී ඒ පඬුර ගෙණ විගවිගහට නවත්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ චක්‍රවර්ති මහරජානෝ එපමණ වූ පඬුරු විකලමාත්‍රයකින් ම දෙරටුපාලයාට වඩා දුර්වලතර නම් වන්නාහු ද? අනික් කිසි පඬුරක් හෝ නො ලබන්නාහු ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, ඒ දෙරටුපාලතෙම ඊර්ෂ්‍යා ප්‍රකෘති ව පඬුර වළක්වාලි ය. ස්වාමීනි, අනික් වාසල්දෙරටුවකින් රජ්ජුරුවන්ට සියදහස් ගුණයෙන් පඬුරු පැමිණෙන්නේ ය'' යි කීහ.

''මහරජානෙනි, එපරිද්දෙන් ම ඊර්ෂ්‍යාප්‍රකෘති වූ පවිටු **මාරදිව්‍යපුත්‍ර** තෙම **පඤ්චසාලක**[1] බ්‍රාහ්මණගෘහපතිකයන් නො හැර ම ආවෙස වි ය. එකල 'භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙහි දිව්‍ය ඔජස් බහාලම්හ'යි සිතා වෙනින් නොයෙක් දේවතාවෝ සියදහස් ගණනෙක් අමෘත වූ දිව්‍යඔජස් ගෙණ පැමිණියාහු ඒ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කෙරෙමින්

1. පඤ්චවාලක

වැඳ ගෙණ සිටියාහු ය'' යි වදළ සේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ කාරණය එසේ ම වේවා. ලොකයෙහි උත්තමපුරුෂ වූ භාග්‍යවතුන් වහන්සේට සිවුපසය සුලභ වන්නේ ය. දිව්‍යමනුෂ්‍යයන් විසින් යාච්ඤා කරණ ලද්ද වූ භාග්‍යවතුන් වහන්සේ සිවුපසය වළඳා වදරණසේක. එතෙකුදු වුවත් ඒ මාර තෙම භාග්‍යවතුන් වහන්සේගේ භොජනයට යම් අන්තරායක් කෙළේ ය. එහෙයින් එපමණකින් මාරයාගේ යම් අභිප්‍රාය යෙක් ඇත් නම්, ඒ අභිප්‍රාය සිද්ධ වී ය. මේ කාරණයෙහි, ස්වාමීනි, මාගේ කාංක්ෂාව නො සිඳෙන්නේ ය. එහි විමති උපන්නා වූ මම කාංක්ෂාවට පැමිණියෙමි. තථාගතත්වාදිගුණයෙන් යුක්ත වූ අර්හත්-වාදිගුණයෙන් යුක්ත වූ දෙවියන් සහිත වූ ලොකයෙහි අග්‍රපුද්ගල වූ උතුම් සුචරිතපුණ්‍යමහිමයෙන් ජනිත වූ කිසිවෙකු හා අසම වූ අනුපම වූ ඉතිරි ප්‍රතිවෙධධර්මයක් නැත්තා වූ චතුස්සත්‍යධර්මයන් අවබොධ කළා වූ සම්‍යක්සම්බුද්ධසර්වඥරාජොත්තමයානන් වහන්සේට නින්දිත වූ ලාමක වූ ස්වල්ප වූ පච්වූ වූ උතුම් නො වන්නා වූ මාරතෙම යම් ලාභාන්තරායක් කෙළේ ය. එහි මාගේ සිත නිෂ්ඨාවකට නො පැමිණෙන්නේ ය''යි කීහ.

''මහරජානෙනි, 'අදිට්ඨන්තරාය ය, උද්දිස්සකටන්තරාය ය, උපක්ඛටන්තරාය ය, පරිභොගන්තරාය ය' යි කියා මේ අන්තරායයෝ සතරදෙනෙක. ඒ චතුර්විධඅන්තරායයන් අතුරෙන් අදෘෂ්ටාන්තරාය නම්: 'බුදුන්ට ය යි නියම නො කොට අදර්ශනයෙන් කරණ ලද භොජනය අනුන්ට දීමෙන් කම් කිම් ද?' යි කියා කිසිවෙක් අන්තරාය කරන්නේ ය. මේ අදෘෂ්ටාන්තරාය නම් වන්නේ ය. උද්දිස්සකටන්තරාය නම් කවරේ ද? මේ ලොකයෙහි 'මෙ නම් පුරුෂයාහට ය යි නියම කොට සමහර පුද්ගල යෙකු උදෙසා භොජනය පිළියෙල කරණ ලද වන්නේ ය' යි ඒ භොජනයට කිසිවෙක් අන්තරාය කරන්නේ ය. මේ උද්දිස්සකටන්තරාය නම් වන්නේ ය. උපක්ඛටන්තරාය නම් කවරේ ද? මේ ලොකයෙහි 'යම් කිසි භොජනයක් කරණ ලද වී ද, නො පිළිගන්නා ලද ද, එහි කිසිවෙක් අන්තරාය කරන්නේ ය.' මේ උපක්ඛටන්තරාය නම් වන්නේ ය. පරිභොගන්තරාය නම් කවරේ ද? මේ ලොකයෙහි 'පාරිභොගික වූ යම් කිසි වස්තුවෙක් ඇද් ද, එහි අන්තරාය කරන්නේ ය. මේ පරිභොගන්-තරාය නම් වන්නේ ය.' මහරජානෙනි, මොහු වනාහි චතුර්විධ අන්තරායයෝ ය.

''යම් හෙයකින්[1] වනාහි පාපී වූ **මාරදිව්‍යපුත්‍රතෙම පඤ්චසාලක** බ්‍රාහ්මණගෘහපතිකයන් නො හැර ම ආවෙස වී ද, ඒ අන්තරාය **(171)** භාග්‍යවතුන් වහන්සේගේ පරිභොගඅන්තරායයකුත් නො වන්නේ ය. උපක්ඛටන්තරායයකුත් නො වන්නේ ය. උද්දිස්සකටන්තරායයකුත් නො වන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ කරා නො පැමිණියා වූ අසම්-

1. යම් අන්තරායක්

Non-Commercial Distribution

ප්‍රාප්ත වූ අදර්ශනයෙන් අන්තරායකරණ ලද්දේ ය.[1] ඒ අන්තරාය කළ කාරණය එක ම භාග්‍යවතුන් වහන්සේට ම නො වන්නේ ය. එකල එසමයෙහි යම් භික්ෂුකෙනෙක් බුදුන් කරා පැමිණ සමග නික්මුනාහු ද, ඒ සියලු ම දෙනා වහන්සේත් එදවස් ආහාරය නො ලද්දහු ය. මහරජානෙනි, යමෙක්තෙම ඒ භාග්‍යවතුන් වහන්සේගේ[2] උද්දිස්සකටලාභයකට[3] හෝ උපක්ඛටලාභයකට හෝ පරිභොගයකට[4] හෝ අන්තරාය කෙරේ ද, එබඳු පුද්ගලයෙක් දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බ්‍රහ්මයන් සහිත වූ ලොකයෙහි ද ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත වූ සංවෘතිදෙවියන් හා අවශෙෂ මනුෂ්‍යයන් සහිත වූ සත්වලොකයා අතුරෙහි මම නො දක්නෙමි. ඉදින් කිසිවෙක් බුදුන්ට ඊර්ෂ්‍යාවෙන් උද්දිස්සකටලාභයකට හෝ උපක්ඛට ලාභයකට හෝ පරිභොගයකට හෝ අන්තරාය කෙළේ වී නම්, ඔහුගේ මස්තකය සියක් කඩට හෝ දහසක් කඩට හෝ පැළී යන්නේ ය.

''මහරජානෙනි, තථාගතයානන් වහන්සේගේ කිසිවකු විසින් අනාවරණීය වූ මේ ගුණධර්මසතරෙක. ඒ සතරගුණය කවරේ ද? මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේගේ උද්දිස්සකට වූ උපක්ඛට වූ ලාභය තෙම කිසිවෙකු විසින් අන්තරාය කරන්ට නො හැකි වන්නේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේගේ ශරීරානුගත වූ සරියන් ව්‍යාමප්‍රභා තොම කිසිවෙකු විසින් අන්තරාය කරන්ට නො හැකි වන්නී ය.[5] මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥතාඥනරත්නය කිසිවෙකු විසින් අන්තරාය කරන්ට නො හැකි වන්නේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේගේ ජීවිතයතෙම කිසිවෙකු විසින් අන්තරාය කරන්නට නො හැකි වන්නේ ය. මහරජානෙනි, මේ සතර වනාහි භාග්‍යවතුන් වහන්සේගේ කිසිවෙකු විසින් අනාවරණීය වූ ගුණයෝ ය.

''මහරජානෙනි, මෙ කී මේ සියලු ගුණයෝ අවිනාශගුණයෙන් යුක්ත බැවින් එකකෘත්‍යයෝ ය. අන්තරායරොගයක් නැති වන බැවින් අරොගයෝ ය. කොප්‍යය කළ නො හැකි බැවින් අකොප්‍යයෝ ය. පරොපක්‍රමයෙන් නො මැඩෙන බැවින් අපරොපක්‍රමයෝ ය. අන්‍ය ක්‍රියාවක් නො වැදගන්නා බැවින් අවුසනක්‍රියාවෝ ය. මහරජානෙනි, පවිටු වූ මාරතෙම අදර්ශනයෙන් නො පෙණී සැහවී ඉඳ **පඤ්චසාලක** බ්‍රාහ්මණගෘහපතිකයන්ට ආවෙස වී ය. මහරජානෙනි, යම් සේ රජ්ජුරුවන්ගේ විෂම වූ ප්‍රත්‍යන්ත දෙශයෙහි සොරු නො පෙණීමෙන් සැහවී හිඳ මාර්ගය දූෂණය කරන්නාහු ය. ඉදින් රජ්ජුරුවෝ ඒ සොරුන් දක්නාහු වූ නම් කිමෙක් ද, ඒ සොරු සැපතක් ලබද් ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, පොරොවින් සියක්වර හෝ දහසක් කඩ කොට හෝ පළවන්නෝ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම පාපී වූ මාරතෙම රහසින් සැහවී හිඳ **පඤ්චසාලක** බ්‍රාහ්මණගෘහපතිකයන් නො හැර ආවේස වී ය.

1. මෙහිද පරිවර්තනයෙහි වැරැදි තිබේ. 2. වහන්සේට 3. ලාභයක්
4. පරිභොගයක් 5. වන්නේ ය

Non-Commercial Distribution

''තවද, මහරජානෙනි, යම් සේ පුරුෂයා ඇති ස්ත්‍රීතොම නො පෙණී මෙන් සැඟවී හිඳ පරපුරුෂයන් සේවනය කරන්නී ද, එපරිද්දෙන් ම, මහරජානෙනි, අදර්ශනයෙන් පාපී වූ මාරතෙම සැඟවී හිඳ **පඤ්චසාලක** බ්‍රාහ්මණගෘහපතිකයන් නො හැර ම ආවේස වි ය. ඉදින්, මහරජානෙනි, **(172)** ස්ත්‍රීතොම ස්වාමිපුරුෂයාගේ සම්මුඛභාවයෙහි දී පරපුරුෂයන් සේවනය කරා නම්, කිමෙක් ද, ඒ ස්ත්‍රීතොම සැපතක් ලබා ද?'' යි විචාළ සේක. ''නැත, ස්වාමීනි, ස්වාමිපුරුෂතෙම ඇ නසන්නේ හෝ ය. වධ කරන්නේ හෝ ය. දඬු කොට බඳින්නේ හෝ ය. දසිත්වයට හෝ පමුණුවන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අදර්ශනයෙන් පාපී වූ මාරතෙම සැඟවී හිඳ **පඤ්චසාලක** බ්‍රාහ්මණගෘහපතිකයන් නො හැර ම ආවේස වි ය. ඉදින්, මහරජානෙනි, පාපී වූ මාරතෙම භාග්‍යවතුන් වහන්සේ උදෙසා කළ භොජනයක් හෝ සමීප කොට පිරිනැමූ උපක්ඛට භොජනයක් හෝ පරිභොග කරණ දෙයක් හෝ අන්තරාය කරන්නේ වී නම්, ඔහුගේ මස්තකය සියක්කඩ ව හෝ දහසක්කඩ ව හෝ පැළී යන්නේ ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ එසේ ම ය. පාපි වූ මාරයා විසින් මේ ආහාරය වැළකූ කාරණය සොරකමින් ම කරණ ලද්දේ ය. පවිටුමාරතෙම සැඟවී හිඳ **පඤ්චසාලක** බ්‍රාහ්මණගෘහ පතිකයන් නො හැර ම ආවේස වි ය. ඉදින්, ස්වාමීනි, ඒ පවිටු මාරතෙම භාග්‍යවතුන් වහන්සේගේ තමන් උදෙසා කළ දෙයක් හෝ සමීප ව කෘත දෙයක් හෝ පරිභොගදෙයක් හෝ අන්තරාය කරන්නේ වී නම්, ඔහුගේ මස්තකය සියක්කඩ ව හෝ සහස්‍රකඩ ව හෝ පැළෙන්නේ ය. ඔහුගේ ශරීරය හෝ බොල්මිටක් මෙන් විසිර යන්නේ ය'' (යි වදළසේක.) ''සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ වදළ මේ කාරණය එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කියා ස්තුති කළහ.

**ප්‍රත්‍යයලාභප්‍රශ්නය නිමි**

---

# අනාපත්තිප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ 'නො දැන යමෙක් ප්‍රාණාතිපාතය කරන්නේ ද, එතෙම බලවත් වූ අපුණ්‍යය රැස් කරන්-නේ ය' යි කියනසේක. නැවත ද ඔබගේ භාග්‍යවතුන් වහන්සේ විසින් විනයප්‍රඥප්තියෙහි 'මෙනම් සත්වයා මරමි' යි කියා නො දන්නාහට ආපත්ති නැතැ' යි කියා වදරණ ලද්දේ ය. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නො දැන ප්‍රාණාතිපාතය කෙරෙමින් බලවත් වූ අකුසල් රැස් කරන්නේ වී නම්, එහෙයින් 'අනාපත්ති අජානන්තස්ස' කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'අනාපත්ති **අජානන්තස්ස**' කියා වදළ වචනය සැබෑ වී නම්, එහෙයින් 'අජානිත්වා පාණාතිපාතං කරොන්තො බලවතරං අපුඤ්ඤං පසවති' යි කියා වදළ



Non-Commercial Distribution

වචනය බොරු වන්නේ ය. මේත් උභතොකොටිකප්‍රශ්නයෙක. උත්තරවිරහිත වූ, කිසිවකු විසින් අතික්‍රමණය කළ නො හැකි බැවින් දුරතික්‍රම වූ, ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් **'යො අජානන්තො පාණාතිපාතං කරොති, සො බලවතරං අපුඤ්ඤං පසවති'** ති යනු වදරණ ලද්දේ ය. නැවැත විනයප්‍රඥප්තියෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් 'අනාපත්ති අජානන්තස්ස' කියා වදරණ ලද්දේ ය. ඒ වදාළ දෙශනායෙහි අර්ථවිශෙෂයෙක් ඇත්තේ ය. කවර නම් අර්ථ විශෙෂයෙක් ද? යත්—

''මහරජානෙනි, චිත්තාංගයාගේ අභාවයෙන් **(173)** මිදෙන බැවින් 'සඤ්ඤාවිමොක්ඛ' නම් වූ ආපත්තිත් ඇත්තේ ය. චිත්තාංගයාගේ අභාවයෙන් නො මිදෙන බැවින් 'නොසඤ්ඤාවිමොක්ඛ' නම් ආපත්තිත් ඇත්තේ ය. මහරජානෙනි, යම් මේ ආපත්තියක් සඤ්ඤාවිමොක්ඛ වී ද, ඒ ආපත්තිය අරහයා **විශාලාමහානුවර** භික්ෂාවෙහි ගිය භික්ෂුනමෙක් පුටුවක් පිට රෙද්දක් වසා හුන් බිළිඳකු හිඳ මරා පසු ව දැන 'පාරාජික' වන්නෙම් දෝ හො' යි මහාශොකයෙන් බුදුන් කරා ගොස් සැළකෙළේ ය. එසේ ම භික්ෂුනමෙක් විෂමිශ්‍රභොජනයක් ලදින් වෙහෙරට ගෙණ ගොස් විෂමිශ්‍රබව නො දැන සභාගභික්ෂුනමකට වළඳවා විෂයෙන් මළ කල මහාශොකයෙන් බුදුන් කරා ගොස් සැළකෙළේ ය, එකල බුදුහු 'මහණෙනි, තෙපි දනු දැ?' යි විචාරා 'අනේ! ස්වාමීනි, අපි නො දනුම්හ'යි කී කල මේ ප්‍රයොගයෙන් මේ සත්වයා නස්නේ ය' යි කියා නො දැන්නහුගේ ප්‍රයොගයකින් අනුන් මළ ද වරද නැති බැවින් භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, නො දන්නාහට අනාපත්තිය' යි වදරණ ලද්දේ ය. ආසනයෙහි පරීක්ෂාකාරී නො වී හුන් භික්ෂූහු අරහයා, 'මහණෙනි, ගෘහස්ථයන් විචාරා ම ආසනයෙහි හුන මැනව. යමෙක් නො විචාරා ආසනයෙහි හුන්නේ වී නම්, ඕහට දුක්කටාපත්තියක් වන්නේ ය' යි දුක්කටයක් පණවා වදාළසේක. මෙසේ ඉදින් ස්වාමීනි, 'නො දැන ප්‍රාණඝාත කළාහට අකුසල් බොහෝ වන්නේ ය' යි කියා වදාළ කාරණය සැබෑ වී නම්, ඒ විනයප්‍රඥප්තියෙහි එම 'ප්‍රාණඝාතය නො දැන කළාහට ආපත්තිය නැතැ' යි කියා වදාළ වචනය බොරු වන්නේ ය,'' යනාදීන් විචාළ රජහට ''මහරජානෙනි, අකුශලවිපාකය නො දැන ප්‍රාණඝාත කළාහට පව් බොහෝ වන නියාවත් සැබෑ ම ය. විනයප්‍රඥප්තියෙහි 'මෙනම් ප්‍රයොගයෙන් ජීවිතයක් නස්නේ ය' යි කියා නො දන්නා භික්ෂුහටත් අනාපත්ති ය යි වදාළ කාරණයත් සැබෑ ම ය'' යි කියා වදාළ කල්හි අතිප්‍රසන්න වූ මිලිඳු මහරජානෝ ''සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ කාරණය එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

**අනාපත්තිප්‍රශ්නය නිමි.**

*Non-Commercial Distribution*

# පිරිස් පරිහරණ ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'ආනන්දයෙනි, තථාගතයන් වහන්සේට වනාහි 'මම භික්ෂුසංඝයා පරිහරණය කෙරෙමි' යි කියා හෝ 'භික්ෂුසංඝතෙම මා ම උද්දෙසක[1] කොට ඇත්තේ ය යි කියා හෝ මෙබඳු සිතෙක් නො වන්නේ ය' යි කියා මේ කාරණය වදාරණ ලද්දේ ය. නැවැත ද මෛත්‍රෙය නම් භාග්‍යවතුන් වහන්සේගේ ස්වභාව ගුණය දක්වා වදාරණ භාග්‍යවතුන් වහන්සේ විසින් 'දැන් මම යම් සේ නොයෙක් සියගණන් භික්ෂුසංඝයා පරිහරණය කෙරෙම් ද, එසේ ම ඒ මෛත්‍රෙය ද්විපදෙත්තමයානෝ අනෙකසහස්‍ර ගණන් භික්ෂුසංඝයා පරිහරණය කරණසේකැ' යි කියා මෙසේ වදාරණ ලද්දේ ය. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයානන් වහන්සේ විසින් 'තථාගතස්ස ඛො ආනන්ද න එවං හොති, අහං භික්ඛු සංඝං පරිහරාමීති වා මමුද්දෙසිකො භික්ඛුසංඝොති වා' යි කියා වදාරණ ලද්දේ **(174)** වී නම්, එහෙයින් මෛත්‍රෙය සර්වඥයන් වහන්සේගේ ස්වභාව ගුණය දක්වා වදාරණ භාග්‍යවතුන් වහන්සේ විසින් 'සො අනෙක සහස්සං භික්ඛුසංඝං පරිහරිස්සති, සෙය්‍යථාපි අහං එතරහි අනෙකසතං භික්ඛුසංඝං පරිහරාමි' යි කියා වදළ වචනය බොරු වන්නේ ය. ඉදින් මෛත්‍රෙය භාග්‍යවතුන් වහන්සේගේ ස්වභාව ගුණය දක්වා වදාරණ භාග්‍යවතුන් වහන්සේ විසින් 'සො අනෙකසහස්සං භික්ඛුසංඝං පරිහරිස්සති සෙය්‍යථාපි අහං එතරහි අනෙකසතං භික්ඛුසංඝං පරිහරාමි' යි කියා වදළ වචනය සැබැ වී නම්, 'එහෙයින් තථාගතස්ස ඛො ආනන්ද න එවං හොති අහං භික්ඛුසංඝං පරහරාමීති වා මමුද්දෙසිකො භික්ඛුසංඝොති' කියා වදළ වචනය බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නයත් නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'ආනන්දයෙනි, තථාගතයන් වහන්සේගේ වනාහි 'මම භික්ෂුසංඝයා පරිහරණය කෙරෙමි' යි කියා හෝ 'භික්ෂුසංඝතෙම මා උද්දෙස කොට ඇත්තේ ය'යි කියා හෝ මෙසේ සිතෙක් නො වන්නේ ය' යි කියා මේ කාරණයත් වදාරණ ලද්දේ ය. මෛත්‍රෙය නම් ද්විපදෙත්තමයානන් වහන්සේගේ ස්වභාවගුණය දක්වා වදාරණ භාග්‍යවතුන් වහන්සේ විසින් 'දැන් මම යම් සේ නොයෙක් සියගණන් භික්ෂුසංඝයා පරිහරණය කෙරෙම් ද, එසේ ම ඒ මෛත්‍රෙය ද්විපදෙත්තමයානෝ නොයෙක් දහස්ගණන් භික්ෂුසංඝයා පරිහරණය කරණ සේකැ' යි කියාත් වදාරණ ලද්දේ ම ය. මහරජානෙනි, ඒ වදළ දෙශනායෙහි ද ප්‍රශ්නයෙක් ඇත. එක් අර්ථයෙක් සාවශෙෂ ය. එක් අර්ථයෙක් නිරවශෙෂ ය. මහරජානෙනි, තථාගතයන් වහන්සේ පිරිස හා අනුගාමික නො වනසේක. පිරිස වනාහි තථාගතයන් වහන්සේට

1. උද්දෙසික

Non-Commercial Distribution

අනුගාමික වන්නාහ. මහරජානෙනි, මේ කාරණයතෙම සම්මුතියෙක. 'මම ය කියා හෝ මාගේ ය' යි කියා හෝ මේ තෙම පරමාර්ථයෙක් නො වන්නේ ය. මහරජානෙනි, තථාගතයන් වහන්සේගේ ප්‍රේමය පහ වන ලද්දේ ය. ස්නේහය ද පහ ව ගියේ ය. 'මාගේ ය' යි කියා තථාගතයන් වහන්සේගේ ග්‍රහණයක් නැත්තේ ය. ගැණීම පිණිස වනාහි ලොකයහට පිහිට වනසේක. ආධාර වනසේක. මහරජානෙනි, යම් සේ පෘථිවිතොම භූමියෙහි වසන සියලු සත්වයන්ට ප්‍රතිෂ්ඨා වන්නී ද, ආවාසය වන්නී ද, මහරජානෙනි, පෘථිවියෙහි සිටින්නා වූ 'මේ සකල සත්වයෝ මාගේ ය' යි කියා සිතිවිල්ලක් වත් පෘථිවියගේ අපෙක්ෂාවෙක් වත් නො ම ඇති වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ සියලු ම සත්වයන්ට ප්‍රතිෂ්ඨා වනසේක. මේ සකල සත්වයෝ තථාගතයන් වහන්සේ නිසා සිටින්නාහ. තථාගතයන් වහන්සේට මොවුහු 'මාගේ ය' යි කියා අපෙක්ෂාවක් නො වන්නේ ය.

''මහරජානෙනි, යම් සේ මහත් වූ මහාමෙඝයෙක් වර්ෂා කෙරෙමින් තෘණ වෘක්ෂ ලතා ගව මහිෂ මනුෂ්‍යයන්ට මහත් වෘද්ධිය දෙන්නේ ය. සන්තතිය පාලනය කරන්නේ ය. සියලු ම මේ සත්වයෝ වෘෂ්ටිය[1] ම උපජීවනය කොට ඇත්තාහු ය. මහාමෙඝයාහට මේ සත්වයෝ 'මාගේ ය' යි කියා අපෙක්ෂාවක් නො වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ සකල සත්වයන්ගේ **(175)** කුශල ධර්මය උපදවන්නේ ය. උපන් කුශලධර්මය පාලනය කරන්නේ ය. මේ සකල සත්වයෝ ම සර්වඥයන් වහන්සේ නමැති[2] වෘෂ්ටිය උප ජීවනය කොට ඇත්තාහු ය. මොවුහු 'මාගේ ය' යි කියා තථාගතයන් වහන්සේට අපෙක්ෂාවෙක් නො වන්නේ ය. ඊට කාරණා කවරේ ද? යත්:— 'සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වූ බැවිනැ'' යි වදළසේක. එකල රජ්ජුරුවෝ ''සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්නය තෙම බහුවිධ වූ කාරණයෙන් සුනිර්වෙඨනය කරණ ලද්දේ ය. ගම්භීරය උත්තානී කරණ ලද්දේ ය. ගණ්ඨිය බිඳින ලද්දේ ය. ගහනය අගහනය[3] කරණ ලද්දේ ය. අන්ධකාරයෙහි ආලොකය කරණ ලද්දේ ය. පරවාද බිඳිනා ලද්දේ ය. සර්වඥපුත්‍රවරුන්ට ප්‍රඥචක්ෂුස උපදවන ලද'' යි ස්තුති කළහ.

**පිරිස්පරිහරණ ප්‍රශ්නය නිමි.**

---

# අභෙද්‍යපිරිස් ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ 'තථාගතයන් වහන්සේ අභෙද්‍යපිරිස් වූසේකැ' යි කියනසේක. නැවත ද දෙවදත්ත තෙරුන් වහන්සේ විසින් 'පන්සියයක් භික්ෂූන් එක පහරින් බිඳින ලද' යි

1. වෘද්ධිය  2. වහන්සේගේ  3. ග්‍රහණය අග්‍රහණය

Non-Commercial Distribution

කියනසේක. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ අභෙද්‍යපිරිස් ඇතිසේක් වූ නම්, එහෙයින් දෙවදත්තයන් විසින් 'එකපහරින් පන්සියයක් භික්ෂූහු බිඳින ලද්‍ද' යි කී යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'දෙවදත්තෙන එකප්පහාරෙන පඤ්චභික්ඛුසතානි භින්නානි' යි කී වචනය සැබෑ වී නම්, එහෙයින් 'තථාගතො අභෙජ්ජපරිසො' යි කී වචනය බොරු වන්නේ ය. නුඹ වහන්සේ කරා පැමිණියා වූ මේ උභතොකොටිකප්‍රශ්නය ද අතිගම්භීර වන්නේ ය. අවිශදබුද්ධියකු විසින් නිර්වෙඨනය නො කළ හැකි බැවින් උනා ලිය නො හැකි ගණ්ඨියකටත් වඩා ගණ්ඨිතරයෙක. මේ ප්‍රශ්න යෙහි[1] මේ ලෝවැසිතෙම විමතියෙන් ආවෘත වන ලද්දේ ය. නිවෘත වන ලද්දේ ය. වැසෙන ලද්දේ ය. වලඳනා ලද්දේ ය. එහි නුඹ වහන්සේගේ ඤාණබලය පරවාදනිග්‍රහයෙහි දක්වා වදළ මැනැවැ'' යි කීහ.

''මහරජානෙනි, තථාගතයන් වහන්සේ අභෙද්‍යපිරිස් ඇතිසේක. දෙවදත්තතෙරුන් වහන්සේ විසින් ද එක පැහැර පන්සියයක් භික්ෂූහු බිඳින ලද්දහු ය. ඒ බිඳුනු කාරණය භෙදකයාගේ බලයෙක් වන්නේ ය. මහරජානෙනි, භෙදකයන් ඇති කල්හි නො බිඳෙන පිරිසෙක් නම් නැත්තේ ය. භෙදකයන් ඇති කල්හි මෑනියෝ පුත්‍රයා හා බිඳෙන්නාහ. පුත්‍රයාත් මෑනියන් හා බිඳෙන්නේ ය. පියානෝත් පුත්‍රයා හා බිඳෙන්නාහ. පුත්‍රයාත් පියානන් හා බිඳෙන්නේ ය. බෑයාත් නැගනියන් හා බිඳෙන්නේ ය. නැගනියෝත් බෑයා හා බිඳෙන්නාහ. යහළුවාත් යහළුවා හා බිඳෙන්නේ ය. නොයෙක් දරුසමූහයෙන් සංඝටිත වූ නැවත් රළවෙග ප්‍රහාරයෙන් බිඳෙන්නේ ය. මී හා සමාන රස ඇති ඵලසම්පන්න වූ වෘක්ෂය වාතබලවෙගයෙන් ඇඹර වී බිඳෙන්නේ ය. ජාතිමත් ස්වර්ණයත් ලොහයෙන් බිඳෙන්නේ ය. මහරජානෙනි, එතෙකුදු වුවත් තථාගතයන් වහන්සේ 'භෙද්‍යපිරිස් ඇතිසේකැ' යි කියන්නා වූ මේ අභිප්‍රාය නුවණැත්තන්ගේ අභිප්‍රායයෙක් නො වන්නේ ය. මෝ තොමෝ ගුණනුවණින් **(176)** වැඩි සිටි වෘද්ධයන්ගේ අධිමුත්තියක් නො වන්නීය. මේ තෙම පණ්ඩිතවරුන්ගේ ආලයෙක් නො වන්නේ ය. එතෙකුදු වුවත් මෙහි යම් කාරණයකින් තථාගතයන් වහන්සේ 'අභෙද්‍යපිරිස් ඇතිසේකැ' යි කියා කියනු ලැබේ ද, එබඳු වූ කාරණයක් ඇත්තේ ය. මෙහි ඒ කාරණය කවරේ ද? යත්:— මහරජානෙනි, තථාගතයන් වහන්සේගේ කරණ ලද අදන[2] ක්‍රියාවකින් හෝ අප්‍රියවචනයෙකින් අනර්ථචර්යාවකින් හෝ අසමානාත්මතාවකින් හෝ යම් කිසි හෙයකින් හැසිර වදරන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ පිරිස බිඳෙන ලද යි කියා මා විසින් නො අසන ලද්දේ ය. ඒ කාරණයෙන් 'තථාගතයන් වහන්සේ අභෙද්‍යපිරිස් වූසේකැ'යි කියනු ලැබෙයි. මහරජානෙනි, මේ කාරණය තොප විසිනුත් දත යුත්තේ ය. නවාංගශාසනබුද්ධවචනයෙහි පෙර බොධිසත්වයන් වහන්සේ විසින් කරණ ලද්ද වූ මෙනම් කාරණයෙන් තථාගතයන් වහන්සේගේ

1. ප්‍රශ්නය 2. අදි

Non-Commercial Distribution

'පිරිස බිඳෙන ලදූ' යි කියා සූත්‍රයෙහි ආවා වූ කිසිවක් ඇසූයේ ඇද් දූ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, මෙබන්දක් ලොකයෙහි නො ම දක්නා ලැබෙයි. අසනුත් නො ලැබෙයි. යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ වදළ මේ කාරණය එපරිද්දෙන් පිළිගන්නෙමි'' යි කීහ.

**අභෙද්‍යපිරිස් ප්‍රශ්නය නිමි.**

**සකලජනමනොනන්දනීය වූ මෙණ්ඩකප්‍රශ්න**
**නම් වූ මේ ශ්‍රීසද්ධර්මාදසයෙහි**
**දෙවෙනි වර්ගය නිමියේ ය.**

---

# ශ්‍රෙෂ්ඨධර්ම ප්‍රශ්නය

නැවතත් මිලිඳු මහරජානෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අග්ගඤ්ඤසූත්‍රයෙහි වාසෙට්ඨ නම් බ්‍රාහ්මණයා හට **'වාසෙට්ඨයානෙනි,** 'මේ ජනසමූහයා කෙරෙහි ඉහාත්මභාවයෙහි ද, පරලෙව්හි ද ගුණධර්මය වනාහි ශ්‍රෙෂ්ඨ ය' යි කියා මෙම වචනය වදරණ ලද්දේ ය. නැවැතත් එම බුදුමුඛයෙන් ම 'වසන ලද සතර අපායද්වාරයන් ඇත්තා වූ සම්‍යක්දෘෂ්ටියගේ වශීප්‍රාප්ත වූ සර්වඥනුශාසනාව දැන ගත්තා වූ එහෙයින් ම සෝවාන් වූ ගෘහස්ථ වූ උපාසකතෙම පෘථග්ජන වූ උපසම්පන්න නමක් වුවත් සාමණේරනමක් වුවත් පසඟ පිහිටුවා වඳින්නේ ය. දැක ආසනයෙන් නැඟී සිටින්නේ ය' යි කියාත් වදරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'ධම්මො හි වාසෙට්ඨ සෙට්ඨො ජනෙතස්මිං දිට්ඨෙ ච ධම්මෙ අභිසංපරායෙ චා' යි කියා වදරණ ලද්දේ සැබෑ වී නම් එහෙයින් 'උපාසකො ගිහී සොතාපන්නො පිහිතාපායො දිට්ඨිප්පත්තො විඤ්ඤාතසාසනො භික්ඛුං වා සාමණෙරං වා පුථුජ්ජනං අභිවාදෙති පච්චුට්ඨෙති' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචන බොරු වන්නේ ය. ඉදින් 'උපාසකො ගිහී සොතාපන්නො පිහිතාපායො දිට්ඨිප්පත්තො විඤ්ඤාතසාසනො භික්ඛුං වා සාමණෙරං වා පුථුජ්ජනං අභිවාදෙති පච්චුට්ඨෙති' යි කියා වදළ වචනය සැබෑ වී නම්, එහෙයින් 'ධම්මො හි වාසෙට්ඨ සෙට්ඨො ජනෙතස්මිං දිට්ඨෙච ධම්මෙ අභිසම්පරායෙ චා' යි කියා වදළ වචනය බොරු වන්නේ ය (177) මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඒ ප්‍රශ්නයතෙම ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

'මහරජානෙනි; අප භාග්‍යවතුන් වහන්සේ විසින් වාසෙට්ඨ නම් බ්‍රාහ්මණයාහට 'වාසෙට්ඨය, මේ ලොකවාසී ජනයා කෙරෙහි ඉහාත්මභාවයෙහි ද පරලෙව්හි ද ධර්මය වනාහි ශ්‍රෙෂ්ඨ වන්නේ ය' යි කියාත් මෙම වචනය වදරණ ලද්දේ ය. නැවැත ද 'වසන ලද සතරඅපායයන්

Non-Commercial Distribution

ඇත්තා වූ දෘෂ්ටියගේ වශීප්‍රාප්ත වූ සර්වඥනුශාසනාව දැන ගත්තා වූ සෝවාන් ගෘහස්ථඋපාසකතෙම පෘථග්ජනඋපසම්පන්න නමකට හෝ සාමණේරනමකට හෝ පසඟ පිහිටුවා වඳින්නේ ය. දැක ආසනයෙන් නැඟී සිටින්නේ ය' යි කියාත් වදාරණ ලද්දේ ම ය. එහි කාරණයක් ඇත. ඒ කාරණය කවරේ ද? යත්:— මහරජානෙනි, යම් ගුණධර්ම කෙනෙකුන් කරණ කොට ගෙණ ශ්‍රමණතෙම අභිවාදන ප්‍රත්‍යුපස්ථාන සම්මාන පූජනයට සුදුසු වේ ද, ශ්‍රමණයාගේ ශ්‍රමණකරණධර්මයෝ ඒ මේ විසිදෙනෙක් වෙති. වේසයෝ ද විවිධ වන්නාහු ය.

**"කතමෙ වීසති සමණස්ස සමණකරණා ධම්මා ද්වෙ ච ලිඞ්ගානි? සෙට්ඨභූමිසයො[1] අග්ගො නියාමො[2] චාරො විහාරො සංයමො සංවරො ඛන්ති සොරච්චං එකත්තචරියා එකත්තාභිරති පටිසල්ලානං හිරිඔත්තප්පං විරියං අප්පමාදො සික්ඛාපදුනං උද්දෙසො පරිපුච්ඡා සීලාභිරති නිරාලයතා සික්ඛාපදපරිපූරිතා කාසාවධාරණා භණ්ඩුභාවො, ඉමෙ ඛො, මහාරාජ, වීසති සමණස්ස සමණකරණා ධම්මා ද්වෙ ච ලිඞ්ගානි."**

'ඒ ද්විවිධ ලිඟු හා ශ්‍රමණයාගේ ශ්‍රමණකරණ ධර්මයෝ විසිදෙන කවර? යත්:— බුද්ධාදී ආර්යයන් විසින් පසස්නා ලද බැවින් ගෘහස්ථයන්ට වඩා ප්‍රශස්ත වූ ගුණයෙන් යුක්ත බව ය[3], කායවාචා මනස්සංඛ්‍යාත ත්‍රිවිධද්වාරය ක්ලෙශසංසර්ගයෙන් නො ඉසිලී ම ය, ශ්‍රේෂ්ඨගුණයෙන් යුක්තබව ය, නිවන් දෙන ප්‍රතිපත්තියෙන් යුක්තබව ය, ප්‍රතිපත්තියෙහි හැසිරීමෙන් යුක්තබව ය, සන්හුන් ඊර්යාපථවිහරණයෙන් යුක්තබව ය, කායවාක් සංයමයෙන් යුක්තබව ය, ඉන්ද්‍රියසංවරයෙන් යුක්තබව ය, ක්ෂාන්තියෙන් යුක්තබව ය, සුවච කීකරු භාවයෙන් යුක්තබව ය, එකලා ව හැසිරීමෙන් යුක්ත බව ය, එකලා ව හැසිරීමෙහි ඇලීමෙන් හා කාය විවේකයෙන් යුක්තබව ය, චිත්තෛකාග්‍රතාවෙන් යුක්තබව ය, පාපයෙහි ලජ්ජා භයින් යුක්තබව ය, නිවන් සාධන සතර සම්‍යක්ප්‍රධානවීර්යයෙන් යුක්තබව ය, නිවන් සොයන අප්‍රමාදස්මෘතියෙන් යුක්තබව ය, ශික්ෂා පදයන්ගේ ඉගෙණීම ය, ශික්ෂාපදයන්ගේ අර්ථ විචාරීම ය, ශීලාදිගුණ ධර්මයෙහි ඇලීම ය, පඤ්චකාමයෙහි ඇලුම් නැති බව ය, ප්‍රඥප්තශික්ෂාපද සම්පූර්ණ කොට ඉගෙණීම ය, සිවුරු ධාරණයෙන් යුක්තබව ය, හිස මුඩු බව ද යි යන මේ විසි ගුණය වනාහි, මහරජානෙනි, ශ්‍රමණයාගේ ද්විවිධ වූ වේසය හා ශ්‍රමණකරණධර්මයෝ' යි.

'භික්ෂූන් වහන්සේ මේ යථොක්ත වූ ගුණධර්මයන් සමාදන් ව ගෙණ පවත්වනසේක. ඒ භික්ෂුතෙම ඒ ගුණධර්මයන්ගේ අනූන බැවින් පරිපූර්ණ

1. සෙට්ඨයො සමො 2. සංයමො

3. 'ගෘහස්ථයන්ට වඩා ශ්‍රේෂ්ඨ වූ ප්‍රව්‍රජ්‍යා භූමියෙහි සිටින බව ය' යි පරිවර්තනය විය යුතු ය.

Non-Commercial Distribution

බැවින් සම්පන්න බැවින් සමන්නාගත බැවින් හික්මීමට ඉතිරි දෙයක් නැති බැවින් අසෙඛභූමි නම් වූ අරහත්තභූමියට පැමිණෙන්නේ ය. ශ්‍රේෂ්ඨ වූ අමෘතමහාඅවකාශභූමියට පැමිණෙන්නේ ය. **(178)** මහරජානෙනි, මහණ වීමෙන් රහතුන්ගේ ආසන්නයට ගියසේකැ' යි කියා සෝවාන් උපාසකතෙම පෘථග්ජනභික්ෂුනමට පසඟ පිහිටුවා වඳින්නට ද දූක ආසනයෙන් නාඟී සිටින්නට ද සුදුසු වන්නේ ය. 'ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා හා යම් භික්ෂුනමෙක් සමාන බවට පැමිණිසේක් ද, ඒ සාමග්‍රී ලාභය මට නැතැ' යි සිතා සෝවාන් වූ උපාසකතෙම පෘථග්ජන භික්ෂුනමට අභිවාදනය කරන්නට ද ආසනයෙන් නැඟී සිටින්ට ද සුදුසු වන්නේ ය. 'උන්වහන්සේ රහතුන්ගේ අග්‍රපිරිසට පැමිණිසේක. මම ඒ ඉසුරට නො පැමිණියෙමි' යි සිතා සෝවාන් උපාසකතෙම පෘථග්ජනභික්ෂුනමට වඳින්නට ද ආසනයෙන් නැඟී සිටින්නට ද සුදුසු වන්නේ ය. 'උන්වහන්සේ පොහොය කෙරෙමින් පාමොක්දෙශනාව අසන්ට ලබනසේක. මම ඒ දෙශනාව අසන්ට නො ලබමි' යි සිතා සෝවාන් වූ උපාසකතෙම පෘථග්ජනභික්ෂුනමට වඳින්නට ද ආසනයෙන් නැඟී සිටින්නට ද සුදුසු වන්නේ ය. 'උන්වහන්සේ දශවයස් පිරි උපාධ්‍යාය ව කර්මාචාර්ය ව සෙස්සන් මහණ කරණසේක. නිසදෙනසේක. උපසම්පද කරණසේක. ජිනශාසනය වර්ධනය කරණසේක. මෙබඳු කට යුතු කරන්නට මම නො ලබමි' යි සිතා සෝවාන් වූ උපාසකතෙම පෘථග්ජනභික්ෂුනමට වඳින්නට ද ආසනයෙන් නැඟී සිටින්නට ද සුදුසු වන්නේ ය. 'උන්වහන්සේ අප්‍රමාණ වූ ශික්ෂාපදයෙහි සම්පූර්ණකාරි වනසේක. මම ඒ ශික්ෂාපදයන් කෙරෙහි නො පවත්නෙමි' යි සිතා සෝවාන් වූ උපාසකතෙම පෘථග්ජනභික්ෂුනමට වඳින්නට ද ආසනයෙන් නැඟී සිටින්නට ද සුදුසු වන්නේය. 'උන්වහන්සේ ශ්‍රමණවෙශයට පැමිණෙමින් බුද්ධාභිප්‍රායෙහි සිටිසේක. මම ඒ ශ්‍රමණවෙශයෙන් දුරට පහ ව ගියෙමි' යි සිතා සෝවාන් වූ උපාසකතෙම පෘථග්ජනතෙම භික්ෂූනමට පසඟ පිහිටුවා වඳින්නට ද දූක ආසනයෙන් නැඟී සිටින්නට ද සුදුසු වන්නේ ය. 'උන්වහන්සේ දික් වූ කක්ෂලොමයන් ඇතිසේක. වස්ත්‍රාභරණයෙන් හා අඳුන් නො ඇඳීම් නො සැරසීම් ඇතිසේක. ආලෙප වූ ශීලසුගන්ධයන් ඇතිසේක. මම වනාහි මණ්ඩනාභරණයෙහි ඇලුම් ඇත්තේමි' යි සිතා සෝවාන් වූ උපාසකතෙම පෘථග්ජනභික්ෂුනමට වඳින්නට ද දූක ආසනයෙන් නැඟී සිටින්නට ද සුදුසු වන්නේ ය. මහරජානෙනි, එතෙකුදු වුවත් 'යම් ඒ විසිවැදෑරුම් වූ ශ්‍රමණකරණධර්මකෙනෙක් ඇද් ද, ද්විවිධ වෙගයෙක් ඇද් ද, සියලු ම ඒ ගුණධර්මයෝ භික්ෂූහු කෙරහි පවත්නාහ. භික්ෂූහු ම ඒ ධර්මයන් ධරණසේක. සෙස්සනුත් එහි හික්මවන සේක. ඒ ආගමධාරණය ද හික්මවා ලීම ද මට නැතැ' යි සිතා සෝවාන් වූ උපාසකතෙම පෘථග්ජනභික්ෂුනමට බැස වඳින්නට ද දූක නැඟී සිටින්නට ද සුදුසු වන්නේ ය.

*Non-Commercial Distribution*

''තවද, මහරජානෙනි, යම් සේ රාජකුමාරතෙම පුරොහිතයාගේ සමීපයෙහි විද්‍යාව උගන්නේ ය. රාජධර්මය ශික්ෂණය කරන්නේ ය.[1] ඒ රාජකුමාරතෙම මෑතභාගයෙහි පිය රජ්ජුරුවන්ගේ ඇවෑමෙන් රාජාභිෂෙකයට පැමිණ 'මේ තෙම මාගේ ශික්ෂක[2] ගුරුන්වහන්සේ ය' යි සිතා ගුරුවරයාට බැස වඳින්නේ ය. දූක ආසනයෙන් නැඟී සිටින්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ශික්ෂක වූ 'මූන්වහන්සේ (179) ශාසන වංශය ධරණසේකැ' යි සිතා සෝවාන් වූ උපාසකතෙම පෘථග්ජනභික්ෂු නමට බැස වඳින්නට ද දූක ආසනයෙන් නැඟී සිටින්නට ද සුදුසු වන්නේ යි.

''තවද, මහරජානෙනි, භික්ෂුභූමියෙහි මේ මහත්බව ද අසමවිපුල බව ද මේ කාරණයෙනුත් දත ගත මැනැව. ඉදින්, මහරජානෙනි, සෝවාන් ව සිටි උපාසකතෙම අර්හත්ඵලය සිද්ධ කෙළේ නම්, ඕහට ගතීහු දෙකෙක් වන්නාහ. අනික් ගතියක් නැත්තේ ය.[3] කවර දෙගතියෙක් ද? යත්:— ඒ රහත් වූ දවසෙහි ම පිරිනිවන් පාන්නේ හෝ භික්ෂුභාවයට පැමිණෙන්නේ හෝ ය. මහරජානෙනි, ඒ ප්‍රව්‍රජ්‍යාතොම අචල වූවා ය. ඉතා මහත් වූවා ය. යම් මේ භික්ෂුභූමිය ඉතා උස් ව පැන නැංගාය'' යි වදාළසේක. එකල මිලිඳු මහරජානෝ ''සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තීක්ෂ්ණඥනයෙන් යුක්ත වූ මේ ප්‍රශ්නයතෙම බලවත් වූ දෘඪ වූ බුද්ධි ඇති නුඹ වහන්සේ විසින් යහපත් කොට නිර්වෙඨනය කරණ ලද්දේ ය. නුඹ වහන්සේ සදෘශ වූ ප්‍රඥවතුන් වහන්සේ කෙනෙකුන් විසින් හැර මේ ප්‍රශ්නය මෙලෙස නිර්වෙඨනය කරන්ට අනික් සමර්ථ කෙනෙක් නැතැ'' යි කියා ප්‍රශංසා කළහ.

ශ්‍රේෂ්ඨධර්මප්‍රශ්නය නිමි.

---

# උණුලේ නිර්ගත ප්‍රශ්නය.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ 'තථාගතයන් වහන්සේ සකල සත්වයන්ගේ අහිතය පහ කොට හිතවැඩ උපදවන සේකැ' යි කියනසේක. නැවත 'අග්නිස්කන්ධොපමධර්මදෙශනාව වදරණ කල්හි සැටනමක් පමණ භික්ෂූන්ගේ මුඛයෙන් උණුලේ උද්ගත වී ය' යි කියනසේක. ස්වාමීනි, අග්නිස්කන්ධොපම ධර්මදෙශනාව දෙශනා කරණ තථාගතයන් වහන්සේ විසින් සැටක් පමණ භික්ෂූන්ගේ හිතවැඩ පහ කොට අවැඩ උපදවන ලද්දේ ය. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ සකල සත්වයන්ගේ අවැඩ පහ කොට වැඩෙහි පිහිටුවනසේක් වූ නම්, එහෙයින් අග්ගික්ඛන්ධොපමධර්මදෙශනාව වදරණ කල්හි සැටක් පමණ භික්ෂූන්ගේ මුඛයෙන් උණුලේ නිර්ගත වී ය' යි කී යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'අග්ගික්ඛන්ධොපමෙ ධම්මපරියායෙ භඤ්ඤමානෙ

---

1. කරවන්නේ ය 2. ශික්ෂාපිත 3. නැත්තාහ

*Non-Commercial Distribution*

සට්ඨිමත්තානං භික්ඛූනං උණ්හං ලොහිතං මුඛතො උග්ගතං' යි කී වචනය සැබෑ වී නම්, එහෙයින් 'තථාගතො සබ්බසත්තානං අහිතමපනෙත්වා හිතමුපදහති' යි කී වචනය බොරු වන්නේ ය. මේ උභතො කොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නය නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප තථාගතයන් වහන්සේ සකලසත්වයන්ගේ අවැඩ පහ කොට වැඩ උපදවනසේක. අග්ගික්ඛන්ධොපම ධර්මදෙශනාව දෙශනා කරණ කල්හි සැටක් පමණ භික්ෂූන්ගේ මුඛයෙන් උණුලේ නික්මෙන ලද්දේ ය. ඒ ලේ වමනය වූ බව වනාහි තථාගතයන් වහන්සේගේ කෘතියකින් නො වන්නේ ය. ඔවුන්ගේ ම තමන් කළ දෙයින් ම ය'' යි කීසේක. ''ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ අග්ගික්ඛන්ධොපම ධර්මදෙශනාව නො වදළසේක් වී නම්, කිමෙක් ද, ඒ භික්ෂූන් වහන්සේලාගේ (180) මුඛයෙන් උණුලේ වමනය වේ දෑ'' යි විචාළෝ ය. ''නැත, මහරජානෙනි, මිත්‍ථ්‍යාප්‍රතිපන්න වූ ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදෙශනාව අසා ශරීරයෙහි ගිනියම උපන්නේ ය. ඒ ගිනියමින් ඔවුන්ගේ මුඛයෙන් උණුලේ වමනය වන ලද්දේ ය'' යි කීසේක.

''එහෙයින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ කළ ධර්මදෙශනාවෙන් ම ඔවුන්ගේ මුඛයෙන් උණුලේ උද්ගත වන ලද්දේ ය. තථාගතයන් වහන්සේ ඔවුන්ගේ නැසීම පිණිස එහි ප්‍රධාන වනසේක. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නාගයෙක් යම් සේ තුඹසකට ප්‍රවෙශ වේ නම්, එකල පස් ඕනෑ කැමැත්තා වූ එක්තරා පුරුෂයෙක් ඒ තුඹස බිඳ පස් ගෙණ යන්නේ ය. ඒ පුරුෂයාගේ පස් ගැණීමෙන් වම්මිකයාගේ සුසිර නම් වූ තුඹස් කට වැහෙන්නේ ය. එකල ඒ සර්පතෙම ඒ තුඹස ඇතුළෙහි ම ආශ්වාස නො ලබමින් නසින්නේ ය. ස්වාමීනි, ඒ නාගතෙම ඒ පුරුෂයා කළ ක්‍රියාවෙන් මරණයට පැමිණියේ නො වේ දෑ?'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජානෙනි, කීසේක. ''එපරිද්දෙන් ම ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ ම ඒ භික්ෂූන්ගේ නැසී යාම පිණිස එහි ප්‍රධාන වූසේකැ'' යි කීහ.

''මහරජානෙනි, සද්ධර්මය දෙශනා කරන්නා වූ අප තථාගතයන් වහන්සේ අනුනයප්‍රතිඝය නො කරණසේක. අනුනය සංඛ්‍යාත ආලයෙන් හා ප්‍රතිඝසංඛ්‍යාත ක්‍රොධයෙන් මිදී ධර්මදෙශනා කරණසේක. මෙසේ ධර්මදෙශනා කරණ කල්හි ඒ ධර්මයෙහි යම් කෙනෙක් මනා කොට පිළිපැද්දාහු ද, ඒ සත්වයෝ අර්හත්ඵලය අවබොධ කෙරෙති. යම් කෙනෙක් නපුරු කොට පිළිපැද්දාහු ද, ඒ සත්වයෝ සසරට වැටෙති. මහරජානෙනි, යම් සේ පුරුෂයෙකු විසින් අඹවෘක්ෂයක් හෝ දඹවෘක්ෂයක් හෝ මීගසක් හෝ සොලවන කල්හි එහි බලවත් වූ දෑඩි වූ නැටි ඇති යම්

Non-Commercial Distribution

ඵලකෙනෙක් ඇද් ද, ඒ ඵලයෝ එහි ම නො ඉගිල සිටින්නාහ. එහි කුණු වූ නැටි මුල් ඇත්තා වූ දුර්වල බන්ධන ඇත්තා වූ යම් ඵල කෙනෙක් ඇද් ද, ඒ ඵලයෝ බිම වැටෙන්නාහ. මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ ධර්මදෙශනා කර වදරමින් ආලය ක්‍රොධය නො කරණසේක. අනුනයප්‍රතිඝයෙන් මිදෙමින් ධර්මදෙශනා කරණ සේක. මෙසේ ධර්මදෙශනා කරණ කල්හි ඒ ධර්මයෙහි යම් කෙනෙක් මනා කොට පිළිපන්නාහු ද, ඒ සත්වයෝ නිවන් අවබොධ කරන්නාහු ය. ධර්මවිනයයෙහි මිථ්‍යාප්‍රතිපන්න වූ යම් කෙනෙක් ඇද් ද, ඒ සත්වයෝ සංසාරසාගරයෙහි වැටෙන්නාහු ය. තව ද, මහරජානෙනි, යම් සේ ධාන්‍ය රොපණය කරණු කැමැත්තා වූ සිසාන පුරුෂතෙම කෙත සාන්නේ ය. ඔහු සිසාන කල්හි නොයෙක් සියදහස්ගණන් තෘණයෝ[1] නසින්නාහ. මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ ශ්‍රද්ධාදිපඤ්චෙන්ද්‍රියන්ගේ වශයෙන් පැසුනා වූ සිත් ඇති සත්වයන්ට චතුස්සත්‍යාවබොධය කෙරෙමින් අනුනයප්‍රතිඝයෙන් මිදී ධර්මදෙශනා කරණසේක. මෙසේ ධර්මදෙශනා කරණ කල්හි එහි යම් කෙනෙක් මනා ව පිළිපන්නාහු ද, ඒ උත්තමයෝ ප්‍රතිවෙධය අවබොධ කරන්නාහ. යම් කෙනෙක් මිථ්‍යාව පිළිපන්නාහු ද, ඒ අනුවණයෝ කෙතෙහි මියන වල් මෙන් මියන්නාහු ය.

''තවද, මහරජානෙනි, යම් සේ මනුෂ්‍යයෝ රසය නිසා (181) උක්දඬු යන්ත්‍රයෙහි ලා මිරිකන්නාහු ය. ඔවුන් විසින් උක්දඬු මිරිකන කල්හි එහි යන්ත්‍රමුඛයට පැමිණියා වූ යම් ක්‍රිමීහු කෙනෙක් ඇද් ද, ඒ පණුවෝ[2] මිරිකෙන්නාහ. එපරිද්දෙන් ම, මහරජානෙනි, තථාගතයන් වහන්සේ මූකළා වූ ශ්‍රද්ධාදි සිත් ඇති සත්වයන්ට චතුස්සත්‍යධර්මයන් අවබොධ කෙරෙමින් සද්ධර්මමහායන්ත්‍රය මිරිකනසේක. ඒ සද්ධර්මයන්ත්‍රයෙහි යම් කෙනෙක් මිථ්‍යාව පිළිපන්නාහු ද, ඒ සත්වයෝ පණුවන් මෙන් නසින්නාහු ය'' යි කීසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ භික්ෂූන් වහන්සේලාගේ ඒ ධර්මදෙශනාවෙන් ම ලේ වැටෙන ලද්දේ නො වේ ද?'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, ලී සහිත වඩුපුරුෂතෙම කපා හෙළූ වෘක්ෂය නො සැහැ රක්ෂා කෙරෙමින් සෘජු කොට පිරිසිදු කෙරේ ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, හැරිය යුතු ඇද පහ කොට වඩුතෙම මෙසේ මේ දුව ඇද හැර පිරිසිදු කරන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ පිරිස් රක්ෂා කෙරෙමින් චතුස්සත්‍යාවබොධය වන සත්වයන්ට නිවන් අවබොධය කරවන්ට නො හැකි[3] වනසේක. මිථ්‍යාප්‍රතිපන්න සත්වයන් පහ කොට මෙසේ මේ අවබොධ වන පින්වත් සත්වයන්ට නිවන් අවබොධය කර වදරණසේක. මහරජානෙනි, තමන් කර ගත් දෙයින් ම ඒ මිථ්‍යාප්‍රතිපන්න සත්වයෝ විනාශයෙහි වැටෙන්නාහු ය.

1. තෘණ  2. පණුවන්  3. කරන්නට හැකි

Non-Commercial Distribution

''තවද, මහරජානෙනි, යම් සේ කදලිවෘක්ෂය (හා උණගස ද) ආජානෙයඅශ්වධෙනුව ද තමා නිසා උපන් දෙයින් ම නස්නේ ය. මහ රජානෙනි, එපරිද්දෙන් ම මිථ්‍යාප්‍රතිපන්න වූ යම් කෙනෙක් ඇද් ද, ඒ සත්වයෝ තමන් කර ගත් දෙයින් ම නස්නාහ. වැටෙන්නාහ. තවද, මහරජානෙනි, යම් සේ නොයෙක් රට ගම් පෙරළි කරණ සොරු තමන් කර ගත් දෙයින් ම නොයෙක් වධ විඳ ඇස් උපුටා හැරීමට ද වදබෙර ගැස්වීමට ද[1] දිවස් උල හිඳුවාලීමට ද හිස් කැපීමට ද පැමිණෙන්නාහ. මහරජානෙනි, එපරිද්දෙන් ම යම් සත්වකෙනෙක් මිථ්‍යාප්‍රතිපන්න වූවාහු ද, ඒ සත්වයෝ තමන් කර ගත් දෙයින් ම නස්නාහු ය. සර්වඥ ශාසනයෙන් පහව වැටෙන්නාහු ය.

''මහරජානෙනි, යම් ඒ සැටනමක් පමණ භික්ෂූන්ගේ මුඛයෙන් උණු ලේ වමනය වන ලද ද, ඔවුන්ගේ ඒ ලේ වමනය උණුබව භාග්‍යවතුන් වහන්සේ විසින් කළ දෙයකිනුත් නො වන්නේ ය. අනුන් විසින් කළ දෙයකිනුත් නො වූයේ ය. තමන් කර ගත් දේ ම ය. අප භාග්‍යවතුන් වහන්සේ මහසඟ පිරිවරා කොසොල්රට මහාමාර්ගයෙක වඩනාසේක්, හාත්පසින් ගිනි ගෙණ ඇවිළෙන්නා වූ ගිනි ම කඳක් වූ මහා ගිනිකඳක් දැක 'මේත් වෛනෙයජනපියුම් ප්‍රබොධ කිරීමට කාරණයෙකැ'යි සිතා මාර්ගයෙන් වෙන් ව මහරුකක් මුල වැඩහිඳ 'මහණෙනි, තෙල ගිනිකඳ දක්නාහු දැ?' යි විචාරා 'එසේ ය, වහන්සැ' යි දුන්වූ කල්හි 'මහණෙනි, තෙපි හේ කුමක් නම් සිතවු ද? දිලිහෙන්නා වූ හාත්පසින් ගිනි ගෙණ ඇවිළෙන්නා වූ ගිනි ම කඳක් වූ යම් මේ මහගිනිකඳ දෙඅතින් වැළඳ ගෙණ සමීපයෙහි හිඳින්නේ හෝ වේ ද, ළඟ සයනය කරන්නේ හෝ වේ ද, මෘදු තරුණ වූ හස්ත පාද ඇති සර්වලක්ෂණ සම්පන්නරාජ කුමාරිකාවක හෝ බ්‍රාහ්මණකුමාරිකාවක හෝ ගෘහපතිකුමාරිකාවක හෝ දෙඅතින් ආලිංගනය (182) කොට සමීපයෙහි හිඳින්නේ හෝ වේ ද, සමීපයෙහි සයනය කරන්නේ හෝ වේ ද, මෙයින් කවරක් උතුම් දැ?' යි විචාළසේක. 'ස්වාමීනි, මෘදු මොළොක් වූ හස්තපාදයන් ඇති සර්වලක්ෂණ සම්පන්න යම් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපතිකුමාරිකාවක වැළඳ ගෙණ සමීපයෙහි හිඳින්නේ හෝ වේ ද, සමීපයෙහි සයනය කරන්නේ හෝ වේ ද, මේ බව ම උතුම් වන්නේ ය. ස්වාමීනි, මේ දිලියෙන මහගිනිකඳ වැළඳ ගෙණ ළඟ හිඳීමෙක් සයනය කිරීමෙක් ඇද් ද, මේ බව මරණ වන මහදුකැ' යි දුන්වූහ. 'මහණෙනි, තොපට මම කියමි. මහණෙනි, තොපට මම දන්වමි. සර්වාපවිත්‍රයෙන් කෙලෙසුනු වස්ත්‍රකඩක් මෙන් සර්වප්‍රකාරයෙන් කෙලෙසුනු සිල් ඇති බැවින් දුශ්ශීල වූ පව්වු වූ ක්‍රියා වෙන් ශික්ෂාපදයන් ඉක්මවා පැමිණි සප්තාපත්තිස්කන්ධයන් ඇති අසුචියට කැත නො වී වදින ගම්හුරකු මෙන් දුශ්ශීල්‍ය ක්‍රියායෙහි ම හැසිරෙණ සමාචාර ඇති 'මාගේ ශික්ෂාපද ව්‍යතික්‍රමණය . සෙස්සෝ

[1] ගැසීමට

Non-Commercial Distribution

නො දනිත්ව' යි කියා පවත්නා වූ ප්‍රතිච්ඡන්න කර්මාන්ත ඇත්තා වූ ක්ලෙශව්‍යුපශමනශ්‍රමණගුණයක් නැති බැවින් අශ්‍රමණ වූ අභ්‍යන්තරයෙහි ශීලශුද්ධිවිරහිත ව ශ්‍රමණවෙශමාත්‍රයෙන් ම 'ශ්‍රමණ යෙමි' යි කියා ප්‍රතිඥ දෙන්නා වූ කායාදිද්වාරත්‍රයෙන් කරණ සුචරිතක්‍රියාවක් නැති බැවින් අබ්‍රහ්මචාරී වූ සිංහසම් පොරොවා ගත් කොටළුවෙකු මෙන් අර්හද්ධවජය ධාරණමාත්‍රයෙන් බ්‍රහ්මචරියවාසය ලොවට ප්‍රතිඥ කරන්නා වූ අභ්‍යන්තරයෙහි දුශ්ශීල්‍යකුණු ම කුණු වීමෙන් අවස්‍රුත වූ ක්ලෙශකුණු ඉපදීමට කසළගොඩක් වැනි වූ ඕහට ගිනි ගෙණ දිලියෙන්නා වූ හාත් පසින් ගිනි ගෙණ ඇවිළෙන්නා වූ ගිනිකඳක් ම වූ යම් මේ මහගිනිකඳක් දෙඅතින් වැලඳ ගෙණ ලඟ හිඳින්නේ හෝ වේ ද, ලඟ සයනය කරන්නේ හෝ වේ ද, යන මේ බව උතුම් වන්නේ ය.

'ඊට කාරණ කවරේ ද? යත්:— මහණෙනි, ඒ තෙම ඒ කාරණයෙන් මරණයට හෝ පැමිණෙන්නේ ය. මරණය සමාන දුකට හෝ පැමිණෙන්නේ ය. එපමණෙක් මුත් ඒ ගිනි වැලඳ ගත් කාරණයෙන් ශරීරභෙදයෙන් මරණින් මත්තෙහි සියලු ම සැපතින් පහ වූ සියලු ම දුකට පිහිට වූ විවස ව වැටෙන්නා වූ සැප ආස්වාදයක් නැති මහානරකයෙහි නො උපදින්නේ ය. මහණෙනි, පාපධර්මයන් ඇත්තා වූ අපවිත්‍ර වූ කායවාක්සමාචාර ඇත්තා වූ ප්‍රතිච්ඡන්නක්‍රියාවන් ඇත්තා වූ අශ්‍රමණ වූ ශ්‍රමණ ප්‍රතිඥ ඇත්තා වූ බ්‍රහ්මචාරී නො වන්නා වූ 'බ්‍රහ්මචාරිය' යි ප්‍රතිඥ දෙන්නා වූ ඇතුළ සතන උපදනා අකුශලධර්මයන් විසින් ඇතුළතින් කුණු වූ කෙලෙස් කසළ උපදින කසළගොඩක් වූ ඒ දුශ්ශීලතෙම මෘදු මොළොක් වූ හස්තපාදයන් ඇති සර්වලක්ෂණ සම්පන්න වූ ක්ෂත්‍රියබ්‍රාහ්මණගෘහපතිකුමාරිකාවක ආලිංගනය කොට සමීපයෙහි හිඳින්නේ වී නම්, සමීපයෙහි සයනය කරන්නේ වී නම්, මහණෙනි, ඒ කාරණය ඕහට බොහෝ කලක් අවැඩ පිණිස දුක් පිණිස වන්නේ ය. ශරීර භෙදයෙන් මරණින් මත්තෙහි සැපතින් පහ වූ දුකට පිහිට වූ විවස ව පතිත වන්නා වූ සැප ආස්වාදයක් නැත්තා වූ නරකයෙහි උපදින්නේ ය.

'මහණෙනි, හේ තෙපි කුමක් සිතවූ ද? බලවත් වූ පුරුෂයෙක් යම් දුශ්ශීලයකු අල්වා අස්ලොමින් ඇඹරූ දෑඩි වූ යොතකින් දෙකකුල් දෑඩි කොට වෙළවෙළා වැර දී අහුරුවන්නේ වී නම්, ඒ යොත්තෙම වහා දුක් **(183)** උපදවමින් ඡවිය සිඳින්නේ ය. ඡවිය සිඳ සම සිඳින්නේ ය. සම සිඳ මස් සිඳින්නේ ය. මස් සිඳ හැර නහර සිඳින්නේ ය. නහර සිඳ හැර අස්ථි සිඳින්නේ ය. අස්ථි සිඳ හැර ඇටමිදුළු පැහැර සිටින්නේ ය. යම් දුශ්ශීලයෙක් ක්ෂත්‍රියමහාසාරයන්ගේ බ්‍රාහ්මණමහාසාරයන්ගේ ගෘහපති මහාසාරයන්ගේ හෝ පසහ පිහිටුවා කරණ නමස්කාරය ඉවසන්නේ වී නම්, මේ දෙකින් කවරක් උතුම් ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ක්ෂත්‍රිය බ්‍රාහ්මණගෘහපතිකයන්ගේ පසහ පිහිටුවා කරණ යම් නමස්කාරයක් ඉවසීමෙක් ඇද් ද, ඒ බව ම උතුම් වන්නේ ය. ස්වාමීනි, බලවත් වූ

Non-Commercial Distribution

පුරුෂයෙක් යමෙකු අල්වාගෙණ දෘඪ වූ වාලයොතකින් දෙකකුල් මුල දක්වා දෘඪ කොට වෙළවෙළා සංඝනය කරන්නේ වී නම්, ඒ වාලරජ්ජුව[1] ඡවි චර්ම මස් නහර ඇට ඇටමිදුළු පැහැර සිටින්නේ වී නම්, මේ බව මහදුක් වන්නේ ය' යි දන්වූහ.

'මහණෙනි, තොපට කියන්නෙමි. මහණෙනි, තොපට දන්වන්නෙමි. යම් සේ දුශ්ශීල වූ පාපධර්ම සමන්නාගත වූ අසුචි සංකස්සර සමාචාර වූ ප්‍රතිච්ඡන්නකර්මාන්ත ඇති අශ්‍රමණ වූ ශ්‍රමණප්‍රතිඥ ඇති ශ්‍රෙෂ්ඨචාරී නො වන්නා වූ 'ශ්‍රෙෂ්ඨචාරිය' යි ප්‍රතිඥ දෙන්නා වූ ඇතුළත්හි දුශ්ශීලකුණෙන් අවස්සුත වූ කෙලෙස් උපදින කසළගොඩක් වැනි වූ ඔහු[2] බලවත් වූ පුරුෂයෙක් අල්වා දෙකකුල් දෘඪ වූ වාලයොතකින් දෘඪ කොට වෙළවෙළා සංඝනය කරන්නේ වී නම්, ඒ වාලයොත්තෙම ඡවි චර්ම මස් නහර ඇට ඇටමිදුළු පැහැර සිටින්නේ වී නම්, මේ බව ම උතුම් වන්නේ ය. ඊට කාරණා කවර? යත්:— මහණෙනි, ඒ කාරණයෙන් ඒ තෙම මරණයට හෝ පැමිණෙන්නේ ය. මරණ සමාන දුකකට හෝ පැමිණෙන්නේ ය. එපමණක් මුත් ඒ කාරණයෙන් ඝොර වූ නරක දුකට නො පැමිණෙන්නේ ය. මහණෙනි, ඒ දුශ්ශීලතෙම ක්ෂත්‍රියබ්‍රාහ්මණාදීන්ගේ පසඟ පිහිටුවා කරණ යම් නමස්කාරයක් ඉවසන්නේ වී නම්, මහණෙනි, ඒ කාරණය ඕහට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස වන්නේ ය. මරණින් මිය නරකයෙහි උපදින්නේ ය.

'මහණෙනි, හේ තෙපි කුමක් සිතවූ ද? බලවත් වූ පුරුෂයෙක් තෙල් ගා මුවහත් තබන ලද්ද වූ තීක්ෂණ වූ ශස්ත්‍රයකින් ශරීරමධ්‍යයෙහි කොටන්නේ වී නම්, යමෙක් ක්ෂත්‍රියබ්‍රාහ්මණ ගෘහපත්‍යාදීන්ගේ දෙයත නඟා වඳින අඤ්ජලිකර්මය ඉවසන්නේ වී නම්, මෙයින් කවරක් උතුම් ද?' යි විචාළසේක. 'ස්වාමීනි, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදීන්ගේ අඤ්ජලිකර්මය ඉවසන්නේ වී නම්, මේ බව උතුම් වන්නේ ය. ස්වාමීනි, බලවත් වූ පුරුෂයෙක් තෙල් ගා මුවහත් තබන ලද්ද වූ තීක්ෂණ වූ ශස්ත්‍රයකින් හෘදය මධ්‍යයෙහි පහර දෙන්නේ වී නම්, ඒ බව මහත් දුක් වන්නේ ය' යි දන්වූහ. 'මහණෙනි, තොපට කියන්නෙමි. මහණෙනි, තොපට දන්වන්නෙමි. කිසි ශීලසංවෘතගුණයක් නැති දුශ්ශීලයාහට බලවත් වූ පුරුෂයෙක් තීක්ෂණ ව මුවහත් කළ ශස්ත්‍රයකින් හෘදයමධ්‍යයෙහි පහරන්නේ ය යන මේ බව උතුම් වන්නේ ය. ඊට කාරණා කවරේ ද? යත්–මහණෙනි, එතෙම ඒ කාරණයෙන් මරණයට හෝ පැමිණෙන්නේය. මරණ සමාන දුකට හෝ පැමිණෙන්නේ ය. එපමණක් මුත් ඒ කාරණයෙන් මරණින් මත්තෙන් ඝොර වූ නරකදුකට නො පැමිණෙන්නේ ය. මහණෙනි, ඒ පාපී වූ දුශ්ශීලයා ක්ෂත්‍රියබ්‍රාහ්මණාදීන්ගේ අඤ්ජලිකර්මය ඉවසුයේ වී නම් මහණෙනි, ඒ (184) කාරණය ඕහට බොහෝ කාලයක්

1. වාලරජ්ජුතොමෝ 2. ඕහට

Non-Commercial Distribution

මුළුල්ලෙහි අහිත පිණිස දුක්ඛවිපාකය පිණිස වන්නේ ය. මරණින් මත්තෙහි ඝොර වූ දුක් ඇති නරකයෙහි උපදින්නේ ය.

'මහණෙනි, හේ තෙපි කුමක් සිතවූ ද? බලවත් වූ පුරුෂයෙක්තෙම ගිනි ගෙණ දිලියෙන්නා වූ හාත්පසින් ගිනි ගෙණ ඇවිළෙන්නා වූ ගිනි ම සහිත වූ රත් වූ ලොහොදලින් සකල ශරීරය වෙළන්නේ ය යන යමක් ඇද් ද, ක්ෂත්‍රියබ්‍රාහ්මණ මහාසාරාදීන් විසින් ශ්‍රද්ධාවෙන් දෙන ලද්ද වූ සිවුරු වලඳින්නේ ය යන යමක් ඇද් ද, මෙයින් කවරක් උතුම් වන්නේ ද ?' යි විචාළසේක. 'ස්වාමීනි, ක්ෂත්‍රියබ්‍රාහ්මණමහාසාරාදීන් විසින් ශ්‍රද්ධාවෙන් දෙන ලද සිවුරු වලඳින්නේ ය යන යමක් ඇද් ද, ඒ බව ම උතුම් වන්නේ ය ස්වාමීනි, බලවත් වූ පුරුෂයෙක් ගිනි ගෙණ දිලියෙන ලොහොදලින් සකලශරීරය වෙළන්නේ ය යන යමක් ඇද් ද, ඒ බව ඉවසිය නො හැකි මහදුකැ' යි දැන්වූහ. 'මහණෙනි, තොපට කියන්නෙමි. මහණෙනි, තොපට දන්වන්නෙමි. ඒ පාපි වූ ආපත්ති සමාදන ඇති දුශ්ශීලයාහට බලවත් වූ පුරුෂයෙක් ගිනි ගෙණ දිලියෙන සජොතිභූත වූ අයොමය වූ දලින් සකලශරීරය වෙඨනය කරන්නේ ය යන යමක් ඇද් ද, ඒ බව උතුම් වන්නේ ය. ඊට කාරණ කවරේ ද? යත්-මහණෙනි, ඒ කාරණ යෙන් ඒ දුශ්ශීලයා මරණයට හෝ මරණ සමාන දුකට හෝ පැමිණෙන් නේ ය. ඒ කාරණයෙන් මරණින් මත්තෙහි ඝොර වූ නරකයෙහි නො උපදින්නේ ය. මහණෙනි, ඒ දුශ්ශීලයා රජ බමුණු වෙළෙඳ ගොවි ආදීන් විසින් ශ්‍රද්ධාවෙන් දෙන ලද සිවුරු පරිභොග කරන්නේ ය යන යමක් ඇද් ද, ඒ කාරණය, මහණෙනි, ඕහට බොහෝ කාලයක් මුළුල්ලෙහි අහිත පිණිස දුක් පිණිස වන්නේ ය. මරණින් මත්තෙහි නරකයෙහි උපදින්නේය.

'මහණෙනි, හේ තෙපි කුමක් සිතවූ ද? බලවත් වූ පුරුෂයෙක් ගින්නෙන් රත් වූ යකඩ අඩුවකින් මුඛය විවෘත කොට ගිනි ගෙණ දිලියෙන්නා වූ සම්ප්‍රජ්වලිත වූ සජොතිභූත වූ රත් වූ ලොහො ගුලියක් මුඛයෙහි බහා ලන්නේ වී නම්, ඒ ලොහොගුළිය ඔහුගේ ඔෂ්ඨයත් දවමින් මුඛයත් දවන්නේ ය. දිවත් දවන්නේ ය. උගුරත් දවන්නේ ය. බඩත් දවන්නේ ය. බඩවැලුත් අතුනුබහනුත් ඇද ගෙණ අධොභාගයෙන් නික්ම යන්නේ ය යන යමක් ඇද් ද, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදීන් විසින් ශ්‍රද්ධාවෙන් දෙන ලද පිණ්ඩපාතය වළඳන්නේ ය යන යමහ් ඇද් ද, මෙයින් කවරක් උතුම් ද?' යි විචාළසේක. 'ස්වාමීනි, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදීන් විසින් ශ්‍රද්ධාවෙන් දෙන ලද පිණ්ඩපාතය වළඳන්නේ ය යන යමක් ඇද් ද, ඒ බව උතුම් වන්නේ ය. ස්වාමීනි, බලවත් වූ පුරුෂයෙක් ගින්නෙන් රත් වූ යකඩ අඩුවකින් මුඛය විවෘත කොට ගිනි ගෙණ දිලියෙන ලොහො ගුළියක් මුඛයෙහි බහාලන්නේ වී නම් ඒ, ලෝගුළිය ඔහුගේ ඔෂ්ඨයත් දවමින් මුඛය රහදිව උගුර බඩ දවා බඩවැල අතුනුබහන ඇද ගෙණ අධොමාර්ගයෙන් නික්ම යන්නේ ය යන යමක් ඇද් ද, ඒ බව ම අහෝ! මහදුකැ' යි දැන්වූහ. 'මහණෙනි, තොපට කියන්නෙමි. මහණෙනි,

Non-Commercial Distribution

තොපට දන්වන්නෙමි. භින්නාජීවිකපාපි වූ ඒ දුශ්ශීලයාහට බලවන්ත පුරුෂයෙක් ගිනි ගෙණ දිලියෙන යකඩඅඬුවෙන්මුඛය විවෘත කොට ගිනි ගෙණ දිලියෙන ලොහොපිණ්ඩය මුඛයෙහි බහා ලන්නේ (185) වී නම්, ඒ ලොහොගුළිය ඔහුගේ ඔෂ්ඨයත් දවමින් මුඛය උගුර බඩ දවා බඩවැල අතුනුබහන ඇද ගෙණ අධොභාගයෙන් නික්ම යන්නේ ය. යන යමක් ඇද් ද, ඒ බව ම උතුම් වන්නේ ය. ඊට කාරණා කවරේ ද? යත්– මහණෙනි, ඒ කාරණයෙන් එතෙම මරණයට හෝ පැමිණෙන්නේ ය. මරණ සමාන වූ දුකට හෝ පැමිණෙන්නේ ය. ඒ ප්‍රත්‍යයයෙන් මරණින් මත්තෙහි නරකයෙහි නො ම උපදින්නේ ය. මහණෙනි, ඒ අශ්‍රමණ වූ දුශ්ශීලපුද්ගලතෙම රජ බමුණු ආදීන් විසින් ශ්‍රද්ධාවෙන් දෙන ලද පිණ්ඩ-පාතය වළඳා නම්, ඒ කාරණය, මහණෙනි, ඕහට බොහෝ කාලයක් අවැඩ පිණිස සතර අපා දුක් පිණිස වන්නේ ය. මරණින් මත්තෙහි නරකයෙහි උපදින්නේ ය.

‘මහණෙනි, හේ තෙපි කුමක් සිතවූ ද? බලවත් වූ පුරුෂයෙක්තෙම දැඩි කොට හිස හෝ අල්වා ගෙණ පිටිකර හෝ අල්වා ගෙණ ගිනි ගෙණ දිලියෙන යකඩමය ඇඳක හෝ යකඩමය පුටුවෙක හෝ හිඳුවා ලන්නේය සයනය කරවා ලන්නේ ය යන යමක් ඇද් ද, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදීන් විසින් ශ්‍රද්ධාවෙන් දෙන ලද ඇඳ පුටු පරිභොග කරන්නේ ය යන යමක් ඇද් ද, මෙයින් කවරක් උතුම් ද?’ යි විචාළසේක. ‘ස්වාමීනි, රජ බමුණු ආදී වූ ශ්‍රද්ධාවතුන් විසින් දෙන ලද ඇඳපුටු ආදිය පරිභොග කරන්නේ ය යන යමක් ඇද් ද, ඒ බව ම උතුම් වන්නේ ය. ස්වාමීනි, බලවත් වූ පුරුෂයෙක් හිස හෝ අල්වා ගෙණ ශරීරය හෝ අල්වා ගෙණ ගිනි ගෙණ දිලියෙන යකඩමය පුටුවෙක්හි හිඳුවා ලන්නේ ය. යකඩ ඇඳෙහි සයනය කරවා ලන්නේ ය යන යමක් ඇද් ද, ඒ බව මහදුක් වන්නේ ය’ යි දැන්වූහ. ‘මහණෙනි, තොපට කියන්නෙමි. මහණෙනි, තොපට දන්වන්නෙමි. පාපි වූ අකර්තව්‍යසේවනය කරණ දුශ්ශීලයාහට බලවත් පුරුෂයෙක් හිස හෝ කඳ හෝ අල්වා ගෙණ ගිනි ගෙණ දිලියෙන පුටුවක හිඳුවා ලන්නේ ය. ඇඳක හෝ සයනය කරවා ලන්නේ ය යන යමක් ඇද් ද, මේ බව ම උතුම් වන්නේ ය. ඊට කාරණ කවරේ ද? යත්:— මහණෙනි ඒ තෙම ඒ කාරණයෙන් මරණයට හෝ පැමිණෙන්නේ ය. මරණ සමාන වූ දුකට හෝ පැමිණෙන්නේ ය. එපමණක් මුත් ඒ කාරණයෙන් මරණින් මත්තෙහි නරකයෙහි නො උපදින්නේ ය. මහණෙනි, ඒ දුශ්ශීලතෙම ක්ෂත්‍රියබ්‍රාහ්මණාදීන්ගේ ශ්‍රද්ධාවෙන් දුන් ඇඳපුටු පරිභොග කරන්නේ ය යන යමෙක් ඇද් ද, ඒ කාරණය, මහණෙනි, බොහෝ කලක් ඕහට අහිත පිණිස දුක් පිණිස වන්නේ ය. මරණින් මත්තෙහි නරකයෙහි උපදින්නේ ය.

‘මහණෙනි, හේ තෙපි කුමක් සිතවූ ද? බලවත් වූ පුරුෂයෙක්තෙම යමෙකු ඌර්ධවපාද කොට අධඃශීර්ෂ කොට අල්වා ගෙණ ගිනි ගෙණ

Non-Commercial Distribution

දිලියෙන්නා වූ සම්ප්‍රජ්වලිත වූ සජෝතිභූත වූ රත් වූ මහලොහොකටාරයෙක බහාලන්නේ වී නම්, එතෙම ඒ ලොහොකටාරයෙහි පෙණ නැගෙන ශරීරයෙන් පැසෙමින් වරෙක පැසිපැයි මත්තට යන්නේ ය. වරෙක පැසිපැයි අධොභාගයට යන්නේ ය. වරෙක පැසිපැසී සරස යන්නේ ය යන යමක් ඇද් ද, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදීන් විසින් ශ්‍රද්ධාවෙන් තනවා දෙන ලද පන්සල් විහාරවල් පරිභොග කරන්නේ ය යන යමක් ඇද් ද, මෙයින් කවරක් උතුම් ද?' යි විචාළසේක. 'ස්වාමීනි, ක්ෂත්‍රියබ්‍රාහ්මණමහාසාරාදීන් විසින් ශ්‍රද්ධාවෙන් කරවා දෙන ලද විහාර පරිභොග කරන්නේ ය යන යමක් ඇද් ද, ඒ බව උතුම් වන්නේ ය. ස්වාමීනි, බලවත් වූ පුරුෂයෙක් (186) යමෙකු ඌර්ධ්වපාද අධඃශීර්ෂ කොට අල්වා ගෙණ ගිනි ගෙණ දිලියෙන තප්ත වූ ලොහොකුම්භියෙක ප්‍රක්ෂෙප කරන්නේ වී නම්, එතෙම ඒ සැළෙහි පෙණ නැගෙන ශරීර ඇති ව පැසෙමින් වරෙක ඌර්ධ්ව යන්නේ ය. වරෙක යට යන්නේ ය. වරෙකු සරස යන්නේ ය යන යමක් ඇද් ද, ඒ බව 'ඉතා දුකැ' යි දන්වූහ. 'මහණෙනි, තොපට මම කියන්නෙමි. මහණෙනි, තොපට මම දන්වන්නෙමි. ඒ පාපී වූ දුශ්ශීලයාහට බලවත් වූ පුරුෂයෙක් ඌර්ධ්වපාද අධඃශීර්ෂ කොට අල්වා ගෙණ ගිනි ගෙණ දිලියෙන මහාලොහකුම්භියෙක බහා ලන්නේ වී නම්, එතෙම ඵෙණුද්දේහක ව පැසෙමින් ඌර්ධ්වාධොසරස පැසෙන්නේ ය යන යමක් ඇද් ද, ඒ බව උතුම් වන්නේ ය. ඊට කාරණ කවරේ ද? යත්:— ඒ කාරණයෙන්, මහණෙනි, එතෙම මරණයට හෝ පැමිණෙන්නේ ය. මරණ සමාන දුකට හෝ පැමිණෙන්නේ ය. ඒ ප්‍රත්‍යයෙන් මරණින් මත්තෙහි නරකයෙහි නො උපදින්නේ ය. මහණෙනි, ඒ දුශ්ශීල වූ පාපධර්මයන් ඇති අසුචිසංකස්සරසමාචාර ඇති ප්‍රච්ඡන්නකර්මාන්තයන් ඇති අශ්‍රමණ වූ ශ්‍රමණප්‍රතිඥ ඇති ශ්‍රෙෂ්ඨචාරී නො වූ ශ්‍රෙෂ්ඨචාරි ප්‍රතිඥ ඇති ඇතුළත්හි අකුශලධර්මයෙන් කුණු වූ නිත්‍යයෙන් කෙලෙසුන් විසින් මඩනා ලද්ද වූ පාපකසළ එකතු වන කසළ ගොඩක් වූ පුද්ගලතෙම ක්ෂත්‍රියමහාසාරයන්ගේ බ්‍රාහ්මණමහාසාරයන්ගේ ගෘහපතිමහාසාරයන්ගේ විහාරවල් පරිභොග කරන්නේ ය යන යමක් ඇද් ද, ඒ කාරණය, මහණෙනි, ඔහට බොහෝ කාලයක් අහිත පිණිස දුක්ඛවිපාකය පිණිස වන්නේ ය. ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සැපතින් පහ වූ දුකට පිහිට වූ විවස ව පතිත වන්නා වූ සැපආස්වාදයක් නැත්තා වූ නරකයෙහි උපදින්නේ ය.

**"තස්මා තිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං; යෙසඤ්ච මයං පරිභුඤ්ජාම චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං තෙසං තෙ කාරා මහප්ඵලා භවිස්සන්ති මහානිසංසා, අම්හාකං චෙවායං පබ්බජ්ජා අනවජ්ජා භවිස්සති සඵලා සඋද්‍රයාති, එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං, අත්තත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං පරත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං, උභයත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතු"න්ති.**



Non-Commercial Distribution

'එහෙයින්, මහණෙනි, මේ ජිනශාසනයෙහි අර්හද්ධවජය ධරණුවන් විසින් මෙසේ හික්මිය යුත්තේ ය. අපි යම් ශ්‍රද්ධාවත් ගෘහස්ථකෙනෙකුන්ගේ චීවර පිණ්ඩපාත සෙනාසන ග්ලානප්‍රත්‍යය බෙහෙත් පිරිකර වළඳින්නමෝ වෙමු ද? ඔවුන්ගේ ඒ ප්‍රත්‍යුපකාරයෝ මහත්ඵල වෙද් ද, මහානිසංස වෙද් ද, අපගේ මේ ප්‍රව්‍රජ්‍යාවත් අපට සිස් නො වේ ද, ස්වර්ග මොක්ෂ සැපත් ලැබීමෙන් සඵල වේ ද, ස්වර්ගමොක්ෂසැපතට කැඳවීමෙන් සඋදය වේ ද, මෙසේ මහණෙනි, තොප විසින් හික්මිය යුත්තේ ය. මහණෙනි, ආත්මාර්ථය හෝ බලන්නාහු විසින් අප්‍රමාදයෙන් ත්‍රිවිධ ශික්ෂාව සම්පාදනය කරන්නට සුදුසු වන්නේ ය. මහණෙනි, පරාර්ථය හෝ බලන්නාහු විසින් ත්‍රිවිධශික්ෂාව අප්‍රමාදයෙන් සම්පාදනය කරන්ට සුදුසු වන්නේ ය. **(187)** මහණෙනි, ආත්මාර්ථපරාර්ථද්වය හෝ බලන්නාහු විසින් ත්‍රිවිධශික්ෂාව සම්පාදනය කරන්නට සුදුසු වන්නේ ම ය' යි කියා මේ දුශ්ශීල භයංකර වූ අග්ගික්ඛන්ධොපම සූත්‍රය ත්‍රෛලොක්‍ය තිලක වූ අප භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. මේ වෙය්‍යාකරණ නම් නිර්ගාථකසූත්‍රාන්තධර්මදෙශනාව වදරණ කල්හි සැටක් පමණ අශික්ෂිතාචාර වූ දුශ්ශීලභික්ෂූන්ගේ හෘදය උණු ව ලේ ඉතිරෙමින් මුඛයෙන් හුණු ලේ වමනය වි ය. සැටක් පමණ භික්ෂූහු 'අපි මහණ ව සිට සිල් රක්නට නො හැකියම්හ' යි සිතා ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි වූහ. ජිනානුශාසනයෙහි පිරිසිදු ව හැසුරුණා වූ සැටදෙනෙකුන් වහන්සේ මාරවාරණදර්පමර්නදය කළා වූ තථාගතයන් වහන්සේට දෙහොත් මුදුන් දී 'දුක්කරං භගවා සුදුක්කරං භගවා' යනාදීන් ප්‍රතිවචන දෙමින් ධර්ම දෙශනාව පිළිගත්හ. ඒ සැටදෙනා වහන්සේගේ චිත්තයෝ තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් කිසිවක් නො ගැණීමෙන් චතුරාශ්‍රවයන් කෙරෙන් මිදුනාහු ය. එහෙයින් ඒ සැටදෙනා තමන් කර ගත් දෙයින් ම විනාශ වූහ.

''මහරජානෙනි, යම් සේ පුරුෂයෙක් සියල්ලන්ට ම අමෘතරසයක් දෙන්නේ ය. ඒ ජනයෝ ඒ අමෘතරසය අනුභව කොට අරොගී ව දීර්ඝායුෂ්ක ව සියලු ම උපද්‍රවයෙන් මිදෙන්නාහු ය. එකල එක්තරා අඥානපුරුෂයෙක් ඒ අමෘතය අනුභව කොට ඔහුගේ දුරුපචාරයෙන් මරණයට පැමිණෙන්නේ ය. කිමෙක් ද? මහරජානෙනි, ඒ අමෘතය දුන් පුරුෂතෙම ඒ කාරණයෙන් මඳකුත් අපුණ්‍යයකට පැමිණේ දැ'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ දසසහශ්‍රීලොකධාතුයෙහි දිව්‍යමනුෂ්‍යයන්ට අමෘතමහාධර්මදනය දෙනසේක. යම් ඒ සත්වකෙනෙක් සද්ධර්මාමෘතපානය කිරීමට යොග්‍යයෝ ද, ඒ සත්වයෝ සද්ධර්මාමෘතය පානය කිරීමෙන් චතුස්සත්‍යය අවබොධ කෙරෙති. යම් ඒ සත්වකෙනෙක් අභව්‍යයෝ ද, ඒ සත්වයෝ ධර්මාමෘතය පානය කිරීමෙන් නසින්නාහ. පතිත වන්නාහ. මහරජානෙනි, භොජනය සකලසත්වයන්ගේ ජීවිතය රක්ෂා කරන්නේ ය. ඒ භොජනය සමහර කෙනෙක් අනුභව කොට

Non-Commercial Distribution

අජීර්ණ ව විරේකාබාධයෙන් නසින්නහු ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ භොජනය දුන් පුරුෂතෙම ඒ කාරණයෙන් මඳකුත් අපුණ්‍යයකට පැමිණේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ දශසහශ්‍රීලොක ධාතුයෙහි වසන දිව්‍යමනුෂ්‍යයන්ට සද්ධර්මාමෘතමහාදනය දෙනසේක. යම් ඒ සත්වකෙනෙක් යොග්‍ය වූ ද, ඒ සත්වයෝ සද්ධර්මාමෘතපානයෙන් චතුස්සත්‍යය අවබොධ කරන්නාහ. යම් ඒ සත්වකෙනෙක් නිවන් ලැබීමට අයොග්‍ය වූ ද, ඒ සත්වයෝ සද්ධර්මාමෘතයෙන් නසින්නාහ. පතිත වන්නාහ'' යි වදළසේක. මේ ප්‍රශ්නව්‍යාඛ්‍යානයෙන් අතිප්‍රසන්න වූ මිලිඳු මහරජානෝ ''සාධු! සාධු!! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ජිනෙන්ද්‍ර ශාසනයෙන් පහ ව දුවන රහට දුශ්ශීලයන්ට තර්ජනය කර වදළසේක. දුශ්ශීලරජස් පිඹ හැර වදළසේක. යහපත, ස්වාමීනි, නුඹ වහන්සේ වදළ මේ කාරණය එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කියා ස්තුති කළහ.

උණුලේ නිර්ගත ප්‍රශ්නය නිමි.

## සෙල ප්‍රශ්නය.

(188) ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින්,

**''කායෙන සංවරො සාධු–සාධු වාචාය සංවරො,**
**මනසා සංවරො සාධු–සාධු සබ්බත්ථ සංවරො,**
**සබ්බත්ථ සංවුතො භික්ඛු–සබ්බදුක්ඛා පමුච්චති''**

යන මේ ගාථාවෙන් 'කායද්වාරයට හසු වන ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයට සිත නො දුවවන විසින් කයින් සිත රැක්ම යහපත. මුසාවාදදිය නො කියන විසින් වචනයෙන් සිත රැක්ම යහපත. මනොද්වාරයට හසු වන අභිධ්‍යා ව්‍යාපාදදිය නො සිතන විසින් තමාගේ සිත රැක්ම යහපත. චක්ෂුරාදි සදෙර ම සංවරය යහපත. සදෙර ම රක්ෂිත වූ මහණතෙම සියලු ම සංසාර දුක්ඛයෙන් මිදෙන්නේ ය' යන මේ අර්ථය වදරණ ලද්දේ ය. මෙසේ කියා නැවත ද ඒ තථාගතයන් වහන්සේ සිව්වණක් පිරිස්මැද වැඩහිඳ දිව්‍යමනුෂ්‍යයන්ගේ ඉදිරියෙහි සෙල නම් බ්‍රාහ්මණයාහට කොසොහිත වස්ත්‍රගුය්හය දක්වා වදළසේක. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'කයින් සංවරවීම යහපතැ' යි යනාදීන් වදරණ ලද්දේ වී නම්, එහෙයින් සෙලබ්‍රාහ්මණයාහට 'කොසයෙහි අවහිත වූ වස්ත්‍රගුය්හ නම් පුරුෂලක්ෂණය දක්වා වළදසේකැ' යි කියන වචනය බොරු වන්නේ ය. ඉදින් සෙලබ්‍රාහ්මණයාහට ඒ 'කොසොහිතවස්ත්‍රගුය්හ දක්වා වදළා ය' යි යන වචනය සැබෑ වී නම්, එහෙයින් 'කායෙන සංවරො සාධු' යනාදීන් කී වචනය බොරු වන්නේ ය. මේ උභතොකොටික ප්‍රශ්නයත් නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඒ ප්‍රශ්නය ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

*Non-Commercial Distribution*

''මහරජාණෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'කායෙන සංවරො සාධු' යනාදී මේ ගාථාවත් වදරණ ලද්දේ ය. සෙල නම් බ්‍රාහ්මණයාහට කොසයෙහි අවහිත වූ වස්ත්‍රගුහ්‍යයත් දක්වන ලද්දේ ම ය. මහරජාණෙනි, යමෙකුට යම් හෙයකින් තථාගතයන් වහන්සේ කෙරෙහි කාංක්ෂා උපන්නේ ද, ඔහට අවබොධ කරවන පිණිස භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් ඒ හා සමාන කයක්[1] මවා දක්වන සේක. හේ[2] ඒ ප්‍රාතිහාර්ය දක්නේ ය''යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් කාරණයකින් පිරිසට පැමිණි කල්හි 'එකෙක් ම[3] ඒ වස්ත්‍රගුය්හය දක්නේ ය. ඒ පිරිසෙහි ම විද්‍යමාන වූ සෙසු සත්වයෝ නො දක්නාහු ය' යි කියන මේ වචනය කවරෙක් නම් අදහන්නේ ද? එබැවින් මට නුඹවහන්සේ එහි කාරණයක් දක්වා වදළ මැනව. කාරණයකින් මට අඟවා වදළ මැනැවැ'' යි කීහ. ''මහරජාණෙනි, ඥාතිමිත්‍රයන් විසින් පිරිවරණ ලද්දා වූ ව්‍යාධියෙන් පීඩිත වූ කිසි පුරුෂයෙක් තොප විසින් දක්නා ලද්දේ ඇද් ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''කිමෙක් ද, මහරජාණෙනි, ඒ පුරුෂතෙම යම් දුක්ඛවේදනාවකින් දුක් විඳිනු ලැබේ ද, ඒ වේදනාව ඒ පිරිස දකිද් ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, ඒ පුරුෂතෙම තෙමේ ම වෙහෙස විඳින්නේ ය'' යි කීහ.

''මහරජාණෙනි, එපරිද්දෙන් ම යම් කෙනෙකුන්ට ම තථාගතයන් වහන්සේ කෙරෙහි කාංක්ෂා උපදනා ලද ද, ඔහට අවබොධය කරවන පිණිස තථාගතයන් වහන්සේ ඍද්ධියෙන් ඊට ම සුදුසු වූ ලෙසක් දක්වා වදරණසේක. ඔහු ම ඒ ප්‍රාතිහාර්යය දක්නේ ය. තවද මහරජාණෙනි, **(189)** යම් සේ කිසියම් පුරුෂයකුහට යක්ෂයෙක් ආවෙශ වන්නේ වී නම්, කිමෙක් ද, මහරජාණෙනි, එතැන්හි රැස් වූ ඒ පිරිස ඒ යක්ෂග්‍රහණය දකිද් ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, ඒ ආතුරයා ම යක්ෂයාගේ එන ගමන දක්නේ ය'' යි කීහ. ''මහරජාණෙනි, එපරිද්දෙන් ම යම් කෙනෙකුන්ට බුදුන් කෙරෙහි කාංක්ෂා උපදනා ලද ද, හේ ම ඒ ප්‍රාතිහාර්යය දක්නේ ය'' යි කීහ. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් යමක් එකක්හටත් නො දක්විය යුතු වේ ද? ඒ බව දක්වාලීමෙන් අතිදුෂ්කර දෙයක් කරණ ලද්දේ ය'' යි කීහ. ''මහරජාණෙනි, භාග්‍යවතුන් වහන්සේ පුරුෂගුහ්‍යය නො ම දක්වා වදළසේක. ඍද්ධියෙන් ඡායාව දක්වා වදළසේකැ'' යි කීසේක. ''ස්වාමීනි, ඡායාවෙන් වුවත් යමක් දුක නිශ්ඨාවට ගිය බැවින් දකීමෙන් පුරුෂගුහ්‍යය දක්නා ලද්දේ ම වන්නේ ය'' යි කීහ. ''දුෂ්කර දෙයත්, මහරජාණෙනි, තථාගතයන් වහන්සේ බොධනෙය්‍ය වූ සත්වයන්ට අවබොධය කරන්ට කර වදරණසේක. මහරජාණෙනි, ඉදින් තථාගතයන් වහන්සේ ඒ ඒ ක්‍රියා හැර[4] වදරණසේක් වී නම්, නිවන් අවබොධ කට හෙන[5] සත්වයෝ චතුස්සත්‍යාවබොධය නො කරන්නාහු ය. මහරජාණෙනි, යම් හෙයකින්

1. ඍද්ධියත් 2. ඔහු 3. එක්කෙනෙක් 4. ක්‍රියා ඒ ඒ විත්ත හැර
5. අවබෝධය වන

Non-Commercial Distribution

අවබොධ වන[1] සත්වයන්ට අවබොධය කරවන්ට තථාගතයන් වහන්සේ උපාය දන්නාසේක. එහෙයින් තථාගතයන් වහන්සේ යම් යම් උපායකින් නිවන් අවබොධය වන[1] සත්වයෝ චතුස්සත්‍යය අවබොධය කෙරෙද් ද, ඒ උපායෙන් අවබොධය වන[1] සත්වයන් අවබොධය කරවනසේක. මහරජානෙනි, යම් සේ ශල්‍යකත්තෘ වූ වෙදෙක් යම් යම් බෙහෙතකින් ආතුරතෙම අරොගී වේ ද, ඒ ඒ බෙහෙතින් ආතුරයා කරා එළඹෙන්නේ ය. එළඹ, වමනය කළ යුතු දෙය[2] වමනය කර වන්නේ ය. විරෙකය කළ යුතු දෙය[2] විරෙක කරවන්නේ ය. ආලෙපය කළ යුතු දෙය[2] ආලෙපය කරවන්නේ ය. තෙල් වස්ති කළ යුතු දෙය[2] තෙල් වස්ති කරවන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ යම් යම් උපායකින් අවබොධය වන[1] සත්වයෝ අවබොධය කරත්[3] ද, ඒ ඒ උපායෙන් අවබොධය කරවනසේක. තවද, මහරජානෙනි, යම් සේ මූඪ වූ දරුගර්භය ඇති ස්ත්‍රීතොම වෛද්‍යාචාර්යයාහට නො දක්විය යුතු වූ ස්ත්‍රීගුහ්‍යය දක්වන්නී ය. මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ අවබොධ කළ මනා සත්වයන් අවබොධ කරවන්ට අදර්ශනීය වූ ගුහ්‍යයෙහි[4] ඍද්ධියෙන් ඡායාව දක්වා වදළසේක. මහරජානෙනි, පුද්ගලයෙකු නිසා අදර්ශනීය නම් වූ අවකාශස්ථානයෙක් නැත්තේ ය. ඉදින්, මහරජානෙනි, කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේගේ හෘදයවස්තුව දැක අවබොධය කෙරේ[5] නම්, ඕහටත් භාග්‍යවතුන් වහන්සේ උපායෙන් තමන් වහන්සේගේ හෘදයවස්තුව දක්වා වදරණසේක. මහරජානෙනි, පරසිත් හැඳින ධර්ම දෙශනා කිරීමෙහි දක්ෂ වූ තථාගතයන් වහන්සේ නොයෙක් උපාය දන්නාසේක.

‘‘මහරජානෙනි, තථාගතයන් වහන්සේ තමන් වහන්සේගේ මල් වූ **නන්ද** නම් තෙරුන් වහන්සේගේ අභිප්‍රාය දැන ඒ **නන්ද** තෙරුන් වහන්සේ දිව්‍යභවනයට ගෙණ ගොස් ‘මේ කාරණයෙන් මේ කුලපුත්‍රතෙම නිවන් අවබොධය කෙරෙ’ යි සිතා **කකුටපාදිනී** නම් දෙවඟනන් දක්වා වදළසේක් නො වේ ද? එහෙයින් ඒ කුලපුත්‍රතෙම නිවන් අවබොධය **(190)** කෙළේ ය. මහරජානෙනි, මෙසේ තථාගතයන් වහන්සේ නොයෙක් කාරණයෙන් ශුභනිමිත්තග්‍රහණයට ගර්හා කෙරෙමින් නින්ද කෙරෙමින් පිළිකුල් කෙරෙමින් ඒ **නන්ද** තෙරුන් වහන්සේට චතුස්සත්‍ය අවබොධය කරවනු පිණිස **කකුටපාදිනී** නම් දිව්‍යාංගනාවන් දක්වා වදළසේක. මෙසේත් උපාය දන්නා තථාගතයන් වහන්සේ ධර්මදෙශනායෙහි දක්ෂසේක.

‘‘මහරජානෙනි, නැවත ද අනිකුදු කාරණයෙක් ඇත. තථාගතයන් වහන්සේ භ්‍රාතෘ වූ **මහාපන්ථක** තෙරුන් වහන්සේ විසින් වෙහෙරින් යව යි පහ කරණ ලද්ද වූ එහෙයින් ම දෙම්නස් වූ **චූල්ලපන්ථක** තෙරුන් වහන්සේට ‘මෙයින් ම මේ කුලපුත්‍රතෙම නිවන් අවබොධය කරන්නේ ය’යි

1. ‘කටහෙත’ යි විය යුතු 2. ‘කරවිය යුක්තනු’ යි විය යුතුයි
3. වෙත් 4. ගුය්හය 5. වේ

Non-Commercial Distribution

දූන පෙරමහට වැඩ **'චූල්ලපන්ථකය,** දෙමනස් වන්නට කරුණු කිම් ද?' යි විචාරා, 'ස්වාමීනි, මාගේ බෑයානන් විසින් වෙහෙරින් පහ කරණ ලද්දෙමි' යි කී කල්හි **'චූල්ලපන්ථකය** තෙපි කොයි යවු ද? මේ ශාසනය මාගේ මුත්, තාගේ බෑයා සතු දෙයෙක් නො වේ' යි වදරා 'මොහු **කසුප් බුදුන්** සමයෙහි ධර්මය පුහුණු කරණ මහණක්හට හීලනය කොට—ඒ පාපයෙන් මෙ සමයෙහි සාරමසකින් එක ම ගාථාව ප්‍රගුණ කරන්ට නො හැකි වී ය. තවත් අතීතයෙහි කලෙක රජ පැමිණ සිවුරඟසෙනඟ පිරිවරා ඇත්කඳපිටින් නුවර ප්‍රදක්ෂිණා කෙරෙමින් මුහුණ තෙමී ගිය ඩහදිය සළුපටින් පිස අනිත්‍යය භාවනා කළ කුශලයෙන් මෙසමයෙහි රහත් වන්නේ ය' යි දූක 'චූල්ලපන්ථකය, මා කීවාක් කරව. හිරට මුහුණ ලා හිඳ **'රජො හරණං' 'රජො හරණං'** කිය කියා මෙයින් මූණ පිසව' යි කියා සියුම් වූ වස්ත්‍රකඩක් මවා දුන්සේක. ඒ කුලපුත්‍රතෙම ද ඒ කාරණයෙන් ම රහත් ව ජිනශාසනයෙහි වශීභාවයට පැමිණියේ ය. මෙසේ ද උපාය දන්නා වූ තථාගතයන් වහන්සේ ධර්මදෙශනායෙහි දක්ෂ වූසේක.

''මහරජානෙනි, නැවත ද අනික් කාරණයකුත් ඇත. **මොඝරාජ** බ්‍රාහ්මණයා විසින් තුන්වරක් දක්වා ම ප්‍රශ්න විචාරණ ලද්ද වූ තථාගතයන් වහන්සේ 'මොඝරාජය, තෙපි හිඳුව' යි දෙවරක් වදරා ප්‍රශ්නය නො වදරමින් තුන්වැනි වාරයෙහි 'මේ ආකාරයෙන් මේ කුලපුත්‍රයාගේ මානය ව්‍යපශමනය වන්නේ ය. මානොපසමය වීමෙන් නිර්වාණාභිසමය වන්නේ ය' යි දූන තුන්වැනි වාරයෙහි දී ප්‍රශ්නය විසඳා 'සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු' යනාදීන් ධර්මදෙශනා කළසේක. ඒ කාරණයෙන් ද ඒ කුලපුත්‍රයාගේ මානය ව්‍යපශමනය විය. මානොපසමය වීමෙන් රහත් වන්ට කුසල් මූකළා වූ බ්‍රාහ්මණතෙම බුදුසසුන් වැද මහණ ව රහත් ව දිවඇස්නුවණ ය, දිවකන්නුවණ ය, පෙර විසූ කඳපිළිවෙල දන්නා නුවණ ය, නොයෙක් ලෙසින් ඍද්ධිප්‍රාතිහාර්ය කරණ නුවණ ය, පරසිත් දන්නා නුවණ ය, සකලක්ලෙශයන්ගේ සිව් නැති කොට කැඩූ ආශ්‍රවක්ෂයකර ඥනය යන ෂඩභිඥයෙහි වශීභාව ප්‍රාප්ත වූසේක. මෙසේ ද උපාය දන්නා වූ තථාගතයන් වහන්සේ ධර්මදෙශනායෙහි දක්ෂ වූසේක..

සෙල නම් බ්‍රාහ්මණතෙම සර්වලොකාග්‍ර වූ සර්වඥයන් වහන්සේ එක්දහස් දෙසියපණසක් පමණ සංඝයා වහන්සේ හා සමග **අංගුත්තරාපණ** නම් දනව්වෙහි සැරිසරණ කල 'ශාක්‍යපුත්‍ර වූ **සිද්ධාර්ථකුමාරයානන්** වහන්සේ ලොවුතුරා බුදු ව දූන් අවුත් මේ **ආපණ** නම් නිගමග්‍රාමයෙහි වැඩවසන සේකැ' යි කියා තමාගේ මිත්‍ර වූ **කෙණිය** නම් ජටිලයන්ගෙන් **(191)** අසා විස්මය පත් ව 'අහෝ! සර්වඥවරයෝ නම් ලොකයෙහි අති දුර්ලභ වන්නාහ. සර්වඥචක්‍රවර්ති වන මහාපුරුෂලක්ෂණයන් දන්නා ශාස්ත්‍රයෙහි මම පාරප්‍රාප්තයෙමි. එබැවින් බුදු නො බුදුබව පරීක්ෂා කෙරෙමි' යි සිතා තුන්සියයක් පමණ බ්‍රාහ්මණමාණවකයන් හා බුදුන්

Non-Commercial Distribution

කරා ගොස් ආදර දක්වා එකත්පසෙක සිට දෙසියසොළසක් පමණ මංගල්‍ය ලක්ෂණයෙන් ශොභමාන ව පුරා සිටි ස්වර්ණමිරිවැඩි දෙකක් මෙන් සම්පූර්ණ වූ දෙපතුල් දුටුයේ ය. ඒ යටිපතුල්තලවල හට ගත්තා වූ පද්මරේණු වැනි දහසක් දැවි ඇති චක්‍රාන්තයෙහි පිහිටි නිම්වලළු ඇති නාභි සහිත වූ නාභිය වඩා සිටි රෙඛාදි සර්වාකාර පරිපූර්ණ වූ දෙපතුල් පුරා සිටි චක්‍රලක්ෂණය දුටුයේ ය. වට වූ රත්පලස් පිඩු දෙකක් වැනි වූ විලිඹු ලක්ෂණය ද, දීර්ඝාංගුලි බව ද, මෘදුමොළොක් හස්තපාද බව ද, ජාලහස්තපාදදිසමතිසක් පමණ මහාපුරුෂලක්ෂණයන් දැක පහුතජිව්හාලක්ෂණය හා කොසොහිතවස්ත්‍රගුය්හය නො දැක කාංක්ෂා කරන්ට වන. එකල භාග්‍යවතුන් වහන්සේ ඔහු කෙරෙහි පතළ මහාකරුණාවෙන් ජිව්හාධාතුව දිගු කොට දෙකන් නාසා නලල්තලය පිරිමදිමින් ඔහට ම පෙණෙන සේ ඍද්ධියෙන් සිවුරු සහ ඡායාරූපමාත්‍රයෙකින් වස්ත්‍රගුය්හය දක්වා වදාළසේක. එකල කාංක්ෂා විරහිත වූ බ්‍රාහ්මණතෙම ප්‍රීතියෙන් පිණා බුදු වූ බව නො දැන:—

**"රාජා අරහසි භවිතුං–චක්කවත්තී රථෙසභො,**
**චාතුරන්තො විජිතාවී–ජම්බුසණ්ඩස්ස ඉස්සරො.**
**ඛත්තියා භොජරාජානො–අනුයුත්තා භවන්තු තෙ,**
**රාජාභිරාජා මනුජින්දො–රජ්ජං කාරෙහි ගොතම."**

යනාදීන් උදිතොදිතශාක්‍යකුලප්‍රසූත වූ ගෞතමගොත්‍ර ඇති සිද්ධාර්ථ කුමාරයෙනි, නුඹ වහන්සේගේ ආශ්චර්යවත් වූ ශ්‍රීශරීරයෙහි චක්‍රවර්ති ලක්ෂණ වූ දෙතිස්මහාපුරුෂලක්ෂණයෝ විද්‍යමාන වූහ. ශරීරය ස්වර්ණවර්ණයෙන් අතිමනොහර ය. විදුලිය වන් කන්සහළින් හා දෙව්දුනු වැනි බැම්සහළින් හා නීලොත්පලදලාකාර නෙත්‍රයුගලින් හා අකුණුසනක් මෙන් නිති දිලෙන ඌර්ණරොමයෙන් හා පුන්සඳක් මෙන් බබළන ශ්‍රී මුඛමණ්ඩලයෙන් යුක්තව ශ්‍රමණගණයා මධ්‍යයෙහි සූර්යදිව්‍යරාජයා සේ බබළා වදරණසේක. මෙ බඳු වූ උතුම් රූපවර්ණයක් ඇත්තා වූ නුඹ වහන්සේට ශ්‍රමණභාවයෙන් කම් කිම් ද? සතරදිගින් චක්‍රාවාටය අන්ත කොට ඇති සතරදිග ජය ගන්නා වූ සතරදිගට ඊශ්වර වූ රථශ්‍රෙෂ්ඨ වූ චක්‍රවර්තිරජ වන්ට සුදුසු වනසේක. සතරදිග අනන්තභොගවත් රජ දරුවෝ නුඹ වහන්සේගේ ආඥාචක්‍රයට අනුයුක්ත වෙති. සප්තවිධ රත්නාධිපති වූ රාජාධිරාජොත්තම චක්‍රවර්තිරාජ්‍යශ්‍රීකර වදාළ මැනැවැ' යි කී කල්හි:—

**අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං–භාවෙතබ්බඤ්ච භාවිතං,**
**පහාතබ්බං පහීණං මෙ–තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ.**
**විනයස්සු මයි කඞ්ඛං–අධිමුච්චස්සු බ්‍රාහ්මණ,**
**දුල්ලභං දස්සනං හොති–සම්බුද්ධානං අභිණ්හසො.**
**(192) යෙසං වෙ දුල්ලභො ලොකෙ–පාතුභාවො අභිණ්හසො.**
**සොහං බ්‍රාහ්මණ සම්බුද්ධො–සල්ලකත්තො අනුත්තරො.**
**බ්‍රහ්මභූතො අතිතුලො–මාරසෙනප්පමද්දනො,**
**සබ්බාමිත්තෙ වසීකත්වා–මොදාමි අකුතොභයො.'**

*Non-Commercial Distribution*

යනාදීන් 'එම්බා සෙලයෙනි' තා කී තාක් චක්‍රවර්තිරාජ්‍යශ්‍රී සම්පත්තිය අලුයම දමූ කෙළපිඬක් සේ දමා රාගාදිසකලක්ලෙශයන් භග්නය කොට අනුත්තර වූ සුන්දරාර්යමාර්ගයෙන් ගොස් සද්ධර්මවරචක්‍රවර්තිරජ වීමි. සමස්තලොකයෙහි කිසි කෙනෙකුන් විසින් පවත්වාලිය නො හැක්කා වූ සද්ධර්මවරචක්‍රය යට අජටාකාශයෙහි පටන් මත්තෙන් භවාග්‍රය පර්යන්ත කොට සරසින් අනන්තාපරිමාණලොකධාතුයෙහි ධර්මයෙන් පවත්වන්නෙමි. තවද, **සෙලබ්‍රාහ්මණය,** මා විසින් දත මනා 'දුක්ඛසත්‍ය ධර්මය එකාන්ත දුකැ' යි කියා අවබොධය කරණ ලද්දේ ය. භාවිත කළමනා වූ මාර්ගසත්‍යධර්මයන් භාවිත කරණ ලද්දේ ය. ප්‍රහාණය කට යුතු වූ සමුදයසත්‍යධර්මයන් ප්‍රහාණය කරණ ලද්දේ ය. අවබොධ කළ යුතු වූ චතුරාර්යසත්‍යධර්මයන් හස්තාමලකක්‍රමයෙන් ම අවබොධය කළ හෙයින් බුද්ධ නම් වීමි. සෙලබ්‍රාහ්මණයෙනි, සර්වඥවරයන්ගේ නිරන්තරයෙන් දර්ශනය දුර්ලභ වන්නේ ය. මා කෙරෙහි අසර්වඥ දෝ හො? යි කියා උපන් කාංක්ෂාව දුරු කරව. නිෂ්ඨාවට යව. තවද, බ්‍රාහ්මණයෙනි, ලොකයෙහි යම් සර්වඥකෙනෙකුන් නිරන්තරයෙන් පහළ වීම එකාන්තයෙන් ම දුර්ලභ වේ ද, ඒ දුර්ලභ වූ මම ක්ලෙශව්‍යාධි අනුත්පත්ති කරණයෙන් අනුත්තර වූ රාගාදි ව්‍යාධියට ශල්‍යකර්තෘ වූ සම්‍යක්සම්බුද්ධ යෙමි. එහෙයින් තුන් ලොවට අග්‍ර වීමි, ශ්‍රෙෂ්ඨ වීමි, අතුල්‍ය වීමි, ප්‍රවර වීමි, වස්තුකාමාදි මාරසෙනාව මර්දනය කෙළෙමි. ක්ලෙශාභිසංස්-කාරස්කන්ධමෘත්‍යු දෙවපුත්‍රමාරසංඛ්‍යාත වූ සර්වාමිත්‍රයන් වසඟ කොට ගෙණ කිසිවකිනුත් භයක් නැත්තා වූ මම අර්හත්ඵලසමාපත්තිසැප විහරණ යෙන් සතුටු වන්නෙමි' යි වදාළසේක. එකල්හි චක්‍රවර්තිරජ වන්ට ආරාධනා කොට සිටි සෙලබ්‍රාහ්මණයානෝ චක්‍රවර්තිරාජ්‍යසම්පත් තෙමේ ලද්දක් මෙන් ප්‍රීතියෙන් හරිත ව බුදුන්ගේ ශ්‍රීපාදයෙහි වැඳ වැටී 'සාධු, සාධු, ස්වාමීනි, දශසහශ්‍රීලොකධාතුව එකබසින් වසඟ කරණ බව අද දන්නෙමි. පස්මරුන් මුළු වද්ද මුළුලොවට නිවන්රසය බෙදන බව අද දන්නෙමි. තුන්ලොවට තිලකබව අද දන්නෙමි. මාරවාරණකෙශරීන්ද්‍ර භූත වූ මාගේ තිලෝගුරු බුදුරජානෙනි, අප හැමත් ශාසනයෙහි මහණ කොට නිර්වාණමෘතපානය කරවා වදාළ මැනැවැ' යි කියා ආරාධනා කළහ. එකල[1] 'සෙලයෙනි, මාගේ බ්‍රහ්මචරියයෙහි තෙපි හැමත් හැසිරේව' යි කියා වදාළ බසින් තුන්සියයක් බ්‍රාහ්මණමාණවකයන් හා සමග පෙර කළ පිණින් ඍද්ධිමය පාසිවුරු ධරා සැටවයස් පිරුණු සඟ පෙළක් සේ පුන්සඳ වටා සිටි තරුපෙළක් මෙන් බුදුන් පිරිවරා සිට ගත්හ. මෙසේ වන පරවැඩ තකා භාග්‍යවතුන් වහන්සේ කොසොහිතවස්ත්‍රගුය්හය දක්වා වදාළසේකැ' යි කියා මේ උභතොකොටිකප්‍රශ්නය විසඳා වදාළ කල්හි ''සාධු, සාධු, ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, අනෙකවිධ වූ කාරණයෙන් ප්‍රශ්නය සුනිර්වෙඨනය කරණ ලද්දේ ය. ගහනය අගහනය කරණ ලද්දේ ය. අන්ධකාරයෙහි **(193)** ආලොකය කරණ ලද්දේ ය.

1. කළකල

Non-Commercial Distribution

ගණ්ඨිභේදය කරණ ලද්දේ ය. පරවාදවල් බිඳින ලද්දේ ය. අනාගතයෙහි පහළ වන සර්‍වඥපුත්‍රවරුන් වහන්සේලාට නුඹවහන්සේ විසින් ප්‍රඥ ඇස උපදවන ලද්දේ ය. ප්‍රවරගණීන්ද්‍රභූත වූ නුඹ වහන්සේ කරා පැමිණ තීර්ථකයෝ කථා නැති වූහ'' යි කියා ස්තුති කළහ.

**සෙලප්‍රශ්නය නිමි.**

---

# මොසපුරිසවාද ප්‍රශ්නය

''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, සද්ධර්මසෙනාධිපති වූ **ශාරිපුත්‍ර** ස්ථවිර ස්වාමීන් වහන්සේ විසින් 'ඇවැත්නි, තථාගතයන් වහන්සේ පිරිසිදු වූ වාක්සමාචාර ඇතිසේක. තථාගතයන් වහන්සේ 'මාගේ මේ වාග්දුශ්චරිතය අන්‍යසත්වතෙම නො දනීව' යි කියා යම් වචීසමාචාරයක් රක්ෂා කරන්නේ වී නම්, එබඳු වාග්දුශ්චරිතයක් තථාගතයන් වහන්සේගේ නැතැ' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. නැවත ද, එම තථාගත යන් වහන්සේ **කලන්දකපුත්‍ර** නම් **සුදින්න** තෙරුන් වහන්සේගේ අපරාධ යෙහි ප්‍රථමපාරාජිකාව පණවා වදරමින් පරුෂවචන වූ මොසපුරුෂවාදයෙන් වදළසේක. මොසපුරුෂවාදය කරණ කොට ගෙණ **කලන්දක** තෙරුන් වහන්සේ මහත් වූ නින්දවට පැමිණියේ ය. භය ව විප්පටිසාර ව ආර්‍ය මාර්ගය ප්‍රතිවෙධය කරන්ට නො හැකි වූ සේක. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'පරිසුද්ධවචීසමාචාරො ආවුසො තථාගතො. නත්ථි තථාගතස්ස වචීදුච්චරිතං' කියා වදළ වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'ථෙරස්ස **සුදින්නස්ස** කලන්දකපුත්තස්ස අපරාධෙ මොස පුරිසවාදෙන සමුදචිණ්ණං' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් ''ථෙරස්ස **සුදින්නස්ස** කලන්දකපුත්තස්ස අපරාධෙ මොසපුරිසවාදෙන සමුද චිණ්ණං' යි කියා වදළ වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'පරිසුද්ධ වචීසමාචාරො ආවුසො තථාගතො නත්ථි තථාගතස්ස වචීදුච්චරිතං' යි කියා වදළ වචනය බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, සද්ධර්මසෙනාධිපති වූ **ශාරිපුත්‍ර** ස්ථවිර ස්වාමීන් වහන්සේ විසින් 'පරිසුද්ධවචීසමාචාරො ආවුසො තථාගතො, නත්ථි තථාගතස්ස වචීදුච්චරිතං යං තථාගතො රක්ඛෙය්‍ය මා මෙ ඉදං පරො අඤ්ඤාසි' යි යන මේ කාරණයත් වදරණ ලද්දේ ය. ආයුෂ්මත් වූ **සුදින්න** නම් **කලන්දක** පුත්‍රයානන්ගේ අපරාධයෙහි පාරාජිකාව පණවන්නා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් තුච්ඡපුරිසවාදයෙන් වදරණ ලද්දේ ය. ඒ වදළ බව දුෂ්ට සිතකිනුත් නො වන්නේ ය. උපද්‍රව කරණ සිතකිනුත්

නො වන්නේ ය. ස්වභාවලක්ෂණයෙන් ම එහි වදළ කිසිවෙක් ඇත් නම්, ඒ ස්වභාව ලක්ෂණ ම ය. මහරජානෙනි, යම් පුරුෂයෙකුට මේ ඉහාත්ම භාවයෙහි දී චතුස්සත්‍යාවබොධ නො වේ නම්, ඔහුගේ පුරුෂත්වය සිස් වන්නේ ය. අනිකක් කරණු ලබන්නේ අනිකෙක් පැමිණෙන්නේ ය. ඒ කාරණයෙන් මොඝපුරුෂය යි කියන ලද්දේ ය. මහරජානෙනි, මේ කාරණයෙන් ද භාග්‍යවතුන් වහන්සේ විසින් ආයුෂ්මත් වූ **සුදින්න** නම් **කලන්දක** පුත්‍ර තෙරුන් වහන්සේට ස්වභාව වූ වචනයෙක් වදරණ (194) ලද්දේ ය. අභූතවාදයකින් කී වචනයක් නො වන්නේ ය'' යි කීසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඇති වූ ස්වභාව දෙයකට වුවත් යමෙක් ආක්‍රොශ කෙරෙමින් අනුන්ට ආක්‍රොශ කරන්නේ වී නම්, ඕහට අපි කහවණුවක් පමණ දඩ කරම්හ. ඒ ආක්‍රොශ කරණ පුද්ගලතෙම කාරණයක් පිණිස වෙන් වූ වචන ව්‍යවහාරයෙකින් හැසිරෙමින් ආක්‍රොශ කරන්නේ වී නම් අපරාධය ම ය'' යි කීහ. ''මහරජානෙනි, යම් කිසි අපරාධයක් කළ පුරුෂයෙකුහට එතැන්හි ම පසහ පිහිටුවා වැඳීමෙක් හෝ දුක ආසනයෙන් නැඟී සිටීමෙක් හෝ සත්කාර කිරීමෙක් හෝ උපාසනානුප්‍රදනයක් හෝ කළ බවක් තොප විසින් අසන ලද්දේ ඇද්ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, යම් කිසිවෙකින් යම් කිසිවෙක්හි අපරාධික පුරුෂතෙම බැණීම් ඇසීමට සුදුසු වන්නේ ය. තර්ජනයට සුදුසු වන්නේ ය. ඔහුගෙ උත්තමාංගයත් කපා හරිති. හිංසාත් කෙරෙති. පිටිතොල හයා බඳිති. දිවි නසති. ධන හානියෙන් නිර්ධනික කෙරෙති'' යි කීහ.

''මහරජානෙනි, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් නො සරුප් ක්‍රියාවෙහි ම නිග්‍රහ කරණ ලද්දේ ය. අක්‍රියායෙක්හි නිග්‍රහයක් නො කළ සේකැ'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ක්‍රියාවක් වුවත් කරන්නාහු විසින් සුදුසු වූ දෙයකින් ම කට යුත්තේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුසුදුසු වචන ශ්‍රවණයෙන් තථාගතයන් වහන්සේට දෙවියන් සහිත වූ ලෝවැසිතෙම භය වන්නේ ය. ලජ්ජා වන්නේ ය. දැකීමෙන් ද, එළඹීමෙන් ද, ආශ්‍රය කිරීමෙන් ද, ඊටත් වඩා බොහෝ සෙයින් ම භය වන්නේ ය. ලජ්ජා වන්නේ ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, චිකිත්සාකාරතෙම දෙස් කුපිත ව සකලශරීරයෙහි ව්‍යාප්ත වූ කල්හි ස්නෙහනීය වූ මෘදුබෙහෙත් දෙන්නේ ද?'' යි විචාළසේක. ''නැත. ස්වාමීන් වහන්ස, නිරොග කරණු කැමැත්තා වූ වෛද්‍යතෙම රොගීහට තීක්ෂ්ණ වූ ලෙඛනීය වූ බෙහෙත් දෙන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ සකල ක්ලෙශව්‍යාධිය ව්‍යපශමනය පිණිස අනුශාසනා නමැති බෙහෙත් දෙනසේක.

''මහරජානෙනි, තථාගතයන් වහන්සේගේ පරුෂවචනය වුවත් සත්වයන්ට ස්නෙහය කරන්නේ ය. මෘදු කරන්නේ ය. මහරජානෙනි, යම් සේ උෂ්ණ උදකය ස්නෙහයනීය වූ යම් කිසිවක් තෙත් කරන්නේ ය.

Non-Commercial Distribution

මෘදු කරන්නේ ය. එපරිද්දෙන් ම මහරජානෙනි, තථාගතයන් වහන්සේගේ පරුෂවචනය කරුණා සහගත වූ අර්ථවත් වන්නේ ය. මහරජානෙනි, යම් සේ පිතෘවචනය පුත්‍රයන්ට කරුණාසහගත වූ අර්ථවත් වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේගේ පරුෂවචනය වුවත් කරුණාසහගත වූ අර්ථවත් වන්නේ ය. මහරජානෙනි, තථාගතයන් වහන්සේගේ පරුෂවචනය සත්වයන්ගේ ක්ලෙශප්‍රහාණය කරණ සුලු වන්නේ ය. මහරජානෙනි, යම් සේ දුර්ගන්ධ ඇති බොන ලද්ද වූ ගොමූත්‍රය ද පහ වූ රස ඇති අනුභව කරණ ලද බෙහෙත් ද, සත්වයන්ගේ සියලු ව්‍යාධීන් නසන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම පුරුෂ වුවත් තථාගතයන් වහන්සේගේ කරුණා සහගත වූ වචනතෙම ප්‍රයෝජනවත් වන්නේ ය. තවද මහරජානෙනි, යම් සේ පර්වතයක් සා මහත් වූ පුලුන්ගොඩක් අනුන්ගේ ශරීරයෙහි වැටී රුදව නො කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේගේ පරුෂවචනය කිසි කෙනෙකුන්ට දුකක් නූපදවන්නේ ය'' යි කීසේක. (195) ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්නයතෙම අනෙකවිධ කාරණයෙන් මනා කොට ම විනිශ්චය කරණ ලද්දේ ය. සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්න (විසර්ජනය) එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

මොඝපුරිසවාදප්‍රශ්නය නිමි.

---

## අචේතනවෘක්ෂප්‍රශ්නය.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ විසින් **පලාසජාතකයෙහි:—**

**''අචෙතනං බ්‍රාහ්මණ අස්සුණන්තං,**
**ජානො අජානන්තං ඉමං පලාසං,**
**ආරද්ධවිරියො ධුවං අප්පමත්තො,**
**සුඛසෙය්‍යං පුච්ඡසි කිස්ස හෙතු.''**

යන ගාථාවෙන් කැලවෘක්ෂයෙහි වෘක්ෂදෙවතා ව උපන් බොධිසත්වයන් තමන් වසන කැලවෘක්ෂය සකසා සරසා උදය සැපසෙය්‍යාව විචාරමින් නිති පුදන දුගීබ්‍රාහ්මණයකුහට 'බ්‍රාහ්මණය කිසි චෙතනාවක් නැත්තා වූ කිසිවක් නො අසන්නා වූ කිසිවක් නො දන්නා වූ මේ පලාසවෘක්ෂය අතින් නො දනිමින් ම අප්‍රමාද ව පටන් ගන්නා ලද වීර්යයෙන් යුක්ත ව කවර නම් අර්ථයක් පිණිස අත්‍යර්ථයෙන් සැපසෙය්‍යාව විචාරන්නෙහි ද?' යි යන මේ කාරණය වදරණ ලද්දේ ය. නැවත ද—

Non-Commercial Distribution

**"ඉති ඵන්දනරුක්ඛොපි–තාවදෙවජඣභාසථ,**
**මය්හමපි වචනං අත්ථි–භාරද්වාජ සුණොහි මෙ."**

යන මේ ගාථාවෙන් **ඵන්දනජාතකයෙහි** කාලසිංහයාගේ වචනයෙන් කෝන්වෘක්ෂය කපන්ට ආවා වූ භාරද්වාජ නම් වඩුබ්‍රාහ්මණයාහට එවේලෙහි ම කෝන්වෘක්ෂය තෙමේත් '**භාරද්වාජයෙනි**, මාගේ වචනයක් ඇත. මාගේ වචනය අසව' යි මෙසේ කීයේ ය යි කියා වදාරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, වෘක්ෂයතෙම සිත් නැත්තේ වී නම්, එහෙයින් ඵන්දනවෘක්ෂය භාරද්වාජබ්‍රාහ්මණයා හා සමග කථා කරණ ලද යි කී යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් ස්වාමීනි, ඵන්දනවෘක්ෂයතෙම භාරද්වාජබ්‍රාහ්මණයා සමග කථා කරණ ලද්දේ සැබෑ වී නම්, එහෙයින් වෘක්ෂයතෙම අචේතනය යි කී වචනය බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඒ ප්‍රශ්නය ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් '**රුක්ඛො අචෙතනො**' කියා මෙම කාරණයත් වදාරණ ලද්දේ ය. 'ඵන්දන වෘක්ෂය භාරද්වාජ බ්‍රාහ්මණයා හා සමග කථා කරණ ලද' යි කියාත් වදාරණ ලද්දේ ය. ඒ වචනය වනාහි ලොකව්‍යවහාරයෙන් වදාරණ ලද්දේ ය. මහරජානෙනි, අචේතන වූ වෘක්ෂයාගේ කථාවෙක් නම් නැත්තේ ය. මහරජානෙනි, එතෙකුදු වුවත් වෘක්ෂය යි කියා ඒ වෘක්ෂයෙහි අධිගෘහිත වූ දෙවතාවාහට මේ පර්යායවචනයෙක. 'වෘක්ෂය කථා කරන්නේ ය' යි යන මේ වචනය ලොකව්‍යවහාරයෙක. මහරජානෙනි, යම් සේ ධාන්‍යයෙන් පුරවන ලද ගැල 'ධාන්‍ය ගැල ය' යි කියා ලෝවැසිතෙම ව්‍යවහාර කරන්නේ ය. ඒ ගැල ධාන්‍යමය ගැලක් නො වන්නේ ය. වෘක්ෂමය **(196)** ගැල නම් වන්නේ ය. ඒ දරුමයගැලෙහි ධාන්‍ය[1] පුරවන ලද බැවින් ධාන්‍ය ගැල ය යි කියා ලෝවැසි ජනතෙම කියන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම වෘක්ෂය තෙම කථා නො කරන්නේ ය. වෘක්ෂය සිත් නැත්තේ ය. ඒ වෘක්ෂයෙහි වනාහි අධිගෘහිත වූ යම් දෙවතාවෙක් ඇද් ද, වෘක්ෂය යි කියා ඒ දෙවතාවාහට මේ පර්යාය වචනයෙක. 'වෘක්ෂය තෙම කථා කරන්නේ ය' යි යන මේ කථාතොම ලොක ප්‍රඥප්තියෙක. මහරජානෙනි, යම් සේ 'දීකිරි මථනය කෙරෙමින් මෝරු මථනය කරන්නෙමි' යි කියන්නේ ය. යමක් ඒ පුරුෂතෙම මථනය කෙරෙමින් මෝරු මථනය කෙරෙමි යි කියන්නේ ,ද ඒ මථනය කළ දෙය මෝරු නො වන්නේ ය. දී ම ය. මහරජානෙනි, එපරිද්දෙන් ම වෘක්ෂයතෙම කථා නො කරන්නේ ය. ඒ වෘක්ෂයතෙම අචේතන ය. ඒ වෘක්ෂයෙහි වනාහි අධිගෘහිත වූ යම් දෙවතාවෙක් ඇද් ද, 'ඒ වෘක්ෂය' යි කියා ඒ දේවතාවාහට මේ පර්යායවචනයෙක. වෘක්ෂය තෙම කථා කරන්නේ ය යි කියා මෝ තොමෝ ලොක ව්‍යවහාරයෙක.

1. ධාන්‍යයෙන්

Non-Commercial Distribution

තවද, මහරජානෙනි, යම් සේ අවිද්‍යමාන වූ දෙයක් සාදනු කැමැත්තා වූ පුරුෂතෙම 'නැත්තක් සාදමි' යි කියන්නේ ය. අසිද්ධයක් සිද්ධ ය යි කියන්නේ ය. මෙසේ කියන්නා වූ කථාතොම ලොකව්‍යවහාරසංඥවෙක. මහරජානෙනි, එපරිද්දෙන් ම ඒ වෘක්ෂයතෙම නො ම කථා කරන්නේ ය. වෘක්ෂය සිතක් නැත්තේ ය. ඒ වෘක්ෂයෙහි වනාහි අධිගෘහිත වූ යම් දෙවතාවෙක් ඇද් ද, 'වෘක්ෂය' යි කියා ඒ දෙවතාවාහට මේ පර්යාය වචනයෙක. 'වෘක්ෂය කථා කරන්නේ ය' යි මෝ තොමෝ ලොක ව්‍යවහාරයෙක. මහරජානෙනි, යම් ලොකප්‍රඥප්තියකින් ලෝවැසිහෙම ව්‍යවහාර කෙරේ ද අප තථාගතයන් වහන්සේත් ඒ ලොකව්‍යවහාරයෙන් ම සත්වයන්ට ධර්මදෙශනා කර වදරණ සේකැ'' යි කීසේක. ''සාධු, සාධු, ස්වාමීනි නාගසෙනයන් වහන්ස, ඒ මේ කාරණය එපරිද් දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

**අචෙතනවෘක්ෂප්‍රශ්නය නිමි.**

---

# චුන්ද භත්ත ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රථමධර්මසංගීතිකාරක මහාථෙරස්වාමීන් වහන්සේලා අතුරෙන්:—

**''චුන්දස්ස භත්තං භුඤ්ජිත්වා-කම්මාරස්සාති මෙ සුතං**
**ආබාධං සම්ඵුසී ධීරො-පබාළ්හං මාරණන්තිකං''**

යන ගාථාවෙන් 'සර්වඥයන් වහන්සේ චුන්ද නම් කර්මාරපුත්‍රයාගේ බත වළඳා බලවත් වූ මාරණාන්තික වූ ආබාධය ස්පර්ශ කළසේකැ' යි කියා මා විසින් අසන ලද්දේ ය, යන මේ අර්ථය ආනන්දස්ථවිර ස්වාමීන් වහන්සේ විසින් වදරණ ලද්දේ ය. නැවත ද, භාග්‍යවතුන් වහන්සේ විසින් 'ආනන්දයෙනි, සම වූ සමඵල ඇති සමවිපාක ඇති මේ පිණ්ඩපාතදෙදෙන අනික් පිණ්ඩපාතදනයන්ට වඩා ඉතා මහත්ඵලතර ද වන්නේ ය. මහානිසංසතර ද වන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, චුන්දයාගේ බත වළඳා වදලා වූ භාග්‍යවතුන් වහන්සේට කෘුර වූ ආබාධය උපන්නේ වී නම්, මරණාසන්න වූ බලවත් වේදනාව පැවැත්තේ වී නම්, ඒ කාරණයෙන් 'ද්වෙ මෙ පිණ්ඩපාතා සමා සමඵලා **(197)** සමවිපාකා අතිවිය අඤ්ඤෙහි පිණ්ඩපාතෙහි මහප්ඵලතරා චෙව මහානිසංසතරා චා ති' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'ද්වෙ 'මෙ පිණ්ඩපාතා සමා සමඵලා සමවිපාකා අතිවිය අඤ්ඤෙහි පිණ්ඩපාතෙහි මහප්ඵලතරා චෙව මහානිසංසතරා චා ති' කියා වදළ වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'භගවතො චුන්දස්ස කම්මාරපුත්තස්ස භත්තං භුත්තාවිස්ස ඛරො ආබාධො උප්පන්නො, බාළ්හා වෙදනා පවත්තා මාරණන්තිකා' යි කියා වදළ ඒ වචනය බොරු වන්නේ ය. කිමෙක් ද, ස්වාමීනි,

*Non-Commercial Distribution*

නාගසෙනයන් වහන්ස, ඒ පිණ්ඩපාතයතෙම බුදුන්ගේ දිවි නසන විෂයක් මෙන් විෂ ගත බැවින් මහත්ඵල වී ද? රොගුප්පාදක බැවින් මහත්ඵල වී ද? බුදුන්ගේ ආයුෂ විනාශ කළ බැවින් මහත්ඵල වී ද? බුදුන්ගේ ජීවිතය නැසූ බැවින් මහත්ඵල වී ද? එහි මට අන්‍යදෘෂ්ටීන්ට නිග්‍රහ කරණු පිණිස කාරණයක් වදළ මැනැව. මේ අර්ථයෙහි 'භාග්‍යවතුන් වහන්සේ රසලොභයෙන් පමණ නො දැන ඉතා බොහෝ කොට වැළඳූ බැවින් අජීර්ණ ව ලොහිතපක්ඛන්දිකාබාධය උපන්නේ ය' යි කියා ලෝවැසි තෙම ඉතා මුළාබවට පැමිණියේ ය. මෙත් මිහිරි වූ අර්ථරස ඇති පණ්ඩිත ගොචර වූ උභතොකොටික ප්‍රශ්නයෙක. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, ධර්මසංගීතිකාරක මහාථෙර ස්වාමීන් වහන්සේ විසින්:—

**''චුන්දස්ස භත්තං භුඤ්ජිත්වා–කම්මාරස්සාති මෙ සුතං,**
**ආබාධං සම්ඵුසී ධීරො–පබාළ්හං මාරණන්තිකං''**

යන ගාථායෙන් මේ අර්ථය වදරණ ලද්දේ ය. අප භාග්‍යවතුන් වහන්සේ විසින් පිරිනිවන් මංගල්‍යයට **කුසිනාරා**නුවරට වඩනාසේක් නෙකකොටි සහස්‍රගණන් භික්ෂූන් වහන්සේ පිරිවරා **පාවා** නම් නුවරට වැඩ **චුන්ද** නම් කර්මාරපුත්‍රයාගේ අඹඋයන්හි ලැගුම් ගත්සේක. එකල **චුන්ද** නම් කර්මාර පුත්‍රතෙම සතුටින් පිණා දිව අවුත් වැඳ වැතිර බුදුන්ට ප්‍රමුඛ වූ නොයෙක් දහස්ගණන් භික්ෂූන් වහන්සේට ආරාධනා කොට ගොස් තමාගේ නිවෙසනයෙහි ආහාරසූපාදිය සම්පාදනය කරවමින් තරුණ වූ හූරුමසක් ලදින් 'මෙයින් බුදුන් වළඳවමි'[1] යි සිතා තෙමේ ම සකස් කොට පිසන්ට පටන් ගත. එකල සකලලොකවාසී වූ දෙවතාවෝ 'අනේ! අප බුදුරජානන් වහන්සේ **සුජාතා** නම් සිටු දූවනියන් විසින් දුන් කිරිබත වළඳා ලොවුතුරා බුදු ව පන්සාළිස්හවුරුද්දක් මුළුල්លෙහි අපට ධර්මදෙශනා කර වදළසේක. අද වූ කලි චුන්දයාගේ හූරුමස වළඳ පිරිනිවන් පා වදරණසේක. ලොවුතුරා සර්වඥයන් වහන්සේ කෙනෙකුන්ගේ ලොකයෙහි පහළ වීම කල්පඅසංඛ්‍යයකිනුදු දුර්ලභ වන්නේ ය' යි සිතා සතරමහදිවයින ඇති තාක් දිව්‍යමයරසඔජස් ගෙණ එක ම හූරුමසෙහි බහාලූහ. කර්මාරපුත්‍ර තෙමේත් දෙවෙනි දවස් සපිරිවර බුදුන් වඩා හිඳුවා වළඳවා ලී ය.

''සර්වඥයන් වහන්සේ චුන්දයා ප්‍රමුඛ වූ දිව්‍යමනුෂ්‍යයන්ට දන කථාදියෙන් ධර්මදෙශනා කොට **'ආනන්දයෙනි, කුසිනාරා** නුවරට **යම්හ'** යි නැඟී සිට නිර්මලතර අනන්ත වූ තාරකාසමූහයා පිරිවරා ගමන් ගත් අනන්තශොභාරංජිතචන්ද්‍රමණ්ඩලය සේ ගණන පථය අතික්‍රාන්ත වූ ශ්‍රමණසමූහයා **(198)** පිරිවරා **කුසිනාරා** නුවර කරා වඩනට පටන් ගත් සේක. එකල සර්වඥ අතුල්‍ය වූ සිවුමැලි ශරීරයෙහි චුන්දයාගේ හූරු

1. වළඳමි.

Non-Commercial Distribution

මාංසය නිධාන ගත වූ කාරණයෙන් ලොහිතපක්ඛන්දිකා නම් රොගය හට ගෙණ මරණාසන්න ව වෙදනාව ඉතා බලවත් වී ය. සර්වඥයන් වහන්සේ සිහිනුවණින් යෙදී ඒ වේදනාව ධ්‍යානබලයෙන් මැඩ පවත්වා ගෙණ වඩනාසේක් මාර්ගයෙන් ඉවත් ව එක්තරා රුකක් මුලට වැඩ 'ආනන්දයෙනි, ක්ලාන්ත වීමි. හිඳිනා කැමැත්තෙමි. සඟලසිවුර සතර ගුණ කොට අතුරව' යි වදරා මඳක් කල් එහි වැඩහිඳ 'ආනන්දයෙනි, පිපාසිතයෙමි. පැන් වළඳනු කැමැත්තෙමි' යි පැන් ගෙන්වා වළඳා වදරා එයින් නික්ම වඩනාසේක් **පුක්කුස** නම් මල්ල පුත්‍රයාහට ධර්මදෙශනා කොට සරණ සිල් ගන්වා ඔහු පිදූ ශෘංගීස්වර්ණවර්ණ වස්ත්‍රයුගලය හැඳ පෙරෙවගෙණ **කකුත්ථා** නම් ගංගාවට වැඩ පැන් සනහා වදරමින් චීවර ශරීරාලොකයෙන් දෙගංහිත්ති ස්වර්ණවර්ණ කෙරෙමින් ඊට නුදුරු වූ ආම්‍රොද්‍යානයට වැඩ ආනන්ද නම් තෙරුන් කැඳවා **'ආනන්දයෙනි**, ක්ලාන්ත වීමි. සයනය කරණු කැමැත්තෙමි. වහා චතුර්ගුණ කොට සඟළ සිවුර අතුරව' යි වදරා පණවන ලද සිවුර මත්තෙහි සිහි නුවණින් යෙදී සිංහශය්‍යාවෙන් වැද හොත්සේක.

''මෙසේ ස්වභාවබලයෙන් කෙළදහසක් ඇතුන්ගේ බල ධරන්නා වූ මාගේ සර්වඥරාජොත්තමශානන් වහන්සේ තමන් වහන්සේගේ ශරිර යෙහි රොගය හට ගත් වේලෙහි පටන් ශ්‍රීපාදද්වන්දද්වය නගා යා නො හැකි ව මහත් වූ ශරීරායාසයෙන් වඩනාසේක්, යෞවන මදමත්ත ජනයන්ගේ යෞවනමදයට නින්දකරන්නා සේ, සංසාරයෙහි ඇලුම් කරණ සත්වයන්ට සංසාරදෙෂය දක්වන්නා සේ, සියලු සත්වයන්ට ජාති ජරා ව්‍යාධි මරණ දුක් දක්වන්නා සේ, ඇසුවන්ගේ සිත් කම්පා කරවමින්, දුටුවන්ගේ ඇස් කඳුළු ගන්වමින්, සිතුවන්ගේ සිත් ශොක කරවමින්, තුන්ලෝවාසීන්ට සංසාරදුක් තෝරවමින් **'ආනන්දයෙනි**, ක්ලාන්ත වීමි. ආනන්දයෙනි, පිපාසිතයෙමි. ආනන්දයෙනි, පැන් වළඳනු කැමැත්තෙමි. ආනන්දයෙනි, වැද හෝනා කැමැත්තෙමි' යි වදරවදරා තුන්ගවු පමණ දුර මාර්ගයෙහි පස්විසි තැනෙක වැඩ හිඳහිඳ මහත් වූ ශරීරායාසයෙන් වඩනාසේක්, **කුසිනාරා** නුවරට නුදුරු වූ අම්‍රොද්‍යානයට වැඩ **'ආනන්ද** යෙනි, චුන්දයාහට යම් කිසිවෙක් චුන්දය, තා දුන් දනය වළඳා බුදුරජානන් වහන්සේ පිරිනිවන් පා වදළසේක. තොපට වූයේ මහත් අලාභයෙකැ' යි කියා කුකුස් උපදවා ලූයේ වී නම්, 'ආනන්දයෙනි, තෙපි මෙසෙයින් චුන්දයාගේ කුකුස් සන්සිඳුවාලව. ඇවැත්නි, **චුන්දයෙනි**, තොපට වූයේ මහත් ලාභයෙක. ඇවැත්නි, චුන්දයෙනි, අප ලොවුතුරා බුදුන්ගේ සම්මුඛයෙන් ම අසන ලද්දේ ය. සම්මුඛයෙන් ම පිළිගන්නා ලද්දේ ය. ආනන්දයෙනි, සම වූ සමඵල ඇත්තා වූ සමවිපාක ඇත්තා වූ අනික් පිණ්ඩපාතදනයන්ට වඩා ඉතා මහත්ඵලතර වූ, මහානිසංසතර වූ මේ පිණ්ඩපාතයෝ දෙදෙනෙක් වෙති. ඒ පිණ්ඩපාතද්වය කවරේ ද? තථාගතයන් වහන්සේ සුජාතාවන් දුන් යම් පිණ්ඩපාතයක් වළඳා අනුත්තර වූ සම්‍යක්සම්බොධිය අවබොධකර වදළසේක් ද, **චුන්දයා** දුන්

Non-Commercial Distribution

යම් පිණ්ඩපාතයක් වළඳා අනුපාදිශෙෂ වූ නිර්වාණධාතුවෙන් පිරිනිවන් පානාසේක් ද, මේ පිණ්ඩපාතයෝ දෙදෙන එක සම වූහ. සම ඵල වූහ. සමවිපාක වූහ. සෙසු පිණ්ඩපාතයන්ට වඩා මහත්ඵලතර ද, මහානිසංසතර ද වන්නාහ.[1] (199) ආයුෂ්මත් වූ චුන්ද නම් කර්මාර පුත්‍රයා විසින් ආයුසංවත්තනික වූ කුසලකර්මයක් රැස් කරණ ලද්දේ ය. වර්ණ සැප යස සංවත්තනික වූ ස්වර්ගසංවත්තනික වූ ආධිපත්‍ය[2] සංවත්තනික වූ කුශලකර්මයක් රැස් කරණ ලද්දේ ය' යි කියා, ආනන්දයෙනි, චුන්දයාගේ කුකුස් සන්හිඳුවා ලව' යි කියා භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලද්දේ ම ය. ඒ පිණ්ඩපාතය වනාහි බොහෝ වූ ගුණ ඇත්තේ ය. අනෙකානිසංස ඇත්තේ ය.

''මහරජානෙනි, සන්තොෂ වූ ප්‍රසන්න වූ සිත් ඇති දෙවතාවෝ 'මේ අප භාග්‍යවතුන් වහන්සේගේ අන්තිම වූ පිණ්ඩපාතයෙකැ' යි සිතා දිව්‍යමය වූ රසඔජස් ගෙණ සූකරමද්දව නම් ඒ තරුණ වූ ඌරුමාංසයෙහි බහාලූහ. ඒ මස වනාහි මනා ව විපාක වූයේ ය. මෘදු වූ විපාක වූයේ ය. මනොඥ වූයේ ය. බොහෝ රස ඇත්තේ ය. ජඨරාග්නිතෙජො ධාතුවට හිත වූයේ ය. මහරජානෙනි, ඒ මාංසය වළඳා වදළ කාරණයෙන් භාග්‍යවතුන් වහන්සේට නො උපන්නා වූ කිසි රොගයක් නො උපන්නේ ය. මහරජානෙනි, එතෙකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේගේ ක්ෂීණ වූ ආයුස්සංස්කාරය ඇති ප්‍රකෘතියෙන් ම දුර්වල වූ ශරීරයෙහි උපන්නා වූ රොගය බොහෝ සෙයින් ම වැඩුනේ ය. මහරජානෙනි, යම් සේ ප්‍රකෘතියෙන් ම ඇවිළ දිලියෙන්නා වූ ගින්නෙහි වෙනින් ගිනිපෙනෙලි දුන් කල්හි බොහෝ සෙයින් ම ගිනි ගෙණ ඇවිළෙන්නේ ම ය. මහරජානෙනි, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රකෘතියෙන් ම ක්ෂීණ වූ ආයුස්සංස්කාර ඇති දුර්වල වූ ශරීරයෙහි උපන් රොගය බොහෝ සෙයින් ම වැඩුනේ ය. තවද, මහරජානෙනි, යම් සේ නිති වැහෙන්නා වූ ප්‍රකෘති වූ උදකශ්‍රොතය මහාමෙඝය වර්ෂා කරණ කල්හි බොහෝ සෙයින් මහොඝය වූ උදකවාහකය වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රකෘතියෙන් ම ක්ෂීණායුස්සංස්කාරය ඇති දුර්වල වූ ශරීරයෙහි උපන්නා වූ රොගයතෙම බොහෝ සෙයින් ම වැඩුනේ ය.

''තවද, මහරජානෙනි, යම් සේ ප්‍රකෘතියෙන් ම පිරුණා වූ ආහාර ධාතු කුක්ෂිය[3] අන්‍ය ආහාරයක් වැළඳූ කල්හි බොහෝ සෙයින් ම නො දිරා චළකින්නේ ය. මහරජානෙනි, ඒ පරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රකෘතියෙන් ම දුර්වල වූ ගෙවුනු ආයුස්සංස්කාරය ඇති ශරීරයෙහි උපන් රොගයතෙම බොහෝ සෙයින් ම වැඩුනේ ය. මහරජානෙනි, එහෙයින් ඒ පිණ්ඩපාතයෙහි දෙෂයෙක් නැත්තේ ය. ඒ පිණ්ඩපාතයට දෙෂය ආරොපණය කරන්ට නො හැකි වන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කවර කාරණයකින් ඒ පිණ්ඩපාතයෝ දෙදෙන

1. වන්නේ ය 2. ආධිප්‍රත්‍යය 3. කුක්ෂිතොම

Non-Commercial Distribution

එකසම වූ ද? සමඵල වූ ද? සමවිපාක වූ ද? සෙසු පිණ්ඩපාතයන්ට වඩා ඉතා මහත්ඵලතර වෙද් ද? මහානිසංසතර වෙද් ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ඒ පිණ්ඩපාතයෝ දෙදෙන ධර්මානුමාර්ජන සමාපත්ති වශයෙන් එකසම වූහ. සමඵල වූහ. සමවිපාක වූහ. සෙසු පිණ්ඩපාත දනයන්ට වඩා ඉතා මහත්ඵලතර වූහ. මහානිසංසතර වූහ'' යි වදාළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කවර ධර්මකෙනෙකුන්ගේ අනුමාර්ජනසමාපත්ති වශයෙන් ඒ පිණ්ඩපාතයෝ දෙදෙන එක සම වූ ද? සමඵල වූ ද? සමවිපාක වූ ද? සෙසු පිණ්ඩපාතයන්ට වඩා ඉතා මහත් ඵලතර වූ ද? මහානිසංසතර වූ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, අප භාග්‍යවතුන් **(200)** වහන්සේ එදවස් සවස් වේලෙහි ඒ ආම්‍රොද්‍යාන යෙන් නික්ම **හිරණ්‍යවතී** නම් ගඟෙන් එතෙර **කුසිනාරා**වෙහි[1] ශාලොද්‍යාන යට වැඩ උද්‍යාන ක්‍රීඩාවට ගෙණ මල්ලරජුන්ගේ ශ්‍රී යහනක් දක '**ආනන්ද**යෙනි, ක්ලාන්ත වීමි, සයනය කරණු කැමැත්තෙමි, වහා මට ශාලවෘක්ෂයන් දෙදෙනා අතුරෙහි උත්තර ශීර්ෂ කොට ශ්‍රීයහන පණවව'යි වදරා පණවන ලද ශ්‍රීයහන් මස්තකයෙහි උතුරට හිස ලා නැවැත නැඟී නො සිටින පරිද්දෙන් සිහිනුවණින් යෙදී දක්ෂිණපාර්ශ්වයෙන් සිංහශය්‍යා වෙන් දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්මයන් විසින් නිති පුදන පූජාවෙන් යුක්ත ව වැදහොත්සේක. මෙසේ වැඩහිඳ 'ආනන්දයෙනි, මල්ලරජුන්ට කථා නො කොට නිවන්පුර ගියෙම් නම්, මල්ල රජදරුවෝ, 'අනේ! අප බුදුරජානන් වහන්සේ අපගේ ග්‍රාමක්ෂෙත්‍රයෙහි දී ම පිරිනිවන් පා වදළ සේක. අහෝ! අන්තිම කාලයෙහි දැස් පුරා බුදුන් දක්නට නො ලදුම්හ. අප කරා වැඩි බුදුන්ගෙන් දහම් අසාපියන්ටත් නො ලදුම්හ. සිත් සකසා වැඳපියන්ටත් නො ලදුම්හ' යි මහාශොකී වෙති. එබැවින් මා ආ පවත් මල්ලරජුන් කරා ගොස් කියව' යි වදළසේක. 'යහපත, ස්වාමීන් වහන්සැ' යි කියා **ආනන්ද** ථෙරස්වාමීන් වහන්සේ මල්ල රජුන්ගේ සන්ථාගාරශාලාවට ගොස් 'පින්වත් වූ **වාසෙට්ඨ**වරුනි, අප බුදුරජානන් වහන්සේ දූන් තොපගේ සල්උයනෙහි වැඩ වසනසේක. අද අලුයම්හි පිරිනිවන් පා වදරණසේක. 'අහෝ! බුදුරජානන් වහන්සේ අපගේ ගම් දෙර දී පිරිනිවන් පා වදළසේක. අහෝ! අන්තිමකාලයෙහි බුදුන් දක බණ අසාපියන්ට නො ලදුම්හ' යි පශ්චාත්තාප නො වී වහා ගොස් අප බුදුන් දකිත්වා' යි වදළසේක. එපවත් ඇසූ සැටදහසක් පමණ මල්ලරජදරුවෝ ද ඒ තාක් බිසෝවරුන් හා කුමාරවරු ද, යේළිනී කුමාරිකාවරු ද:—

> **''අභාවීතො දුම්මනා චෙතොදුක්ඛසමප්පිතා අප්පෙකච්චෙ කෙසෙ පකිරිය කන්දන්ති, බාහා පග්ගය්හ කන්දන්ති, ඡින්න පපාතං පපතන්ති, ආවට්ටන්ති, විවට්ටන්ති, අතිඛිප්පං භගවා පරිනිබ්බායිස්සති, අතිඛිප්පං සුගතො පරිනිබ්බායිස්සති. අතිඛිප්පං චක්ඛුං ලොකෙ අන්තරධායිස්සතී' ති.''**

1. කුසිනාරාවන්ගේ



Non-Commercial Distribution

යනාදීන් උපන්නා වූ මහදුක් ඇති ව දෙම්නස් ඇති ව චිත්තදුක්ඛයෙන් සමප්පිත ව 'අනේ අප භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ ඉතා කඩිනමින් පිරිනිවන් පා වදාරණසේක. අහෝ! අප සුගත තථාගතයන් වහන්සේ ඉතා කඩිනමින් පිරිනිවන් පා වදාරණසේක. අහෝ! ලොකයෙහි අප සියල්ලන් ගේ දුක් බලන්නා වූ බුදුඇස ඉතා කඩිනමින් අන්තර්ධාන වන්නේ ය' යි කියකියා සමහර කෙනෙක් හිසකෙස් විසුරුවා[1] ගෙණ හඬන්නාහ. සමහර කෙනෙක් හිස අත බැඳ ගෙණ හඬන්නාහ. සමහර කෙනෙක් ඡින්නවෘක්ෂපතනාකාරයෙන් ඒ ඒ අතට නැමීනැමී හඬන්නාහ. සමහර කෙනෙක් හඬා වැටී පෙරළී එමින් ආවර්තනය වන්නාහ. ඒ ඒ අතට පෙරළිපෙරළි යමින් විවර්තනය වන්නාහ. මෙසේ අනෙක ශොකාතුර ව හඬා වැලප **ආනන්දස්ථවිර** දර්ශනප්‍රීතියෙන් සිහි උපදවා ගෙණ නැඟී සිට මහාශොකයෙන් හඬහඬා බුදුන් කරා ගොස් බුද්ධදර්ශනයට විෂය වන තාක් තන්හි වැතිර සිට ගන්නාහ. ඔවුන්ට ධර්මදෙශනා **(201)** කිරීමෙන් ශොක තුනී කොට සමු දෙමින් **සුභද්‍ර** නම් පරිබ්‍රාජකයා විනයනය කොට රහත් කරවා **මහාසුදර්ශනසූත්‍රය** දෙශනා කොට දසදහසක් සක්වළින් අවුත් රැස් වූ දිව්‍යබ්‍රහ්මාදීන්ට ධර්මදෙශනා කොට **ශක්‍රදෙවෙන්ද්‍රයාහට** ශක්‍රදෙවෙන්ද්‍රය යි වදරා:—

**"පතිට්ඨිස්සති දෙවින්ද-ලඞ්කායං මම සාසනං,**
**තස්මා සපරිවාරං තං-රක්ඛ ලඞ්කඤ්ච සාධුකං.**
**විජයො ලාළවිසයා-සීහබාහුනරින්දජො,**
**එකො ලඞ්කමනුප්පත්තො-සත්තාමච්චසතානුගො"** යි

යනාදීන් 'එම්බා! ශක්‍රදෙවෙන්ද්‍රයෙනි, මාගේ ත්‍රිවිධ වූ ශාසනය මෙහි **ශ්‍රී ලංකාද්වීපයෙහි** සුස්ථිර ව පිහිටයි. **සිංහබාහු** නම් නරෙන්ද්‍රයාගේ පුත්‍ර වූ **විජය** නම් එක් රාජකුමාරයෙක් **ලාඩ** දෙශයෙන් සත්සියයක් අමාත්‍ය යොධයන් ගෙණ ශ්‍රී ලංකාද්වීපයට පැමිණ මනුෂ්‍යවාස කෙරෙයි. එබැවින් පිරිවර සහිත වූ ඒ රාජකුමාරයා හා ලංකාශාසනය යහපත් කොට රක්ෂා කරව' යි කියා ලංකාරජුන් හා ශාසනය ශක්‍රදෙවෙන්ද්‍රයාට භාර කොට අලුයම්වේලෙහි සංඝයාට ආමන්ත්‍රණය කොට 'මහණෙනි, මා විසින් පන්සාළිස්හවුරුද්දක් මුළුල්ලෙහි කී ධර්මයෙහි තොපට සැකයක් ඇත් නම්, බුදුන්ගෙන් අසාපියන්ට නො ලදුම්හ' යි කියා ශොක නො කොට මාගෙන් ඇසුව මැනැව. එසේත් භය ඇතියා නම් ඔවුනොවුන් හා සමග කථා කළ මැනැවැ' යි වදරා එබඳු සැකයක් නැති බැවින් තුෂ්ණීම්භූත ව හුන් සංඝයා බලා **'හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො, වයධම්මා සංඛාරා, අප්පමාදෙන සම්පාදෙථ'** යි යනුවෙන් එසේ වී නම් 'මම නිවන්පුර යන්නෙමි. තොපට ආමන්ත්‍රණය කරන්නෙමි. සර්වසංස්කාර ධර්මයෝ ව්‍යයස්වභාව වූහ. ත්‍රිවිධශික්ෂාව අප්‍රමාදයෙන් සම්පාදනය කරව්' කියා අප්‍රමාදපදයෙන් අවවාද කොට නවමහාඅනුපූර්වවිහාරසමාපත්ති

1. විසිර

Non-Commercial Distribution

සංඛ්‍යාත වූ ප්‍රථමධ්‍යානය ද්විතීයධ්‍යානය තෘතීයධ්‍යානය චතුර්ථධ්‍යානය අරූපධ්‍යානසතර ය සංඥාවෙදයිතනිරොධසමාපත්තිය යන මේ සූවිසි කෙළලක්ෂයක් පමණ ප්‍රභෙද ඇති නවවිධ වූ අනුපූර්වවිහාරසමාපත්තීන්ට නො වරදවා ම අනුලොමප්‍රතිලොම වශයෙන් සමවැද වදළසේක.

''මහරජානෙනි, නවවිධ වූ අනුපූර්වවිහාරසමාපත්තීන්ගේ අනුලොම ප්‍රතිලොම සමවැදීම් වශයෙන් ඒ පිණ්ඩපාතයෝ දෙදෙන සම වූහ. සම ඵල වූහ, සමවිපාක වූහ. අනික් පිණ්ඩපාතයන්ට වඩා ඉතා මහත්ඵලතර ද වූහ. මහානිසංසතර ද වූහ'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ලොවුතුරා බුද්ධරාජ්‍යයට පැමිණ වදළා වූ ද, පිරිනිවන් පා වදළ වූ ද දෙදවස්හි ම අධිකමාත්‍ර ව තථාගතයන් වහන්සේ නවානුපූර්වවිහාර-සමාපත්ති අනුලොමප්‍රතිලොම වශයෙන්[1] සමවැද වදළසේක් දැ?'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජානෙනි,'' යි කීසේක. ''ස්වාමීනි, නාග සෙනයන් වහන්ස, ඉතා ආශ්චර්ය ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉතා අද්භූත ය, මේ අප බුදුන්ගේ බුද්ධක්ෂෙත්‍රයෙහි අසදෘශ වූ පරම වූ යම් අසදෘශදනයෙක් ඇද් ද, ඒ අසදෘශදනයත් මේ පිණ්ඩපාතද්වය හා සදෘශ බවට නො ගණිත ලද්දේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉතා **(202)** ආශ්චර්ය ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉතා අද්භූත ය. යම් තාක් නවමහාඅනුපූර්වවිහාරසමාපත්තීන් යම් තෙනෙක්හි නම්, ඒ තාක් නවානුපූර්වවිහාරසමාපත්ති වශයෙන් චුන්දයාගේ දනය මහත් ඵලතර වන්නේ ය. මහානිසංසතර වන්නේ ය. සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ වදළ කාරණය එපරිද්දෙන් ම පිළි ගන්නෙමි'' යි කීහ.

**චුන්දහත්තප්‍රශ්නය නිමි.**

---

# ආමිසපූජාප්‍රතික්ෂෙප ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ විසින් **'ආනන්දයෙනි,** තෙපි තථාගතයාගේ ශරීරපූජාව පිණිස ව්‍යාපෘත නො වවු' යි කියා මේ කාරණය වදරණ ලද්දේ ය. නැවත 'පූජනීයයාගේ ඒ ධාතු යථාශක්තීන් පූජාසත්කාර කරවු. මෙසේ කරන්නා වූ නුවණැත්තෝ මේ මිනිස්ලොවින් ස්වර්ගලොකයට යන්නාහ' යි කියාත් වදරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ විසින් 'අව්‍යාවටා තුම්හෙ ආනන්ද හොථ තථාගතස්ස සරීරපූජාය' යි කියා වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'පූජෙථ නං පූජනීයස්ස ධාතුං, එවංකරා සග්ගමිතො ගමිස්සථ' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් 'පූජෙථ

---

1 අනුලොම ප්‍රතිලොමයට

නං පූජනීයස්ස ධාතුං, එවංකරා සග්ගමිතො ගමිස්සථ' යි කියා වදරණ ලද්දේ සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'අව්‍යාවටා තුම්හෙ ආනන්ද, හොථ තථාගතස්ස සරීරපූජාය' යි කියා වදාළ ඒ වචනය බොරු වන්නේ ය. මේත් උභතොකොටිකප්‍රශ්නයෙක. නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නය නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'අව්‍යාවටා තුම්හෙ ආනන්ද, හොථ තථාගතස්ස සරීරපූජාය' යන මේ කාරණයත් වදරණ ලද්දේ ය. නැවත ද 'පූජෙථ නං පූජනීයස්ස ධාතුං, එවංකරා සග්ගමිතො ගමිස්සථ' යි යන මේ කාරණයත් වදරණ ලද්දේ ම ය. ඒ වදාළ කාරණය වනාහි 'අව්‍යාවටා තුම්හෙ ආනන්ද, හොථ තථාගතස්ස සරීරපූජාය' යි කියා මෙසේ සියලු ම ජිනපුත්‍රයන් අරභයා නො වදරණ ලද්දේ ය. මහරජානෙනි, සර්වඥරාජොත්තමයානන් වහන්සේ එම පිරිනිවන් සමයෙහි අනඳ මහතෙරුන් වහන්සේට:—

**'අව්‍යාවටා තුම්හෙ ආනන්ද, හොථ තථාගතස්ස සරීර පූජාය, ඉඞ්ඝ තුම්හෙ ආනන්ද, සදත්ථෙ ඝටථ. සදත්ථමනුයුඤ්ජථ. සදත්ථෙ අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරථ. සන්තා නන්ද, ඛත්තියපණ්ඩිතා'පි බ්‍රාහ්මණපණ්ඩිතා'පි ගහපති පණ්ඩිතා'පි තථාගතෙ අභිප්පසන්නා, තෙ තථාගතස්ස සරීරපූජං කරිස්සන්ති.'**

යනුවෙන් 'ආනන්දයෙනි, තෙපි තථාගතයාගේ ශරීරපූජාව පිණිස ව්‍යාපෘත නො වවූ. ආනන්දයෙනි, තෙපි උතුම් වූ අර්හත්ඵලයෙහි ව්‍යායාම කරවු. එම අර්හත්ඵලය උපදවාලීමට නො හැර ම වීර්ය කරවු. තමන්ගේ ස්වකීය වූ උතුම් නිර්වාණාර්ථ සිද්ධියෙහි අප්‍රමාද ව කෙලෙසුන් නසන වීර්යයෙන් **(203)** යුක්ත ව නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇති ව වාසය කරවු. ආනන්දයෙනි, තථාගත වූ මා කෙරෙහි අභිප්‍රසන්න වූ රාජපණ්ඩිතවරුත් ඇත. බ්‍රාහ්මණපණ්ඩිතවරුත් ඇත. ගෘහපතිපණ්ඩිත වරුත් ඇත. ඒ ගෘහස්ථපණ්ඩිතවරු තථාගත වූ මාගේ ශරීරධාතු පූජා කෙරෙති' යි කියා භික්ෂූන් ප්‍රතිපත්තිපූජායෙහි යොදා ගෘහස්ථයන් ආමිෂ පූජායෙහි යොදා වදාළසේක.

''මහරජානෙනි, යම් මේ ආමිසපූජාවක් ඇද් ද, මේ තෙම වනාහි සර්වඥපුත්‍රයන් විසින් කට යුතු කර්මයෙක් නො වන්නේ ය. සර්වසංස්-කාරයන් අනිත්‍යවශයෙන් සම්මර්ශනය කිරීම ද, යොනිසොමනස්කාරය ද, සතරසතිපට්ඨානුපස්සනා කෙනෙක් ඇද් ද, අනිත්‍යාදි ආරම්මණයෙහි සාරග්‍රහණයෙක් ඇද් ද, ක්ලෙශයන් හා යුද්ධයක් ඇද් ද, අර්හත්ඵලයෙහි යෙදීමෙක් ඇද් ද, මේ තෙම ජිනපුත්‍රයන් විසින් කට යුතු දෙය නම් වන්නේ ය. අවශෙෂ වූ දිව්‍යමනුෂ්‍යයන් විසින් ආමිසපූජා කට යුතු

*Non-Commercial Distribution*

වන්නේ ය. මහරජානෙනි, යම් සේ මහාපෘථිවියෙහි රජදරුවන් විසින් හස්තිශිල්ප ය, අශ්වශිල්ප ය, රථශිල්ප ය, ඛඩ්ගශිල්ප ය, ධනුශ්ශිල්ප ය, අක්ෂරලිඛිත ය, ඇඟිල්ල අල්ලා කියන සාමුද්‍රිකාශිල්ප ය, ක්ෂත්‍රිය[1] මායම් දන්නා ක්ෂත්‍රියමන්ත්‍ර ය, ශ්‍රැතිශාස්ත්‍ර ය, ස්මෘතිශාස්ත්‍ර ය, යුද්ධප්‍රයොග ක්‍රියාව ය (යන මෙය) කට යුතු වන්නෝ ය. අවශෙෂ වූ බොහෝ ගෘහපතිශූද්‍රයන් විසින් කෘෂිවණික් ගව රක්ෂා කට යුතු වන්නේ ය.

''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් මේ ආමිසපූජාවෙක් ඇද් ද' ජිනපුත්‍රයන් විසින් මේ තෙම කට යුතු දෙයක් නො වන්නේ ය. සංස්කාරයන් සම්මර්ශනය කිරීම ද, යොනිසොමනස්කාරය ද සතර සතිපට්ඨාන දර්ශනය- ද අරමුණෙහි සාරග්‍රහණය ද කිලෙසයුද්ධය ද නිර්වාණාර්ථයෙහි යෙදීම ද යන මේ තෙම සර්වඥපුත්‍රයන් විසින් කට යුතු වන්නෙ ය. අවශෙෂ වූ දිව්‍යමනුෂ්‍යයන් විසින් සෙසු පූජා කට යුතු වන්නේ ය.

''මහරජානෙනි, යම් සේ බ්‍රාහ්මණමාණවකයන් විසින් ඍග්වෙදය යජුර්වෙදය සාමවෙදය අථර්වන් නම් ඉන්ද්‍රජාලවිද්‍යාය[2] 'මෙබඳු ලක්ෂණයෙන් සමන්විත වූයේ රජ වන්නේ ය, යනාදීන් කියන ලක්ෂණශාස්ත්‍රය ද, **භාරතරාමායණාදි** පුරාණකථාව ද, වෘක්ෂාදීන්ගේ නම් කියනා[3] නිඝණ්ඩු ශාස්ත්‍රය ද, වර්ණපාදබන්ධන පදර්ථාදියෙන් සර්වාකාරනිර්මල වූ කෙටුභ නම් ප්‍රබන්ධ කරණ ශාස්ත්‍රය ද, මූර්ධජඔෂ්ඨජාදී විසින් අක්ෂරයන්ගේ ස්ථාන කරණ නිර්වචනභාවයෙන් අක්ෂරප්‍රභෙදය ද, නාමාඛ්‍යාතොපසර්ගනිපාතය යන චතුර්විධ පදය ද, ඒ ඒ ශබ්දර්ථයන් ප්‍රකාශ කරන්නා වූ ව්‍යාකරණ ශාස්ත්‍රය ද, අර්ථකථනමාර්ගය දෝ හෝ නොහොත් භාෂ්‍ය මාර්ග නම්[4] ශාස්ත්‍රය ද, සෙණ ගැසීම් ආදිය දුක 'මෙබඳු ඉෂ්ටානිෂ්ටයෙක් ඇතැ' යි කියන්නා වූ උත්පාතිකශාස්ත්‍රය ද, ස්වප්නයන්ගේ ඉෂ්ටානිෂ්ට කියන්නා වූ ස්වප්නමාලාශාස්ත්‍රය ද, ඒ ඒ කාර්ය පරීක්ෂා කොට බලා කියන්නා වූ නිමිතිශාස්ත්‍රය ද, ෂඩ්විධ වූ වෙදාංගශාස්ත්‍රය ද, චන්ද්‍රග්‍රහණය ද, සූර්යග්‍රහණය ද, ශුක්‍රරාහුචරිතය ද, ග්‍රහතාරකායුද්ධය ද, අසනිපාත වශයෙන් ආකාශයෙහි ශුෂ්ක වලාහක ගර්ජනා කෙරෙමින් යන දෙවදුන්දුභිස්සරය ද, චන්ද්‍රසූර්යාදීන්ගේ රාශි ගමන දෝ හෝ නොහොත් අවක්‍රාන්තිය ද, ආකාශයෙන් ගිනිසිළු වැටීම් වශයෙන් පවත්නා උල්කාපාතය ද, පෘථිවි කම්පාව ද, වහ්නිශිඛාවෙන් දික් දහය ද, භූම්‍යන්තරීක්ෂයෙහි දෙෂ පරීක්ෂා කොට **(204)** ගෘහවස්තුශුද්ධිය කියන්නා වූ භූම්‍යන්තරීක්ෂශාස්ත්‍රය ද, ගණිතාඛ්‍ය වූ ජ්‍යොතිශ්ශාස්ත්‍රය ද, ලොකායතික නම් තර්කය ද, සාවක්‍ර නම් ශාස්ත්‍රය ද, මෘගචක්‍ර නම් ශාස්ත්‍රය ද, අන්තරචක්‍ර නම් ශාස්ත්‍රය ද,

1. ශාක්‍ය
2. මෙහි මෙසේ කීවත් අථර්වවෙදය ඉන්ද්‍රජාලවිද්‍යාව නොව මන්ත්‍රවිද්‍යාව ය.
3. කියන ලද
4. භාසමාර්ග නම එනම්·

මිශ්‍රකොත්ථාශාස්ත්‍රය ද, පක්ෂීන්ගේ හැඬීම් ශබ්ද අසා ඵලාඵල කියන ශාස්ත්‍රය ද යන මෙකී ශික්ෂාවෝ කට යුත්තාහු ය. බොහෝ වෛශ්‍යශුද්‍රයන් විසින් කෘෂිවණික් ගව රක්ෂා කට යුත්තාහු ය.

''මහරජානෙනි, එපරිද්දෙන් ම සර්වඥපුත්‍රයන් විසින් යම් මේ ආමිස පූජා කිරීමෙක් ද ඇද් ද, මේ තෙම කට යුත්තෙක් නො වන්නේ ය. සර්ව සංස්කාරයන් කෙරෙහි සම්මර්ශනය යොනිසොමනස්කාරයෙන් පැවැත්ම ද කායානුපස්සනාදි සතරසතිපට්ඨානය දැකීම ද, අරමුණෙහි සාරග්‍රහණය ද, තත් තත් මාර්ගයෙන් ක්ලෙශයන් නැසීම් වශයෙන් කරණ ක්ලෙශ යුද්ධය ද, අර්හත්ඵලයෙහි යෙදීම ද යන මේ ප්‍රතිපත්තිපූජාව සර්වඥ පුත්‍රයන් විසින් කට යුතු වන්නේ ය. අවශෙෂ වූ දිව්‍යමනුෂ්‍යයන් විසින් ආමිසපූජා කට යුතු වන්නේ ය.

''මහරජානෙනි, එහෙයින් අප බුදුරජානන් වහන්සේ 'මාගේ මේ ශ්‍රාවකයෝ අකර්මයෙහි නො යෙදෙත්ව' යි 'මාගේ මේ ශ්‍රාවකයෝ කට යුතු කර්මයෙහි ම යෙදෙත්ව' යි කියා කරුණා කර වදරමින් 'අව්‍යාවටා තුම්හෙ ආනන්ද, හොථ තථාගතස්ස, සරීරපූජාය' යි කියා මේ පාළිය වදළසේක. මහරජානෙනි, ඉදින් අප තථාගතයන් වහන්සේ මේ කාරණය මෙසේ නො වදළසේක් නම් පස්වාදහසක් හවුරුදු මුළුල්ලෙහි භික්ෂූහු තමතමන්ගේ පාත්‍රසිවුරුත් පූජා පිණිස ගෙණ බුද්ධපූජාව ම කරන්නාහු ය'' යි කීසේක. ''යහපත ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ කාරණය වදළ නියා යම් පරිද්දෙකින් ද එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' කීහ.

ආමිසපූජාප්‍රතික්ෂෙපප්‍රශ්නය නිමි.

---

## පපටිකාපතිතප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'භාග්‍යවතුන් වහන්සේ වැඩ වදරණ කල්හි මේ අචෙතන වූ මහාපෘථිවිතොමෝ මිටිතැන් පිරී සමතලා වන්නී ය.[1] උස්තැන් නැමී සමභූමි වන්නී ය' යි කියා නුඹ වහන්සේ කියනසේක. නැවත ද, 'භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයතෙම ගල්පතුරකින් වදින ලද්දේ ය' යි කියනසේක. යම් ඒ ගල්පතුරක් බුදුන්ගේ ශ්‍රීපාදයෙහි පතිත වන ලද ද, ඒ ගල්පතුර බුදුන්ගේ ශ්‍රීපාදය කෙරෙන් පහ ව කුමක් පිණිස නො නවත්නා ලද්දේ ද? ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'භගවතො ගච්ඡන්තස්ස අයං අචෙතනා මහාපඨවි නින්නං උන්නමති, උන්නතං ඔනමති' කියා වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'භගවතො පාදෙ සකලිකාය ඛතො' කියා යම් වචනයක් වදළේ[2] ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'භගවතො පාදෙ සකලිකාය ඛතො' යි කී වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'භගවතො ගච්ඡන්තස්ස අයං අචෙතනා

---

1. වන්නේ ය. 2. වදළා

Non-Commercial Distribution

මහාපඨවි නින්නං උන්නමති, උන්නතං ඕනමති' යි කී වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නයත් නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ම ඉසිලිය යුත්තේ ය''යි කීහ.

''සැබෑව, මහරජානෙනි, 'වැඩම කර වදරන්නා වූ අප භාග්‍යවතුන් වහන්සේට මේ අචෙතන වූ මහාපෘථිවිය මිටිතැන් පිරී යන්නේ ය. උස් තැන් මිටි වන්නේ ය' යි කී මේ වචනය ඇත්තෙක් ම ය. (205) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි ගල්පතුරක් වදින ලද්දේ ය. ඒ ගල්පතුර තමාගේ ස්වභාවයෙන් ඉබේ ම නො වැටෙන ලද්දේ ය. දෙවදත්තයාගේ උපක්‍රමයෙන් වැටෙන ලද්දේ ය. මහරජානෙනි, දෙවදත්තයෝ බොහෝ ජාතිසියදහස්ගණන් මුළුල්ලෙහි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෛර බැඳ ගෙණ ආවාහ. එසේ හෙයින් ඒ දෙව දත්තයෝ ඒ වෛරයෙන් කුටාගාරයක් ප්‍රමාණ මහගලක් 'භාග්‍යවතුන් වහන්සේගේ හිස මත්තෙහි හෙළමි' යි සිතා අද්ද හෙළුහ. එකල භාග්‍යවතුන් වහන්සේගේ කුශලමහිමයෙන් මහාපර්වතයෝ දෙදෙනෙක් පෘථිවියෙන් විසිරියනක් පමණ උස් ව නැඟී ඒ මහගල දෙඅතින් ඇල්ලූ කලක් මෙන් පිළිගත්තාහු ය. එකල ඔවුන්ගේ වැද ගැණීමෙන් මතු ගලින් ගල්පතුරක් බිඳී ඉගිල යම් ඒ කොයි අතක වත් වැටෙන්නා වූ ගල් පතුර භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි වැටෙන ලද්දේ ය'' යි කීසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් ප්‍රකාරයකින් ඒ පර්වතයෝ දෙදෙන උඩින් එන ගල පිළිගත්තාහු ද, එපරිද්දෙන් ම ගල්පතුරෙක් පිළිගන්ට නපුරු ද?'' යි කීහ. ''මහරජානෙනි, මේ ලොකයෙහි පිළි ගන්නා ලද්ද වූත් ඇතැම් දෙයක් පග්ඝරණය වන්නේ ය. ඉතිර වාහින්නේ ය. අස්ථානයට පැමිණෙන්නේ ය. මහරජානෙනි, යම් සේ දෙඅතින් ගන්නා ලද පැන් ඇඟිලි අතුරෙන් පග්ඝරණය වන්නේ ය. වාහින්නේ ය. අස්ථානයට පැමිණෙන්නේ ය. තව ද අතින් ගන්නා ලද කිරිමෝරු මීපැණි ගිතෙල් තලතෙල් මත්ස්‍ය ඉස්ම මාංස ඉස්ම ඇඟිලි අතුරෙන් පග්ඝරණය වන්නේ ය, වාහින්නේ ය. යථාස්ථානයෙහි නො සිට නැමෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ගල පිළිගන්නා පිණිස පැමිණියා වූ පර්වතයන් දෙදෙනාගේ වැද ගත් පහරින් ගලෙන් ගල්පතුරක් ඉගිල යම් ඒ තැනෙක කොතනක වත් වැටෙන්නා වූ ගල්පතුර භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි වැටුනේ ය.

''තවද, මහරජානෙනි, යම් සේ මෘදු සියුම් වූ ක්ෂුද්‍රරජස් සම වැලි මිටින් ගත් කල්හි ඇඟිලි අතුරෙන් නැමෙන්නේ ය. ප්‍රස්‍රවණ වන්නේ ය. යථාස්ථානයෙහි නො සිටින්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ගල පිළිගන්නා පිණිස සම ව ගියා වූ පර්වතයන් දෙදෙනාගේ සම්ප්‍රහාරයෙන්

Non-Commercial Distribution

ගලින් පතුරක් බිඳී යම් තැනෙක්හි හෝ එතැන්හි හෝ වැටෙන්නා වූ පපටිකාතොම භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි වැටෙන ලද්දී ය. තව ද, මහරජානෙනි, යම් සේ මුඛයෙන් ගන්නා ලද්ද වූ බත්පිඩ මේ ලොකයෙහි ඇතැම් කෙනෙකුන්ගේ මුඛයෙන් මිදී වැගිරෙන්නේ ය. වාහින්නේ ය, බත්හුළු වැටෙන්නේ ය, යථාස්ථානයනට ම පැමිණ නො සිටින්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ගල පිළිගන්ට සම ව යන්නා වූ පර්වතයන් දෙදෙනාගෙ සම්ප්‍රහාරයෙන් පාසාණයෙන් ගල් පතුරක් බිඳී යම් අතක වැටෙන්නා වූ ගල්පතුර භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි වැටුනේ ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ එසේ ම වේවා. පර්වතයන් දෙදෙනා විසින් වැටෙන ගල පිළිගන්නා ලද්දේ වේවා, නැවත ගල්පතුර විසිනුත් ඛාණුකණ්ටකකඨලාදී උපද්‍රව පහ කොට සමහුම් වන මහාපෘථිවිය යම් සේ ද, එමෙන් අපචිති කටයුතු[1] නො වේ ද?'' යි කීහ.

''මහරජානෙනි, දෙළොස් දෙනෙක් අපචිතියක් නො කරති. ඒ දෙළොස් දෙන කවරු[2] ද? යත්:— රාගයෙන් රත් වූ පුරුෂතෙම නිරන්තරයෙන් රාගස්වාදය කරණ වශයෙන් **(206)** අපචිති නම් පූජාසත්කාරයක් තුණුරුවන් කෙරෙහි නො කරන්නේ ය. ද්වේෂයෙන් දූෂිත වූ පුරුෂ තෙම තමාගේ ද්වේෂය කරණ කොට ගෙණ පූජාසත්කාර නො කරන්නේ ය. මොහයෙන් මුළා වූ පුරුෂතෙම තමාගේ නුනුවණ වශයෙන් පූජාසත්කාර නො කරන්නේ ය. උඩඟු වූ පුරුෂතෙම මාන වශයෙන් හා නිර්ගුණිකපුරුෂතෙම කිසි විශෙෂතාවක් නො දන්නා බැවින් හා නඟුලිස ගිලපු පිඹුරකු මෙන් මහතුන්ගේ අවවාදයට නො නැමෙන ඉතා දැඩි පුරුෂතෙම නො මැඩෙන බැවින් හා, හීනයා තමාගේ හීනස්වභාව බැවින් හා, කීවාක් කරන්ට හැඳී සිටීන වචනකරයා තමාගේ අප්‍රමාණික බැවින් හා, ලාමකයා තමාගේ කදරිය බැවින් හා, දුකට පත් වූ තැනැත්තේ දුක්ඛිත බැවින් හා, ලොභීපුරුෂතෙම ලොභයෙන් මැඩ පවත්නා බැවින් පූජාසත්කාරයක් නො කරන්නේ ය. ආයූහිතයා ඥතිමිත්‍රයන්ට අර්ථ සාධනයෙන් පූජාසත්කාරයක් රතනත්‍රයෙහි නො කරන්නේ ය. මහරජානෙනි, මෙකී දෙළොස්දෙන අපචිතියක් නො කරන්නාහු ය. ඒ ගල්පතුරු තොම ද ගල් ප්‍රහාරයෙන් බිඳී අනිමිත්තකෘත දිශා ගමන් ඇති ව යම් තැනෙක හෝ වැටෙමින් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපතුලෙහි පතිත වූ ය.

''තවද, මහරජානෙනි, යම් සේ මෘදු සියුම් ක්ෂුද්‍රරජස් වාතබලයෙන් මඩනා ලද්දේ අනිමිත්තකෘතදිශා ගමන් ඇති ව යම් තැනක හෝ එතැන්හි හෝ විසිර යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ඒ ගල්පතුර පාෂාණ ප්‍රහාරයෙන් බිඳී 'මේ දිසාවට එම්' යි කියා නියම නො කළ අනිමිත්තකෘතදිශා ඇති ව යම් තැනෙක හෝ ඒ තැන්හි හෝ වැටෙන්නේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි පතිත වූ ය. මහරජානෙනි, ඉදින්

1. කටයුත්තී 2. කවරේ

Non-Commercial Distribution

ඒ ගල්පතුර තොම උඩින් වැටුනු ගල කෙරෙන් වෙන් නො වූවා නම් බුදුන් ඇඟට නියම ව එකවිට ම ආවා නම්, ඒ පර්වතයෝ දෙදෙන ඒ ගල්පතුරත් උඩ පැන අල්වා ගන්නාහු ය. මුඛයට ගත් බත් පිඩින් හුළක් වැටුනු කලක් මෙන් සිලාසට්ටනයෙන් ගල්පතුරක් සරස වෙන් ව පලා ගියේ ය. මහරජානෙනි, ඒ ගල්පතුර භූමියෙහි සිට ගියෙත් නො වෙයි. අහස්හි සිට ආයෙත් නො වෙයි. අන්තරයෙහි ශිලාසම්ප්‍රහාරවෙගයෙන් බිඳී අනිමිත්තකෘතදිශා ගමන් ඇති ව යම් අතක හෝ ඒ අතක හෝ වැටෙමින් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි පතිත වූ ය.

තව ද, මහරජානෙනි, යම් සේ වාතමණ්ඩලයෙන් නඟා ගත් පරඬලා පත්‍රය අනිමිත්තකෘත දිශා ගමන් ඇති ව යම් දිසාවක හෝ එතැන්හි හෝ වැටෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ඒ ගල්පතුර ගල් සම්ප්‍රහාර වෙගයෙන් ම අනිමිත්තකෘතදිශා ගමන් ඇති ව යම් තැනක හෝ එතැන්හි හෝ වැටෙන්නී භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි පතිත වූ ය. මහ රජානෙනි, එතෙකුදු වුවත් මහාඅකෘතඥ වූ අනාර්ය වූ ලාමක වූ අසත්-පුරුෂ වූ දෙවදත්තයාහට මදකින් නො හැර කල්පයක් මුළුල්ලෙහි අවීචියෙහි හෙළා කප්ලක්ෂයක්[1] මුළුල්ලෙහි සතර අපායෙහි මහදුක් අනුභව කරණු පිණිස ඒ ගල්පතුරුතොම භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි පතිත වූ ය'' යි වදළසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාග සෙනයන් වහන්ස, මේ වදළ කාරණය මමත් එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

**පපටිකාපතිත ප්‍රශ්නය නිමි.**

---

# ශ්‍රමණවිනිශ්චය ප්‍රශ්නය

**(207)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'කාමාශ්‍රවාදී ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ශ්‍රමණ වන්නේ ය' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. නැවත ද 'සතර ධර්මයකින් යුක්ත වූයේ වී නම්, ඒ මනුෂ්‍යයා එකාන්තයෙන් ම ශ්‍රමණයා ය යි කියා ලොකයෙහි නුවණැත්තෝ කියන්නාහු ය' යි කියා වදරණ ලද්දේ ය. එහි ක්ෂාන්තිය, අල්පාහාරබවය, ආලය හැරීමය, ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානගුණය යන යම් සතරධර්මයෝ ය. මේ සියල්ල ම ක්ෂය නො කළ ආශ්‍රවයන් ඇති සක්ලේශයාහට ම වන්නාහු ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ආසවානං ඛයා සමණො හොති' ති කියා වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන්,

**''චතුහි ධම්මෙහි සමංගීභූතං**
**තං වෙ නරං සමණං ආහු ලොකෙ''**

---

1. කප්ලක්ෂයක් යනු වැරදියි. එය පාළි පොතෙහි නො ආවකි. දෙවදත්ත ප්‍රව්‍රජ්‍යාප්‍රශ්නය කියවා බැලිය යුතු.

*Non-Commercial Distribution*

කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'චතුභි ධම්මේහි සමංගීභූතො සමණො හොති' යි කී වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'ආසවානං ඛයා සමණො හොති' කී වචනය බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නය නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ. ''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'ආසවානං ඛයා සමණො හොති' කියා මේ කාරණයත් වදරණ ලද්දේ ය. නැවත ද,

**'චතුභි ධම්මෙහි සමංගීභූතං,**
**තං වෙ නරං සමණං ආහු ලොකෙ'**

කියාත් වදරණ ලද්දේ ය. මහරජානෙනි, යම් මේ වචනයක් ඇද් ද, ඒ වචනය ඒ ඒ පුද්ගලයන්ගේ ගුණ වශයෙන්.

**'චතුභි ධම්මෙහි සමංගීභූතං,**
**තං වෙ නරං සමණං ආහු ලොකෙ'**

යි කියා වදරණ ලද්දේ ය. 'ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ශ්‍රමණ වන්නේ ය' යි වදළ හෙයින් ශ්‍රමණ වන්ට ඉතිරි ධර්මයක් නැත. මේ නිරවශෙෂ වූ වචනයක.

''මහරජානෙනි, එතෙකුදු වුවත් 'යම්කිසි කෙනෙක් ක්ලෙශව්‍යුපශමනය පිණිස පිළිපැද්දහු ද, ඒ සියල්ලන් උපාදයුපාදය[1] ක්ෂීණාශ්‍රව වූ ශ්‍රමණතෙම අග්‍රය' යි කියනු ලැබෙයි. තවද, මහරජානෙනි, යම් සේ ජලජ වූ ථලජ වූ යම්කිසි පුෂ්පජාතියෙක් ඇද් ද, ඒ පුෂ්පයන්ට වඩා 'දෑසමන් මල් අග්‍ර ය' යි කියනු ලැබෙයි. අවශෙෂ යම්කිසි අනෙකප්‍රකාර පුෂ්පජාතියෙක් ඇද් ද, ඒ සියලු ම මල්ජාතියට වඩා දෑසමන් මල් ම සියලු ජනයා විසින් ප්‍රාර්ථිත ය. කැමැති වන ලද්දේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කිසි උත්තමකෙනෙක් සකලක්ලෙශව්‍යුශමනය පිණිස පිළිපන්නාහු ද, ඒ සියල්ලන් වඩා 'ක්ෂීණාශ්‍රවශ්‍රමණතෙම අග්‍රය' යි කියනු ලැබෙයි. තවද, මහරජානෙනි, යම් සේ සියලු ධාන්‍යජාතීන්ට වඩා 'රත්හැල් අග්‍ර ය' යි කියනු ලැබෙයි. යම් කිසි අවශෙෂ වූ නානාප්‍රකාර ධාන්‍යජාතියෙක් ඇද් ද, ඒ සියලු ම ධාන්‍යයන්ට වඩා ශරීරය යාපනය වන භොජනයෙන් ඇල්වී ම සියලු ම ධාන්‍යජාතීන්ට අග්‍ර ය යි කියනු ලැබෙයි. මහරජානෙනි, එපරිද්දෙන් ම 'යම්කිසි කෙනෙක් ක්ලෙශව්‍යුපශමනය පිණිස පිළිපන්නාහු ද, ඒ සියලුදෙන උපාදයුපාදය ක්ෂීණාශ්‍රව වූ ශ්‍රමණතෙම අග්‍ර ය' යි කියනු ලැබෙයි, වදළසේක.

''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ කාරණය අපි ද එපරිද්දෙන් ම පිළිගණුම්හ'' යි කීහ.

**ශ්‍රමණවිනිශ්චයප්‍රශ්නය නිමි.**

---

1. මේ පාළි පූර්වක්‍රියා පද යි. 'ගෙණ ගෙණ' යනු එහි අර්ථ යි. 'සියල්ලන් නො හැර ගෙණ ඒ හැම දෙනා අතුරෙන් ක්ෂීණාශ්‍රවයා අග්‍ර ය' යනු පාඨයෙහි අදහස යි.

Non-Commercial Distribution

# උබ්බිල්ලාවිතප්‍රශ්නය

**(208)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, අන්‍යසත්වයෝ මාගේ හෝ ගුණ කියද් ද, ධර්මයෙහි හෝ ගුණ කියද් ද, සංඝයාගේ හෝ ගුණ කියද් ද, ඒ ගුණ කීමෙහි තොප විසින් ප්‍රීති නො කට යුත්තේ ය. සන්තොෂ නො කට යුත්තේ ය. සිතින් උඩඟු ව ඉල්පෙනබවක් නො කට යුත්තේ ය' යි කියා මේ කාරණය වදාරණ ලද්දේ ය. තථාගතයන් වහන්සේ සෙලබ්‍රාහ්මණයා විසින් විද්‍යමාන වූ බුදුගුණ කියන කල්හි ඊට ප්‍රීති වූසේක. සන්තොෂ වූසේක. සිතින් උඩඟු ව ඉල්පෙමින් බොහෝ ඉතිරි වූ තමන් වහන්සේගේ ගුණ රාශියක්,

**'රාජාහමස්මි සෙලාති-ධම්මරාජා අනුත්තරො,**
**ධම්මෙන චක්කං වත්තෙමි-චක්කං අප්පතිවත්තියං'**

යනාදීන් ගුණ ප්‍රකාශ කර වදාළසේක. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මමං වා භික්ඛවෙ පරෙ වණ්ණං භාසෙය්‍යුං **ධම්මස්ස,** වා සංඝස්ස වා වණ්ණං භාසෙය්‍යුං, තත්‍ර තුම්හෙහි න ආනන්දො න සොමනස්සං න චෙතසො උබ්බිල්ලාවිතත්තං කරණීයං'යි කියා වදාරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'සෙලස්ස බ්‍රාහ්මණස්ස යථාභූච්චෙ වණ්ණෙ භඤ්ඤමානෙ ආනන්දිතො සුමනො උබ්බිල්ලාවිතො භිය්‍යො උත්තරිං සකගුණං පකිත්තෙසි' යි කී යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'සෙලස්ස බ්‍රාහ්මණස්ස යථාභූච්චෙ වණ්ණෙ භඤ්ඤමානෙ ආනන්දිතො සුමනො උබ්බිල්ලාවිතො භිය්‍යො උත්තරිං සකගුණං පකිත්තෙසි' යි කී වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'මමං වා භික්ඛවෙ පරෙ වණ්ණං භාසෙය්‍යුං ධම්මස්ස වා සංඝස්ස වා වණ්ණං භාසෙය්‍යුං, තත්‍ර තුම්හෙහි න ආනන්දො න සොමනස්සං න චෙතසො උබ්බිල්ලාවිතත්තං කරණීයං' යි කී වචනයෙන් බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නයත් නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නය නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, අන්‍ය ජනයෝ මාගේ හෝ ගුණ කියද් ද? ධර්මයාගේ හෝ ගුණ කියද් ද, සංඝයාගේ හෝ ගුණ කියද් ද, ඒ ගුණ කීමෙහි තොප සැමදෙනා විසින් ප්‍රීති නො කට යුත්තේ ය. සොම්නස් නො කට යුත්තේ ය. සිතින් උඩඟු ව ඉල්පෙනබවක් නො කට යුත්තේ ය' යි කියා මේ කාරණයත් වදාරණ ලද්දේ ය. සෙලබ්‍රාහ්මණයා විසින් ද බුදුන්ගේ විද්‍යමාන වූ ගුණවර්ණනාව කියන කල්හි බොහෝ සේ ඉතිරි වූ තමන් වහන්සේගේ ගුණය,

**'රාජා හමස්මි සෙලාති-ධම්මරාජා අනුත්තරො,**
**ධම්මෙන චක්කං වත්තෙමි-චක්කං අප්පතිවත්තියං'**

*Non-Commercial Distribution*

යනාදීන් ප්‍රකාශ කර වදරණ ලද්දේ ය. මහරජානෙනි, පළමු කොට ම සද්ධර්මයාගේ ස්වභාව රස ලක්ෂණය හා නිබොරු වූ විද්‍යමාන වූ ඇත්තා ම වූ තදර්ථය දක්වන්නා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් 'මමං වා භික්ඛවෙ පරෙ වණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා සංඝස්ස වා වණ්ණං භාසෙය්‍යුං, තත්‍ර තුම්හෙහි න ආනන්දෙ න සොමනස්සං න චෙතසො උබ්බිල්ලාවිතත්තං කරණීයං' යි කියා වදරණ ලද්දේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් ද, සෙලබ්‍රාහ්මණයා විසින් විද්‍යමාන වූ ගුණ වර්ණනා කරණ කල්හි බොහෝ සෙයින් ඉතිරි වූ තමන් වහන්සේගේ 'රාජා හමස්මි සෙලාති ධම්මාරාජා අනුත්තරො' යනාදීන් **(209)** යම් ගුණයක් වදරණ ලද ද, ඒ ගුණය වුවමනා ලාභයක් පිණිසත් නො වදළසේක. යස පිණිසත් නො වදළසේක. පක්ෂග්‍රහණය පිණිසත් නො වදළසේක. අතැවැසි කර වදරණ පිණිසත් නො වදළසේක. නැවැත කුමක් පිණිස ද? යත්:— 'මේ ආකාරයෙන් තුන්සියයක් පමණ බ්‍රාහ්මණමාණවකයන්ට හා මේ සෙලයාහට චතුස්සත්‍යාභිසමය වන්නේ ය' යි දැන කරුණා-වෙන්[1] අනුකම්පාවෙන් හිත වැඩ වසයෙන් ම 'සෙලයෙනි, මම රජ වීමි. අනුත්තර වූ සද්ධර්මවරචක්‍රවර්තිරාජයෙමි. සමස්තලොකයෙහි කිසිවකු විසින් පවත්වා ලිය නො හැක්කා වූ ආඥාචක්‍රය මම ධර්මයෙන් පවත්-වන්නෙමි, යනාදීන් බොහෝ සෙයින් ම ඉතිරි වූ තමන් වහන්සේගේ ගුණරාශියක් වදරණ ලද්දේ ය'' යි කීසේක. ''යහපත ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ මේ කාරණය එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

උබ්බිල්ලාවිතප්‍රශ්නය නිමි.

---

# අහිංසානිග්‍රහප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'ලොකයෙහි අනුන්ට හිංසා නො කරන්නා වූ මාමක පුරුෂතෙම ලොකයාහට ප්‍රිය වන්නේ ය' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. නැවත ද, නිග්‍රහ කිරීමට සුදුස්සාහට නිග්‍රහ කරන්නේ ය. ප්‍රශංසා කරන්නට සුදුස්සාට ප්‍රශංසා කරන්නේ ය' කියාත් වදරණ ලද්දේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නිග්‍රහකරණ අය[2] නම් අත් සිඳීම ය, පා සිඳීම ය, වධ කිරීම ය, බැඳීම ය, තැළීම ය, මැරීම ය, ජීවිතසන්තතිය වෙන් කිරීම ය. මේ වචනය වදරන්ට භාග්‍යවතුන් වහන්සේට යුතු නො වන්නේ ය. මේ වචනය වදරන්ට භාග්‍යවතුන් වහන්සේ සුදුසු නො වන සේක් ම ය. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'අහිංසයං පරං ලොකෙ පියො හො හිති[3] මාමකො' ති කියා වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'නිග්ගණ්හෙ නිග්ගහාරහං

---

1 කරුණා වූ 2. කරණ අය 3. හොති හි

Non-Commercial Distribution

පග්ගණ්හෙ පග්ගහාරහං' කියා වදාළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් 'නිග්ගණ්හෙ නිග්ගහාරහං පග්ගණ්හෙ පග්ගහාරහං' කියා වදාළ වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'අභිංසයං පරං ලොකෙ පියො හොහිති මාමකො' යි කියා වදාළ වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නය නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'අභිංසයං පරං ලොකෙ පියො හොහිති මාමකො' ති යන මෙම කාරණයත් වදරණ ලද්දේ ය. 'නිග්ගණ්හෙ නිග්ගහාරහං පග්ගණ්හෙ පග්ගහාරහං' යන මේ කාරණයත් වදරණ ලද්දේ ය. මහරජානෙනි, මේ ලොකයෙහි පරහට හිංසා නො කරන්නා වූ සකලසත්වයන් කෙරෙහි මමත්වය ඇති මාමක පුරුෂතෙම ලොවට ප්‍රිය වන්නේ ය. මේ පරහට හිංසා නො කිරීම සියලු ම තථාගතයන් වහන්සේලාගේ චාරිත්‍රයෙක. මෝ තොම අනුශාසනාවෙක. මෝ තොම ධර්මදෙශනාවෙක. මහරජානෙනි, ධර්මය වනාහි අවිහිංසාව ලක්ෂණ කොට ඇත්තේ ය. මේ තෙම ස්වභාවවචනයෙක. මහරජානෙනි, අප තථාගතයන් වහන්සේ 'නිග්ගණ්හෙ නිග්ගහාරහං පග්ගණ්හෙ පග්ගහාරහං' කියා යමක් වදාළසේක් ද, මේ වචනාර්ථයතෙම ස්වභාවවචනයෙක. **(210)** මහරජානෙනි, නො සන්හුන් චිත්තය නිග්‍රහ කට යුත්තේ ය. සන්හුන් චිත්තය ප්‍රශංසා කට යුත්තේ ය. අකුශලචිත්තය නිග්‍රහ කට යුත්තේ ය. කුශලචිත්තය ප්‍රශංසා කට යුත්තේ ය. අයොනිසොමනස්කාරය නිග්‍රහ කට යුත්තේ ය. යොනිසොමනස්කාරය ප්‍රශංසා කට යුත්තේ ය. මිථ්‍යා ප්‍රතිපන්නපුද්ගලයා නිග්‍රහ කට යුත්තේ ය. මනා ව ප්‍රතිපන්නපුද්ගලයා ප්‍රශංසා කට යුත්තේ ය. අනාර්යයා නිග්‍රහ කට යුත්තේ ය. ආර්ය වූ උත්තමයා ප්‍රශංසා කට යුත්තේ ය. චෞරයා නිග්‍රහ කට යුත්තේ ය. නො සොරා සංග්‍රහ කට යුත්තේ ය.'' යි කීසේක

''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ එසේ ම වේවා. දැන් නුඹ වහන්සේ මාගේ විෂයට ම පැමිණ වදාළසේක. යම් අර්ථයක් මම විචාරම් ද, ඒ අර්ථයට ම පැමිණියේසක.[1] ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සොරහු නිග්‍රහ කරන්නවුන් විසින් කෙසේ නිග්‍රහ කට යුත්තේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, සොරහු නිග්‍රහ කරන්නවුන් විසින් දෙෂ කථනය කළ යුත්තහුගේ[2] දෙෂ කථනය කළ යුත්තේ ය. දණ්ඩනය කළ යුත්තහුට දණ්ඩනය කළ යුත්තේ ය. රටින් නෑහිය යුත්තහු රටින් නෑහිය යුත්තේ ය. සංඛලිකාදියෙන් බැන්ද යුත්තහු බන්ධනය කළ යුත්තේ ය. නැසිය යුත්තහු නැසිය යුත්තේ ය. මෙසේ සොරහු නිග්‍රහ කට යුත්තේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සොරුන්ගේ යම් ඝාතනයක් ඇද් ද, ඒ ඝාතනය බුදුවරයන් වහන්සේලා විසින් අනුදන්නා ලද්දේ ද?'' යි විචාළෝ ය. ''නැත, මහරජානෙනි,'' යි කීසේක. ''ස්වාමීනි, කුමක් පිණිස

1. පැමිණියේ ය 2. යුත්තහු

Non-Commercial Distribution

'සොරහු අනුසාසනිය ය' යි කියා තථාගතයන් වහන්සේ විසින් අනුදන්නා ලද්දේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් ඒ සොරෙක් අනුන් විසින් නසනු ලැබේ ද, එතෙම තථාගතයන් වහන්සේලාගේ අනුදැනීමෙන් නසනු නො ලැබෙයි. තමා කර ගත් අපරාධයෙන් ම එතෙම ඝාතනය වනු ලැබෙයි. එතෙකුදු වුවත් බුදුන් විසින් ධර්මානුශාසනාව අනුශාසනා කරණු ලැබෙයි.

''මහරජානෙනි, කිසි වරදක් නො කළා වූ කිසි අපරාධයක් නැත්තා වූ, වීථියෙහි හැසිරෙන්නා වූ පුරුෂයෙක් අල්වා ගෙණ නුවණැත්තෙකු විසින් නසාපියන්ට හැකි වේදැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, එසේ නො හැක්කැ'' යි කීහ. ''මහරජානෙනි, හේ කවර කාරණයකින් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, ඔහු වරදක් නො කළ බැවිනැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම සොරහු තථාගතයන් වහන්සේගේ අනුදැනීමෙන් නො නසින්නෝ ය. තමා කර ගත් දෙයින් ම ඒ සොරතෙම නස්නෝ ය. කිමෙක් ද, මෙහි අනුශාසනා කළ බුදුරජානන් වහන්සේ කිසි වරදකට පැමිණෙනසේක් දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''එහෙයින් මහරජානෙනි, තථාගතයන් වහන්සේලාගේ අනුශාසනා තොමෝ සකලසත්වසාධාරණ වූ අනුශාසනාවක් නම් වන්නේ යි.'' ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ වදළ ප්‍රශ්නය එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

**අභිංසානිග්‍රහප්‍රශ්නය නිමි.**

## සංඝපනාමිත ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මම ක්‍රොධ නැත්තෙමි යි උපුටා හැරීමෙන් පහ කරණ ලද පඤ්ච චෙතොඛිලයන් ඇත්තේ වීමි' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. නැවත ද, තථාගතයන් **(211)** වහන්සේ සියලු ම පිරිස් සහිත වූ **ශාරිපුත්‍ර මහමුගලන්** තෙර ස්වාමීන් වහන්සේවරුන් පනාමය[1] කර වදළසේක. කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ කිපෙමින් සංඝපිරිස පනාමය කර වදළසේක් ද? නොහොත් සන්තොෂ වෙමින් 'යව' යි කියා එළවා වදළසේක් ද? මේ කාරණය ඇති තාක් ම මෙබඳු ය යි කියා දැන් වදළ මැනැව. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කිපෙමින් සංඝපිරිස පනාමය කර වදළසේක් වී නම්, ඒ කාරණ යෙන් තථාගතයන් වහන්සේ විසින් ක්‍රොධය නො මැඩ පවත්වන ලද්දේ ය. ඉදින් සන්තොෂයෙන් පනාමය කර වදළසේක් වී නම්, එහෙයින් සංඝයා කෙරෙහි කිසි වරදක් නැති ව අකාරණයෙහි ම කුමකුත් නො දැනීමෙන් පන්නා වදළසේක. මේ උභතොකොටිකප්‍රශ්නය තෙමේත් නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඒ ප්‍රශ්නයතෙමේ ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

1. ප්‍රණාමය.

Non-Commercial Distribution

''මහරජානෙනි, ධනිය නම් සිටු පුත්‍රතෙම කාශ්‍යප බුදුන්ගේ ශාසනයෙහි විසිදහසක් හවුරුදු පවත්නා සමයෙහි පින් කෙරෙමින් සලාකදන විස්සක් දෙමින් එයින් චුත ව දෙව්ලොව ඉපද බුද්ධාන්තරයක් මුළුල්ලෙහි දිව්‍යසම්පත් වළඳා අප බුදුන් සමයෙහි දෙවුලොවින් අවුත් වෙදෙහරට සිටුපුත්‍රයෙක් ව ඉපද වැඩිවිය පැමිණ තිස්දහසක් ගවයන් හා විසිදහසක් කිරිදෙනුන් පොෂ්‍ය කෙරෙමින් ජීවිකා කෙරෙයි. ඔහුගේ පුත්‍රයෝ සත් දෙනෙක. දියනියෝ සත්දෙනෙක. යේළිනිහු සත්දෙනෙක. වැඩකරුවෝ නොයෙක් සියදහස්ගණනෙක. එතෙම හෙමන්ත ග්‍රීෂ්මසෘතුද්වයයෙහි ගවයන්ට තෘණොදකය දුර්ලභ බැවින් ගමින් නික් ම ඵාසු තැන් සොයමින් මහාසමුද්‍රය සමීපයෙහි මහී නම් ගංගාව බෙදී ගොස් අන්තරද්වයිනාකාරයෙන් පිහිටා ගියා වූ මහාරම්‍යභූමියෙක නිවාසයක් කොට ගෙණ පිරිවර සහිත ව වාසය කෙරෙයි. එක් දිනෙක පක්ෂීන්[1] වෘක්ෂාග්‍රශාඛායෙහි කැදලි තනන්නා වූ කර්කටකයන් උදක සමීපයෙහි බිලවල් වසා ථල සමීපයෙහි බිල තනා සංචාරණය කරන්නා වූ වර්ෂානිමිත්තලක්ෂණය දැක තමා හුන් අන්තරද්වීපයෙන් නික්ම මහාමහී නම් ගංගාවගේ පරතීරයෙහි සත්සතියක් මුළුල්ලෙහි වර්ෂා කරණ කල්හිත් උදකයෙන් ඔත්ථරණය නො වන්නා වූ ස්ථානයෙක නිවාසස්ථානය කොට ගෙණ වාසය කෙරෙමින් සියලු ම ගවයන්ට තෘණොදකය සම්පාදනය කරවා පුත්‍රදරදසකර්මකරපුරුෂයන්ට නානාප්‍රකාර වූ ඛාද්‍යභොජ්‍යාදිය පිළියෙල කළ කල්හි සතරදිගින් මෙඝය නභා වසින්ට වන. සිටු පුත්‍රතෙම සත්විසි දහසක් කිරිදෙනුන්ගෙන් ක්ෂීරදෙහනය කරවා තබා, වච්ඡසාලාවෙහි ගවදරුවන් බන්ධනය කරවා, ගවයන්ට සතර දිගින් දුම් කරවා, සියලු පිරිවර ජනයන්ට බත් අනුභව කරවා, ඒ ඒ තන්හි පහන් දල්වා, තෙමේත් මිහිරි කිරෙන් බත් අනුභව කොට, මහාසයනයකට නැඟී සිට, තමාගේ මහාඓශ්වර්යසම්පත්තිය විමසා බලා, සතුටෙන් පිණා ඒ ඒ අත මෙඝධ්වනි අසා ප්‍රීතියෙන් පිරී සිට, 'පක්කොදනො දුද්ධඛීරොහමස්මි' යනාදි ගාථාවෙන් 'සිද්ධ කරණ ලද බත් ඇත්තෙමි. දෙනුන්ගෙන් කිරි දෙව ගන්නා ලද්දේ වීමි' යි යනාදීන් උදන් ඇනී ය.

'එකල සත්සියයක් යොදුනෙන් හෙවත් අටසිය දෙදහසක් ගව්වෙන් ඔබ්බෙහි වූ දෙව්රම්වෙහෙර ශ්‍රී මහාසුගන්ධගන්ධකුටියෙහි වැඩ වසන්නා වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ ඒ (212) ධනියයාගේ උදන් ගාථාව මනුෂ්‍යකණ ඉක්ම සිටියා වූ විශුද්ධ වූ දිව්‍යශ්‍රොත්‍රධාතුවෙන් අසා වදරමින් බුද්ධඥානයෙන් බලා වදරා ගවසම්පත්ති ම ධන කොට ඇති බැවින් ධනිය නම් වූ ධනියයා හා ඔහුගේ භාර්යාව ද දැක, 'මේ දෙදෙන ම කෘතාධිකාර ඇත්තෝ ය. ඉදින් මම ගොස් ඔවුන්ට ධර්ම දෙශනා කෙළෙම් නම්, දෙදෙනා ම සියලු සැපත් හැර මාගේ ශාසනයෙහි මහණ ව රහත් ව අමාමහනිවන් දක්නාහ. ඉදින් නො ගියේ වී නම්, සෙට

1. පක්ෂිහු

Non-Commercial Distribution

දවස් මහත් වූ උදකොසයෙන් මුහුදු බත් ව නස්නාහ' යි කියා දැක ඒ ක්ෂණයෙහි ම ඍද්ධියෙන්[1] ඔවුන් වසන තැනට අහසින් වැඩ ඔවුන්ගේ ගේ මුදුනෙහි ආකාශයෙහි වැඩ සිටිසේක. සිටුපුත්‍රයා නැවතත් එම ගාථාව ම ගායනා කරන්නේ ය. නිෂ්ඨා නො කරන්නේ ය. එකල සර්වඥ රාජොත්තමයානන් වහන්සේ 'ධනිය, තෝ ඔදනක්‍රියාවෙන් සතුටු වෙමින් ජීවිතාන්තය දක්වා ධනය සෙවීමෙන් ක්ෂය කිරීමෙන් දුක්ඛ යෙහි ම සිට, දුකින් ම සතුටු වන්නෙහි ය. ක්‍රොධීපුද්ගලතෙමේ නව ආඝාතවස්තුවෙන් ක්‍රොධය උපදවමින් හෘදය උණු ව ගෙණ තවන්නේ ය. ඇතැම් කෙනෙක් ඊට වැඩියක් කිපෙමින් මුඛශබ්ද මාත්‍රයක් ම කරන්නේ ය. ඇතැම් කෙනෙක් ඊටත් වඩා කිපී පරුෂවචන කියනු කැමැති ව හනුව සොලවන මාත්‍රයක් ම කරන්නේ ය. සමහරෙක් ඊටත් වඩා කිපී පරුෂ වචන කියන්නේ ය. අනිකෙක් ඊටත් වඩා කිපී වෙව්ලවෙව්ලා අනුන් නසන්ට දණ්ඩක් හෝ ශස්ත්‍රයක් හෝ සොයමින් ඒ ඒ අත දිවන්නේ ය. එසේ ම අනිකෙක් කිපී දණ්ඩශස්ත්‍රාදියක් ඇද ගෙණ පනින්නේ ය. එසේ ම අනිකෙක් කිපී දණ්ඩශස්ත්‍රාදිය ගෙණ දිවන්නේ ය. අනිකෙක් බලවතරයෙන් කිපී දෙතුන් පහරක් තළන්නේ ය. අනිකෙක් ක්‍රොධයෙන් මත් ව ගොස් ඥතිමිත්‍රසුහෘදයන්ගේ දිවි නසන්නේ ය. අනිකෙක් ඊට වඩා[2] බලවතරයෙන් කිපී විපිළිසර ව තමාගේත් දිවි නසා ගන්නේ ය. මම එබඳු ක්‍රොධය බුදු වූ ද ම නැසුයෙමි. අක්‍රොධ වීමි, සන්තොස වෙමින් සාන්දෘෂ්ටිකසාම්පරායිකදුඃඛයාගේ අභාවෙන් සතුටු වන්නෙමි. ධනිය, තෝ 'දෙහනය කරණ ලද කිරි ඇත්තේ වීමි' යි සතුටු වන්නෙහි ය. මම වනාහි 'පහකරණ ලද පඤ්චචෙතොඛිලයන් ඇත්තේ වීමි' යි සතුටු වන්නෙමි' යනාදීන් ධනිය සූත්‍රධර්මදෙශනාව කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් 'අක්කොධනො විගතඛිලො හමස්මි' කියා මෙම කාරණයත් වදරණ ලද්දේ ය.

"මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ **චාතුමා** නම් නුවර ශාක්‍යයන්ගේ **ආමලකී** නම් උයනෙහි වැඩ වසන කල්හි **සැරියුත් මුගලන්** දෙදෙනා වහන්සේ ප්‍රධාන කොට ඇති පන්සියක් දෙනා වහන්සේ බුදුන් දක්නට **ආමලකාරාමයට** අවුත් නෙවාසිකභික්ෂූන් වහන්සේලා හා සමග සතුටු වෙමින් සෙනාසනවල් පණවමින් පාත්‍රසිවුරු තැන්පත් කරමින් තබන්නාහු උස් වූ ශබ්ද මහාශබ්ද කළාහු ය. සර්වඥයන් වහන්සේ ඒ අසා '**ආනන්දයෙනි,** මච්ඡවිලොපනයෙහි කෙවුළන් සේ උස් වූ මහාශබ්ද කරන්නෝ[3] කවුරු ද?' යි විචාරා 'ස්වාමීනි, ආයුෂ්මත් වූ **සැරියුත් මුගලන්** දෙදෙනා වහන්සේ හා ආගන්තුක ව පැමිණියා වූ පන්සියයක් දෙනා වහන්සේට සෙනාසනාදිය පැණවීමෙන් පැවැති ශබ්දය' යි දන්වූ කල්හි 'යව, ආනන්දයෙනි, මාගේ වචනයෙන් සියලු ම සංඝයා කැඳවා ලව' යි වදරා **අනඳමහතෙරුන්** **(213)** වහන්සේ සංඝයා සන්නිපාත කළ

1. ඍද්ධි වෙමින් 2. මේ සඳහා පොත්හි යෙදුනේ මේ අර්ථ ඇති 'තතො' යන්නය. එය මෙහි නො ගැළපේ. 3. කරන්නේ

Non-Commercial Distribution

කල්හි ‘කිමෙක් ද, මහණෙනි, තෙපි මත්ස්‍යවිලොපනයෙහි කෙවුළන් සේ උස් වූ ශබ්ද මහාශබ්ද මාගේ සම්මුඛයෙහි ම කරව් ද? ‘ගච්ඡථ භික්ඛවෙ, පනාමෙමි වො, න වො මම සන්තිකෙ වත්ථබ්බං’ යනුවෙන් ‘යව, මහණෙනි, තොප පනාමය කෙරෙමි. තොප විසින් මාගේ සමීපයෙහි නො වැසිය යුතු ය’ යි වදාළ කල්හි බුද්ධතෙජසින් භය ගෙණ සියලු ම සංඝයා වහන්සේ බුදුන් වැඳ පැදකුණු කොට සමු ගෙණ පාත්‍රසිවුරු ධරා **ශාක්‍යරජ්ජුරුවන්ගේ** සන්ථාගාරශාලාව සමීපයෙන් වඩනාසේක. ඒ දැක **චාතුමෙය්‍යක** නම් ශාක්‍යරජදරුවෝ වහා දිව ගොස් වැඳ වැටී, ‘ස්වාමීනි, බොහෝ දෙනෙකුන් වහන්සේ මේ අවේලායෙහි කොයි යන ගමනෙක් දෝ හො?’ යි විචාළ කල ‘ඇවැත්නි, ලොවුතුරා බුදුන් විසින් වෙහෙරින් එලවනු ලදුම්හ’ යි වදාළසේක. ‘එසේ වී නම්, ආයුෂ්මතුන් වහන්සේලා මෙහි මදක් කල් වැඩ හුන මැනැව. අපි බුදුන් කරා ගොස් පහදවා අභය ගෙණ දෙම්හ’ යි කියා බුදුන් කරා ගොස් වැඳ වැටී දෙහොත් නහා ගෙණ ‘අනේ! ස්වාමීනි, ලොවුතුරා බුදුරජානෙනි, භික්ෂුසංඝයා කෙරෙහි අභිනන්දනය කර වදාළ මැනව. ඉවසා වදාළ මැනැව. ස්වාමීනි, යම් සේ පැන් නො ලබන්නා වූ තරුණ වූ බීජජාතීන්ගේ අන්‍යථාත්වය වේ ද, විනාශය වේ ද? යම් සේ මෑනියන් නො දක්නා තරුණ වූ ගවබිලිඳක්හට අන්‍යථාත්වය වේ ද, විනාශය වේ ද, ස්වාමීනි, එමෙන් මේ ශාසනයෙහි අළුත මහණ වූ දහරභික්ෂූන් වහන්සේවරුත් ඇත. මේ ධර්මවිනයට අළුත පැමිණි මහතෙරුන් වහන්සේවරුත් ඇත. ලොවුතුරා බුදුන් නො දක්නා වූ ඒ ළදරු වූ තරුණ වූ භික්ෂූන් වහන්සේලාට අන්‍යථාත්වය වන්නේ ය. විනාශය වන්නේ ය. එසේ හෙයින්, ස්වාමීනි, භික්ෂුසංඝයා කෙරෙහි අභිනන්දනය කර වදාළ මැනැව’ යි කියා ආරාධනා කර සිටින වේලෙහි **සහම්පතී** මහාබ්‍රහ්මතෙමේත් එපවත් දැක බ්‍රහ්මලොකයෙන් අන්තර්ධාන වෙමින් ක්ෂණයෙකින් අවුත් බුදුන් පෙරටු ව නැමී වැඳ ගෙණ සිට ‘අභිනන්දතු භන්තෙ භගවා භික්ඛුසංඝෙ’ යනාදීන් එසේ ම ආරාධනා කොට සිටියේ ය. එපවත් දිවැසින් බලා සිටි **මුගලන්**මහතෙරුන් වහන්සේ ‘ආයුෂ්මත්නි, **ශාක්‍යයන්** හා **මහාබ්‍රහ්මයා** විසින් අපගේ බුද්ධසෙවනය පිණිස යාච්ඤා කර සිටින ලද්දේ ය. සර්වඥයන් වහන්සේ ද ඉවසූසේක. ‘බුදුන් දක්නට යම්හ. බුදුන් දක්නට යම්හ’ යි කියකියා ගොස් බුදුන් වැඳ පිරිවරා උන්හ. එකල සර්වඥයන් වහන්සේ **‘ශාරිපුත්‍රයෙනි,** මා විසින් භික්ෂුසංඝයා පනාමය කළ කල තොපට කුමන සිතිවිල්ලෙක් වූයේ දෑ?’ යි විචාරා ‘ස්වාමීනි, අල්පොත්සාහී ව දෘෂ්ටධර්මසැප විහරණයෙන් යුක්ත ව වසම්හ යි කියා සිතිමි’ යි දැන්වූසේක. එවිට සර්වඥයන් වහන්සේ ‘ආගමෙහි ත්වං සාරිපුත්ත. ආගමෙහි ත්වං සාරිපුත්ත න බො තෙ සාරිපුත්ත පුනපි එවං චිත්තං උප්පාදෙතබ්බං’ යනුවෙන් **‘ශාරිපුත්‍රයෙනි,** තෙපි හිඳුව. ශාරිපුත්‍රයෙනි, තොප විසින් නැවත මෙබඳු සිතක් නො උපදවාලිය යුත්තේ ය’ යි වදරා **‘මොගගල්ලානයෙනි,** තොපට කුමන සිතිවිල්ලෙක් වූයේ දෑ?’ යි විචාළසේක. ‘ස්වාමීනි, ලොවුතුරා



Non-Commercial Distribution

සර්වඥයන් වහන්සේ සංඝයා හැර දෘෂ්ටධර්මසුඛවිහරණයෙන් යුක්ත ව වාසය කරණ සේක. එහෙයින් දැන් මම හෝ ආයුෂ්මත් වූ ශාරිපුත්‍ර ස්ථවිරයානෝ හෝ භික්ෂුසංඝයා පරිහරණය (214) කොට රක්ෂා කරම්හ යි කියා සිතීම්' යි දන්නුසේක. 'සාධු, සාධු, මොග්ගල්ලානයෙනි, තොප සිතුයේ කල්‍යාණ වූ චේතනාවෙකැ' යි යනාදීන් මධ්‍යමනිකායවරයෙහි වූ චාතුමසූත්‍රය වදරණ භාග්‍යවතුන් වහන්සේ විසින් පිරිවර සහිත වූ සැරියුත් මුගලන් මහාසංඝයා පනාමය ද කරණ ලද්දේත් සැබැව. ඒ නෙරපූ කාරණය ද, කිපි සිතකින් නො වන්නේ ය.

"මහරජානෙනි, මේ ලොකයෙහි කිසියම් පුරුෂයෙක්තෙම මහා පෘථිවියෙහි මුලෙක හෝ කණුවෙක හෝ ගලෙක හෝ කැටෙක හෝ විෂම වූ භූමිභාගයෙක හෝ පය වැදී පැකිල වැටෙන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, මහාපෘථිවිය කිපී ඒ පුරුෂයා හෙළන්නී ද?" යි විචාළ සේක. "නැත, ස්වාමීනි, මහාපෘථිවියගේ කිපිමෙක් හෝ ප්‍රසාදයෙක් හෝ නැත්තේ ය. මහාපෘථිවිතොම ආලය ක්‍රොධය දෙකින් මිදුනා ය. ඒ අලසපුරුෂතෙම තෙමේ ම පය පැකිල වැටුනේ ය" යි කීහ. "මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේලාගේ කිපීමෙක් හෝ ප්‍රසාද වීමෙක් හෝ නැත්තේ ය. තථාගත වූ අර්හත්සම්‍යක්සම්බුද්ධ සර්වඥයන් වහන්සේලා අනුනයප්‍රතිඝයෙන් මිදුනුසේක් ලා ය. එහෙයින් ම සංඝයා වහන්සේලා තමන් කරණ ලද්ද වූ තමන්ගේ අපරාධයෙන් ම පනාමය කරණ ලද්දහු ය.

"තවද, මහරජානෙනි, මේ ලොකයෙහි මහාසමුද්‍රයතෙම මළා වූ කුණපය හා එක් ව නො වසන්නේ ය. මළා වූ යම් කුණපයක් ඇත් නම්, ඒ කුණපය සමුද්‍රයතෙම වහා ම ගොඩ දමන්නේ ය. තලයට නහන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, මහාසමුද්‍රයතෙම කිපෙමින් ඒ කුණපය ගොඩ දමා ද?" යි විචාළසේක. "නැත, ස්වාමීනි, මහාසමුද්‍රයාගේ කිපෙන්නා වූ ක්‍රොධයක් හෝ සතුටු වන්නා වූ ප්‍රසාදයෙක් හෝ නැත්තේ ය. මහාසමුද්‍රය තෙම අනුනයප්‍රතිඝයෙන් මිදුනේ ය" යි කීහ. "මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේලාගේ කෝපයෙක් හෝ ප්‍රසාදයෙක් හෝ නැත්තේ ය. තථාගත වූ අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥයන් වහන්සේලා අනුනයප්‍රතිඝයෙන් මිදුනුසේක් ලා ය. එහෙයින් ඒ සංඝයා වහන්සේලා තමන් විසින් කරණ ලද්ද වූ තමන්ගේ අපරාධයෙන් ම පනාමය කරණු ලද්දහු ය.

"මහරජානෙනි, යම් සේ පොළොවෙහි ඛලිත වූයේ වැටෙනු ලැබේ ද, එපරිද්දෙන් ම සර්වඥනුශාසනවරයෙහි ඛලිත වූයේ බුදුන් විසින් පනාමය කරණු ලැබෙයි. යම් සේ මහාසමුද්‍රයෙහි මළා වූ කුණපය රැළින් ගොඩ ලනු ලැබේ ද, එපරිද්දෙන් ම සර්වඥශාසනවරයෙහි ඛලිත වූයේ පනාමය කරණු ලැබෙයි. මහරජානෙනි, තථාගතයන් වහන්සේ 'යම් කාරණයකින් ඒ සංඝයා වහන්සේලා පනාමය කළසේක් ද, ඒ කාරණය මේ ආකාරයෙන් මේ භික්ෂූහු ජාති ජරා ව්‍යාධි මරණ දුක්ඛයෙන් මිදෙන්නාහු ය' යි දැක

භික්ෂූන්ට වැඩ කැමැත්තා වූ හිත කැමැත්තා වූ සැප කැමැත්තා වූ ක්ලේශශුද්ධිය කැමැත්තා වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ සංඝයා පනාමය කර වදළසේකැ'' යි කීසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, නුඹවහන්සේ වදළ මේ කාරණය එසේ ම පිළිගන්නෙමි''යි ස්තුති කළහ.

සංඝපනාමිත ප්‍රශ්නය නිමි.

සකලජනමනොනන්දනීය වූ මෙණ්ඩකප්‍රශ්න නම් වූ මෙ ශ්‍රීසද්ධර්මාදසයෙහි තෘතීයවර්ගය නිමියේ ය.

---

# මෞද්ගල්‍යාන ඍද්ධිවිභාගප්‍රශ්නය.

**(215)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මාගේ ඍද්ධි ඇත්තා වූ ශ්‍රාවකභික්ෂූන් අතුරෙන් යම් මේ **මහාමොග්ගල්ලාන** ස්ථවිරයෝ ය යන (යම් කෙනෙක් වෙත් ද) මේ තෙම අග්‍ර ය' යි කියා මේ එතදග්‍රපාලිය වදරණ ලද්දේ ය. නැවත ද ඒ මුගලන් මහාථෙරස්වාමීන් වහන්සේ 'සොරුන් විසින් මුගුරුවලින් පොථිත කරණ ලදු ව බිඳුනු හිස් ඇති ව අස්ථී සුණු ව මස්නහර මර්දිත ව ගර්භා වෙමින් පිරිනිවන් පැසේකැ' යි යනු ඇසීමි. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, **මහමුගලන්** තෙරුන් වහන්සේ ඍද්ධියෙහි කෙළ පැමිණිසේක් වී නම්, ඒ කාරණයෙන් 'සොරුන් විසින් මුගුරුවලින් පොථ බාන ලදු ව පිරිනිවන් පැසේකැ' යි කියන්නා වූ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් මුගුරුවලින් පොථිත ව පිරිනිවන් පැසේක් වී නම්, එහෙයින් 'ඍද්ධියෙහි කෙළ පැමිණිසේකැ' යි කියන්නා වූ ඒ වචනය බොරු වන්නේ ය. කිමෙක් ද, ඍද්ධ්‍යානුභාවයෙන් තමහට පැමිණියා වූ නැස්ම පහ කර ගන්ට අසමර්ථ කල දෙවියන් සහිත වූ ලොකයාහට පිළිසරණ වන්ට සුදුසු වනසේක් ද? මේ උභතොකොටික ප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් **'එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ඉද්ධිමන්තානං යදිදං මහාමොග්ගල්ලානො'** යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. ආයුෂ්මත් වූ **මහාමොග්ගල්ලානස්ථවිරයෝ** ද මුගුරු වැද පිරිනිවීසේක. ඒ බව වනාහි 'කර්මාධිගෘහීත හෙයිනැ' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඍද්ධිමතුන් වහන්සේගේ ඍද්ධිවිෂයත් කර්මවිෂයත් දෙක ම අචින්තෙය්‍ය වන්නාහ. එසේ කල අචින්තෙය්‍ය වූ ඍද්ධියෙන් අචින්තෙය්‍ය වූ කර්මය පහ කළ යුතු නො වේ ද? ස්වාමීනි, යම් සේ ඵල කැමැත්තා වූ කිසි කෙනෙක් දිවුල්ගෙඩියෙන් දිවුල්ගෙඩිය පොථනය කෙරෙති. අඹයෙන් අඹය පොථනය කෙරෙති. එපරිද්දෙන් ම ස්වාමීනි, නාගසෙනයන්

Non-Commercial Distribution

වහන්ස, අචින්තෙය්‍යයෙන් අචින්තෙය්‍යය පොඨනය කොට පහ කළ යුත්තේ ය'' යි කීහ. ''මහරජානෙනි, අචින්තෙය්‍ය වූ ධර්මයන්ගෙන් ද එක ම ධර්මයක් අධික වූ බලතර වන්නේ ය. මහරජානෙනි, යම් සේ පොළෝතෙලෙහි සමානජාති ඇත්තා වූ රජදරුවෝ වෙති. සමජාති ඇත්තා වූ ඔවුන් අතුරෙන් එක් කෙනෙක් ම සියල්ලන් ම අභිභවනය කොට ආඥාව පවත්වන්නාහ.[1] මහරජානෙනි, එපරිද්දෙන් ම ඒ අචින්ත්‍ය ධර්මයන්ගෙන් කර්මවිපාකය ම ඉතා අධික වූ බලවත් වන්නේ ය. කර්ම විපාකය ම සියල්ලන් අභිභවනය කොට ආඥා පවත්වන්නේ ය. අකුශල කර්මය අධිගෘහිත වූ කල්හි අවශෙෂකුසලක්‍රියාවෝ අවකාශයක් නො ලබති. මහරජානෙනි, මේ ලොකයෙහි වනාහි කිසියම් පුරුෂයෙක් කිසි යම් කට යුත්තෙක අපරාධයක් කෙළේ වී නම්, ඔහුගේ මැනියෝ හෝ පියානෝ හෝ නැගනි භාතෘකෙනෙක් හෝ මිත්‍ර යහළුකෙනෙක් හෝ, අසමර්ථ බැවින් රක්ෂා නො කරති. එකල රජ්ජුරුවෝ ම එහි සියල්ලන් අභිභවනය කොට **(216)** රාජාඥාව පවත්වන්නෝ ය. එහි කාරණා කවරේ ද? යත්:— රාජාපරාධය කළ බැවින. මහරජානෙනි, එපරිද්දෙන් ම අචින්තනීය ධර්මයන්ට වඩා කර්මවිපාකය ම අධික වූ බලතර වන්නේ ය. කර්මවිපාකය ම සියල්ල මැඩ පවත්වා ගෙණ ආඥාව පවත්වන්නේ ය. කර්මාධිගෘහීතයාගේ අවශෙෂ වූ කුශලක්‍රියාවෝ අවකාශයක් නො ලබති.

''මහරජානෙනි, යම් සේ මහාපෘථිවියෙහි ලැව්ගින්නක් නැගි කල්හි කළදහසකින් ගෙණෙන ලද ජලය වුවත් ඒ ගින්න නිවන්ට නො හැකි වන්නේ ය. එකල වනාහි වහ්නිය එහි අභිභවනය කොට ආඥාව පවත්වන්නේ ය. එහි කාරණා කිම? යත්:— වහ්නියගේ බලවත් බැවින. මහරජානෙනි, එපරිද්දෙන් ම ඒ අචින්තනීයධර්මයන් අතුරෙන් කර්ම විපාකය ම අධිකමාත්‍රයෙන් බලතර වන්නේ ය, කර්මවිපාකය ම සියල්ල අභිභවනය කොට ආඥාව පවත්වන්නේ ය. කර්මය අධිපති වූ පුරුෂයාගේ සෙසු කුශලක්‍රියාවෝ අවකාශයක් නො ලබන්නාහු ය.

''මහරජානෙනි, මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ සූවිසි බුදුවරයන් වහන්සේලාට ම පෙණිපෙණී අග්‍රශ්‍රාවකබොධිය පිණිස පාරමීතාධර්මයන් පූරණය කරණසේක් සසර එක් ජාතියෙක තමන්ගේ දෙයැස් අන්ධ වූ දෙමවුපියන් රක්ෂා කෙරෙමින් වාසය කොට කල් යාමෙන් අඹුව කෙරෙහි සිත් බැඳි කාමයෙන් අන්ධ ව භාර්යාවගේ වචනයෙන් දෙමවුපියන් මරණ උපායක් සොයමින් 'මිනිසුන් නැති වනයෙහි දී මරමි' යි සිතා 'අපගේ ඔබ්බෙ ගම්හි නෑයෝ නුඹලා දක්නා කැමැත්තම්හ' යි කියා එවූහ. එබැවින් නෑයන් දක්නට යම්හ' යි කියා මහවනයක් මධ්‍යයෙන් යමින් 'අම්ම, පියානෙනි, මේ මග සොරහු මිනී මරති, සොරුන් එන ලෙසක් මෙන් පෙණෙන්නේ ය' යි කියා වඤ්චාවෙන් තෙමේ ම දිව ඉවුත් අන්ධ වූ දෙමවුපියන් මුගුරෙන් තළන කල්හි 'පුතණ්ඩ,

1. පවත්වන්නේ ය.

Non-Commercial Distribution

සොරු අප මරති, පුතණ්ඩ, සොරු අප මරති, පුතණ්ඩ, තෙපි දිවි රැක ගණුව' යි කියාකියා මහහඬ තළන කල්හි ද, කිසි කරුණාවක් නො කොට දෙමවුපියන් තළා මරා මහවනයට දමා ගොස් අඹුව හා සිත් සේ වාසය කොට එයින් මිය මහනරකයෙහි වැටී බොහෝ දීර්ඝකාලයක් මුළුල්ලෙහි මහනරක දුක් විඳපියාත් පව් නො ගෙවුනු හෙයින් සියක් ජාතියෙක තැළුම් කා මරණයට පැමිණ පෙර කළ මහපින් ඇති හෙයින් අප බුදුන් සමයෙහි ද්විතීය අග්‍රශ්‍රාවකතනතුරට පැමිණ ඍද්ධිමතුන් කෙරෙහි අග්‍රස්ථානාන්තරය ලදින් වසන කල මිථ්‍යාදෘෂ්ටීන්ගෙන් අල්ලස් ගත් සොරු අල්වා ගෙණ මුගුරුවලින් සකලශරීරය තළා පයියක පුරා ලූ සාල් මෙන් අස්ථීන් බිඳ 'මළාහ' යි දමා ගියාහු ය. එහෙයින් කර්මාධිගෘහීත වූ මුගුරුවලින් පොථනය වන්නා වූ ආයුෂ්මත් වූ මහමුගලන් තෙරුන් වහන්සේට ඍද්ධියෙන් තමන් ගළවා ගැණීම නො වූයේ ය'' යි කීසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ මේ කාරණය එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

මෞද්ගල්‍යාන ඍද්ධිවිභාග ප්‍රශ්නය නිමි.

---

# විනයප්‍රතිච්ඡන්නප්‍රශ්නය.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, තථාගතයානන් විසින් කියන ලද ධර්මවිනයතෙම විවෘත ව බබළන්නේ ය, පටිච්ඡන්න නො වන්නේ' ය.[1] යන මේ පාළිය වදරණ ලද්දේ ය. (217) නැවත ද, 'සියලු විනයපිටකය හා ප්‍රාතිමොක්ෂොද්දෙශය පිහිත ය, ප්‍රතිච්ඡන්න ය' යි කියන ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, විනයප්‍රඥප්තිය විවෘත ව බබළන්නේ වී නම් ජිනශාසනයෙහි යුක්තයක් හෝ ප්‍රාප්තදෙයක් හෝ ප්‍රතිවෙධධර්මයක් හෝ ලබන්නේ ය. ඒ විනයපිටකයෙහි දශවිධශික්ෂාපදසංවර ශීලය, ඛන්ධකාදිවත්ය, ශීල ගුණය, ආචාරප්‍රඥප්ති, අර්ථරසය, ධර්මරසය, විමුක්තිරසය යන සියලු ම විනය කවර කාරණයකින් ප්‍රතිච්ඡන්න වී ද? පිහිත වී ද? ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො' යි කියා වදරණ ලද්දේ සැබෑ වී නම්, එහෙයින් 'පාතිමොක්ඛුද්දෙසො කෙවලඤ්ච විනයපිටකං පිහිතං පටිච්ඡන්නං' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'පාතිමොක්ඛුද්දෙසො කෙවලඤ්ච විනයපිටකං පිහිතං පටිච්ඡන්නං' යි කියා වදළ වචනය සැබෑ වී නම්, එහෙයින් 'තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො' යි කියා වදළ වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

1. 'පටිච්ඡන්න වූයේ නො බබළන්නේ ය' යි විය යුතු

Non-Commercial Distribution

"මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'තථාගතප්පවේදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො' යි කියා මෙම කාරණයත් වදරණ ලද්දේ ය. නැවත ද, 'පාතිමොක්ඛුද්දෙසො කෙවලඤ්ච විනයපිටකං පිහිතං පටිච්ඡන්නං' යි කියාත් වදරණ ලද්දේ ය. ඒ බව වනාහි භික්ෂූන් හැර සෙසු සියල්ලන්ට වැද්ද නො දී සීමා කොට වසන ලද්දේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් තුන් ප්‍රකාරයකින් ප්‍රාතිමොක්ෂොද්දෙශය සීමා කොට අනුපසම්පන්නයන්ට නො දක්වා වසන ලද්දේ ය. පූර්වතථාගතයන්ගේ වංශය වශයෙනුත් වසන ලද්දේ ය. සද්ධර්මයන්ගේ ගුරු බැවිනුත් පිහිත කරණ ලද්දේ ය. භික්ෂුභූමියගේ මහත් බැවිනුත් ප්‍රතිච්ඡන්න කරණ ලද්දේ ය.

"**පුරාණ ගෞතම, දීපංකරාදි** පූර්වතථාගතයන්ගේ වංශ වශයෙන් ප්‍රාතිමොක්ෂොද්දෙශය සීමා කොට කෙසේ වසන ලද්දේ ද? යත්:— මහරජානෙනි, පූර්ව සියලු තථාගතයන් වහන්සේලාගේ යම් මේ භික්ෂූන් මධ්‍යයෙහි දෙසන ප්‍රාතිමොක්ෂොද්දෙශයෙක් ඇද් ද, මේ තෙම අනන්ත තථාගතවංශයෙක. අවශෙෂ වූ දිව්‍යමනුෂ්‍යයන්ට නො දක්වා වසන ලද්දේ ය. මහරජානෙනි, යම් සේ ක්ෂත්‍රියයන්ගේ ක්ෂත්‍රියමායා ක්ෂත්‍රිය යන් කෙරෙහි ම පවත්නේ ය. හැසිරෙන්නේ ය. මෙසේ මේ කාරණය ක්ෂත්‍රියයන්ගේ[1] ලොක ප්‍රවෙණියක. අවශෙෂ වූ දිව්‍යමනුෂ්‍යයන්ට නො දක්වා වසන ලද්දේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම පූර්වයෙහි වූ සියලු ම තථාගතයන් වහන්සේලාගේ යම් මේ භික්ෂූන් මධ්‍යයෙහි ම දෙසන ප්‍රාතිමොක්ෂොද්දෙශයෙක් ඇද් ද, මේ තෙම අනන්ත වූ බුදුන්ගේ වංශයෙක, සෙසු දිව්‍යමනුෂ්‍යයන්ට නො දක්වා වසන ලද්දේ ය.

"නවද, මහරජානෙනි, යම් සේ මහාපෘථිවියෙහි ජනසමූහයෝ වෙන් වෙන් ව පවතිති. හේ කවරේ ද? යත්:— **මල්ලවයෝ** ය, **අනොණයෝ** ය, **පබ්බතයෝ** ය, **ධර්මගිරියෝ** ය, **බ්‍රහ්මගිරියෝ** ය, **නාටකයෝ** ය, **නෘත්‍යාකාරයෝ** ය, **ලංගිකයෝ** ය, **පිසාචයෝ** ය, **මණිභද්‍රයෝ** ය, **(218) පූර්ණභද්‍රයෝ** ය, **චන්ද්‍රසූර්යභක්තිකයෝ** ය, **සිරිදෙවතාවෝ** ය, **කාළි දෙවතාවෝ** ය, **ශිව නම් ඊශ්වරභක්තිකයෝ** ය, **වාසුදෙවයෝ** ය, **ඝනිකයෝ** ය, **අසිපාසයෝ** ය, **භද්දියපුත්‍රයෝ** ය, යනාදි ජනසමූහ කෙනෙක් ඇද් ද, ඔවුනොවුන්ගේ රහස් ඒ ඒ ජනසමූහයා කෙරෙහි ම පවතින්නේ ය. හැසිරෙන්නේ ය. එයින් පිටත් අවශෙෂයන්ට නො දක්වා වසන ලද්දේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම පූර්ව වූ සියලු ම තථාගතයන්ගේ යම් මේ භික්ෂුමධ්‍යයෙහි ප්‍රාතිමොක්ෂොද්දෙශයෙක් ඇද් ද, මේ තෙම අනන්ත තථාගතවංශයෙක, අවශෙෂ වූ දිව්‍යමනුෂ්‍යයන්ට නො දක්වා වසන ලද්දේ ය. මෙසේ පූර්වතථාගතයන්ගේ වංශය වශයෙන් ප්‍රාතිමොක්ෂොද්දෙශය සීමා කොට වසන ලද්දේ ය.

1. ශාක්‍ය

Non-Commercial Distribution

''සද්ධර්මයාගේ මහත් බැවින් ප්‍රාතිමොක්ෂොද්දෙශය කෙසේ නම් සීමා කොට වසන ලද්දේ ද? යත්:— මහරජානෙනි, ධර්මයතෙම ඉතා මහත් වන්නේ ය. ඉතා බැරෑරුම් වන්නේ ය. එහි චතුරාර්යමාර්ගය භාවිත කිරීමෙන් සම්මත්තකාරී වූ භික්ෂුතෙම අර්හතඵලය සිද්ධ කරන්නේ ය. ඒ භික්ෂුතෙම ඒ ධර්මයෙහි පරම්පරාවෙන් සම්මත්තකාරිත්වයට පැමි-ණෙන්නේ ය. ඒ භික්ෂුතෙම ඒ ධර්මයෙහි පරම්පරාවෙන් සම්මත්තකාරිත්-වයට නො පැමිණියේ වී නම් 'අහෝ! මේ සාරධර්මය ප්‍රවරධර්මයතෙම ආර්යමාර්ගභාවිතාවක් නැති බැවින් අසම්මත්තකාරී වූ දෘෂ්ටිවාදීන්ගේ හස්තගත ව ලාමක ව දූනීමෙක්, නින්ද ව දූනීමෙක්, නින්ද කිරීමෙක්, බිඳීමෙක්, ගර්හාවක් නො වේ ව' යි කියා ද, මේ 'සාරධර්මය ප්‍රවරධර්මය දුර්ජනයන් කරා පැමිණ ලාමක ව දූනීමෙක්, නින්ද ව දූනීමෙක්, නින්ද කිරීමෙක්, ධර්මයාගේ භෙදයෙක්, ගර්හා කිරීමෙක්, නො වේ ව' යි කියා ද මෙසේ විනයධර්මයාගේ මහත් බැවින් ප්‍රාතිමොක්-ෂොද්දෙශය හා විනයපිටකය භාග්‍යවතුන් වහන්සේ විසින් සීමා කොට අප්‍රකට කොට වසන ලද්දේ ය.

''මහරජානෙනි, 'යම් සේ සාරවරප්‍රවරාභිජාත වූ ජාතිමත් ලක්ෂයක් අගේ ඇති රත්නප්‍රමාණ වූ රක්තලොහිතසඳුන්හරය සවරපුර නම් වූ චණ්ඩාල නුවරට පැමිණ ඔඤාත වන්නේ ය. අවඤත වන්නේ ය. හීලිත වන්නේ ය, ඛලිත වන්නේ ය, ගර්හිත වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම මේ සාරධර්ම ප්‍රවරධර්මය පරම්පරාවෙන් පමණ නො දන්නා අසම්මත්තකාරීන්ගේ හස්තගත ව ඔඤාත අවඤාත හීලිත ඛිලිත ගර්හිතයෙක් නො වේ ව' යි කියා ද, 'මේ සාරධර්මය ප්‍රවරධර්මය දුර්ජනගත වූයේ ඔඤාත අවඤාත හීළිත ඛිලිත ගර්හිතයෙක් නො වේ ව'යි කියා ද, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ ධර්මයාගේ මහත් බැවින් ප්‍රාතිමොක්ෂොද්දෙශය සීමා කොට වසන ලද්දේ ය.

''භික්ෂුභූමියගේ ගරු බැවින් ප්‍රාතිමොක්ෂොද්දෙශය කෙසේ නම් සීමා කොට වසන ලද්දේ ද? යත්:— මහරජානෙනි, භික්ෂුභාවය වනාහි සදෘශ දෙයක් නැති බැවින් අතුල්‍ය වන්නේ ය. ප්‍රමාණ කළ යුතු දෙයක් නැති බැවින් අප්‍රමාණ වන්නේ ය. අගය කළ නො හැකි බැවින් අනර්ඝ වන්නේ ය. 'මා විසින් මෙබඳු වූ භික්ෂුභාවයෙහි සිටිනා ලද්දේ ය. ලොකය හා සම සම වේ ය' යි කියා කිසිවක් කරණ කොට ගෙණ අගය කරන්නට සදෘශ කරන්නට පමණ කරන්නට නො හැකි වන්නේ ය. එහෙයින් භික්ෂූන් වහන්සේගේ අතුරෙහි ම ප්‍රාතිමොක්ෂොද්දෙශය හැසිරෙන්නේ ය.

''මහරජානෙනි, යම් සේ ලොකයෙහි ප්‍රවර උතුම් භාණ්ඩයක් හෝ වස්ත්‍රයක් හෝ ආස්තරණයක් හෝ හස්ත්‍යශ්ව රථ ස්වර්ණ රජත මුතු

Non-Commercial Distribution

මැණික් ස්ත්‍රී රත්නාදියක් හෝ (219) ජයගෘහිත කෘත්‍ය සුරාපානයක් හෝ ජයග්‍රහණය කරණ ශිල්පකර්මාන්ත ඇති ශූර කෙනෙක් හෝ ඇද් ද? ඒ සියල්ල ම රජුන් කරා පැමිණෙන්නාහ. මහරජානෙනි, එපරිද්දෙන් ම ලොකයෙහි යම් තාක් සුගතාගමපර්යාප්ති ශික්ෂාපදයෙක් ඇද් ද, ආචාර සංයමසීලසංවරගුණයෙක් ඇද් ද, ඒ සියල්ල ම භික්ෂුසංඝයා කරා පැමිණියාහු වෙති. මෙසේ භික්ෂුභූමියගේ ගරු බැවින් ප්‍රාතිමොක්ෂොද්-දෙශයතෙම දිව්‍යමනුෂ්‍යයන්ට ආවරණ කිරීමෙන් සීමා කොට ප්‍රතිච්-ඡන්න කරණ ලද්‍ද'' යි කීසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ වදළ කාරණය එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

**විනයප්‍රතිච්ඡන්න ප්‍රශ්නය නිමි.**

---

# මුසාවාදපාරාජිකාප්‍රශ්නය.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'දැන දැන මුසාවාද කීමෙහි පාරාජිකා වන්නේ ය' යි යන මේ වචනය වදරන ලද්දේ ය. නැවත ද, 'දැන දැන මුසාවාද කීමෙහි ලහුකාපත්තියට පැමිණෙන්නේ ය. එක භික්ෂුනමක් ලඟ දී දෙශනාවෙන් ශුද්ධ වන දෙශනාවස්තුක ය' යි කියාත් වදරණ ලද්දේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙය වනාහි විශෙෂය කවරේ ද? ඉදින් එකමුසාවාදයකින් මූලොච්ඡින්න ව ශාසනයෙන් පහ ව යන්නේ ය. ඉදින් එකමුසාවාදයකින් සතෙකිච්ඡ වන්නේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'සම්පජානමුසාවාදෙ පාරාජිකො හොති'[1] කියා වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'සම්පජානමුසාවාදෙ ලහුකං ආපත්තිං ආපජ්ජති එකස්ස සන්තිකෙ දෙසනා වත්ථුකං' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් 'සම්පජානමුසාවාදෙ ලහුකං ආපත්තිං ආපජ්ජති එකස්ස සන්තිකෙ දෙසනාවත්ථුකං' යි කියා වදළ ඒ වචනය සැබෑ වී නම් ඒ කාරණයෙන් 'සම්පජානමුසාවදෙ පාරාජිකො හොති' යි කියා වදළ ඒ වචනය බොරු වන්නේ ය. මේත් උභතොකොටිකප්‍රශ්නයෙක. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය''. යි කීහ.

''මහරජානෙනි, වැදැරට වග්ගුමුද නම් ගංතෙර වස් විසූ බොහෝ භික්ෂූහු ප්‍රත්‍යය එාසු නො ලදින් 'මේ නම් වහන්දෑ ප්‍රථමධ්‍යාන ලාභීසේක. සෝවාන්සේක. රහත්සේකැ' යි යනාදීන් ඔවුනොවුන්ගේ නැති ගුණ ගෘහස්ථයන්ට පහළ කොට පහදවා ගෙණ ප්‍රත්‍යය ලබා සමග සතුටු ව

1. පාළිපොතෙහි මේ අර්ථ ඇති පාඨයක් නො පෙණේ.

Non-Commercial Distribution

ජීවත් වෙමින් වස් අන්තයෙහි බුදුන් කරා ගොස් වැඳ එකත්පස් ව උන්හ. බුදුරජානන් වහන්සේ ඒ භික්ෂූන්ගේ සැපදුක් විචාරමින් නැති ගුණ පහළ කොට ප්‍රත්‍යය ලැබූබව අසා අනෙකාකාරයෙන් ගර්හා කර වදරමින් 'කෙසේ නම් තෙපි, තුච්ඡ පුරුෂයෙනි, උදරාර්ථය පිණිස ගෘහස්ථයන්ට තොප කෙරේ නැති ලොකොත්තරධර්මයාගේ ගුණ කිවු ද? මොඝපුරුෂයෙනි, තොප උදරාර්ථය පිණිස ඔවුනොවුන් කෙරෙහි නැති උත්තරිමනුෂ්‍යධර්මයාගේ ගුණ කියා ලොව රවටා කැමට වඩා තීක්ෂ්ණ වූ ගෙරි කපන කැත්තෙන් බඩවැල් කපා ඉරණ ලද්දේ මැනවැ. දිලියෙන ලොහොගුළි ගිලින ලද්දේ ඉතා උතුම. මාගේ සද්ධර්මචක්‍රයට විරුද්ධ ව හැසිර නරකයෙහි උපදින මහසොරහු පස්දෙනෙක. එක් මහසොරෙක් (නම් යමෙක්) 'අහෝ! මම **(220)** කවර දවසක සියයක් හෝ දහසක් හෝ පිරිවරා ගෙණ ගෘහස්ථප්‍රව්‍රජිතයන්ගෙන් සිවුපසය ලදින් සත්කාර ගරුකාරාදිය ලදින් ග්‍රාමනිගමරාජධානි ආදියෙහි හැසිරෙම් දෝ? හො' යි සිතා අනෙකඅකර්තව්‍යසමාදනයෙන් පිරිස් සාධා ගෙණ එසේ ම හැසිරෙන්නේ වී නම්, මේ ප්‍රථම මහසොරා ය. අනිකුත් ඇතැම් පවිටු මහණෙක් ධර්මවිනය ඉගෙණ එහි නො පිහිටා මිහිරිබසින් ලොව රවටා අනාපදෙශ[1] රහිත ව ඒ ධර්මය තමා කෙරෙහි ම පිහිටුවා ගන්නේ වී නම්, මේ දෙවෙනි සොරා ය. තවත් පවිටුමහණෙක් සුපිරිදු ව බ්‍රහ්මචර්යය හැසිරෙන්නා වූ සුශීලභික්ෂුනමකට අමූලික වූ ස්ත්‍රීධර්මයෙන් වරද නගන්නේ වී නම්, මේ තුන්වැනි මහසොරා ය. තවත් මාගේ මේ ශාසන යෙහි ඇතැම් පවිටුමහණෙක් සාංඝික වූ පුෂ්පාරාම ඵලාරාම ආරාමවාස්තු ඇඳ පුටු බිසි බිම්බොහන ලොහොසැළ කටාරම් ලොහොකළ ලොහො කටාහ වෑ පොරෝ කෙටේරි උදලු නියංකටු වේවැල් හුණ මෘදුතෘණ බබුස්තෘණ මැටි මැටිභාණ්ඩ දරු දරුභාණ්ඩ යන ගරු භාණ්ඩාදියෙන් ගිහින්ගේ සිත් ගන්නේ වී නම්, නළවන්නේ වී නම්, එතෙම සතර වැනි මහසොරා ය. යමෙක් 'තමා කෙරෙහි අවිද්‍යමාන වූ උත්තරිමනුෂ්‍යධර්මය තමා කෙරෙහි ඇතැ' යි ප්‍රකාශ කොට කියා නම්, සියලු දිව්‍ය බ්‍රහ්ම මාර මානුසික සකලසත්වලොකයෙහි මේ තෙම අග්‍රමහසොරෙක. එබැවින් මහණෙනි, තොප විසින් ගෘහස්ථයන් රහතුන් උදෙසා දුන් පිණ්ඩපාතය සොරකමින් වළඳන ලද්දේ ය. ලොකොත්තරගුණධර්මය තමා කෙරෙහි නැතිබව දන දන බොරු කීමෙහි කෙලෙස්සොරුන් විසින් පරදවන ලද බැවින් පාරාජික වන්නේ ය' යි කියා මෙම කාරණය බුදුන් විසින් වදරණ ලද්දේ ය. නො කී නො කළ දෙයක් කියන ලද්දේ ය. කරණ ලද්දේ ය. කියා දන දන බොරු කීමෙහි ලහුක වූ පචිති ආපත්තියට පැමිණෙන්නේ ය. එක ම භික්ෂුනමක්හුගේ සමීපයෙහි උක්කුටුකයෙන් හිඳ දසනබසමොධාන යෙන් වැඳ ගෙණ තමා[2] බාල වූ ව 'අහම්භන්තෙ සම්බහුලා සම්පජාන මුසාවාදපත්තියො ආපජ්ජිං, තා තුම්හමූලෙ පටිදෙසෙමි' කියා 'ආපත්ති

1. අනෙ‍්‍යාපදෙශ 2. තෙමේ

Non-Commercial Distribution

දෙශනාවෙන් ශුද්ධ වන දෙශනාවස්තුකය වන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය. ඒ කාරණය වස්තුවශයෙන් ගරුක ලහුක වන්නේ ය.

''මහරජානෙනි, තෙපි ඒ කුමක් සිතවු ද? මේ නුවර වීථියෙහි කිසි පුරුෂයෙක් අන්‍ය පුරුෂයක්හට අතින් පහරක් දුන්නේ වී නම්, තෙපි ඕහට කවර දඬුවමක් පමුණුවන්නාහු ද?'' යි විචාළසේක. ''ඉදින්, ස්වාමීනි, ඒ පුරුෂයා 'ක්ෂමා නො වෙමි' යි කීයේ වී නම්, ඔහුගෙන් අපි ක්ෂමා නො වන කල්හි කහවණුවක් දඩ ගන්වම්හ'' යි කීහ. ''මහරජානෙනි, මෙහි ඒ පුරුෂයා ම එම අතින් ම තොපට පහරක් දුන්නේ වී නම්, තෙපි ඕහට එවිට කවර දඬුවමක් පණවන්නහු ද?'' යි විචාළසේක. ''අහෝ! ස්වාමීනි, එසේ වී නම් මඳකින් නො හරුම්හ. ඔහුගේ අතත් සිඳුවා ලවම්හ. පයත් සිඳුවා ලවම්හ. ඔහුගේ හිස දක්වාත් කලිරච්ඡෙදයෙන් සිඳුවා ලවම්හ. ඔහුගේ සියලු ම ගෙය බඩු පැහැර ගන්වා ලම්හ. ඔහුගේ මවුපිය දෙපක්ෂයෙන් සත්වන කුලපරම්පරාව දක්වාත් නස්වා ලම්හ'' යි කීහ. ''මහරජානෙනි, එකක්හට දුන් පාණිප්‍රහාරයෙහි යම් සියුම් කහවණුවක් දඩවන්නේ ය. තොපට දුන් පාණිප්‍රහාරයෙහි යම් හස්තච්ඡෙදනය පාදච්ඡෙදනය (221) යම් කලිරච්ඡෙදනය සර්වගෘහාදනය මවුපියදෙපක්ෂයෙන් සත්වන කුලපරම්පරාව දක්වා නැසීම වන්නේ ය. මෙහි විශෙෂ කවරේ ද? කාරණ කවරේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, හීනොත්කෘෂ්ට වූ මනුෂ්‍යභෙදයෙනැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම, සම්පජාන මුසාවාදය ද, හීනොත්කෘෂ්ටවස්තුවශයෙන් ගරුක ලහුක වන්නේ ය'' යි කියා වදළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, වදළ මේ කාරණය යම් සේ ද, එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

මුසාවාදපරාජිකාප්‍රශ්නය නිමි.

---

## කාලවිලොකනප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් පළමුවෙන් ම 'බොධිසත්ත්වවරයන්ගේ මාතෘපිතෘදෙදෙන නියත වන්නාහ. බොධිය නියත වන්නේ ය. අග්‍රශ්‍රාවකදෙදෙන නියත වන්නාහ, පුත්‍රතෙම නියත වන්නේ ය, උපස්ථායකතෙම නියත වන්නේ ය. හෙ ධර්මතාවෙක. ස්වභාවකාරණයෙකැ' යි කියා මේ බව වදරණ ලද්දේ ය. නැවත ද 'තුසිත කායයෙහි සිටියා වූ බොධිසත්ත්වයන් වහන්සේ කාලය බලනසේක. දිවයින බලනසේක, දෙශය බලනසේක, වංශය බලනසේක, මෑනියන් බලනසේක, ආයුස බලනසේක, මාසය බලනසේක, නෛෂ්ක්‍රම්‍ය බලනසේකැ' යි කියා නුඹ වහන්සේ වදරණසේක. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සර්වඥතාඥනයට ප්‍රඥව නො මුහු කළ කල්හි සියල්ල අවබොධයෙන් බුදු වීමක් නම් නැත්තේ ය. සර්වඥතාඥනයට ප්‍රඥව මුහු කළ කල්හි නිමෙසන්තරය යි කියන ලද ලඝු අක්ෂරයක් කථනමාත්‍රකාල වූ ක්ෂණයකුදු

නො බුදු ව සිටින්ට නො හැකි වන්නේ ය. පාරමිතාවන්ගේ පිරීමෙන් පැසුනා වූ චිත්තය අතික්‍රමණය කළ නො හැකි වන්නේ ම ය. කවර කලක උපදිම[1]දෝ හො?' යි කියා බොධිසත්වයන් වහන්සේ කුමක් නිසා කාලය බලා වදරණසේක් ද? ඥානය නො මුහු කළ කල්හි බුදුවීමෙක් නම් නැත්තේ ය. ඥානය මෝරා ගිය කල්හි නිමෙෂමාත්‍ර වූ ක්ෂණයකු දූ නො බුදු ව සිටින්ට නො හැකි වන්නේ ය. එහෙයින් කුමක් පිණිස බොධි-සත්වයන් වහන්සේ කාලය බලා වදරණ සේක් ද? ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, බොධිසත්වයන්ගේ ඉපදීමට[2] පළමු කොට ම මවුපිය දෙදෙන නියත ව උපදනා බව සැබැ වී නම්, ඒ කාරණයෙන් වංශය බලනසේකැ යි කියන්නා වූ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් උපදනට පළමු ව වංශය බලනසේකැ යි කී වචනය සැබෑ වී නම් ඒ කාරණයෙන් 'පුබ්බෙව ඛො බොධිසත්තස්ස මාතාපිතරො නියතා' යි කී වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටික ප්‍රශ්නයත් නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නය නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, පළමු කොට ම බොධිසත්වයන්ගේ මාතෘපිතෘ දෙදෙන නියත වන බවත් සැබෑ ම ය. කුලය ද බොධිසත්වයන් වහන්සේ බලා වදරණසේක. කිමෙක් ද, වනාහි මාගේ යම් දෙමවුපිය කෙනෙක් ඇද් ද? ඒ දෙමවුපියෝ රජ දෝහො? නොහොත් බ්‍රාහ්මණ දෝ හො?' යි කියා කුලය බලනසේක. මෙසේ වංශය බලනසේක. මහරජානෙනි, පළමු කොට ම අටදෙනෙකුන් විසින් අනාගතය බැලිය යුතු වන්නේ ය. කවර අටදෙනෙකුන් විසින් ද? යත්:— මහරජානෙනි, වාණිජයා **(222)** විසින් පළමු කොට ම විකුණන බඩුව බැලිය යුතු වන්නේ ය. හස්ති නාගයා විසින් පළමු කොට ම සොඬින් අනාගතමාර්ගය බැලිය යුතු වන්නේ ය. ගැල් පැද ගෙණ යන සාකටිකයා විසින් පළමු කොට ම අනාගතතීර්ථය බැලිය යුතු වන්නේ ය. නැවිකාරයා විසින් පළමු කොට ම පෙර නො ගියා වූ අනාගතතොට සලකා බලා නැව හැරිය යුතු වන්නේ ය. වෙද විසින් පළමු කොට ම ආයු පරීක්ෂා කොට බලා රොගාතුරයා කරා එළඹිය යුතු වන්නේ ය. හේදඬු ආදියෙන් එතර වන්නාහු විසින් පළමු කොට ම ථිරාථිර බව දැන ගෙණ සේතුවට නැගිය යුතු වන්නේ ය. භික්ෂූන් වහන්සේලා විසින් පළමු කොට ම හිරමුදුන දක්වා ඉතිරි අනාගතකාලය බලා භොජනය වැළඳිය යුතු වන්නේ ය. බොධිසත්ව වරයන් වහන්සේලා විසින් පළමු කොට ම 'රාජවංශය හෝ බ්‍රාහ්මණ වංශය හෝ කවරෙක් උතුම් දෝ හො' යි කියා උපදනා වංශය බැලිය යුතු වන්නේ ය. මහරජානෙනි, මේ අටදෙනා විසින් පළමු කොට ම අසම්-

1. උපදිද්ද, 2. ඉපදිම

Non-Commercial Distribution

ප්‍රාප්ත වූ අනාගතය බැලිය යුතු වන්නේ ය'' යි වදාළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ කාරණයත් යම් සේ ද, එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

කාලවිලොකනප්‍රශ්නය නිමි.

---

# මරණසමුච්ඡෙද ප්‍රශ්නය.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, තමන් නො හෙළිය යුත්තේ ය. යමෙක් තමන් හෙළන්නේ වී නම්, ඕහට ධර්මය වූ පරිද්දෙන් කට යුත්තේ ය' යි කියා මේ පාලිධර්මය වදාරණ ලද්දේ ය. නැවත ද, යම් කිසි තැනෙක දී සුගතශ්‍රාවකයන්ට ධර්ම දෙශනා කර වදාරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ 'නොයෙක් කාරණයෙන් ජාති ජරා ව්‍යාධි මරණයාගේ නැසීම පිණිස ධර්මය දෙශනා කර වදාරණසේක. යම් කිසිවෙක් ජාති ජරා ව්‍යාධි මරණය අතික්‍රමය කෙරේ නම්, ඔහුට උතුම් වූ ප්‍රශංසාවෙන් ප්‍රශංසා කර වදාරණසේකැ' යි කියා නුඹ වහන්සේ කියනසේක. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'න භික්ඛවෙ අත්තානං පාතෙතබ්බං, යො පාතෙය්‍ය යථා ධම්මො කාරෙතබ්බො' යි කියා වදාරණ ලද්දේ සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'ජාති ජරා ව්‍යාධි මරණයාගේ නැසීම පිණිස ධර්මය දෙශනා කරණසේකැ' යි කියන්නා වූ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'ජාතියා ජරාය ව්‍යාධිනො මරණස්ස සමුච්ඡෙදය ධම්මං දෙසෙති' යි කී වචනය සැබෑ වී නම්, එහෙයින් 'න භික්ඛවෙ අත්තානං පාතෙතබ්බං, යො පාතෙය්‍ය, යථා ධම්මො කාරෙතබ්බො' යි කියා වදළ ඒ වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටික ප්‍රශ්නය ද, නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නය තෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජාණෙනි, 'ගිහිගේ හැර මහණ වූ එක්තරා භික්ෂුනමෙක් ක්ලේශකාමයෙහි සිත් බැඳී අනභිරතියෙන් පෙළෙමින් බ්‍රහ්මචරියාව රක්ෂා කළ නො හී පාපවිතර්ක සිතීමෙන් ශාසනයෙහි වාසයට වඩා මිය යාම උතුමැ' යි සිතා **ගිජ්ඣකූටපර්වතයට** නැගී මහාප්‍රපාතයෙක්හි **(223)** පනිමින් බටදඬු සොයා ආ එක්තරා සැඩයක්හු ඇඟ වැතිර ගෙණ මැරුයේ ය. ගිරිමුදුනෙන් පැන පියාත් මරණ නො වූ ඒ භික්ෂූන් වහන්සේ 'අනුන් නැසීමෙන් පාරාජික වන්නෙම් දෝ හො?' යි සිතා බුදුන්ට එපවත් සැළකළසේක. සර්වඥයන් වහන්සේ ඒ අසා 'මහණ, තට පාරාජිකාවෙන් ඇවැත් නැතැ' යි කියා වදාරා 'න භික්ඛවෙ අත්තානං පාතෙතබ්බං යො පාතෙය්‍ය, යථා ධම්මො කාරෙතබ්බො' යි කියා මේ පාළිය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. යම් කිසි තැනෙක්හි දී ශ්‍රාවකයන්ට ධර්ම දෙශනා කරණ කල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කාරණයෙන් ජාති ජරා ව්‍යාධි මරණයාගේ සිඳීම පිණිස ධර්මයත් දෙශනා

Non-Commercial Distribution

කරණ ලද්දේ ය. භාග්‍යවතුන් වහන්සේ යම් කාරණයකින් දිවි නසා ගැණීම ප්‍රතික්ෂෙප කරණසේක් ද, ජාතිය නැසීමෙහි යොදවා වදරණසේක් ද, එහි කාරණයෙක් ඇතැ'' යි කීසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම් කාරණයකින් දිවි නසා ගැණීම ප්‍රතික්ෂෙප කරණසේක් ද, ජාතිය නැසීමෙහි සමාදන් කරවනසේක් ද, මෙහි ඒ කාරණය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, සිල් ඇත්තා වූ සීලසම්පන්න වූ භික්ෂූන් වහන්සේ සකලසත්වයන්ගේ ක්ලේශ විනාශ කිරීමෙහි දිව්‍යබෙහෙතක් හා සමාන වූසේක. සත්වයන්ගේ ක්ලේශව්‍යාධිව්‍යපශමනයෙහි දිව්‍යඖෂධයක් හා සදෘශ වනසේක. සකල සත්වයන්ගේ ක්ලේශරජස්දූලි පහ කිරීමෙහි උදකස්කන්ධයක් හා සදෘශ වනසේක. සත්වයන්ට සියලු සම්පත් දීමෙහි සිතුමිණිරුවනක් හා සදෘශ වනසේක. සකලසත්වයන්ට කාමෞඝාදි චතුර්විධමහෞඝයෙන් එතෙර ව යාමෙහි නැවක් හා සදෘශ වනසේක. සත්වයන්ට ජාතිකාන්තාරයෙන් මිදී යාමෙහි ගැල්සාර්ථවාහකයකු හා සදෘශ වනසේක. සත්වයන්ගේ රාගාදීත්‍රිවිධාග්නිසන්තාපය ශාන්ත කොට නිවීමෙහි මිහිරි මාරුතයක් හා සදෘශ වනසේක. සත්වයන්ගේ මනදෙළ පිරීමෙහි මහාමෙඝයක් හා සදෘශ වනසේක. සත්වයන්ට ත්‍රිවිධ කුශලධර්මය උගන්වාලීමෙහි අසහාය වූ ආචාර්යක්හු සදෘශ වනසේක. සකල සත්වයන් නිර්වාණක්ෂෙම නගරප්‍රවෙශ කිරීමෙහි මාර්ගොද්–දෙශකකෙනෙකුන් හා සදෘශ වනසේක.

''මහරජානෙනි, 'මෙබඳු වූ බොහෝ ගුණ ඇත්තා වූ අනෙක ගුණ ඇත්තා වූ අප්‍රමාණගුණ ඇත්තා වූ ගුණරාශියක් වැනි වූ ගුණගොඩක් ඇත්තා වූ සත්වයන්ට අභිවෘද්ධිකර වූ සිල්වත් භික්ෂූන් වහන්සේ නො නසිත්ව' යි සිතා සකලසත්වයන්ට අනුකම්පාවෙන් ම භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, තමන් මරණට නො ම හෙළිය යුත්තේ ය. යමෙක් තමන් හෙළා නම්, ධර්මය පරිද්දෙන් කට යුත්තේ ය' යි කියා ශික්ෂාපද පණවා වදළසේක. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ යම් කාරණයකින් මරණ ප්‍රතික්ෂෙපය කර වදළසේක් නම්, මේ මෙහි කාරණය වන්නේ ය. මහරජානෙනි, මෙම කාරණය විචිත්‍රචිත්‍රකථික වූ **කුමාර කාශ්‍යප** තෙරුන් වහන්සේ විසින් **පායාසිරාජඤ්ඤ** නම් බ්‍රාහ්මණයාහට [1] පරලොකය දක්වා වදරමින්— 'රාජඤ්ඤය, කල්‍යාණ ධර්මයෙන් සමන්විත වූ සිල්වත් වූ ශ්‍රමණබ්‍රාහ්මණයෝ යම් යම් පරිද්දෙකින් බොහෝ දීර්ඝ කාලයක් මුළුල්ලෙහි නො නැසී සිටිද් ද, ඒ ඒ පරිද්දෙන් බොහෝ ජනයාට හිත පිණිස බොහෝ ජනයාට සැප පිණිස දිව්‍යමනුෂ්‍යයන්ට වැඩ පිණිස සැප පිණිස ලොකානුකම්පාවෙන් පිළිපදනාහු ය' යි කියා වදරණ ලද්දේ ය.

**(224)** ''ශතපුණ්‍යධරත්වාදී අනෙකභාග්‍යයෙන් යුක්ත වූ භාග්‍යවතුන් වහන්සේ කවර කාරණයකින් ජාතිජරාදීන්ගේ විනාශය සමාදන් කරවන

1. 'රාජන්‍යයාට' යි විය යුතු. 'රාජඤ්ඤොති අනභිසිත්තකරාජා' යනු අටුවා යි.

Non-Commercial Distribution

සේක් ද, මහරජානෙනි, මනුෂ්‍යතිරශ්චීනාදී ජාතිය ද දුක් වන්නී ය. ඇඟ වැරලි දන්තචලන හිස පැසීම් ආදි ජරාව ද දුක් වන්නී ය. මධුමෙහ භගන්දරා කුෂ්ඨරොග අතීසාර රුජාදී වූ ව්‍යාධිය ද දුක් වන්නේ ය.[1] සර්ව ඥාති මිත්‍ර ග්‍රාම ධන සැපත් හැර මහණ වීම ද, දුක් වන්නේ ය. නැසුනු දෙයට ශොක කිරීමත් දුක් වන්නේ ය. එසේ ම විලාප කියා හැඬීමත් දුක් වන්නේ ය. නො ලැබෙන දෙයට දුක් වීමත් දුක් වන්නේ ය. සිත්හි දොම්නස් ඉපදීමත් දුක් වන්නේ ය. උපායාස නම් සිත්තැවිල්ලත් දුක් වන්නේ ය. අප්‍රියයන් හා එක්වීමත් දුක් වන්නේ ය. ප්‍රියයන්ගෙන් වෙන් වීමත් දුක් වන්නේ ය. මාතුමරණය ද දුක් වන්නේ ය. පිතුමරණය ද දුක් වන්නේ ය. එක කුස උපන් භාතුමරණය ද, දුක් වන්නේ ය. නැගනියන් මරණය ද දුක් වන්නේ ය, පුත්‍ර මරණය ද දුක් වන්නේ ය. අඹු මරණය ද දුක් වන්නේ ය. නෑයන්ගේ මරණය ද දුක් වන්නේ ය. නෑයන්ට වන ව්‍යසනය ද දුක් වන්නේ ය. රොගව්‍යසනය ද දුක් වන්නේ ය. භොග ව්‍යසනය ද දුක් වන්නේ ය. ශීලවිනාශය ද දුක් වන්නේ ය. දෘෂ්ටි ව්‍යසනය ද දුක් වන්නේ ය. රාජදණ්ඩනය ද දුක් වන්නේ ය. සොරුන් ගෙන් වන භය ද දුක් වන්නේ ය. වෛරීන්ගෙන් වන භය ද දුක් වන්නේ ය. දුර්භික්ෂයෙන් වන භය ද දුක් වන්නේ ය. ගින්නෙන් වන භය ද දුක් වන්නේ ය. උදකයෙන් වන භය ද දුක් වන්නේ ය. රළවේගයෙන් වන භය ද දුක් වන්නේ ය. ජලසළායෙන් වන භය ද දුක් වන්නේ ය. කිඹුලන් ගෙන් වන භය ද දුක් වන්නේ ය. සුසුක නම් මත්ස්‍යයන්ගෙන් වන භය ද දුක් වන්නේ ය. අත්තානුවාදභය ද දුක් වන්නේ ය. පරානුවාදභය ද දුක් වන්නේ ය. ධනදණ්ඩභය ද දුක් වන්නේ ය. දුර්ගතිභය ද දුක් වන්නේ ය. විනිශ්චය පිරිසට එළඹීමෙන් උපදනා සාරජ්ජභය ද, දුක් වන්නේ ය. අන්‍යදෘෂ්ටීන්ගෙන් වන ආජීවකභය ද දුක් වන්නේ ය. අනුන්ගෙන් වන මරණභය ද දුක් වන්නේ ය. නො කී නො කළ දෑ කළහ' යි කියා වේවැලින් තැළීමත් දුක් වන්නේ ය. කසවලින් තැළීමත් දුක් වන්නේ ය. දෙරියන් දිග ඇති මුගුරුවලින් තැළීමත් දුක් වන්නේ ය. අත් කැපීමත් දුක් වන්නේ ය. පා කැපීමත් දුක් වන්නේ ය. අත්පා කැපීමත් දුක් වන්නේ ය. කන් කැපීමත් දුක් වන්නේ ය. නාසච්ඡේදය ද දුක් වන්නේ ය. කර්ණනාසච්ඡේදය ද දුක් වන්නේ ය. හිස්කබල් උගුළුවා කාඩිදිය උණු කොට වත් කරන්නා වූ **බිලංගථාලික** වධය ද දුක් වන්නේ ය. හිස සම් උගුළුවා බොරළුයෙන් උලා සකක් මෙන් කරන්නා වූ **සංඛමුණ්ඩික** වධය ද දුක් වන්නේ ය. අඬුවෙන් මුඛය විවෘත කොට පහන්කඩ අවුළුවා මුඛයෙහි බහාලන්නා වූ **රාහුමුඛ** නම් වධය ද දුක් වන්නේ ය. සකල ශරීරයෙහි තෙල් පිළී සිසාරා ගිනි දල්වන්නා වූ **ජොතිමාලික** වධය ද දුක් වන්නේ ය. එසේ ම දෙයත් ගිනි දෙන්නා වූ **හත්ථපජ්ජොතිකවධය** ද, දුක් වන්නේ ය. කටියෙහි පටන් චර්මය උගුළුවා කෙණ්ඩයෙහි වළලු කොට තබන්නා වූ **එරකවත්තික** වධය ද දුක් වන්නේ ය. තන මත්තෙහි පටන් චර්මය උගුළුවා

---

1. වන්නී ය.

Non-Commercial Distribution

ඉහෙහි බහා වැහැරි කොට අඳවන්නා වූ **චීරකවාසික** නම් වධය ද දුක් වන්නේ ය. දෙදණ දෙවැලමිටි එක් කොට යපත් ගසා යවුල හිඳුවා වට කොට **(225)** ගිනි අවුළුවන්නා වූ **එනෙය්‍යක** නම් වධයද දුක් වන්නේ ය. අයොමය බිලීකොක්කෙහි අමුණා එල්වන්නා වූ **බළිසමංසික** නම් වධය ද දුක් වන්නේ ය. කහවණු මෙන් ශරීරයෙහි මස් කපා හරින්නා වූ **කහාපණක** නම් වධය ද දුක් වන්නේ ය. ශරීරයෙහි කෙඳි වත් කොට ක්ෂාරලුණු ඇඹුල් ගල්වන්නා වූ **ඛාරාපතච්ඡික** නම් වධය ද දුක් වන්නේ ය. එක් ඇළයකින් භූමියෙහි සයනය කරවා කණෙහි යවුලක් ගසා එක කකුලක් අල්වා ගෙණ වට කොට කරකවන්නා වූ **පලීඝපරිවත්තික** නම් වධය ද දුක් වන්නේ ය. සකල ශරීරයෙහි ඇට මස් තළා පොඩි කොට පිදුරු බිස්සක් මෙන් අකුළුවන්නා වූ **පලාලපීඨක** වධය ද දුක් වන්නේ ය. ගින්නෙන් රත් කරණ ලද තෙලින් ඇහට ඉසින්නා වූ වධයත් දුක් වන්නේ ය. සුනඛයන් ලවා කවන්නා වූ වධය ද දුක් වන්නේ ය. දිවස්හුල හිඳුවාලීම ද දුක් වන්නේ ය. වධබෙර ගස්වාලීමත් දුක් වන්නේ ය. කඩුවෙන් ඉස කැපීම ද දුක් වන්නේ ය. මහරජානෙනි, මෙබඳු වූ බොහෝ වධ වූ අනෙකවිධ වූ අනන්තදුක් සංසාරගත සත්වතෙම අනුභව කරන්නේය, විඳින්නේ ය.

''මහරජානෙනි, යම් සේ **හිමවත්**පර්වතයෙහි වස්නා ලද වර්ෂාජලය පන්සියක් ගවු දිග ඇති **ගංගා** නම් නදියගේ පාසාණ සක්ඛරා ඛර මරුම්බ දියසළා ගර්ගලක ඌළ වංක වලා වෙරල ආවරණ මුල් සාඛාදියෙහි පැතිර ගෙණ යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම මෙබඳු වූ බොහෝ විධ වූ අනෙකවිධ වූ දුක් අනන්ත වූ සංසාර දුක් සංසාරගත සත්වතෙම අනුභව කරන්නේ ය. එහෙයින් මහරජානෙනි, ජාතියගේ පැවැත්ම දුක් වන්නේ ය. නො පැවැත්ම සැප වන්නේ ය. අප්‍රවෘත්තියගේ ආනිසංසය ඇත්තේ ය. මහරජානෙනි, පැවැත්මෙහි වන භය දක්වා වදරන්නා වූ බුදුරජානන් වහන්සේ බොහෝ ගුණ ඇත්තා වූ අප්‍රවෘත්තියගේ සාක්ෂාත් කිරීමෙන් සියලු ම ජාති ජරා ව්‍යාධි මරණය ඉක්මවාලීම පිණිස ජාත්‍යාදිධර්මයන්ගේ විනාශයෙහි යොද වදළසේක. මහරජානෙනි, සර්වඥරාජොත්තමයානන් වහන්සේ යම් කාරණයකින් ජාතිය නැසීම පිණිස සමාදන් කරවා වදළසේක් ද, මේ එහි කාරණය'' යි වදළසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සංසාරදුඃඛය විශෙෂයෙන් ම දක්වා වදරණ ලද්දේ ය. ප්‍රශ්නයතෙම සුනිර්වෙඨනය කරණ ලද්දේ ය. ඊට ම කාරණා සුන්දර කොට කථනය කරණ ලද්දේ ය. මෙසේ මේ ප්‍රශ්නය යම් සේ ද, එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**මරණසමුච්ඡෙදප්‍රශ්නය නිමි.**

---

Non-Commercial Distribution

# මෙත්තානිසංසප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, ආසෙවනය කරණ ලද්ද වූ භාවිත කරණ ලද්ද වූ බහුලීකෘත කරණ ලද්ද වූ යානාවක් මෙන් කරණ ලද්ද වූ ගෘහවාස්තුවක් මෙන් කරණ ලද්ද වූ අනු ව ම සිටින ලද්ද වූ පුරුදු කරණ ලද්ද වූ මනා ව පටන් ගන්නා ලද්ද වූ ව්‍යාපාදචිත්තයෙන් මිදෙන ලද්ද වූ මෛත්‍රියගේ එකාදසානිසංසකෙනෙක් සිතින් කැමැති වන ලද්දහ. කවර එකාදසානිසංසයෙක් ද? යත්:— සුව සේ නිද්‍රොපගත වන්නේ ය. සුව සේ ම පුබුදින්නේ ය. දුඃස්වප්න නො දක්නේ ය. මනුෂ්‍යයන්ට ප්‍රිය වන්නේ ය. අමනුෂ්‍යයන්ට ද ප්‍රිය වන්නේ ය. දෙවතාවෝ රක්ෂා කෙරෙති. ඒ මෛත්‍රීසමංගීපුද්ගලයා හට **(226)** වහ්නියක් හෝ විෂයක් හෝ ශස්ත්‍රයක් හෝ නො වදින්නේ ය. රූපශබ්දදියෙහි නො දුවන විසින් වහා සිත එකඟ වන්නේ ය. මුඛ වර්ණය දුටුවන්ට ප්‍රාසාදික වන්නේ ය. නො මුළා ව කාලක්‍රියා කරන්නේ ය. අධිගම ප්‍රතිවෙධ නො කළහොත් මරණින් මත්තෙහි බ්‍රහ්ම ලොකූපගත වන්නේ ය' යි කියා මේ කාරණය වදරණ ලද්දේ ය. ''නැවත ද 'මෛත්‍රීවිහරණයෙන් යුක්ත වූ සාමකුමාරයන් වහන්සේ මෘග සමූහයා විසින් පිරිවරණ ලදු ව, වනයෙහි හැසිරෙණසේක් පිළියක්ඛ නම් රජ්ජුරුවන් විසින් විෂ පෙවූ හීයකින් විදින ලද්දේ එතැන්හි ම මූර්ඡිත ව වැටෙන ලද්දේ ය' යි කියා නුඹ වහන්සේ කියනසේක. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මෙත්තාය භික්ඛවෙ' යනාදීන් 'බ්‍රහ්මලොකයෙහි උපදින්නේ ය' යි කියා වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'සාමො කුමාරො මෙත්තාවිහාරී මිගසංඝෙන පරිවුතො පවනෙ විචරන්තො පිළියක්ඛෙන රඤ්ඤා විද්ධො විස පීතෙන සල්ලෙන තත්ථෙව මුච්ඡිතො පතිතො' යි කියා වදාළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'සාමො කුමාරො මෙත්තාවිහාරී මිගසංඝෙන පරිවුතො පවනෙ විචරන්තො පිළියක්ඛෙන රඤ්ඤා විද්ධො විසපීතෙන සල්ලෙන තත්ථෙව මුච්ඡිතො පතිතො' යි කියා වදරණ ලද්දේ සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'මෙත්තාය භික්ඛවෙ' යනාදීන් 'මෛත්‍රීසමංගී ඒ පුද්ගලයාහට වහ්නියක් හෝ විෂයක් හෝ ශස්ත්‍රයක් හෝ නො වදින්නේ ය' යි කියා වදාළ ඒ වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද අතිතීක්ෂ්ණ වන්නේ ය. පහ වූ මෘදුත්වය ඇත්තේ ය. සියක්වර පැළූ අස්ලොම් අගක් මෙන් අතිසියුම් වන්නේ ය. මදුරුතුඩින් සමුද්‍රජලය බී පියා පමණ කළ නො හැක්කා සේ අතිගම්භීර වන්නේ ය. වාලවෙධි රූපීන් වැනි ප්‍රඥාවෙන් අති දක්ෂ වූ මනුෂ්‍යපණ්ඩිතවරුන්ගේ ද ශරීරයෙහි දහඩිය සොලවන්නේ ය. ඒ ප්‍රශ්නතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ය. මහඅවුලෙන් වැළඳ සිටියා වූ ඒ ප්‍රශ්නය නිරවුල් කොට විජටනය කර වදාළ මැනැව. මේ

Non-Commercial Distribution

ප්‍රශ්නයාගේ ඉසිලීම පිණිස අනාගතයෙහි පහළ වන සර්වඥපුත්‍ර වූ පිටකත්‍රයධාරීන් වහන්සේලාට ප්‍රඥානේත්‍රය ශුද්ධ කොට දෙවා වදාළ මැනවැ'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'මෙත්තාය භික්ඛවෙ' යනාදීන් 'මෛත්‍රීසමංගීපුද්ගලයාහට වහ්නියක් හෝ විෂයක් හෝ ශස්ත්‍රයක් හෝ නො වදින්නේ ය' යි කියා මේ කාරණයත් වදාරණ ලද්දේ ම ය. 'සාමො කුමාරො මෙත්තාවිහාරී මිගසංඝෙන පරිවුතො පවනෙ විචරන්තො පිළියක්ඛෙන රඤ්ඤා විද්ධො විසපීතෙන සල්ලෙන තත්ථෙව මුච්ඡිතො පතිතො' යි කියා වදාළ වචනයක් සැබෑ ම ය. මහ රජානෙනි, එහි කාරණයක් ඇත. ඒ කවරේ ද? යත්:— මහරජානෙනි, මේ ආනිසංසයෝ පුද්ගලයෙකුගේ නො වන්නාහ. මේ ආනිසංසයෝ මෛත්‍රීභාවනාවගේ ම ය. මහරජානෙනි, කිසි පවක් සිනයෙනුත් නො සිතා සාමකුමාරයන් වහන්සේ පැන් කළය පුරවා ඔසවා ගන්නසේක් ඒ ක්ෂණයෙහි මෛත්‍රීභාවනායෙහි ප්‍රමාද වූසේක. මහරජානෙනි, යම් ක්ෂණයෙක පුද්ගලතෙම මෛත්‍රියට පැමිණියේ වී නම්, ඒ පුරුෂයාහට ඒ ක්ෂණයෙහි වහ්නියෙක් **(227)** හෝ ශස්ත්‍රයක් හෝ නො වදින්නේ ය. ඔහුට අහිතකාමී වූ යම් කිසි කෙනෙක් දිව අවුත් ඔහු නො දක්නාහ. එහි හානියකට අවකාශයක් නො ලබන්නාහ. මහරජානෙනි, මේ පුද්ගලයාගේ ආනිසංසයක් නො වන්නේ ය. මෛත්‍රීභාවනාවගේ මේ ආනිසංසයෝ ය. මහරජානෙනි, මේ ලොකයෙහි සංග්‍රාමාවචර ශූරපුරුෂයෙක්තෙම කිසිවකින් භේද්‍යය කළ නො හැක්කා වූ අයොමය දැලින් කළ බලවත් වූ සන්නාහය කින් සන්නද්ධ ව යුද්ධයට බස්නේ වී නම් ඕහට විදින ලද්ද වූ හීගස් ලහට ගොස් නො වැද වැටෙන්නාහ. විසිරෙන්නාහ. ඔහු කෙරෙහි අවකාශයක් නො ලබන්නාහ. මහරජානෙනි, මේ ආනිසංසයෝ සංග්‍රාමශූරයාගේ නො වන්නාහු ය. යම් සංග්‍රාමශූරයක්හට විදින ලද සැරයෝ සමීපයට අවුත් වැටෙත් ද, විසිරෙද් ද, ඒ මේ ආනිසංසය අභෙද්‍ය සන්නාහ ජාලිකයාගේ වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම මේ ආනිසංසයෝ පුද්ගලයක්හුගේ නො වන්නාහු ය. මේ ආනිසංසයෝ මෛත්‍රීභාවනාවගේ වන්නාහු ය. මහරජානෙනි, යම් ඇසිල්ලෙක පුද්ගලතෙම මෛත්‍රීසමන්නාගත වූයේ වේ ද, ඒ පුද්ගලයාහට ඒ ඇසිල්ලෙහි ගින්නක් හෝ විෂයක් හෝ ශස්ත්‍රයක් හෝ නො වදින්නේ ය. ඕහට අහිත කැමැත්තා වූ යම් කිසි කෙනෙක් ශස්ත්‍රාදිය ගෙණ දිව අවුත් ඔහු නො දකිති. විනාශයට ඔහු කෙරෙහි අවකාශයක් නො ලබති. මහරජානෙනි, මේ ආනිසංසයෝ ඔහුගේ නො වන්නාහු ය. මේ ආනිසංසයෝ මෛත්‍රීභාවනාවගේ වන්නාහු ය.

''තව ද, මහරජානෙනි, මනුෂ්‍යලොකයෙහි පුරුෂයෙක්තෙම දිව්‍යමය අන්තර්ධාන ඇති බෙහෙත් මුලක් හස්තයට ග්‍රහණය කෙළේ වී නම්, බෙහෙත් මුල යම් තාක් ඔහුගේ හස්තගත වන ලද්දේ වේ ද, ඒ තාක් කල්



Non-Commercial Distribution

අනික් කිසි ප්‍රකෘතිමනුෂ්‍යයෙක් ඒ පුරුෂයා නො දක්නේ ය. මහරජානෙනි, මේ ආනිසංසය පුරුෂයාගේ නො වන්නේ ය. අන්තර්ධානයාගේ යමක් ඒ ප්‍රකෘතිමනුෂ්‍යතෙම චක්ෂුඃපථයෙන් නො දක්නේ වී නම්, ඒ බෙහෙත් මූලයාගේ ම ඒ ආනිසංසය වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම මේ ගුණානිසංසය පුද්ගලයාගේ නො වන්නේ ය. මේ ගුණානිසංසය මෛත්‍රීභාවනාවගේ ම ය. මහරජානෙනි, යම් ක්ෂණයක පුද්ගලතෙම මෛත්‍රියට පැමිණියේ වේ ද, ඒ පුද්ගලයාහට ඒ ක්ෂණයෙහි ගින්නක් හෝ විෂයක් හෝ ශස්ත්‍රයක් හෝ නො වදින්නේ ය. ඕහට අහිත කැමැත්තා වූ **(228)** යම් කිසි කෙනෙක් ලඟට අවුත් ඔහු නො දකිති. ඔහු කෙරෙහි අවකාසයක් නො ලබති. මහරජානෙනි, මේ ආනිසංසය පුද්ගලයාගේ නො වන්නේ ය. මේ ආනිසංසය මෛත්‍රීභාවනාවගේ ම ය.

''තව ද, මහරජානෙනි, යම් සේ මනා කොට කරණ ලද මහත් වූ මහගල්ලෙනකට ප්‍රවිෂ්ට වූ පුරුෂයකු විශෙෂයෙන් වර්ෂා කරන්නා වූ මහාමෙඝයතෙම තෙමන්ට නො හැකි වන්නේ ය. මහරජානෙනි, මේ ආනිසංසය පුරුෂයාගේ නො වන්නේ ය. මහත් වූ මහාමෙඝය වර්ෂා කෙරෙමින් යම් පුරුෂයකු නො තෙමෙන්නේ වේ ද? ඒ ආනිසංසය මහා ලෙනයාගේ ම ය. මහරජානෙනි, එපරිද්දෙන් ම මේ ආනිසංසයෝ පුද්ගලයාගේ නො වන්නාහු ය, මේ ආනිසංසයෝ මෛත්‍රීභාවනාවගේ ම ය. මහරජානෙනි, යම් ක්ෂණයක පුද්ගලතෙම මෛත්‍රීසමන්නාගත වූයේ වේ ද, ඒ ක්ෂණයෙහි ඒ පුරුෂයාහට ගින්නක් හෝ විෂයක් හෝ ශස්ත්‍රයක් හෝ නො වදින්නේ ය. ඕහට අවැඩ කැමැත්තා වූ යම් කිසි කෙනෙක් ලඟට අවුත් ඔහු නො දක්නාහු ය. ඕහට අවැඩක් කරන්ට නො හැකි වන්නාහු ය. මහරජානෙනි, මේ ගුණානිසංසයෝ පුද්ගලයාගේ නො වන්නාහු ය. මේ ගුණානිසංසයෝ මෛත්‍රීභාවනාවගේ ම ය.

ශක්‍රයන්ගේ ආරාධනාවෙන් **දූකූල** තපස්වීන් වහන්සේ **පාරිකා** නම් තපස්සිනීන්දෑගේ නාභිපරාමර්ශනය කළ වේලෙහි බොධිසත්වයෝ දෙව්ලොවින් අවුත් **පාරිකාවන්** බඩ ඉපිද මව්කුසින් බිහි ව ස්වර්ණවර්ණ වූ ශරීරයක් ඇති බැවින් **සාම** නම් කුමාර වූසේක. ඔවුන්ගේ මෛත්‍රී ආනුභාවයෙන් ඒ වනයෙහි වසන කිඳුරුදෙනුහු අවුත් බොධිසත්වයන් වඩා ගෙණ ගොස් කඳුරැළිආදියෙන් නහවා අනෙකවිධ විසිතුරු වන කුසුමයෙන් සරහා හිරියල්තිලක දෙමින් පන්සල ගෙණ ලා නිති රකිති. මෘගපොතකයෝ අවුත් බොධිසත්වයන් ක්‍රීඩාමඩුල්ලෙන් නළවා රකිති. මේ නියායෙන් සොළොස් අවුරුදු පිරුණු කල දෙමවුපියන්ගේ පූර්ව කර්මයකින් ඇස් අන්ධ වී ය. මහබෝසතානෝ අන්ධ වූ දෙමවුපියන් පන්සැල හිඳුවා උණුදිය සිහිල්දිය මධුර වූ ඵලාඵලයන් දී පොෂ්‍ය කෙරෙමින් වැස දිනෙක දෙමවුපියන් වැඳ සමු ගෙණ මෘගයන් පිරිවරා ඵලාඵල පිණිස පර්වතාන්තරයෙහි කිඳුරන් හා සමග ඇවිදිමින් ඵලාඵල ගෙණවුත් පන්සැල තබා 'පැන් ගෙණෙමි' යි කියා කළය ගෙණ මුවන්

Non-Commercial Distribution

දෙදෙනෙකු පිට කළය තබා අල්වා ගෙණ මෘගයන් පිරිවරා **මිගසම්මතා** නම් ගඟට පැමිණිසේක. එකල බරණැස් නුවර රජ කරණ **පිළියක්ඛ** නම් රජ්ජුරුවෝ මෘගමාංසලොභයෙන් දහසක් දෙන ඇද නඟන දළ්හධනුව හා විෂපිත හී ගෙණ හිමාලයෙහි මෘගඝාතනය කොට ඇවිදිමින් **මෘග සම්මතා** නම් ගඟට පැමිණ මෘගපාද සටහන් බලා ගොස් මෘගයන් එන මං බලා කොටුපතෙක සැඟවී හිඳ, සාම කුමාරයන් දක, විස්මය පත් ව, 'යක්ෂයෙක් දෝ හෝ? නොහොත් නාගයෙක් දෝ හෝ?' යි 'කථා කරපීම් නම් අන්තර්ධාන ව යෙයි. එහෙයින් විදපියා දුර්වල කොට තොරතුරු අසා ගෙණ ගොස් අමාත්‍යයන්ට කියමි' යි සිතසිතා හුන්නාහු ය. එකල **සාමකුමාරයන්** සියලු මුවන් පැන් බී ගොඩ නැඟි කල්හි ගඟට බැස පැන් නා ගෙණ ගොඩ නැඟී වැහැරි සිවුර හැඳ අජිනචර්මය එකාංශ කොට බහා ගෙණ පැන් කළය ඔසවා වම්කර තබාපියන වේලෙහි දුක්ඛවෙදනාව ඉපිද මෛත්‍රීභාවනාවයෙහි සිත මදක් ප්‍රමාද වී ය. ඒ ක්ෂණයෙහි ම රජ්ජුරුවෝ **සාමකුමාරයන්ට** විද්දහු ය. ඒ සැරය **සාමකුමාරයන්ගේ** දකුණැළයෙහි වැදී වම්ඇළයෙන් නික්ම ගියේ ය.

ඒ දක මෘගයෝ භයින් තැති ගෙණ පලා ගියාහ. ඒ සැරය වදින ලද්ද වූ ස්වර්ණවර්ණ වූ සාමකුමාරයෝ පැන්කළය බිම නො හෙළා ම සිහි උපදවා ගෙණ සනික ම කරින් බා වැලි පීරා, කළය තබා දෙමවුපියන් වසන දිසාවට හිස දමා වැඳ වැතිර වැලි මත්තෙහි රන්පිළිමයක් සේ මුණින් හිඳ 'මේ වනයෙහි මට සතුරුකෙනෙක් නැත්තේ ය. මාගෙන් කිසි කෙනෙකුන් කෙරෙහි වෛරයක් නැත්තේ ය'යි කියමින් මුඛයෙන් එන ලේ වමාර වමාරා—

**'කො නු මං උසුනා විජ්ඣි – පමත්තං උදහාරකං,**
**ඛත්තියො බ්‍රාහමණො වෙසො – කො මං විද්ධා නිලීයසී.'**

**(229)** යනාදින් පැන් ඔසවා ගෙණ යන්නා වූ. එහෙයින් ම මෛත්‍රී භාවනායෙහි ප්‍රමාද වූ මට බලවත් වූ හී පහරින් කවරෙක් විද්දේ ද? රජකෙනෙක් ද? බ්‍රාහ්මණ කෙනෙක් ද? ගෘහපතිකෙනෙක් ද? කවරෙක් මා විද සැඟවී ගියේ ද? මාගේ මාංස කෑ යුතු දේකුත් නො වන්නේ ය. සමින් ප්‍රයෝජනයකුත් නැත්තේ ය. එසේ කල කුමන කාරණයකින් මා විදින්ට සිතුයේ ද? මා විද්ද වූ තෙපි කවුරු ද?' යි විචාළසේක. එබස් අසා රජ්ජුරුවෝ 'අහෝ! මේ තෙම මා විසින් විෂපීත සැරයෙන් විද හෙළන ලදු ව ද, කිසි ක්‍රොධයක් නො කොට ප්‍රියවචනයෙන් ම කථා කරන්නේ ය' යි සිතා වහා ලඟට දිව අවුත් සිට—

**'රාජාහමස්මි කාසීනං – පිළියක්ඛොති මං විදූ,**
**ලොභා රට්ඨං පහත්වාන – මිගමෙසං චරාමහං.**
**ඉස්සත්ථෙ චස්මි කුසලො – දළ්හධම්මොති විස්සුතො,**
**නාගොපි මෙ න මුච්චෙය්‍ය – ආගතො උසුපාතනං.'**

යනාදීන් ‘පින්වත, මම කාශිදෙශවාසීන්ට රජ වීමි. ‘මා පිළියක්ඛරජය’යි කියා දන්නේ ය. මම මාංසලොභයෙන් බරණැස හැර අවුත් මුවන් සොයමින් මේ වනයෙහි හැසිරෙන්නෙමි. මම ධනුශ්ශිල්පයෙහි අති දක්ෂ වීමි. දහසක් දෙනා ඇද නහන (දුන්න නහන හෙයින්) දළ්හධනුර්-ධර ය යි කියා ප්‍රසිඬයෙමි. මා විසින් විද හරණ ලද හී සැරය තෙම හස්ති රාජයකු වුවත් නො හැර විනිවිද යන්නේ ය’ යි ‘මෙසේ යක්ෂනාගාදීහුත් මනුෂ්‍යභාෂාවෙන් කථා කෙරෙති. මොහු යක්ෂනාගාදී කවරෙකු බවත් නො දනිමි. කිපී මාගේ දිවි නැසුයේ වී නම් නපුර.’ ‘මම රජ්ජුරුයෙමි’ යි කීකල ‘භය නො වන්නා වූ කෙනෙක් නම් නැතැ’ යි සිතා තමාගේ තෙජස් හා බලය දක්වා කථා කොට සාමකුමාරයන්ගේ නාමගොත්‍රය විචාළෝය. ඒ අසා සාමකුමාරයෝ—

**‘නෙසාද පුත්තො භද්දන්තෙ – සාමො ඉති මඤාතයො,**
**ආමන්තයිංසු ජීවන්තං – සො, අජ්ජේවං අතො සයෙ,**

යනාදීන් ‘පින්වත් මහරජ, නුඹ වහන්සේට වැඩෙක් වේව යි. මම නෙසාද පුත්‍රයෙක්මි. ජීවත් ව සිටින්නා වූ මට සාම ය යි කියා මෙසේ මාගේ දෙමවුපියනැයෝ ආමන්ත්‍රණය කරන්නාහු ය. ඒ මම අද මරණමුඛයෙහි පිහිටියෙමි. මරණපරායණ ව සයනය කෙරෙමි. මහරජාණෙනි, විෂවත් මහත් යවුලකින් විනිවිද ගිය මෘගයකු මෙන් මාගේ ශරීරයෙන් ගලන රුධිරධාරායෙහි ගැලී සුසුම් හෙළමි. මාගේ දකුණැළයෙන් වැද වම් ඇළයෙන් සම්මස්විනිවිද ගිය යවුල බැලුව මැනැව. මුඛයෙන් ගලන ලේ බැලුව මැනැව. නාසයෙන් එන ලේ කිඹීස හරිමි. මෙබඳු වූ බලවත් මරණාතුර ව විචාරමි. කුමක් පිණිස මා විදපියා වනගහනයෙහි සැඟවී ගියේ දැ?’ යි කියා මෛත්‍රීසිතින් ම විචාළසේක. එකල රජ්ජුරුවෝ අනෙකා-කාරයෙන් විමසා බලා, මනුෂ්‍යයෙක් ම ය යි නිශ්චය කොට දූන බල-වත් වූ ශොකයට පැමිණ ‘මෙබඳු වූ ස්වර්ණවර්ණ වූ සාමකුමාරයෝ එකලා ම ව මෙම මහාවනයෙහි වාසය කරන්නෝ නො වෙති. නෑ කෙනෙකුන් හා සමග විසිය යුතු වන්නේ ය’ යි සිතා ‘පින්වත් වූ මා යහළු සාමකුමාරයෙනි, තෙපි කවර දෙශයකින් මේ වනයට අවුත් වසවු ද? ‘ගහට ගොස් පැන් ගෙණෙව යි **(230)** කියා කවුරුන් විසින් එවන ලද්ද වූ තෙපි මේ මෘගසම්මතා නම් ගහට ආවාහු දැ?’ යි විචාළෝ ය. එකල ආ තොරතුරු කියනු කැමැති වූ මහබෝසතාණෝ මුඛයෙන් ලේ වමාරවමාරා—

**‘අන්ධා මාතා පිතා මය්හං – තෙ භරාමි බ්‍රහාවනෙ**
**තෙසාහං උදහාරකො – ආගතො මිගසම්මතං.’**

**අත්ථි තෙසං උසාමත්තං – අථ සාහස්ස ජීවිතං**
**උදකස්ස ච අලාභෙන – මඤ්ඤෙ අන්ධා මරිස්සරෙ,**

**ඉදං දුතියකං සල්ලං – කම්පෙති හදයං මම,**
**යං ච අන්ධෙ න පස්සාමි – යං ච හෙස්සාමි ජීවිතං.’**

Non-Commercial Distribution

යනාදීන් 'මහරජානෙනි, මාගේ මවුපියෝ දෙදෙන අන්ධ වූහ. මේ මහා වනයෙහි මධුර වූ ඵලාඵල ගෙණවුත් දෙමින් ඒ අන්ධ වූ මවුපියන් දෙදෙනා පොෂ්‍ය කෙරෙමින් ඒ අන්ධවූ දෙමවුපියන්ට පැන් ගෙණ යන්නා වූ මම කළය ගෙණ මේ මෘගසම්මතාවට ආයෙමි. ඒ දෙමවුපියන්ට හොජනමාත්‍රයෙක් ම ඇත. ඒ හොජනමාත්‍රයෙන් සදවසක් පමණ ජීවිතය පවත්නේ ය. පැන් නො ලැබීමෙන් මාගේ අන්ධ වූ දෙමවුපියෝ මැරෙත් ම ය' යි සිතන්නෙමි. මට පැමිණියා වූ මේ දුකට වඩා මාගේ අන්ධදෙමවුපියන් නො දක්නා දුක ඉතා බලවත් වන්නේ ය. ඒ මාගේ අන්ධ වූ මෑනියෝ ඉතා දිළිඳු ව බොහෝ කලක් හඬනදෑ ය. දිළිඳු වූ ඒ මාගේ පියානෝ බොහෝ කලක් හඬනදෑ ය. මා නො දක්නා වූ මාගේ මවුපිය දෙදෙන **'සාම, සාම ය'** යි විලාප කියමින් මහවනයෙහි ඇවිදිති. මාගේ අන්ධ වූ දෙමවුපියන් නො දක්නා යම් දුකෙක් ඇද් ද, අද මාගේ දිවි නැසී යන යම් දුකෙක් ඇද් ද, එයින් දෙමවුපියන් නො දක්නා මේ දෙවෙනි මහාශොක ශල්‍යය මාගේ හෘදය කම්පා කරන්නේ ය' යි අනෙක අඳෝනා කියා සිටි කල්හි රජ්ජුරුවන් 'අහෝ! මේ තෙම අත්‍යන්තබ්‍රහ්මචාරී ව අන්ධ වූ දෙමවුපියන් රක්ෂා කෙරෙයි. මේ සා මහත් මරණදුකට පැමිණපියාත් දෙමවුපියන් උදෙසා ම හඬන්නේ ය. මා කළ මහාඅපරාධයෙන් නරකයෙහි වැටේ ම ය. එයින් මට රාජ්‍යසම්පත්තියෙන් කම් කිම් ද? මොවුන්ගේ දෙමවුපියන්ට දසභූත ව උපස්ථාන කෙරෙමි' යි සිතා 'මාගේ ස්වාමීනි, සාමකුමාරයෙනි, නුඹගේ දෙමවුපියන්ට මම උපස්ථාන කෙරෙමි. නුඹ වහන්සේ ශොක නො කළ මැනැව. දෙමවුපියන් වසන දෙස මට වදළ මැනැවැ' යි කියා සිටි කල්හි දෙමවුපියන් වසන පන්සලට පාර කියා දෙමවුපියන්ට උපස්ථාන කරන්ට රජහට ගරුතර ව අඤ්ජලිය කොට යවා තමා විසංඥබවට පැමිණියේ ය. ඒ බව දක්වා වදරණ ලොවුතුරා බුදුන් විසින්:—

**'ඉදං වත්වාන සො සාමො – යුවං කල්‍යාණදස්සනො,**
**මුච්ඡිතො විසවෙගෙන – විසඤ්ඤං සමපජ්ජථ.'**

යනුවෙන් 'මහණෙනි, ඒ කල්‍යාණදර්ශනය ඇත්තා වූ ළදරුවයස් ඇත්තා වූ ස්වර්ණවර්ණ වූ සාමකුමාරතෙම පිළියක් රජහට 'මහරජානෙනි, මාගේ දෙමවුපියන් රක්ෂා කරන්නැ' යි යන මේ වචනය කියා සැරපහර වැදගත් විෂවෙගයෙන් ශරීරය ඵද්ධ වීමෙන් මුඛය වැසී ගියේ ය. කඨා සිඳී **(231)** ගියේ ය, ඇස් පියවී ගියේ ය, චිත්තසන්තතිය හෘදයවස්තුව නිසා පැවැත්තේ ය, එහෙයින් මූර්ජා වෙමින් විසංඥබවට පැමිණියේ ය, සකලශරීරය ලෙහෙයෙන් ආලෙප වී ය. ඒ දුක පිළියක්රජ්ජුරුවෝ හෘදය පැළී යන සේ අධිකතර වූ සංවෙගයට පැමිණ 'සාමකුමාරයෝ මළහ' යි කියා හට ගත්තා වූ ශොකය දරා ගත නො හී දැත් මුදුනෙහි තබා ගෙණ මහහඬින් හඬමින් 'අහෝ! මම මෙතෙක් කල් මුළුල්ලෙහි මා අජරාමර කෙනෙකුන් මෙන් සිතා උන්නෙමි. අද මේ සාමකුමාරයන්

Non-Commercial Distribution

නැසුනුබව දැක ඒ මරණ මටත් සෙස්සන්ටත් පැමිණෙන බව අද දැන ගන්තෙමි. මීට පළමුවෙන් නො දත්තෙමි' යනාදී අනෙකවිලාපයෙන් හඬන්ට වන. එකල **සාමකුමාරයන්ට** සත්වැනි ආත්මභාවයෙහි මාතෘ වූ **බහුසොදරී** නම් දිව්‍යාංගනාවක් **ගන්ධමාදනපර්වතයෙහි** සිට මහාබොධිසත්වයන් පුත්‍රස්නෙහයෙන් ආවර්ජනා කොට බලා දැක 'අහෝ! **පිළියක්** රජහු මා පුතනුවෝ සාමකුමාරයා[1] විද හෙළා මළහ' යි කියා හඬන්නේ ය. ඉදින් මම එතැනට නො ගියේ වී නම්, මාගේ පුත්‍ර වූ ස්වර්ණවර්ණසාම කුමාරයෝ ඒ ගහ වැල්ලෙහි ම නස්නාහ. රජහුගේත් හෘදය පැළෙයි. සාම කුමාරයන්ගේ මවුපියෝ දෙදෙන ද අහරපැන් නො ලැබ වියලි නස්නාහු ය. මා ගිය කල්හි සාමකුමාරයෝ ජීවත් වෙති. දෙමවුපියෝ ඇස් ලබති. රජ්ජුරුවෝ සාමකුමාරයන්ගෙන් බණ අසා පැහැද මහදන් පවත්වා දශ රාජධර්මයෙන් රජ කෙරෙමින් දෙව්ලොව උපදනාහ' යි කියා දැක මහත් වූ ප්‍රීතියෙන් **ගන්ධමාදනපර්වතයෙන්** අන්තර්ධාන ව ආකාශයෙහි නො පෙණී සිට:—

**'ආගුං කරි මහාරාජ – අකරා කම්ම දුක්කටං,**
**අදූසකා පිතා පුත්තා – තයො එකුසුනා හතා.'**

'මහරජාණෙනි, තෙපි මහාඅපරාධ වූ මහාපාපයක් කළාහු ය. නපුරු වූ ලාමකකර්මයක් කළාහු ය. නිර්දෙෂ වූ මාතෘපිතෘ පුත්‍ර යන තුන් දෙනෙක්[2] එක හී පහරින් විදින ලද්දෝ ය.[3] එහෙයින් තොප[4] මැන අව මැනැව. යම් ලෙසකින් තොපට සුගතියෙක් වේ නම්, එපරිද්දෙන් තොපට මම අනුශාසනා කෙරෙමි. සාමකුමාරයන් මෙන් මේ වනයෙහි අන්ධ වූවන් ධර්මයෙන් පොෂ්‍යය කරව. එසේ කල තොප විසින් සුගතියට ගිය යුතු වන්නේ ය යි කියන්නෙමි' යි කියා අවවාද කළාහ. රජ්ජුරුවන් දිව්‍යාංගනාවගේ අවවාදය අසා අතිශයින් භය ගෙණ 'මට රාජ්‍යසුවෙන් කම් නැත. සාමකුමාරයන්ගේ අන්ධ වූ දෙමවුපියන්ට උපස්ථානය කෙරෙමින් නරකදුක්ඛයෙන් මිදී යෙමි' සිතා අනෙකවිධ වූ විසිතුරු වූ වනකුසුමයෙන් සාමකුමාරයන්ට පූජා කොට තුන් වරක් ප්‍රදක්ෂිණා කෙරෙමින් සතර තැනෙක බැස හෙව වැඳ වැතිර මහාශොකයෙන් හඬ හඬා පැන් කළය ගෙණ පන්සලට ගොස් **දූකූල** තාපසයන් හා **පාරිකා** නම් තපස්විනීන් දැක පිළිසඳර කථා කොට **සාමකුමාරයන්** මළ පවත් හා තමන් උපස්ථානයට ආ පවත් කී කල්හි මහාශොකයෙන් ලය පැහැර ගෙණ ඒ රජහුගේ දෙපත්ලස හඬා පෙරළෙමින් 'අනේ! කසිමහරජාණෙනි, තොප වඳුම්හ. අප සාමකුමාරයන් මළ තැනට ගෙණ ගොස් හරුව. අපි ද **සාමකුමාරයන්** මළ තැන මරණකල් බලා හිඳුම්හ. අනේ, **කසි**මහරජාණෙනි, අප සාමකුමාරයන් මළ තැනට ගෙණ ගොස් හරුව' යි කියකියා විලාපයට පටන් ගත් කල්හි **(232) පිළියක්ඛරජ්ජුරුවන්** ද හෘදය පැළීයන තරම් අධිකතර වූ ශොකයට පැමිණ 'අහෝ! දූන් හිරු අස්තංගත වීමෙන් අන්ධකාරය පැමිණියේ ය. මේ අන්ධකාරයෙහි දූන්

1. සාමකුමාරයෝ 2. දෙනෙකුන් 3. ලද්දේ ය. 4. තෙපි.

Non-Commercial Distribution

සාමකුමාරයන් මළ තැනට මොවුන් කැඳවා ගෙණ ගියේ වීම් නම්, එතැන ම හෘදය පැළී නස්නාහු ය. එසේ කල මා නරකයෙහි උපන්නාක් වැන්න. එහෙයින් මොවුන් කල් යවා ශොක තුනී කොට කැඳවා ගෙණ යෙමි' යි සිතා '**බ්‍රවාහාලමිගාකිණ්ණං**' යනාදීන් 'අන්ධකාරවනගහනයෙහි දෙෂ දක්වාපියාත් නවත්වා ගත නො හී කැඳවා ගෙණ ගොස් 'අම්ම, පියානෙනි, මේ තොපගේ පුතනුවෝ **සාමකුමාරයෝ** ය' යි කියා දූන්වූ කල්හි 'පුතණ්ඩ, මාගේ සාමකුමාරයෙනි, තුඹට වන් දුක් අසා අපි ආම්හ. අපට වන් දුක් ගෙවා නැගිටින්නැ' යි 'අම්ම පියානෙනි, කියන බසක් කියාලන්නැ' යි කියාකියා මැනියෝ දෙපය ගෙණ ඔක්ක තබා ගෙණ හඬන්ට වන්හ. පියානෝ හිස ඔක්ක තබාගෙණ හඬන්ට වන්හ. මෙසේ අනෙක ශොකාතුර ව ආලාපවිලාපයෙන් මෙසේ හඬහඬා මැනියන් සාම කුමාරයන්ගේ ලය අත තබා උෂ්ණගති පරීක්ෂා කෙරෙමින් 'නො මළහ' යි දූන මහාප්‍රීතින් 'සත්‍යක්‍රියා කොට විෂ විනාශය කෙරෙමින් උපදවමි' යි සිතා:—

**'යෙන සච්චෙන යං සාමො – ධම්මචාරී පුරෙ අහූ,**
**එතෙන සච්චවජ්ජෙන – විසං සාමස්ස හඤ්ඤතු.'**

යනාදීන් 'මේ **සාමකුමාරතෙම** මීට පූර්වභාගයෙහි ඇත්තා වූ යම් කාරණය කින් කුශලකර්මපථචාරී වී ද, මේ සත්‍යානුභාවයෙන් සාමකුමාරයාගේ සැරවෙගවිෂය අලපත වතුර සෙයින් විනාශ වේවා. තවද, මේ සාම කුමාරතෙම උපන් තැන් පටන් අද දක්වා ම බ්‍රහ්මචාරී වී ද, සත්‍යවාදී වී ද, මාතෘපිතෘපොෂක වී ද, කුලජෙට්ඨාපචායික වී ද, මාගේ ප්‍රාණයට වඩා ප්‍රියතර වී ද, දෙමවුපිය වූ අප විසින් කරණ ලද යම් කුශලකර්මයක් ඇද් ද, මේ සත්‍යානුභාවයෙන් හිරු දුටු අඳුරක් මෙන් සාමකුමාරයන්ගේ ශරීර ගත විෂය විනාශ වේව' යි සත්‍යක්‍රියා කළ කල්හි සාමකුමාරයෝ ආශ්වාස ලදින් එක් ඇළයට කරකැවී හුන්නාහ. එකල පියානෝ 'අහෝ! මා පුතනුවෝ ජීවත් ව වෙසෙති. මම ද සත්‍යක්‍රියා කෙරෙමි' යි කියා එසේ ම සත්‍යක්‍රියා කළෝ ය. එකල මහබෝසතානෝ ආශ්වාසප්‍රශ්වාස ලදින් ඇළයට කරකැවී වැද හොත්සේක. ඒ දූක දිව්‍යාංගනාවෝ ද සත්‍යක්‍රියා කරණුවෝ:—

**'පබ්බත්‍යාහං ගන්ධමාදනෙ – චිරරත්ත නිවාසිනී,**
**න මෙ පියතරො කොචි – අඤ්ඤො සාමා න විජ්ජති,**
**එතෙන සච්චවජ්ජෙන–විසං සාමස්ස හඤ්ඤතු.'**

යනාදීන් 'සර්වසුගන්ධයෙන් සුගන්ධිත වූ **ගන්ධමාදනපර්වතයෙහි** බොහෝ කාලයක් වාසය කළා වූ මට සාමකුමාරයන්ට වඩා අනික් ප්‍රියතර කෙනෙක් නැත්තේ ය. මේ මාගේ සත්‍යානුභාවයෙන් සාමකුමාරයාගේ ශස්ත්‍රවිෂය නසීව' යි කියා සත්‍යක්‍රියා කළාහ. මෙසේ ඒ දෙමවුපියන් හා දිව්‍යාංගනාවන්ගේ බැගෑපත් කරුණා මෛත්‍රීසත්‍යගුණානුභාවයෙන් සත්‍ය-ක්‍රියාවසානයෙහි සාමකුමාරයන් වහන්සේ නිරොගී ව නැගී සිට කථා

*Non-Commercial Distribution*

කළසේක. සකල ශරීරයෙහි ව්‍යාප්ත වූ විෂවෙගය පියුම්පත්‍රයෙහි (233) නො රඳා වැටෙන ජලබින්දුවක් සෙයින් පහ ව ගියේ ය. 'විදි සැරය වැදී ගියේ මෙතන දෝ හෝ? මෙතන දෝ හො?' යි කියා සොයා දක්නටත් නො හැකි වී ය. මෙසේ මහාබොධිසත්වයන් වහන්සේගේ නීරොගබව ද, අන්ධ වූ දෙමවුපියන්ගේ ඇස් ලැබීම ද, රාත්‍රිය ගෙවී අරුණු නැගීම ද, ඔවුන් සතරදෙනාගේ පර්ණශාලාප්‍රවෙශය ද දෙවානුභාවයෙන් එකවිට ම විය. ඒ ආශ්චර්යයට පැමිණි දෙමවුපියෝ ප්‍රීතියෙන් පිණා අවුත් මහා බොධිසත්වයන් වැලඳ ගෙණ හඬමින් සතුටුකඳුළෙන් දෙනුවන් පුරා ගත්හ. පිළියක්ඛරජ්ජුරුවෝ ද ප්‍රීතිවෙගයෙන් කුල්මත් වෙමින් දෙහොත් මුදුනේ තබා ගෙණ 'ස්වාමීනි, මාගේ සාමකුමාරයෙනි, මම නුඹ වහන්සේගේ සරණ යෙමි. නුඹ වහන්සේ මට නරක මාර්ගය වළක්වා ස්වර්ගමාර්ගයට හරවා පිළිසරණ වී වදාළ මැනැවැ' යි කියා වැඳ වැතිර ගියාහ. එකල ඒ බුද්ධාංකුරයානෝ 'මහරජානෙනි, ඉදින් තෙපි දෙව්ලොවට නුමුළා ව යනු කැමැතියවු නම්:—

**'ධම්මං චර මහාරජ – මාතාපිතූසු ඛත්තිය,**
**ඉධ ධම්මං චරිත්වාන - රාජා සග්ගං ගමිස්සසි.'**

යනාදීන් 'මහරජානෙනි, මාතෘපිතෘන් කෙරෙහි දෙමවුපිය පොෂක ධර්මයෙහි හැසුරුණ මැනැව. ක්ෂත්‍රියමහරජානෙනි, මේ මනුෂ්‍යලොක යෙහි ධර්මයෙහි හැසිරෙමින්, මහරජානෙනි, නුඹ වහන්සේ ස්වර්ග ලොකයට නුමුළා ව යනසේකැ' යි කියා ගාථාදසයකින් දශරාජධර්මයෙන් ධර්මදෙශනා කළසේක. එහි පිළියක්ඛරජහු ධර්මදෙශනාව ශිරොමස්තක යෙන් පිළිගෙණ බරණැසට ගොස් දශරාජධර්මයෙන් රාජ්‍ය කෙරෙමින් (සිට මරණින් මත්තෙහි) දෙව්ලොව උපන්නාහු ය. බෝසතුන් වහන්සේ ධ්‍යාන උපදවා දෙමවුපියන් හා සමග ම බඹලොව උපන්හ' යි වදාළසේක. ''අහෝ! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉතා ආශ්චර්ය ම ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉතා අද්භූත වන්නේ ය. අත්‍යර්ථයෙන් ම මෛත්‍රී භාවනාතොම සියලු ම පව් වළකන්නේ ය'' යි කියා ස්තුති කළහ. මහරජා නෙනි, මෛත්‍රීභාවනාතොම හිතයන්ට ද, යම් ඒ සත්වකෙනෙක් විඥාන ප්‍රතිබද්ධ වූ ද, ඒ සියල්ලන්ට ම සියලු කුශලගුණය එළවන්නී ය.[1] මෛත්‍රී භාවනාතොම සියල්ලන්ට ම මහානිසංසය විභජනය කරන්නී ය''[2] යි වදාළසේක.

මෙත්තානිසංසප්‍රශ්නය නිමි.

---

# කුශලාකුශලකාරීවිශෙෂ ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කුශලකාරීහුගෙන් අකුශලකාරීහු ගෙන් විපාකය සමසම වේ ද? නොහොත් කිසි විශෙෂයකුත් ඇද් දැ?'' යි කියා විචාළෝ ය. ''මහරජානෙනි, කුශලයාගේ ද අකුශලයාගේ ද විශෙෂ යෙක් ඇත. මහරජානෙනි, කුශලය සැප විපාක ඇත්තේ ය. ස්වර්ග

1. එලවන්නේ ය. 2. කරන්නේ ය.

Non-Commercial Distribution

සංවත්තනික වන්නේ ය. අකුශලය දුක්ඛවිපාකය ඇත්තේ ය. නරකයට පමුණුවන්නේ ය'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, '**දෙවදත්තයන්** වහන්සෙ එකාන්තපාපීසේක. එකාන්තපාපධර්මයෙන් සමන්නාගත වූසේක. බොධිසත්වයන් වහන්සේ එකාන්ත කුශලීසේක. එකාන්ත කුශලධර්මයෙන් සමන්නාගත වූසේකැ' යි කියා නුඹ වහන්සේ කියනසේක. නැවත ද, **දෙවදත්තයන්** වහන්සේ ජාතිජාතියෙහි බොධිසත්වයන් වහන්සේ හා යශසින් ද, පක්ෂබලයෙන් ද, සම වන්නෝ ය. කිසිකලෙක අධිකතර ද වන්නෝ ය. **(234)** යම් කලෙක දෙවදත්තයෝ **බරණැස්නුවර බ්‍රහ්මදත්ත** රජ්ජුරුවන්ගේ පුරොහිතයාගේ පුත්‍ර වූවෝ ද, එකල බොධිසත්වයෝ **ජවක** නම් චණ්ඩාල වූසේක. අකාල ආම්‍රඵල ගන්වන්නා වූ විද්‍යාධරයෙක් මන්ත්‍රය දූප කොට අකාලයෙහි ආම්‍රඵල උපදවා ලූසේක. මේ **අම්බජාතකයෙහි** බොධිසත්වයන් වහන්සේ දෙවදත්තයන්ට වඩා ජාතියෙන් හීන වූසේක. යසසින් ද හීන වූසේක. තවත් නැවත ද, යම් කලෙක දෙවදත්තයෝ **මගධරට** සර්වකාමසමංගී වූ **මහාමහීපති** නම් මගධරජ වූ ද, එකල මහබෝසතාණෝ ඒ රජහුගේ පාරිභොගික වූ සර්වලක්ෂණ සම්පන්න වූ ඇලිඇත්රාජන් වූසේක. ඒ හස්තිරාජයාගේ මනොඥ වූ හස්තිගතිවිලාසශ්‍රීය දැක ඉවසිය නො හැකි වූ රජ්ජුරුවන් වධ කොට මරවනු කැමැති ව හස්ත්‍යාචාරීයාහට 'ආචාර්යයෙනි, තොපගේ හස්තිරාජයා අශික්ෂිත වූයේ ය' යි මෙසේ කියා, 'ඒ හස්තිරාජයාගේ ශික්ෂිතත්වය බලමි' යි සිතා පිරිවර සහිත වූ **වෙපුල්ල** නම් පර්වතය මුදුනට නැඟී, 'ආචාර්යයෙනි, මේ හස්තියාගේ එක් පයක් නභා හිඳින සේ කරව, දෙපයක් නභා හිඳින සේ කරව, තුන් පයක් නභා ගෙණ හිඳින සේ කරව, සතරපය ම නභා ආකාශයෙහි ගමනාකාරය කරව' යි කී කල්හි හස්ත්‍යාචාරියාගේ වචනයෙන් සතරපය ම නභා ගෙණ පුණ්‍යසෘද්ධියෙන් අහසට පැන නැඟී **බරණැස් නුවරට** ගියේ ය. ඒ **දූම්මෙධජාතකයෙහි** ද දෙවදත්තයන්ට වඩා බොධිසත්වයන් වහන්සේ ජාතියෙන් හීන වූ සේක. ලාමක වූ සේක, තිරශ්චීනගත වූසේක.

''තවද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ බරණැස ගොවියෙක් ව ඉපද කෘෂිකර්මාන්තයෙන් ජීවත් වෙමින් ගොන් සොයා වනයෙහි ඇවිදිමින් මං මුළා ව සද්දවසක් නිරාහාරයෙන් තින්දුක රුකකට නැඟී ඵල කමින් එයින් සැටරියන් උස නරාවළෙක වැටී ඒ මිනිසුන් නැති මහවනයෙහි නැසීමට පැමිණියෝ ද,[1] එකල බොධිසත්වයන් වහන්සේ මහාපෘථිවිය සේ මහාගුණ ඇති බැවින් **'මහාපයවි'** නම් වඳුරෙක් ව වනයෙහි ගොදුරු සොයා ඇවිදින්නේ නරාවළ හුන් පුරුෂයා දැක කරුණා උපදවා මිනිස් බඳක් ප්‍රමාණ වූ ගලක් බඩ බැඳ ගෙණ වළට පැනපියා, කිරුම් බර බලා, වළට පැන, දුකට පත් පුරුෂයා ඔසවා ගෙණවුත් ගොඩට දමා ඉතා වෙහෙස වූ හෙයින් ක්ලාන්ත ව ඔහුගේ කලවයෙහි හිස තබා මඳක් සැතපී ගත්සේක. එකල අකෘතඥපුරුෂයා වඳුරා මරා මස් කනු කැමැති ව

1. පැමිණියේ ය.

*Non-Commercial Distribution*

ලඟ තුබූ මහගල්කැටක් ගෙණ කණඇටයෙහි ගැසූ කල්හි වහා පුබුදු වීම හා සමග ම කම්මුල් මස් උපුටා ගියෙන් වෘක්ෂාග්‍රයට පැන නැඟී, 'අකෘතඥ පුරුෂය, තට මම පරාංමුඛ වීම් නම්, තෝ මේ වනාන්තරයෙහි නස්නේ ය. මා කළ වීර්යපාරමිතායෙහිත් කම් නැත. තෝ මා යන දිග බලා බිමින් එව' යි කියා මිනිස්පථයට ගෙණ හැරියෝ ය. ඒ **මහාකපිජාතකයෙහිත්** මනුෂ්‍යාත්මයාගේත් තිරශ්චීනාත්මයාගේත් විශෙෂය දක්නා ලැබෙයි. එහිත් බොධිසත්වයන් වහන්සේ දෙවදත්තයන්ට වඩා ජාතියෙන් හීන වූ සේක.

''නවද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ මහත් බල ඇති බලවත්තර වූ ඇත්බල ඇත්තා වූ **'සොණුත්තර'** නම් වැද්දෙක් ව මනුෂ්‍ය වූහ. එකල බොධිසත්වයෝ **හිමාලයෙහි** අටදහසක් පමණ ආකාශ චාරී වූ හස්තීන්ට නායක වූ මුඛපාද රත් වූ සර්වාංගය සුදු වූ අසූඅටරියන් උස ඇති එසියවිසිරියන් දිග ඇත්තා වූ රිදීදමක් වැනි පණස්අටරියන් සොඬ ඇත්තා වූ පසළොස්රියන් වට හා තිස් **(235)** රියන් දිග ඇති දන්ත යුගලින් ෂඩ්වර්ණ වූ රශ්මි විහිදෙන්නා වූ **ඡද්දන්ත** නම් හස්තිරාජන් ව ඉපද, අටදහසක් හස්තීන් පිරිවරා ගෙණ, **ඡද්දන්ත** නම් විල ක්‍රීඩා කොට, හැසිරෙමින් පසේබුදුන් නිති පුද වාසය කරණසේක් ද[1], එකල බරණැස් රජ්ජුරුවන්ගේ **සුභද්‍ද** නම් අග්‍රමහෙසිකාවගේ වචනයෙන් ඒ සොණුත්තර නම් වැදිපුත්‍රතෙම හිමාලයට ගොස් පොළෝ යට වළක් කපා හිඳ, විෂ පෙවූ හියකින් ඒ හස්තිරාජයා විද මරා, දත් කපා ගෙණ ආයේ ය. ඒ **ඡද්දන්තජාතකයෙහි** ද දෙවදත්තයෝ ම අධිකතර වූවාහු ය.

''නැවත ද, යම් කලෙක දෙවදත්තයෝ **කලිඟු** රට වෙළඳුන්ගේ බඩු ඇද ජීවත් වන්නා වූ තමහට නිල වූ ගෙයක් නැති බැවින් අනිකෙත වාසී වූ 'වනචාරණ' නම් මනුෂ්‍යයෙක් වූවාහු ද, එකල බොධිසත්වයෝ පක්ෂි ව ඉපද වෙදත්‍රය ඉගෙණ මන්ත්‍ර හදරන්නා වූ 'තිත්තිර' නම් පණ්ඩිත වූසේක. මුළු මහත් දඹදිව වාසීන්ට වෙදත්‍රය උගන්වමින් වනාන්තර ප්‍රදෙශයක වාසය කරණසේක. එකල ඒ වනචාරණ නම් පුරුෂතෙම ජීවත් වන උපායක් සිතා තපස් වෙශයකින් ඒ වනයට පැමිණ ඒ තිත්තිර පණ්ඩිතයන් මරා කෑයේ ය. ඒ **තිත්තිරජාතකයෙහි** ද, දෙවදත්තයෝ ම ජාතියෙන් අධිකතර වූවාහු ය.

''නැවත ද, යම් කලෙක දෙවදත්තයෝ බරණැස **කලාබු** නම් කසී රජ වූ ද, එසමයෙහි බොධිසත්වයෝ අසූකොටියක් ධනය ඇති බ්‍රාහ්මණ කුලයක ඉපිද, සියලු සැපත් හැර ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව වනාන්තර යෙහි වාසය කොට ලුණුඇඹුල් සොයනා පිණිස **බරණැස්** නුවරට අවුත් සෙනාපතින් උපාසක කොට ගෙණ රාජොද්‍යානයෙහි වාසය කරණ සේක. එකල ඒ **කලාබුරජ** උද්‍යාන ක්‍රීඩාවට ගොස් බෝසතුන් දැක

1. සේක.

*Non-Commercial Distribution*

**'ක්ෂාන්තිවාදිහ'** යි අසා කිපී 'ක්ෂාන්තිය බලමි' යි වධකරුවා ගෙන්වා කටුසැමිටියෙන් තපස්වීන් වහන්සේගේ ශරීරය සතර පැත්තට පාර දෙදහසක් ගස්වාලී ය. එකල බොධිසත්වයන් වහන්සේගේ ශරීරයෙහි ඡවි සම මස් සිඳී ගොස් ලේ වැගිරෙන්නට පටන් ගත. එකල්හි ද ක්ෂාන්තිවාදීසේක් ම ය. නැවතත් අත්දෙක සිඳුවා ලී ය. එවිටත් ක්ෂාන්තිවාදීසේක් ම ය. තවත් පාදෙක සිඳුවා ලී ය. මෙසේ හස්ත පාදයන් උණ ගොබ සෙයින් සිඳුවා ලී ය. එවිටත් ක්ෂාන්තිවාදීසේක් ම ය. කැපූ සතරසන්ධියෙන් සටච්ඡිද්‍රාවලින් වැහෙන සාදිලිංගම්කල්ක සෙයින් ලේ වාහින්ට වන. 'නැවතත් දෙකන් නාසා සිඳුවා ලවමි. කූටජටිල තපස්විය, තෝ කුමන වාදී ද?' යි විචාරා 'මහරජානෙනි, මම ක්ෂාන්ති වාදීමි' යි කියා වදළ කල 'කූටජටිලය, තාගේ ක්ෂාන්තිය තෝ ම තබා ගණුව' යි කියා විලිඹින් බොධිසත්වයන්ගේ ලයට ඇන පලා ගියේ ය. එකල උපස්ථායක වූ සෙනාපතිහු එපවත් අසා වහා දිව අවුත් වැඳ වැතිර මහාශොකයෙන් පොළෝ පස් කකා පෙරළී හඬමින් 'අනේ ස්වාමීනි, නුඹවහන්සේට වධ කෙළේ රජහු මුත් සෙස්සෝ නො වෙති. රටවාසීන්ට නො කිපෙන්නැ' යි කී කල්හි:—

**"යො මෙ හත්ථෙ ච පාදෙ ච – කණ්ණනාසඤ්ච ඡෙදයී,**
**චිරං ජීවතු සො රාජා – න හි කුජ්ඣන්ති මාදිසා."**

යනාදීන් 'එම්බා සෙනාපතිය, යම් රජෙක් මාගේ හස්තපාදයන් හා කන්නාසා ඡෙදනය කරවාලි ද, ඒ රජතෙම බොහෝ කලක් ජීවත් වේවා. මා වැනි ක්ෂාන්තිමෛත්‍රීයෙන් යුක්ත වූ පණ්ඩිතවරු නො කිපෙන්නාහ'යි **(236)** කියා වදරමින් පිරිනිවි[1] සේක. ඒ **ක්ෂාන්තිවාදිජාතකයෙහි** ද බොධිසත්වයන්ට වඩා දෙවදත්තයෝ ම ජාතියෙන් හා යසසින් අධිකතර වූවාහු ය.

"නැවත ද, යම් කලෙක **දෙවදත්තයෝ** වනයෙහි සතුන් මරා ජීවත් වන වනචාරී මනුෂ්‍යයෙක් වූහ.[2] එකල බොධිසත්වයන් වහන්සේ **හිමාලයෙහි** අසූදහසක් පමණ වඳුරන්ට නායක වූ **නන්දිය** නම් වානරෙන්ද්‍ර වූසේක. එතෙක් වඳුරුසෙනඟ හැර තමන්ගේ අන්ධ වූ මෑනියන් රක්නා පිණිස මහවනින් නික් ම අවුත් තමන්ගේ මලනුවන් හා සමග ප්‍රත්‍යන්ත ගම් අසලෙක්හි වූ නුගේක හිඳ අන්ධ වූ මෑනියන් රක්ෂා කරණසේක. එකල්හි ද, ඒ වනචාරී වැදිතෙම දුනු හී ගෙණ වනයෙහි ඇවිද කිසිවක් නො ලැබ සිස් අතින් ගෙට එනුයේ අතර මග මහනුගරුක උඩ බලා අන්ධ වූ වැඳිරිය දැක, දුන්න නභා උර පුරා ඇද මාත් බලයි. එපවත් දුටු **නන්දිය** නම් බෝසතානන් අතුපතරින් පැන එමින් 'මලණ්ඩ, **චුල්ලනන්දිය,** මම මෑනියන්ට දිවි පුදමි. මා මෑනියන් තෙපි රකුව' යි කියා දිව අවුත් මෑනියන් පසු කොට ලා හිඳ 'පින්වත්වූ මාගේ වැද්දනුවෙනි.

1. 'පිරිනිවි' යන්න මෙහි යෙදීම වැරදි ය. පිරිනිවෙන්නෝ ක්ෂීණාශ්‍රවයෙකි. බොධිසත්වසම්බන්ධ වූ මේ තාපසයන් වහන්සේ එසේ නුවූහ. 2. වී ය.

Non-Commercial Distribution

අන්ධ වූ ජරා දුර්වල වූ මාගේ මෑනියන් නො විදුව. මෑනියන් නියාවට මා දිවි පුදමි' යි කියකියා සිටි ඒ වානරෙන්ද්‍රයන් හා එසේ ම කියා සිටි බාලමලනුවන් හා මහලු මෑනියන් විද මරා ගෙණ ගියේ ය. ඒ **චුල්ලනන්දිය ජාතකයෙහි** ද බොධිසත්වයන්ට වඩා දෙවදත්තයෝ ම ජාතියෙන් අධික තර වූවාහු ය.

''තවද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ **කාරම්භිය** නම් අචෙලක වෙශධාරී වූ මනුෂ්‍යයෙක් වූ ද, එකල බොධිසත්වයෝ **පණ්ඩරක** නම් නාගරාජ වූසේක. ඒ **පණ්ඩරජාතකයෙහිත්** දෙවදත්තයෝ ජාතියෙන් අධිකතර වූවාහු ය.

''තවද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ වනයෙහි වසන කූටජටිල තපස්වී වූ මනුෂ්‍යයෙක් වූ ද, එකල බොධිසත්වයෝ **තච්ඡක** නම් මහහූරෙක් වූසේක. එහිත් දෙවදත්තයෝ ම ජාතියෙන් අධිකතර වූවාහු ය.

''තවද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ ප්‍රථමකල්පික මහා බ්‍රහ්මයන්ගේ සම්මතයෙන් සම්මත වූ **මහාසම්මත** රජහු පටන් පැවත ආ **චර** නම් අසංඛ්‍යායු රජහට පුත්‍ර ව **උපචර** නම් වූ ද, ඒ තෙම ක්‍රමයෙන් වැඩී **චෙතිය** රට **සූරපරිචර** නම් **චෙතිය** රජ විය. ඕහට දෙවතාවෝ සතර දෙනෙක් ඛඩ්ග ධරා සතරදිග මුර කෙරෙති. ඔහුගේ ශරීරයෙන් සඳුන් සුවඳ පැතිරෙයි. මුඛයෙන් දිව්‍යමහනෙල් මල්සුවඳ නික්මෙයි. පුරුෂ ප්‍රමාණ අහස්තලය මත්තෙහි යන අහස් ගමන් ඇත්තේ ය. මේ චතුර්විධ ඍද්ධියෙන් හා අනන්තඓශ්වර්යයෙන් යුක්ත ව රජ කෙරෙයි. එසමයෙහි මහාබොධිසත්වයන් වහන්සේ **කපිල** නම් පුරොහිත බ්‍රාහ්මණ වූයේ රජහුගේ අවිශ්වාසය දැක මහණ වනු කැමැති ව තමාගේ පුත්‍රයාහට පුරොහිත තනතුර දෙන සේ නිල කොට **චෙතියරජහට** අනුදන්වා සමු ගෙණ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව ධ්‍යානසමාපත්ති උපදවා ගෙණ තමාගේ පුත්‍රයාගේ ආරාධනාවෙන් එම නුවර රාජෝද්‍යානයෙහි වසනසේක. එකල **චෙතියරජ** තමා හා සමග එක තීර්ථායතනයෙහි ශාස්ත්‍ර උගත් **කොරකලම්බක** නම් බ්‍රාහ්මණයා කැඳවා 'කොරකලම්බකයෙනි, තාගේ භ්‍රාතෘහු පැවිදි වූයෙන් තෙපි පුරොහිතතනතුර කරව' යි කීහ. 'ස්වාමීනි, අපගේ පරම්පරාවෙන් පැවැත ආ ධානාන්තරය මාගේ භාතෘන් වහන්සේ විසින් පුත්‍රයාට දෙන ලද්දේ ය' යි කීහ. 'එසේ වී නම්, මම තොප වැඩිමහලු කොට කපිලයන් **(237)** බාල කෙරෙමි' යි කීහ. 'ස්වාමීනි, ඒ කෙසේ ද ?' යි විචාළේ ය. 'සද්දවසක් මුළුල්ලෙහි මහපිරිස් රැස් කරවා ඒ පිරිස් මධ්‍යයෙහි අහස හිඳ 'කපිලයෝ බාලයහ. **කොරකලම්බකයෝ** වැඩිමහල්ලහ' යි බොරුවක් කොට තොපට තනතුරු දෙමි' යි කීහ. එපවත් මුළු නුවර ඇළලී ගොස් 'කොල, රජ්ජුරුවන් වහන්සේ මුසාවාදයක් කොට වැඩිමහල්ලහු බාල කෙරෙමින් බාලහු වැඩිමහලු කොට පුරොහිතතනතුර දෙනසේක් ලු. 'මුසාවාදය' නම් කෙබඳු දෙයක් දෝ ?

Non-Commercial Distribution

නීලවර්ණයෙක් දෝ හෝ? නොහොත් ශ්වෙතවර්ණ පීතවර්ණාදියක් දෝ හෝ' යි කියා විතර්ක උපදවා මුසාවාදයක් එකල ලොකයෙහි නැති බැවින් බලනු පිණිස සද්දවසක් මුළුල්ලෙහි රැස් වෙමින් රාජාංගණයෙහි මැසි පිට මැසි බැඳ ගෙණ සිට ගත්හ.

''එකල චෙතියරජ චක්‍රවර්තිවිලාසයෙන් සැරසී මුසාවාදය පහළ කිරීමට ආකාශයෙහි දිව්‍යරාජයකු සේ පලක් බැඳ සිට ගත්තේ ය. එකල පුරොහිතපුත්‍රයාගේ වචනයෙන් **කපිලතපස්වීන්** වහන්සේත් අහසින් අවුත් රජහුගේ අභිමුඛයෙහි අහස පලක් බැඳ වැඩ හිඳ, 'මහරජ, මුසාවාදය නම් සියලු ම ගුණ නසන්නා වූ සතර අපායෙහි උපදවන්නා වූ බලවත් වූ පාපයෙක. මුසාවාදය පහළ කොට බොරු කියා ජෙට්ඨාපචායනධර්මය නසා තෙමේත් නැසෙන්නේ ය . දෙවතාවෝ කඩු දමා පලා යෙති, ශරීරය හා මුඛය කුණුගඳ වැහෙයි, අහස නො ඉඳ බිම වැටෙයි, එයින් දැන දැන මුසාවාදය නො කියව' යි යනාදීන් අවවාද කරණ කල්හි **කොරකළම්බකයා** මුහුණ බලා ඡන්දගතියට ගොස් අභිප්‍රාය ම සාධන පිණිස 'ත්වමසි භන්තෙ ජෙට්ඨයො කොරකළම්බකො' යි කියා බොරු කීයේ ය. ඒ ක්ෂණයෙහි ම දෙවතාවෝ කඩු පාමුල දමා අන්තර්ධාන වූහ, කුණු වූ කුක්කුටබීජයක් මෙන් මුඛය කුණුගඳ විය. විවෘත කළ නානගෙයක් මෙන් ශරීරය දුර්ගන්ධ වැහින. ආකාසයෙන් ඉපිළ බිම වැටුනේ ය, එවිට **කපිලතපස්වීන්** වහන්සේ 'මහරජ, දැන් මේ දැන දැන මුසාවාදය හැර සත්‍යයෙහි පිහිටියේ නම් නටුවා වූ ඍද්ධියත් ප්‍රකෘති කෙරෙමි. විචාරණ ලද අර්ථය යම් රජෙක් නො කියා දැන දැන මුසාවාද කොට කීයේ වී නම්, රජහුගේ විජිතයෙහි කලට වැසි නො වස්නේ ය. අකාලයෙහි වර්ෂා කරන්නේ ය. ජාතිජාතියෙහිත් ඔහුගේ දිව නාගයාගේ මෙන් ද්විවිධ වන්නේ ය. උපනුපන් තැන මත්ස්‍යයාගේ මෙන් දිව ලුහුඬු ව ගොළු වන්නේ ය. ජන්මජන්මයෙහි ඕහට දූන් මුත් පුත්තු නො ලැබෙති.[1] පුත්‍රයන් ලද හොත් අනුපකාරී ව නො කීකරු ව පලායෙති' යනාදීන් ධර්ම දෙශනා කරණ කල්හි එපවත් නො ගෙණ 'වහන්ස, තුඹ වහන්සේ බාල වූසේක. කොරකළම්බකයෝ වැඩිසිටියහ' යි මුසාවාද කියත් ම ගොප්මස දක්වා පොළෝ ගිලින. දෙදණ දක්වා ගිලින, කටිය දක්වා ගිලින, නාභිය දක්වා ගිලින, තන මත්ත දක්වා ගිලින. එකල පෘථිවිය විවර ව අවීචියෙන් ගිනි දැලෙක් අවුත් වෙළා අවීචියට ගෙණ ගියේ ය. ඒ **චෙතියජාතකයෙහි** ද දෙව්දත් ජාතියෙන් හා යසසින් අධිකතර වූයේ ය.

''තවද, නැවැතත් යම් කලෙක දෙවදත්තයෝ **'සාම'** නම් මනුෂ්‍යයෙක් වූ ද, එකල මහබෝසතාණෝ **'රුරු'** නම් මෘගරාජයෙක් වූහ. එහි ද දෙවදත්තයෝ ජාතියෙන් අධිකතර වූහ. නැවතත් යම් කලෙක දෙවදත්තයෝ වනයෙහි හැසිරෙන්නා වූ වැද්දෙක් වූ ද, එකල

1. පුතුන් නො ලැබෙයි,

Non-Commercial Distribution

මහබෝසතාණෝ **(238)** හිමාලයෙහි හස්තියොනියෙක ඉපිද රිදීපර්වතයක් වැනි ශරීරයක් ඇත්තා වූ රක්තකම්බිලියක් හා සාදෘශ්‍ය වූ මුහුණක් ඇත්තා වූ ඉන්ද්‍රනීලමාණික්‍ය රත්නගුළ ප්‍රතිභාග වූ නෙත්‍රද්වයක් ඇත්තා වූ ස්වර්ණ බුබුල් එබූ රජතදමයක් හා සාදෘශ්‍ය වූ සොඬක් ඇත්තා වූ ලාක්ෂාරසවර්ණ නඛ පංක්තියක් ඇත්තා වූ සමත්‍රිංශත්පාරමිතා නමැති චිත්‍රකාරයන් විසින් නිර්මිත කරණ ලද්ද වූ ගුණශීලමහිමයෙන් **ශීලව** නම් හස්තිරාජ ව අසූදහසක් හස්තීන් පිරිවරා වාසය කෙරෙමින් ගණ[1]සංගණිකා දෙෂයෙන් දුරු ව එකචාරී ව වාසය කරණසේක. එකල ඒ වැදිපුත්‍රයා තමා ජීවත් වන දෙයක් සොයා වනයෙහි ඇවිද මංමුළා වෙමින් මහහඬින් හඬා ඇවිදුත් ඒ හස්තිරාජයාගේ සහායත්වයෙන් මිනිස්පථයට පැමිණ හස්තිදන්ත විකුණන්නවුන් දැක 'ජීවදන්ත ගෙණෙමි' යි කියා මාර්ගොපකරණ හා වැ කියත් ගෙණ පෙර පුරුදු මාර්ගයෙන් **හිමාලයට** ගොස් 'ස්වාමීනි, මම ජීවත්විය නො හැකි දුගී දුප්පත් හෙයින් නුඹ වහන්සේගෙන් දන්ත කඩක් ලබා ගෙණ ගොස් විකුට කාපියන්ට ආමි' යි කියා හස්තිරාජයාහට දැන්නු කල්හි 'අහෝ! මේ නියා මහවනයෙහි මා සොයා මාගේ දනපාරමිතව පූරණය කරවාලීමට ආවා වූ කල්‍යාණ මිත්‍රයෙකැ' යි සිතා 'දරුව, මෙයින් දළකඩක් කියතකින් කපා ගණුව' යි කියා පෘථිවියෙහි ගවසෙය්‍යාවෙන් වැද හොත්සේක.

''එකල වැද්දනුවෝ තමහට ගෙණ යන බරට කියතින් දෙදන්තයන් අගින් සිඳ හෙළූ ය. මහාබොධිසත්වයන් වහන්සේ දන්තකඩයන් සොඬින් ගෙණ බලා, 'මාගේ දිවි රකින්නා වූ මේ දන්ත යුගල මට ප්‍රිය නැත්තෙන් අනුන්ගේ දිවි රක්නට දෙන්නේ නො වෙමි. මීට වඩා මට ශතසහස්‍රගුණයෙන් සර්වඥතාඥනය ප්‍රිය වන්නේ ය. මේ දන්තදන-පාරමිතාවෙන් මට මතු ලොවුතුරා සර්වඥතාඥනය මස්තකප්‍රාප්ත වේව' යි කියා බුදුබව පතා දත්යුවල වැද්දහු අත තැබූසේක. ඔහුත් දත් ගෙණ ගොස් විකුට කා මේ නියායෙන් සවරක් ගෙණ ගොස් සත්වැනි වර මහපෘථිවි යෙහි වැද හොත්තා වූ මහාබොධිසත්වයන්ගේ රජතදමයක් හා සදෘශ වූ සොඬ පයින් මැඩගෙන **කෛලාසකූට**පර්වතය වැනි කුම්භස්ථලයට නැගී නිෂ්කාරුණික යමයෙකුසේ විලිඹින් දත්මුල් පැහැර මස් නෙරවා හැර සිනිඳු මොළොක් වූ කුඹය පිට හිඳ, ක්‍රූරතර රළු කියතින් ලේ හා මස් කලව්වූ කෙරෙමින් දත් මුල් කපා ගෙණ ගියේ ය. ඒ තාක් මරණාසන්න වූ බලවත් වෙදනායෙහි මහාබොධිසත්වයන් වහන්සේ 'මාගේ දන පාරමිතාවෙන් ලොවුතුරා බුදු ව අනවරාග්‍රසංසාරය ලුහුඩු කොට තුන්ලෝ වාසීන් අමාමහනිවන් දක්වමි' යි කියා බුදු බව පැතූසේක. ඒ **සීලවනාග-රාජජාතකයෙහි** ද, දෙවදත්තයෝ ම මනුෂ්‍යයොනි වසයෙන් අධිකතර වූවාහු ය.

1. ජන

Non-Commercial Distribution

''තව ද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ 'ක්ෂත්‍රියධර්මය' යි කියන ලද රජ වන්නා වූ මන්ත්‍රයක් උගත්තා වූ ශෘගාලයෙක් වූ ද, ඒ ශෘගාලතෙම යම් තාක් සියලු ජම්බුද්වීපයෙහි ප්‍රදෙශරජ කෙනෙක් ඇද් ද, ඒ සියලු ම රජදරුවන් තමහට යටත් ව පවත්නා සේ අනුයුත්තක කෙළේ ය. එසේ කොට **''පෘථිවිවිජය''** මන්ත්‍රය මතුට අනෙක ශෘගාල හස්ත්‍යශ්ව සිංහ ව්‍යාඝ්‍ර දිවි වලස් හුරු මෘගාදීන් පිරිවරා හස්තීන් දෙදෙනෙකුන් පිට සිංහයෙක් නහා ඒ සිංහයා පිට **''සබ්බදඨී''** නම් ශෘගාල රජතෙමේ නැඟී මහත් වූ ඓශ්වර්යයෙයන් **(239)** මත් ව, **බරණැස්**නුවර රාජ්‍යය ගන්නා පිණිස ගොස් දෙළොස්යොදුනක් තන්හි හාත්පසින් නුවර වටා සිට, 'රාජ්‍යය හෝ දෙව. යුද්ධ හෝ කරව' යි කියා **බරණැස්**නුවර වාසීන් භ්‍රාන්ත කොට සිට ගත්තේ ය. එකල අපමහාබොධිසත්වයන් වහන්සේ බරණැස්රජහට පුරොහිත වූ **විධුර** නම් බ්‍රාහ්මණපණ්ඩිත ව සර්වශාස්ත්‍රයෙහි පරතෙරට පැමිණ ඒ **පෘථිවිවිජය** මන්ත්‍රය රහස් තැනෙක හිඳ පාඩම් කියන ශබ්දය අසා ඒ ශෘගාලයා උගත්බව දන්නාසේක් 'මහ රජානෙනි, මම තෙල සබ්බදඨී නම් ශෘගාලරජ හා සමග යුද්ධ කෙරෙමි'යි කියා **බරණැස්රජු** අස්වසා බළලුන් පටන් මිනිසුන් දක්වා සියල්ලවුන්ගේ උභයකර්ණච්ඡිද්‍රයෙහි උඳුපිටි ගන්වා නුවර ඇතුළ මහඅටල්ලක නැඟී සිට 'එම්බල, **සබ්බදඨීය,** තෝ කුමක් කොට යුද්ධ කෙරේ ද?' යි විචාළසේක. 'බ්‍රාහ්මණය, මම සිංහනාදය කරවා මනුෂ්‍යයන් ජීවිතක්ෂය කරවා රාජ්‍යය ගණිමි' යි කීහ. 'අහෝ ජරශෘගාලය, තෝත් කෙසරසිංහරාජයන් ලවා සිංහනාද කරවා පියන්ට සමර්ථයෙහි ද?' යි කීසේක. එකල **සබ්බදඨීයා** මහත් වූ මානයෙන් කිපී සිංහනාදය කරණ සේ තමා යට හුන් සිංහරාජයා හට සංඥ කෙළේ ය. එකල ඒ කෙසරසිංහරාජතෙම හස්තිකුම්භස්ථලය මිරිකා පාත් කොට වැර දී තුන් වරක් අභීතකෙසරසිංහනාදය කෙළේ ය. එකල සිවල්රජ බිම වැටී අත්පයින් සුණු විසුණු විය. දෙළොස්යොදුන් තන්හි තැර දී සිටි චතුෂ්පදිකමහසෙනහ සෙණහඬ දහස්වරින් වර කම්මුල් පැහැර ගිය කලක් මෙන් උඩ බිම නො දන භයින් තැති ගෙණ ඇද පෙරළෙමින් හිසින් හිස, දතින් ඇඟ පයින් වෙර, ඔවුනොවුන් පැහැර ගෙණ එතැන්හි ම මළෝ ය. ලක්ෂගණන් සිංහරාජයෝ මහවනයට පලාගියාහ. නුවර වටා දෙළොස්යොදුනක් තන්හි එක ම මස්ගොඩක් වී ය. ඒ **සබ්බදඨීජාතකයෙහි** ද දෙවදත්තයෝ ම බොධිසත්වයන්ට වඩා ඓශ්වර්ය යස පිරිවරින් අධිකතර වූවාහු ය.

''තවද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ හස්තිරාජ ව ඉපිද, කැටකිරිල්ලී නම් පක්ෂිධෙනුවගේ දරුවන් මැරුවාහු ද, එසමයෙහි බොධිසත්වයන් වහන්සේ අසූදහසක් හස්තීන්ට ප්‍රධාන වූ හස්තිරාජ වූසේක. **ඒ ලටුකිකජාතකයෙහි** ඒ දෙදෙන ම සම සම වූහ. තවද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ කාමාවචරදිව්‍යලොකයෙහි **අධර්ම** නම් දෙවතාවෙක් වූ ද, එකල බොධිසත්වයන් වහන්සේත් **ධර්ම** නම් දිව්‍යරාජ වූසේක. **ඒ ධර්මජාතකයෙහි** ද දෙදෙන ම සම සම වූහ. තවද, නැවතත් යම්

කලෙක දෙව්දත්හු පන්සියයක් කුලයට අධිපති වූ නාවික වූ ද, එකල බොධිසත්වයන් වහන්සේ පන්සියයක් කුලයට අධිපති ව නැව්කාර වූසේක. එහිත් දෙදෙන ම සම සම වූහ. තවද, නැවතත් යම් කලෙක දෙව්දත්හු පන්සියයක් ගැල්වලට ප්‍රධාන වූ සාර්ථවාහකයෙක් වූ ද, එකල බොධි-සත්වයෝත් පන්සියයක් ගැල්වලට ප්‍රධාන ව සාර්ථවාහක වූසේක. **අපණ්ණකජාතකයෙහිත්** දෙදෙන ම සම සම වූහ. තවද, යම් කලෙක දෙවදත්තයෝ **සාඛ** නම් මෘගරාජ වූ ද, එකල බොධිසත්වයෝත් **නිග්‍රොධ** නම් මෘගරාජ වූහ. ඒ **නිග්‍රොධමෘගරාජජාතකයෙහි** ද දෙදෙන ම සම සම වූහ. තවද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ **සාඛ** සෙනාධිපතියෙක් වූ ද, එකල බොධිසත්වයෝ **නිග්‍රොධ** නම් රජ වූසේක. ඒ **නිග්‍රොධ** **(240) ජාතකයෙහි** ද දෙදෙන ම සම සම වූහ. තවද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ **එකරාජ** නම් **බරණැස්** රජහට අර්ථ ධර්ම අනුශාසක වූ **ඛණ්ඩහාල** නම් පුරොහිතබ්‍රාහ්මණයෙක් වූ ද, එකල බොධිසත්වයෝ ඒ රජහට පුත්‍ර වූ **චන්ද** නම් කුමාර වූහ. එසමයෙහි ඛණ්ඩහාලයා ම අධිකතර විය.

''තවද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ **බරණැස බ්‍රහ්මදත්ත** නම් රජ වූ ද, එකල බොධිසත්වයෝ ඒ රජහට පුත්‍ර වූ විකසිතපද්මාකාර සශ්‍රීක වූ මුහුණක් ඇති බැවින් **මහාපද්‍ම** නම් කුමාර ව ඓශ්වර්යයශශ්‍රීන් වැඩී යුවරාජ්‍යය කරණසේක. එකල බොධිසත්වයන්ගේ මාතෘදෙවීන් කාලක්‍රියා කළ හෙයින් අන්‍ය තරුණබිසවක් අග්‍රමහෙසිකා කොට වාසය කෙරෙමින් රජ්ජුරුවන් ප්‍රත්‍යන්තයුද්ධ මථනයකට ගිය කල්හි ඒ බිසව් මහාබොධිසත්වයන්ගේ ඓශ්වර්යවත් වූ රූපශොභාවෙහි බැඳී කර්තව්‍ය සෙවනයට අනෙකාකාරයෙන් උත්සාහ කෙරෙමින් මහාබොධි-සත්වයන් වහන්සේගේ හස්තග්‍රහණය කොට ආකඩ්ඪනය කළ කලැ, නැමී දැත් නගා වැඳ ගෙණ, 'මා මෑණියෙනි, මේ ජාතියෙහි මාගේ ඉඳුරන් බිඳ සස්වාමිකස්ත්‍රීරූපයක් නො බැලූ වීරිමි. මෙබන්දක් මා කණ නො හෙළන්න' යි කීසේක. 'එසේ වී නම් රජ්ජුරුවන් වහන්සේ ආ විට තා හිස සිඳුවා ලම්' යි කියා මහාක්‍රොධයෙන් නො කා නො බී සිට, ශත්‍රුමථනය කොට රජ්ජුරුවන් නුවරට අවුත් බිසව අතින් සැප දුක් විචාළ කල, **පද්‍ම** කුමාරයන් දුන් පහරින් වෙහෙස ව ගිලන් වූ බවක් මෙන් අහවා 'ස්වාමීනි, පද්‍මකුමාරයෝ මා හා සමග අකර්තව්‍යසෙවනයට අවුත් පැමිණි කල 'පුතණ්ඩ, **පද්‍මකුමාරයෙනි**, මම තොපගේ මෑනියෙමි. තොපගේ පිය රජ්ජුරුවන් සිහි කරව' යි කීමි. එවිට 'තෝ මාගේ කුමන මෑනිකෙනෙක් ද?' යි කියා, මාගේ හිසකේවරල ගෙණ ඔබිනොබ ඇද කඩා මට නො කී නො කළ වධයෙක් නම් නැතැ' යි කියා රජ්ජුරුවන් බිඳුවාලුව. එකල අපරීක්ෂාකාරී වූ ඒ රජ්ජුරුවන් ආශිවිෂයකු සේ කිපී වහා **පද්‍මකුමාරයන්** අල්වා නොයෙක් වධ කරවා දඩි කොට බැඳ, රත්මල් කර එල්වා, සතර වීදියෙහි වදබෙර ගස්වන කල්හි 'රජ්ජුරුවන්ගේ පාපී වූ බිසවගේ

වචනයෙන් නිරපරාධ වූ මහාපද්මකුමාරයන් අල්වා බැඳ වධ බෙර ගස්වන සේකැ' යි කියා ඒ සියලු නුවර ඇලළී ගොස් මහසෙනඟ දිව අවුත් ඇඟින් වැටෙන ලේ බලා ඇසින් වැහෙන[1] කඳුළු බලා 'අහෝ! මේ නියා වධයක් ගුණශීලමහිමයෙන් නිර්මිත වූ නුඹ වහන්සේටත් පැමිණියේ දෑ?'යි කියකියා දෙපතුල් මුල හඬා වැටෙමින් මහත් කොලාහල කෙළේ ය. ඒ ශබ්දය අසා රජ්ජුරුවෝ මහාපද්මකුමාරයන් ගෙන්වා මුහුණ දකුත් ම මහාක්‍රොධයෙන් කිපී, 'මොහු මාගේ අන්තඃපුරයට ගොස් බිසවුන් හා සමග වරද කෙළේ ය. මොහු ගෙණ ගොස් සොරුන් දමන මහාපර්වත-යෙන් දමව' යි නියොග කළෝ ය. එකල මහබෝසතානෝ 'පියානන් වහන්ස, මා අන්තඃපුරයෙහි කළ වරදෙක් නැත, මහා මායාකාරී වූ ස්ත්‍රීන්ගේ වචනයෙන් නිරපරාධ වූ මාගේ දිවි නො නසන්නැ' යි කියාත් දෙනුවන් තෙමා කඳුළු වස්වන්නට වන්හ.[2] ඒ දැක සොළොස්දහසක් අන්තඃපුර බිසෝවරු ද ලය උණු ව ගෙණ 'පුතණ්ඩ, මහාපද්ම කුමාරයෙනි, නුඹගේ වරදක් මෙතෙක් කල් අපි නුදුටු වීරුම්හ'යි **(241)** කියමින් රජගෙය මිනී මළ තැනක් සෙයින් (කරමින්) මහත් කොට හැඬූහ. එකල ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාරාදිමහාජනසමූහයෝ ද රජහු වටා හඬහඬා සිට 'අනේ! ස්වාමීනි, ශීලාචාරසම්පන්න වූ මහාපද්මකුමාරයෝ රාජ වංශානුරක්ෂණයෙහි නියුක්ත වූසේක. මෙබඳු වූ ගුණනුවණින් රූසිරින් යුක්ත වූ කුමාර කෙනකුන් පසු ව නො ලැබිය හැක්කේ ය. අපරීක්ෂාකාරී ව ස්ත්‍රීන්ගේ වචනයෙන් ජීවිතය නො නැසුව මැනැව. රජදරුවෝ නම් පරීක්ෂාකාරී විය යුත්තාහු ය' යි කියන්නාහු:—

**'නාදිට්ඨා පරතො දොසං – අණුං ථූලානි සබ්බසො,**
**ඉස්සරො පනයෙ දණ්ඩං – සාමං අප්පටිවෙක්ඛිය.**
**යො ච අප්පටිවෙක්ඛිත්වා – දණ්ඩං කුබ්බති ඛත්තියො,**
**සකණ්ටකං සො ගිලති – ජච්චන්ධො'ව සමක්ඛිකං.'**

යනාදීන් 'පින්වත් වූ දෙව ස්වාමීනි, යම් පෘථිවීශ්වර රජකෙනෙක් අනුන්ගේ කුඩා මහත් වූ සියලු වරද තමාගේ ඇසින් නො දැක කණින් නො අසා අන්‍යසාක්ෂින්ගේ වචනයත් පරීක්ෂා කොට නො බලා තෙමේ ම ප්‍රත්‍යක්ෂ නො කොට ගෙණ අනුන්ට වධ දඬුවම් නො පණවන්නේ ය. මුළු පොළොවට රජ වූ මහාසම්මතරාජවංශයෙහි භය ගැන්වීමට වඩා අධික වූ දඬුවමෙක් නැත්තේ ය. තැළීම් ගර්හා කිරීම් රටින් හැරීමට වඩා හස්තපාදච්ඡෙදන ඝාතන නම් වධයෙක් නැත්තේ ය. පසු පසු ව පැමිණි ලෙහි ගුණ නැති කර්කශ රජුන්ගේ කාලයෙහි සීසච්ඡෙදනාදී[3] අනෙකවධ උපන්නේ ය. එබැවින් අනුන්ගේ වරද ඇසින් නො දැක දඬුවම් නො ම කළ යුතු ය. යම් පෘථිවීශ්වර මහරජාන කෙනෙක් අගතියට ගොස් දෙෂ පරීක්ෂා නො කොට හස්තපාදච්ඡෙදදී දඬුවම් කෙරේ ද, ඒ රජතෙම තමහට බොහෝ දුක් විඳීමට කාරණය කරණ හෙයින් දිවි නැසීමට කාරණා වූ

1. වඟින 2. වස්නට වන 3. සීසඝාතනාදි



Non-Commercial Distribution

කටු සහිත වූ භොජනයක් ගිලින්නේ වෙයි. මැස්සන් සහිත මධුපටලයක් අනුභව කරන්නා වූ ජාත්‍යන්ධයකු වැන්නේ ය. යම් පෘථිවීශ්වරයෙක් තෙම දණ්ඩනයට නො නිසි වූ නිරපරාධයන්හට දණ්ඩනය කෙරේ ද, දණ්ඩනයට නිසි වූ සාපරාධයෙකුහට තර්ජන පබ්බාජනාදි[1] දණ්ඩනයක් නො කොට තමාගේ අභිප්‍රායක් ම කෙරේ ද, ඒ රජතෙම විෂම වූ මාර්ගයට පැමිණ ඛාණුකණ්ටකශිලාදියෙහි පැකිල වැටෙන අන්ධයකු මෙන් ධර්මය නො දන සතරඅපායෙහි වැටී මහත් දුක් විඳින්නේ ය' යි යනාදීන් අනුසාසනා කොට සිටි කල්හි එපවත් නො ගෙණ 'මොහු ගෙණ ගොස් සොරුන් දමන මහගලින් හෙළව' යි කියා **චොරප්‍රපාත** නම් පර්වතයෙන් අධඃශීර්ෂ කොට හෙළවා ලූයේ ය. එකල බොධිසත්වයන්ගේ මෛත්‍රී ආනුභාවයෙන් ඒ පර්වතයෙහි අධිගෘහිත වූ දිව්‍යපුත්‍රතෙම 'මාගේ **මහා-පදුම** කුමාරයෙනි, නුඹ වහන්සේ භය නො වන්නැ' යි කියා දෙ අත දිගු කොට වඩා ගෙණ දිව්පහස් ගන්වා වෙහෙස දුරු කොට දිව්‍යමයවස්ත්‍රාභරණ යෙන් සරහා දිවබොජුන් මේ නිමවා ඒ පර්වතපාර්ශ්වයෙහි නාගභවයනට ගෙණ ගොස් නාරජහුගේ පෙණගර්භයෙහි හිඳුවා ලූයේ ය. නාරජතෙම සතුටු ව ඔහුගේ නාගභවනය දෙකට බෙද අර්ධරාජ්‍යය දුන්නේ ය. මහා බොධිසත්වයෝ කලක් එහි වැස නාරජහට **(242)** කියා ඔහුගේ සහායත්ව යෙන් **හිමාලයට** ගොස් පැවිදි ව ධ්‍යාන උපදවා වාසය කළසේක. ඒ බව දක්වා. වදරණ භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**'චිඤ්චමාණවිකා මාතා – දෙවදත්තො ච මෙ පිතා,**
**ආනන්දො පණ්ඩිතො නාගො – සාරිපුත්තො ච දෙවතා,**
**අහං තදා රාජපුත්තො – එවං ධාරෙථ ජාතකං' යි.**

(වදරණ ලදී).

මේ නියායෙන් යම් කිසි තැනෙක්හි පියතෙම පුත්‍රයන්ට වඩා අධිකතර වන්නේ ය. විශෙෂතර වන්නේ ය. එහි දෙවදත්තයෝ ම අධිකතර වූ ය.

''තවද, නැවතත් යම් කලෙක දෙවදත්තයෝ **මහාප්‍රතාප** නම් රජ වූ ද, එකල බොධිසත්වයෝ ඒ රජහට පුත්‍ර වූ **ධර්මපාල** නම් කුමාර වූසේක. එකල ඒ රජතෙම තමාගේ පුත්‍ර වූ ධර්මපාලකුමාරයාගේ හස්තපාදයන් හා හිස සිඳුවා ලී ය. ඒ **ධර්මපාලජාතකයෙහි** ද දෙවදත්තයෝ ම වැඩි වූ ය. අධිකතර වූ ය. දැන් මෙසමයෙහිත් දෙදෙන ම ශාක්‍යවංශයෙහි ම උපන්නාහු ය. එයින් බොධිසත්වයන් වහන්සේ සකලලොකනායක වූ සියල්ල දන්නා වූ ලොවුතුරා බුදු වූසේක. දෙවදත්තයන් වහන්සේ ඒ දෙවාතිදෙව වූ සර්වඥයන් වහන්සේගේ ශාසනයෙහි මහණ ව අභසින් යන සෘද්ධි උපදවා බුද්ධලීලා කළසේක. කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මා විසින් යමක් කියන ලද්දේ ද, ඒ සියලු ම ජාතක ඇත්තෙක් ද?

1. පබ්බජ්නාදි

Non-Commercial Distribution

නොහොත් නැත්තෙක් ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, තෙපි බොහෝ යම් කාරණයන් කීවාහු ද? ඒ සියල්ල ම එසේ ම ය. අන්‍යථාවෙක් නැතැ'' යි කීසේක.

''ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අකුශලකාරිපුරුෂතෙමේත් කුශලකාරිපුරුෂතෙමේත් දෙදෙන ම සමගතික වන්නාහු ය. එසේ හෙයින් කුශලධර්මයත් අකුශලධර්මයත් දෙක ම සම සම විපාක වේදැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, කුශලධර්මයත් අකුශලධර්මයත් දෙක සම සම විපාක නො වන්නේ ය. මහරජානෙනි, දෙවදත්තයෝ සියලු ම ජනයන් කෙරෙහි විරුද්ධත්ව[1] ඇත්තෝ[2] නො වෙති. බොධිසත්වයන් කෙරෙහි ම විරුද්ධත්ව ඇත්තෝ ය. ඒ දෙවදත්තයාගේ බොධිසත්වයන් වහන්සේ කෙරෙහි යම් විරොධයෙක් ඇද් ද? ඒ ක්‍රොධය තෙම ඒ ඒ භවයෙහි පැමිණෙන්නේ ය. ඵල දෙන්නේ ය, මහරජානෙනි, රාජෛශ්වර්යයෙහි සිටියා වූ දෙවදත්තයෝත් ජනපදයෙහි ආරක්ෂා පිහිටුවන්නෝ ය, හේදඬු ලවන්නෝ ය, සභා කරවන්නෝ ය, පුණ්‍යශාලා කරවන්නෝ ය, ශ්‍රමණයන්ට හා දුගී මගී වනිබ්බකයන්ට ද නාථානාථයන්ට ද නිති පිහිටුවා දන් දෙන්නෝ ය. ඒ දනයාගේ විපාකයෙන් ඒ දෙවදත්තතෙම ජාතිජාතියෙහි ඓශ්වර්යසම්පත් ලබන්නේ ය. මහරජානෙනි, 'යමෙක් දනය ශීලය කායවාචාසංයමය උපොසථකර්මය හැර සම්පත්තියක් අනුභව කරන්නේ ය' යි කියා මේ කාරණය කියන්ට කවරෙක්[3] නම් හැකි වේ ද? නො හැක්කේ ම ය. මහරජානෙනි, තෙපි වනාහි 'දෙවදත්තයෝත් බොධිසත්වයන් වහන්සේත් දෙදෙන ම එකට සසර හැසුරුණාහ' යි කියා මෙසේ යම් කාරණයක් කීවාහු ද, ඒ සමාගමය තෙම ජාතිසියයක්හුගේ ඇවෑමෙනුත් නුවූයේ ය. ජාතිසහස්‍රයක්හුගේ ඇවෑමෙනුත් නො වූයේ ය. ශතසහස්‍රයක් ජාතීන්ගේ ඇවෑමෙනුත් **(243)** නො වූයේ ය. බොහෝ අනන්තදිනරාත්‍රීන්ගේ ඇවෑමෙන් කිසි කලෙක්හි දී දෙදෙනාගේ ඒ සමාගමය වූයේ ය.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් මනුෂ්‍යාත්මභාව ප්‍රතිලාභය පිණිස යම් මේ කාණකච්ඡපොපමාවක් වදරණ ලද ද, මහරජානෙනි, මේ දෙවදත්ත-බොධිසත්ව දෙදෙනාගේ එකතු වන සමාගමය එබඳු වූ උපමා වන්නේ ය. මහරජානෙනි, බොධිසත්වයන් වහන්සේගේ දෙවදත්තයන් හා සමග ජාති පිළිවෙළින් සමාගමයෙක් නො වූයේ ය. ඒ බව සිත්හි මනා කොට ධරාගණුව'' යි වදළසේක. ''තවද, මහරජානෙනි, සැරියුත්මහතෙරුන් වහන්සේ ද, අනෙකජාතිශතසහස්‍රයෙහි බොධිසත්වයන් වහන්සේට පිතෘ වූසේක. මහාපිතෘ වූසේක. චුල්ලපිතෘ වූසේක. භ්‍රාතෘ වූසේක, භාගිනෙය්‍ය වූසේක. මිත්‍ර වූසේක.

---

1. විරුඬ 2. ඇත්තේ 3. කවරක්හට

Non-Commercial Distribution

''මහරජානෙනි, මහාබොධිසත්වයන් වහන්සේ ද අනෙකජාති ශතසහස්‍රයෙහි සැරියුත් මහතෙරුන් වහන්සේට පිය වූසේක, මහපිය වූසේක, සුළුපිය වූසේක, මල්බෑ වූසේක, පුත්‍ර වූසේක, බෑන වූසේක, මිත්‍ර වූසේක. මහරජානෙනි, සත්වකායපරියාපන්න වූ සංසාරමහාශ්‍රොතයට පැමිණියා වූ සංසාරමහාශ්‍රොතයෙන් ගෙණ යනු ලබන්නා වූ සියලු සත්වයෝ ම තමන්හට ප්‍රිය වූවන් හා ද, අප්‍රිය වූවන් හා ද එකතු වෙති. මහරජානෙනි, යම් සේ ශ්‍රොතයෙන් ගෙණ යන්නා වූ ජලය අසූචිය පවිත්‍ර දෙය යහපත් වූ ලාමක වූ දේ හා එකතු වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම සත්වකායපරියාපන්න වූ සංසාරමහාශ්‍රොතයට පැමිණියා වූ සංසාරමහාශ්‍රොතයෙන් ගෙණ යනු ලබන්නා වූ සියලු සත්වයෝ ම අප්‍රියයන් හා ද ප්‍රියයන් හා ද සමග එකතු වෙති.

''මහරජානෙනි, දෙවදත්තයෝ යක්ෂ[1] වූවහු තුමූ අධර්ම ව අන්‍යයන් අධර්මයෙහි යොද ඒ පාපයෙන් නරකයෙහි වැටී සත්පණස්වර්ෂකොටි සැටලක්ෂයක් හවුරුදු මුළුල්ලෙහි මහානරකයෙහි පැසුනෝ ය. මහරජානෙනි, බොධිසත්වයන් වහන්සේ ද ඒ කාමාවචරදිව්‍යලොකයෙහි තෙමේ ධර්ම නම් යක්ෂරාජ වූසේක්, අන්‍යයන් ධර්මයෙහි යොද එම කුශල බලයෙන් සත්පණස්වර්ෂකොටිසැටලක්ෂයක් හවුරුදු මුළුල් ලෙහි සර්වපඤ්චකාමසමංගී ව ස්වර්ගයෙහි ප්‍රමුදිත වූසේක. තවද, මහරජානෙනි, දෙවදත්තයයෝ මේ භවයෙහි දී කිසි වෙහෙසක් නො වින්ද යුතු වූ ලොවුතුරා බුදුන්ට ශිලාපාතනාදියෙන් වෙහෙස විඳුවා සමගි වූ සංඝයා ද බිඳ පොළෝ යට ගිලී ගියෝ ය. අප ලොවුතුරා තථාගතොත්තමයානන් වහන්සේ දත මනා සියලු ම ධර්මයන් අවබොධ කොට ලොවුතුරාබුදු ව රාගාදී සර්වොපධීන් ක්ෂය කිරීමෙන් පිරිනිවන් පෑ වදළ සේක.'' ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නය එසේ ම පිළිගත්තෙමි'' යි කියා ප්‍රශංසා කළහ.

**කුශලාකුශලකාරිවිශෙෂප්‍රශ්නය නිමි.**

---

# අමරාදේවීප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින්,

**'සචෙ ලභෙථ ඛණං වා රහෝ වා**
**නිමන්තකං වාපි ලභෙථ තාදිසං,**
**සබ්බාපි ඉත්ථියො කරෙය්‍යුං පාපං**
**අඤ්ඤං අලද්ධා පීඨසප්පිනා සද්ධිං.'**

**(244)** යන මේ ගාථාවෙන් 'ඉදින් සියලු ස්ත්‍රීහු අවකාශයක් හෝ රහස් වීමක් හෝ ලද්දහු වූ නම්, එබඳු වූ නිමන්ත්‍රණයක් හෝ ලද්දහු වූ නම්,

1. පක්ෂ

Non-Commercial Distribution

අන්‍ය සුදුසු පුරුෂයකු නො ලදින් අත් පා නැති පීඨසප්පි නම් පුරුෂයා හා සමගත් පරපුරුෂ සෙවනය කරන්නාහු ය' යි කියා මේ කාරණය වදාරණ ලද්දේ ය. නැවැත ද 'නුවරින් පිටත ගමෙක සිටියා වූ, වැස ගිය[1] පුරුෂයා ඇත්තා වූ දෙවෙනි කෙනෙකුන් නැති බැවින් රහසි ව සිටියා වූ, එසේ ම හුදකළා වූ, මහෞෂධපණ්ඩිතයන්ගේ භාර්යාව වූ අමරා නම් ස්ත්‍රීතොම රජකෙනෙකුන් හා සදෘශ වූ ස්වාමිපුරුෂයකු සරහා හරණ ලද පුරුෂයා විසින් මසුරන්දහසකින් නිමන්ත්‍රණය කරණ ලදු ව පාපයක් නො කළා ය' යි කියා නුඹ වහන්සේ විසින් කියනු ලැබෙයි. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**'සබ්බෙ ලභෙථ ඛණං වා රහො වා**
**නිමන්තකං වාපි ලභෙථ තාදිසං,**
**සබ්බාපි ඉත්ථියො කරෙය්‍යුං පාපං**
**අඤ්ඤං අලද්ධා පීඨසප්පිනා සද්ධිං.'**

කියා වදාරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් '**මහොසධස්ස භරියා අමරා නාම ඉත්ථී ගාමකෙ ඨපිතා පවුත්ථපතිකා රහො නිසින්නා විවිත්තා රාජපටිසමං සාමිකං කරිත්වා සහස්සෙන නිමන්තියමානා පාපං නාකාසි'** යනාදීන් කී යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'මහොසධස්ස භරියා අමරා නාම ඉත්ථී ගාමකෙ ඨපිතා පවුත්ථපතිකා රහො නිසින්නා විවිත්තා රාජපටිසමං සාමිකං කරිත්වා සහස්සෙන නිමන්තියමානා පාපං නාකාසි' යි වදාළ වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන්:—

**'සබ්බෙ ලභෙථ ඛණං වා රහො වා**
**නිමන්තකං වාපි ලභෙථ තාදිසං,**
**සබ්බාපි ඉත්ථියො කරෙය්‍යුං පාපං**
**අඤ්ඤං අලද්ධා පීඨසප්පිනා සද්ධිං' යි.**

කියා වදාළ ඒ වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටික ප්‍රශ්නය ද නුඹවහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, ස්ත්‍රීන්ගේ අගුණ ප්‍රකාශිත වූ **කුණාලජාතකය** වදාරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, පෙර **බරණැස කණ්ඩරී** නම් රජ්ජුරුවන්ගේ සර්වලක්ෂණසම්පන්න වූ **කින්නරා** නම් අග්‍රමහෙසිකාවක රජහු නිද්‍රොපගත කල්හි මධ්‍යමරාත්‍රියෙහි ප්‍රාසාද කවුළුයෙන් සොරා බැස ඇතුළු ප්‍රාකාරය ලඟ පිහිටි ජම්බුරුක්සෙවණ වසන අත් පා කොර[2] වූ **පීඨසප්පි** නම් මනුෂ්‍යප්‍රෙතයකු හා සමග පාප ක්‍රියා කොට එමින් කල් යවා වාසය කළ බව[3] අරහයා:—

1. වැස යන ලද 2. කොට 3. කළාවූ බිසවක්

Non-Commercial Distribution

'සචෙ ලභෙථ ඛණං වා රහො වා
නිමන්තකං වාපි ලභෙථ තාදිසං,
සබ්බාපි ඉත්ථියො කරෙය්‍යුං පාපං
අඤ්ඤං අලද්ධා පීඨසප්පිනා සද්ධිං.'

**(245)** යන මේ කාරණය වදරණ ලද්දේ ය. නැවත ද **උම්මග්ගජාතක** යෙහි ගමෙක ගෙණවුත් සිටුවන ලද්ද වූ, බැහැර ගිය ස්වාමීපුරුෂයා ඇත්තා වූ, එකලා වීමෙන් රහස් ව සිටින ලද්ද වූ, හුදකලා වූ, **මහෞෂධ** නම් පණ්ඩිතොත්තමයාගේ භාර්යාව වූ **අමරා** නම් ස්ත්‍රීතොම රජ කෙනෙකුන් සදෘශ වූ ස්වාමීපුරුෂයකු කොට සරහා මසුරන් දහසකින් යාච්ඤා කොට සිටින ලදු ව පරපුරුෂපාපක්‍රියාවන් නො කළා ය' යි කියාත් වදරණ ලද්දේ ම ය.

''මහරජානෙනි, ඉදින් ඒ අමරාතොමෝ අවකාශයක් හෝ රහසක් හෝ නිමන්ත්‍රකයකු[1] හෝ එබඳු වූ පව් කරණ අවකාශයක් ලැබුවා[2] නම්, පව් නො කරන්නී ද? ඒ ස්ත්‍රීතොම මසුරන් දහසක් ලබමින් එබඳු වූ රාජ ලීලා හා සදෘශ වූ පුරුෂයා හා සමග පාපකර්මය කරා ම ය. මහරජානෙනි, අවකාශයක් හෝ රහසක් හෝ නිමන්ත්‍රකයකු හෝ සොයන්නා වූ ඒ අමරා නම් ස්ත්‍රීතොම එබඳු වූ පව් කරණ අවකාශයක් නො දක්කාහ. මේ ලොකයෙහි අනුන් කරණ ගර්හා භයින් අවකාශයක් නො දක්කාහ. පරලොව විඳිනා නරකදුක්ඛභයින් අවකාශයක් නො දක්කාහ. 'පරපුරුෂ සේවනය කරණ පාපය කර්කශවිපාක ඇතැ' යි සිතා අවකාශයක් නො දක්කාහ. ප්‍රිය වූ පුරුෂයා නො හරිණු කැමැති ව අවකාශයක් නො දක්කාහ. ස්වාමීපුරුෂයාගේ මහත් ගරු බැවින් අවකාශයක් නො දක්කාහ. ධර්මයට ගෞරව කරමින් අවකාශයක් නො දක්කාහ. ආර්ය නො වන්නා වූ නීචකෘත්‍යයට ගර්හා කෙරෙමින් අවකාශයක් නො දක්කාහ. පතිව්‍රතාක්‍රියාව නො බිඳුනු කැමැති ව අවකාශයක් නො දක්කාහ. මෙබඳු වූ බොහෝ කාරණයන් කරණ කොට ගෙණ අවකාශයක් නො දක්කාහ. ඒ **අමරාවෝ** ලොකයෙහි රහසකුදු සොයා නො දක පාපයක් නො කළාහ.

''ඉදින් ඒ අමරාතොමෝ මනුෂ්‍යයන් කෙරෙන් රහසක් ලැබුවා නම්, එකල අමනුෂ්‍යයන්ගෙන් රහසක් නො ලබන්නී ය. ඉදින් අමනුෂ්‍යයන් කෙරෙන් රහසක් ලැබුවා නම්, නැවැත ද, පරසිත් දන්නා දිවැස් ඇති ප්‍රව්‍රජිතයන් වහන්සේලාගෙන් රහසක් නො ලබන්නී ය.[3] ඉදින් පරසිත් දන්නා ප්‍රව්‍රජිතයන් වහන්සේලාගෙන් රහසක් ලැබුවා නම්, නැවත ද, පරසිත් දන්නා දෙවියන්ගෙන් රහසක් නො ලබන්නී ය. ඉදින් පරසිත් දන්නා දෙවියන්ගෙන් රහසක් ලැබුවා නම්, නැවැත ද, තොමෝ[4] ම පාපයෙන් රහසක් නො ලබන්නී ය. ඉදින් තොමෝ පාපයෙන් රහසක්

1. නිමන්ත්‍රණයකු 2. ලැබුයේ. 3. නො ලබන්නේ ය 4. තමා

*Non-Commercial Distribution*

ලැබුවා නම්, තව ද අධර්මයෙන් රහසක් නො ලබන්නී ම ය. මෙබඳු වූ අනෙකප්‍රකාර වූ කාරණයන් කරණ කොට ගෙණ රහසක් නො ලදින් පාපයක් නො ම කළාහ. ඒ මහෞෂධපණ්ඩිතොත්තමයාගේ අමරාවෝ ලොකයෙහි නිමන්ත්‍රකයකු ද සොයා එබන්දක්හු නො ලදින් පාපයක් නො ම කළාහ.

"මහරජානෙනි, ඒ මහෞෂධ නම් පණ්ඩිතොත්තමයානෝ අෂ්ට විංශතිගුණගණාංගයකින් සමන්නාගත වූහ. කවර නම් අටවිසි ගුණ-ගණාංගයකින් සමන්නාගත වූ ද යත්:— මහරජානෙනි, මහෞෂධ පණ්ඩිතයානෝ මහත් ශූරබල ඇත්තාහ. මහත් ලජ්ජා ඇත්තාහ. පාප යෙහි මහත් භය ඇත්තාහ. පක්ෂබල ඇත්තාහ. බොහෝ මිත්‍රයන් ඇත්තාහ. බොහෝ ඉවසීම් ඇත්තාහ. නො කඩ වූ සිල් ඇත්තාහ. සත්‍ය වාදීහ. සුවචගුණයෙන් සමන්විතයහ. පරහට **(246)** ක්‍රොධ නැත්තාහ, නිහතමානීහ. ඊර්ෂ්‍යාව නැත්තාහ. මහත් වීර්යය ඇත්තාහ. ධන පිරිස් රැස් කිරීම් ඇත්තාහ. සකල ජනයාට සංග්‍රහ කිරීම් ඇත්තාහ. ධනසං-විභාගය කිරීම් ඇත්තාහ. සර්වජනප්‍රියවචන ඇත්තාහ, යටත් ප්‍රවෘත්ති ඇත්තාහ, ශඨප්‍රයොග නැත්තාහ, වංචා නැත්තාහ, ඉතා මහත් වූ ප්‍රඥාවෙන් සමන්විතයහ, දෙව්මිනිසුන් කෙරෙහි පතළ කීර්ති ඇත්තාහ, ලොකයෙහි ඇති තාක් විද්‍යාවෙන් සමන්විත වූහ, සියල්ලන්ට හිතවැඩ කැමැත්තාහ, ආශ්‍රය කරන්නවුන් විසින් ප්‍රාර්ථනීය වූවෝ ය, සියලු ජනයාගේ ධන සම්පත්තියක් වැනි වූවෝ ය, සියලු ජනයාගේ යසශක් වැනි වූවෝ ය. මහරජානෙනි, ඒ මහෞෂධ නම් පණ්ඩිතොත්තමයානෝ මේ යථොක්ත වූ අෂ්ටවිංශතිගුණගණාංගයෙන් සමන්නාගත වූවාහු ය. මහරජානෙනි, ඇති තාක් සියලු ම ස්ත්‍රීගුණයෙන් යුක්ත වූ ඒ අමරා නම් මහෞෂධ භාර්යාවෝ නුවණින් විමසා බලමින් එබඳුවූ අනික් කියා සිටින නිමන්ත්‍රක-යකු නො ලැබ පරපුරුෂ සෙවනය වූ පාපය නො කළාහ" යි වදාළසේක.

එකල රජ්ජුරුවෝ අතිප්‍රසන්න ව "සාධු, සාධු, ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, මේ ප්‍රශ්නය නුඹ වහන්සේ යම් පරිද්දෙකින් වදාළසේක් ද, මමත් එපරිද්දෙන් ම පිළිගන්නෙමි" යි කියා ප්‍රශංසා කළහ.

අමරාදේවිප්‍රශ්නය නිමි.

---

# අර්හත් නිර්භයප්‍රශ්නය

නැවතත් ප්‍රශ්නයක් පිළිවිසිනු කැමැත්තා වූ මිලිඳුමහරජානෝ "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'රහත්හු[1] පහ වූ භයසන්ත්‍රාස ඇත්තාහු ය' යි කියා මේ වචනය වදාරණ ලද්දේ ය. නැවතත් 'රජගහනුවර දී භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි එළවා එන්නා වූ

1 රහත්

Non-Commercial Distribution

ධනපාල නම් නාලාගිරි හස්තිරාජයා දැක පන්සියයක් රහතුන් වහන්සේ සර්වඥයන් වහන්සේ හැර එක ම අනඳමහතෙරුන් වහන්සේ පමණක් ම හිඳුවා දිසානුදිසාවට ගියාහු ය' යි කියා නුඹ වහන්සේ කියනසේක. කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පන්සියයක් පමණ ඒ රහතන් වහන්සේලා ඇත්රජහට භයින් පැන ගියාහු ද? ශාන්තදන්ත වූ ස්වකීය කටයුත්තෙන් තමන් වහන්සේට ම දැනෙනවා ඇතැ යි කියා දසබලධාරි වූ ලොවුතුරා බුදුන් ඇද හෙළවනු කැමැති ව පැන ගියාහු ද? නොහොත් තථාගතොත්තමයානන් වහන්සේගේ අතුල්‍ය වූ මහත් වූ අසදෘශ වූ ප්‍රාතිහාර්ය දක්නා කැමැති ව පැන ගියාහු ද? ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'විගතභයසන්තාසා අරහන්තො' යි කියා වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'නගරෙ රාජගහෙ ධනපාලකං හත්ථිං භගවති ඔපතන්තං දිස්වා පඤ්චඛීණාසව සතානි පරිච්චජිත්වා ජිනවරං පක්කන්තානි දිසාවිදිසං එකං ඨපෙත්වා ථෙරං ආනන්දං' යි කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'නගරෙ රාජගහෙ ධනපාලකං හත්ථිං භගවති ඔපතන්තං දිස්වා පඤ්චඛීණාසවසතානි පරිච්චජිත්වා ජිනවරං පක්කන්තානි දිසාවිදිසං එකං ඨපෙත්වා ථෙරං ආනන්දං' යි කියා වදළ බව සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'විගතභයසන්තාසා අරහන්තො' යි කියා වදළ වචනය හෝ බොරු වන්නේ ය. නුඹ වහන්සේ කරා පැමිණියේ **(247)** මේත් උභතොකොටිකප්‍රශ්නයෙක. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'රහත්හු පහ වූ භය සන්ත්‍රාස ඇත්තාහු ය' යි කියා මෙම කාරණයත් වදරණ ලද්දේ ය. රාජගෘහනගරවරයෙහි දී භාග්‍යවතුන් වහන්සේ කරා ලං ව එන්නා වූ ධනපාලක නම් නාලාගිරිහස්තියා දැක පන්සියයක් පමණ රහතන් වහන්සේලා සර්වඥරාජොත්තමයා හැර දිසානුදිසාවට එක ම අනඳ මහ තෙරුන් වහන්සේ පමණක් බුදුන් ලඟ තබා ඒ ඒ අත ගියාත් සැබෑ ම ය. ඒ හැර ගිය කාරණය වනාහි භයකිනුත් නො වන්නේ ය. මහරජානෙනි, යම් හෙතුවකින් රහතන් වහන්සේලා භය වන්නාහු වූ නම්, තැති ගන්නාහු වූ නම් රහතන් වහන්සේලාගේ ඒ හෙතුව මූලොච්ඡින්න වී ය. එහෙයින් රහත්හු පහ වූ භයසන්ත්‍රාස ඇතිසේක් ලා ය. මහරජානෙනි, මහාපෘථිවිය සාරණ කල්හි ද, බිඳිනා කල්හි ද සමුද්‍ර පර්වත ගිරිශිඛරයන් ධරණ කල්හි ද භය ගණී ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි'' යි කීහ.

''මහරජානෙනි, හේ කුමන කාරණයකින් ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, යම් හෙතුවකින් මහාපෘථිවිය භය වේ ද, උත්ත්‍රාසත් වේ ද, එබඳු හෙතුවක් මහාපෘථිවියෙහි නැතැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් හෙතුවකින් රහතන් වහන්සේලා භය වනසේක් ලා ද, තැති ගන්නාසේක් ලා ද, එබඳු වූ හෙතුවෙක් රහතන් වහන්සේලාගේ

Non-Commercial Distribution

නැත්තේ ය. තවද, මහරජානෙනි, 'පර්වතශිඛරය සිඳින කල්හි ද, උගුළුවා හෙළන කල්හි ද, බිඳින කල්හි ද, ගින්නෙන් දවන කල්හි ද හය වේද ?''යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, හේ කවර කාරණයකින් ද'' යි විචාළසේක. ''ස්වාමීනි, යම් හෙතුවකින් පර්වතශිඛරය හය වේ ද, තැති ගණී ද, එබඳු කාරණයෙක් පර්වතශිඛරයාගේ නැතැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කාරණයකින් රහත්හු හය වෙද් ද, උත්‍රාස වෙද් ද, එබඳු කාරණයක් රහතුන් වහන්සේලාගේ නැත්තේ ය. ඉදින් මහරජානෙනි, ශතසහස්‍රලොකධාතුයෙහි සත්වකායපරියාපන්න වූ යම් කිසි සත්වකෙනෙක් ඇද් ද, ඒ සියල්ලෝ ම නානාවිධ ආවුධ ගත් අත් ඇති ව එක ම රහතුන් වහන්සේ කෙනකුන් කරා දිව අවුත් වට කොට ගෙණ 'මරම්හ' යි කියා තැති ගන්වන්නාහු වූ නමුත්, ඒ රහතුන් වහන්සේගේ සිතට මඳකුත් අන්‍යථාත්වයක් නො වන්නේ ය. ඊට කාරණා කවරේ ද? යත්:— හයට අවකාශයක් නො වන බැවින් අස්ථානයෙකි.

''මහරජානෙනි, එතෙකුදු වුවත් ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාට මෙබඳු වූ චිත්තවිතර්කයෙක් වූයේ ය. 'අහෝ! අද දවස් නරවරප්‍රවර වූ ජිනවරොත්තමයානන් වහන්සේ නගරප්‍රවරයට ප්‍රවිෂ්ට වූ කල්හි නුවර මහාවීථියෙහි ද, නාලාගිරි නම් ධනපාල හස්තිරාජයා අභිමුඛයට දිව එන්නේ ය. එකල බුද්ධුපස්ථායක වූ ආනන්දස්ථවිරයන් විසින් එකාන්ත යෙන් ම දෙවාතිදෙව වූ මතිසාගරයන් වහන්සේට ජීවිතපරිත්‍යාගය කරණු ලැබෙයි. ඉදින් අපි සියල්ලෝ ම භාග්‍යවතුන් වහන්සේ හැර නො ගියමෝ නම්, ආනන්දස්ථවිරයන්ගේ ගුණය ප්‍රකාශ නො වන්නේ ය. නො සෙලවී හිඳිනා අප බොහෝ දෙනෙකුන් දක හස්තිරාජතෙම ද, තථාගතයන් වහන්සේ ලඟට නො එන්නේ ම ය. එබැවින් අපි පහ ව යම්හ. මෙසේ ඇති කල මහත් වූ ජනසමූහයාගේ ක්ලේශබන්ධනයෙන් මිදීම වන්නේ ය. ආනන්දස්ථවිරයන්ගේ ද, ගුණය ප්‍රසිද්ධ වන්නේ ය'යි සිතා මෙසේ ඒ රහතන් **(248)** වහන්සේලා මහත් ආනිසංසය දක දිසානු–දිසාවට වැඩ වදළසේක්ලාහ'' යි වදළසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ප්‍රශ්නය මනා ව ම විභාග කොට වදරණ ලද්දේ ය. මේ කාරණය එසේ ම ය. රහතන් වහන්සේලාට හයක් හෝ සන්ත්‍රාසයෙක් හෝ නැත්තේ ය. ආනිසංසය දක ඒ රහතන් වහන්සේලා දිසානුදිසාවට වැඩ වදළහ'' යි කීහ.

අර්හත්නිර්භයප්‍රශ්නය නිමි.

---

# සර්වඥනුමාන ප්‍රශ්නය

නැවතත් ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ 'තථාගතයන් වහන්සේ සියල්ල දන්නාසේකැ' යි කියනසේක. නැවත ද, 'තථාගතයන් වහන්සේ විසින් ශාරිපුත්‍ර මුගලන් ප්‍රමුඛ වූ භික්ෂුසංඝයා

පනාමය[1] කර වදළ කල්හි **චාතුමෙය්‍යක** නම් ශාක්‍යයෝ ද **සහම්පති** නම් මහාබ්‍රහ්මයා ද, බීජූපමාව හා තරුණ වච්ඡූපමාව ද දක්වා ලොවුතුරා බුදුන් පහදවා ලූවාහු ය. ක්ෂමා කෙරෙව්වාහු ය, ආදරය කෙරෙව්වාහු ය'යි කියා කියනසේක. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් උපමා දෙකකින් තථාගතයන් වහන්සේ සංඝයා කෙරෙහි ඇලුනුසේක් ද, ක්ෂමා කළ සේක් ද, සන්හිඳුනුසේක් ද, දයාවට පැමිණිසේක් ද, ඒ උපමාද්වය තථාගතයන් වහන්සේ විසින් දන්නා ලද ද, ඉදින්, ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, තථාගතයන් වහන්සේ විසින් ඒ උපමා නො දන්නා ලද්දේ වී නම්, ඒ කාරණයෙන් බුදුරජානන් වහන්සේ අසර්වඥ වූසේක. ඉදින් දන්නා ලද්දේ නම්, ඒ කාරණයෙන් සංඝයා ආකඩ්ඪනය කොට අභිභවනය කරවා විමසනු කැමැති ව පනාමය[1] කර වදළසේක. ඒ කාරණයෙන් සර්වඥයන් වහන්සේගේ අකාරුණිකතාව සම්භ වන්නේ ය. මේ උභතො–කොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, තථාගතයන් වහන්සේ සර්වඥසේක් ම ය. භාග්‍ය–වතුන් වහන්සේ ඒ උපමාවලින් ද ප්‍රසන්න වූසේක. ඇලුනුසේක, ක්ෂමා වූසේක, උපශාන්ත වූසේක, නිජ්ඣන්තියට පැමිණිසේක. මහරජානෙනි, ධර්මස්වාමී වූ තථාගතයන් වහන්සේගේ ඒ තථාගතප්පවෙදිත වූ උපමා වලින් ම තථාගත වූ බුදුන් සිත් ගත්තාහු ය. සන්තොස කළාහු ය, පැහැදීම කළාහු ය. ඔවුන්ගේ වචනයට ද, තථාගතයන් වහන්සේ ප්‍රසන්න ව 'මැනවැ' යි වදරා පිළිගෙණ වදළසේක. මහරජානෙනි, යම්සේ ස්ත්‍රීතොම ස්වාමිපුරුෂයා සන්තක වූ ධනයෙන් ම ස්වාමිපුරුෂයා සිත් ගන්නී ය. සන්තොස කරවන්නී ය, පහදවන්නී ය. ඒ ඒ කටයුත්ත ද ස්වාමීතෙම ඉතා මැනවැ යි කියා අනුමෝදන් වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම **චාතුමෙය්‍යක** නම් ශාක්‍යයෝ ද, **සහම්පති** නම් මහාබ්‍රහ්මයානෝ ද, තථාගතප්පවෙදිත වූ උපමාවෙන් ම බුදුන් සිත් ගත්තාහු ය. සතුටු කෙරෙව්–වාහු ය. පැහැදීම කෙරෙව්වාහු ය. ඔවුන්ගේ වචනයට ද, තථාගතයන් වහන්සේ ප්‍රසන්න ව 'ඉතා මැනවැ' යි වදරා පිළිගත්සේක.

''නවද, මහරජානෙනි, යම් සේ අන්දම් තබන කප්පකපුරුෂතෙම රජ්ජුරුවන් ම සන්තක වූ රන්පණාවෙන් රජ්ජුරුවන්ගේ උත්තමාංගය පැපත නභා පිරමින් රජ්ජුරුවන් සිත් ගන්නේ ය, සතුටු කරන්නේ ය, පහදවන්නේ ය. ඒ කපුවාහට ද, ප්‍රසන්න වූ රජ්ජුරුවෝ 'මැනැවැ' යි කියා අනුමෝදන් **(249)** වන්නාහු ය, යම් කැමැති දෙයක් දෙන්නාහු ය. ''මහරජානෙනි, එපරිද්දෙන් ම **චාතුමෙය්‍යක** නම් ශාක්‍යයෝ ද, **සහම්පති** නම් මහාබ්‍රහ්මයානෝ ද, තථාගතප්පවෙදිත වූ උපමාවලින් ම බුදුන් සිත් ගත්තාහු ය, සතුටු කළාහු ය, පහදවා ලූවාහු ය. ඔවුන්ගේ වචනයට ද තථාගතයන් වහන්සේ ප්‍රසන්න ව 'යහපතැ' යි අනුමෝදන් වූසේක.

---

1 ප්‍රණාමය

Non-Commercial Distribution

''තවද, මහරජාණෙනි, යම් සේ සද්ධිවිහාරිකතෙම තමාගේ උපාධ්‍යායයන් විසින් ගෙණෙන ලද පිණ්ඩපාතය ගෙණ උපාධ්‍යායයන් වහන්සේට පිරිනමමින් උපාධ්‍යායයන් සිත් ගන්නේ ය, සතුටු කරන්නේ ය, පහදවන්නේ ය, ඒ කෘත්‍යයට ද උපාධ්‍යායයන් වහන්සේ ප්‍රසන්න ව යහපතැ යි පිළිගන්නාහු ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම **චාතුමෙය්‍යක** නම් ශාක්‍යරජදරුවෝ ද **සහම්පති** නම් මහාබ්‍රහ්මයාණෝ ද තථාගතයන් වහන්සේ දූන වදරන්නා වූ බීජතරුණවච්ඡුපමාවලින් ම බුදුන් සිත් ගත්තාහු ය, සන්තොස කෙරෙව්වාහු ය, ප්‍රසාදය කෙරෙව්වාහු ය. ඔවුන්ගේ වචනයට ද තථාගතයන් වහන්සේ ප්‍රසන්න වෙමින් 'ඉතා මැනැවැ' යි පිළිගෙණ සියලු ම සංසාරදුක්ඛයෙන් මිදීම පිණිස සද්ධර්ම දෙශනා කර වදළසේකැ'' යි කියා මේ ප්‍රශ්නය විසඳූසේක.

එකල රජ්ජුරුවෝ ''සාධු, සාධු, ස්වාමීනි, නාගසේනයන් වහන්ස, මේ ප්‍රශ්නය එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

**සර්වඥනුමානප්‍රශ්නය නිමි.**

---

**සකලජනමනොනන්දනීය වූ මෙණ්ඩකප්‍රශ්න නම් වූ මේ ශ්‍රීසද්ධර්මාදසයෙහි සතරවන වර්ගය නිමියේ ය.**

# සෙනාසනප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මිත්‍රසන්ථවයෙන් භය උපදින්නේ ය. ගෘහයෙන් කෙලෙස් රජස් උපදින්නේ ය. අගෘහය අසන්ථවය යන මේ කාරණය ඒකාන්තයෙන් ම ඥාණයෙන් අගතැන්පත් මුනීන්ගේ නිරවද්‍ය දර්ශනය' යි කියා මෙම අර්ථය වදරණ ලද්දේ ය. නැවත ද 'රම්‍ය වූ විහාර කරවන්නේ ය. ඒ විහාරයෙහි බහුශ්‍රැත භික්ෂූන් වාසය කරවන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ විසින්:—

**'සන්ථවාතො භයං ජාතං—නිකෙතා ජායතී රජො,**
**අනිකෙතමසන්ථවං—එතං වෙ මුනිදස්සනං.'**

කියා වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'විහාරෙ කාරයෙ රම්මෙ වාසයෙත්ථ බහුස්සුතෙ' කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් 'විහාරෙ කාරයෙ රම්මෙ වාසයෙත්ථ බහුස්සුතෙ' කියා වදළ වචනය සැබෑ වී නම්, එහෙයින් 'සන්ථවාතො භයං ජාතං' යනාදීන් වදළ ඒ වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹවහන්සේ කරා පැමිණියේ ය. ඒ

Non-Commercial Distribution

ප්‍රශ්නය තෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ. ''සැබැව මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින්:—

(250) **'සන්ථවාතො භයං ජාතං–නිකෙතා ජායතී රජො,**
**අනිකෙතමසන්ථවං–එතං වෙ මුනිදස්සනං.'**

කියාත් ගෘහදෙෂ වදරණ ලද්දේ ය. 'විහාරෙ කාරයෙ රම්මෙ වාසයෙත්ථ බහුස්සුතෙ' කියාත් ආවාසදනානිසංස වදරණ ලද්දේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ 'සන්ථවාතො' යනාදීන් යමක් වදරණ ලද ද, ඒ ස්වභාවවචනයෙක. අශෙෂවචනයෙක. නිස්සෙසවචනයෙක. නිෂ්පර්‍යාය වචනයෙක, ශ්‍රමණානුච්ඡවික වචනයෙක, ශ්‍රමණසාරුප්‍ය වචනයෙක, ශ්‍රමණපතිරූප වචනයෙක, ශ්‍රමණාර්හවචනයෙක, ශ්‍රමණවිෂය වූ වචනයෙක, ශ්‍රමණප්‍රතිපදවචනයෙක, ශ්‍රමණප්‍රතිපත්තිවචනයෙක. මහරජානෙනි, යම්සේ ආරණ්‍යක මෘගතෙම අරණ්‍ය වනාන්තරයෙහි ගොචරය කොට හැසිරෙමින් එක තැනෙක ආලයක් නැති ව ගෘහයක් නැත්තේ ය, අභිප්‍රාය තැනෙක සයනය කරන්නේ ය, මහරජානෙනි, එපරිද්දෙන් ම උපසම්පද වූ භික්ෂූහු විසින්:—

**'සන්ථවාතො භයං ජාතං–නිකෙතා ජායතී රජො,**
**අනිකෙතමසන්ථවං–එතං වෙ මුනිදස්සනං.'**

යන මේ ශ්‍රී මුඛ පාලියෙහි අර්ථය සිතිය යුත්තේ ය, මහරජානෙනි. අප භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**'විහාරෙ කාරයෙ රම්මෙ–වාසයෙත්ථ බහුස්සුතෙ,**
**පපං ච විවනෙ කයිරා–දුග්ගෙ සංකමනානි ච.'**

යන මේ ගාථායෙන් කොසලසංයුත්තකයෙහි යම් ආවාසදනානිසංසයක් වදරණ ලද ද, ඒ වදළ කාරණය ආවාසයාගේ ප්‍රයොජනද්වයයක් දක වදරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලද්දේ ය. ඒ ප්‍රයොජනද්වය කවරේ ද? යත්:— විහාරදනය නම් සියලු ම සර්වඥවරයන් විසින් ප්‍රශංසා කරණ ලද්දේ ය. අනුදන්නා ලද්දේ ය, ස්තුති කරණ ලද්දේ ය. ප්‍රශස්ත කර වදරණ ලද්දේ ය. ඒ ආවාසදනය දී දයකයෝ එකාන්තයෙන් ම ජාති ජරා ව්‍යාධි මරණ දුකින් මිදෙමින් නිවන් දක්නාහු ය. විහාරදනයාගේ මේ පළමුවන ආනිසංසය නම් වන්නේ ය තවද, ආවාසය ඇති කල්හි භික්ෂුණීහු ව්‍යක්ත වූ සලකුණු ඇති වෙති. භික්ෂූන් දක්නා කැමැත්තවුන්ට දර්ශනය සුලභ වන්නේ ය. ගෘහය නැති කල්හි දුඃඛදර්ශනය ඇත්තාහු වෙති. සුව සේ භික්ෂූන් දක්නට නො ලැබෙති. විහාරදනයෙහි මේ දෙවෙනි ආනිසංසය නම් වන්නේ ය. මේ ප්‍රයොජනද්වය දක වදරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් 'විහාරෙ කාරයෙ රම්මෙ වාසයෙත්ථ බහුස්සුතෙ' යන මේ ආවාසදනානිසංසය වදරණ ලද්දේ ය. එතෙකුදු වුවත් බුද්ධපුත්‍රයන් විසින් ඒ ආවාසයෙහි ආලය නො කළ යුත්තේ ය''යි වදළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ප්‍රශ්නය එපරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

**සෙනාසනප්‍රශ්නය නිමි.**

Non-Commercial Distribution

# උදරසංයත ප්‍රශ්නය

**(251)** නැවැතත් ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'භික්ෂාටනය කොට ලැබිය යුතු ආහාරයෙහි ගෙපිළිවෙළින් සිඟන විසින් ප්‍රමාද නො වන්නේ ය. උදරපොෂණයෙහි පමණ දන වැළඳීමෙන් සංයතකාරී වන්නේ ය' යි කියා මේ කාරණය වදරණ ලද්දේ ය. නැවත ද එම භාග්‍යවතුන් වහන්සේ විසින් මහාඋදායිසූත්‍රයෙහි 'උදායී පරිබ්‍රාජිකයෙනි, මම වනාහි සමහර දවසෙක මාගේ මේ පාත්‍රයෙන් සම්පූර්ණ වූ ආහාරයත් වළඳමි. එයට වඩාත් වළඳන්නෙමි' යි කියා වදරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය උදරෙ සංයතො සියා' යි කියා වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'අහං ඛො පනුදායි අප්පෙකදා ඉමිනා පත්තෙන සමිතිත්තිකම්පි භුඤ්ජාමි. භියොපි භුඤ්ජාමි' කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් 'අහං ඛො පනුදායි අප්පෙකදා ඉමිනා පත්තෙන සමතිත්තිකම්පි භුඤ්ජාමි. භියොපි භුඤ්ජාමි' කියා වදරණ ලද්දේ සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය, උදරෙ සංයතො සියා' කියා වදළ ඒ වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය උදරෙ සංයතො සියා' යන මේ කාරණයත් වදරණ ලද්දේ ම ය. තවද 'අහං ඛො පනුදායි අප්පෙකදා ඉමිනා පත්තෙන සමතිත්තිකම්පි භුඤ්ජාමි. භියොපි භුඤ්ජාමි' කියාත් වදරණ ලද්දේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය උදරෙ සංයතො සියා' කියා යමක් වදරණ ලද්දේ ද, ඒ ස්වභාවවචනයෙක, අශෙෂ වචනයෙක, නිරවශෙෂවචනයෙක, කාරණසහිත වචනයෙක, විද්‍යමාන වූ වචනයෙක, සත්‍යවචනයෙක, යථාස්වරූප වචනයෙක, අවිපරීත වචනයෙක, ඍෂින්ගේ වචනයෙක, මුනීන්ද්‍රවචනයෙක, භාග්‍යවතුන්ගේ වචනයෙක, රහතුන්ගේ වචනයෙක, ප්‍රත්‍යෙකබුද්ධ වචනයෙක, ජිනෙන්ද්‍ර වචනයෙක, සර්වඥවචනයෙක, තථාගතඅර්හත්සම්‍යක්සම්බුද්ධ වචනයෙක. මහරජානෙනි, යමෙක් උදර පොෂණයෙහි අසංඥතකාරී වී නම්, එතෙම පරප්‍රාණය ද නසන්නේ ය. නුදුන් වස්තුව ද ගන්නේ ය, පරදර යෙහි ද හැසිරෙන්නේ ය, මුසාවාද ද කියන්නේ ය, සුරාපානය ද කරන්නේ ය, මැනියන්ගේ ජීවිතයත් තොර කරන්නේ ය, පියානන්ගේ ජීවිතයත් තොර කරන්නේ ය, අරහන්තඝාතනය ද කරන්නේ ය, සංඝභෙදය ද කරන්නේ ය, දුෂ්ට වූ සිතින් තථාගතයන් වහන්සේගේ ශරීරයෙහි ලේ උපදවන්නේ ය.

Non-Commercial Distribution

''මහරජානෙනි, දෙවදත්තයන් වහන්සේ උදරපොෂණයෙහි අසංයත වූහ.[1] සමානසංඝයා බිඳ කල්පස්ථායික වූ අකුශලකර්මයක් රැස් කර ගත්තේ නො වේ ද? මහරජානෙනි, මෙබඳු වූ අනිකුදු බොහෝ විවිධ වූ කාරණයන් දැක භාග්‍යවතුන් වහන්සේ විසින් 'උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය උදරෙ සංයතො සියා' යි කියා වදාරණ ලද්දේ ය. මහරජානෙනි, උදරයෙහි සංයතකාරී වූ පුද්ගලතෙම චතුරාර්යසත්‍යය ප්‍රතිවෙධය කරන්නේ ය. සෝවාන්ඵලාදී චතුර්විධ ශ්‍රාමණ්‍යඵලය සිද්ධ කරන්නේ ය. අර්ථ (252) ධර්ම නිරුක්ති ප්‍රතිභාන පටිසම්භිදා ය යි කියන ලද සිවුපිළිසිඹියාවෙහි ද, ප්‍රථමධ්‍යාන ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යානය යන සතර රූප-ධ්‍යාන හා ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය යන මේ අෂ්ටසමාපත්ති යෙහි ද, දිව්‍යචක්ෂුරභිඥනය, දිව්‍යශ්‍රොත්‍රඥනය, පරචිත්තවිජානනඥනය පූර්වෙනිවෙසානුස්මෘතිඥනය, අනෙකවිධ වූ ඍද්ධිවිධඥනය, සකල ක්ලේශයන්ගේ සිව් නැති කොට කැඩූ ආශ්‍රවක්ෂයකරඥනය යන ෂඩභිඥයෙහි ද වශීභාවප්‍රාප්ත වන්නේ ය. සියලු ම ශ්‍රමණධර්මය සම්පූර්ණය කරන්නේ ය.

''මහරජානෙනි, අතීතයෙහි නොයෙක් ලක්ෂගණන් ගිරාපොතකයෝ හිමාලයෙහි රැකිත් රුක දිඹුල්ඵල අනුභව කෙරෙමින් වාසය කෙරෙති. එක් ගිරාපොතකයෙක් තමන් වසන දිඹුල්රුක ම ඵලපත්‍ර අනුභව කෙරෙමින් නිමි කල සුඹුලු අනුභව කරමින් ගඟින් පැන් බී, අපිස් සතොස් ගුණය යි කියන ලද උදරයෙහි සංයතකාරී ව තාවතිංසභවනය දක්වා කම්පා කොට ශක්‍රදෙවෙන්ද්‍රයන් උපස්ථානයට ගෙන්වූයේ නො වේ ද? එකල ශක්‍රතෙම 'පාණ්ඩුකම්බලසිලාසනය හුණු වූයේ කාට වන් දුකකින් දෝ හො?' යි බලා අවුත් දිඹුල්රුක ක්ෂය නො වන ඵලපත්‍ර ලියලවා දී ගියේ ය. මහරජානෙනි, මෙබඳු වූ අනිකු දු බොහෝ කාරණයන් දැක භාග්‍යවතුන් වහන්සේ විසින් 'උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය උදරෙ සංයතො සියා' කියා වදාරණ ලද්දේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'අහං බො පනුදායි අප්පෙකදා ඉමිනා පත්තෙන සමතිත්තිකම්පි භුඤ්ජාමි. භිය්‍යොපි භුඤ්ජාමි' කියා යමක් වදාරණ ලද ද, ඒ වදාළ කාරණය සර්වඥ බොධිය පිණිස කොට නිමවන ලද කෘත්‍යයන් ඇත්තා වූ නිෂ්ඨාක්‍රියාවන් ඇත්තා වූ දීපංකරපාදමූලයෙහි දී සිතූ අර්ථය සිද්ධ කළා වූ වැස නිමවන ලද දීපංකරාදිබුද්ධානුශාසනාවන් ඇත්තා වූ කිසිවෙක ආවරණයක් නැත්තා වූ සියල්ල දත්තා වූ ස්වයම්භූඥන වූ අප තථාගතොත්තමයානන් වහන්සේ විසින් තමන් වහන්සේ උදෙසා ම වදාරණ ලද්දේ ය.

''මහරජානෙනි, යම් සේ වමනය කරවන ලද්ද වූ විරේකය කරවන ලද්ද වූ වස්තිකර්මය කරවන ලද්ද වූ රොගාතුරයාහට සප්පායක්‍රියාවෝ

1. වූයේ ය

Non-Commercial Distribution

කැමැති විය යුත්තාහු වෙද් ද, මහරජානෙනි, එපරිද්දෙන් ම 'ක්ලේශයන් සහිත ව පවත්නා වූ චතුස්සත්‍යධර්මය නො දක්කහු විසින් සතර පස් පිඩක් අහර නො වළඳා[1] පැන් බී සසරකතර ගෙවන්ට උත්සාහ කළ මැනැවැ' යි වදාළ අවවාද සිතට නභා ගෙණ උදරපොෂණයෙහි සංයම කට යුතු වන්නේ ය. තවද මහරජානෙනි, එසේ ම ඝනාන්ධකාරයෙහි හාත්පසින් සතර ගව්වක් ප්‍රමාණ තන්හි ආලොක කරන්නා වූ ප්‍රභා ඇත්තා වූ ජාතිමත් වූ උපන් තැන් පටන් ම අතිපරිශුද්ධ වූ චක්‍රවර්තිමාණික්‍ය රත්නයාගේ ඔප් නැගීම පිණිස මර්දන සංඝන ධොවනයෙන් කටයුත්තක් නො වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම සර්වඥබුද්ධවිෂයයෙහි පාරමිතා ධර්මයට පැමිණියා වූ තථාගතයන් වහන්සේගේ කෘත්‍යකරණයෙහි ආවරණයක් නො වන්නේ ය'' යි වදාළසේක. එකල රජ්ජුරුවෝ අතිප්‍රසන්න ව ''සාධු භන්තෙ නාගසෙන, එවමෙතං, තථා සම්පටිච්ඡාමි'' යි කීහ.

උදරසංයතප්‍රශ්නය නිමි.

---

## බක්කුලත්ථෙර ප්‍රශ්නය

**(253)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මම බාහිත කරණ ලද පාපයන් ඇති බැවින් බ්‍රාහ්මණ වූ යාචයොගී වූ සද පවිත්‍රහස්තයන් ඇති උත්තරිතරයෙකු විරහිත බැවින් අනුත්තර වූ ක්ලේශරොගයට වෛද්‍යාචාර්යයකු වැනි වූ ක්ලේශව්‍යාධියට ශල්‍යකර්තෘ නම් වෙදෙකු වැනි වූ අන්තිමදෙහධාරී වීමි' යි කියා මේ කාරණය වදරණ ලද්දේ ය. නැවත එම භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මාගේ අල්පාබාධික වූ ශ්‍රාවකභික්ෂූන් අතුරෙන් යම් මේ **'බක්කුලස්ථවිරතෙම අග්‍ර ය'** යි කියා මේ එතදග්‍රපාලිය වදරණ ලද්දේ ය. 'භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙහි ද බොහෝ වරෙක ආබාධ උපන්නේ ය' යි කියා ධර්මයෙහි දක්නා ලැබෙයි. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ අනුත්තර වූසේක් වූ නම්, එහෙයින් **'එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං අප්පාබාධානං යදිදං බක්කුලො'** යි කියා වදාළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් බක්කුලමහතෙරුන් වහන්සේ සියලු ම අල්පාබාධ තැනට අග්‍රසේක් වූ නම්, ඒ කාරණයෙන් 'අහමස්මි භික්ඛවෙ බ්‍රාහ්මණො යාචයොගො සද පයතපාණි අන්තිමදෙහධාරී අනුත්තරො භිසක්කො සල්ලකත්තා' කියා වදාළ ඒ වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතො-කොටිකප්‍රශ්නය ද නුඹවහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'අහමස්මි භික්ඛවෙ බ්‍රාහ්මණො යාචයොගො සද පයතපාණි අන්තිමදෙහධාරී අනුත්තරො භිසක්කො සල්ලකත්තා' යන මේ පාළියත් වදරණ ලද්දේ ම ය. 'එතදග්ගං

1. අහර පිඩු කොට වළඳා

Non-Commercial Distribution

භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං අප්පාබාධානං යදිදං බක්කුලො’ යි කියා මේ එතදග්‍රපාළියත් වදරණ ලද්දේ ය. ඒ වදළ කාරණය වනාහි තමන් වහන්සේ (තුළ) විද්‍යමාන වුව ද, ඉන් පිටත් වූ ආගමධරී වූ අධිගම ධාරි වූ පර්යාප්තිධර වූ ශ්‍රාවකයන් සඳහා වදරණ ලද්දේ ය.

‘‘මහරජාණෙනි, භාග්‍යවතුන් වහන්සේගේ ධ්‍යානචංකමික වූ ශ්‍රාවකයන් වහන්සේලා ඇති. ඒ සිටින සක්මන් කරණ භික්ෂූන් වහන්සේලා සිටීමෙන් සක්මන් කිරීමෙන් දිවාරාත්‍රියෙහි කල් යවා වදරණසේක්ලා ය. මහරජාණෙනි, භාග්‍යවතුන් වහන්සේ සිටීමෙන් සක්මනින් හිඳීමෙන් සයනය කිරීමෙන් දිවාරාත්‍රියෙහි කල් යවා වදරණසේක. මහරජාණෙනි, වක්ඛුපාලස්ථවිරාදි වූ යම් ඒ ධ්‍යානචංකමික භික්ෂු කෙනෙක් ඇද් ද, ඒ ශ්‍රාවකයෝ ඒ ගුණගණාංගයෙන් අතිරේක වූහ. මහරජාණෙනි, අප භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි එකාසනිකාංගය රක්ෂා කරණ භික්ෂූන් වහන්සේලාත් ඇත. ඒ භික්ෂූන් වහන්සේලා දිවිහිමි-යෙනුත් දෙවෙනි භොජනයක් නො වළඳනසේක්ලා ය. මහරජාණෙනි, භාග්‍යවතුන් වහන්සේ උදය වළඳා දෙවනුවත් කල් දක්වා තුන්වනුවත් ආහාර වළඳා වදරණසේක. මහරජාණෙනි, යම් ඒ එකාසනික භික්ෂූහු කෙනෙක් ඇද් ද, ඒ ශ්‍රාවකයන් වහන්සේලා ඒ ගුණගණාංගයෙන් වැඩි වූහ. මහරජාණෙනි, ඒ ඒ ශ්‍රාවකයන්ගේ ඒ ඒ කාරණයෝ අනෙකවිධ ය. ඒ කාරණය සඳහා වදරණ ලද්දේ ය. මහරජාණෙනි, අප භාග්‍යවතුන් වහන්සේ ශීල සමාධි ප්‍රඥ විමුක්ති විමුක්තිඥනදර්ශන දශබල චතුර්වෛශාරද්‍යඅෂ්ටාදශබුඩධර්ම ෂඩ්අසාධාරණඥනයෙන් අනුත්තර වූ සේක. සර්වඥවිෂය වූ සියලු (254) ධර්මයෙහි ද අග්‍රප්‍රාප්ත වූසේක. ඒ අනුත්තරභාවය සඳහා ‘අහමස්මි භික්ඛවෙ බ්‍රාහ්මණො යාචයොගො සදා පයතපාණි අන්තිමදෙහධාරි අනුත්තරො භිසක්කො සල්ලකත්තො’ කියා වදරණ ලද්දේ ය. මහරජාණෙනි, මේ ලොකයෙහි මනුෂ්‍යයන් අතුරෙන් එක්කෙනෙක්[1] උත්තම ජාති ඇති වන්නේ ය. එක්කෙනෙක් මහත් ධන සම්පත් ඇති වන්නේ ය. එක්කෙනෙක් විශෙෂවිද්‍යා ඇති වන්නේය. එක්කෙනෙක් නිර්මලශිල්ප ඇති වන්නේ ය. එක්කෙනෙක් අතිදක්ෂවන්නේ ය. එක්කෙනෙක් මහත් වූ ප්‍රඥව ඇත්තේ ය. මෙකී සියලු දෙන ම අභිභවනය කොට රජ්ජුරුවෝ ම ඒ සියලු දෙනාහට උතුම් වන්නෝ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම අප භාග්‍යවතුන් වහන්සේ සනරාමරසකල සත්වයන්ට අග්‍ර වූසේක. ජ්‍යෙෂ්ඨ වූසේක. ශ්‍රෙෂ්ඨ වූ වූසේක. මහරජාණෙනි, එපරිද්දෙන් ම යම් කාරණයකින් ආයුෂ්මත් වූ බක්කුලස්ථවිරයන් වහන්සේ අල්පාබාධික වූසේක් ද, ඒ කාරණය අභිනිහාර වශයෙන් සිඬ වූයේ ය.

1 ‘එකෙක්’ යි විය යුතුය. ‘එක් කෙනෙක්’ යි යෙදුනොත් අවසාන ක්‍රියාපදය බහුවචන විය යුතු ය.

Non-Commercial Distribution



ලොමස කස්සප තවුසා වෙතට චන්ද්‍රවතී කුමරිය යෑම. (296 පිටුව)

Non-Commercial Distribution

''මහරජානෙනි, ඒ බක්කුල මහතෙරහු මේ මහාභද්‍රකල්පයට එකාසංඛ්‍යකල්පලක්ෂයකින් යට ලොකයෙහි බුදු වූ අනොමදස්සි නම් බුදුන් දවස වෛද්‍යයයෙහි කෙළ පැමිණි බ්‍රාහ්මණයෙක් ව සියලු සැපත් හැර ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව පඤ්චඅභිඥ අෂ්ටසමාපත්ති උපදවා වසමින් අනොමදස්සි බුදුන්ගෙන් බණ අසා සරණ සිල් පිහිටා ධ්‍යාන සැපතින් කල් යවනුයේ ඒ අනොමදස්සි බුදුන්ට උපන්නා වූ උදරාබාධයට නානාප්‍රකාර බෙහෙත් සම්පාදනය කොට ආබාධය ගුණ කරවා බුදුන් වැඳ වැතිර 'ස්වාමිනි, ඔබ වහන්සේට කළා වූ මේ භෛෂජ්‍යක්‍රියා පුණ්‍යානුභාවයෙන් මා උපනුපන් ජාතියෙහි කිරිපීරක් දෝන කලු දු මට ශරීරව්‍යාධියක් නො වේව' යි කියා ප්‍රාර්ථනා කෙරෙමින් ඒ ආත්මභාව යෙන් චුත ව බ්‍රහ්මලොකයෙහි ඉපිද එකාසංඛ්‍යකල්පයක් මුළුල්ලෙහි දිව්‍යමනුෂ්‍ය (ලොක) දෙක්හි සැරිසරමින් පදුමුත්තර නම් බුදුන් සමයෙහි හංසවතී නම් නුවර ඉපිද වැඩිවිය පැමිණ දිනෙක පදුමුත්තර නම් බුදුන් විසින් සිවුවණක් පිරිස් මැද එක් භික්ෂූනමකට 'අල්පාබාධික භික්ෂූන්ට මේ තෙම අග්‍රය' යි කියා අග්‍රස්ථානාන්තර දෙන කල්හි අතිප්‍රසන්න ව 'මම ද අනාගතයෙහි මෙසේ ම බුදුකෙනෙකුන්ගේ ශාසනයෙහි අල්පා–බාධිකස්ථානාන්තරය ලබම්' යි ප්‍රාර්ථනා කොට දනශීලාදි බොහෝ කුසල් රැස් කෙරෙමින් දෙව්ලොව ඉපිද දිව්‍යසම්පත් වළඳමින් සසර සැරිසරා විපස්සි බුදුන් උපදනාට පෙරටු ව දෙව්ලොවින් අවුත් බන්ධුමතී නුවර බ්‍රාහ්මණකුලයෙහි ඉපද වැඩි විය පැමිණ සසර කලකිරි සියලු ම සැපත් හැර ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව ධ්‍යාන උපදවා හිමාලයෙහි වාසය කෙරෙමින් විපස්සි බුදුන් බුදු ව බණ වදරණ කල හිමාලයෙන් අවුත් බණ අසා පැහැද තිසරණ පිහිටා තමන් පැමිණි ධ්‍යානගුණය හැරපිය නො හැකි ව කලින් කලට බුදුන් කරා එන්නේ ය. එකල විපස්සි බුදුන් හා අග්‍රශ්‍රාවක යුගය හැර අටසැටලක්ෂයක් පමණ භික්ෂූන් වහන්සේට හිමාලය යෙහි විෂවෘක්ෂයන්ගේ මල් පිපී විෂමිශ්‍ර ව ආ වාතස්පර්ශයෙන් තෘණ පුෂ්පක නම් රොගයක් උපන්නේ ය. **(255)** ඒ දැක තපස්වීන් වහන්සේ තමන්ගේ ආනුභාවයෙන් නානාවිධ වූ බෙහෙත් රැස් කොට යොද භික්ෂූන් වහන්සේලාට වෛද්‍යක්‍රියා කෙළේ ය. ඒ ක්ෂණයෙහි ම සියලු ම භික්ෂූන් වහන්සේලා නිරොග වූහ.

''තපස්වීන් වහන්සේත් එයින් චුත ව බ්‍රහ්මලොකයෙහි ඉපද එකානු කපක් මුළුල්ලෙහි දිව්‍යමනුෂ්‍යසම්පත් වළඳා කාශ්‍යප නම් බුදුන් දවස බරණැස් නුවර ඉපද වැඩිවිය පැමිණ ඝරාවාසයෙන් යුක්ත ව වාසය කෙරෙමින් තමන්ගේ පුරාණ ගෙය ජීර්ණ ව ගිය හෙයින් 'නවගෘහයක් කෙරෙමි' යි සිතා නොයෙක් වඩුවන් හා බොහෝ දෙනෙකුන් පිරිවරා ගෙණ දැවදඬු පිණිස ප්‍රත්‍යන්තගමකට යනුයේ අතුරුමග ජීර්ණ ව දිරා ගිය මහාවිහාරයක් දැක 'අහෝ! මාගේ ගෘහකර්මාන්තය තිබේවා. මේ ආයර්‍යයන් වහන්සේලා ගේ විහාරය කරවා දෙමින් අනුගාමික වූ කුසල් *රැස් කෙරෙමි'යි* සිතා වනාන්තරයෙන් බොහෝ දරුසම්භාරයන් ගෙන්වා



*Non-Commercial Distribution*

ඒ ජීර්ණවිහාරය ඉවත් කොට මහපොහෝ ගෙයක් කෙළේ ය. භොජනශාලාවක් හා ගිනිහල්ගෙයක් කෙළේ ය. නොයෙක් විසිතුරු ගෘහපන්තියක් හා සක්මන්මළුවක් කෙළේ ය. පානීයශාලාවක් හා කැපකිළියක් කෙළේ ය. ආරොග්‍යශාලාවක් කෙළේ ය. ගම්භීරවූ වැසිකිළි-යක් කෙළේ ය. නොයෙක් කප්පියභාණ්ඩ හා අනෙකවිධ වූ බෙහෙත්බඩු සම්පාදනය කොට තබා මහාසංඝයාවහන්සේට සංඝාරාමය පූජා කෙරෙමින් දිවිහිමියෙන් කුසල් රැස් කොට දිව්‍යලොකයෙහි ඉපද එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි දිව්‍යමනුෂ්‍යශ්‍රී සම්පත් අනුභව කෙරෙමින් අප බුදුන් සමයෙහි **කොසඹෑනුවර** සිටු කුලයෙක උපන්හ.

''ඔහු උපන් දවස් පටන් ඒ සිටුකුලය ලාභාග්‍ර යශොග්‍ර ප්‍රාප්ත විය. මවුකුසින් බිහි වූ පුත්‍රයා දක මෑනියෝත් 'මා පුතනුවෝ මහපින් ඇති කෙනෙක. යම් තාක් කල් නිරොග ව දීර්ඝායුෂ්ක ව වෙසෙත් නම්, ඒ තාක් කල් අපට මහසැපත් සිඬ කෙරෙති' යි සිතා උපන් දවස් ම **මහායමුනා** නම් ගඟින් නැහැ වූ කුමාරයෝ දීර්ඝයුෂ්ක වෙති' යි යනු අසා නහවනු පිණිස මහපෙරහරින් යැවූහ. කිරිමෑනියන් විසින් කුමාරයා මහගඟ ගලගලා නහවන කල්හි 'ගොදුරකැ'යි සිතා මහාමත්ස්‍යයෙක් දිව අවුත් ගිලපිහ. කුමාරයාගේ පුණ්‍යානුභාවයෙන් කිසි දුකක් හෝ අන්තරායක් නො වී ය. ස්වර්ණමැදුරකට වන් කල මෙන් විය. කුමාරයාගේ තෙජොනුභාවයෙන් මත්ස්‍යතෙම රත් වූ හීවැලක් ගිලපු කලක් මෙන් ලය දවා ගෙණ මහත් වෙගයෙන් තිස්යොදුනක් ගෙවා ගොස් **බරණැස්නුවර** **කෙවුළන්ගේ** දැලෙක වැටී මළේ ය. කෙවුළෝ මහමසු දක උගුලා කදින් ගෙණ යමින් දුටු දුටුවන්ට 'කහවණු දසයකට දෙම්හ' යි කියකියා වීථියෙහි ඇවිදිමින් අසූකොටියක් ධන ඇති දරුවන් නැති සිටුගෙයකට දී කහවණුවක් ගෙණ ගියාහ. ඒ ගෙය සිටු භාර්යාවෝ ද එදවස් මසු දක ලහට අවුත් ශස්ත්‍රයෙන් මසු පිට සෙමෙන් මස් කෙරෙමින් මසුබඩ හුන් ස්වර්ණවර්ණකුමාරයන් දක ප්‍රීතියෙන් පිණා 'මම ස්වර්ණවර්ණ වූ පුතනු කෙනෙකුන් ලද්දෙමි' යි මහත් කොට හඬ ගසා කුමාරයා වඩා ගෙණ සිටානන් ලහට ගියාහ. සිටානෝ ද මහත් වූ ප්‍රීතියට පැමිණ නුවර බෙර හසුරුවා මහපෙරහරින් ගෙණ ගොස් **බරණැස්රජුහට** දක්වූහ. බරණැස්රජ ද ප්‍රසන්න ව 'මහ සිටානෙනි, මොහු මහපිණැති කෙනෙක. මහපෙරහරින් පොෂ්‍ය කරව' යි නියොග කෙළේ ය.

''එකල කොසඹැ (256) නුවර සිටුභාර්යාවෝ 'බරණැස් නුවර අපුත්‍රකසිටුභාර්යා කෙනෙක් මසෙකු බඩින් රන්වන් පුතනු කෙනෙකුන් ලද්දෝ' යි යනු අසා මහසෙනහ සමගින් වහා ගොස් පුත්‍රයානන් දක හැඳින 'මාගේ පුත්‍රයා ය, මාගේ පුත්‍රයා ය' යි ඔවුනොවුන් විවාද වඩා ගෙණ දෙගොල්ල ම රජ්ජුරුවන් කරා ගොස් පැමිණියාහු ය. රජ්ජුරුවන් වහන්සේ ද ඔවුන්ගේ විවාදය තත් වූ පරිද්දෙන් විනිශ්චය කොට 'මැ තම දසමාසයක් ම උසුලා ගෙණ වැදූ හෙයින් අමාත්‍ය කරන්ටත්

Non-Commercial Distribution

නඩු නැත්තේ ය, මැ තම මව්කුසින් නො දරුවත් මිල දී ගත් මත්ස්‍යයකු ගෙන් ලැබූ හෙයින් අමාත්‍ය කරන්වත් නඩු නැත්තේ ය. එහෙයින් දෙසිටු ගෙවල ධනසම්පත්තියට මොහු දයාදපුත්‍ර වූහ. 'මුරයෙන් මුරය මොහු පොෂ්‍ය කළ මැනැවැ' යි කියා භාර දුන්හ.[1] එකල දෙනුවර සිටුවරු දෙදෙන ම ප්‍රසන්න ව මහත් වූ ප්‍රේමයෙන් පොෂ්‍යය කෙරෙති. කුමාරයාගේ ද පුණ්‍යානුභාවයෙන් ඒ සිටුවරුන් දෙදෙනාගේ යසලාභ සම්පත් වැඩෙන් තේ ය. 'ඔහු සිටුකුලයන් දෙදෙනෙකුන්ගේ පොෂ්‍යයෙන් වැඩුනු හෙයින් බක්කුලකුමාරයා ය' යි කියා දඹදිව්තලෙහි ප්‍රසිද්ධ වූහ. ඒ බක්කුලකුමාර යන තන්හි **'ද්වෙ කුලානි අස්සාති ද්වක්කුලො'** යි කිය යුතු තැන අන්‍යාර්ථ සමාසවිෂයෙහි **'බා වත්තාළීසාදෙ'** යන සූත්‍රයෙන් ද්විශබ්දයහට බකාරා-දෙශ කොට 'බක්කුල කුමාර ය' යි කියා ව්‍යාකරණකර්තෘහු අර්ථ කියති. ඒ කුමාරතෙම වැඩී විය පැමිණි කල්හි ඕහට දෙනුවර සප්තභූමකප්‍රාසාද තුණ තුණ බැවින් සයක් වෙති. එහි දෙවඟනන් වැනි නරඟනෝ දිව්‍යමය සුවපහස් ගෙණ නිති පතා රැක හිඳිති. ඒ නාටකස්ත්‍රීන් පිරිවරා එකෙක නුවර සාරමසක් සාරමසක් බැගින් සම්පත් අනුභව කරන්නේ ය. නුවරින් නුවර යන මාර්ගය ද **මහාමහී** නම් මහගඟ පිටින් මහනැවපිට විසිතුරු මණ්ඩප යෙන් දෙවඟනන් වැනි නරඟනන් සමගින් මහාසම්පත් විඳිමින් සාර මසකින් එක් නුවරකට යන්නේ ය. ඒ නුවර වාසීහු මහනැව්පිටින් දෙමාසයක් පෙරමගට ගොස් මහපෙරහරින් වඩා යෙති. මෙසේ මහත් වූ ඓශ්වර්ය ශ්‍රී සම්පත් අනුභව කරන්නා වූ බක්කුලමහසිටානන්ට අසූ හවුරුද්දෙක් අතික්‍රාන්ත වී ය. එවකට අප භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ ලොවුතුරා බුද්ධරාජ්‍යයට පැමිණ ලෝවැඩ පිණිස දනවු සැරිසරා වඩනාසේක් **කොසඹෑ**නුවරට වැඩ වදළසේක.

''එකල **බක්කුල**මහසිටානෝ ද ගඳදුම්මල්පහන් ගත් අත් ඇති ව බුදුන් කරා ගොස් බණ අසා පැහැද සියලු සැපත් හැර මහණ ව සිවුපිළි-සිඹියාපත් රහත් වූසේක. එකල්හි ද බක්කුල මහතෙරුන් වහන්සේගේ දෙනුවර පුරාණ දුතියිකාවරු අඩමස අඩමස බැගින් මාහැඟි වූ චීවරාදී සිවුපසයෙන් උපස්ථාන කළාහු ය. ඒ බක්කුල මහතෙරුන් වහන්සේට අසූහවුරුද්දක් මුළුල්ලෙහි ගිහිගෙහි වසන කලත් අසූහවුරුද්දක් මහණ ව වසන කලත් ඇඟිල්ලෙන් සුවඳපිඩක් ගෙණ ඉඹපියන මාත්‍ර කාලයකු දු කිසි ආබාධයෙක් නම් නො වී ය. මෙසේ අල්පාබාධ වීමට නිසි වූ මහත් කුසල් කළ බැවින් නීරොගබවට පැමිණිසේක. එහෙයින් අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛුනං අප්පා-බාධානං යදිදං බක්කුලො' කියා මේ අර්ථය වදරණ ලද්දේ ය.

''මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේට ව්‍යාධියන් උපදනා කල්හි ද නො උපදනා කල්හි ද ධුතාංගසමාදන වශයෙන් ග්‍රහණය කරණ කල්හි ද
**(257)** නො කරණ කල්හි ද භාග්‍යවතුන් වහන්සේ හා සදෘශ වූ කිසි සත්ව

1. දුන්නේ ය.

Non-Commercial Distribution

කෙනෙක් සමස්තලොකයෙහි ම නැත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය ත්‍රෛලොක්‍යස්වාමී වූ දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් සංයුත්තනිකායවරලාඤ්ඡනයෙහි ද වදරණ ලද්දේ ය. හේ මෙසේ යි:—'යාවතා භික්ඛවෙ සත්තා අපදා වා ද්විපදා වා' යනාදීන් 'මහණෙනි අපද වූ හෝ ද්විපද වූ හෝ චතුෂ්පද වූ හෝ බහුප්පද වූ හෝ රූපී වූ හෝ අරූපී වූ හෝ සඤ්ඤී වූ හෝ අසඤ්ඤී වූ හෝ නෙවසඤ්ඤීනාසඤ්ඤී වූ හෝ යම් පමණ සත්වකෙනෙක් ඇද් ද, ඒ සකල සත්වයන්ට ම තථාගතත්-වාදිගුණයෙන් යුක්ත වූ අර්හත්සම්‍යක් සම්බුද්ධ සර්වඥයන් වහන්සේ අග්‍ර ය යි කියනු ලැබෙයි' යන මේ ශ්‍රී මුඛපාලිය ගෙණ හැර දක්වා වදළ සේක. එකල්හි රජ්ජුරුවෝ "සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ප්‍රශ්නය එපරිද්දෙන් ම පිළිගන්නෙමි" යි කීහ.

බක්කුලත්ථෙරප්‍රශ්නය නිමි.

---

# නිර්වාණමාර්ගප්‍රශ්නය

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතතෙම නූපන් මාර්ගය[1] උපදවන සුලුසේකැ' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. නැවත ද, එම භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මම පූර්ව වූ සම්‍යක් සම්බුද්ධයන් විසින් හැසුරුණා වූ 'පුරාණ අඤ්ජසය යි කියන ලද පුරාණ මාර්ගය දුටුයෙමි' යි කියා වදරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙන-යන් වහන්ස, තථාගතයන් වහන්සේ නූපන් මාර්ගය[1] උපදවනසුලු සේක් වූ නම්, ඒ කාරණයෙන් 'අද්දසං ඛො අහං භික්ඛවෙ පුරාණං මග්ගං පුරාණං අඤ්ජසං පුබ්බකෙහි සම්මාසම්බුද්ධෙහි අනුයාතං' කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් 'අද්දසං ඛො අහං භික්ඛවෙ පුරාණං මග්ගං පුරාණං අඤ්ජසං පුබ්බකෙහි සම්මාසම්බුද්ධෙහි අනුයාතං' කියා වදරණ ලද්දේ සැබෑ වී නම්, එහෙයින් 'තථාගතො භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා' කියා වදළ ඒ වචනය බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය"යි කීහ.

"මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'තථාගතො භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා' කියා මෙම කාරණයත් වදරණ ලද්දේ ය. නැවත ද, 'අද්දසං ඛො අහං භික්ඛවෙ පුරාණං මග්ගං පුරාණං අඤ්ජසං පුබ්බකෙහි සම්මාසම්බුද්ධෙහි අනුයාතං' කියාත් වදරණ ලද්දේ ම ය. ඒ වදළ කාරණද්වයය මත්

1. මාර්ගයාගේ

Non-Commercial Distribution

ස්වභාවවචනයෙක් ම ය. මහරජානෙනි, පූර්වතථාගතයන් වහන්සේලාගේ අන්තර්ධාන වීමෙන් අනුශාසනා කරණ මාර්ගදෙශකයන් නැති කල්හි ආර්යමාර්ගය අන්තර්ධාන වි ය. සිඳුනා වූ නැසුනා වූ ගුළ්හ වූ වැසුනා වූ ප්‍රතිච්ඡන්න වූ අසංවරණ වූ ආර්යමාර්ගය තථාගත වූ ඒ අප බුදුරජානන් වහන්සේ චතුස්සත්‍යය දක්නා ප්‍රඥාචක්ෂුසින් සම්මර්ශනය කර වදරණ සේක් 'පූර්ව සම්‍යක්සම්බුද්ධයන් විසින් ගිය මාර්ගය මේය' යි **(258)** කියා දැක වදළසේක. ඒ කාරණයෙන් 'අද්දසං ඛො අහං භික්ඛවෙ පුරාණං මග්ගං පුරාණං අඤ්ජසං පුබ්බකෙහි සම්මාසම්බුද්ධෙහි අනුයාතං' යන මේ පාළිය වදළසේක. මහරජානෙනි, පූර්ව තථාගතයන්ගේ අන්තර්ධානය වීමෙන් අනුශාසක වූ ශ්‍රාවකයන් නැති කල්හි යම් ආර්යමාර්ගයක් සිඳී ගියේ ද, නැසී ගියේ ද, ගුළ්හ වී ද, පිහිත වී ද, ප්‍රතිච්ඡන්න වී ද? ඒ ආර්ය මාර්ගය මෙසමයෙහි දූන් අප තථාගතයන් වහන්සේ ලොකයෙහි හැසිරීම කර වදළසේක. උපදවා වදළසේක. ඒ කාරණයෙන් 'තථාගතො භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා' කියා වදළසේක.

''තව ද, මහරජානෙනි, මේ ලොකයෙහි චක්‍රවර්තිමහරජානන් අන්තර්ධාන වීමෙන් මාණික්‍යරත්නය වෙපුල්ලපර්වතශිඛරාන්තරයෙහි සැඟවී යන්නේ ය. අනික් චක්‍රවර්තිමහරජානකෙනෙකුන්ගේ මනා ව චක්‍රවර්තිවත් පිරීමෙන් මාණික්‍යරත්නය අහසින් අවුත් සමීපයට පැමිණෙන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ මාණික්‍යරත්නය ඒ පශ්චිම චක්‍රවර්තිරජහු විසින් නිර්මිත කරණ ලද්දේ ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, ඒ මාණික්‍යරත්නය විද්‍යමාන වූ ප්‍රකෘතියක් ම ය. ස්වාමීනි, ඒ චක්‍රවර්තිරජහු විසින් වනාහි උපදවන ලදූ'' යි[1] කීහ. ''මහ රජානෙනි, එපරිද්දෙන් ම ප්‍රකෘතික වූ අෂ්ටාංගිකනිර්වාණමාර්ගය පූර්ව තථාගතයන් විසින් නො හැර පුරුදු කරණ ලද්දේ ය. අනුශාසක වූ පුද්ගලයන් නැති කල්හි ලුග්ග වි ය. පලුග්ග විය, ගුළ්හ වි ය, පිහිත වි ය, ප්‍රතිච්ඡන්න වි ය, අසංවරණ වි ය. 'තථාගතො භික්ඛවෙ අරහං සම්මා සම්බුද්ධො අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා' කියා වදළසේක.

''තව ද, මහරජානෙනි, යම් සේ විද්‍යමාන වූ ම පුත්‍රයා යොනිමාර්ග යෙන් උපදවා මැනියෝ 'ජනිකාවය' යි කියනු ලැබෙත් ද,[2] මහරජානෙනි, එපරිද්දෙන් ම අප තථාගතයන් වහන්සේත් ලුග්ග වූ පලුග්ග වූ ගුළ්හ වූ ප්‍රතිච්ඡන්න වූ අසංවරණ වූ පෙරත් ඇත්තා ම වූ නිර්වාණමාර්ගය ප්‍රඥා චක්ෂුසින් සම්මර්ශනය කර වදරමින් උපදවා වදළසේක. හැසිරීම කර වදළසේක. ඒ කාරණයෙන් 'මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ නූපන් මාර්ගය උපදවන සේකැ' යි කියා වදළසේක.

---

1. 'තෙන පන නිබ්බත්තං' 'ඒ සක්විතිරජහු නිසා පහළ වී ය' යි විය යුතු ය.
2. ලැබෙයි.

*Non-Commercial Distribution*

''තව ද, මහරජානෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක් නටුවා වූ යම් කිසි වස්තුවක් දුටුයේ වී නම්, ඒ පුරුෂයා විසින් ඒ භාණ්ඩය උපදවන ලදැ යි කියා ලොකවාසි සත්වතෙම කියන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ ලුග්ග පලුග්ග වූ ගුළ්හ පිහිත වූ ප්‍රතිච්ඡන්න අසංවරණ වූ පෙරත් ඇත්තා ම වූ මාර්ගය ප්‍රඥාචක්ෂුසින් සම්මර්ශනය කෙරෙමින් උපදවා වදාළසේක. සංවරණය කර වදාළසේක. ඒ කාරණයෙන් 'මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ නූපන් මාර්ගය උපදවන සේකැ' යි කියා වදාළසේක.

''තව ද, මහරජානෙනි, යම් සේ කිසි පුරුෂයෙක්තෙම වනාන්තරය කොටා පායා ශුද්ධ කොට භූමිය ආවරණය කර ගන්නේ ය. ඒ භූමිතොම ඒ පුරුෂයාගේ ය යි කියා ලොකවාසී ජනතෙම ව්‍යවහාරය කරන්නේ ය. ඒ භූමිතොම ඒ පුරුෂයා විසින් සම්බ කරණ ලද්දේත් නො වේ ම ය. ඒ භූමිය ශුද්ධ කෙරීම් ආදි කටයුතු කොට භූමිස්වාමික නම් වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ සිඳී ගියා වූ නැසී ගියා වූ ගුළ්හ වූ පිහිත වූ ප්‍රතිච්ඡන්න වූ සංවරණයක් නැත්තා වූ පූර්වයෙහිත් ඇත්තා ම වූ නිර්වාණමාර්ගය ප්‍රඥාචක්ෂුසින් දැක **(259)** උපදවා වදාළසේක. ලොකයෙහි හැසිරීම කර වදාළසේක. ඒ කාරණයෙන් අප තථාගතයන් වහන්සේ 'මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ තථාගත තෙම නූපන් මාර්ගය[1] උපදවන සේකැ' යි කියා වදාළසේක. මහරජානෙනි, පූර්ව තථාගතයන් සමයෙහිත් මේ නිර්වාණමාර්ගය ඇතැ'' යි වදාළසේක.

''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ප්‍රශ්නය නුඹ වහන්සේ වදාළ පරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

**නිර්වාණමාර්ගප්‍රශ්නය නිමි.**

---

# ලොමසකාශ්‍යපප්‍රශ්නය

''භන්තෙ, නාගසෙන, භාග්‍යවතුන් වහන්සේ විසින් 'පූර්වයෙහි මම මනුෂ්‍යභූත වූයේ සත්වයන්ට වෙහෙස නො කරණ සුලු වීමි' යි කියා මෙම කාරණය වදාරණ ලද්දේ ය. නැවත ද, '**ලොමසකාශ්‍යප** නම්, සෘෂි වූයේ නොයෙක් සියගණන් ප්‍රාණයන් නසා යාගය කළ යුතු වූ මහායාගයක් කෙළේ[2] යි' කියාත් වදාරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'පුබ්බෙවාහං මනුස්සභූතො සමානො සත්තානං අවිහෙඨකජාතිකො අහොසිං' කියා වදාරණ ලද්දේ සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'ලොමසකස්සපෙන ඉසිනා අනෙකසතෙ පාණෙ ඝාතයිත්වා වාජපෙය්‍යං මහායඤ්ඤං යජිතං' කියා වදාළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'ලොමසකස්සපෙන

1. මාර්ගයාගේ
2. යාගයක් කරණ ලද්දේ

Non-Commercial Distribution

ඉසිනා අනෙකසතෙ පාණෙ ඝාතයිත්වා වාජපෙය්‍යං මහායඤ්ඤං යජිතං' කියා වදාළ වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'පුබ්බෙවාහං මනුස්සභූතො සමානො සත්තානං අවිහෙඨකජාතිකො අහොසිං' කියා වදාළ ඒ වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'පුබ්බෙවාහං මනුස්සභූතො සමානො සත්තානං අවිහෙඨකජාතිකො අහොසිං' යන මේ වචනයත් වදාරණ ලද්දේ ය. 'ලොමසකාශ්‍යප නම් ඍෂීන් වහන්සේ විසින් නොයෙක් සියගණන් ප්‍රාණයන් නසා කළ යුතු වූ මහායාගය යදින ලද්' යි කියාත් වදාරණ ලද්දේ ම ය. ඒ යාගයට පටන් ගත් කාරණය වනාහි රාගවශයෙන් විසංඥ වෙමින් විෂමචෙතනාවකින් නො වන්නේ ය''[1] යි වදාළසේක. ''එසේ ය, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස,' මේ පුද්ගලයෝ අටදෙනෙක් පරප්‍රාණය නසති. ඒ කවර අටදෙනෙක් ද? යත්:— රාගයෙන් නැවුනු පුරුෂතෙම රාගවශයෙන් පරප්‍රාණය නසන්නේ ය. ද්වෙෂයෙන් දූෂිත පුරුෂතෙම ද්වෙෂවශයෙන් පරප්‍රාණය නසන්නේ ය. මොහයෙන් මුළා වූ පුරුෂතෙම මොහවශයෙන් පරප්‍රාණය නසන්නේ ය. මානයෙන් නැවුනු පුරුෂතෙම මානයෙන් පරප්‍රාණය නසන්නේ ය. ලොභීපුරුෂතෙම ලොභ වශයෙන් පරප්‍රාණය නසන්නේ ය. කිසි ධනයක් නැති අකිංචන පුරුෂයා තමාගේ ජීවිකාර්ථය පිණිස පරප්‍රාණය නසන්නේ ය. බාල වූ ළදරුතෙම සිනා වශයෙන් පරප්‍රාණය නසන්නේ ය. පෘථිවිශ්වර රජ තෙම ලොකයා හික්මවාලීම් වශයෙන් පරප්‍රාණය නසන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙකී පුද්ගලයෝ අටදෙන පරප්‍රාණය නසන්නාහු ය.

**(260)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, **ලොමසකාශ්‍යප** වූ බොධිසත්වයන් වහන්සේ විසින් ප්‍රකෘතියක් ම කරණ ලද්'' යි කීහ. ''මහරජානෙනි, බොධිසත්වයන් වහන්සේ විසින් ප්‍රකෘතියක් කරණ ලද්දේ නො වෙයි. මහරජානෙනි, ඉදින් බොධිසත්වයන් වහන්සේ ප්‍රකෘතිභාවයෙහි සිටිසේක් වූ නම්, ඒ මහායාගය යදින්නට නො නැමෙන සේක. මේ ගාථාව ද නො කියනසේක.

**'සසමුද්දපරියායං–මහිං සාගරකුණ්ඩලං,**
**න ඉච්ඡෙ සහ නින්දාය–එවං සක්ක විජානහි' යි.**

'මහරජානෙනි, **ලොමසකාශ්‍යප** නම් ඍෂීන් වහන්සේගේ ශීල සමාධ්‍යාදි තපොතෙජසින් ශක්‍රයාගේ පාණ්ඩුකම්බලශෛලාසනය හුණු වී ය. එකල ශක්‍රදෙවෙන්ද්‍රතෙම 'මේ කවර කාරණයක් දෝ හො' යි කියා දහසක් නුවණැසින් මුළුලොව බලා මහාබොධිසත්වයන් දැක භයින් තැති ගෙණ 'මේ තෙම මා ශක්‍රසම්පත්තියෙන් පහ කෙරේ දෝ? හො' යි

---

1. 'රාගවසෙන විසඤ්ඤිනා නො සචෙතනෙන' යන පාළි පාඨයෙහි මේ පරිවර්තනය වැරදි යි. 'ඒ වනාහි රාගවශයෙන් විසංඥවූවහු විසින් කරණ ලද්දකි. චෙතනා සහිත වූවහු නො වේ.' යනු එහි අදහස යි.

*Non-Commercial Distribution*

කියා මොහයෙන් මුළා ව ශීලවිනාශය කරවනු පිණිස **ශක්‍රභවනයෙන්** අන්තර්ධාන වෙමින් **බරණැස්** රජ්ජුරුවන්ගේ සයනසරයෙහි පෙණී සිට 'මහරජ, 'මම **ශක්‍රදෙවෙන්ද්‍රයෙමි**, තෙපි සියලු ම පෘථිවිතලයට අධිපති ව **ශක්‍රදෙවෙන්ද්‍ර**විලාශයෙන් රාජ්‍යශ්‍රීසම්පත් විඳිනු කැමැත්තහු නම්, **හිමාල** යෙහි වසන **ලොමසකාශ්‍යප** නම් ඍෂීන් ගෙන්වා ඇතුන් පටන් සර්ව චතුෂ්පදික සතුන් නසා මහායාගයක් කරව' යි කියා අවවාද කොට ගියේ ය.

''එවිට බරණැස් රජ්ජුරුවෝ ද 'යහපත, **ශක්‍ර**දෙවෙන්ද්‍රයන් වහන්සැ'යි කියා නුවර බෙර හසුරුවා **හිමාලයට** යන මාර්ගොපදෙශක වැද්දක්හු ලදින් ඔහු හා **සය්හ** නම් මහාමාත්‍යයෙකු යවූහ. ඒ අමාත්‍යයා මහාබොධි-සත්වයන් කරා ගොස් වැඳ වැතිර, 'ස්වාමීනි, **ලොමසකාශ්‍යපයානන්** වහන්ස, අප **බරණැස්** මහාරාජෝත්තමයානන් වහන්සේ චතුෂ්පදික මහායාගයක් කරවා සියලු ම පෘථිවිතලයට රජ වනු කැමැති ව නුඹවහන්සේ ලවා යාග කරවා නුඹ වහන්සේට කැමැති සැපයක් දෙන සේ මා එවූසේක. මා හා සමග වැඩිය මැනවැ' යි කී කල්හි '**සය්හයෙනි**, සතරමහාසාගරය පිරිවරා සිටි චක්‍රවාටපර්වතය හා සතරමහදිවයින වටා පිහිටි මුහුද කරණ කොට ගෙණ කර්ණලතායෙහි තැබූ කුණ්ඩලාභරණයක් වැනි වූ චක්‍රවාටය මධ්‍යගත සියලු ම පෘථිවිතලයෙහි රාජ්‍යසම්පත්තිය උතුම් තපොගුණයක් හැර ලාමක වූ රජසැපතට පැමිණියේ ය' යි ලොකයා කරණ නින්දවෙන් යුක්ත ව[1] නො කැමැත්තෙමි. 'මෙසේ දැන ගණුව' යි කියා මේ ගාථාව වදළසේක් නො වේ ද?

''මහරජානෙනි, මෙබඳු වාදී වූ බොධිසත්වයන් වහන්සේ **චන්ද්‍රවතී** නම් රාජකන්‍යාව දැකීම හා සමග රාගවශයෙන් විසංඥ වූසේක. පඤ්චෙන්-ද්‍රියයන් බිඳීමෙන් සිත වික්ෂිප්ත කළ[2] සේක. රාගයෙන් රත් වූ සේක. සංඥවගේ විපර්යාසයට පැමිණිසේක.[3] ආකුලාකුල වූසේක. වහවහා (කරන්නෙක්) වූසේක. ඒ වික්ෂිප්ත භ්‍රාන්ත ලුලිත සිතින් මහත් වූ මහා චතුෂ්පදඝාත වූ ආශිවිෂයකු වුවත් අතින් අල්වා ගන්නේ ය. මත්තහස්තියා සමීපයට නො බා ව ම යන්නේ ය. පරතෙරක් නො දැක මහාසමුද්‍රයටත් පනින්නේ ය. ග්‍රීෂ්මකාලයෙහි නොයෙක් පණුවන් පැයෙන ගවරවළ ද, ගම්දෙර නොයෙක් කුණු දමන ඔලිගල්ලය ද, පයින් මැඩ ඇවිදින්නේ ය. කටු සහිත ප්‍රදෙශයට ද නඟින්නේ ය. ප්‍රපාතයෙහි ද පනින්නේ ය, අසූචිය ද අනුභව කරන්නේ ය, නග්න **(261)** වූයේ ද වීථියෙහි ඇවිදින්නේ ය, අනෙකප්‍රකාර වූ අනිකුදු බොහෝ අකර්තව්‍යය කරන්නේ ය, මහරජානෙනි, එපරිද්දෙන් ම බොධිසත්වයන් වහන්සේ **බරණැස්**රජ්ජුරුවන්ගේ දූවනියන් වූ **චන්ද්‍රවතී** නම් රාජකන්‍යාව දැකීම හා සමග ම විසංඥ වූසේක. චිත්ත වික්ෂෙප වූසේක, විපර්යාස වූසේක, ආකුල වූසේක, ඒ වික්ෂිප්ත භ්‍රාන්ත ලුලිත චිත්තයෙන් මහත් වූ මහාපසුඝාතන ගලරුධිර රාසියක් වන්නා වූ මහායාගයක් කළසේක. මහරජානෙනි, වික්ෂෙප වූ උමතුසිතින් කරණ

1. යුක්ත වනු 2. වූ 3. විපර්යාසය වූ සේක.

Non-Commercial Distribution

ලද අකුශලකර්මය දෘෂ්ටධර්මයෙහිත් මහත් සාවද්‍ය නො වන්නේ ය. පරලොව විපාක දෙන තන්හි ද, එසේ ම මහත් නො වන්නේ ය. මහරජාණෙනි, මේ ලොකයෙහි කිසි උම්මත්තකයෙක් තෙම වරදකට පැමිණියේ වී නම්, ඕහට තෙපි කවර දඬුවමක් පනවන්නහු ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, උම්මත්තකයාහට කවර දඬුවමක් වේ ද? අපි ඕහට තළවා පහ කරවා ලවම්හ, ඔහුට දඬුවම් මෙපමණ ය'' යි කීහ.

''මහරජාණෙනි, මෙසේ වනාහි උම්මත්තකයාගේ අපරාධය යි දඬුවමකුත් නො වන්නේ ය. එහෙයින් උම්මත්තකයා විසින් කළ කෘත්‍ය යෙහි ද දෙෂයෙක් නො වන්නේ ය, පිළියම් කළ නො හැකි වන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම **ලොමසකාශ්‍යප** නම් ඍෂීන් වහන්සේ **චන්ද්‍රවතී** නම් රාජකන්‍යාවගේ දර්ශනය හා සමග ම විසංඥ වූසේක. වික්ෂිප්ත සිත් ඇති වූසේක, රාගයෙන් රත් වූසේක, විපර්යාස වූසේක, පතළා වූ කාමතෘෂ්ණාවට පැමිණියේ ය, කාමතෘෂ්ණාවෙන් ආකුලාකුල වූයේ ය, එම තෘෂ්ණාවෙන් වහවහා යොමු වූයේ ය, ඒ වික්ෂිප්ත භ්‍රාන්ත ලුලිත චිත්තයෙන් මහත් වූ මහාපසුඝාතන ගලරුධිරරාශියක් වූ වාජපෙය්‍ය නම් මහායාගය කළසේක.

''තව ද, **ලොමසකාශ්‍යප** නම් ජාතකයෙහි **ශක්‍රදෙවෙන්ද්‍රයෝ** නැවතත් පෙර සෙයින් ම බරණැස් රජ්ජුරුවන් කරා අවුත් 'මහරජ, **ලොමස කාශ්‍යපයානන්** ගෙන්වන උපායක් කියමි. තොපගේ **චන්ද්‍රවතී** නම් කුමාරිකාවන් සරහා යවා ලොමසකාශ්‍යපයන් ගෙන්වා යාගය කරව'යි කීහ. ඒ අසා බරණැස් රජ්ජුරුවෝ තමන් **චන්ද්‍රවතී** නම් දූවනියන් දෙවහනක සේ සර්වාභරණයෙන් සරහා ලවා මහපිරිවරින් **සය්හ** නම් ඇමතියා හා සමග හිමාලයට හැරියාහ. **සය්හ** නම් අමාත්‍යයා මහාබොධි- සත්වයන් වැඳ ගෙණ, 'ස්වාමීනි, අපගේ බරණැස් රජ්ජුරුවෝ වාජපෙය්‍ය නම් මහායාගය කරවා නුඹ වහන්සේට මේ **චන්ද්‍රවතී** නම් කුමාරිකාවන් හා අර්ධරාජ්‍ය සම්පත්තිය දෙන සේ මා ආරාධනාවට එවූසේකැ' යි කී කල්හි ඉඳුරන් බිඳ **චන්ද්‍රවතී** කුමාරිකාවන් මුහුණ දැකීමෙන් ම සියලු ම ධ්‍යානගුණයෙන් පිරිහී කාමූම්මත්තක ව බරණැස්නුවර කරා ගොස් රාජ විධානයෙන් කළ මහායාගශාලායෙහි ඇත් අස් ගව මහිස මෘගාදී නොයෙක් සිවුපා සතුන් බන්ධනය කරවා ප්‍රථම යාගස්තම්භයෙහි බැඳි මංගලහස්ති රාජයා ඝාතනය කරණු පිණිස කඩුව ඔසවා ඝාතනයට ආරම්භ කළසේක. ඒ දැක හස්තිරාජතෙමේ මරණ භයින් තැති ගෙණ මහහඬින් ගුගුළේ ය. ඒ අසා සර්වචතුෂ්පදික සත්වයෝ ම මරණ භයින් එකවිට ම මහහඬින් හැඬූහ. එකල මහබෝසතානෝ කළකිරි අඳුන්දිවිසම් කක්ෂලොම ජටාමඬුලු දැක 'අප වැනි තපස්වීන්ට මේ සුදුස්සෙක් නො වන්නේ ය' යි සිතා කඩුව දමා යම් කලෙක ප්‍රකෘති සිත් වූසේක් ද, මනා වූ සිහිය ලැබූසේක් ද, එකල්හි නැවතත් ප්‍රව්‍රජිතධර්මය පුරා හිමයට **(262)** වැඩ

1. වූයේ ය.

Non-Commercial Distribution

පඤ්චඅභිඥා උපදවා වාසය කොට 'නො පිරිහුණා වූ ධ්‍යානයෙන් බ්‍රහ්ම ලොකූපගත වූසේකැ' යි වදළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ප්‍රශ්නයත් එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**ලොමසකාශ්‍යපප්‍රශ්නය නිමි.**

---

# ජොතිපාලමාණවකප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, **ඡද්දන්ත** නම් නාගෙන්ද්‍රතෙම:—

**'වධිස්ස මෙ තන්ති පරාමසන්තො–කාසාවමද්දක්ඛි ධජං ඉසීනං**
**දුක්ඛෙන ඵුට්ඨස්සුදපාදි සඤ්ඤා–අරහද්ධජො සබ්භි අවජ්ඣරූපො.'**

යන මේ ගාථාවෙන් 'වල හුන් මේ **සොණුත්තරයා** වධ කොට මරමි' යි සිතා සොඬින් අල්ලා පරාමර්ශනය කෙරෙමින් බුද්ධාදි ඍෂිවරයන්ගේ ධවජය යි කියන ලද කාසායවස්ත්‍රය දුටුයේ ය. දැක අර්හත්ධවජය නම් සත්පුරුෂපණ්ඩිතවරුන් විසින් අවධ්‍යස්වරූප හෙයින් 'එකාන්තයෙන් ම සත්කාර ගරුකාර කට යුත්තේ ය' යි කියා එබඳු බලවත් දුක්ඛවෙදනාවෙන් වැලඳ සිටියා වූ හස්තිරාජයාහට 'මෙබඳු වූ සත්පුරුෂසංඥවෙක් පහළ වූයේ ය' යි කියා මේ බව වදරණ ලද්දේ ය. නැවත ද '**ජොතිපාල** නම් බ්‍රාහ්මණමාණවක වූ බොධිසත්වයන් වහන්සේ **කාශ්‍යප** නම් භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධ සර්වඥයන් වහන්සේට මුණ්ඩකවාදයෙන් සත්පුරුෂ නො වන්නා වූ පරුෂවචනයෙන් ආක්‍රොශ කළහ.[1] අවනම්බු වචන කීවෝ ය' යි කියාත් වදරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, බොධිසත්වයන් වහන්සේ තිරශ්චීනාත්ම ගත වූයේ ද, කාෂායවස්ත්‍රයට මනා කොට ම පිදූසේක. එහෙයින් '**ජොතිපාල**මානවකයන් විසින් **කාශ්‍යප** නම් භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේට මුණ්ඩකවාදයෙන් ශ්‍රමණකවාදයෙන් සත්පුරුෂ නො වන්නා වූ පරුෂ වචනයෙන් ආක්‍රොෂය කරණ ලද්දේ ය. අවනම්බු කරණ ලද් දේ ය' යි කියන්නා වූ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් ජොතිපාල නම් මාණවකයානන් විසින් **කාශ්‍යප**ගොත්‍ර සම්භූත වූ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට මුණ්ඩකවාදයෙන් ශ්‍රමණක වාදයෙන් අසභ්‍ය වූ පරුෂවචනයෙන් ආක්‍රොශ කරණ ලද්දේ අවනම්බු කරණ ලද්දේ සැබෑ වී නම්, එහෙයින් '**ඡද්දන්ත** නම් හස්තිරාජයානන් විසින් කාෂායවස්ත්‍රය පුදන ලද්දේ ය' යි කී වචනය හෝ බොරු වන්නේ ය. ඉදින් තිරශ්චීනගත වූ කර්කශක්‍රෑරතර කටුක වෙදනාව විඳින්නා වූ බොධිසත්වයන් වහන්සේ විසින් **සොණුත්තර** වැද්දහු ඇඳි කාෂායවස්ත්‍රය පවා පුදන ලද්දේ ය. එසේ කල සර්වඥතාඥනයට පාරමිතාධර්මය

1. කෙළේ ය.

*Non-Commercial Distribution*

මුහුකළ කල මනුෂ්‍ය ව ද නුවණ මුහුකුරා සිට කල දසබලධාරී වූ ලොක නායක වූ උදිතොදිත බ්‍රාහ්මණ කුලප්‍රසූත වූ නිති දිලිහෙන ව්‍යාමප්‍රභාවක් ඇත්තා වූ ප්‍රවරොත්තම වූ මනා කොට වලඳින ලද්ද වූ ප්‍රවර මනොහර කායික කාෂායවස්ත්‍රයන් ඇත්තා වූ කාශ්‍යප නම් භගවත් අර්හත් සම්බුද්ධයන් වහන්සේ දැක කුමක් පිණිස පූජා නො කළසේක් ද? මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. **(263)** ඒ ප්‍රශ්නය තෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, ඡද්දන්ත නම් හස්ති නාගරාජතෙම:—

**'වධිස්ස මෙ තන්ති පරාමසන්තො–කාසාවමද්දක්ඛි ධජං ඉසීනං,**
**දුක්ඛෙන ඵුට්ඨස්සුදපාදිසඤ්ඤා–අරහද්ධජො සබ්භි අවජ්ඣරූපො.**

යන මේ ගාථාවෙන් මෙම අර්ථයන් වදරණ ලද්දේ ය. **ජොතිපාල** නම් බ්‍රාහ්මණමාණවකයානන් විසින් ද මුණ්ඩකවාදයෙන් ශ්‍රමණකවාදයෙන් අසභ්‍ය වූ පරුෂවචනයෙන් **කාශ්‍යප** නම් භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයාන් වහන්සේට ආක්‍රොශය කරණ ලද්දේ ය. අවනම්බු වචනය කියන ලද්දේ ය. ඒ ආක්‍රොශ පරිභව කළ කාරණය වනාහි ජාතිවශයෙන් කුලවශයෙන් කරණ ලද්දේ ය. මහරජානෙනි, **ජොතිපාල**බ්‍රාහ්මණමාණවකතෙම අශ්‍රද්ධාවත් වූ අප්‍රසන්නකුලයෙහි උපන්නේ ය. ඒ ජොතිපාලමාණවකයානන්ගේ මාතෘ පිතෘ නැගනි භ්‍රාතෘ දසි දස කම්කරු පරිවාරක මනුෂ්‍යයෝ සියල්ල ම මහාබ්‍රහ්මයා දෙවතා කොට ඇත්තාහු ය. මහාබ්‍රහ්මයා ම ගරු කොට ඇත්තාහු ය. ඒ සියල්ලෝ ම 'බ්‍රාහ්මණයෝ උත්තමයෝ ය. ප්‍රවරයෝ ය' යි කියා අවශෙෂ වූ ප්‍රව්‍රජිතයන්ට නින්ද කෙරෙති. පිළිකුල් කෙරෙති. බ්‍රහ්ම භක්තික වූ ඔවුන්ගේ ඒ වචනය අසා බාලකාලයෙහි පටන් පුරුදු වූ ජොතිපාලමාණවකතෙම වැලිකෙළියෙහි පටන් මිත්‍ර වූ **ඝටීකාර** නම් කුම්භකාරයා විසින් බුදුන් දක්නා පිණිස කැඳවනු ලද වූයේ 'සම්ම ඝටීකාරයෙනි, ඒ ශ්‍රමණවෙශධාරී වූ මුඩුමහණහු දැකීමෙන් අපට කවර ප්‍රයොජනයෙක් ද?' යි මෙසේ අවනම්බු වචනයක් කීයේ ය. මහරජානෙනි, යම් සේ මහත් වූ අමෘතරසය පවා නපුරු විෂයට පැමිණ තිත්තරස වන්නේ ද, යම් සේ සීතොදකය ගින්නට පැමිණ හුණු වන්නේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම **ජොතිපාලමාණවකයෝ** අශ්‍රද්ධ වූ අප්‍රසන්න වූ බ්‍රාහ්මණ කුලයෙහි උපන්නෝ ය. ඒ ජොතිපාලතෙම තමාගේ කුල වසයෙන් දෘෂ්ටි ගෙණ ලොවුතුරා බුදුන්ට ආක්‍රොශ කෙළේ ය. අවනම්බු කොට කීයේ ය.

තව ද, මහරජානෙනි, යම් සේ ජ්වලිතප්‍රජ්වලිත වූ ප්‍රභා සහිත වූ මහා අග්නිස්කන්ධයතෙම ජලයට පැමිණ නැසුනා වූ උෂ්ණප්‍රභා ඇති ව සීතල වන්නේ ද, පැසුනා වූ නිර්ගුණ්ඩීඵලයක් හා සදෘශ ව කළු වන්නේ ද,

Non-Commercial Distribution

මහරජානෙනි, එපරිද්දෙන් ම අනන්තපුණ්‍යසම්භාරයන් ඇත්තා වූ විශුද්ධ ශ්‍රද්ධාවක් ඇත්තා වූ මහත් වූ ඥාණාලොකය සහිත වූ **ජොතිපාල** නම් මාණවකයෙයෝ අශ්‍රද්ධ වූ අප්‍රසන්න වූ කුලයෙහි උපන්නෝ ය. ඒ ජොතිපාල මාණවකතෙම මිථ්‍යාදෘෂ්ටි කුලවශයෙන් අප **කාශ්‍යප** නම් තථාගතයන් වහන්සේට ආක්‍රොශ කෙළේ ය. අවනම්බු කොට කීයේ ය. ඒ අසා ඝටිකාර නම් කුම්භකාරතෙම 'අහෝ! මාගේ යහළු වූ ජොතිපාල කුමාරයන් අවැඩින් මුදා වැඩෙහි සලස්වාලම්' යි සිතා බොධිසත්වයන්ගේ හිසකේ වරල වැරයේ අල්වා අදිමින් 'මා යහළු වූ **ජොතිපාල**කුමාරයෙනි, ලොවුතුරා බුදුන් දක්නට යම්හ' යි කැඳවා ලී ය. එවිට **ජොතිපාල** කුමාරතෙම 'අහෝ! මොහු මොහුගේ නීචජාතිගොත්‍රයත් නො සලකා ම මාගේ හිස ගෙණ ඇද්දේ ය. එකාන්තයෙන් මට මහත් වූ අභිවෘද්ධි **(264)** සාධක වූ කාරණයක් ඇතැ'යි සිතා 'සම්ම, ඝටිකාරයෙනි, බුදුන් දක්නට එමි. හිස වරල හරුව' යි කියා ගලවා ගෙණ මිත්‍රසහායත්වයෙන් ලොවුතුරා බුදුන් ලහට ගොස් බණ අසා බුදුගුණ දැනීමෙන් දසභූත වූවාක් මෙන් වූයේ ය. ඒ ජිනශාසනයෙහි පැවිදි ව උපසම්පද වෙමින් සිල් පුරා විවරණශ්‍රී ලදින් අභිඥසමාපත්ති උපදවා බ්‍රහ්මලොකූපගත වූයේ යැ'' යි වදළසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නයත් එසේ ම පිළිගන්නෙමි''' යි කීහ.

**ජොතිපාල මාණවකප්‍රශ්නය නිමි.**

---

# ඝටීකාරවාසප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඝටිකාරස්ස කුම්භකාරස්ස ආවෙසනං සබ්බං තෙමාසං ආකාසච්ඡදනං අට්ඨාසි න චාභිවස්සි' යනුවෙන් '**ඝටිකාර** නම් කුම්භකාරයාගේ සියලු ම ගෙය තුන්මාසයක් මුළුල්ලෙහි ආකාශය ම ඡදනය කොට සිටියේ ය. ගෙට නො වැස්සේ ය' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. නැවත '**කාශ්‍යප** නම් තථාගතයන් වහන්සේගේ විහාරගෙය වර්ෂා වැස තෙමුනේ ය' යි කියා වදරණ ලද්දේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මහත් වූ කුශලමූලයන් ඇත්තා වූ තථාගතොත්තමයානන් වහන්සේගේ විහාරගෙය කුමක් පිණිස තෙමේ ද, දසපෙරුම් පිරූ තථාගතොත්තමයානන් වහන්සේට නම් ඒ ආනුභාවයතෙම කැමැති විය යුත්තේ ය. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, '**ඝටීකාර** නම් කුම්භකාරයාගේ ආවෙසනය වර්ෂාවෙන් නො තෙමී අහස්ඡදන වූයේ වී නම්, ඒ කාරණයෙන් 'තථාගතයන් වහන්සේගේ විහාරගෙය තෙමුනේ ය' යි වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'තථාගතයන් වහන්සේගේ විහාරගෙය තෙමුනේ වී නම්, ඒ කාරණයෙන්, ඝටීකාර නම් කුම්භකාරයාගේ ආවෙසනය අනොවස්සක ව අහස් සෙවෙනි වූයේ' යි

*Non-Commercial Distribution*

වදාළ ඒ වචනය බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද, නුඹ වහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඝටීකාරස්ස කුම්භකාරස්ස ආවෙසනං සබ්බං තෙමාසං ආකාසච්ඡදනං අට්ඨාසි න වාභිවස්සි' යි කියා මෙම කාරණයත් වදරණ ලද්දේ ය. '**කාශ්‍යප** නම් තථාගතයන් වහන්සේගේ විහාරකුටිය වැස්සෙන් තෙමුනේ ය' යි කියාත් වදරණ ලද්දේ ය, මහරජානෙනි, ඒ **ඝටීකාර** නම් කුම්භකාරතෙම නිර්මලතර සිල් ඇත්තේ ය, යහපත් වූ ගුණ ඇත්තේ ය, මහත් වූ කුශල මූලයන් ඇත්තේ ය, ඒ තෙම අන්ධ වූ ජීර්ණ වූ මවුපියන් පොෂ්‍ය කරන්නේ ය. ඔහුගේ අසම්මුඛයෙන් නො විචාරා ම ඔහුගේ ගෘහයෙහි තෘණ සෙවෙනි ගෙණ ගොස් සංඝයාවහන්සේලා **කාශ්‍යප** බුදුන්ගේ විහාරය වසාලූහ. ඒ තෘණ ගෙණ ගිය කාරණය කරණ කොට ගෙණ **ඝටීකාර** නම් ඒ කුම්භකාරතෙම අකම්පිත වූ අසඞ්චලිත වූ සුසණ්ඨිත වූ මහත් වූ අසදෘශ වූ ප්‍රීතිසැපයක් ලැබුයේ ය. 'අහෝ! සර්වලොකොත්තම වූ භාග්‍යවත් සර්වඥයන් වහන්සේ එකාන්තයෙන් ම මට අතිවිශ්වාස සේකැ' යි සිතා බොහෝ සෙයින් අතුල්‍ය වූ සොම්නස් උපදවාලී ය. ඔහුට උපන් ප්‍රීතිසැපය අඩමසක් සිතින් පහ නො වී ය. ඒ කාරණයෙන් ඔහට ඉහාත්මභාවයෙහි දී ම ඵල දෙන්නා වූ දෘෂ්ටධාර්මික වූ **(265)** විපාකය උපන්නේ ය. මහරජානෙනි, තථාගතයන් වහන්සේ එපමණ වූ ගේ තෙමුනා වූ විකාරමාත්‍රයෙන් කම්පා නො වනසේක. මහරජානෙනි, යම් සේ **මහාමේරුපර්වතරාජ**තෙම අනෙකශතසහස්‍ර ගණන් වාතමණ්ඩලසම්ප්‍රහාරයෙනු දු කම්පා නො වන්නේ ය. නො සෙලවෙන්නේ ය. තව ද, මහොදධි වූ වරප්‍රවරමහාසාගරතෙම අනෙක සියනහුතමහාගංගා ශතසහස්‍රයෙනු දු නො පිරෙන්නේ ය. විකාරයකට නො පැමිණෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේගේ තෙමුනා වූ එපමණ වූ විකාරයෙන් කම්පා නො වනසේක. මහරජානෙනි, 'තථාගතයන් වහන්සේගේ විහාරගෙය තෙමුනේ ය' යි කියා යම් කාරණයක් වදළා ඇද් ද, ඒ කාරණය වනාහි මහත් වූ ජනසමූහයාහට අනුකම්පා පිණිස වන්නේ ය. මහරජානෙනි, මේ අර්ථද්වයක් දැක වදරන්නා වූ තථාගතයන් වහන්සේලා තමන් නිර්මිත කළ ප්‍රත්‍යය නො වළඳන සේක් ලා ය. කවර අර්ථද්වයක් ද? යත්:—'මේ ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ අග්‍රදක්ෂිණීය වූසේකැ යි සිතා භාග්‍යවතුන් වහන්සේට සිවුපසය දන් දී දිව්‍යමනුෂ්‍යයෝ සියලු දුර්ගති දුකින් මිදෙති' යනු සිතා ද, 'ප්‍රාතිහාර්ය ලොවට දක්වා වෘත්තිය සොයන්නාහු ය යි කියා සෙස්සෝ අපවාද නො කෙරෙත්ව' යි කියා ද යන මේ අර්ථද්වය දක්නා වූ තථාගතයන් වහන්සේලා තමන් වහන්සේලා විසින් නිර්මිත කර ගත් ප්‍රත්‍යය නො වළඳන්දනාහු ය. ඉදින් මහරජානෙනි, **ශක්‍රදෙවෙන්ද්‍ර**තෙම හෝ ඒ විහාරගෙය නො තෙමෙන සේ

*Non-Commercial Distribution*

කරන්නේ නම්[1] මහාබ්‍රහ්මතෙම හෝ නො තෙමෙන සේ කරන්නේ නම්[2] ගෘහය තෙමේ ම හෝ නො තෙමෙන්නේ[2] වී නම්, ඒ කාරණය සාවද්‍ය වන්නේ ය. දෙෂ වන්නේ ය, සනිග්‍රහ වන්නේ ය. 'මේ බුදුවරයෙෝ දක්ෂක්‍රියා කොට ලොකයා මුළා කරන්නාහු ය යි අධිකතර ක්‍රියා කරන්නාහු ය' යි අපවාද කෙරෙති. එහෙයින් ඒ කාරණය හැරිය යුතු වන්නේ ය. මහරජානෙනි, තථාගතයන් වහන්සේලා කිසි වස්තුවක් නො ඉල්වන සේක්ලා ය. ඒ වස්තු ඉල්වීමෙන් බුදුවරයෝ ස්වල්පවචනීයහු නො වන්නාහු ය'' යි වදළසේක. ''යහපත ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ප්‍රශ්නයත් එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**සටීකාරාවාසප්‍රශ්නය නිමි.**

---

# බ්‍රාහ්මණරාජ ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ විසින් 'මහණෙනි, මම ඉල්ලූ දෙය දීමට යොග්‍ය වූ බාහිත කරණ ලද පාපයන් ඇති බැවින් බ්‍රාහ්මණ වීමි' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. නැවත ද, 'එම්බා සෙලයෙනි, 'මම රජ වීමි' යි කියාත් වදරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'අහමස්මි භික්ඛවෙ බ්‍රාහ්මණො යාචයොගො' කියා වදරණ ලද්දේ සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'රාජාහමස්මි සෙල' කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් 'රාජාහමස්මි සෙල' යි කියා වදරණ ලද්දේ සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'අහමස්මි භික්ඛවෙ බ්‍රාහ්මණො යාචයොගො' කියා වදළ ඒ වචනය හෝ බොරු වන්නේ ය, රජෙක් හෝ වන්නේ ය, නොහොත් බ්‍රාහමණයෙක් හෝ වන්නේ ය. උපන් එක ම ජාතියෙහි ජාති දෙකක් නම් නැත්තේ ය. **(266)** මේ උභතොකොටිකප්‍රශ්නය ද නුඹවහන්සේ කරා පැමිණියේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'අහමස්මි භික්ඛවෙ බ්‍රාහ්මණො යාචයොගො' කියා මෙම කාරණයත් වදරණ ලද්දේ ය. නැවත ද, 'රාජාහමස්මි සෙල' යි කියා සෙලබ්‍රාහ්මණයාහටත් වදරණ ලද්දේ ය. යම් කාරණයකින් තථාගතයන් වහන්සේ බ්‍රාහ්මණ වනසේක් ද, රජ වනසේක් ද, එහි කාරණයක් ඇතැ'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් කාරණයකින් තථාගතයන් වහන්සේ බ්‍රාහ්මණ වන සේක් ද, රජ වන සේක් ද, ඒ කාරණය කවරේ ද?'' යි විචාළෝ ය.

''මහරජානෙනි, සියලු පවිටු වූ අකුශලධර්මෝ[3] තථාගතයන් වහන්සේ විසින් බැහැර කරණ ලද්දේ ය. ප්‍රහීණ කරණ ලද්දේ ය, පහ කරණ

1. කරන්නේ ය  2. නො තෙමීම වන්නේ  3. කර්මධර්මයෝ

ලද්දේ ය, දුරු කරණ ලද්දේ ය, මූලොච්ඡින්න කරණ ලද්දේ ය, ක්ෂය කරණ ලද්දේ ය, විනාශයට පමුණුවන ලද්දේ ය, නිරුද්ධ කරණ ලද්දේ ය, සන්හිඳුවන ලද්දේ ය. ඒ කාරණයෙන් තථාගතයන් වහන්සේ 'බ්‍රාහ්මණ සේකැ' යි කියනු ලැබෙයි. ක්ෂීණාශ්‍රව වූ බ්‍රාහ්මණතෙම නම් දුරු කරණ ලද නොයෙක් කාංක්ෂා විමතිපථයන් ඇත්තේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ ද දුරු කරණ ලද නොයෙක් කාංක්ෂා විමතිපථයන් ඇතිසේක. ඒ කාරණයෙන් 'තථාගතයන් වහන්සේ බ්‍රාහ්මණසේකැ' යි කියන ලද්දේ ය. බ්‍රාහ්මණතෙම නම් සියලු ම භවගතියොනි හැරියේ ය. කෙලෙස්රජස් ගතියෙන් මිදෙමින් අසහාය වූයේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ ද, සියලු ම භවගතියොනි හැර වදළසේක. කෙලෙස් මල රජස්ගතියෙන් මිදුනුසේක් අසහාය වූසේක. ඒ කාරණයෙන් 'තථාගතයන් වහන්සේ බ්‍රාහ්මණසේකැ' යි කියන ලද්දේ ය. බ්‍රාහ්මණතෙමෙ නම් අග්‍රශ්‍රෙෂ්ඨ වරප්‍රවර දිව්‍යවිහරණය බහුල කොට ඇත්තේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ ද, අග්‍රශ්‍රෙෂ්ඨවරප්‍රවරදිව්‍යවිහරණය බහුල කොට ඇතිසේක. ඒ කාරණයෙන් ද 'භාග්‍යවතුන් වහන්සේ බ්‍රාහ්මණ සේකැ' යි කියන ලදී. බ්‍රාහ්මණතෙමෙ නම් හැදෑරීම් හදරවාලීම් දක්ෂිණා දන පිළිගැනීම, ඉන්ද්‍රියදමනය වීම, ශීලසංවරය වීම, ව්‍රත දැරීම් සංඛ්‍යාත වූ පූර්වානුශාසනාප්‍රවෙණිවංශයන් දරන්නේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ ද හැදෑරීම්, හදරවාලීම්, දක්ෂිණා දන පූජා පිළිගැණීම්, ඉන්ද්‍රිය දමන ශීලසංවර ධූතගුණාදි පූර්ව ජිනානුශාසනාප්‍රවෙණිවංශය ධරණසේක. ඒ කාරණයෙන් ද 'තථාගතයන් වහන්සේ බ්‍රාහ්මණසේකැ' යි කියන ලදී. බ්‍රාහ්මණතෙමෙ නම් මහත් වූ සැපවිහරණ ධ්‍යාන සමවැදීම් ඇත්තේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ ද මහත් වූ සැපවිහරණ ධ්‍යාන සමවැදීම් ඇතිසේක. ඒ කාරණයෙන් ද 'තථාගතයන් වහන්සේ බ්‍රාහ්මණ සේකැ' යි කියන ලදී. බ්‍රාහ්මණ තෙමෙ නම් සර්වභවාභවගතියෙහි විශෙෂ ජාතිවෘත්තිය හැසිරීම දන්නේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ ද සර්වභවාභවගතියෙහි විශෙෂජාතිවෘත්තිය අතුචරිතය දැන වදරණසේක. ඒ කාරණයෙන් ද 'තථාගතයන් වහන්සේ ද බ්‍රාහ්මණසේකැ' යි කියන ලදී. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේට 'බ්‍රාහ්මණ' ය යි කියන ලද මේ නාමය **(267)** මැනියන් විසින් කරණ ලද නාමයකුත් නො වන්නේ ය. පියානන් විසින් කරණ ලද නාමයකුත් නො වන්නේ ය. භ්‍රාතෘකෙනෙකුන් විසින් කරණ ලද නාමයකුත් නො වන්නේ ය. නැගනි කෙනෙකුන් විසින් කරණ ලද නාමයකුත් නො වන්නේ ය. මිත්‍රාමාත්‍යකෙනෙකුන් විසින් කරණ ලද නාමයකුත් නො වන්නේ ය. නෑසිය කෙනෙකුන් විසින් කරණ ලද නාමයකුත් නො වන්නේ ය. ශ්‍රමණබ්‍රාහ්මණයන් විසින් කරණ ලද නාමයකුත් නො වන්නේ ය. දිව්‍යබ්‍රහ්මයන් විසින් කරණ ලද නාමයකුත් නො වන්නේ ය. මේ නාමය විමොක්ෂවශයෙන් කියන ලද නාමයෙක් වන්නේ ය. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ බොධිද්‍රැම මූලයෙහි දී මාරසෙනාව විධමනය කොට අතීතඅනාගතප්‍රත්‍යුත්පන්න වූ

සර්වපපවිටු අකුශලධර්මයන් දුරු කොට සර්වඥතාඥනප්‍රතිලාභය හා සමග ම ලැබ වදළසේක. යම් මේ බ්‍රාහ්මණ යන නාමයෙක් ඇද් ද, එය සර්වඥතාඥනය උපන් මාත්‍රයෙහි ම පහළ වූ ප්‍රත්‍යක්ෂ කරණ ලද නාම යෙකි. ඒ කාරණයෙන් 'තථාගතයන් වහන්සේ බ්‍රාහ්මණසේකැ' යි කියන ලදී.''

''ඒ එසේ ය, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කවර කාරණයකින් 'තථාගතයන් වහන්සේ රජය' යි කියා කියනු ලැබෙත්[1] ද?''යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් කිසි රජෙක් නම් දශධර්මයෙන් රාජ්‍යය කරන්නේ ය. උපායෙන් ලොකයාට අනුශාසනා කරන්නේ ය. මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ ද දශසහශ්‍රීලොකධාතුයෙහි සද්ධර්මයෙන් බුද්ධ රාජ්‍යශ්‍රී කර වදරණසේක. කාමාවචර දෙවියන් සහිත වූ මාරයන් සහිත වූ සියලු ම බ්‍රහ්මරාජයන් සහිත වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ ප්‍රජාසංඛ්‍යාත සත්වලොකයාට 'මේ නො කරව, මේ දේ කරව' යි කියා අනුශාසනා කර වදරණසේක. ඒ කාරණයෙන් ද 'තථාගතයන් වහන්සේ රජ ය' කියනු ලැබෙයි.[2]

''තව ද, මහරජානෙනි, රජ්ජුරුවෝ නම් සියලු මනුෂ්‍යජනයන් අභිභවනය කොට නැසමූහයා සන්තොෂ කෙරෙමින් අමිත්‍රසමූහයා ශොක පත් කෙරෙමින් මහත් වූ මහායසශ්‍රී භාර වූ ස්පීර වූ ක්ෂාන්ති නමැති අරටු ඡත්‍රදණ්ඩෙන් හෙබියා වූ ප්‍රවරඥාන නමැති අතුන වූ ඡත්‍රසලාකා සියයෙන් අලංකෘත වූ නිර්මල ශ්වෙතච්ඡත්‍රය උස්වා ලවන්නේ ය. මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ ද සියලු ම මාරසෙනාව අභිභවනය කොට දුෂ්ප්‍රතිපන්න පුද්ගලයන් ශොක පත් කෙරෙමින් මනා ව පිළිගන්නා වූ දිව්‍යබ්‍රහ්මමනුෂ්‍යයන් සන්තොෂ කෙරෙමින් දශසහශ්‍රී ලොකධාතුයෙහි මහත් වූ මහායසශ්‍රීභර වූ ස්පීර වූ ක්ෂාන්ති නමැති අරටු ඡත්‍රදණ්ඩෙන් යුක්ත වූ ප්‍රවර වූ අනාවරණඥාන නමැති අතුන වූ ඡත්‍රසලාකාසියයෙන් අලංකෘත වූ අග්‍රප්‍රවර වූ අර්හත්ඵල සමාපත්ති නමැති නිර්මලධවලච්ඡත්‍රය නගා වදරණසේක. ඒ කාරණයෙන් ද 'තථාගතයන් වහන්සේ රජ ය'යි කියනු ලැබෙයි. රජ්ජුරුවෝ නම් සමීපගත වූ සමීපයට සම්ප්‍රාප්ත වූ බොහෝ ජනයන් විසින් වැන්ද යුතු වන්නේ ය. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ ද සමීපගත වූ සමීපයට සම්ප්‍රාප්ත වූ බොහෝ දිව්‍යබ්‍රහ්ම මනුෂ්‍යයන් විසින් පසහ පිහිටුවා වැන්ද යුතු වන්නේ ය. ඒ කාරණයෙන් ද, 'තථාගතයන් වහන්සේ රජ ය' කියනු ලැබෙත්.

රජ්ජුරුවෝ නම් යම් කිසි සිත් සේ කටයුතු කරණ ආරාධකයෙක්හට පැහැද චාරිත්‍රානුකූල වූ වර දෙමින් **(268)** පඤ්චකාමයෙන් සන්තොෂය කරන්නෝ ය. මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ ද කයින් වචසින් මනසින් සම්‍යක් ප්‍රතිපත්තිය කිරීමෙන් ආරාධක වූ යම්කිසිවක්හට පැහැද

1. ලැබෙ. 2. ලැබෙයි.

Non-Commercial Distribution



කාමයෙන් උමතු වූ ලොමස කස්සප තවුසා යාගය සඳහා ඇතෙකු මැරීමට සැරසීම. (297 පිටුව)

Non-Commercial Distribution

අනුත්තර චරිතවර වූ සර්වසංසාරදුඃඛයාගේ මිදීම දෙමින් අශෙෂකාමාවචරයෙන් ද තර්පණය කර වදරණසේක. ඒ කාරණයෙන් ද 'තථාගතයන් වහන්සේ රජ ය' යි කියන ලද්දේ ය. පෘථිවීතලතිලක වූ රජ්ජුරුවෝ නම් රාජාඥව ඉක්මවන්නාහට නින්ද කරන්නාහු ය, දණ්ඩදනය කරන්නාහු ය, නසන්නාහු ය. මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේගේ නිර්මලතර ශාසනවරයෙහි ද දුන දුන ආපත්තියට පැමිණෙන්නා වූ පැමිණි විට ද බොරුවෙන් සඟවන්නා වූ සතර අගතියට යන්නා වූ අලජ්ජියා බුද්ධාඥව ඉක්මවමින් නිස්තෙජස්භාවයෙන් ලාමක වෙමින් නින්දවෙමින් ගර්හිත වෙමින් සර්වඥසාසනවරයෙන් පහ වන්නේ ය. ඒ කාරණයෙන් ද තථාගතයන් වහන්සේ බුදුරජ ය යි කියනු ලැබෙයි.

''මහරජානෙනි, ලොකපාලරජදරුවෝ නම් මහාසම්මතාදී පූර්ව වූ ධර්මිෂ්ඨ වූ රජදරුවන්ගේ ප්‍රවෙණි වූ අනුශාසනාවෙන් ධර්මානුධර්ම දෙක නො හැර ම දක්වා දශධර්මයෙන් රාජ්‍යය කෙරෙමින් ජනහෘෂ්ට වන්නෝ ය, ප්‍රිය වන්නෝ ය, ප්‍රාර්ථනීය වන්නෝ ය. සියලු ම මනුෂ්‍ය ජනයන්ගේ රාජකුශලවංශය රාජධර්මගුණබලයෙන් බොහෝ කාලයක් පිහිටුවා ලවන්නෝ ය. මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ ද ස්වයම්භූත වූ දීපංකරාදි පූර්වබුදුරවයන් වහන්සේලාගේ ප්‍රවෙණි වූ සර්වඥ අනුශාසනාවෙන් ධර්මානුධර්ම දෙක නො හැර ම දක්වා සද්ධර්මයෙන් ලොකය අනුශාසනා කර වදරණසේක් දිව්‍යබ්‍රහ්මනුෂ්‍යයන්ට සන්තොෂ වනසේක, ප්‍රිය වනසේක, ප්‍රාර්ථනීය වනසේක, සර්වඥශාසනය ධර්ම ගුණබලයෙන් බොහෝ කාලයක් පවත්වා වදරණසේක. ඒ කාරණයෙන් ද තථාගතයන් වහන්සේ බුදුරජ ය යි කියනු ලැබෙයි. මහරජානෙනි, තථාගතයන් වහන්සේ යම් කාරණයකින් බ්‍රාහ්මණ ද රජ ද වනසේක් ද, මෙසේ (එබඳු) අනෙකවිධ වූ කාරණ ඇත්තේ ය. මහරජානෙනි, අපටත් වඩා අතිසමර්ථ වූ භික්ෂුනමක් කල්පයක් මුළුල්ලෙහිත් සම්පාදනය කොට කියන්නේ වී නමුත් නිමාවට නො යන්නේ ය. එහෙයින් ඉතා බොහෝ කොට කීමෙන් කම් කිම් ද? සංක්ෂෙපයෙන් පිළිගත යුත්තේ ය'' යි වදළසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නය එසේ ම' පිළිගන්නෙමි'' යි කීහ.

**බ්‍රාහ්මණරාජප්‍රශ්නය නිමි.**

## සව්ඥගොචර ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹගේ ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**'ගාථාභිගීතමෙම අභොජනීයං**
**සම්පස්සතං බ්‍රාහමණ නෙස ධම්මො,**
**ගාථාභිගීතං පනුදනති බුඩා**
**ධමෙම සති බ්‍රාහමණ වුතතිරෙසා.'**



Non-Commercial Distribution

**(269)** යන ගාථාවෙන් 'බ්‍රාහ්මණය, මා විසින් ගාථා කියා මේ කිරිබත ලබන ලද්දේ ය. එහෙයින් වළඳන්ට නිසි නො වෙයි. හැම ලෙසින් ම ආජීවසුද්ධිය බලන්නා වූ බුදුවරයන්ගේ ගාථා කියා ලද දෙය වැළඳීම නම් චාරිත්‍රධර්මයෙක් නො වන්නේ ය. එහෙයින්, බ්‍රාහ්මණය, ගාථා කියා ලත් භොජනය බුදුවරයෝ නො වළඳා ප්‍රතික්ෂෙප කෙරෙති. බුදුන්ගේ ආජීවපාරිශුද්ධි සුචරිතචාරිත්‍රධර්මය නො නැසී විද්‍යමාන ව පවත්නා කල්හි මේ පැවතීම තෙම බුදුන්ගේ ඒකාන්ත නිර්මල විශුද්ධ වූ ජීවිකා වෘත්තියෙකැ' යි කියා මෙම අර්ථයත් වදරණ ලද්දේ ය. නැවත ද බුදුරජානන් වහන්සේ පිරිසට ධර්මදෙශනා කෙරෙමින් අනුපූර්වකථාව කෙරෙමින් පළමු කොට ම දනකථාව වදරණසේක. සර්වලොකෙශ්වර වූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අසා දිව්‍යමනුෂ්‍යයෝ විශෙෂ කොට සරහා දන් දෙන්නාහු ය. ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් උපදවන ලද්ද වූ ඒ දනය සුගතශ්‍රාවකයන් වහන්සේලා වළඳා වදරණසේක් ලා ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් **'ගාථාභි ගීතම්මෙ අභොජනීයං'** යනාදින් වදරණ ලද්දේ සැබෑ වී නම්, ඒ කාරණයෙන් ස්වාමීනි, 'භාග්‍යවතුන් වහන්සේ පළමු කොට දනකථාව වදරණසේකැ' යි කියන්නා වූ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් **'දනකථං පඨමං කථෙති'** කී වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'ගාථාභි ගීතම්මෙ අභොජනීයං' කී වචනය හෝ බොරු වන්නේ ය. මේ දෙක ම සැබෑ වන්ට කාරණා නැත, එකක් බොරු වෙයි, එකක් සැබෑ වෙයි. ඊට කාරණා කවරේ ද? යත හොත්:— ස්වාමීනි, යම් ඒ අග්‍රදක්ෂිණීය වූ භික්ෂුනමක් ගිහින්ට පිණ්ඩපාතදනයාගේ ආනිසංසය කියන්නේ ය. ඒ භික්ෂූන් වහන්සේගේ ධර්මකථාව අසා ප්‍රසන්නසිත් ඇත්තා වූ ඒ ගෘහස්ථයෝ නැවත නැවතත් දන් දෙති. යම් සුගතශ්‍රාවක කෙනෙක් ඒ දනය වළඳිත් නම්, ඒ සියලු සුගතශ්‍රාවකයෝ ම ගාථා කියා ලත් භොජනය වළඳන්නාහු නම් වෙති. මේ සර්වඥගොචර වූ උභතො කොටිකප්‍රශ්නය ද සියක්වර පැළූ අස්ලොම්අගක් මෙන් අතිසියුම් වන්නේ ය. ජලපොළෝ සෙයින් අතිගම්භීර වන්නේ ය. ඒ ප්‍රශ්නය නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය. නුඹගේ සමර්ථතාව බලමි'' යි කීහ.

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින්:—

> **'ගාථාභිගීතමෙම අභොජනීයං**
> **සමපස්සතං බ්‍රාහමණ නෙස ධමෙමා,**
> **ගාථාභිගීතං පනුදනාති බුඩා**
> **ධමෙමා සති බ්‍රාහමණ වුතතිරෙසා.'**

යන මේ ගාථාඅර්ථයත් වදරණ ලද්දේ ය. භාග්‍යවතුන් වහන්සේ පළමු කොට ම දනකථාව ද වදරණසේක. ඒ කාරණය වනාහි සියලු ම තථාගතයන්ගේ චාරිත්‍රක්‍රියාවෙක. පළමු කොට ම දනකථාවෙන් එහි සිත අභිරමණය කරවා පසු ව ශීලයෙහි යොදා වදරණසේක් ලා ය. මහරජානෙනි, යම්සේ මනුෂ්‍යයෝ තරුණ දරුවන් නළවනු පිණිස පළමු කොට

Non-Commercial Distribution

ක්‍රීඩාභාණ්ඩයන් දෙන්නාහු ය. හේ කවරේ ද යත්?:— කුඩා නගුල ය, ඝටික නම් කල්ලික්‍රීඩාභාණ්ඩය, චිංගුලික නම් තල්කොළඇඹරුම ය, කෙළිනැළිය, **(270)** කුඩා රථය, කුඩා දුන්න ය මේ ආදි කෙළිභාණ්ඩය, පසු ව ඒ ළදරුවන් ස්වකීය කර්මාන්තයෙහි යොදවන්නාහු ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම අප තථාගතයන් වහන්සේ පළමු කොට ම දාන කථාවෙන් එහි සිත අභිරමණය කරවා පසු ව ශීලයෙහි යොද වදාරණසේක.

''තව ද, මහරජාණෙනි, යම් සේ වෛද්‍යාචාර්යතෙමේ රෝගාතුරයන්ට පළමු කොට ඖෂධබලය පිහිටන පිණිස ශරීරය මොළොක් වන පිණිස සතර පස්දවසක් තෙල් පොවා ලන්නේ ය. පසු ව විරේක කර වන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ පළමු කොට ම දානකථාවෙන් සිත අභිරමණය කරවා පසු ව ශීලයෙහි යොද වදාරණසේක. මහරජාණෙනි, දානපති වූ දායකයන්ගේ සිත මෘදු වන්නේ ය. මර්දනය වන්නේ ය, සිනිද්ධ වන්නේ ය, ඒ දායකයෝ ඒ දානසෙතු සංක්‍රමණයෙන් දාන නමැති මහනැවින් සංසාරමහාසාගරයාගේ පරතෙරට පැමිණෙන්නාහු ය. එහෙයින් ඒ ගෘහස්ථයන්ට පළමු කොට කටයුතු භූමිය අනුශාසනා කර වදාරණසේක. ඒ කාරණයෙන් බුදුරජානන් වහන්සේ විඤ්ඤත්තියට නො පැමිණෙනසේකැ'' යි වදාළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'විඤ්ඤත්තියයි' කියා යමක් වදාළ සේක් ද, ඒ විඤ්ඤත්තිහු කොපමණෙක් ද?'' යි විචාළෝ ය. ''මහරජාණෙනි, විඤ්ඤත්තිහු 'කායවිඤ්ඤත්තිය, වචීවිඤ්ඤත්තිය' යි කියා මේ දෙකෙක් වෙති. එහි සාවද්‍ය වූ කායවිඤ්ඤත්තියකු දු ඇත. අනවද්‍ය වූ කායවිඤ්ඤත්තියකු දු ඇත. සාවද්‍ය වූ වචීවිඤ්ඤත්තියකු දු අනවද්‍ය වූ වචීවිඤ්ඤත්තියකු දු ඇත.

''සාවද්‍ය වූ කායවිඤ්ඤත්තිය කවරේද? යත්: — මහරජාණෙනි, මේ ශාසනයෙහි මහණ වූ ඇතැම් භික්ෂුනමක් උපාසකකුලයට එළඹ පිණ්ඩපාතයෙන් සිටීමට නිසි නො වන අනවකාශස්ථානයෙහි සිට භික්ෂාචාරයට නිසි ස්ථානයෙහි නො ඉඳ, පිණ්ඩපාත වත බිඳින්නේ ය. මේ කායවිඤ්ඤත්තිය සාවද්‍ය වන්නේ ය. ඒ කායවිඤ්ඤත්තියෙන් විනවන ලද්ද වූ භොජනය බුද්ධාදී ආර්යයෝ නො වළඳන්නාහු ය. ඒ පුද්ගලතෙමේ ද ආර්යයන්ගේ ලබ්ධියෙහි ලාමක වන්නේ ය, නින්ද වන්නේ ය, බිඳීම වන්නේ ය, ගර්හිත වන්නේ ය, පිළිකුල් වන්නේ ය, අචිත්තීකෘත වන්නේ ය, භින්නාජීවක සංඛ්‍යාවට යන්නේ ය. නැවත ද, මහරජාණෙනි, අනිකු දු ඇතැම් භික්ෂුනමක් උපාසකකුලයට එළඹ අනවකාශස්ථානයෙහි සිට ග්‍රීවය නමා 'මෙසේ ඇති කල, මොවුහු බලති' යි සිතා මයුර බැල්මෙන් බලන්නේ ය. ඒ ග්‍රීවය නමා බැලීම කරණ කොට ගෙණ ඒ උපාසකවරු ද ඒ මහණහු දකිති. මේ කායවිඤ්ඤත්තිය ද සාවද්‍ය වන්නේ ය. ඒ කාය විඤ්ඤත්තියෙන් විනවන ලද භොජනය බුද්ධාදී ආර්යයෝ නො වළඳන්නාහු ය. ඒ පුද්ගලතෙමේ ද ආර්යයන්ගේ ලබ්ධියෙහි ලාමක වන්නේ ය.

*Non-Commercial Distribution*

නින්ද්‍ය වන්නේ ය, බිඳිම වන්නේ ය, ගර්හිත වන්නේ ය, පිළිකුල් වන්නේ ය, අචිත්තීකෘත වන්නේ ය, භින්නාජීවිකසංඛ්‍යාවට යන්නේ ය, නැවත ද, මහරජානෙනි, මේ ශාසනයෙහි අනිකු දු සමහර භික්ෂුනමක් හනුවෙන් හෝ බැමින් හෝ ඇඟිල්ලෙන් හෝ අඟවන්නේ ය, මේ කාය විඤ්ඤප්තිය ද සාවද්‍ය වන්නේ ය, ඒ කායවිකාරයෙන් විනවන ලද භොජනය බුද්ධාදී ආර්යයෝ නො වළඳන්නාහු ය. ඒ පුද්ගලතෙමේ ද ආර්යයන්ගේ සම්‍යක්දෘෂ්ටි වූ ශාසනයෙහි ලාමක වන්නේ ය, නින්ද්‍ය වන්නේ ය, ගර්හිත වන්නේ ය, පිළිකුල් වන්නේ ය, අචිත්තීකෘත වන්නේ ය, 'භින්නාජීවය ඇත්තේ ය' යි කියා සංඛ්‍යාවට යන්නේ ය.

''අනවද්‍ය වූ **(271)** කායවිඤ්ඤත්තිය කවරේ ද? යත්:— මේ ශාසන යෙහි සිල්වත් මහණතෙම සෙබියායෙහි කී සෙයින් උපාසකකුලයට එළඹ සිහිනුවණින් යෙදී සංහිඳී ස්ථානයෙහිත් අස්ථානයෙහිත් බුදුන් වදළ අනුශාසනා පරිද්දෙන් ගොස් නිසි ස්ථානයෙහි සිටින්නේ ය, කිසිවක් දෙනු කැමැති කල්හි සිටින්නේ ය, නො දෙනු කැමැති කල්හි නො ඉඳ යන්නේ ය, මේ කායවිඤ්ඤත්තිය අනවද්‍ය වන්නේ ය. ඒ අනවද්‍ය වූ කායවිඤ්ඤත්තියෙන් විනවන ලද භොජනය බුද්ධාදී ආර්යයෝ වළඳන්-නාහු ය. ඒ ආර්යාජීවශුද්ධිකපුද්ගලතෙම ආර්යයන්ගේ ලබ්ධියෙහි වර්ණිත කරණ ලද වන්නේ ය, ප්‍රශස්ත කරණ ලද්දේ ය, සල්ලෙඛිකාචාර ඇත්තේ ය, සුපරිසුද්ධාජීවය ඇති සංඛ්‍යාවට යන්නේ ය. මහරජානෙනි, දෙවාතිදෙව වූ අප භාග්‍යවත් වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ විසින් ද:—

**'න වෙ යාචන්ති සප්පඤ්ඤා-අරියා ගරහන්ති යාචනං,**
**උද්දිස්ස අරියා තිට්ඨන්ති-එසා අරියාන යාචනා.'**

යන මේ ගාථාවෙන් 'සප්‍රාඥ වූ ආර්යයෝ කිසිවක් නො ඉල්වති, ඉල්වීමට ගර්හා කෙරෙති, උවමනා දෙයක් උදෙසා ආර්යයෝ සිටිති. මෝතොමෝ ආර්යයන්ගේ ඉල්වීම ය' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. සාවද්‍ය වූ වචීවිඤ්ඤත්තිය කවරේ ද? යත්:— මහරජානෙනි, මේ ශාසන යෙහි මහණතෙම වචනයෙන් බොහෝ වූ චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය බෙහෙත් පිරිකර ඉල්වන්නේ ය, මේ වචීවිඤ්ඤත්තිතොම සාවද්‍ය වන්නේ ය. ඒ වචීවිඤ්ඤත්තියෙන් ඉපද වූ සිවුපසය ආර්යයෝ නො වළඳති. ඒ පුද්ගලතෙමේ ද ආර්යයන්ගේ ලබ්ධියෙහි ලාමක වන්නේ ය, හීලිත වන්නේ ය, ඛිලිත වන්නේ ය, ගර්හිත වන්නේ ය, පරිභූත වන්නේ ය, අචිත්තීකෘත වන්නේ ය. 'බිඳුනා වූ ආජීවය ඇත්තේම ය'යි කියා සංඛ්‍යාවට යන්නේ ය. නැවත ද, මහරජානෙනි, මේ ශාසනයෙහි අනිකුදු ඇතැම් භික්ෂුනමක් අනුන්ගේ යමක් ඉල්වමින් 'මේ දෙයින් මට ප්‍රයෝජන ඇතැ' යි මෙසේ කියන්නේ ය. කයින් වචනයෙන් අනුන්ට අස්වා ලීමෙන් ඒ මහණහට ලාභය උපදනේ ය. මේ වචීවිඤ්ඤත්තිය ද සාවද්‍ය වන්නේ ය. ඒ වචීවිඤ්ඤත්තියෙන් උපදවන ලද ලාභය ආර්යයෝ

Non-Commercial Distribution

නො වළඳන්නාහු ය. ඒ පුද්ගලතෙමේ ද ආර්යයන්ගේ සම්‍යක් ලබ්ධියෙහි ලාමක වන්නේ ය, හීලිත වන්නේ ය, ඛීලිත වන්නේ ය, අවමාන වන්නේ ය, අචිත්තීකෘත වන්නේ ය, භින්නාජීවය ඇත්තේ ය'' යි කියා සංඛ්‍යාවට යන්නේ ය.

''නැවත ද, මහරජානෙනි, අනිකුදු සමහර භික්ෂුනමෙක් මේ ශාසන යෙහි වචන පැතිරවීමෙන්[1] 'මෙපරිද්දෙන් භික්ෂූන්ට දිය යුත්තේ ය' යි කියා පිරිසට අස්වාලන්නේ ය. ඒ පිරිස ඒ වචනය අසා ගුණ කී ප්‍රත්‍යය ගෙණවුත් දෙති. මේ වචීවිඤ්ඤත්තිය ද සාවද්‍ය වන්නේ ය. ඒ වචීවිඤ්ඤත්තියෙන් විනවන ලද්ද වූ පසය ආර්යයෝ නො වළඳන්නාහු ය. ඒ පුද්ගලතෙම ද ආර්යයන්ගේ ලබ්ධියෙහි ලාමක වන්නේ ය, හීලිත වන්නේ ය, ඛීලිත වන්නේ ය, ගර්හිත වන්නේ ය, පරිභූත වන්නේ ය, අචිත්තීකෘත වන්නේ ය, භින්නාජීවික සංඛ්‍යාවට යන්නේ ය.

''මහරජානෙනි, **ශාරිපුත්‍ර**මහතෙරුන් වහන්සේ ද හිරු අස්තංගත කල්හි රාත්‍රිභාගයෙහි බලවත් වූ බඩරුජාවෙක් ඇති ව මහත් වූ දුක්ඛ වෙදනාවෙන් පෙළෙමින් ගිලන් වූසේක.[2] **මහමුගලන් තෙරුන් වහන්සේ** **(272)** විසින් ඒ දැක 'වහන්ස, පෙර මේ රුජාව ගත් කල වැළඳූ බෙහෙත් කවරේ ද?' යි විචාරණ ලද්දෝ 'ඇවැත්නි, මා ගිහි කාලයෙහි අපගේ මෑනියෝ හෙලහිතෙල් මී සකුරු එක් කොට යොද දිය නුමුසු කොට පිසූ කිරිබතක් දෙති. ඒ කිරිබතින් මේ රුජාව සන්හිඳෙන්නේ ය' යි කියා වාග්භෙදය කර වදාළසේක. මුගලන් මහතෙරුන් වහන්සේ ද 'වහන්ස, නුඹවහන්සේගේ හෝ මාගේ හෝ පිණෙක් ඇත්තේ වී නම්, බෙහෙත් කිරිබත ලබම්හ' යි කීදැ ය. එකල එබස් අසා සක්මන් කෙළවර වෘක්ෂයෙහි හුන් දෙවතාවා **මුගලන්** මහතෙරුන් වහන්සේගේ උපාසකකුලයට එළඹ වැඩිමහලු පුත්‍රයාගේ ශරීරයෙහි ආවෙශ වෙමින් වෙහෙස කෙළේ ය. එකල ඔහට පිළියම් කරන්නට රැස් වූ නෑයන්ට 'කොල, තෙපි කුමක් කරව් ද? **සැරියුත්**මහතෙරුන් වහන්සේට ගිතෙල් මී සකුරු එක් කොට කිරිබතක් උයා යවුව හොත් යක්ෂලෙඩ හරිමි' යි වෙවුලා කීයේ ය. ඒ අසා උපාසකවරු 'මහායක්ෂයානෙනි, තොප නො කීවත් අපි තෙරුන් වහන්සේට නිරන්තරයෙන් ම දන් දෙම්හ' යි කියා දෙවෙනි දවස් එබඳු කිරිබතක් පිස ගෙණ මග බලබලා උන්හ. මුගලන් මහතෙරුන් වහන්සේ ද එදවස් උදය ම නැඟී සිට පෙර පුරුදු වූ ඒ උපාසකකුලයට වැඩ වදාළසේක. ඒ දැක සතුටින් උපාසකවරු පාත්‍රය ලබා ගෙණ කිරිබත් පුරවා දුන්හ. තෙරුන් වහන්සේ කිරිබත් ගෙණ වඩනාකාර දැක්වූසේක. ඒ දැක උපාසකවරු 'වහන්ස, මේ බත වළඳා වදාළ මැනැව. අනික් කිරිබත්පාත්‍රයක් දෙම්හ' යි කියා ඒ බත වැළඳූ නැවත පාත්‍රය පුරවා කිරිබත් දුන්හ. තෙරුන්වහන්සේ ඒ කිරිබත ගෙණ ගොස් 'වහන්ස, මේ කිරිබත වළඳා වදාළ මැනැවැ' යි කියා **සැරියුත්** මහතෙරුන් වහන්සේට පිරිනැමූ

1 පැවතීමෙන් 2 වූයේ

Non-Commercial Distribution

සේක. ඒ **සැරියුත්**මහතෙරුන් වහන්සේට වාග්භෙදයෙන් ඒ බෙහෙත් කිරිබත උපන්නේ ය. එවිට **සැරියුත්** මහතෙරුන් වහන්සේ යහපත් වූ ඒ කිරිබත දැක 'මේ කිරිබත කෙසේ උපන්නේ දෝ හො?' යි දිවැසින් බලා දෙවතාවා උපාසකකුලයට එළඹ දුක් දී ඉපද වූ බව දැක 'වාග්භෙද යෙන් මට මේ බෙහෙත්කිරිබත උපන්නේ ය. මාගේ සම්‍යග්ආජීවය නො බිඳේව' යි සිතා ආජීවභෙදභයින් ඇවැත්නි, මේ බෙහෙත් ආහාරය අනුභවයට සුදුසු නො වෙයි. පහ කරව' යි කියා ඒ බෙහෙත හැර වදාළ සේක. ඒ කිරිබතින් ජීවිකා නො කළසේක. මුගලන් මහතෙරුන් වහන්සේ ද 'මා වැනි සෘද්ධිමත් මහාශ්‍රාවක කෙනෙකුන් ගෙණ ආ බත නො වළඳනසේකැ' යි නො සිතා එක වචනයෙන් ම පාත්‍රමුවවිට අල්වා ගෙණ එක් පසෙක්හි මුණින් නැමූසේක. එකෙණෙහි ම සැරියුත් මහ- තෙරුන් වහන්සේගේ බඩරුජාවත් සන්හිඳින. එතැන්පටන් පිරිනිවන් පාන තැන් දක්වා පන්සාළිස්හවුරුද්දක් මුළුල්ලෙහි ඒ රුජාව හට ගත්තේ නො වේ. මෙබඳු වූ වචීවිඤ්ඤත්තිය ද සාවද්‍ය වන්නේ ය. ඒ වචීවිඤ්- ඤත්තියෙන් විනවන ලද්ද වූ ආහාරය බුද්ධාදී ආර්යයෝ නො වළඳන් නාහු ය. ඒ පුද්ගලතෙම ද ආර්යයන්ගේ ලබ්ධියෙහි ඔඤාත වන්නේ ය. හීලිත වන්නේ ය, ඛිලිත වන්නේ ය, ගර්හිත වන්නේ ය, පරිභූත වන්නේ ය, අචිත්තීකෘත වන්නේ ය, භින්නාජීවික සංඛ්‍යාවට යන්නේ ය.

''අනවද්‍ය වූ වචීවිඤ්ඤත්තිය කවරේ ද? යත්:— මහරජානෙනි, මේ ශාසනයෙහි මහණතෙම කරුණක් ඇති කල්හි නෑ පැවරූ කුලයෙන් බෙහෙත් ඉල්වන්නේ ය. ඒ වචීවිඤ්ඤත්තිය අනවද්‍ය වන්නේ ය. ඒ වචීවිඤඤත්තියෙන් **(273)** විනවන ලද පසය බුද්ධාදී ආර්යයෝ වළඳන්නාහු ය. ඒ පුද්ගලතෙම ද ආර්යයන්ගේ සම්‍යක්ලබ්ධියෙහි වර්ණනා කරණ ලද වන්නේ ය. ස්තුති කරණ ලද වන්නේ ය, ප්‍රශස්ත කරණ ලද වන්නේ ය, පරිශුද්ධාජීවය ඇති සංඛ්‍යාවට යන්නේ ය. තථාගත වූ අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේලා විසින් පරිසුද්ධාජීවය ඇත්තේ ය'' යි අනුදන්නා ලද්දේ ය.

''මහරජානෙනි, තථාගතයන් වහන්සේ **කසීභාරද්වාජ** නම් බ්‍රාහ්මණ- යාගේ යම් භොජනයක් නො ගෙණ දුරු කළසේක් ද, ඒ භොජනය තද අර්ථයන්ගේ වෙළීම් දහ හැරීම් ඇදීම් නිග්‍රහ කිරීම් ප්‍රතිකර්මයෙන් උපදනා ලද්දේ ය. එහෙයින් තථාගතයන් වහන්සේ ඒ පිණ්ඩපාතය පිළිනොගෙණ ප්‍රතික්ෂෙපය කළසේක. එයින් ජීවිකාව නො කළසේක.

''මහරජානෙනි, සකලසුරනරවන්දනීය වූ අප තථාගතයන් වහන්සේ එක්සමයෙක්හි **මගධරට රජගහනුවර** වටා පිහිටි පර්වතයට දකුණු භාගයෙහි වූ හෙයින් **දක්ෂිණගිරි** නම් විහාරයෙහි **එකනාලක** නම් බ්‍රාහ්මණ ග්‍රාමය නිසා වැඩ වාසය කරණසේක. එසමයෙහි එම **එකනාලක** නම් බ්‍රාහ්මණග්‍රාමයට ජ්‍යෙෂ්ඨ වූ **කෘෂිකර්මයෙන්** ජීවත් වන හෙයින් ද **භාරද්වාජ**ගොත්‍රවශයෙන් ද **කසීභාරද්වාජ** නම් බ්‍රාහ්මණයාගේ කැකුලම් සා

වපුරන්නා වූ වප්මඟුලෙක් විය. ඒ වප්මඟුලෙහි රක්තශ්වෙතාදී වර්ණ ඇත්තා වූ දහසක් පමණ හීගොනුන්ගේ සතරපා රිදීකුර ගසා සියලු අං රන්කොපුයෙන් වසා සර්වාංගය සුවඳ පසඟුල් දෙමින් සුදුමල් පලඳවන ලද්දේ ය. පන්සියයක් නඟුල් හිස් විය. කෙවිටි ස්වර්ණයෙන් බහා කරණ ලද්දේ ය. පන්සියයක් පමණ කෘෂිකාර්මිකයෝ නවවස්ත්‍රාභරණයෙන් සැරහී සමන්මල් උර පැලඳ සිරියල්මනෝසිලකල්කයෙන් වෙර ආලේප ගෙණ දස දස දෙන පෙළ සැදී පන්සියයක් නඟුල් ගෙණ ගොන් යොද සාමින් යෙති. එතෙක් දෙන ගැලින් වී ඉසිමින් යෙති. පන්සියයක් ගොන් විධා හරිති. බ්‍රාහ්මණතෙම ද උදය ම නාපියා රැවුළ අන්දම් ගෙණ සුවඳ විලවුන් ආලෙප කොට පන්සියයක් අගේ ඇති සළුවක් හැඳ දහසක් අගේ ඇති සළුවක් පෙරවගෙණ, දසැඟිල්ලෙහි විසිමුන්දෙක් බහා ගෙණ, කර්ණයුගලයෙහි කුණ්ඩලාභරණ පැලඳ ගෙණ, දසදහසක් අගේ ඇති මුණ්ඩාසනයක් හිස බහා ගෙණ, රන්මාලයක් කර ලා ගෙණ, බ්‍රාහ්මණ ජනයා පිරිවරා ගෙණ වැපිරීම් බලමින් ඒ ඒ තන්හි උස්සිතධජපතාකා යෙන් බබලන ක්ෂේත්‍රභූමියෙහි ඇවිදින්නේ ය. එකල **කසීභාරද්වාජයාගේ** බැමිණිය නොයෙක් සියගණන් භාජනයන්හි කිරිබත් පිසවා මහගැලක නගා ගෙණ දෙවහනක සේ සැරහී බැමිණියන් පිරිවරා ගෙණ කර්මාන්ත භූමියට අවු ය. බ්‍රාහ්මණතෙමේ ද තමන් අනුභව කරණ තලියෙහි කිරිබත පුරවා මධුශර්කරා ගිතෙලින් සරහා නංගලබලිකර්මය කොට නිමවා පන්සියයක් පමණ කසීපුරුෂයන් හා දෙළොස්දහස්පන්සියයක් සෙනග වඩා හිඳුවා රන්මිරිවැඩි පය ලා ගෙණ රක්තවර්ණ රන්සෝලුලියක් අතින් ගෙණ 'මොහුට කිරිබත් දෙව, මොහුට ගිතෙල් දෙව, මොහුට ශර්කරා දෙව' යි කියකියා විධාන කෙරෙමින් යෙයි. බැමිණි ස්වර්ණරජතලොහ තාම්‍රමය භාජනයන් ගෙන්වා ගෙණ රන්සැන්දෙන් කිරිබත් ආදිය බෙදමින් යෙයි. එදවස් අප තිලෝගුරු සර්වඥරාජොත්තමයානන් වහන්සේ අලුයම්හි නැඟී සිට මහාකරුණාසමාපත්තියට සමවැදී අද **(274)** කෙසේ නම් ලෝවැඩක් කෙරෙම් දො හො?'' යි බුදුඇසින් සියලු ලෝකය බලා වදරණසේක් තීක්ෂ්ණ වූ ප්‍රඥගති ඇති **කසීභාරද්වාජ** නම් බ්‍රාහ්මණයා රහත් වීමට කුසල් මෝරා බිජු වපුරවමින් සිටි බව දැක මහත් වූ කරුණා වෙන් ඔහු විනයනය කර වදරණ පිණිස උදය කාලයෙහි ම පාසිවුරු ගෙණ වදරමින් ක්ෂණයකින් බත් නිමවන තැනට වැඩ බ්‍රාහ්මණයාට පෙණෙන සේ උස් තැනෙක වැඩ සිටිසේක. එසේ වැඩසිට සහස්‍රගණන් චන්ද්‍රසූර්ය යන්ගේ ප්‍රභාවට අපහාස කරන්නාක් මෙන් සශ්‍රීක වූ ස්වර්ණවර්ණශ්‍රී ශරීරයෙන් නික්මුනා වූ ස්වර්ණවර්ණ වූ බුද්ධරශ්මිමණ්ඩලය කරණ කොට ගෙණ රන්වන් මයුරපිඤ්ජයක් විදපී කලක් මෙන් හාත්පසින් උඩින් යටින් සරසින් අසූරියනක් පමණ තන්හි බුදුරැස් පතුරුවා වදළසේක. බ්‍රාහ්මණයාගේ කර්මාන්තශාලා භිත්තිවෘක්ෂ සා වැසූ පස්පිඩු ආදී වූ සියල්ල ම රන්වන්මය වූවාක් මෙන් විය. එකල කිරිබත් කකා හුන් මනුෂ්‍යයෝ වට්ටංගුල්‍යාදී අශීත්‍යනුව්‍යංජනලක්ෂණයෙන් පිරිවරා සිටි

Non-Commercial Distribution

ද්වාත්‍රිංශද්වරමහාපුරුෂලක්ෂණයෙන් ප්‍රතිමණ්ඩිත වූ ශරීරයක් ඇත්තා වූ ව්‍යාමප්‍රභාපරික්ෂෙපයෙන් විභූසිත වූ බාහුයුගලයක් ඇත්තා වූ ශිරොධාතු මස්තකයෙන් රියනක් පමණ තැන් අහසට නැඟී නිරන්තරයෙන් බබලන්නා වූ කෙතුමාලාලංකාරයෙන් සශ්‍රීකතර දර්ශනයක් ඇති, ෂඩ්වර්ණඝනබුද්ධරශ්මිමාලාවෙන් බබළන්නා වූ අනන්තතාරකාසමූහයෙන් බබළන ගගනතලය හා සදෘශ වූ කජ්ගිනි ගත් රුවන් මෙරක් මෙන් අනන්තශ්‍රීයෙන් දිලිසෙන්නා වූ එකත් පසෙක සිටි ඒ සර්වඥරාජොත්තමයානන් වහන්සේ දැක සතුටින් පිණා ගොස් අත් පා ධොවනය කොට දෙහොත් මුදුනෙහි තබා ගෙණ බුදුන් පිරිවරා සිට ගත්හ. **කසීභාරද්වාජ** බ්‍රාහ්මණතෙම ද එපවත් දැක 'අහෝ! මේ මහාශ්‍රමණතෙම මාගේ කර්මාන්තය භංග කරණු පිණිස ආයේ ය' යි සිතා නො සතුටු ව බුදුන්ගේ රූපසම්පත්තිය දැක 'ඉදින් මේ තෙම අප සේ ම කෘෂිකර්මාන්තයෙහි නියුක්ත වී නම් මුළුමහත් දඹදිවට අග්‍ර වෙයි. තමාගේ අලසතාවෙන් කර්මාන්තයක් නො කොට වජ්මඟුල ආදියෙහි පිඬු සිඟා වළඳමින් කාය කුසීත ව වාසය කරන්නේ ' යි සිතා ද **'සුද්ධොදන'** නම් රජහට පුත්‍ර ව **ශාක්‍යරාජකුලයෙහි** කුමාරයෙක් උපන්නේ ය' යි පෙර ඇසූයේ ඇත. ඒ මේ තෙම චක්‍රවර්තිරාජ්‍යය හැර ගෙණ මහණ ව දුන් ක්ලාන්ත වී ය' යි පරිභව කරණු පිණිස තමන් මහත් නුවණැති බැවින් කථා උපදවනු පිණිස ද 'ශ්‍රමණය, මම සී සාන්නෙමි, වපුරන්නෙමි, සී සාමින් වපුරමින් ධාන්‍යයන් ගෙණ අනුභව කෙරෙමි. මහණ, තෙපිදු සී සාව, වී වපුරව, සීසාමින් වී වපුට ධාන්‍යයන් ගෙණ අනුභව කරව' යි කීය.

''එකල බුදුරජානන් වහන්සේ ද කථාවට නිසි කල් හෙයින් 'බ්‍රාහ්මණය, මම ද සාන්නෙමි, වපුරන්නෙමි, සාමින් වපුරමින් අමෘතඵල අනුභව කරමි' යි වදළසේක. එකල බ්‍රාහ්මණතෙම 'මේ ශ්‍රමණයන් වහන්සේ 'සා වපුට වළඳමි' යි කියනසේක. එතෙකුත් වියනංගලාදියක් දක්නට නැත. 'බොරු කීසේක් දෝ හො' යි සිතා බුදුන්ගේ පාදන්තයෙහි පටන් කෙශාන්තය දක්වා බලමින් ද්වාත්‍රිංශද්වරමහාපුරුෂලක්ෂණයන් දැක විස්මය පත් ව 'මෙබඳු වූ උත්තමශ්‍රීධරපුරුෂයෝ බොරු නො කියති'යි කියා සිත්හි උපන් මහත් බුහුමන් ඇති ව ශ්‍රමණවාදය හැර **ගෞතමගොත්‍රයෙන්** කථා කෙරෙමින් 'භවත් ගෞතමයන් වහන්ස, නුඹවහන්සේගේ සී සාන වියනඟුල් **(275)** සීවැල් කෙව්ටී ගොන් අපි නො දකුම්හ. නුඹවහන්සේගේ කෘෂිභාණ්ඩය වදළ මැනැවැ' යි කී ය. එකල ලොකොත්තර වූ කෘෂිභාණ්ඩය දක්වා වදරණ බුදුරජානන් වහන්සේ:—

**'සද්ධා බීජං තපො වුට්ඨි–පඤ්ඤා මෙ යුගනඞ්ගලං,**
**හිරී ඊසා මනො යොත්තං–සති මෙ ඵාලපාචනං.**
**කායගුත්තො වචීගුත්තො–ආහාරෙ උදරෙ යතො,**
**සච්චං කරොමි නිද්දානං–සොරච්චං මෙ පමොචනං.**

Non-Commercial Distribution

**විරියමෙම ධුරධොරය්හං-යොගක්ඛෙමාධිවාහනං,**
**ගච්ඡති අනිවත්තන්තං-යත්ථ ගන්ත්වා න සොචති.**
**එවමෙසා කසී කට්ඨා-සා හොති අමතප්ඵලා,**
**එතං කසිං කසිත්වාන-සබ්බදුක්ඛා පමුච්චති.'**

යන මෙයින් 'කසීභාරද්වාජයෙනි, මාගේ සර්වඥශාසනය නමැති ක්ෂේත්‍රයෙහි රොපණයට බොරදිය පහදන උදකප්‍රසාදක මැණික් සෙයින් ද ආදසතල ජලතලාදීන්ගේ ප්‍රසාදය වැනි ව චිත්තයාගේ පැහැදීම කරන්නා වූ සම්ප්‍රසාදකාදී ශ්‍රද්ධාතොමෝ යට සිල්මුලින් පිහිටා මත්තෙහි සමථ විදර්ශනා අංකුර නැඟීමෙන් විරූහණාර්ථයෙන් බිජුවට නම් වෙයි. අකුශලධර්මයන් හා ශරීරය තවන අර්ථයෙන් තප නම් වූ ඉන්ද්‍රියසංවර ධූතාංග දුෂ්කරක්‍රියාතොමෝ වර්ෂාව ය. විදර්ශනාමාර්ග ප්‍රඥතොමෝ ලොවුතුරාධර්ම සීයට විය හා නඟුල් ය. සියලු අකුශලධර්මයෙහි ලජ්ජා භයාකාරයෙන් පවත්නා හිරිතොමෝ මාගේ ලොකොත්තරසීයට නඟුලිස ය. චිත්තසම්ප්‍රයුක්ත වූ සමාධිය වියනඟුල් බඳිනා යොත් ලනු ය. සරණ ලක්ෂණ වූ විදර්ශනාමාර්ගය හා සම්ප්‍රයුක්ත වූ ස්මෘතිතොමෝ මාගේ ලොකොත්තරසීයෙහි පදිනා අර්ථයෙන් සීවැල් කෙවිටි ය. මාගේ ශ්‍රද්ධාබීජයෙන් උපන් නොයෙක් කුසල්ගොයම් ත්‍රිවිධ වූ කාය සුචරිතයෙන් රක්නා ලද්දේ ය. චතුර්විධ වූ වාක්සුචරිතයෙන් රක්නා ලද්දේ ය. උදරාබ්‍ය වූ බඩට කන ඛාද්‍යභොජ්‍යාදි චතුර්විධාහාරයෙහි පස් විකා වැළඳීමෙන් පමණ දන්නා ලද බොජුන් ඇත්තෙමි. මේ ත්‍රිවිධ වූ වැටින් රැක මාගේ කුසල්ගොයම් නසන චඤ්චාදිතෘණයන් සත්‍යයෙන් නෙළීම කෙරෙමි. සුන්දරතර නිර්වාණයෙහි ඇලුනු හෙයින් සොරච්ච නම් වූ අර්හත් ඵලවිමුක්තිය මාගේ වීර්ය බලිවර්දයන්ගේ මිදීම නම් වන්නේ ය. ප්‍රඥවියනඟුල් සංඛ්‍යාත වූ ධුරය උසුලන්නා වූ මාගේ චතුර්විධ සම්‍යක් ප්‍රධාන වූ වීර්යතෙම නිර්වාණයට අභිමුඛ ව උසුලන්නේ නැවැත්මක් නැත්තේ ප්‍රථමාදිමගින් කෙලෙසුන් සිඳිමින් යන්නේ ය. එසේ යන්නා වූ ඒ මාගේ වීර්යධුරධොරය්හය යම් තැනකට ගොස් ශොක නො කෙරේ ද, ඒ අමෘතමහානිර්වාණස්ථානයට යන්නේ යි. මෙසේ ශ්‍රද්ධාබීජාදී මේ සීතොමෝ සාන ලද්දී ය ඕ තොමෝ අමෘතඵල ඇත්තී වෙයි. යම් කිසිවෙක් මේ සීය සා සංස්කාරවිපරිණාම සංඛ්‍යාත වූ සියලු ම දුකින් මිදෙනු ලබන්නේ ය.

"එම්බා, කසීභාරද්වාජය, මේ ශ්‍රද්ධාබීජ තපොවෘෂ්ටියෙන් අනුග්‍රහ කරණ ලද සීතොමෝ ප්‍රඥමයවියනඟුල් ද, හිරිමය නඟුලිස ද (276) චිත්තසමාධිමය යොත්බානින් එකාබද්ධ කොට ප්‍රඥ නමැති නඟුලෙහි සිහි නමැති සීවැල ගසා ගෙණ සිහි නමැති කැවිට ගෙණ කායවාචා ආහාර ගුත්තියෙන් ගොපනය කොට සත්‍යයෙන් නෙළීම කොට රහත්ඵල විඳීම වූ වීර්ය සංඛ්‍යාත වූ ධුරොද්වාහකයා චතුර්විධෞඝයෙන් ක්ෂෙම වූ නිර්වාණාභිමුඛ කොට නො නවත්නා කොට උසුලන්නාහු විසින් සාන

Non-Commercial Distribution

ලද්දේ සිකම් කෙළවර වූ සතර ශ්‍රාමණ්‍යඵලසංඛ්‍යාත සතරඵලයට පමුණු-වන ලද්දී ය. 'ඒ මාගේ සී තොමෝ නිර්වාණාමෘතඵල ඇත්තී ය' යි කියා මෙසේ භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ බ්‍රාහ්මණයාහට අර්හත්ඵලය කුළු ගෙණ නිර්වාණය අවසාන කොට ධර්මදෙශනා කර වදළසේක. එකල බ්‍රාහ්මණතෙම ගම්භීරාර්ථයෙන් යුක්ත වූ ධර්මදෙශනාව අසා අති ප්‍රසන්න ව මහත් වූ ප්‍රීතියෙන් ලක්ෂයක් අගනා මහත් වූ ස්වර්ණථාලියෙහි කිරිබත් පුරවා මධුඵාණිතාදියෙන් විචිත්‍ර කොට සරභා දුහුල්වියනකින් වසා දෙඅතින් ඔසවා ගෙණවුත් ආදරයෙන් නැමී. 'භවත් ගෞතමයානන් වහන්සේ කිරිබත් වළඳා වදළ මැනැව. උතුම් කස්සක වූ භවත් ගෞතම-යානන් වහන්සේ නිවන් අනුසස් කොට ඇති සීසා වදරණසේකැ' යි කීය.[1] බුදුරජානන් වහන්සේට පිරිනමා ලී ය. එකල බුදුරජානන් වහන්සේ 'උදයකාලයෙහි පටන් කෙත සමීපයෙහි සිට බත්සැන්දකුත් නො ලැබ සියලු බුදුගුණ ප්‍රකාශ කොට ලත් භොජනය නෘත්‍යගීතකාරාදීන් විසින් නටා ගී කියා ලත් දෙයක් සදෘශ ය' යි සිතා 'ගාථාභි ගීතං මෙ අභොජනීයං' යනාදීන් ඒ භොජනය ප්‍රතික්ෂෙප කර වදළසේක. එකල්හි බ්‍රාහ්මණ තෙම 'මාගේ කිරිබත් ප්‍රතික්ෂෙප කරණසේක. මේ භොජනය මහණුන් වහන්සේලාට කැප නො වී ය. දන් දී ගත නුහුනු හෙයින් මම නිර්ධනික වීමි' යි දෙම්නස් උපදවා 'අනික් දනක් පිළිගත්සේක් නම් යෙහෙකැ' යි සිතී ය. එකල පරසිත් දන්නා මාගේ සර්වඥරාජොත්තමයන් වහන්සේ ඒ සිත දැක 'දෙම්නස් පහ කරවා නිර්වාණධර්මය අවබොධ කරවමි' යි සිතා:—

> 'අඤ්ඤෙන ච කෙවලිනං මහෙසිං
> ඛීණාසවං කුක්කුච්චවූපසන්තං,
> අන්නෙන පානෙන උපට්ඨහස්සු
> ඛෙත්තං හි තං පුඤ්ඤපෙඛස්ස හොති.'

යන ගාථාවෙන් 'එම්බා, කසිභාරද්වාජයෙනි, සියලු ම ලෞකික ලොකොත්තරගුණය ඇති මහත් වූ ශීලස්කන්ධාදිගුණය සෙවීමෙන් මහෙසි වූ සත්හුන් හස්තපාද කුකුස් හා විනය පිළිබඳ වූ සියලු කුකුස් ඇති ක්ෂය කරණ ලද සකලාශ්‍රවයන් ඇති රහත්හු මේ පායාසයෙන් අන්‍ය වූ ඛාද්‍යභොජ්‍යාදි ත්‍රිවිධාහාරයෙන් ද අෂ්ටවිධ වූ පානවර්ගයෙන් ද උපස්ථාන කරව. පින් කැමැත්තාහට උභයලොකයට හිත වූ පින්කෙත් වන්නේ ය'යි මෙසේ බුදුරජානන් වහන්සේ බ්‍රාහ්මණයාගේ දෙම්නස් හරවා සෙසු බත් පිළිගන්නා බව පරියායෙන් වදළ කල බ්‍රාහ්මණතෙම 'අනික් දනක් පිළිගන්නේ ඇතැ' යි සිතා සතුටු ව 'බුදුන්ට පිරි නැමූ මේ පායාසයත් මාගේ කැමැත්තෙන් අන් කිසිවක්හට දෙන්නට නුසුදුස්සේ ය' යි සිතා 'භවත් ගෞතම ස්වාමීන් වහන්ස, මේ කිරිබත මම කවරක්හට දෙම් දැ?' යි විචාළේ ය.

1. කීහ

Non-Commercial Distribution

**(277)** එවිට බුදුරජානන් වහන්සේ **සුජාතාවගේ** ක්ෂීරභොජනයෙහි මෙන් **චුන්දයාගේ** ඌරුමාංසයෙහි මෙන් **වෙරඤ්ජායෙහි** දී බුදුන් ගන්නා ආලොපයෙහි මෙන් **භෙසජ්ජක්ඛන්ධකයෙහි** ගුළපිණ්ඩයෙහි මෙන් බුදුන්ට කිරිබත පිරිනමනා වේලෙහි දෙවතාවන් දිව්‍යමයරසඔජස් බහා ලූ හෙයින් අනන්තරසවත් කිරිබත බුදුන් රහතුන් මිස සමස්තලොකයෙහි කිසිවක්හට දිරවා ගත නො හැකිබව දූන 'බ්‍රාහ්මණය, පඤ්චකාමාවචර දෙවියන් සහිත වූ දෙවපුත්‍රාදිපස්මරුන් සහිත වූ රූපාවචරබ්‍රහ්මයන් සහිත වූ අවකාශලොකයෙහි ශාසනප්‍රතිපක්ෂ මහණබමුණන් සහිත වූ සම්මුති දෙවියන් හා අවශෙෂ මනුෂ්‍යයන් සහිත වූ සත්වලොකයා අතුරෙන් තථාගතයන් වහන්සේ හෝ තථාගතශ්‍රාවක වූ ක්ෂීණාශ්‍රවනමක් හෝ හැර යම් කෙනෙකුන් විසින් මේ කිරිබත වළඳන ලද්දේ මනා කොට දිරීමට යේ නම්, එසේ වූ කෙනෙකුන් මම නො දක්නෙමි. එහෙයින්, බ්‍රාහ්මණය, තෙපි මේ කිරිබත ගෙණ ගොස් තෘණ නැති ගල්තලෙක හෝ දමාපියව. පණුවන් නැති මහත්දියකඳෙක හෝ උපුල්වාපියව' යි වදළ කල්හි බ්‍රාහ්මණතෙම කිරිබත් ගෙණ ගොස් පණුවන් නැති මහදියකඳෙක දමාපි ය. එකල ඒ කිරිබත බුද්ධානුභාවයෙන් දවසක් මුළුල්ලෙහි උෂ්ණයෙහි ලා රත් කළ සීවැලක් දියෙහි බහා ලූ කලක් මෙන් 'චිච්චිටායන චිටිචිටායන' ශබ්ද කෙරෙමින් හාත්පසින් දුම්කඳ නැංගේ ය. ඒ දූක බ්‍රාහ්මණතෙම සිත්හි චන් භයට පැමිණ සකලශරීරය ලොමුදැහැ ගෙණ බුදුන් කරා ගොස් වැඳ වැතිර 'අභික්කන්තං භන්තෙ' යනාදීන් ස්තුති පූජා කොට බුදුසසුන් වැද මහණ ව රහත් වී ය'' යි වදළසේක.

''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ වළඳා වදරණ කල්හි හැම කාලයෙහි ම දෙවතාවෝ දිව්‍යඔජස් පාත්‍රයෙහි බහා ලන්නාහු ද? නොහොත් ශූකරමර්දවයෙහි ද මධුපායාසයෙහි ද යන පිණ්ඩපාතද්වයෙහි ම දිව්‍යඔජස් බහාලූවාහු ද?'' යි විචාළෝ ය. ''මහ–රජානෙනි, තථාගතයන් වහන්සේ වළඳා වදරන්නා වූ සියලු කාලයෙහි ම දෙවතාවෝ දිව්‍යමයරසඔජස් ගෙණ ළඟ සිට නැඟු නැඟු ආලොපයෙහි බහාලති. මහරජානෙනි, යම් සේ රජ්ජුරුවන්ගේ රසකාරකපුරුෂතෙම රජ්ජුරුවන් මේ නිමවන වේලෙහි ව්‍යංජන ගෙණ ළඟ සිට පිණ්ඩපිණ්ඩයෙහි සූපයෙහි රසය බහන්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම බුදුරජානන් වහන්සේ වළඳා වදරන්නා වූ සියලු කාලයෙහි ම දෙවතාවෝ දිව්‍යඔජස් ගෙණ ළඟ සිට නැඟු නැඟු ආලොපයෙහි දිව්‍යඔජස් බහාලති. මහරජානෙනි, **වෙරඤ්ජායෙහි** දී ද තථාගතයන් වහන්සේ විසින් වියලි යවපෙති වළඳා වදරණ වේලෙහි දෙවතාවෝ දිව්‍යඔජසින් තෙමතෙමා ලං කළාහු ය. ඒ කාරණයෙන් තථාගතයන් වහන්සේගේ ශ්‍රී ශරීරය සම්පූර්ණ වී ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් දෙවතාකෙනෙක් තථාගතයන් වහන්සේගේ ශරීරපටිජග්ගනයෙහි

*Non-Commercial Distribution*

නිරන්තරයෙන් යම් උත්සාහයකට පැමිණියාහු ද, ඒ දෙවතාවන්ට ඒකාන්තයෙන් ම මහත් ලාභයෙක. සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ප්‍රශ්නය එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

සර්වඥගොචරප්‍රශ්නය නිමි.

## බ්‍රහ්මාරාධනා ප්‍රශ්නය.

**(278)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'තථාගතයන් වහන්සේ විසින් චතුරසංඛ්‍යකල්පලක්ෂයකින් හා මේ අතරතුරෙහි මහත් වූ ජන සමූහයාගේ ගොඩ නැඟීම පිණිස සර්වඥතාඥනය මුහු කරවන ලද්' යි කියා නුඹ වහන්සේ වදරණසේක. නැවත ද 'සර්වඥතාඥනයට පැමිණ වදළා වූ බුදුරජානන් වහන්සේගේ සිත මන්දෙත්සාහ බවට නැමුනේ ය. ධර්මදෙශනාවට සිත නො නැමුනේ ය.' ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් සේ දුනුවායෙක් හෝ දුනුවායන්ගේ අන්තෙවාසිකයෙක් හෝ බොහෝ දවසක් මුළුල්ලෙහි යුද්ධ කරණු පිණිස විදීම් ශික්ෂිත ව මහායුද්ධයක් සම්ප්‍රාප්ත කල්හි පසු බස්නේ වේ ද, එපරිද්දෙන් ම, ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, තථාගතයන් වහන්සේ විසින් සාරාසංඛෙය්‍යයකින් හා කල්ප ලක්ෂයකින් යුක්ත වූ මේ තාක් දීර්ඝකාලයක් මුළුල්ලෙහි මහත් වූ ජන සමූහයාගේ ගොඩ නැඟීම පිණිස සර්වඥතාඥනය මුහු කරවා ගෙණ සර්වඥතාඥනයට පැමිණ වදළා වූ බුදුරජානන් වහන්සේ විසින් ධර්ම දෙශනා කිරීමෙහි පසු බස්නා ලද්දේ ය.

''තවද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් සේ මල්ලවයෙක් හෝ මල්ලවයන්ගේ අන්තෙවාසිකයෙක් හෝ බොහෝ දවසක් මුළුල්-ලෙහි මල්ලවයුද්ධ පුරුදු කොට මල්ලවයුද්ධයක් සම්ප්‍රාප්ත කල්හි පසු බස්නේ වේ ද, එපරිද්දෙන් ම ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගත-යන් වහන්සේ එයින් සාරාසංඛෙය්‍යයකින් හා කල්ලක්ෂයකින් යුක්ත වූ ඒ තාක් කල් මුළුල්ලෙහි මහත් වූ ජනසමූහයා ගොඩ නගාලීම පිණිස සර්වඥතාඥනය මුහු කරවා ගෙණ දූන් සර්වඥතාඥනයට පැමිණ වදළා වූ බුදුරජානන් වහන්සේ විසින් ධර්මදෙශනා කිරීමෙහි පසු බස්නා ලද්දේ ය. කිමෙක් ද, ස්වාමීනි,. නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ විසින් තුන්ලෝවාසීන්ට බණ කියන්ට භයින් පසු බස්නා ලද්දේ ද? නොහොත් බණ කියන්ට නො දැනෙන බැවින් පසු බස්නා ලද්දේ ද? නැතහොත් අසමර්ථ බැවින් පසු බස්නා ලද ද? නොහොත් අසර්වඥ බැවින් පසු බස්නා ලද්දේ ද? ඒ බණ දෙශනා නො කිරීමෙහි මැළි වූ කාරණා කවරේ ද? මාගේත් ලෝකයාගේත් කාංක්ෂා දුරු වන පිණිස වහා නුඹ වහන්සේ මට කාරණයක් වදළ මැනව. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ විසින් 'චතුහි ච

Non-Commercial Distribution

අසංඛෙය්‍යෙහි කප්පානං සතසහස්සෙන ච එත්ථන්තරෙ සබ්බඤ්ඤුතඤාණං පරිපාචිතං මහතො ජනකායස්ස සමුද්ධරණාය' කියා වදරණ ලද්දේ සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'සබ්බඤ්ඤුතං පත්තස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමි, නො ධම්මදෙසනාය' කියා වදළ යම් වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් 'සබ්බඤ්ඤුතං පත්තස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමි. නො ධම්මදෙසනාය' කී වචනය සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'තථාගතෙන චතුහි ච අසංඛෙය්‍යෙහි කප්පානං සතසහස්සෙන ච එත්ථන්තරෙ සබ්බඤ්ඤුතඤාණං පරිපාචිතං මහතො ජනකායස්ස සමුද්ධරණාය' කී වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටිකප්‍රශ්නය ද අතිගම්භීර වන්නේ ය, දුෂ්කර වූ නිර්වෙඨනය ඇත්තේ ය. ඒ ප්‍රශ්නයතෙම නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඉසිලිය යුත්තේ ය' යි කීහ.

''මහරජානෙනි, තථාගතයන් වහන්සේ විසින් චතුරසංඛෙය්‍යකල්ප ලක්ෂයකින් පාරමිතාධර්මය මුහු කරවන ලද්දේත් සැබෑ ම ය. ඒතාක් **(279)** දීර්ඝකාලයක් මුළුල්ලෙහි මහත් වූ ජනසමූහයා ගොඩ නඟාලීම පිණිස සර්වඥතාඥනයට පැමිණ වදළා වූ බුදුරජානන් වහන්සේගේ සිත ධර්මදෙශනා කිරීමෙහි නො නැමුනේ ම ය. මන්දෝත්සාහබවට පැමිණ වදළ කාරණය වනාහි නිර්වාණධර්මයාගේ ජලපොළොව සෙයින් අති ගම්භීර බව ද, සියක්වර පැළූ අස්ලොම්අගක් මෙන් අතිසූක්ෂ්මබව ද, මහත් වූ ඝනතරපර්වතයකින් ප්‍රතිච්ඡන්න වූ වස්තුවක් මෙන් දක්ක නො හැකි බව ද, සර්වඥයන් වහන්සේ හැර සෙසු ලොකයාගේ ඤාණයෙන් අවබොධ නො කට හැකි බව ද, සර්වඥතාඥනය හැර ලෞකික ඥනයෙන් දක්ක නො හැකි හෙයින් අතිසියුම්බව ද, චතුරාර්යසත්‍යඥන දර්ශනීය වූ තථාගතයන් වහන්සේ හැර සෙසු ලෞකිකඥනවතුන් විසින් ප්‍රතිවෙධය දුෂ්කරබව ද, සනරාමරසකලලොකවාසීසත්වයන්ගේ වස්තුකාමක්ලේශකාමයෙහි ආලයාරාමබව ද, කිඹුලා කටින් ඩැහැ ගත් දෙයක් ගලවා ගත නො හැක්කා සේ සත්කායදෘෂ්ටියගේ දැඩි කොට සුගෘහිත බව ද, දැක වදරා 'කිම දෝ හො යි? කෙසේ දෝ? හො' යි කියා මන්දොත්සාහබවට සිත නැමුසේක. ධර්මදෙශනා කිරිමෙහි නො නැමුසේක. මේ මන්දෝත්සාහ වූ බව ද, සනරාමරසකලලොකවාසීසත්වයන්ට චතුස්සත්‍ය ප්‍රතිවෙධය සිතන සිත ම ය.

''මහරජානෙනි, යම් සේ ශල්‍යකර්තෘ වූ වෛද්‍යාචාරීතෙම නොයෙක් ව්‍යාධියෙන් පීඩිත වූ මනුෂ්‍යයකු කරා එළඹ 'කවර නම් උපක්‍රමයකින් කවර නම් බෙහෙතකින් මොහුගේ ව්‍යාධිය ව්‍යපශමනය වේ දෝ හො' යි කියා මෙසේ සිතන්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම අප තථාගතයන් වහන්සේ 'සියලු ම ක්ලේශව්‍යාධියෙන් පීඩිත වූ ජනයා ද නිර්වාණධර්මයාගේ ගම්භීර නිපුණ දුර්දර්ශක දුරනුබොධ සියුම් දුෂ්ප්‍රතිවෙධබව කිම් දෝ හො යි කෙසේ දෝ හො?' යි කියා මන්දෙත්සාහබවට

*Non-Commercial Distribution*

සිත නැමූසේක. ධර්මදෙශනා කිරීමට නො නැමූසේක. මේ මන්දෙත්-සාහ වූ බව ද සනරාමරසකලලොකවාසීසත්වයන්ට චතුස්සත්‍යප්‍රතිවෙධය සිතන මනස ම ය.[1] සිතම ය.

''තවද, මහරජානෙනි, යම් සේ ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂේක වූ ක්ෂත්‍රියමහරජහට තමාගේ දෙරටුපාල අංගපාල පාරිෂද්‍ය නිගමයොධහට බලප්‍රධානික අමාත්‍යක්ෂත්‍රිය ප්‍රභෘති වූ රාජූපජීවික ජනයන් දැක 'කිම දෝ? හෝ යි කෙසේ දෝ?' හෝ යි 'කෙසේ නම් මොවුන්ට සංග්‍රහ කෙරෙම් ද?' යි කියා මෙසේ සිත් උපදනේ ය. මහරජානෙනි, එපරිද්-දෙන් ම අප තථාගතයන් වහන්සේ නිර්වාණධර්මයාගේ ගම්භීරාතිසූක්ෂ්ම දුරදර්ශක දුරනුබොධසුඛුමදුෂ්ප්‍රතිවෙධ බව ද, සියලු සත්වයන්ගේ වස්තුකාමාදි ආලයාරාමබව ද, සත්කායදෘෂ්ටියගේ දෘඪසුගෘහීත බව ද දැක 'කිමෙක් දෝ හො යි කෙසේ දෝ හො?' යි කියා මන්දෙත්සාහබවට සිත නැමූසේක. ධර්මදෙශනා කිරීමෙහි සිත නො නැමූසේක. ඒ මන්දෙත්-සාහ වූ බව ද සියලු සත්වයන්ට චතුස්සත්‍යප්‍රතිවෙධය සිතන මනස ම ය. මහරජානෙනි, එතෙකුදු වුවත් 'මහාබ්‍රහ්මයා විසින් ආරාධනා කරණ ලද්ද වූ තථාගතයෝ ධර්මදෙශනා කරන්නාහු ය' යි යන මේ කාරණය තෙම සියලු ම තථාගතයන්ගේ ධර්මතාවෙක. එහි වනාහි කාරණා කවරේ ද? යත්:— ඒ බුදුන් ධර්මදෙශනා කිරීමට පූර්වකාලයෙහි යම් මනුෂ්‍යකෙනෙක් ඇද් ද, තපස්වී කෙනෙක් ඇද් ද, පරිබ්‍රාජකකෙනෙක් ඇද් ද, ශ්‍රමණබ්‍රාහ්මණ කෙනෙක් ඇද් ද, ඒ සියල්ලෝ ම බ්‍රහ්මයා දෙවතා කොට ඇත්තාහු ය. බ්‍රහ්මයා ම ගරු කොට ඇත්තාහු ය. බ්‍රහ්මයා ම පිළිසරණ කොට ඇත්තාහු ය. එහෙයින් මහත් බල ඇත්තා වූ මුළු ලෝ **(280)** පතළ යශස් ඇත්තා වූ ප්‍රසිද්ධ වූ අග්‍ර වූ ඉතිරි සිටියා වූ ඉතා උස් ව සිටියා වූ මහාබ්‍රහ්මයාගේ වැඳීමෙන් දෙවියන් සහිත වූ ලෝවැසිතෙම නමස්කාරය කරන්නේ ය. සිතන්නේ ය, සනිටුහන් කරන්නේ ය, මහ-රජානෙනි, මේ කාරණයෙන් ද බ්‍රහ්මරාජයා විසින් යාච්ඤා කර සිටින ලද්ද වූ තථාගතයන් වහන්සේලා ධර්මය දෙශනා කරණසේක්ලා ය.

''තවද, මහරජානෙනි, යම් සේ කිසියම් මහාරාජොත්තමකෙනෙක් හෝ රාජමහාමාත්‍යයෙක් හෝ ශ්‍රමණාදි යම් කිසිවකුට නමස්කාරය කෙරෙත් ද[2], ඉතා මහත් වූ රාජබලයෙන් යුක්ත වූ ඒ රජ්ජුරුවන්ගේ වැඳීමෙන් අවශෙෂ වූ ජනසමූහයාත් නමස්කාරය කරන්නේ ය, පූජාසත්කාර කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම මහාබ්‍රහ්මයා ප්‍රණාමය කළ කල්හි තථාගතයන් වහන්සේලාට දෙවියන් සහිත වූ ලෝවැසිතෙම ද නමස්කාර කරන්නේ ය. මහරජානෙනි, ලොකවාසීසත්වතෙම පූජිත පූජා ඇත්තේ ය. පුදන්නවුන් දැක පුදන්නේ ය. එහෙයින් ඒ මහාබ්‍රහ්ම රාජයා සියලු ම තථාගතයන් වහන්සේලාට ධර්මදෙශනා කිරීම පිණිස

---

1. ප්‍රතිවෙධ කරණ සිත නමන සමය 2. කෙරේ

Non-Commercial Distribution

යාච්ඤා කර සිටින්නේ ය. ඒ කාරණයෙන් ද මහාබ්‍රහ්මරාජයා විසින් ආරාධනා කරණ ලද්ද වූ තථාගතයන් වහන්සේලා ධර්මදෙශනා කර වදරණසේක්ලා ය.

''මහරජානෙනි, අප තිලෝගුරු සර්වඥරාජොත්තමයන් වහන්සේ ලොවුතුරා බුදු ව අටවනසතියෙහි **අජපාල** නම් නිග්‍රොධමූලයෙහි වැඩ සිට අනන්තාපරිමෙය්‍ය වූ බුදුවරයන් වහන්සේලාගේ සිතිවිලික්‍රමයෙන් ම සිතා වදරණසේක් 'මාගේ නිර්වාණධර්මය අතිගම්භීර වන්නේ ය, සත්ව–යන්ගේ නුවණ ලාමක ය, රාගද්වෙෂාදි ක්ලේශයෝ ද ඉතා උත්සන්න යෝ ය. මා බුදු වූ බව මුත් ධර්මදෙශනා කිරිමට අල්පරජස්ක කලෙක් නො වෙයි. ධර්මදෙශනා නො කෙරෙම් දෝ හො?' යි ධර්මගම්භීරත්ව යෙන් පසු බටසේක. එකෙණෙහි ම **සහම්පති** නම් මහාබ්‍රහ්මරාජයා 'නස්සති වත භො ලොකො, විනස්සති වත භො ලොකො' යනාදීන් දස දහසක් සක්වළට ඇසෙන සේ කියකියා දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්ම නාග සුපර්ණ ගරුඩ ගාන්ධර්ව යක්ෂ රාක්ෂස උෂ්ණවලාහක අභ්‍රවලාහක සීතවලාහක වස්සවලාහක සිද්ධවිද්‍යාධරාදී දිව්‍යසේනාව වෙවුල්වා මහ හඬින් ගුගුරුවා දසදහසක්සක්වළ දෙවියන් රැස් කොට එක්ලක්ෂපණස් දහසක් බ්‍රහ්මරාජයන් පිරිවරා දසදහසක්සක්වළ අනුදහසක් දිව්‍යරාජයන් හා සමග මේ මගුල් සක්වළ රැස් ව තමාගේ අටසාළිස්ගවු උස ශරීරයෙහි සත්ගවුසමාර බැගින් දිග ඇති දෙපතුලින් හා දෙළොස්ගවු දිග රියන් හා සගවු දිග වියත් හා අඩගවු තැන් වසාලන ඇඟිලින් හා ඇතුළු වූ දෙළොස් යොදුන් දිවසළු පැලඳ දෙළොස්යොදුන් සළු එකාංශ කොට සොළොස් ගවු උස මැණික්ඔටුනු පැලඳ තමාගේ දසැඟිල්ලෙන් දිවු රැස්කඳින් දස දහසක්සක්වළ හිරුදහස් සඳුදහස් නැංගා සේ එකාලොක කෙරෙමින් දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්මයන් ගෙණ අපගේ සද්ධර්මවරචක්‍රවර්ති වූ බුදුරජානන් වහන්සේ කරා ඒ **අජපාලන්‍යග්‍රොධ** මූලයට දිව තමාගේ දෙළොස්ගවු උස දකුණු දණමඬල නමා හිඳ තමාගේ සගවු පළල් විශාල වූ දෙහොත් මුදුනෙහි තබා ගෙණ පුන්සඳ වන් මුහුණ බලබලා 'ස්වාමීනි, බුදුකෙනෙකුන් ඉපදීම කප්අසංඛ්‍යයකිනුත් ඉතා දුර්ලභ වන්නේ ය. නුඹ වහන්සේ මේ සාරාසංඛෙය්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි පාරමිතාධර්මයන් **(281)** පුරා මහත් වූ දුක් ගත්තේ ධර්මදෙශනා කොට සියලු සතුන් සංසාරසාගරයෙන් ගොඩ නහම්' යි කියා නො වේ ද? එසේ වූ නුඹ වහන්සේ දූන් සද්ධර්මවරචක්‍රවර්තිරජ ව ධර්මචක්‍රය නො පවත්වම් යි සිතූ සේ නො යෙදෙයි. නුඹ වහන්සේගේ දෙශනා නමැති රශ්මියෙන් ප්‍රබොධය බලා හිඳිනා මේ විනෙයජනපද්මයෝ අසංඛෙය්‍ය ගණනෙක. නුඹ වහන්සේගේ ධර්මචක්‍රය ඉක්ම පවත්නේ වී නම්, මම මාගේ ආඥ චක්‍රයෙන් හික්මවා දෙන්නෙමි. 'දෙසෙතු සුගතො ධම්මං. දෙසෙතු භගවා ධම්මං' යනාදීන් ධර්මදෙශනාවට ආරාධනා කෙළේ ය. ඒ සර්ව-ලොකෙශ්වර වූ බ්‍රහ්මාරාධනාව පිළිගෙණ ධර්ම දෙශනා කළසේකැ'' යි කීසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ

Non-Commercial Distribution

විසින් ප්‍රශ්නය සුනිර්වෙඨනය කරණ ලද්දේ ය. නුඹ වහන්සේගේ ප්‍රශ්නය ප්‍රකාශ කිරීම අතිමනොඥ ය. මෙසේ මේ ප්‍රශ්නය එසේ ම පිළිගන්නෙමි''යි කීහ.

බ්‍රහ්මාරාධනාප්‍රශ්නය නිමි.

---

සකලජනමනොනන්දනීය වූ මෙණ්ඩකප්‍රශ්න
නම් වූ මේ ශ්‍රී සද්ධර්මාදසයෙහි
පස්වැනි වර්ගය නිමියේ ය.

## ගුරුවිරහිතප්‍රශ්නය.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**'න මෙ ආචරියො අත්‍ථි-සදිසො මෙ න විජ්ජති,**
**සදෙවකස්මිං ලොකස්මිං-නත්‍ථි මෙ පටිපුග්ගලො.''**

යන මේ ගාථාවෙන් 'මට ආචාර්ය කෙනෙක් නො ම ඇත. මට සදෘශ කෙනෙකු ද නැත්තේ ය. දෙවියන් සහිත වූ ලොකයෙහි මට වැඩි පුද්ගල යෙක් නැත්තේ ය' යි කියා මේ ගාථාව වදරණ ලද්දේ ය. නැවත ද:—

**'ඉති ඛො භික්ඛවෙ ආලාරොකාලාමො ආචරියො මෙ සමානො අන්තෙවාසිං මං සමානං අත්තනා සමසමං ඨපෙසි. උළාරාය ච මං පූජාය පූජෙසි' යි.**

යන මෙයින් 'මහණෙනි, 'මෙසේ ආළාරකාලාමතෙම මට ආචාර්ය වූයේ අන්තෙවාසික වූ මා තමා හා සම සම ව තැබූයේ ය. මට මහත් වූ පූජා වෙන් පූජා කෙළේ ය' යි කියාත් වදරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ විසින්:—

**'න මෙ ආචරියො අත්‍ථි-සදිසො මෙ න විජ්ජති,**
**සදෙවකස්මිං ලොකස්මිං-නත්‍ථි මෙ පටිපුග්ගලො' යි.**

මෙම ගාථාව වදරණ ලද්දේ වී නම්, ඒ කාරණයෙන් 'ඉති ඛො භික්ඛවෙ ආළාරොකාලාමො ආචරියො මෙ සමානො අන්තෙවාසිං මං සමානං අත්තනා සමසමං ඨපෙසි' යි කී වචනයක් ඇද් ද, ඒ වචනය බොරු වන්නේ ය. ඉදින් තථාගතයන් වහන්සේ විසින් 'ඉති ඛො භික්ඛවෙ ආළාරොකාලාමො ආචරියො මෙ සමානො අන්තෙවාසිං මං සමානං අත්තනා සමසමං ඨපෙසි' යි කියා වදරණ ලද්දේ සැබෑ වී නම්, ඒ කාරණයෙන් 'න මෙ ආචරියො අත්ථි සදිසො මෙ න විජ්ජති' යනාදි වදළ (282) ඒ වචනය හෝ බොරු වන්නේ ය. මේ උභතොකොටික ප්‍රශ්නය ද නුඹ වහන්සේ කරා පැමිණියේ ය. නුඹ වහන්සේ විසින් ඒ ප්‍රශ්නයතෙම ඉසිලියයුත්තේ ය'' යි කීහ.

Non-Commercial Distribution

''මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**'න මෙ ආචරියො අත්‍ථි-සදිසො මෙ න විජ්ජති,**
**සදෙවකස්මිං ලොකස්මිං-නත්‍ථි මෙ පටිපුග්ගලො.'**

යන මේ ගාථාවත් වදරණ ලද්දේ ය. නැවත ද:—

**'ඉති බො භික්ඛවෙ ආළාරො කාලාමො ආචරියො මෙ සමානො අන්තෙවාසිං මං සමානං අත්තනා සමසමං ඨපෙසි. උළාරාය ච මං පූජාය පූජෙසි.'**

**(282)** කියා මෙම කාරණයත් වදරණ ලද්දේ ය. ඒ වදළ වචනය වනාහි බුදු වීමට පූර්වයෙහි ම අභිසම්බුද්ධ නො වූ බොධිසත්වයන් වහන්සේගේ ආචාර්යභාවය සඳහා වදරණ ලද්දේ ම ය. මහරජානෙනි, බුදු වීමට පූර්වයෙහි ම යම් කෙනෙකුන් විසින් අනුශාසනා කරණ ලද්ද වූ බොධිසත්වයන් වහන්සේ ඒ ඒ තන්හි දවස් හැර වදළසේක් ද, ඒ අභිසම්බුද්ධ නො වූ බොධිසත්වයන් වහන්සේගේ මේ ආචාර්යවරයෝ පස්දෙනෙක. ඒ ගුරුවරයෝ පස්දෙන කවරහු ද? යත්:— මහරජානෙනි, යම් ඒ බ්‍රාහ්මණයෝ අටදෙනෙක් බොධිසත්වයන් උපන් කල්හි ලක්ෂණ පරීක්ෂා කළාහු ද, හේ කවරහ? යත්:— චතුර්වෙදයෙහි නිපුණ වූ රාම ය, ධජ ය, ලක්ඛණ ය, මන්ති ය, යඤ්ඤ ය, සුයාම ය, සුභොජ ය, සුදත්ත ය යන ඒ බ්‍රාහ්මණයෝ බොධිසත්වයන්ගේ දෙතිස්මහාපුරුෂලක්ෂණාදිය බලා 'මේතෙම ගෘහවාසයෙහි විසී නම් චක්‍රවර්තිරජ වෙයි, මහණ වී නම්, ලොවුතුරාබුදු වෙ' යි කියා දෙඇඟිලි නැඟුහ. හැමට ම බාල සුදත්ත නම් බ්‍රාහ්මණයා මකුළුහුයක් වැනි ඌර්ණාරොම ධාතුව බලා 'මේ තෙම එකාන්තයෙන් ම ලොවුතුරා බුදු වේ ම ය' යි කියා එකැඟිල්ලක් නඟා ලී ය. මෙසේ බොධිසත්වයන්ගේ සිරිසෙත් ප්‍රකාශ කොට කියා රක්ෂා කට යුතු කෙරෙව්වාහු ය. ඒ අට දෙන පළමුවන ආචාර්යයෝ ය.

''නැවත ද, මහරජානෙනි, බොධිසත්වයන්ගේ පිතෘ වූ සුද්ධෝදන නම් මහරජානෝ එසමයෙහි විශෙෂජාති ඇති උදිච්චබ්‍රාහ්මණවංශ ඇති පදක වෙය්‍යාකරණෂළංගශාස්ත්‍ර දන්නා සබ්බමිත්ත නම් බ්‍රාහ්මණයෙකු ලඟට ගෙන්වා ස්වර්ණභිංකාරයෙන් පැන් වත්කොට 'මේ කුමාරයාට ශිල්ප උගන්ව' යි කියා භාර දුන්නාහු ද, මේ දෙවෙනි ආචාර්යයා ය.

''තවද, මහරජානෙනි, බොධිසත්වයන් වහන්සේ සාරමසින් සාර මසින් ශක්‍රදෙවෙන්ද්‍රවිලාසයෙන් සැරයි උද්‍යානක්‍රීඩාවට වඩනා කල්හි යම් ඒ දෙවතාවෙක්[1] මහණවෙසය සතර වැනි කොට ජරා ව්‍යාධි මෘත රූපයන් දක්වා බොධිසත්වයන්ට සංවෙග කෙළේ ද[2] යම් දෙවතාවකුගේ ආනුභාවයෙන් කියූ රථාචාර්යයාගේ වචනය අසා බොධිසත්වයන් වහන්සේ තුන් භවය ම ගිනි ගත් ගෙයක් සේ සිතා සසර කලකිරී උද්විග්න ව ඒ ක්ෂණයෙහි ම නෛෂ්ක්‍රම්‍ය නික්ම පැවිදි වූසේක් ද, මේ තුන්වැනි

1. දෙවතාවෙක් තොම 2. කළා ද



Non-Commercial Distribution

ආචාර්යයා ය. තව ද, මහරජානෙනි, අප මහබෝසතානන් වහන්සේ **පාණ්ඩව** නම් පර්වතගුහායෙන් නික්ම ඒ ඒ තැන විහරණය කරණසේක් **(283)** අරූපසමාපත්තිලාභී වූ **ආළාරකාලාම** නම් තපස්වීන් කරා එළඹ වාසය කොට අෂ්ටසමාපත්ති උපදවා ගෙණ 'මේ ආචාර්යයාගේ සමය යෙහි නිවන් මෙතෙක් ම ය' යි එතැනින් ඉවත වැඩිසේක. මේ සතරවැනි ගුරුවරයා ය. නැවැතත්, මහරජානෙනි, බොධිසත්වයෝ **උද්දකරාමපුත්‍ර** නම් තපස්වීන් කරා ගොස් වාසය කොට 'ධ්‍යානමාත්‍රයක් මිස එහිත් නිවන් නැතැ'යි සිතා එහිත් නො රඳා **උරුවෙලාවට** වැඩියසේක. මේ පස්වැනි ආචාර්යතෙම ය. මහරජානෙනි, සම්බොධියට පූර්වයෙහි ම සම්බුද්ධ නො වූ බොධිසත්වයන් වහන්සේගේ මේ ගුරුවරයෝ පස්දෙනා ය. ඒ ආචාර්යවරයෝ වනාහි ලෞකිකගුණධර්මයෙහි යෙදූහ. මහරජානෙනි, මේ ලොකොත්තර වූ නිර්වාණගුණධර්මයෙහි සර්වඥතාඥනය ප්‍රතිවෙධ කිරීමෙහි තථාගතයන් වහන්සේට අනුත්තර වූ අනුශාසක ගුරුවරයෙක් නැත්තේ ය. මහරජානෙනි, අප තථාගතයන් වහන්සේ අන්‍යොපදෙශ විරහිත ව ස්වයම්භූඥනයෙන් ම බුදු වූ සේක. ආචාර්ය විරහිතසේක. ඒ කාරණයෙන් බුදුරජානන් වහන්සේ විසින්:—

**'න මෙ ආචරියො අත්‍ථි-සදිසො මෙ න විජ්ජති,**
**සදෙවකස්මිං ලොකස්මිං-නත්‍ථි මෙ පටිපුග්ගලො.'** යි

යන මේ ගාථාව වදරණ ලදූ'' යි වදළසේක. ''යහපත, ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, මෙසේ මේ ප්‍රශ්නය ද එසේ ම මමත් පිළිගන්නෙමි'' යි කීහ.

**ගුරුවිරහිතප්‍රශ්නය නිමි.**

---

# එකබුද්ධධාරණීප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**'අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං එකිස්සා ලොකධාතුයා ද්වෙ අරහන්තො සම්මාසම්බුද්ධා අපුබ්බං අචරිමං උප්පජ්ජෙය්‍යුං, නෙතං ඨානං විජ්ජති'** යි.

යන මෙයින් **බහුධාතුකසූත්‍රයෙහි** 'මහණෙනි, එක් ලොකධාතුයෙක්හි අර්හත් සම්‍යක් සම්බුද්ධවරයෝ දෙදෙනෙක් එක් ව උපදනාහු ය යන යමෙක් ඇද් ද, ඒ බව අකාරණයෙක. එබඳු ප්‍රත්‍යයයෙක් නො වන්නේ ය. එබඳු කාරණයක් විද්‍යමාන නො වන්නේ ය' යි කියා මේ කාරණය වදරණ ලද්දේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, දෙශනා කරන්නා වූ ද සියලු ම තථාගතයන් වහන්සේලා සත්තිස්බොධිපාක්ෂිකධර්මයන් දෙශනා කරණසේක්ලා ය. කථනය කෙරෙමින් ද චතුරාර්යසත්‍යධර්මය කථනය කරණසේක් ලා ය. ශික්ෂණය කරවන්නාහු ද ත්‍රිවිධශික්ෂායෙහි ම

Non-Commercial Distribution

ශික්ෂණය කරවති. අනුශාසනා කරන්නාහු ද අප්‍රමාදප්‍රතිපත්තියෙන් අනුශාසනා කෙරෙති. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සියලු ම තථාගතයන් වහන්සේලාගේ එක දෙශනාව ම ය. කථාවත් එක ම ය. ශික්ෂාවත් එක ම ය. අනුශාසනාවත් එකාකාර ම ය. කවර කාරණයකින් තථාගතයන් වහන්සේලා දෙදෙනෙක් එකවිට ඒ ක්ෂණයෙහි නොවුපදනාසේක් ලා ද? එක ම ලොවුතුරා බුදුකෙනෙකුන්ගේ බුද්ධොත්පාදයෙන් ම මේ දශසහශ්‍රිලොකයතෙම ප්‍රභාවත් වී ය. ඉදින් තවත් දෙවෙනි බුදුකෙනෙක් පහළ වූසේක් නම්, ඒ දෙදෙනා වහන්සේගේ ප්‍රභාවෙන් මේ දශසහශ්‍රී ලොකයතෙම (284) බොහෝ සෙයින් ම ප්‍රභාවවත්[1] වන්නේ ය. අවවාද කර වදරන්නා වූ තථාගතයන් වහන්සේලා දෙදෙන ද සැප සේ අවවාද කරන්නාහු ය. අනුශාසනා කරන්නාහු ද සැප සේ අනුශාසනා කෙරෙති. එහි මම යම් ප්‍රකාරයකින් සැක නැති වෙම් ද, එසේ ම මට එබඳු වූ කාරණයක් නුඹ වහන්සේ වදාළ මැනැවැ'' යි කීහ.

''මහරජානෙනි, අප බුදුරජානන් වහන්සේ උපන් තිඹිරිගෙයක් වැනි වූ මේ දශසහශ්‍රිලොකධාතුතොම එක බුද්ධධාරණීය ය. එක ම බුදුකෙනෙකුන්ගේ ගුණය ධරන්නී ය.

**'යදි දුතියො බුද්ධො උප්පජ්ජෙය්‍ය, නායං දසසහස්සී ලොකධාතු ධාරෙය්‍ය, චලෙය්‍ය, කම්පෙය්‍ය, නමෙය්‍ය ඔනමෙය්‍ය, විනමෙය්‍ය, විකිරෙය්‍ය, විධමෙය්‍ය, විද්ධංසෙය්‍ය, නට්ඨානමුපගච්ඡෙය්‍ය.'**

'ඉදින් දෙවෙනි බුදුන් වහන්සේ කෙනෙක් උපන්නෝ වූ නම්[2] දශසහශ්‍රී ලොකධාතුතොම නො දරන්නී ය, වෙවුලන්නී ය, කම්පා වන්නී ය, නැමෙන්නී ය, ඔනමනය වන්නී ය, විශෙෂයෙන් නැමෙන්නී ය, විකිරෙන්නී ය, විධමනය වන්නී ය, විධ්වංසනය වන්නී ය, යථාස්ථානයට පැමිණ නො සිටින්නී ය. මහරජානෙනි, යම් සේ එක් පුරුෂයකු එතෙර කරන්නා වූ නැවෙක් වී නම්, එක පුරුෂයෙකු නැඟි කල්හි සමබර වන්නී ය, උසුලන සුලු වන්නී ය. නැවත ද එබඳු වූ ආයුෂයෙන් වර්ණයෙන් යෞවනයෙන් ප්‍රමාණයෙන් කෘශස්ථූලයෙන් සර්වාංගප්‍රත්‍යංගයෙන් යුක්ත වූ දෙවෙනි පුරුෂයෙක් එන්නේ ය. ඒ ආ පුරුෂතෙමේත් ඒ නැවට නැඟුනේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ කොල්ලෑ නම් නැව ඒ පුරුෂයන් දෙන්නා ම උසුලා ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, එසේ වී නම්, ඒ කොල්ලැව— 'චලෙය්‍ය කම්පෙය්‍ය නමෙය්‍ය විනමෙය්‍ය විකිරෙය්‍ය විධමෙය්‍ය විද්ධංසෙය්‍ය' තීරස්ථානයට නො පැමිණෙන්නේ ය. ජලයෙහි ගිලෙන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම එක බුදුකෙනෙකුන් උසුලන්නා වූ මේ දශසහශ්‍රිලොකධාතුව එක ම බුදුකෙනෙකුන්ගේ ගුණය ම උසුලන්නේ ය. ඒ එක ම බුදුන්ගේ මේ මහුල් සක්වළ මවුකුස උපදනා දවස් බිහිවන දවස් බුදු වන දවස් දම්සක් දෙසන දවස් ආයුෂය හරණා දවස් පිරිනිවන් පානා දවස් මේ දශසහශ්‍රී ලොකධාතුව

1. ප්‍රභාව ඉපදීම 2. බුදුකෙනෙකුන් වහන්සේ කෙනෙක් උපන්නේ වී නම්

Non-Commercial Distribution

යදණ්ඩෙන් ගැසූ ලෝතලියක් මෙන් ශතසහස්‍ර වාරයෙහි කම්පා වෙයි. මහාමෙරුපර්වතයෝ අත්බඹර සේ භ්‍රමණය වෙති. ඉදින් දෙවෙනි බුදු කෙනෙකුන් වහන්සේ උපන්සේක් වී නම්, 'නායං දසසහස්සීලොකධාතු ධාරෙය්‍ය චලෙය්‍ය කම්පෙය්‍ය නමෙය්‍ය ඔනමෙය්‍ය විනමෙය්‍ය විකිරෙය්‍ය විධමෙය්‍ය විද්ධංසෙය්‍ය නට්ඨානමුපගච්ඡෙය්‍ය' යන මේ අර්ථ සම්බන්ධ යි. තව ද, මහරජානෙනි, යම් සේ පුරුෂයෙක් අභිප්‍රාය පමණක් භොජනය පැවරි කෙරෙමින් උගුර දක්වා මනා කොට පුරවා අනුභව කරන්නේ ය. අනුභව කිරීමෙන් පිරුණා වූ සම්පූර්ණ වූ පරිපූර්ණ වූ අතුරක් නැත්තා වූ සමෘද්ධ කරණ ලද්ද වූ නො නැමිය[1] හැක්කා වූ දඩු වූ ඒ පුරුෂතෙම නැවතත් පෙර සේ ම සම්පූර්ණ කොට භොජනය අනුභව කෙළේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ පුරුෂයා සුවපත් වේ දැ'' යි විචාළසේක. නැත, ස්වාමීන් වහන්ස, නැවැත අනුභව කළ එකවරින් ම මැරෙන්නේ ය'' කීහ. මහරජානෙනි, එපරිද්දෙන් ම:—

(285) **''අයං දසසහස්සීලොකධාතු එකබුද්ධධාරණී එකස්සෙව තථාගතස්ස ගුණං ධාරෙති. යදි දුතියො බුද්ධො උප්පජ්ජෙය්‍ය, නායං දසසහස්සිලොකධාතු ධාරෙය්‍ය, චලෙය්‍ය කම්පෙය්‍ය නමෙය්‍ය ඔනමෙය්‍ය විනමෙය්‍ය විකිරෙය්‍ය විධමෙය්‍ය විද්ධංසෙය්‍ය නට්ඨානමුපගච්ඡෙය්‍ය.'**

යන මේ තාක් අනර්ථ වෙයි'' වදාළසේක.

''කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අතිධර්මභාරයෙන් පෘථිවිය කම්පා වන නියා දැ?'' යි විචාළෝය. ''මහරජානෙනි, මේ මනුෂ්‍යලොකයෙහි ගැල් දෙකක් ගැල්මුහුණ සම කොට රත්න පුරවන ලද වන්නාහු වී නම්, එයින් එක් ගැලකින් රත්න ගෙණ අනික් ගැලෙහි ම බහා ලන්නාහු වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ ගැල ගැල්දෙකේ ම රත්න උසුලා දැ'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, ඒ සකටයාගේ නාභියත් පැලෙන්නේ ය. ඒ ගැලෙහි අරද බිඳී යන්නාහු ය. ඒ ගැලෙහි නිම්වළලු ද ගලවා වැටෙන්නාහු ය. ඒ ගැලෙහි ගැල්අකුර ද බිඳෙන්නේය'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, රත්නයන්ගේ ඉතා බර බැවින් ගැල බිඳෙන්නේ දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අතිධර්මභාරයෙන් පොළෝ සෙලවෙන්නේ ය. මහරජානෙනි, එතෙකුදු වුවත් මේ අප කී කාරණය අසදෘශ වූ බුදුබලය දක්වන පිණිස අස්වන ලද්දේ ය. එහි යම් කාරණයකින් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේලා දෙදෙනෙක් එකවිට නොවුපදනසේක්ලා ද, ඊට ම අනිකුදු ස්වරූප වූ කාරණයක් තෙපි ඉඳුරා ම අසා ගණුව, මම කියන්නෙමි. ඉදින්, මහරජානෙනි, සර්වඥවරයෝ දෙදෙනෙක් එකවිට ම උපන්සේක්ලා නම්, ඒ බුදුවරයන් දෙදෙනාගේ පිරිසෙහි විවාදයෙක් උපදින්නේ ය. 'තොපගේ බුදුහු අපගේ බුදුහ' යි කියා

1. නොනැමුන

Non-Commercial Distribution

දෙපාර්ශ්වයෙහි පක්ෂ වන්නාහු ය. මහරජානෙනි, යම් සේ මහත් බල ඇත්තා වූ අමාත්‍යයන් දෙදෙනෙකුන්ගේ පිරිසෙහි විවාදයෙක් උපන්නේ ය. 'තොපගේ අමාත්‍යයහ, අපගේ අමාත්‍යාහ' යි කියා දෙපක්ෂයෙහි ම පක්ෂ ග්‍රහණය වෙයි.[1] මහරජානෙනි, එපරිද්දෙන් ම ඉදින් බුදුවරයන් වහන්සේලා දෙදෙනෙක් එකවිට උපන්සේක්ලා නම්, ඒ දෙදෙනා වහන්සේලාගේ පිරිසෙහි විවාදයෙක් උපදනේ ය. 'තොපගේ බුදුවරයාණෝ ය. අපගේ බුදුවරයාණෝ ය' යි කියා දෙපාර්ශවයෙහි පක්ෂග්‍රහණය වෙයි. මහරජානෙනි, යම් කාරණයකින් සර්වඥවරයෝ දෙදෙනෙක් එකවිට නූපදනාහු ද, ඒ මේ පළමුවන කාරණය යි.

"තවද, මහරජානෙනි, යම් කාරණයකින් සම්‍යක් සම්බුද්ධවරයෝ දෙදෙනෙක් එකවිට නූපදනාහු ද, ඊට ම අනිකුදු ඉතිරි කාරණයක් ඇසුව මැනැව. ඉදින්, මහරජානෙනි, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා දෙනමක් එකවිට ම උපන්නාහු වී නම්, සර්වඥතෙම අග්‍ර ය' යි කියන්නාවූ යම් වචනයක් ඇද් ද, ඒ වචනයත් මිථ්‍යා වන්නේ ය. සර්වඥයන් වහන්සේ ජ්‍යෙෂ්ඨය' යි කියන්නා වූ යම් වචනයක් ඇද්ද, ඒ වචනයත් මිථ්‍යා වන්නේ ය. 'ශ්‍රෙෂ්ඨ බුද්ධ ය' යි කියන්නා වූ යම් වචනයක් ඇද්ද, ඒ වචනයත් බොරු වන්නේ ය. 'විසිට්ඨයො බුද්ධො' කියන වචනය ද 'උත්තමො බුද්ධො' කියන වචනය ද 'ප්‍රවරබුද්ධ ය' කියන වචනය ද 'අසමබුද්ධය' යි කියන වචනය ද, 'අසමසම බුද්ධ ය' යි කියන වචනය ද, 'අප්‍රතිම බුද්ධ ය යි කියන වචනය ද 'අප්‍රතිභාග බුද්ධ ය' යි කියන වචනය ද 'අප්‍රතිපුද්ගල බුද්ධ ය' යි කියන වචනය ද යන **(286)** යම් වචනයක් ඇද්ද, ඒ වචනය මිථ්‍යා වන්නේ ය. මහරජානෙනි, යම් කාරණයකින් සර්වඥවරයෝ දෙදෙනෙක් එකවිට නොවූපදනාහු ද, ඊට ම මේ කාරණයත් තෙපි අර්ථ වශයෙන් පිළිගණුව. එතෙකුදු වුවත් මහරජානෙනි, මේ එක ම බුදුකෙනෙකුන් වහන්සේ කෙනෙක් ලෝකයෙහි උපදනාසේක යි යන මෝතොම භාග්‍යවත් වූ බුදුවරයන් වහන්සේලාගේ ස්වභාව ප්‍රකෘතියෙක. හේ කවර කාරණයකින් ද? යත්— සර්වඥ බුදුවරයන් වහන්සේලාගේ බුදුගුණය ඉතා මහත් බැවින. මහරජානෙනි, මේ ලොකයෙහි අනිකුදු මහත් දෙයක් ඇත් නම්, එකෙක් ම වන්නේ ය. මහරජානෙනි, මේ මහාපෘථිවිය මහත් වූවා ය. ඒ පෘථිවිතොම එකක් ම වූවා ය. මහා සාගරයතෙම ඉතා මහත් වූයේ ය. ඒ මහාසමුද්‍රයතෙම එකෙක් ම වන්නේ ය. මහාමෙරුපර්වතයතෙම ඉතා මහත් වන්නේ ය. ඒ පර්වතය එකක් ම වන්නේ ය. ආකාශයතෙම ඉතා මහත් වන්නේ ය. ඒ ආකාශය එකක් ම වන්නේ ය. ශක්‍රදෙවෙන්ද්‍රතෙම ඉතා මහත් වන්නේ ය. ඒ ශක්‍රදෙවෙන්ද්‍රතෙම එක් කෙනෙක් ම වන්නේ ය. මාරදිව්‍යපුත්‍රතෙම මහත් වූයේ ය. ඒ මාරතෙම එක්කෙනෙක් ම වන්නේ ය. මහාබ්‍රහ්මරාජ තෙම ඉතා මහත් වන්නේ ය. ඒ මහාබ්‍රහ්මරාජ තෙම එක්කෙනෙක් ම

1. වෙති.

*Non-Commercial Distribution*

වන්නේ ය. අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතොත්තමයානන් වහන්සේ ඉතා මහත් වන්නේ ය. ඒ තථාගතොත්තමයානන් වහන්සේ එක්කෙනෙකුන් වහන්සේ ම ය. ලොකයෙහි යම් තැනෙක ඒ මහත් වූ පෘථිවි ආදීහු උපදිද්ද, එහි එබඳු වූ අනිකක්හට අවකාශයක් නො වන්නේ ය. මහරජානෙනි, එහෙයින් අප තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තම වූ එක් කෙනෙකුන් වහන්සේ ම ලොකයෙහි උපදනාසේකැ'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ප්‍රශ්නය තෙම නුඹ වහන්සේ විසින් සුන්දරතර උපමා කාරණයන් දක්වීමෙන් මනා කොට ම වදරණ ලද්දේ ය. ප්‍රඥයෙහි දක්ෂ නො වූ මඳ නුවණැත්තකු ද මේ ප්‍රශ්නය අසා සතුටු වන්නේ ය. මා වැනි වූ මහාප්‍රාඥයෙකු සන්තොෂ වන බව කියනු ම කවරේ ද? සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නය එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**එකබුද්ධධාරණීප්‍රශ්නය යි.**

---

## සංඝපූජනීය ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ලොවුතුරා බුදුන්ගේ මාතෘ වූ **මහාමායාදෙවින්ගේ** නැගනි වූ **මහාප්‍රජාපතිගොතමී** නම් කුඩා මැනියන් විසින් තමන් වහන්සේට වැසිසළුසිවුරක් දෙන කල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් '**ගොතම ගොත්‍ර** ඇති මා මැනියෙනි, තෙල සිවුර සංඝයා කෙරෙහි දුන මැනැව. නුඹ විසින් සංඝයා කෙරෙහි සිවුර දුන් කල්හි මම ද පුදන ලද වීමි. සංඝතෙමේ ද පුදන ලද වන්නේ ය' යි කියා මෙපවත් වදරණ ලද්දේ ය. කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ සංඝරත්නයට වඩා බැරෑරුම් නො වනසේක් ද? මහත් නො වන සේක් ද? දක්ෂිණාර්හ නො වනසේක් ද? තථාගතයන් වහන්සේ තමන්ගේ කුඩා මැනියන් විසින් තමා ම පිඤ්ජනය කරණ ලද්ද වූ තමා ම සිඳින ලද්ද වූ තමා ම පොථීත කරණ ලද්ද වූ යම් වැසිසළුසිවුරක් තමන් වහන්සේට දෙන කල්හි සංඝයා වහන්සේට දෙවා වදාළසේක. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ සංඝරත්නයට වඩා උත්තරීතර වනසේක් වී නම්, අධිකතර **(287)** වනසේක් වී නම්, විශෙෂතර වනසේක් වී නම්, සිවුර මට දුන් කල්හි මහත් ඵලය වන්නේ ය'යි කියා දන්නාසේක් වී නම් තථාගතයන් වහන්සේ කුඩා මැනියන් ලවා තමා විසින් ම පිඤ්ජනය කරණ ලද්ද වූ තමා විසින් ම ලුඤ්චනය කරණ ලද්ද වූ තමා විසින් ම පුලුන් ගසන ලද්ද වූ තමා විසින් ම කටින ලද්ද වූ තමා විසින් ම වියන ලද්ද වූ වැසිසළුසිවුර සංඝයා කෙරෙහි නො දෙවා වදරණසේක. 'ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් හෙයකින් තථාගතයන් වහන්සේ තමන් පූජාවට නො එළඹෙනසේක් සමීප නො වනසේක් ද, එහෙයින් තථාගතයන් වහන්සේ කුඩා මැනියන් ලවා වැසිසළුසිවුර සංඝයා වහන්සේට දෙවා වදාළසේකැ'' යි කීහ.

*Non-Commercial Distribution*

''මහරජානෙනි, **සුද්ධෝදන** නම් මහරජානන්ට අග්‍රමහෙසිකා වූ **මහාමායාදේවීන්** වහන්සේ අප බුදුන් උපන් සත්දවසින් කලුරිය කොට දෙව්ලොව උපන්හ. එකල මහාප්‍රජාපතීගොතමී වහන්සේ එදවස් තමන් කුසින් උපන් **නන්දකුමාරයන්** කිරිමවුන්ට භාර කොට මහාබොධි-සත්වයන් මහත් වූ ප්‍රේමයෙන් වැඩූහ. එහෙයින් ලොවුතුරා බුදු ව ඥාති සංග්‍රහය පිණිස **කපිලවස්තුපුරයට** වැඩි ගමනේ අනන්ත වූ බුද්ධශ්‍රීයෙන් බබළන්නා වූ ලොවුතුරා බුදුන් දැක 'මේ නියා ලොවුතුරා තුන්ලොවට සෙත්සිරිදෙන බුදුරුවනක් පොෂ්‍යය කොට වැඩූයෙමි' යි කියා මහත් වූ ප්‍රීතියට පැමිණ මහත් වූ ප්‍රේමයෙන් ස්වහස්තයෙන් ම සිවුරක් කොට 'ලොවුතුරා බුදුන් පලඳවමි' යි සිතා සමීපාපණයකින් කපු ගෙන්වා ගෙණ සියතින් කපු කපා පුළුන් තළා වළ කොට සිහින් නූල් කැට ඇතුළ මළුයෙහි ම ශාලාවක් කරවා පෙහෙරුන් රැස් කරවා කැම්පිම් ආදිය දෙවා වියමන් සදවා දෙවහනක් සේ මහත් වූ ශ්‍රීයෙන් ස්ත්‍රීන් පිරිවරා ශාලාවට ගොස් නඩාව හෙළා වෙළුම කෙළවර අල්වා තද කොට එක් නුහුලක් වියා පෙහෙරුන්ට සත්කාර කරවා සළුදෙකක් වියවා ගෙණ සුවඳ කවා පත් කොට විසිතුරු කරඬුවෙක ලා හිස තබා ගෙණ නොයෙක් පෙරහරින් **නිග්‍රොධාරාමයට** ගොස් බුදුන් වැඳ 'ස්වාමීනි, මාගේ ස්වහස්තයෙන් නුඹ උදෙසා ම කළ මේ සිවුරු පිළිගෙණ වදළ මැනැවැ' යි කියා පිරිනමාලූව.

''එකල භාග්‍යවත් බුදුරජානන් වහන්සේ විසින් ඒ මාතෘ නැගනි වූ **මහාප්‍රජාපතීගොතමීන්** වහන්සේ විසින් ඒ වැසිසළුසිවුරු දෙන කල්හි '**ගෞතමගොත්‍ර** ඇති මාගේ මැනියෙනි, සිවුරු සංඝයා කෙරෙහි දුන මැනැව. සංඝයාට දුන් කල්හි මම ද පුදනු ලබන්නෙමි යි, සංඝතෙම ද පුදන ලද වෙයි' කියා, මෙපවත් වදරණ ලද්දේ ය. ඒ වදළ බව වනාහි තමන් වහන්සේට පූජා කළාහට අවිපාක බැවිනුත් නො වන්නේ ය. අදක්ෂිණාර්හ බැවිනුත් නො වන්නේ ය. එතෙකුදු වුවත් 'මතු පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි සංඝතෙම මාගේ ඇවැමෙන් ලොකයා විසින් පූජා කරණ ලද වේවා' යි සිතා සංඝයාගේ විද්‍යමාන වූ ගුණය ම ප්‍රකාශ කර වදරණසේක් '**ගෞතමගොත්‍ර** ඇති මැනියෙනි, සිවුර සංඝයා කෙරෙහි දුන් කල්හි මම ද පුදන ලද වන්නෙමි. සංඝතෙම ද පුදන ලද වන්නේ ය'යි කියා මෙසේ සංඝයාට හිතවැඩ පිණිස අනුකම්පාවෙන් ම වදළසේක. තව ද මහරජානෙනි, යම් සේ පියානන් ජීවත්වන කාලයෙහි ම තමාගේ පුත්‍රයා ගුණ කියා 'මේ රාජසභායෙහි තබන ලද්දේ වී නම්, අනාගත කාලයෙහි ජනසමූහයා මධ්‍යයෙහි පූජිත වන්නේ ය' යි සිතා පුත්‍රයා ගෙණ ගොස් අමාත්‍ය යොධ භට බල ප්‍රධානික දෙරටුපාල රාජදෙහාවයට රක්නා අමාත්‍යරාජ **(288)** පිරිස්ජනමධ්‍යයෙහි රජ්ජුරුවන් සමීපයෙහි දී පුත්‍රයාගේ විද්‍යමාන වූ ගුණය ම ප්‍රකාශ කොට කියන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම අප තථාගතයන් වහන්සේත්:—

**'හිතත්ථාය අනුකම්පාය අනාගතමද්ධානං සංඝො මමච්චයෙන චිත්තීකතො භවිස්සතීති විජ්ජමානෙයෙව ගුණෙ පරිකිත්තයන්තො එවමාහ: 'සංඝෙ ගොතමි දෙහි. සංඝෙ තෙ දින්නෙ අහඤ්චෙව පූජිතො භවිස්සාමි සංඝො ච' යි**

කියා මෙම අර්ථය වදාළසේක. මහරජානෙනි, වස්සිකසාටිකානුප්‍රදන-මාත්‍ර වූ එපමණකින් ම සංඝතෙම තථාගතයන් වහන්සේට වඩා අධිකතර නො වනසේක. විශෙෂතර ද නො වනසේක. තවද, මහරජානෙනි, යම් සේ දෙමවුපියෝ පුත්‍රයාගේ ඇඟ උළන්නාහු ය, මර්දනය කරන්නාහු ය, නහවන්නාහු ය, සම්බාහණය කරන්නාහු ය, කිමෙක් ද, මහරජානෙනි, ඒ උච්ඡාදන පරිමර්දන නහාපන පමණකින් ම පුත්‍රතෙම මාතෘපිතෘන්ට වඩා අධිකතර වේ ද? විශෙෂතර වේ දැ? යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, ස්වාමීනි, පුත්‍රයෝ මාතෘපිතෘන් විසින් අකාමකරණීයෝ ය. පුත්‍රයන්ගේ නො කැමැත්තෙන් ම කෙරෙති. එසේ හෙයින් ම දෙමවුපියෝ පුත්‍රයන්ගේ ශරීරය උච්ඡාදන පරිමර්දන නහාපන සම්බාහනය කරන්නාහු ය' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම එපමණ වැසිසළුසිවුර දුන් මාත්‍රයකින් ම සංඝතෙම තථාගතයන් වහන්සේට වඩා අධික නො වනසේක. විශෙෂ නො වනසේක. එතෙකු දු වුවත් තථාගතයන් වහන්සේ අකාමකරණීය කරණසේක් කුඩා මෑණියන්ගේ ඒ වැසිසළුසිවුර සංඝයා වහන්සේට දෙවා වදාළසේක. තවද, මහරජානෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක් පෘථිවිශ්වර වූ රජක්හට අයපඬුරක් ගෙණවුත් දක්වූයේ වී නම්, රජ්ජුරුවෝ ඒ අයපඬුරු ගෙණ එක්තරා යොධභටයෙකුට හෝ බලප්‍රධානයෙකුට හෝ සෙනාපතිහට හෝ පුරෝහිතයාහට හෝ දෙන්-නාහු ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ අයපඬුරු ප්‍රතිලාභ[1] මාත්‍රයකින් ම ඒ පුරුෂතෙම ඒ රජහට අධිකතර වේ ද? විශෙෂතර වේ දැ'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, ඒ පුරුෂතෙම රාජභතිකයා ය. ස්වාමීනි, රජ්ජුරුවන් නිසා ජීවත් වන්නවුන් ඒ ජීවනස්ථානයෙහි තබන්නා වූ රජ්ජුරුවෝ ඒ අයපඬුර දෙනසේකැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්-දෙන් ම වස්සිකසාටිකානුප්‍රදනමාත්‍ර වූ එපමණකින් ම සංඝයා වහන්සේ තථාගතයන් වහන්සේට වඩා අධික නො වනසේක. විශෙෂතර ද නොවන සේක. එසේ කල සංඝතෙම බුදුන් අනුදත් දෙයක් ම අනුභව කරණ හෙයින් තථාගත භොජක වනසේක. තථාගත ජීවික වූ සංඝයා ජීවනස්-ථානයෙහි තබා වදරන්නා වූ තථාගතයන් වහන්සේ සංඝයා වහන්සේට වැසිසාරමසට වලඳින වැසිසළු සිවුර දෙවා වදාළසේක. එතෙකුදු වුවත්, මහරජානෙනි, අප තථාගතයන් වහන්සේට මෙ බඳු වූ කරුණාවෙක් වී ය. මාගේ මේ සංඝතෙම ද ස්වභාවයෙන් ම පූජනීය වූයේ ය. එහෙයින් මා සන්තක ව පිරිනැමුනු මේ සිවුරෙන් සංඝයා පූජා කෙරෙමි යි සිතා සංඝයා

1. ප්‍රතිෂ්ඨා ලාභ

වහන්සේට වස්සිකසාටිකය දෙවා වදාළසේක. මහරජානෙනි, තථාගතයන් වහන්සේ තමන් වහන්සේට ම කරණ පූජාව වර්ණනා නො කරණසේක, නොහොත් ලොකයෙහි යම් කෙනෙක් පූජාසත්කාරයට සුදුසු වෙද්ද, ඔවුන්ට කරණ පූජා (289) සත්කාරය ද තථාගතයන් වහන්සේ වර්ණනා කර වදරණසේක. මහරජානෙනි, අල්පෙච්ඡ වූ ප්‍රතිපත්තිය ප්‍රකාශ කර වදරන්නා වූ දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් මධ්‍යමනිකාය-වරලාංඡනයෙහි වූ ධර්මදායාදසූත්‍රයෙහි 'මාගේ පූජ්‍යතර වූ ප්‍රශස්‍යතර වූ පළමුවන භික්ෂුනමෙක් වූයේ ම ය' යි[1] කියා මේ බව වදරණ ලද්දේ ය. මහරජානෙනි, තථාගතයන් වහන්සේට වඩා දක්ෂිණාර්හ වූ උත්තරීතර වූ හෝ අධික වූ හෝ විශෙෂතර වූ හෝ කිසි ම සත්වයෙක් භවත්‍රයෙහි ම නැත්තේ ය. තථාගතයන් වහන්සේ ම උත්තරතර වූසේක. අධික වූසේක. විශෙෂතර වූසේක. මහරජානෙනි, මේ කාරණය සංයුක්තනිවරයෙහි මාණවගාමික නම් දිව්‍යපුත්‍රයා විසින් ලොවුතුරා බුදුන්ගේ ඉදිරිපිට සිට සියලු දිව්‍යමනුෂ්‍යයන් මධ්‍යයෙහි කියන ලද්දේ ය:—

**'විපුලො රාජගහීකානං-ගිරි සෙට්ඨො පවුච්චති,**
**සෙතො හිමවතං සෙට්ඨො-ආදිච්චො අඝගාමිනං.**
**සමුද්දො උදධීනං සෙට්ඨො-නක්ඛත්තානඤ්ච චන්දිමා,**
**සදෙවකස්ස ලොකස්ස-බුද්ධො අග්ගො පවුච්චති.'**

යනුවෙන් 'ලොවුතුරා බුදුරජානෙනි, රජගහනුවර වටා පිහිටි සියලු පර්වතයන්ට වඩා මේ විපුල නම් පර්වතය ශ්‍රෙෂ්ඨ ය' යි කියනු ලැබෙයි. හිමාලයෙහි වූ පර්වතයන්ට වඩා ශ්වෙත නම් පර්වතය ශ්‍රෙෂ්ඨ වන්නේ ය. ආකාශගාමීන්ට වඩා සූර්යදිව්‍යරාජතෙම ශ්‍රෙෂ්ඨ වන්නේ ය. සියලු ම ජලස්ථානයන්ට වඩා මහාසමුද්‍රය ශ්‍රෙෂ්ඨ වන්නේ ය. සියලු ම නක්ෂත්‍ර තාරකාවන්ට වඩා චන්ද්‍රදිව්‍යරාජතෙම ශ්‍රෙෂ්ඨ වන්නේ ය. දිව්‍යබ්‍රහ්ම මාරමානුෂික සකල සත්වලොකයාහට සච්නේ ගෙවා දත් ලොවුතුරා බුදුරජානෝ අග්‍ර ය යි කියනු ලැබෙ' යි කියා මෙසේ කීයේ ය: මහරජානෙනි, ඒ මේ වනාහි මාණවගාමිකදිව්‍යපුත්‍රයා විසින් ගාථා මනා කොට කියන ලද්දේ ය. නපුරු කොට නො කියන ලද්දේ ය. සුභාෂිත කොට කියන ලද්දේ ය. දුර්භාෂිත කොට නො කියන ලද්දේ ය. බුදුන් විසින් ද මැනැවැයි අනුදන්නා ලද්දේ ය. මහරජානෙනි, සද්ධර්මසෙනාධිපති වූ සැරියුත් මහතෙරුන් වහන්සේ විසින් ද 'මාරබල නසන්නා වූ ලොවුතුරා බුදුන් කෙරෙහි කරණ ලද එක ම චිත්තප්‍රසාදයෙක් හෝ සරණාගමනයෙක් හෝ නමස්කාරයෙක් හෝ ඇද්ද, ඒ තෙම ඒ සත්වයන් සසරින් එතෙර කරන්ට සමර්ථ වන්නේ ය' යි කියා වදරණ ලද නො වේ ද? දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් ද 'මහණෙනි, ලොකයෙහි එක් පුද්ගලයෙක් උපදිමින් බොහෝ ජනයාහට හිත පිණිස සැප පිණිස ලෝකානුකම්පා පිණිස

1. මෙහි ද පරිවර්තනය වැරදී ය 'පිණ්ඩපාතය නො වැළඳූ ඒ පළමු භික්ෂූ නම ම ඉතා පිදිය යුතු ද පැසසිය යුතු ද වෙයි' යනු පාළිපාඨයෙහි තේරුම යි.

Non-Commercial Distribution

ප්‍රයෝජන පිණිස දිව්‍යමනුෂ්‍යයන්ට හිතසැප පිණිස උපදනේ ය. ඒ කවර නම් එක පුද්ගලකෙනෙක් ද? යත්:— තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජතෙම සියලු ම දිව්‍යමනුෂ්‍යාදීන්ට හිතසැප පිණිස උපදනේ ය'යි යනාදි වදරණ ලද්දේ ය. එතෙකුදු වුවත්, මහරජාණෙනි, අප තථාගතෝත්තමයානන් **(290)** වහන්සේ **දක්ෂිණාවිභංගසූත්‍රාන්තයෙහි** තුදුස්ප්‍රකාර පුද්ගලිකදානයන් ප්‍රකාශ කොට දානානිසංස හා සංඝගත දක්ෂිණායෙහි මහත්ත්වය දක්වනසේක්:—

**'තත්‍රානන්ද, තිරච්ඡානගතෙ දානං දත්වා සතගුණා දක්ඛිණා පාටිකංඛිතබ්බා. පුථුජ්ජනදුස්සීලෙ දානං දත්වා සහස්සගුණා දක්ඛිණා පාටිකංඛිතබ්බා. පුථුජ්ජනසීලවන්තෙ දානං දත්වා සතසහස්සගුණා දක්ඛිණා පාටිකංඛිතබ්බා. බාහිරකෙ කාමෙසු වීතරාගෙ දානං දත්වා කොටිසතසහස්සගුණා දක්ඛිණා පාටිකංඛිතබ්බා. සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නෙ දානං දත්වා අසංඛෙය්‍යා අප්පමෙය්‍යා දක්ඛිණා පාටිකංඛිතබ්බා. කො පන වාදෙ සොතාපන්නෙ? කො පන වාදෙ සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නෙ? කො පන වාදෙ සකදාගාමිස්ස? කො පන වාදෙ අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නෙ? කො පන වාදෙ අනාගාමිස්ස? කො පන වාදෙ අරහත්තඵලසච්ඡිකිරියාය පටිපන්නෙ? කො පන වාදෙ අරහන්තෙ? කො පන වාදෙ පච්චෙකබුද්ධෙ? කො පන වාදෙ තථාගතෙ අරහන්තෙ සම්මාසම්බුද්ධෙ?**

**'සත්ත ඛො පනිමානන්ද, සංඝගතා දක්ඛිණා–බුද්ධපමුඛෙ උභතොසංඝෙ දානං දෙති, අයං පඨමා සංඝගතා දක්ඛිණා. තථාගතෙ පරිනිබ්බුතෙ උභතොසංඝෙ දානං දෙති, අයං දුතියා සංඝගතා දක්ඛිණා. භික්ඛුසංඝෙ දානං දෙති, අයං තතියා සංඝගතා දක්ඛිණා. භික්ඛුණීසංඝෙ දානං දෙති, අයං චතුත්ථි සංඝගතා දක්ඛිණා. එත්තකා මෙ භික්ඛු ච භික්ඛුණියො ච සංඝතො උද්දිසථාති දානං දෙති, අයං පඤ්චමී සංඝගතා දක්ඛිණා. එත්තකා මෙ භික්ඛුසංඝතො උද්දිසථාති දානං දෙති, අයං ඡට්ඨී සංඝගතා දක්ඛිණා. එත්තකා මෙ භික්ඛුණියො සංඝතො උද්දිසථාති දානං දෙති, අයං සත්තමී සංඝගතා දක්ඛිණා. භවිස්සන්ති ඛො පනානන්ද, අනාගතමද්ධානං ගොත්‍රභුනො කාසාවකණ්ඨා දුස්සීලා පාපධම්මා, තෙසු දුස්සීලෙසු සංඝං උද්දිස්ස දානං දස්සන්ති, තදපහං ආනන්ද සංඝගතං**

Non-Commercial Distribution

**දක්ඛිණං අසංඛෙය්‍යං අප්පමෙය්‍යං වදාමි. න ත්වෙවාහං ආනන්ද, කෙනචි පරියායෙන සඞ්ඝගතාය දක්ඛිණාය පාටිපුග්ගලිකං දානං මහප්ඵලතරං වදාමි.’**

“**ආනන්ද**යෙනි, එහි තිරශ්චීනගත සත්වයා කෙරෙහි දන් දී ඒ පින්කමින් සියක්ජාතියෙහි ආයු වර්ණ සැප බල නුවණ යන අනුසස්පසක් බැගින් පන්සියක් අනුසස් ලැබීමෙන් ඒ දක්ෂිණාව[1] සියයක් අනුසස් කැමැති විය යුතු වන්නේ ය. ලැබිය යුතු වන්නේ ය. මෙසෙයින් පෘථග්ජන දුශ්ශීල මිනිසක්හට දන් දී දහසක් ජාතියෙහි පන්දහසක් අනුසස් ලැබිය යුතු වන්නේ ය. පෘථග්ජන සිල්වත් මිනිසක්හට දන් දී **(291)** ලක්ෂයක් ජාතියෙහි පනස්ලක්ෂයක් අනුසස් ලැබිය යුතු වන්නේ ය. ශාසනයෙන් පිටත පහ වූ කාමරාග ඇති ධ්‍යාන ලාභියක්හට දන් දී කොටිලක්ෂයක් ජාතියෙහි පස්කොටිලක්ෂයක් අනුසස් ලැබිය යුතු වන්නේ ය. සෝවාන්මාර්ගයට පැමිණියක්හට දන් දී අසංඛෙය්‍ය වූ අප්‍රමෙය වූ අනුසස් ලැබෙ ම ය. සෝවාන්ඵලප්‍රාප්ත වූ කෙනෙකුන්හට දුන් දනයෙහි අනුසස් කියනු ම කවරේ ද? සකෘදගාමිමාර්ගයට පැමිණියක්හට කියනු ම කවරේ ද? සකෘදගාමිඵලයට පැමිණියක්-හට කියනු ම කවරේ ද? අනාගාමිමාර්ගයට පැමිණියක්හට කියනු ම කවරේ ද? අනාගාමිඵලයට පැමිණියක්හට කියනු ම කවරේ ද? අර්හත් මාර්ගයට පැමිණියක්හට දුන් දනයෙහි අනුසස් නො බුදු වූ කවරෙක් කියා ද? එසේ ම රහත් කෙනකුන්හට දුන් දනයෙහි අනුසස් කියනු ම කවරේ ද? පසේබුදු කෙනකුන්හට දුන් දනයෙහි අනුසස් කියනු ම කවරේ ද? තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධ කෙනෙකුන්හට දුන් දනයෙහි අනුසස් කවරෙක් නම් කියා ද?

“ආනන්දයෙනි, මේ සංඝගත දක්ෂිණාවෝ සත්වැදෑරුම් වෙති. හේ කවරේ ද? යත්:— බුදුන් ප්‍රමුඛ වූ භික්ෂුභික්ෂුණී සංඛ්‍යාත වූ උභතො සංඝයා වඩා හිඳුවා දන් දෙන්නේ ය. මේ පළමු වන සංඝගතදක්ෂිණාව ය. තථාගතයන් පිරිනිවි කල දෙපාර්ශ්වයෙහි උභතොසංඝයා වඩා හිඳුවා මධ්‍යයෙහි බුද්ධාසනයක් පණවා ඒ අස්නට සධාතුක පිළිමයක් වඩා බුදුන් පෙරටු ව ආධාරයෙක හැම පිදිය යුතු[2] දෑ සඳ තබා ‘ඉමං භික්ඛං සසූප-බ්‍යඤ්ජනං ඉමස්මිං නිසින්නස්ස බුද්ධපමුඛස්ස සකලස්ස භික්ඛුසංඝස්ස දෙමි’[3] යන වාක්‍යය කියා හැමදෑ පළමු ව බුදුන්ට පුද සඟනට පිළිවෙළින් දිය යුතු වන්නේය. මේ දෙවෙනි වූ සංඝගත දක්ෂිණාව ය. සඟුන් ම වඩා හිඳුවා පසය එළවා ‘මෙහි වැඩඋන් සියලු සඟනට මේ පසය දෙමි’ යි කියා දෙන්නේ ය. මේ තුන්වැනි සංඝගතදක්ෂිණාව ය. භික්ෂුණීසංඝයා ම වඩා හිඳුවා ‘මෙහි වැඩඋන් සියලු භික්ෂුණීසංඝයාට මේ පසය දෙමි’ යි කියා දෙන්නේ ය. මේ සතරවන සංඝගතදක්ෂිණාව ය. යමෙක් වෙහෙරට

1. දක්ෂිණාතොම 2. පිදිය 3. මේ පාඨය ද ධර්මානුකූල නො වේ.

Non-Commercial Distribution

ගොස් සඟුන් වැඳ 'වහන්ස, සඟින් මට මෙපමණ භික්ෂුසංඝයා මෙපමණ භික්ෂුණීසංඝයා දෙන්නේ ය' යි කියා සාංඝිකනිමන්ත්‍රණයෙන් පවරා දන් දෙන්නේ ය. මේ පස්වන සංඝගත දක්ෂිණාව ය. 'වහන්ස, මට සඟින් මෙපමණ සංඝයා දෙන්නේ ය' යි කියා සාංඝික නිමන්ත්‍රණයෙන් පවරා දන් දෙන්නේ ය. මේ සවන සංඝගතදක්ෂිණාව ය. 'වහන්ස, මට සඟින් මෙපමණ භික්ෂුණීසංඝයා දෙන්නේ ය' යි කියා පවරා දන් දෙන්නේ ය. මේ සත්වන සංඝගතදක්ෂිණාව ය. ආනන්දයෙනි, අනාගත කාලයෙහි සහඹු ව වාසය කිරීමෙන් පාපධර්මසමන්නාගත වූ දුශ්ශීලාචාර ඇති කර බැඳි කඩින් 'උපසම්පන්නයම්හ' යි කියා ප්‍රතිඥා ඇති ගොත්‍රභූ නම් දුශ්ශීලයෝ වර්ගයෙක් වෙති. එකල කුසල් කරණ සත්වයෝ 'දන් සරහා සංඝයාහට දෙම්හ' යි කියා ඒ දුශ්ශීලයන්ට මාගේ සංඝයා උදෙසා දන් දෙති. 'ආනන්දයෙනි, එකල්හි ද සංඝගත වූ ඒ දක්ෂිණාව අසංඛෙය්‍ය වූ අප්‍රමෙය වූ අනුසස් ඇතැ' යි මම කියන්නෙමි. 'ආනන්දයෙනි, සංඝගත වූ හා දක්ෂිණාව **(292)** පුද්ගලිකදානය කවර කාරණයකින් මහත් ඵල ඇතැයි කියා මම නො කියන්නෙමි' යි කියා පස්වාදහසක් හවුරුදු මුලුල්ලෙහි සංඝරත්නය දිව්‍යමනුෂ්‍යයන්ට පින්කෙත් කොට තබා වදාළ සේකැ'' යි කීසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නය එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**සංඝපූජනීයප්‍රශ්නය යි.**

---

# ප්‍රව්‍රජ්‍යාවිශෙෂ ප්‍රශ්නය

''පින්වත් වූ නාගසෙනස්ථවිරොත්තමයානෙනි, ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මම ගෘහස්ථයාගේ හෝ ප්‍රව්‍රජිතයාගේ හෝ සම්‍යක්ප්‍රතිපත්තිය වර්ණනා කෙරෙමි. මහණෙනි, ගෘහස්ථයෙක් හෝ ප්‍රව්‍රජිතයෙක් හෝ මනා කොට පිළිපන්නේ සම්‍යක්ප්‍රතිපත්ති කරණයෙන් අනවද්‍ය වූ යහපත් වූ නිර්වාණධර්මය සිද්ධ කිරීමෙන් ආරාධක වන්නේ ය' යි කියා මේ කාරණය වදාරණ ලද්දේ ය. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ශ්වෙතවස්ත්‍රාදි විසිතුරු වූ වස්ත්‍ර ධරන්නා වූ පඤ්චකාමසම්පත් අනුභව කරන්නා වූ පුත්‍රදාරාවන්ගෙන් සම්බාධ වූ සයනයෙහි වාසය කරන්නා වූ ජවිරාග කරණය සඳහා කසා සඳුන් වලඳින්නා වූ මල්සුගන්ධ විලෙපනයන් ධාරණයෙන් සැරහෙන්නා වූ ස්වර්ණරජතාදිය සිතින් ඉවසන්නා වූ මාණික්‍යස්වර්ණයෙන් විචිත්‍ර වූ ඔටුනු බඳනා ලද්ද වූ මනා කොට පිළිපන්නා වූ ගෘහස්ථ තෙම අනවද්‍ය වූ නිර්වාණධර්මය සිද්ධ කරන්නේ වේ නම්, හිස මුඩු ව ගෙණ කාෂායවස්ත්‍ර ධරන්නා වූ දෙර දෙර සිඟා ලබන රසපිණ්ඩයට එළඹෙන්නා

Non-Commercial Distribution

වූ චතුර්විධශීලස්කන්ධයෙහි මනා කොට සම්පූර්ණකාරී වූ එසියපණසක් පමණ ශික්ෂාපදයන් සමාදන් ව පවත්නා වූ තෙළෙස් ධුතාංගගුණයන් නිරවශෙෂ කොට සමාදන් ව පවත්නා වූ මනා කොට පිළිපන්නා වූ ප්‍රව්‍රජිතයන් වහන්සේ ද අනවද්‍ය වූ නිර්වාණධර්මය සිද්ධ කර ගන්නේ වේ නම්, ස්වාමීනි, එහි ගෘහස්ථයාගේ ද ප්‍රව්‍රජිතයන් වහන්සේගේ ද විශෙෂ කවරේ ද? තපස්ක්‍රියාව අඵල වන්නේ ය. ප්‍රව්‍රජ්‍යාවත් නිරර්ථක වන්නේ ය. ශික්ෂාපද රක්ෂා කිරීමත් වඳ වන්නේ ය. ධුතාංගගුණසමාදනය ද සිස් වන්නේ ය. ඒ ප්‍රව්‍රජිතකෘත්‍යයෙහි දුක් රැස් කිරීමෙන් කම් කිම ද? සැපයෙන් ම සැපතට පැමිණිය යුතු නො වේ දැ' යි කීහ.

''සැබැව, මහරජානෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින්—

> **'ගිහිනො වාහං භික්ඛවෙ පබ්බජිතස්ස වා සම්මාපටිපත්තිං වණ්ණෙමි. ගිහී වා භික්ඛවෙ පබ්බජිතො වා සම්මාපටිපන්නො සම්මාපටිපත්තාධිකරණං ආරාධකො හොති ඤායං ධම්මං කුසලං'** යි

කියා මෙම කාරණය වදරණය ලද්දේ ය. ඒ වදළ කාරණය එසේ ම ය. මහරජානෙනි, මනා කොට පිළිපන්නා වූ පුද්ගලයා ම ශ්‍රෙෂ්ඨ වන්නේ ය. මහරජානෙනි, යමෙක් ප්‍රව්‍රජිත වූයේ ද, මම පැවිදි වීමි යි කියා මනා කොට මහණධර්මය නො පිළිපදිනේ වී නම් එසේ කල හෙතෙම[1] ශ්‍රමණ භාවයෙන් දුරු **(293)** වූයේ ය. උත්තමභාවයෙන් ද දුරු වූයේ ය. ශ්වෙත වස්ත්‍රධාරී වූ ගෘහස්ථයා මනා කොට පිළිපදී නම් කියනුම කවරේ ද? මහරජානෙනි, මනා කොට පිළිපන්නා වූ ගෘහස්ථතෙම අනවද්‍ය වූ නිර්වාණ ධර්මය සිද්ධ කරන්නේ වේ. මහරජානෙනි, ප්‍රව්‍රජිත වූයේ ද මනා කොට පිළිපදිනේ අනවද්‍ය වූ නිර්වාණධර්මය සිද්ධ කරන්නේ වේ ද, මහරජානෙනි, එතෙකුදු වුවත් ප්‍රව්‍රජිතයන් වහන්සේ ම ශ්‍රමණබවට ඊශ්වර වන්නේ ය. අධිපති වන්නේ ය, මහරජානෙනි, ප්‍රව්‍රජ්‍යාව බොහෝ වූ ගුණ ඇත්තේ ය. අනෙක ගුණ ඇත්තේ ය. අප්‍රමාණ වූ ගුණ ඇත්තේ ය. ප්‍රව්‍රජ්‍යාවගේ ගුණය ප්‍රමාණ කරන්ට නො හැක්කේ ය. මහරජානෙනි, යම් සේ කැමැති කැමැති සියලු ම සම්පත් දෙන්නා වූ චින්තාමාණික්‍ය රත්නයාගේ අනඝිබව මාණික්‍යරත්නයට 'මිල ය මෙපමණ ය' යි කියා කිසි ධනයක් හා ප්‍රමාණ කරන්ට නො හැක්කේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ප්‍රව්‍රජ්‍යාව බොහෝ වූ ගුණ ඇත්තේ ය. අනෙකගුණ ඇත්තේ ය. අප්‍රමාණ වූ ගුණ ඇත්තේ ය. ප්‍රව්‍රජ්‍යාවගේ ගුණය ප්‍රමාණ කරන්ට නො හැක්කේ ම ය.

''තවද, මහරජානෙනි, යම් සේ මහාසමුද්‍රයෙහි රැළ නැඟීම 'මහා-සමුද්‍රයෙහි රැළ මෙපමණ ය' යි කියා ප්‍රමාණය කරන්නට නො හැක්කේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ප්‍රව්‍රජ්‍යාව බොහෝ වූ ගුණ ඇත්තේ ය. අනෙක ගුණ ඇත්තේ ය. අප්‍රමාණ වූ ගුණ ඇත්තේ ය. ප්‍රව්‍රජ්‍යාවගේ ගුණය ප්‍රමාණ කරන්නට නො හැක්කේ ම ය, මහරජානෙනි, ප්‍රව්‍රජිතයන්

1. ඔහු

Non-Commercial Distribution

වහන්සේගේ යම් කිසි කළ මනා කෘත්‍යයෙක් ඇත්තේ වී නම්, ඒ සියලු ම කෘත්‍යය වහා ම සිද්ධ වන්නේ ය. බොහෝ කල් නො යවන්නේ ය. එයට කාරණා කවරේ ද? යත්:— මහරජානෙනි, ප්‍රව්‍රජිතයන් වහන්සේ අල්පේච්ඡ වනසේක. සන්තුෂ්ට වනසේක. විවෙක වනසේක. අසංසෘෂ්ට වනසේක. පටන් ගන්නා ලද වීර්ය ඇති වනසේක. නිරාලය වනසේක. නිත්‍යගෘහයක් නැති වනසේක. සම්පූර්ණ වූ සිල් ඇති වනසේක. සැහැල්ලු ප්‍රවෘත්ති ඇති වනසේක. ධූතාංගප්‍රතිපත්තියෙහි දක්ෂ වනසේක. ඒ කාරණයෙන් ප්‍රව්‍රජිතයන් වහන්සේගේ යම්කිසි කටයුතු කෘත්‍යයෙක් ඇද්ද, ඒ සියල්ල ම කල් නො යවා වහා ම සමෘද්ධ වන්නේ ය. තවද, මහරජානෙනි, යම් සේ කිසි ග්‍රන්ථියක් නැත්තා වූ වට සම වූ යහපත් සේ මුවහත් කරණ ලද්ද වූ සෘජු වූ නිර්මල වූ යහපත් කොට හරණ ලද්ද වූ අයොමය නාරාචයතෙම මනා කොට පැමිණේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම මහණුන් වහන්සේගේ යම් කිසි කට යුතු කෘත්‍යයෙක් ඇද්ද, ඒ සියල්ල ම වහා ම සමෘද්ධ වන්නේ ය. බොහෝ කලක් පමා නො වන්නේ ය'' යි වදාළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නයත් එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

ප්‍රව්‍රජ්‍යාවිශෙෂප්‍රශ්නය යි.

---

## දුෂ්කරක්‍රියා ප්‍රශ්නය.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ශාක්‍යකුල ප්‍රසූත වූ ඒ අප මහා බොධිසත්වයන් වහන්සේ ගෘහාභිනික්මන් නික්ම බුද්ධකාරකධර්මයන් සොයනසේක් යම් කලෙක බුදු විය නො හී දුෂ්කරක්‍රියා කර වදාළසේක් ද, **(294)** අනික් කාලයෙක එබඳු වූ වීර්යයෙක් එබඳු වූ පරාක්‍රමයෙක් එබඳු වූ ක්ලේශයුද්ධයෙක් එබඳු වූ මාරසෙනා විධමනයෙක් එබඳු වූ ආහාර වැළකීමෙක් එබඳු වූ දුෂ්කරක්‍රියාවෙක් නො වූයේ ය. මෙබඳු වූ පරාක්‍රම යෙන් මදකුත් ආස්වාදයක් නො ලැබ එම චිත්තය ක්‍රමයෙන් පිරිහෙළා ගෙණ:—

**'න ඛො පනාහං ඉමාය කටුකාය දුක්කරකාරිකාය අධිගච්ඡාමි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං. සියා නු ඛො අඤ්ඤො මග්ගො බොධාය?'**

යනාදීන් 'මම වනාහි මේ කර්කශ වූ දුෂ්කරක්‍රියාවෙන් උතුම් වූ සර්වඥතාඥානදර්ශනයට පොහොසත් වූ විශෙෂයකට හෝ උත්තරීමනුෂ්‍යධර්මයට නො පැමිණෙන්නෙමි. සර්වඥතාඥනාවබොධය පිණිස අනික් මාර්ගයෙක් වන්නේ ම ය' යි මෙසේ කියා ඒ දුෂ්කරක්‍රියාමාර්ගයෙන් කලකිරී සැහැල්ලු ව අනික් මාර්ගයකින් සර්වඥතාඥනයට පැමිණ නැවත ඒ දුෂ්කර වූ ප්‍රතිපදවෙන් ම ශ්‍රාවකයන්ට අනුශාසනා කර වදරණසේක. සමාදන් කර වදරණසේක. 'මහණෙනි:—

Non-Commercial Distribution

**'ආරභථ නික්ඛමථ-යුඤ්ජථ බුද්ධසාසනෙ,**
**ධුනාථ මච්චුනො සෙනං-නළාගාරං ව කුඤ්ජරො.'**

යන මෙයින් 'බුද්ධශාසනයෙහි කායචිත්තවීර්යයෙන් යෙදෙවු. කර්මස්ථාන ගෙණ වෘක්ෂමූලසුසානාදියට නික්මෙවු. ක්ලේශයුද්ධ මථනයට පටන් ගණිවු. හුණබටගෘහයක් සුණු විසුණු කරණ හස්තිරාජයෙකු මෙන් මරහුගේ මාරසේනාව නසවු' කියා දුෂ්කරක්‍රියායෙහි ම යොදවා වදරණසේක. ස්වාමීනි,'නාගසෙනයන් වහන්ස, තථාගතයන් වහන්සේ අතිදුෂ්කර වූ යම් ප්‍රතිපදාවකින් තමන් වහන්සේ කලකිරුණුසේක්, නො ඇලුනුසේක්, ඒ ප්‍රතිපදායෙහි කවර කාරණයකින් ශ්‍රාවකයන්ට අනුශාසනා කරණසේක් ද? සමාදන් කර වදරණසේක් ද?'' යි විචාළෝ ය.

''මහරජානෙනි, එකල්හි දු දැනු දු ඒ මධ්‍යමප්‍රතිපදාව ම පිළිපැද ඒ මාගේ ශ්‍රී මහාබොධිසත්වයන් වහන්සේ ලොවුතුරා සර්වඥතාඥනයට පැමිණ වදාළසේක. එතෙකුදු වුවත්, මහරජානෙනි, ඒ අපගේ ශ්‍රීමහාබොධි-සත්වයන් වහන්සේ සර්වඥතාඥනය පිණිස ශතාසංඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි මනොප්‍රණිධානය පුරා නවාසංඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි වාක්ප්‍රණිධානය පුරා සකල ලොකශිවංකර වූ **දීපංකර** නම් ලොවුතුරා බුදුන්ගේ සම්මුඛයෙන් නියතවිවරණ ශ්‍රී ලදින් සාරාසංඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි සමත්‍රිංශත්පාරමීධර්මයන් පූරණය කෙරෙමින් **වෙස්සන්-තරාත්**මභාවයට පැමිණ මෙම සර්වඥතාඥනය පිණිස ම ප්‍රෙමතර වූ පුත්‍රදරාදීන් පරිත්‍යාග කිරීමෙන් සත්වරෙක මහාපෘථිවි මෙරුයුගන්ධරාදිය කම්පා කොට පාරමිතාධර්මයන් සම්පූර්ණ කෙරෙමින් **තුසී** නම් දෙව්ලොව ඉපිද දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයන්ගේ ආරාධනාවෙන් තුසීපුරයෙන් චුත ව **මහාසම්මත**පරම්පරානුයාත විසුද්ධසූර්යවංශොද්භූත ව **සුද්ධෝදන** නම් මහරජානන් නිසා අමායාභූත වූ **මහාමායා**දෙවීන් කුස **(295)** ඉපද දසළුකඩමසින් **මහාබ්‍රහ්මයාගේ** අතට බිහි ව බඹ සුර නරන් අතින් ක්‍රමයෙන් ගොස් භූමියට පැමිණ පුණ්‍යමහිමයෙන් පෘථිවි ප්‍රදලනය කොට පැන නැංගා වූ සත්බුමුමහපියුම්පිටින් සත්පියවරක් නිරුත්තර වූ උත්තර දිශාභිමුඛ ව වඩුත් ශ්‍රීශරීරයෙන් නිකුත් ස්වර්ණාලොකයෙන් තුන්ලෝ උතුරුවා ලොකාන්තරිකමහානරක හිරුදහස් සඳුදහස් නැඟී කලක් සේ එකාලොක කෙරෙමින් සප්තපදව්‍යතිහාරාවසානයෙහි වැඩ සිට දසදිසා විලොකනය කෙරෙමින් 'අග්ගො'හමස්මි ලොකස්ස, ජෙට්ඨො'හමස්මි ලොකස්ස, සෙට්ඨො'හමස්මි ලොකස්ස' යනාදීන් දසදහසක් සක්වළට ඇසෙන සේ අභීතකෙසරසිංහනාද පතුරුවා සකල ලොකවාසීන් සැණ කෙළියෙන් නළවා දිව්‍යබ්‍රහ්මමනුෂ්‍යපෙරහරින් අන්තොපුර ප්‍රවිෂ්ට ව අසූසාරදහසක් කල්පයෙක පැවැති තොරතුරු අතැඹුල සේ දක්නට සමර්ථ වූ **කාළදෙවල** නම් සෘෂීන්ගේ ජටාන්තරයෙහි දෙපතුල් තබා වැඳුම් ලදින් ප්‍රාර්ථිත වූ **සිද්ධාර්ථ** නමින් ප්‍රසිද්ධ ව වැඩෙන පුන්සඳක් සේ වැඩි කෘත-පුණ්‍යධාරී වූ **යශොධරා** දේවීන් ප්‍රධාන කොට ඇති සතළිස්දහසක් බිසෝ

*Non-Commercial Distribution*

වරුන් පිරිවරා සෘතුත්‍රයට යොග්‍ය වූ ප්‍රාසාදත්‍රයෙහි වාසය කොට ශක්‍ර දෙවේන්ද්‍රවිලාසයෙන් එකුන්තිස්හවුරුද්දක් මුළුල්ලෙහි රාජශ්‍රීසම්පත් අනුභව කෙරෙමින් උද්‍යානයාත්‍රායෙහි දෙවියන් දක්වාලූ සතර පූර්ව නිමිත්ත දැක භවත්‍රයෙහි කලකිරී මහණ වනු කැමැති ව **යශෝධරාදේවීන්** **රාහුලකුමාරයන්** වැදූ දිනයෙහි බිසෝගෙය කරා ගොස් දෙර හැර දකුණු පය එළිපත මත්තෙහි තබා රන්බාපත අත තබා සිට සුවඳවැටපහන් ආලොකයෙන් දිලිසෙන්නා වූ ශ්‍රීයහන්ගබඩායෙහි අමුණක් සමන්මල් අතුළ ශ්‍රීයහන් මස්තකයෙහි **රාහුලකුමාරයන්**ට බඩ දී ගෙණ දෙවහනක සේ සැතපෙන්නා වූ **යශෝධරාදේවීන්** දැක 'මා පුතනුවන් වඩා ගෙණ සිඹ සනසා පියා යෙම් දෝ හො?' යි සිතා 'එකල **යශෝධරා**වොත් පිබිද යෙති. මාගේ මහණ වීමට ද අන්තරාය පෙණෙයි. අද **රාහුලයන්** මූහුණ බලා ගෘහබන්ධනයෙන් බැඳී ගියේ වීම් නම්, මතු තුන්ලෝවාසීහු කාගේ මූහුණ බලා සංසාරබන්ධනයෙන් ගැලවෙන්නාහු ද? පසු ව බුදු වෙලා අවුත් රාහුලයන් දක්නෙමි' යි සිතා මහමෙර ඔසවන්නා සේ ශ්‍රීපාදය නගා ගෙණ ප්‍රාසාදයෙන් බැස **කන්ථක** නම් අශ්වරාජයා පිටට පැන නැඟී **ඡන්න** නම් අමාත්‍යයා හා සමග රාත්‍රියගේ පසළොස්පැවෙලාවෙහි දහසක් පමණ යොධපුරුෂයන් විසින් හැරපියන මහදෙරටුවට පැමිණිසේක.

“ඒ වේලෙහි දෙවතාවෝ 'ස්වාමීනි, අපට නිවන්දෙර හැර දුන මැනැවැ' යි කියා වාසල්දෙර හැරපූහ. එකෙණෙහි **වශවර්තිමාරයා** 'අහෝ! අද **සිද්ධාර්ථකුමාරයා** මේ දෙරින් පිටත් ව ගියේ වී නම්, ඒකාන්තයෙන් ම ලොවුතුරාබුදු වෙයි. එදවස් මාගේ නරකවල ගිනි නිවයි. හැම නරක සිස් කෙරෙයි. නිවන්පුරය පුරවා ලයි. මාගේ ආඥව බිඳ මට මහත් හානි කෙරෙයි. මායමකින් ඔහු නවත්වා ලම්' යි සිතා දිව අවුත් ආකාශයෙහි පෙණී සිට:—

**'මා නික්ඛම මහාවීර–ඉතො තෙ සත්තමෙ දිනෙ,**
**දිබ්බන්තු චක්කරතනං–අද්ධා පාතු භවිස්සති.'**

**(296)** යන ගාථාවෙන් 'නො යව මහාවීර පුරුෂොත්තමයාණෙනි, මෙයට සත්වන දවස් තොපට දිව්‍යමයචක්‍රරත්නය ප්‍රධාන ව ඇති සප්තවිධරත්න-යෙන් යුක්ත වූ චක්‍රවර්තිරාජ්‍යය ඒකාන්තයෙන් ම පහළ වෙයි. දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතරමහදිවයින සහිත මේ සක්වළ මුලුල්-ලෙහි චක්‍රවර්තිරාජ්‍යශ්‍රීය කරව. යහළුව, නො යව, නො යව' යි කියා බාධා කෙළේ ය. එකල බෝධිසත්වයෝ අහස බලා 'තෝ කවරෙහි දැ?' යි විචාළසේක. මාරයා ඒ අසා 'මා යහළු **සිද්ධාර්ථකුමාරයෙනි**, සවන **පරනිර්මිතවශවර්ති** දිව්‍යලොකයෙහි මම මාරදිව්‍යපුත්‍රයෙමි. මා කීවාක් කරව' යි කී ය. එවිට මහබෝසතාණෝ:—

**'මාර ජානාමහං මය්හං–චක්කස්ස පන සම්භවං,**
**අනත්ථිකො'හං රජ්ජෙන–නිවත්ත ත්වං මාර මා ඉධ.'**

*Non-Commercial Distribution*



ගෞතම බෝසතානන් වහන්සේගේ දුෂ්කර ක්‍රියාව. (339 පිටුව)

*Non-Commercial Distribution*

'මාරය, මට චක්‍රවර්තිරාජ්‍යය සම්භව වන බව තට වඩා මමත් දනිමි. චක්‍රවර්තිරාජ්‍යයෙන් මට ප්‍රයෝජන නැත්තේ වෙමි. තා සේ සියදහසක් මාරයෝ අවුත් නවත්වත් මූත් නො වළකින්නෙමි. මාරය, තෝ මට බාධා නො කොට මාගේ මේ දෙරකඩ නො ඉඳ පලායව. මම දසදහසක් සක්වළ ගුගුරුවා ලොවුතුරා බුදු වෙමි ම ය. ධර්මදෙශනාවෙන් දසදහසක් සක්වළ උතුරුවාලම්මැ' යි කියා අභිතගර්ජනා කෙරෙමින් වහසල්දෙරටුවෙන් නික්මුනුසේක.

''එකෙණෙහි දසදහසක් සක්වළ පෘථිවීතලය යදණ්ඩෙන් ගැසූ ලොහොතලියක් මෙන් මහහඩින් ගුගුරා කම්පා වී ය. දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මසේනාව 'අපගේ සිද්ධාර්ථ කුමාරයෝ මහබිනික්මන් කරණසේක. අපි අද රැ අඳුරු දුරු කොට මහබිනික්මන් පූජා කරම්හ'යි රැස් ව පෙරට සැටදහසක් දෙවියෝ සැටදහසක් පමණ මැණික්දඬුවැටපහන් ගෙණ සිටියාහ. දකුණැළයෙන් සැටදහසක් පහන් ගෙණ සිටියාහ. වම්ඇළයෙන් ද සැටදහසක් පහන් ගෙණ සිටියාහ. පිටිපස්හි ද සැට දහසක් පහන් ගෙණ සිටියාහ. සෙසු දෙවියෝ සක්වළගල වටා උරෙන් උර ගසා මැණික්දඬුවැටපහන් ගෙණ සිට ගත්හ. එද රැ මේ සා සක්වළ මුළුල්ලෙහි අඳුරෙන් වැසෙන්නා වූ අල්ලක්සාත් අවකාශයෙක් නො වී ය. කුරුකුහුඹුවන් දක්වාත් ඔවුනොවුන්ට පෙණෙන්ට වන. සෙසු දෙවියෝ ද නාගයෝ ද ගරුඩයෝ ද ගන්ධර්වයෝ ද දිවමලින් සුවඳින් පුදන්ට වන්හ. දෙවියන් දමන පරසතු මදරා මලින් හා අසුරයන් දමන පලොල්මලින් හා නයින් දමන කඩුපුල්මලින් හා ආකාශයෙහි අතුරු නැති ව වස්නා ඝනමහාවර්ෂාවක් සේ මල්දරා වයින්ට වන. දසදහසක් සක්වළ ගන්ධර්ව දෙවතාවෝ තුන්ගවු දිග හෙරි වීණාදිය කර ලා ගෙණ දිව අවුත් ඉදිරියෙහි අටසැටදහසක් දෙන පඤ්චාංගිකතූර්යනාද කෙරෙමින් යෙති. දකුණු දෙසින් අටසැටදහසක් තූර්යනාද කෙරෙමින් යෙති. වමත් පස ද අටසැට දහසක් දිව්‍යහෙරිනාද කෙරෙමින් යෙති, පිටිපස්හි ද අටසැටදහසක් හෙරි නාද කෙරෙමින් යෙති. අවශෙෂ වූ ගන්ධර්වයෝ සිටිනට අවකාශ නැත්තෙන් සක්වළ මෝවිට සිසාරා සිට ගත්හ. එද ඒ හෙරිනාදඝොෂාව මිහිමඬල පටන් අකනිෂ්ඨ **(297)** බඹලොව දක්වා එකනින්නාද විය.

''මෙසේ අනන්‍යසාධාරණපුණ්‍යනිර්මිත වූ ශ්‍රීමහාබොධිසත්වයන් වහන්සේ දසදහසක්සක්වළ දෙවියන් කරණ පූජා විඳිමින් අසුකුරින් හිසින් දෙවියන් පුදන මල්කඳු පිහිරවපිහිරවා තිස්යොදුන් මග ගෙවා අලුයම්වේලෙහි **අනොමා** නම් ගංතෙරට පැමිණිසේක් **ඡන්න** නම් අමාත්‍යයා ලවා අසුවාලධිය ගන්වා අශ්වයාහට විලිඹින් සන් කළසේක. එවේලෙහි අශ්වරාජතෙම **ඡන්නයා** හා බොධිසත්වයන් උසුලා ගෙණ අටසියයක් රියන් පළල ඇති ගඟින් එතෙර පැන වැලිතලායෙහි රිදීපිඩක් සේ සිටියේ ය. එවිට මහාබොධිසත්වයන් වහන්සේ ප්‍රසන්න ව මහල්



Non-Commercial Distribution

කඩුවෙන් සිගාවරල කපා අහසට දමා මහාබ්‍රහ්මයා ගෙණවුත් දුන් අට පිරිකර වැලඳ පැලඳි සළු අහසට දමා ඡන්නයාහට සියනුවරට යන සේ සමු දෙමින් එයින් **අනූපිය** නම් අඹවනයට වැඩ මහණප්‍රීතිසැපයෙන් සද්දවසක් නිරාහාරයෙන් වැඩ සිට සත්වන දවස් එයින් තිස්යොදුන් මග ගෙවා **රජගහනුවරට** වැඩ ගෙපිළිවෙළින් සිඟමින් මහාබ්‍රහ්මයා පැමිණි කලක් මෙන් සියලු නුවර විස්මය පත් කරවා ලත් ආහාර **පාණ්ඩව** නම් පර්වතච්ඡායායෙහි වැඩ හිඳ වළඳා වදරා දෙවෙනි දවස් **රජගහනුවර** පිඩු සිඟන කල වහා දිව අවුත් වැඳ වැතිර රාජ්‍යසම්පත්තියෙන් පූජා කළ **බිම්බිසාර** රජහට බුදු ව අවුත් පළමු කොට ධර්මදෙශනා කරණ සේ ප්‍රතිඥ දී ඒ **පාණ්ඩව** නම් පර්වතගුහායෙන් නික්ම දනවු සැරිසරණසේක් **ආළාර** ය **උද්දක** ය යි කියන ලද තාපසවරුන් කරා ගොස් කීපදවසකින් ම අෂ්ට සමාපත්ති උපදවා ගෙණ ‘මේ තපස්වීන්ගේ සමයෙහින් නිවන් නැතැ’යි කියා එයින් නික්ම **උරුවෙලා** නම් දනව්වට වැඩ එහි වසන **පස්වගමහණුන්** හා සමග සතුටු ව වාසය කෙරෙමින් ‘අද බුදු වෙමි’ ‘සෙට බුදුවෙමි’ යි කිය කියා සාවුරුද්දක් මුළුල්ලෙහි දුෂ්කරක්‍රියා කරණසේක් මහත් වූ වීර්යයෙන් යුක්ත ව දන්තපන්තියෙන් දන්තපන්තිය තද කොට පිහිටුවා ගෙණ දිවින් තල්ල පැහැර ගෙණ කුසලසිතින් අකුසල සිතට නිග්‍රහ කෙරෙමින් දෙපක්ෂයෙන් ද ඩා සෙලවෙන[1] තාක් වීර්ය කරන් බුදු විය නො හී ‘මේ නියා වීර්යයෙන් බුදු විය හෙම් දෝ හො?’ යි සිතා මුඛයෙන් නාසිකාවෙන් ආශ්වාසප්‍රශ්වාසය වළක්වා ගෙණ, වීර්ය කරණසේක. කඹුරුසම්තුඩින් නික්මෙන සුළං සෙයින් මහත් වූ හඬින් උභයකර්ණච්ඡිද්‍රයෙන් වාතය නික්මෙන තාක් දක්වා මහත් වූ දුක්ඛවෙදනාවෙන් දුෂ්කරක්‍රියා කෙරෙමින් බුදු විය නො හී තවත් නො හැර ම වීර්ය කරණසේක. මුඛයෙන් ද නාසිකායෙන් ද උභයකර්ණශ්‍රොත්‍රයෙන් ද ආශ්වාසප්‍රශ්වාස වළක්වා ගෙණ බලවත් වූ දුෂ්කරක්‍රියා කරණසේක්, මහත් බල ඇති පුරුෂයකු තීක්ෂ්ණ වූ යකඩ විදින කටුවකින් මස්තකය විදින්නාක් මෙන් බලවත් වූ දුක්ඛවෙදනා වන තාක් වීර්ය කරපියාත් බුදු විය නො හී තවත් එසේ ම ආශ්වාසප්‍රශ්වාසය වළක්වා ගෙණ ප්‍රධානක්ෂම වූ අසල්ලීන වූ වීර්ය කරණසේක් බලවත් වූ පුරුෂයෙකු දෘඩ් වූ අස්ලොම්යොතකින් බලවත් කොට ශිර්ෂය වෙළන කලක් මෙන් බලවත් වූ දුක්ඛවෙදනා විඳිමින් දුෂ්කරක්‍රියා කොට පියාත් බුදු විය නො හී එසේ ම ආශ්වාසප්‍රශ්වාසය වළකා වීර්ය කරණසේක් බලවත් වූ වාතය හිස පැහැර මස්තකය බිඳ **(298)** යා නො හැකි ව පෙරළා ඇතුළු කුක්ෂියට වැද තීක්ෂ්ණ වූ මස් කපන කැත්තෙන් ඇතුළු ගර්භය කපා ලන්නාක් මෙන් ඉතා බලවත් වූ දුක්ඛවෙදනා වන තාක් දක්වා ම නො හැර වීර්ය කෙරෙමින් මහත්බල ඇති පුරුෂයන් දෙදෙනෙකුන් දුර්වලතරපුරුෂයෙකු දෘඩ් කොට අල්වා ගෙණ මහත් වූ ගිනිඅඟුරු රැසෙක්හි ලං කොට තවන කලක් මෙන් සකලශරීරය ඩා සෙලවෙන තාක් දක්වා ආශ්වාසප්‍රශ්වාසය වළක්වා ගෙණ නිරාශ්වාසක

1. දෙපක්ෂයෙන් සෙලවෙන

Non-Commercial Distribution

ධ්‍යානය වඩමින් සාරාසංඛ්‍යකල්පලක්‍ෂයක් මුළුල්ලෙහි සර්වඥතා ඥානය පිණිස කර වදළා වූ වීර්යය මේ ම දුෂ්කරක්‍රියායෙන් ම සමස්ත ලොකවාසීන්ට දක්වමින් සකල දිව්‍යබ්‍රහ්මාදීන් විස්මය පත් කරවා දුෂ්කර ක්‍රියායෙහි කෙළ පැමිණිපියාත් බුදු විය නුහුනුසේක්, 'මඳ මඳ කොට ආහාර ගැණීමෙන් වීර්ය කෙරෙමි' යි සිතා මුං පිසූ යූෂපතක් ලදින් එයිනුදු යැපෙනසේක්, කොල්ලු පිසූ යූෂපතක් ලදින් එයිනුදු යැපෙනසේක්, දවස තලඇටක් සා භොජනයකිනුත් යැපී දවස් යවනසේක්, මීරිස්කැනක් ලද්දත් තිබ්බටුකැනක් ලද්දත් එයින් යැපී අතිවීර්ය කරණසේක්, සර්ව-ප්‍රකාරයෙන් ම ආහාරය වර්ජිත කොට දුෂ්කරක්‍රියා කරණසේක් ම ය.

''එකල දෙවතාවෝ 'අපගේ සිද්ධාර්ථකුමාරයෝ ආහාර වැළකීමෙන් නො නසිත්ව' යි සිතා නවානුදහසක් ලොමකූපයෙන් දිව්‍යරසඔජස් බහා ලමින් ජීවිතය රක්‍ෂා කෙරෙති. මහාබොධිසත්වයන් වහන්සේගේ අනන්තපුණ්‍යනිර්මිත වූ ශ්‍රීශරීරය ආහාර වර්ජිත කිරීමෙන් දුර්වල ව කාල වර්ණ වී ය. මනුෂ්‍යයෝ දැක 'කාලවර්ණශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේ ය' යි කියති. දෙතිස්මහාපුරුෂලක්‍ෂණයෝ ද ශරීරයෙහි ම සැඟවී ගියාහු ය. දෙසියසොළසක් මංගලලක්‍ෂණයෙන් විරාජමාන වූ ශ්‍රීපාදද්වන්දය හා උල්මාංසය මස් සිඳී ඔට්ඨපදකාර වී ය. පිට්ඨිකණ්ටකය ඉඳිඇට විද ඇමුණු වට්ටනාවලියක් මෙන් සන්ධි සන්ධි උස්මිට් වන්නේ ය. ඉලඅස්ථීහු ජීර්ණ වූ ශාලායෙක ගොනැස් මෙන් සෙලවෙන්නාහ. නීලොත්-පලදලාකාර සශ්‍රීක වූ නෙත්‍රද්වන්දය ගම්භීර වූ ලිඳ පැන්හි දක්නා උදක තාරකාය යි කියන ලද දියබුබුලුදෙකක් සෙයින් අතිගැඹුරු වී ය. පුන් සඳක් වැනි මුහුණුමඬලින් යුක්ත වූ සිරොධාතුව නො මේරූ තිත්ත ලාබුවක් නෙළා ආතපයෙන් වියලූ කලක් මෙන් විරූප වී ය. 'බඩසම අල්වමි' යි සිතා ගත් අතට වැළක පිටකොන්ද හසු ව යන්නේ ය. 'පිට අල්වමි' යි සිතා ගත් අතට බඩසම හසු ව යන්නේ ය. බඩසමත් පිටකටුවත් දෙක එකට ඇලී ගියේ ය. 'මලමූත්‍ර කෙරෙමි' යි කියා ආරම්භ කළ කල භ්‍රමණ කණ්ටයෙන් විදින කලක් මෙන් බලවත් වූ දුක්ඛවෙදනාවෙන් පෙළී එතැන්හි ම මුණින් වැටී යන්නේ ය. මුඛයෙන් නාසිකාවෙන් ආශ්වාසය කෙරෙමින් අතින් ගාත්‍ර පිරිමදින කල කුණු වූ මුල් ඇති ලෝමයෝ කයින් ඉපිළ වැටෙන්නාහු ය. සිතූ තැනෙක පය තබාපිය නො හැකි වූ අසථි චර්මමාත්‍ර වූ ශරීරයෙන් 'අද බුදු වෙමියි, සෙට බුදු වෙමි' යි සිතසිතා අති දුෂ්කරක්‍රියා කරණසේක් සමහර විටෙක මුණින් වැටී කල් යවනසේක. ඒ දැක දේවතාවෝ 'අහෝ! සිද්ධාර්ථකුමාරයන් වහන්සේ බුදු විය නො හී මළාහ' යි මහාසොකයෙන් හඬා වැලප යෙති, සමහර දෙවතා කෙනෙක් තව ම නො මළාහ. නස්නේ ඇතැ' යි කියති. සමහර **(299)** දෙවතා කෙනෙක් 'සිද්ධාර්ථ කුමාරයෝ නො මළාහ. සිත කයට නහා ගෙණ හිඳිනාසේක. නො බුදුව මරණ පත් නො වනසේකැ' යි බලා හිඳිති. සමහර දෙවතාකෙනෙක් සුද්ධෝදනරජ්ජුරුවන් කරා ගොස් 'මහරජා

Non-Commercial Distribution

නෙනි, තොප පුතනුවෝ සිද්ධාර්ථකුමාරයෝ අද බුදු වෙමි යි, සෙට බුදු වෙමි'යි කියකියා මහත් දුෂ්කරක්‍රියා කෙරෙමින් බුදු විය නො හී මළාහ' යි කියති. මෙසේ ත්‍රිභුවනජනවන්දනීය වූ ශ්‍රී මහාබොධිසත්වයන් වහන්සේ ඉතාමත් වූ දුක්ඛවේදනා විඳිමින් දුෂ්කරක්‍රියා කළහ. ආහාරවර්ජිත වූ දුෂ්කරක්‍රියාවෙන් ඒ මහතානන්ගේ චිත්තයෙහි අතිදුර්වල බව උපන්නේ ය. ඒ චිත්තදුර්වල බව කරණ කොට ගෙණ ඒ මහබෝසතානන් වහන්සේ සර්වඥතාඥනයට පැමිණ පියන්නට නො හැකි වූසේක්, 'ආහාරවර්ජිත වූ මෙබඳු වූ වීර්‍ය්‍යයෙන් බුදු විය නො හෙමි. එහෙයින් මඳ මඳ කොට වඩවඩා ආහාරය වළඳමි' යි සිතා ඒ බොධිසත්වයන් වහන්සේ කබලිංකාහාරය පමණ පමණ කොට සෙවනය කෙරෙමින් පහන්රුකක් ඇවිළගියා සේ බබළන්නා වූ දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් විරාජමාන වෙමින් එම මධ්‍යමප්‍රතිපදවෙන් ම ගොස් සර්වඥතාඥනයට පැමිණ වදළසේක.

''මහරජානෙනි, අතීතානාගතවර්තමාන යන කාලත්‍රයවර්ති වූ සියලු ම තථාගතයන් වහන්සේලාගේ සර්වතාඥනප්‍රතිලාභය පිණිස එම මධ්‍යමප්‍රතිපදව ම ය. මහරජානෙනි, යම් සේ සකල සත්වයන්ට ආහාරය උපස්තම්භක වන්නේ ය. සියලු සත්වයෝ ආහාරය උපනිශ්‍රිත වූවාහු සැප අනුභව කරන්නාහු ය. මහරජානෙනි, එපරිද්දෙන් ම සියලු ම තථාගතයන් වහන්සේලාගේ සර්වඥතාඥනප්‍රතිලාභය පිණිස එම මධ්‍යමප්‍රතිපත්තිය ම ය. මහරජානෙනි, ඒ බුදු නො වී ප්‍රමාද වූ දෙෂය තෙම පටන් ගත් වීර්‍ය්‍යයාගේත් නො වන්නේ ය. පරාක්‍රමයාගේත් නො වන්නේය. ක්ලේශයුද්ධයාගේත් නො වන්නේ ය. තථාගතයන් වහන්සේ ඒ දුෂ්කරක්‍රියාසමයෙහි යම් අධිකවීර්‍ය්‍යයක් කරණ කොට ගෙණ සර්වඥතා ඥනයට නො පැමිණිසේක් ද, එකල ඒ ආහාරවර්ජිතයාගේ දෙෂය ම ය. ඒ ප්‍රතිපදව හැමකල ම පටියත්ත ම ය. මහරජානෙනි, යම් සේ පුරුෂයෙක්තෙම මාර්ගයෙහි බලවත් වූ වෙගයෙන් යන්නේ වී නම්, ඒ කාරණයෙන් ඒ පුරුෂතෙම දෙඅත් විනාස වූවාක් මෙන් හෝ වන්නේ ය. පා දඬු ව පීඨසප්පික හෝ වන්නේ ය. අවසහ ව පෘථිවීතලයෙහි හෝ වැටෙන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ පුරුෂතෙම යමක් කරණ කොට ගෙණ අත් බිඳීම පා බිඳීම ආදී කිසි ව්‍යසනයකට පැමිණෙන ලද්දේ වී නම්, මහාපෘථිවියගේ දෙෂයෙක් ඇද් ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, මහපෘථිවීතොම සදා පටියත්ත ම ය. ස්වාමීනි, ඒ පෘථිවියගේ දෙෂයෙක් කොයින් ද? ඒ පුරුෂතෙම යම් ශීඝ්‍රගමනක් කරණ කොට ගෙණ හස්තභෙදනාදියකට පැමිණියේ වී නම් ඒ මේ දෙෂය වීර්යයාගේ ම ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම තථාගතයන් වහන්සේ යමක් කරණ කොට ගෙණ ඒ දුෂ්කරක්‍රියා සමයෙහි සර්වඥතා ඥනයට නො පැමිණිසේක් ද, මේ දෙෂය පටන් ගන්නා ලද වීර්‍ය්‍යයා ගේත් නො වන්නේ ය. දුෂ්කරක්‍රියාපරාක්‍රමයාගේත් නො වන්නේ ය. **(300)** ක්ලේශයන් හා කළ යුඬයාගේත් නො වන්නේ ය. එකල

*Non-Commercial Distribution*

ආහාර වර්ජිතයාගේ ම මේ දෙෂය වන්නේ ය. ඒ මධ්‍යමප්‍රතිපදතොම හැම දවස් ම පිළියෙල ව ම පවත්නේ ය. තවද මහරජානෙනි, යම් සේ පුරුෂයෙක්තෙම කිලුටු වූ වස්ත්‍රයක් වලඳින්නේ ය. ඒ වස්ත්‍රය ඔහු නො සෝදවන්නේ වී නම්, ඒ දෙෂය උදකයාගේ නො වන්නේ ය. උදකය හැම දවස්හි ම පිළියෙළ ව ම පවත්නේ ය. ඒ අලස වූ පුරුෂයාගේ ම මේ දෙෂය වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන්ම යම් ආහාරවර්ජිතයක් කරණ කොට ගෙණ අප තථාගතයන් වහන්සේ ඒ දුෂ්කරක්‍රියාසමයෙහි සර්වඥතාඥනයට නො පැමුණුනුසේක් ද, මේ දෙෂය වීර්යයාගේත් නො වන්නේ ය. පරාක්‍රමයාගේත් නො වන්නේ ය. ක්ලේශයුද්ධයාගේත් නො වන්නේ ය. එකල්හි ආහාරවර්ජිතයාගේ ම මේ දෙෂය වන්නේ ය. එම මධ්‍යමප්‍රතිපදතොම සද ම පිළියෙල ව ම පවත්නේ ය. එහෙයින් තථාගතයන් වහන්සේ ඒ මධ්‍යමප්‍රතිපදවෙන් ම තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ට අනුශාසනා කරණසේක. සමාදන් කරවා වදරණසේක. මහරජානෙනි, මෙසෙසින් අනවද්‍ය වූ ඒ ප්‍රතිපදතොමෝ සද පිළියෙල ව පවත්නේ ය'' යි වදළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නය ද එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**දුෂ්කරක්‍රියා ප්‍රශ්නය යි.**

---

# සීරළු ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ බුද්ධශාසනය ඉතා මහත් වන්නේ ය, සාර වන්නේ ය, උතුම් වන්නේ ය, ශ්‍රෙෂ්ඨ වන්නේ ය, ප්‍රවර වන්නේ ය, අනුපම වන්නේ ය, පරිශුද්ධ වන්නේ ය, විමල වන්නේ ය, පිරිසිදු වන්නේ ය, අනවද්‍ය වන්නේ ය. ගෘහස්ථයන් එපමණකින් ම පැවිදි කරන්නට යුතු නො වන්නේ ය. ගෘහස්ථභූමියෙහි දී ම එක් මාර්ගඵලයක හික්මවා ලමින් යම් කලෙක සිවුරු හැර නො යාමෙන් අපුනරාවර්තික වේ ද, එකල ඒ ගෘහස්ථයා පැවිදි කළ යුත්තේ ය. ඊට කාරණා කවරේ ද? යත්:— මේ නුවණ මඳ සමහර දුර්ජන කෙනෙක් පළමු කොට ම අත්‍යන්ත පිරිසිදු වූ බුද්ධශාසනයෙහි පැවිදි ව ප්‍රතිපත්ති පිරීමෙන් වැළක සිවුරු හැර ලාමක වූ ගෘහස්ථභාවයට පැමිණෙන්නාහු ය. ඒ අඥනයාගේ වැළක එන ගමනින් මේ ලොකවාසී වූ සමහර මහජන කෙනෙක් පින්වත්නි, මේ ජනයෝ යම් කාරණයකින් ශාසනයෙන් වැළක එන්නාහු ද, ඒ කාරණයෙන් 'ශ්‍රමණ භවත්ගෞතමයන් වහන්සේගේ මේ ශාසනය එකාන්තයෙන් ම තුච්ඡ වන්නේ ය' යි කියා මෙසේ සිතන්නාහ.[1] මේ මෙහි කාරණ ය'' යි කීහ.

---

1. *සිතන්නේ ය.*

*Non-Commercial Distribution*

''මහරජානෙනි, මේ තෙපි කුමක් කියවූ ද? යම් සේ පවිත්‍ර විමල සීතලජලයෙන් සම්පූර්ණ වූ මහවිලෙක් වන්නේ ය. පසු ව සකලශරීරය රජස්මලකර්දම ඝන ව කෙලෙසුනා වූ යම් කිසිවෙක් ඒ විලට ගොස් පැන් නො නා ම කෙලෙසුනා වූ ශරීරයෙන් ම ගියේ වී නම්, මහරජානෙනි, එහි සත්වතෙම රජස් ආදියෙන් කෙලෙසුනා වූ පුරුෂයාහට හෝ යහපත් වූ විලට හෝ කවරක්හට ගර්හා කරන්නේ දැ?'' යි විචාළසේක. 'අනේ! ස්වාමීනි, 'මූ විලට ගොස් පැන් නො නා ම කෙලෙසුනු **(301)** ශරීරයෙන් ම පලා ආයේ ය. කිමෙක් ද? නො නානු කැමැත්තා වූ මූ විලතෙමේ තෙමේ ම නහවාලන්නේ ද? අහෝ! විලගේ දෙෂ කවරේ දැ?' යි කියා සත්වතෙම රජස් ආදියෙන් කෙලසුනු පුරුෂයාහට ම ගර්හා කරන්නේ ය'' යි කීහ. මහරජානෙනි, එපරිද්දෙන් ම අප තථාගත වූ සර්වඥයන් වහන්සේ කිලෙසමලින් කෙලෙසුනා වූ යම්කිසි සත්වකෙනෙක් ඇද්ද, ආත්මාර්ථ පරාර්ථ සිඳින්නා වූ පාපචෙතනා ඇත්තා වූ යම් සත්වකෙනෙක් ඇද්ද, ඒ සත්වයෝ 'මේ විලින් නාපියා සර්වක්ලේශයන් පහ කරන්නාහුය' යි සිතා අර්හත්ඵල නමැති උතුම් වූ අමෘතජලයෙන් සම්පූර්ණ වූ සද්ධර්ම-වරමහවිලක් මවා වදළසේක. ඉදින් කිසි අඥනයෙක් ඒ ශාසන නමැති සද්ධර්මවරමහවිලට ගොස් අර්හත්ඵල නමැති අමෘතජලයෙන් නො නා ක්ලේශයන් සහිත ව ම සිට ශාසනයෙන් වැළක ලාමක වූ ගෘහස්ථභාවයට පැමිණියේ වී නම්, මේ ලොකවාසි ජනතෙම 'අහෝ! මේ අඥනතෙම සර්වඥශාසනයෙහි පැවිදි ව එහි ප්‍රතිෂ්ඨාවක් නො ලැබ ගෘහස්ථභාවයට පැමිණියේ ය. කිමෙක්ද? කිසි සීලව්‍රතයක් නො පිළිපදනා වූ මූ සර්වඥ ශාසනයතෙමේ තෙමේ ම කෙසේ පිරිසිදු කරවා ලන්නේ ද? සර්වඥ ශාසනයාගේ කවර දෙෂයෙක් දැ?' යි කියා ඒ සීරළුහට ම ගර්හා කරන්-නේ ය'' යි වදළසේක.

''ස්වාමීනි, තවත් උපමාවක් වදළ මැනැවැ'' යි කීහ. ''මහරජා-නෙනි, යම් සේ පරමව්‍යාධියෙන් පීඩිත වූ පුරුෂයෙක්තෙම ත්‍රිවිධ වූ රොගුප්පත්ති දැනීමෙහි දක්ෂ වූ ස්ථිර සිද්ධකර්මාන්ත ඇති ශල්‍යකත්තෘ නම් වෛද්‍යාචාර්යයෙකු කරා ගොස් දක පිළියම් නො කරවා ගෙණ ව්‍යාධිසහිත ව ම පෙරළා ආයේ වී නම්, එහි මේ ලෝවැසි ජනතෙමේ රොගාතුරයාහට හෝ වෛද්‍යාචාර්යයාහට හෝ කවරක්හට ගර්හා කරන්නේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, මේ ලොකවාසී ජනතෙම 'අහෝ! මේ ජඩ මූඪතෙම රොගුප්පත්ති දැනීමෙහි දක්ෂ වූ ස්ථිර සිද්ධ කර්මාන්ත ඇති ශල්‍යකත්තෘ වෙද කරා ගොස් දක වෛද්‍යක්‍රියාවක් නො කරවා ගෙණ ව්‍යාධිසහිත ව ම පෙරළා ආයේ ය. කිමෙක් ද? පිළියම් නො කරවා ගන්නා කැමැත්තා වූ මොහුට වෛද්‍යාචාර්යතෙම තෙමේ ම කෙසේ පිළියම් කරන්නේ ද? වෛද්‍යාචාර්යයාගේ දෙෂය කවරේ දැ?' යි කියා රෝගාතුරයාහට ම ගර්හා කරන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අප තථාගතයන් වහන්සේ සර්වක්ලේශ ව්‍යාධියෙන් ප්‍රතිපීඩිත වූ සම්‍යක් සිතිවිලි ඇත්තා වූ යම්කිසි විබුධජන

Non-Commercial Distribution

කෙනෙක් ඇද්ද, ඒ සුධීජනයෝ 'මේ අමෘතෞෂධය පානය කොට සර්ව ක්ලේශව්‍යාධි ම ව්‍යුපශමන කෙරෙති' යි කියා සිතා වදරා තමන්වහන්සේගේ ශාසන නමැති කනකකරඬුයෙහි හාත්පසින් සියලු ම ක්ලේශ ව්‍යාධීන් ව්‍යුපශමනයෙහි සමර්ථ වූ ලොකොත්තර වූ අමෘතමහාඖෂධයන් ප්‍රක්ෂෙප කර වදළසේක. ඉදින් කිසිවෙක් ඒ අමෘතමහාඖෂධය පානය නො කොට සකිලෙස ව ම ශාසනයෙන් වැළක ගෘහස්ථභාවයට පැමිණියේ වී නම්, ලොකවාසි ජනතෙම 'අහෝ! මේ ජඩ මූඪතෙම සර්වඥ ශාසනයෙහි පැවිදි ව එහි ප්‍රතිෂ්ඨාවක් නො ලැබ ගෘහස්ථභාවයට පැමිණියේ ය. කිමෙක් ද? ශීලව්‍රතාදියක් නො පිළිපදනා වූ මේ පුරුෂයා සර්වඥශාසනය තෙමේ ම කෙසේ පිරිසිදු කරවා ලන්නේ ද? සර්වඥ ශාසනයාගේ කවර නම් දෙෂයෙක් ද? කියා ඒ සීරළුහට ම **(302)** ගර්හා කරන්නේ ය'' යි වදළසේක.

''ස්වාමීනි, නැවැතත් උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''එසේ වී නම්, තවද, මහරජානෙනි, යම් සේ ක්ෂුධාවෙන් පීඩිත වූ පුරුෂයෙක් තෙම මහාපුණ්‍යවතුන්ගේ මහාපුණ්‍යභක්තපරිවෙශනයකට ගොස් ඒ පුණ්‍යබත් අනුභව නො කොට ක්ෂුධාග්නියෙන් ම පලා ගියේ වී නම්, ලෝවැසි ජනතෙම එහි බත් නො කා ගිය ක්ෂුධායෙන් පීඩිතයාහට හෝ ඒ පුණ්‍යබතට හෝ කවරක්හට ගර්හා කරන්නේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ජනතෙම 'අහෝ! මේ ක්ෂුධාවෙන් පීඩිත වූ පුරුෂතෙම යහපත් වූ පුණ්‍යබතක් සැප සේ ලැබ ක්ෂුධාග්නිය මකා නො කා ක්ෂුධාවෙන් පලා ගියේ ය. කිමෙක් ද? බත් අනුභව නො කරන්නා වූ මෝහට භොජනය තෙමේ ම කෙසේ නම් මුඛයට ප්‍රවෙශ වේ ද? භොජනයාගේ කවර දෙෂයෙක් ද?' කියා බත් අනුභව නො කළා වූ ක්ෂුධායෙන් පීඩිතයාහට ම ගර්හා කරන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අප තථාගතයන් වහන්සේ 'ක්ලේශයන් විසින් ක්ලාන්ත කරණ ලද ආධ්‍යාත්මිකයන් ඇති ත්‍රිවිධතෘෂ්ණා වශයට ගිය සිත් ඇති යම්කිසි සචෙතනික විබුධජන කෙනෙක් ඇද්ද, ඒ සුධීජනයෝ මේ කායගතාසති නමැති අමෘතභොජනය අනුභව කොට කාමභව රූපභව අරූපභව සංඛ්‍යාත ත්‍රිවිධභවයෙහි සියලු ම තෘෂ්ණාව පහ කෙරෙති' යි කියා සිතා වදරා තමන් වහන්සේගේ ත්‍රිවිධශාසන නමැති ස්වර්ණපෙලාන්තරයෙහි පරම ප්‍රවර ශාන්ත ශිව ප්‍රණීතාමෘත පරම මධුර වූ කායගතාසති නමැති අමෘතභොජනය තබා වදළසේක. ඉදින් කිසිවෙක් ඒ අමෘතභොජනය නො වළඳා ත්‍රිවිධතෘෂ්ණාවශී ව ම ශාසනයෙන් වැළක හීන වූ ගෘහස්ථභාවයට පැමිණියේ වී නම්, මේ ලෝවැසිජනතෙම 'අහෝ! මොහු සර්වඥශාසන යෙහි පැවිදි ව අර්හත් ප්‍රතිෂ්ඨාවක් නො ලැබ සිවුරු හැර ගෘහස්ථ වූයේ ය. කිමෙක් ද? ශාසනප්‍රතිපත්තියක් නො පිළිපදින්නා වූ මොහු තෙමේ ම සර්වඥශාසනය කෙසේ නම් පිරිසිදු කරවා ලන්නේ ද? බුද්ධශාසනයෙහි කවර දෙෂයෙක් ද?'' යි කියා ඒ අශ්‍රද්ධික ජඩ මූඪ දුර්ජන මූර්ඛ ප්‍රඥ

Non-Commercial Distribution

හීන වූ සිරළුහට ම ගර්හා කරන්නේ යි. මහරජානෙනි, ඉදින් තථාගතයන් වහන්සේ ගෘහස්ථභූමියෙහි දී ම එක මාර්ගඵලයෙක්හි පැමිණීමෙන් විනීත වූ ගෘහස්ථයා පැවිදි කරවා වදරණසේක් වී නම්, මේ ප්‍රව්‍රජ්‍යාතොමෝ ක්ලේශප්‍රහාණය පිණිස නො වන්නේ ය. ක්ලේශශුද්ධිය පිණිස ද නො වන්නේ ය. ගිහිගෙය හැර පැවිදි වන ප්‍රව්‍රජ්‍යාවෙනුදු කට යුත්තෙක් නැත්තේ ය.

''මහරජානෙනි, යම් සේ පුරුෂයෙක් තෙම නොයෙක් සිය ගණන් කර්මාන්තජනයා ලවා පොකුණක් සාරවා ලවා පසු ව පිරිසට 'පින්වත්නි, මාගේ මේ විලට කර්දම රජසාදීන් සකිලිටු වූ කිසි කෙනෙක් නො බසිවු. පහ කරණ ලද රජස්දූලි ඇත්තා වූ නිර්මල වූ වෙර ඔප් නැඟීම් ඇත්තා වූ සුපරිසුඬ වූ ජනයෝ මෙ විලට බසිවු' කියා මෙසේ අනුශාසනා කරන්නේ වී නම් කිමෙක් ද? මහරජානෙනි, පහ කරණ ලද රජොජල්ලයන් ඇත්තා වූ පරිසුද්ධ වූ යහපත් වූ වෙර ඔප් නැඟීම් ඇත්තා වූ ඒ ජනයන්ට ඒ විලින් ප්‍රයොජන කටයුත්තෙක් වන්නේ ද'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, යම් උදකස්නානාර්ථය පිණිස ඒ පිරිසිදු වූ ජනයෝ ඒ විල කරා පැමිණෙද් ද, ඒ කටයුත්ත ඔවුන් විසින් අනික් තැනක දී ම කරණ **(303)** ලද්දේ ය. එහෙයින් ඔවුන්ට ඒ විලින් කම් කිම් ද?'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අප තථාගතයන් වහන්සේ ඉදින් ගෘහස්ථයා ගෘහස්ථභූමියෙහි දී ම එක් මාර්ගඵලයක්හි හික්මවා පසු ව පැවිදි කරවා වදරණසේක් වී නම්, ඒ ගෘහස්ථභූමියෙහි දී ම ඔවුන් විසින් කළමනා කෘත්‍යය කරණ ලද්දේ ය. ඔවුන්ගේ මහණ වීමෙන් කම් කිම් ද'' යි වදාළසේක.

''ස්වාමීනි, තවත් උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''තවද, මහරජානෙනි, යම් සේ ස්වභාවයෙන් ම සෘෂිභක්තික වූ ශ්‍රැතමන්ත්‍රධාරී වූ වෛද්‍යක්‍රියා නො දනීම් වශයෙන් විතර්කයක් නැත්තා වූ සර්වරොගොත්-පත්ති දැනීමෙහි දක්ෂ වූ අසිස් වූ ස්ථිර වූ සිද්ධකර්මාන්ත ඇත්තා වූ ශල්‍ය කත්තෘ වූ වෛද්‍යාචාර්යයෙක් තෙම සර්වරොගව්‍යාපශමනය වන භෛෂජ්‍යයක් රැස් කරවා තම පිරිසට 'පින්වත්නි, ව්‍යාධියක් ඇත්තා වූ කිසිකෙනෙක් මාගේ සමීපයට නො එළඹෙවු. කිසි ව්‍යාධියක් නැත්තා වූ අව්‍යාධිකයෝ මාගේ සමීපයට එළඹෙත්ව' යි කියා මෙසේ අනුශාසනා කරන්නේ වී නම්, කිමෙක් ද? මහරජානෙනි, අව්‍යාධිත වූ අරොගී වූ සම්පූර්ණ ව පවත්නා ඉරියවු ඇත්තා වූ ඉපිල පැන නැඟී පවත්නා සිත් ඇත්තා වූ ඔවුන්ට ඒ වෛද්‍යාචාර්යයාගෙන් කට යුත්තෙක් වන්නේ ද?'යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, යම් වෛද්‍යක්‍රියා ප්‍රයෝජන පිණිස ඒ නීරොගීජනයෝ ශල්‍යකත්තෘ වූ ඒ වෛද්‍යාචාර්යයා කරා එළඹෙද් ද, ඒ කට යුත්ත ඔවුන් විසින් අනික් තැනක දී ම කරණ ලද්දේ ය. එහෙයින් ඔවුන්ට ඒ වෙදහුගෙන් කම් කිම් ද?'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම ඉදින් තථාගතයන් වහන්සේ ගෘහස්ථයා ගෘහස්ථභූමියෙහි දී ම එක් මාර්ගඵලයෙක්හි විනීත කරවා පැවිදි කරවා වදරණසේක් වී නම්,

Non-Commercial Distribution

ඒ ගෘහස්ථභූමියෙහි දී ම ඔවුන්ගේ කට යුත්ත කරණ ලද වන්නේ ය. එහෙයින් ඔවුන්ගේ නැවත ප්‍රව්‍රජ්‍යාවෙන් කම් කිම ද?'' යි වදළසේක.

''ස්වාමීනි, තවත් උපමාවක් කර වදළ මැනැවැ'' යි කීහ. ''තවද, මහරජානෙනි, යම් සේ කිසියම් මහාධනවත් පුරුෂයෙක් තෙම මහා ශාලායෙක නොයෙක් සියගණන් සැළතාලියෙහි පිසූ භොජනය පිළියෙළ කරවා පිරිසට 'පින්වත්නි, මාගේ මේ බත් අනුභව කරණ තැනට ක්ෂුධාවෙන් පීඩිත වූ කිසිකෙනෙක් නො එළඹෙවු. මනා කොට අනුභව කළා වූ බත් අනුභව කිරීමෙන් තෘප්තියට පැමිණියා වූ සුහිත වූවා වූ සම්පූර්ණතාවෙන් ධාත වූ අනූනතාවෙන් පිණිත වූ කුක්ෂිය පිරීමෙන් පරිපූර්ණ වූ ජනයෝ මේ බත් අනුභව කරණ තැනට එළඹෙත්ව' යි කියා මෙසේ අනුශාසනා කරන්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, සිත් සේ බත් අනුභව කළා වූ තෘප්තියට පැමිණියා වූ ක්ෂුධාව සංහිඳි සුහිත වූ හැකිතාක් අනුභව කිරීමෙන් දැඩි වූ පිණිත ව පරිපූර්ණ වූ ඒ ජනයන්ට ඒ පිළියෙළ කළ භොජනයෙන් කට යුත්තෙක් වන්නේ ද?'' යි විචාළ සේක. ''නැත, ස්වාමීන් වහන්ස, යම් ආහාරාර්ථයක් පිණිස ඒ ජනයෝ ඒ බත් අනුභව කරණ තැනට එළඹෙද් ද, ඒ බත් අනුභව කරණ කටයුත්ත ඔවුන්ගේ අනික් තැනක දී ම කරණ ලද වන්නේ ය. එහෙයින් ඒ බත් අනුභව කරණ තැනට යාමෙන් ඔවුන්ට කවර ප්‍රයොජනයෙක් ද?'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අප තථාගතයන් වහන්සේ ඉදින් එක් මාර්ගඵලයක හික්මුනා වූ ගෘහස්ථයා ම පැවිදි කරවා වදරණසේක් වී නම්, ඒ ගෘහස්ථභූමියෙහි දී ම ඔවුන්ගේ ශ්‍රමණ කට යුත්ත කරණ ලද වන්නේ ම ය. නැවත ඔවුන්ගේ මහණ වීමෙන් කමෙක් නැත්තේ යි.

**(304)** ''මහරජානෙනි, එතෙකුදු වුවත් යම් අඥනකෙනෙක් සිවුරු හැර ගෘහස්ථභාවයට පැමිණෙද් ද, ඒ සිවුරුහළ ජනයෝ සර්වඥ ශාසනයාගේ අසදෘශ වූ පඤ්චවිධ වූ ගුණයක් දක්වති. ඒ පඤ්චවිධ වූ ගුණය කවරේ ද? යත්— ප්‍රව්‍රජ්‍යාභූමියෙහි මහත්බව දක්වති. ප්‍රව්‍රජ්‍යාවෙහි පරිසුද්ධවිමලභාවය දක්වති. පාපයන් හා අසංවාසිභාවය දක්වති. දුෂ්ප්‍රතිවෙධභාවය දක්වති. බොහෝ වූ සංවර රක්ෂා කරණබව දක්වති. එහි භූමි මහන්තභාවය කෙසේ දක්වද් ද? යත්— මහරජානෙනි, යම් සේ කිසි ධනයක් නැත්තා වූ හීනජාති ඇත්තා වූ විද්‍යාශාස්ත්‍රාදි කිසි විශෙෂයක් නැත්තා වූ ප්‍රඥ ප්‍රහීණ වූ පුරුෂයෙක්තෙම මහත් වූ මහාරාජ්‍යශ්‍රී සම්පත්තියක් ලැබ නොබෝ කාලයකින් ම ඒ යශශ්‍රීන් පිරිහෙන්නේ ය. වැටෙන්නේ ය, නැසෙන්නේ ය. ඒ රජ්ඉසුරු ධරන්නට නො හැකි වන්නේ ය. ඊට කාරණා කවරේ ද? යත්— රාජ්‍යශ්‍රීසම්පත්තියගේ ඉතා මහත් බැවින. මහරජානෙනි, එපරිද්දෙන් ම කිසි විශෙෂයක් නැත්තා වූ පෙර කළ පිණක් නැත්තා වූ ප්‍රඥ ප්‍රහීණ වූ යම්කිසි ජනකෙනෙක් සර්වඥ ශාසනයෙහි පැවිදි වෙද් ද, ඒ ජනයෝ ප්‍රවරොත්තම වූ ඒ ප්‍රව්‍රජ්‍යාව ධරන්නට නො හැකි වූවාහු නොබෝ කලකින් ම සර්වඥශාසනයෙන්

Non-Commercial Distribution

ඉපිල වැටී නැසී පිරිහී ගෘහස්ථභාවයට පැමිණෙති. ජිනශාසනයෙහි අර්හද්ධ්වජය ධරන්නට නො හැකි වෙති. ඊට කාරණ කවරේ ද? යත්— සර්වඥශාසනභූමියගේ ඉතා මහත් බැවින. මෙසෙයින් ශාසනභූමිමහද්-භාවය දක්වති. පරිශුද්ධ වූ නිර්මලභාවය කෙසේ දක්වද් ද? යත්— මහරජාණෙනි, යම් සේ පියුම්පත්‍රයෙහි ජලය නො රඳා විකිරෙන්නේ ය. විධමනය වන්නේ ය. විධ්වංසනය වන්නේ ය. යථාස්ථානයෙහි නො සිටින්නේ ය, නො ඇලෙන්නේ ය. ඊට කාරණ කවරේ ද? යත්— පියුම්පත්‍රයාගේ අත්‍යන්තපරිසුද්ධ වීම බැවින. මහරජාණෙනි, එපරිද්දෙන් ම නොයෙක් ශඨප්‍රයොග ඇත්තා වූ නොයෙක් වඤ්චනක්‍රියා ඇත්තා වූ නොයෙක් රැවටිලි ඇත්තා වූ නොයෙක් කුටිලප්‍රවෘත්ති ඇත්තා වූ විෂම වූ නොයෙක් සිතිවිලි ඇත්තා වූ යම්කිසි කෙනෙක් බුද්ධශාසනයෙහි පැවිදි වෙද් ද, ඒ ජනයෝ පරිසුද්ධ විමල කණ්ටක පණ්ඩර ප්‍රවර වූ ශාසනයෙන් චුත ව නොබෝ කාලයකින් ම විකිර ව විධමන ව විධ්වංසන ව නො සිට නො ඇලී ගිහිභාවයට පැමිණෙති. ඊට කාරණ කවරේ ද? යත්— සර්වඥශාසනයාගේ පරිසුද්ධ විමල බැවින. මෙසේ පරිසුද්ධ විමලභාවය දක්වති. පාපයන් හා අසංවාසිබව කෙසේ දක්වද් ද? යත්— මහරජාණෙනි, යම් සේ මහාසමුද්‍රයතෙම මළා වූ කුණපය හා සමග නො වසන්නේ ය. මහාසමුද්‍රයෙහි මළා වූ යම් කුණපයක් ඇති වී නම්, ඒ කුණපය වහා ම තෙරට පමුණුවන්නේ ය. ථලයට හෝ නභා ලන්නේ ය. ඊට කාරණ කවරේ ද? යත්— මහාසමුද්‍රය තිමිංගලාදි මහාභූතයන්ට වාසභවනය වූ බැවින. මහරජාණෙනි, එපරිද්දෙන් ම නොයෙක් පාපක්‍රියා ඇත්තා වූ කායසුචරිතාදියක් නො කිරීමෙන් අකිරිය වූ හරණ ලද සම්‍යක්වීර්ය ඇත්තා වූ කුජීත වූ ක්ලේශයන්ගෙන් කෙලෙසුනා වූ දූර්ජන වූ යම්කිසි මනුෂ්‍ය කෙනෙක් සර්වඥශාසනයෙහි පැවිදි වෙද් ද, ඒ අසත්පුරුෂයෝ නොබෝ කාලයකින් ම අර්හත් නිර්මලක්ෂීණාශ්‍රවමහාභූතයන් වහන්සේලාගේ **(305)** වාසභවනය වූ සර්වඥශාසනයෙන් නික්ම ශාසනයෙහි නො වැස හීන වූ ගෘහස්ථභාවයට පැමිණෙති. ඊට කාරණ කවරේ ද? යත්— පාපයන් හා සර්වඥ ශාසනයාගේ අසංවාසික බැවින. මෙසෙයින් පාපයන් හා අසංවාසිකභාවය දක්වති. දුෂ්ප්‍රතිවෙධබව කෙසේ දක්වද් ද? යත්— මහරජාණෙනි, යම් සේ ධනුශ්ශිල්පයෙහි දක්ෂබවක් නැත්තා වූ සික්ඛිතබවක් නැත්තා වූ ධනුශ්ශිල්පය නො දන්නා වූ නුවණ විප්‍රහීණ වූ යම්කිසි අල්පබුද්ධික ධනුර්ධර කෙනෙක් විදුලිය එළියෙන් දුන්න නභා ගෙණ බට්ට අනුසාරයෙන් ලක නො වරදවා අශ්වලොමාග්‍රය පළා විදින්නා වූ වාලාග්‍රවෙධිය විදින්නට නො හැක්කාහු පලායන්නාහ. පහ ව යන්නාහ. ඊට කාරණ කවරේ ද? යත්— අශ්වලොමාග්‍රයාගේ මෘදු සියුම් දුෂ්ප්‍රතිවෙධ වූ බැවින. මහරජාණෙනි, එපරිද්දෙන් ම දුෂ්ප්‍රාඥ වූ ජඩ වූ කෙළතොලු වූ මුළා වූ ප්‍රමාදගතික වූ යම්කිසි නපුරු ජනකෙනෙක් සර්වඥශාසනයෙහි පැවිදි වෙද් ද, ජනයෝ ඒ පරමසණ්හසුඛුම වූ චතුස්-සත්‍යප්‍රතිවෙධය කරන්නට නො හැකි වූවාහු සර්වඥශාසනයෙන් පහ ව

*Non-Commercial Distribution*

ඉවත් ව නොබෝකාලයකින් ම ගෘහස්ථභාවයට පැමිණෙන්නාහු ය. ඊට කාරණා කවරේ ද? යත්— චතුරාර්යසත්‍යධර්මයන්ගේ පරමසණ්හසුබුම දුෂ්ප්‍රතිවෙධ වූ බැවින. මෙසෙයින් දුෂ්ප්‍රතිවෙධභාවය දක්වන්නාහු ය. බොහෝ වූ සංවර රක්ෂා කට යුතුබව කෙසේ දක්වද් ද? යත්— මහරජාණෙනි, යම් සේ කිසියම් පුරුෂයෙක්තෙම මහත් වූ මහායුද්ධභූමියට පැමිණියේ සතුරුසේනාව විසින් දිසානුදිසාවෙන් හාත්පසින් පිරිවරණ ලදුයේ සමීපයට එන්නා වූ ශස්ත්‍ර ගත් අත් ඇති ජනයා දුක භය ගෙණ පසු බස්නේ ය. ඉදිරියට නො ගොස් වළකින්නේ ය. පැන දුවන්නේ ය. ඊට කාරණා කවරේ ද? යත්— බහුවිධ වූ යුද්ධමුණවල් රක්නා බැවින. මහරජාණෙනි, එපරිද්දෙන් ම නොයෙක් පව් කළා වූ කිසි ශීලයක් ව්‍රතයක් නැත්තා වූ පාප කරණයෙහි කිසි සැකයක් නැත්තා වූ කිසි සුචරිතක්‍රියාවක් නැත්තා වූ කිසි ශාන්තියක් නැත්තා වූ චපල වූ චලිත වූ ස්වල්ප වූ යම්කිසි ජනකෙනෙක් සර්වඥශාසනයෙහි පැවිදි වෙද් ද? ඒ ජනයෝ බොහෝ වූ ශික්ෂාපද රක්ෂා කරන්නට නො හැකි වූවාහු ශාසනයෙන් පහ ව වැළක ඉවත් ව නොබෝ කලකින් ම ගෘහස්ථභාවයට පැමිණෙන්නාහු ය. ඊට කාරණා කවරේ ද? යත්— සර්වඥශාසනයාගේ බොහෝ වූ සංවරශීලය රක්ෂා කටයුතු බැවින. මෙසෙයින් බොහෝ වූ සංවරශීල රක්ෂා කට යුතු බව දක්වන්නාහු යි.

"මහරජාණෙනි, ගොඩ උපන්නා වූ උතුම් වස්සිකා ලැහැබෙහි ද පණුවන් විදි පුෂ්පයෝ[1] ඇති වන්නාහ. පණුවන් විදීමෙන් හැකුළුනා වූ ඒ අංකුර නම් මල්පෙති අන්තරායෙන් ම ගිලිහී වැටෙන්නේ ය. ඒ මල් පෙති කැකුළු ගිලිහී වැටුනු කල්හි ඒ සමන්මල් අකුල ගර්හිත නම් නො වන්නේ ය. ඒ මල්වැල් ලැහැබෙහි නො වැටී සිටියා වූ යම් පිපුනු මල් රැසෙක් ඇද් ද, ඒ පුෂ්පයෝ මනා සුගන්ධයෙන් දිසානුදිසායෙහි පැතිරෙන්නාහ. මහරජාණෙනි, එපරිද්දෙන් ම, යම් ඒ සත්වකෙනෙක් සර්වඥශාසනයෙහි පැවිදි ව නැවැත සිවුරු හැර ගෘහස්ථභාවයට පැමිණෙද් ද, ඒ සත්වයෝ වර්ණ **(306)** ගන්ධරහිත වූ පණුවන් විදි සමන් මල් මෙන් සර්වඥශාසනයෙහි නිර්වාර්ණාකාරශීලි වූ විපුලභාවයකට අයොග්‍ය වූ ඒ අඥනයන්ගේ ගිහි වීමෙන් සර්වඥශාසනය ගර්හිත නම් නො වන්නේ ය. පණ්ඩරවරප්‍රවර වූ ශාසනයෙන් නොබෝ කලකින් ම එහි පිහිටියා වූ යම් ඒ නිර්මල වූ භික්ෂූන්වහන්සේලා කෙනෙක් ඇද් ද, ඒ භික්ෂූහු දෙවියන් සහිත වූ ලොකයෙහි ශීලසුගන්ධයෙන් පැතිරෙන්නාහු ය. තවද, මහරජාණෙනි, නීරොගී වූ සුගන්ධරත්හැල් අතුරෙහි ද කාරුම්භක නම් කාවලුපඳුරුජාතියෙක් ඉපිද හැල් පැසෙන අතුරෙහි ම නස්නේ ය. ඒ කාවලු හැල්ජාතිය විනාශ වූ බැවින් සුවඳරත්හැල් ගර්හිත නම් නො වන්නේ ය.[2] ඒ හැල්කෙතෙහි මනා කොට කලට පැසී සිටියා වූ යම් සුවඳ රත්හැල් ජාතියෙක් ඇද් ද, ඒ රත්හැල් රජදරුවන්ට

1. පුෂ්පයන් 2. නො වන්නාහ.

Non-Commercial Distribution

පරිභොගාර්හ වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යම් ඒ සත්ව කෙනෙක් සර්වඥශාසනයෙහි පැවිදි ව සිවුරු හැර යෙද් ද, ඒ සත්වයෝ සුවඳ රත්හැල් අතුරෙහි කාරුම්භක මෙන් බුද්ධශාසනයෙහි නො වැඩී විපුලත්වය කට නො පැමිණ අතරතුරෙහි ම ගිහි වන්නාහු ය. ඒ සිවුරු හළ ජනයන් ගේ ගෘහස්ථවීමෙන් සර්වඥශාසනය ගර්හිත නම් නො වන්නේ ය. ඒ විශුද්ධ බුද්ධශාසනයෙහි මනා කොට සුශීලාදිගුණයෙහි පිහිටියා වූ යම් ඒ භික්ෂූන් වහන්සේලා කෙනෙක් ඇද් ද, ඒ භික්ෂූන් වහන්සේලා අර්හත්ඵලයාගේ උපදවා ලීමට සුදුසු වනසේක්ලා ය. තවද, මහරජානෙනි, කැමැති කැමැති සම්පත් දෙන්නා වූ මාණික්‍යරත්නයාගේ පරිශුද්ධ වූ යම් ප්‍රදේශයෙක් ඇද්ද, ඒ මාණික්‍යප්‍රදේශය ජනයාහට සන්තොෂකර වන්නේ ය මහරජානෙනි, එපරිද්දෙන් ම යම් ඒ සත්වකෙනෙක් සර්වඥශාසනයෙහි පැවිදි ව සිවුරු හැර ගිහි වෙද්ද, ඒ අඥනයෝ සර්වඥශාසන නමැති චින්තාමාණික්‍ය රත්නයෙහි කර්කශ වූ නිෂ්ප්‍රයොජන ගල්පතුරු වැන්නෝ ය. ඔවුන්ගේ ගෘහස්ථවීමෙන් සර්වඥශාසනය ගර්හිත නම් නො වන්නේ ය. ඒ ශාසන යෙහි යහපත් සේ සිටියා වූ යම් භික්ෂූන් වහන්සේලා කෙනෙක් ඇද්ද, ඒ භික්ෂූන් වහන්සේලා දිව්‍ය බ්‍රහ්ම මානුසික ජනයන්ට ප්‍රමුදිතජනක වන්නාහු යි. තවද මහරජානෙනි, ජාතිසම්පන්න වූ ලොහිතචන්දන යාගේ ද එක් ප්‍රදෙශයක් කුණු ව දිරා සුගන්ධ නැති වන්නේ ය. එයින් ලොහිතචන්දනය ගර්හිත නම් නො වන්නේ ය. ඒ රත්හඳුන්ඛණ්ඩයෙහි කුණු නො වූ සුවඳ ඇත්තා වූ යම් ප්‍රදෙශයෙක් ඇද්ද, ඒ සුගන්ධවත් වූ ප්‍රදෙශයතෙම හාත්පසින් සුවඳ හමා ලන්නේ ය. පතුරුවා ලන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම අශ්‍රද්ධාවත් වූ යම් ඒ සත්වකෙනෙක් සර්වඥ ශාසනයෙහි පැවිදි ව ගෘහස්ථභාවයට පැමිණෙද්ද, ඒ අනුවණජනයෝ රක්තචන්දනසාරාන්තරයෙහි කුණු වූ ප්‍රදෙශය මෙන් සර්වඥශාසනයෙන් පහ කොට දමිය යුත්තාහු ය. ඒ අසජ්ජනයන්ගේ ගිහි වීමෙන් සර්වඥ ශාසනය ගර්හිත නම් නො වන්නේ ය. ඒ විශුද්ධතර ශාසනයෙහි විශුද්ධ වූ ශීලව්‍රතාදි ගුණයෙහි ඇලී සිටියා වූ යම් භික්ෂූන් වහන්සේලා කෙනෙක් ඇද්ද, ඒ සර්වඥපුත්‍ර වූ ආර්යයන් වහන්සේලා දෙවියන් සහිත වූ ලොකය ශීලවරචන්දනසුගන්ධයෙන් ලිම්පනය කර වදාරණසේක්ලා ය'' යි වදාළ සේක. සාධු, සාධු, ස්වාමීනි, නාගසෙන ස්ථවිරොත්තමයානෙනි, සර්වගණීන්ද්‍රභූත වූ නුඹ වහන්සේ විසින් ඒ ඒ සුදුසු (307) ආකාරයෙන් ඒ ඒ සදෘශ වූ කාරණයෙන් සර්වඥශාසනය නිරවද්‍යබවට පමුණුවන ලද්දේ ය. ශ්‍රෙෂ්ඨභාවයෙන් ම ප්‍රකාශ කරණ ලද්දේ ය. හීන වූවෝ ගෘහස්ථභාවයට පැමිණෙන්නාහු ද, ඒ සිවුරු හළ ජනයෝ සර්වඥශාසන යාගේ ශ්‍රෙෂ්ඨභාවය ම දක්වන්නාහු ය'' යි කියා ප්‍රශංසා කළහ.

**ඕරළු ප්‍රශ්නය යි.**

*Non-Commercial Distribution*

# එකවෙදනා ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'රහතන්වහන්සේ කායික වූ එක ම වෙදනාවක් විඳිනාසේක. චෙතසික වූ වෙදනාව නො විඳිනාසේකැ' යි කියා නුඹ වහන්සේ වදරණසේක. කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, රහතුන් වහන්සේගේ චිත්තය යම් ශරීරයක් නිසා පවත්නේ ද, ඒ ශරීරයෙහි රහතුන් වහන්සේ අනීශ්වරසේක් ද? අස්වාමිකසේක් ද? අවශවර්තිසේක් ද?'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජ ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ රහතුන් වහන්සේ ස්වකීය චිත්තය තමන් වසහයෙහි පවත්නා කල්හි ශරීරයෙහි අනීශ්වර වනසේක. අස්වාමික වනසේක. අවශවර්ති වනසේකැ යි කියන්නා වූ යම් යම් කාරණයෙක් ඇද්ද, ඒ මේ කාරණය යුක්තෙක් නො වන්නේ ම ය. ස්වාමීනි, පක්ෂිතෙම පවා යම් කැදැල්ලක වාසය කෙරේ ද, එහි ඒ පක්ෂි තෙම ඊශ්වර වන්නේ ය, ස්වාමි වන්නේ ය, වශවර්ති වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, ශරීරානුගත වූ මේ ධර්මයෝ දශදෙනෙක් ජාති ජාතියෙහි ශරීරය අනු ව දිවන්නාහු ය. අනු ව පවත්නාහු ය. ඒ දශධර්ම[1] කවරේ ද? යත්— සීත ය, උෂ්ණ ය, සාගිනි ය, පිපාසා ය, අසූචි ය, මූත්‍ර ය, කායඅකර්මණ්‍යා ලක්ෂණ වූ ථීන ය හා චිත්ත සංකොචනලක්ෂණ වූ මිද්ධ ය ද නොහොත් නිද්‍රාව ද, ජරාව ද, ව්‍යාධිය ද, මරණය ද යන මේ ශරීරානුගත වූ ධර්මයෝ දශදෙන, මහරජානෙනි, ජාති ජාතියෙහි නො හැර ශරීරය අනු ව ම දිවන්නාහු ය. අනු ව පවත්නාහු ය. ඒ දශධර්මයයෙහි රහතන් වහන්සේ අනීශ්වරසේක. අස්වාමිකසේක. අවශවර්තිසේක.'' ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කවර කාරණයකින් රහතුන් වහන්සේගේ ශරීරයෙහි ආඥාව නො පවත්නේ ද? ඉසුරු බව නො පවත්නේ ද? එහි මට කාරණා වදළමැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ පෘථිවිනිශ්‍රිත වූ යම්කිසි සත්වකෙනෙක් ඇද්ද, ඒ සියලු සත්වයෝ ම පෘථිවිය නිසා හැසිරෙන්නාහු ය. වාසය කරන්නාහු ය, ජීවිකා කරන්නාහු ය. කිමෙක් ද, මහරජානෙනි, පෘථිවියෙහි ඒ සත්වයන්ගේ ආඥාව පවත්නේ ද, ඉසුරු බව පවත්නේ දැ'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම රහතන් වහන්සේගේ චිත්තය ශරීරය නිසා පවත්නේ ය. රහතන් වහන්සේගේ ශරීරයෙහි ආඥාව නො ම පවත්නේ ය, ඉසුරුබව ද නො පවත්නේ ය.'' ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කවර කාරණයකින් පෘථග්ජනතෙම කායික වූ ද, චෛතසික වූ ද වෙදනාද්වය ම විඳිනේ දැ'' යි විචාළෝය. ''මහරජානෙනි, සමථ විදර්ශනාදි විසින් චිත්තයාගේ භාවිතාවක් නැති බැවින් පෘථග්ජනතෙම කායික වූ ද, චෛතසික වූ ද වෙදනාද්වය ම විඳින්නේ ය. මහරජානෙනි, යම් සේ කලකිරීමට පැමිණියා වූ ක්ෂුධායෙන් පීඩිත වූ වෘෂභයෙක් **(308)** තෙම අබල දුර්වල ස්වල්ප වූ කදලිතාල්පට්ටාදි තෘණයකින් හෝ කිසියම්

1. ධර්මයෝ

Non-Commercial Distribution

ලතායකින් හෝ දැඩි කොට බඳනා ලද්දේ වී ද, යම් දවසක වෘෂභතෙම කිපෙන ලද්දේ වේ ද, එකල ඒ බැම්ම හා සමග කඩා ගෙණ පැන යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම සමථවිදර්ශනාදි විසින් භාවිතාවක් නැති චිත්තයාගේ වෙදනාව ඉපද චිත්තය කිපෙන්නේ ය. කිපුනා වූ චිත්තය තෙම ශරීරය මර්දනය කරන්නේ ය. වැළඳ ගන්නේ ය. සම්පරිවර්තනය කරන්නේ ය. එකල්හි ඒ අභාවිත සිත් ඇත්තා වූ පුරුෂතෙම චකිත වන්නේ ය, භය වන්නේ ය, හඬන්නේ ය, භයානක වූ මහහඬින් හඬන්නේ ය. මහරජානෙනි, යම් කාරණයකින් පෘථග්ජනතෙම කායික වූ ද, චෛතසික වූ ද, වෙදනාද්වය ම විඳින්නේ වේ ද, මේ මෙහි කාරණ ය''යි වදළසේක.

''ස්වාමීනි යම් කාරණයකින් රහතන් වහන්සේ ඉදින් කායික වූ එක ම වෙදනාවක් විඳිනසේක් ද, චෛතසික වූ වෙදනාව නො විඳිනසේක් ද, ඒ කාරණය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, රහතන් වහන්සේගේ චිත්තය සමථවිදර්ශනාදි විසින් භාවිත වූයේ ය. සුභාවිත වූයේ ය. ප්‍රථමධ්‍යානාදියෙන් දමනය වූයේ ය. මනා ව දමනය වූයේ ය. කීකරු වූයේ ය. වචනකර වූයේ ය. එහෙයින් ඒ රහතන් වහන්සේ මරණ වූ දුක්ඛවෙදනාවකිනුදු ස්පර්ශවන ලද වූයේ 'අනිත්‍යභ' යි කියා සිත දැඩි කොට ගන්නා සේක. එකාග්‍ර වූ සමාධිස්තම්භයෙහි සිත බන්ධනය කරණසේක. එලසමාධිටැඹෙහි බඳන ලද්ද වූ ඒ රහතන් වහන්සේගේ ඒ නිර්වාණසැප ඇති චිත්තය කිසි දුකකින් කම්පා නො වන් නේ ය, නො සෙලවෙන්නේ ය, අවික්ෂිප්ත ව සිටින ලද්දේ වෙයි. ඒ රහතන් වහන්සේගේ ශරීරය වනාහි දුක්ඛවෙදනාවිකාර විස්ඵුරණයෙන් වැලඳ ගන්නේ ය, පහළ වන්නේ ය, නැවැත නැවැතත් වැළඳ ගන්නේ ය. මහරජානෙනි, යම් කාරණයකින් රහතන් වහන්සේ කායික වූ එක ම වෙදනාවක් විඳිනසේක් ද, චෛතසික වූ වෙදනාව නො විඳිනසේක් ද, මේ මෙහි කාරණය'' යි වදළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ශරීරය කම්පාවන කල්හි එහි ම පිහිටියා වූ චිත්තය කම්පා නො වන්නේ ය' යන යමක් ඇද්ද, ඒ කාරණය නම් ලොකයෙහි ඉතා ආශ්චර්ය වන්නේ ය. එහි මට වහා කාරණයක් දක්වා වදළ මැනවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ බන්ධශාඛා පලාස සම්පන්න වූ මහාවෘක්ෂයෙක්හි ප්‍රචණ්ඩ වූ වාතබලය පැමිණි කල ශාඛා සෙලවෙන්නේ ය. කිමෙක් ද, ඒ වෘක්ෂයාගේ මහකඳත් සෙලවේ දැ?''යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීය. 'මහරජානෙනි, එපරිද්දෙන් ම දුක්ඛවෙදනාවෙන් ස්පර්ශ වන ලද්ද ම වූ රහතන් වහන්සේ 'අනිත්‍යභ' යි කියා චිත්තය දෘඪ කොට ග්‍රහණය කරණසේක. සමාධි ස්තම්භයෙහි සිත බන්ධනය කරණසේක. සමාධි නමැති මහාස්ථම්භයෙහි මාර්ගඵල නමැති යොතින් බඳනා ලද්ද වූ උන්වහන්සේගේ ඒ චිත්තය කිසිවකින් කම්පා නො වන්නේ ය. නො සෙලවෙන්නේ ය.

Non-Commercial Distribution

අවික්ෂිප්ත ව සිටිනා ලද්දේ වේ. දුක්ඛවේදනා විකාර විස්ඵුරණයෙන් උන්වහන්සේ ශරීරය වැළඳ ගන්නේ ය, නිර්භුජනය[1] වන්නේ ය, සම්පරිවර්තනය වන්නේ ය ඒ රහතන් වහන්සේ (309) ගේ චිත්තය වනාහි මහාවාතයෙන් කම්පා නො වන මහාවෘක්ෂයාගේ මහකඳ මෙන් කිසිවකින් කම්පා නො වන්නේ ය, නො සෙලවෙන්නේ ය'' යි වදාළසේක.

එකල සකල පෘථිවීතලතිලක වූ මිලිඳු මහරජානෝ ප්‍රීතියෙන් ඉපිල පැන නැඟී ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙන ස්ථවිරොත්තමයානෙනි, මහාස්ඵටිකමාණික්‍යකදම්බයක් වැනි වූ තුංග වූ වට ඇති ආකාශගංගාව මාගේ හෘදය පැහැර ගිය කලක් මෙන් මේ ප්‍රශ්නව්‍යාඛ්‍යානයෙන් මාගේ හෘදය අතිසිහිල ව ගියේ ය. ස්වාමීනි, ඉතා ආශ්චර්ය වන්නේ ය, ඉතා අද්භූත වන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙබඳු වූ සර්ව කාලික වූ සද්ධර්මප්‍රදීපයෙක් මා විසින් පෙර නො දක්නා ලද්දේ ය'' යි කියා ස්තොත්‍ර කළහ.

**එකවෙදනා ප්‍රශ්නය නිමි.**

---

# ගෘහස්ථපාරාජික ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ලොකයෙහි යම්කිසි ගෘහස්ථයෙක්තෙම නො දූන මාතෘ මැරීමෙන් පිතෘ මැරීමෙන් බොධි කැපීමෙන් රහතුන් මැරීමෙන් බුදුන් ඇඟින් ලේ සෙලවීමෙන් භික්ෂුණී දූෂණය කිරීමෙන් පාරාජිකාවට පැමිණෙන ලද වන්නේ වී නම්, ඒ ගෘහස්ථ භූමියෙහි දී ම පාරාජිකාවට පැමිණි ඒ පුරුෂතෙම එයින් මත්තෙ කාලයෙක ශාසනයෙහි පැවිදි වන්නේ වී නම්, 'ගෘහස්ථභූමියෙහි දී ම පාරාජිකාවට පැමිණෙන ලද්දේ වීමි' යි කියා හේ[2] තෙමේ මත් නො දන්නේ වී නම් ඕහට, අනික් කිසිවෙක් එළඹ 'තෝ ගිහි කල පාරාජිකාවට පැමිණෙන ලද්දේ ය' යි කියා නො කීයේත් වී නම්, ඒ තෙම රහත්ඵලය පිණිස පිළිපදනේ වී නම්, කිමෙක් ද, ඕහට නිර්වාණාභිසමය වේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ඕහට ධර්මාභිසමය නො වන්නේ ය'' යි වදාළසේක. ''ස්වාමීනි, හේ කවර කාරණයකින් ද?'' යි විචාළෝ ය. ''සද්ධර්මාභිසමය පිණිස ඔහුගේ යම් හෙතුවෙක් ඇද් ද, ඒ හෙතුව ඔහුගේ මූලොච්ඡින්න වී ය. එහෙයින් නිර්වාණාභිසමය නො වන්නේ ය'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'කළ වරද දන්නාහුට කුකුස් වන්නේ ය. කුකුස් ඇති කල්හි චිත්තය ශීලගුණාදියෙහි ආවරණය වන්නේ ය. චිත්තය වැළකුනු කල්හි ධර්මාභිසමය නො වන්නේ ය' යි කියා තුඹ වහන්සේ වදාරණසේක. එකල වරදක් නො දන්නා වූ කිසි කුකුසක් නූපන්නා වූ ශාන්ත වූ සිතින් විහරණය කරන්නා වූ මෝහට

---

1. නිර්භුඤ්ජනය 2. ඔහු

Non-Commercial Distribution

වනාහි කවර කාරණයකින් ධර්මාභිසමය නො වන්නේ ද? ස්වාමීනි, මේ ප්‍රශ්නය සෙසු ප්‍රශ්නයන් මෙන් නො ව විස්මයයෙන් විස්මයට යන්නේ ය. ස්වකීය වූ ශ්‍රැතවත් වූ බුද්ධීන් සිතා පරීක්ෂා කර වදාරමින් විසඳා වදාළ මැනැවැ'යි 'කීහ.

''මහරජාණෙනි, මනා කොට ම දෙසීය සාහා ලද්ද වූ කලල් මඩ ඇත්තා වූ පැපත නහා වප් හෙළු කුඹුරෙහි ධාන්‍ය සාරය දෙන්නා වූ යහපත් කොට වාපනය කරණ ලද්ද වූ බීජසංඛ්‍යාත එලමූල් මනා ව ම හට ගණී ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, මනා කොට හට ගණී ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජාණෙනි, ඒ බීජ සංඛ්‍යාත වූ එලමූල් ම ඝනශෛලශිලාතලයෙහිත් මනා කොට හට ගණී දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජාණෙනි, **(310)** කුමක් පිණිස වනාහි ඒ බිජු ම කලල් මඩෙහි හට ගන්නේ ද? කුමක් පිණිස ඝන ශෛලයෙහි නො හට ගන්නේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, ඒ බීජයාගේ හට ගැණීම පිණිස ඒ ඝනශෛලයෙහි හෙතුවෙක් නැත්තේ ය. අහෙතුක බැවින් ගලෙහි බිජු නො හට ගන්නේ ය'' යි කීහ. ''මහරජාණෙනි, එපරිද්දෙන් ම යම් හෙතුවකින් ඕහට ධර්මාභිසමය වන්නේ වී නම්, ඔහුගේ ඒ හෙතුව සමුච්ඡින්න වූයේ ය. අහෙතුක බැවින් ධර්මාභිසමය නො වන්නේ ය'' යි කියා වදාළසේක. ''ස්වාමීනි, තවත් මධුරතර වූ උපමාවක් වදාළ මැනැවැ'' යි කීහ. ''තවද, මහරජාණෙනි, යම් සේ ලිඳඩු කැටගල් ලකුට මුගුරු පෘථිවියෙහි වැටී නවත්නා ස්ථානයට පැමිණෙන්නාහු ය. කිමෙක් ද, මහරජාණෙනි, එම දණ්ඩ ලෙඩ්ඩු ලකුට මුග්ගරයෝ ආකාශයෙහිත් නො වැටී සිටින ස්ථානයකට පැමිණ සිටින්නාහු දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජාණෙනි, මෙහි වනාහි යම් කාරණයකින් එම දණ්ඩ ලෙඩ්ඩු ලකුට මුගුරු පෘථිවියෙහි නවත්නා ස්ථානයට පැමිණෙන්නාහු ද, ඊට කාරණා කවරේ ද? කවර කාරණයකින් ආකාශයෙහි නො වැටී නො සිටින්නාහු දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, ඒ දණ්ඩ ලෙඩ්ඩු ලකුට මුග්ගරයන්ගේ පිහිටීම පිණිස ආකාශයෙහි හෙතුවෙක් නැත්තේ ය. අහෙතුක බැවින් නො සිටින්නාහු ය'' යි කීහ. ''මහරජාණෙනි, එපරිද්දෙන් ම ඔහුගේ ඒ දෙෂයෙන් ධර්මාභිසමය වන හෙතුව සිඳී ගියේ ය. හෙතුව නැසුනු කල්හි අහෙතුවෙන් නිර්වාණාභිසමය නො වන්නේ යි. තවද, මහරජාණෙනි, යම් සේ ගොඩ ගිනි ඇවිළෙන්නේ ය. කිමෙක් ද, මහරජාණෙනි, එ ම ගිනි ජලයෙහිත් ඇවිළේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. මහරජාණෙනි, යම් කාරණයකින් එම වහ්නිය ථලයෙහි ඇවිළෙන්නේ ද, කවර කාරණයකින් ජලයෙහි නො ඇවිළෙන්නේ ද? මෙහි වනාහි කාරණය කවරේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, වහ්නියගේ දීප්තිමත් වීම පිණිස ජලයෙහි හෙතුවෙක් නැත්තේ ය. අහෙතුක බැවින් දීප්තිමත් නො වන්නේ ය'' යි කීහ. ''මහරජාණෙනි, එපරිද්දෙන් ම

Non-Commercial Distribution

ඒ ගෘහස්ථපාරාජිකයාගේ ඒ කළ දෙෂයෙන් නිවණට හෙතු සිඳී ගියේ ය. හෙතු නැසී ගිය කල්හි අහෙතුවෙන් නිර්වාණාභිසමය නො වන්නේ ය'' යි වදාළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නැවතත් මෙම අර්ථය මෙනෙහි කර වදාළ මැනැව, 'කායව්‍යතික්‍රමණය වූ වරදක් නො දන්නාහට කුකුසකුදු නැති කල්හි ස්වර්ගමොක්ෂාවරණය වන්නේ ය' යි කියා ඒකාන්තයෙන් ම ඒ **විනයපිටකයෙහි** සිතට වරද පැණ වූ චිත්තප්‍රඥප්තියක් නො වන්නේ ය, කාරණයකින් ම මට අවබොධ කරවා වදාළ මැනැවැ'' යි කීහ. ''කිමෙක් ද මහරජානෙනි, ගුඪ වූ ශෘංගිවිෂය නො දන්නහු විසින් කන ලද්දේ ජීවිතය නසා ද? නො නසා දැ?''යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, ජීවිතය නසා ම ය''යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම නො දන්නහු විසින් කරණ ලද පාපය වුවත් අභිසමයන්තරාය කරවන්නේ යි. කිමෙක් ද, මහරජානෙනි, වහ්නිය නො දැන පයින් මඩින්නාහු දවා දැ?'' යි විචාළසේක. එසේ ය, වහන්ස, දවා ම ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම නො දන්නහු විසිනුදු කරණ ලද **(311)** පාපය වුවත් අභිසමයන්තරාය කරවන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, නිද්‍රාකරණාදි විසින් නො දන්නා වූ පුරුෂයකු නාගයෙක් දෂ්ට කොට ජීවිතය පහ කෙරේ දැ?'' යි විචාළසේක. ''එසේ ය වහන්ස, දිවි නසා ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම නො දන්නහු විසින් කරණ ලද පාපය ද අභිසමයන්තරාය කරවන්නේ යි. තවද මහරජානෙනි, **කාලිංගබොධිජාතකයෙහි** ආත්මලොභයෙන් රජ සැප හැර වනාන්තරයෙහි තාපසප්‍රව්‍රජ්‍යාවෙන් කල් යැවූ රාජතපස්වීන් නිසා උපන් **කාලිංගකුමාරයෝ** තමන්ගේ පුණ්‍යසෘද්ධියෙන් තමන් සතු වූ **කලිඟුරටට** අහසින් අවුත් රජ පැමිණ **කාලිංගභාරද්වාජගොත්‍ර** නම් පුරොහිතබ්‍රාහ්මණ පණ්ඩිතොත්තමයානන්ගේ සහායයෙන් දශවිධචක්‍රවර්තිවත් පුරා චක්‍රවර්තිරාජ්‍යය ලැබ සප්තවිධරත්නයන් පිරිවරා ගත්හ. ශ්‍රමණවෙශ ගත් රජුන්ට පුත්‍ර ව උපන් හෙයින් **ශ්‍රමණකොලඤ්ඤ** නම් වූ ඒ **කාලිංගචක්‍රවර්තිමහරජානෝ** සතිස්යොත්නෙක පැතිර සිටින මහ සෙනඟ පිරිවරා ගෙණ **පොෂථහස්තිරත්නය** පිටට පැන නැඟී දෙමවුපිය ඥාතිකුලයන් දක්නා පිණිස වනයට ආකාශයෙන් යනුවෝ[1] මහබෝමැඩට ලං ව 'මෙහි බුදුන් පහළ වන බෝමැඩක් ඇතැ' යි කියා නො දන්නෝ වූ නමුත්[2] මහබෝමැඩට මස්තකයෙන් යන්නට නො හැකි වූවෝ නො වෙද්ද? මහරජානෙනි, යම් කාරණයකින් 'නො දන්නහු විසිනුදු කරණ ලද පාපය නිර්වාණාන්තරාය කරවන්නේ ය' යි යන මේ කාරණය වදාළ සේක. ''ඉතිකින් එතෙක් ම ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස,

1. යනුයේ 2. නො දන්නේ වී නමුත්



Non-Commercial Distribution

මේ කාරණය සර්වඥභාෂිත වන ලද්දේ ය. පටික්කොසනය කරන්නට නො හැක්කේ ය. මේ ප්‍රශ්නයාගේ අර්ථය මෙම වදාළ ලෙස ම ය. ඒ කාරණය එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**ගෘහස්ථපාරාජිකප්‍රශ්නය යි.**

---

# ශ්‍රමණදුශ්ශීල ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ගිහිවිනය වරදවා පිළිපදින්නා වූ ගෘහස්ථදුශ්ශීලයාගේ ද ශ්‍රමණවිනය වරදවා පිළිපදින්නා වූ ශ්‍රමණදුශ්ශීලයාගේ ද විශෙෂය කවරේ ද? වෙනස් වූ කාරණය කිමෙක් ද? මොහු දෙදෙන ම මරණින් මත්තෙහි සම සම වූ දුර්ගතිගමන් ඇත්තා වූ ද දෙදෙනාහට ම සමසම වූ දුක්ඛවිපාකය වේ ද? නොහොත් මඳක් වත් වෙනස් කාරණයක් ඇද්ද'' යි විචාළහ. ''මහරජානෙනි, ශ්‍රමණදුශ්ශීලයාගේ ගෘහස්ථදුශ්ශීලයාට වඩා විශෙෂයෙන් ඉතිරි වූ මේ ගුණයෝ දශ දෙනෙක. ඉතිරි වූ කාරණා දශයකින් ද දක්ෂිණාව පිරිසිදු වන්නේ ය. ශ්‍රමණදුශ්ශීලයාගේ ගෘහස්ථදුශ්ශීලයාට වඩා විශෙෂයෙන් ම අතිරෙක වූ දශගුණය කවරේ ද? යත්— මහරජානෙනි, මේ ශාසනයෙහි ශ්‍රමණදුශ්ශීල තෙම බුදුන් කෙරෙහි ගෞරව ඇති වන්නේ ය. ධර්මයෙහි ගෞරව ඇති වන්නේ ය. සබ්‍රහ්මචාරීන් කෙරෙහි ගෞරව ඇති වන්නේ ය. උද්දෙස පරිපුච්ඡායෙහි වීර්ය කරන්නේ ය. බොහෝ වූ ඇසීම් ඇති වන්නේ ය. මහරජානෙනි, භින්නශීලී වූ දුශ්ශීලතෙම යම් පිරිසකට ගියේ ද, මනා වූ ස්මෘති උපදවන්නේ ය. ගර්හාභයින් කායිකය වාචසිකය රක්ෂා කරන්නේ ය. ඔහුගේ සිත භාවනාභිමුඛ **(312)** වන්නේ ය. භික්ෂූන්ගේ ශ්‍රාමණ්‍යයට එළඹෙන ලද වන්නේ ය. මහරජානෙනි, ශ්‍රමණදුශ්ශීල තෙම පව් කරන්නේ ද ප්‍රතිච්ඡන්න කොට හැසිරෙන්නේ යි. මහරජානෙනි, යම් සේ පුරුෂයා ඇති ස්ත්‍රීතොම සැඟ වී රහසින් ම පරපුරුෂ පාප ක්‍රියාවෙහි හැසිරෙන්නී ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ශ්‍රමණදුශ්ශීල තෙම පව් කරන්නේ ද, ප්‍රතිච්ඡන්න ව ම හැසිරෙන්නේ ය. මහරජානෙනි, මොහු වනාහි ශ්‍රමණදුශ්ශීලයාගේ ගෘහස්ථදුශ්ශීලයට වඩා විශෙෂයෙන් ම අතිරෙක වූ දශගුණයෝ යි.

**'කතමෙහි දසහි කාරණෙහි උත්තරිං දක්ඛිණං විසොධෙති. අවජ්ජකවචධාරණතායපි දක්ඛිණං විසොධෙති. ඉසිසාමඤ්ඤභණ්ඩුලිඞ්ගධාරණතොපි දක්ඛිණං විසොධෙති. සංඝසමය මනුපවිට්ඨතායපි දක්ඛිණං විසොධෙති. බුද්ධ ධම්ම සඞ්ඝ සරණගතතායපි දක්ඛිණං විසොධෙති. පධානාසයනිකෙත වාසිතායපි දක්ඛිණං විසොධෙති. ජිනසාසනධනපරියෙසනතොපි දක්ඛිණං විසොධෙති. පවරධම්මදෙසනතොපි දක්ඛිණං විසොධෙති. ධම්මදීපගති**

Non-Commercial Distribution

**පරායණතායපි දක්ඛිණං විසොධෙති, අග්ගො බුද්ධොති එකන්ත උජුදිට්ඨිතායපි දක්ඛිණං විසොධෙති, උපොසථසමාදානතොපි දක්ඛිණං විසොධෙති. ඉමෙහි ඛො මහාරාජ දසහි කාරණෙහි උත්තරිං දක්ඛිණං විසොධෙති'.**

''කවර නම් දශවිධ වූ කාරණයකින් මත්තෙහි දක්ෂිණාව පිරිසිදු කෙරේ ද? යත්— ඒ ශ්‍රමණදුශ්ශීලතෙම සර්වක්ලේශශත්‍රුමර්ථනයට ත්‍රිවිධ බුදුවරයන් වහන්සේලා විසින් පැලඳ වදරණ ලද්ද වූ අර්හද්ධවජ නමැති අවධ්‍යස්වරූප වූ උරච්ඡදනධාරණතායෙනුදු දක්ෂිණාව පිරිසිදු කරන්නේ ය. ඍෂිශ්‍රාමණ්‍යභාවොපගත වූ මුඩුවෙස ධාරණයෙන් ද දක්ෂිණාව ස්වර්ගමොක්ෂ සම්පත් සාධා ලීම් වශයෙන් පිරිසිදු කරන්නේ ය. සංඝසමූහයාට ඇතුළත් ව ප්‍රවිෂ්ට වූ බැවින් ද පරලෝ අදහා දෙන්නා වූ දක්ෂිණාව පිරිසිදු කරන්නේ ය. බුද්ධ ධර්ම සංඝ සරණගත බැවින් ද දක්ෂිණාව පිරිසිදු වන්නේ ය. වීර්යකරණයට ආධාර වූ ජනශූන්‍ය ගෘහයෙහි වාසය කරණ බැවින් ද දක්ෂිණාව පිරිසිදු කරන්නේ ය. සර්වඥශාසන නමැති ශ්‍රෙෂ්ඨ වූ ධනය සොයන බැවිනුත් දක්ෂිණාව පිරිසිදු කරන්නේ ය. ප්‍රවරසද්ධර්මය දෙශනා කරණ බැවින් ද දක්ෂිණාව පිරිසිදු කරන්නේ ය. ධර්මද්වීපගති පරායණ බැවින් ද දක්ෂිණාව පිරිසිදු කරන්නේ ය. බුදුරජානන් වහන්සේ තුන් ලොවට අග්‍ර ය, යි කියා එකාන්තයෙන් ම ඍජු වූ දෘෂ්ටි ඇති බැවින් ද දක්ෂිණාව පිරිසිදු කරන් නේ ය. නවළපොසථය නො වරදවා සමාදන් ව පාමොක් ඇසීමෙන් ද දක්ෂිණා පිරිසිදු කරන්නේ ය. මහරජානෙනි, මේ දශවිධ වූ කාරණයෙන් මත්තෙහි කුශලාර්ථීන් විසින් දෙන ලද්ද වූ දක්ෂිණාදනය පිරිසිදු කරන්-නේ යි. මහරජානෙනි, ඉතා විපරීත ව පිළිපදින්නේ ද ශ්‍රමණදුශ්ශීල තෙම දායකයන්ගේ දක්ෂිණාව පිරිසිදු කරන්නේ ය. මහරජානෙනි, යම් සේ ජලයතෙම ඉතා බොහෝ වූ ද කලල කර්දම රජොජල්ලිකා කසළ සෝද පහ කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ඉතා විපරීත ව පිළිපන්නේ ද ශ්‍රමණදුශ්ශීලතෙම දායකයන්ගේ දක්ෂිණාව පිරිසිදු කරන්නේ යි. තවද මහරජානෙනි, යම් සේ ඉතා දැඩි ව හුණු වූ උෂ්ණොදකයතෙමේ ගිනි ගෙණ දිලියෙන්නා වූ මහත් වූ ගිනිකඳ වුවත් නිවා ලන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ඉතා විපරි **(313)** තව පිළි පන්නා වූ ශ්‍රමණදුශ්ශීලතෙම ද දායකයන්ගේ දක්ෂිණාව පිරිසිදු කරන්නේ යි. තවද මහරජානෙනි, යම් සේ පහ වූ රස ඇත්තා වූ ද භොජනයතෙම ක්ෂුධාග්නි හා ශරීර දුර්වලබව පහ කරන්නේ ය. මහරජානෙනි, එපරිද්-දෙන් ම ඉතා වරදවා පිළිපන්නා වූ ද ශ්‍රමණදුශ්ශීලතෙම දායකයන්ගේ දක්ෂිණාව විශොධනය කරන්නේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ සනරාමරලොකස්වාමී වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් මධ්‍යමනිකායවරලාඤ්ජනයෙහි වූ වෙය්‍යාකරණ සංඛ්‍යාත **දක්ඛිණාවිභංග සූත්‍රාන්තයෙහි** ද වදරණ ලද්දේ ය:—

**'යො සීලවා දුස්සීලෙසු දදාති දානං**
**ධම්මෙන ලද්ධං සුපසන්නචිත්තො,**
**අභිසද්දහං කම්මඵලං උළාරං**
**සා දක්ඛිණා දායකතො විසුජ්ඣති'යි.'**

'පූර්වාපරමධ්‍යමචෙතනා සුද්ධ කරණ විසින් සුප්‍රසන්න සිත් ඇත්තා වූ යම් සිල්වත් පුද්ගලයෙක්තෙම නිරාශායෙන් කොට සකල සම්පත්ති ප්‍රදනය කිරීමෙන් මහත් වූ කුශලකර්මඵලය විශෙෂයෙන් අදහමින් දැහැමින් ලබන ලද්ද වූ ධනයකින් කිසි දනයක් දුශ්ශීලයන් කෙරෙහි දෙන්නේ වී නම්, ඒ දක්ෂිණාතොමෝ දයකයා කෙරෙන් පිරිසිදු වන්නේ ය. මහත්ඵල වන්නේ යි.'

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්නය විසඳා වදළ පරිදි ඉතා ආශ්චර්ය වන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්නය විසඳූ නියාව ඉතා අද්භුත වන්නේ ය. අපි එපමණකට ප්‍රශ්නය විචාළිම්හ. ඒ ප්‍රශ්නය නුඹ වහන්සේ නොයෙක් උපමා විසින් කාරණා විසින් විභාග කෙරෙමින් ශ්‍රොත්‍රයට අමෘතමධුර රස කොට පශ්චිමජනයාහට කර්ණාභරණ කොට තබා වදළසේක. ස්වාමීනි, යම් සේ රජ්ජුරුවන්ගේ සූදයෙක් හෝ සූදයාගේ අතවැසියෙක් හෝ එපමණකට මාංසයක් ලැබ නානාප්‍රකාර වූ දුරුමිරිස්ලාවණාදියෙන් සම්පාදනය කොට රාජුපභොගය කෙරේ ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, එපරිද්දෙන් ම එපමණකින් අපි ප්‍රශ්නය විචාළම්හ. ඒ ප්‍රශ්නය නුඹවහන්සේ නොයෙක් උපමා විසින් කාරණා විසින් විභාග කොට අමෘතමධුර වූ ශ්‍රවණොපගය කර වදළ සේකැ'' යි කීහ.

ශ්‍රමණදුශ්ශීලප්‍රශ්නය යි.

---

# උදකප්‍රාණිප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් සීතොදකය ගින්නෙන් තවන කල්හි බොහෝ කොට චිටිචිටායන ශබ්ද වන්නේ ය. චිටිචිටායන ශබ්ද වන්නේ ය. තව තවත් කුදුමහත් ශබ්ද වන්නේ ය. කිමෙක් ද, ස්වාමීනි, නාග(314) සෙනයන් වහන්ස, උදකය ප්‍රාණය සහිත ව ජීවත් වන්නේ ද? කිමෙක් ද? කෙළිමින් ශබ්ද වන නියා ද? නොහොත් අනික් කෙනෙකුන් විසින් පීඩිත කරණ ලද්දේ ශබ්ද කෙරේ දැ?'' යි විචාළහ. ''මහරජානෙනි, උදකය ජීවත් නො වන්නේ ය. උදකයෙහි ජීවිතයෙක් හෝ ප්‍රාණයෙක් හෝ නැත්තේ ය. මහරජානෙනි, එතෙකුදු වුවත් අග්නිසන්තාපවෙගයාගේ මහත් බැවින් උදකය චිටිචිටායන ශබ්ද වන්නේ ය. චිටිචිටායන ශබ්ද වන්නේ ය. වෙනත් බොහෝ ශබ්ද වන්නේ ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ලොකයෙහි සමහර මිථ්‍යාදෘෂ්ටික කෙනෙක් 'උදකය ජීවත් වන්නේ ය' යි

කියා ප්‍රාණඝාත භයින් සිහිල්පැන් ප්‍රතික්ෂෙප කොට පැන් හුණු කරවා ගෙණ හුණුහුණුයෙන් අනුභව කරන්නාහු ය. ඒ මිථ්‍යාදෘෂ්ටිහු නුඹ වහන්සේලාට 'අහෝ! **ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ** ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ ප්‍රාණජීවය පමණින් එකින්ද්‍රිය වූ ජීවය නසන්නාහු ය' යි කියා ගර්හා කරන්නාහු ය. නින්ද කරන්නාහු ය. ඒ මිථ්‍යාදෘෂ්ටීන්ගේ ගර්හාව, නින්ද කිරීම දුරු කර වදළ මැනව. පහ කර වදළ මැනැව. හරවා වදළ මැනැවැ'' යි කීහ. ''මහරජාණෙනි, උදකය ජීවත් නො වන්නේ ය. මහරජාණෙනි, උදකයෙහි ප්‍රාණජීවයෙක් හෝ සත්වයෙක් හෝ නැත්තේ ය. එතෙකුදු වුවත් වහ්නිසන්තාපවෙගයාගේ ඉතා මහත් බැවින් උදකය චිටචිටායන ශබ්ද වන්නේ ය. චිටිචිටායන ශබ්ද වන්නේ ය. නවත් බොහෝ ශබ්ද වන්නේ ය'' යි වදළසේක.

''නවද, මහරජාණෙනි, යම් සේ හෙප් විල් නදී දහ තළාක කන්දර පැළි[1] විවර වූ පදර හා ලිං හෝ පොකුණු ගත වූ උදකය වාතාතපවෙගයාගේ මහත් බැවින් පෘථිවියෙහි ව්‍යාප්ත වන්නේ ය. සිඳී යන්නේ ය, ක්ෂය වන්නේ ය. කිමෙක් ද? හෙප් සර සරිතාදියෙහිත් උදකය චිටචිටායන ශබ්ද වේ ද? චිටිචිටායන ශබ්ද වේ ද? වෙනත් බොහෝ ශබ්ද වේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''ඉදින් මහරජාණෙනි, උදකය ජීවත් ව ප්‍රාණය ඇති කෙනෙක් වී නම්, ඒ හෙප් සර නදී ආදියෙහිත් උදකය ශබ්ද වන්නේ ය. මහරජාණෙනි, මේ කාරණයෙනුත් තෙපි දත ගණුව. උදකයෙහි ජීවයෙක් හෝ සත්වයෙක් හෝ නැත්තේ ය. අග්නිසන්තාපවෙගයාගේ මහත් බැවින් උදකය චිටචිටායන ශබ්ද වන්නේ ය. චිටිචිටායන ශබ්ද වන්නේ ය. වෙනත් බොහෝ වූ ශබ්ද වන්නේ යි. නවද, මහරජාණෙනි, අනිකුදු ඉතිරි කාරණයක් ඇසුව මැනව. උදකයෙහි ජීවයෙක් හෝ සත්වයෙක් හෝ නැත්තේ ය. අග්නිසන්තාපවෙගයාගේ ඉතා මහත් බැවින් උදකය ශබ්ද වන්නේ ය. මහරජාණෙනි, යම් සේ උදකය යම් කලෙක සහල් හා මිශ්‍ර ව භාජනගත වූයේ වේ ද, වසන ලද්දේ උදුනෙහි නො තබන ලද්දේ වේ ද, එකල්හි කිමෙක් ද, ඒ භාජනගත වූ උදකය ශබ්ද කෙරේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, ශාන්ත ශාන්ත ව අචල වන්නේ ය'' යි කීහ. ''මහරජාණෙනි, ඒ සිහිල් උදකය ම භාජනගත කොට ගිනි දල්වා උදුනෙහි තබන ලද්දේ වේ ද, කිමෙක් ද, එහි උදකය ශාන්ත ශාන්ත ව අචල ව ම පවත්නේ දැ'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, කම්පා වන්නේ ය, **(315)** චලිත වන්නේ ය, ලෙල දෙන්නේ ය, කැළඹෙන්නේ ය, රළ ඉපදීම වන්නේ ය, ඌර්ධ්වාධොදිශානුදිශාවට යන්නේ ය, ඉතිරෙන්නේ ය, පැතිරෙන්නේ ය, ඵෙණමාලාකුල වන්නේ ය'' යි කීහ. ''මහරජාණෙනි, කුමක් පිණිස ඒ ප්‍රකෘති වූ උදකය නිශ්චල වේ ද? ශාන්ත ශාන්ත වේ ද? කුමක් පිණිස වනාහි වහ්නිගත කල්හි කම්පා වන්නේ ද? චලිත වන්නේ ද? ලෙල දෙන්නේ ද? කැළඹෙන්නේ ද? රළ පතර ඉපදීම වන්නේ ද? ඌර්ධ්වාධොදිශානුදිශාවට

1. පාළි

Non-Commercial Distribution

යන්නේ ද? ඵෙණමාලාකුල වන්නේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීන් වහන්ස, ප්‍රකෘති වූ උදකය නො සෙලවෙන්නේ ය. අග්නිගත වූ උදකය වනාහි අග්නිසන්තාපවෙගයාගේ ඉතා මහත් බැවින් 'චිටිචිටායන' ශබ්ද වන්නේ ය. 'චිටිචිටායන' ශබ්ද වන්නේ ය. බොහෝ වූ වෙනත් ශබ්ද වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ කාරණයෙනුදු ඒ සීතොදකයෙහි ජීවයෙක් හෝ ප්‍රාණයෙක් හෝ නැත්තේ ය. අග්නිසන්තාපවෙගයාගේ ඉතා මහත් බැවින් උදකය ශබ්ද වන්නේ ය යි කියා දැන ගණුව''යි වදාළසේක.

තවද, මහරජානෙනි, ඉතිරි කාරණයක් ඇසුව මැනව. උදකයෙහි ජීවයෙක් හෝ ප්‍රාණයෙක් හෝ නැත්තේ ය. අග්නිසන්තාපවෙගයාගේ මහත් බැවින් උදකය ශබ්ද වන්නේ ය. මහරජානෙනි, ඒ සීතොදකය ගෙයක් ගෙයක් පාසා ම පැන්කළගත ව තබන ලද වේ දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, මනුෂ්‍යයෝ එසේ උදකඝට තබති'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, ඒ ඒ භාජනගත වූ උදකය කම්පා වේ ද? චලිත වේ ද? ලුලිත වේ ද? කැලඹේ ද? රැළ උපදනා ලද වේ ද? ඌර්ධවාධොදිශානුදිශාවට යේ ද? ඉතිරේ ද? ඵෙණමාලාකුල වේ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, ප්‍රකෘති වූ ජලය ඒ පැන්කළගත කල දු අචල වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, තොප විසින් වනාහි මහාසමුද්‍රයෙහි උදකය කම්පා වන්නේ ය, චලිත වන්නේ ය, ලුලිත වන්නේ ය, ආවිල වන්නේ ය, රැළ උපදනා ලද වන්නේ ය, ඌර්ධවාධොදිශාවට යන්නේ ය, ඉතිරෙන්නේ ය, පැතිරෙන්නේ ය, පෙණමාලාකුල වන්නේ ය, උස් ව පැන පැන මුහුදුවෙරලෙහි වැද යන්නේ ය, බොහෝ ශබ්ද පවත්වන්නේ ය යි කියා අසන ලද්දේ ඇද්දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, මේ වදාළ කාරණය මා විසින් අසන ලද්දේ වී ය. දක්නා ලද්දේ වී ය. මහාසමුද්‍රයෙහි උදකය සියක් රියන් තැන්හි ද දෙසියක් රියන් තැන්හි ද ආකාශයෙහි පනින්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, කුමක් පිණිස පැන් කළයට පැමිණියා වූ උදකය කම්පා නො වේ ද? ශබ්ද නො පවතී ද? කුමක් පිණිස වනාහි මහාසමුද්‍රයෙහි උදකය කම්පා වෙ ද? ශබ්ද පවතී දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, වාතවෙගයාගේ මහත් බැවින් මහාසමුද්‍රයෙහි උදකය කම්පා වන්නේ ය. පැන්කළය ගත වූ කල්හි උදකය කිසිවකින් සට්ටනය නො කළ කල්හි කම්පා නො වන්නේ ය, ශබ්ද නො පවත්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, යම සේ වාතවෙගයාගේ මහත් බැවින් මහාසමුද්‍රයෙහි උදකය කම්පා වේ ද, ශබ්ද පවතී ද, එපරිද්දෙන් ම අග්නිසන්තාපවෙගයාගේ මහත් බැවින් උදකය ශබ්ද පවත්නේ ය'' යි වදාළසේක.

''මහරජානෙනි, වියලූනා වූ හෙරිමුඛය වියලූනා වූ ගෙරිසමින් වලඳවා ලන්නේ ද? සද ලන්නේ දැ? යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, ඒ හෙරියාගේ ප්‍රාණජීවයෙක් හෝ සත්වයෙක් හෝ ඇද් දැ?''යි විචාළසේක. ''නැත. ස්වාමීන්

Non-Commercial Distribution

වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, කුමක් පිණිස කෙසේ ඒ භෙරිය ශබ්ද කරා ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ස්ත්‍රියකගේ හෝ පුරුෂයකුගේ හෝ තත්කෘත්‍යසාධක වූ වීර්‍ය්‍යයෙන් හෝ උත්සාහයෙන් හෝ භෙරි ශබ්ද පවත්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ ස්ත්‍රියකගේ හෝ පුරුෂයාගේ හෝ තර්ජනයෙන් හෝ ව්‍යායාමයෙන් හෝ[1] භෙරි ශබ්ද පවතී ද? එපරිද්දෙන් ම අග්නිසන්තාපවෙගයාගේ මහත් බැවින් උදකය ශබ්ද පවත්නේ ය. මහරජානෙනි, මේ කාරණයෙනුදු උදකයෙහි ජීවකයෙක් හෝ සත්වයෙක් හෝ නැත්තේ ය. 'අග්නිසන්තාපවෙගයාගේ මහත් බැවින් උදකය ශබ්ද පවත්නේ ය.' යි කියා දැන ගණුව''යි වදාළසේක.

''මහරජානෙනි, මෙසේ මේ ප්‍රශ්නය යම් තාක් මනා වූ විනිශ්වය වේ ද? ඒ තාක් දක්වා මා විසිනුත් තොපගෙන් විචාළ ම යුත්තෙක් ඇත්තේ ය. කිමෙක් ද මහරජානෙනි, තවනු ලබන්නා වූ උදකය සියලු භාජනයෙහි ම ශබ්ද පවත්වා[2] ද? නොහොත් තවනු ලබන්නා වූ උදකය සමහර භාජනයෙක්හි ශබ්ද පවත්වා[2] ද?'' යි විචාළසේක. ''ස්වාමීන් වහන්ස, තවනු ලබන්නා වූ උදකය සියලු භාජනයෙහි ම නො ම ශබ්ද පවත් වන්නේ ය. තවනු ලබන්නා වූ උදකය ඇතැම් භාජනයෙක්හි ශබ්ද පවත් වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ කාරණයෙන් තොපගේ ස්වකීය දෘෂ්ටිය තොප ම හරණ ලද්දේ ය. මාගේ විෂයට ම තෙපිත් පැමිණියාහු ය. උදකයෙහි ජීවයෙක් හෝ සත්වයෙක් හෝ නැත්තේ ම ය. ඉදින් මහරජානෙනි, තවනු ලබන්නා වූ උදකයෙහි සියලු ම භාජනවල ශබ්ද පවත්නේ වී නම් මේ 'සීතොදකය ජීවත්වන ප්‍රාණයෙකැ' යි කියන්නට යුතු වන්නේ ය. මහරජානෙනි, යම් 'සීතොදකයක් ශබ්ද පවත්වා ද, ඒ සීතොදකය ජීවත් වන්නේ ය. යම් සීතොදකයක් ශබ්ද නො පවත්වා ද, ඒ සීතොදකය ජීවත් නො වන්නේ ය' යි කියා එක ම සීතොදකය දෙකක් නො වන්නේ ය'' යි වදාළසේක. ඉදින්, මහරජානෙනි, උදකය ජීවත් වන්නේ වී නම් සොඬින් උරවා නහා ගෙණ මුඛයෙහි ප්‍රක්ෂෙප කොට කුක්ෂියට ප්‍රවෙශ කරන්නා වූ ත්‍රිමදගලිත වූ උත්සන්න වූ මදමණ්ඩල ඇති සහෙදන වූ මත්තහස්තිරාජයන්ගේ ඒ සොඬින් ගත් උදකය ද ඔවුන්ගේ දත් අතුරෙහි තැර දෙන ලද්දේ ශබ්ද පවත්වන්නේ ය. මහත් වූ අතිභාර වූ නොයෙක් සියදහස්ගණන් භාණ්ඩයෙන් හා බොහෝ මනුෂ්‍ය යන්ගෙන් පිරුණා වූ සියක් රියන් දිග ඇත්තා වූ මහානෞකාවෝ මහාසමුද්‍රයෙහි වාතවෙගයෙන් ඔබිනොබ හැසිරෙන්නාහ. ඒ නෞකා වලින් තැර දෙන ලද්ද වූ උදකය ශබ්ද පවත්වන්නේ ය. තව ද, මහරජා නෙනි, නොයෙක් සියගණන් යොදුන් දිග ශරීර ඇත්තා වූ තිමි ය, තිමිංගල ය, තිමිරපිංගල ය යනාදි මහත් වූ මත්ස්‍යයෝ මහාසමුද්‍රය ඇතු-

1. 'තර්ජනයෙන්' යනාදි පරිවර්තනය වැරදී යි 'තජ්ජෙන වායාමෙන' යනු පාළි යි. 'ඒ සඳහා වූ උපන් වෑයමින්' යනු එහි අර්ථ යි.

2. පවතී.

ලෙහි ගැලී මහාසමුද්‍රයෙහි වාසස්ථාන බැවින් වාසය කරන්නාහු මහා උදකධාරාවන් ආචමනය කරන්නාහ. ගිලින්නාහ. ශබ්ද කරන්නාහ. පිඹින්නාහ. ඒ මහාමත්ස්‍යයන්ගේ ද දත් අතුරෙහිත් උදරාන්තර යෙහිත් මිරිකෙන ලද්ද වූ උදකය ශබ්ද පවත්වන්නේ ය. මහරජානෙනි, යම් හෙයකින් මෙබඳු වූ මෙබඳු වූ මහත් වූ මහත් වූ පීඩනයෙන් පීඩිත වූ උදකය ශබ්ද නො කරන් **(317)** නේ ය. එහෙයින් උදකයෙහි ජීවයෙක් හෝ සත්වයෙක් හෝ නැත්තේ ය. මහරජානෙනි, මා කී මෙපරිද්දෙන් ම උදකයෙහි ප්‍රාණියෙකු නැතිබව දරා ගණුව, අදහා ගණුව'' යි වදාළසේක.

''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සර්වඥදෙශනාගත වූ ප්‍රශ්නයතෙම සුදුසු වූ බෙදීමෙන් ම බෙදන ලද්දේ ය. ස්වාමීනි, නාග-සෙනයන් වහන්ස, යම් සේ මාහැඟි වූ මහත් වූ මාණික්‍යරත්නයක් සුශික්ෂිත වූ අතිදක්ෂ වූ සමර්ථ වූ ගුරුගොත්‍ර ඇති මණිකාරයකු කරා පැමිණ කීර්තියක් ම ලබන්නේ ය. ස්තුතියක් ම ලබන්නේ ය. ප්‍රශංසා වක් ම ලබන්නේ ය. මාහැඟි වූ මුතුරත්නයක් හෝ මුතුකරන්නක්හු කරා පැමිණ මාහැඟි වස්ත්‍රයක් හෝ සායම්කාරයකු කරා පැමිණ රක්ත චන්දනයක් හෝ සුවඳ කරන්නා කරා පැමිණ කීර්තියක් ම ලබන්නේ ය. ස්තුතියක් ම ලබන්නේ ය. ප්‍රශංසාවක් ම ලබන්නේ ය. එපරිද්දෙන් ම ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සර්වඥ දෙශනා ගත වූ මේ ප්‍රශ්නය සුදුසු වූ බෙදීමෙන් බෙද දීමෙන් බෙද වදරණ ලද්දේ ය. මෙසේ මේ ප්‍රශ්නය මම ද එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**උදකප්‍රාණිප්‍රශ්නය යි.**

**සකලජනමනොනන්දනීය වූ ශ්‍රී සද්ධර්මාදසයෙහි**
**සවන වර්ගය නිමියේ ය.**

---

# නිෂ්ප්‍රපඤ්චප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, තෙපි නිෂ්ප්‍රපඤ්චාරාම ව වාසය කරවු. නිෂ්-ප්‍රපඤ්චයෙහි ඇලී වාසය කරව' කියා මේ කාරණය වදරණ ලද්දේ ය. ස්වාමීනි, ඒ වදාළ නිෂ්ප්‍රපඤ්චය කවරේ ද?''යි විචාළෝය. ''මහරජා නෙනි, දෘෂ්ටිප්‍රපඤ්චයෙන් විරත හෙයින් සොතාපත්තිඵලය නිෂ්ප්‍රපඤ්චය නම් වන්නේ ය. සකෘදගාමිඵලය ද නිෂ්ප්‍රපඤ්චය නම් වන්නේ ය, තෘෂ්ණාප්‍රපඤ්චයෙන් විරත හෙයින් අනාගාමිඵලය නිෂ්ප්‍රපඤ්චය නම් වන්නේ ය. තෘෂ්ණා දෘෂ්ටි මාන ප්‍රපඤ්චය යන ත්‍රිවිධ ප්‍රපඤ්චයෙන් විරත හෙයින් අර්හත්ඵලය නිෂ්ප්‍රපඤ්චය නම් වන්නේ ය'' යි වදාළසේක. ''ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සොතාපත්ති ඵලයත් නිෂ්ප්‍රපඤ්චය වී නම්, සකෘදගාමිඵලයත් නිෂ්ප්‍රපඤ්චය වී නම්,

*Non-Commercial Distribution*

අනාගාමිඵලයත් නිෂ්ප්‍රපඤ්චය වී නම් රහත්ඵලයත් නිෂ්ප්‍රපඤ්චය වී නම්, කුමක් පිණිස වනාහි මේ ශාසනගත වූ භික්ෂූන් වහන්සේලා බුදුන් වදළ 'සූත්‍ර' නම් ධර්මයක් ඇද් ද, 'ගෙය්‍ය' නම් ධර්මයක් ඇද්ද, 'වෙය්‍යාකරණ' නම් ධර්මයක් ඇද්ද, 'ගාථා' නම් ධර්මයක් ඇද්ද, 'උදාන' නම් ධර්මයක් ඇද්ද, 'ඉතිවුත්තක' නම් ධර්මයක් ඇද්ද, 'ජාතක' නම් ධර්මයක් ඇද්ද, යම් 'අබ්භූත' නම් ධර්මයක් ඇද්ද, 'වෙදල්ල' නම් ධර්මයක් ඇද්ද යන මේ නවාංගශාස්තෘශාසනය වාචුග්ගත කොට හදාරණසේක්ලා ද, එහි අර්ථ විචාරණසේක්ලා ද, කුමක් පිණිස දානයෙන් ද පූජාසත්කාර කරණයෙන් ද බණ්ඩඵුල්ලපටිසංඛරණ (318) යෙන් ද නවකර්මාන්තයෙන් ද පලිබොධය වනසේක්ලා ද, ඒ භික්ෂූන් වහන්සේලා සර්වඥයන් වහන්සේ විසින් ප්‍රතික්ෂෙප කරණ ලද්ද වූ කට යුතු කරන්නාහු නො වෙත් දැ?'' යි කීහ.

''මහරජානෙනි, ඒ ශාසනගත වූ යම් භික්ෂුකෙනෙක් සූත්‍ර ය, ගෙය්‍ය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය, උදාන ය, ඉතිවුත්තක ය, ජාතක ය, අබ්භූත ධර්ම ය, වෙදල්ල ය යන නවාංගශාස්තෘශාසනය හදාරද්ද, අර්ථ විචාරත් ද, දානයෙන් ද, පූජායෙන් ද, බණ්ඩඵුල්ලපටිසංඛරණාදි නවකර්මයෙන් ද පලිබොධය වෙද්ද, ඒ සියලු ම භික්ෂූන් වහන්සේලා රහත්ඵලයට පැමිණීම පිණිස ම ඒ කට යුතු කරන්නාහු ය. මහරජානෙනි, යම් ඒ භික්ෂු කෙනෙක් ස්වභාවයෙන් ම පිරිසිදු වූ පූර්වයෙහි කරණ ලද වාසනා ඇත්තාහු ද, ඒ අල්පරජස්කයෝ එක ම චිත්තක්ෂණයෙහි ම රහත් වෙති. යම් ඒ භික්ෂුකෙනෙක් මන්දභාග්‍ය ඇත්තාහු ද, ඒ මහාරජස්කයෝ මේ බණ භාවනාදි ප්‍රයොගයෙන් ක්‍රමයෙන් ම රහත් වෙති. මහරජානෙනි, යම් සේ එක් පුරුෂයෙක්තෙම ක්ෂේත්‍රයෙහි බීජ වපුට රොපණය කොට තමාගේ යථාබල වූ වීර්යයෙන් ක්ෂේත්‍රය වටා පෙර කළ අගල් ඉවුරු ඇති බැවින් අළුත් ප්‍රාකාරයක් හෝ වැටක් හෝ නැති ව ම සැප සේ ම ධාන්‍ය යන් නභා ගන්නේ ය. එහි යම් හෙයකින් ධාන්‍යය ගැණීම පිණිස ඒ අලසපුරුෂයාගේ ඒ වතිප්‍රාකාරයන් සෙවීමක් අමුතුවෙන් නැත්තේ වේ ද. මහරජානෙනි, එපරිද්දෙන් ම ස්වභාවෙන් ම පරිශුද්ධ වූ යම් ඒ භික්ෂු කෙනෙක් පූර්වයෙහි කරණ ලද වාසනා ඇත්තාහු ද, ඒ බිප්පාභිඤ්ඤ භික්ෂූන් වහන්සේලා එක චිත්තක්ෂණයෙන් ම වතිප්‍රාකාර නැති ව සැප සේ වී නභා ගන්නා පුරුෂයා මෙන් රහත් වන්නාහු ය. යම් ඒ භික්ෂු කෙනෙක් බලවත් වූ රාගාදිකෙලෙස් ඇත්තාහු ද, ඒ මහාරජස්කයෝ මේ ප්‍රයොගයෙන් ගොස් වතිප්‍රාකාර කොට ධාන්‍ය නභා ගන්නා පුරුෂයා මෙන් රහත් වන්නාහු ය. තවද, මහරජානෙනි, යම් සේ මහත් වූ ආම්‍ර වෘක්ෂයක් මස්තකයෙහි මහත් ඵලපිණ්ඩයෙක් වී නම්, එකල ඒ අඹ කැමැත්තා වූ යම් කිසි අහසින් යන ඍද්ධිමත් කෙනෙක් අවුත් ඒ වෘක්ෂයාගේ ඵලය සැප සේ ගෙණ යන්නේ ය. එතැනට ඍද්ධියක් නැති කිසිවෙක් ආයේ වී නම්, එතෙම වනයෙන් දඬු වැල් කපා ගෙණවුත් හිණිමහක් බැඳ ගෙණ එයින් රුකට නැඟී ඵල කඩා ගෙණ යන්නේ ය. ඵල ග්‍රහණය පිණිස ඒ ඍද්ධිමත්හුගේ යම් ඒ නිස්සෙණි සෙවීමක් නැත්තේ ය. මහරජානෙනි,

Non-Commercial Distribution

එපරිද්දෙන් ම ස්වභාවයෙන් ම පිරිසිදු වූ අංගුලිමාලමහාකාශ්‍යප ස්ථවිරාදි වූ යම් ඒ භික්ෂු කෙනෙක් ඇද්ද, පූර්වයෙහි කරණ ලද වාසනා ඇත්තාහු ද, ඒ ඒ උත්තමයෝ එකචිත්තක්ෂණයෙන් ම අඹරුකින් ඵල ගෙණ යන්නා වූ ඍද්ධිමතුන් වහන්සේ මෙන් මාර්ගඵලසමංගීහු වෙති. යම් ඒ භික්ෂු කෙනෙක් බලවත් වූ කෙලෙස්රජස් ඇති බැවින් මහාරජස්ක වූ ද ඒ භික්ෂූහු මේ ප්‍රයොගයෙන් නිස්සෙණියෙන් අඹරුකකට නැඟී අඹ නෙළා ගෙණ ගිය පුරුෂයා මෙන් චතුස්සත්‍යධර්මයන් අභිසමය කරන්නාහු ය.

''තවද, මහරජානෙනි, යම් සේ ස්වාර්ථසිද්ධිකාරක වූ එක් යොධ පුරුෂයෙක් තමාගේ ස්වාමිපුරුෂකෙනෙකුන්ගේ කිසි කට යුත්තක් පැමිණි කල්හි තෙමේ එකලා ව ම ගොස් ඒ ස්වාමිපුරුෂයාගේ අර්ථය සිද්ධ කරන්**(319)** නේ ය. එසේ ම අසමර්ථ වූ ධනවත් වූ එක් පුරුෂයෙක් ධනය වශයෙන් පිරිස වඩා ගෙණ ඒ පිරිස ලවා පැමිණි අර්ථය සිද්ධ කරවා ලන්නේ ය. පැමිණි අර්ථය සිද්ධ කිරීම පිණිස ඒ යොධපුරුෂයාගේ යම් ඒ පිරිස් රැස් කිරීමෙක් නැත්තේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යම් ඒ භික්ෂුකෙනෙක් ස්වභාවයෙන් ම පිරිසිදුහු ද, පෙර කරණ ලද වාසනා ඇත්තාහු ද, ඒ අල්පරජස්කයෝ පමා නො වී එක චිත්තක්ෂණයෙන් ම එකලා ව ම, අර්ථසිද්ධිය රැස් කරන්නා වූ පුරුෂයා මෙන්, ෂඩ්අභිඥයෙහි වසීභාවයට පැමිණෙන්නාහු ය. යම් ඒ භික්ෂුකෙනෙක් මහාරජස්ක වූ ද, ඒ මහාරජස්කයෝ මේ ප්‍රයොගයෙන්, පිරිස ලවා අර්ථ සිද්ධිය කරවන්නා වූ පුරුෂයා මෙන් ශ්‍රාමණ්‍යාර්ථය සාධන්නාහු යි. මහරජානෙනි, පෙළපාළිය සකසා හැදෑරීම ද බොහෝ උපකාර ඇත්තේ ය. එම පෙළ අර්ථ ඇසීම ද බොහෝ උපකාර ඇත්තේ ය. ඛණ්ඩපුල්ල පටිසංඛරණාදි නවකර්මය ද බොහෝ උපකාර ඇත්තේ ය. ආමිසදන ධර්මදන ශබ්දදනය ද බොහෝ උපකාර ඇත්තේ ය. රත්නත්‍රයෙහි පූජා සත්කාරකරණය ද බොහෝ උපකාර ඇත්තේ ය. ඒ ඒ කට යුතු කෘත්‍යයෙහි බොහෝ වූ ආනිසංස ඇත්තේ ය. මහරජානෙනි, යම් සේ රජ්ජුරුවන් සේවනය කරන්නා වූ අමාත්‍ය යොධ භට බල ප්‍රධානික දෙරටුපාල රජගෙය රක්නා අනීකට්ඨ පාරිෂද්‍යජනයා අතුරෙන් හැමට වඩා රජ්ජුරුවන්ගේ සිත සේ රාජසෙවනය කරන්නා වූ පුරුෂයෙක් වී නම්, ඒ රාජකාරුණිකපුරුෂයාහට යම් කට යුත්තක් පැමිණි[1] කල්හි ඒ අමාත්‍ය යෝධ භට බල ප්‍රධානිකාදි සියල්ලෝ උපකාර වන්නාහු ය. ආදර වන්නාහු ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ඒ ඒ කට යුතු අතුරෙන් පෙළපාළිය හැදෑරීමත් බොහෝ උපකාර ඇත්තේ ය. අර්ථ විචාරීමත් බොහෝ උපකාර ඇත්තේ ය. නවකර්මයත් බොහෝ උපකාර ඇත්තේ ය. දන් දීමත් බොහෝ උපකාර ඇත්තේ ය. පූජාසත්කාරත් බොහෝ උපකාර ඇත්තේ ය. මහරජානෙනි, ඉදින් සියල්ලෝ ම ස්වභාව ජාතියෙන් ම පිරිසිදු වන්නාහු නම්, අනුශාසක වූ බුදුන්ගෙනුත් කට යුත්තක් නො වන්නේ වේ ද? මහරජානෙනි, යම් හෙයකින් සද්ධර්ම

1. පැමිණෙන්නේ

Non-Commercial Distribution

ශ්‍රවණයෙන් කට යුත්තෙක් වන්නේ ම ය. මහරජානෙනි, අපරිමිත අසංඛ්‍යගණන් කල්ප පටන් රැස් කරණ ලද දානශීලාදි කුශලමූලයන් ඇත්තා වූ ප්‍රඥවෙහි කෙළ පැමිණියා වූ **ශාරිපුත්‍ර** මහාථෙර සාමීන් වහන්සේ ද නමන් වහන්සේ පවා ආශ්‍රවක්ෂයකට පැමිණීමට සද්ධර්මශ්‍රවණය හැර නො හැකි වූසේක. මහරජානෙනි, එසේ හෙයින් සද්ධර්මශ්‍රවණය බොහෝ වූ උපකාර ඇත්තේ ය. එසේ ම පෙළ හැදෑරීම ද අර්ථ විචාරීම ද බොහෝ වූ උපකාර ඇත්තේ ය. එහෙයින් උද්දෙසපරිපුච්ඡානොම ද නිෂ්ප්‍රපඤ්ච සංඛ්‍යාත වූ අසංඛතධර්මයෙකැ'' යි වදාළසේක.

''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ප්‍රශ්නය තෙම නුඹ වහන්සේ විසින් මනා කොට ම චින්තනය කරණ ලද්දේ ය. මෙසේ මේ ප්‍රශ්නයත් එසේ පිළිගන්නෙමි'' යි කීහ.

**නිෂ්ප්‍රපඤ්චප්‍රශ්නය නිමි.**

---

# වෙගතිප්‍රශ්නය

**(320)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'යමෙක් ගෘහස්ථභූමියෙහි දී ම රහත්ඵලයට පැමිණියේ වී නම්, එදවස් ම ඔහු පැවිදි වන්නේ හෝ ය. පිරිනිවන් පාන්නේ හෝ ය. ඔහට මේ ගතිහු දෙකෙක් ම වන්නාහ. අනික් ගතියෙක් නැත්තේ ය. ඒ රහත් වූ දවස ගෘහස්ථභූමියෙහි ම සිට අතික්‍රාන්ත කරන්නට නො හැක්කේ ය' යි කියා නුඹ වහන්සේ වදාරණ සේක. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉදින් ඒ ගෘහස්ථභූමියෙහි දී රහත් වූ පුද්ගලතෙම ඒ රහත් වූ දවස්හි ම කර්මවාක්‍යය කියන ආචාර්ය-යක්හු හෝ සිවුරු නිස දෙන උපාධ්‍යායයක්හු හෝ පාත්‍රය හා තුන්සිවුරු හෝ නො ලැබුනේ වී නම්, කිමෙක් ද, ඒ රහතන් වහන්සේ තෙමේ ම පැවිදි වනසේක් ද? දවස අතික්‍රාන්ත කරණසේක් ද? ඍද්ධි ඇති රහතන් වහන්සේ කෙනෙක් හෝ අවුත් ඔහු පැවිදි කරවා වදාරණසේක් ද? නොහොත් පිරිනිවන් පානාසේක් දැ?'' යි විචාළෝ ය.

''මහරජානෙනි, ඒ රහතන් වහන්සේ තෙමේ ම පැවිදි නො වනසේක. තෙමේ ම පැවිදි වීමෙන්[1] ලිංගත්ථෙනභාවයට පැමිණෙන්නේ ය. එහෙයින් පැවිදි නො වනසේක. දවස ද අතික්‍රාන්ත නො කරණසේක. අනික් රහතන් වහන්සේ කෙනෙකුන්ගේ ආගමනයක් වන්නේ හෝ ය. නොහොත් නො වූයේ වී නම්, එදවස් ම පිරිනිවන් පානසේකැ'' යි කීසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමක් කරණ කොට ගෙණ පැමිණියා වූ රහත්ගුණය ජීවිතය නැසීම පිණිස වේ ද, ඒ කාරණයෙන් රහතන් වහන්-සේගේ සත්පුරුෂගුණභාවය පහවන ලද වන්නේ ය'' යි කීහ. ''මහරජා නෙනි, ගිහිවෙශය විෂම වූයේ ය. විෂම වූ වෙශයෙහි වෙශයාගේ දුර්වල බැවින් රහත් වූ ගෘහස්ථතෙම එදවස්හි ම පැවිදි වන්නේ හෝ ය.

1. වෙමින්

පිරිනිවන් පාන්නේ හෝ ය. මහරජානෙනි, මේ දෝෂය රහතන් වහන්සේගේ නො වන්නේ ය. ගිහිවෙශයාගේ දුර්වල බැවිනැ යි කියා මේ ගිහිවෙශයාගේ මේ දෝෂය නම් වන්නේ ය. මහරජානෙනි, යම් සේ සකල සත්වයන්ගේ ආයු පාලනය කරන්නා වූ සාලිමංසාදිභොජනය ජඨරාග්නිය මඳ ව දුර්වලග්‍රහණික වූ විෂම වූ කුක්ෂියගේ ආහාරය නො පැයීමෙන් ජීවිතය නස්නේ ද, මහරජානෙනි, මේ දෝෂය භොජනයාගේ නො වන්නේ ය. මේ දෝෂය මන්දග්නි වූ කුක්ෂියගේ වන්නේ ය. (එනම්[1]) ජඨරාග්නිය දුර්වලබව ය. මහරජානෙනි, එපරිද්දෙන් ම විෂම වූ වෙසයෙහි වෙසයාගේ දුර්වල බැවින් රහත්ඵලයට පැමිණි ගෘහස්ථ තෙම එදවස්හි ම පැවිදි වන්නේ ය. නොහොත් පිරිනිවන් පාන්නේ ය. මහරජානෙනි, මේ දෝෂය රහතන් වහන්සේගේ නො වන්නේ ය. මේ දෝෂය ගිහිවෙශයාගේ ම ය. (එනම්)[2] ගිහිවෙසයාගේ දුර්වල බව ය. තවද, මහරජානෙනි, යම් සේ ස්වල්ප වූ තෘණසලාකාසංඛ්‍යාත හුණු ලැල්ලක් මත්තෙහි මහත් වූ ගලක් තැබූ කල්හි දුර්වල බැවින් බිඳී වැටෙන්නේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම රහත්ඵලයට පැමිණි ගෘහස්ථතෙම ඒ ගෘහස්ථවෙශයෙන් රහත්භාවය ධරන්ට නො හැකි ව එදවස්හි ම පැවිදි වනසේක. නොහොත් පිරිනිවන් පා වදාරණසේක.

**(321)** ''තවද, මහරජානෙනි, යම් සේ ශරීරබලයක් නැති බැවින් අබල වූ පිරිස්බලයක් නැති බැවින් දුර්වල වූ රාජබ්‍රාහ්මණ ගොත්‍ර නො වන බැවින් හීනජාති ඇත්තා වූ පෙර කළ මහත් වූ පිණක් නැති බැවින් මඳ පින් ඇත්තා වූ පුරුෂයෙක්තෙම මහත් වූ රාජ්‍යසම්පත්තියක් ලැබ ක්ෂණයකින් ම නො බෝ කලකින් ම එයින් පිරිහෙන්නේ ය, නසින්නේ ය, පසු බසින්නේ ය, ඒ රාජඉසුරු ධරන්නට නො හැකි වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම අර්හත්ඵලයට පැමිණියා වූ ගෘහස්ථතෙම ඒ ගිහිවෙශයෙන් රහත්භාවය ධරන්ට නො හැකි වනසේක. ඒ කාරණයෙන් එදවස්හි ම පැවිදි වනසේක. නැතහොත් පිරිනිවන් පා වදාරණසේකැ'' යි වදළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නයත් මම එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

ද්වෛගතිප්‍රශ්නය නිමි.

---

## අසම්මොහ ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, රහතන් වහන්සේගේ සිහි මුළා වීමෙක් ඇද්ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, රහතන් වහන්සේලා පහ වූ සතිසම්මොස ඇතිසේක්ලා ය. රහතන් වහන්සේලාගේ සිහි මුළා වීමෙක් නැතැ'' යි වදළසේක. ''ස්වාමීන් වහන්ස, රහතන් වහන්සේ

1. හේ කවරේද යත්

2. මෙහි 'යදිදං යන නිපාතයෙන් හේ කවරේ ද යන අර්ථය' යන පාඨයක් පෙණේ. 'යදිදං' යනු 'යං' ඉදං' යන නාම පද දෙකයි 'යම් මේ පනු එහි අර්ථ යි.

Non-Commercial Distribution

ආපත්තියට පැමිණ වදරණසේක් දූ?'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජ, පැමිණෙන්නේ ඇතැ'' යි වදළසේක. ''කවර වස්තුවෙක්හි දූ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, සුගත්වියතින් දෙළොස්වියතක් දිගින් හා සත්වියතක් පුළලින් හා කුන්ථකිපිල්ලිකබිලාදි උපද්‍රවයක් නැති ගොන් යෙදූ රථය ගෙපළ වටා පැද යා හැකි උපචාරය ඇති ව, සඟුන් වඩා භූමිය දෙසා උඩින් යටින් සිතියම් කර්මාන්ත කොට තෙමේ ම තමා උදෙසා ම කරන්නා වූ (කුටිය පිළිබඳ) **කුටිකාරකශික්ෂාපදයෙහි** සොපද්‍රවභූමියෙහි හෝ අනුපචාරයෙහි හෝ වස්තු දෙසීමට සඟුන් නො එළවා හෝ වදළ තාක් ප්‍රමාණයෙන් මඳක් වඩා හෝ සංයාචික කුටිය කරන්නා වූ රහතන් වහන්සේ අචිත්තකසමුට්ඨාන හෙයින් කුටිකාරකසංඝාදිසෙසාපත්තියට පැමිණෙනසේක. මහරජානෙනි, ස්ත්‍රීපුරුෂ දෙදෙනාගෙන් අභිප්‍රාය ගෙණ ඔබ්නොබ කියා හැසිරීමෙන් වන්නා වූ ඡසමුට්ඨානික වූ **සංචරිත්තසංඝාදිසෙසාපත්තිය** කයිනුත් නඟින්නේ ය, වචනයෙනුත් නඟින්නේ ය, කායවචනයෙනුත් නඟින්නේ ය, කායචිත්තයෙනුත් නඟින්නේ ය, වාචාචිත්තයෙනුත් නඟින්නේ ය, කායවාචාචිත්තයෙනුත් නඟින්නේ ය. එහෙයින් වදළ ප්‍රඥප්තිය නො දන්නා වූ රහතන් වහන්සේට කායවාචාසමුට්ඨානයෙන් ආපත්තිය නඟින්නේ ය. රහතන් වහන්සේගේ මවුපියදෙදෙන කලහ වඩා වෙන් ව පලා ගියාහු වෙද් ද, එකල රහතන් වහන්සේ පියානන් නිසා ගෘහයට වැඩි කල 'අනේ! ස්වාමීනි, නුඹගේ මැනියන් වහන්සේ මහලු වූ මා හැර නැකුලයට ගියාහ. ස්වාමීනි, මැනියන් ලඟට ගොස් ඈ මට උපස්ථානයට එවා වදළ මැනැවැ'යි කීකල පියානන්ගේ වචනය ගෙණ මැනියන් ලඟට ගොස් විමසා නැවත පියානන්ට ලඟට අවුත් මැනියන් එන බව හෝ නො එනබව හෝ **(322)** කියන්නා වූ රහතන් වහන්සේ සංඝාදිසෙසාපත්තියට පැමිණෙනසේක.[1] හිරු අවර වීමෙන් විකල වූ අකාලයෙහි කාලසංඥවෙන් ආහාරකෘත්‍යය කරන්නා වූ රහතන් වහන්සේ විකාලභොජනාපත්තියට පැමිණෙනසේක. සප්තවිධධාන්‍යයෙන් කළ බත ය. සප්තවිධධාන්‍යයන් කරණ කොට බැඳ සුණු කරණ ලද යවයෙන් කළ කොමු ය. දියෙහි උපන් මස් ය, ගොඩ උපන් මස් ය යන මේ පඤ්චවිධ වූ භොජනයෙන් එකක් වළඳමින් සිටිනවිට[2] දයකයා දෙරියන්වියත් අත්පසට පැමිණ[3] පඤ්චවිධභොජනයෙන් එකක් දෙනු[4] කැමැති ව පිරිනැමූ විට[5] කායවිකාරයෙන් හෝ වචනයෙන් ප්‍රතික්ෂෙප කිරීම ය යන මේ පඤ්චාංගයෙන් පවාරණය වූ කල්හි අප්පවාරිතසංඥවෙන් යම්කිසි භොජනයක් වළඳන්නා වූ රහතන් වහන්සේ පාචිත්තියාපත්තියට පැමිණෙනසේක. සුශීලභික්ෂුනමක් ලඟ උක්කුටුකයෙන් ඇඳිලි බැඳ හිඳ 'න පුනෙවං කරිස්සාමි' යන දෙසනා සුද්ධිවාක්‍යය දෙසා ආපත්තියෙන් මිදෙන්නේ ය. උදය පවාරණ ව කිසිවක් නො වැළඳිය යුතු ව සිට සප්තවිනය කර්මයෙන් කැප කළ

1. පැමිණෙන්නේ ය. 2. සිටියේ 3. පැමිණ සිටියේ ඔහු අත
4. එකක් වූයේ ඔහු විසින් භොජනය දෙනු 5. පිරිනැමූයේ.

Non-Commercial Distribution

අතිරිත්තභොජනයෙහි පඤ්චවිධ වූ ශ්‍රමණව්‍යවහාර කප්පියයෙන් කැප කරණ ලද්ද වූ භික්ෂූහු විසින් පිළිගෙණ කරණ ලද්ද වූ, කැප කරවා ගැණීමට ආ භික්ෂූන් වහන්සේ ලවා භාජනය මදක් නහවා හෝ ඇලයකට නම්වා කරණ ලද්ද වූ, කැප කරවා ගැණීමට ආ භික්ෂූන් වහන්සේගේ අත්පසින් ඇතුළත සිටියාහු විසින් කරණ ලද්ද වූ, කැප කරණ භික්ෂූන් වහන්සේ විසින් පවාරණය වීමට සෑහෙන භොජනයක් වළඳන ලදු ව කරණ ලද්ද වූ, අනුභව කළා වූ පවාරණ කළා වූ, ආසනයෙන් නො නැංගා වූ භික්ෂූහු විසින් කරණ ලද්ද වූ, කැප කරණ භික්ෂූන් වහන්සේ විසින් 'අලමෙතං සබ්බං' කියා කැප කරණ වාක්‍යය කියන ලද්ද වූ මේ සප්තවිධ වූ විනයකර්මයෙන් කැප කළ අතිරිත්තභොජනය ද ගිලන්හට ගෙණවුත් ඉතිරි වූ අතිරිත්තභොජනය ද යි යන මේ අතිරිත්ත වූ භොජන (යෙන් අන්‍ය වූ අනතිරිත්තභොජනයක් අතිරිත්තභොජන) සංඥවෙන් වළඳන්නා වූ රහතන් වහන්සේ පාචිත්තියාපත්තියට පැමිණෙනසේක. තමන් කෙරෙහි විද්‍යමාන වූ උත්තරීමනුෂ්‍යධර්මය අනුපසම්පන්නයක්හට කියන්නා වූ රහතන් වහන්සේ පාචිත්තියාපත්තියට පැමිණෙනසේක. ප්‍රඥප්තිය නො දන්නා වූ රහතන් වහන්සේ කායසමුට්ඨානයෙන් ද වාචාසමුට්ඨානයෙන් ද කායවාචා සමුටඨානයෙන් ද යන ත්‍රිවිධ අචිත්තක සමුට්ඨානයෙන් වන්නා වූ ආපත්තියට පැමිණෙනසේක'' යි වදාළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'යම් උපසම්පන්න කෙනෙක් ආපත්තියට පැමිණෙද්ද, ඒ සඟහු ශික්ෂාපදයෙහි අනාදරයෙන් හෝ ශික්ෂාපදය නො දැනීමෙන් හෝ යන කාරණද්වයෙන් ආපත්තියට පැමිණෙන්නාහු ය' යි කියා නුඹ වහන්සේ වදරණසේක. කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, රහතන් වහන්සේ යම් ආපත්තියකට පැමිණෙනසේක් ද, එහෙයින් රහතන් වහන්සේට ශික්ෂාපදයෙහි අනාදර වේ ද'' යි විචාළෝ ය. ''මහරජානෙනි, රහතන් වහන්සේට අනාදරය නො වන්නේ ය'' යි වදාළසේක. ''ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, රහතන් වහන්සේ ආපත්තියට පැමිණෙනසේක් නම්, රහතන් වහන්සේට අනාදරයෙක් නො වේ නම්, ඒ **(323)** කාරණයෙන් රහතුන් වහන්සේට සිහි මුළා වීම ඇතැ'' යි කීහ. ''මහරජානෙනි, රහතන් වහන්සේට සිහි මුළා වීම නැත්තේ ය. රහතන් වහන්සේ ආපත්තියට පැමිණෙනසේකැ'' යි වදාළසේක. ''එහෙයින් ස්වාමීනි, මට කාරණය-කින් අඟවා වදාළ මැනැව. එහි කාරණය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, 'ක්ලේශයෝ ලොකවද්‍ය ය, ප්‍රඥප්තිවද්‍ය ය' යි කියා දෙදෙනෙක. මහරජානෙනි, ඒ ලොකවද්‍යය කවරේ ද යත්— 'ප්‍රාණඝාත අදින්නාදන කාමමිථ්‍යාචාර මුසාවාද පිසුනාවාචා සම්ඵප්‍රලාප අභිද්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටිය යන දශඅකුශලකර්මපථයෝ මේ ලොකාවද්‍යය' යි කියනු ලැබේ. ප්‍රඥප්තිවද්‍යය කවරේ ද? යත්— 'ලොකයෙහි ශ්‍රමණශාක්‍ය

පුත්‍රයන්ට සුදුසු නො වන්නා වූ අනුලොම් නො වන්නා වූ ගිහින්ට අනවද්‍ය වූ යමක් ඇද්ද, එහි දිවිහිමියෙන් නො ඉක්මිය යුතු ය' යි කියා බුදුරජානන් වහන්සේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවා වදාළසේක.

**'විකාල භොජනං මහාරාජ ලොකස්ස අනවජ්ජං, තං සාසනෙ වජ්ජං. භූතගාමවිකොපනං මහාරාජ ලොකස්ස අනවජ්ජං, තං ජිනසාසනෙ වජ්ජං. උදකෙ හස්සධම්මං මහාරාජ ලොකස්ස අනවජ්ජං. තං ජිනසාසනෙ වජ්ජං. ඉති එවරූපානි මහාරාජ ජිනසාසනෙ වජ්ජානි. ඉදං වුච්චති පණ්ණත්තිවජ්ජං. යා කිලෙසා ලොකවජ්ජං, අභබ්බා ඛීණාසවො තං අජ්ඣාචරිතුං, යං කිලෙසං පණ්ණත්ති වජ්ජං, තං අජානන්තො ආපජ්ජෙය්‍ය'** යි.

''මහරජානෙනි, විකාලභොජනය ලොකයාහට අනවද්‍ය වන්නේ ය. ඒ විකාලභොජනය සර්වඥශාසනයෙහි සාවද්‍ය වන්නේ ය, මහරජානෙනි, තෘණවෘක්ෂාදිය විකොපනය කිරීම ලොකයාහට නිරවද්‍ය වන්නේ ය. ඒ තෘණවෘක්ෂාදිය විකොපනය කිරීම සර්වඥශාසනයෙහි සාවද්‍ය වන්නේ ය. මහරජානෙනි, උදකයෙහි සිනා කොට දිය කෙළීම ලොකයාහට නිරවද්‍ය වන්නේ ය. ඒ උදකක්‍රීඩා සර්වඥශාසනයෙහි සාවද්‍ය වන්නේ ය. මහරජානෙනි, මෙසේ මෙබඳු මෙබඳු වූ දෙය සර්වඥශාසනයෙහි සාවද්‍ය වන්නේ ය. මේ ප්‍රඥප්තිවද්‍ය ය යි කියනු ලැබේ. ලොකවද්‍ය වූ යම් ක්ලේශධර්මයක් ඇද්ද, ඒ සාවද්‍යධර්මයෙහි හැසිරෙන්නට ක්ෂීණාශ්‍රව-යන් වහන්සේ අයොග්‍ය වනසේක. ප්‍රඥප්තිවද්‍ය වූ යම් ක්ලේශධර්ම කෙනෙක් ඇද්ද, ඒ ධර්මයෙහි ක්ෂීණාශ්‍රවයන් වහන්සේ නො දැන පැමිණෙනසේක. මහරජානෙනි, ශුෂ්කවිදර්ශක වූ ඇතැම් රහතන් වහන්සේ කෙනෙකුන්හට සියලු ම දෙය දැනගන්ට අවිෂය වන්නේ ය. ඒ ශුෂ්ක විදර්ශක භික්ෂූන් වහන්සේට සියල්ල දැන ගන්ට ඥානබලයක් නො ම ඇත්තේ ය. මහරජානෙනි, සර්වක්ලේශයන්ගේ සිවි නැති කොට කැඩූ ආශ්‍රවක්ෂයකරඥානය පමණක් ලද්ද වූ රහතන් වහන්සේ විසින් තමන් නො හඳුනන ස්ත්‍රීපුරුෂයන්ගේ නාමය ද ගොත්‍රය ද නො දන්නා ලද්දේ ය. ඒ රහතන් වහන්සේ විසින් පෘථිවියෙහි නො පුරුදු මාර්ගය නො දන්නා ලද්දේ ය. මහරජානෙනි, දිව්‍යඥානපූර්වෙ-නිවාසානුස්මෘතිඥනාදි කිසි විශෙෂයක් නැති ඇතැම් රහතන් වහන්සේ නමෙක් අර්හත්ඵල විමුක්තිය ම දන්නාසේක. කෙලෙසුන් නැසූ පමණෙක් ම ය. දිව්‍ය **(324)** චක්ෂුරභිඥනාදි ෂඩභිඥලාභී වූ මහරහතන් වහන්සේ තමන්ගේ විෂය වූ සියලු ධර්මය දන්නාසේක. මහරජානෙනි, සර්වඥතාඥනයට පැමිණියා වූ තථාගතයන් වහන්සේ ම සියල්ල ම දැන වදාරණසේක. එහෙයින් බුදු පසේබුදු දෙදෙනා වහන්සේ ම ආපත්තියට

නො පැමිණෙනසේක. සෙසු රහතන් වහන්සේ ප්‍රඥප්තිවද්‍ය වූ ආපත්තියට පැමිණෙනසේකැ'' යි වදළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නයත් එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**අසම්මොහප්‍රශ්නය නිමි.**

---

# සිංහනාද ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ලෝකයෙහි බුදුවරයෝත් දක්නා ලැබෙති. පසේබුදුවරයෝත් දක්නා ලැබෙති. සුගතශ්‍රාවකයෝත් දක්නා ලැබෙති. චක්‍රවර්ති මහරජහුත් දක්නා ලැබෙති. ප්‍රදෙශමහරජහුත් දක්නා ලැබෙති. දිව්‍යබ්‍රහ්මමනුෂ්‍යයෝත් දක්නා ලැබෙති. සධනික සත්වයෝත් දක්නා ලැබෙති. නිර්ධනික සත්වයෝත් දක්නා ලැබෙති. සුගතිසත්වයෝත් දක්නා ලැබෙති. දුර්ගතිසත්වයෝත් දක්නා ලැබෙති. පුරුෂයාහට ස්ත්‍රීලිඟු පහළවීමත් දක්නා ලැබේ.[1] ස්ත්‍රීහට පුරුෂලිඟු පහළ වීමත් දක්නා ලැබේ.[1] සුකෘත දුෂ්කෘත කර්මවලුත් දක්නා ලැබේ.[1] යහපත් නපුරු කර්මයන්ගේ විපාකුපභොගී වූ සත්වයෝත් දක්නා ලැබෙති. අණ්ඩජ වූ ජලාබුජ වූ සංසෙදජ වූ ඕපපාතික වූ සත්වයෝත් ඇත. අපාද වූ දිපාද වූ චතුප්පදික වූ බහුප්පදික වූ සත්වයෝත් ඇත. ලෝකයෙහි යක්ෂයෝ ය, රාක්ෂසයෝ ය, කුම්භාණ්ඩයෝ ය, අසුරයෝ ය, දනවයෝ ය, ගන්ධර්වයෝ ය, ප්‍රෙතයෝ ය, පිසාචයෝ ය යන මොවුහුත් ඇත. කිඳුරෝ ය, මහෝරගයෝ ය, නාගයෝ ය, ගරුඬයෝ ය, සිද්ධයෝ ය, විද්‍යාධරයෝ ය යන මොහුත් ඇත. හස්තීහු ය, අශ්වයෝ ය, ගවයෝ ය, මීසරක්හු ය, ඔටුවෝ ය, කොටළුවෝ ය, තිරෙළුවෝ ය, එළුවෝ ය, මෘගයෝ ය, ශූකරයෝ ය, සිංහයෝ ය, ව්‍යාඝ්‍රයෝ ය, දිවියෝ ය, වලස්සු ය, කොක්නාවෝ ය, කරබානා වලස්සු ය, සුනඛයෝ ය, ශෘංගාලයෝ ය යන මොහුත් ඇත. අනෙකප්‍රකාර වූ බොහෝ පක්ෂිහුත් ඇත. රන් රිදී මුතු මැණික් සංඛ ශිලා ප්‍රවාල ලොහිතංක මසාරගල්ල වෙළුරිය වීදුරු ස්ඵටික මාණික්‍ය යන මේ රත්නජාතියත් ඇත. කළුලොහ ය, තඹ ය, වටලොහය, කස්ලොහ ය යන මේ ලොහජාතියත් ඇත. කොමුපිළි ය, පටපිළි ය, කපුපිළි ය, සණපිළි ය, බංගාලේ පිළි ය කම්බිලිපිළි ය යන මේ වස්ත්‍රජාතියත් ඇත. හැල් වී ජාති ය, යව වී ජාති ය, තණජාති ය, කළුහමුජාති ය, සුදුහමුජාති ය, හොරවාල ය, මුං ය, මෑ ය, තල ය, කොල්ලු ය යන මේ ධාන්‍යජාතියත් ඇත. මූලගන්ධ ය, සාරගන්ධ ය, සුඹුළුගන්ධ ය. ත්වචගන්ධ ය, පත්‍රගන්ධ ය, පුෂ්පගන්ධ ය, ඵලගන්ධය සර්වසංහාරගන්ධ ය යන මේ සුගන්ධජාතියත් ඇත. තෘණ ලතා පැළ වෘක්ෂ ඖෂධී ඵල නදී පර්වත සමුද්‍ර මත්ස්‍ය කැසුප් යන මේ සියල්ලත් ලොකයෙහි ඇත. ස්වාමීනි, මේ කී තාක් දෙය හැර ලොකත්‍රයෙහි යම් දෙයක් නැත්තේ වී නම් ඒ නැති දෙය මට වදළ හොත් සමර්ථසේකැ'' යි කීහ.

---

1. ලැබෙති.

Non-Commercial Distribution



තවුස් බවට පැමිණි වෙස්සන්තර රජ පවුල (386 පිටුව)

*Non-Commercial Distribution*

එකල නාගසෙනස්ථවිරොත්තමයානෝ—

**(325) "තීණිමානි මහාරාජ, ලොකෙ නත්ථි. කතමානි තීණි? සචෙතනා වා අචෙතනා වා අජරාමරා ලොකෙ නත්ථි. සංඛාරානං නිච්චතා නත්ථි. පරමත්ථෙන සත්තුපලබ්ධි නත්ථි. ඉමානි ඛො මහාරාජ තීණි ලොකෙ නත්ථී" ති.**

යනුවෙන් "මහරජානෙනි, මේ ත්‍රිවිධ වූ ධර්මකෙනෙක් ලොකත්‍රයයෙහි ම නැත්තේ ය. කවර නම් ත්‍රිවිධ ධර්මකෙනෙක් ද? යත්—දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය තිරශ්චීනාදි සචෙතනික වූ හෝ වෘක්ෂපර්වතාදි අචෙතනික වූ හෝ ජරාමරණ නො වන්නා වූ අජරාමරයෙක් ලොකයෙහි නැත්තේ ය. ස්පර්ශ වෙදනා සංඥ චෙතනාදි සර්වසංස්කාරයන්ගේ නිත්‍යතාවෙක් නැත්තේ ය. පරමාර්ථයෙන් සත්තුපලද්ධියෙක් නැත්තේ ය. මහරජානෙනි, මේ ත්‍රිවිධධර්මයෝ ලොකයෙහි නැතැ" යි වදළසේක. "සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පණ්ඩිතජනාහෘදයානන්ද කෙරෙමින් සිංහනාදයක් කර වදළසේක. ලොකයෙහි අජරාමර දෙයකු ද නැත්තේ ය. සංස්කාරයන්ගේ නිත්‍යතාවකුත් නැත්තේ ය. පරමාර්ථ වශයෙන් විමසා බැලූ කල ලැබිය යුතු සත්වයෙකු ද නැත්තේ ය. යහපත, ස්වාමීනි, මෙසේ මේ ප්‍රශ්නයත් මම එසේ ම පිළිගන්නෙමි"යි කීහ.

සිංහනාදප්‍රශ්නය නිමි.

---

## නිර්වාණවිමතිච්ඡෙදනප්‍රශ්නය

නැවතත් ප්‍රශ්නයක් අසනු කැමැත්තා වූ මිලිඳුමහරජානෝ "ස්වාමීනි, නාගසෙනස්ථවිරයානන් වහන්ස, ලොකයෙහි කුශලාකුශලකර්මයෙන් උපන්නාහුත් දක්නා ලැබෙති. හෙතු නිසා උපන් දෙයත් දක්නා ලැබෙති. ඍතුවෙන් උපන් දෙයත් දක්නා ලැබෙති. මේ ඇර ලොකයෙහි කර්මයෙන් නූපන් බැවින් අකර්මජ වූ ද හෙතුවකින් නූපන් බැවින් අහෙතුජ වූ ද ඍතුවකින් නූපන් බැවින් අනුතුජ වූ ද යමක් ඇත් නම්, ඒ දෙය මට වදළ මැනැවැ" යි කීහ.

එකල නාගසෙනස්ථවිරයානන් වහන්සේ—

**"ද්වෙ මෙ මහාරාජ, ලොකස්මිං අකම්මජා අහෙතුජා අනුතුජා. කතමෙ ද්වෙ? ආකාසො මහාරාජ අකම්මජො අහෙතුජො අනුතුජො. නිබ්බානං මහාරාජ අකම්මජං අහෙතුජං අනුතුජං. ඉමෙ ඛො මහාරාජ, ද්වෙ අකම්මජා අහෙතුජා අනුතුජා" ති.**

යනුවෙන් "මහරජානෙනි, ලොකයෙහි මොහු දෙදෙනෙක් අකර්මජ වූහ. අහෙතුජ වූහ. අනුතුජ වූහ. කවර දෙදෙනෙක් ද? යත්–මහරජානෙනි, අකාශය අකර්මජ ය. අහෙතුජ ය. අනුතුජ ය. මහරජානෙනි,

24

Non-Commercial Distribution

නිර්වාණය අකර්මජ වූයේ ය. අහෙතුජ වූයේ ය. අනුතුජ වූයේ ය. මහරජානෙනි, මොහු දෙදෙන වනාහි අකර්මජ වූහ. අහෙතුජ වූහ. අනුතුජ වූහ''යි වදළසේක. ''අහෝ! අහෝ! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ලොවුතුරා බුදුන්ගේ සර්වඥවචනය නො මකන්න. නො දන ප්‍රශ්න නො කියන්න. නො දන්නා ප්‍රශ්නයෙහි ව්‍යාපෘත නො වන්නැ'' යි කීහ. ''මහරජානෙනි, මම කුමක් කියන්නෙම් ද? මට තෙපි 'මා භන්තෙ, නාගසෙන ජින වචනං මක්ඛෙහි මා **(326)** අජානිත්වා පඤ්හං ව්‍යාකරොහී' යි කියා යම් වචනයක් මෙසේ කියන්නාහු ය. හේ කවරේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ආකාශය අකර්මජ ය, අහෙතුජ ය. අනුතුජ ය'යි කියා මේ වචනය නුඹ වහන්සේට වදරන්ට යුතු වන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නොයෙක් සියදහස් කාරණයෙන් ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන් වහන්සේලාට නිර්වාණයාගේ සිඬ කිරීම පිණිස ආර්‍යමාර්ගය වදරණ ලද්දේ ය. එසේ කල නුඹ වහන්සේ 'ඒ නිර්වාණය අහෙතුජ ය' යි කියා මෙසේ වදරණ සේකැ'' යි කීහ. ''සැබව, මහරජානෙනි, අප භාග්‍යව න් වහන්සේ විසින් නොයෙක් සියගණන් කාරණයෙන් ශ්‍රාවකයන්ට නිර්වාණයාගේ සිඬ කිරීම පිණිස ආර්‍යමාර්ගය වදරණ ලද්දේ ය. නිර්වාණයාගේ උපදවා ලීම පිණිස හෙතුයෙක් නො වදරණ ලද'' යි වදළසේක.

'ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් අර්ථයෙක්හි නුඹ වහන්සේ 'අමෘතමහානිර්වාණයාගේ සිඬ කිරීම පිණිස ආර්‍යමාර්ග සංඛ්‍යාත වූ හෙතුයෙක් ඇත්තේ ය. ඒ නිර්වාණධර්මයාගේ වනාහි උපදවා ලීම පිණිස හෙතුයෙක් නැතැ'යි කියා වදළ මේ අර්ථයෙහි අපි මූළා ව අන්ධකාරයකින් බලවත් අන්ධකාරයකට පැමිණියම්හ. වනාන්තරයකින් මහාවනාන්තරයකට පැමිණියම්හ. මහාවනගහනයකින් අධිකතර වූ වනගහනයකට පැමිණියම්හ. ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නිර්වාණයාගේ සාක්ෂාත් කිරීම පිණිස හෙතුයෙක් ඇත් නම්, ඒ කාරණ යෙන් නිර්වාණයාගේ ද උපදවා ගැණීම පිණිස හෙතුයෙකුත් කැමැති විය යුත්තේ ය. වුවමනා වන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් සේ පුත්‍රයක්හට පිතෘකෙනෙක් ඇත්තාහ. ඒ කාරණයෙන් පියානන්හටත් පිතෘකෙනෙකුත් කැමැති විය යුතු වන්නේ ය. යම් සේ අන්තෙවාසිකයා හට ගුරුකෙනෙක් ඇත්තාහු ද, ඒ කාරණයෙන් ගුරුවරයාහටත් ගුරු කෙනෙක් ඇතැ යි කියා කැමැති විය යුත්තේ ය. යම් සේ අංකුර සංඛ්‍යාත වූ දළුව නැගීමට බීජයෙක් ඇත්තේ ය. ඒ කාරණයෙන් බීජයටත් බීජයක් කැමැති විය යුත්තේ ය. එපරිද්දෙන් ම, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉදින් නිර්වාණයාගේ සිඬ කිරීම පිණිස හෙතුයෙක් ඇත්තේ වී නම්, ඒ කාරණයෙන් අමෘතමහානිර්වාණයාගේ ද උපදවාලීම පිණිස හෙතුයෙකුත් කැමැති විය යුත්තේ ය. උවමනා වන්නේ ය. යම් සේ වෘක්ෂයක හෝ ලියක හෝ මුදුන් දළුව ඇති කල්හි ඒ කාරණයෙන් මධ්‍යයක් ඇත්තේ ය. මුලත් ඇත්තේ ය. එපරිද්දෙන් ම ස්වාමීනි, නාග-

සෙනයන් වහන්ස, ඉදින් නිර්වාණයාගේ සිඬ කිරීම පිණිස හෙතුයෙක් ඇත්තේ වී නම්, ඒ කාරණයෙන් අමෘතමහානිර්වාණයාගේ උපදවා ගැණීම පිණිස ද හෙතුයෙක් කැමැති විය යුත්තේ ය. ඇතැ යි කියා සැලකිය යුත්තේ ය'' යි කීහ. ''මහරජාණෙනි, අමෘතමහානිර්වාණය උපදවාලිය හැකි දෙයෙක් නො වන්නේ ය. එහෙයින් නිර්වාණයාගේ උත්පාදය පිණිස හෙතුයෙක් බුදුන් විසින් නො වදරණ ලද'' යි වදාළසේක. ''එසේ ය, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කාරණයක් දක්වා නිර්වාණයාගේ සිඬ කිරීම පිණිස හෙතුයෙක් ඇත. 'නිර්වාණයාගේ **(327)** උපදවා ගැණීම පිණිස හෙතුයෙක් නැතැ' යි කියා යම් පරිද්දෙකින් මම දැන ගණිම් ද, එසේ වූ කාරණයකින් මට අවබොධ කරවා වදාළ මැනැව''යි කීහ.

''මහරජාණෙනි, එසේ වී නම්, තෙපි ශ්‍රොත්‍රය සකස් කොට යොමු කරව. යහපත් කොට ම අසා ගණුව. එහි කාරණයක් කියන්නෙමි. මහරජාණෙනි, පුරුෂයෙක් තමාගේ ප්‍රකෘති වූ ශරීරබලයෙන් මේ සාගල් පුරය පටන් හිමාලයපර්වතයට යන්නට හැකි වේ ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, යන්නට හැකි වන්නේ ය'' යි කීහ. ''මහ-රජාණෙනි, ඒ පුරුෂතෙම තමාගේ ප්‍රකෘති වූ බලයෙන් ඒ තුන්දහසක් යොදුන් පළල ඇති හිමාලයපර්වතරාජයා මේ සාගල්පුරයට ගෙණෙන්ට හැකි වේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, එසේ නො හැකි වන්නේ ය''යි කීහ. මහරජාණෙනි, එපරිද්දෙන් ම නිර්වාණයාගේ සිද්ධ කිරීම පිණිස මාර්ගය කියන්නට හැකි වන්නේ ය. නිර්වාණයාගේ උපදවා ලීම පිණිස කාරණයක් දක්වන්නට නො හැක්කේ ය. මහරජාණෙනි, පුරුෂයෙක් ප්‍රකෘති වූ බලයෙන් මහාසමුද්‍රය නැවින් එතර ව පරතෙරට යන්නට හැකි වේ ද?'' යි විචාළසේක. එසේ ය, වහන්ස, හැකි වන්නේ ය'' යි කීහ. ''මහරජාණෙනි, ප්‍රකෘති වූ බලයෙන් ඒ පුරුෂතෙම මහාසමුද්‍රයාගේ පරතෙර මේ සාගල්පුරයට ගෙණෙන්නට හැකි වේ ද?'' යි විචාළසේක. නො හැක්ක, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජාණෙනි, එපරිද්දෙන් ම නිර්වාණයාගේ සිද්ධ කිරීම පිණිස මාර්ගය කියන්නට හැකි වන්නේ ය. නිර්වාණයාගේ උපදවා ගැණීම පිණිස හෙතුයෙක් දක්වන්නට නො හැක්කේ ය. ඊට කාරණා කවරේ ද? යත්— නිර්වාණධර්මයාගේ අසංඛත බැවිනැ'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ අමෘත මහානිර්වාණය කිසි කුශලාකුශල හෙතුවකින් නුපන්නා වූ අසංඛතධර්ම-යෙක් ද'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජාණෙනි, ඒ අමෘතමහා නිර්වාණය කුශලාකුශලකර්මයකින් නුපන් බැවින් ද වෘක්ෂලතාදීන් මෙන් හෙතුවකින් නුපන් බැවින් ද පෘථිවි මෙරු යුගන්ධරාදීන් මෙන් ඍතුවකින් නුපන් බැවින් ද අසංඛත නම් වී ය. වාණසංඛ්‍යාත වූ තෘෂ්ණාව කෙරෙන් ඉක්ම සිටි බැවින් නිර්වාණය නම් වී ය. ශක්‍රබ්‍රහ්මාදි කිසි කෙනෙකුන් විසින් නිර්මිත ද නො කරණ ලද්දේ ය. මහරජාණෙනි, නිර්වාණය උපන්නේ ය යි කියා හෝ නුපන්නේ ය යි කියා හෝ

*Non-Commercial Distribution*

උපදනේ ය යි කියා හෝ අතීත ය යි කියා හෝ අනාගත ය යි කියා හෝ වර්තමාන ය යි කියා හෝ චක්ඛුවිඤ්ඤෙය්‍ය ය යි කියා හෝ සොතවිඤ්ඤෙය්‍ය ය යි කියා හෝ ඝාණවිඤ්ඤෙය්‍ය ය යි කියා හෝ ජිව්හාවිඤ්ඤෙය්‍ය ය යි කියා හෝ කායවිඤ්ඤෙය්‍ය ය යි කියා හෝ නො කිය යුත්තේ ය'' යි වදාළසේක. ''ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නිර්වාණය උපන්නේත් නො වේ නම්, නූපන්නේත් නොවේ නම්, උපදනේත් නො වේ නම්, අතීතත් නො වේ නම්, අනාගතත් නො වේ නම්, වර්තමානත් නො වේ නම්, ඇසින් දත යුතු වූ චක්ඛුවිඤ්ඤෙය්‍යයකුත් නො වේ නම්, සොතයෙන් දත යුතු වූ සොතවිඤ්ඤෙය්‍යයකුත් නො වේ නම්, ඝාණයෙන් දත යුතු වූ ඝාණවිඤ්ඤෙය්‍යයකුත් නො වේ නම්, දිව්න් දත යුතු වූ ජිව්හා විඤ්ඤෙය්‍යයකුත් නො වේ නම්, කයින් දත යුතු වූ කායවිඤ්ඤෙය්‍යයකුත් නො වේ නම්, එහෙයින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ නැති ස්වභාව වූ නිර්වාණයක් වදරණසේක. නුඹ වහන්සේ ඒ නිර්වාණය 'නිර්වාණය' යි එකවන් කියනසේක. ඉතිකින් නිර්වාණ නැතැ'' යි කීහ.

(328) **''අත්ථි මහාරාජ, නිබ්බානං, මනොවිඤ්ඤෙය්‍යං නිබ්බානං විසුද්ධෙන මානසෙන පණීතෙන උජුකෙන අනාවරණෙන නිරාමිසෙන සම්මාපටිපන්නො අරිය සාවකො නිබ්බානං පස්සති.''**

''මහරජාණෙනි, නිර්වාණය ඇත. නිර්වාණය මනසින් දත යුතු වූ මනොවිඤ්ඤෙය්‍ය වන්නේ ය. ආර්යඅෂ්ටාංගිකමාර්ගයෙන් මනා කොට පිළිපන්නා වූ ආර්යශ්‍රාවකයන් වහන්සේ විශුද්ධ වූ ප්‍රණීත වූ ඍජු වූ අවිද්‍යාවරණ විරහිත වූ තෘෂ්ණාමිෂ විරහිත වූ අර්හත්ඵලමානසින් අමෘතමහා නිර්වාණය දක්නාසේකැ''යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, උපමා විසින් දක්විය යුතු වූ විද්‍යාමාන වූ ඒ නිර්වාණය වනාහි කෙබඳු ද? ඇති ස්වභාව වූ නිර්වාණය යම් යම් ප්‍රකාරයකින් උපමා විසින් දක්විය යුතු වේ ද, ඒ ඒ ප්‍රකාරයෙන් මට කාරණා විසින් අභවා වදාළ මැනැවැ''යි කීහ.

**''අත්ථි මහාරාජ වාතො නාමාති. ආම භන්තෙ. ඉඞ්ඝ මහාරාජ, වාතං දස්සෙහි වණ්ණතො වා සණ්ඨානතො වා අණුං වා ථූලං වා දීඝං වා රස්සං වා ති, න සක්කා භන්තෙ, නාගසෙන වාතං උපදස්සයිතුං. න සො වාතො හත්ථගහණං වා නිම්මද්දනං වා උපෙති. අපි ච අත්ථි සො වාතොති. යදි මහාරාජ, න සක්කා වාතො උපදස්සයිතුං, තෙන හි නත්ථි වාතොති. ජානාමහං භන්තෙ නාගසෙන වාතො. අත්ථි මෙ හදයෙ අනුපවිට්ඨං න චාහං සක්කොමි වාතං උපදස්සයිතුන්ති. එවමෙව ඛො මහාරාජ අත්ථි නිබ්බානං. න සක්කා නිබ්බානං උපදස්සයිතුං වණ්ණෙන වා සණ්ඨානෙන වා'' යි.**

Non-Commercial Distribution

"මහරජානෙනි, වාතය නම් ඇද්ද?" යි විචාළසේක. "එසේ ය, ස්වාමීන් වහන්ස, ඇතැ" යි කීහ. "මහරජානෙනි, එසේ වී නම් ඒ වාතය මට තෙපි නීලපීතාදි වර්ණයකින් හෝ සණ්ඨානයකින් හෝ ක්ෂුද්‍ර ය යි කියා හෝ ස්ථූල ය යි කියා හෝ දීර්ඝය යි කියා හෝ හ්‍රස්ව ය යි කියා හෝ දක්වා ලව"යි වදාළසේක. "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස 'වාතය මෙබඳු ය' යි කියා දක්වන්නට නො හැක්කේ ය. ඒ වාතය හස්ත ග්‍රහණයට හෝ මර්දනය කොට අල්වා ගැණීමට හෝ නො පැමිණෙන්නේ ය. එසේ ද වුවත් වාතය ඇතැ" යි කීහ. "ඉදින් මහරජානෙනි, වාතය දක්වාපියන්ට නො හැක්කේ වේ ද, එහෙයින් ම වාතය නැද්ද?" යි විචාළසේක. "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මම වාතය ඇතැ යි කියා ම දන්නෙමි. මාගේ හෘදයෙහිත් පිහිටා පවත්නේ ය. ශරීරයෙහිත් වැද යන්නේ ය. මහාවනාන්තරයන් ද අඹරවා ගෙණ යන්නේ ය. මම ඒ වාතය දක්වා පියන්නට නො හැක්කෙමි" යි කීහ. "මහරජානෙනි, එපරිද්දෙන් ම අමෘතමහානිර්වාණයත් ඇත්තේ ම ය. මහරජානෙනි, අනන්තලොකධාතුවෙහි ඇති තාක් දුක් ඉක්ම සිටියා වූ අනන්තලොක ධාතුවෙහි ඇති තාක් සියලු සැපතින් අග්‍ර ව සිටියා වූ ඒ අමෘතමහානිර්වාණය වර්ණයකින් හෝ ලක්ෂණාදිසණ්ඨානයකින් හෝ මෙබඳු ය යි කියා දක්වන්නට නො හැක්කේ ය" යි වදාළසේක. "සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පස්වාදහසක් හවුරුදු මුළුල්ලෙහි පණ්ඩිතජන මනොනන්ද**(329)** නය කෙරෙමින් නුඹ වහන්සේ විසින් සුන්දරතර උපමා සුන්දර කොට ම දක්වන ලද්දේ ය. විදුරෙන් විදුර විදින්නාක් මෙන් ඊට ම නිසි වූ කාරණා ම මනා කොට දක්වන ලද්දේ ය. ඒ අමෘතමහා නිර්වාණය ඇත්තේ ම ය. මෙසේ මේ ප්‍රශ්නයත් එසේ ම මම පිළිගන්-නෙමි" යි කියා ප්‍රශංසා කළහ.

**නිර්වාණවිමතිච්ඡේදනප්‍රශ්නය නිමි.**

---

# නිර්වාණාකාශොපමා ප්‍රශ්නය

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ලොකයෙහි කර්මජයෝ කවුරු ද? හෙතුජ වූවෝ කවුරු ද? ඍතුජ වූවෝ කවුරු ද? අකර්මජ වූවෝ කවුරු ද? අහෙතුජ වූවෝ කවුරු ද? අනුතුජ වූවෝ කවුරු ද?" යි විචාළෝ ය.

**"යෙ කෙචි මහාරාජ සත්තා සචෙතනා සබ්බෙ තෙ කම්මජා, අග්ගී ච සබ්බානි ච බීජජාතානි හෙතුජානි. පඨවී ච පබ්බතා ච උදකඤ්ච වාතො ච සබ්බෙ තෙ උතුජා. ආකාසො ච නිබ්බාණඤ්ච ඉමෙ අකම්මජා. අහෙතුජා. අනුතුජා" ති.**

*Non-Commercial Distribution*

''මහරජානෙනි, චතුරපායපර්යාපන්නයන් හා මනුෂ්‍යයන් හා දිව්‍ය-බ්‍රහ්මයන් හා අරූපීන් හා ඇතුළු වූ යම්කිසි සත්වකාය පර්යාපන්න වූ සචෙතනික වූ සත්වකෙනෙක් ඇද් ද, ඒ සියලු සත්වයෝ ම කුශලාකුශල කර්මයෙන් උපන් හෙයින් කර්මජයෝ ය. වහ්නිය හා සියලු ම බීජ ජාතීහු හෙතුයෙන් උපන් හෙයින් හේතුජයෝ ය. පෘථිවිය හා පර්වතයන් හා ජලය හා වාතය ද යන මේ සියල්ල සෘතුයෙන් උපන් බැවින් සෘතුජයෝ ය. ආකාශය ද නිර්වාණය ද යන මේ දෙදෙන අකර්මජ වූහ. අහෙතුජ වූහ. අනුතුජ වූහ. මහරජානෙනි, නිර්වාණය වනාහි කර්මජ ය යි කියා හෝ හෙතුජ ය යි කියා හෝ සෘතුජ ය යි කියා හෝ උපන්නෝ ය යි කියා හෝ නුපන්නෝ ය යි කියා හෝ උපදනෝ ය යි කියා හෝ අතීත ය යි කියා හෝ අනාගත ය යි කියා හෝ වර්තමාන ය යි කියා හෝ චක්ඛුවිඤ්ඤෙය්‍ය ය යි කියා හෝ සොතවිඤ්ඤෙය්‍ය ය යි කියා හෝ ඝාණවිඤ්ඤෙය්‍ය ය යි කියා හෝ දිවට දැනෙන්නෝ ය යි කියා හෝ කායවිඤ්ඤෙය්‍ය ය යි කියා හෝ, නො කිය යුත්තේ ය. මහරජානෙනි, එතෙකුදු වුවත් ඒ අමෘතමහා නිර්වාණය සිතට දැනෙන්නා වූ මනොවිඤ්ඤෙය්‍ය ය නම් වන්නේ ය. මනා කොට පිළිපන්නා වූ ඒ ආර්යශ්‍රාවකයන් වහන්සේ යම් මේ අමෘත මහානිර්වාණය විසුද්ධ වූ ඥාණයෙන් දක්නාසේකැ'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්නය අතිරමණීය වූයේ ය. විශෙෂයෙන් ම විනිශ්චයකරණ ලද්දේ ය. නිස්සංක කරණ ලද්දේ ය. ඒකාන්තයට පැමිණියේ ය. සර්වගණීන්ද්‍රවර ප්‍රවර වූ නුඹ වහන්සේ කරා පැමිණ මාගේ කාංක්ෂා සිඳී ගියේ ය'' යි කීහ.

**නිර්වාණාකාශොපමාප්‍රශ්නය නිමි.**

---

# යක්ෂ ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ලොකයෙහි යක්ෂයෝ නම් වූ සත්වකෙනෙක් ඇද්ද?'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජානෙනි, ලොකයෙහි යක්ෂයෝ නම් වූ සත්වකෙනෙක් ඇතැ'' යි වදාළසේක. ''ස්වාමීනි, ඒ යක්ෂයෝ **(330)** ඒ යක්ෂයෝනියෙන් චුත වෙද්ද?'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජානෙනි, ඒ යක්ෂයෝ ඒ යක්ෂයොනියෙන් චුත වන්නාහු ය'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙන ස්ථවිරයන් වහන්ස, කාලක්‍රියා කළා වූ ඒ යක්ෂයන්ගේ මෘතශරීර කුමක් පිණිස වනාහි නො දක්නා ලැබේ ද? දුර්ගන්ධය ද නො පැතිරෙන්නේ කිම් ද?''යි විචාළෝ ය. ''මහරජානෙනි, මළා වූ යක්ෂයන්ගේ මෘතශරීරත් දක්නා ලැබෙයි. ඔවුන්ගේ කුණපගන්ධයත් හමන්නේ ය. මහරජානෙනි, මළා වූ යක්ෂයන්ගේ මෘතශරීර කටුසු වර්ණයෙන් හෝ දක්නා ලැබෙයි. නොයෙක් පණුවර්ණයකින් හෝ දක්නා ලැබෙයි. කුහුඹුවර්ණයකින් හෝ දක්නා ලැබෙයි. පළහැටිවර්ණයකින් හෝ දක්නා ලැබෙයි. නයි

වර්ණයකින් හෝ දක්නා ලැබෙයි. ගෝනුසුවර්ණයකින් හෝ දක්නා ලැබෙයි. පත්තැවර්ණයකින් හෝ දක්නා ලැබෙයි. පක්ෂිවර්ණයකින් හෝ දක්නා ලැබෙයි. මෘගසංඛ්‍යාත වූ සිවුපාවර්ණයකින් හෝ දක්නා ලැබෙ'' යි කියා වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ වැනි වූ ප්‍රඥවත් කෙනෙකුන් වහන්සේ හැර මේ ප්‍රශ්නය විචාරණ ලද්ද වූ අනික් කවරෙක් නම් විසර්ජනය කරන්නේ ද?'' යි කියා ප්‍රශංසා කළහ.

**යක්ෂප්‍රශ්නය නිමි.**

---

# සර්වඥසෘෂිප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් සෘෂිවර කෙනෙක් චිකිත්සා කාරයන්ට පූර්වංගම වූ ද ආචාර්ය වූවාහු ද, හේ කවරේ ද? යත්— **නාරද** නම් සෘෂි ය, **ධන්වන්තරී** නම් සෘෂි ය, **අංගීරස** නම් සෘෂි ය, **කපිල** නම් සෘෂි ය, **කණ්ඩරග්ගී** නම් සෘෂි ය, **සාම** නම් සෘෂි ය, **අතුල** නම් සෘෂි ය, **පූර්වකාත්‍යායන** නම් සෘෂි ය, මෙ කී පූර්වාචාර්යවරයෝ එකවර ම රොගුප්පත්තිය ද නිදානය ද ස්වභාවය ද සමුට්ඨානය ද චිකිත්සාව ද ක්‍රියාව ද සාද්ධ්‍යාසාද්ධ්‍යබව ද යන ඒ සියල්ල ම නිරවශෙෂ කොට තමන්ගේ ඥාණයෙන් දැන මේ මනුෂ්‍යශරීරයෙහි මෙපමණ වූ අටඅනූවක් රොග නවානූවක් ව්‍යාධි උපදනේ ය යි කියා එක පහරින් ම කලාපග්‍රහණය කොට ශ්ලොක බැන්දහු ය. මෙ කී සියලු සෘෂිවරයෝ ම අසර්වඥවරයෝ ය, එසේ කල සර්වඥ වූ බුදුරජානන් වහන්සේ අනාගතයෙහි ශාසනයෙහි වන නපුරුක්‍රියාවන් බුද්ධඥනයෙන් බලා දැන වදරමින් මෙපමණ වූ නො සරුප් වස්තුයෙහි මෙපමණ වූ ශික්ෂාපද පැණවිය යුතු වන්නේ ය යි කියා කුමක් පිණිස පිරිසිඳ නිරවශෙෂවශයෙන් ශික්ෂාපද නො පණවා වදළ සේක් ද? උපනුපන් නො සරුප් වස්තුයෙහි අයස ප්‍රසිද්ධ වූ කල්හි දෙෂය විස්තාර වූ කල්හි අයස මහත් ව ගිය කල මනුෂ්‍යයන් බොහෝ කොට නින්ද කළ කල ඒ ඒ කාලයෙහි ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවා වදළ සේක් ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, මේ ජිනෙන්ද්‍රශාසන කාලයෙහි මේ මනුෂ්‍යයන් කෙරෙහි සාධික වූ එසියපණසක් ශික්ෂාපද පැණවිය යුතු වන්නේ ය යි කියා අප තථාගතයන් වහන්සේ විසින් මේ කාරණය දැන වදරණ ලද්දේ ය. එතෙකුදු වුවත් තථාගතයන් වහන්සේට මෙබඳු වූ සිතෙක් වූයේ ය. **(331)** ඉදින් මම සාධික වූ එසියපණසක් ශික්ෂාපද එක පහරින් ම පණවා ලන්නේ වීම් නම්, මහාජනතෙම 'අහෝ! මේ ශාසනයෙහි බොහෝ දෙයක් රැක්ක යුතු වන්නේ ය. **ශ්‍රමණ භවත් ගෞතමයන්** වහන්සේගේ ශාසනයෙහි පැවිදි වන්නට එකාන්තයෙන් ම ඉතා දුෂ්කර වන්නේ ය' යි සිතා භයට පැමිණෙන්නේ ය. පැවිදි වනු කැමැත්තාහු ද නො පැවිදි වෙති. අප්‍රමාද ව ශීලය රක්ෂා කරව, කියන්නා වූ මාගේ වචනය ද නො අදහති. මාගේ අප්‍රමාදධර්මය

නො අදහන්නා වූ ඒ මනුෂ්‍යයෝ ද අප්‍රමාදධර්මයට ගෞරව නො කොට අපායගාමී වෙති. උපනුපන් නො සරුප් කාරණයෙහි නැවැත නො කරවයි කියා ධර්මදෙශනා කිරීමෙන් අභවා දෙෂය ප්‍රසිද්ධ වූ කල්හි ශික්ෂාපද පණවාලමි යි සිතා වදරා පැමිණි පැමිණි කාරණයෙහි ශික්ෂාපද පැණවූසේකැ''[1] යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස. බුදුවරයන්ගේ සර්වඥතාඥනය ඉතා ආශ්චර්ය ය. ස්වාමීනි, නාගසෙනන් වහන්ස, බුදුවරයන්ගේ ඥනය ඉතා අද්භූත ය. අප තථාගතයන් වහන්සේගේ සර්වඥතාඥනය යම්තාක් ඉතා මහත් වී ද, ඒ තාක් බුදු වරයෝ ම මීස කවුරු දනිද් ද? ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, වදළ කාරණය ඒ එසේ ම ය. මේ අර්ථයතෙම තථාගතයන් වහන්සේ විසින් මනා කොට ම දන වදරණ ලද්දේ ය. 'නවකෙළදහස් එක්සිය අසූකෙළ පණස්ලක්ෂ සතිස් සංවරයක් වූ බැවින් මේ බුද්ධශාසනයෙහි බොහෝ වූ ශික්ෂාවෝ රැක්ක යුතු ය' යි අසා මනුෂ්‍යයන්ට භය උපදනේ ය. එක ම ශ්‍රද්ධාවතෙකු දු ජිනශාසනයෙහි පැවිදි නො වන්නේ ය. මෙසේ මේ ප්‍රශ්නයත් මම එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**සර්වඥසාක්ෂිප්‍රශ්නය නිමි.**

---

# සූර්‍ය්‍යොපතාපකලශ ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ **සූර්යදිව්‍යරාජතෙම** සර්ව කාලයෙහි ම තද ව දිලියේ ද? නොහොත් මඳක්කල් මඳ ව දිලියේ දූ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, සූර්යදිව්‍යරාජතෙම සර්වකාලයෙහි ම ක්‍රෑර ව දිලියෙන්නේ ය. මඳක් කල් වත් මඳ ව නො දිලියෙන්නේ ය. **මහාමෙරුපර්වතය** වටා පිහිටියා වූ **යුගන්ධරපර්වතය** භූමිය පටන් දෙසාළිස්දහසක් යොදුන් උස ඇත්තේ ය. යුගන්ධරපර්වතය පටන් සක්වළ ගල දක්වා මෙරට හාත්පසින් **චාතුර්මහාරාජිකය** පිහිටියේ ය. එහි අනන්ත වූ උද්‍යාන විමාන කල්පවෘක්ෂාදියෙන් සැදුම් ලත් **අජවීථිය** **නාගවීථිය** **ගොවීථිය** ය යි යන වීථිත්‍රයයෙහි සප්තවිංසතිනක්ෂත්‍ර තාරකාවන් පිරිවරා **චන්ද්‍රසූර්යදෙදෙන** නිති හැසිරෙති. සූර්යදිව්‍යපුත්‍ර තෙම චන්ද්‍රවිමානයට යොදුනක් මත්තෙන් යනුයේ ක්‍රමයෙන් සරස ගමන් වඩ වඩා **ඇසළමස** පටන් සමසක් මහමෙර පටන් චක්‍රවාටපර්වතය සමීපයට යන්නේ ය. **පුසේනැකතලත්** **දුරුතුමාසේ** පටන් සමාසයක් චක්‍රවාටපර්වත සමීපය පටන් මහාමෙරුපර්වතය සමීපයට යන්නේ ය. චන්ද්‍රසූර්යදෙදෙන **අජවීථියෙහි** ගමන් යන කල මිනිස්ලොවට වැසි නො වස්නේ ය. **නාගවීථියෙහි** ගමන් යන කල වැසි බොහෝ වස්නේ ය. **ගොවීථියෙහි** ගමන් යන කල වැසි මධ්‍යමාකාරයෙන් වස්නේ ය. ඍතු සම ව පවත්නේ ය. **චන්ද්‍රවිමානය** උසින් එකුන් පණස්යොදුන. හාත්-පසින් වට තුන් යොදුනකින් අඩු වූ එසියපණස් යොදුන. **(332)** ඇතුළ

1. පණවා

*Non-Commercial Distribution*

ස්ඵටික මාණික්‍යමය ය. පිටත රිදීමය ය. උභයපාර්ශ්වයෙන් ම සිහිල් ගුණය ඇත්තේ ය. සූර්යවිමානය උසින් පණස්යොදුන. හාත්පසින් වට එසියපණස් යොදුන. ඇතුළත ස්වර්ණමය ය. පිටත ඵළිකමය ය. උභයපාර්ශ්වයෙන් ම උෂ්ණ ඇත්තේ ය. චන්ද්‍රතෙම ඍජු ව යන ගමන් පමා ව යන්නේ ය. සරස යන ගමන් ශීඝ්‍ර ව යන්නේ ය. සූර්යදිව්‍යපුත්‍රතෙම ඍජු ව යන ගමන් ශීඝ්‍ර ව යන්නේ ය. සරස යන ගමන් පමා ව යන්නේ ය. සූර්යදිව්‍යපුත්‍රතෙම කළුවර පොහොය අතික්‍රාන්ත වූ කල පැළවිය දවස් චන්ද්‍රමණ්ඩලය ලක්ෂයක් ලක්ෂයක් යොදුන් තැන් පසු කොට යන්නේ ය. එකල චන්ද්‍රමණ්ඩලය රෙඛාවක් මෙන් පෙනෙන්නේ ය. දියවක් දවස්හි දු ලක්ෂයක් යොදුන් පසු කොට යන්නේ ය. මෙම ක්‍රමයෙන් වැඩී අටවක්දවස චන්ද්‍රමණ්ඩලයෙන් අර්ධයක් පෙණෙන්නේ ය. උපරිමඅර්ධය සූර්යරශ්මියෙන් වැසී නො පෙනෙන්නේ ය. පසළොස්වක් පොහොයදවස් සූර්දිව්‍යරාජතෙම පසළොස් ලක්ෂයක් යොදුන් පසු කොට යන්නේ ය. එකල චන්ද්‍රමණ්ඩලය සූර්යරශ්මිය වැළකීමෙන් වැඩී සම්පූර්ණ වන්නේ ය. නැවැත අවපැළවිය දවස ලක්ෂයක් යොදුන් දිව ගොස් ලං වන්නේ ය. එකල චන්ද්‍රමණ්ඩලය සූර්යරශ්මියෙන් රෙඛාමාත්‍රයෙක් වැසී නො පෙණෙන්නේ ය. දෙවෙනි දවස්හි දු ලක්ෂයක් යොදුන් තැන් දිවගොස් ලං වන්නේ ය. මෙම ක්‍රමයෙන් කාලපක්ෂ උපොසථ දවස්හි පසළොස් ලක්ෂයක් යොදුන් දිව ගොස් චන්ද්‍රයා හා සමග ගමන් යන්නේ ය. චන්ද්‍රමණ්ඩලය ද අනුක්‍රමයෙන් කලාවෙන් කලාව පිරිහී කළුවරපොහෝ දවස්හි සූර්යවිමානයාගේ අධොභාගයට පැමිණ හිරු හා සම ව යනුයේ සූර්යතෙජසින් මඳකුත් නො පෙණෙන්නේ ය. මෙසේ භූමියට දෙසාළිස්දහසක් යොදුන් මත්තෙහි ආකාශස්ථ වූ කනකවිමානයෙන් හැසිරෙන්නා වූ සූර්යදිව්‍යපුත්‍රතෙම එකපහරින් තුන් දිවයිනක ඝනාන්ධකාරය විධමනය කෙරෙමින් බබළන්නේ ය. මේ දඹදිවට යම් කලෙක හිරු උද වේ නම්, එකල පූර්වවිදෙහයට හිරුමුදුන් වූ මධ්‍යාහ්නකාලය වන්නේ ය. උතුරුකුරුදිවයිනට හිරු අස්තංගත වන්නේ ය. අපරගොයානයට අර්ධරාත්‍රිය වන්නේ ය. යම් කලෙක අපරගොයානයට හිරු උද වේ නම් එකල මේ ජම්බුද්වීපයට හිරු මුදුන් වූ මධ්‍යාහ්න කාලය වන්නේ ය. පූර්වවිදෙහයට හිරු අස්තංගත වන්නේ ය. උතුරුකුරුදිවයිනට අර්ධරාත්‍රිය වන්නේ ය. එයින් කීහ:—

**ඉමම්හි දීපම්හි යදා උදෙති-මජ්ඣන්තිකො හොති විදෙහදීපෙ,**
**කුරූන දීපම්හි ච අත්ථමෙති-ගොයානදීපෙ භවතඩ්ඪරත්ති.**
**ගොයානදීපම්හි යදා උදෙති-මජ්ඣන්තිකො හොති ච ජම්බුදීපෙ,**
**විදෙහදීපම්හි ච අත්ථමෙති-කුරූනරට්ඨම්හි ච අඩ්ඪරත්ති.''**

''මෙසේ සූර්යමණ්ඩලය සර්වකාලයෙහි ම දෙසාළිස්දහසක් යොදුන් උස ඇති ව චක්‍රවාටපර්වතය අවසන් කොට සතරමහදිවයින ඝනාන්ධකාරය විධමනය කෙරෙමින් දිලියෙන්නේ ය'' යි වදළසේක. ''ඉදින්,

*Non-Commercial Distribution*

ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සූර්යදිව්‍යරාජතෙම සර්වකාලයෙහි ම දැඩි ව දිලියේ නම්, කුමක් පිණිස වනාහි සමහර දවසෙක සූර්යදිව්‍යරාජ තෙම ක්‍රෑර ව **(333)** දිලියේ ද? සමහර දවසෙක කාන්ති මඳ ව දිලියේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, සූර්යදිව්‍යරාජයාහට මේ රොගයෝ සතරදෙනෙක. යම් මේ රොගයන් සතරදෙනාගෙන් එක්තරා රොගයකින් පෙළන ලද්ද වූ සූර්යදිව්‍යරාජතෙම මඳ ව දිලියේ ද, ඒ කවර නම් සතර දෙනෙක් ද? යත්— මහරජානෙනි, වලාකුළු සූර්යාහට එක් රොගයෙක. ඒ රොගයෙන් පෙළන ලද්ද වූ සූර්යදිව්‍යරාජතෙම රැස් මඳ ව දිලියෙන් නේ ය. මහරජානෙනි, භූමියෙන් නඟින්නා වූ මහිකා නම් ධූමය සූර්යයාහට එක් රොගයෙක. ඒ රොගයෙන් පෙළන ලද්ද වූ සූර්යදිව්‍ය රාජතෙම මඳ ව දිලියෙන්නේ ය. මහරජානෙනි, මෙඝය සූර්යයාහට එක් රොගයෙක. ඒ රොගයෙන් පෙළන ලද්ද වූ සූර්යදිව්‍යරාජතෙම මඳ ව දිලියෙන්නේ ය. මහරජානෙනි, **රාහුඅසුරෙන්ද්‍ර**තෙම සූර්යයාහට එක් රොගයෙක. ඒ රොගයෙන් පෙළන සූර්යදිව්‍යරාජතෙම මඳ ව දිලියෙන්නේ ය. මහරජානෙනි, මොවුන්ගෙන් එක්තරා රොගයකින් පෙළන ලද්ද වූ සූර්යදිව්‍යරාජතෙම මඳ ව දිලියේ ද, ඒ සූර්යදිව්‍යරාජයාහට මේ රොගයෝ සතරදෙන ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්නය විසඳා වදළ නියාව ඉතා ආශ්චර්ය ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, විසඳා වදළ පරිදි ඉතා අද්භූත වන්නේ ය. එක පහරින් තුන් දිවයිනක ඝනාන්ධකාරය විධමනය කරන්නා වූ මහත් වූ තෙජස් සම්පන්න වූ සූර්යදිව්‍යරාජයාහට පවා රොග උපදනේ ය. සෙසු සත්වයන්ට රොග උපදින බව කියනු ම කවරේ ද? ස්වාමීනි, නුඹ වහන්සේ සදෘශ වූ ප්‍රඥාවතුන් වහන්සේ කෙනෙකුන් විසින් වදරණ ලද්ද වූ මධුරතර අර්ථ බෙදීමෙක් මිස ඒ ඇර අනික් අල්පබුද්ධියකුහට මෙබඳු වූ ප්‍රඥාශක්තියෙක් නැතැ'' යි කියා ප්‍රශංසා කළහ.

**සූර්යොපක්ලේශප්‍රශ්නය නිමි.**

---

# ක්‍රෑරප්‍රභා ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, **කැතිනැකත** ලත් **හිල්මස** පෞර්ණමීපොහොය පටන් හෙමන්තඍතුයෙහි සූර්යදිව්‍යරාජතෙම කුමක් පිණිස ක්‍රෑර ව දිලියේ ද? **උතුරුපල්ගුණේ** නැකැත ලත් **මැදින්දින** පෞර්ණමී පොහොය පටන් ගිම්හානඍතුයෙහි එසේ නැතැ'' යි කීහ. ''මහරජා- නෙනි, ග්‍රීෂ්මඍතුයෙහි රජස්සමූහය ඌර්ධව අනුගත වන ලද වෙයි. වාතයෙන් කැළැඹෙන ලද්ද වූ දූවිලි ගගනානුගත වෙති. ආකාශයෙහි ද වලා ඉතා බහුල වන්නාහු ය. මහාවාතය ද ඉතා බලවත් ව හමන්නේ ය. රජොජල්ල දූවිලි වලා වාතය යන ඒ සියල්ල නොයෙක් රාශියෙන් යුක්ත වූවාහු සූර්යරශ්මීන් වසා ගණිති. ඒ කාරණයෙන් ග්‍රීෂ්මඍතුයෙහි සූර්යදිව්‍යරාජතෙම මඳ ව දිලියෙන්නේ ය. මහරජානෙනි, හෙමන්ත

*Non-Commercial Distribution*

සෘතුයෙහි යට පොළොව සන්හිඳෙන ලද වන්නේ ය. මත්තෙහි මහා මෙඝය පටන් ගන්නා ලද වන්නේ ය. භූමියෙහි රජොජල්ලය ශාන්ත වන ලද්දේ ය. රේණු සංඛ්‍යාත වූ ධූලිය ද ශාන්ත ශාන්ත ව අහසෙහි හැසිරෙන්නේ ය. ආකාශය පහ වූ වලා ඇති වන්නේ ය. වාතය ද මඳ මඳ ව හමන්නේ ය. රජොජල්ලය දූවිලි වලා වාතය යන ඒ උපක්ලේශයන්ගේ වැළකීමෙන් සූර්යරශ්මීහු පිරිසිදු වන්නාහු ය. උපද්‍රව යෙන් මිදුනා වූ සූර්යදිව්‍යරාජයාගේ තාපය ඉතා බලවත් **(334)** ව දිලියෙන්නේ ය. මහරජානෙනි, යම් කාරණයකින් සූර්යදිව්‍යරාජතෙම හෙමන්තසෘතුයෙහි ක්‍රූර ව දිලියේ ද, ගිම්හානසෘතුයෙහි එසේ නො දිලියේ ද, මේ මෙහි කාරණ ය'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සර්වොපද්‍රවයෙන් මිදුනා වූ සූර්යදිව්‍යරාජතෙම ක්‍රූරතර ව දිලියෙන්නේ ය. මෙඝාදි උපද්‍රව සහගත වූ සූර්යදිව්‍යරාජතෙම ක්‍රූර ව නො දිලියෙන්නේ ය. යහපත, ස්වාමීනි, එසේ ම පිළිගන්නෙමි' යි කීහ.

**ක්‍රූරප්‍රභාප්‍රශ්නය නිමි.**

**සකලජන මනොනන්දනීය වූ මේ ශ්‍රීසද්ධර්මාදසයෙහි සත්වන වර්ගය නිමියේ ය.**

---

# පුත්‍රදාන ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සියලු ම බොධිසත්වවරයෝ පුත්‍රදාරාවන් දන් දෙන්නාහු ද? නොහොත් **වෙස්සන්තර** නම් රජ්ජුරුවන් විසින් ම පුත්‍රදාරාවෝ දන් දෙන ලද්දෝ[1] දැ'' යි විචාළෝ ය. ''මහරජානෙනි, සියලු ම බොධිසත්වවරයෝ පුත්‍රදාරාවන් දන් දෙති. **වෙස්සන්තර** රජ්ජුරුවන් විසින් ම පුත්‍රදාරාවන් දන් දෙන ලද්දේ නො වේ'' යි කියා වදාළසේක. ''කිමෙක් ද, ස්වාමීන් වහන්ස, ඒ බොධිසත්වවරයෝ ඒ අඹුදරුවන්ගේ සම්මතයෙන් දෙන්නාහු දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ඒ **වෙස්සන්තර** රජ්ජුරුවන්ගේ භාර්යාව[2] 'මැනැවැ' යි කියා අනුදන්නා ලද්දී ය. ළඳබොළඳ වූ කුමාරවරු වනාහි ළදරු බැවින් 'අම්ම, පියානෙනි' යි යනාදීන් කියා බිණූහ. ඉදින් ඒ කුමාරවරු ද අර්ථ වශයෙන් දන්නාහු වූ නම්, ඔහුත් විලාප නො කියන්නාහු ය. 'යහපතැ'යි කියා ඒ කුමාරවරුත් අනුමොදත් වන්නාහු ය'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ **වෙස්සන්තර** නම් බුද්ධාංකුරයානෝ තමහට ද වූ ප්‍රියපුත්‍රයන් **ජූජක** නම් බමුණුහට දසමෙහෙවර පිණිස දුන්නාහු ය යි යන යම් ක්‍රියාවක් බොධිසත්වයන් විසින් කරණ ලද ද, ඒ ක්‍රියාව ඉතා දුෂ්කර වන්නේ ය. තවද, ඒ වෙස්සන්තර නම් බුද්ධාංකුරයානෝ තමාගේ ඉතා ළදරු වූ තරුණ වූ ප්‍රිය වූ ඖරසපුත්‍රයන් මහවැලකින් බැඳ දෙමින් ඒ **ජූජක** නම් බමුණා විසින් එම වැලින් අත් මර්දනය කොට වෙළන්නවුන් දැක උපෙක්ෂක[3] වූසේකැ යි යන යම් කාරණයක් ඇද්ද, මේ ඒ දෙවෙනි වූ

1. පුත්‍රදාරාවන් දන් දෙන ලද්දේ 2. භාර්‍ය්‍යාවෝ 3. උපෙක්ෂා

Non-Commercial Distribution

කාරණය ද දුෂ්කරයටත් වඩා දුෂ්කර වන්නේ ය. තවද ඒ වෙස්සන්තර නම් බුද්ධාංකුරයානෝ ස්වකීය වූ බලයෙන් ජූජකයාගේ බන්ධනයෙන් මිදී අත ගලවා ගෙණ ලහට ආවා වූ භයට පැමිණියා වූ දරුවන් එම වැලින් බැඳ දුන්සේකැ යි යන යම් කාරණයෙක් ඇද්ද, ඒ මේ තුන් වැනි කාරණය ද දුෂ්කරයෙනුත් දුෂ්කරතර වන්නේ ය. තවද, ඒ වෙස්සන්තර නම් බුද්ධාංකුරයානෝ කුමාර දෙදෙනා 'අහෝ! පියාණෙනි, මේ යක්ෂයා අප කා මරන්නට ගෙණ යන්නේ ය' යි කියකියා විලාප කියන කල්හි 'දෙදරුවෙනි, තෙපි නො බව' යි කියා අස්වසා නො වදළසේකැ 'යි යන යමක් ඇද්ද, ඒ මේ සතර වැනි දුෂ්කර කාරණය ද දුෂ්කරයෙනුත් අතිදුෂ්කර වන්නේ ය. තවද, ඒ වෙස්සන්තර නම් බුද්ධාංකුරයානෝ දෙපතුල හඬා වැටී 'පියාණෙනි, මා නැඟනියන් **කෘෂ්ණජිනාවන්** නවත්වාලුව මැනැව. **(335)** මේ යක්ෂයා මා කාපියා ද මේ යක්ෂයා හා සමග මම යන්නෙමි' යි යාච්ඤා කර සිටින්නා වූ දෙහොත් මුදුන් ගෙණ හඬන්නා වූ **ජාලියකුමාරයන්හට** එසේ මැනැවැ යි කියා නො පිළිගත්සේකැ යි යන යමක් ඇද්ද, ඒ මේ පස්වැනි වූ කාරණය ද දුෂ්කරයෙනුත් දුෂ්කරතර වන්නේ ය. තවද 'ඒ වෙස්සන්තර නම් බුද්ධාංකුරයානෝ 'පියාණෙනි, තෙල නුඹගේ හෘදය ඒකාන්තයෙන් ම ගලක් වැන්න. යම් බඳු වූ නුඹ වහන්සේ දුක්ඛිත වූ අප බලාහිඳිමින් මිනිසුන් නැති මහාවනාන්තරයෙහි යක්ෂයෙකු විසින් අප ගෙණ යන කල නො වළක්වනසේකැ' යි කියා විලාප කියන්නා වූ **ජාලියකුමාරයාහට** කිසි කරුණාවක් නො කළසේකැ'යි යන යමක් ඇද්ද, ඒ මේ සවන දුෂ්කරය ද දුෂ්කරයටත් වඩා අතිදුෂ්කරයෙක. තවද ඒ ජූජකයා විසින් කුමාරවරුන් ගෙණ ගිය කල්හි අදර්ශනයට ගිය පසු '**මද්‍රීන්** ඵලාඵල ගෙණ ආ කල කුමක් කියා අස්වසාලිය හෙම් දෝ හො'යි සිතා බියපත් ව පුත්‍රස්නෙහයෙන් හඬහඬා සිටියා වූ ඒ වෙස්සන්තර නම් බුද්ධාංකුරයානන්ගේ හෘදය සියක් කඩක් ව හෝ දහසක් කඩක් ව හෝ නො පැළුණේ ය යි යන යමක් ඇද්ද, ඒ මේ සත්වැනි වූ කාරණය වනාහි දුෂ්කරයෙනුත් දුෂ්කරතර වන්නේ ය. ස්වාමීනි, පින් කැමැත්තා වූ මනුජෙන්ද්‍රයා විසින් අනුන්ගේ සිතට කයට දුක් පමුණුවා ලීමෙන් කම් කිම් ද? තමන් සතු ධනධාන්‍ය ජීවිතය ආදි දනය දිය යුතු වන්නේ නො වේ ද?'' යි කීහ. ''මහරජාණෙනි, පෙර ගියදවස **සිවිරට ජයතුරානුවර** සඳමහරජානන් නිසා **ඵුසතිදේවීන්** කුස උපන් ශ්‍රීමහාබොධිසත්වයන් වහන්සේ මවු කුසින් බිහි වෙමින් ම මවුදේවීන් මුහුණ බලා 'අම්ම, දන් දිපියන්නට කිසිවෙක් ඇද්ද?' යි කියා දෙඅත දිගු කෙරෙමින් දනපාරමිතාවගේ පරිපූරණතාව පිණිස උපන් බව සකලලොකවාසීන්ට අභවා නොයෙක් කුමාරපෙරහරින් දිව්‍යකුමාරලීලායෙන් ශුක්ලපක්ෂාභිවර්ධනමානචන්ද්‍රමණ්ඩලානුකාරයෙන් . ක්‍රමයෙන් වඩනාසේක් පියරජ්ජුරුවන් විසින් නවවාරයෙක පලඳවාලූ නවලක්ෂයක් අගනා ස්වර්ණමාලාවන් කඩකඩා කිරිමවුන්ට දන් දෙමින් දනක්‍රීඩායෙන් අට අවුරුදු පිරුණු සඳ බාහිරවස්තු දන් දීමෙන් චිත්තය තෘප්තියට නො පැමිණ දිනෙක ප්‍රාසාදහි–

රුැස් ව බද්ධපර්යංකයෙන් හිඳ දනපරමාර්ථපාරමිතා චින්තනයෙන් සමස්තලොකවාසීන්ගෙන් නමස්කාර ලත්සේක. ඒ බව දක්වා වදරන්නාවූ තිලෝගුරු සර්වඥරාජොත්තමයානන් වහන්සේ **චර්යාපිටකයෙහි**:—

**'යදාහං දාරකො හොමි - ජාතියා අට්ඨවස්සිකො,**
**තදා නිසජ්ජ පාසාදෙ - දානං දාතුං විචින්තයිං.**
**හදයං දදෙය්‍යං චක්ඛුම්පි - මංසාපි රුධිරම්පි ච,**
**දදෙය්‍යං කායා සාවෙත්වා - යදි කොචි යාචයෙ මමං.**
**සභාවං චින්තයන්තස්ස - අකම්පිතමසණ්ඨිතං,**
**අකම්පි තත්ථ පුථුවී - සිනෙරුවනවටංසකා'** යි.

යන මෙයින් **කිඹුල්වත්**පුරයට වැඩි ගමනේ බුදු වූ බව නො දන 'අපට බාල වූ **සිද්ධාර්ථ**කුමාරයන් නො වඳුම්හ' යි කියා හුන් නෑයන්ගේ මාන මර්දනය සඳහා ආකාශයට සෘද්ධි වෙමින් දසදහසක් සක්වළ මෙර **(336)** මුදුන්හි මවාලූ රුවන්සක්මන්හි සර්වඥලීලාවෙන් සක්මන් කර වදරමින් දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මමාරමනුෂ්‍යනාගයක්ෂාදි සියලු සත්වයන්ට ම පෙණි පෙණී **චර්යාපිටකය** දෙශනාකරණසේක්, රුවන්සක්මන් කෙළවර නභාලූ ප්‍රදීපයක් සේ බුදුන් දසාවට වැඳුම් ගෙණ හුන් **ශාරිපුත්‍ර**ස්ථවිරයන් බණවා '**ශාරිපුත්‍ර**යෙනි, මෙම සර්වඥතාඥනය පිණිස ම පාරමිතාධර්මයන් පූරණය කරන්නෙමි, යම් කලෙක මම **වෙස්සන්තර**කුමාර වීම් ද, එදවස් ජාතියෙන් අටවයස් වූයෙමි, ප්‍රාසාදයෙහි බද්ධපර්යංකයෙන් හිඳ මේ බුදුබව පිණිස ම මාගේ ජීවිතදනය දෙන්නට සිතීමි. ඉදින් කිසි යාචකයෙක් අවුත් මාගේ හෘදයවස්තුව ඉල්ලූයේ වී නම්, මාගේ වෙර පළා හෘදයවස්තුව උපුටා දන් දෙමි. මාගේ දෙඇස ඉල්ලූයේ වී නම්, දෙඇස උපුටා දන් දෙමි. ශරීරමාංසය ඉල්ලූයේ වී නම්, මාගේ ශරීරමාංසය කපකපා දන් දෙමි. රුධිරය ඉල්ලූයේ වී නම්, මාගේ ශරීරය පැසෙකලා මිරිකා බඳුන් පුරා ලේ දන් දෙමි. 'වෙස්සන්තරය, මට දසභූත ව' යි කියා දසමෙහෙවර ඉල්ලූයේ වී නම්, 'මොහුට මම දස වීමි' යි කියා සියලු ම මේ **සිව්රට**වාසීන්ට අස්වාලවා මාගේ කය දසත්වයට දෙන්නෙමි' කියා මෙසේ මසුරුභාවයෙහි නො පිහිටියා වූ අචල වූ ස්වභාවය සිතන්නා වූ **වෙස්සන්තර**කුමාරයන්ගේ සිත අනු ව ම ඒ ජීවිතපරිත්‍යාගි චෙතනායෙහි **මහාමෙරු**පර්වතය හා **හිමාලය**පර්වත නමැති මුදුන්මල්කඩින් යුක්ත වූ මහීකාන්තාතොමෝ කම්පා වන ලද්දී ය. මහාමෙරුපර්වතය නැමී නැමී නමස්කාර කෙළේ ය. අකාලමෙඝ ගර්ජනා කොට වර්ෂා කෙළේ ය. අහස විදුලිය පැහැර ගියේ ය. මහාසමුද්‍රය විපරිවර්තනාකාර විය. **ශක්‍රදෙවේන්ද්‍ර**තෙම අත්පොළසන් දිනි. මහාබ්‍රහ්මාදීහු සාධුකාර දුන්හ. මෙසේ අන් සතකු විසින් නො සිතිය හැක්කා වූ දුෂ්කර වූ ජීවිතපරිත්‍යාග චෙතනාවෙන් සියලු ලොකය විස්මය පත් කරවා පුරසඳ සෙයින් වැඩී සොළොස් හැවිරිදි පිරුණුසඳ **සඳමහරජානෝ** 'මපුතුගේ රාජ්‍යශ්‍රීසම්පත් මාගේ ඇස්හමුයෙහි ම දක්නා කැමැත්තෙමි' යි කියා **චෙතියරටින්**

Non-Commercial Distribution

දෙවඟනක වැනි **මද්‍රී** නම් කුමාරිකාකෙනෙකුන් මහපෙරහරින් ගෙන්වා බොධිසත්වයන්ට අභිසෙක කොට රාජ්‍යශ්‍රීසම්පත් දුන්නෝ ය. එතැන් පටන් **වෙස්සන්තර** නම් බුද්ධාංකුරයානෝ දශරාජධර්මයෙන් රාජ්‍යශ්‍රී කෙරෙමින් අප්‍රමාද ව දෙමවුපියන්ට උපස්ථාන කෙරෙමින් සදන්හල් කරවා දවස සලක්ෂයක් වියදම් කරවා මහදන් දෙමින් **ජාලියකුමාර** ය. **කෘෂ්ණජිනා** ය යන මහපින්වත් පුරුත්රුවන් ලදින් වසනසේක් **කලිඟුරට** වැසි නො ලැබ දුර්භික්ෂ භයින් පීඩිත වූ සරාජික ජනයාගේ සම්මතයෙන් ඇලිඇතු දන් ඉල්වා ආ බමුණන්ට ඇලිඇතු දන් දෙන දවස් සුවිසිලක්ෂයක් අගනා වූ සත්රුවන්මය හස්ත්‍යාලංකාරයෙන් විචිත්‍ර කොට සරහන ලද්ද වූ සතර පා රන්ගිගිරි ලන ලද්ද වූ කෙලාශකූටපර්වතය සේ අතිධවල වූ හස්තිරාජයාගේ රිදීදමක් වැනි ඇත්සොඬ දකුණු අතින් ගෙණ වාමහස්ත යෙන් ස්වර්ණභිංකාරය ගෙණ 'අහෝ! සාධු! මේ ඇතු දන් දුන් කුශල බලයෙන් මතු ලොවුතුරාබුද්ධරාජ්‍යයට පැමිණෙමි' යි කියා බුදුබව ප්‍රාර්ථනා කෙරෙමින් බමුණන් අත පැන් වත් කොට බ්‍රාහ්මණයන්ට හස්තිරාජයා දන් දුන්සේක. ඒ සර්වාංගශ්වෙත වූ නාගෙන්ද්‍රයා දන් දෙන්නා වූ බොධිසත්වයන්ගේ සිත හා අනු ව ම එ ද **(337)** වස්හි දූ මහා මෙරු හිමාලයපර්වත නමැති මුදුන්මල්කඩ ලෙලවා මහීකාන්තාතොමෝ කම්පා වන ලද්දී ය. දිව්‍යබ්‍රහ්මයෝ සාධුකාර දුන්හ. මෙම **චර්යා පිටකයෙහි** වදරණ ලද්දේ ය.

> **'නාගං ගහෙත්වා සොණ්ඩාය–භිංකාරෙ රතනාමයෙ,**
> **ජලං හත්ථෙ ආකිරිත්වා–බ්‍රාහමණානං අදං ගජං.**
>
> **පුනාපරං දදන්තස්ස–සබ්බසෙතං ගජුත්තමං,**
> **තදපි පඨවී කම්පි–සිනෙරුවන වටංසකා'–යි.**

''මෙසේ ඇලිඇතු දන් දුන් කල අසුරයන් වන් **ශක්‍රපුරය** මෙන් **ජයතුරා** නුවර එක කොලාහල විය. නගර වාසීහු කිපී **සඳමහරජ්ජුරුවන්** කරා ගොස් හඬහඬා 'අනේ! ස්වාමීනි, අප දන්වන්නක් අසා වදළ මැනව. අපගේ **වෙස්සන්තර** මහතානන් වහන්සේ බාල කල ම රජ පැමිණ අප රක්ෂා කරණසේකැ යි සිතා උන්නම්හ. දැන් අප රක්ෂා කර වදළ නියා අසා වදළ මැනැව. අනේ! ස්වාමීනි, මිනිස්ලොවට අතිදුර්ලභ වූ මාහැඟි වූ ආභරණයෙන් හා සුවිසිලක්ෂයක් අනගි වස්තුවෙන් සරහන ලද්ද වූ දෙවියන් විසින් මිනිස් ලොවට පහළ කරණ ලද්ද වූ අකාලයෙහි වැසි වස්වාපියන තරම් මහානුභාවසම්පන්න වූ **පිණ්ඩා** නම් හස්තිරත්නය කලිඟුරටින් ආ බමුණන්ට දන් දෙමින් අප නැසූසේක. අනේ! ස්වාමීනි, ශ්‍රද්ධාව ඇතියා නම්, සෙසු ඇතුන් දීපිය නො හැකි වේ ද? නොයෙක් රන්රුවන් දීපිය නො හැකි වේ ද? මේ නියා මුළුලොවට අතිදුර්ලභ වූ ඇත්රජ දන් දුන්සේකැ' යි කියකියා හඬන්නට පටන් ගත්තාහු ය. එකල **සඳමහරජානෝ** ඉතා බලවත් ව නගරවාසීහු කිපුනු බැව් දැන උපායෙන් මොවුන් සන්හිඳුවාලමි යි සිතා 'සගයෙනි, ඒ නො කළ මනා දෙයෙක.

Non-Commercial Distribution

සගයෙනි, ඒ නො කළ මනා දෙය කළ තැනැත්තාහට තොප කී දඬුවමක් කරන්නෙමි' යි කීහ. එවිට නගරවාසීහු මඳක් සන්හිඳී සිට 'ස්වාමීනි, එසේ කළ නො හැක්ක. මේ නුවර ම සිට අප නැසූ තැනැත්තන් මෙ රට හින්ද නො දී **වංකගිරි** නම් පර්වතයට යවම්හ' යි සම්මත කළාහු ය.

''මහාබොධිසත්වයන් වහන්සේ එපවත් අසා පියරජ්ජුරුවන්ගෙන් දෙදවසකට අවසර ගෙණ මහදන් සරහා ලවා සර්වාංගයන් සුවඳපසඟුල් දෙමින් ස්වර්ණාලංකාරයෙන් සරහන ලද්ද වූ රන්ධ්වජ නඟන ලද්ද වූ රන්දැලින් වසන ලද්ද වූ ඇතුන් සත්සියයක් හා එසේ ම අසුන් සත්සියයක් හා එසේ ම අසුන් යොද සිංහසම් ඔබා සත්රුවන් කර්මාන්තයෙන් නිමියා වූ රන්ධජ නඟන ලද්ද වූ සත්සියයක් රථ හා සර්වාභරණයෙන් සරහන ලද්ද වූ දෙවඟනන් වැනි වූ නරඟනන් සත්සියයක් හා සුශික්ෂිතාචාර ඇති සත්සියයක් දසීන් හා එසේ ම සර්වාභරණ විභූෂිත වූ දසයන් සත්සියයක් හා කිරිදෙනුන් සත්සියයක් හා සත්රුවන් පර්යංක සත්සියයක් ද යනාදී මනුෂ්‍යයන්ට උපභොග පරිභොග වූ වස්තූන් සත්සියයක් සත්සියයක් බැගින් දන් දෙමින් දෙවෙනි දවස් මුළුල්ලෙහි දනක්‍රීඩා කොට අසුර සංග්‍රාමයෙන් ජය ගත් **ශක්‍රදෙවෙන්ද්‍රයා** සේ ප්‍රීතියෙන් පිණා **(338)** 'ඉතිකින් මම **හිමාලයෙහි** තපස්ක්‍රීඩාවට යන්නෙමි' යි කියා දෙමවුපියන් වැඳ අවසර ගෙණ 'අනේ! ස්වාමීනි, ඉතිකින් අප රක්නෝ කවුරුද?' යි කියකියා හිස අත බැඳ ගෙණ පොළෝ වැතිර හඬන්නා වූ සොළොස් දහසක් බිසෝවරුන් දෙස නො බලා 'හිමි, අප මූබය පස් හුණහ' යි කියකියා දණ්ඩනමස්කාරයෙන් වැඳ පෙරළෙමින් හඬන්නා වූ සැට දහසක් සහජාත අමාත්‍යයන්ට අවවාද කෙරෙමින් 'මාහිමීතුමන් නො දක රජගෙයි විසීමට වඩා මහාවනයෙහි මීය යාම උතුමැ' යි කියා දෙදරුවන් ගෙණ පසු ගමන් ගත් **මද්‍රීදෙවීන්** බලා 'මද්‍රිනි, හිමාලයෙහි චණ්ඩ වූ ඝොර වූ භයානක වූ සිංහ ව්‍යාඝ්‍ර දිවි වලස් දරපිඹුරු හූරු ආදීන්ගෙන් හා සීතසුළං ආදියෙන් බොහෝ වූ උපද්‍රව ඇත්තේ ය. තෙපි අත්‍යන්ත රාජසුඛුමාල බැවින් මහහිමයෙහි වැසපිය නො හැක්කැ' යි වදරත් ම 'අනේ! ස්වාමීනි, ඒ තාක් වෙහෙස මා හිමි දක්නා මට රජ සැපතක් හා සදෘශය' යි කියා එන්නා වූ **මද්‍රීදෙවීන්** කෙරෙහිත් උපෙක්ෂක ව ම නුවරින් නික්ම වඩනා සේක් 'අහෝ! මම මෙබඳු වූ දිව්‍යශ්‍රීසම්පත්තියක් වැනි වූ රාජ්‍යශ්‍රීසම්පත්තියක් හා ආත්මය සමාන වූ මිත්‍රාමාත්‍ය බන්ධූන් හැර උදක් ශ්‍රද්ධාවෙන් හිමවත් වැද ශීලගොපනය කෙරෙමි' යි සිතා 'ප්‍රීතියෙන් නුවර බලමි' යි සිතත් ම මහපොළොව කරකැවී බොධිසත්වයන් නුවරට අභිමුඛ කෙළේ ය. දෙලක්ෂසතළිස්දහසක් යොදුන් ඝනකඩ මහාපෘථිවිය කම්පා විය. **මෙරුයුගන්ධරාදි** පර්වතයෝ නමස්කාර කළාහු ය. දිව්‍යබ්‍රහ්මයෝ සාධුකාර දුන්හ. එයින් වදළහ.

Non-Commercial Distribution

චර්යාපිටකයෙහි:—

> ‘හත්ථිං අස්සං රථං දත්වා – දාසිං දාසං ගවං ධනං,
> මහාදානං දදිත්වාන – නගරා නික්ඛමිං තදා.
>
> නික්ඛමිත්වාන නගරා – නිවත්තිත්වා විලොකිතෙ,
> තදාපි පඨවී කම්පි – සිනෙරු වනවටංසකා’ යි.

‘‘මෙසේ දුෂ්කර වූ නෛෂ්ක්‍රම්‍යපාරමිතාදිය පූරණතායෙන් පෘථිවි කම්පාදිය කරවා තමන් වහන්සේ ජාලියකුමාරයන් වඩා ගෙණ කෘෂ්ණ–ජිනාවන් වඩා ගත් මද්‍රීදෙවීන් සහ අසුන් යෙදූ රථයට නැඟී වඩනාසේක. එකල ඵුසතිදෙවීන් වහන්සේ හෘදය පැළී යන සේ මහත් වූ සොකයෙන් හඬමින් ‘අහෝ! මපුතනුවන් වහන්සේ ඉතා දිළිඳු වූසේක. මෙයින් මාර්ගොපකරණ වේව’ යි කියා දහසක් සත්රුවන් ගැල් පුරවා යවූහ. මහා බොධිසත්වයන් වහන්සේ ඒ සත්රුවන් රාශිය මාර්ගයෙහි පැමිණි යාචකයන්ට දන් දෙමින් නිමවා වඩනාසේක. එකල සත්තසතක මහා දනයට නො පැමිණියා වූ බ්‍රාහ්මණයන් සතරදෙනෙකුන් ජයතුරානුවරට පැමිණ මහාබොධිසත්වයන් නො දුක වහා දිව ගොස් ‘අනේ! ස්වාමීනි, අපගේ පින් මඳ හෙයින් ඔබගෙන් කිසිවක් නො ලදුම්හ. තෙල අසුන් අපට දුන මැනැව’ යි කියා ඉල්ලූ (කල ඒ) බමුණන්ට ඒ සෛන්ධවයන් සතර දෙන දුන්සේක. එකල රථචක්‍ර අහස්හි ම සිටියේ ය. එවිට දෙවතාවෝ සතරදෙනෙක් වහා අවුත් රොහිත මෘගවෙස් ගෙණ රථය අදිමින් යෙති. එකල්හි දූ පෙර සේ ම ජයතුරාවට පැමිණියා වූ බ්‍රාහ්මණ යෙක් මහාබොධිසත්වයන් කොයි දූ යි විචාරා **(339)** වංකගිරි නම් පර්වතයට ගියහ යි යනු අසා වහා දිව ගොස් ‘අනේ! සකල සත්වයන්ගේ මනදෙළ පූරණ කල්පවෘක්ෂයක් වැනි වූ වෙස්සන්තර ස්වාමීනි, මහගඟ වතුරු සෙයින් ඔබ දුන් මහාදනයෙන් කිසිවක් නො ලද්දෙමි. තෙල රථය මට දුන මැනැවැ’ යි කියා රථය ඉල්ලී ය. ඒ බමුණුහට රථය දන් දී දෙදරුවන් ගෙණ පයින් ම වඩනාසේක. එකල මාර්ගදෙපාර්ශ්වයෙහි පිහිටි ආම්‍ර ජම්බු ජම්බීර නාරංගාදි නානා ඵලහරිත වෘක්ෂයන් දුක කුමාරවරු දෙඅත් ඔසවා ගෙණ ‘අම්ම, පියානෙනි’ යි කියකියා හඬති. එකල මේ කප බුදු වන්නා වූ ඒ වෙස්සන්තර නම් බුද්ධාංකුරොත්තම-යානන් වහන්සේගේ පුණ්‍යතෙජානුභාවයෙන් ආම්‍ර නාරංගාදි ඒ ඒ ඵල හරිත වෘක්ෂයෝ තෙමේ ම නැමී නැමී ඵල ගන්වාලති. මෙසේ ඒ ජයතුරා නුවර පටන් චෙතියරජුන්ගේ නුවර දක්වා තිස්යොදුන් වනමාර්ගය දෙවතාවෝ ලදබොලඳ සිවුමැලි වූ කුමාරවරුන් කෙරෙහි අනුකම්පාවෙන් හ්‍රස්ව කොට නැඟුහ. එහෙයින් ජයතුරානුවරින් නික්මුනු දවස්හි ම තිස් යොදුන් මග ගෙවා සවස් වේලෙහි චෙතියරජුන්ගේ නුවරට වන්හ.

එයින් වදළහ:—

> ‘සංඛිපිංසු පථං යක්ඛා – අනුකම්පාය දාරකෙ,
> නික්ඛන්තදිවසෙනෙව – චෙතීරට්ඨමුපාගමුං’–යි.

Non-Commercial Distribution



වෙස්සන්තර රජතවුස්තුමා මද්‍රී දෙවිය ශක්‍රබ්‍රාහ්මණයාට දන්දීම (397 පිටුව)

Non-Commercial Distribution

''මෙසේ මයිලනු රජුන්ගේ නුවරට පැමිණ ඇතුළු රජගෙට නො ගොස් වාසල්දෙර ශාලායෙක ලැගුම් ගත් කල එපවත් සියලු නුවර ඇලළි ගොස් චෙතියමහරජානන් හා සැටදහසක් චෙතියරජදරුවෝ ද ඒතාක් බිසෝවරු ද ක්ෂණයකින් දිව අවුත් මහහඬින් හඬා දෙඅතින් වැලඳ ගෙණ ''අහෝ! වෙස්සන්තරමහරජානෙනි, කුමන ගමනෙක් ද? දුරුකතර ගෙවා වැඩියා වූ ඔබගේ නීරොගිබව කිමෙක් ද? නිදුක්බව කිමෙක් ද? නුඹගේ පියානන්ගේ නීරොගිබව කිමෙක් ද? සිවිරට සෙස්සන්ගේ නිදුක්බව කිමෙක් ද? මහරජානෙනි, නුඹගේ මහබලසෙනඟ කොයි ද? නුඹ වහන්සේගේ රථසෙනඟ කොයි ද? අසුන් නැති ව ම රථ නැති ව ම කුණම් නැති ව ම බොහෝ දීර්ඝමාර්ගයෙක්හි ශරීරය මැඩි ගෙණ මේ දෙශයට පැමිණිසේක. මා දුවනියන් නැඟී ආ රන්දෝලි කොයි ද? රන්සිවි ගෙවල් කොයි ද? මා මුනුබුරෝ අවුසුළං විඳ කෙසේ අවු ද? තොප රටින් නෙරපූවෝ කවුරු ද? ජයතුරානුවර සතුරන් හස්තගත වී ද? මේ කෙබඳු වූ විපත්තියෙක් දැ?''යි විචාළාහු ය. එකල මහබෝසතානෝ ''මයිලනුවන් වහන්ස, නුඹ විචාළතාක් හානියෙක් නැත. යළිදු මාගේ පිණින් දෙවියන් විසින් පහළ කරවා දෙන ලද්ද වූ කෛලාශකූටපර්වතය සේ අතිධවල වූ පණ්ඩුකම්බලසිලාසනය සේ මාහැඟි වූ සර්වලක්ෂණසම්පන්න වූ පිණ්ඩා නම් හස්තිරත්නය බමුණන්ට දන් දිනිමි. එහෙයින් සිවිරට වාසීහු කිපි මා වංකගිරිපර්වතයට යන සේ සම්මත කළාහු ය. ඒ මම වංකගිරි පර්වතයට යන්නෙම් මෙහි පැමිණියෙමි' යි කී කල්හි එබසට ප්‍රසන්න වූ සැටදහසක් රජදරුවෝ 'ස්වාගතන්තෙ මහාරාජ' යනාදීන් 'පින්වත් වූ වෙස්සන්තරමහාරාජොත්තමයානන් වහන්ස, නුඹවහන්සේගේ මේ ආගමන ඉතා යහපත් ගමනෙක. මෙහි වැඩ හිඳ අප හැමට රාජ්‍යශ්‍රී කර වදළ මැනැවැ'' යි කියා රජ සැපතින් පැවරූහ.

**(340)** ''එකල මහාබොධිසත්වයන් වහන්සේ අනෙකාදීනවයන් ගෙණ හැර දක්වා රාජ්‍යශ්‍රීසම්පත් ප්‍රතික්ෂෙප කොට එදවස් රෑ එහි ම වැස දෙවෙනි දවස් අනන්ත වූ චතුරංගිනීසෙනාව පිරිවර කොට ඇති සැටදහසක් චෙතියරජුන් පිරිවරා ශක්‍රදෙවෙන්ද්‍ර ලීලායෙන් වඩනාසේක. චෙතිය රජදරුවෝ ද පසළොස්යොදුන් සුළු වනය ගෙවා ගොස් සිට දකුණත් ඔසවා වංකගිරියට මාර්ගය කියා මුහුණු පිරුණු කඳුළෙන් සිත් පිරුණු ශොකයෙන් මහහඬින් හඬා වැඳ සමු ගෙණ මහවන දෙර මූර සලස්වා ගියාහු ය. ඒ චෙතිය රජුන් කී සලකුණෙන් මහවනයෙහි වඩනාසේක්, සර්වසුගන්ධයෙන් ගන්ධිත වූ ගන්ධමාදනපර්වතයෙහි දවසක් වැස එයින් විපුල නම් පර්වතපාදයෙන් ගොස් කෙතුමතී නම් ගඟට පැමිණ වැද්දක්හුගේ සහායත්වයෙන් ගඟින් එතෙර ව ඔහු දුන් මී හා අඟුරුමස් වළඳා ඕහට රන්ඔටුන්න තද කරණ ලක්ෂයක් අගේ ඇති රන්ඉද්ද දෙවා වදරමින් එයින් නික්ම සානුපර්වතය නිසා පිහිටි අමෘතඵල ඇති මහා න්‍යග්‍රොධවෘක්ෂයෙන් මධුර වූ ඵල අනුභව කොට එයින් නාලික නම්



Non-Commercial Distribution

පර්වතය ගෙවා මුචලින්ද නම් විල්තෙරින් ගොස් ගිරිදුර්ග වනදුර්ග ගෙවා එකපදිකමාර්ගයෙන් ගොස් වංකගිරියට නුදුරු වූ සතරැස් පොකුණට පැමිණිසේක.

''එකෙණෙහි **ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ** නියොග ලත් **විශ්වකර්මදිව්‍ය** පුත්‍රතෙම වහා දෙව්ලොවින් අවුත් **වංකගිරි** නම් පර්වතකුක්ෂියෙහි ආශ්‍රමදෙකක් හා තවුස්පිරිකර මවා 'පැවිදි වන්නාවුන්ට කැප ය' යි කියා භිත්තියෙහි අකුරු ඇඳ හාත්පසින් දෙළොස්යොදුනක් ප්‍රමාණයෙහි චණ්ඩ වූ සිංහව්‍යාඝ්‍රාදීන් ලුහුබඳවා දෙව්ලොව ගියේ ය. බොධිසත්වයන් වහන්සේ මද්‍රිදෙවින් හා කුමාරවරුන් පොකුණුතෙර හිඳුවා ගොස් පන්සල් හා පිරිකර දැක අකුරු බලා අඳුන්දිවිසම වැලඳ ජටාමඩුලු ධරා තපස්වෙස ධාරි වූසේක. **මද්‍රිදේවීන්වහන්සේ** ද එසේ ම ගොස් කුමාරවරුන් හා පැවිදි ව මධුර වූ ඵලාඵල ගෙණවුත් **වෙස්සන්තර**මහරජානන් වහන්සේ හා කුමාරවරුන් පොෂ්‍යය කෙරෙමින් වාසය කරණ කල්හි **කලිඟුරට දුන්නිවිට්ඨ** නම් බමුණුගම **ජූජක** නම් බමුණෙක් බාල කාලයෙහි පටන් සිඟා කහවණුසියයක් ලදින් එක් දුගී බමුණකු ලඟ තබා ගොස් කල් යාමකින් අවුත් 'යහළුව, මාගේ කහවණු දෙව' යි කියා ඉල්වී ය. ''යහළු, මා දුක්පත් බැවින් තාගේ කහවණු විකොට කාපීමි. තාගේ කහවණු නියාවට මාගේ **අමිත්තතාපා** නම් දූවනියන් ගෙණ යව' යි කියා දූවනියන් භාර කෙළේය. **ජූජක** නම් බ්‍රාහ්මණතෙම ද තමන් කාමදස බැවින් ඈ **දුන්නිවිට්ඨ** නම් බ්‍රාහ්මණග්‍රාමයට ගෙණ ගොස් අඹු කොට ගෙණ ඈ කෙරෙහි අප්‍රමාද ව වාසය කෙරෙයි. ඒ **අමිත්තතාපා** නම් බැමිණිය ද **ජූජකයා** කෙරෙහි මහත් වූ ගෞරවයෙන් උපකාර සත්කාර කරන්නී ය. එකල ඒ බමුණුගම බ්‍රාහ්මණමාණවකයෝ තමතමන්ගේ බැමිණියන්ට රෑහැණි ව 'කෙල්ලනි, තොප[1] අප කෙරෙහි ප්‍රමාද වන්නට කරුණු කිම ද? **ජූජක** නම් මහලු බමුණුහට **අමිත්තතාපා** නම් තරුණ වූ බ්‍රාහ්මණභාර්යා කෙනෙක් යහපත් සේ සකසා උපස්ථාන කරන්නී නො වෙත් දැ' යි කියා හෙළා දකිති. එබස් ඇසූ බැමිණියෝ 'ඈ ජූජකයාගේ ගෘහයෙන් තොර කරම්හ' යි කියා සම්මත **(341)** කෙරෙමින් **අමිත්තතාපා** නම්, බැමිණි පැනට යන කල්හි බලා ගොස් වට කොට ගෙණ 'එම්බල, පව් කළ තැනැත්තිය, මෙසේ නවයෞවනයෙන් යුක්ත වූ තී ජරාදුර්වල වූ ජූජකයාහට දුන් තිගේ දෙමවුපියෝ තිට සතුරෝ ය. තී පෙර නවවක්හි යාගයෙහි ලූ බත් පළමු කොට ම මහලු කවුඩෙක් කැ හෙයින් මහලුසැමියකු ලද්දී ය. ගැරඬිසමක් වැනි ඇඟ රැළි ඇති කඩදත් ඇති කෙළතොලු මහලු බමුණු හා තිගේ කවර නම් පඤ්චකාම සැපතෙක් දැ'' යි යනාදීන් බිණුහ.

''**අමිත්තතාපා** නම් බැමිණිය ඒ අසා හඬහඬා පැන් කළය ගෙණ ගොස් තබා **ජූජකයාගේ** රැවුල වැරයේ අල්වා ගෙණ 'අහෝ! බමුණ, තා කෙරෙහි හුන් විපාකය අද ලද්දෙමි. මේ ගම ලඳුරියෝ මට පැන් නොට දි

1. තෙපි

නො කී නො කළ නින්දවෙක් නම් නැත. වහා ගොස් දසයකු හෝ දසියක ගෙණෙව. නැත හොත් තා කෙරෙහි නො ඉඳ යෙමි' යි කිවු ය. එකල **ජූජක**තෙමේ කියනුයේ 'එම්බා සොඳුර, මා මහලු වූ බැවින් දස දයින් ලද[1] නො හෙමි. මෙවක් පටන් තොපට දරත් ගෙණ දෙමි. දියත් ගෙණ දෙමි. තෙපි ගෙය රැක හිඳුව' යි කීයේ ය. 'අහෝ! බ්‍රාහ්මණය, සැමියන්ගෙන් මෙහෙවර ගන්නා කුලයෙක නො උපන්නෙමි. නපුරුබස් නො කියා දසයකු හෝ දසියක ගෙණ එව' යි කිවු ය. 'සොඳුර, දසදසීන් කෙසේ ලබම් දූ?' යි කීයේ ය. 'අහෝ! මහලු බ්‍රාහ්මණය, එව්තරකුත් නො දන්නෙහි ද? **වෙස්සන්තර** නම් මහරජානන් වහන්සේ අඹුදරුවන් සහිත ව ම **වංකගිරි** නම් පර්වතයෙහි වසනසේක. යව, ගොස් දසදසියන් ගෙණ එව' යි කියා මාර්ගොපකරණ සාද දුන්නී ය. බ්‍රාහ්මණතෙමේත් අඹුව කෙරෙහි මහත් හයින් බොහෝ දර ගෙණවුත් ගෙදෙර පුරවා දිය ගෙණවුත් වලන් පුරවා ගේවට වැටකඩුලු කටු පැලලි බැඳ අඹුව වැලඳ ආදර දක්වා තුන් තැනක වැඳ වැටී සමු ගෙණ හඬහඬා අඹුව වටා තුන්යලක් ප්‍රදක්ෂිණා කෙරෙමින් මාර්ගොපකරණ පයිය කරලා ගෙණ **ජයතුරානුවර** කරා ගොස් දුටු දුටුවන්ගෙන් '**වෙස්සන්තර**මහරාජානෝ කොයි දූ?''යි විචාළේ ය.

''එකල නගරවාසීහු කිපී මෙබඳු වූ දූර්ජන බමුණු මහල්ලෝ අවුත් අවුත් අපගේ **වෙස්සන්තර** නම් නරදෙවයන් වහන්සේ **වංකගිරියට** පන්වාලූහ' යි කියා කැටපහර දෙමින් ලුහුබැඳ ගත්හ. **ජූජක** නම් බ්‍රාහ්මණතෙමේ ද මරණභයින් දුවනුයේ දෙවියන්ගේ ආනුභාවයෙන් **වංකගිරියට** යන මාර්ගයෙන් ගොස් **චෙතපුත්‍ර** නම් වැදිපුත්‍රයා රැකවල හුන් බන්ධාවාරයට පැමිණියේ ය. එකල්හි[2] වැදිපුත්‍රයාගේ කිනබල්ලෝ ලුහුබැඳ ගත්තාහ. එකල **ජූජකයා** මහලු වඳුරකු සේ මරණභයින් රුකකට නැඟී වෙවුලවෙවුලා අනෙක විලාපයට පටන් ගත්තේ ය. වැදිපුත්‍රයා ඒ අසා දිව අවුත් උර පුරා දුන්න ඇද 'අහෝ! බ්‍රාහ්මණය, තාගේ මහෝදරය විද පලා අතුණුබහනින් මේ මහාවනමාර්ගයෙහි දෙවතාවුන්ට බිලි පූජා කෙරෙමි' යි කී කල්හි ජූජකයා අතිශයින් හය ගෙණ 'පින්වත, මා නො විදුව. **ජයතුරානුවර** සිවිරටවාසීන්ගේ සම්මතයෙන් ආ දූතයෙමි. **වෙස්සන්තර**මහරජානන්ගේ **ජයතුරා**නගරප්‍රවෙශමංගල්‍යයට දූතමෙහෙවරයට යන්නෙමි' යි බොරුවක් ගොතා කීයේ ය. එකල වැදිපුත්‍රතෙම ප්‍රසන්න ව බල්ලන් ගස් බැඳ බමුණු බස්වා බොහෝ සත්කාර කෙරෙමින් **වංකගිරියට** මාර්ගය කියා නැවැත්තේ ය. **(342)** ඔහු කී මාර්ග සලකුණෙන් ගොස් **විපුල** නම් පර්වතයෙහි වසන **අච්චුත** නම් තාපසයන් වහන්සේ දැක වැඳ පිළිසඳර කථා කොට 'ස්වාමීනි, වෙස්සන්තර රජ්ජුරුවන් බාල කල අකුරු කරවාලීමි. දැන් සත්මාසයක් මුළුල්ලෙහි මා ඇස නො දක්කෙමි. සැපදුක් විචාරාපියන්නට යන්නෙමි' යි කියා තාපසයන් වහන්සේ වඤ්චා කොට මාර්ගය විචාරා ගෙණ

1. ලද්දේ 2. පැමිණි කල්හි

ඒ මාර්ගයෙන් ගොස් සන්ධ්‍යාසමයෙහි වංකගිරිපර්වතාසන්නයට පැමිණ මද්‍රීදෙවීන් වහන්සේ පර්ණශාලායෙහි වෙසෙති. ස්ත්‍රීහු නම් දනමානාදියට අන්තරායකාරීහු ය. එහෙයින් කුමාරවරුන් දන් ලබා පියන්නට නො දෙති. උදය එළාඑලයට ගිය කල ගොස් කුමාරවරුන් දන් ලබමි' යි සිතා එක ගල්තැල්ලක සැඟවී හුන්නේ ය. එදවස් රෑ පශ්චිමයාමයෙහි මද්‍රීදෙවී නපුරුස්වප්නයක් දැක භයින් තැති ගෙණ වෙස්සන්තරරජ්ජුරුවන්ගේ පන්සලට ගොස් දෙරට ගැසූ ය. එකල වෙස්සන්තරරජ්ජුරුවෝ 'කව් දැ?' යි විචාළසේක. 'ස්වාමීනි, මම මද්‍රී ය' යි කිවූ ය. **'මද්‍රීනි,** කාලයෙහි මුත් අකාලයෙහි මාගේ පන්සලට නො වදනා සේ කතිකාවෙක් සම්මත කරණ ලද්දේ නො වේ දැ?' යි වදළසේක. 'ස්වාමීනි, අකාරණයෙහි ආයෙම් නො වෙමි. නපුරු ස්වප්නයක් දැක විචාරා පියන්නට ආමි' යි කිවූ ය. 'කෙබඳු ස්වප්නයෙක් දැ?' යි විචාළසේක. 'ස්වාමීනි, කාලවර්ණ වූ එක් පුරුෂයෙක් කසාපිළිදෙකක් හැඳ දෙකණ රත්මල් පැලඳ භයානක වූ ආයුධයක් අතින් ගෙණ මාගේ පන්සලට වැද ජටාමඩුලු සහිත වූ මාගේ හිස ගෙණ භූමියෙහි මා හෙළා හඬවහඬවා මාගේ ඇස් දෙක උපුටා ගෙණ දෙඅත් කපා ගෙණ හෘදය පළා ලේ හෙළහෙළා හෘදය මාංසය ගෙණ ගියේ ය' යි කිවූ ය. මහාබොධිසත්වයන් වහන්සේ එපවත් අසා තමාගේ දනපාරමිතාව පූරවාලීමට කල්‍යාණමිත්‍රයෙකු එන්නේ ඇතැ යි සිතා **'මද්‍රීනි,** රජසැපත් හැර මේ වනයෙහි නපුරු බොජුන් වළඳන්නා වූ තොපට පෙණෙන ස්වප්න යැ' යි කියා අස්වසා යවූසේක.

**'මද්‍රීදේවීන්** ද අරුණු නැගුනු කල කළ මනා සියලු ම වතාවත් කොට නිමවා දෙදරුවන් වැලඳ ගෙණ සිඹ සනහා 'දරුවෙනි, අද නපුරු ස්වප්නයක් දක්නා ලද්දේ ය. බිය පත් ව විසුව මැනැවැ' යි අවවාද කොට 'මා දුටු ස්වප්නයෙහි මඳකුත් සුභයෙක් නැත. මා දරුවන් රැක වදළ මැනැවැ' යි කියා බොධිසත්වයන්ට දෙදරුවන් භාර කොට කෙක්ක හා පැස ගෙණ කඳුළු පිසපිස වනයට එළාඑල පිණිස ගියාහ. මහාබොධිසත්වයන් වහන්සේ ද 'දන් යාචක කෙනෙකුන් එන්නේ ඇතැ' යි සිතා පන්සලින් නික්ම ගල් පෝරුවක් මත්තෙහි ස්වර්ණප්‍රතිමාවක් සේ වැඩ හිඳිනාසේක. කුමාරවරු පාමුල කෙළිමින් හිඳිති. එකල ජූජකයා සානු පර්වතයෙන් බැස එක පදිකමාර්ගයෙන් පන්සලට ගියේ ය. මහාබොධිසත්වයන් වහන්සේ ජූජකයා දැක ජාලියකුමාරයන් බණවා 'පුතනුවනි, තෙල බ්‍රාහ්මණයාගේ පිරිකර ගෙණ සත්කාර කරව' යි වදළ කල්හි 'යහපතැ' යි කියා පෙර මගට ගොස් පිරිකර ඉල්ලූ කල 'මොහු මට වෙස්සන්තරරජ්ජුරුවන් දෙන දසයෙක. එබැවින් මෘදුකමක් ඇඟවීම් නම්, මතු මට සුවච නො වන්නේ ය' යි සිතා 'ඉවත යව. ඉවත යව' යි කියා පරුෂවචනයෙන් කිපී ලෙස් දක්කුයේ ය. ජාලියකුමාරයෝ භයින් ඉවත් ව ගියෝ ය. ජූජකතෙම බොධිසත්වයන් කරා ගොස් සැපදුක් විචාරා එකත් පසෙක හුන්නේ ය. මහාබොධිසත්වයන් වහන්සේ ද ඔහට කළ මනා සත්කාර කොට ආ තොරතුරු විචාළ කල්හි 'ස්වාමීනි,

*Non-Commercial Distribution*

යම් සේ පඤ්චමහාගංගායෙහි ජලස්කන්ධය කෙතෙක් දෙනා විසින් ඇද බීපියන කල්හිත් සදකල්හි ම ක්ෂය නො වේ ද, එමෙන් ශ්‍රද්ධාජලයෙන් පිරුණා වූ නුඹ වහන්සේගෙන් මම කිසිවක් ඉල්ලා පියන්නට ආමි. ඉල්වන ලද්ද වූ නුඹ වහන්සේගෙන් පුත්‍රවරුන් මට දසත්වයට දුන මැනැවැ'' යි කී ය.

''එකල ශ්‍රී මහාබොධිසත්වයන් වහන්සේ ප්‍රීතියෙන් පිණා සාධුකාර දෙමින් 'බ්‍රාහ්මණය, මා දෙදරුවන් තොපට දන් දෙමි. ඔවුන්ගේ මැනියෝ එලාඑලයට ගියෝ ය. අද මෙහි ලැග සෙට උදය ම දරුවන් ගෙණ යව' යි වදාළසේක. 'අහෝ! ස්වාමීනි, ස්ත්‍රීහු නම් දනයට බාධාකාරීහු ය. ඔවුන්ගෙන් කම් කිම් ද? දෙත හොත් දූන් ම දුන මැනැවැ' යි කීයේ ය. 'එසේ වී නම්, බ්‍රාහ්මණය, මාගේ මේ ප්‍රියබොලඳ වූ දරුවන් ගෙණ සිවිරටට යව. මා දරුවන්ගේ මුත්තනු වූ සඳමහරජ්ජුරුවන් වහන්සේ තොපට බොහෝ සැපත් දෙනසේකැ' යි වදාළසේක. 'අහෝ! වෙස්සන්තර මහා රාජොත්තමයන් වහන්ස, උපායෙන් මා නසාපියන උපායක් සොයා ගත් සේක් ද? මෙබඳු වූ කුමාරවරුන් බැඳ ගෙණ ගියා වූ මා දක වස්තු දෙන්නෝ කවුරු ද? මොහු අපගේ කුමාරවරුන් සොරා ගෙණ යේ ය යි කියා උදුරා ගණිති. නැත හොත් මා දිවි නසති. දෙවයන් වහන්ස, නො පමා ව ම තෙල දරුවන් මට දසභාවයට දුන මැනැවැ' යි කියමින් හුන්නේ ය. ඒ තෙපුල් අසා හුන් කුමාරවරු භයින් තැති ගෙණ සිත් පිරුණු සෝකයෙන් දැස් පිරුණු කඳුලෙන් දැතින් දෙනුවන් කඳුළු පිසපිස 'නගණ්ඩ, **කෘෂ්ණජිනාවෙනි**, අපි කෙසේ ගැලවී යන්නමෝ දැ' යි කියකියා සිංහභයින් භ්‍රාන්ත වූ මෘගපොතකයන් සෙයින් වෙවුලවෙවුලා දිව ගොස් පන්සල් පිටිපස්හි සැඟවී හුන්හ.

''එතැන්හි දූ **ජූජකයා** ම පෙණෙන හෙයින් නික්ම වන ලැහැබ්හි සැඟවී උන්හ. ගිය ගිය තැන ම ජූජකයා පෙණෙන හෙයින් කිසි තැනක සැඟවී ගත නො හී ඔබිනොබ දුවමින් සිවුරැස් පොකුණට වැද කරවටක් දියට බැස 'නගණ්ඩ, කිසිවක් නො බැණ හිඳුම්හ' යි කියා ගෙණ පොකුරු පතින් හිස වසා ගෙණ, සැඟවී උන්හ. එකෙණෙහි බ්‍රාහ්මණයා කුමාර වරුන් නො දක 'අහෝ! **වෙස්සන්තරමහරජානෙනි**, නුඹ වහන්සේ දූන් ම මට වචනයෙන් දරුවන් දී ඔවුන්ට ඉඟි කොට ලා පන්වාලමින් නො දක්නාක් මෙන් හිඳිනාසේක. තමන් වහන්සේ සදෘශ වූ මුසාවාදී කෙනෙකුන් ලොව නැතැ' යි කීයේ ය. එකල බොධියසත්වයන් වහන්සේ 'බ්‍රාහ්මණය, මා දරුවෝ භයින් පලා ගියෝ ය. සොයා ගෙණවුත් දෙමි' යි කියා හුන් තැනින් නැඟී ගොස් පන්සලින් පිට බලමින් නො දක කෙළිමඩුලු වනලැහැබ් රුක්සෙවණ බලා නො දක සතරැස් පොකුණුතෙර පියවර සටහන් දක 'මාගේ ප්‍රිය පුතනුවෙනි, **ජාලියකුමාරයෙනි**, මොබ එන්න, මාගේ දනපාරමිතාව පුරවා ලන්නැ' යි කියා හඬ ගා **(344)** ලූසේක. ඒ ශබ්දය කණ වැටුනු **ජාලියකුමාරයන්** වහන්සේ **ජූජක** නම්

යකු මා කා මරා නුමුත් පියානන් දෙවිටක් හඬ ගා පියන තෙක් නො හිඳිමි'යි සිතා 'මපියානෙනි, කියමින් නෙළුම්පත් ඉවත් කොට අවුත් බොධි-සත්වයන් වහන්සේගේ දකුණු පය ගෙණ හඬන්නට වන්හ. එකල බොධිසත්වයන් වහන්සේ පුතණ්ඩ, ජාලියකුමාරයෙනි, තොප නැගනියෝ **කෘෂ්ණජිනාවෝ** කොයි ද?' යි විචාළසේක. 'මා පියානෙනි, භයක් පැමිණි සත්වයෝ නම් තමහට ම පිහිට සොයන්නාහු ය' යි කීහ. එකල මහබෝසතානෝ 'මා මැනියෙනි, ප්‍රියතර දූවනියෙනි, මෙහි අව මැනව. මාගේ දනපාරමිතාව පුරවා ලන්නැ' යි කියා වදරත් ම වහා පොකුණින් ගොඩ අවුත් බොධිසත්වයන්ගේ වම්පය ගෙණ හඬන්නට වන්හ. ඒ කුමාරවරුන් දෙදෙනාගේ මුහුණින් වැහෙන, කඳුළු මහාබොධිසත්වයන්ගේ සුත්පුල්ලරක්තපද්මවර්ණ වූ පාපිට වැටෙන්නේ ය. මහාබොධිසත්ව යන්ගේ මුහුණ තෙමා බස්නා කඳුළු රන්පුවරු සදෘශ වූ ඔවුන්ගේ පිට තෙමා වැටෙන්නේ ය. එකල මහාබොධිසත්වයන් වහන්සේ කුමරුන් නැඟිටුවා අස්වසා ලමින් 'දරුවෙනි, තොප ම මහානෞකා කොට ගෙණ මේ අනවරාග්‍ර සංසාරසාගරයාගේ පරතෙරට එතෙර වනු කැමැත්-තෙමි. මම එතෙර ව තොපත් ඇතුළු වූ දෙවියන් සහිත වූ ලොකයා සංසාරසාගරයෙන් එතෙර කරන්නෙමි. දරුවෙනි, තෙපි මාගේ දනාධ්‍යාශය නො දන්නාහු ද? දරුවෙනි, මාගේ දනපාරමිතාව මස්තක-ප්‍රාප්ත කරවාලුව මැනැවැ' යි කියා අස්වසා ලමින් 'පුතණ්ඩ, තෙපි නිදහස් වනු කැමැත්තහු නම් බමුණුහට රන්නික්ෂදහසක් දෙමින් නිදහස් වුව මැනැව. තොප නැගනියන් නිදහස් කොට ගන්නා කැමැත්තහු නම් බමුණුහට දසදසීන් ඇත් අශ්ව රථ ගව වෘෂභ රන්නික්ෂ යනාදියෙන් සියයක් බැගින් දී නිදහස් කොට ගණුව' යි කියා කුමාරවරුන්ගේ අත් ගෙණ 'බ්‍රාහ්මණය, මැන එව. මා දරුවන් කෙරෙහි ප්‍රිය නැත්තෙම දෙන්නෙම් නො වෙමි. මෙයට වඩා සර්වඥතාඥනය ශතසහස්‍ර ගුණ යෙන් ම මට ප්‍රියතර වන්නේ ය. මා දරුවන් දන් දෙමින් ඒ කුශල බලයෙන් මතු සර්වඥතාඥනයට පැමිණ මුළුලොවට සෙත් කෙරෙමි' යි කියා බුදුබව ප්‍රාර්ථනා කෙරෙමින් කමඬලාවෙන් බමුණු අත පැන් වත් කොට දරුවන් දන් දුන්සේක. එකෙණෙහි දෙලක්ෂසතළිස්දහසක් යොදුන් ඝනකඩමහාපෘථිවිය කම්පා වී ය. මහමෙරුපර්වතය නැමනැමී නමස්කාර කෙළේ ය. ශක්‍රාදි දෙවියෝ සාධුකාර දුන්හ. මහාබ්‍රහ්මයෝ අත්පොළසන් දුන්හ. අකාලවිදුලිය පැහැර වර්ෂා කෙළේ ය. හිමාලය ඒකනින්නාද කොට සිංහයෝ සිංහනාද කළෝ ය. මිහිමඬල පටන් බඹලොව දක්වා එකකොලාහල වී ය. එයින් වදළහ. **චර්යාපිටකයෙහි-**

**'සකෙ පුත්තෙ චජන්තස්ස – ජූජකෙ බ්‍රාහමණෙ යදා,**
**තදපි පඨවී කම්පි – සිනෙරුවනවටංසකා'** යි.

*Non-Commercial Distribution*

''ජූජක නම් බමුණු තෙමේ ද මහාබොධිසත්වයන් වහන්සේ බලබලා හින්ද දී ම වනයෙන් වැලක් දතින් කඩා ගෙණ ජාලියකුමාරයන්ගේ දකුණු අත හා කෘෂ්ණජිනාවන්ගේ වම් අතත් දෙක එකට බැඳ අල්වා ගෙණ **(345)** වැල්පොටින් තළතළා ගෙණ යන්නේ ය. වැල වැදුනු වැදුනු තැන්හි සම් ඉපිල ලේ වැහෙන්නේ ය. කුමාරයන්ගේ පිට හෙන පහරට නැගනියෝ පිට අල්වති. නැගනියන්ගේ පිට හෙන පහරට කුමාරයෝ පිට අල්වති. මරණ භයින් පැන දුවන්නට වැරයේ ඇදපියති. විෂම ස්ථානයක පය පැකිල බමුණු වැටුනු කල්හි අත් පා මල ගලවා ගෙණ දිව අවුත් බොධිසත්වයන්ගේ දෙපතුල මූහුණ තබා හඬන්නාහු:—

**'අම්මා ච තාත නික්ඛන්තා – ත්වඤ්ච නො තාත දස්සසි,**
**යාව අම්මම්පි පස්සෙම – අථ නො තාත දස්සසි.**

**අම්මා ච තාත නික්ඛන්තා–යාව අම්මා ච එති නො,**
**තදායං බ්‍රාහ්මණො කාමං – වික්කිණාතු හනාතු වා.**

**බලංකපාදො දුට්ඨනඛො – අථො ඔවට්ටපිට්ඩීකො,**
**දීඝුත්තරොට්ඨො චපලො – කලාරො භග්ගනාසකො.**

**කුම්භොදරො භග්ගපිට්ඨී – අථො විසමචක්ඛුකො,**
**මස්සුහරිතකෙසො ච – වලිනො තිලකාහතො.**

**පිඞ්ගලො ච විනතො ච–විකටො ච බ්‍රහාඛරො,**
**අජිනානි ච ඔනද්ධො–අමනුස්සො භයානකො.**

**මනුස්සො උදාහු යක්ඛො–මංසලොහිතභොජනො,**
**ගාමා අරඤ්ඤං ආගම්ම–ධනං තාතඤ්ච යාචති.**

**යස්මා තෙ පිසාචෙන–කින්නු තාත උදික්ඛසි,**
**අස්මා හි නූන තෙ හදයං–ආයසං දළ්හබන්ධනං.**

**යො නො බද්ධෙ න ජානාසි–බ්‍රාහ්මණෙන ධනෙසිනා,**
**අච්චායිකෙන ලුද්දෙන–යො නො ගවොව සුම්භති.**

**ඉධෙව අච්ඡතං කණ්හා–න සා ජානාති කිඤ්චි,**
**මිගීව ඛීරසම්මත්තා–යූථා හීනා පක්කන්දතී'–යි.**

''යනුවෙන් 'පියානන් වහන්ස, අම්මා එලාඑලයට නික්ම ගියා ය. පියානෙනි, නුඹ වහන්සේ ද අප මැනියන් නො ආ කල ම බමුණුහට දුන්නාහු ය. නැවැත එසේ නො කරන්න. යම් තාක් කලකින් අපි මැනියන් දක්නමෝ ද, එකල අප පියානෙනි, බමුණුහට දුන මැනැව. යම් තාක් කලකින් අම්මා එන්නී ද, එකල පියානන් වහන්ස, නුඹ වහන්සේ අප මේ බ්‍රාහ්මණයා කැමැති ලෙස විකුණා හෝ මරා හෝ බමුණුහට දුන මැනැව. එතෙකුදු වුවත්, මපියානෙනි, මේ කර්කශ වූ පරුෂ වූ බමුණු

Non-Commercial Distribution

තෙම බකල වූ පාද ඇත්තේ ය, කුණු වූ නිය ඇත්තේ ය, අධොගලිත වූ මස්පිඩු ඇත්තේ ය, මූබය වැසී තිබෙන උත්තරොෂ්ඨය ඇත්තේ ය, දෙතොල්බිතින් වැහෙන කෙළ ඇත්තේ ය, හූරුදන්ත වැනි වූ නපුරු දත් ඇත්තේ ය, මැදින් බිඳී නැමුනු නාසය ඇත්තේ ය, කළයක් බඳු මහොදරය ඇත්තේ ය, මැදින් බිඳුනු කුදු වූ පිටක් ඇත්තේ ය, විෂම වූ ඇස් ඇත්තේ ය, තඹරැවුල් ඇත්තේ ය, රන්වන් හිසකේ ඇත්තේ ය, ඇඟ සම්හි කාලවර්ණ වූ තලකැලැල් ඇත්තේ ය, බළල්ඇස් ඇත්තේ ය, කටි ය පිට ය පපුව ය යන තුන් තැනකින් නැමුනු ශරීරයක් ඇත්තේ ය, විවර වන්නා වූ අබද්ධ ඇටසන්ධි ඇත්තේ ය, අතිදීර්ඝ වූයේ ය, අජින චර්මසන්නද්ධ වූයේ ය යන මේ අටළොස් වැදැරුම් පුරුෂදෙෂයෙන් යුක්ත වූ භයානක වූ අමනුෂ්‍යයෙක. නොහොත් මනුෂ්‍යවෙශයෙන් හැසිරෙන්නා වූ මස්ලේ භොජන කොට ඇත්තා වූ යක්ෂයෙක් ම ය. මොහු ගමින් වනයට අවුත් අපගේ මස් කනු කැමැති ව, නුඹගෙන් පුත්‍ර ධනය ඉල්වන්නේ ය. මපියානෙනි, යකෙකු විසින් අප කා මරන්නට ගෙණ යන කල්හි මධ්‍යස්ථ ව බලා හිඳිනේ ඇයි ද? මපියානෙනි, දෙමවු පියන්ගේ හෘදය නම් දරුවන් කෙරෙහි ඉතා මෘදු වන්නේ ය. නුඹගේ සිත එකාන්තයෙන් ම යපතින් දැඩි කොට බැඳි බැම්මක් වැන්න. සිත් පිත් නැති ගලක් වැන්න. දසධනය සොයන්නා වූ බ්‍රාහ්මණයා විසින් අප බැඳ ගත්බව ඒ නුඹ වහන්සේ නො දන්නාහු ද? ඉතා රෞද්‍රයකු විසින් යොදු ගත් ගෙරිබානක් සේ පොථනය කරන්නේ ය. මපියානෙනි, මේ මා නැගනියෝ **කෘෂ්ණජිනාවෝ** කිසි දුකක් නො දන්නී ය. මෘග සමූහයෙන් පිරිහුනා වූ කිරි නො ලැබ හාමත් වූ මෘගපොතිකාවක මෙන් මා අම්මණ්ඩීන් නො දැක කිරට හඬන්නී ය. අම්මා නො දැක හඬා වියලී නස්නී ය. එහෙයින් මා බමුණුහට දුන මැනැව. මා නැගනියෝ මෙහි ම හිඳිත්වයි. මම බමුණා හා යන්නෙමි. මා නො දක්නා මා මෑනියෝ ඉතා දිළිඳු වන ඇ ය. මා නැගනියන් නො දක්නා මා මෑනියෝ ඉතා දිළිඳු ව හඬන ඇ ය' යනාදීන් අනෙකවිලාපයෙන් හඬන කල්හි මහ බොධිසත්වයන් වහන්සේ කිසිවක් නො බැණ හුන්සේක.

''එකල **ජූජකයා** දිව අවුත් බැඳ තළතළා ගෙණ යන්නේ ය. එකල මහාබෝධිසත්වයන් වහන්සේට පුත්‍රයන් උදෙසා බලවත් වූ සොක උපන්නේ ය. හෘදයමාංසය හුණු වී ය. කෙසරසිංහරාජයෙකුට හසු වූ ත්‍රිමදගලිතහස්තිරාජයෙකු සේ සොකයෙන් තැවෙමින් දැසින් වැහෙන කඳුළු අතින් පිස පිස[1] පන්සලට වැද 'අහෝ! අපගේ රජගෙයි වසන දසයකුටත් නො කරණ වද මේ නපුරු බමුණු මා දුවනියන්ට කෙරෙයි. ලුහුබැඳ ගොස් ඔහු මරා මා දරුවන් ගෙණෙමි' යි සිතා 'අහෝ! මා සිතුයේ නපුරු චෙතනාවෙක. පූර්වබොධිසත්වවරයෝ ධන[2] පරිත්‍යාගය අංග පරිත්‍යාගය ජීවිතපරිත්‍යාගය පුත්‍රපරිත්‍යාගය කලත්‍රපරිත්‍යාගය යන

1. පිසින් පිසින්  2. දන

Non-Commercial Distribution

පඤ්චමහාපරිත්‍යාගය කොට ලොවුතුරා බුදු වූහ. මම ද පුත්‍රපරිත්‍යාගය කොට ඒ මහොත්තමයන්ට ඇතුළත් වූ ලොවුතුරා බුදු වෙමි’ යි සිතා අවවාද කොට ගෙණ පන්සලින් නික්ම පුවරුවක හුන්සේක. එකල කුමාරවරු බ්‍රාහ්මණයා විෂමස්ථානයක පය පැකිල වැටුනු කල්හි පෙර සේ ම බැම්ම ගලවා ගෙණ පහර ලදින් මරණ භයින් හඬ ලන කුකුළන් සෙයින් බිය පත් වූ ශබ්ද කෙරෙමින් පලා අවුත් මහාබෝධිසත්වයන්ගේ පාමුල වැද වැටී හඬන්නට වන්හ. ජූජකතෙමේත් වහා දිව අවුත් ‘කොල්ලෙනි, තෙපි පැන යන්ට ඉතා සමර්ථයහ’ යි කියා නැති ගන්වමින් අල්වා බැඳ ගෙණ බෝධිසත්වයන් වහන්සේ බලබලා හින්ද දී ම සාබා ඉපලින් තළතළා ගෙණ **(347)** යන්නේ ය. එකල **කෘෂ්ණජිනාවන්** කරකැවී මහාබෝධිසත්වයන්ගේ මුහුණ බලබලා ‘අම්මණ්ඩිනි, මේ බ්‍රාහ්මණයා තමාගේ ගෙයක උපන් දසියක සේ මා තළතළා ගෙණ යන්නේ ය. මොහු ධාර්මික බ්‍රාහ්මණයෙක් නො වන්නේ ය. යක්ෂයෙක් බ්‍රාහ්මණවර්ණයෙන් අවුත් මා කා මරන්නට හෝ පිස පියන්නට හෝ ගෙණ යන්නේ ය. අම්මණ්ඩිනි, මේ පිසාචයකු විසින් ගෙණ යන කල්හි බලා හිඳිනේ ඇයි ද? මා පිටින් වාහින ලේ නො පෙණේ ද? රන්සුණු ආලෙප කොට සුවඳ දියෙන් නහවා සමන්මල් පිට ලා මා වැඩුයේ මෙබඳු වූ දුක් දීපියන්නට ද?’ යනාදීන් අනෙක විලාප කියකියා යන කල්හි මහාබෝධිසත්වයන් වහන්සේට ඉතා බලවත් වූ සොක උපන්නේ ය. හෘදයවස්තුව හුණු වී ය. බලවත් ව නික්මෙන ආශ්වාසප්‍රශ්වාසයට නාසය නො සෑහීමෙන් මුඛයෙන් අතිඋෂ්ණ වූ ආශ්වාසප්‍රශ්වාසය නික්මෙන්නට වන. ඇසින් ලේ කඳුළු වාහින්ට වන. හෘදය පැළී යන සේ බලවත් වූ සොකයෙන් නැවෙත් නැවෙත් සර්වඥතාඥනය ම සිහි කෙරෙමින් ප්‍රඥබලයෙන් සොකසල්ලය නැති කොට ගත්සේක. කුමාරවරු ද කිසි පිළිසරණක් නැත්තෙන් ‘නහෝ වරෝ, නැසී යම්හ. මෙවිට අපගේ දිවි නො රැකේ ම ය. මපියානන් ලය ගලක් වැන්න. අප මෑනියෝ අවූ නම්, මේ සා දුක් වැද්ද නො දෙන දැ ය. අහෝ! මවුනුදු ඇසින් දක්නා නො ලදුම්හ. අනේ! වන දෙවතාවෙනි, තොපට යටත් ව වඳුම්හ. පියුම්සර වසන නාගෙන්ද්‍රගොල්ලෙනි, තොප වඳුම්හ. මේ සොහන නම් නදීතීර්ථයෙහි අධිගෘහීත වූ දෙවතාවෙනි, තොප වඳුම්හ. අප අම්මණ්ඩීන් වැඳ සමු ගත් බව කියන්නේ ය. අප නීරොගබව[1] කියන්නේ ය. අප බමුණු ගෙණ ගිය බව කියන්නේ ය. අනේ! රුක්දෙවියෙනි, අප හා පුරුද්දෙනි, අපගේ මද්‍රී නම් මෑනියන්ට ‘ඉදින් තෙපි ලුහුබැඳ යනු කැමැත්තහු නම්, අනුබඳනා වූ තෙපි දරුවන් වහා ම දක්නහු ය’ යි කියන්නේ ය. අනේ! වනදෙවතාවෙනි, අපි යම්හ. අනේ අප හා පුරුද්දෙනි, අපට සමු දෙන්නේ ය’ යනාදීන් විලාප කියකියා හඬ දෙන්නා වූ කුමාරවරුන් ජූජකයා යමයකු සේ මරමරා ගෙණ ගියේ ය.

1. නීරෝගී ව

*Non-Commercial Distribution*

"මද්‍රීදෙවීන් වහන්සේ ද 'අහෝ! මා විසින් රාත්‍රියෙහි නපුරු ස්වප්න යක් දක්නා ලද්දේ ය. උදය ම පන්සලට යෙමි' සිතා ඵලාඵල අල සොයමින් ඇවිදින කල තෙප්පින්න අතින් වැටෙන්නේ ය. පැස උරෙන් ගැලවී වැටෙන්නේ ය. දකුණු ඇස නටන්නේ ය. අඵලරුක් ඵලරුක් සේ පෙණෙන්නේ ය. දශදිශාව මේ ය යි කියා නො දනෙන්නේ ය. සර්වාංගය වෙවුලන්නේ ය. එකල වනයෙහි අධිගෘහිත වූ දෙවතාවෝ 'අහෝ! මද්‍රීදෙවීන් වහන්සේ ඵලාඵල ගෙණ අද උදය ම පන්සලට ගියෝ නම්, දරුවන් නො දක විමසා පියවර බලා දිව ගොස් බලවත් වූ දුකට පැමිණෙති. එබැවින් සිංහ ව්‍යාඝ්‍ර දිවිවෙස් ගෙණ මාර්ගය රකිම්හ' යි කියා තුන්දෙනෙකු සිංහවෙස් ව්‍යාඝ්‍රවෙස් දිවිවෙස් ගෙණ මද්‍රීදෙවීන්ට පෙණිපෙණී සරස් ව මාර්ගය රකිමින් හිරු අස්තංගත වූ කල අන්තර්ධාන වූහ. මද්‍රීදෙවීන් වහන්සේ මහාසොකයෙන් තැවිතැවී එදවස් මුළුල්ලෙහි පන්සලට යා නො හැකි ව අනෙකවිලාප කියා ඇවිදිමින් දෙවතාවන් ඉවත් ව ගිය කල පන්සලට ගොස් කුමාරවරුන් නො දක 'අහෝ! මා දරුවෝ මෙතෙක් දවස් දිව අවුත් අම්ම **(348)** කියති. ඵලාඵල ඉල්වති. පැස ගණිති. මා කර එල්වී යෙති. අද එකාන්තයෙන් ම මා දරුවෝ 'නස්නා ලද්දෝ ය' යි සිතා මහාසොකයෙන් ලය උණු ව ගෙණ බොධි-සත්වයන් ලඟට ගොස් පැස බිම තබා දෙහොත් නගා වැඳ ගෙණ 'අනේ! ස්වාමීනි, මා දරුවෝ කොයි ද? ඇතුළුගෙට වැද සැතපී ගත්තු ද? ක්‍රීඩා ප්‍රසෘත ව වන මැද ගියාහු ද? සිංහ ව්‍යාඝ්‍රාදීන් විසින් ගෙණ යන ලද්දෝ ද? මුත්තනුවන්ගේ රටින් අවුත් ගෙණ ගියෝ ද? අහසින් ඇත්කඳලිහිණියෝ ගෙණ ගියාහු ද? කිසිවක් නො බැණ හිඳිනේ ඇයි ද, හිමි, මපුත්තු කොයි ද?'යි විචාළී ය. එකල මහබෝසතාණෝ මුවෙන් නො බැණ හුන්සේක. එවිට ම මද්‍රීදෙවීන් වහන්සේ 'අනේ! ස්වාමීනි, මට නුඹ වහන්සේ කිසිවක් නො බැණ හිඳුනු එක් දුකෙක. මා දරුවන් නො දක්නා එක් දුකෙක. මහාරාජොත්තමයානන් වහන්ස, අද රෑ උදය ම නුඹ වහන්සේ මාගේ මෘතශරීරය දක්නාසේකැ' යි යනාදීන් විලාප කියකියා හැඬූහ. එකල මහාබොධිසත්වයන් වහන්සේ 'කර්කශ වූ කථාවෙන් මැගේ පුත්‍රශොකය තුනී කෙරෙමැ' යි සිතා:—

**'නනු මද්දි වරාරොහා-රාජපුත්ති යසස්සිනී,**
**පාතො ගතාසි උඤ්ඡාය-කිමිදං සායමාගතා.'**

යනුවෙන් 'මද්‍රීනි, තෙපි උතුම් වූ ආරොහපරිනාහයෙන් යුක්ත වූහ.. පෘථිවි-තලතිලක වූ චෙතියමහරජානන්ගේ දුවනි වූහ. අනන්ත වූ යසස් ඇත්තී ය. ඵලාඵල භික්ෂාචර්යාවට උදය ම ගියෝ[1] වුව. හිමාලයෙහි නම් බොහෝ වූ වනචරයන් හා තාපස සිද්ධ විද්‍යාධරයෝ හැසිරෙන්-නාහු ය. තොප විසින් කරණ ලද කිසිවක් කවුරු දනිද් ද? තෙපි උදය ම ගොස් මේ සඳපහනින් යුත් රාත්‍රි වනතුරු ලදරුවන්ගේ පවත් කෙසේ

1. ගියේ

Non-Commercial Distribution

දෝ හෝ යි කියා හෝ මාගේ ස්වාමිපුත්‍රතෙම කිසිවක් සිතනසේකැ යි කියා හෝ මෙච්චරකුත් නො සිතා ම කිමෙක් ද, මේ සවස චන්ද්‍රාලොක යෙහි අවු ය. මා දුර්ගත වූහ යි සිතුයෙහි ද? අරණ්‍යයට ගියා වූ සස්වාමික ස්ත්‍රීහු නම්, මෙ බඳු නො වන්නාහු ය' යි කියා තැනි ගන්වා වඤ්චා කොට කථා කළසේක. එපවත් අසා මද්‍රිදෙවීන් වහන්සේ 'අනේ! ස්වාමීනි, මේ වනාන්තරයෙහි සිංහව්‍යාඝ්‍රාදීන්ගේ භයානක වූ ශබ්ද නො ඇසූසේක් ද? මම වනාන්තරයෙහි ඵලාඵල සොයමින් නොයෙක් නපුරුනිමිති දැක 'නුඹ වහන්සේට හෝ මා දරුවන්ට වූ හානියෙක් ඇතැ' යි සිතා උදය ම එන්නෙම් සිංහ ව්‍යාඝ්‍ර දිවි යන තුන්දෙනෙකු මග සරස් ව මාගේ ගමනට අන්තරාය කළ හෙයින් පමා ව ආමි. ස්වාමීනි, මට ක්ෂමා කළ මැනව' යි කිවු ය. මහබෝසතාණෝ කිසිවක් නො බැණ හුන්සේක. එකල මද්‍රී දෙවීන් වහන්සේ අනෙකවිලාප කියා හඬත් ම මහාබොධිසත්වයන් වහන්සේ තුෂ්ණීම්භූත ව ම හිඳිනාසේක. එවිට මද්‍රීදෙවීන් වහන්සේ මහා සොකයෙන් කම්පා වෙමින් 'මා දරුවෝ කොයි ගියා ඇද් හො' යි කියකියා මහවනයට වැද චන්ද්‍රාලොකයෙහි දරුවන් සොයා ඇවිදිමින් 'මාගේ ප්‍රිය පුතනුවෙනි, **ජාලියකුමාරයෙනි**, මොබ එන්නේ ය. මා මැනියෙනි, **කෘෂ්ණජිනාවෙනි**, මොබ එන්නේ ය. අම්ම ය යන බසක් මා කණ හෙළා ලන්නේ ය. මාගේ ලය ගිනි නිවා ලන්නේ ය' යි කියකියා හිස ලය පැහැර හඬහඬා කෙළ පුරුදු රුක්සෙවණ වැලිතලා ලියමඬුලු බලා නො දැක කෙළි වලන් ඇත් අස් ගොන්රු බලා නො දැක 'මා දරුවෝ මළාහු (349) ය' යි කියා මහාවිලාපයෙන් හඬන්නා වූ ශබ්දය අසා ඒ ඒ අතින් දිව ආ මෘගාදීන් දැක 'අනේ! ස්වර්ණවර්ණ වූ සාම නම් කුඩා මුවගොල්ලෙනි, තොප හා පුරුදු මාගේ දරුවෝ දක්නා ලද්දෝ ද? අනේ! සස ගොල්ලෙනි, කදලිමෘගයෙනි, උලූකයෙනි, ස්වර්ණවර්ණ වූ හංසයෙනි, මයූරයෙනි, තොප හා පුරුදු වූ මාගේ දරුවෝ දක්නා ලද්දෝ ද? අනේ! මා දරුවන් හා පුරුදු වූ කොස්ලිහිණියෙනි, මා දරුවෝ නො දක්නා ලද්දෝ ද?' යනාදීන් විලාප කියකියා මුළු වනය විමසා දරුවන් නො දැක අවුත්, මහා බොධිසත්වයන්ගේ පා මුල හඬා වැටී 'ස්වාමීනි, මා දරුවෝ කොයි දැ?' යි විචාළී ය.

එකල බොධිසත්වයන් වහන්සේ තුෂ්ණීම්භූත ව ම හුන්සේක. එවිට මද්‍රීදෙවීන් වහන්සේ පහර කෑ කිකිළියක සේ මහාසොකයෙන් හඬා වනයට වැද පෙර සේ ම විමසා අවුත් 'ස්වාමීනි, මා දරුවෝ කොයි දැ?'යි විචාළී ය. මහාබොධිසත්වයන් වහන්සේ කිසිවක් නො වදළසේක. තුන්වැනි වටහි දු මද්‍රීදෙවීන් වහන්සේ පුත්‍රශොකයෙන් මහාවනයට වැද සියලු වෘක්ෂ පර්වත ගංගා විල් පොකුණු ගල්ගුහාදිය විමසා තුන්ගමනින් පසළොස්යොදුනක ගමන් ගෙවා හැසිර දරුවන් නො දැක අරුණු නැඟුනු කල උමතු ගත්තියක සේ පන්සලට වැද මහාබොධිසත්වයන්ගේ පාමුල

Non-Commercial Distribution

'ස්වාමීනි, මා දරුවන් නැතැ' යි කියා හිස අත බැඳ මහහඬින් හඬා පුත්‍ර ශොකයෙන් විසංඥ ව ස්වර්ණකදලිස්කන්ධයක් කපා හෙළූ කලක් මෙන් එතැන පෘථිවියෙහි පතිත වූහ. එයින් වදළහ:—

**'ඉති මද්දී වරාරොහා–රාජපුත්තී යසස්සිනී,**
**බාහා පග්ගය්හ කන්දිත්වා–තත්ථෙව පපතා ඡමා' යි.**

''එකල අප මහාබොධිසත්වයන් වහන්සේ '**මද්‍රී මළාහ**' යි සිතා කම්පා වෙමින් 'අහෝ! අස්ථාන වූ මහාවනයෙහි කලුරිය කළෝ ය. ඉදින් මද්‍රී මාගේ **ජයතුරා**නුවර කලුරිය කළා නම් මහත් වූ ආදහන පෙරහරෙක් වන්නේ ය. දෙරට සෙල්වී යන්නේ ය. මම වනාහි අරණ්‍යයෙහි එකලා ව ම කුමක් කෙරෙම් දැ?' යි කියා උපන්නා වූ බලවත් සොකයෙන් තැවෙමින් නැවත සිහි උපදවා ගෙණ 'තවත් පරීක්ෂා කෙරෙමි' යි සිතා නැඟිට හෘදයෙහි අත තබා ප්‍රාණගති ඇති බව දැන වහා කමණ්ඩලාවෙන් පැන් ගෙණවුත් සත්මාසයක් මුළුල්ලෙහි අතින් ශරීරය නො ඇල්ලූයේ ද බලවත් වූ සොකයෙන් ප්‍රව්‍රජිතභාවයත් සලකා ගත නො හැකි වූසේක්, 'මා මද්‍රීනි, යි කියමින් කඳුළු පිරුණු ඇසින් යුක්ත ව නැමී දැතින් මද්‍රී දෙවින්ගේ හිස ඔසවා දෙපා දිගු කොට හිඳ ඔක්ක තබා ගෙණ පැන් ඉස මුඛය හා හෘදය පිරිමැද මැද සුසුම් ලලා හුන්සේක. මද්‍රීදෙවීන් වහන්සේ ද මඳක් කල් මූර්ඡා ව හිඳ සිහි ලදින් හිරිඔතප් උපදවා නැඟී සිට බොධි-සත්වයන් වැඳ, 'ස්වාමීනි, මාගේ **වෙස්සන්තර**මහරජානෙනි, මාගේ දරුවෝ කොයි ගියාහු දැ?' යි විචාළී ය. 'දෙවිනි, එක්තරා මහලු බමුණෙක්හට බුදුබව පතා දන් දිනිමි. තෙපි ද පින් අනුමෝදන් ව' යි වදළසේක. 'අහෝ! ස්වාමීනි, මෙපවත් නො වදරා තුන්යම් රෑ මා වෙහෙසා වදළසේකැ' යි කියා සතුටින් පැන නැඟී 'සාධු! ස්වාමීනි, පින් අනුමෝදන් වීමි. සාධු! සාධු! ස්වාමීනි, පින් අනුමෝදන් වීමි' යි කියා තුන්යලක් සාධුකාර **(350)** දුන්හ. එකෙණෙහි ඈගේ පින් අනුමෝදන් වීම හා සමග ම **හිමාලයෙහි** නාරදපර්වතවාසී වූ විවිධදෙවනිකායෙහි දෙවියෝ තමතමන්ගේ විමන්දෙර හිඳ 'සාධු! සාධු! දෙවීනි, අපි ද පින් අනුමෝදන් වම්හ' යි කියා සාධුකාර දුන්හ. ශක්‍රබ්‍රහ්මාදී දෙවියෝ ද සතුටින් පින් අනුමෝදන් ව සාධුකාර දුන්හ. මෙසේ පුත්‍රදානයෙහි පින් අනුමෝදන් ව ඔවුනොවුන් සමග සතුටු කථා කෙරෙමින් හුන් කල **ශක්‍ර දෙවෙන්ද්‍ර**තෙම සිතනුයේ 'අහෝ! සාධු! අපගේ **වෙස්සන්තර** නම් බුද්ධාංකුරොත්තමයානන් වහන්සේ හීයේ දවස් පෘථිවි කම්පා කරවා කුමාරවරුන් දන් දුන්සේක. සර්වශීලාචාරසම්පන්න වූ **මද්‍රී**දෙවීනු දූ අනික් හීන ජාති ඇති යාචකයක්හට දුන්සේක් වී නම්, නපුර. බොධි-සත්වයෝ ද එකල එකලා ව ම වෙසෙති. එබැවින් මම බමුණුවෙසින් ගොස් **මද්‍රී**දෙවීන් දන් ලබා පාරමිතාධර්මයන් කුළු ගන්වා ඒ **මද්‍රී**දෙවීන් රජහට ම භාර කෙරෙමින් එමි' යි සිතා මහලු වූ බ්‍රාහ්මණවෙශයක් මවා ගෙණ මහාබොධිසත්වයන් වහන්සේ කරා ගොස් සැපදූක් විචාරා එකත්-පසෙක හිඳ 'මහාරාජොත්තමයානන් වහන්ස, මම ඉතා මහලු වීමි,

Non-Commercial Distribution



වෙස්සන්තර රජතුවූස්තුමා මද්‍රී දේවිය ශක්‍රබ්‍රාහ්මණයාට දන්දීම (397 පිටුව)

Non-Commercial Distribution

ස්වහස්තයෙන් කර්මාන්තයකු දු කොට ගත නො හැක්කෙමි. එබැවින් මේ තාක් දුරුකතර ගෙවා මොබ එන්නෙමි, තෙල මද්‍රීදෙවීන් පිණිස ආමි. ඈ මට භාර්යා කොට දුන මැනැවැ' යි කීහ. එකල මහාබොධිසත්වයන් වහන්සේ සතුටින් පිණා සාධුකාර දෙමින් මද්‍රිදෙවීන් මුහුණ බලා 'මද්‍රිනි, මාගේ ප්‍රියදෙවීනි, තොප නිසා ම සංසාරසාගරයෙන් එතෙර වනු කැමැත්තෙමි. මාගේ ප්‍රිය දෙවීනි, තොපගේ ආධාරයෙන් ම ලොවුතුරා සර්වඥතාඥානයට පැමිණෙනු කැමත්තෙමි. මද්‍රීනි, තොපගේ සහායෙන් ම ලොවුතුරා සර්වඥතාඥානයට පැමිණ තොප ඇතුළු වූ තුන්ලෝවාසීන් සංසාර සාගරයෙන් එතෙර ලනු කැමැත්තෙමි. මේ තාක් ආත්මාර්ථ පරාර්ථ සලකව' යි වදළ කල්හි 'යහපත, ස්වාමීනි. නුඹ වහන්සේගේ අභිප්‍රාය ලෙසක් කර වදළ මැනැවැ' යි කීකල සතුටින් පැනනැඟී 'බමුණ, මොබ එව' යි වදරා මද්‍රීදෙවීන්ගේ අත ගෙණ බමුණු අත තබා 'සාධු! සාධු! මාගේ මේ ප්‍රියතර කලත්‍රදනයෙන් මතු ලොවුතුරා බුද්ධරාජ්‍යයට පැමිණ සූවිසි අසංඛ්‍යයක් සත්වයන් නිවන් දක්වමි' යි කියා බුදුබව පතා බමුණු අත පැන් වක් කොට මද්‍රීදෙවීන් දන් දුන්සේක. එකල **මද්‍රීදෙවීන්** දෙන කල්හි දූ භූමිය පටන් බ්‍රහ්මලොකය දක්වා එකනින්නාද කොට ගගනතලයෙහි දෙවියෝ ප්‍රමුදිත ව සාධුකාර දුන්හ. දෙලක්ෂසතළිස්දහසක් යොදුන් ඝනකඩ මහාපෘථිවිය ද මහහඬින් ගුගුරා කම්පා වී ය. මහමෙර නැමී නමස්කාර කෙළේ ය. හිමාලයපර්වතය හා සප්තකුලපර්වතයෝ ද නැමිනැමී වැඳුම් ගත්හ. ලොකයෙහි අනෙක ආශ්චර්ය පහළ වී ය. එයින් වදළහ. **චර්යාපිටකයෙහි:—**

**'මද්දියා දීයමානාය–ගගනෙ දෙවා පමොදිතා,**
**තදාපි පඨවි කම්පි–සිනෙරුවනවටංසකා' යි.**

''මෙසේ **ශක්‍රබ්‍රාහ්මණ**තෙමේ මද්‍රීදෙවීන් දන් ලැබ, 'එම්බා, රජ්ජුරුවෙනි, මා ලත් මේ බිරින්ද තොපට ම භාර කෙරෙමි. මට මුත් අනිකක්හට නො දෙව' යි කියා බොධිසත්වයන්ට ම භාර කොට ශක්‍රදෙවෙන්ද්‍රවිලාසයෙන් **(351)** අහස සිට, 'මහරජානෙනි, මාගෙන් අටවරයක් ගණුව' යි කියා කී තාක් වර දෙමින් 'මාගේ ශ්‍රී මහාබෝසතානන් වහන්ස, නුඹ වහන්සේගේ මේ දනපාරමිතාව සමග ම දශපාරමිතාධර්මයෝ ම අද මස්තකප්‍රාප්ත වූහ. තෙල **මද්‍රීදෙවීන්** දන් දුන් වේලෙහි මහපොළොව කම්පා වී ය, දෙදරුවන් දන් දුන් වේලෙහි ද මහපොළොව කම්පා වී ය. එයින් නුඹවහන්සේ මේ කල්පයෙහි ම ලොවුතුරා බුදු වනසේක් ම ය. මෙවිට මේ වනයෙහි වෙහෙස ව වාසය නො කොට සියනුවරට ගොස් රාජ්‍යශ්‍රී විඳ දෙව්ලොවට අව මැනැව. නුඹ වහන්සේගේ දෙදරුවන් ගෙණ ගිය **ජූජක** නම් බමුණුතෙමෙ මංමුලා ව **සඳමහරජ්ජුරුවන්** කරා ගියේ ය. **සඳමහරජ්ජුරුවෝ** බමුණුහට අගය කළ තාක් වස් දෙමින් නිදහස් කොට ගෙණ මුණුබුරන්ගෙන් දෙමවුපියන්ගේ තොරතුරු අසා මහාසොකයෙන්

Non-Commercial Distribution

කම්පා වෙමින් සැටදහසක් චෙතියරජුන් හා ඒ තාක් බිසෝවරුන් හා ඵුසතිදෙවින් ඇතුළු ව දෙරට මහසෙනග ගෙණ තොප පියානෝ සත් දවසකින් තොප කරා එති' කියා කියා දෙව්ලොවට ගියේ ය.

මෙසේ ශක්‍රදෙවෙන්ද්‍රයන් කියා ගිය පරිද්දෙන් ම සඳමහාරාජොත්තමයානෝ සත්දවසින් දෙරට මහසෙනග ගෙණ වංකගිරියට ගොස් මහාබොධිසත්වයන් වහන්සේ දකින් ම ලය හුණු ව ගෙණ දෙඅතින් මහාබොධිසත්වයන් වැලඳ ගත්තෝ ය. මහාබොධිසත්වයෝ ද පෙර ගමන් ගොස් පියානන් වැලඳ ගත්තෝ ය. මද්‍රීදෙවින් හා ඵුසතිදෙවින් ඔවුනොවුන් වැලඳ ගත්තෝ ය. දෙදරුවෝ දිව අවුත් මද්‍රීදෙවින්ගේ දෙතන එල්වී ගියෝ ය. එපවත් දුටු කිසිකෙනෙක් ස්වභාවයෙන් හින්ද නො හී ඔවුන්ගේ ප්‍රෙම නමැති කල්පාන්ත මහාවාතයෙන් මුලින් උපුටා ගිය මහසල් වනයක් සේ මිහිමඬල ගලා හඬා වැටී අස්වස් නො ලැබ උන්හ. ඒ දැක ශක්‍ර දෙවෙන්ද්‍රයන් වස්වාලූ පොකුරුවර්ෂාවෙන් තෙමී සියන් ලැබ ඔවුනොවුන්ගේ සැප දුක් විචාළාහු ය. එකෙණෙහි ද මහපොළොව කම්පා වී ය. එයින් වදළහ:—

'පුනාපරං බ්‍රහාරඤ්ඤෙ-මාතාපිතු සමාගමෙ,
කරුණං පරිදෙවන්තෙ-සල්ලපන්තෙ සුඛං දුඛං.
හිරොත්තප්පෙන ගුරුනා-උභින්නං උපසංකමි
තථාපි පඨවී කම්පි-සිනෙරුවන වටංසකා' යි.

"මෙසේ නෑයන් සහිත වූ මාතෘපිතෘසමාගමයෙහි හඬා වැලප සඳමහ රජ්ජුරුවන්ගේ ආරාධනාවෙන් ඔටුනු පැළඳ ශක්‍රදෙවෙන්ද්‍ර විලාසයෙන් මහපෙරහරින් ජයතුරානුවරට වැඩි දවස්හි ද මහපොළොව මහහඬින් ගුගුරා කම්පා වී ය. හිමාලයපර්වතය හා සප්තකුලපර්වතයෝ නැමී නැමී වැඳුම් ගත්හ. මහමෙර නැමී නමස්කාර කෙළේ ය. අකාලමෙඝ වර්ෂා කොට භූමිය ශුද්ධ කෙළේ ය. සත්රුවන් වර්ෂා කෙළේ ය. ශක්‍රපුරය සෙයින් ජයතුරානුවර අනන්ත ක්‍රීඩා මගුල් වී ය. එයින් වදළහ. චර්යාපිටකයෙහි:—

'පුනාපරං බ්‍රහාරඤ්ඤා-නික්ඛමිත්වා සඤාතිභි,
පවිසාමි පුරං රම්මං-ජේතුත්තරපුරුත්තමං.
(352) රතනානි සත්තවස්සිංසු-මහාමේඝො පවස්සථ,
තදාපි පඨවී කම්පි-සිනෙරුවන වටංසකා' යි.

"මහරජානෙනි, මෙසේ ඒ වෙස්සන්තර නම් බුද්ධාංකුරොත්තමයානෝ අටවයස්හි ජීවිතපරිත්‍යාගචෙතනාව ය, හස්තිදන ය, නගරවිලොකන ය, පුත්‍රදන ය, කලත්‍රදන ය, වංකගිරිය ඥාතිසන්නිපාතය, ජයතුරා නගර ප්‍රවෙශය යන සත් තැනෙක පෘථිවි කම්පා කරවා තමන්වහන්සේගේ ආත්මය සමාන අතිවිශ්වාස වූ ඉතා සුවච කීකරු වූ ගුණනුවණින් තුන්ලෝ

Non-Commercial Distribution

අගනා වූ **ජාලියකුමාර කෘෂ්ණජිනා මද්‍රීදේවීන්** බුදුබව ප්‍රාර්ථනා කොට බමුණන්ට දන් දෙමින් මහපොළොව ගුගුරුවා මහමෙර නමා වැඳුම් ගණිමින් තුන්ලෝවාසීන් ලවා සාධුකාර දෙවමින් පාරමිතාධර්මයන් පුරා මස්තකප්‍රාප්ත කර වදළසේක. මහරජාණෙනි, මෙසේ අතිදුෂ්කර වූ ක්‍රියාවන් කළ බැවින් මහාබොධිසත්වයන් වහන්සේගේ කීර්තිඝොෂාව දසදහසක් සක්වළ මුළුල්ලෙහි දිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි ඉතා උස් ව පැන නැංගේ ය. සදිව්‍යලොකයෙහි දෙව්යෝ තමතමන්ගේ දිව්‍යභවනවල හිඳ ‘අහෝ! **වෙස්සන්තරරජ්ජුරුවන්ගේ** පුත්‍රදානය ආශ්චර්ය ය’ යි කියා ප්‍රශංසා කෙරෙති. අසුරයෝ අසුරභවනයෙහි ප්‍රශංසා කෙරෙති, ගරුඩයෝ ගරුඩභවනයෙහි ප්‍රශංසා කෙරෙති, නාගයෝ නාගභවනයෙහි ප්‍රශංසා කෙරෙති, යක්ෂයෝ යක්ෂභවනයෙහි ප්‍රශංසා කෙරෙති. ඒ **වෙස්සන්තර** මහරජානන්ගේ කීර්තිශබ්දය මුඛපරම්පරාවෙන් ම පිළිවෙළින් ම අද දක්වා අපගේ මේ සරාජිකශ්‍රමණපිරිසට පැමිණියේ ය. ඒ දානය යහපත් කොට දෙන ලද්දේ ද ය. නොහොත් නපුරු කොට දෙන ලද්දේ ද ය යි කියා අපි දූන් අගුණ කියමින් කිපෙමින් උන්නම්හ. මහරජාණෙනි, ඒ මේ කීර්ති ශබ්දයතෙමේ ප්‍රඥවෙන් නිපුණ වූ ඤාණවත් විද්වජ්ජන වූ අතිසයින් ප්‍රඥව භාවිත වූ බොධිසත්වයන් වහන්සේලාගේ දශගුණයක් දක්වන්නේ ය, කවර දශගුණයෙක් ද? යත්:— කිසිවෙක නො ගිජු බව ය, නිරාලයබව ය, වස්තු පරිත්‍යාග ය, සියලු සැපත් හැරීම ය, නැවත ගිහිගෙට නො එන බව ය, බොධිසත්වචරිතයාගේ මෘදු බව ය, ඉතා මහත් බව ය, බුද්ධකාරකධර්මයාගේ අවබොධ නො කට හැකිබව ය, අතිදුර්ලභබව ය, අසදෘශතාව ය යන මොහු ය. මහරජාණෙනි, ඒ මේ කීර්තිශබ්දයතෙම නුවණින් නිපුණ වූ ඤාණවත් වූ විද්වජ්ජන වූ අතිසයින් ප්‍රඥව භාවිත වූ බොධිසත්වයන් වහන්සේලාගේ මෙකී දශගුණයන් වන්නේ ය’’ (යි වදළ සේක.) ‘‘ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමෙක් අනුන්ට දුක් දෙවා දන් දෙන්නේ ය, කිමෙක් ද, ඒ දානය ස්වර්ගසංවර්තනික වූ ලොවී-ලොවුතුරා සැපවිපාකයෙක් වේ ද?’’ යි විචාළෝ ය. ‘‘එසේ ය, මහ රජාණෙනි, ඒ දානය ස්වර්ගසංවත්තනිකබව කිය යුතු කිම ද? අනන්ත සැප ඇතැ’’ යි වදළසේක. ‘‘එසේ වී නම් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මට කාරණයක් ගෙණ හැර දක්වා වදළ මැනැවැ’’ යි කීහ. ‘‘මහරජාණෙනි, මේ ලොකයෙහි කල්‍යාණධර්ම සමන්නාගත වූ සිල්වත් වූ කිසි ශ්‍රමණකෙනෙක් හෝ බ්‍රාහ්මණකෙනෙක් හෝ වන්නාහ. හෙතෙම අත්පා බිඳුනේ හෝ කොර වූයේ හෝ අනික් කිසි ව්‍යාධියකට හෝ පැමිණියේ හෝ වී නම්, ඒ දුකට පත් වූ ඔහු දක යම් කිසි පින් කැමැත්තා වූ **(353)** පුරුෂයෙක් ගොන් යෙදූ සකටරථාදි යානාවකට නඟා ඔහු ප්‍රාර්ථිත වූ කැමැති දෙසයකට පමුණුවා ලූයේ වී නම්, කිමෙක් ද, මහරජාණෙනි, ඒ පින් කැමැති පුරුෂයාහට ඒ කාරණයෙන් කිසි සැපතක් පහළ වේ ද? ඒ පුණ්‍යකර්මය ස්වර්ගසංවත්තනික වේ ද?’’ යි විචාළසේක. ‘‘එසේ ය, ස්වාමීන් වහන්ස, ඔහට සැප උපදනාබව කිය යුතු කිම ද? ස්වාමීනි, ඒ

Non-Commercial Distribution

පුරුෂතෙම කැමැති නම් නොයෙක් හස්තිවාහන හෝ ලබන්නේ ය. අශ්වයානාවන් හෝ ලබන්නේ ය, රථයානාවන් හෝ ලබන්නේ ය, ථලයෙහි ථලයානාවන් හෝ ලබන්නේ ය, ජලයෙහි ජලයානාවන් ලබන්නේ ය, දිව්‍යලොකයෙහි දිව්‍යයානාවන් ලබන්නේ ය, මනුෂ්‍ය ලොකයෙහි මනුෂ්‍යයානාවන් ලබන්නේ ය, උපනුපන් භවයක් භවයක් පාසා එයට සුදුසු සුදුසු වූ එයට අනුලොමික වූ යානාවන් පහළ වන්නේ ය, ඔහට එයට සුදුසු වූ සැපසම්පත් ද පහළ වන්නේ ය, එම කුශලයෙන් ම සුගතියෙන් සුගතියට යන්නේ ය, එ ම කුශලානිසංසයෙන් ම ඍද්ධි යානාවට නැඟී ප්‍රාර්ථිත වූ අමෘතමහානිර්වාණපුරයට පැමිණෙන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ පින් කැමැත්තා වූ පුරුෂතෙම යානාව උසුලන බලිවද්දයන්ට යම් දුකක් අනුභව කරවා තෙමේ මෙබඳු වූ ලොව්ලොවුතුරා සැපසම්පත් අනුභව කරන්නේ වී නම්, ඒ කාරණයෙන් අනුන්ට දුක් දීමෙන් දෙන ලද දනය ද ස්වර්ගසංවත්තනික වූ සැපවිපාක වන්නේ ය.''

''තව ද, මහරජානෙනි, යම් ප්‍රකාරයකින් අනුන්ට දුක් පමුණුවා ලීමෙන් දෙන ලද්ද වූ දනය ස්වර්ගසංවත්තනික වූ සැපවිපාකය වේ ද, එයට තෙපි අනිකුදු ඉතිරි කාරණයක් අසව. මහරජානෙනි, මේ ලොක යෙහි පෘථිවීශ්වර වූ යම්කිසි නරදෙවෙන්ද්‍රයෙක් තෙම තමාගේ ආඥව පවත්නා ජනපදයෙන් රජගෙට නියත වූ ධාර්මිකපඬුරු ආඥ පවත්වා ලීමෙන් ගෙන්වා එයින් දන් දෙන්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ රජ්ජුරුවෝ ඒ කාරණයෙන් කිසි සැපතක් අනුභව කෙරෙද් ද? ඒ දනය ස්වර්ගසංවත්තනික ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, ස්වර්ගසංවත්තනික බව කිය යුතු කිම් ද? ස්වාමීන් වහන්ස, ඒ මහරජානන් වහන්සේ ඒ දන් දුන් කාරණයෙන් ඒ රජසැපතට අධික වූ අනෙකශතසහස්‍ර ගුණයන් ලබන්නේ ය. සියලු රජදරුවන්ට අධිපති ව අතිරාජ වන්නේ ය, සියලු දෙවියන්ට අතිදිව්‍යරාජ වන්නේ ය, සියලු බ්‍රහ්මයන්ට අධිපති ව අතිබ්‍රහ්මරාජ වන්නේ ය, සියලු ශ්‍රමණයන්ට අධිපති ව අතිශ්‍රමණ වන්නේ ය, සියලු ම බ්‍රාහ්මණයන්ට අධිපති ව අතිබ්‍රාහ්මණ වන්නේ ය සියලු ම රහතන් වහන්සේට වඩා අතිඅරහන්ත වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ රජ[1] අය පඬුරු ගෙණ ජනයා පීඩිත කොට දෙන ලද්ද වූ දනයෙන් මෙබඳු වූ යම් අධික වූ යසසම්පත්තියක් අනුභව කරන්නේ වී නම්, එහෙයින් පරදුක්ඛාපානයෙන් දෙන ලද්ද වූ දනය ද ස්වර්ගසංවත්තනික වූ සැපවිපාක වන්නේ යි.'' ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ **වෙස්සන්තර** නම් මහරජානන් වහන්සේ තමන් වහන්සේගේ යම් භාර්යාකෙනෙකුන් අනිකක්හට භාර්යා පිණිස දුන්සේක් ද, තමන්ගේ ඖරසපුත්‍රවරුන් ජූජකබ්‍රාහ්මණයාට දසභාවයට දුන්සේක් ද, ඒ **වෙස්සන්තර (354)** මහරජානන් විසින් දෑඬි වූ දනයක් දෙන ලද්දේ ද, **අතිදනය** නම්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ලොකයෙහි නුවණැත්තන් විසින් නින්ද කරණ ලද්දේ ය. ගර්හා කරණ ලද්දේ ය. ස්වාමීනි,

1. රජ්ජුරුවෝ

Non-Commercial Distribution



වෙස්සන්තර රජතවුස්තුමා මද්‍රී දේවිය ශක්‍රබ්‍රාහ්මණයාට දන්දීම (397 පිටුව)

Non-Commercial Distribution

නාගසෙනයන් වහන්ස, යම් සේ ඉතා දැඩි වූ භාරයෙන් ගැලෙහි අකුර බිඳෙන්නේ ය, අතිභාරයෙන් නැව ගිලෙන්නේ ය, අතිඅනුභවයෙන් භොජනය විසමයට යන්නේ ය, අතිවර්ෂාවෙන් ධාන්‍යය විනාශ වන්නේ ය, අතිදානයෙන් භොගක්ෂය වන්නේ ය, අතිතාපයෙන් ඇඟ දන්නේ ය, අතිරාගයෙන් උම්මත්තක වන්නේ ය, අතිද්වෙෂයෙන් වධ ප්‍රාප්ත වන්නේ ය, අතිමොහයෙන් අනයව්‍යසනයට පැමිණෙන්නේ ය, අතිලොභයෙන් චොරග්‍රහණයට පැමිණෙන්නේ ය, අතිභයින් නිරුද්ධ වන්නේ ය[1] ඉතා පිරීමෙන් ගඟ ඉතිර යන්නේ ය, අතිවාතයෙන් අසනිපාත වන්නේ ය, අතිවහ්නියෙන් ඔදනය ඉතිර වැටෙන්නේ ය, අතිසංචාර යෙන් බොහෝ කලක් ජීවත් නො වන්නේ ය, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, එපරිද්දෙන් ම අතිදානය නම් ලොකයෙහි නුවණැත්තන් විසින් නින්දා කරණ ලද්දේ ය. ගර්හා කරණ ලද්දේ ය. ස්වාමීනි, නාගසෙන යන් වහන්ස, **වෙස්සන්තර** රජ්ජුරුවන් විසින් අතිදානය දෙන ලද්දේ ය. එහි අතිදානයෙන් කැමැති විය යුතු වූ ලැබිය යුතු වූ මඳකුත් ඵලයක් නැතැ'' යි කීහ.

''මහරජානෙනි, අතිදානය ලොකයෙහි නුවණැත්තන් විසින් වර්ණනා කරණ ලද්දේ ය, ස්තුති කරණ ලද්දේ ය, ප්‍රශස්ත කරණ ලද්දේ ය, යම් කිසිකෙනෙක් යම්කිසි දානයක් දෙන්නාහු ය, අතිදානය දෙන්නා වූ දායක තෙම ලොකයෙහි කීර්තියට පැමිණෙන්නේ ය, මහරජානෙනි, යම් සේ අතිප්‍රවර බැවින් දිව්‍යමය අන්තර්ධාන ඇති බෙහෙත්මුලක් ගන්නා ලද පුරුෂයා හස්තපාසයෙහි සිටියා වූ පරජනයන්ට නො දක්වනු ලබන්නේ ය. සර්වව්‍යාධිඝාතක වූ භෛෂජ්‍යයතෙම අතිජාතිතාවෙන් සර්වරොගයන් කෙළවර කරන්නේ ය, වහ්නිතෙම අතිජොති බැවින් සියල්ල දවන්නේ ය, උදකය අතිසීත බැවින් උෂ්ණය නිවන්නේ ය. පද්මය අතිපිරිසිදු බැවින් උදකකර්දමය හා නො ඇලෙන්නේ ය, මාණික්‍යරත්නය අතිගුණ බැවින් කැමැති සැපත් දෙන්නේ ය, විදුර අතිතිඛිණ බැවින් මුතුමැණික්පළිඟු විදින්නේ ය, පෘථිවිය අතිමහත් බැවින් නරොරගමෘග පක්ෂි ජල ශෛල පර්වත වෘක්ෂයන් ධරන්නේ ය, සමුද්‍රය අතිමහත් බැවින් නො පිරෙන්නේ ය, මහමෙර අතිභාරිත බැවින් අචල වන්නේ ය, ආකාශය අතිවිස්තාර බැවින් අනන්ත වන්නේ ය, සූර්යදිව්‍යරාජයා අතිප්‍රභා බැවින් අන්ධකාරය නසන්නේ ය, සිංහරාජතෙම අතිජාත බැවින් පහ වූ භය ඇත්තේ ය, මල්ලවයා අතිබල ඇති බැවින් ප්‍රතිමල්ලවයා වහා ම උඩ ඔසවා දමන්නේ ය, රජ්ජුරුවෝ අතිපින්වත් බැවින් අධිපති වන්නෝ ය, භික්ෂූන් වහන්සේ අතිසිල්වත් බැවින් නාග යක්ෂ නර අමරුන් විසින් නමස්කාර ලැබිය යුතු වනසේක. බුදුරජානන් වහන්සේ තුන්ලොවට අතිඅග්‍ර බැවින් අනොපමෙය්‍ය වනසේක. මහරජානෙනි, එපරිද්දෙන් ම අතිදානය නම් ලොකයෙහි නුවණැත්තන් විසින් **(355)** වර්ණනා කරණ ලද්දේ ය.

1. මෙය 'අතිභාසයෙන් නිරුම්භිත වන්නේය' යි විය යුතු ය යි හැඟේ 'අධික සිනාවෙන් හුස්ම නැති වන්නේ ය'



Non-Commercial Distribution

ස්තුති කරණ ලද්දේ ය, ප්‍රශස්ත කරණ ලද්දේ ය. යම් කිසි කෙනෙක් යම්කිසි දෙයක් දෙත්. එහෙත්[1] අතිදනය දෙන්නා වූ දයකතෙම ලොකයෙහි කීර්තියට පැමිණෙන්නේ ය. අතිදනයෙන් **වෙස්සන්තර** නම් මහරජානන් වහන්සේ ද දසසහශ්‍රීලොකධාතුයෙහි දෙවියන් විසින් වර්ණනා කරණ ලද්දහ.[2] පසස්නා ලද්දහ, පුදන ලද්දහ. කීර්තනය කරණ ලද්දහ. ඒ අතිදනයෙන් ම **වෙස්සන්තර** නම් මහරජානන් වහන්සේ අද දූන් දක්වා සදිව්‍යලොකයට අග්‍ර වූ බුදුරජානන් වහන්සේ ව උපන්සේක.

''මහරජානෙනි, ලොකයෙහි දන් පිළිගන්නා දක්ෂිණීය පුද්ගලයන් පැමිණි කල්හි නො දිය යුතු තැබිය යුතු වූ යම් දනයෙක් නම් ඇද් ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, ලොකයෙහි අදන සම්මත වූ යම් මේ දනයෝ දසදෙනෙක. යමෙක් ඒ දනයන් දෙන්නේ වී නම්, ඒ තෙම අපායගාමිනී වන්නේ ය. ඒ දසදන[3] කවරේ ද? යත්— ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මද්‍යදනය ලොකයෙහි අදන සම්මත ය. යමෙක් ඒ දනය දෙන්නේ වී නම්, ඒ තෙම අපායගාමිනී වන්නේ ය. සමජ්ජ දනය ද, ස්ත්‍රී දනය ද, වෘෂභ දනය ද, චිත්‍රකර්ම දනය ද, ශස්ත්‍ර දනය ද, විෂ දනය ද, සංඛලික දනය ද, කුක්කුට සූකර දනය ද, වඤ්චාප්‍රයොග ඇති තුලාකූට මානකූට දනය ද ලොකයෙහි අදන සම්මත ය. ස්වාමීනි නාගසෙනයන් වහන්ස, යමෙක් ඒ දනය දෙන්නේ වී නම්, එතෙම අපාය ගාමිනී වන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ දශවිධ දනයෝ ලොකයෙහි අදන සම්මතයෝ ය. යමෙක් ඒ දනයන් දෙන්නේ වී නම්, ඒ තෙම අපායගාමිනී වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, මම ඒ දන සම්මතයක් නො විචාරන්නෙමි. මහරජානෙනි, මම තොපගෙන් මේ අර්ථය විචාරන්නෙමි. මහරජානෙනි, ලොකයෙහි දක්ෂිණීය පුද්ගල යෙකු පැමිණි කල්හි නො දිය යුතු වූ යම් ඨපනීය්‍ය වූ දනයෙක් ඇද් ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, ලොකයෙහි දක්ෂිණීය පුද්ගල යෙකු පැමිණි කල්හි නො දිය යුතු වූ ඨපනීය්‍ය වූ යම් දනයෙක් නම් නැත්තේ ය. චිත්තප්‍රසාදය උපන් කල්හි සමහර කෙනෙක් දක්ෂිණාර්හ ජනයන්ට භොජනයන් දන් දෙන්නාහු ය. සමහර කෙනෙක් වස්ත්‍ර දන් දෙන්නාහ. සමහර කෙනෙක් ආසන දන් දෙන්නාහ. සමහර කෙනෙක් ආවාසයන් දෙන්නාහ, සමහර කෙනෙක් ආස්තරණ පොරෝනයන් දෙන්නාහු ය, සමහර කෙනෙක් දසිදසයන් දෙන්නාහ, සමහර කෙනෙක් කෙත්වත් දෙන්නාහ, සමහර කෙනෙක් ද්විපදචතුෂ්පදයන් දෙන්නාහ, සමහර කෙනෙක් වස්තුසියක් දහසක් දෙන්නාහ, සමහර කෙනෙක් මසුරන් ශතසහස්‍රයක් දෙන්නාහ, සමහර කෙනෙක් මහත් වූ රාජ්‍යශ්‍රී සම්පත් දෙන්නාහ, සමහර ශ්‍රද්ධාවත් කෙනෙක් තමාගේ ජීවිතයත් දන් දෙන්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, ඉදින් සමහර කෙනෙක් තමාගේ ජීවිතයත් දෙන්නාහු නම්, කුමන කාරණයකින් **වෙස්සන්තර** නම් දන

1. කෙනෙක් යම් බඳු වූ දනයක් දෙන්නාහු වී නම් කෙබඳු වූ දනයක් දෙන්නාහු ද යි කියා ප්‍රසිද්ධ ව ගොස්   2. ලද්දේ ය   3. දනයෝ

Non-Commercial Distribution

පතීන් වහන්සේට ඉතා දූඩි කොට නින්ද කරන්නෙහි ද? වෙස්සන්තර මහරජානෝ පුත්‍රදාරාවන් මනා කොට ම දුන්සේක. තවද, මහරජානෙනි, පියානෝ නය ගැති වූවෝ[1] හෝ ජීවිකා වෘත්ති (356) කොට ගත නුහුනුවෝ[2] හෝ තමාගේ පුත්‍රයා අන්තැනෙක ඇපයේ හිඳුවන්නට හෝ විකුණන්නට හෝ ලබන්නාහු ය යි යන ලොකප්‍රකෘතියෙක් ලොක චාරිත්‍රයෙක් ඇද් ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, නය ගැති වූවා වූ හෝ ජීවිකා කොට ගත නුහුනුවූවා වූ හෝ පිතෘතෙම තමාගේ පුත්‍රයා ඇපයේ හිඳුවා ලන්නට හෝ විකුණන්නට හෝ ලබන්-නේ ය යි යන ලොක ප්‍රකෘතියෙක් ඇතැ'' යි කීහ. ''ඉදින්, මහරජානෙනි, නය ගැති වූ ජීවත් විය නො හැකි වූ පිතෘතෙම පුත්‍රයා ඇපයෙහි හිඳුවන්නට විකුණන්නට ලබන්නේ වී නම්, මහරජානෙනි, **වෙස්සන්තර** නම් මහ-රජානන් වහන්සේ ද සර්වඥතාඥනය නො ලබමින් වියොගයට පැමිණි සේක් චිත්තදුක්ඛයට පැමිණිසේක් ඒ සර්වඥතාඥනධනලාභය පිණිස පුත්‍රදාරාවන් ඇපයෙහි හිඳුවාලූසේක. විකුණා වදළසේක. මහරජානෙනි, මේ ප්‍රකාරයෙන් **වෙස්සන්තර** මහරජානන් විසින් සෙස්සන් විසින් දුන් දෙයක් ම දෙන ලද්දේ ය. අන්‍යයන් විසින් කළ දෙයක් ම කර වදරණ ලද්දේ ය. මහරජානෙනි, එසේකල තෙපි වනාහි කුමක් පිණිස ඒ දනය කරණ කොට ගෙණ **වෙස්සන්තර** නම් දනපතීන් වහන්සේට ඉතා බලවත් කොට අපසාදනය කරන්නහු ද? අසන්තොෂ වන්නහු දූ?'' යි විචාළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මම **වෙස්සන්තර** නම් දනපතීන් වහන්සේගේ දනයට ගර්හා නො කරන්නෙමි. එතෙකුදු වුවත් යාචකයන් පුත්‍රදාරාවන් ඉල්වන කල්හි ඒ ලදරුවන් නො දී තමන් නියම කොට දිය යුතු නො වේ ද?'' යි කීහ. ''මහරජානෙනි, යම් පුත්‍රදාරාකෙනෙකුන් ඉල්වන කල්හි ඔවුන් නො දී තමන් දෙන්නේ වී නම්, මේ වනාහි අසත්-පුරුෂයන්ගේ කාරණයෙක. යම් යම් දෙයක් ඉල්වන කල ඒ ඒ දෙය ම දිය යුත්තේ ය. මේ සත්පුරුෂයන්ගේ ක්‍රියාවෙක. මහරජානෙනි, යම් සේ පැන් පානය කරණු කැමැත්තා වූ කිසි පුරුෂයෙක් පැන් ගෙණෙව යි කියා ගෙන්වන කල්හි ඔහට යමෙක් භොජනයක් දෙන්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ පුරුෂතෙම ඒ පැන් බොනු කැමැති පුරුෂයාහට කෘත්‍යකාරි වන්නේ දූ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, ඒ පුරුෂයා යම් උදකයක් ඉල්වන්නේ වී නම්, ඔහට ඒ උදකය ම දෙනුයේ කෘත්‍යකාරි වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම වෙස්සන්තර මහරජානන් වහන්සේ බ්‍රාහ්මණයන් පුත්‍රදාරාවන් ඉල්වන කල්හි පුත්‍රදාරාවන් ම දුන්සේක. මහරජානෙනි, ඉදින් බ්‍රාහ්මණයා අවුත් වෙස්සන්තරමහරජානන්ගේ ශරීරය ඉල්ලුයේ වී නම්, මහරජානෙනි, ඒ වෙස්සන්තර නම් මහරජානන් වහන්සේ ආත්මය නො රක්නාසේක. කම්පා නො වනසේක, ජීවිතයෙහි නො ඇලෙනසේක, ආලය හැර ඒ බමුණුහට දෙන ලද වන්නේ ය. මහරජානෙනි, කිසිවෙක් වෙස්සන්තර

1. වූයේ ය. 2. නුහුණුයේ

නම් දනපතීන් වහන්සේ කරා පැමිණ ‘මහරජ, මට දසභාවයට එළෙඹව’යි කියා දසත්වය ඉල්ලුයේ වී නම්, ඒ වෙස්සන්තර නම් මහරජානන්ගේ ශරීරය ආලය හැර ම දෙන ලද වන්නේ ය. ඒ වෙස්සන්තර නම් මහරජානන් වහන්සේ ජීවිතදනය දී පසු ව නො තැවෙනසේක. මහරජානෙනි, වෙස්සන්තරමහරජානන් වහන්සේගේ ශරීරය බොහෝ දෙනාහට සාධාරණ වන්නේ ය. මහරජානෙනි, යම් සේ පිසූ මාංස සියල්ල **(357)** බොහෝ දෙනාහට සාධාරණ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම වෙස්සන්තර නම් මහරජානන් වහන්සේගේ ශරීරය බොහෝ දෙනාහට සාධාරණය වන්නේ ය. නවද මහරජානෙනි, යම් සේ මධුර ඵල ඇති වෘක්ෂය නොයෙක් පක්ෂිසමූහයාට සාධාරණ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම වෙස්සන්තරමහරජානන් වහන්සේගේ ශරීරය බොහෝ දෙනාහට සාධාරණ වන්නේ ය. කාරණා කවරේ ද? යත්– මෙපරිද්දෙන් ම මහපෘථිවිය සේ සර්ව සාධාරණ ව පිළිපදිමින් සම්‍යක්සම්බොධියට පැමිණෙම් යි යන කරුණාධ්‍යාශය ඇති බැවිනි. නවද, මහරජානෙනි, යම් සේ කිසි ධනයක් නැත්තා වූ ධනයෙන් ප්‍රයෝජන කැමැත්තා වූ ධනය සොයන පිණිස හැසිරෙන්නා වූ පුරුෂයෙක්තෙම අජපථයෙහි ද හුල්හි එල්වී යන සංකුපථයෙහි ද වේවැල් ආදියෙහි එල්වී යන වෙත්ත පථයෙහි ද මහත් වූ උත්සාහයෙන් යන්නේ ය, ජලථලයෙහි වෙළඳාම් කරන්නේ ය, කයින් වචසින් සිතින් ධනය උපදවා ගන්නේ ය, ධන ප්‍රතිලාභය පිණිස වීර්ය කරන්නේ ය. මහරජානෙනි, පරිද්දෙන් ම වෙස්තන්තර දනපතීන් වහන්සේ බුද්ධධනයෙන් අධන වූසේක්, සර්වඥරත්න ප්‍රතිලාභය පිණිස යාචකයන්ට ධනධාන්‍යයන් දුන්සේක. දසිදසයන් දුන්සේක, අනන්ත වූ යානවාහන හා සියලු ම වස්තු දුන්සේක, තමාගේ පුත්‍රදරාවන් හා ආත්මයත් පරිත්‍යාග කොට සම්‍යක්සම්බොධිය ම විමසූසේක.

‘‘නවද, මහරජානෙනි, යම් සේ හස්තාංගුලි අල්වා ගණන් දක්නා මුද්‍රාගණන් පෙරෙක්කුව කැමැත්තා වූ අමාත්‍යයෙක්තෙම ඒ මුද්‍රාසංඛ්‍යාත වූ ගණන කරණ කොට ගෙණ බොහෝ වස්තු උපදවනු පිණිස තමාගේ ගෘහයෙහි මඳක් වත් යම් ධනධාන්‍යයෙක් ඇද්ද, හිරණ්‍යස්වර්ණයෙක් ඇද්ද, ඒ සියල්ල ම රජගෙට දීපියාත් මුද්‍රාප්‍රතිලාභය පිණිස ව්‍යායාම කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම වෙස්සන්තර නම් දනපතීන් වහන්සේ ඒ සියලු ම බාහිරාභ්‍යන්තර වූ ධනධාන්‍යාදියත් තමන්ගේ ජීවිතයත් අනුන්ට දී සම්‍යක්සම්බොධිය ම සොයා වදළසේක.

‘‘නවද මහරජානෙනි, වෙස්සන්තර නම් දනපතීන් වහන්සේට මෙබඳු වූ සිතෙක් වූයේ ය. කෙබඳු වූ සිතෙක් ද? යත්— ‘ඒ බ්‍රාහ්මණයා යමක් ඉල්ලුයේ වී නම්, ඔහට මම ඒ ඉල්ලූ දෙය ම දෙමින් කෘත්‍යකාරී නම් වෙමි’ යි සිතා ඒ මහාබොධිසත්වයන් වහන්සේ ඒ බමුණුහට පුත්‍ර දරාවන් දුන්සේක. මහරජානෙනි, වෙස්සන්තරදනපතීන් වහන්සේ පුත්‍ර

Non-Commercial Distribution

දරාවන් අප්‍රියතාවෙන් බමුණුහට දුන්සේකුත් නො වන්නාහ.[1] පුත්‍රදරාවන් නො දක්නා කැමැති බැවින් දුන්සේකුත් නො වන්නාහ.[1] මාගේ පුත්‍ර දරාවෝ ඉතා බොහෝ වූහ. ඔවුන් පොෂ්‍ය කරන්නට නො හැක්කෙමි'යි සිතා පුත්‍රදරාවන් දුන්සේකුත් නො වන්නාහ.[1] මේ අඹුදරුවෝ මට අප්‍රියයෝ ය යි සිතා කලකිරී පහ කරණු කැමැතිබවකින් පුත්‍රදරාවන් දුන්සේකුත් නො වන්නාහ.[1] එසේ කල කුමක් පිණිස ද? යත්— සර්වඥතා ඥාන නමැති රත්නයාගේ ම ප්‍රිය බැවින් සර්වඥතාඥනයාගේ ම ලැබීමට කාරණා පිණිස ම ඒ අප වෙස්සන්තර නම් මහාරාජොත්තමයානන් වහන්සේ බමුණුහට මෙබඳු වූ අතුල්‍ය විපුල අනුත්තර පියමනාප දයාබර ප්‍රාණසම වූ පුත්‍රදර දනප්‍රවරයක් දුන්සේක. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් එම චර්යාපිටකයෙහි ම වදරණ ලද්දේ ය.

**(358) 'න මෙ දෙස්සා උභො පුත්තා–මද්දිදෙවී න දෙස්සියා, සබ්බඤ්ඤුතං පියං මය්හං–තස්මා පියෙ අදාසහං' යි.**

යන මෙයින් 'ශාරිපුත්‍රයෙනි, ඒ වෙස්සන්තර ව උපන්නා වූ මට පුත්‍රයෝ දෙදෙන අප්‍රියයෝ නුවූහ. මද්‍රීදෙවී ද අප්‍රිය නො වී ය. එයට වඩා මට සර්වඥතාඥනය ප්‍රියතර වන්නේ ය. එහෙයින් මම ප්‍රිය වූ අඹුදරුවන් දන් දිනිමි' යි වදාළසේක. මහරජානෙනි, ඒ වෙස්සන්තරාත්මභාවයෙහි බොධිසත්වයන් වහන්සේ පුත්‍රයන් දන් දී පර්ණශාලාවට ප්‍රවිෂ්ට ව වැද හොත්සේක. ඒ අතිප්‍රෙමයෙන් දුක්ඛිත වූ බොධිසත්වයන් වහන්සේට බලවත් වූ සොක උපන්නේ ය. පෙණ නැඟෙන මස්සැළියක් මෙන් හෘදයවස්තුව හුණු වී ය. නාසිකාව නො සෑහීමෙන් මුඛයෙන් උෂ්ණ වූ ආශ්වාසප්‍රශ්වාස ඇරියසේක. කඳුළු ලේ මිශ්‍ර ව පෙරළි ලේ බින්දු ව නේත්‍රයෙන් නික්මුනේ ය.[2] මහරජානෙනි, මෙබඳු වූ මහාදුක්ඛයෙන් වෙස්සන්තරමහරජානන් වහන්සේ මාගේ දනපථය නො පිරිහෙව යි සිතා බ්‍රාහ්මණයාහට පුත්‍රදනය දුන්සේක. එතෙකුදු වුවත්, මහරජානෙනි. වෙස්සන්තර මහරජානන් වහන්සේ අර්ථද්වයයක් පිණිස බ්‍රාහ්මණයා හට දෙදරුවන් දුන්සේක. කවර නම් අර්ථද්වයයෙක් ද? යත්— 'මාගේ දනපථය නො පිරිහෙලන ලද වේවා යි සිතා ද, වනමූලඵලාහාරයෙන් දුක්ඛිත වූ මාගේ පුත්‍රවරුන් මේ කාරණයෙන් මුත්තනුවෝ මුදන්නාහ' යි සිතා ද, මහරජානෙනි, වෙස්සන්තරමහරජානන් වහන්සේ 'මාගේ දරුවෝ කිසිවකු විසින් දසපරිභොගයෙන් උපකාර විඳින්නට නො හැක්කෝ ය' යි කියා ද, 'මේ දරුවන් මුත්තනුවෝ මිල දී ගන්නාසේක. එසේ කල අපට ද සිවිරටට ගමන වන්නේ ය' යි කියා ද දන වදරණසේක් ම ය. මහරජානෙනි, මේ අර්ථද්වය සලකා වෙස්සන්තරමහරජානෝ බමුණුහට දෙදරුවන් දුන්සේක. තව ද, මහරජානෙනි, 'මේ බ්‍රාහ්මණතෙම ජරා ජීර්ණ වූයේ ය, වයොවෘද්ධ වූයේ ය, මහලු වූයේ ය, දුර්වල වූයේ ය. කොන්ද අභිමුඛයට නැමුනේ ය, සැරයටිය ආධාර කොට ඇත්තේ ය,

1. නො වන්නේ ය. 2. නික්මුණාහු ය.

Non-Commercial Distribution

ක්ෂීණායුෂය ඇත්තේ ය, ඉතා මඳ වූ පින් ඇත්තේ ය. මේ බමුණුතෙමෙ මේ දරුවන් දසපරිභොගයෙන් පරිභොග විඳින්ට සමර්ථ නො වන්නේ ම ය' යි කියා වෙස්සන්තරමහරජානන් වහන්සේ දන්නාසේක. මහරජානෙනි, පුරුෂයෙක් තමාගේ ප්‍රකෘති වූ ශරීරබලයෙන් මෙසේ මහත් සෘද්ධි ඇත්තා වූ මෙසේ මහත් ආනුභාව ඇත්තා වූ මේ චන්ද්‍ර සූර්යයන් දෙදෙනා අල්වා ගෙණ පෙට්ටියක හෝ කරඬුයෙක හෝ සඟවා තබා නිෂ්ප්‍රභාවත් කොට රජතස්වර්ණතාලක පරිභොගයෙන් පරිභොග කරන්ට හැකි වන්නේ ද?'' යි විචාළසේක. ''අහෝ! ස්වාමීනි, එසේ නො හැක්කැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම මේ ලොකයෙහි චන්ද්‍රසූර්යයන් සදෘශ වූ **වෙස්සන්තර** මහරජානන්ගේ කුමාරවරු කිසි කෙනෙකුන් විසින් දසපරිභොගයෙන් වළඳින්නට නො හැක්කාහ.

''මහරජානෙනි, යම් කාරණයකින් වෙස්සන්තරමහරජානන්ගේ කුමාරවරුන් කිසිකෙනෙකුන් විසින් දසපරිභොගයෙන් භුක්ති විඳින්නට නො හැකි වේ ද, ඊට ම අනිකුදු ඉතිරි කාරණයක් ඇසුව මැනව. මහ **(359)** රජානෙනි, යම් සේ චක්‍රවර්ති මහරජානන්ගේ යහපත් වූ ජාතිමත් වූ අටැස් වූ සුපරිකර්ම කරණ ලද්ද වූ සතර රියන් දිග ඇත්තා වූ ගැල්නාභි පමණ වට ඇත්තා වූ සතරගව්වෙක ඝනාන්ධකාරයන් විධමනය කරන්නා වූ මාණික්‍යරත්නය කිසිකෙනෙකුන් විසින් වස්ත්‍රකඩකින් වෙළා පෙට්ටියක ලා ගෙණ ශස්ත්‍ර මුවහත් කරණ කරගල් පරිභොගයෙන් පරිභොග කරන්නට නො හැක්කේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ලොකයෙහි චක්‍රවර්තිමහරජානන්ගේ මාණික්‍යරත්න ප්‍රතිභාග වූ වෙස්සන්තරමහරජානන්ගේ කුමාරවරුන් කිසිකෙනෙකුන් විසින් දස පරිභොගයෙන් පරිභොග කරන්නට නො හැක්කේ යි. තව ද, මහරජා-නෙනි, යම් කාරණයකින් වෙස්සන්තර මහරජානන්ගේ කුමාරවරුන් කිසිවෙකු විසින් දසපරිභොගයෙන් පරිභොග කරන්නට නො හැක්කේ වේ ද, ඊට ම අනිකුදු ඉතිරි කාරණයක් ඇසුව මැනව. මහරජානෙනි, යම් සේ ත්‍රිධාප්‍රභින්න වූ සර්වශ්වෙත වූ සප්තප්‍රතිෂ්ඨිත වූ අටරියන් උස ඇත්තා වූ නවරත්න ප්‍රමාණ ආයාම පරිණාහ ඇත්තා වූ ප්‍රාසාදික වූ දර්ශනීය වූ හෙම නම් කුලයෙහි ඇතුන් දසදෙනෙකුන්ගේ බල ධරන්නා වූ ආකාශචාරී වූ උපොසථ නම් හස්තිරාජයා කිසිවෙකු විසින් කුල්ලකින් හෝ මාලාවකින් හෝ වසාපියන්නට හෝ ගොන් වස්සෙකු මෙන් වච්ඡ ශාලාවෙක ප්‍රක්ෂෙප කොට පරිහරණය කරන්නට නො හැකි වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ලොකයෙහි උපොසථ නාගෙන්ද්‍ර ප්‍රතිභාග වූ වෙස්සන්තරමහරජානන්ගේ කුමාරවරුන් කිසිවකු විසින් දසපරිභොග යෙන් පරිභොග කරන්නට නො හැක්කේ ය.

''තවද, මහරජානෙනි, යම් කාරණයකින් වෙස්සන්තර මහ රජානන්ගේ කුමාරවරුන් කිසිවෙකු විසින් දසපරිභොගයෙන් පරිභොග කරන්නට නො හැක්කේ වේ ද, ඊට ම අනිකුදු ඉතිරි කාරණයක් ඇසුව

Non-Commercial Distribution

මැනව. මහරජානෙනි, යම් සේ දිගපුළලින් විස්තීර්ණ වූ අතිගම්භිර වූ අප්‍රමාණ වූ එතෙර විය නොහැක්කා වූ බැසපිය නො හැක්කා වූ කිසි ආවරණයක් නැත්තා වූ මහාසමුද්‍රය කිසිවකු විසින් සර්වප්‍රකාරයෙන් වසා එක ම තොටකින් එතෙර මෙතෙර යාම් ආදීන් විසින් පරිභොග කරන්නට නො හැක්කේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ලෝකයෙහි මහාසමුද්‍රප්‍රතිභාග වූ වෙස්සන්තර මහරජානන්ගේ කුමාරවරු කිසිවකු විසින් දසපරිභොගයෙන් පරිභොග කරන්නට නො හැක්කේය.

''තවද මහරජානෙනි, යම් කාරණයකින් වෙස්සන්තර මහ-රජානන්ගේ කුමාරවරුන් කිසිවකු විසින් දසපරිභොගයෙන් පරිභොග කරන්නට නො හැක්කේ වේ ද, ඊට ම අනිකුදු කාරණයක් ඇසුව මැනව. මහරජානෙනි, යම් සේ හිමවත්පර්වතරාජයා ආකාශයෙහි පන්සියයක් යොදුන් තැන් ඉතා උස් ව සිටියේ ය. අයම්විතරින් තුන්දහසක් යොදුන් විතර ඇත්තේ ය. සුවාසූදහසක් පර්වතකූටයෙන් ප්‍රතිමණ්ඩිත වූයේ ය, පන්සියයක් මහාගංගාවන්ට උත්පත්තිභූත ව සිටියේ ය. මහායක්ෂ සමූහයාට ගෘහභූත ව සිටියේ ය, නානාවිධ සුගන්ධ ධරමින් සිටියේ ය, නොයෙක් සියගණන් දිව්‍යෞෂධයෙන් සමලංකෘත වූයේ ය. නභස්ථලයෙහි වසා සිටි මහාවලාකුළක් මෙන් ඉතා උස් ව දක්නා ලැබෙයි. මහරජානෙනි, එපරිද්දෙන් ම ලොක **(360)** යෙහි හිමවත් පර්වතරාජයා ප්‍රතිභාග වූ වෙස්සන්තරමහරජානන්ගේ කුමාරවරුන් කිසිවකු විසින් දසපරිභොග යෙන් පරිභොග විඳින්නට නො හැක්කේ යි.

''තවද, මහරජානෙනි, යම් කාරණයකින් වෙස්සන්තරමහරජා නන්ගේ කුමාරවරුන් කිසිවකු විසින් දසපරිභොගයෙන් පරිභොගය කරන්නට නො හැකි වේ ද, ඊට ම අනිකුදු ඉතිරි කාරණයක් ඇසුව මැනව. මහරජානෙනි, යම් සේ රාත්‍රියගේ ඝනතරතිමිරාන්ධකාරයෙහි මහා පර්වතාග්‍රයක් මස්තකයෙහි දිලියෙන්නා වූ මහාඅග්නිස්කන්ධයක්තෙම ඉතා දුරස්ථයාට ද පෙණෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම වෙස්සන්තර මහරජානන් වහන්සේ පර්වතාග්‍රයෙහි දිලියෙන්නා වූ මහාගිනිකඳක් මෙන් ඉතා දුරස්ථ ව ප්‍රකට ව පෙණෙන්නාහ. ඒ වෙස්සන්තරමහරජා-නන්ගේ කුමාරවරුන් කිසිවකු විසින් දසපරිභොගයෙන් ප්‍රයොජනය විඳින්නට නො හැක්කේ ය.

''තවද, මහරජානෙනි, යම් කාරණයකින් වෙස්සන්තරමහරජානන් වහන්සේගේ කුමාරවරුන් කිසිවකු විසින් දසපරිභොගයෙන් ප්‍රයොජන විඳින්නට නො හැකි වේ ද, ඊට ම අනිකුදු ඉතිරි කාරණයක් ඇසුව මැනව. මහරජානෙනි, යම් සේ හිමාලයපර්වතයෙහි නාමල් පිපෙන කල්හි වාතය ඍජු ව හමන කල දසයොදුනක් හෝ දොළොස්යොදුනක් හෝ මල්සුවඳ පැතිරෙන්නේ ය, හමන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම වෙස්සන්තර මහරජානන් වහන්සේගේ ද ගුණකීර්තිශබ්දය සරසින් ශතසහස්‍රගණන්

*Non-Commercial Distribution*

යොදුන් දක්වා ද මත්තෙන් අකනිට්ඨබ්‍රහ්මලොව දක්වා ද මේ තාක් අතුරෙහි සර්වසුරාසුරගරුඬගන්ධර්වරාක්ෂස නාග කින්නර ශක්‍ර බ්‍රහ්ම සංඛ්‍යාත වූ ඒ ඒ ඉන්ද්‍රභවනයෙහි ඉතා උස් ව පැන නැංගේ ය. ඒ වෙස්සන්තර මහොත්තමයාගේ පවිත්‍රප්‍රවරශීල සුගන්ධය ද එසේ ම හමා ගියේ ය. ඒ කාරණයෙන් වෙස්සන්තරමහරජානන්ගේ කුමාරවරුන් කිසිකෙනෙකුන් විසින් දසපරිහරණයෙන් පරිභොග කරන්නට නො හැක්කේ යි.

"මහරජානෙනි, පිතෘ වූ **වෙස්සන්තර**මහරජ්ජුරුවන් විසින් 'පුත්‍ර **ජාලියකුමාරයෙනි**, නුඹගේ මුත්තනු වූ මපියානෝ බ්‍රාහ්මණයාහට ධන සම්පත් දී තොප විකුණා ගන්නාසේක් නම්, නුඹට ස්වර්ණ නිෂ්කදහසක් දී විකුණා ගන්නාසේක්වා. **කෘෂ්ණජිනාවන්** විකුණා ගන්නාසේක් නම්, දසයන් සියයෙක, දසින් සියයෙක, ඇතුන් සියයෙක, අසුන් සියයෙක, දෙනුන් සියයෙක, ගොනුන් සියයෙක, රන්නිෂ්කසියයක් දැ යි යනාදීන් සියල්ලෙන් සියය සියය බැගින් සියලු ම දෙය දී විකුණා ගන්නාසේක්වා. ඉදින්, 'පුතනුවෙනි, නුඹගේ මුත්තනුවෝ තොප බ්‍රාහ්මණයා අතින් රාජාඥවෙන් හෝ රාජබලයෙන් හෝ නොමුදලකින් හෝ උදුරා ගන්නාසේක් නම්, තෙපි මුත්තනුවන්ගේ වචනය නහමක් කරවූ. බ්‍රාහ්මණයාට ම අනු ව හැසිරෙවූ' කියා ජාලියකුමාරයන් අනුශිෂ්ට කරණ ලද්දේ ය. හික්මවන ලද්දේ ය. මෙසේ අනුශාසනා කොට පුත්‍රවරුන් හැර වදළසේක. එයින් ඒ ජාලියකුමාරයෝ ද ගුරුළෙකුට හසු වූ නාගයකු සේ මහාසොකයෙන් තැවෙමින් හඬමින් ජූජකයා හා සමග **ජයතුරා**නුවරට ගොස් මුත්තනුවන් දැක **(361)** නො ලං ව නුදුරු ව සිටිසේක. එකල **සඳමහරජ්ජුරුවෝ** සිවුමැලිකුමරුවන් දැක සතුටින් දෙඅත් නහා 'මා මුනුබුරානෙනි, **ජාලියකුමාරයෙනි**, මාගේ ඇකයට එන්නේ ය. මා මැනියෙනි, **කෘෂ්ණජිනාවෙනි**, මාගේ ඇකයට එන්නේ ය' යි කියා ප්‍රිය තෙපුලෙන් හඬගාලූ කල්හි ජාලියකුමාරයෝ හඬහඬා 'මුත්තනුවෙනි, මෙබඳු වූ බමුණන්ගේ දස වූවෝ ශාක්‍යරජුන්ගේ ඔක්කට නො නැඟෙන්නාහ' යි කීහ. ඒ තෙපුල් අසා **සඳමහරජ්ජුරුවන්** හෘදය පැළී යන සේ බලවත් වූ ශොකයෙන් තැවෙමින් හඬමින් 'මා මුණුබුරානෙනි, තොප බමුණුහට දෙන කල පියානන් කුමක් කියා දුන් නියා ද?' යි කියා මුත්තනුවන් විසින් විචාරණ ලද්ද වූ ජාලියකුමාරයෝ මෙසේ කීහ:—

**'සහස්සග්ඝං හි මං තාත–බ්‍රාහ්මණස්ස පිතා අදා,**
**අථො කණ්හාජිනං කඤ්ඤං–හත්ථිනා ච සතෙන ච' යි.**

යන මෙයින් 'නරදෙවෙන්ද්‍ර වූ මාගේ මුත්තනුවෙනි, මා පියානෝ රන් නිෂ්කදහසක් අගේ කොට බමුණුහට දුන්සේක. නැවත මාගේ නැගනි වූ කෘෂ්ණජිනා නම් මේ ළදබොළඳ වූ රාජකන්‍යාවට හස්ති පටන් සියයෙන් සියය අගේ කොට බමුණුහට දුන්සේකැ' යි කීහ. එවිට **සඳමහරජානෝ** ප්‍රීතියෙන් පිණා සමීපයෙහි උන් **බත්තා** නම් ඇමති බණවා:—

Non-Commercial Distribution

**'උට්ඨෙහි බත්ත තරමානො-බ්‍රාහමණස්ස අවාකර,
දාසිසතං දාසසතං-ගවං හත්ථි සතං සතං,
ජාතරූප සහස්සඤ්ච-පුත්තානං දෙහි නික්කයං' යි.**

යන මෙයින් ''**බත්තය,** වහා නැඟිටෙව. බමුණුහට දාසීන් සියයෙක, දාසයන් සියයෙක, කිරිදෙනුන් සියයෙක, ඇතුන් සියයෙක, වෘෂභයන් සියයෙක, අසුන් සියයෙක, රථ සියයෙක, රත්රන් සියයෙක යනාදීන් නොයෙක් දෙයින් සියය සියය හා රන්නිෂ්ක දහසක් දෙව. මා දරුවන් නිදහස් කොට දෙව' යි කී කල්හි **බත්තා** නම් ඇමැතිතෙම යුහු ව නැඟිසිට කී තාක් වස්තු බමුණුහට දෙමින් කුමාරවරුන් නිදහස් කොට **සඳමහා** නරෙන්ද්‍රයන්ගේ ඇකයේ වඩාලූයේ ය'' යි වදාළසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ විසින් ප්‍රශ්නය සුනිර්වෙඨනය කරණ ලද්දේ ය, දෘෂ්ටිසමූහය බිඳ හරණ ලද්දේ ය, පරවාද මර්දනය කරණ ලද්දේ ය, ස්වකීය වූ සම්‍යක්දෘෂ්ටිය මනා කොට දක්වන ලද්දේ ය, අර්ථව්‍යඤ්ජනය පරිසොධිත කරණ ලද්දේය. අර්ථය මනා ව ම බෙදන ලද්දේ ය. මෙසේ මේ ප්‍රශ්නයත් එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**පුත්‍රදානප්‍රශ්නය නිමි.**

---

# දුෂ්කරපරිපාක ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සියලු ම බොධිසත්වවරයෝ දුෂ්කරක්‍රියාව කරන්නාහු ද? නොහොත් **ගෞතම** බොධිසත්වයන් වහන්සේ විසින් ම දුෂ්කරක්‍රියාව කරණ ලද්දේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, සියලු ම බොධිසත්වවරයන්ගේ කරණ දුෂ්කර ක්‍රියාවෙක් නැත්තේ ය. ගෞතම **(362)** බොධිසත්වයන් වහන්සේ විසින් ම දුෂ්කර ක්‍රියාව කරණ ලදැ'' යි වදාළසේක. ''භවත් **නාගසෙනයන්** වහන්ස, ඉදින් මෙසේ බොධිසත්වයන්ගේ බොධිසත්වයන් හා වෙමත්තතාවෙක් වන්නේ ය යි යන යමෙක් ඇද්ද, ඒ වෙනස් බව අයුත්ත ය'' යි කීහ. ''මහරජානෙනි, සතර කාරණයකින් බොධිසත්වයන්ගේ බොධිසත්වවරයන් හා වෙමත්තතාව වන්නේ ය. කවර නම් සතර කාරණයකින් ද? යත්-ක්ෂත්‍රිය මහාසාරවංශයෙහි හෝ බ්‍රාහ්මණ මහාසාරවංශයෙහි හෝ ඉපදීම් වශයෙන් කුලයාගේ වෙමත්තතාව ද උපදනා කාලයෙහි හවුරුදු සියදහස් ලක්ෂ වශයෙන් අද්ධානවෙමත්තතාව ද, එසේ ම ආයුෂයාගේ වෙමත්තතාව ද ඒ ඒ කාලයෙහි පුරුෂප්‍රමාණ ව උපදනා වෙමත්තතාව දැ යි යන, මහරජානෙනි, මේ සතර කාරණයෙන් බොධිසත්වවරයන් වහන්සේලාගේ සමහර බොධිසත්වවරයන් වහන්සේලා හා විශෙෂතාව වන්නේ ය. මහරජානෙනි, සියලු ම බුදුවරයන් වහන්සේලාගේ රූපයෙහි ශීලයෙහි සමාධියෙහි ප්‍රඥයෙහි විමුක්තියෙහි විමුක්තිඥනදර්ශනයෙහි චතුර්වෛශාරද්‍යයෙහි දශවිධතථාගතබලයෙහි ෂඩ්විධ අසාධාරණඥනයෙහි චතුර්දශබුද්ධඥනයෙහි අෂ්ටාදශබුද්ධධර්මයෙහි සියලු ම බුද්ධධර්මයෙහි ද යන

*Non-Commercial Distribution*

මෙහි වෙමත්තතාවෙක් නැත්තේ ය. සියලු සර්වඥවරයෝ ම බුද්ධ ධර්මයෙන් සම සම වූහ'' යි වදාළසේක. ''ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සියලු බුදුවරයෝත් බුද්ධධර්මයෙන් සම සම වූ නම්, කවර කාරණයකින් ගෞතම බොධිසත්වයන් වහන්සේ විසින් ම සාවුරුද්ද මුළුල්ලෙහි දුෂ්කරක්‍රියාව කරණ ලද්දේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, චතුස්සත්‍යය දක්නා ඥනය නො මූ කළ කල්හි සර්වඥතාඥනය නො මූ කළ කල්හි අප ගෞතම බොධිසත්වයන් වහන්සේ නෛෂ්ක්‍රම්‍යයට නික්මුනුසේක් නො මූ කළ ඥනය පැසවන්නා වූ බොධිසත්වයන් විසින් දුෂ්කරක්‍රියාව කරණ ලදූ'' යි වදාළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කවර කාරණයකින් බොධිසත්වයන් වහන්සේ ඥනය නො මූ කළ කල්හි සර්වඥතාඥනය නො මූ කළ කල්හි මහභිනික්මන් නික්මුනුසේක් ද? චතුස්සත්‍යඥනය මෝරවා ගෙණ ඥනය මෝරා සිටි කල්හි මහභිනික්මන් නික්මිය යුත්තේ ය. කිමෙක් ද, එසේ නපුරු දැ?'' යි කීහ. ''මහරජානෙනි, බොධිසත්වයන් වහන්සේ උද්‍යාන ගමනින් කලකිරී අවුත් පරම රමණිය වූ ප්‍රාසාදභිරූඪ ව සිරිසයනයෙහි වැදහොත්සේක. එකල සුඬොදනමහරජානන්ගේ නියොගයෙන් දෙවඟනන් හා සදෘශ වූ සතළිස්දහසක් පමණ තරුණ පුරාංගනාවෝ දිව්‍යාංගනාවන් සේ සැරහී මනොහර වූ මධුරධ්වනි මෘදංග වීණාදී තූර්යභාණ්ඩයන් ගෙණ 'මහතානන් පඤ්චකාමයෙන් බඳුම්හ'යි කියා පිරිවරා ගෙණ අනන්තලීලා දක්වමින් නෘත්‍යගීත වාදිත ගායානාදියෙහි ව්‍යාපෘත වූහ. බොධිසත්වයන් වහන්සේ ක්ලෙශකාමයෙහි සිත නො ඇලෙන බැවින් මඳක් නිද්‍රාවට පැමිණිසේක. නාටකස්ත්‍රීහු ඒ දැක 'අහෝ! අපගේ ස්වාමීන් වහන්සේ නිද්‍රා කර වදරණ කල අපි කාට නෘත්‍ය ගීත දක්වමෝ දැ?' යි කියා ගත්ගත් තූර්යභාණ්ඩ වැලඳ ගෙණ ඒ ඒ තැන වැද හෙව නිදන්නාහු ය. සමහරෙක් කටින් කුණුකෙළ පෙරති. සමහරෙක් කට දත් කති. සමහරෙක් කථා **(363)** කරමින් ගොරවති. සමහරෙක් නොයෙක් දෑ දොඩවති. සමහරෙක් අපගතවස්ත්‍රයෙන් වෙසෙති. සමහරෙක් භය ගෙණ දහලති, සමහරෙක් මුක්තකෙශී ව නොයෙක් විකාර කෙරෙති. මහාබොධිසත්වයන් වහන්සේ පිබිද ශ්‍රීයහන් මස්තකයෙහි බඩපයර්‍යංකයෙන් හිඳ ඒ ස්ත්‍රීන්ගේ විපරීත වූ විකාරය දැක විපිළිසර වූසේක. ඒ විපිළිසර වූ බොධිසත්වයන් වහන්සේට අරතිසිත් උපන්නේ ය. ඒ අරතිසිත් උපන්බව දැක එක්තරා මාරකායික දිව්‍යපුත්‍රයෙක් 'සිඬාර්ථකුමාරයන්ගේ අරතිචිත්තය ප්‍රහාණය කරණ පිණිස මේ කලැ' යි සිතා දෙව්ලොවින් දිව අවුත් ප්‍රාසාදයට නුදුරු ව ආකාශයෙහි සිට 'මාගේ නිදූකානෙනි, නුඹ වහන්සේ නො කලකිරෙන්නේ ය. නුඹ වහන්සේට මෙයින් සත්වැනි දවස්හි දහසක් දැවි ඇත්තා වූ නිම්වළලු සහිත වූ නාභි සහිත වූ සර්වාකාර පරිපූර්ණ වූ දිව්‍යමයචක්‍රරත්නය පහළ වන්නේ ය. ආකාශයෙහි සිටිනට සමර්ථ වූ හස්තිරත්නාදිය හා පෘථිවිගත වූ සෙසු රත්නයෝ ද තොපට තෙමේ තෙමේ ම අවුත් පහළ වෙති. දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති

*Non-Commercial Distribution*

සතර මහාද්වීපයෙහි තොපගේ එක මුඛයෙන් ආඥ පවත්වනු ලබන්නේ ය. ශූර වූ දෙවියන් වැනි වූ රූ ඇත්තා වූ වීර්‍ය්‍යවත් ශරීර ඇත්තා වූ සතුරුසේනා මර්දනයෙහි සමර්ථ වූ දහසකින් වැඩියක් පුත්‍රයෝ තොපට පහළ වන්නාහු ය. ඒ පුත්‍රයන් විසින් පිරිවරණ ලද්ද වූ තෙපි සප්තරත්න සමන්නාගත ව සතර මහාද්වීපයට අනුශාසනා කරන්නහු ය' යි කියා මේ වචනය කීයේ ය.

''එකල යම් සේ දවසක් මුළුල්ලෙහි උෂ්ණයෙක ලා රත් කරණ ලද්ද වූ සර්වභාගයෙන් ම ඇල් විය නො හැකි ව දවන්නා වූ යකඩ උලක් කර්ණශ්‍රොත්‍රයට වැද ගියේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ඒ වචනය බොධිසත්වයන් වහන්සේගේ කර්ණශ්‍රොත්‍රයට ප්‍රවිෂ්ට ව ගියේ ය. මෙසේ ඒ බොධිසත්වයන් වහන්සේ ආකෘතියෙන් ම කලකිරුණුසේක. ඒ මාරකායිකදෙවතාවාගේ වචනයෙන් නැවතත් අප්‍රමාණ ව කලකිරුණුසේක. භය වූසේක. සංවේගයට පැමිණිසේක. තව ද, මහරජානෙනි, යම් සේ දිලියෙන්නා වූ මහත් වූ මහාවහ්නිස්කන්ධය වෙනින් දර දමූ කල බොහෝ සෙයින් දිලියෙන්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ප්‍රකෘතියෙන් ම කලකිරුණා වූ බොධිසත්වයන් වහන්සේ ඒ මාරකායිකදෙවතාවාගේ වචනයෙන් බොහෝ සෙයින් ම කලකිරුණුසේක. භය වූසේක. සංවේගයට පැමිණිසේක. තව ද, මහරජානෙනි, යම් සේ ප්‍රකෘතියෙන්ම තෙත් වූ හට ගන්නා ලද තෘණ ගහන හා අභිනව තෘණ ඇත්තා වූ වැලඳ ගිය ජලය ඇත්තා වූ උපන් කර්දමය ඇත්තා වූ මහාපෘථිවිය නැවත නැවතත් මහාමෙඝය වර්ෂා කරණ කල බොහෝ සෙයින් ම චික්ඛල්ලතර වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ප්‍රකෘතියෙන් ම කලකිරුණා වූ බොධිසත්වයන් වහන්සේ ඒ මාරපාක්ෂික වූ දෙවතාවාගේ වචනයෙන් බොහෝ සෙයින් කලකිරුණුසේක. භය වූසේක. සංවේගයට පැමිණිසේක.''

''කිමෙක් ද, ස්වාමිනි, නාගසෙනයන් වහන්ස, බොධිසත්වයන් වහන්සේට 'ඉදින් සත්වැනි දවස්හි දිව්‍යචක්‍රරත්නය පහළ වන්නේ වී නම් බොධිසත්වයන් වහන්සේ දිව්‍යචක්‍රරත්නය පහළ වූ කල්හි මහණ නො වී නවතිනසේක් ද?'' යි විචාළෝය. ''මහරජානෙනි, සත්වන දවස්හි **(364)** බොධිසත්වයන් වහන්සේට දිව්‍යචක්‍රරත්නය පහළ නො වන්නේ ය. එතෙකුදු වුවත් පඤ්චකාමයෙහි ආලය වඩවා සිත් පොලඹන පිණිස ඒ මාරකායිකදෙවතාවා විසින් මුසාවාදයක් කියන ලද්දේ ය. මහරජානෙනි, ඉදින් සත්වන දවස්හි දිව්‍යචක්‍රරත්නය පහළ වන්නේ වී නමුත් බොධිසත්වයන් වහන්සේ මහණ නො වී නො නවත්නාසේක. කවර කාරණයකින් ද? යත්—මහරජානෙනි, බොධිසත්වයන් වහන්සේ රූප වෙදනා සංඥ සංස්කාර විඥන යන පඤ්චස්කන්ධය අනිත්‍ය ය යි කියා දැඩි කොට සිතා ගත්සේක. ජාති ජරා ව්‍යාධි මරණාදි විසින් සංසාර ප්‍රවෘත්තිය දුකැ යි කියා දැඩි කොට සිතා ගත්සේක. පංචස්කන්ධය අනාත්ම

*Non-Commercial Distribution*

ය යි කියා දැඩි කොට සිතා ගත්සේක. උපාදනස්කන්ධය යි කියන ලද ආලය වශයෙන් ගැන්මගේ ක්ෂයට පැමිණිසේක. මහරජානෙනි, යම් සේ අනොතත්ත විලින් ජලය නික්ම ගංගා නම් ගඟින් මහාසමුද්‍රයට යන්නේ ය. මහසමුද්‍රයෙන් පාතාලමුඛයට යන්නේ ය. කිමෙක් ද, මහ රජානෙනි, පාතාලමුඛයට ගියා වූ ඒ උදකය නැවත කරකැවී මහාසමුද්‍රයට ප්‍රවෙශ වේ ද? මහාසමුද්‍රයෙන් ගංගා නම් ගඟට ප්‍රවෙශ වේ ද? ගංගා නම් ගඟින් නැවත අනොතත්ත විලට ප්‍රවෙශ වේ ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, ඒ උදකය නැවත නො එන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම බොධිසත්වයන් වහන්සේ විසින් සාරාසංඛෙය්‍ය කල්ලක්ෂයක් මුළුල්ලෙහි ලොවුතුරා බුදු වන මේ භවය පිණිස ම සමත්‍රිංශත්පාරමිතා කුශලධර්මය මුහු කරවන ලද්දේ ය. ඒ මේ අන්තිම ආත්මභාවය පැමිණියේ ය. සර්වඥතාඥනය මෝරා සිටියේ ය. සභවුරුද්දකින් මත්තෙහි ලොකාග්‍රපුද්ගල වූ සර්වඥ වූ ලොවුතුරා බුදුවනසේක. කිමෙක් ද, මහරජානෙනි, බොධිසත්වයන් වහන්සේ චක්‍රවර්තිරාජ්‍යය පිණිස බුදු නො වී වළක්නාසේක් ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ.

''තවද, මහරජානෙනි, සියලු ම වන සහිත වූ පර්වත සහිත වූ මහා පෘථිවිය පෙරළේ නමුදු මහාබොධිසත්වයන් වහන්සේ සම්‍යක් සම්බොධියට නො පැමිණ නො නවත්නාසේක් ම ය. මහරජානෙනි, ඉදින් ගංගා නම් නදියගේ උදකය උඩුගඟට නැඟෙන්නේ නමුදු මහාබොධිසත්වයන් වහන්සේ සම්‍යක්සම්බොධියට නො පැමිණ නො නවත්නාසේක් ම ය. තවද, මහරජානෙනි, ඉදින් අපරිමිතජලධාරී වූ මහාසමුද්‍රය ගවකුරයෙහි ජලය මෙන් වියලී සිඳී යේ නමුදු මහාබොධිසත්වයන් වහන්සේ සම්‍යක්සම්බොධියට නො පැමිණ නො නවත්නාසේක් ම ය. තව ද, මහරජානෙනි, ඉදින් මහාමේරුපර්වතරාජයා සියක්කඩ ව දහසක් කඩ ව හෝ පැළී යේ නමුදු මහාබොධිසත්වයන් වහන්සේ සම්‍යක්සම්බොධියට නො පැමිණ නො නවත්නාසේක් ම ය. තවද, මහරජානෙනි, ඉදින් තාරකාවන් සහිත වූ චන්ද්‍රසූර්‍ය්‍යයෝ දෙදෙන කුරු මෙන් වහා පෘථිවියෙහි වැටෙන්නාහු නමුදු මහාබොධිසත්වයන් වහන්සේ සම්‍යක්සම්බොධියට නො පැමිණ නො නවත්නාසේක් ම ය. තවද, මහරජානෙනි, ඉදින් ආකාශය කලල්කඩක් මෙන් හැකිළේ නමුදු මහබොධිසත්වයන් වහන්සේ සම්‍යක්සම්බොධියට නො පැමිණ නො නවත්නාසේක් ම ය. ඊට කාරණා කවරේ ද? යත්— සියලු ම සංසාරබන්ධනයන් ප්‍රදලනය කර වදළ බැවිනැ'' යි වදළසේක.

**(365)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ලොකයෙහි බන්ධනයෝ කොපමණ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ලෝකයෙහි යම් බන්ධනයකින් බැඳුනා වූ සත්වයෝ ගිහිගෙයින් නො නික්මෙද් ද, නික්ම ගොස් නැවැත ගිහිගෙට ම එද්ද, ඒ මේ බන්ධනයෝ දශදෙනෙක. කවර දශදෙනෙක් ද? යත්—

Non-Commercial Distribution

**"මාතා මහාරාජ ලොකෙ බන්ධනං. පිතා මහාරාජ ලොකෙ බන්ධනං. භරියා මහාරාජ ලොකෙ බන්ධනං. පුත්තා මහාරාජ ලොකෙ බන්ධනං. ඤාතී මහාරාජ ලොකෙ බන්ධනං. මිත්තා මහාරාජ ලොකෙ බන්ධනං. ධනං මහාරාජ ලොකෙ බන්ධනං. ලාභසක්කාරො මහාරාජ ලොකෙ බන්ධනං. ඉස්සරියං මහාරාජ ලොකෙ බන්ධනං. පඤ්චකාමගුණා මහාරාජ ලොකෙ බන්ධනං. ඉමානි ඛො මහාරාජ දස ලොකෙ බන්ධනානි, යෙහි බන්ධනෙහි බද්ධා සත්තා න නික්ඛමන්ති. නික්ඛමිත්වා පටිනිවත්තන්ති" ති.**

"මහරජානෙනි, 'ශාසනයෙහි මහණ වීම් නම්, මාගේ මෑනියෝ ජීවත් විය නො හෙති' යි සිතන විසින් ලොකයෙහි මෑනියෝ ද මහණ විය නො හැකි වන ගෘහබන්ධනයෙක. එසේ ම මහරජානෙනි, පියානෝ ද ලොකයෙහි ගෘහබන්ධනයෙක. ප්‍රෙමතර වූ භාර්යාවෝ ද මහරජානෙනි, ලොකයෙහි ගෘහබන්ධනයෙක. ප්‍රියතර ලදරු වූ පුත්‍රයෝ ද මහරජානෙනි, ලොකයෙහි ගෘහබන්ධනයෙක. අසරණීභූත වූ නෑසමූහයා ද මහරජානෙනි, ලොකයෙහි ගෘහබන්ධනයෙක. සුවදුක්හි සම ව පවත්නා වූ මිත්‍රයෝ ද මහරජානෙනි, ලොකයෙහි ගෘහබන්ධනයෙක. අපරිමිතධන සම්පත්තිය ද මහරජානෙනි, ලොකයෙහි ගෘහබන්ධනයෙක. ලාභසත්කාරය ද මහරජානෙනි, ලොකයෙහි ගෘහබන්ධනයෙක. රාජාමාත්‍යාදි ඉසුරු සම්පත්තිය ද මහරජානෙනි, ලොකයෙහි ගෘහබන්ධනයෙක. පඤ්චකාමගුණය ද මහරජානෙනි, ලොකයෙහි මහණ විය නො හැකි වූ ගෘහබන්ධනයෙක. මහරජානෙනි, යම් බන්ධනයකින් බැඳුනා වූ සත්වයෝ ගිහිගෙය හැර නො යෙද්ද, නික්ම ගොස් නැවත ගිහිගෙට ම එද්ද, ලොකයෙහි ඒ මේ බන්ධනයෝ දසදෙන ය. ඒ දශප්‍රකාර වූ බන්ධනයෝ මහාබොධිසත්වයන් වහන්සේ විසින් නිරාලය වශයෙන් සිඳ හරණ ලද්දහු ය, ප්‍රදලනය කරණ ලද්දහු ය, මහරජානෙනි, ඒ කාරණයෙන් මහාබොධිසත්වයන් වහන්සේ චක්‍රවර්තිරාජ්‍යය පිණිස මහණ නො වී නො නවත්නාසේකැ" යි වදාළසේක.

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉදින් මහබොධිසත්වයන් වහන්සේ මාරකායිකදෙවතාවාගේ වචනයෙන් අරතිචිත්තය උපන් කල්හි චතුස්සත්‍යඥනය නො මූ කළ කල්හි ම සර්වඥතාඥනය නො මූ කළ කල මහාභිනික්මන් නික්මුනුසේක. ඒ මහාබොධිසත්වයන් වහන්සේ විසින් කරණ ලද්ද වූ දුෂ්කරක්‍රියාවෙන් කම් කිම් ද? චතුස්සත්‍යඥන පරිපාකය බලා වදරන්නා වූ බොධිසත්වයන් වහන්සේ විසින් බුදු වන කල් පැමිණෙන තුරු සියලු ම සම්පත් අනුභව කිරීමෙන් යුක්ත ව විසීම නපුරු ද?" යි කීහ.

"මහරජානෙනි, පුද්ගලයෝ දසදෙනෙක් ලොකයෙහි ලාමක කරණු ලබන්නාහු ය. අවඥ කරණු ලබන්නාහු ය, ගර්හා කරණු ලබන්නාහු ය, කෲරබස් අසනු ලබන්නාහු ය, නින්ද කරණු ලබන්නාහු ය, දෙෂ නෙපුල්

Non-Commercial Distribution

අසනු **(366)** ලබන්නාහු ය. අනාදර කරණු ලබන්නාහු ය. මහරජානෙනි, ලොකයෙහි පුරුෂයා නැති ස්ත්‍රීතොම ජනයන් විසින් ලාමක කරණු ලබන්නී ය, අවඥ කරණු ලබන්නී ය, ගර්හා කරණු ලබන්නී ය, කෘරබස් අසනු ලබන්නී ය, නින්ද කරණු ලබන්නී ය, දෙෂතෙපුල් අසනු ලබන්නී ය. අනාදර කරණු ලබන්නී ය. මහරජානෙනි, කලහකාමී වූ දූර්වල පුරුෂ තෙම ද. මහරජාණෙනි, ඥනිමිත්‍ර විරහිත වූ පුද්ගලතෙම ද, මහරජානෙනි, පමණ නොදන මහත් කොට බොහෝ අනුභව කරණ පුද්ගලතෙම ද, මහරජානෙනි, අගෞරව කුලවාසී පුද්ගලතෙම ද, මහරජානෙනි, පාපමිත්‍රයන් භජනය කරණ පුද්ගලතෙම ද, මහරජානෙනි, ධනහීන වූ පුද්ගලතෙම ද, මහරජානෙනි, ජාතිගොත්‍රයට නිසි වූ චාරිත්‍රහීන වූ පුද්ගලතෙම ද, මහරජානෙනි, කෘෂිවාණිජ්‍යාදී කර්මාන්ත හීන වූ පුද්ගලතෙම ද, මහරජානෙනි, ප්‍රයොග හීන වූ පුද්ගලතෙම ද ලොකයෙහි සත්වයන් විසින් ලාමක කරණු ලබන්නේ ය, අවඥ කරණු ලබන්නේ ය, ගර්හා කරණු ලබන්නේ ය. කෘරබස් අසනු ලබන්නේ ය, නින්ද කරණු ලබන්නේ ය, දෙෂතෙපුල් අසනු ලබන්නේ ය, අනාදර කරණු ලබන්නේ ය. මහරජානෙනි, ලොකයෙහි මේ පුද්ගලයෝ දසදෙන ලොකයා විසින් ලාමක කරණු ලබන්නාහු ය, අවඥ කරණු ලබන්නාහු ය, ගර්හා කරණු ලබන්නාහු ය. කෘරබස් අසනු ලබන්නාහු ය, නින්ද කරණු ලබන්නාහු ය, දෙෂතෙපුල් අසනු ලබන්නාහු ය, අනාදර කරණු ලබන්නාහු ය. මහරජානෙනි, මේ දසකාරණය සිහි කර වදරන්නා වූ මහාබොධිසත්වයන් වහන්සේට මෙබඳු වූ සංඥවෙක් උපන්නේ ය. 'ඉදින් මම වනාහි කර්ම හීන නො වන්නෙම්, දිව්‍යමනුෂ්‍යයන් විසින් ගර්හිත වූ ප්‍රයොගහීනයකුදු නො වන්නෙම්. මම කර්මස්වාමී වීම් නම් ඉතා යෙහෙක. ක්‍රියාව ම ගරු කොට ඇත්තා වූ කර්මය ප්‍රතිෂ්ඨා කොට ඇත්තා වූ කර්මය ම උසුලන්නා වූ කර්මසංඛ්‍යාත වූ ක්‍රියාව ම ගෘහවාස කොට ඇත්තා වූ මම කායචිත්ත වීර්යයෙන් අප්‍රමාද ව වාසය කෙරෙමි' යි කියා මෙබඳු වූ සංඥවෙක් උපන්නේ ය. මහරජානෙනි, මෙසේ මහාබොධිසත්වයන් වහන්සේ බුද්ධඥනය මුහු කරවමින් සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කර වදළසේකැ'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මහාබොධිසත්වයන් වහන්සේ දුෂ්කරක්‍රියා කරණසේක් 'මම වනාහි මේ කටුක වූ දුෂ්කර ක්‍රියාවෙන් උතුම් වූ සර්වඥතාඥන දර්ශනයට පොහොසත් වූ විශෙෂය-කට හෝ උත්තරිමනුෂ්‍යධර්මයට නො පැමිණෙන්නෙමි. සර්වඥතාඥනාවබොධය පිණිස අනික් සැහැල්ලු වූ මාර්ගයෙක් වන්නේ ම ය' යි මෙසේ කීසේක් නො වේ ද? සිතූසේක් නො වේ ද? කිමෙක් ද, එසමයෙහි ආර්යමාර්ගය අරභයා මහාබොධිසත්වයන් වහන්සේට සතිසම්මොසය වී ද?'' යි විචාළෝ ය. මහරජානෙනි, යමක් විසින් දූර්වල කරණ ලද්ද වූ චිත්තය ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම පිණිස මනා ව ම නො පැමිණේ ද, ඒ මේ චිත්තදුබ්බලීකරණධර්මයෝ පස්විසිදෙනෙක, කවර නම් පස්විසිදෙනෙක් ද? යත්—

Non-Commercial Distribution

**"කොධො මහාරාජ චිත්තස්ස දුබ්බලීකරණො ධම්මො, යෙන දුබ්බලීකතං චිත්තං න සම්මා සමාධියති ආසවානං ඛයාය. උපනාහො-මක්ඛො-පලාසො-ඉස්සා-මච්ඡරියං-මායා-සාඨෙය්‍යං- ථම්භො-(367) සාරම්භො- මානො-අතිමානො-මදො-පමාදො-ථීනං-මිද්ධං තන්දි-ආලස්සං-පාපමිත්තතා-රූපා-සද්දා-ගන්ධා - රසා - ඵොට්ඨබ්බා - ඛුදා - පිපාසා - අරති මහාරාජ චිත්තස්ස දුබ්බලී කරණො ධම්මො, යෙන දුබ්බලී කතං චිත්තං න සම්මා සමාධියති ආසවානං ඛයාය."**

"මහරජාණෙනි, යම් ක්‍රොධ ධර්මයකින් දුර්වල කරණ ලද චිත්තය ආශ්‍රවක්ෂය පිණිස මනා කොට එකඟ නො වේ ද, නවාඝාතවස්තුක වශයෙන් අනුන් කෙරෙහි කරණ ක්‍රොධය චිත්තයාගේ දුර්වලීකරණ-ධර්මයෙක. වෛර බැඳීම ද අනුන්ගේ ගුණමකු බව ද, යුගග්‍රාහ ලක්ෂණ වූ ගුණ ඇත්තවුන් හා තමා සම කොට සිතා ගැන්ම ද, අනුන් කෙරෙහි කරණ ඊර්ෂ්‍යාව ද, මසුරුබව ද, තමාගේ ඇති අගුණ සඟවන මායාව ද, තමාගේ නැති ගුණ පහළ කරණ සඨගුණය ද, මහතුන්ගේ අවවාදයට නො නැමෙන දැඩි වූ සිත් ඇති බව ද, 'යමෙකු එකක් කී කල මම දෙකක් කියමි' යි යන කරණුත්තරිය කරණය ද, මානය ද, අධික වූ මානය ද, ජාත්‍යාදීන් කරණ මදය ද, ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවස්තුවෙහි ප්‍රමාද වන බව ද, දාන ශීල ධ්‍යාන භාවනායෙහි චිත්තසංකොචන ලක්ෂණ වූ ථීනය ද, කායාකර්මණ්‍යලක්ෂණ වූ මිද්ධය ද, තන්ද්‍රි සංඛ්‍යාත වූ නිද්‍රා බහුල බව ද, අලස බව ද, පව්ටුමිතුරන් සෙවනය කරණ බව ද, ස්ත්‍රීරූපාදි රූපදර්ශනය ද, භෙරිවීණාදි ශබ්දශ්‍රවණය ද, ශාන්ද්‍ර ජබාදි පුෂ්පාදි සුගන්ධාඝ්‍රාණය ද, ශාලිමාංසාදිභොජනරසය ද, මෘදු ස්නිග්ධ වස්ත්‍රරූපාදියක් සෙයින් ස්පර්ශ කිරීම ද, බලවත් වූ ක්ෂුධාව ද, බලවත් වූ පිපාසය ද මහරජාණෙනි, යම් ධර්මයකින් දුර්වල කරණ ලද්ද වූ චිත්තය චතුරාශ්‍රවයන්ගේ ක්ෂය කිරීම පිණිස මනා කොට එකඟ නො වේ ද, ඒ මේ අරතිය චිත්තයාගේ දුර්වලීකරණ ධර්මයෙක. මහරජාණෙනි, යම් ධර්ම කෙනෙකුන් විසින් දුර්වල කරණ ලද්ද වූ චිත්තය චතුරාශ්‍රවයන්ගේ ක්ෂය කිරීම පිණිස මනා කොට එකඟ නො වේ ද, ඒ මේ පස්විසිධර්මයෝ චිත්තදුබ්බලීකරණ ධර්මයෝ ය. මහරජාණෙනි, ක්ෂුධාපිපාසාද්වය බොධිසත්වයන් වහන්සේගේ ශරීරයෙහි ව්‍යාප්ත වූවාහු ය. ක්ෂුධාපිපාසාද්වය ශරීරයෙහි ව්‍යාප්ත වූ කල්හි චිත්තය ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම් පිණිස මනා කොට එකඟ නො වන්නේ ය.

"මහරජාණෙනි, මහාබෝධිසත්වයන් වහන්සේ සාරාසංඛෙය්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි මහාජනක සරභංගාදී ඒ ඒ ජාතියෙහි චතුරාර්ය සත්‍යධර්මයන්ගේ ප්‍රතිවෙධය ම සොයා වදළසේක. කිමෙක් ද, ඒ මහා-බොධිසත්වයන් වහන්සේට පශ්චිමභවික වූ චතුරාර්යසත්‍යධර්මය ප්‍රති-වෙධය වන්නා වූ මේ ජාතියෙහි චතුරාර්යමාර්ගය අරභයා සතිසම්මොසය

Non-Commercial Distribution

වේ ද? මහරජානෙනි, එතෙකුදු වුවත් දුෂ්කරක්‍රියා කරන්නා වූ මහාබොධිසත්වයන් වහන්සේට චතුස්සත්‍යප්‍රතිවෙධය පිණිස අනික් මාර්ගයෙක් වේ දෝ හො යි කියා සංඥමාත්‍රයෙක් උපන්නේ ය. මහරජානෙනි, බුදු වීමට පූර්වයෙහි බොධිසත්වයන් වහන්සේගේ උපන් ජාතියෙන් එකමාසික වූසේක් තමන් වහන්සේගේ පිතෘ වූ **සුද්ධොදන** නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ මංගල්‍ය නෙයාාඩම් ඇති වප්මඟුල් දවස්හි කර්මාන්ත භූමියට නුදුරු වූ සිහිල් වූ දඹරුක් සෙවණැල්ලෙහි විචිත්‍ර විතාන තොරණ තිර ජවනිකාදියෙන් සුරක්ෂිත වූ පරික්ෂෙප ඇති ශ්‍රී යහන් මස්තකයෙහි රන්පිළිමයක් සේ පලඟ බැඳ **(368)** වැඩ හිඳ වස්තුකාම ක්ලේශකාම යෙන් වෙන් වූ රාගද්වෙෂාදී අකුශලධර්මයෙන් වෙන් වූ විතර්කසහිත වූ විචාරසහිත වූ විවෙකයෙන් උපන්නා වූ ප්‍රීතිසැප ඇති ප්‍රථමධ්‍යානය උපදවා විහරණය කළසේක. විතර්ක විචාර දෙදෙනාගේ සන්හිඳීම හෙතු කොට ගෙණ ස්වසන්තානය විශෙෂයෙන් ම පැහැදීම කරන්නා වූ චිත්තයාගේ එකහබව ඇති විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් උපන්නා වූ ප්‍රීතිසැප ඇති ද්විතීයධ්‍යානය උපදවා විහරණය කළසේක. ප්‍රීතියගේ විරාගය හෙතු කොට ගෙණ ද උපෙක්ෂා ඇත්තේ ද ස්මෘති ඇත්තේ ද සම්පජානකාරී වූයේ ද වසන්නේ ය. ආර්යයෝ 'යම්බඳු වූ ඕහට උපෙක්ෂා ඇත්තේ ය. ස්මෘති සම්පන්න ය. සැපවිහරණයන් ඇත්තේ ය' යි කියද් ද, එබඳු සැපය ද කයින් විඳින්නේ තෘතීයධ්‍යානයට සමවැද විහරණය කළසේක. සැපයාගේ ප්‍රහාණය හෙතු කොට ගෙණ ද දුඃඛයාගේ ප්‍රහාණය හෙතු කොට ගෙණ ද සෞමනස්‍ය දෞර්මනස්‍යයන්ගේ පළමු විනාසය හෙතු කොට ගෙණ දුක් නැති සැප නැති උපෙක්ෂා ස්මෘති පාරිශුද්ධි ඇති චතුර්ථධ්‍යානයට සමවැද විහරණය කළසේක. මහරජානෙනි, චතුරාර්යසත්‍යධර්මය ප්‍රතිවෙධය කිරීම සොයන්නා වූ මහාබොධිසත්වයන් වහන්සේට සතිසම්මොසය නො වන බව මෙයින් දත යුතු ය'' යි වදළසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, චතුස්සත්‍යඥනය මුහු කරවන්නා වූ මහාබොධිසත්වයන් වහන්සේ දුෂ්කරක්‍රියා කර වදළසේක. මෙසේ මේ ප්‍රශ්නයත් එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

ඥාණපරිපාක ප්‍රශ්නය යි.

---

# පුණ්‍යාධිකතරභාව ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කුශලකර්මය හෝ අකුශලකර්මය හෝ මේ දෙකින් කවරෙක් විශෙෂයෙන් ම බලතර වී ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, කුශලකර්මය විශෙෂයෙන් ම බලතර වන්නේ ය. අකුශලකර්මය එසේ අධිකතර නැතැ'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කුශලකර්මය විශෙෂයෙන් ම බලතර වන්නේ ය.

Non-Commercial Distribution

අකුශලකර්මය එසේ අධිකතර නැතැ' යි කියා වදාළ ඒ වචනය මම නො පිළිගන්නෙමි. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ලොකයෙහි ප්‍රාණඝාතය කරණුවෝ ද දනා අයත් වස්තු සොරකමින් හෝ බලාත්කාර යෙන් ග්‍රහණය කරණුවෝ ද සස්වාමික ස්ත්‍රීපුරුෂයන් සම්බන්ධි වූ කාමයෙහි මිථ්‍යා ව හැසිරෙණුවෝ ද, මුසාවාද කියනුවෝ ද, ගාමඝාතක යෝ ද, මාර්ගයෙහි යන එන්නන් නසා වස්තු පැහැර ගන්නෝ ද, සැඟවී හිඳ වස්තු පැහැර ගන්නා වූ නෙකතිකයෝ ද, නොයෙක් වඤ්චනප්‍රයොග ඇත්තාහු ද යනාදි සත්වයෝ දක්නා ලැබෙති. ඒ සියලු ජනයෝ එපමණ වූ පාපක්‍රියාවෙන් හස්තච්ඡෙදය පාදච්ඡෙදය කර්ණච්ඡෙදය නාසාච්ඡෙදය කර්ණනාසාච්ඡෙදය බිලංගතාලික වධය සංඛමුණ්ඩි වධය රාජමුඛ වධය ජොතිමාලික වධය හත්ථපජ්ජොතික වධය ඒරකවත්තික වධය චීරක වාසික වධය එණෙයාක වධය බලිසමංසික වධය කහාපණක වධය ඛාරාපතච්ඡික වධය පළිඝපරිවත්තික වධය පලාලපීඨක වධය හුණු කළ තෙලින් ඇඟ වත් කිරීම ය, සුනඛයන් ලවා ඇඟ කවාලීම ය, දිවස්හුල නැඟීම ය, කඩුවෙන් හිස කැපීම ය යනාදීන් **(369)** නොයෙක් වධබන්ධන ලබන්නාහු ය. සමහර කෙනෙක් රාත්‍රියෙහි මිත්‍ථ්‍යාචාරාදි පාපක්‍රියාවන් කොට දවල්හි ම වධබන්ධනාදි විපාක අනුභව කරන්නාහ. කිසි කෙනෙක් දවල්හි පාපක්‍රියාවන් කොට එදවස් ම වධබන්ධනාදිය අනුභව කරන්නාහ. සමහරකෙනෙක් දවල්හි ප්‍රාණඝාතාදි පව් කොට එදවස් ම රාත්‍රියෙහි කර්කශ විපාක අනුභව කරන්නාහ. කිසිකෙනෙක් පව්වුකර්ම කොට දෙතුන් දවසක් ඉකුත් වූ කල විපාක අනුභව කරන්නාහ. ඒ සියලු දෙන ම ඉහාත්මභාවයෙහි දී ම විපාක දෙන්නා වූ දෘෂ්ටධර්මයෙහි ම විපාක අනුභව කරන්නාහු ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, එක්නමකට හෝ දෙනමකට හෝ තුන්නමකට හෝ සතරනමකට හෝ පස්නමකට හෝ දසනමකට හෝ සියක්නමකට හෝ දහසක්නමකට හෝ ලක්ෂයක් දෙනා වහන්සේට හෝ පිරිකර සහිත වූ මහදන් දී දෘෂ්ටධාර්මික වූ භොගයක් හෝ යශසක් හෝ සැපතක් හෝ අනුභව කළා වූ යම්කිසි ශ්‍රද්ධාවත් වූ උපාසකකෙනෙක් ඇද්ද? ශීලයෙන් හෝ උපොසථකර්ම යෙන් හෝ මේ ලොව ම සැප ලැබූ කෙනෙක් ඇද් ද?'' යි විචාළෝ ය.

''හැයි, මහරජානෙනි, දන් දී සිල් සමාදන් ව ගෙණ පොහොය පෙහෙවී උපොසථකර්මය කොට දෘෂ්ටධර්මවෙදනීය කුශලකර්මයෙන් එම ශරීර දෙහයෙන් ම දිව්‍යලොකයෙහි අනන්ත වූ යසසම්පත්තියට පැමිණියා වූ පුරුෂයෝ සතරදෙනෙක් ඇතැ'' යි වදාළසේක. ''ස්වාමීනි, ඔහු කවුරු කවරු දැ?'' යි විචාළෝ ය.

''මහරජානෙනි, **මහාමන්ධාතුරජ්ජුරුවෝ** ය, **නිමිරජ්ජුරුවෝ** ය, **සාධිනරජ්ජුරුවෝ** ය, ගන්ධර්වයෙහි දක්ෂ වූ **ගුත්තිලපණ්ඩිතයෝ** ය'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ කාරණය නොයෙක් සියදහස්ගණන් ජාතියෙන් අතර වූ දෙයක. මේ නුඹ වහන්සේ වදාළ

27

Non-Commercial Distribution

කාරණය අප දෙපක්ෂයට ම පරොක්ඛ ය යි කියන ලද අනුමාන වූ නො දුටු කාරණයෙක. ඉදින්, ස්වාමීනි, නුඹ වහන්සේ සමර්ථසේක් වී නම්, මේ වර්තමානකාලයෙහි අප බුදුන් ධරමාන කාලයෙහි කථාවක් වදළ මැනැවැ'' යි කීහ.

''මහරජානෙනි, මේ වර්තමානභවයෙහි ද **පූර්ණක** නම් දසතෙම **සැරියුත්**මහතෙරුන් වහන්සේට දන් දී එදවස්හි ම සිටුතනතුරට පැමිණියේ ය. ඒ පූර්ණකයා දූන් මෙසමයෙහි **පූර්ණකසිටානෝ** ය' යි කියා මුළුලොව ප්‍රසිද්ධ වී ය. **ගොපාල මාතෘදෙවී** නම් දුක්පත් සිටුදූවනියෝ තමාගේ හිසකේ කපා විකුණා ලත් අටකහවණුවකින් දන් සපයා **මහා කාත්‍යායනස්ථවිරයන්** වහන්සේ අටවැනි කොට ඇති සහ අටනමකට පිණ්ඩපාතදානය දී එදවස්හි ම **උදේනි** නම් නරනිඳුන්හට අග්‍රමහෙසිකා තනතුරට පැමිණියාහ. **සුප්පියා** නම් උපාසිකාතොමෝ අන්‍යතර වූ උපසපන් ගිලන්නමකට තමාගේ කලවේ මාංසයෙන් මාංසරසයක් කොට දන් දී දෙවෙනි දවස්හි පිරි ප්‍රකෘතිවූ වණච්ඡවි ඇති ව අරොගී වූහ. **මල්ලිකා** දෙවී ලොවුතුරා බුදුන්ට රැයක් ඉකුත් වීමෙන් ආභිදෙසික වූ කොමුපිඩු දන් දී එදවස්හි ම **කොසොල්**මහරජහට අග්‍රමහෙසිකා වූහ. **සුමන** නම් මාලාකාරතෙම සමන්මල් අටමිටකින් ලොවුතුරා බුදුන්ට පූජා කොට එදවස්හි ම මහත් වූ සම්පත්තියට පැමිණියේ ය. **එකසාටකබ්‍රාහ්මණ** තෙම තමාගේ උතුරුසළුවෙන් බුදුන් පුද එදවස්හි ම ගම්වර අටක් බැගින් **(370)** සියල්ලෙන් ම සබ්බටඨක නම් මහාරාජසම්මානයක් ලැබුයේ ය. මහරජානෙනි, මේ කී සියලුදෙන ම ඉහාත්මභාවයෙහි ම ලැබිය යුතු දෘෂ්ටධාර්මික වූ භොගය ද යශස් ද අනුභව කළාහු ය'' යි වදළසේක.

''අනේ! ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මහාසමුද්‍රයට වැද මුතු සයක් සොයා ගත් කෙනෙකුන් මෙන් නුඹ වහන්සේ මෙතෙක් ජිනෙන්ද්‍ර ශාසනයට වැද සොයසොයා ගොස් සදෙනෙකුන් ම දක වදළසේකැ''යි කීහ. ''එසේ ය, මහරජ'' යි වදළසේක. ''එහෙයින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අකුශලකර්මය විශෙෂයෙන් ම බලතර වන්නේ ය. කුශලකර්මය එසේ අධිකතර නැත්තේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මම වනාහි එකදවසෙක්හි ම පාපකර්මයාගේ විපාකයෙන් දිවස්හුල නගන්නා වූ පුරුෂයන් දශදෙනෙකුනුදු දක්නෙමි. විස්සකුදු තිහකුදු සතළිසකුදු පණස් දෙනෙකුනුදු පුරුෂයන් දක්නෙමි. පාපකර්මයාගේ විපාකයෙන් හුල හිඳුවන්නා වූ පුරුෂයන් සියයකුදු පුරුෂයන් දහසකුදු දක්නෙමි. තවද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ දඹදිවට අධිපති ව රජ කළ **නන්දගුත්ත** නම් බ්‍රාහ්මණවංශයෙහි **භද්‍රසාල** නම් සෙනාපති පුත්‍රයෙක් වී ය. එතෙම **ශාක්‍යවංශාභිජාත** වූ **චන්ද්‍රගුප්ත** නම් රජහට විරුද්ධ ව අනන්තසෙනාවාහන ගෙණ ඒ චන්ද්‍රගුප්ත නම් රජු හා යුද්ධ කරණු පිණිස සන්නද්ධ ව අවුත් පැමිණි කල්හි මහත් වූ සංග්‍රාමයෙක් පැමිණියේ වී ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ දෙදෙනාගේ

Non-Commercial Distribution

යුද්ධයෙහි උභයපක්ෂයෙන් ම බලසෙනායෙහි අසූවක් ඉමණ කවන්ධ රූපිහු වූහ. ඇතුන් දසදහසක් හා අසුන් ලක්ෂයක් හා රථ පණස්දහස් එක්සියයක් හා පාබලසේනාවගෙන් සියක්කෝටියක් සත්වඝාතන වූ යුද්ධභූමියෙහි ශීර්ෂරාශියට ශීර්ෂකලන්ද ය යි කියා පරසමයවාදීන්ගේ මතයෙක. ඒ එකම ශීර්ෂකලන්දයක් පරිපූර්ණ වූ කල්හි කවන්ධරූපය' යි කියන ලද හිස් නැති එක් මෘතශරීරයක් නැඟිට යුද්ධභූමියෙහි නටන්නේ ය. මෙබඳු කවන්ධරූප අසූවෙක් වරින් වර ඒ යුද්ධභූමියෙහි නැංගේ ය. මෙ කී සියලු දෙන ම පව්වුකර්මයාගේ විපාකයෙන් මහත් වූ අනයව්‍යසනයට පැමිණියාහු ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ කාරණයෙනුදු අකුශලය ම විශෙෂයෙන් ම බලතර වන්නේ ය' යි කියන්නෙමි. කුශලය එසේ අධිකතර නැත්තේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස; මේ ගෞතමබුදුන්ගේ ශාසනයෙහි **කොසොල්මහරජානන්** වහන්සේ විසින් අසදෘශදනයක් දෙන ලද්දේ ය යි කියා අසන ලද්දේ ඇද් ද ?'' යි විචාළෝ ය. ''එසේ ය, මහරජානෙනි, අසන ලද්දේ ය'' යි වදළසේක. ''කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ **කොසොල්මහරජානන්** වහන්සේ ඒ අසදෘශදනය දී ඒ හෙතුයෙන් මදක් වත් දෘෂ්ටධාර්මික වූ භොගයක් හෝ යශසක් හෝ සැපතක් හෝ ලැබූසේක් ද ?'' යි විචාළෝ ය. ''නැත, මහරජ'' යි වදළසේක. ''ඉදින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, **කොසොල්**මහරජානන් වහන්සේ මෙබඳු වූ නිරුත්තර වූ මහා දනයක් දී පියාත් ඒ දන් දුන් හෙතුයෙන් දෘෂ්ටධාර්මික වූ භොගයක් හෝ යශසක් හෝ සැපතක් හෝ නො ලැබූසේක් වී නම්, එහෙයින්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අකුශලය ම විශෙෂයෙන් ම බලතර වන්නේ ය. කුශලය එසේ අධිකතර නැතැ'' යි කීහ.

**(371)** ''මහරජානෙනි, අකුශලය ඉතා ස්වල්ප බැවින් වහා ම පිරිනැමෙන්නේ ය. කුශලය ඉතා මහත් බැවින් දීර්ඝකාලයකින් පිරිනැමෙන්නේ ය. මහරජානෙනි, මේ කාරණය උපමායෙනුදු පරීක්ෂා කට යුත්තේ ය. මහරජානෙනි, යම් සේ **අපරන්ත**ජනපදයෙහි වපුරන්නා වූ කුමුදභාණ්ඩිකා නම් ධාන්‍යජාතියක් මසින් සිඳින හෙයින් මසලු නම් විය, ඒ ධාන්‍යජාතිය ගොවියන්ගේ ඇතුළු ගෙට එක්මසින් යන ලද වන්නේ ය. හැල්ජාතිය පස්මාසයකින් ගොවියන්ගේ ගෙට පැමිණෙන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, කුමුදුභණ්ඩිකා නම් ශස්‍යජාතියගේ ද හැල්ජාතියගේ ද යන මේ දෙභාගයෙහි භෙද වූ විශෙෂය කවරේ ද ?'' යි විචාළසේක. ''ස්වාමීන් වහන්ස, කුමුදුභණ්ඩික ධාන්‍යජාතියගේ ස්වල්ප බැවින් හා හැල්ජාතීන්ගේ ඉතාමහත් බැවින. භවත් නාගසෙනයන් වහන්ස, හැල්ජාතිය නම් රාජාර්හ වන්නේ ය. රාජභොජනය වන්නේ ය. කුමුදභණ්ඩිකා ධාන්‍යය නම් දසකර්මකාරයන්ට භොජනය වන්නේ ය''යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අකුශලය ස්වල්ප බැවින් වහා පිරිනැමෙන්නේ ය. කුශලය ඉතා මහත් බැවින් දීර්ඝකාලයකින් පිරිනැමෙන්නේ ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස,

Non-Commercial Distribution

එහි යමක් වහා පිරිනැමේ නම්, ඒ දෙය ලොකයෙහි විශෙෂයෙන් ම බලතර නම් වන්නේ ය. ඒ කාරණයෙන් අකුශලය විශෙෂයෙන් ම බලතර වන්නේ ය. කුශලය එසේ අධිකතර නැත්තේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් සේ යම්කිසි යොධයෙක් මහත් වූ මහායුද්ධභූමියකට ගොස් බලවත් සතුරන් අල්වා ගෙණ හිස් කිසිල්ලෙන් දූඩි කොට ගෙණ ඇද ගෙණ වහා ම තමාගේ ස්වාමීන්ට සමීප කොට නමන්නේ වී නම්, ඒ යොධතෙම ලොකයෙහි සමර්ථ නම් වන්නේ ය. ශූර නම් වන්නේ ය. යම් වෛද්‍යාචාරියෙක් තෙම අනුන් වෙර ඇනි උලක් වහා උගුළුවා සුවපත් කෙරේ ද, ව්‍යාධි පහ කොට සුවපත් කෙරේ ද, ඒ වෛද්‍යාචාරිතෙම දක්ෂ නම් වන්නේ ය. යම් ගණකයෙක් වහ වහා ගණන් කොට කඩිනම දක්වා ද, ඒ ගණකතෙම දක්ෂ නම් වන්නේ ය. යම් මල්ලවයෙක් වහා ම ප්‍රතිමල්ලවයා ඔසවා උත්තාන කොට ඇද හෙළන්නේ වී නම්, ඒ මල්ලවතෙම සමර්ථ වන්නේ ය. ශූර නම් වන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, එපරිද්දෙන් ම කුශලය හෝ අකුශලය හෝ යමක් වහා ම පිරිනැමෙන්නේ වී නම්, ඒ දෙය ලොකයෙහි විශෙෂයෙන් ම බලතර වන්නේ ය' යි කීහ. ''මහරජානෙනි, මේ කුශලාකුශලකර්මදෙක මත් අනතුරු භවයෙහි ඉෂ්ටානිෂ්ට වූ විපාකානිසංස විඳුවන්නේ ම ය. එතෙකුදු වුවත් අකුශලය සාවද්‍ය බැවින් පව් කළ ඇසිල්ලෙන් ම දෘෂ්ටධර්මවෙදනීය වූ දුක්ඛවිපාක වන්නේ ය. මහරජානෙනි, පූර්ව වූ රජදරුවන් විසින් 'යමෙක් ප්‍රාණඝාතය කෙළේ නම්, එතෙම වධදණ්ඩයට ධනදණ්ඩයට සුදුසු වන්නේ ය. යමෙක් වස්තු ස්වාමීහු විසින් කයින් වචසින් නුදුන් වස්තු සොරකමින් හෝ බලාත්කාරයෙන් ගණී ද, යමෙක් අනුන් පිළිබඳ ස්ත්‍රීන් කෙරෙහි හැසිරේ ද, යමෙක් මුසාවාද කියා ද, යමෙක් මං පැහැර ගණී ද, යමෙක් සැහැවි හිඳ වස්තු පැහැර ගැණීම් ආදී වූ වඤ්චන ප්‍රයොග කෙරේ ද, හෙතෙම වධ දණ්ඩයට ධනදණ්ඩයට සුදුසු වන්නේ ය. ඔහු අල්වා වධ කළ යුත්තේ ය. කැපිය යුත්තේ ය, බින්ද යුත්තේ ය, නැසිය **(372)** යුත්තේ ය' යි කියා මේ නියමය තබන ලද්දේ ය. ඒ නියම කළ වධ්‍යයා[1] සොයා ගෙණ ඒ වධකාරකජනයෝ දඬුවම් කෙරෙති. වධ කෙරෙති, හිස් කපති, අත් පා බිඳිති, ජීවිතය නසති. කිමෙක් ද, මහරජානෙනි, 'යමෙක් දනයක් හෝ දේ ද, ශීලයක් හෝ රක්ෂා කෙරේ ද, උපොසථකර්මයක් හෝ කෙරේ ද, ඕහට ධනයක් හෝ යශසක් හෝ දිය යුත්තේ ය' යි කියා කිසි කෙනෙකුන් විසින් තබන ලද්ද වූ නියමයෙක් ඇද්ද? නොහොත් කරණ ලද පාපක්‍රියා ඇති සොරහුහට කරණ වධබන්ධනය මෙන් ඒ සුචරිතක්‍රියාව කළා වූ පුරුෂයා සොයා ධනයක් හෝ යශසක් හෝ දෙන්නාහු ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ' 'යි කීහ.

''ඉදින්, මහරජානෙනි, දයකයන්ටත් සොයසොයා ධනසම්පත් හෝ යසසම්පත් හෝ දෙන්නාහු වී නම්, කුශලධර්මයත් දෘෂ්ටධර්මවෙදනීය

1. වධය

Non-Commercial Distribution

වන්නේ ය. මහරජානෙනි, යම් හෙයකින් 'ධනයක් හෝ යශසක් හෝ දෙම්හ' යි කියා කිසි කෙනෙක් දයකයන් නො සොයද්ද, එහෙයින් කුශලකර්මය දෘෂ්ටධර්මවෙදනීය නො වන්නේ ය. මහරජානෙනි, මේ කාරණයෙනුදු අකුශලකර්මය දෘෂ්ටධර්මවෙදනීය වන්නේ ය. යම් දයකයෙක් පරලෙව්හි සැපවෙදනාව විඳිනු ලැබේ ද, එහෙයින් ඒ කුශලකර්මය විශෙෂයෙන් ම අධිකතර ය'' යි වදළසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹවහන්සේ හා සදෘශ වූ ප්‍රඥවතුන් වහන්සේ කෙනෙකුන් විසින් හැර මේ ප්‍රශ්නය සුනිර්වෙඨනය කළ හැකි නො වන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මා විචාළ මේ ලෞකික වූ ප්‍රශ්නය ලොකොත්තර වූ අර්ථයෙන් අභවන ලදූ'' යි කියා ස්තොත්‍ර කළහ·

**පුණ්‍යාධිකතරභාවප්‍රශ්නය නිමි.**

---

# ඥතිප්‍රෙත පින්පෙත් ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ලොකවාසී දයකයෝ දන් දී තමන්ගේ මිය පරලොව ගියා වූ, ඥතිප්‍රෙතයන්ට 'මේ දනයෙහි පින්පෙත් ඒ අපගේ ඥතිප්‍රෙතයන්ට පැමිණේව' යි කියා පින් දෙන්නාහු ය. කිමෙක් ද, ඒ පින් දුන් කාරණයෙන් මදක් වුවත් විපාකයක් ඒ ඥතිප්‍රෙතයෝ ලබන්නාහු ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, සමහර ප්‍රෙත කෙනෙක් ලබති, සමහර ප්‍රෙත කෙනෙක් නො ලබන්නාහු ය'' යි වදළසේක. ''ස්වාමීන් වහන්ස, කවර කෙනෙක් ලබන්නාහු ද? කවර කෙනෙක් නො ලබන්නාහු ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, එක්සිය සතිස් මහනරකයෙහි උපන්නා වූ නිරිසත්වයෝ පින්පෙත් හා දුන් බත් නො ලබති. ස්වර්ගලොකයට පැමිණියා වූ දෙවියෝත් නො ලබන්නාහ. තිරශ්චීන යොනිගතසත්වයෝත් නො ලබන්නාහු ය. ප්‍රෙතයොනිගත වූ චතුර්විධප්‍රෙතයන්ගෙන් අනෙකවර්ෂශතසහස්‍රයෙහි මහදුක් අනුභව කෙරෙමින් ඒ ඒ තන්හි වමන ගර්භමාලාදිය අනුභව කෙරෙමින් වසන්නා වූ වන්තාසික නම් ප්‍රෙතයෝ ද, අනෙකබුද්ධාන්තරයෙහිත් යැපෙන ආහාර පානයක් නොලදින් සාපිපාසායෙන් පෙළෙන්නා වූ ඛුප්පිපාසික ප්‍රෙතයෝ ද, ජීර්ණ වූ රුක්සිදුරු ඇවිළ ගත් ගිනි සෙයින් ඇතුළු කුක්ෂියෙහි ඇවිළ දවන්නා වූ වහ්නිජ්වාලාවෙන් දූවි **(373)** මහදුක් අනුභව කරන්නා වූ නිජ්ඣාමතණ්හික නම් ප්‍රෙතයෝ ද යන මේ ත්‍රිවිධ වූ ප්‍රෙතයෝත් ඒ පින් පෙත් නො ලබති. ඥතිමිත්‍රාදීන් විසින් දුන් දෙයින් යැපෙන්නා වූ ප්‍රෙතයෝ ඒ පින්පෙත් ලබති. ඒ පරදත්තූපජීවී වූ ප්‍රෙතයෝ ද සිහි කරන්නාහු ම ලබන්නාහු ය'' යි වදළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් ප්‍රෙතකෙනෙකුන් උදෙසා දනාදියක් කරණ ලද්දේ ද, ඉදින් ඒ ප්‍රෙතයෝ පින්පෙත් නො ලබන්නාහු නම්, ඒ කාරණයෙන් දයකයන්ගේ දනය අස්ථානගත වන්නේ ය, නිෂ්ඵල

වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, දනය අඵල නො වන්නේ ය, අවිපාක නො වන්නේ ය. දයකයෝ ඒ දනයාගේ ඵලානිසංසය අනුභව කරන්නාහු ය'' යි වදළසේක. ''ස්වාමීන් වහන්ස, එහෙයින් මට කාරණයකින් අඟවා වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, මේ ලොකයෙහි කිසි මනුෂ්‍යයෙක් තමන්ගේ නෑයින් බලාපියන්නට යනු කැමැති ව මත්ස්‍යමාංස සුරා හා බත් ද කැවිලි ද පිළියෙල කොට ගෙණ ඥතීන්ගේ කුලයට යෙති. එකල ඉදින් ඒ නෑයෝ සම්භව නො වීමෙන් ඒ මත්ස්‍යමාංස සුරා කැවිලි සහිත වූ බත නො පිළිගත්තු නම්, කිමෙක්ද, උපායනය යි කියන ලද ඒ පර්ණාකාර අස්ථානයට යන්නේ වේ ද? විනාස වන්නේ වේ දූ?'' යි විචාළසේක. ''ස්වාමීන් වහන්ස, ඒ ගෙණා පඬුරු අස්ථානයෙහි නො නස්නේ ය, හිමියන්ට ම වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම දයකයෝ ම ඒ දනයාගේ ඵලය අනුභව කරන්නාහු ය. තව ද, මහරජානෙනි, යම් සේ පුරුෂයෙක් ගෘහගර්භයකට ප්‍රවිෂ්ට වූයේ පෙරට නික්ම යන දෙරටුවක් නැති කල්හි කවර තෙනකින් නික්මයේ දූ?'' යි විචාළසේක. ''ස්වාමීනි, ප්‍රවිෂ්ට වූ ද්වාරයෙන් ම නික්ම යන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම දයකයෝ ම ඒ දනයාගේ ඵලය අනුභව කරන්නාහු ය'' යි වදළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ වදළ කාරණය එසේ ම වේවා. මම ද එසේ ම පිළිගන්නෙමි. දයකයෝ ම ඒ දනයාගේ ඵලය අනුභව කරන්නාහු ය. ඒ කාරණය අපි විරුද්ධ නො කරම්හ. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉදින් මේ දයකයන් විසින් දෙන ලද්ද වූ මතකදනය ඥතිප්‍රෙතයන්ට පැමිණෙන්නේ ය. ඒ ඥතිප්‍රෙතයෝ ද ඒ දනයාගේ විපාකය අනුභව කෙරෙති. ඒ කාරණයෙන් ප්‍රාණඝාත කරන්නා වූ රෞද්‍ර වූ සත්වඝාතනය කිරීමෙන් ලේ වැකුණු අත් ඇත්තා වූ ප්‍රදුෂිත වූ චිත්තසංකල්පනා ඇති යමෙක් බොහෝ මනුෂ්‍යයන් නසා දරුණු වූ අකුශලකර්මයන් කොට 'මාගේ මේ අකුශලකර්මයාගේ විපාකය ඥති ප්‍රෙතයන්ට පැමිණේව' යි කියා ඥතිප්‍රෙතයන්ට අකුසල් දෙන්නේ වී නම්, කිමෙක් ද, ඒ අකුශලකර්මයාගේ විපාකය ඥතිප්‍රෙතයන්ට පැමිණේ දූ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, එසේ අකුසල් නො පැමිණෙන්නේ ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමක් කරණ කොට ගෙණ කුශලකර්මය පැමිණෙන්නේ ය. අකුසලකර්මය නො පැමිණෙන් නේ ය' යි වදළා වූ ඒ අර්ථයෙහි එසේ වන්නට හෙතුවෙක් නැත්තේ ය. එසේ වන්නට කාරණය කවරේ දූ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, මේ තෙම ඇසිය යුතු වූ ප්‍රශ්නයෙක් නො වන්නේ ය. මහරජානෙනි, **(374)** (තෙපි නහමක් විසඳන්නෙක් ඇතැ යි නො සිතව. තෙපි නො ඇසිය යුත්තක් විචාළාහු ය.[1]) 'කුමක් පිණිස ආකාශය එල්වී ගත හෙන දෙයක් නැති ව නිරාලම්බන වී ද? කුමක් පිණිස ගංගාවෝ ඌර්ධවමුඛ ව

1. වරහන් තුළ තිබෙන පාඨය ''විසඳන්නෙකු ඇතැයි සිතා නො විචාළ යුත්තක් නො විචාරව'' යි විය යුතු ය.

Non-Commercial Distribution

නො යන්නාහු ද? කුමක් පිණිස මේ මනුෂ්‍යයෝ ද්විපද වූ ද? කුමක් පිණිස පක්ෂීහු ද්විපද වූ ද? කුමක් පිණිස මෘගජාතීහු චතුෂ්පදී වූ දැ' යි කියා ඒ කාරණයත් තෙපි මාගෙන් විචාරන්නාහු ද? මෙබඳු වූ දෙය විචාළ යුත්තක් නො වන්නේ ය'' යි* වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මම නුඹවහන්සේ වෙහෙසනු කැමැති ව නො විචාරන්නෙමි. එතෙකුදු වුවත් ශංකාවගේ ප්‍රතිබාහනය පිණිස විචාරන්නෙමි. 'ලොකයෙහි බොහෝ වූ මනුෂ්‍යයෝ වාමග්‍රාහී වූහ. වරදවා ගන්නාහ. පහ වූ නුවණැස් ඇත්තාහ. කිමෙක් ද? ඒ අඥනයෝ අවකාශයක් නො ලබත්ව' යි සිතා මෙසේ මම නුඹ වහන්සේගෙන් විචාරන්නෙමි'' යි කීහ.

''මහරජානෙනි, පාපකර්මය සමග නො කළ කල්හි දු 'මෙබඳු වූ ප්‍රයොගයෙන් ප්‍රාණඝාතාදිය කරව' යි කියා නො අනුදත් කල්හි දු පාප කර්මය සමග බෙද ගන්නට නො හැකි වන්නේ ය. මහරජානෙනි, යම් සේ මනුෂ්‍යයෝ හුණබටමාතිකාදි උදකය ඉසිලීමෙන් ජලය ඉතා දුරට ද ගෙණ යන්නාහ. කිමෙක් ද, මහරජානෙනි, ඝනශෛලමහාපර්වත හුණ එලකාදි ඉසිලීමකින් අභිප්‍රාය තෙනකට ගෙණ යන්නට හැකි වේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, එසේ නො හැක්කැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම කුශලකර්මය බෙද ගන්නට හැකි වන්නේ ය. අකුශල කර්මය බෙද ගන්නට නො හැකි වන්නේ ය. තවද, මහරජානෙනි, යම් සේ තිලතෛලාදීන් ප්‍රදීපය දල්වන්නට හැකි වන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, ජලයෙනුත් ප්‍රදීපය දල්වන්නට හැකි වේ දැ?'' යි විචාළ සේක. ''ස්වාමීනි, එසේ නො හැක්කැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම කුශලකර්මය ඔවුනොවුන්ට බෙද ගන්නට හැකි වන්නේ ය. අකුශලකර්මය බෙද ගන්නට නො හැක්කේ ය. තවද මහරජානෙනි, යම් සේ හිකාරයෝ විලින් පැන් හරවා ගෙණ ගොස් ධාන්‍ය වපුට පැස වන්නාහු ය. කිමෙක් ද, මහරජානෙනි, මහාසමුද්‍රයෙනුත් පැන් හරවා ගෙණවුත් ධාන්‍යය පැසවා ගන්නට හැකි වේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, එසේ නො හැක්කැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම කුසල් බෙද ගන්නට හැක්කේ ය. අකුසල් බෙද ගන්නට නො හැක්කේය.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කවර කාරණයකින් කුසල් බෙද ගන්නට හැකි වේ ද? අකුසල් බෙද ගන්නට නො හැකි වේ ද?කාරණයකින් මට අභවා වදාළ මැනැව. මම කිසිවක් නො දක්නා අන්ධයෙක් නො වෙමි. නුඹ වහන්සේ වදාළ දෑයක් අසා දැන ගන්නෙමි'' යි කීහ. ''මහ-රජානෙනි, අකුශලය ඉතා ස්වල්ප වන්නේ ය. මඳ වන්නේ ය, කුශලය ඉතා බොහෝ වන්නේ ය, මහත් වන්නේ ය, ස්වල්ප බැවින් අකුශල කරන්නාහු ම ග්‍රහණය කෙරෙයි. කුශලය මහත් බැවින් දෙවියන් සහිත වූ ලොකයෙහි පැතිරෙන්නේ ය'' යි වදාළසේක. ''ස්වාමීනි, මීට ම උපමාවක් කර වදාළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ ඉතා ක්ෂුද්‍ර වූ ජල බින්දුවක් මහාපෘථිවියෙහි පතිත වන්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි,

Non-Commercial Distribution

ඒ ජල බින්දුව මහාපෘථිවියෙහි දසදෙළොස් යොදුනක් තැන් පැතිරේ ද?''යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්ස, යම් (375) තැනෙක ඒ ජල බින්දුව පතිත වන ලද ද, එතැන්හි ම සිඳී යන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, හේ කවර කාරණයකින් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, ජල බින්දුවගේ කුඩා බැවිනැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අකුසලය ඉතා කුඩා වන්නේ ය. ස්වල්ප බැවින් පව් කරන්නාහු ග්‍රහණය කොට හිඳිනේ ය. අනුන් හා බෙදන්ට නො හැක්කේ ය. තවද, මහරජානෙනි, යම් සේ මහත් වූ මහාමෙඝයෙක් සකල පෘථිවිතලය පිණනය කෙරෙමින් වස්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ මහාමෙඝය හාත්පසින් දිසානුදිසායෙහි පැතිරේ දැ?'' යි විචාළසේක. ''එසේ ය. ස්වාමීන් වහන්ස, ඒ මහාමෙඝයතෙම හෙජ් විල් ගංගා සුළු ගංගා කඳුරැළි පෘථිවි පැළුණු විවර මහවිල් ලිං පොකුණු පුරවා ගෙණ දසදෙළොස් යොදුන් තන්හි පැතිරෙන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, හේ කවර කාරණයකින් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, මහාමෙඝයාගේ ඉතා මහත් බැවිනැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම කුශලය ඉතා බොහෝ වන්නේ ය. ඉතා බොහෝ බැවින් සියලු දිව්‍යමනුෂ්‍යයන් හා සමගත් බෙදන්නට හැක්කැ'' යි වදාළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කවර කාරණයකින් අකුසල් මඳ වී ද, කුසල් බොහෝ වී දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, මේ ලොකයෙහි යම් කිසිවෙක් බුද්ධාදීන්ට දන් දෙන්නේ ය, සිල් සමාදන් වන්නේ ය, පොහෝ කර්මාන්ත කරන්නේ ය, එකල්හි ඒ පුරුෂතෙම සතුටු වන්නේ ය. විශෙෂයෙන් ම සතුටු වන්නේ ය, සන්තොෂ වන්නේ ය, විශෙෂයෙන් ම සන්තොෂ වන්නේ ය, ප්‍රමුදිත වන්නේ ය, ප්‍රසන්න වූ සිත් ඇත්තේ ය, ජනිත වූ ප්‍රීති ඇති වන්නේ ය, ඕහට නැවත නැවතත් ප්‍රීති උපදනේ ය, ප්‍රීතිසිත් ඇත්තාහට නැවත නැවතත් කුසල් වඩින්නේ ය. මහරජානෙනි, යම් සේ බොහෝ වූ මධුරජලයෙන් සම්පූර්ණ වූ ලිංහි එක් දෙසකින් උල්පත්ජලය ලිඳට ප්‍රවෙශ වන්නේ වී නම්, එක් දෙසකින් පිරුණු පැන් නික්ම යන්නේ ය, එසේ නිරන්තරයෙන් පැන් නික්ම යන කල්හිත් නැවත නැවතත් පැන් උපදනේ ය. කිසි කෙනෙකුන් විසින් ඇදපියාත් ඒ ලිඳපැන් විනාශයට පමුණුවාපියන්නට නො හැකි වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම කුශලකර්මය නැවත නැවතත් වඩින්නේ ය. මහරජානෙනි, ඉදින් පුරුෂතෙම අවුරුදු සියයකිනිදු ඈත කරණ ලද්ද වූ කුශලකර්මය ආවර්ජනා කරන්නේ වී නම්, ආවර්ජිත ආවර්ජිත ක්ෂණයෙහි නැවත නැවතත් කුසල් වඩින්නේ ය. ඒ පුරුෂයාගේ ඒ කුශලකර්මය යම් කැමැති කෙනෙකුන් හා සමග බෙද ගන්නට හැකි වන්නේ ය. මහරජානෙනි, මේ ප්‍රශ්නයෙහි යම් කාරණයකින් කුශලකර්මය ඉතා බොහෝ වී ද, ඊට ම දක්වාලූ මේ කාරණය'' යි වදාළසේක. ''මහරජානෙනි, යමෙක් අකුශලකර්මය කෙරෙමින් අජාතශත්‍රුනරෙන්ද්‍රාදීන් මෙන් පසු ව විපිළිසර ඇති වන්නේ ය. 'මා කළ දෑ නපුරැ' යි කියා විපිළිසර

වන්නාහුගේ චිත්තය හැකිළෙන්නේ ය, වළකින්නේ ය, ආවට්ටනය වන්නේ ය, නො පැතිරෙන්නේ ය, සොක කරන්නේ ය, තැවෙන්නේ ය, භය වන්නේ ය, තෙමේ ම වෝදනාවට පැමිණෙන්නේ ය, නො වැඩෙන්නේ ය, එහි ම ක්ෂයභාවයට පැමිණෙන්නේ ය. මහරජානෙනි, යම් සේ බොහෝ උස් මිටි වූ **(376)** බොහෝ වැලි ඇත්තා වූ වියලි ගංගායෙහි වකුටු වූ එක් භාගයකින් ගඟ ඉහළ පටන් එන්නා වූ ස්වල්ප වූ ජලය පිරිහෙන්නේ ය, ක්ෂය වන්නේ ය, නො වඩින්නේ ය, ඒ ගඟ වැල්ලෙහි ම සිඳෙන්නේ ය, මහරජානෙනි. එපරිද්දෙන් ම අකුශලකර්මය කරන්නාහුගේ චිත්තය හැකිලෙන්නේ ය, වකුටු වන්නේ ය, පෙරළෙන්නේ ය, නො පැතිරෙන්නේ ය, සොක කරන්නේ ය, තැවෙන්නේ ය, පිරිහෙන්නේ ය, ක්ෂය වන්නේ ය, නො වැඩෙන්නේ ය, පව් කළ තන්හි ම ක්ෂය භාවයට පැමිණෙන්නේ ය. මහරජානෙනි, මේ ප්‍රශ්නයෙහි යම් කාරණයකින් අකුශලකර්මය ස්වල්ප වී ද, මඳ වී ද, ඊට ම දක්වා ලූ මේ කාරණය''යි වදාළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නයත් එසේ ම පිළිගන්නෙමි'' යි කියා ස්තොත්‍ර කළහ.

**ඥාතිප්‍රෙත පින්පෙත්ප්‍රශ්නය නිමි.**

---

# මහාස්වප්න ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ලොකයෙහි ස්ත්‍රීපුරුෂයෝ යහපත් වූ ද, පවිටු වූ ද, පෙර දුටුවා වූ ද, නුදුටුවාවූ ද, පෙර කළා වූ ද, පෙර නො කළා වූ ද, සැප ඇත්තා වූ ද, භය සහිත වූ ද, ස්වප්න දකිති. ඉතා දූරස්ථයෙහි ද, සමීපස්ථයෙහි ද, බහුප්‍රකාර වූ ද නොයෙක් සියදහස්ගණන් වර්ණ ඇති ස්වප්න දකිති. මේ ස්වප්න නම් කිමෙක් ද? මේ ස්වප්න කවරෙක් දකී ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, සිතට යමක් අරමුණු ව පැමිණේ ද, මේ සුපිනය නම් ඒ නිමිත්තමාත්‍රයෙක.

> **''ඡයිමෙ මහාරාජ සුපිනං පස්සන්ති. වාතිකො සුපිනං පස්සති. පිත්තිකො සුපිනං පස්සති. සෙම්හිකො සුපිනං පස්සති. දෙවතූපසංහාරතො සුපිනං පස්සති. සමුදාචිණ්ණතො සුපිනං පස්සති. පුබ්බනිමිත්තතො සුපිනං පස්සති. තත්‍ර මහාරාජ යං පුබ්බනිමිත්තතො සුපිනං පස්සති. තං යෙව සච්චං. අවසෙසං මිච්ඡාති''** යි.

''මහරජානෙනි, වාතප්‍රකෘති වූ පුද්ගලතෙම අහස්ගමනාදි ස්වප්න දක්නේ ය. පිත්තප්‍රකෘති වූ පුද්ගලතෙම අග්නිදාහාදි ස්වප්න දක්නේ ය. සෙම් කිපුනා වූ පුද්ගලතෙම ජලක්‍රීඩාදි ස්වප්න දක්නේ ය, අර්ථානර්ථ සාධනු කැමැත්තා වූ දෙවතාවන් විසින් කල්‍යාණ නපුරු දක්වීමෙන් ස්වප්න දක්නේ ය, පෙර පුරුදු කථාසල්ලාප ක්‍රියාදි විසින් ස්වප්න දක්නේ ය, තමහට මතු වන වැඩ අවැඩ පිණිස පූර්වනිමිති වශයෙන්

*Non-Commercial Distribution*

ස්වප්න දක්නේ ය. මහරජානෙනි, මොහු සදෙන ම ස්වප්න දක්නාහු ය. මහරජානෙනි, ඒ සවැදෑරුම් වූ කාරණයෙහි පූර්වනිමිති වශයෙන් යම් ස්වප්නයක් දක්නේ වී නම්, ඒ ස්වප්නය ම සත්‍ය වන්නේ ය, සෙස්ස බොරු වන්නේ යි.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමෙක් පූර්වනිමිති වශයෙන් ස්වප්න දක්නේ ය. කිමෙක් ද, ඔහුගේ චිත්තය තෙමේ ම ගොස් ඒ නිමිත්ත සොයන්නේ ද? ඒ නිමිතිලක්ෂණ හෝ සිතට හමු ව පැමිණේ ද? නොහොත් අනිකෙක් හෝ අවුත් ඕහට කියා ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ඔහුගේ චිත්තය තෙමේ ම ගොස් ඒ නිමිතිලක්ෂණය නො සොයන්නේ ය. අනික් කිසිවෙක් හෝ අවුත් ඕහට නො ම කියන්නේ ය. හුදෙක් ඒ නිමිතිලක්ෂණය ම **(377)** චිත්තයට ආපාථගත වන්නේ ය. මහරජානෙනි, යම් සේ ආදසය තෙමේ ම කිසි තැනකට ගොස් ඡායාව නො ම සොයන්නේ ය. අනික් කිසිවෙක් හෝ ඡායාව ගෙණවුත් ආදසයට නො ම නගන්නේ ය. හුදෙක් යම්කිසි තැනෙකින් ඡායාව අවුත් ආදසයට ආපාථගත වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ඔහුගේ චිත්තය තෙමේ ම ගොස් ඒ නිමිතිලක්ෂණය නො ම සොයන්නේ ය. අනික් කිසිවෙක් හෝ අවුත් නො ම කියන්නේ ය. හුදෙක් යම්කිසි තැනෙකින් ඒ නිමිතිලක්ෂණය ම අවුත් සිතට ආපාථගත වන්නේ ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, චිත්තය යම් ඒ ස්වප්නයක් දක්නේ ද, කිමෙක් ද, සැපතක් හෝ භයක් හෝ මේ නම් විපාකයෙක් වන්නේ යැ' යි කියා ඒ චිත්තය දනි ද?''යි විචාළෝ ය. ''මහරජානෙනි, 'සැපතක් හෝ භයක් හෝ මෙබඳු වූ විපාකයෙක් වන්නේ ය' යි කියා ඒ චිත්තය නො ම දන්නේ ය. යම් කෙනෙකුන්ට එබඳු වූ ස්වප්නලක්ෂණයෙක් උපන්නේ වී නම්, එකල්හි ඒ තෙම අනික් ජනයන්ට කියන්නේ ය. එකල ඒ විබුධජනයෝ අර්ථ කථනය කෙරෙති'' යි වදළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, එබැවින් මට කාරණයක් දක්වා වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ තමහට වන්නා වූ ලාභයක් පිණිස හෝ අලාභයක් පිණිස හෝ යශසක් පිණිස හෝ අයසක් පිණිස හෝ නින්දවක් පිණිස හෝ ප්‍රශංසාවක් පිණිස හෝ සැපතක් පිණිස හෝ දුකක් පිණිස හෝ ශරීරයෙහි තලකැලල් ඉනිගැට දදහු නගින්නාහු ය. කිමෙක් ද? මහරජානෙනි, ඒ තලකැලැල් දදහු 'මෙබඳු වූ වැඩ අවැඩ වන්නේ ය'යි කියා දූන උපදනාහු ද?'අපි මෙ නම් අර්ථයක් සාධා ලම්හ'යි කියා උපදනාහු ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි, අවකාශ තෙනෙක තලකැලැල් ද තිනිගැට දදහු හට ගන්නාහු ය. එහි ඒ පිළිකාදිය දක නෛමිත්තකජනයෝ මෙ නම් විපාකයෙක් වන්නේ යැ යි කියා ප්‍රකාශ කොට කියන්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම චිත්තය යම් ඒ ස්වප්නයක් දක්නේ ද, ඒ චිත්තය සැපතක් හෝ භයක් හෝ මෙ

Non-Commercial Distribution

නම් විපාකයක් වන්නේ යැ යි කියා නො දන්නේ ය. යම් කිසිවක්හට යථොක්ත වූ නිමිතිලක්ෂණයක් උපන් කල්හි එතෙම අනුන්ට කියන්නේ ය. එයින් ඒ ජනයෝ අර්ථානර්ථ කියන්නාහු ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යමෙක් ස්වප්න දක්නේ වී නම්, මේ තෙම නිදිමත වෙමින් දක්නේ ද? නො හොත් නිදිවර්ජිත වෙමින් දක්නේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් පුරුෂයෙක් ස්වප්න දක්නේ ද, ඒ පුරුෂතෙම නිදිමත වෙමින් නො දක්නේ ය, නිදිවර්ජිත වෙමිනුත් නො දක්නේ ය. කපිනිද්‍රාවට පැමිණි කල්හි චිත්තය භවාංගයට අසම්ප්‍රාප්ත කල්හි මේ අතුරෙහි ස්වප්න පෙණෙන්නේ ය. මහරජානෙනි, නිද්‍රාවට පැමිණියාහුගේ චිත්තය කැදැල්ලට වන් පක්ෂියකු මෙන් භවාංගගත වන්නේ ය. හෘදයවස්තුව නිසා පවත්නාවූ ඒ භවාංගගත චිත්තය කිසිවක නො පවත්නේ ය. ඒ කිසිවක නො පවත්නා චිත්තය කිසි සැප දුකක් නො ම දන්නේ ය. සුවදුක් විභාග නො දන්නා චිත්තයට ස්වප්න අරමුණෙක් නො වන්නේ ය. සුවදුක් ආදියෙහි චිත්තය පවත්නා කල්හි ම ස්වප්න පෙණෙන්නේ ය. මහරජානෙනි, යම් සේ **(378)** කිසි ආලොකයක් නැත්තා වූ ඝනතරතිමිරාන්ධකාරයෙහි ඉතා පිරිසිදු වූ ආදසයෙහි ද ඡායාව නො පෙණෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිද්‍රාවට පැමිණි කල්හි චිත්තය භවාංගගත ව සිටිකල්හි දු වම්මිකාභ්‍යන්තරගත සර්පයකු මෙන් චිත්තය ශරීරාභ්‍යන්තරයෙහි ම වන්නේ ය. අරමුණු සැලකීම් වශයෙන් චිත්තය නො පවත්නා කල්හි ස්වප්න නො පෙණෙන්නේ ය. මහරජානෙනි, ආදසය යම් සේ ද, එපරිද්දෙන් ම ශරීරය දත යුත්තේ ය. අන්ධකාරය යම් සේ ද, එපරිද්දෙන් ම නිද්‍රාව දත යුත්තේ ය. ඡායාව යම් සේ ද, එමෙන් චිත්තය දත යුත්තේ ය. තවද, මහරජානෙනි, යම් සේ මීදුමින් වැසෙන ලද්ද වූ සූර්යදිව්‍යරාජයාගේ ප්‍රභාව නො පෙණෙන්නේ ය. ඇත්තා ම වූ ඒ සූර්යරශ්මිය නො පවත්නේ ය. සූර්යරශ්මිය නො පවත්නා කල්හි ආලොකය නො පවත්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිද්‍රාවට පැමිණියහුගේ චිත්තය භවාංගගත වන්නේ ය. භවාංගගත වූ චිත්තය සුවදුක් අරමුණෙක නො පවත්නේ ය. චිත්තය නො පවත්නා කල්හි ස්වප්න නො පෙනෙන්නේ ය. මහරජානෙනි, සූර්යමණ්ඩලය යම් සේ ද, එමෙන් ශරීරය දත යුත්තේ ය. මීදුමින් වැසීයාම යම් සේ ද, එමෙන් නිද්‍රාව දත යුත්තේ ය. සූර්යරශ්මිය යම් සේ ද, එමෙන් සිත දත යුත්තේ ය. මහරජානෙනි, දෙදෙනෙකුන්ගේ විද්‍යමාන වූ ද ශරීරයෙහි චිත්තය නො පවත්නේ ය. නිද්‍රොපගත වූ භවාංගගතයාගේ විද්‍යමාන වූ ශරීරයෙහි ද, චිත්තය නො පවත්නා ලද වන්නේ ය. නිරොධසමාපත්තියට පැමිණියා වූ රහතන් වහන්සේගේ ශරීරය විද්‍යමාන වූ කල්හි ද, චිත්තය අප්‍රවෘත්ත වන ලද වන්නේ ය. මහරජානෙනි, නිදිවර්ජිතයාගේ චිත්තය ලොල් වන්නේ ය, විවෘත වන්නේ ය, ප්‍රකට වන්නේ ය, නිබඳ එක අරමුණෙක නො සිටින්නේ ය. මෙබඳු වූ සත්වයාගේ චිත්තයෙහි ස්වප්නලක්ෂණයක් ආපාථයට නො එළඹෙන්-

Non-Commercial Distribution

නේ ය. මහරජානෙනි, යම් සේ රහස් කියන්ට නුසුදුසු වූ විශ්වාස නො කට යුතු වූ ප්‍රකට වන ක්‍රියා ඇත්තා වූ විවෘත කරණ ලද රහස්ක්‍රියා ඇති පුරුෂයා රහස් කැමැත්තා වූ පුරුෂයෝ දුරු කරන්නාහු ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිදිවර්ජිත වූවහුට ප්‍රකෘතිමනුෂ්‍ය විෂය නො වන්නා වූ දිව්‍යමය වූ කාරණය අරමුණු නො වන්නේ ය. එහෙයින් නිදිවර්ජිත වූ පුද්ගලතෙම ස්වප්න නො දක්නේ ය. තවද, මහරජානෙනි, යම් සේ බිඳුනා වූ ආජීවමර්යාද ඇත්තා වූ ආචාරශීල විරහිත වූ පාපමිත්‍රයන් ඇත්තා වූ දුශ්ශීල වූ කුසීත වූ පසුබට වීර්ය ඇත්තා වූ භික්ෂුහු කරා සත්තිස්බොධිපාක්ෂික වූ කුශලධර්මයෝ අරමුණට නො පැමිණෙද්ද, මහරජානෙනි, එපරිද්දෙන් ම නිදි වර්ජිත වූවාහට දිව්‍ය වූ කාරණය අරමුණට නො පැමිණෙන්නේ ය. එහෙයින් නිදිවර්ජිත වූ පුද්ගලතෙම ස්වප්න නො දක්නේ ය'' යි වදළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මිද්ධ' ය යි කියන ලද නිද්‍රාවගේ ආදියෙක් ඇද්ද? මධ්‍යයෙක් ඇද්ද? අවසානයෙක් ඇද්ද?'' යි විචාළෝ ය. එසේ ය, මහරජානෙනි, මිද්ධයාගේ ආදියත් ඇත, මධ්‍යයත් ඇත, අවසානයත් ඇතැ'' යි වදළසේක. ''ස්වාමීනි, ඒ ආදිය කවරේ ද? මධ්‍යය කවරේ ද? අවසානය **(379)** කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ආකාශය වැසී යන මෙඝපටලය මෙන් ශරීරයෙහි බැඳෙන්නා වූ යම් ඔනාහයෙක් ඇද්ද, හාත්පසින් ශරීරයාගේ බැඳීයාමෙක් ඇද්ද, දුර්වලබවෙක් ඇද්ද, ශක්ති මඳ බවෙක් ඇද්ද, ශරීරයාගේ අකර්මණ්‍යතාවෙක් ඇද්ද, මේ මිඩයාගේ ආදිය නම් වන්නේ ය. මහරජානෙනි, යමෙක් කපිනිද්‍රාවෙන් යුක්ත වූයේ සර්වොපහාරචිත්තය ඉක්මුනා වූ භවාංගචිත්තයට නො පැමිණියා වූ විකීර්ණකචිත්තයෙන් නිද්‍රාක්ෂය කෙරේ ද, මේ මිද්ධයාගේ මධ්‍යය නම් වන්නේ ය. චිත්තය භවාංගගත වීම මිද්ධයාගේ පරියොසානය නම් වන්නේ ය. මහරජානෙනි, නිද්‍රා චිත්තමධ්‍යගත වූ කපිනිද්‍රාවෙන් යුක්ත වූ පුරුෂතෙම ස්වප්න දකින්නේ ය. මහරජානෙනි, යම් සේ සතරසම්‍යක්ප්‍රධානවීර්යයෙන් යුක්ත වූ ප්‍රථම ධ්‍යානයෙන් සංහිඳුනා වූ සිත් ඇති වාචොද්ගත ව ස්ථිර ව සිටියා වූ පර්යාප්තිධර්මයන් ඇති ස්ථිර වූ ප්‍රඥව ඇති ප්‍රහීණ වූ අනාර්යකථා සල්ලාප ශබ්ද ඇති කිසි ශ්‍රාවකයෙක්තෙම විවෙක රමණීය වූ වනයට වැද එකචාරිකෙශරසිංහරාජයකු සේ හැසිරෙමින් සුඛුම වූ අර්ථ චින්තනය කරන්නේ ය. ඒ ආර්යශ්‍රාවකතෙම ඒ වනයෙහි නිද්‍රාවට නො පැමිණෙන්නේ ය. සංහිඳුනා වූ එක්සිත් ඇත්තා වූ ඒ ආර්යශ්‍රාවකතෙම ඒ වනයෙහි හිඳ සියුම් වූ අර්ථය ප්‍රතිවෙධය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිදිවර්ජිත වූ නිද්‍රාවට නො පැමිණියා වූ මඳ මඳ නිද්‍රාවට පැමිණියා වූ කපිනිද්‍රාවෙන් යුක්ත වූ පුද්ගලතෙම ස්වප්න දක්නේ ය. මහරජානෙනි, අනාර්ය වූ කොතුහල ශබ්දය යම් සේ ද, එමෙන් ම නිදි වැළකීම දත යුත්තේ ය. විවෙක රම්‍ය වූ විචිත්‍රවනය යම් සේ ද, එමෙන් කපිනිද්‍රායෙන් යුක්ත වූ පුද්ගලතෙම දත යුත්තේ ය. ඒ ආර්යශ්‍රාවකතෙම අනාර්ය-

Non-Commercial Distribution

ජන කථාසල්ලාපශබ්ද හැර මිද්ධය විවර්ජිත කොට මධ්‍යස්ථ වූයේ සියුම් වූ අර්ථයෙන් යුක්ත වූ අර්හත්ඵලය යම් සේ ප්‍රතිවෙධය කෙරේ ද, එමෙන් නිදි වැළකීමෙන් යුක්ත වූ අධිකනිද්‍රාවට නො පැමිණියා වූ කපිනිද්‍රාවට පැමිණියා වූ කපිනිද්‍රාවෙන් යුක්ත වූ පුරුෂතෙම ස්වප්න දක්නේ ය. එසේ දක්නා වූ ස්වප්න ද පූර්වනිමිති වශයෙන් කොසලනරෙන්ද්‍රාදීන් විසින් දුටු සොළොස් ස්වප්නාදිය සෙයින් සත්‍යය'' යි වදළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නයත් එසේ ම පිළිගන්නෙමි'' යි ස්තොත්‍ර කළහ.

**මහාස්වප්නප්‍රශ්නය නිමි.**

# අකාලමරණ ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් ඒ සත්වකෙනෙක් නස්නාහු ද, ඒ මේ සියලු සත්වයෝ ම කාලයෙහි ම නස්නාහු ද? නොහොත් අකාලයෙහිත් නස්නාහු දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, කාලයෙහිත් මරණ ඇත, අකාලයෙහිත් මරණ ඇතැ'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කාලයට නසින්නා වූ ඒ සත්වයෝ කවුරු ද? කවර සත්වකෙනෙක් අකාලයෙහි නස්නාහු දැ?'' යි විචාළෝ ය. ''මහ-රජානෙනි, තොප විසින් වනාහි ආම්‍රවෘක්ෂවලින් හෝ දඹවෘක්ෂවලින් හෝ අනික් ඵලවෘක්ෂවලින් හෝ ආමය වූ ද, පැසුනා වූ ද වැටෙන්නා වූ ඵලයෝ දක්නා ලද්දෝ ඇද්දැ?'' යි විචාළ **(380)** සේක. එසේ ය, ස්වාමීනි, දක්නා ලද්දෝ ඇතැ'' යි කීහ. ''මහරජානෙනි, යම් ඒ ඵල කෙනෙක් වෘක්ෂයෙන් වැටෙන්නාහු ද, ඒ සියලු ඵලයෝ කාලයෙහි ම වැටෙන්නාහු ද? නොහොත් අකාලයෙහිත් වැටෙද් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පැසුනා වූ විලිකුන් වූ යම් ඵල කෙනෙක් වැටෙද් ද, ඒ සියලු ම ඵලයෝ කාලයෙහි වැටෙන්නාහු ය. අවශෙෂ වූ යම් ඒ ඵල කෙනෙක් වැටෙද්ද, ඒ ඵල අතුරෙන් කිසි ඵල කෙනෙක් පණුවන් විසින් විදිනා ලද්දහු වැටෙන්නාහ. කිසි ඵලකෙනෙක් පොල්ලෙන් වදින ලද්දහු වැටෙන්නාහ, කිසි ඵලකෙනෙක් වාතයෙන් සෙලවී වැටෙන්නාහ, කිසි ඵලකෙනෙක් . ඇතුළ කුණු ව වැටෙන්නාහ. ඒ සියලු ම ඵලයෝ අකාලයෙහි ම වැටෙන්නාහු ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් ඒ සත්වකෙනෙක් ජරාවෙගයෙන් නසින ලද්දහු වැටෙද්ද, ඒ සත්වයෝ ම කාලයෙහි නස්නාහු ය, අවශෙෂ වූ සත්වයන් අතුරෙන් සමහර කෙනෙක් තමන් පෙර කළ අකුශලකර්මයාගේ ඉතා දැඩි බැවිනුත් නස්නාහු ය, කිසි කෙනෙක් ගමන ප්‍රතිබාල්හතාවෙනුත් නස්නාහු ය, කිසි කෙනෙක් ක්‍රියාප්‍රතිබාල්හතාවෙනුත් නස්නාහු ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් ඒ සත්වකෙනෙක් උපච්ඡෙදදි කර්මප්‍රතිබාධයෙන් නස්නාහු ද, යම් ඒ සත්වකෙනෙක් යාත්‍රාදි ප්‍රතිවිරුද්ධතාවෙන් නස්නාහු ද, යම් ඒ සත්වකෙනෙක් විසමාහාරසෙවන

Non-Commercial Distribution

උදකපතනාදි ක්‍රියාවිරොධයෙන් නස්නාහු ද, යම් ඒ සත්වකෙනෙක් ජරා වෙගයෙන් පීඩිත වත් නස්නාහු ද, ඒ සියලු දෙන ම කාලයෙහි ම නස්නාහ. යමෙක් තෙම මාතෘකුක්ෂි ගත වූයේ ද නස්නේ ය, ඔහට ඒ කාලය යි. කාලයෙහි ම ඒ තෙම නස්නේ ය. යමෙක් වැදූගෙහි දී නසින්නේ ය, ඔහට ඒ කාලය නම් වන්නේ ය. ඒ උපන් කාලයෙහි ම ඒ තෙම නසින් නේ ය. යමෙක් උපන් මාසයෙන් ම නසින්නේ ය, යමෙක් උපන් හවුරුද්දෙන් නසින්නේ ය, යමෙක් උපන් සියක් හවුරුදු වූයේත් නසින්-නේ ය, ඔහට ඒ කාලය නම් වන්නේ ය. ඒ කාලයෙහි දී ම එතෙම නසින්නේ ය. ඒ කාරණයෙන්, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අකාලයෙහි මරණයක් නම් නො වන්නේ ය. යම්කිසි කෙනෙක් නසිත් නම්, ඒ සියල්ලෝ ම කාලයෙහි ම නසින්නාහු ය'' යි කීහ.

''මහරජානෙනි, ආයුෂය මතු ඇති කල්හි දු මොහු සත්දෙනෙක් අකාලයෙහි නස්නාහු ය. කවර සත්දෙනෙක් ද? යත්— මහරජානෙනි, ක්ෂුධාවෙන් පීඩිත වූ පුරුෂතෙම භොජනය නො ලබනුයේ ජඨරාග්නි වෙගයෙන් දවන ලද අභ්‍යන්තරය ඇති ව මත්තෙහි ආයුෂය විද්‍යමාන කල්හි ද අකාලයෙහි නසින්නේ ය. මහරජානෙනි, පිපාසායෙන් පීඩිත වූ පුරුෂෙතම පැන් නො ලබනුයේ වියලුනා වූ හෘදය ඇති ව මත්තෙහි ආයුෂය ඇති කල්හි ද අකාලයෙහි ම නසින්නේ ය. මහරජානෙනි, නාගයා විසින් දෂ්ට කරණ ලද්ද වූ විෂවෙගයෙන් පීඩිත වන ලද්ද වූ පුරුෂතෙම චිකිත්සාකාරයෙකු නො ලබනුයේ මතු ආයුෂය විද්‍යමාන කල්හි ද අකාලයෙහි නසින්නේ ය. මහරජානෙනි, විෂ වළඳන ලද්ද වූ පුරුෂතෙම අංගප්‍රත්‍යංගයන් විෂ තෙජසින් දැවෙන කල්හි දු බෙහෙදක් නො ලබනුයේ මත්තෙහි ආයුෂය ඇති කල්හි ම අකාලයෙහි නසින්නේ ය. මහරජානෙනි, ගිනි ගත්තා වූ සකල **(381)** ශරීරය ගින්නෙන් දැවෙන ලද්ද වූ පුරුෂතෙම ගිනි නිවාලීමක් නො ලබනුයේ ආයුෂය ඉතිරි ව විද්‍යමාන කල්හි ද අකාලයෙහි නසින්නේ ය. මහරජානෙනි, මහජලයට පැමිණියා වූ පුරුෂතෙම ගොඩ යාමට ප්‍රතිෂ්ඨාවක් නො ලදින් මතු ආයුෂය විද්‍යමාන කල්හි ද, ආකලයෙහි ම නස්නේ ය. මහරජානෙනි, ශස්ත්‍රයෙන් ප්‍රහාර ලද්ද වූ, එහෙයින් අබාධික වූ පුරුෂතෙම වෛද්‍යාචාර්යයෙකු නො ලබනුයේ මත්තෙහි ආයුෂය විද්‍යමාන කල්හි දු අකාලයෙහි ම නසින්-නේ ය. මහරජානෙනි, මොහු සද්දෙන මත්තෙහි ආයුෂය විද්‍යමාන කල්හි දු අකාලයෙහි ම නස්නාහු ය. මහරජානෙනි, ඒ මරණයෙහි ද මම එක් කාරණයක් ම නො කියමි. මහරජානෙනි, අටප්‍රකාරයකින් සත්වයන්ගේ කාලක්‍රියාව වන්නේ ය. වාතසමුට්ඨානයෙන් ද, පිත්ත සමුට්ඨානයෙන් ද, සෙම්හසමුට්ඨානයෙන් ද, සන්නිපාතයෙන් ද, ඍතු පරිවර්තනයෙන් ද, විසම පරිහරණයෙන් ද, උපක්‍රමයෙන් ද, කර්මවිපාක යෙන් දැ යි යන මේ අට ප්‍රකාරයෙන්, මහරජානෙනි, සත්වයන්ගේ කාලක්‍රියාව වන්නේ ය. මහරජානෙනි, ඒ අෂ්ටවිධ වූ කාලක්‍රියාවන් අතුරෙන් යම් මේ කර්මවිපාකයෙන් වන කාලක්‍රියාවෙක් ඇද්ද, ඒ කාල

ක්‍රියාව ම ඒ කාලක්‍රියාවන් අතුරෙන් කාලයට ම වන්නා වූ සාමයික කාලක්‍රියාව ය. අවශෙෂ වූ කාලක්‍රියාවෝ අසාමායික කාලක්‍රියාවෝ ය. එපවත් මෙහි ගාථාවෙන් දක්වීම වන්නේ ය:—

**"ජිඝච්ඡාය පිපාසාය-අහිනා දට්ඨො විසෙන ච,**
**අග්ගි උදක සත්තීහි-අකාලෙ තත්ථ මීයති.**
**වාත පිත්තෙන සෙම්හෙන-සන්නිපාතෙනුතූහි ච,**
**විසමොපක්කමකම්මෙහි-අකාලෙ තත්ථ මීයති"** යි.

"ඒ මරණයෙහි ක්ෂුධාවෙන් ද, පිපාසායෙන් ද, නාගයින් විසින් දෂ්ට කරණ ලදු ව ද, බලවත් විෂයෙන් ද වහ්නි උදක ශස්ත්‍රයෙන් ද යි යන මේ සත්කාරණයෙන් අකාලයෙහි මියෙනු ලැබේ. වාතයෙන් ද, පිත්තයෙන් ද, ශ්ලේස්මයෙන් ද, සන්නිපාතයෙන් ද, ඍතු පෙරළීමෙන් ද, විෂමොපක්‍රම ක්‍රියාවෙන් ද යි යන මේ සත්කාරණයෙන් ඒ අකාලයෙහි මියෙනු ලැබේ. මොහු අකාලමරණ ය' යි කියනු ලැබේ.

"තවද, මහරජානෙනි, සමහර සත්වකෙනෙක් පෙර කළ ඒ අකුශල කර්මවිපාකයෙන් නස්නාහු ය. මහරජානෙනි, මේ ලොකයෙහි යමෙක් අතීතයෙහි අනුන් ක්ෂුධාවෙන් මරවන්නේ ය. ඒ සත්වතෙම නරකයෙහි ඉපිද අනන්තදුක් විඳපියා කිසිකලෙක මිනිස්පියෙක උපන්නේ වී නම්, ඉතා දීන ව විරූප ව ක්ෂුධාවෙන් පීඩිත ව සයින් පෙළෙනුයේ සාදුකින් ක්ලාන්ත ව වියලී මලානික වූ හෘදය ඇති ව සාගින්නෙන් ශුෂ්ක ව විශෙෂයෙන් ම ශුෂ්ක ව ක්ෂුධාගින්නෙන් දැවෙනුයේ හාත්පසින් අභ්‍යන්තරය සාගින්නෙන් දැවෙනුයේ බොහෝ වර්ෂශතසහස්‍රයෙහි මහදුක් විඳිමින් ලදරු වූයේ ද මධ්‍යම වූයේ ද, මහලු වූයේ ද, බත් නො ලදින් ක්ෂුධාවෙන් ම මැරෙන්නේ ය. මේ පෙර කළ පව් ඇත්තා වූ ඔහුගේ කාලකර්ම වූ සාමයික මරණය නම් වන්නේ ය.

"යමෙක් අතීතයෙහි අන්‍යයන් පැන් නො දී පිපාසායෙන් මරන්නේ ය. එතෙම සතර අපාදුක් විඳ **(382)** පියා කිසි කලෙක මිනිස්පියක් ලද්දේ නම් නිජ්ඣාමතණ්හිකප්‍රෙතයකු සමාන ව මනුෂ්‍යප්‍රෙත ව රූක්ෂ වූ ශරීර ඇති ව පිපාසායෙන් වියලුනා වූ ශරීර ඇති ව බොහෝ අනෙකවර්ෂශතසහස්‍රයෙහි මහදුක් විඳ තරුණ වූයේ ද, මධ්‍යම වූයේ ද, මහලු වූයේ ද, පිපාසායෙන් ම මැරෙන්නේ ය. ඒ පෙර කළ පව් ඇත්තා වූ ඔහුගේ මේ ද සාමයික මරණය නම් වන්නේ ය.

"යමෙක් අතීතයෙහි අන්‍යයන් සර්පයන් ලවා දෂ්ටකරවා මරවන්නේ ය. එතෙම බොහෝ වර්ෂශතසහස්‍රයෙහි නරකදුක් විඳපියා තිරිසන් යෝනිගත ව දරපිඹුරු සර්පාදීන්ට ගොදුරු ව පිඹුරුමුඛයෙන් පිඹුරු මුඛයට ගැරඬි මුඛයෙන් ගැරඬිමුඛයට කෘෂ්ණසර්පමුඛයෙන් කෘෂ්ණ සර්පමුඛයට පෙරළි පෙරළී ඇවිදිමින් මිනිස්පියක් ලද්දේ ද, එ ම සර්පාදීන්

Non-Commercial Distribution

විසින් ලේ පෙරපෙරා කඩා කන ලද්දේ ම තරුණ වූයේ ද, මධ්‍යම ,වූයේ ද මහලු වූයේ ද, සර්පයන් විසින් දෂ්ට කරණ ලද්දේ ම මැරෙන්නේ ය. පව් කළා වූ ඔහුගේ මේ ද සාමයික මරණය නම් වන්නේ ය.

''යමෙක් අතීතයෙහි අනුන් විෂ දී මැරුයේ වී නම්, ඒ සත්වනෙම නරකයෙහි වැටී අනන්තදුක් විඳපියාත් ප්‍රෙත ව ගිනිගෙණ දැවෙන්නා වූ අංගප්‍රත්‍යංගයෙන් බොහෝ වර්ෂශතසහස්‍රයෙහි ප්‍රෙතදුක් විඳ කිසිකලෙක මිනිස්බවක් ලද්දේ නම්, මනුෂ්‍යප්‍රෙත ව ඒ ඒ තෙනින් කුණු ව සිඳුනු බිඳුනු ශරීරයෙන් සර්වජනප්‍රතිකූල්‍ය වූ කුණුගඳ හමනුයේ තරුණ වූයේ ද, මධ්‍යම වයසට පැමිණියේ ද, මහලු වූයේ ද' තමහට අප්‍රිය වූ විෂයෙන් ම මැරෙන්නේ ය. ඔහුගේ මේ ද සාමයික මරණය නම් වන්නේ ය.

''යමෙක් අතීතයෙහි අනුන් ගින්නෙන් මැරුයේ වී නම්, ඒ සත්ව නෙම ගිනිඅඟුරු නරකයෙහි වැටී ගින්නෙන් දද මහහඬින් හඬහඬා අංගාර පර්වතයට නගිමින් බසිමින් සජීවයන් සෙයින් කර්මයෙන් මැවී අල්වා ගෙණ වධ කරණ යමපලුන්ගේ යම් විෂයෙන් යම විෂයට පැමිණ බොහෝ අනෙකවර්ෂශතසහස්‍රයෙහි අංගාරකාග්නියෙන් දැවෙනුයේ එයින් පරි-වර්තන ව කිසිකලෙක මිනිස්පියක් ලද්දේ නම්, තරුණවයස් ඇත්තේ ද මධ්‍යම වයස් ඇත්තේ ද, මහලු වයස් ඇත්තේ ද, ගින්නෙන් දැවෙන ලද ගාත්‍ර ඇත්තේ අග්නියෙන් ම මැරෙන්නේ ය. ඔහුගේ මේ ද සාමයික මරණය නම් වන්නේ ය.

''යමෙක් අතීතයෙහි අනුන් උදකයෙන් මැරුයේ වී නම්, ඒ සත්ව නෙම අනන්ත නරකදුක් විඳපියා මිනිස්පියට පැමිණියේ ද, විරූප ව නැසුනු සිඳුනු බිඳුනු දුර්වල වූ ශරීර ඇති ව බොහෝ වර්ෂශතසහස්‍රයෙහි මහදුක් විඳිමින් නොයෙක් භයින් චලිත වන ලද සිත් ඇති ව ළදරු වූයේ ද, මධ්‍යම වූයේ ද, මහලු වූයේ ද තමන් පෙර කළ කර්මසාදෘශ්‍යයෙන් ගංගා හැලි දෙළ වැව් පොකුණු ආදියෙහි ගැලී උදකයෙන් ම මැරෙන්නේ ය. ඔහුගේ මේ ද සාමයිකමරණය නම් වන්නේ ය.

''යමෙක් පෙර අනුන් ශස්ත්‍රයෙන් මැරුයේ වී නම්, ඒ සත්වනෙම නිරා වැද බොහෝ අනෙකවර්ෂශතසහස්‍රයෙහි නරකදුක් විඳපියාත් පව් නො ගෙවුනෙන් හුරු මෘග කර්කටක කුක්කුටාදි තිරිසන්යොනි ගත ව ශස්ත්‍රයෙන් ඡින්නභින්නභේද්‍ය ව මැරෙමින් කිසි කලෙක මිනිසත්බවක් ලද්දේ ද, අනෙකජාතියෙහි ශස්ත්‍රමුඛයෙන් නැසෙමින් තරුණ වූයේ ද, මධ්‍යම වූයේ ද, මහලු වූයේ ද ශස්ත්‍රමුණයෙන් ම මැරෙන්නේ ය. පෙර කළ පව් ඇත්තා වූ ඔහුගේ මේ ද සාමයිකමරණය නම් වන්නේ ය'' යි වදළසේක. මොහු කාලමරණයෝ ය.

**(383)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අකාලමරණයෙක් ඇතැ යි කියා නුඹ වහන්සේ යමක් වදළසේක් ද, එහි මට නුඹ වහන්සේ වහා ම කාරණයක් දක්වා වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ හාත්පසින් ගිනි ගෙණ දිලියෙන්නා වූ මහත් වූ මහාඅග්නිස්කන්ධයෙක්

Non-Commercial Distribution

ග්‍රහණය කරණ ලද තෘණ කාෂ්ට ශාඛා පත්‍ර ඇත්තේ ක්ෂය ව ගියා වූ ආහාර ඇත්තේ ගිනිපෙනෙලි ක්ෂය වීමෙන් නිවී යන්නේ ය. නිරුපද්‍ර වූ ඒ අනුපද්‍රව වූ අග්නිස්කන්ධය කාලයට ම නිවී ගියේ නමැයි කියනු ලැබේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම, යම් කිසිවෙක් බොහෝ දවස් හවුරුදු සියදහස් ගණනෙක් නීරොගී ව ජීවත් ව ජරාවෙන් ජීර්ණ ව ආයුස යාගේ ක්ෂය වීමෙන් අනුපද්‍ර ව ව නිරුපද්‍ර ව ව මැරේද, එතෙම කාලයෙහි ම මරණයට පැමිණියේ ය' යි කියනු ලැබේ. තව ද, මහරජානෙනි, යම් සේ ග්‍රහණය කරණ ලද තෘණ කාෂ්ට ශාඛා පත්‍රයන් ඇති මහත් වූ මහාඅග්නි ස්කන්ධයෙක් වූයේ වේ ද, ඒ අග්නිස්කන්ධය ක්ෂය නො වූ තෘණ කාෂ්ට ශාඛා පත්‍රයන් ඇති කල්හි ම මහත් වූ මහාමෙඝයෙක් වර්ෂා කොට නිවී ගියේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ මහාඅග්නිස්කන්ධය කාලයෙහි නිවෙන ලද නම් වේ ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීනි වහන්සැ'යි කීහ. ''මහරජානෙනි, කුමක් පිණිස වනාහි ඒ පසු වූ අග්නිස්කන්ධය පූර්ව වූ ගිනිකඳ හා සමගතික නො වන්නේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ආගන්තුක වූ මහාමෙඝයෙන් ප්‍රතිපීඩිත වන ලද්ද වූ ඒ අග්නිස්කන්ධය අකාලයෙහි ම නිවෙන ලදැ'' යි කීහ. මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කිසිවෙක් අකාලයෙහි මියේ ද, ඒ සත්වතෙම ආගන්තුක වූ රොගයෙන් ප්‍රතිපීඩිත ව නස්නේ ය, වාතසමුට්ඨානයෙන් හෝ පිත්තසමුට්ඨානයෙන් හෝ සෙම්හසමුට්ඨානයෙන් හෝ සන්නිපාතයෙන් හෝ සෘතු පරිවර්තන යෙන් හෝ විසමපරිහාරයෙන් හෝ ඖපක්‍රමිකයෙන් හෝ ක්ෂුධාවෙන් හෝ පිපාසයෙන් හෝ සර්පයන් දෂ්ට කිරීමෙන් හෝ විෂ වැළඳීමෙන් හෝ ගින්නෙන් හෝ උදකයෙන් හෝ ශස්ත්‍රයෙන් හෝ ප්‍රතිපීඩිත වන ලදු ව අකාලයෙහි ම මැරෙන්නේ ය. මහරජානෙනි, යම් කාරණයකින් අකාලමරණයෙක් ඇතැ' යි කීම් ද, මේ මෙහි ඒ කාරණය නම් වන්නේ ය. තව ද මහරජානෙනි, යම් සේ ගගනයෙහි මහත් වූ මහවැසිවලාවෙක් නැඟී නිම්නස්ථාන ථලස්ථාන පරිපූරණය කෙරෙමින් වර්ෂා කරන්නේ වී නම්, ඒ මහාමෙඝය අනුපද්‍රව ව නිරුපද්‍ර ව ව වස්නේ ය' යි කියනු ලැබේ ද, මහ-රජානෙනි, එපරිද්දෙන් ම යම් කිසිවෙක් බොහෝ කලක් ජීවත් ව ජරාවෙන් ජීර්ණ ව ආයුක්ෂයවීමෙන් අනුපද්‍රව වූයේ නිරුපද්‍රව වූයේ නස්නේ ද, එතෙම කාලයෙහි ම මරණයට පැමිණියේ ය'' යි කියනු ලැබෙයි. තව ද, ''මහරජානෙනි, යම් සේ ගගනතලයෙහි මහත් වූ මහ වැසි වළායෙක් නැඟී මහත් ව හමන්නා වූ මහාවාතයෙන් විනාශයට යන්නේ ය. කිමෙක් ද? මහරජානෙනි, ඒ වැසිවලාව කාලයෙහි ම පහ වන ලද නම් වේ ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, කුමක් පිණිස වනාහි ඒ පසු ව නැඟී වලාව පූර්ව නැඟි වැසිවලාව හා සමගතික නො වූයේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ආගන්තුක වූ වාතයෙන් පීඩිත වන ලද්ද වූ ඒ වලාහකයතෙම අසමයට පැමිණියේ ම පහ ව ගියේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කිසිවෙක් **(384)** අකාලයෙහි මියේ ද, එතෙම ආගන්තුක වූ රොග



*Non-Commercial Distribution*

යෙන් පීඩිත ව වාතසමුට්ඨානයෙන් හෝ පිත්තාදිසමුට්ඨානයකින් හෝ ශස්ත්‍රවේගයෙන් හෝ පීඩිත ව අකාලයෙහි නසින්නේ ය. මහරජානෙනි, මෙහි යම් කාරණයකින් අකාලයෙහි මරණෙක් ඇතැ' යි කීයෙම් ද, මේ ඒ කාරණාව ය.

''තවද, මහරජානෙනි, යම් සේ මහත් බල ඇත්තා වූ කිපුනා වූ ආශීර්විෂයකු කිසියම් පුරුෂයකු දෂ්ට කෙළේ වී නම්, ඒ පුරුෂයාගේ අනීතික අනුපද්‍රව වූ ඒ විෂය ඔහු මරණට පමුණුවන්නේ ය. අනීතික අනුපද්‍රව වූ විෂය ඒ කෙළ පැමිණියේ ය'' යි කියනු ලැබෙයි. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කිසිවෙක් බොහෝ කලක් ජීවත් ව ජරාජීර්ණ ව ආයුෂය ගෙවීමෙන් අනුපද්‍රව ව නිරුපද්‍රව ව මැරෙන්නේ ය. ඒ පුරුෂ තෙම අනුපද්‍රව වූ නිරුපද්‍රව වූ ජීවිතයාගේ කෙළ පැමිණියා වූ සාමයික මරණයට පැමිණියේ ය'' යි කියනු ලැබේ. තවද, ''මහරජානෙනි, යම් සේ උග්‍ර විෂ ඇති බලවත් වූ ආශීර්විෂයකු විසින් දෂ්ට කරණ ලද පුරුෂයක්හට ඒ අතුරෙහි ම අහිගුණ්ඨිකයෙක් බෙහෙදක් දී අවිෂය කෙළේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ විෂය කාලයෙහි පහ වන ලද නම් වන්නේ ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, ඒ කුමක් පිණිස වනාහි පශ්චිම වූ විෂය පළමු විෂය හා සමගතික නො වූයේ වේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ආගන්තුක වූ බෙහෙතින් පෙළෙන ලද විෂය කෙළ පැමිණීම පහ ව ගියේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කිසිවෙක් අකාලයෙහි මියේ ද, එතෙම ආගන්තුක වූ රොගයෙන් ප්‍රතිපීඩිත ව වාතසමුට්ඨානයෙන් හෝ පිත්තාදි සමුට්ඨානයකින් හෝ ශස්ත්‍රවේගයෙන් හෝ පීඩිත ව අකාලයෙහි ම මැරෙන්නේ ය. මහරජානෙනි, මේ අකාලමෘත්‍යුයෙහි යම් කාරණය-කින් අකාලයෙහි මරණෙක් ඇතැ' යි කියා කීයෙම් ද, ඒ මේ කාරණය වන්නේ ය.

''තවද, මහරජානෙනි, යම් සේ ධනුශ්ශිල්පියෙක් හීසැරයක් පතනය කරන්නේ වී නම්, ඉදින් ඒ හීසැරය ගමන වූ පරිද්දෙන් ගමනපථයාගේ මස්තකයට යන්නේ ය. ඒ හීසැරය අනුපද්‍ර ව නිරුපද්‍ර ව ගමන වූ පරිද්-දෙන් ම ගමනපථයාගේ මස්තකයට ගියේ නමැයි කියනු ලැබේ ද, මහ-රජානෙනි, එපරිද්දෙන් ම යම් කිසිවෙක් බොහෝ කලක් ජීවත් ව ජරා ජීර්ණ ව ආයු ගෙවීමෙන් අනීතික ව අනුපද්‍ර ව ම මැරෙන්නේ ය. එතෙම අනීතික ව අනුපද්‍රව ව කාලයෙහි ම මරණයට පැමිණියේ ය'' යි කියනු ලැබෙයි. තවද, ''මහරජානෙනි, යම් සේ ධනුශ්ශිල්පියෙක් හීසැරයක් පතනය කෙළේ වී නම්, ඒ ධනුර්ධරයාගේ ඒ හීසැරය ඒ විදි ක්ෂණයෙහි ම කිසි බලවතෙක්[1] සැරය වළක්වා ග්‍රහණය කෙළේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ගමන වූ පරිද්දෙන් ම යන්නා වූ ඒ හීසැරය ගමනපථයාගේ මුදුන් පැමිණියේ නම් වන්නේ ද?'' යි විචාළසේක ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, කුමක් පිණිස වනාහි ඒ පසු වූ හී

1. බලවත් කෙනෙක්

Non-Commercial Distribution

සැරය පළමු විදි සැරය හා සමගතික නො වූයේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ආගන්තුක වූ ග්‍රහණයෙන් ඒ හි සැරයාගේ ගමන වැළකුනේ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කිසිවෙක් අකාලයෙහි මියේ ද, එතෙම ආගන්තුක වූ රොගයෙන් ප්‍රතිපීඩිත ව වාත-සමුට්ඨානයෙන් හෝ පිත්තාදිසමුට්ඨානයකින් හෝ ශස්ත්‍ර **(385)** වේග යෙන් හෝ පීඩිත ව අකාලයෙහි මියයන්නේ ය මහරජානෙනි, මේ මෘත්‍යුයෙහි යම් කාරණයකින් අකාලයෙහි මරණෙක් ඇතැ'යි කීයෙම් ද, ඒ මේ කාරණය වන්නේ ය.

''තවද, මහරජානෙනි, යම් කිසිවෙක් ලෝහමයභාජනයක් යම් සේ ආකොටනය කරන්නේ වී නම්, ඒ පුරුෂයාගේ පහරින් ශබ්ද ඉපිද ගති පරිද්දෙන් ම ගමනපථ මස්තකයට යන්නේ ය. අනීතික වූ අනුපද්‍රව වූ ඒ ශබ්දය යථාගති ගමනපථ මස්තකයට ගියේ නමැයි කියනු ලැබේ. මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කිසිවෙක් බොහෝ දවස් හවුරුදු සිය දහසක් මුළුල්ලෙහි ජීවත් ව ජරාජීර්ණ ව ආයු ගෙවීමෙන් නිරුපද්‍රව ව මියේ ද, ඊතිසංඛ්‍යාත උපද්‍රව විරහිත වූ අනුපද්‍රව වූ එතෙම කාලයෙහි ම මරණයට පැමිණියේ ය'' යි කියනු ලැබෙයි. තවද, ''මහරජානෙනි, යම් සේ යම් කිසිවෙක් ලොහමය භාජනයක් දණ්ඩාදියකින් පහරන්නේ වී නම්, ඒ පුරුෂයාගේ ආකොටනය කරණ කොට ගෙණ මධුර ශබ්දයෙක් පහළ වන්නේ ය. පහළ වූ ශබ්දය ඉතා දුරට නො ගිය කල්හි ම කිසිවෙක් ඒ ලෝකඩභාජනය ඇල්ලුයේ වී නම්, ආමසනය හා සමග ම ඒ ශබ්දය නිරුද්ධ වන්නේ ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ ශබ්දය ගමන පරිද්-දෙන් ම ගමනපථයාගේ මස්තකයට පැමිණියේ නම් වන්නේ ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, කුමක් පිණිස වනාහි පසු වූ ඒ ශබ්දය පළමු ශබ්දය හා සමගතික නො වන්නේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ආගන්තුක වූ ආමසනයෙන් ඒ ශබ්දය උපහත වී ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කිසිවෙක් අකාලයෙහි මියේ ද, එතෙම ආගන්තුක වූ රොගයෙන් පෙළෙන ලදු ව වාතසමුට්ඨානයෙන් හෝ පිත්තාදිසමුට්ඨානයකින් හෝ ශස්ත්‍ර වෙගප්‍රතිපීඩිත වන ලදු ව හෝ අකාලයෙහි මැරෙන්නේ ය. මහරජා-නෙනි, යම් කාරණයකින් මේ මෘත්‍යුයෙහි අකාල මරණෙක් ඇතැ' යි කීයෙම් ද ඒ මේ කාරණය වන්නේ ය.

''තවද, මහරජාණෙනි, යම් සේ යහපත් වූ කෙදරයෙහි හට ගත්තා වූ පැළ මුල් ධාන්‍ය බිජු මනා ව පවත්නා වූ වර්ෂාව කරණ කොට ගෙණ ඝන වූ පතළ වූ ආකීර්ණ වූ බොහෝ ඵල ව ගොයම් නහන කලට මනා ව පැසීමට පැමිණෙන්නේ ය. ඒ ධාන්‍යය නිරුපද්‍රව ව අනුපද්‍රව ව කාලයට පැමිණියේ නම් වන්නේ ය'' යි කියනු ලැබෙයි. ''මහරජානෙනි, එපරිද්-දෙන් ම යම් කිසිවෙක් බොහෝ දවස් හවුරුදු සියදහසක් ජීවත් ව ජරා ජීර්ණ වූයේ ආයුක්ෂය වීමෙන් අනීතික ව අනුපද්‍රව ව, මැරෙන්නේ ය.

*Non-Commercial Distribution*

එතෙම අනීතික ව අනුපද්‍රව ව කාලයෙහි ම මරණට පැමිණෙන ලද්‍ද'' යි කියනු ලැබේ. තවද, ''මහරජානෙනි, යම් සේ ක්ෂේත්‍රයෙහි හට ගත්තා වූ ධාන්‍යබිජු පැන් වැළක මැරුණේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ ධාන්‍යය කාලයට පැසුනා නම් වේ ද්‍ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, කුමක් පිණිස වනාහි ඒ පසු ව වපුළ ධාන්‍යය පෙර වපුළ ධාන්‍යය හා සමගතික නො වූයේ ද්‍ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ආගන්තුග වූ උෂ්ණයෙන් ප්‍රතිපීඩිත වන ලද්ද වූ ඒ ධාන්‍යය නැසෙන ලද්‍ද'' යි කීහ. මහරජානෙනි, **(386)** එපරිද්දෙන් ම යම් කිසිවෙක් අකාලයෙහි මියේ ද, එතෙම ආගන්තුග වූ රොගයෙන් ප්‍රතිපීඩිත ව වාත සමුට්ඨානයෙන් හෝ පිත්තාදිසමුට්ඨානයකින් හෝ ශස්ත්‍රවෙගප්‍රති-පීඩිත ව හෝ අකාලයෙහි නසින්නේ ය. මහරජානෙනි, මේ මෘත්‍යුයෙහි යම් කාරණයකින් අකාලයෙහි මරණෙක් ඇතැ යි කියා මම කීයෙම් වීම් නම් ඒ මේ කාරණය වන්නේය. මහරජානෙනි, නුඹ විසින් වනාහි සම්පූර්ණ වූ තරුණ වූ ගොයමෙහි පණුවෝ නැඟී මුල් සහිත ව නසන්නාහු ය යි කියා අසන ලද්දේ ඇද්ද්‍ද?'' යි විචාළසේක. ''සැබව, ස්වාමීනි, ඒ කාරණය අප විසින් අසන ලද්දේත් ඇතැ'' යි කීහ. ''කිමෙක් ද, මහ-රජානෙනි, ඒ ගොයම් කාලයෙහි නස්නා ලද ද? නොහොත් අකාලයෙහි නැසුනේ ද්‍ද'' යි විචාළසේක. ''ස්වාමීනි, අකාලයෙහි නැසුනේ ය. ඉදින්, ස්වාමීනි, ඒ ගොයම් පණුවෝ අනුභව නො කළාහු නම්, ගොයම් නගන කාලයට යහපත් ව පැසී පැමිණෙන්නාහු ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, ආගන්තුග වූ උපඝාතයෙන් ශස්‍ය නසින්නේ ය. නැසීමක් නැත්තා වූ ශස්‍ය ගොයම් කපා නහන කලට යහපත් ව පැමිණේ ද්‍ද?''යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්-දෙන් ම යම් කිසිවෙක් අකාලයෙහි මියේ ද, එතෙම ආගන්තුග වූ රොග යෙන් ප්‍රතිපීඩිත ව වාතසමුට්ඨානයෙන් හෝ පිත්තසමුට්ඨානාදියකින් හෝ ශස්ත්‍රවෙගයෙන් පීඩිත ව හෝ මැරෙන්නේ ය. මහරජානෙනි, මේ මෘත්‍යුයෙහි යම් කාරණයකින් අකාලයෙහි මරණෙක් ඇතැ යි කීයෙම් ද, මේ ඒ කාරණය වන්නේ ය.

''මහරජානෙනි, නුඹ විසින් වනාහි ඵලභාරයෙන් ඒ ඒ දෙසට නැමුනා වූ කරල් පත්‍ර ඇත්තා වූ සශ්‍රීක ව පැසුණු ශස්‍යයෙහි පාෂාණවර්ෂා නම් වූ වර්ෂාජතියක් නිපතිත ව කරල් විනාස කරන්නේ ය. අපල කරන්නේ ය යි කියා අසන ලද්දේ ද්‍ද?'' යි විචාළසේක. ''සැබැව, ස්වාමීනි, ඒ කාරණය අප විසින් අසන ලද්දේත් ඇත, දක්නා ලද්දේත් ඇතැ'' යි කීහ. ''කිමෙක්ද, මහරජානෙනි, ඒ කරල් නැඟුනු ගොයම් කාලයෙහි නස්නා ලද ද? නොහොත් අකාලයෙහි නටුයේ ද්‍ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, අකාලයෙහි නැසුනේ ය. ඉදින්, ස්වාමීනි, ඒ ශස්‍යය කරක වැස්ස නො වැස්සේ වී නම් ශස්‍යොද්ධරණ සමයට පැමිණෙන්නේ ය'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, ආගන්තුග වූ උපඝාතනයෙන් ශස්‍යය විනාශ වන්නේ ය. නැසීමක් නැත්තා වූ ශස්‍යය ශස්‍යොද්ධරණ කාලයට

Non-Commercial Distribution

පැමිණේ ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි'' යි කීහ. 'මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කිසිවෙක් අකාලයෙහි මියේ ද, ඒ සත්වතෙම ආගන්තුග වූ රොගයෙන් පීඩිත ව වාතසමුට්ඨානයෙන් හෝ පිත්ත සමුට්ඨානයෙන් හෝ සෙම් කිපීමෙන් හෝ සන්නිපාතිකයෙන් හෝ ඍතුපරිවර්තනයෙන් හෝ විෂම පරිහරණයෙන් හෝ ආත්මපරොපක්‍රමයකින් හෝ ක්ෂුධාවෙන් හෝ පිපාසායෙන් හෝ සර්පයන්ගේ දෂ්ට කිරීමෙන් හෝ විෂ අනුභව කිරීමකින් හෝ වහ්නියෙන් හෝ උදකයෙන් හෝ ශස්ත්‍රවෙගප්‍රතිපීඩිත ව හෝ අකාලයෙහි ම හෝ මියෙන්නේ ය. ඉදින් වනාහි ආගන්තුග වූ රොගයෙන් පීඩිත නො වූයේ වී නම්, කාලයෙහි මරණයට පැමිණෙන්නේ ය. මහරජානෙනි, යම් කාරණයකින් මේ මෘත්‍යුයෙහි අකාලමරණෙක් ඇතැ යි කීයෙම් ද, ඒ මේ කාරණය වන්නේ ය'' යි වදාළසේක.

(387) ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්නය විසඳා වදාළ නියාව ඉතා ආශ්චර්ය වන්නේ ය. සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ප්‍රශ්නය විසර්ජනය කර වදාළ පරිදි ඉතා අද්භූත වන්නේ ය. මනොනන්දනීය වූ කාරණා යහපත් කොට ම දක්වන ලද්දේ ය. අකාලයෙහි මරණයාගේ ප්‍රකාශ කරණු පිණිස සුන්දරතර උපමා යහපත් කොට ම දක්වන ලද්දේ ය. අකාලයෙහි මරණ ඇතැ යි කියා ලැහැල්ලු කරණ ලද්දේ ය. ප්‍රකට කරණ ලද්දේ ය. ප්‍රසිද්ධ කරණ ලද්දේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සිත් නැත්තා වූ වික්ෂිප්ත වූ මනුෂ්‍යයෙකුදු එක එක උපමාවෙකින් ම අකාලයෙහි මරණ ඇතැ යි කියා නිෂ්ඨාවට යන්නේ ය. සිත් සහිත වූ මා වැනි මනුෂ්‍යයෙකු නිෂ්ඨාවට යන බව කියනු ම කවරේ ද? ස්වාමීනි, මට පළමු වදාළ උපමාවෙන් ම අකාලයෙහි මරණ ඇතැ යි කියා ම අවබොධ විය. එතෙකුදු වුවත් නැවැත නැවැතත් ප්‍රකාශ කිරීම අසනු කැමැති ව නො පිළිගත්තෙමි. අද මේ ප්‍රශ්නය විසඳා වදාළ නියාවට, ඉදින් සනරාමර ලොක පූජිත වූ සර්වඥශාස්තෘන් වහන්සේ වැඩවාසය කරණසේක් වී නම්, ශ්‍රී හස්තය දිගු කොට නුඹ වහන්සේගේ ශිරොමස්තකය පිරිමදිමින් සාධුකාර දෙනසේක. සාධු, සාධු, ස්වාමීනි, මේ ප්‍රශ්නයත් එසේ ම පිළිගන්නෙමි'' යි ස්තොත්‍ර කළහ..

අකාලමරණප්‍රශ්නය නිමි.

---

# චෛත්‍ය ප්‍රාතිහාර්‍ය ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පිරිනිවියා වූ සියලු ම රහතුන්ගේ චෛත්‍යවල ප්‍රාතිහාර්ය පහළ වේ ද? නොහොත් ඇතැම් රහතුන් වහන්සේලාගේ චෛත්‍යයෙහි ම ප්‍රාතිහාර්ය පහළ වේ ද?''යි විචාළෝ ය. ''මහරජානෙනි, සමහර රහතුන්ගේ චෛත්‍යයෙහි ප්‍රාතිහාර්ය වන්නේ ය, සමහර රහතුන්ගේ චෛත්‍යයෙහි ප්‍රාතිහාර්ය නො වන්නේ ය'' යි වදාළ

Non-Commercial Distribution

සේක. "ස්වාමීනි, කවර කෙනෙකුන්ගේ චෛත්‍යයෙහි ප්‍රාතිහාර්ය වේ ද? කවර කෙනෙකුන්ගේ චෛත්‍යයෙහි නො වේ ද?" යි විචාළෝ ය.

**"තිණ්ණන්නං ඛො මහාරාජ-පෙ-පාටිහීරං හොති"**

"මහරජානෙනි, තුන්දෙනෙකුන් අතුරෙන් අන්‍යතරයක්හුගේ අධිෂ්ඨානයෙන් පිරිනිවියා වූ රහතුන්ගේ චෛත්‍යයෙහි ප්‍රාතිහාර්යය වන්නේ ය. කවර තුන්දෙනෙකුන් අතුරෙන් ද? යත්:— මහරජානෙනි, මේ ශාසනයෙහි රහතුන් වහන්සේ 'මාගේ චෛත්‍යයෙහි මෙබඳු වූ ප්‍රාතිහාර්යයෙක් වේව' යි සිතා ජීවමාන ව සිටීමින් ම දිව්‍යමනුෂ්‍යයන්ට අනුකම්පාවෙන් අධිෂ්ඨාන කර වදරණසේක. ඒ රහතුන් වහන්සේගේ අධිෂ්ඨාන වශයෙන් චෛත්‍යයෙහි ප්‍රාතිහාර්ය වන්නේ ය. මෙසේ පිරි නිවියා වූ රහතුන් වහන්සේලාගේ චෛත්‍යයෙහි අධිෂ්ඨාන වශයෙන් ප්‍රාතිහාර්යය වන්නේ ය. නැවත ද, මහරජානෙනි, සම්‍යක්දෘෂ්ටික දෙවතාවෝ මනුෂ්‍යයන්ට අනුකම්පාවෙන් මෙබඳු වූ ප්‍රාතිහාර්යයෙන් ලොවුතුරා බුදුන්ගේ සද්ධර්මය නිත්‍යයෙන් ලොකයා විසින් ග්‍රහණය කරණ ලද වන්නේ ය. ප්‍රසන්න වූ මනුෂ්‍යයෝ ද කුශලධර්මයෙන් වැඩෙන්නාහු ය" යි සිතා පිරිනිවියා වූ **(388)** රහතුන්ගේ චෛත්‍යයෙහි ප්‍රාතිහාර්යය දක්වන්නාහු ය. මෙසේ දෙවතාවන්ගේ අධිෂ්ඨානයෙන් පිරිනිවියා වූ රහතුන්ගේ චෛත්‍යයෙහි ප්‍රාතිහාර්යය වන්නේ ය. නැවත ද, මහරජානෙනි, ශ්‍රද්ධාවත් වූ රත්නත්‍රයෙහි ප්‍රසන්න වූ පණ්ඩිත වූ සද්ධර්ම ශ්‍රවණ ධාරණයෙන් ව්‍යක්ත වූ සද්ධර්මසාගරයෙහි පිහිනන මහා බුද්ධි ඇති මහත් වූ ප්‍රඥාවෙන් යුක්ත වූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ බුදුගුණ නුවණින් සිතා සලකා සුගන්ධද්‍රව්‍යයක් හෝ සුමනවකුලාදී මල් හෝ ඛොමකාසිකාදී වස්ත්‍රයක් හෝ අන්කිසිවක් හෝ බුද්ධචෛත්‍යාදියෙහි සකසා පුද මෙබඳු ප්‍රාතිහාර්යයෙක් වේව" යි අධිෂ්ඨාන කොට තහන්නේ ය. ඒ ශ්‍රද්ධාවත්හුගේ අධිෂ්ඨානයෙන් පිරිනිවියා වූ ත්‍රිවිධබුදුන්ගේ චෛත්‍ය යෙහි ප්‍රාතිහාර්ය වන්නේ ය. මෙසේ මනුෂ්‍යයාගේ අධිෂ්ඨාන වශයෙන් පිරිනිවියා වූ ත්‍රිවිධ බුදුන්ගේ චෛත්‍යයෙහි ප්‍රාතිහාර්ය පහළ වන්නේ ය. මහරජානෙනි, මේ රහත් දෙවතා ශ්‍රද්ධාවත් යන තුන්දෙනා අතුරෙන් එක්තරා කෙනෙකුන්ගේ අධිෂ්ඨාන වශයෙන් පිරිනිවියාහුගේ චෛත්‍ය යෙහි ප්‍රාතිහාර්ය පහළ වන්නේ ය. මහරජානෙනි, ඉදින් ඔවුන්ගේ අධිෂ්ඨානයෙක් නො වී නම්, චෙතොවශිප්‍රාප්ත වූ ෂඩභිඥලාභී වූ මහා- ක්ෂීණාශ්‍රවයන් වහන්සේ කෙනෙකුන්ගේ චෛත්‍යයෙහි හෝ ප්‍රාතිහාර්යය පහළ වන්නේ ය. මහරජානෙනි, මේ යථොක්තප්‍රකාරයෙන් ප්‍රාතිහාර්ය යක් නැති කල්හි ද ඒ ප්‍රාතිහාර්යය පහළ නො වන බව දැක තමාගේ පූර්ව කෘතපුණ්‍යතාවයකින් හෝ ඉහාත්මභාවයෙහි සුචරිතගුණබලයකින් හෝ ලැබිය යුතු හෙයින් අප්‍රමාද ව ම ශ්‍රද්ධාවත් සුජනජනයා විසින් රහතුන්ගේ සුපරිසුද්ධභාවය කල්පනා කට යුත්තේ ය. මේ සර්වඥපුත්‍ර වූ රහතුන්

Non-Commercial Distribution

වහන්සේ පිරිනිවන් පෑ වදාළසේකැ යි කියා නිශ්චාවට ගිය යුත්තේ ය. ඇදහිය යුත්තේ ය'' යි වදාළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නයත් ඒ වදාළ පරිද්දෙන් ම පිළිගන්නෙමි'' යි කීහ.

**චෛත්‍යප්‍රාතිහාර්යප්‍රශ්නය නිමි.**

---

# නිර්වාණාභව්‍ය ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම් ඒ පිළිපැද්ද වූ සත්ව කෙනෙක් මනා කොට පිළිපදින්නාහු වී නම්, ඒ සියල්ලන්ට ම ධර්මාභිසමය වේ ද? නොහොත් කිසිවක්හට ධර්මාභිසමය නො වේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, කිසිවක්හට ධර්මාභිසමය වන්නේ ය. කිසිවක්හට ධර්මාභිසමය නො වන්නේ ය'' යි වදාළසේක. ''ස්වාමීනි, කවරක්හට ධර්මාභිසමය වේ ද? කවරක්හට ධර්මාභිසමය නො වේ දැ?''යි විචාළෝ ය, ''මහරජානෙනි, මනා කොට පිළිපන්නා වූ තිරශ්චීනගතයාහට ද ධර්මාභිසමය නො වන්නේ ය. මනා කොට පිළිපන්නා වූ ප්‍රෙතවිෂයෙහි උපන්නාහට ද නියත මිථ්‍යාදෘෂ්ටිකයාහට ද, කුහකයාහට ද, මාතෘඝාතකයාහට ද, පිතෘඝාතකයාහට ද, අරහන්තඝාතකයාහට ද, සංඝභෙදකයාහට ද, ලොහිතුප්පාදකයාහට ද, ථෙය්‍යසංවාසකයාහට ද, බුදුසසුන් හැර තීර්ථකසමයට ගියාහට ද, භික්ෂුණීදූෂකයාහට ද, තෙළෙස් සංඝාදිසෙසාපත්තින් අතුරෙන් එක්තරා ආපත්තියකට පැමිණ දෙශනා ක්‍රමයෙන් පිරිසිදු ව නො නැංගාහට ද, පණ්ඩකයාහට ද, උභතොබ්‍යංජනකයාහට ද, යන මෙතෙක් දෙනාහට ධර්මාභිසමය නො වන්නේ ය. **(389)** අඩු වූ සත්හැවිරිදි ඇත්තා වූ යම් මනුෂ්‍යලදරුවෙක් ඇද්ද, මනා ව පිළිපන්නා වූ ඕහටත් ධර්මාභිසමය නො වන්නේ ය. ''මහරජානෙනි, මනා කොට පිළිපන්නා වූ මේ සොළොස් වැදෑරුම් වූ පුද්ගලයන්ට ධර්මාභිසමය නො වන්නේ ය'' යි වදාළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පසළොස් වැදෑරුම් වූ යම් පුද්ගල කෙනෙක් ඇද්ද, ඒ පුද්ගලයෝ ශීලයට විරුද්ධයෝ ම ය. ඔවුන්ට ධර්මාභිසමය වේවා හෝ නො වේවා හෝ එපවත් එසේ ම ය. කිමෙක් ද, කවර කාරණයකින් මනා කොට පිළිපදින්නා වූ ඌනුසත්හවුරුදු ඇත්තා වූ මනුෂ්‍යලදරුවාහට ධර්මාභිසමය නො වේ ද? මෙහි ම මාගේ ප්‍රශ්නයෙක් වන්නේ ය. ස්වාමීනි, ළදරුවාහට රාගයෙක් නො වන්නේ ය. ද්වෙෂයකුදු නො වන්නේ ය, මොහයකුදු නො වන්නේ ය, මානයකුදු නො වන්නේ ය, මිථ්‍යාදෘෂ්ටියකුදු නො වන්නේ ය, අරතියකුදු නො වන්නේ ය, කාමවිතර්කයකුදු නො වන්නේ ය, ක්ලෙශයන් හා ද අමිශ්‍ර වූයේ ය, ඒ ළදරුතෙම නම් නිර්වාණසම්පත් ලැබීමට යුක්ත වූයේ ය, ප්‍රාප්ත වූයේ ය. චතුරාර්යසත්‍යධර්මයන් එකප්‍රතිවෙධයෙන් ම ප්‍රතිවෙධය කරන්නට සුදුසු

Non-Commercial Distribution

වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, මනා කොට පිළිපන්නා වූ උනු සත්හවුරුදු මනුෂ්‍යලදරුවාහට යම් කාරණයකින් ධර්මාභිසමය නො වන්නේ ය යි යන මෙහි තොපට මම කාරණයක් කියන්නෙමි. සකසා අසා සිතින් ධරා ගණුව. මහරජානෙනි, ඉදින් උනුසත්හවුරුදු ලදරුතෙම රජනීය වූ රූප ශබ්දදියෙහි ඇලෙන්නේ වී නම් දූෂණීයයෙහි දූෂිත වන්නේ වී නම්, මොහනීයයෙහි මුළා වන්නේ වී නම්, මදනීයයෙහි මත් වන්නේ වී නම්, සම්‍යක්දෘෂ්ටිය දන්නේ වී නම්, අභිරතිය හා අනභිරතිය දන්නේ වී නම්, කුශලාකුශලය සිතින් සිතන්නේ වී නම්, ඒ ලදරුවාහට ද ධර්මාභිසමය වන්නේ ය. එතෙකුදු වුවත් මහරජානෙනි, උනුසත්හවුරුදු ලදරුවාගේ චිත්තය අබල ය, දුර්වල ය, ශූන්‍ය ය, අල්ප ය, ස්වල්ප ය. මඳ ය, අප්‍රසිද්ධ ය, අසංඛත වූ නිර්වාණධාතුව ගරු වූවා ය, බර වූවා ය, විපුල වූවා ය, මහත් වූවා ය, මහරජානෙනි. උනුසත්හවුරුදු ලදරුතෙම ඒ පරිත්ත වූ මඳ වූ අපතළා වූ අප්‍රසිද්ධ වූ දුර්වල වූ චිත්තයෙන් ගරුක වූ භාරික වූ විපුල වූ මහත් වූ අසංඛත වූ නිර්වාණධාතුව ප්‍රතිවෙධය කරන්නට නො හැකි වන්නේ ය. මහරජානෙනි, යම් සේ මහමෙරු පර්වතරාජ තෙම ගරුක වූයේ ය, භාරික වූයේ ය, විපුල වූයේ ය, මහත් වූයේ ය. කිමෙක් ද, මහරජානෙනි, පුරුෂයකු තමාගේ ප්‍රකෘති වූ ථාමබලවීර්ය-යෙන් ඒ මහාමෙරුපර්වතරාජයා උගුළු වන්නට හැකි වේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, එසේ නො හැක්කැ'' යී කීහ. ''මහරජානෙනි ඒ කවර කාරණයකින් ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, පුරුෂයාගේ දුර්වල බැවින් හා මහාමෙරු පර්වතයාගේ ඉතා මහත් බැවිනැ'' යි කීහ. ''මහරජා-නෙනි, එපරිද්දෙන් ම උනුසත්හවුරුදු වූ ලදරුවාගේ චිත්තය අබල වූයේ ය, ස්වල්ප වූයේ ය, අල්ප වූයේ ය, මඳ වූයේ ය, අවිභූත වූයේ ය. අසංඛත වූ අමෘතමහානිර්වාණධාතුව ගරුක වූයේ ය, භාරික වූයේ ය. විපුල වූයේ ය, මහත් වූයේ ය. උනුසත්හවුරුදු වූ මනුෂ්‍යලදරුතෙම ඒ අබල වූ දුර්වල වූ ස්වල්ප වූ මඳ වූ අවිභූත වූ චිත්තයෙන් **(390)** ගරුක වූ භාරික වූ විපුල වූ මහත් වූ අසංඛත වූ නිර්වාණධාතුව ප්‍රතිවෙධය කරන්නට නො හැකි වන්නේ ය. යහපත් කොට පිළිපන්නා වූ ද, උනුසත්හවුරුදු වූ මනුෂ්‍යලදරුවාහට මේ කාරණයෙන් ධර්මාභිසමය නො වන්නේ ය. තවද, මහරජානෙනි, යම් සේ මහාපෘථිවිතොම බොහෝ දීර්ඝ වූවා ය. ආයත වූවා ය, පෘථුල වූවා ය, විස්තාර වූවා ය, විසාල වූවා ය, විස්තීර්ණ වූවා ය, විපුල වූවා ය, ඉතා මහත් වූවා ය. කිමෙක් ද, මහරජානෙනි, ඒ මහාපෘථිවිය ස්වල්ප වූ ජලබින්දුවකින් තෙමා උදකචික්ඛල්ලය කරන්ට හැකි වේ ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, එසේ ඒ ජලබින්දුවකින් පෘථිවිය ගෝරුමඩ කරන්නට නො හැක්කැ'' යි කීහ. ''මහරජානෙනි, ඒ කවර කාරණයකින් ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, ජලබින්දුවගේ ඉතා කුඩා බැවින් හා මහාපෘථිවියගේ ඉතා මහත් බැවිනැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම උනුසත්හවුරුදු ඇත්තහුගේ චිත්තය අබල ය, දුර්වල ය, පරිත්ත ය, අප්ප ය, ථොක ය, මන්ද ය, අවිභූත ය.

Non-Commercial Distribution

අසංඛත වූ අමෘතමහානිර්වාණධාතුව දීර්ඝ ය, ආයත ය, පෘථුල ය, විත්ථත ය, විසාල ය, විස්තීර්ණ ය, විපුල ය, මහත් වූයේ ය. උනුසත් හවුරුදු ලදරුතෙම ඒ ස්වල්ප වූ මඳ වූ අවිභූත වූ දුර්වල වූ චිත්තයෙන් මහත් වූ අසංඛත වූ අමෘතමහානිර්වාණධාතුව ප්‍රතිවෙධය කරන්ට නො හැකි වන්නේ ය. ඒ කාරණයෙන් මනා කොට පිළිපන්නා වූ උනුසත් හවුරුදු මනුෂ්‍යලදරුහට ධර්මාභිසමය නො වන්නේ ය.

''තවද, මහරජානෙනි, යම් සේ අබල දුර්වල පරිත්ත අප්පථොක මන්දග්නියෙක් වන්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, එපමණ වූ මන්දග්නියෙන් දෙවියන් සහිත වූ සියලු ම ලොකයෙහි ඝනතරතිමිරාන්ධ කාරය විධමනය කොට ආලොක කරන්ට හැකි වේ දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, එසේ නො හැක්කැ'' යි කීහ. ''මහරජානෙනි, හේ කවර කාරණයකින් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, වහ්නිය ඉතා මඳ බැවින් හා ලොකයා ඉතා මහත් බැවිනැ'' යි කීහ. මහරජානෙනි, එපරිද්දෙන් ම උනුසත්හවුරුදු වූ ලදරුවාගේ සිත අබල වූයේ ය, දුර්වල වූයේ ය, ඉතා කුඩා වූයේ ය, අල්ප වූයේ ය, ස්වල්ප වූයේ ය, මඳ වූයේ ය, අප්‍රකට වූයේ ය, මහත් වූ අවිද්‍යාන්ධකාරයෙන් වැසෙන ලද්දේ ය. එහෙයින් ප්‍රඥාලොකය දක්වන්ට දුෂ්කර වන්නේ ය. ඒ කාරණයෙන් මනා කොට පිළිපන්නා වූ උනුසත්හවුරුදු ලදරුවාහට නිර්වාණාභිසමය නො වන්නේ ය. තවද, මහරජානෙනි, යම් සේ රොගාතුර වූ කෘශ වූ පමණින් යුත් කුඩා ශරීරය ඇත්තා වූ සාලක නම් කෘමිතෙම තමා හුන් තැනට පැමිණියා වූ නවරියන්දිග ඇත්තා වූ තුන්රියන් පළල් ආසනය ඇත්තා වූ බඳවට දසරියන් ඇත්තා වූ අටරියන් උස ඇත්තා වූ ත්‍රිමදගලිත වූ උපොසථ නාගෙන්ද්‍රයා දැක ගිලින්නට අදින්නේ වී නම්, කිමෙක් ද, මහරජානෙනි, ඒ සාලක නම් කෘමිතෙම ඒ හස්තිනාගෙන්ද්‍රයා ගිලින්ට හැකි වේ දැ?'' යි විචාළසේක. ''අහෝ! ස්වාමීනි, එසේ නො හැක්කැ'' යි කීහ. ''මහරජානෙනි, කවර කාරණයකින් දැ?'' යි විචාළසේක. ''ස්වාමීනි, සාලක ශරීරයාගේ කුඩා බැවින් හා හස්තිනාගෙන්ද්‍රයාගේ ඉතා මහත් බැවිනැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම උනුසත්හවුරුදු මනුෂ්‍යලදරුවාගේ සිත අබල ය, දුර්වල ය, ඉතා කුඩා ය, අල්ප ය, මඳ ය, අප්‍රකට ය. අසංඛත වූ අමෘතමහා **(391)** නිර්වාණධාතුව ඉතා මහත් වන්නේ ය. ඒ ලදරු තෙම අබල වූ දුර්වල වූ කුඩා වූ මඳ වූ අප්‍රකට වූ ඒ චිත්තයෙන් මහත් වූ අසංඛත වූ අමෘතමහානිර්වාණධාතුව ප්‍රතිවෙධය කරන්ට නො හැකි වන්නේ ය. ඒ කාරණයෙන් මනා කොට පිළිපන්නා වූ උනුහත්හවුරුදු මනුෂ්‍යකුමරුවාහට ධර්මාභිසමය නො වන්නේ ය'' යි වදළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නයත් එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

නිර්වාණාභව්‍යප්‍රශ්නය නිමි.

Non-Commercial Distribution

# නිර්වාණ සාත ප්‍රශ්නය

නැවතත් නෛකවාදිවාරණකෙශරින්ද්‍රභූත වූ මිලිඳු නම් මහරජානෝ පරමරමණීය වූ නිර්වාණසැපතෙහි ලා සියලු ම විනෙයජනහෘදයානන්දනය කරන්නා වූ ප්‍රඥගොචර වූ ප්‍රශ්නයක් අසනුවෝ ''කිමෙක් ද, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නිර්වාණය එකාන්ත සැප වී ද? නොහොත් දුකින් මිශ්‍ර ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, නිර්වාණය එකාන්ත සැප ම ය. දුකින් අමිශ්‍රිත ය'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නිර්වාණය එකාන්ත සැප ඇතැ යි කියා නුඹවහන්සේ විසින් වදළ ඒ වචනය අපි නො අදහා ගණුම්හ. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ නුඹ වහන්සේ වදළ මේ අර්ථයෙහි 'අපි නිර්වාණය දුකින් මිශ්‍රිත ය' යි කියා ගණුම්හ. නිර්වාණය දුකින් මිශ්‍රිත ය යි කියා අප කියන මේ අර්ථයෙහි කාරණයකුදු දක ලද්දමෝ ම ය. එහි කාරණය කවරේ ද? යත්— ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ නුඹ වහන්සේ යම් ඒ නිවන් කැමති කෙනෙක් නිර්වාණය සොයද් ද, ඔහුගේ ශරීරයාගේ ද, චිත්තයාගේ ද දුක්ඛතාපනය සොකතාපනය දක්නා ලැබෙයි. සිටීම් සක්මන් කිරීම් පල්ලංක ව හිඳීම් ආහාර ගැණීම් සයනය කිරීම් නිදිමත වැළකීම් දක්නා ලැබෙයි. චක්ෂු සොත ඝාණ ජිව්හා කාය මන යන ෂඩායතනයන්ගේ මිරිකීම් දක්නා ලැබෙයි. නොයෙක් ධනධාන්‍ය ප්‍රිය වූ නෑ මිත්‍රයන් හැරීම දක්නා ලැබෙයි. මේ ලොකයෙහි යම්කිසි කෙනෙක් සුඛිත වූ ද, සැපතින් වැඩුනාහු ද, ඒ සියල්ලෝ ම පඤ්චකාමගුණයෙන් චක්ෂුරාදී ෂඩායතනයන් රමණය කරවති. පිණවති, සන්තොෂ කරවති. මනාප මනාප වූ බොහෝ ශුභකාරණ වූ රූපය කරණ කොට ගෙණ ඇස රමණය කරවති. පිණවති, මනාප මනාප වූ බොහෝ ගීතවාද්‍ය ශුභ කාරණ වූ මධුර වූ ශබ්දය කරණ කොට ගෙණ ශ්‍රොත්‍රය රමණය කරවති, පිණවති. මනාප මනාප වූ බොහෝ පුෂ්පඵල පත්‍රත්වක් මුල් හර ශුභ කාරණ වූ සුගන්ධයෙන් නාසය රමණය කරවති, පිණවති. මනාප මනාප වූ බොහෝ ඛාද්‍ය භොජ්‍ය ලෙය්‍ය පෙය්‍ය සායනීය්‍ය ශුභකාරණ වූ රසයෙන් දිව රමණය කරවති, පිණවති. මනාප මනාප වූ සිනිඳු වූ සියුම් වූ මෘදු මොළොක් වූ බොහෝ ශුභකාරණ වූ ස්පර්ශයෙන් ශරීරය රමණය කරවති, පිනවති. මනාප මනාප වූ යහපත් නපුරු ශුභාශුභ වූ බොහෝ නින්දිත විතර්ක මනස්කාරයෙන් සිත රමණය කරවති, පිණවති. නුඹ වහන්සේත් මේත් චක්ඛු සොත ඝාණ ජිව්හා කාය මන යන ෂඩායතනයන්ගේ පිණවීම නසනසේක. සිඳ හරණසේක, උපච්ඡෙදය කරණසේක, වළක්නාසේක, උපරුන්ධනය කරණසේක. ඒ කාරණයෙන් (392) ශරීරයත් දුක සේ තැවෙන්නේ ය. සිතත් දුක සේ තැවන්නේ ය. ශරීරය දුක සේ තැවුනු කල්හි කායිකදුක්ඛවෙදනාව විඳිනු ලැබෙයි. සිත තැවුනු කල්හි චෛතසිකදුක්ඛවෙදනාව විඳිනු ලැබෙයි. මාගන්දිය සූත්‍රයෙහි ද මාගන්දිය නම් පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේට ගර්හා කෙරෙමින්

Non-Commercial Distribution

'භුනහු සමණො ගොතමො' යන පදයෙන් 'ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ අනභිවෘද්ධි කරණසේක,' යි මෙසේ කීයේ නො වේ ද? 'නිර්වාණය දුකින් මිශ්‍රය' යි කියා මම යම් කාරණයකින් කියන්නෙම් ද, මේ එහි කාරණය වන්නේ ය'' යි කීහ.

''මහරජානෙනි, නිර්වාණය දුකින් මිශ්‍ර නැත. නිර්වාණය ඒකාන්ත සැප ම ය. මහරජානෙනි, තෙපි වනාහි නිර්වාණසැපත දුකැ යි කියා යමක් කියවු ද? ඒ මේ නිර්වාණසැපත දුකක් නම් නැත්තේ ය. නිර්වාණයාගේ වනාහි සිද්ධ කිරීම පිණිස මේ පූර්වභාග ප්‍රතිපදව නම් වන්නේ ය. නිර්වාණය සෙවීම නම් වන්නේ ය. මහරජානෙනි, නිර්වාණය ඒකාන්තයෙන් ම සැප ඇත්තේ ම ය. දුකින් අමිශ්‍ර ම ය. එහි මම කාරණයක් කියන්නෙමි. මහරජානෙනි, පෘථිවීශ්වර වූ රජුන්ගේ රාජ්‍යසැපත නම් වූ දෙයක් ඇද්ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, රජ දරුවන්ගේ රාජ්‍යසැපත නම් දෙයෙක් ඇතැ' යි කීහ. ''කිමෙක් ද, මහ–රජානෙනි, ඒ රජසැපත දුකින් මිශ්‍ර ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, ඒ රජදරුවෝ ප්‍රත්‍යන්තරටවල් කුපිත වූ කල්හි ඒ ප්‍රත්‍යන්ත නිශ්‍රිත වූ සතුරන් සාදනු පිණිස පිරිස් නායක මහාමාත්‍යයන් හා යොධයන් හා බලප්‍රධානිකයන් හා නොයෙක් සෙනග පිරිවරා ගෙණ වාඩිවාසයට ගොස් මැසි මදුරු සීත සුළං වැසි අවු ආදියෙන් පීඩිත ව කුමක් පිණිස සම විෂමස්ථානයෙහි දිව පනින්නාහු ද, මහත් වූ යුද්ධ කරන්නාහු ද, ජීවිතය නො ලැබෙයි කියා කාංක්ෂාවටත් පැමිණෙන්නාහු '' යි විචාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ යුද්ධක්‍රියාව රජසැපතක් නො වන්නේ ය. රජසැපත සෙවීම පිණිස මේ පූර්වභාගක්‍රියාවෙක. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, රජදරුවෝ දුකින් ම රාජ්‍යය සොයා පසු ව රජසැපත අනුභව කෙරෙති. නාගසෙනයන් වහන්ස, මේ ප්‍රකාරයෙන් රාජසැපත දුකින් අමිශ්‍ර ම ය. ඒ රාජ්‍යසැපත අනිකෙක. දුක්ඛය අනිකෙකැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අමෘතමහානිර්වාණය ද, ඒකාන්ත වූ සැප ඇත්තේ ය. දුකින් මිශ්‍ර ද නැත්තේ ය. යම්කිසි කෙනෙක් ඒ නිර්වාණය සොයත් නම්, ඒ ශ්‍රද්ධාවත් උත්තමයෝ ශරීරයත් චිත්තයත් දෙක කෙලෙසුන් තවන වීර්යයෙන් තවා ධ්‍යානචංක්‍රමණය නිෂද්‍යා සයනාහාර පමණින් යුක්ත කොට ගන්වා නිදිවර්ජිත කොට චක්ෂුරාදි ෂඩින්ද්‍රියයන් පීළනය කොට කායජීවිතදෙක පරිත්‍යාග කොට දුක සේ නිර්වාණය සොයා නසන ලද පසමිතුරන් ඇති ව රජසැප අනුභව කරණ රජදරුවන් මෙන් ඒකාන්ත සැප වූ නිර්වාණසම්පත්තිය අනුභව කෙරෙති. මහරජානෙනි, මෙසේ නිර්වාණය ඒකාන්ත සැප ඇත්තේ ය, දුකින් මිශ්‍ර නැත්තේ ය. නිර්වාණය අනිකෙක, දුක් අනිකෙකි.

**(393)** ''මහරජානෙනි, අනිකුදු ඉතිරි කාරණයක් ඇසුව මැනව, නිර්වාණය ඒකාන්ත සැප ඇත්තේ ය, දුකින් මිශ්‍ර නැත්තේ ය. දුක

අනිකෙක, නිර්වාණය අනිකෙක. මහරජානෙනි, ශිල්පවත් ආචාර්ය වරයන්ගේ ශිල්ප සැපයෙක් නම් ඇද් ද?'' යි විචාළසේක. ''එසේ ය. ස්වාමීනි, ශිල්පවත් වූ ආචාර්යවරයන්ගේ ශිල්ප සැපයෙක් ඇතැ'' යි කීහ. ''කිමෙක් ද, මහරජානෙනි, ඒ ශිල්පසැපත දුකින් මිශ්‍ර ද?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, ඒ අන්තෙවාසිකයෝ කුමක් පිණිස ආචාර්යවරයන්ට අභිවාදන ප්‍රත්‍යුත්ථාන යෙන් හා පානීයාහරණ ගෘහසම්මාර්ජන දැහැටි මුඛොදකානුප්‍රදානයෙන් හා ඉඳුල් ප්‍රතිග්‍රහණ වෙර ඉළීම් නැහැවීම් පාදපරිකර්මයෙන් තමාගේ සිත හැරපියා අනුන්ගේ සිත සේ පවතිමින් දුක්ඛිත ව සයනය කිරීමෙන් අවෙලාවෙහි විෂම භොජනය අනුභව කිරීමෙන් ශරීරය තවාලන්නාහු ද?'' යි විචාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඒ මේ ශරීර තාපනය ශිල්පසැපතෙක් නම් නො වන්නේ ය.[1] ශිල්පය සෙවීමෙහි මේ පූර්වභාග ක්‍රියාවෙක. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අන්තෙ-වාසිකයෝ දුක සේ ආචාර්යශිල්පය සොයා ගෙණ පසු ව සිල්පසැපත අනුභව කරන්නාහු ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ ප්‍රකාර යෙන් ශිල්පසැපත දුකින් අමිශ්‍ර ම ය. ඒ ශිල්පසැප අනිකෙක. ඒ පැවති දුක්ඛය අනිකෙකැ'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය එකාන්ත සැප ඇත්තේ ය, දුකින් මිශ්‍ර නැත්තේ ය. යම් කෙනෙක් ඒ නිර්වාණය සොයන්නාහු නම්, ඒ සත්වයෝ ශරීරයත් සිතත් දෙක තවා සිටීමෙන් සක්මන් කිරීමෙන් හිඳීමෙන් ආහාර ගැණීමෙන් පමණින් යුක්ත කොට ගෙණ නිදිවර්ජිත කොට චක්ෂුරාදි ෂඩායතනය පීළනය කොට නිවන් පිණිස කායජීවිතය පරිත්‍යාග කොට දුක සේ නිර්වාණය සොයා එකාන්තසැප වූ නිර්වාණය ශිල්පසැපත අනුභව කරණ ගුරුන් සෙයින් අනුභව කරන්නාහු ය. මහරජානෙනි, මෙසේ නිර්වාණය එකාන්ත වූ සැප ඇත්තේ ය, දුකින් මිශ්‍ර නැත්තේ ය. නිවන් සොයන දුක අනිකෙක, නිවන් අනිකෙකැ'' යි වදාළසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේසේ මෙ ප්‍රශ්නය ද එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

නිර්වාණසාතප්‍රශ්නය නිමි.

---

## නිර්වාණ අරූප ප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹ වහන්සේ යමක් නිර්වාණය නිර්වාණය යි කියා එක්වන් ව කියනසේක. ඒ නිර්වාණයාගේ නීලපීතාදි රූපයෙක් හෝ සටහනක් හෝ වයසක්[2] හෝ හ්‍රස්වදීර්ඝාදි ප්‍රමාණයක් හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හේතුවකින් හෝ නයකින් හෝ මට දක්වා පියන්නට හැකි වනසේක් ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි,

1. නො වන්නාහ 2. වාසයක්

නිර්වාණය අසදෘශ ය, නිර්වාණයාගේ නීලපීතාදී රූපයක් හෝ සට ගනක් හෝ වයසක් හෝ ප්‍රමාණයක් හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හෙතුවකින් හෝ ක්‍රමයකින් හෝ දක්වාපියන්නට නො හැකි වන්නේ ය''යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ වදළ වචනය **(394)** මම සැබවැ යි කියා නො පිළිගන්නෙමි. නිර්වාණධර්මයාගේ රූපයක් හෝ සටහනක් හෝ වයසක් හෝ ප්‍රමාණයක් හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හෙතුවකින් හෝ ක්‍රමයකින් හෝ පැණවීමෙක් ඇත්තේ ම ය. ඒ බව කාරණයකින් මට අහවා වදළ මැනැවැ'' යි කීහ.

''මැනැව, මහරජානෙනි, කාරණයකින් තොපට අවබොධ කරවන් නෙමි. මහරජානෙනි, මහාසමුද්‍රය තෙමේ ඇත්තේ දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, මේ මහාසමුද්‍රය ඇත්තේ ම ය'' යි කීහ. ''ඉදින්, මහරජානෙනි, කිසිවෙක් තොප අතින් 'මහරජානෙනි, මහාසමුද්‍ර යෙහි ජලය කළ නාළිකාදියෙන් කොපමණෙක් ඇත්තේ ද? මහාසමුද්‍ර යෙහි වසන්නා වූ යම් සත්ව කෙනෙක් ඇද්ද, ඒ සත්වයෝ ගණනින් කොපමණෙක් දැ?'' යි කියා මෙසේ විචාළේ වී නම්, මහරජානෙනි, මෙසේ විචාරණ ලද්ද වූ තෙපි ඕහට කොපමණ ඇතැ යි කියා කියන් නාහු දැ?'' යි විචාළසේක. ''ඉදින් ස්වාමීන් වහන්ස, කිසිවෙක් මා අතින් 'මහරජානෙනි, මහාසමුද්‍රයෙහි ජලය කෙතෙක් ද? මහාසමුද්‍රයෙහි වසන්නා වූ යම් ඒ සත්වයෝ කෙතෙක් දැ?' යි කියා මෙසේ විචාළේ වී නම්, ස්වාමීන් වහන්ස, මම ඕහට මෙසේ කියන්නෙමි. 'එම්බල, පුරුෂය, තෝ මා අතින් නො විචාළ යුතු දෙයක් අසන්නෙහි ය. මේ නාගේ විචාරීම කිසිකෙනෙකුත් ඇසිය යුතු දෙයක් නො වන්නේ ය. මේ නා විචාළ ප්‍රශ්නයතෙම නො කියා තැබිය යුතු වන්නේ ය. පූර්වයෙහි ලොකය විභාග කොට කියන්නවුන් විසින් උදක සත්ව වශයෙන් මහා–සමුද්‍රය බෙද නො කියන ලද්දේ ය. එසේ හෙයින් මහාසමුද්‍රයෙහි ජලස්-කන්ධය මැන පමණ කරන්නට නො හැක්කේ ය. එහි වාසයට පැමිණියා වූ යම් ඒ සත්වකෙනෙක් ඇද්ද, ඒ සත්වයෝ ද සංඛ්‍යා කොට කිය නො හැක්කේ ම ය' යි කියා, ස්වාමීන් වහන්ස, මෙසේ මම ඕහට ප්‍රතිවචන දෙන්නෙමි'' යි කීහ. ''මහරජානෙනි, තෙපි කුමක් පිණිස වනාහි ඇති ස්වභාව වූ මහාසමුද්‍රයෙහි මෙසේ ප්‍රතිවචන දෙන්නහු ද? ගණන් බලා 'මහාසමුද්‍රයෙහි ජලය මෙපමණ ය, මහාසමුද්‍රයෙහි මෙපමණ සත්වයෝ වසන්නාහු ය' යි කියා ඒ විචාළ පුරුෂයාහට කිය යුතු නො වේ දැ?'' යි වදළසේක. ''ස්වාමීන් වහන්ස, එසේ කිය නො හැක්කේ ය. මේ ප්‍රශ්නය අවිෂය වන්නේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඇති ස්වභාව වූ මහාසමුද්‍රයෙහි ජලය මැනපියා ගණන් කරන්ට යම් සේ නො හැකි වේ ද, ඒ සමුද්‍රයහේ වාසයට පැමිණියා වූ යම් සත්වකෙනෙකුන් ගණන් කොට පිය නො හැකි වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ඇති ස්වභාව වූ නිර්වාණයාගේ රූපයක් හෝ සටහනක් හෝ වයසක්[1] හෝ ප්‍රමාණයක්

1. වාසයක්

Non-Commercial Distribution

හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හේතුවකින් හෝ ක්‍රමයකින් හෝ දක්වාපියන්නට නො හැක්කේ ම ය. මහරජානෙනි, චිත්තයාගේ වශිප්‍රාප්ත වූ සෘද්ධි ඇත්තා වූ මහානුභාවසම්පන්න වූ පුද්ගලතෙම මහා සමුද්‍රයෙහි ජලය ද එහි වසන්නා වූ සත්වයන් ද ගණන් කරන්නට සමර්ථ වන්නේ ය. ඒ් චිත්තයාගේ වශිප්‍රාප්ත වූ සෘද්ධිමත්තෙම නිර්වාණයාගේ රූපයක් හෝ සටහනක් හෝ වයසක් හෝ ප්‍රමාණයක් හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හෙතුවකින් හෝ ක්‍රමයකින් හෝ දක්වාපියන්නට නො හැකි වන්නේ ය.

**(395)** ''මහරජානෙනි, ස්වභාවයෙන් ම ඇත්තා වූ නිර්වාණයාගේ රූපයක් හෝ සටහනක් හෝ වයසක්[1] හෝ ප්‍රමාණයක් හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හේතුවකින් හෝ ක්‍රමයකින් හෝ දක්වා පියන්නට නො හැක්කේ වේ ද, ඊට ම අනිකුදු ඉතිරි කාරණයක් ඇසුව මැනැව. මහරජානෙනි, අරූපාවචරදෙවනිකායෙහි අරූපකායිකා නම් දෙවිකෙනෙක් ඇද් ද?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීන් වහන්ස, දෙවියන් කෙරෙහි අරූපකායිකා නම් දෙවිකෙනෙක් ඇතැ යි කියා අසන ලද්දේ ය'' යි කීහ. ''මහරජානෙනි, ඒ අරූපකායිකා නම් දෙවියන්ගේ රූපයක් හෝ සටහනක් හෝ විනාශයක් හෝ ප්‍රමාණයක් හෝ උපමා- වකින් හෝ කාරණයකින් හෝ හේතුවකින් හෝ ක්‍රමයකින් හෝ දක්වා පියන්නට හැකි වේදැ?'' යි විචාළසේක. ''ස්වාමීන් වහන්ස, එසේ නො හැක්කෙමි'' යි කීහ. ''මහරජානෙනි, එසේ වී නම්, අරූපකායිකා නම් දෙවියෝ නැද් ද?'' යි විචාළසේක. ''ඇත, ස්වාමීන් වහන්ස, අරූප කායිකා නම් දෙවියෝ ඒ අරූපීන්ගේ රූපයක් හෝ සටහනක් හෝ විනාශයක් හෝ ප්‍රමාණයක් හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හේතුවකින් හෝ ක්‍රමයකින් හෝ දක්වාපියන්නට නො හැක්කේ ය'' යි කීහ. ''මහරජානෙනි, යම් සේ ඇත්තා වූ අරූපකායිකා නම් දෙවියන්ගේ රූපයක් හෝ සටහනක් හෝ වයසක් හෝ ප්‍රමාණයක් හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හේතුවකින් හෝ ක්‍රමයකින් හෝ දක්වාපියන්නට නො හැක්කේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ස්වභාවයෙන් ම ඇත්තා වූ නිර්වාණයාගේ රූපයක් හෝ සටහනක් හෝ වයසක් හෝ ප්‍රමාණයක් හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හෙතුවකින් හෝ ක්‍රමයකින් හෝ දක්වාපියන්නට නො හැක්කේ ය'' යි වදාළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නිර්වාණය ඒකාන්ත සැප ඇත්තේ ය' යි වදාළ කාරණය එසේ ම වේවා. ඒ නිර්වාණයාගේ රූපයක් හෝ සටහනක් හෝ වයසක් හෝ ප්‍රමාණයක් හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හෙතුවකින් හෝ ක්‍රමයකින් හෝ දක්වාපියන්නට නො හැක්කේ ම ය. ස්වාමීනි, නිර්වාණයාගේ අන්‍යකෙනෙකුන් විසින් නො දක්නා ලද්ද වූ උපමා දර්ශනමාත්‍ර වූ කිසි ගුණයක් ඇද් ද?'' යි

1. වාසයක්

Non-Commercial Distribution

විචාළෝ ය. ''මහරජානෙනි, ස්වරූප වශයෙන් රූපයෙක් නැත්තේ ය. ගුණ වශයෙන් වනාහි කිසි උපමාදර්ශනමාත්‍රයක් දක්වාපියන්නට හැකි වන්නේ ය'' යි වදළසේක. ''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මම යම් පරිද්දෙකින් නිර්වාණයාගේ ගුණ වශයෙන් දක්වන්නා වූ එක දෙශමාත්‍රයක් වත් ලබන්නෙම් ද, එබඳු ප්‍රකාරයකින් මට අතිකඩිනමින් වදළ මැනැව. මාගේ හෘදයපරිලාහය විගස සීතලමධුරවචන මාරුත යෙන් නිර්වාපණය කර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, පද්මයාගේ එක්ගුණයෙක් නිර්වාණයට ප්‍රවිෂ්ට වි ය. උදකයාගේ දෙගුණයෙක් නිර්වාණයට ප්‍රවිෂ්ට වි ය. අගදයාගේ ත්‍රිවිධ ගුණයෙක. මහාසමුද්‍රයාගේ සතර ගුණයෙක, භොජනයාගේ පඤ්ච ගුණයෙක, ආකාසයාගේ දශ ගුණයෙක, මාණික්‍යරත්නයාගේ තුන් ගුණයෙක, රත්තචන්දනයාගේ තුන් ගුණයෙක, සප්පිමණ්ඩයාගේ තුන් ගුණයෙක, පර්වත **(396)** ශිඛරයාගේ පඤ්ච ගුණයෙක යන මෙතක් ගුණ කෙනෙක් නිර්වාණයට ප්‍රවිෂ්ට වූහ.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'පද්මයාගේ එක් ගුණයෙක් නිර්වාණයට ප්‍රවිෂ්ට වී යැ' යි කියා යම් වචනයක් වදළසේක් ද, පද්මයාගේ නිර්වාණයට ප්‍රවිෂ්ට වූ ඒ එක ගුණය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහ රජානෙනි, පද්මය යම් සේ උදකය හා අනුපලිප්ත වී ද, මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය රාගාදී සර්වක්ලෙශයන් හා අනුපලිප්ත වන්නේ ය. මහරජානෙනි, පද්මයාගේ මේ එක් ගුණය නිර්වාණයට අනුප්‍රවිෂ්ට වී ය'' යි කීසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, උදයකාගේ දෙගුණ කෙනෙක් නිර්වාණයට ප්‍රවිෂ්ට වූහ' යි කියා නුඹවහන්සේ යම් වචනයක් වදළසේක් ද, ඒ නිර්වාණයට ප්‍රවිෂ්ට වූ උදකයාගේ ගුණද්වයය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ ජලය සීතලගුණ ඇත්තේ වේ ද, ශරීරපරිදාහ නිර්වාපණය කෙරේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම අමෘත මහානිර්වාණය සීතලගුණය ඇත්තේ ය. සර්වක්ලෙශගිනිය ම නිවන්නේ ය. මහරජානෙනි, මේ උදකයාගේ පළමුවන ගුණය නිර්වාණයට ප්‍රවිෂ්ට වූයේ ය. තවද, මහරජානෙනි, ජලය ක්ලාන්ත තෂිත පිපාස ග්‍රීෂ්මාභිතප්ත වූ ජන චතුෂ්පදදී සත්වයන්ගේ පිපාසය දුරු කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය ද අෂ්ටොත්තරශතප්‍රභෙද වූ කාමතෘෂ්ණාව හා ලොකය ඇතැ යි කියා ශාශ්වතදෘෂ්ටි වශයෙන් ගන්නා භවතෘෂ්ණාව ද මරණින් මත්තෙහි නැතැ යි කියා උච්ඡෙදදෘෂ්ටි වශයෙන් ගන්නා විභවතෘෂ්ණාව ද යන මේ ත්‍රිවිධ පිපාසය දුරු කරන්නේ ය. මහරජානෙනි, උදකයාගේ මේ දෙවෙනි ගුණය නිර්වාණයට ප්‍රවිෂ්ට වි ය. මහරජානෙනි, උදකයාගේ මේ ගුණයෝ දෙදෙන නිර්වාණයට ප්‍රවිෂ්ට වූහ.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'භෛෂජ්‍යයාගේ තුන් ගුණ කෙනෙක් නිර්වාණයට ප්‍රවිෂ්ට වූහ' යි කියා නුඹ වහන්සේ යමක් වදළ සේක් ද, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ භෛෂජ්‍යයාගේ ඒ තුන්ගුණය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, භෛෂජ්‍යය යම් සේ විෂයෙන් පීඩිත වූ සත්වයන්ට පිළිසරණ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය ද රාගාදි ක්ලෙශ වශයෙන් පීඩිත වූ සකල සත්වයන්ට පිළිසරණ වන්නේ ය. මහරජානෙනි, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ භෛෂජ්‍යයාගේ මේ පළමුවන ගුණය වන්නේ ය. මහරජානෙනි, නැවත ද අනික් ගුණයෙක් ඇත. භෛෂජ්‍යය සියලු ම රොගයන්ගේ කෙළවර කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය සියලු ම සංසාරදුඃඛයන් කෙළවර කරන්නේ ය. මහරජානෙනි, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ ඖෂධයාගේ මේ දෙවෙනි ගුණය වන්නේ ය. තවද, මහරජානෙනි, ඖෂධයතෙම අමෘත ගුණය ඇත්තේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණයතෙම අජරාමෘතගුණයෙන් යුක්ත ය. මහරජානෙනි, ඖෂධයාගේ මේ තුන්වැනි ගුණය වන්නේ ය. තවද, මහරජානෙනි, ඖෂධයාගේ මේ ගුණයෝ තුන්දෙන නිර්වාණයට ප්‍රවිෂ්ට වූහ.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මහාසමුද්‍රයාගේ සතර ගුණයක් නිර්වාණයට ප්‍රවිෂ්ට වී ය' යි කියා නුඹ වහන්සේ යමක් වදළසේක් ද, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ මහාසමුද්‍රයාගේ ඒ සතරගුණය කවරේ ද?'' යි විචාළෝ ය. **(397)** ''මහරජානෙනි, යම් සේ මහාසමුද්‍රයතෙම සියලු කුණපයෙන් ශුන්‍ය වූයේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය තෙම සර්වක්ලෙශකුණපයෙන් ශුන්‍ය වූයේය. මහරජානෙනි, මහා සමුද්‍රයාගේ නිර්වාණයට ප්‍රවිෂ්ට වූ මේ පළමුවන ගුණය වන්නේ ය. තවද, මහරජානෙනි, මහත් වූ සමුද්‍රයතෙම බැස ගොඩ දකින එතෙර මෙතෙර නැත්තේ ය. සියලු ම ගංගාවලින් නො පිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම අනොරපාර ඇති මහත් වූ නිර්වාණයතෙම අනන්ත අසංඛ්‍ය වූ සියලු සත්වයන්ගෙන් නො පිරෙන්නේ ය. මහරජානෙනි, මහාසමුද්‍ර-යාගේ නිර්වාණයට ප්‍රවිෂ්ට වූ මේ දෙවෙනි ගුණය නම් වන්නේ ය. මහ-රජානෙනි, නැවත ද අනික් ගුණයෙක් ඇත. මහාසමුද්‍රයතෙම මහා මත්ස්‍ය තිමිතිමිංගල තිමිරපිංගලාදි මහාසත්වයන්ට ආවාසය වූයේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණයතෙම **ශාරිපුත්‍රාන්නද මහාකාශ්‍යපාදී** නිර්මලවිමලක්ෂීණාශ්‍රවබලප්‍රාප්ත වශීභූත මාහභූත වූ රහතන් වහන්සේ සේලාට ආවාස වූයේ ය. මහරජානෙනි, මහාසමුද්‍රයාගේ නිර්වාණයට ප්‍රවිෂ්ට වූ මේ තුන්වැනි ගුණය නම් වන්නේ ය. තවද, මහරජානෙනි, මහාසමුද්‍රයතෙම අපරිමිත විවිධ විපුලරළපුෂ්පකුසුමයෙන් ගැවසී ගත්තේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණයතෙම අපරිමිත විවිධවිපුල පරිශුද්ධවිද්‍යාවිමුක්තිපුෂ්පයෙන් පිපී ගියේ ය. කුසුමිත වී ය. මහරජානෙනි, මහාසමුද්‍රයාගේ නිර්වාණයට ප්‍රවිෂ්ට වූ මේ සතරවැනි

*Non-Commercial Distribution*

ගුණය නම් වන්නේ ය. මහරජානෙනි, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ මහා සමුද්‍රයාගේ මේ සතරගුණය නම් වන්නේ ය.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'භොජනයාගේ පඤ්චගුණයක් නිර්වාණයට ප්‍රවිෂ්ට වූයේ යැ' යි කියා නුඹ වහන්සේ යමක් වදළසේක් ද, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ භොජනයාගේ ඒ පඤ්චගුණය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ භොජනය සියලු සත්වයන්ගේ ආයුෂය දරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණයතෙම සාක්ෂාත් කළවුන්ගේ ජරා මරණ නැසීම් වසයෙන් ආයුෂය දරන්නේ ය. මහරජානෙනි, භොජනයාගේ නිර්වාණයට ප්‍රවිෂ්ට වූ මේ ප්‍රථමගුණය වන්නේ ය, තවද. මහරජානෙනි, භොජනය නම් සියලු සත්වයන්ගේ බල වඩන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණයතෙම සාක්ෂාත් කළාවූ සියලු සත්වයන්ගේ අනෙකවිධ ඍද්ධිබල වඩන්නේ ය. මහරජානෙනි, භොජනයාගේ නිර්වාණයට ප්‍රවිෂ්ට වූ මේ දෙවෙනි ගුණය නම් වන්නේ ය. තවද, මහරජානෙනි, භොජනය සියලු සත්වයන්ගේ ශරීරවර්ණය උපදවන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය සාක්ෂාත් කළා වූ සියලු සත්වයන්ගේ ගුණවර්ණනාව උපදවන්නේ ය. මහරජානෙනි, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ භොජනයාගේ මේ තුන්වන ගුණය නම් වන්නේ ය. තවද, මහරජානෙනි, භොජනය සියලු සත්වයන්ගේ දරථය ව්‍යපශමනය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණයතෙම සාක්ෂාත් කළා වූ සියලු සත්වයන්ගේ සර්වක්ලෙශ දරථය ව්‍යපශමනය කරන්නේ ය. මහරජානෙනි, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ භොජනයාගේ මේ සතරවන ගුණය වන්නේ ය. තවද, මහරජානෙනි, භොජනය සියලු සත්වයන්ගේ ක්ෂුධාවෙන් වන දුර්වලබව දුරු කරන්නේ ය. **(398)** මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණයතෙම සාක්ෂාත් කළා වූ සියලු සත්වයන්ගේ සර්වදුඃඛ ක්ෂුධාවෙන් වන දුර්වලබව දුරු කරන්නේ ය. මහරජානෙනි, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ භොජනයාගේ මේ පස්වන ගුණය වන්නේ ය. මහරජානෙනි, භොජනයාගේ මේ පඤ්චවිධ ගුණයෝ නිර්වාණයට ප්‍රවිෂ්ට වූහ'' යි වදළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ආකාශයාගේ දශගුණ කෙනෙක් නිර්වාණයට ප්‍රවිෂ්ට වූහ' යි කියා නුඹ වහන්සේ යමක් වදළසේක් ද, ඒ ආකාශයාගේ නිර්වාණය අනු ව ගියා වූ දශගුණයෝ කවරහු ද?'' යි විචාළෝ ය.

**''යථා මහාරාජ ආකාසො න ජායති, න ජීයති, න මීයති, න චවති, න උප්පජ්ජති, දුප්පසහො, අචොරහරණො අනිස්සිතො, විහඞ්ගමගමනො, නිරාවරණො, අනන්තො, එව මෙව ඛො මහාරාජ නිබ්බාණං න ජායති, න ජීයති, න මීයති, න චවති, න උප්පජ්ජති, දුප්පසහං, අචොරහරණං, අනිස්සිතං, අරියගමනං නිරාවරණං, අනන්තං. ඉමෙ ඛො, මහාරාජ ආකාසස්ස දසගුණා නිබ්බාණං අනුපවිට්ඨා''ති''**



*Non-Commercial Distribution*

''මහරජානෙනි, යම් සේ ආකාශය නො උපදින්නේ ය, නො ජීවත් වන්නේ ය, නො මියන්නේ ය, චුත නො වන්නේ ය, මතු නො උපදින්නේ ය. මැඩලිය නො හැක්කේ ය, සොරුන් ගත නො හැක්කේ ය. කිසි ආශ්‍රයක් නැත්තේ ය, විහග හැසිරීම් ඇත්තේ ය, කිසි ආවරණයක් නැත්තේ ය. අනන්ත වූයේ ය, එපරිද්දෙන් ම මහරජානෙනි, නිර්වාණය තෙම නො උපදින්නේ ය, නො ජීවත් වන්නේ ය, නො මියන්නේ ය, චුත නො වන්නේ ය, මතු නො උපදින්නේ ය, මැඩ ගත නො හැක්කේ ය. සොරුන් ගත නො හැක්කේ ය, කිසි ආශ්‍රයක් නැත්තේ ය, තුන් බුදු ආර්යගමන යා කිසි ආවරණයක් නැත්තේ ය, අනන්ත වූයේ ය. මහරජානෙනි, මොහු වනාහි නිර්වාණය අනු ව ගියා වූ ආකාශයාගේ දශ ගුණයෝ'' යි.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'චින්තාමාණික්‍යරත්නයාගේ තුන්ගුණයක් නිර්වාණය හා අනු ව ගියේ ය'' යි කියා නුඹ වහන්සේ යමක් කීසේක් ද, මාණික්‍යරත්නයාගේ නිර්වාණයට අනු ව ගියා වූ ඒ තුන් ගුණය කවරේ ද?'' යි විචාළෝ ය. මහරජානෙනි, යම් සේ මාණික්‍ය රත්නය කැමැති දෙයක් දෙන්නේ ය, මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය කැමැති දෙය දෙන්නේ ය. මහරජානෙනි, මාණික්‍ය රත්නයාගේ නිර්වාණයට අනු ව ගියා වූ මේ පළමු ගුණය නම් වන්නේ ය. තවද, මහරජානෙනි, මාණික්‍යරත්නය ප්‍රීති ජනනය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය ද ප්‍රීතිජනනය කරන්නේ ය. මහරජානෙනි, මාණික්‍යරත්නයාගේ මේ දෙවෙනි ගුණය නිර්වාණයට ප්‍රවිෂ්ට වූයේ ය. තවද මහරජානෙනි, මාණික්‍යරත්නයාගේ බැබළීමෙන් ප්‍රයොජන කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය ද බැබළීමෙන් ප්‍රයොජන කරන්නේ ය. ''මහරජානෙනි, මාණික්‍යරත්නයාගේ මේ තුන්වන ගුණය නිර්වාණයට ප්‍රවිෂ්ට වූයේ ය. මහරජානෙනි, මාණික්‍යරත්නයාගේ මේ ගුණයෝ තුන්දෙන නිර්වාණය හා අනුව ගියාහු ය'' යි කීසේක.

**(399)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'රත්තචන්දනයාගේ තුන් ගුණකෙනෙක් නිර්වාණය හා අනු ව ගියාහු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ නිර්වාණය හා අනු ව ගියා වූ රත්තචන්දනයාගේ තුන්ගුණය කවරේ ද?'' යි විචාළෝ ය. 'මහරජානෙනි, යම් සේ රත්තචන්දනය දුර්ලභ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය දුර්ලභ වන්නේ ය. මහරජානෙනි, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ ලොහිතචන්දනයාගේ මේ ප්‍රථම ගුණය නම් වන්නේ ය. තවද, මහරජානෙනි, ලොහිතචන්දනය අසදෘශ වූ සුගන්ධ ඇත්තේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය ද අසදෘශ වූ ගුණ සුගන්ධ ඇත්තේ ය. මහරජානෙනි, ලොහිතචන්දනයාගේ මේ දෙවෙනි ගුණය නිර්වාණයට අනු ව ගියේ ය. තවද, මහරජානෙනි, ලොහිතචන්දනය සජ්ජනයන් විසින් ප්‍රශස්ත වන්නේ ය. මහරජානෙනි,

Non-Commercial Distribution

එපරිද්දෙන් ම නිර්වාණය බුද්ධාදී ආර්යජනයන් විසින් ප්‍රශස්ත වන්නේ ය. මහරජානෙනි, මේ ලොහිතචන්දනයාගේ තුන්වන ගුණය නිර්වාණයට අනු ව ගියේ ය. මහරජානෙනි, මොහු වනාහි ලොහිතචන්දනයාගේ නිවණට අනු ව ගියා වූ තුන් ගුණයෝ ය.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ගිතෙල්මණ්ඩයාගේ තුන්ගුණ කෙනෙක් නිර්වාණය හා අනු ව ගියාහු ය'' යි කියා යමක් වදළසේක් ද, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ ඒ සප්පිමණ්ඩයාගේ තුන්ගුණයෝ කවරහු ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ ගිතෙල් මණ්ඩය වර්ණසම්පන්න වී ද, මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය ගුණවර්ණයෙන් සම්පන්න වූයේ ය. මහරජානෙනි, සප්පිමණ්ඩයාගේ මේ ප්‍රථමගුණය නිර්වාණයට අනු ව ගියේ ය. තවද, මහරජානෙනි, සප්පිමණ්ඩය සුගන්ධ ඇත්තේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය මුළු ලෝ පතළ සීලසුගන්ධය ඇත්තේ ය. මහරජානෙනි, සප්පිමණ්ඩයාගේ මේ දෙවෙනි ගුණය නිර්වාණයට අනු ව ගියේ ය. තවද, මහරජානෙනි, සප්පිමණ්ඩය මිහිරි රසය ඇත්තේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය ද අනන්තරස ඇත්තේ ය. මහරජානෙනි, ගිතෙල්මණ්ඩයාගේ මේ තුන්වන ගුණය නිර්වාණයට අනු ව ගියේ ය. මහරජානෙනි, මොහු වනාහි සප්පි මණ්ඩයාගේ නිර්වාණයට අනු ව ගියා වූ තුන්ගුණයෝ යි.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'පර්වතශිඛරයාගේ පඤ්ච ගුණ කෙනෙක් නිර්වාණයට ප්‍රවිෂ්ට වූහ' යි කියා යමක් වදළසේක් ද, නිර්වාණයට ප්‍රවිෂ්ට වූ පර්වතශිඛරයාගේ ඒ පස්ගුණයෝ කවරහු ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ මහාමෙරු පර්වතශිඛරය ඉතා උස් ව ගියේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය ද තුන්ලෝ ඉක්ම ඉතා උස් ව ගියේ ය. මහරජානෙනි, පර්වතශිඛරයාගේ මේ පළමු වන ගුණය නිර්වාණයට අනු ව ගියේ ය. තවද, මහරජානෙනි, පර්වත ශිඛරය අචල වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය අචල වන්නේ ය. මහරජානෙනි, පර්වතශිඛරයාගේ මේ දෙවෙනි ගුණය නිර්වාණයට අනුව ගියේ ය. තවද, මහරජානෙනි, පර්වතශිඛරයට නැගීම දුෂ්කර වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම සක්ලෙශයන්ට නිර්වාණයට නැඟීම දුෂ්කර වන්නේ ය. මහරජානෙනි, පර්වතශිඛරයාගේ මේ තුන්වන ගුණය නිර්වාණයට අනු ව ගියේ ය. **(400)** තවද, මහරජානෙනි, පර්වතශිඛරයතෙම සියලු බීජජාතීන්ගේ නො හට ගැනීම කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණය සර්වක්ලෙශයන්ගේ නො හට ගැනීම කරන්නේ ය. මහරජානෙනි, පර්වතශිඛරයාගේ මේ සතරවන ගුණය නිර්වාණය හා අනු ව ගියේ ය. තවද, මහරජානෙනි, පර්වතශිඛරයතෙම අනුනය ප්‍රතිඝයෙන් මිදුනේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණයතෙම දයා ක්‍රොධ දෙකින් මිදුනේ ය. මහරජානෙනි, පර්වතශිඛරයාගේ මේ පස්වන ගුණය තෙම නිර්වාණයට අනු

Non-Commercial Distribution

ප්‍රවිෂ්ට වූයේ ය. මහරජානෙනි, පර්වතශිඛරයාගේ මේ පඤ්චගුණයෝ නිර්වාණය හා අනු ව ගියාහු යි. මහරජානෙනි, අජරාමෘතවූ නිර්වාණ ධර්මයාගේ රූපවර්ණාදියක් නැති නියාව හා අනන්ත වූ ගුණයෙන් යුක්ත බව අප කී මේ එකුන්සාළිස් ගුණානුසාරයෙන් තොපගේ නුවණින් මනා කොට දැනගණුව'' යි වදාළසේක. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නය එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

නිර්වාණඅරූපප්‍රශ්නය නිමි.

---

## නිර්වාණ සාක්ෂාත්කරණ ප්‍රශ්නය

''අහෝ! ස්වාමීනි. නාගසෙනයන් වහන්ස, 'නිර්වාණය අතීත වූයේත් නො වෙයි, අනාගත වූයේත් නො වෙයි, වර්තමාන වූයේත් නො වෙයි, උපන්නේත් නො වෙයි, නූපන්නේත් නො වෙයි, ඉපදිය යුතුත් නො වෙයි කියා නුඹ වහන්සේ කියනසේක් නො වේ ද? ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ බුද්ධශාසනයෙහි යම් කිසි ශ්‍රද්ධාවන්තයෙක් තෙම මනා කොට පිළිපදිමින් තුබූ නිර්වාණයක් සිද්ධ කෙරේ ද, නොහොත් ඔහු ම උපදවා ගෙණ සිද්ධ කෙරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, මනා කොට පිළිපන්නා වූ යම් කිසිවෙක් නිර්වාණය සිද්ධ කෙරේ නම්, එතෙම ඉපිද තුබූ නිර්වාණයක් සිද්ධ කරන්නේත් නො වෙයි, නැති නිවණක් උපදවා ගෙණ සිද්ධ කරන්නේත් නො වෙයි. එතෙකුදු වුවත්, මහරජානෙනි, මනා ව පිළිපන්නා වූ ඒ පුරුෂතෙම යම් නිර්වාණයක් සිද්ධ කෙරේ ද, ඒ මේ නිර්වාණධාතුව ඇතැ'' යි වදාළසේක. ''අනේ! මාගේ ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මේ නිර්වාණප්‍රශ්නය ප්‍රතිච්ඡන්න කොට නො දක්වන්න, විවර කොට ප්‍රකට කොට දක්වා වදරන්න. බොහෝ සේ ආලය උපදවමින් උත්සාහ උපදවමින් නුඹ වහන්සේ විසින් ශාසනගත වූ තැන් පටන් උගන්නා ලද්ද වූ යම් අර්ථධර්මයක් ඇද්ද, ඒ සියලු ම උගත් දෙය මේ ප්‍රශ්නයෙහි ම බහාලුව මැනැව. මේ ප්‍රශ්නයෙහි මේ ලොකවාසී සත්වතෙම බොහෝ සේ ම මුළා වූයේ ය. විමති උපදවන ලද්දේ ය, කාංක්ෂාවට පැමිණියේ ය. මේ මාගේත් ඇතුළු සතන්හි උපන්නා වූ මේ කාංක්ෂාදෙෂශල්‍යය බිඳ හැර වදළ මැනැවැ'' යි කීහ. ''මහරජානෙනි, පරම ශාන්තසුව ප්‍රණීත වූ මේ නිර්වාණධාතුව ඇත්තේ ම ය. ඒ නිර්වාණය මනා කොට පිළිපදිමින් සර්වඥනුශාසන වූ පරිද්දෙන් සර්වසංස්කාරධර්මයන් සම්මර්ශනය කෙරෙමින් ප්‍රඥවෙන් සිද්ධ කරන්නේ ය. මහරජානෙනි, යම් සේ අන්තෙවාසිකතෙම ආචාර්යානුශාසනා වූ පරිද්දෙන් විද්‍යාව ප්‍රඥවෙන් සිද්ධ කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම මනා කොට පිළිපදිමින් සර්වඥශාසනා වූ පරිද්දෙන් ප්‍රඥවෙන් නිර්වාණය සිද්ධ කරන්නේ ය'' යි කීසේක.

(401) ''ස්වාමීන් වහන්ස, ඒ නිර්වාණය කෙසේ දත යුතු දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ඒ නිර්වාණය අනුපද්‍රවවශයෙන් නිරුපද්‍රව වශයෙන් අභයවශයෙන් ක්ෂෙමවශයෙන් ශාන්තවශයෙන් සුවවශයෙන් සැපවශයෙන් ප්‍රණීතවශයෙන් පවිත්‍රවශයෙන් සිහිල්වශයෙන් දත යුත්තේ ය. මහරජානෙනි, යම් සේ බොහෝ කාෂ්ට රාශියක් කරණ කොට ගෙණ හුණු ව ඇවිලෙන්නා වූ ගින්නෙන් දැවෙන්නා වූ පුරුෂයෙක් තෙම මහත් වූ ව්‍යායාමයකින් එයින් මිදී ගිනි නැති අවකාශස්ථානයකට ගොස් එහි පරමසැපතක් ලබන්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යමෙක් මනා ව පිළිපදිමින් එතෙම යොනිසොමනස්කාරයෙන් පහ කරණ ලද රාගද්වෙෂමොහසංඛ්‍යාත ත්‍රිවිධාග්නිසන්තපාය ඇති පරමසැප වූ නිර්වාණය සිද්ධ කරන්නේ ය. මහරජානෙනි, පුරුෂයා වැලඳ ගත් වහ්නිය යම් සේ ද, එසේ ම රාගාදි ත්‍රිවිධාග්නිය දත යුත්තේ ය. වහ්නියට පැමිණි පුරුෂයා යම් සේ ද එසේ ම මනා කොට පිළිපන්නා වූ යොගාවචර තෙම දත යුත්තේ ය. නිරග්ගික වූ අවකාශස්ථානය යම් සේ ද, එපරිද්-දෙන් නිර්වාණය දත යුත්තේ යි.

''නවද, මහරජානෙනි, යම් සේ නොයෙක් තැනින් සිල් ව කුණුගඳ වැහෙන්නා වූ ගරඬි නයිකුණප සුනඛකුණප මනුෂ්‍ය කුණප ශරීර වැලඳි කොට්ඨාස රාශිගත වූ කුණප අවුලෙන් ම වැලඳ සිටී ඒ මධ්‍යයට ප්‍රවිෂ්ට වූ පුරුෂයෙක් මහත් වූ ව්‍යායාමයකින් එයින් මිදී කිසි කුණපයක් නැති රම්‍ය වූ අවකාශස්ථානයකට ප්‍රවිෂ්ට ව පරමසුඛාස්වාදයක් ලබන්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යමෙක් මනා කොට පිළිපදිමින් එතෙම යොනිසොමනස්කාරයෙන් පහ කරණ ලද කෙලෙස්කුණපයන් ඇති පරම සුඛ ප්‍රණීත වූ නිර්වාණය සිද්ධ කරන්නේ ය. මහරජානෙනි, නොයෙක් කුණප යම් සේ ද, එසේ ම රූපශබ්දදී පඤ්චකාමගුණයෝ දත යුත්තාහු ය. ඒ නොයෙක් කුණපමධ්‍යයට පැමිණි පුරුෂයා යම් සේ ද, එපරිද්දෙන් මනා කොට පිළිපන්නා වූ යොගාවචරතෙම දත යුත්තේ ය. කිසි කුණපයක් නැති රම්‍ය වූ අවකාශස්ථානය යම් සේ ද, එපරිද්දෙන් ම අමෘතමහානිර්වාණය දත යුත්තේ යි.

''නවද, මහරජානෙනි, යම් සේ කඩු ගත් අත් ඇති ශත්‍රුසේනාවක් මධ්‍යගත වූ පුරුෂයෙක් භයින් භීත වූයේ තසිත වූයේ කම්පිත වූයේ විපරීත භ්‍රාන්ත වූ සිත් ඇත්තේ මහත් වූ ව්‍යායාමයකින් ඒ සතුරුසෙනාවගෙන් මිදී දෘඪස්ථිරඅචලඅභයස්ථානයකට වැද එහි පරම සුඛාස්වාදය ලබන්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යමෙක් මනා ව පිළිපදිමින් එතෙම යොනිසොමනස්කාරයෙන් පහ කරණ ලද භය සන්ත්‍රාසය ඇති පරම සුඛ ප්‍රණීත වූ නිර්වාණසම්පත්තිය සිද්ධ කරන්නේ ය. මහරජානෙනි, අමිත්‍ර භයස්ථානය යම් සේ ද, එපරිද්දෙන් ම ජාතිජරාව්‍යාධිමරණය නිසා නැවත නැවතත් පවත්නා භය දත යුත්තේ ය. භයින් භීත වූ පුරුෂයා

යම් සේ ද, එපරිද්දෙන් ම මනා කොට පිළිපන්නා වූ යොගාවචරතෙම දත යුත්තේ ය. නිර්භයස්ථානය යම් සේ ද, එමෙන් අමෘතමහානිර්වාණය දත යුත්තේ'' ය.

''තවද, මහරජානෙනි, යම් සේ ක්ලිෂ්ට මලින කලල කර්දම ප්‍රදෙශයක වැටුනා වූ පුරුෂයෙක් මහත් වූ ව්‍යායාමයකින් ඒ කලල් ගෝරු මඩ පහ කොට අත්‍යන්තපරිශුද්ධ නිර්මල ප්‍රදෙශයකට ගොස් එහි උතුම් වූ සැප ලබන්නේ වේ ද, **(402)** මහරජානෙනි, එපරිද්දෙන් ම යමෙක් මනා කොට පිළිපදිමින් එතෙම යොනිසොමනස්කාරයෙන් පහ ව ගිය ක්ලෙශ්මල කර්දම ඇති පරම සැප වූ නිර්වාණය සිද්ධ කරන්නේ ය. මහරජානෙනි, කලල් මඩ යම් සේ ද, එමෙන් ලාභ සත්කාර ස්තුති දත යුත්තේ ය. කලල් මඩට පැමිණි පුරුෂයා යම් සේ ද, එමෙන් සම්‍යක්ප්‍රතිපත්තියෙහි හැසිරෙණ යොගාවචරතෙම දත යුත්තේ ය. පිරිසිදු වූ නිර්මල තර ප්‍රදෙශය යම් සේ ද, එමෙන් අමෘතමහානිර්වාණය දත යුත්තේ ''යි.

''ස්වාමීන් වහන්ස, අමෘතමහානිර්වාණය යොගාවචරතෙම මනා කොට පිළිපදිමින් කුමක් කොට සිද්ධ කෙරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් ඒ යොගාවචරතෙම මනා කොට පිළිපදිමින් එතෙම සර්වසංස්කාරධර්මයන්ගේ පැවැත්ම සම්මර්ශනය කරන්නේ ය. ඒ ප්‍රවෘත්තිය සම්මර්ශනය කෙරෙමින් ඒ පැවැත්මෙහි ජාති ඉපදීම දක්නේ ය. ජරාව දක්නේ ය, ව්‍යාධිය දක්නේ ය, මරණය දක්නේ ය. ඒ ජාති ඉපදීමෙහි ආදියෙහිත් මධ්‍යයෙහිත් පරියොසානයෙහිත් මඳකුත් සැපතක් නො දක්නේ ය. ඒ යොගාවචරතෙම එහි නිත්‍ය සැපය යි කියා ගත යුතු වූ කිසිවක් නො දක්නේ ය. මහරජානෙනි, යම් සේ පුරුෂයෙක්තෙම දවසක් මුළුල්ලෙහි උෂ්ණයෙහි ලා රත් කළා වූ ගිනි ගෙණ දිලියෙන්නා වූ සජොතිභූත වූ අතිශයින් රත් වූ විශෙෂයෙන් හුණු වූ යගුළියෙහි ආදියෙහිත් මධ්‍යයෙහිත් පරියොසානයෙහිත් අල්වා ගත යුතු වූ මඳකුත් ප්‍රදෙශයක් නො දක්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යම් යොගාවචරයෙක්තෙම සර්වසංස්කාරප්‍රවෘත්තිධර්මයන්ගේ ප්‍රවෘත්තිය සම්මර්ශනය කරන්නේ ය. ඒ යොගාවචරතෙම ප්‍රවෘත්තිය සම්මර්ශනය කෙරෙමින් එහි සර්වභවයොනිගතිස්ථිතිසත්වාවාසභෙදගත වූ ඒ ඒ සකල සත්වයන්ගේ ඒ ඒ සත්වනිකායෙහි ඉපදීම හා රූපාදිපඤ්චස්කන්ධයන්ගේ පහළ වීම ද, චක්ෂුරාදි ෂඩායතනයන්ගේ ප්‍රතිලාභ ය යි කියන ලද ජාතිය දක්නේ ය. එසේ ම ඒ ඒ සත්වයන්ගේ ශරීර ජරාව ද ජීර්ණතාව ද දත් වැටීම හා හිස පැසීම ද ශරීර වැරළි වැටීම ද ආයුෂයාගේ නැසියාම ද ෂඩින්ද්‍රියයන්ගේ පැසී යාම ය යි කියන ලද මේ තාක් ජරාව දක්නේ ය. ඒ ඒ සත්වයන්ට වන මධුමෙහ භගන්දර කුෂ්ඨරොග අතීසාර විෂමජ්වර සන්නිපාතාදි ව්‍යාධිය ද දක්නේ ය. ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්වනිකායයෙන් සර්වඥතිමිත්‍ර සෑම ධන සැපත් හැර චුත වීමය, නැසෙන බව ය, ශරීරභෙදය ප්‍රාණඅන්තර්ධාන ය, මෘත්‍යු මරණ ය, කාලක්‍රියා ය,

පඤ්චස්කන්ධයන්ගේ භෙද ය, මෘතශරීරයාගේ වනයෙහි දැමීම ය යි කියන ලද මෙබඳු මරණ දක්නේ ය. මෙසේ දක ඒ ජාති ඉපදීමෙහි සැපය යි කියා මඳකුත් සැපතක් නො දක්නේ ය. ඒ ජාතියගේ ආදි මධ්‍ය පරියොසානයෙහි සාරග්‍රහණය කට යුතු මඳකුත් ප්‍රදේශයක් නො දක්නේ ය. සාරග්‍රහණයකට දෙයක් නො දක්නා වූ ඒ යොගාවචරයාගේ සිත්හි සසර කලකිරීම් වශයෙන් නිරාලය පිහිටන්නේ ය. ශරීරයෙහි ධහදිය සෙල වෙන්නේ ය. එහෙයින් කිසි රක්ෂාවක් නැත්තා වූ කිසි පිහිටක් නැත්තා වූ අසරණ වූ ඒ යොගාවචරතෙම භවත්‍රයයෙහි කලකිරෙන්නේ ය. මහරජානෙනි, යම් සේ පුරුෂයෙක්තෙම ගෘහයක දිලියෙන **(403)** ගිනිදැල් ඇති මහත් වූ වහ්නිස්කන්ධයක් ලහට ප්‍රවෙශ වන්නේ වී නම්, ඔහු එතැන්හි කිසි රක්ෂාවක් නැත්තේ කිසි පිහිටක් නැත්තේ අසරණ වූයේ ගිනිකඳ කෙරෙහි කලකිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ජාතියගේ සාරග්‍රහණ කට යුතු දෙයක් නො දක්නා වූ ඒ යොගාවචරයාගේ සිත්හි අරති උපදනේ ය. ශරීරයෙහි ඩා සෙලවෙන්නේ ය. ඒ අනාථ වූ අසරණීභූත වූ යොගාවචරතෙම ගිනි ගත් ගෙට වන් එකක්හු සේ භවත්‍රයෙහි කලකිරෙන්නේ ය. මෙසේ දැලෙහි බැඳුනු මත්ස්‍යයෙකු මෙන් ද සර්පමුඛයට පැමිණි මණ්ඩූකයකු මෙන් ද මැදිරියක ලූ වන පක්ෂියකු මෙන් ද ගරුඬමුඛයට පැමිණි නාගයකු මෙන් ද රාහුමුඛප්‍රාප්ත චන්ද්‍රයා මෙන් ද සර්වසංස්කාරධර්මයන් කෙරෙන් මිදෙනු කැමැති සසර කලකිරි සියලු ම ජාතිප්‍රවෘත්තියෙහි භය දක්නා සුලු වූ ඒ යොගාවචරයා හට මෙබඳු සිතෙක් උපදනේ ය. කෙබඳු සිතෙක් ද? යත්:— මේ ජාතියගේ පැවැත්ම රාගාදි ත්‍රිවිධාග්නියෙන් රත්වූයේ ය. රාගාද්‍යග්නියෙන් දීප්තිමත් වූයේ ය. ත්‍රිවිධාග්නියෙන් සම්ප්‍රජ්වලිත වූයේ ය. සාන්දෘෂ්ටික සාම්පරායික වූ බොහෝ දුක් ඇත්තේ ය. ක්ලෙශකර්දම යෙහි ආලය කිරීම් වශයෙන් බොහෝ වූ සිත්තැවිලි ඇත්තේ ය. ඉදින් කිසිවෙක් ඒ ජාතියගේ නො පැවැත්ම ලැබුයේ වී නම්, මේ ශාන්තබවට ගියේ ය. මේ ප්‍රණීතබවට ගියේ ය. ඒ කවර? යත්— සර්වසංස්කාර ධර්මයන්ගේ සන්හිඳවීම ය. සර්වක්ලෙශයන් දුරු කිරීම ය, ත්‍රිවිධතෘෂ්ණාව ක්ෂයකිරීම ය, රාගය හැරීම ය, නිරොධ ය, තෘෂ්ණාව හැරීම ය. මෙසේ නිර්වාණාභිමුඛ වූ සිත උපදනේ ය. මෙසේ ජාතියගේ අප්‍රවෘත්තිකචිත්තයෙහි ම ඒ යොගාවචරයාගේ සිත මා විසින් භවනිස්සරණය ලද්දේ ය යි කියා පනින්නේ ය, පහදින්නේ ය, සතුටු වන්නේ ය, විස්මය පත් වන්නේ ය.

''මහරජානෙනි, යම් සේ අන්‍යදෙශයකට ගියා වූ අතිදූරයෙහි දී මග නැසීම ප්‍රාප්ත වූ පුරුෂයෙක්තෙම ස්වකීය දෙශයට නො මුළා ව පැමිණිය යුතු මහාමාර්ගයක් දැක මා විසින් නිර්වාණමාර්ගයක් ලබන ලද්දේ ය යි කියා එහි පනින්නේ ය. පහදින්නේ ය. සතුටු වන්නේ ය. විස්මය පත් වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම සර්වසංස්කාර ප්‍රවෘත්තියෙහි

Non-Commercial Distribution

භය දක්නා වූ යොගාවචරමහණුන් වහන්සේගේ සිත සර්වසංස්කාර ප්‍රවෘත්තීන්ගේ අභාවයෙහි ම 'මා විසින් පිළිසරණක් ලද්දේ ය' යි කියා පනින්නේ ය, පහදින්නේ ය, සතුටු වන්නේ ය, විස්මය පත් වන්නේ ය. ඒ මහණුන් වහන්සේ කෙලෙසුන් තවන වීර්යයෙන් යුක්ත ව සංසාර ප්‍රවෘත්තියගේ අභාවය පිණිස ආර්යමාර්ගභාවනාව රැස් කරන්නේ ය, සොයන්නේ ය, වඩන්නේ ය, බහුලීකෘත කරන්නේ ය, ඒ යොගාවචර යාගේ ස්මෘතිතොම සසර හා නො හැනී ඉක්ම සිටි බැවින් නිස්සරණ ඛ්‍යාත ඒ නිර්වාණාර්ථයෙහි ම එළඹ සිටින්නේ ය, එම නිස්සරණාර්ථ යෙහි ම වීරිය ද එළඹ සිටින්නේ ය, එම නිස්සරණාර්ථයෙහි ම ප්‍රීතිය ද එළඹ සිටින්නේ ය. මෙසේ නැවැත නැවැතත් සිත්හි කරන්නා වූ ඔහුගේ සිත ආර්යමාර්ගයෙන් ගොස් සංසාරප්‍රවෘත්තිය අතික්‍රමණය කොට අප්‍රවෘත්ති ය යි කියන ලද අර්හත්ඵලයට පැමිණෙන්නේ ය.

**(404)** ''මහරජානෙනි, මෙසේ මනා කොට පිළිපන්නා වූ අප්‍රවෘත්තියට පැමිණියා වූ මහණුන් වහන්සේ අජරාමරනිත්‍ය මංගලපරමසුන්දර වූ අමෘතමහානිර්වාණය සිද්ධ කරන්නේ ය. අනන්ත බුදුන් විසින් ද මේ නිස්සරණය මෙපරිද්දෙන් දක්වන ලද්දේ යි. ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නිර්වාණාමෘතරසය බොහෝ කොට වදළසේක. යහපත, ස්වාමීනි, මේ ප්‍රශ්නය එසේ ම පිළිගන්නෙමි'' යි කීහ.

**නිර්වාණසාක්ෂාත්කරණප්‍රශ්නය නිමි.**

---

# නිර්වාණසිද්ධිප්‍රශ්නය

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, පූර්වදිශායෙහි හෝ දක්ෂිණ දිශායෙහි හෝ පශ්චිමදිශායෙහි හෝ උත්තරදිශායෙහි හෝ උඩ යට හෝ සරස හෝ යම් තැනෙක නිර්වාණය පිහිටියේ ද, එබඳු ප්‍රදෙශයෙක් ඇද්ද? ඒ ප්‍රදෙශය කොතැන්හි දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, පූර්වදිශායෙහි හෝ දක්ෂිණදිශායෙහි හෝ පශ්චිමදිශායෙහි හෝ උත්තර දිශායෙහි හෝ උඩ අහස්හි හෝ යට පෘථිවියෙහි හෝ සරස අනන්ත සක්වළෙහි හෝ යම් තැනෙක නිර්වාණය පිහිටියේ ය යි යන එබඳු ප්‍රදෙශයක් නැතැ'' යි වදළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉදින් නිර්වාණයාගේ පිහිටියා වූ ස්ථානයෙක් නැත්තේ වී නම්, ඒ කාරණ යෙන් නිර්වාණයත් නැත්තේ ය. යම් දිව්‍යමනුෂ්‍යකෙනෙකුන් විසින් නිර්වාණය සිද්ධකරණ ලද්දේ වී නම්, ඔවුන්ගේ ඒ නිවන් සිද්ධ කිරීම ද බොරු වන්නේ ය, ඇත්තක් නො වන්නේ ය. ඊට කාරණයක් මම කියන්නෙමි. පින්වත් වූ නාගසෙනයන් වහන්ස, යම් සේ පොළෝ තෙලෙහි ධාන්‍ය නැඟීමට කෙතෙක් ඇත්තේ ය, සුවඳ නැඟීමට මල් ඇත්තේ ය, මල් නැඟීමට වනලැහැබෙක් ඇත්තේ ය, ඵල නැඟීමට

රුකෙක් ඇත්තේ ය, රත්න පහළ වීමට ආකරයෙක් ඇත්තේ ය. එහි යම් කිසිවෙක් පුෂ්පඵලාදි යම් යම් දෙයක් කැමැත්තේ වී නම්, එතෙම වෘක්ෂගුම්බාදි ඒ ඒ තෙනට ගොස් පුෂ්පඵලාදි ඒ ඒ දෙය ගෙණ යන්නේ ය, පින්වත් වූ නාගසෙනයන් වහන්ස, එපරිද්දෙන් ම ඉදින් නිර්වාණයත් ඇත්තේ වී නම්, ඒ නිර්වාණයාගේ පැන නැගෙන්නා වූ ස්ථානයකුත් කැමැති විය යුත්තේ ය, වුවමනා වන්නේ ය. ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, යම්හෙයකින් නිර්වාණයාගේ පැන නගින්නා වූ ස්ථානයෙක් නැද්ද, එහෙයින් නිර්වාණයත් නැතැ යි කියන්නෙමි. යම් දිව්‍යමනුෂ්‍ය කෙනෙකුන් විසින් නිර්වාණය සාක්ෂාත් කරණ ලද ද, ඔවුන්ගේ ඒ නිර්වාණය සිද්ධ කිරීම ද මිථ්‍යා ය'' යි කීහ.

''මහරජානෙනි, නිර්වාණයාගේ පිහිටියා වූ ස්ථානයක් නැත්තේ ය. එසේ වුවත් මේ අමෘතමහානිර්වාණයත් ඇත්තේ ම ය. මනා කොට පිළිපන්නා වූ යොගාවචරයන් වහන්සේ යොනිසොමනස්කාරයෙන් ඒ නිර්වාණය සිද්ධ කරණසේක් ම ය. මහරජානෙනි, මේ ලොකයෙහි වහ්නිය ඇත්තේ ම ය. ඒ වහ්නියගේ තිබෙන ස්ථානයෙක් නැත්තේ ය. කාෂ්ටද්වයක් ඝර්ෂණය කරණ කල්හි වහ්නිය පැමිණෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නිර්වාණයත් ඇත්තේ ය. ඒ නිර්වාණයාගේ සන්නිහිත ස්ථානයෙක් නැත්තේ ය. **(405)** මනා කොට පිළිපන්නා වූ යොගාවචරතෙම යොනිසොමනස්කාරයෙන් නිර්වාණය සිද්ධ කරන්නේ ය. තවද, මහරජානෙනි, යම් සේ චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ සප්තවිධ රත්නයෙක් නම් ඇත. හේ කවරේ ද? යත්— අහස පිහිටන චක්‍ර රත්න ය, අහසින් යන හස්තිරත්නය ආකාශචාරී අශ්වරත්න ය, නිති දිලෙන මාණික්‍යරත්නය, මනුෂ්‍යරූපය ඉක්ම සිටි ස්ත්‍රීරත්න ය, සතර ගවුපොළෝ නිධාන දක්නා ගෘහපතිරත්න ය, පිරිස් නායක වූ පුත්‍රරත්න ය යන මෙයි. ඒ සප්තවිධ රත්නයන්ගේ සන්නිහිතස්ථානයෙක් නො ම ඇත්තේ ය, දශවිධ වූ චක්‍රවර්තිවත් පිරීමෙන් මනා කොට පිළිපන්නා වූ ක්ෂත්‍රිය මහරජානන්ගේ ප්‍රතිපත්තිබලයෙන් ඒ සප්තවිධ රත්නයෝ සමීපයට එළඹෙන්නාහු ය. මහරජානෙනි, එපරිද්දෙන් ම අමෘතමහානිර්වාණයත් ඇත්තේ ය, ඒ නිර්වාණයාගේ සන්නිහිත ස්ථානයෙක් නැත්තේ ය, මනා කොට පිළිපන්නා වූ යොගාවචරයන් වහන්සේ යොනිසොමනස්කාරය යි කියන ලද නුවණින් ඒ නිර්වාණය සිද්ධ කරන්නේ'' යි. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නිර්වාණයාගේ පිහිටි ස්ථානයෙක් නො වෙයි. ඒ බව සැබව. යොගාවචරතෙම මනාව පිළිපදිමින් යම් තැනෙක සිට නිර්වාණය සිද්ධ කරණසේක් ද, එබඳු වූ ස්ථානයෙක් ඇද්ද?'' යි විචාළෝ ය.

''එසේ ය, මහරජානෙනි, යොගාවචරතෙම යම් තැනෙක සිට මනා කොට පිළිපදිමින් නිර්වාණය සිද්ධ කෙරේ ද, එබඳු ස්ථානයෙක් ඇත්තේ ය'' යි කීසේක. ''ස්වාමීනි, යොගාවචරයන් වහන්සේ යම් තැනෙක

Non-Commercial Distribution

කොට පිළිපදිමින් නිර්වාණය සිද්ධ කරන්නේ ය යි යන ඒ ස්ථානය කවරේ ද?'' යි විචාළෝ ය. මහරජානෙනි, ශීලය ඒ ස්ථානය වන්නේ ය. ශීලයෙහි පිහිටියා වූ යොගාවචරතෙම නුවණින් සිත්හි කෙරෙමින් ස්වකීය **යවනදෙශයෙහි** ද, **චීනමිලාතදෙශයෙහි** ද, **අලසන්ද** යෙහි ද, **නිකුම්බදෙශයෙහි** ද, **කාශිකොශලදෙශයෙහි** ද, **කාශ්මීරදෙශ** යෙහි ද, **ගන්ධාරදෙශයෙහි** ද, **මහමෙර** මුදුනෙහි ද, බඹලොවෙහි ද, යම්කිසි තැනෙක්හි සිටියේ මනා කොට පිළිපදිමින් නිර්වාණය සිද්ධ කරන්නේ යි. මහරජානෙනි, යම් සේ ඇස් ඇත්තා වූ යම්කිසි පුරුෂයෙක් තෙම ස්වකීය **යවනදෙශයෙහි** ද, **චීනමිලාතදෙශයෙහි** ද, **අලසන්දයෙහි** ද, **නිකුම්බ** දෙශයෙහි ද, **කාශිකොශලදෙශයෙහි** ද, **කාශ්මීරදෙශයෙහි** ද, **ගන්ධාර** දෙශයෙහි ද, මෙර මුදුනෙහි ද, බ්‍රහ්මලොකයෙහි ද යම්කිසි තැනෙක සිටියේ ආකාශය දකී ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ශීලයෙහි ප්‍රතිෂ්ඨිත වූ යොගාවචරතෙම නුවණින් සලකමින් ස්වකීය යවන නම් දෙශාදි යම්කිසි තැනෙක සිටියේ මනා කොට පිළිපදිමින් නිර්වාණය සිද්ධ කරන්නේ ය. නවද, මහරජානෙනි, යම් සේ ස්වකීය යවන දෙශාදි යම් තැනෙක ප්‍රතිෂ්ඨිත වූ ඒ පුරුෂයාහට පූර්වදිශාභාගය ඇද්ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ශීලයෙහි ප්‍රතිෂ්ඨිත වූ නුවණ සිත්හි කරන්නා වූ ස්වකීය **යොනකදෙශාදි** යම්කිසි තැනෙක සිටියා වූ මනා කොට පිළිපන්නා වූ යොගාවචරයාගේ නිර්වාණය සාක්ෂාත් ක්‍රියාව ඇතැ යි වදළසේක. මෙසේ යථොක්ත වූ ප්‍රඥාගොචර නිර්වාණප්‍රශ්නය විසර්ජනාවසානයෙහි **මිලිඳු** මහරජානෝ සද්ධර්මාලම්බන ප්‍රීතියෙන් පිණ **(406)** පිණා දෙහොත් මුදුන් දී ''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අනෙක මධුරොදර විසිතුරු උපමා කාරණයන් දක්වීමෙන් නුඹවහන්සේ විසින් අමෘතමහානිර්වාණය දෙශනා කරණ ලද්දේ ම ය. සාක්ෂාත් ක්‍රියාවත් දෙශනා කරණ ලද්දේ ම ය. සිලානිසංසය ද දක්වා වදරණ ලද්දේ ය. ත්‍රිවිධබොධියාත්‍රායෙහි සම්‍යක් ප්‍රතිපත්තියක් දක්වන ලද්දේ ය, සර්වදෘෂ්ටි මථනයෙන් විජය වූ සද්ධර්ම ධවජය ඉතා උසස් කොට නඟන ලද්දේ ය. විපරිතදෘෂ්ටියකු විසින් පන්දහස්වස් සොලවාලිය නො හෙන සේ ධර්මවිනය ස්ථිර කොට තබන ලද්දේ ය. නිවන් සෙවීමෙහි සුප්‍රයුක්ත වූ උත්තමයන්ගේ සම්‍යක් ප්‍රයොගය සිස් නො වන්නේ ය, සඵල වන්නේ ය, මාගේ පින්වත් වූ සර්වගණීන්ද්‍ර ප්‍රවරොත්තමයානන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නය එසේ ම පිළිගන්නෙමි'' යි කියා ප්‍රශංසා කළහ.

**නිර්වාණසිද්ධිප්‍රශ්නය නිමි.**

---

**සකලජන මනොනන්දනීය වූ මේ ශ්‍රීසද්ධර්මාදසයෙහි**

**අටවැනි වර්ගය නිමියේ ය.**

*Non-Commercial Distribution*

# මහාඅනුමාන ප්‍රශ්නය

නැවතත් ප්‍රඥාධනනිධාන වූ මිලිඳු මහරජානෝ යම් තැනෙක ආයුෂ්මත් වූ නාගසෙන ස්ථවිරයන් වහන්සේ වැඩ වාසය කර වදරණසේක් ද, එතැන්හි එළඹියාහ. එසේ එළඹ ආයුෂ්මත් වූ **නාගසෙන** ස්ථවිරොත්-තමයානන් සකසා වැඳ එකත්පසෙක්හි හුන්නාහ. එකත්පසෙක හුන්නා වූ ඒ මිලිඳු මහරජානෝ විශෙෂයෙන් ම සුගතාගම දකිනු කැමැති වූවාහු අසනු කැමති වූවාහු සිතින් දරණු කැමැති වූවාහු ප්‍රඥාලොකය දක්නා කැමැති වූවාහු නුනුවණ බිඳ හරිණු කැමැති වූවාහු ප්‍රඥාලොකය උපදවනු කැමැති වූවාහු අවිද්‍යාන්ධකාරය නසනු කැමැති වූවාහු අධික වූ ධෛර්යයද උත්සාහය ද, සිහිය ද, ප්‍රඥාව ද උපදවා ආයුෂ්මත් වූ නාගසෙනයන් ස්ථවිරයන් වහන්සේට මේ මතු කියන කථාව කීහ. ''කිමෙක් ද, ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, නුඹ වහන්සේ විසින් සර්වඥ බුදුරජතෙමේ දක්නා ලද්දේ දැ?'' යි විචාළෝ ය. ''නැත, මහරජැ'' යි වදාළසේක. ''කිමෙක් ද, වහන්ස, නුඹගේ ආචාර්යවරුන් විසින් සර්වඥතෙමේ දක්නා ලද්දේ දැ?'' යි විචාළෝ ය. ''නැත, මහරජැ'' යි වදාළසේක. ''පින්වත් වූ **නාගසෙනයන්** වහන්ස, නුඹ වහන්සේ විසිනුත් ලොවුතුරා බුදුරජතෙමේ නො දක්නා ලද්දේ ය, නුඹ වහන්සේගේ ආචාර්යවරයන් විසිනුත් ලොවුතුරා බුදුරජතෙමේ නො දක්නා ලද්දේ ය. පින්වත් වූ නාගසෙනයන් වහන්ස, ඒ කාරණයෙන් බුදුහු නැත්තාහ[1]. මෙහි බුදුකෙනෙක් මට නො දැනෙන්නාහ[2]'' යි කීහ. ''මහරජානෙනි, යම් ඒ රජකෙනෙක් තොපගේ රාජවංශයට පූර්වංගම වූවාහු ද, ඒ පූර්වරජදරුවෝ ඇද් දැ?'' යි විචාළසේක. ''එසේ ය, ස්වාමීනි, කවර කාංක්ෂාවෙක් ද? මාගේ රාජ වංශයට යම් රජදරු කෙනෙක් පූර්වංගම වූවාහු ද, ඒ පූර්වරජදරුවෝ ඇතැ'' යි කීහ. ''මහරජානෙනි, තොප විසින් ඒ පූර්වරජදරුවෝ දක්නා ලද්දෝ දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, **(407)** තොපට යම් පුරොහිත සෙනාපති විනිශ්චය මහාමාත්‍යකෙනෙක් අනුසාසනා කෙරෙද්ද, ඔවුන් විසින් ඒ පූර්වරජ දරුවෝ දක්නා ලද්දහු දැ?'' යි විචාළසේක. ''නැත, ස්වාමීන් වහන්සැ'' යි කීහ. ''මහරජානෙනි, ඉදින් තොප විසිනුත් පූර්ව රජදරුවෝ නො දක්නා ලද්දහු නම්, තොපට අනුශාසනා කරන්නවුන් විසිනුත් පූර්ව රජදරුවෝ නො දක්නා ලද්දහු වී නම්, එහි පූර්ව රජදරුකෙනෙක් නැත්තාහ. මේ තොපගේ රාජවංශයෙහි පූර්ව ක්ෂත්‍රියකෙනෙක් මට නො දැනෙන්නාහ[3]'' යි වදාළසේක. ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, අපගේ පූර්වරජදරුවන් විසින් අනුභව කළා වූ පරිභොග කළා වූ භාණ්ඩය දක්නා ලැබෙයි. හේ කවරේ ද? යත්— මාහැඟි වූ ධවලච්ඡත්‍රය, නළල් පට ය, රන්මිරිවැඩි සහල ය, වල්විදුනාව ය, ඛඩ්ගරත්න ය, මහාර්හ වූ ශ්‍රී යහන් ය. යම් භාණ්ඩ කෙනෙකුන් කරණ කොට ගෙණ අපි පූර්ව

1. නැත්තේ ය 2. නො දැනෙන්නේ ය 3. නො දැනෙන්නේ ය

Non-Commercial Distribution

රජදරුවෝ ඇතැ යි කියා අදහන්නමෝ ද, දන ගන්නමෝ ද, ඒ මේ භාණ්ඩයෝ ය'' යි කීහ. ''මහරජානෙනි, එපරිද්දෙන් ම අපිදු ඒ ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ ඇතැ'' යි කියා දන ගණුමහ. අදහා ගණුමහ. යම් කාරණයකින් ඒ ලොවුතුරා බුදුන් ඇතැ යි කියා දන ගන්නමෝ ද, අදහා ගන්නමෝ ද, ඊට ම කාරණයක් ඇතැ'' යි වදළ සේක. ''ඒ කාරණය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, භාග්‍යවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ ඒ සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන් වහන්සේ විසින් අනුභව කර වදළා වූ පරිභොගභාණ්ඩයෝ ඇත. ඒ කවරේ ද? යත්— සතර සතිපට්ඨානයෝ ය, සතර සම්‍යක්ප්‍රධානයෝ ය, සතර ඍද්ධිපාදයෝ ය, පඤ්චේන්ද්‍රියයෝ ය, පඤ්චබලයෝ ය, සප්ත බොද්ධාංගයෝ ය, ආර්යඅෂ්ටාංගිකමාර්ගය දැ යි යන යම් ධර්මකෙනෙකුන් කරණ කොට ගෙණ ඒ ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ ඇතැ යි කියා දෙවියන් සහිත වූ ලෝවැසිතෙම දන්නේ ද, අදහන්නේ ද, ඒ මේ ලොකොත්තර භාණ්ඩයෝ නම් වෙති. මහරජානෙනි, මේ කාරණයෙන් ද මේ හෙතුයෙන් ද මේ ක්‍රමයෙන් ද මේ අනුමානයෙන් ද ලොවුතුරා බුදුහු ඇතැ යි කියා දත යුත්තේ ය. තවද, මහරජානෙනි, යම් ද්විපදෙත්තම වූ ලොවුතුරා බුදුරජානන් වහන්සේ කෙනෙක් බොහෝ දිව්‍යබ්‍රහ්මමනුෂ්‍යයන් සංසාරසාගරයෙන් එතෙර කොට උපධි සංඛ්‍යාත සර්වක්ලෙශයන් ක්ෂය කිරීමෙන් පිරිනිවී ගිය සේක් ද, මේ අනුමානයෙන් ඒ ද්විපදෙත්තමයානන් වහන්සේ ඇතැ යි කියා දත යුත්තේ යි. එයින් වදළහ:—

**'බහු ජනෙ තාරයිත්වා–නිබ්බුතො උපධිසංඛයෙ,**
**අනුමානෙන ඤාතබ්බො–අත්ථි සො දිපදුත්තමො' යි.**

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මෙපමණකින් මාගේ කාංක්ෂාව විරමණය නො වෙයි. තවත් උපමාවකුත් කර අදළ මැනැවැ'' යි කීහ. ''සැබව, මහරජානෙනි, ගම්භීර වූ අර්ථධර්ම උපමා දර්ශනයෙන් සමහර පණ්ඩිතවරු අවබොධය කෙරෙති. මහරජානෙනි, යම් සේ නුවරක් මවනු කැමැත්තා වූ නුවර වඩුතෙම පළමු කොට ම සම වූ උස් මිටි තැන් නැත්තා වූ බොරළු ගල් නැත්තා වූ නිරුපද්‍රව වූ කිසි දෙෂයක් නැත්තා වූ රමණීය වූ භූමිප්‍රදෙශයක් විමසා බලා එහි විෂම වූ යමක් ඇත් නම් ඒ සම කරවා කණු (408) කටු පහ කිරීමෙන් භූමිය ශුද්ධ කරවා ඒ භූමිප්‍රදෙශයෙහි සර්ව නගරාංගශ්‍රීයෙන් ශොභන වූ සර්වදෙෂ විරහිත වූ ගෙබිම් බෙදීම් ඇති රාජගෘහමණ්ඩපාංගණාදී ප්‍රමාණයෙන් යුක්ත වූ ගම්භීර වූ අගලින් හා උස් වූ ප්‍රාකාරපංක්තීන් ඇති දැඩි වූ වහසල් දෙරටු හා අටලු කොටු ඇති පාථුලාංගණ චතුෂ්කසන්ධි ඇති පවිත්‍ර සමතලා රාජමාර්ග ඇති සුන්දරාකාරයෙන් බෙද කරණ ලද අතරතුර සල්පිල් ඇති ආරාමොද්‍යාන වැව් පොකුණු ලිඳින් සම්පූර්ණ වූ බොහෝ වූ දෙවාලයස්ථානයෙන් ප්‍රති මණ්ඩිත වූ පහ වූ සර්වදෙෂ ඇති මහනුවරක් මවාලන්නේ වී නම්, සර්වප්‍රකාර

Non-Commercial Distribution

යෙන් ඒ නුවර විපුලබවට පැමිණි කල්හි ඒ වඩුපුරුෂතෙම අනික් දෙශයකට යන්නේ ය. නැවත ඒ නුවර අනික් කාලයක සකලසම්පත් යෙන් සමෘද්ධ වන්නේ ය. සුත්පුල්ලපද්මයක් සෙයින් සම්පූර්ණ වන්නේ ය. ඛාද්‍යභොජ්‍යාදියෙන් සුභික්ෂ වන්නේ ය, ක්ෂෙම වන්නේ ය, නොයෙක් සමෘද්ධි ඇත්තේ ය, මංගල්‍යක්‍රියා ඇත්තේ ය, උවදුරු නැත්තේ ය, නිරුපද්‍රව වන්නේ ය, නානා ජනයන්ගෙන් ආකුල වන්නේ ය.

**"පුන ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා හත්ථාරොහා අස්සාරොහා රථිකා පත්තිකා ධනුග්ගහා ථරුග්ගහා චෙලකා චලකා පිණ්ඩදායකා මහායොධා උග්ගා රාජපුත්තා පක්ඛන්දිනො මහානාගා සූරා චම්මයොධිනො දාසිපුත්තා භටිපුත්තා මල්ලගණා ආළාරිකා සූදා කප්පකා නහාපකා චුන්දා මාලාකාරා සුවණ්ණකාරා සජ්ඣුකාරා සීසකාරා තිපුකාරා ලොහකාරා වට්ටකාරා අයකාරා මණිකාරා පෙසකාරා කුම්භකාරා ලොහකාරා චම්මකාරා රථකාරා දන්තකාරා රජ්ජුකාරා කොච්ඡකාරා සුත්තකාරා විලීවකාරා ධනුකාරා ජියාකාරා උසුකාරා චිත්තකාරා රඞ්ගකාරා රජකා තන්තවායා තුන්නවායා හෙරඤ්ඤිකා දුස්සිකා ගන්ධිකා තිණහාරකා කට්ඨහාරකා භතකා පණ්ණිකා ඵලිකා මූලිකා ඔදනිකා පූවිකා මච්ඡිකා මංසිකා මජ්ජිකා නටකා නච්චකා ලංඝකා ඉන්ද්‍රජාලිකා වෙතාලිකා මල්ලා ඡවඩාහකා පුප්ඵඡඩ්ඩකා වෙණිකා නෙසාදා ගණිකා ලාසිකා කුම්භදාසියො සක්කයවනා චීනවිලාතා උජ්ජෙනිකා භාරුකච්ඡකා කාසිකොසලා පරන්තකා මාගධකා සාකෙතකා සොරට්ඨකා පාඨෙය්‍යකා කොටුම්බරකා මධුරකා අලසන්දකස්මීරගන්ධාරා තං නගරං වාසාය උපගතා නානාවිසයිනො ජනා නවං සුවිභත්තං අදොසමනවජ්ජං රමණීයං තං නගරං පස්සිත්වා අනුමානෙන ජානන්ති: ඡෙකො වත භො සො නගරවඩ්ඪකී යො ඉමස්ස නගරස්ස මාපෙතා'ති."**

"එනුවර වාසයට එළෙඹියා වූ ස්වකීය යවන නම් දෙශවාසීහු ද, චීන විලාත දෙශවාසීහු ද, උදේනිරට වාසීහු ද, භාරුකච්ඡරට වාසීහු ද, කාශිකොශලදෙශ වාසීහු ද, අපරන්තකයෝ ද, මගධරට වාසීහු ද, සාකෙතයෝ ද, සොරට්ඨයෝ ද, පාඨෙය්‍යකයෝ ද, කොටුම්බරදෙශ වාසීහු ද, මථුරාරට වාසීහු ද, ආලසන්දවෝ ද, කාශ්මීරරට වාසීහු ද, ගන්ධාරදෙශ වාසීහු ද, යනාදී නොයෙක් දෙශ වාසී වූ නොයෙක් ක්ෂත්‍රියයෝ ය, බ්‍රාහ්මණයෝ ය, වෛශ්‍යයෝ ය, ශූද්‍රයෝ ය, හස්ත්‍යාරොහයෝ ය, අශ්වාරොහයෝ ය, රථාරොහයෝ ය, **(409)** පාබලසෙනාව ය, දුනු ගත්තෝ ය, කඩු ගත්තෝ ය යුද්ධයෙහි ජයකොඩි ගෙණ පෙරටු ව යන චෙලකයෝ ය, යුධයෙහි සෙනා රාශි සදමින් ඒ ඒ තැන දිව පනින්නා වූ චලකයෝ ය,

Non-Commercial Distribution

සංග්‍රාමයෙහි යොධාදීන්ට බත් පැන් දෙන්නා වූ පිණ්ඩදයකයෝය, ශත්‍රු සෙනාමධ්‍යයට පනිමින් හිස් සිඳ සිඳ ඉපිල පැන එන්නා වූ සාහසිකමහා යොධයෝ ය, උග්‍ර වූ වික්‍රම ඇති සංග්‍රාමාවචර රාජපුත්‍රයෝ ය, 'කාගේ ශීර්ෂය කාගේ ආයුධය ගෙණෙම් දැ?'' යි විචාරා ශත්‍රුසෙනාමධ්‍යයට පැන එම කී හිස් හා කඩු ගෙණ ඒන්නා වූ පක්ඛන්දික නම් මහාසූරයෝ ය, ත්‍රිමදගලිත හස්තිරාජයෙකු වුවත් අභිමුඛයට පැමිණි කල නො පසු බස්නා මහානාග නම් යෝධයෝ ය, මුහුදින් එතෙර පිහිනා පියන තරම් එකවින්නි සූරයෝ ය, සම්සැට්ට පෙරවා ගෙණ යුද්ධ කරණ චර්මයෝධයෝ ය, බලවත් ස්නේහ ඇති ගෘහදසක පුත්‍රයෝ ය, රාජභටයන්ගේ පුත්‍රයෝ ය. මල්ලවජනයෝ ය, රසකාරකයෝ ය, සූපකාරකයෝ ය, අලංකාර කරණයෙන් අන්දම් තබන කපුවෝ ය, චූර්ණවිලෙපනාදීයෙන් රජුන් නහවන්නෝ ය, ලී ලියන වඩුවෝ ය, මාලාකාරයෝ ය, ස්වර්ණකාරයෝ ය, රිදීකාරයෝ ය, කෘෂ්ණ ඊයම්කාරයෝ ය, තිපුකාරයෝ ය, ලොහකාරයෝ ය, තැටිකාරයෝ ය, යකඩකාරයෝ ය, මැණික්කාරයෝ ය, පෙසකාරයෝ ය, කුම්භකාරයෝ ය, ලෝකුරුවෝ ය, සොම්මරුවෝ ය. රථකාරයෝ ය. දන්තකාරයෝ ය, ලනුකාරයෝ ය, පණාකාරයෝ ය, නුල්කාරයෝ ය, හැඩයෝ ය, දුනුකාරයෝ ය, දුනුදිය කරන්නෝ ය, හීවඩුවෝ ය, චිත්‍රකාරයෝ ය, සායම්කාරයෝ ය, රදවු ය, නූල් වියන්නෝ ය, සන්නාලියෝ ය, රන්මසු තනන්නෝ ය, පිළිවෙළෙන්දෝ ය, සුවඳ තනන්නෝ ය, තෘණහාරකයෝ ය, දර ගෙණෙන්නෝ ය, බත් බැළයෝ ය, පර්ණිකයෝ ය, එළිකයෝ ය, මුලඅල හරණෝ ය, ඔදනිකයෝ ය, පූවිකයෝ ය, මත්ස්‍යවෙළෙන්දෝ ය, මාංස වෙළෙන්දෝ ය, සුරාවෙළෙන්දෝ ය, නැට්ටුවෝ ය, නෘත්‍යකාරයෝ ය, පිනුම්කාරයෝ ය, ඉන්ද්‍රජාල දන්නෝ ය, වෙතාලයෙහි මංගලාෂ්ටක කියන්නා වූ වෙතාලිකයෝ ය, මුෂ්ටිමල්ලවයෝ ය, මළමිනි දවන්නෝ ය, මල්පර දමන්නෝ ය, වීණාකාරයෝ ය, වැද්දෝ ය, වෙසියෝ ය, ප්‍රීතියෙන් ඉපිලෙන්නාක් මෙන් පැනනැඟි නැඟී නටන්නා වූ ලසිකා නම් නෘත්‍යාංගනාවෝ ය. කුම්භ දසියෝ ය, යනාදි ජනයෝ නගරාංග විශිඛාදි මනා වූ බෙදුම් ඇති නිර්දෙෂානවද්‍යරමණීය වූ ඒ අලුත් නුවර දැක විස්මයපත් ව 'පින්වත්නි, යම් වඩුවෙක් මේ නුවර මවාලූයේ වේ ද, ඒ නගරවඩ්ඩකී පුරුෂතෙම ඒකාන්තයෙන් ම අතිදක්ෂ ය යි කියා අනුමානයෙන් ම දැනගන්නාහු යි.

**"එවමෙව ඛො මහාරාජ සො භගවා අසමො අසමසමො අප්පටිමො අසදිසො අතුලො අසංඛෙය්‍යො අප්පමෙය්‍යො අපරිමෙය්‍යො අමිතගුණො ගුණපාරමිප්පත්තො අනන්තධිති අනන්තතෙජො අනන්තවිරියො අනන්තබලො බුද්ධබලපාරමිං ගතො, සසෙනං මාරං පරාජෙත්වා දිට්ඨිජාලං පදාලෙත්වා අවිජ්ජං ඛෙපෙත්වා විජ්ජං උප්පාදෙත්වා ධම්මුක්කං ධාරෙත්වා සබ්බඤ්ඤුතං පාපුණිත්වා නිජ්ජිතවිජිතසංගාමො ධම්මනගරං මාපෙසි. භගවතො ඛො මහාරාජ ධම්මනගරං සීලපාකාරං හිරිපරිඛං**

*Non-Commercial Distribution*

**ඤාණද්වාර කොට්ඨකං විරියට්ටාලකං (410) සද්ධෙසිකං සතිදොවාරිකං පඤ්ඤාපාසාදං සුත්තන්තචච්චරං අභිධම්මසිංඝාටකං විනයවිනිච්ඡයසාලං සතිපට්ඨානවීථි, තස්සං ඛො පන මහාරාජ සතිපට්ඨාන වීථියං එවරූපා ආපණා පසාරිතා හොන්ති. සෙය්‍යථිදං පුප්ඵාපණං ගන්ධාපණං ඵලාපණං අගදාපණං ඔසධාපණං අමතාපණං රතනාපණං සබ්බාපණන්ති.''**

''මහරජානෙනි, එපරිද්දෙන් ම ඒ භගවත් අරහත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජොත්තමයානන් වහන්සේ අසම වූසේක, අසම සම වූසේක, අප්‍රතිම වූසේක, අසදෘශ වූසේක, අතුල්‍ය වූසේක, අසංඛෙය්‍යගුණයෙන් යුක්ත වූසේක, අප්‍රමෙයගුණයෙන් යුක්ත වූසේක, අපරිමාණගුණයෙන් යුක්ත වූසේක, පමණ නැති ගුණයෙන් යුක්ත වූසේක, ගුණපාරමිතාවගේ කෙළ පැමිණිසේක, අනන්තධෛර්ය ඇතිසේක, අනන්තතේජස් ඇතිසේක, අනන්ත වූ වීර්ය ඇතිසේක අනන්ත වූ ඥාණබල ඇතිසේක, සර්වඥබලපාරමිතාවගේ කොටිප්‍රාප්ත වූසේක, කාමතෘෂ්ණාදි මාරසෙනාව සහිත වූ වශවර්තිමාරයාගේ දර්පමර්දනය කිරීමෙන් පරාජය කොට දෙපතුල් වඳවා ගෙණ දෘෂ්ටිගතිකයන් විසින් සකලසත්වයන් බඳ සතර අපායෙහි හෙළන දෘෂ්ටිදල අර්හත්මාර්ගඥනශස්ත්‍රයෙන් ප්‍රදලනය කොට චතුස්සත්‍ය ප්‍රතිච්ඡාදක අවිද්‍යාව ක්ෂය කොට සර්වමොහන්ධකාරය විධ්වංසනය කරන්නා වූ අෂ්ටවිද්‍යාව උපදවා ප්‍රඥ නමැති මහගිනිසුළ දරා සර්වඥතාඥනයට පැමිණ නිර්ජිත විජිත සංග්‍රාම ඇතිසේක් සද්ධර්ම මහනුවරක් මවා වදළසේක.

''මහරජානෙනි, අප ලොවුතුරා බුදුන්ගේ සද්ධර්මමහනුවර වටා කෙලෙස් සොරුන් වැද්ද නො දෙන ශීලමයප්‍රාකාර ඇත්තේ ය, ලජ්ජා නමැති මඩඅගල් ඇත්තේ ය, ඥාණ නමැති වාසල්කඩ ඇත්තේ ය, වීර්ය නමැති අට්ටාල ඇත්තේ ය, ශ්‍රද්ධා නැමැති ඉන්ද්‍රඛීල ඇත්තේ ය, සිහි නමැති දෙර ඇත්තේ ය, ප්‍රඥ නමැති මහාප්‍රාසාද ඇත්තේ ය, සූත්‍රාන්ත ධර්ම නැමැති රාජාංගණ ඇත්තේ ය, අභිධර්ම නමැති සතරමංසන්ධි ඇත්තේ ය, විනයධර්ම නමැති විනිශ්චයශාලා ඇත්තේ ය, සතර සතිපට්ඨාන නමැති සතර මහාවීථි ඇත්තේ ය, මහරජානෙනි, ඒ සතර සතිපට්ඨාන නමැති වීථියෙහි මෙබඳු සල්පිල් සදන ලද්දහු වෙති. හේ කවර ද? යත්— පුෂ්පාපණ ය, ගන්ධාපණ ය, ඵලාපණ ය, අගදපණ ය, ඔසධාපණ ය, අමෘතාපණ ය, රතනාපණ ය, සර්වාපණ ය යන මේ අෂ්ටාපණයෝ සදන ලද්දහු යි.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවත් වූ සර්වඥ රාජොත්තමයානන් වහන්සේගේ පුෂ්පාපණය කවරේ ද ''යි විචාළෝ ය. මහරජානෙනි, ඒ භාග්‍යවත් වූ සියල්ල දක්නා වූ අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන් වහන්සේ විසින් වදරණ ලද්ද වූ අරමුණු බෙදීම්හු ඇත්තාහු ය. හේ කවරේ ද? යත්— රූප වෙදනා සංඥ සංස්කාර

Non-Commercial Distribution

විඥාන ය යන පඤ්චස්කන්ධය අනිත්‍ය යැ යි කියා සලකන්නා වූ අනිත්‍ය සංඥාව ය. චක්ෂුඃ ශොත්‍ර යනාදි ද්වාදශායතනයෝ අනාත්ම ය යි කියා දන්නා වූ අනාත්ම සංඥාව ය. මේ ශරීරය දෙපතුල පටන් හිස දක්වා හිස පටන් දෙපතුල දක්වා හිසකේ **(411)** රොම නිය දත් මල මූත්‍රාදී දෙතිස් කුණපයෙන් ආකුල වූයේ ය යි කියා අසුභාකාරයෙන් සිතන්නා වූ අශුභ සංඥාව ය. 'මේ ශරීරයෙහි උපදනා වූ අටඅනූවක් රොග හෙයින් නව අනූවක් ව්‍යාධි හෙයින් මේ කය බොහෝ වූ දුක් ඇත්තේ ය, බොහෝ වූ ආදීනව ඇත්තේ ය' යි කියා ආදීනව වසයෙන් සිතන්නා වූ ආදීනව සංඥාව ය, සිත්හි උපන් කාම විතර්කය, ව්‍යාපාදවිතර්ක ය, විහිංසා විතර්ක ය හා උපනුපන් නොයෙක් අකුශලධර්මයන් නො ඉවසා පහ කරන්නා වූ ප්‍රහාණ සංඥාව ය, 'යම්බඳු වූ මේ සර්වසංස්කාරයන්ගේ සංහිඳීම ය, සර්වක්ලෙශයන්ගේ හැරීම ය, තෘෂ්ණාවගේ ක්ෂය වීම ය, රාගයෙන් වෙන් වීම ය, නිර්වාණ ය යි යන මේ ශාන්ත වන්නේ ය. මේ ප්‍රණීත වන්නේ ය' යි කියා සිතන්නා වූ විරාගසංඥාව ය. 'යම්බඳු වූ මේ සර්වසංස්කාරයන්ගේ සංහිඳීම ය, සර්වක්ලෙශයන්ගේ හැරීම ය, සියලු දුක්ඛයාගේ නිරුද්ධ වීම ය, නිර්වාණ ය යි යන මේ ශාන්ත ය, මේ ප්‍රණීත ය' යි කියා සිතන්නා වූ නිරොධ සංඥාව ය, පඤ්චස්කය පිණිස යම් ගැණුම් කෙනෙක් ඇද්ද, සිතට පිහිටන්නා වූ අරමුණු අනු වන කෙලෙස් කෙනෙක් ඇද්ද, ඔවුන් පහ කෙරෙමින් නො ගෙණ දුරු වන්නා වූ මුළු ලොව නො ඇලෙන සංඥාව ය, එසියපන්සාළිස් ප්‍රභෙදගත වූ චිත්ත චෛතසිකධර්මයෙහි හා විසිඅට වැදෑරුම් වූ රූපධර්මය යන සර්වසංස්කාරධර්මයෙහි පෙළෙන්නා වූ ලජ්ජා වන්නා වූ පිළිකුල් වන්නා වූ අනිත්‍ය සංඥාව ය. සියලු සසර දුක සේ දක නිවන් සොයනු කැමැති කිසිවෙක් අරණ්‍ය වෘක්ෂමූල ශුන්‍යස්ථානයෙහි පලඟ බැඳ කය ඍජු කොට තබා අරමුණු අවුළුවන සිහි එළවා හේ සිහි ඇත්තේ ම ආශ්වාසය අදනේ ය. සිහි ඇත්තේ ම ප්‍රශ්වාසය පදනේ ය. දික් කොට නාසාවාතය අදිමින් දික් කොට නාසාවාතය අදිමි යි කියා දන්නේ ය. දික් කොට නාසාවාතය පදනේ දික් කොට නාසාවාතය පදිමි යි කියා දන්නේ ය. ලුහුඩු කොට නාසාවාතය ගෙණෙන්නේ ද, ලුහුඩු කොට නාසාවාතය ගෙණෙමි යි කියා දන්නේ ය. ලුහුඩු කොට නාසාවාතය හෙළන්නේ ද ලුහුඩු කොට නාසාවාතය හෙළමි යි කියා දන්නේ ය. සියලු ආශ්වසකායයාගේ ආදි මධ්‍ය පරියොසානය විදිත කෙරෙමින් ප්‍රකට කෙරෙමින් ඥානසංප්‍රයුක්ත චිත්තයෙන් ආශ්වාසය පවත්වමින් දන හික්මෙන්නේ ය. සියලු ආශ්වාස කායයාගේ ආදි මධ්‍ය පරියොසානය විදිත කෙරෙමින් ප්‍රකට කෙරෙමින් ඥාණසංප්‍රයුක්තචිත්තයෙන් ප්‍රශ්වාසය පවත්වමින් දන හික්මෙන්නේ ය. නාස්බිල නො සෑහෙන්නාක් මෙන් බලවත් ව පවත්නා ඔළාරික වූ කාය වාතය පටිප්පසම්භනය කෙරෙමින් සන්හිඳුවමින් ආශ්වාසය කෙරෙමි යි දන හික්මෙන්නේ ය. නාස්බිල නො සෑහෙන්නාක් මෙන් බලවත් ව පවත්නා වූ ඔළාරික වූ කායවාතය පටිප්පස්සම්භනය කෙරෙමින් සන්හිඳු

Non-Commercial Distribution

වමින් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. සප්‍රීතිකධ්‍යාන සමාපත්තික්ෂණයෙහි ප්‍රතිලාභක්ෂණයෙහි උපදනා ප්‍රීතිය විදිත කෙරෙමින් ප්‍රකට කෙරෙමින් ආශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. සප්‍රීතික ධ්‍යානසමාපත්තික්ෂණයෙහි ප්‍රතිලාභක්ෂණයෙහි උපදනා ප්‍රීතිය විදිත කෙරෙමින් ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්-නේ ය. තෘතීයධ්‍යානසමාපත්ති **(412)** ප්‍රතිලාභක්ෂණයෙහි උපදනා ධ්‍යානසැප විඳිමින් ආශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. තෘතීය ධ්‍යානසමාපත්ති ප්‍රතිලාභක්ෂණයෙහි උපදනා ධ්‍යානසැප විඳිමින් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. ඖදාරික වූ චිත්ත චෛතසිකධර්මයන් විඳිමින් ආශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. ඖදාරික වූ චිත්තචෛතසිකධර්මයන් විඳිමින් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. ඖදාරික වූ චිත්තචෛතසිකධර්මය පටිප්පස්සම්භනය කෙරෙමින් සන්හිඳුවමින් ආශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. ඖදාරික වූ චිත්තචෛතසිකධර්මය පටිප්පස්සම්භනය කෙරෙමින් සන්හිඳුවමින් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. සතර ධ්‍යානචිත්තයන් පහළ කෙරෙමින් ආශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන් නේ ය. සතර ධ්‍යානචිත්තයන් පහළ කෙරෙමින් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. සමාධිවිපස්සනා වසයෙන් චිත්තය සන්තොෂ කෙරෙමින් ආශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. සමාධි විපස්සනා වසයෙන් චිත්තය සන්තොෂ කෙරෙමින් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. ප්‍රථමධ්‍යානාදි වශයෙන් ආරම්මණයෙහි චිත්තය සම කොට පිහිටුවමින් ආශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. ප්‍රථමධ්‍යානාදි වශයෙන් ආරම්මණයෙහි චිත්තය සම කොට පිහිටුවමින් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. සතර ධ්‍යානයෙහි නීවරණ විතර්ක විචාර ප්‍රීති සුඛ දුඃඛයෙන් සිත මුදමින් ආශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. සතර ධ්‍යානයෙන් නීවරණ විතර්ක ප්‍රීති සුඛ දුඃඛයෙන් සිත මුදමින් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. පඤ්චස්කන්ධයන්ගේ අනිත්‍ය ලකුණු දනිමින් ආශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. පඤ්චස්කන්ධයන්ගේ අනිත්‍ය ලකුණු දනිමින් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. ඛයඅච්චන්තවිරාගද්වය දනිමින් ආශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. ඛයඅච්චන්ත විරාගද්වය දනිමින් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. සර්ව සංස්කාරයන්ගේ විනාශය කිරීමෙන් ක්ෂයනිරොධය හා අච්චන්ත නිරොධය නම් අමෘතමහානිර්වාණය දක්නෙම් ආශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ ය. එම නිරොධද්වය දක්නෙම් ප්‍රශ්වාසය කෙරෙමියි දැන හික්මෙන්නේය. අමෘතමහානිර්වාණයට පනින්නා වූ විපස්සනාමාර්ගය දක්නෙම් ආශ්වාසය කෙරෙමි යි දැන හික්-මෙන්නේ ය. අමෘතමහානිර්වාණයට පනින්නා වූ විපස්සනා මාර්ගය දක්නෙම් ප්‍රශ්වාසය කෙරෙමි යි දැන හික්මෙන්නේ



Non-Commercial Distribution

ය යි යන මේ සොළසාකාර වූ ආනාපානසති භාවනාව ය, අමු-සොහොන් ආදියෙහි දමන ලද භයානක ව ඉදිමගියා වූ මනුෂ්‍යකුණපය දැක මාගේ ශරීරයත් මෙබඳු වූ ස්වභාව වන්නේ ය යි කියා උද්ධුමාතකසංඥව උපදවා ''උද්ධුමාතකපටික්කූලං උද්ධුමාතකපටික්-කූලං'' කියා මෙනෙහි කරන්නා වූ උද්ධුමාතක සංඥව ය, එසේ ම නිලමැසි ආදීන් විසින් පිරිවරන ලද ගැරඬිකුණපයක් සේ නිල් ව ගිය මනුෂ්‍යකුණපය දැක 'මාගේ ශරීරයත් මෙබඳු වූ ස්වභාව ඇත්තේ ය' යි කියා භාවනා කරන්නා වූ විනීලක සංඥව ය, නොයෙක් තැනින් සිල් ව ගෙණ සම ඉගිල කුණුදිය **(413)** වැහෙන්නා වූ දුර්ගන්ධ වූ මනුෂ්‍යකුණපය දැක 'මාගේ ශරීරයත් මෙබඳු වූ ස්වභාව ඇත්තේ ය' යි සිතා භාවනා කරන්නා වූ විපුබ්බක සංඥව ය, එසේ ම නොයෙක් තැන සිදුරු ඇති[1] දුර්ගන්ධ වැහෙන්නා වූ භයානක වූ මනුෂ්‍යකුණපය දැක 'මාගේ ශරීරයත් මෙබඳු වූ ස්වභාව ඇත්තේ ය' යි සිතා භාවනා කරන්නා වූ විච්ඡිද්‍රක සංඥව ය, එසේ ම සොහොන්හි දමන ලද්ද වූ කාක උකුසු ශෘගාලාදීන් විසින් ඔවුනොවුන් පරදවා ඒ ඒ තෙනින් මස් කඩා කන ලද්ද වූ මනුෂ්‍යකුණපය දැක 'මාගේ ශරීරයත් මෙබඳු වූ ස්වභාව වන්නේ ය' යි දැන සිතා භාවනා කරන්නා වූ වික්ඛායිතක සංඥව ය, මනුෂ්‍යඝාතනස්ථානාදියෙහි හස්ත පාද හිස් සිඳ ඒ ඒ දෙස්හි දමන ලද භයානක වූ මෘතශරීර දැක 'මාගේ ශරීරයත් මෙබඳු වූ ස්වභාව වන්නේ ය' යි සලකා භාවනා කරන්නා වූ වික්ඛිත්තක සංඥව ය, එසේ ම සකල ශරීරය ශස්ත්‍රයෙන් කාකපාදකාර යෙන් සැත් එළා හස්තපාදහිස් සිඳ සොහොන්හි දමන ලද්ද වූ භයානක වූ මනුෂ්‍යකුණපය දැක 'මාගේ ශරීරයත් මෙබඳු වූ දුක් නො ඉක්ම සිටියේ ය' යි සිතා මෙනෙහි කරන්නා වූ හතවික්ඛිත්තක කර්මස්ථාන භාවනාව ය, රාජනියොගාදියෙන් සත්වඝාතන ස්ථානයෙහි රුධිරයෙන් ආලේප වූ කවන්ධරූපාදිය දැක 'මාගේ ශරීරයත් මෙබඳු වූ ස්වභාව ඇත්තේ ය' යි සලකා භාවනා කරන්නා වූ ලොහිතක සංඥව ය, සොහොන්හි කුණු ව නවද්වාරයෙන් කෘ වදින නොයෙක් පණුවන්ගෙන් හා සකල ශරීරය පණුරාශියක් වැනි වූ බැලිය නො හැක්කා වූ සංසාර ආලය සිඳුවන්නා වූ මනුෂ්‍යකුණපය දැක, 'අහෝ! මාගේ ශරීරයත් මෙබඳු වූ ස්වභාව වන්නේ ය' යි සිතා පුලවක සංඥව උපදවා 'පුලවකපටික්කූලං පුලවක පටික්කූලං' යි මෙනෙහි කරන්නා වූ පුලවක සංඥව ය, එසේ ම සොහොන්හි දිරා පහ ව ගිය මස් ලේ නහර වෙළුම් ඇති ඇටකටු රාශිය දැක 'අහෝ! මාගේ මේ ශරීරයත් ඇටසැකිල්ලකැ' යි සිතා 'අට්ඨික පටික්කූලං අට්ඨික පටික්කූලං' යි මෙනෙහි කරන්නා වූ අස්ථික සංඥ කර්මස්ථාන භාවනාව ය, හිතාහිත වූ සකලසත්වයන් කෙරෙහි මෛත්‍රී පතුරුවා 'සබ්බෙ සත්තා අවෙරා හොන්තු, අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු' යනාදීන් මෛත්‍රීකරණයෙන් ජනිත වන මෛත්‍රී සංඥධ්‍යානචිත්තය, 'පරදුක්ඛෙ සති සාධූනං මනො කම්පනං කරොතීති

1. තැනින් සිදුරු දැක

Non-Commercial Distribution

කරුණා. කිණාති වා පරදුක්ඛං හිංසති විනාසෙතීති කරුණා' යනුවෙන් අනුන්ට වන් දුකක් ඇති කල්හි සත්පුරුෂයන්ගේ සිත කම්පා කෙරේ නු යි, අනුන්ගේ දුක් ගණී නු යි නසා නු යි විනාශ කෙරේ නු යි කරුණා නම් වූ කරුණාව හිතාහිත වූ සකල සත්වයන් කෙරෙහි පතුරුවා වඩන්නා වූ කරුණාසංඥධ්‍යාන චිත්ත ය, ඓශ්වර්ය යශශ් ශ්‍රී සම්පත්තිප්‍රතිලාභයෙන් සජ්ජිත වූවන් දැක 'අහෝ! සාධු, අහෝ! සාධු' යි කියා ප්‍රමුදිත වන්නා වූ මෘදුචිත්තය හිතාහිත වූ සකලසත්වයන් කෙරෙහි පතුරුවා විහරණය කරන්නා වූ මුදිතාසංඥධ්‍යාන චිත්ත ය, හිතාහිත වූ සකල සත්වයන් කෙරෙහි මධ්‍යස්ථාකාර වූ උපෙක්ෂාවිහරණයෙන් යුක්ත වූ ධ්‍යානචිත්ත ය, 'සර්වඥතිමිත්‍රාමාත්‍ය ධනසැපත් හැර නො කැමැති පරිද්දෙන් ම මේ ජීවිතය මරුමුඛයට යන්නේ ය' යි කියා නිරන්තරයෙන් සිහි කරන්නා වූ මරණානුස්සති භාවනාව ය, 'මේ ශරීරය (414) නව ද්වාරයෙන් වැහෙන අසුචියෙන් හා දෙතිස්කුණපකොට්ඨාසයෙන් ගැවසී ගත්තේ ය' යි කියා භාවනා කරන්නා වූ කායගතාසතිභාවනාව ය, මහරජාණෙනි, අප භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ විසින් මේ තාක් අරමුණු බෙදීම්හු වදරණ ලද්දහ. එහි යම් කිසිවෙක් ජාති ජරා ව්‍යාධි මරණ දුක්ඛයෙන් මිදෙනු කැමැත්තේ වී නම්, ඒ පුරුෂතෙම අරමුණු බෙදීම අතුරෙන් එක්තරා අරමුණක් ගන්නේ ය. ඒ ගත් අරමුණෙන් කාමරාගයෙන් මිදෙන්නේ ය, ද්වේෂයෙන් මිදෙන්නේ ය, මොහයෙන් මිදෙන්නේ ය, මානයෙන් මිදෙන්නේ ය, නොයෙක් දෘෂ්ටියෙන් මිදෙන්නේ ය, සංසාරයෙන් එතෙර වන්නේය, තෘෂ්ණා නමැති උදකසොතය වළක්වන්නේ ය, රාගාදි ත්‍රිවිධමලය සෝද පිරිසිදු කරන්නේ ය, සර්වක්ලේශයන් විනාශ කොට ක්ලේශමලය නැත්තා වූ පහ වූ ක්ලේශරජස් ඇති අති පරිශුද්ධ වූ සුදුසු වූ අජර වූ අමර වූ අනන්තසැප ඇති ශීතීභූත වූ නිර්භය වූ නගරොත්තම වූ අමෘතමහානිර්වාණනුවරට ගොස් අර්හත්ඵලයෙහි ලා සිත මුදන්නේ යි. මහරජාණෙනි, අප ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ හේ මේ පුෂ්පාපණය යි කියනු ලැබෙයි. සංසාර බන්ධනයෙන් මිදීයාම පිණිස කුශලකර්ම නමැති මිල ගෙණ ලොවුතුරා බුදුන්ගේ අනිත්‍යසංඥදි අනෙකාකාර වූ පුෂ්පාපණය කරා නො පමා ව එළඹෙවු. ඒ පුෂ්පාපණයෙන් අනිත්‍යාදි කිසි අරමුණක් ගෙණ සංසාර බන්ධනයෙන් මිදෙවු. එයින් කීහ:—

**"කම්මමූලං ගහෙත්වාන–ආපණං උපගච්ඡථ,**
**ආරම්මණං කිණිත්වාන–තතො මුච්චථ මුත්තියා."**

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවත් වූ ලොවුතුරා බුදුන්ගේ ගන්ධාපණය කවරේ ද?" යි විචාළෝ ය. "මහරජාණෙනි, ඒ භාග්‍යවත් වූ ලොවුතුරා බුදුන් විසින් වදරණ ලද්ද වූ සීල බෙදීම්හු ඇත. යම් ශීල සුගන්ධයකින් අනුලිප්ත වූ ලොවුතුරා බුදුන්ගේ පුත්‍ර වූ ශ්‍රාවකයෝ දෙවියන් සහිත වූ ලොකය ශීලසුගන්ධයෙන් දුම් කෙරෙති. සතර දිසායෙහි ද

Non-Commercial Distribution

අනුදිසායෙහි ද යට් සුළඟෙහි ද උඩු සුළඟෙහි ද ශීලසුගන්ධය පවත්වාලති. විශෙෂයෙන් ම පතුරුවාලති, තුන්ලොව පතුරුවා සිටිති, ඒ ශීලවිභක්තීහු කවරේ ද? යත්— ශරණ ශීලය, පඤ්ච ශීලය, අෂ්ටාංග ශීලය, දශාංග ශීලය, නිදන පාරාජික සංඝාදිශෙෂ අනියත විස්තාරොද්දෙශය යන පඤ්චොද්දෙශ පරියාපන්න වූ ප්‍රාතිමොක්ෂසංවර ශීලය යි. මහරජාණෙනි, මේ අප ලොවුතුරා බුදුන්ගේ ගන්ධාපණය යි කියනු ලැබෙයි. මහරාජනෙනි, මේ කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවත් වූ ලොවුතුරා බුදුන් විසින්—

**"න පුප්ඵගන්ධො පටිවාතමෙති-න චන්දනං තගරමල්ලිකා වා,**
**සතඤ්ච ගන්ධො පටිවාතමෙති-සබ්බාදිසා සප්පුරිසො පවාති.**

**චන්දනං තගරං වාපි-උප්පලං අථ වස්සිකී,**
**එතෙසං ගන්ධජාතානං-සීලගන්ධො අනුත්තරො.**

**අප්පමත්තො අයං ගන්ධො-යායං තගර චන්දනී,**
**යො ච සීලවතං ගන්ධො-වාති දෙවෙසු උත්තමො."**

**(415)** යන මේ ගාථා අර්ථයෙන් 'මහණෙනි, සපු දුනුකේ ආදිවූ පුෂ්පයන්ගේ සුගන්ධය උඩු සුළඟට නො පැමිණෙන්නේ ය, සඳුන් සුවඳ තුවරලා සුවඳ සීනිද්ද බොලිද්දදි සුවඳ ද උඩු සුළඟට නො යන්නේය. බුද්ධාදි සත්පුරුෂයන්ගේ ශීලසුගන්ධය වනාහි උඩුසුළඟට පැමිණෙන්නේ ය. සත්පුරුෂතෙම ශීලසුගන්ධ හෙයින් සියලු ම දශදිශාවෙහි පැතිරෙන්නේ ය. සඳුන් තුවරලා මහනෙල් දැසමන්මල් ද යන මේ කියන ලද සුගන්ධ සමූහයන්ගේ සුගන්ධයට වඩා සත්පුරුෂයන්ගේ ශීලසුගන්ධය තමහට ඉතිරියක්හු නැති හෙයින් නිරුත්තර වන්නේ යි. තුවරලා සඳුන් සම්බන්ධි වූ යම් මේ සුගන්ධයෙක් ඇද්ද, හේ මේ සුගන්ධය ස්වල්පමාත්‍ර වන්නේ ය. සිල්වත් වූ බුද්ධාදි සත්පුරුෂයන්ගේ යම් මේ ශීලසුගන්ධයෙක් ඇද්ද, හේ මේ උතුම් වූ ශීලසුගන්ධය තෙම දිව්‍යබ්‍රහ්මයන් කෙරෙහි ද හමන්නේ ය' යි කියා වදරණ ලද්දේ යි.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවත් වූ සර්වඥ රාජොත්තමයානන් වහන්සේගේ ශ්‍රීසද්ධර්මවර මහානගරවීථියෙහි ඵලාපණය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජාණෙනි, අප භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලද්ද වූ ඵලජාතියෙක් ඇති. හේ කවරේ ද? යත්— සොතාපත්තිඵලය, සකෘදගාමිඵලය, අනාගාමිඵලය, අර්හත්ඵලය, රාග ද්වෙෂ මොහාදි අකුශලයන්ගෙන් ශුන්‍ය වූ ශුන්‍යතාඵලසමාපත්තිය, රාගද්වෙෂමොහාදි අකුශලධර්මයෙහි නිමිත්තග්‍රහණයක් නැත්තා වූ අනිමිත්තඵලසමාපත්තිය, රාගද්වෙෂමොහාදිඅකුශලධර්මයන්ගේ ප්‍රාර්ථනාවක් නැත්තා වූ අප්පණිහිතඵලසමාපත්තිය යන මේ සත්වැදෑරුම් වූ ඵලයෝ ය, එහි යම්කිසි කෙනෙක් යම් ඵලයක් කැමැත්තේ වී නම්, ඒ පුරුෂතෙම කර්මස්ථාන නමැති මිල දී ප්‍රාර්ථනා කළ ඵලයක් ගන්නේ ය. ඉදින් සොතාපත්තිඵලය කැමැති නම් සොතාපත්තිඵලය ගන්නේ ය.

Non-Commercial Distribution

ඉදින් සකෘදගාමිඵලය කැමැති නම් සකෘදගාමිඵලය ගන්නේ ය. අනාගාමි ඵලය කැමැති නම් අනාගාමිඵලය ගන්නේ ය. රහත්ඵලය කැමැති නම් රහත්ඵලය ගන්නේ ය. ඉදින් ශූන්‍යතාඵලසමාපත්තිය කැමැති නම් ශූන්‍යතාඵලසමාපත්තිය ගන්නේ ය. ඉදින් අනිමිත්තඵලසමාපත්තිය කැමැති නම් අනිමිත්තඵලසමාපත්තිය ගන්නේ ය. ඉදින් අප්පණිහිත ඵලසමාපත්තිය කැමැති නම් ඒ නිවන් අරමුණු කොට ගෙණ වසන අප්පණිහිතඵලසමාපත්තිය ගන්නේ ය. මහරජාණෙනි, යම් සේ කිසි පුරුෂයක්හුගේ නිත්‍ය ඵල ඇති ආම්‍රවෘක්ෂයෙක් වන්නේ වී නම්, ඒ පුරුෂ තෙම යම්තාක් අඹ මිලයට ගන්නා වෙළෙන්දෙක් නො එළඹේ ද, ඒ තාක් කල් ඒ රුකින් ඵල නො නෙළන්නේ ය. අඹ මිලයට ගන්නා වෙළෙන්-දෙකු පැමිණි කල්හි ඔහුගේ මිල ගෙණ 'පින්වත්, වූ පුරුෂය මේ ආම්‍ර වෘක්ෂය නිත්‍ය ඵල ඇත්තේ ය. සලාටුක වූ හෝ මලාන වූ හෝ කෙසික වූ හෝ ආමය වූ හෝ විලිකුන් වූ හෝ එයින් යම් වර්ගයක් කැමැත්තෙහි නම් මෙපමණ අඹඵල ගණුව යි' කියා මෙසේ කියන්නේ ය. එකල ඒ පුරුෂතෙම තමන් දුන් ඒ මිලයෙන් ඉදින් සලාටුක අඹ කැමැත්තේ නම් සලාටුක නම් ලා අඹ ගන්නේ ය, ඉදින් දෝවිල අඹ කැමැත්තේ **(416)** නම් දෝවිල නම් බුබුල් අඹ ගන්නේ ය, ඉදින් කෙසික අඹ කැමැත්තේ නම් කෙසික අඹ ගන්නේ ය, අමුඅඹ කැමැත්තේ නම් අමුඅඹ ගන්නේ ය, ඉදින් විලිකුන් අඹ කැමැත්තේ නම, විලිකුන් අඹ ගන්නේ ය. මහරජා ණෙනි, එපරිද්දෙන් ම යමෙක් යම් ඵලයක් කැමැත්තේ වී නම්, එතෙම කර්මස්ථාන නමැති මිල දී ඉදින් සොතාපත්තිඵලාදියක් හෝ ඉදින් අප්පණිහිතඵලසමාපත්තියක් හෝ ප්‍රාර්ථිත වූ ඵලයක් ගන්නේ ය. මහ–රජාණෙනි, ත්‍රිභුවනජනවන්දනීය වූ අප භාග්‍යවතුන් වහන්සේගේ මේ ඵලාපණය යි කියනු ලැබෙයි. ධීරවීරශීලගුණාලංකෘතජනයෝ සල්පිල කරා ගොස් කර්මස්ථාන නමැති මිල දී අමෘතමහානිර්වාණඵල ග්‍රහණය කෙරෙති. අමෘතමහානිර්වාණඵලය යම් කෙනෙක් ගත්තාහු වෙද්ද, ඒ සුගතොවාදකාරී ජනයෝ ඒ නිර්වාණඵලය ගැණීමෙන් සියලු ම සංසාර දුක් ගෙවා සුවපත් වෙති. එයින් කීහ—

**''කම්මමූලං ජනා දත්වා–ගණ්හන්ති අමතප්ඵලං,**
**තෙන තෙ සුඛිතා හොන්ති–යෙ කීණා අමතප්ඵලා''යි.**

''පින්වත් වූ මාගේ නාගසෙන ස්ථවිරොත්තමයානන් වහන්ස, භාග්‍යවත් වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේගේ අගද නම් සල්පිල කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජාණෙනි, යම් බෙහෙදක් කරණ කොට ගෙණ ඒ අප ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ දිව්‍යබ්‍රහ්මයන් සහිත වූ ලොකයා රාගාදික්ලේශවිෂයෙන් මුදා වදරණ සේක් ද, ඒ බෙහෙත්හු අප භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලද්දහු ය. ඒ බෙහෙත් කවරේ ද? යි යත හොත්— මහරජාණෙනි, ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ චතුරාර්යසත්‍ය කෙනෙක් වදාරණ ලද්දහු ද, ඒ කවරේ ද? යත්— **'ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි**

*Non-Commercial Distribution*

**දුක්ඛො'** යනාදීන් වදළා වූ දුක්ඛසත්‍යය සසර රාගාදි කෙලෙසුන් විසින් පෙළෙන බැවින් පීළනට්ඨයෙන් ද, හෙතු නිසා උපන් පඤ්චස්කන්ධය හෙයින් සංඛතට්ඨයෙන් ද, රාගාදි කෙලෙසුන් විසින් තවන බැවින් සන්තාපට්ඨයෙන් ද, කාමභවාදි නවභවයෙහි පඤ්චස්කන්ධය සිටි වන නො සිට පෙරළීමෙන් විපරිණාමට්ඨයෙන් ද යන මේ සතරධර්මයෙන් යුක්ත වූ දුඃඛසත්‍යය දුක්ඛව බුද්ධාදි ආර්යයන් විසින් සත්‍යය යි කියා දක්නා ලද හෙයින් ආර්ය සත්‍ය නම් වූ දුඃඛාර්යසත්‍යය ද, **'යායං තණ්හා පොනොභවිකා'** යනාදීන් වදළා වූ දුක්ඛසමුදයසත්‍යය කුශලාකුශල කර්මයන් රැස් කරන්නා වූ ආයූහනට්ඨයෙන් ද, සසර හා එක් කොට යොදන්නා වූ සංයොගට්ඨයෙන් ද, සංසාරයෙහි ම පිහිටුවන්නා වූ නිදනට්ඨයෙන් ද, සසර බලා නිවන් වළකා අනාදිමත් සසර සිටුවන්නා වූ පළිබොධයෙන් ද යන මේ සතරධර්මයෙන් යුක්ත වූ සමුදයසත්‍යය දුක් උපද වනබව සත්‍යය යි කියා බුද්ධාදි ආර්යයන් විසින් දක්නා ලද හෙයින් දුක්ඛසමුදයාර්යසත්‍යය නම් වූ සමුදයයාර්යසත්‍යය ද, ඒ ත්‍රිවිධ වූ තෘෂ්ණාවගේ සර්වප්‍රකාරයෙන් ම යම් ප්‍රහාණයෙක් ඇද්ද යනාදීන් වදළා වූ දුක්ඛනිරොධාර්යසත්‍යය එකිනෙකට දුරු වූ අහස පොළොව මෙන් ද, මුහුදු එතෙර මෙතෙර වෙරළ මෙන් ද සසර හා **(417)** නො හැනි ඉක්ම සිටිනා වූ නිස්සරණට්ඨයෙන් ද, සසර නමැති මහනපුරු කතරින් වෙන් වූ නිරාකුල වූ විවෙකස්ථාන වූ විවෙකට්ඨයෙන් ද, හෙතු නිසා නො උපන්නා වූ අසංඛතට්ඨගුණයෙන් ද, යට අජටාකාශයෙහි පටන් මත්තෙන් භවාග්‍රය පරියන්ත කොට ඇති සරස අනන්තාපරිමාණ සක්වළ තමා හා සමාන රසයක් නැත්තා වූ අමතට්ඨගුණයෙන් ද යන මේ සතරධර්මයෙන් යුක්ත වූ නිරොධසත්‍යය මෙතෙකින් දුක් නිරුද්ධ වන බව සත්‍ය ය යි කියා බුද්ධාදි ආර්යයන් විසින් දක්නා ලද බැවින් දුක්ඛනිරොධාර්යසත්‍ය නම් වූ නිරොධ සත්‍යය ද, 'සම්මාදිට්ඨි සම්මාසංකප්පො' යනාදීන් වදළා වූ ආර්යඅෂ්ටාංගික මාර්ගසංඛ්‍යාත වූ දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදර්යසත්‍යය නිවන් පසක්කරණයෙන් යුක්ත වූ නියයානට්ඨගුණයෙන් ද, නිවන් දක්වන බැවින් යුක්ත වූ දස්සනට්ඨගුණයෙන් ද, නිවණට ම හෙතු බැවින් හෙතට්ඨ ගුණයෙන් ද. සියලු ම අනන්තාපරිමාණ සක්වළ තමා හා සම කෙනෙකුන් නැත්තා වූ අධිපතිගුණයෙන් ද යන මේ සතරධර්මයෙන් යුක්ත වූ මාර්ගසත්‍යය දුක් නිරුද්ධ කිරීම පිණිස පැමිණෙන්නා වූ ප්‍රතිපදව සත්‍යය යි කියා බුද්ධාදි ආර්යයන් විසින් දක්නා ලද බැවින් දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදර්යසත්‍ය නම් වූ මාර්ගසත්‍යය යි ද යන මේ සොළොසාකාර වූ චතුස්සත්‍යධර්මයෝ අප ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලද්දෝ ය. එහි චතුරාර්යසත්‍යය අවබොධය කැමැත්තා වූ යම් කිසි කෙනෙක් බුදුන් කරා එළඹ සුගතොවාදධර්මය අසද් ද, ඒ සුගතොවාදකාරීහු ජාතිදුකෙන් මිදෙති, ජරාදුකින් මිදෙති, මරණදුකින් මිදෙති, සොකපරිදෙවදුක්ඛ දෞර්මනස්‍ය උපායාසයෙන් මිදෙති, මහරජානෙනි. ත්‍රිභුවනෛකප්‍රදීපායමාන වූ අප භාග්‍යවතුන් වහන්සේගේ මේ 'අගදපණ ය' යි කියනු ලැබේ.

Non-Commercial Distribution

ලොකයෙහි විෂ ප්‍රතිබාහනය කරන්නා වූ යම් කිසි අගද නම් භෛෂජ්‍ය කෙනෙක් ඇද්ද, ඒ අගදයෝ වනාහි ලෞකිකව්‍යාධි නසති. එහෙයින් සද්ධර්මාගදය හා සදෘශයෙක් නැත්තේ ය. මහණෙනි, මේ සද්ධර්මාගදය පානය කරව්. එයින් වදළහ:—

**"යෙ කෙචි ලොකෙ අගදා-විසානං පටිබාහකා,**
**ධම්මාගද සමං නත්ථි-එතං පිවථ භික්ඛවො"-යි.**

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවත් වූ සර්වඥරාජොත්තම යානන් වහන්සේගේ ඖෂධාපණය කවරේ දැ?" යි විචාළෝ ය. මහ රජානෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ඖෂධජාතීහු ද වදරණ ලද්දහු ය. යම් ඖෂධ කෙනෙකුන් කරණ කොට ගෙණ ඒ භාග්‍යවත් වූ සර්වඥයන් වහන්සේ දිව්‍යමනුෂ්‍යයන්ට පිළියම් කරණසේක් ද, හේ කවරේ ද? යත්— ශරිරය දෙතිස්කුණපකොට්ඨාස කොට බලා කය අසුභ කොට දක්නා කායානුපස්සනාව ය, ත්‍රිවිධවෙදනාදි නොයෙක් වෙදනා හෙයින් කය දුක් කොට දක්නා වෙදනානුපස්සනාව ය, චිත්තයාගේ උප්පදට්ඨිතිභංගය දැක සිත අනිත්‍ය කොට දක්නා චිත්තානුපස්සනාව ය, පඤ්චස්කන්ධාදි වූ ධර්මපුඤ්ජය දැක ආත්මය අනාත්මය කොට දක්නා ධර්මානුපස්සනාව ය යන සතර සති **(418)** පට්ඨානය ද, නො උපන් අකුසල් නො උපැද්ද දෙන බව ය, උපන් අකුසල් දුරු කරණ බව ය, නො උපන් කුසල් උපදවන බව ය, උපන් කුසල් තහවුරු කරණ බව ය යන මේ වීර්ය ශක්ති හෙයින් ප්‍රධානත්වයට ගියා වූ සතරසම්‍යක්ප්‍රධානයෝ ද, දන ශීල භාවනා පාදක කොට ගෙණ බුදුබව කෙළවර කොට ඇති සිතු පැතු තාක් සකල සමෘද්ධි සිද්ධකරණයෙන් ඍද්ධිපාද නම් වූ ඡන්දිද්ධිපාදය යනු භාවනා කළ මැනැවැ යි යන සිත ය, විරියිද්ධිපාදය යනු නිවන් සොයා මුත් නො පසුබස්නා වීර්ය ය, චිත්තිද්ධිපාදය යනු සිත වසඟ කරණ බව ය, විමංසිද්ධිපාදය යනු නුවණ ය යන මේ සතර ඍද්ධිපාදයෝ ද, අශ්‍රද්ධාව මැඩ ආධිපත්‍යය කරන්නා වූ ශ්‍රද්ධෙන්ද්‍රිය ද, කුසීතභාවය මැඩ ඉන්ද්‍රත්වය කරන්නා වූ විරියින්ද්‍රිය ද, මුට්ඨස්සතිය මැඩ ඉන්ද්‍රත්වය කරන්නා වූ සතින්ද්‍රියය ද, සිත නො සන්හුන් බව ය යි කියන ලද උද්ධච්චය මැඩ ඉන්ද්‍රත්වය කරන්නා වූ සමාධින්ද්‍රියය ද, නුනුවණ මැඩ ආධිපත්‍යය කරන්නා වූ පඤ්ඤින්ද්‍රිය ය ද යන මේ පාඤ්චෙන්ද්‍රිය ය ද, අශ්‍රද්ධාවෙන් කම්පා නො වන්නා වූ ශ්‍රද්ධාබලය ද, කුසීතභාවයෙන් කම්පා නො වන්නා වූ වීර්යබලය ද, මුට්ඨස්සතියෙන් කම්පා නො වන්නා වූ ස්මෘතිබලය ද, උද්ධච්චයෙන් කම්පා නො වන්නා වූ සමාධිබලය ද, අවිද්‍යාවෙන් කම්පා නො වන්නා වූ ප්‍රඥබලය ද යන මේ පඤ්චබලයෝ ද, නිවන් ගන්නට භාවනා කරණ 'බොධි' නම් වූ පුද්ගලයාහට අංග වූ සතිසම්බොජ්ඣංග සංඛ්‍යාත වූ සිහිය ද, ධර්මවිචයසම්බොජ්ඣංග සංඛ්‍යාත වූ නුවණ ද, වීර්යසම්බොජ්ඣංග සංඛ්‍යාත වූ වීර්යය ද, ප්‍රීතිසම්බොජ්ඣංග සංඛ්‍යාත වූ ප්‍රීතිය ද, පස්සද්ධිසම්බොජ්ඣංග සංඛ්‍යාත වූ කය හා සිත හා දෙක සංසුන් බව ද, සමාධිසම්බොජ්ඣංග සංඛ්‍යාත වූ සිත එකඟ ව ගිය බව ද, උපෙක්ඛා

Non-Commercial Distribution

සම්බොජ්ඣංග සංඛ්‍යාත වූ උපෙක්ෂාව ද යන මේ සප්තබොජ්ඣංගයෝ ද, බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ මහරහතන්වහන්සේලා අනාර්ය වූ පෘථග්ජනයන් ආර්ය කරවා ගෙණ නිර්වාණපුරයට වැඩ වදලා වූ අසාධාරණගුණ සහිත වූ මාර්ගය වූ හෙයින් ආර්යඅෂ්ටාංගිකමාර්ගය නම් වූ මිථ්‍යාදෘෂ්ටියෙන් පහ වූ සම්‍යක්දෘෂ්ටිය ද, මිථ්‍යාකල්පනාවෙන් පහ වූ සම්‍යක් කල්පනාව ද, මිථ්‍යාවචනයෙන් පහ වූ සම්‍යක්වචනය ද, මිථ්‍යාකර්මාන්තයෙන් පහ වූ සම්‍යක් කර්මාන්තය ද, මිථ්‍යා ආජීවයෙන් පහ වූ සම්‍යක් ආජීවය ද, මිථ්‍යා ව්‍යායාමයෙන් පහ වූ සම්‍යක් ව්‍යායාමය ද, මිථ්‍යා සිහියෙන් පහවූ සම්‍යක් සිහිය ද, මිථ්‍යා සමාධියෙන් පහ වූ සම්‍යක් සමාධිය ද යන මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ද, මෙසේ සත්තිස්බොධිපාක්ෂික වූ ධර්ම නමැති ඖෂධයන් කරණ කොට ගෙණ අප ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ දෙසැටමිථ්‍යාදෘෂ්ටි නමැති ආමය විරෙක කරවනසේක. මිථ්‍යාකල්පනාව විරෙක කරවනසේක. මිථ්‍යාවචනය විරෙක කරවනසේක. මිථ්‍යා කර්මාන්තය විරෙක කරවනසේක. මිථ්‍යාජීවය විරෙක කරවනසේක, මිථ්‍යාව්‍යායාමය විරෙක කරවනසේක, මිථ්‍යාස්මෘතිය විරෙක කරවනසේක, මිථ්‍යාසමාධිය විරෙක කරවනසේක, ලොභය වමනය කරවා වදරණසේක, ද්වෙෂය වමනය කරවා වදරණසේක, මොහය වමනය කරවා වදරණසේක, මානය වමනය කරවා වදරණසේක, දෘෂ්ටිය වමනය කරවා වදරණසේක, බුද්ධාදී **(419)** අටතැන්හි කාංක්ෂා කරන්නා වූ විචිකිච්ඡාව වමනය කරවා වදරණසේක. සිත නොසන්හුන් බව ය යි කියන ලද උද්ධච්චය වමනය කරවා වදරණසේක, චිත්තයාගේ හැකිළීම ය යි කියන ලද ථීනය හා කාය අකර්මණ්‍ය ය යි කියන ලද මිද්ධය වමනය කරවා වදරණසේක. ගම්හුරා අසූචියට කැත නැත්තා සේ පාපයට කැත නැත්තා වූ අහිරිකබව හා පොළහැටියා පානට නො බා පනින්නා සේ පාපයට නො බා ච ම පනින්නා වූ අනොතප්පබව වමනය කරවා වදරණසේක. සර්වක්ලේශ වමනය කරවා වදරණසේක. මහරජානෙනි, ත්‍රිභුවනජනවන්දනීය වූ අප භාග්‍යවතුන් වහන්සේගේ මේ ඖෂධාපණ ය යි කියනු ලැබෙයි. ලොකයෙහි නානා ප්‍රකාර වූ බොහෝ වූ යම් කිසි ඖෂධ කෙනෙක් විද්‍යමාන වෙද්ද, ඒ ඖෂධ කෙනෙක් වුවත් සද්ධර්මඖෂධය හා සම වූ ඖෂධයක් නැත්තේ ය. මහණෙනි, මෙ සද්ධර්මඖෂධය පානය කරවු. නවවිධ විදර්ශනාඥනය වඩා සමාධිධර්මය ස්පර්ශ කොට සද්ධර්මෞෂධය පානය කොට සර්ව ක්ලේශොපධික්ෂය කිරීමෙන් පිරිනිවියාහු අජරාමර වන්නාහු ය. මෙම වදරණ ලද්දේ මැයි:—

**'යෙ කෙචි ඔසධා ලොකෙ–විජ්ජන්ති විවිධා බහු,**
**ධම්මොසධසමං නත්ථි–එතං පිවථ භික්ඛවො.**

**ධම්මොසධං පිවිත්වාන–අජරාමරණා සියුං,**
**භාවයිත්වාන පස්සිත්වා–නිබ්බුතා උපධික්ඛයෙ' යි.**

*Non-Commercial Distribution*

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවත් වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේගේ අමෘතාපණය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, අප ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ යම් අමෘතයකින් දෙවියන් සහිත වූ ලොකයා අභිෂෙකය කර වදාළසේක් ද, යම් අමෘතයකින් අභිෂික්ත වූ දිව්‍යමනුෂ්‍යයෝ ජාති ජරා ව්‍යාධි මරණ සොක පරිදෙව දුක්ඛ දෞර්මනස්‍ය උපායාසයෙන් මිදුනාහු ද, ඒ අමෘතයත් අප භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. ඒ අමෘතය කවරේ ද? යත හොත්— යම් මේ කායගතාසති භාවනාව යි. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ භාග්‍යවතුන් වහන්සේ විසින් 'යම්කිසි කෙනෙක් කායගතාසති භාවනාව (සිත නමැති) මුඛයෙන් අනුභව කෙරෙත් නම් මහණෙනි, ඒ මාගේ වෛනෙයජනයෝ අමෘතරසය අනුභව කරන්නාහු ය' යි කියා වදාරණ ලද්දේ ය. මහරජානෙනි, සද්ධර්ම චක්‍රවර්ති වූ භාග්‍යවතුන් වහන්සේගේ මේ අමෘතාපාණය යි කියනු ලැබෙයි. 'සකලජනනයන රසායන වූ ලොවුතුරා සර්වඥයන් වහන්සේ සංසාරව්‍යාධියෙන් පිඩිත වූ ජනසමූහයා දැක කායගතාසති නමැති අමෘතාපණය ප්‍රසාරණය කර වදාළසේක් ද, සංසාරයෙහි භය දක්නා සුලු වූ භික්ෂූනි, ඒ සල්පිල් කරා ගොස් කර්මස්ථාන මිල දී ගෙණ කායගතාසති අමෘතරසය අනුභව කරවූ. එයින් කියන ලදී:—

**''බ්‍යාධිතං ජනතං දිස්වා–අමතාපණං පසාරයි,**
**කම්මෙන තං කිණිත්වාන–අමතං ආදෙථ භික්ඛවො'' යි.**

**(420)** ''භවත් නාගසෙන ස්ථවිරොත්තමයානන් වහන්ස, භාග්‍යවත් වූ සර්වඥයන් වහන්සේගේ රත්නාපණය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් රත්නජාතිය ද වදාරණ ලද්දේ ය. යම් රතනාලංකාරයකින් සැරහුනා වූ සර්වඥපුත්‍ර වූ ශ්‍රාවකයෝ දෙවියන් සහිත වූ ලොකයා බබුළුවති: ඔභාසය කෙරෙති, ප්‍රභා කෙරෙති, තමනුත් දිලියෙති, විශෙෂයෙන් ම දිලියෙති, ඌර්ධවාධො සරස ආලොකයන් දක්වති, ඒ රත්නයෝ කවුරු ද? යත්— ශීලරත්නය සමාධිරත්නය ප්‍රඥරත්නය විමුක්තිරත්නය විමුක්තිඥනදර්ශනරත්නය ප්‍රතිසම්භිද රත්නය බොද්ධ්‍යංගරත්නය යි. මහරජානෙනි, ඒ ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ ශීලරත්නය නම් කවරේ ද? යත්— ප්‍රාතිමොක්ෂසංවරශීලය, ඉන්ද්‍රියසංවරශීලය, ආජීවපාරිශුද්ධිශීලය, ප්‍රත්‍යයසංනිශ්‍රිතශීලය, චුල්ල ශීලය, මධ්‍යමශීලය, මහාශීලය, මාර්ගශීලය ඵලශීලය. මහරජානෙනි, ශීල රත්නයෙන් සැරහුනා වූ පුරුෂයාහට දෙවියන් සහිත වූ ලොකවාසී සත්ව තෙම ද මරුන් සහිත වූ බ්‍රහ්මයන් සහිත වූ ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත වූ සත්වතෙම ද කැමැති වන්නේ ය. නැවැත නැවැතත් ප්‍රාර්ථනා කරන්නේ ය. මහරජානෙනි, ශීලරත්නය පැළැන්ද වූ භික්ෂූන් වහන්සේ දිශායෙහි ද අනුදිශායෙහි ද උඩ බඹලොව දක්වා ද යට අජටාකාශය දක්වා ද සරස අනන්තා පරිමාණ සක්වලෙහි ද බබළනසේක. ඉනා මහත් ව බබළනසේක. යටින් අවීචිය හා මත්තෙන් භවාග්‍රය දක්වා මේ තාක්

Non-Commercial Distribution

අතර ඇත්තා වූ සර්වරත්නජාතීන් අතික්‍රාන්ත කොට විශෙෂවත් කොට අජ්ඣොත්ථරණය කොට සිටිනාසේක. මහරජානෙනි, මෙබඳු වූ ශීල රත්නජාතිහු ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ රත්නාපණයෙහි සඳන ලද්දහ. මහරජානෙනි, අනන්තඥානගොචර වූ ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ මේ 'ශීලරත්නය' යි කියනු ලැබෙයි. මෙබඳු වූ ශීලරත්න ජාතිහු ලොවුතුරා බුදුන්ගේ සල්පිල්හි ඇත්තාහ, 'කර්මස්ථානයෙන් ඒ රත්න ගෙණ භික්ෂූනි, තෙපි ශීලරත්නය පලඳිව්' කීවේ මැනෝ:—

**''එවරූපානි සීලානි-සන්ති බුද්ධස්ස ආපණෙ,**
**කම්මෙන තං කිණිත්වාන-රතනං වො පිළන්ධථ'' යි.**

''මහරජානෙනි, අප ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ සමාධි රත්නය කවරේ ද? යත්— සමාධි ය යි කියන ලද අනවද්‍ය සුබලක්ෂණ වූ චිත්තෛකාග්‍රතා තොමෝ ඝණ්ඨාභිජාත ශබ්දයක් මෙන් පවත්නා වූ විතර්කය සහිත බැවින් හා එම අනුරාවය වැනි වූ විචාරය සහිත බැවින් සවිතර්ක සවිචාර සමාධි නම් වූ 'ඣෙ-චින්තායං' යන ධාතුවට සිද්ධ වූ ප්‍රථමද්ධ්‍යාන සමාධිය ද, නීවරණසතුරන්ට ආසන්න වූ අරමුණු සිතීමෙහි දෙෂ දැකීමෙන් හා විචාරයෙහි ආදීනව නො දක විචාරය ම ඒකාන්ත ශාන්ත ය යි දක විතර්කය ප්‍රහාණය කොට විචාරමාත්‍රයක් ඇති ද්විතීය ධ්‍යානය උපදවා වසන්නේ ය. යන මේ අවිතර්ක විචාරමාත්‍ර වූ සමාධිය ද, තෘතීය චතුර්ථ පඤ්චමධ්‍යානත්‍රයයෙහි චිත්තෛකාග්‍රතාව විතර්ක විචාරද්වය විරහිත හෙයින් අවිතර්ක අවිචාර සමාධි නම් වූ ලෞකික ලොකොත්තරාදිය විසින් ද සප්‍රීතික සුඛ උපෙක්ෂා විසින් ද බහුප්‍රකාර වූ අවිතර්ක අවිචාර සමාධිය ද, **(421)** රාගාදිඅකුශලධර්මයන්ගෙන් ශූන්‍ය වූ ශූන්‍යතා සමාධිය ද, රාගාදි ත්‍රිවිධ අකුශලධර්මයන්ගේ නිමිත්තග්‍රහණයක් නැත්තා වූ අනිමිත්තසමාධිය ද, රාග ද්වෙෂ මොහාදි අකුශලධර්මයන්ගේ ප්‍රණිධියක් නැත්තා වූ අප්‍රණිහිත සමාධිය ද යන මොහු සමාධිරත්නයෝ ය. මහරජා නෙනි, සමාධිරත්නය පැලැන්ද වූ භික්ෂූන් වහන්සේගේ යම් ඒ කාම විතර්ක කෙනෙක් ඇද්ද, ව්‍යාපාද විතර්ක කෙනෙක් ඇද්ද, විහිංසාවිතර්ක කෙනෙක් ඇද්ද, මානොද්ධච්ච දෘෂ්ටි විචිකිච්ඡාදි ක්ලේශවස්තු කෙනෙක් ඇද්ද, නානා ප්‍රකාර වූ ලාමක අකුශලවිතර්ක කෙනෙක් ඇද්ද, ඒ සියලුම අකුශලධර්මයෝ ඒකාරම්මුණෙහි චිත්ත චෛතසිකයන්ගේ පිඩු ව නො විසිර පිහිටියා වූ සමාධිය කරා පැමිණ විසිරෙති. විධමනය වෙති. විධ්වංසනය වෙති. නො සිටිති, සිත්හි නො ඇලී පහ ව යෙති. මහරජා-නෙනි, යම් සේ නෙළුම් පත්‍රයෙහි ජලය විසිර යන්නේ ය. විධමනය වන්නේ ය, විධ්වංසනය වන්නේ ය, නො පිහිටන්නේ ය, නො ඇලෙන්-නේ ය, ඊට කාරණා කවරේ ද? යත්— පියුම් පත්‍රයාගේ පිරිසිදු බැවින. මහරජානෙනි, එපරිද්දෙන් ම සමාධිරතනාලංකාරයෙන් සැරහුනා වූ භික්ෂූන් වහන්සේගේ යම් ඒ කාමවිතර්ක කෙනෙක් ඇද්ද, ව්‍යාපාද විතර්ක කෙනෙක් ඇද්ද, විහිංසා විතර්ක කෙනෙක් ඇද්ද, මානොද්ධච්ච

Non-Commercial Distribution

දෘෂ්ටි විචිකිච්ඡා ක්ලේශවස්තු කෙනෙක් ඇද්ද, නානාප්‍රකාර වූ ලාමක විතර්ක කෙනෙක් ඇද්ද, ඒ සියලු ම අකුශලධර්මයෝ සමාධිය කරා පැමිණ විසිරෙත්. විධමනය වෙත්, විධ්වංසනය වෙත්, නො සිටිත්, නො ඇලෙත්, ඊට හේතු කවරේ ද? යත්— උපෙක්ෂාපාරිශුද්ධි චිත්තෛකාග්‍රතාසමාධියගේ අත්‍යන්තපරිශුද්ධ බැවිනි. මහරජානෙනි, සකල වෛනෙයජන කුමුදවන ප්‍රබොධ කරණයෙහි සූර්යදිව්‍යරාජයා වැනි වූ ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ මේ සමාධිරත්නය යි කියනු ලැබෙයි. මහරජානෙනි, මෙබඳු වූ සමාධිරත්නජාතීහු ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ රත්නාපණයෙහි සදන ලද්දාහු යි. සමාධිරත්නමාලයෙන් සැරහුනා වූ රහතන් වහන්සේගේ චිත්තසන්තානයෙහි ක්ලේශකාමාදීන්ගේ ප්‍රතිලාභය සිතීම ය යි කියන ලද කාමවිතර්කාදි ලාමකවිතර්කයෝ නො උපදනා ලැබෙත්. සමාධියගේ වශීප්‍රාප්ත වූ භික්ෂූන් වහන්සේගේ චිත්තය, විදුර නො දිරන්නා සේ, නො පෙළෙන්නේ ය. පින්වත්නි, සසර දුක් ගෙවනු කැමතියාහු නම්, තෙපි ද මේ රත්නාලංකාරය අප ලොවුතුරා බුදුන්ගේ සල්පිලින් ලබා ගණිව්. වදළේ මැනෝ:—

**"සමාධිරතනමාලස්ස-කුවිතක්කා න ජායරෙ,**
**න ච වික්ඛිපතෙ චිත්තං-එතං තුම්හෙ පිළන්ධථ" යි.**

"මහරජානෙනි, ලොවුතුරා බුදුන්ගේ ප්‍රඥාරත්නය කවරේ ද? යත්— මහරජානෙනි, යම් ප්‍රඥාවක් කරණ කොට ගෙණ ආර්යශ්‍රාවකයන් වහන්සේ මේ කුශලධර්මය යි කියා තත් වූ පරිද්දෙන් දැන ගන්නාසේක් ද, මේ අකුශලධර්මය යි කියා ද තත් වූ පරිද්දෙන් දැන ගන්නාසේක් ද, මේ සාවද්‍යධර්ම ය යි කියා ද, මේ නිරවද්‍ය ය යි කියා ද, මේ සෙවිතව්‍ය ය, මේ අසෙවිතව්‍ය ය යි **(422)** කියා ද, 'මේ හීන ය, මේ ප්‍රණීත ය' යි කියා ද, 'මේ කෘෂ්ණ ශුක්ල සප්‍රතිභාග ධර්ම ය' යි කියා තත් වූ පරිද්දෙන් දැන ගන්නාසේක් ද, මේ දුඃඛසත්‍යය යි කියා තත් වූ පරිද්දෙන් දැන ගන්නාසේක් ද, මේ දුඃඛසමුදයසත්‍යය යි කියා තත් වූ පරිද්දෙන් දැන ගන්නාසේක් ද, මේ දුඃඛනිරොධසත්‍යය යි කියා තත් වූ පරිද්දෙන් දැන ගන්නාසේක් ද, මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාව ය යි කියා තත් වූ පරිද්දෙන් දැන ගන්නාසේක් ද, මහරජානෙනි, ශාක්‍යකුල ප්‍රසූත වූ අප ලොවුතුරා බුදුන්ගේ මේ ප්‍රඥාරත්නය යි කියනු ලැබේ. ප්‍රඥාරත්න නමැති මාලාලංකාරයෙන් සැරහුනා වූ භික්ෂූන් වහන්සේගේ භව සංඛ්‍යාත වූ පඤ්චස්කන්ධය බොහෝ කලක් නො පවත්නේ ය. ඒ භික්ෂූන් වහන්සේ ත්‍රිවිධභවය ම නො කැමැති වනසේක. වහාම අමෘතමහානිර්වාණය ස්පර්ශ කරණසේක. වදළේ මැනෝ:—

**"පඤ්ඤාරතනමාලස්ස-න චිරං වත්තතෙ භවො,**
**ඛිප්පං ඵස්සෙති අමතං-න ච සො රොචතෙ භවෙ" යි.**

Non-Commercial Distribution

"මහරජානෙනි, ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ විමුක්ති රත්නය කවරේ ද? යත්— මහරජානෙනි, විමුක්තිරත්නය යි කියා අර්හත් ඵලය කියනු ලැබෙයි. මහරජානෙනි, රහත්ඵලයට පැමිණියා වූ භික්ෂූන් වහන්සේ 'විමුක්තිරත්නය පලඳිනා ලද්දේ ය'යි කියනු ලැබෙයි. මහරජානෙනි, යම් සේ මුක්තාකලාප මාණික්‍ය ස්වර්ණ ප්‍රවාලාභරණයෙන් සැරහෙන ලද්ද වූ අගරු කළුඅගිල් තුවරලා තලිස් රත්හඳුන් ආලෙප කරණ ලද දෙහය ඇත්තා වූ නාග පුන්නාග ශාල සල්ල සපු සීනිද්ද යොහොඹු පළොල් උපුල් දෑසමන් බෝලිද්දදි මලින් සැරහෙන ලද්ද වූ උත්තම ශ්‍රීධර පුරුෂතෙම මාලාගන්ධ රත්නාභරණයන් කරණ කොට ගෙණ සෙසු ජනයා ඉක්මවා බබළන්නේ ය. විශෙෂයෙන් බබළන්නේ ය. ඕභාස වන්නේ ය, ප්‍රභාවත් වන්නේ ය, විශෙෂයෙන් ම ප්‍රභාවත් වන්නේ ය, දිලියෙන්නේ ය, ප්‍රජ්වලිත වන්නේ ය, සෙස්සන් අභිභවනය කරවන්නේ ය. මැඩපවත්වා ලන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ලෞකික පලඳනාවන් පැලැඳ ගැණීමට වඩා විමුක්ති රත්නාලංකාරය පැලැන්ද වූ අර්හත්ඵලයට පැමිණියා වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ අර්හත්ඵල විමුක්තිය කරණ කොට ගෙණ සෙසු තදංගවිෂ්කම්භණාදී විමුක්තිමත් භික්ෂූන් අතික්‍රමණය කොට බබළනසේක, විශෙෂයෙන් බබළනසේක. ඕභාස වනසේක, ප්‍රභාවත් වනසේක, විශෙෂයෙන් ම ප්‍රභාවත් වනසේක, දිලිසෙනසේක, අතිශයින් දිලිසෙනසේක, ලොකය අභිභවනය කරණ සේක, මැඩපවත්වන සේක, ඊට හේතු කවරේ ද? යත්— මහරජානෙනි, යම් මේ අර්හත්ඵල පලඳනාවෙක් ඇද්ද, ඒ මේ පලඳනාව සියලු ම පලඳනාවන්ට වඩා අග්‍ර වන්නේ ය. මහරජානෙනි, අප ලොවුතුරා බුදුන්ගේ මේ විමුක්තිරත්න ය' යි කියනු ලැබෙයි. ස්වර්ණ මාණික්‍ය මාලාලංකාරධාරී වූ කුලජෙට්ඨස්වාමිපුත්‍රයා ගෘහනිශ්‍රිතජනතෙමේ තෘප්තියෙන් බලන්නේ ය. එසේ ම අර්හත්ඵලරත්න මාලාධාරී වූ රහතන් වහන්සේ සදිව්‍යමනුෂ්‍යයෝ ප්‍රීතිමත් ව තෘප්තියෙන් ම බලන්නාහු යි. කියේ මැ නෝ:—

(423) "මණිමාලාධරං ගෙහ-ජනො සාමිං උදික්ඛති,
විමුත්තිරතනමාලන්තු-උදික්ඛන්ති සදෙවකා" යි.

"මහරජානෙනි, ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ විමුක්තිඥාන දර්ශනරත්නය කවරේ ද? යත්— මහරජානෙනි, ආර්ය ශ්‍රාවකයන් වහන්සේ යම් ඥානයකින් මාර්ගඵල නිර්වාණ ධර්මයන් හා ප්‍රහීණ ක්ලේශාවශිෂ්ටක්ලේශයන් ප්‍රත්‍යවෙක්ෂා කරණසේක් වී නම්, ඒ ප්‍රත්‍ය වෙක්ෂාඥානය ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ විමුක්තිඥානදර්ශන රත්න ය යි කියනු ලැබේ. ආර්යශ්‍රාවකයෝ යම් ඥාණයක් කරණ කොට ගෙණ කෘතකෘත්‍යතාව ය යි කියන ලද රහත්බව අවබොධය කෙරෙද් ද, ඒ ඥානරත්නය ලබන්නට ජිනෙන්ද්‍රපුත්‍රවරයෙනි, නෙපි දු ව්‍යායාම කරව්.

"යෙන ඤාණෙන බුජ්ඣන්ති-අරියා කතකිච්චතං,
තං ඤාණරතනං ලද්ධුං-වායමෙථ ජිනොරසා" යි.

Non-Commercial Distribution

''මහරජාණෙනි, අප භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රතිසම්භිදරත්නය කවරේ ද? යත්— මහරජාණෙනි, ප්‍රතිසම්භිදවෝ අර්ථප්‍රතිසම්භිද ය, ධර්ම ප්‍රතිසම්භිද ය, නිරුක්තිප්‍රතිසම්භිද ය, ප්‍රතිභානප්‍රතිසම්භිද ය යි කියා සතර දෙනෙක් වෙති. මහරජාණෙනි, මේ චතුර්විධ වූ ප්‍රතිසම්භිදරත්නයෙන් සැරහුනා වූ භික්ෂූන් වහන්සේ, ඉදින් රජපිරිසකට හෝ ඉදින් බ්‍රාහ්මණ පිරිසකට හෝ ඉදින් ගහපතිපිරිසකට හෝ ශ්‍රමණපිරිසකට හෝ යම් යම් පිරිසකට එළඹෙනසේක් නම්, විශාරද ව එළඹෙනසේක. තෙජස් නැති නො වී පහ වූ ලොමුදහ ගැණුම් ඇති ව තැති ගැණුම් නැති ව උත්‍රාස නො වී නිර්භීත ව පිරිසට එළඹෙන්නේ ය. මහරජාණෙනි, යම් සේ පඤ්චායුධසන්නද්ධ වූ අසම්භීත වූ සංග්‍රාමශූර වූ යොධතෙම 'ඉදින් සතුරු සෙනග දුර දී සම්භව වේ නම්, හී පහරින් විද හෙළන්නෙමි. එහෙයින් මැත දී සම්භ වේ නම්, හෙල්ලයෙන් ඇන හෙළන්නෙමි. එයටත් මැත දී සම්භව වේ නම්, කණය සංඛ්‍යාත වූ ඉලුක්කෝලයෙන් පැහැර හෙළන්නෙමි. සමීපයට පැමිණියා වූ සතුරු සත්වකෙනෙකුන් ඇත් නම්, කඩුවෙන් දෙපළු කොට සිඳ හරින්නෙමි. ඇහට ලං වූ සතුරු සෙනා කෙනෙකුන් ඇත් නම්, ඡුරිකා සංඛ්‍යාත වූ කිරිසියෙන් ඇන විනිවිද හරින්නෙමි' යි කියා යුද්ධයට බස්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම චතුර්විධ වූ ප්‍රතිසම්භිදවෙන් සැරහුනා වූ භික්ෂූන් වහන්සේ ද 'යම් කිසිවෙක් අර්ථප්‍රතිසම්භිදයෙහි ලා මාගෙන් ප්‍රශ්නයක් විචාළේ වී නම්, ඔහට ප්‍රශ්නව්‍යාකරණයෙන් අර්ථයෙන් අර්ථය ගළපා කියමි. කාරණයෙන් කාරණය දක්වා කියමි. හෙතුවෙන් හෙතුව අහවා කියමි. නයින් නය දක්වා කියමි. සැක නැති කෙරෙමි. කුකුස් දුරු කෙරෙමි. සන්තොෂ කෙරෙමි' යි කියා ද, 'යම්කිසිවෙක් මා ධර්මප්‍රතිසම්භිදවෙන් ප්‍රශ්නයක් විචාළේ නම්, ඔහට ප්‍රශ්නව්‍යාකරණයෙන් ධර්මයෙන් ධර්මය ගළපා කියමි. අමෘතයෙන් අමෘතය යොද කියමි. අසංඛතයෙන් අසංඛතය කියමි. නිර්වාණයෙන් නිර්වාණය කියමි. ශූන්‍යයෙන් ශූන්‍යය කියමි. අනිමිත්තයෙන් අනිමිත්තය කියමි. අප්‍රණිහිතයෙන් අප්‍රණිහිතය කියමි. ආනෙඤ්ජසමාධියෙන් ආනෙඤ්ජසමාධිය කියමි. නිශ්ශංක **(424)** කෙරෙමි. කුකුස් පහ.කෙරෙමි. සන්තොෂ කෙරෙමි'යි සිතා ද, 'යම් කිසිවෙක් මා නිරුක්තිප්‍රතිසම්භිදඥනයෙහි ලා ප්‍රශ්නයක් විචාරන්නේ වී නම්, ඔහට ඒ ප්‍රශ්නය තෝරා කීමෙන් නිරුත්තියෙන් නිරුත්තිය සංසන්දන කොට කියමි. චතුර්විධපදයෙන් චතුර්විධපදය කියමි. අනුපදයෙන් අනුපදය කියමි. අක්ෂරයෙන් අක්ෂරය කියමි. සන්ධියෙන් සන්ධිය කියමි. කකාරාදි ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය කියමි. අනුව්‍යඤ්ජනයෙන් අනුව්‍යඤ්ජනය කියමි. වර්ණයෙන් වර්ණය කියමි. ස්වරයෙන් ස්වරය කියමි. ප්‍රඥප්තියෙන් ප්‍රඥප්තිය කියමි. ව්‍යවහාරයෙන් ව්‍යවහාරය කියමි. නිශ්ශංක කෙරෙමි. විමතිය පහ කෙරෙමි. සන්තොෂය කෙරෙමි' යි සිතා ද, 'යම් කිසිවෙක් මා ප්‍රතිභානප්‍රතිසම්භිදඥනයෙන් ප්‍රශ්නයක් විචාරන්නේ නම්, ඔහට ප්‍රශ්න ව්‍යාකරණයෙන්

Non-Commercial Distribution

ප්‍රතිභානයෙන් ප්‍රතිභානය කියමි. උපමාවෙන් උපමාව සංසන්දනය කොට කියමි. ලක්ෂණයෙන් ලක්ෂණය කියමි. රසයෙන් රසය කියමි. නිශ්ශංක කෙරෙමි. සන්තොෂ කෙරෙමි' යි සිතා ද, අසම්භීත ව පිරිසට එළඹෙන සේක. මහරජානෙනි, මේ අප ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ සතර ප්‍රතිසම්භිදරත්නය යි කියනු ලැබෙයි. යොගාවචර භික්ෂූන් වහන්සේ ලොවුතුරා බුදුන්ගේ සල්පිලින් ප්‍රතිසම්භිදරත්නය ගෙණ ඥානය හා ස්පර්ශ කොට උත්තමශ්‍රීධර ව අසම්භීත ව අචලිත ව දෙවියන් සහිත වූ ලොකයෙහි අතිශයින් බබළනසේක.

**"පටිසම්භිදා කිණිත්වාන–ඤාණෙන ඵස්සයෙය්‍ය සො,**
**අසම්භීතො අනුබ්බිග්ගො–අතිරොචති සදෙවකෙ" යි.**

"මහරජානෙනි, ලොවුතුරා බුදුන්ගේ බොද්ධ්‍යංගරත්නය කවරේ ද? යත්— මහරජානෙනි, බොද්ධ්‍යංගයෝ ද ස්මෘතිසම්බොද්ධ්‍යංගය ප්‍රඥ සම්බොද්ධ්‍යංගය වීර්යසම්බොද්ධ්‍යංගය ප්‍රීතිසම්බොද්ධ්‍යංගය පස්සද්ධි සම්බොද්ධ්‍යංගය සමාධිසම්බොද්ධ්‍යංගය උපෙක්ෂා සම්බොද්ධ්‍යංගය යි කියා මොහු සප්තවිධ වෙති. මහරජානෙනි, මේ සප්තවිධ වූ බොද්ධ්‍යංග රත්නයෙන් ප්‍රතිමණ්ඩිත වූ භික්ෂූන් වහන්සේ සියලු ම පාපාන්ධකාරය මැඩ දෙවියන් සහිත වූ ලොකයා බබුළුවනසේක. ප්‍රභාවත් කරණසේක. කුශලාලොකය උපදවන සේක. මහරජානෙනි, භාග්‍යවතුන් වහන්සේගේ මේ බොද්ධ්‍යංගරත්නය යි කියනු ලැබේ. බොද්ධ්‍යංගරත්නමාලාලංකාර යෙන් සැරසුනා වූ ඒ භික්ෂූන් වහන්සේට දෙවියන් සහිත වූ ලොකවාසීහු නැඟී සිටීම් වශයෙන් ගෞරව කෙරෙති. එහෙයින් කර්මස්ථාන මිල යෙන් ඒ බොද්ධ්‍යංගරත්නය ගෙණ, පින්වත්නි, තෙපි ද බොද්ධ්‍යංගය රත්නය පලඳිව්.

**"බොජ්ඣඞ්ග රතනමාලස්ස–උට්ඨහන්ති සදෙවකා,**
**කම්මෙන තං කිණිත්වාන–රතනං වො පිලන්ධථ" යි.**

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, භාග්‍යවත් වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේගේ සර්වාපණය කවරේ ද?" යි විචාළෝ ය. "මහරජානෙනි, සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණාදි නවාංග ශාස්තෘවචනයක් ඇද්ද, ශාරීරිකධාතු කෙනෙක් ඇද්ද, පාරිභොගික ධාතුකෙනෙක් ඇද්ද, ප්‍රතිමාරූප පාදලාංඡන බොධිද්‍රුම චෛත්‍යකෙනෙක් ඇද්ද, සංඝරත්න යෙක් **(425)** ඇද්ද, ඒ මේ ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ සර්වාපණය නම් වන්නේ ය. මහරජානෙනි, සියලු සම්පත් සැදූ සර්වාපණයෙහි ලොවුතුරා බුදුන් විසින් දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය ජාති සම්පත් සදන ලද්දේ ය. භොග සම්පත් සදන ලද්දේ ය. ආයුසම්පත් සදන ලද්දේ ය. ආරොග්‍ය සම්පත් සදන ලද්දේ ය, වර්ණසම්පත් සදන ලද්දේ ය, ප්‍රඥසම්පත්තිය සදන ලද්දේ ය, මනුෂ්‍යසම්පත්තිය සදන ලද්දේ ය, දිව්‍යසම්පත්තිය සදන ලද්දේ ය, බ්‍රහ්මසම්පත්තිය සදන ලද්දේ ය, නිර්වාණසම්පත්තිය සදන ලද්දේ ය. ඒ සල්පිලින් යම් සත්ව කෙනෙක් යම් ඒ සම්පත්තියක්

Non-Commercial Distribution

කැමැති වෙත් නම්, ඒ සත්වයෝ කුශලක්‍රියා මිල දී පැතූ පැතූ සම්පත්තියක් ලැබ ගණිති. කිසි කෙනෙක් ශීලසමාදනයෙන් ගණිති. කිසි කෙනෙක් උපොසථකර්මයෙන් ගණිති, ස්වල්ප මාත්‍ර වූ කුශලකර්මමිලයෙනුත් වඩ වඩාත් සම්පත් ලබති. මහරජානෙනි, යම් සේ කඩ වෙළෙන්දගේ සල්පිල්හි තල මුං උඳු මෑ ආදිය ඉතා මඳ වූ ස්වල්ප මිලයෙන් වඩ වඩාත් ගණිති. මහරජානෙනි, එපරිද්දෙන් ම ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ සර්වාපණයෙහි ස්වල්පමාත්‍ර වූ ද කුශලක්‍රියාමිලයෙන් වඩ වඩා සම්පත්තීන් ලබති. මහරජානෙනි, ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ මේ සර්වාපණය යි කියනු ලැබේ. ආයුරාරොග්‍ය ශරීරවර්ණය ද, ස්වර්ග සම්පත්තිය හා බ්‍රහ්මසම්පත්තිය ද, උතුම් ජාතිසම්පත්තිය ද, අසංඛත වූ අමෘතමහානිර්වාණසම්පත්තිය ද යන මේ ලොවී ලොවුතුරා සකල සම්පත් ම ජිනෙන්ද්‍ර වූ ලොවුතුරා බුදුන්ගේ සර්වාපණයෙහි ඇත්තේ යි. අල්ප වූ ද, බොහෝ වූ ද, ත්‍රිවිධ වූ කුශලක්‍රියාමිලයෙන් ඒ සම්පත් ගන්නේ ය. සංසාරයෙහි භය දක්නා සුලු වූ භික්ෂූනි, නුඹ වහන්සේලා ද, ශ්‍රද්ධා නමැති මිලයෙන් ඒ ලොවීලොවුතුරා සම්පත් ගෙණ සමෘද්ධ වුව මැනැව.

**"ආයු අරොගතා වණ්ණං-සග්ගං උච්චාකුලීනතං,**
**අසඞ්ඛතඤ්ච අමතං-අත්ථි සබ්බාපණෙ ජිනෙ.**
**අප්පෙන බහුකෙනාපි-කම්මමූලෙන ගණ්හථ,**
**කිණිත්වා සද්ධාමූලෙන-සමිද්ධා හොථ භික්ඛවො"යි.**

"මහරජානෙනි, ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්ම මහානගරවරයෙහි මෙබඳු වූ ජනයෝ වාසය කරන්නාහු ය. කෙබඳු ජනයෝ ද? යත්— සූත්‍ර ගෙණ හැර දක්වන්නා වූ **සූත්‍රාන්තිකයෝ** ය, විනය ගෙණ හැර දක්වන්නා වූ **වෛනයිකයෝ** ය, අභිධර්ම ධරයෝ ය, ධර්ම කථිකයෝ ය, **ජාතකභාණකයෝ** ය, **දීර්ඝනිකාය** භාණකයෝ ය, **මැඳුම් සඟිභාණකයෝ** ය, **සංයුත්සඟිභාණකයෝ** ය, **අංගොත්තර** භාණකයෝ ය, **බුද්ධවංශ ය, චර්යාපිටක ය, ඉතිවුත්තක ය, විමානවස්තු ය, ප්‍රෙත වස්තු ය, අනාගතවංශ ය, සූත්‍රනිපාත ය, දම්පියා ය, ජාතක ය, ථෙරගාථා ය, ථෙරිගාථා ය, උදන ය, චූලනිර්දෙශ ය, මහානිර්දෙශ ය, ප්‍රතිසම්භිද ය,** යන පසළොස් ප්‍රකරණයෙන් යුක්ත වූ **කුදුගොත්සඟි** භාණකයෝ ය, ශීලසම්පන්නයෝ ය, සමාධි සම්පන්නයෝ ය, ප්‍රඥසම්පන්නයෝ ය, බොද්ධ්‍යංගභාවනායෙහි ඇලී වසන්නෝ ය, විදර්ශනා වඩන්නෝ ය, අර්ථයෙන් යුක්ත වූවෝ ය, ආරණ්‍යකාංගය **(426)** රක්ෂා කරන්නා වූ **ආරණ්‍යකයෝ ය,** එසේ ම **වෘක්ෂමූලිකයෝ ය,** අබ්භොකාසිකය රක්ෂා කරන්නෝ ය, ශාඛා ආදියෙක පිදුරු රැසක් වසා ගෙණ නො තෙමී යට හිඳ නිවන් සොයන්නා වූ **පලාලපුංජකයෝ ය,** 'සොසානිකංගං සමාදියාමි,' කියා සමාදන් ව මිනීකුණු ඇති සුසානයට ගොස් තුන් යම් රෑ කෙලෙස් සුද්ධ කරණ **සොසානික** පුරුෂොත්තමයෝ ය, සයනයක පිට නො තබා

*Non-Commercial Distribution*

තුන්යම් රෑ මුළුල්ලෙහි නිදි වර්ජිත කිරීමෙන් නිවන් සොයන්නා වූ සංසාරභීරුක නෙසජ්ජිකයෝ ය, සතර මාර්ගයට පිළිපන්නෝ ය, සතර ඵලස්ථයෝ ය, ශෛක්ෂ්‍යයෝ ය, ඵලසමංගීයෝ ය, සොත සංඛ්‍යාත වූ මාර්ගයෙන් ඵලයට පැමිණියා වූ සූවිසිවැදෑරුම් වූ සොතාපන්න පුද්ගල යෝ ය, දෙළොස් වැදෑරුම් වූ සකෘදගාමී ආර්යයෝ ය, අටසාළිස් වැදෑරුම් වූ අනාගාමී ආර්යයෝ ය, දෙළොස් වැදෑරුම් වූ රහතන් වහන්සේලා ය, පූර්වෙනිවාසානුස්මෘති ඥනය, පරචිත්තවිජානන ඥනය, ආශ්‍රවක්ෂයකර ඥනය යන ත්‍රිවිද්‍යාවෙන් යුක්ත වූ ත්‍රිවිද්‍යාධරයෝ ය, දිවැසින් සකල සත්වයන්ගේ ච්‍යුතිඋත්පත්ත්‍යාදිය දක්නා දිව්‍යචක්ෂුරභිඥනය ද, ශොත්‍රයෙන් දිව්‍ය වූ ද, මනුෂ්‍ය වූ ද, දූරස්ථ සමීපස්ථ වූ ද, සියලු ශබ්දයන් ශ්‍රවණ කරණයට සමර්ථ වූ දිව්‍යශ්‍රොත්‍රඥනය ද, තමාගේ චිත්තයෙන් අනුන්ගේ චිත්තය සරාගාදි සොළොස් ආකාරයෙන් පිරිසිඳ දක්නට සමර්ථ වූ පරචිත්තවිජානනඥනය ද, නාමගොත්‍රාදි වශයෙන් තමාගේ ද අනුන්ගේ ද පෙර විසූ කඳපිළිවෙළ දක්නට සමර්ථ වූ පූර්වෙනිවාසානුස්මෘතිඥනය ද, නොයෙක් ලෙසින් ඍද්ධිප්‍රාතිහාර්යකරණයට සමර්ථ වූ ඍද්ධිප්‍රභෙදගත ඥනය ද, චතුරාර්යසත්‍යයන් තත් වූ පරිද්දෙන් සොළොස් ආකාරයෙන් දැන ගන්නට සමර්ථ වූ ආශ්‍රවක්ෂයකර ඥනය ද යන මේ ෂඩ්අභිඥවෙන් යුක්ත වූ ෂඩ්අභිඥලාභීන් වහන්සේලා ය, තමන් වැනි කොට සියදහස්ගණන් රූපනිර්මිත කිරීම් හා එක් මොහොතකින් දෙව ලොව බඹලොව පෙණියාම් ආදී අධිෂ්ඨානඍද්ධිය ද, කයත් සිතත් දෙක සභවා තුන්ලෝවාසීන්ට නො පෙණීම් හා ඇතුන් අසුන් සාගරපර්වතාදිය මවන්නා වූ විකුර්වණඍද්ධිය ද, කොපුවෙන් කඩුව අදනාක් මෙන් ද, තණගසින් තණගොප් අදනාක් මෙන් ද, ඇතුළු ශරීරය රන්ධ්‍ර කොට සිය දහස් ගණන් රූප කොට මවා නොයෙක් ප්‍රාතිහාර්ය කරන්නා වූ මනොමය ඍද්ධිය ද, පලඟ බැඳ නිරොධසමාපත්තියෙන් වැඩ හුන් පසේබුදුන් රහතුන් මෙර සා දරසෑයෙන් දවාපියත් කිසි උවදුරක් නො වී සිවුර හළු ගසාපියා නැඟී වඩින්ට සමර්ථකරවන සමාධිවිෂ්ඵාරඍද්ධිය ද යන මේ අධිෂ්ඨානවිකුර්වණමනොමය සමාධිවිෂ්ඵාර යන චතුර්විධඍද්ධි ඇත්තා වූ මහරහතන් වහන්සේලා ය, ප්‍රඥපාරමිතායෙහි කෙළ පැමිණියා වූ මහා ශ්‍රාවකයන් වහන්සේලා ය, සතිපට්ඨානය සම්‍යක්ප්‍රධානය ඍද්ධිපාදය ඉන්ද්‍රියය බලය බොද්ධ්‍යංගය ආර්යමාර්ගවර ධ්‍යාන විමොක්ෂ රූපාරූප ශාන්තසුඛ ප්‍රණීත සමාපත්තියෙහි දක්ෂ වූ රහතන් වහන්සේලා ය යන මේ ත්‍රිවිධ ශාසනාධාර රහතන් වහන්සේලාගෙන් ඒ සද්ධර්මමහානගරය හුණවණයක් මෙන් ද, පියුම්වනයක් මෙන් ද, ආකුල වූයේ ය. සමාකුල වූයේ ය, ආකීර්ණ වූයේ ය, ගැවසී ගත්තේ යි. මෙහි ඒ සද්ධර්මනාගරික ජනයන්ගේ වර්ණනාව වන්නේ යි:—

(427 “වීතරාගා වීතදොසා–වීතමොහා අනාසවා,
වීතතණ්හා අනාදානා–ධම්මනගරෙ වසන්ති තෙ.

ආරඤ්ඤකා ධුතධරා–ඣායිනො ලූඛචීවරා,
විවෙකාභිරතා ධීරා–ධම්මනගරෙ වසන්ති තෙ.

නෙසජ්ජිකා සන්ථතිකා–අථොපි ඨානචඞ්කමා,
පංසුකූලධරා සබ්බෙ–ධම්මනගරෙ වසන්ති තෙ.

තිචීවරධරා සන්තා–චම්මඛණ්ඩචතුත්ථකා,
රතා එකාසනෙ විඤ්ඤූ–ධම්මනගරෙ වසන්ති තෙ.

අප්පිච්ඡා නිපකා ධීරා–අප්පාහාරා අලොලුපා,
ලාභා'ලාභෙන සන්තුට්ඨා–ධම්මනගරෙ වසන්ති තෙ.

ඣායී ඣානරතා ධීරා–සන්තචිත්තා සමාහිතා,
ආකිඤ්චඤ්ඤං පත්ථයානා–ධම්මනගරෙ වසන්ති තෙ.

පටිපන්නා ඵලට්ඨා ච–සෙඛඵල සමඞ්ගිනො,
ආසිංසකා උත්තමත්ථං–ධම්මනගරෙ වසන්ති තෙ.

සොතාපන්නා ච විමලා–සකදාගාමිනො ච යෙ,
අනාගාමී ච අරහන්තා–ධම්මනගරෙ වසන්ති තෙ.

සතිපට්ඨානකුසලා–බොජ්ඣඞ්ගභාවනාරතා,
විපස්සකා ධම්මධරා–ධම්මනගරෙ වසන්ති තෙ.

ඉද්ධිපාදෙසු කුසලා–සමාධිභාවනාරතා,
සම්මප්පධානමනුයුත්තා–ධම්මනගරෙ වසන්ති තෙ.

අභිඤ්ඤාපාරමිප්පත්තා–පෙත්තිකෙ ගොචරෙ රතා,
අන්තලික්ඛම්හි චරණා–ධම්මනගරෙ වසන්ති තෙ.

ඔක්ඛිත්තචක්ඛු මිතභාණී–ගුත්තද්වාරා සුසංවුතා,
සුදන්තා උත්තමෙ ධම්මෙ–ධම්මනගරෙ වසන්ති තෙ.

තෙවිජ්ජා ඡළභිඤ්ඤා ච–ඉද්ධියා පාරමී ගතා,
පඤ්ඤාය පාරමිප්පත්තා–ධම්මනගරෙ වසන්ති තෙ.”

“යන මෙයින් වීතරාගී වූ වීතද්වෙෂී වූ වීතමොහී වූ කිසි ආශ්‍රවයක් නැත්තා වූ පහ කරණ ලද ත්‍රිවිධ තෘෂ්ණාවන් ඇත්තා වූ තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් කිසිවක් නො ගන්නා වූ ඒ පුරුෂොත්තමයෝ ලොවුතුරා බුදුන්ගේ සද්ධර්මමහානගරවරයෙහි වසන්නාහු ය. ග්‍රාමයට දුනු පන්සියයෙන් දුර වූ අරණ්‍යයෙහි වසන්නා වූ ගුණභූෂණයෝ ද, යෙහෙන් පමණකින් ධුතාංග සමාදන් ව වසන්නා වූ ධුතාංගධරයෝ ද, කායජීවිත නිරපෙක්ෂක ව ක්ලේශශත්‍රුමථනයට වීර්යධවජ නභා ධ්‍යානයෙන් යුක්ත ව වසන ධ්‍යායිහු ද, රාග විරාග කරණයෙහි ව්‍යාපෘත රුක්ෂසිවුරු ධරන්නා වූ ලූඛචීවරයෝ ද, සසරකතර ගෙවන්නට සුගතොවාදය සිරසින් ගෙණ (428) විවේකයෙහි ඇලී වසන්නා වූ ප්‍රාඥයෝ ද යන ඒ සර්වඥපුත්‍රයෝ සද්ධර්මමහානුවර



*Non-Commercial Distribution*

වසන්නාහු ය. සූතිස්යොධයෝ කවර දෙරින් වැද සිල් පැහැර ගණිද්දෝ හොයි නො නිද ශීල ගොපනය කරන්නා වූ නෙසජ්ජිකාංගයෝ ද නානා සෙනස්නෙහි ලොල්බව ප්‍රතික්ෂෙප කොට ලත් සෙනස්නෙන් සතුටු ව වසන්නා වූ යථාසන්ථතිකංගය රක්නෝ ද, නීවරණ නිවාරණයට සතිපට්ඨානය මෙනෙහි කෙරෙමින් සිටීමෙන් සක්මන් කිරීමෙන් කල් යවන්නා වූ පාපභීරුකයෝ ද, සංකාරස්ථානය සුසානාදියෙහි නිරපෙක්ෂ ව දමූ වස්ත්‍ර ගෙණ සිවුරු කොට පලඳින්නා වූ පාංසුකුලධරයෝ ද යන මේ සියලු ගුණ මූලිකයෝ සද්ධර්මමහානගරයෙහි වසන්නාහු ය. සම්කඩ සතර වැනි කොට ඇති චීවරධාරී වූ සත්පුරුෂගුණභූෂණයෝ ද, වෙන වෙන හස්නෙහි හිඳ කරණ ආහාර පරිභොගය ප්‍රතික්ෂෙප කෙරෙමින් ඒකාසනිකාංගයෙහි ඇලී වසන්නා වූ නුවණැත්තෝ ද යන ඒ ගුණ-කාමිකයෝ ධර්මමහානගරයෙහි වසන්නාහු ය. අල්පෙච්ඡ වූ කර්මස්ථාන පරිහරණයෙහි නියුක්ත නිපක නම් ප්‍රඥව ඇත්තා වූ උපචාරඅර්පණාදිය උපදවාලීමෙහි නුවණ ඇත්තා වූ රාගමද වැඩෙන හෙයින් අල්පාහාර ඇත්තා වූ නිවන් සෙවීමෙහි මුත් ප්‍රත්‍යය ලාභයෙහි ලොල්බවක් නැත්තා වූ ලාභ අලාභ දෙකින් ම සතුටු වන්නා වූ ශීලසුගන්ධ ඇති ඒ මුනීන්ද්‍රපුත්‍රයෝ සද්ධර්මමහානගරවරයෙහි වසන්නාහු ය. ආලම්බනොපනිධ්‍යානාදී ධ්‍යානයන් ඇත්තා වූ ලක්ෂෙණාපනිධ්‍යානාදි ධ්‍යානයෙහි ඇලුනා වූ ප්‍රඥවත්හු ද, රූපශබ්දදියෙහි සිත නො දුවන විසින් ශාන්ත සිත් ඇත්තා වූ උපචාරසමාධි අර්පණාසමාධි ප්‍රතිලාභයෙන් එකඟ වූ සිත් ඇති යොගාවචර යෝ ද, අකිඤ්චනස්වභාව ඇති නිර්වාණසම්පත්තිය ප්‍රාර්ථනා කරන්නා වූ නිර්වාණාභිලාෂයෝ ද යන ඒ නරවරොත්තමයෝ සද්ධර්ම මහානගරවරයෙහි වසන්නාහු ය. සතරමාර්ගයට පිළිපන්නා වූ ආර්ය පුද්ගලයෝ ද, ඵලස්ථ වූ පුද්ගලයෝ ද, ඵලසමංගී වූ ශෛක්ෂ්‍යයෝ ද, අර්හත්ඵලය ප්‍රාර්ථනා කරන්නා වූ ආර්යයෝ ද යන ඒ පාපගර්හි ආර්යයෝ සද්ධර්මමහානගරවරයෙහි වසන්නාහු ය නිර්මල වූ ශීල ඇති සොතාපන්න ආර්යශ්‍රාවකයෝ ද, යම් සකෘදගාමී ආර්යශ්‍රාවක කෙනෙක් ඇද්ද, අනාගාමි ශ්‍රාවක කෙනෙක් ඇද්ද, ඔහු ද රහතුන් වහන්සේලා ද යන ඒ ආර්යයෝ සද්ධර්මමහානගරවරයෙහි වසන්නාහු ය. සතර සතිපට්ඨානභාවනායෙහි දක්ෂ වූවෝ ද, සප්තබොද්ධ්‍යංගභාවනායෙහි ඇලුනෝ ද, සමථවිදර්ශ-නානුභාවනායොගී වූ ආර්යයෝ ද ධර්මධරයතීන්ද්‍රයෝ ද යන ඒ ආර්යයෝ සද්ධර්මමහානගරවරයෙහි වසන්නාහු ය. චතුර්විධ ඍද්ධිපාදයෙහි දක්ෂ වූ ශ්‍රාවකයෝ ද, උපචාර අර්පනාසමාධියෙහි ඇලුනා වූ ආර්යයෝ ද, සතර සම්‍යක්ප්‍රධානවීර්යයෙහි ඇලුනා වූ නියුක්ත වූ ආර්යයෝ ද යන ඒ සුගතශ්‍රාවකයන් වහන්සේලා සද්ධර්මමහානගරවරයෙහි වසන්නාහු ය. අභිඥපාරමිතාවට පැමිණියා වූ ද, තමන් පිතෘ වූ ලොවුතුරා බුදුන්ගේ අනවද්‍යගොචරයෙහි ඇලුනා වූ ආර්යයෝ ද, ස්වර්ණහංසයන් සෙයින් අහස්හි හැසිරෙන්නා වූ අතුල්‍යධ්‍යානපාදයෝ ද යන ඒ සර්වඥශ්‍රාවකයෝ සද්ධර්මමහානගරවරයෙහි වසන්නාහු ය. වියදඬු පමණ දුර බලන්නා වූ

Non-Commercial Distribution

යටිකුරු කරණ ලද (429) ඇස් ඇත්තා වූ, පමණින් යුක්ත වූ කථා ඇති, ගුප්ත කරණ ලද චක්ෂුරාදිද්වාරයන් ඇති සංවෘත කරණ ලද ඉන්ද්‍රියයන් ඇති උතුම් වූ සමාධිධර්මයෙහි මනා කොට දමනය වූ ඒ ආර්යශ්‍රාවකයෝ සද්ධර්මමහානගරවරයෙහි වසන්නාහු ය. ත්‍රිවිද්‍යාධර වූ ආර්යයෝ ද, ෂඩභිඥධාරි වූ ආර්යයෝ ද, මනොමය ඍද්ධිවිධඥනාදී ඍද්ධියෙහි පරතෙරට පැමිණියා වූ ආර්යයෝ ද, ශ්‍රාවකප්‍රඥපාරමිතායෙහි කෙළ පැමිණියා වූ මහාශ්‍රාවකයන් වහන්සේලා ද යන ඒ අනුබුද්ධශ්‍රාවකයන් වහන්සේලා සද්ධර්මමහානගරවරයෙහි වසන්නාහු ය.

''මහරජානෙනි, යම් ඒ භික්ෂුකෙනෙක් අපරිමිතඥාණවරධාරිහු ද, අසහාය වූ ද අතුල්‍යගුණ ඇත්තාහු ද, අසදෘශයශස් ඇත්තාහු ද, අතුල්‍ය බල ඇත්තාහු ද, අතුල්‍ය වූ තෙජස් ඇත්තාහු ද, සද්ධර්මාඥචක්‍රය නො හැර පවත්වන්නාහු ද, ප්‍රඥපාරමිතාවට පැමිණියාහු ද, මහරජානෙනි, මෙබඳු වූ මහාශ්‍රාවකභික්ෂූන් වහන්සේලා ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි සද්ධර්මසෙනාධිපතිහු ය'' යි කියනු ලැබෙත්.

''මහරජානෙනි, යම් භික්ෂු කෙනෙක් අනෙකවිධ ඍද්ධි ඇත්තාහු ද, පැමිණෙන ලද චතුර්විධ ප්‍රතිසම්භිදවත් ඇත්තාහු ද, පැමිණෙන ලද චතුර්-වෛශාරද්‍යයන් ඇත්තාහු ද, බඹලෝ දක්වා අහස සැරිසරන්නාහු ද, අමිත්‍රයකු විසින් ලං විය නො හැක්කාහු ද, කිසිකෙනෙකුන් විසින් මැඩලිය නො හැක්කාහු ද, කිසිවෙක නො ඇලී හැසිරෙන්නාහු ද, චතුස්සාගර සහිත මහාපෘථිවිය ධරන්නා වූ චක්‍රවාටපර්වතය සහිත වූ මහාපෘථිවිය කම්පා කරන්නාහු ද, අත දිගු කොට චන්ද්‍රසූර්යයන් පිරිමදින්නාහු ද, විකුර්වණඍද්ධි අධිෂ්ඨානඍද්ධි ආදියෙහි අභිනීහාර හෙයින් දක්ෂ වූ ඍද්ධියෙහි පරතෙරට පැමිණියා වූ මහාශ්‍රාවකයෝ ද යන මෙබඳු වූ ශ්‍රාවකයෝ මහරජානෙනි, ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි අග්‍රපුරෝහිතයෝ ය'' යි කියනු ලැබෙත්.

''මහරජානෙනි, මේ ශාසනයෙහි යම් භික්ෂුකෙනෙක් ධූතාංග සමාදනයට පැමිණියාහු ද අල්පෙච්ඡ වූවාහු ද, ලද දෙයකින් සතුටු වන්නාහු ද, කායවාචාවිඤ්ඤත්තියට හා කුලදූෂණය කරන්නා වූ එක්විසි අන්වෙෂණයට පිළිකුල් කරන්නාහු ද, මලට වෙහෙස නො කොට සුවඳ රොන් ගෙණ යන භෘංගරාජයන් මෙන් පිණ්ඩපාතයෙන් උපාසකකුලය නො වෙහෙයා පිඩු සිහා ගෙණ විවික්ත වූ වනාන්තරයට ප්‍රවෙශ වන්නා වූ සපදනචාරීන් වහන්සේලා ද ශරීරයෙහිත් ජීවිතයෙහිත් උපෙක්ෂා විරහිත ව වසන්නාහු ද, ලෞකිකඥනය ඉක්මවා අර්හත්ඵලයට පැමිණියාහු ද, ධූතාංගගුණ සමාදනයෙහි කාමච්ඡන්දය අග්‍ර කොට තවන ලද්දහු ද, මහ-රජානෙනි, මෙබඳු වූ භික්ෂූන් වහන්සේලා ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි විනිශ්චය මහාමාත්‍යයෝ ය'' යි කියනු ලැබෙත්.

Non-Commercial Distribution

''මහරජානෙනි, යම් ඒ භික්ෂූන් වහන්සේලා කෙනෙක් ක්ලේශමලාපගමනයෙන් පිරිසුදු වූවාහු ද, තෘෂ්ණාමල විරමණයෙන් නිර්මල වූවාහු ද, නික්ලේශික වූවාහු ද, චුති උත්පාදද්වය දක්නා ඥාණයෙහි දක්ෂ වූවාහු ද, දිව්‍යඥානයෙහි පරතෙරට පැමිණියා වූ මෙබඳු වූ භික්ෂූන් වහන්සේලා, මහරජානෙනි, භාග්‍යවත් වූ ලොවුතුරා බුදුන්ගේ ශ්‍රී සද්ධර්මමහානගර වරයෙහි නගරජොතිකයෝ ය'' යි කියනු ලැබෙත්.

**(430)** ''මහරජානෙනි, යම් ඒ භික්ෂූන් වහන්සේලා කෙනෙක් බොහෝ ඇසූ පිරූ තැන් ඇති හෙයින් බහුශ්‍රැත වූවාහු ද, සුගතාගමධාරී වූවාහු ද, ධර්මධර වූවාහු ද, විනයධර වූවාහු ද, මාතෘකාධර වූවාහු ද, සිථිල ධනිත දීර්ඝ හ්‍රස්ව ගුරු ලඝු සංඛ්‍යාත වූ අක්ෂරයන්ගේ ප්‍රමාණ දැනීමෙහි දක්ෂ වූවාහු ද, නවාංගශාස්තෘශාසනධාරී වූවාහු ද, මහරජානෙනි, මෙබඳු භික්ෂූන් වහන්සේලා ලොවුතුරා බුදුන්ගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි වූ ධාර්මික වූ ආරක්ෂාග්‍රහණයෙහි නියුක්ත වූවාහු ය'' යි කියනු ලැබෙත්.

''මහරජානෙනි, යම් ඒ භික්ෂූන් වහන්සේලා කෙනෙක් විනය දන්නාහු ද, විනයෙහි දක්ෂ වූවාහු ද, ආපත්ති ගෙණ හැර දැක්වීමෙහි දක්ෂ වූවාහු ද, ආපත්ති අනාපත්ති ගරුක ලහුක සතෙකිච්ඡ අතෙකිච්ඡ වුට්ඨාන දෙශනා නිග්‍රහ ප්‍රතිකර්ම ඔසාරණ නිස්සාරණ ප්‍රතිසාරණාදි විනයකර්ම යෙහි අතිදක්ෂ වූවාහු ද විනයසාගරයෙහි පාරප්‍රාප්ත වූවාහු ද, මහරජානෙනි, මෙබඳු වූ ශාසනකාරක භික්ෂූන් වහන්සේලා ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි ස්වභාවප්‍රතිකර්මයෙහි දක්ෂ වූ රූපදක්ඛ අමාත්‍යයෝ ය'' යි කියනු ලැබෙත්.

''මහරජානෙනි, යම් භික්ෂු කෙනෙක් අර්හත්ඵල නමැති ප්‍රවරකුසුම මාලායෙන් බද්ධ වූවාහු ද, වරප්‍රවරානර්ඝ ශ්‍රෙෂ්ඨභාවයට පැමිණියාහු ද, බොහෝ ජනයාගේ මන වැඩීමෙන් ප්‍රාර්ථිත වූවාහු ද, මහරජානෙනි, මෙබඳු වූ භික්ෂූන් වහන්සේලා ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි පුෂ්පසල්පිල්හු ය'' යි කියනු ලැබෙත්.

''මහරජානෙනි, යම් ඒ භික්ෂු කෙනෙක් චතුස්සත්‍යය ප්‍රතිවෙධය කළාහු ද, චතුස්සත්‍යය දක්නා ලද්දහු ද, සර්වඥශාසනය නෛර්යාණිකයහ යි කියා දක්නා ලද්දහු ද, සතර ශ්‍රාමණ්‍යඵලයෙහි එතෙර වූ කුකුස් ඇත්තාහු ද, ප්‍රතිලබ්ධ අර්හත්ඵලසැප ඇත්තාහු ද, අර්හත්ඵලය පිණිස පිළිපන්නා වූ ශෛක්ෂ්‍යයන්ටත් ඒ සතරඵලයන් බෙද දෙන්නාහු ද, මහරජානෙනි, මෙබඳු වූ භික්ෂූන් වහන්සේලා ලොවුතුරා බුදුන්ගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි ඵලාපණිකයෝ ය'' යි කියනු ලැබෙත්.

''මහරජානෙනි, යම් භික්ෂූන් වහන්සේ කෙනෙක් ශීලසංවර සුගන්ධ යෙන් ආලේප වූවාහු ද, අනෙකවිධ වූ බොහෝ ගුණ දරන්නාහු ද, ක්ලේශ මල දුර්ගන්ධ නසන්නාහු ද, මහරජානෙනි, මෙබඳු වූ භික්ෂූන් වහන්සේලා ලොවුතුරා බුදුන්ගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි සුගන්ධාපණයෝ ය'' යි කියනු ලැබෙත්.

*Non-Commercial Distribution*

''මහරජානෙනි, යම් ඒ භික්ෂු කෙනෙක් ධර්මප්‍රීතිවාක්‍යය පැවතීම ඇති ව ධර්මකාමී වූවාහු ද, අභිධර්මයෙහි ද විනයධර්මයෙහි ද මහත් වූ ප්‍රමොද්‍ය ඇත්තාහු ද, අරණ්‍යයට ගියාහු ද, වෘක්ෂමූලයට ගියාහු ද, ශූන්‍යාගාරයට ගියාහු ද, කයින් වචසින් මනසින් සද්ධර්මවරරසය පානය කෙරෙද්ද, සද්ධර්මාමෘතරසයට බස්නා ලද්දහු ද, බලවත් වූ ප්‍රතිභානයන් ඇත්තාහු ද, ත්‍රිවිධ ධර්මයෙහි පර්යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ සංඛ්‍යාත වූ ධර්මය සොයමින් පිළිපන්නාහු ද, මෙතැන්හි හෝ එතැන්හි හෝ යම් තැනෙක්හි අල්පෙච්ඡකථා, සන්තුෂ්ටකථා විවෙකකථා, අසංසර්ගකථා, වීර්යාරම්භකථා, සීලකථා, සමාධිකථා, ප්‍රඥකථා, විමුක්තිකථා, විමුක්ති ඥාන දර්ශනකථා ය යන දශකථා පවතී නම් ඒ ඒ තැනට ගොස් ඒ ඒ රසය පානය කෙරෙද්ද, මහරජානෙනි, මෙබඳු වූ **(431)** බුද්ධශාසනකාරක භික්ෂූන් වහන්සේලා ලොවුතුරා බුදුන්ගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි පිපාසය ඇති සුරාසොණ්ඩජනයෝ ය'' යි කියනු ලැබෙත්.

''මහරජානෙනි, යම් ඒ භික්ෂු කෙනෙක් පෙරයම පටන් පශ්චිම යාමය දක්වා නිදි වර්ජිත කිරීමෙන් යුක්ත ව හිඳීමෙන් සිටීමෙන් සක්මනින් රෑ දවල් ඉක්මවන්නාහු ද, සර්වක්ලේශයන්ගේ ප්‍රතිබාහනය පිණිස භාවනායෙහි නියුක්ත වූ වීර්යයෙන් යුක්ත වූවාහු ද, අර්හත්ඵලය උපදවා ලීමෙහි ව්‍යාපෘත වූවාහු ද, මහරජානෙනි, මෙබඳු වූ භික්ෂූන් වහන්සේලා ලොවුතුරා බුදුන්ගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි නගර ගුත්තිකයෝ ය'' යි කියනු ලැබෙත්.

''මහරජානෙනි, යම් ඒ භික්ෂූන් වහන්සේලා කෙනෙක් නවාංග බුද්ධවචනය අර්ථවශයෙන් ද, ව්‍යඤ්ජනවශයෙන්ද, නයවශයෙන් ද, කාරණවශයෙන් ද, හෙතුවශයෙන් ද, උදහරණවශයෙන් ද, උපමා වශයෙන් ද කියන්නාහු ද, නො හැර ම කියන්නාහු ද, දෙශනා කෙරෙද් ද, නො හැර ම දෙශනා කෙරෙද් ද, මහරජානෙනි, මෙබඳු වූ භික්ෂූන් වහන්සේලා ලොවුතුරා බුදුන්ගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි ධාර්මිකා-පණිකයෝ ය'' යි කියනු ලැබෙත්.

''මහරජානෙනි, යම් ඒ භික්ෂූන් වහන්සේලා කෙනෙක් සද්ධර්ම රත්න නමැති භොගයෙන් හා ආගම පර්යාප්ති ශ්‍රැත භොගයෙන් භොගවත් වූවාහු ද, ධනවත් වූවාහු ද, නිර්දිෂ්ට ස්වරව්‍යඤ්ජන ලක්ෂණ ප්‍රතිවෙධ ඇත්තාහු ද, විදුරෙන් විදුර විදින්නාක් මෙන් අභිධර්ම ප්‍රස්ථානප්‍රකරණාදි යෙහි ප්‍රඥව පතුරුවන්නා වූ ප්‍රාඥයෝ ද යන මෙබඳු වූ භික්ෂූන් වහන්සේලා මහරජානෙනි, ලොවුතුරා බුදුන්ගේ ශ්‍රී සද්ධර්මමහානගරවරයෙහි ධාර්මික වූ සිටුවරු ය'' යි කියනු ලැබෙත්.

''මහරජානෙනි, යම් ඒ භික්ෂූන් වහන්සේලා කෙනෙක් මහත් වූ ධර්මදෙශනා ප්‍රතිවෙධ ඇතිසේක්ලා ද, පුරුදු කරණ ලද අරමුණු බෙදීම් හා නිර්දෙශ ඇත්තාහු ද, අධිශීල අධිචිත්ත අධිපඤ්ඤා යන ත්‍රිවිධශික්ෂා

Non-Commercial Distribution

රාශියගේ පරතෙරට පැමිණියාහු ද, මහරජානෙනි, මෙබඳු වූ භික්ෂූන්-වහන්සේලා ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මමහානගර වරයෙහි ප්‍රසිද්ධ වූ ධාර්මිකයෝ ය'' යි කියනු ලැබෙත්.

''මහරජානෙනි, ලොවුතුරා බුදුන්ගේ සද්ධර්මනුවර මෙසේ මනා කොට බෙද කරණ ලද්දේ ය. මෙසේ මවන ලද්දේ ය. මෙසේ පවිත්‍ර කරණ ලද්දේ ය. මෙසේ ලොකොත්තරරත්නයෙන් පුරවන ලද්දේ ය. මෙසේ ව්‍යවස්ථා කරණ ලද්දේ ය. මෙසේ රක්ෂා කරණ ලද්දේ ය. මෙසේ ගොපනය කරණ ලද්දේ ය. මෙසේ ප්‍රතිවිරුද්ධ වූ මාරාදි පස-මිතුරන් විසින් යුද්ධ කොට පැහැර ගත නො හැක්කේ ය. මහරජානෙනි, මේ කාරණයෙන් ද, මේ හෙතුයෙන් ද, මේ නයින් ද, මේ අනුමානයෙන් ද ඒ ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ ඇතැ යි කියා ම දැන ගත යුත්තේ යි. යම් සේ යහපත් කොට බෙද කරණ ලද මනොරම්‍ය වූ නුවර දැක ඒ නුවරට පැමිණියා වූ ජනයෝ අනුමානයෙන් ම වඩුවාගේ මහත්ත්වය දැන ගණිද්ද, එපරිද්දෙන් ම සර්වලොකෛකනායක වූ ලොවුතුරා බුදුන්ගේ උතුම් වූ ශ්‍රී සද්ධර්මමහනුවර දැක බෞද්ධාගමධාරී වූ පණ්ඩිතජනයෝ අනුමානයෙන් ම ඒ ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ ඇතැ යි ම කියා දැන ගන්නාහු යි.

**''යථාපි නගරං දිස්වා–සුවිභත්තං මනොරමං,**
**අනුමානෙන ජානන්ති–වඩ්ඪකිස්ස මහත්තතං.**
(432) **තථෙව ලොකනාථස්ස–දිස්වා ධම්මපුරං වරං,**
**අනුමානෙන ජානන්ති–අත්ථි සො භගවා ඉති''** යි.

''නවද, මහරජානෙනි, යම් සේ මහාසමුද්‍රයෙහි මහාකඳු සේ අඹරවන්නා වූ ඌර්මිවෙගය දැක 'මේ මහාරළවෙගයෙක් දක්නා ලැබෙයි. එහෙයින් ඒ සමුද්‍රයතෙම ඉතා මහත් වන්නේ ය' යි කියා ජනයෝ අනුමානයෙන් ම දැන ගණිද්ද, එපරිද්දෙන් ම සදිව්‍යමනුෂ්‍යලොකයෙහි එකපැහැර දුවන්නා වූ සද්ධර්මරළවෙගය දැක යම් සේ සද්ධර්මරළවෙගය මහත් වී ද, එපරිද්දෙන් ම එහෙයින් බුදුරජානන් වහන්සේ ලොකත්‍රයට ම අග්‍ර වනසේකැ යි කියා අනුමානයෙන් ම සියලු ම ශොක දුරු කරන්නා වූ හැම තැන්හි ම පරාජයක් නැත්තා වූ ත්‍රිවිධ තෘෂ්ණාක්ෂයට පැමිණියා වූ සියලු ම සංසාරභවයෙන් මිදුනා වූ සියල්ල දත්තා වූ බුදුහු දැන ගත යුතු වන්නාහ.

**''අනුමානෙන ජානන්ති–ඌර්මි දිස්වාන සාගරෙ,**
**යථායං දිස්සතෙ ඌර්මි–මහන්තො සො භවිස්සති.**

**තථා බුද්ධං සොකනුදං–සබ්බත්ථ මපරාජිතං,**
**තණ්හක්ඛයමනුප්පත්තං–භවසංසාර මොචනං.**

**අනුමානෙන ඤාතබ්බො–ඌර්මිං දිස්වා සදෙවකෙ,**
**යථා ධම්මූම්මිවිප්ඵාරො–අග්ගො බුද්ධො භවිස්සති''** යි.

Non-Commercial Distribution

"නවද, මහරජානෙනි, යම් සේ ඉතා උස් ව පැන නැංගා වූ හිමාලය පර්වතය දැක ලොකවාසීහු 'මේ ඉතා උස් වූ ඒ හිමාලයපර්වතය වන්නේ ය' යි කියා අනුමානයෙන් දැන ගණිද්ද, එපරිද්දෙන් ම සිහිල් වූ උපධි රහිත වූ අචල වූ සුප්‍රතිෂ්ඨිත වූ භවාග්‍රය දක්වා ඉතා උස් වූ ලොවුතුරා බුදුන්ගේ සද්ධර්මපර්වතය දැක 'ඒ මහාවීර බුදුරජතෙමේ අග්‍ර වන්නේ ය' යි කියා එසේ ම අනුමානයෙන් ම දැන ගත යුතු වන්නේ ය.

**"අනුමානෙන ජානන්ති-දිස්වා අච්චුග්ගතං ගිරිං,**
**යථා අච්චුග්ගතො එසො-හිමවා සො භවිස්සති.**

**තථා දිස්වා ධම්මගිරිං-සීතිභූතං නිරූපධිං,**
**අච්චුග්ගතං භගවතො-අචලං සුප්පතිට්ඨිතං.**

**අනුමානෙන ඤාතබ්බො-දිස්වාන ධම්මපබ්බතං,**
**තථා හි සො මහාවීරො-අග්ගො බුද්ධො භවිස්සති" යි.**

නවද, මහරජානෙනි, යම් සේ හස්තිරාජයාගේ පියවර දැක මනුෂ්‍යයෝ 'මේ පාද තබා ගියා වූ මේ තෙමේ මහාහස්තිරාජයෙකැ' යි කියා අනුමාන යෙන් ම දැන ගණිද් ද, එපරිද්දෙන් ම ලොවුතුරා සර්වඥරාජ නමැති හස්තිරාජයාගේ චතුර්විධඍද්ධිපාදයන් හා සච්චබද්ධ සමන්තකූට නර්මද නදී පුලිනතීරාදියෙහි තැබූ ශ්‍රීපාදලාංඡනයන් දැක නුවණැත්තතෝ ඒ සර්වඥරාජොත්තමයානන් වහන්සේ ඉතා මහත් වනසේකැ යි කියා නුවණින් දැන ගන්නාහු යි.

**(433) "යථාපි ගජරාජස්ස-පදං දිස්වාන මානුසා,**
**අනුමානෙන ජානන්ති-මහා එසො ගජො ඉති.**

**තථෙව බුද්ධනාගස්ස-පදං දිස්වා විභාවිනො,**
**අනුමානෙන ජානන්ති-උළාරො සො භවිස්සති" යි.**

"නවද, මහරජානෙනි, යම් සේ භයින් භීත වූ ලාමකමෘගජාතීන් දැක 'සිංහරාජයාගේ ශබ්දයෙන් මේ ලාමක වූ මෘගජාතීහු මෙසේ භය වූවාහු ය' යි කියා ලොකවාසී ජනයෝ අනුමානයෙන් ම දැන ගණිද්ද, එපරිද්දෙන් ම 'අඤ්ඤෙපි අත්ථි භික්ඛවෙ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබොධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවෙදනීයා' යනාදීන් දෙශනා කර වදරන්නා වූ සර්වඥකෙසරසිංහරාජොත්තමයානන් වහන්සේගේ සද්ධර්ම ගර්ජනාව අසා භ්‍රාන්ත වූ සිත් ඇති විස්තීර්ණ වූ අනන්තතීර්ථක සමූහයන් දැක 'එකාන්තයෙන් ම සද්ධර්මරාජොත්තමයානන් වහන්සේ විසින් කරණ ලද ගර්ජනාවෙකැ' යි කියා අනුමානයෙන් ම දත යුත්තේ යි.

**"අනුමානෙන ජානන්ති-භීතෙ දිස්වාන කුම්මිගෙ,**
**මිගරාජස්ස සද්දෙන-භීතා 'මෙ කුම්මිගා ඉති.**

**තථෙව තිත්ථියෙ දිස්වා-විත්ථතෙ භීතමානසෙ,**
**අනුමානෙන ඤාතබ්බං-ධම්මරාජෙන ගජ්ජිතං" යි.**

Non-Commercial Distribution

"තවද, මහරජානෙනි, මහාමෙඝය වර්ෂා කෙරෙමින් මහාඋෂ්ණය නිවී ගියා වූ ලිං පිහිලි දෙණිපත් පිරීමෙන් මහොදික වූ මනා ව නිල් ව ගියා වූ තෘණ ලතා පත්‍ර ඇති පෘථිවිතලය දැක ජනයෝ 'මේ මහානියඟ මහාමෙඝයෙන් ශාන්ත ව නිවී යන ලදැ' යි කියා අනුමානයෙන් ම දැන ගණිද්ද, ඒ එපරිද්දෙන් ම ස්වර්ගමොක්ෂ සම්පත්ති ප්‍රතිලාභයෙන් ආමොදිත ප්‍රමුදිත වූ මේ සත්වලොකයා දැක 'ඒකාන්තයෙන් ම සද්ධර්ම මහාමෙඝයෙන් සන්තර්පිත වූයේ ය' යි කියා ලක්ෂණානුසාර වූ අනුමාන ඥානයෙන් දැන ගත යුත්තේ යි.

"නිබ්බුතං පඨවිං දිස්වා–හරිතපත්තං මහොදිකං,
අනුමානෙන ජානන්ති–මහාමෙඝෙන නිබ්බුතං.

තථෙවිමං ජනං දිස්වා–ආමොදිත පමොදිතං,
අනුමානෙන ඤාතබ්බං–ධම්මමෙඝෙන තප්පිතං" යි.

"තවද, මහරජානෙනි, යම් සේ තැබූ පය ගැලී ඇලෙන්නා වූ මහමඩ ගොහොරුවක් වූ බොරමඩින් තෙත් වූ මහාපෘථිවිතලයක් දැක මනුෂ්‍යයෝ 'අහෝ! මේ ගෝරු මඩ වීමට මෙහි මහාජලස්කන්ධයෙක් ආයේ වනැ'යි කියා ලක්ෂණානුසාර වූ අනුමානඥානයෙන් ම දැන ගණිද්ද, එපරිද්දෙන් ම අප ලොවුතුරා සර්වඥයන් වහන්සේ ක්ලේශරජස්කර්දමයෙන් වැලඳ සිටියා වූ මේ ජනසමූහයා දැක කරුණාකර වදරමින් ධර්මදෙශනා නමැති ගංගාවෙන් උසුලමින් ලොකොත්තරධර්ම නමැති අමෘතමහාසාගරයෙහි හරණ ලද්දේ ය. එහෙයින් සද්ධර්මාමෘතමහාසගරයට පැමිණියා වූ (434) දිව්‍යබ්‍රහ්මයන් සහිත වූ පෘථිවිනිඃශ්‍රිත වූ මේ මනුෂ්‍යජනයා දැක නුවණැත්තන් විසින් 'අහෝ! මෙහි මහාධර්මස්කන්ධයෙක් පැතිර ගියේ ය' යි කියා අනුමානඥානයෙන් ම දැන ගත යුත්තේ යි.

"ලග්ගං දිස්වා භුසං පඞ්කං–කලලද්දගතං මහිං,
අනුමානෙන ජානන්ති–වාරික්ඛන්ධො මහා ගතො.

තථෙවිමං ජනං දිස්වා–රජොපඞ්කසමොහිතං,
වහිතං ධම්ම නදියා–විස්සට්ඨං ධම්මසාගරෙ.

ධම්මාමතගතං දිස්වා–සදෙවකමිමං මහිං,
අනුමානෙන ඤාතබ්බං–ධම්මක්ඛන්ධො මහාගතො"යි.

"තවද, මහරජානෙනි, යම් සේ උතුම් වූ සුගන්ධය නාසයෙන් ආඝ්‍රාණය කොට 'මේ මහාසුගන්ධයෙක් හමන්නේ ය. එහෙයින් සුපුෂ්පිත මල් ඇති සපු දුනුකේ මුහුනාදී වෘක්ෂයෝ සමීපයෙහි වන්නාහු ය' යි කියා ජනයෝ අනුමානයෙන් ම දැන ගණිද්ද, එපරිද්දෙන් ම 'මේ ශීලසුගන්ධය ද සනරාමර සකල ලොකයෙහි පැතිර හමන්නේ ය. ඒ කාරණයෙන් අනුත්තර වූ අප තිලෝගුරු සර්වඥරාජොත්තමයානන් වහන්සේත් ඇතැ' යි කියා ම අනුමාන සංඛ්‍යාත ඥානයෙන් දැන ගත යුත්තේ යි.

Non-Commercial Distribution

**"අනුමානෙන ජානාති - ඝායිත්වා ගන්ධමුත්තමං,**
**යථායං වායති ගන්ධො - හෙස්සන්ති පුප්ඵිතා දුමා.**

**තථෙවායං සීලගන්ධො - පවායති සදෙවකෙ,**
**අනුමානෙන ඤාතබ්බො - අත්ථි බුද්ධො අනුත්තරො" ති.**

මහරජානෙනි, එබඳු වූ කාරණා සියයකින් කාරණා දහසකින් හෙතු සියයකින් හෙතු දහසකින් නය සියයකින් නය දහසකින් උපමා සියයකින් උපමා දහසකින් බුද්ධබලය ගෙණ හැර දක්වා පියන්නට සමර්ථයෙමි. හැකි වන්නෙමි. එසේ වුවත් බුදුබල නො ගෙවේ ම ය. මහරජානෙනි, යම් සේ මල් ගෙතීමෙහි අතිදක්ෂ වූ මාලාකාරයෙක් තෙම සුගන්ධකෙතකී වකුල සපු සිනිද්ද දැසමන් ආදී නානාප්‍රකාරපුෂ්පරාශියකින් ආචාර්යානුශාසන වූ පරිද්දෙන් තමා තුළ වූ ශක්තියෙන්[1] විසිතුරු වූ මාලාබන්ධන රාශියක් කරන්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ත්‍රිභුවන ජන වන්දනීය වූ ඒ අප භාග්‍යවත් වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ අනෙකවර්ණ ඇති විසිතුරු වූ මල්රාශිය මෙන් අනන්ත වූ ගුණ ඇතිසේක. අප්‍රමෙය වූ ගුණ ඇතිසේක. මේ සර්වඥශාසනයෙහි මම දූන් මල් ගොතන්නා වූ මාලාකාරයෙකු මෙන් පූර්වාචාර්යවරයන්ගේ අර්ථකථා[2] මාර්ගයෙන් ද මාගේ ප්‍රඥශක්තිබලයෙන් ද අසංඛ්‍ය වූ කාරණයෙන් සුගතතථාගතඅර්හත්සම්‍යක්සම්බුද්ධබලය අනුමානයෙන් ම තොපට දක්වා කියන්නෙමි. ප්‍රකාශ කෙරෙමි. ඒ අප ලොවුතුරා සද්ධර්ම චක්‍රවර්ති වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ මේ යථොක්ත වූ සද්ධර්මමහානගරවරයෙහි බුද්ධරාජ්‍යශ්‍රී කර වදරමින් අමෘතමහානිර්වාණ පුර ප්‍රවිෂ්ට වූසේක. පරිභොගය කර වදළා වූ සත්තබොද්ධ්‍යංගාදී ලොකොත්තර වූ පරිභොග **(435)** භාණ්ඩයන් දූක අප බුදුන් ඇති බව තත් වූ පරිද්දෙන් ම දන්නෙමි. මහරජානෙනි, තෙපි වනාහි මා කී මේ අනුමාන ප්‍රශ්නාර්ථයෙහි තවත් අර්ථ අසනු කැමැත්තාහු නම්, අසනු පිණිස සඳ උපදව" යි වදළසේක.

"සාධු, සාධු, ස්වාමීනි, නාගසෙන ස්ථවිරොත්තමයානෙනි, නුඹ වහන්සේ මුත් ලොවුතුරා බුදුන් හැර මේ ප්‍රශ්නය විසඳන්නෝ කවුරු ද? මෙබඳු වූ කාරණා දක්වීමෙන් අනුමානයෙන් ම සර්වඥබල දක්වා පියන්නට සෙස්සන්ට දුෂ්කර වන්නේ ය. ස්වාමීනි, නාගසෙන ස්ථවිරොත්තමයානෙනි, නුඹ වහන්සේගේ මේ සකල සුර නර හෘදයානන්දනය කරවන්නා වූ පරම විචිත්‍ර මධුරතර ප්‍රශ්න ව්‍යාකාරණයෙන් මම සහස්‍රකිරණයාගේ රශ්මියෙන් ප්‍රබොධ වූ පද්මයක් සෙයින් නිර්වෘත වීමි" යි කියා ස්තොත්‍ර කළහ.

**මහාඅනුමානප්‍රශ්නය නිමි.**

---

1. 'සතුරුපුරුෂාකාරයෙන් මල් අල්වා' යන මෙය 'පච්චත්තපුරිසකාරෙන' යන්නෙහි අර්ථය නො වේ. 2. අත්‍ථි ගුණ කථා

Non-Commercial Distribution

# ධුතඞ්ගානිසංස ප්‍රශ්නය.

නැවතත් **මිලිඳු**මහරජානෝ එක් දිනෙක තමාගේ රාජභවනයෙහි ශ්‍රී යහන්මස්තකයෙහි වැද හෙව තමන් **නාගසෙන**ස්ථවිරොත්තමයානන් වහන්සේගෙන් විචාළ තාක් අර්ථධර්මයන් මෙනෙහි කරමින් සර්වඥ ශාසනය නිර්මල සේ දක ප්‍රීතියෙන් පිණා නැවැත නැවැතත් ප්‍රඥවෙන් විමසමින් කෙලෙස්ධුතාංගගුණයට බටුවා වූ ආරණ්‍යයක භික්ෂූන් දුටුවාහු ය. නැවැත අනාගාමිඵලයට පැමිණ සිටින්නා වූ බොහෝ ගෘහස්ථයන් දුටුවාහු ය. ඒ දෙපක්ෂයන් බලා 'ඉදින් ගෘහස්ථනෙම මාර්ගඵලධර්මයන් අවබොධ කරන්නේ වී නම්, දුෂ්කර වූ කෙලෙස් ධුතාංගය නිෂ්ඵල වන්නේ ය' යි කියා ඒ මිලිඳු මහරජහට මහත් වූ කුකුසෙක් උපන්නේ ය. ඒ කුකුස් උපන්නා වූ **මිලිඳු** මහරජානෝ 'එබැවින් මම පරවාදීන්ගේ වාදමථනය කරන්නා වූ පිටකත්‍රයධර්මයෙහි නිපුණ වූ චිත්‍රකථීන්ට ශ්‍රෙෂ්ඨ වූ නාගසෙන ස්ථවිරොත්තමයානන් වහන්සේගෙන් විචාරමි. ඒ නාගසෙන ස්ථවිරොත්තමයානන් වහන්සේ මාගේ කාංක්ෂාව දුරු කර වදරණසේකැ' යි සිතූහ. ඉක්බිති **මිලිඳු** මහරජානෝ ආයුෂ්මත් වූ නාගසෙන ස්ථවිරොත්තමයානන් වහන්සේ යම් තැනෙක වැඩ වාසය කර වදරණසේක් ද, එතැන්හි එළෙඹියාහු ය. එළඹ ආයුෂ්මත් වූ නාගසෙන ස්ථවිරොත්තමයානන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහු ය. එකත්පසෙක සිටියා වූ මිලිඳුමහරජානෝ ආයුෂ්මත් වූ නාගසෙන ස්ථවිරොත්තමයානන් වහන්සේට මෙපවත් කීවාහු ය:— ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ගිහිගෙයි වාසි වූ පඤ්ච කාමභොගී වූ පුත්‍රදරාවන්ගෙන් සම්බාධ වූ ශයනයෙහි වසන්නා වූ කාසිකසඳුන් පරිභොග විඳින්නා වූ මල් ගඳ විලෙවුන් දරන්නා වූ රන් රිදී සිතින් ඉවසන්නා වූ මුක්තාමාණික්‍යස්වර්ණයෙන් විචිත්‍ර වූ ඔටුනු බඳනා ලද්ද වූ කිසි ගෘහස්ථයෙක් ඇද්ද, ඒ යම් ගෘහස්ථයෙකු විසින් ශාන්ත වූ පරමාර්ථ වූ අමෘතමහානිර්වාණය සිද්ධ කරණ ලද්දේ ද?'' යි විචාළෝ ය.

''මහරජානෙනි, ගෘහස්ථභූමියෙහි ම සිට නිවන් දක්කා වූ සත්වයෝ එක ම සියයකුදු නො වන්නාහ.[1] දෙසියයකුදු නො වන්නාහ.[1] තුන්සියයකුදු සාරසියයකුදු පන්සියයකුදු නො වන්නාහ.[1] දහසකුදු නො වන්නාහ.[1] ලක්ෂයකුදු නො වන්නාහ. සියක්කොටියකුදු නො වන්නාහ. **(436)** කොටිදහසකුදු නො වන්නාහ. කොටිලක්ෂයකුදු නො වන්නාහ. මහරජානෙනි, දසදෙනකුන්ට සියක් දෙනකුන්ට දහසක් දෙනකුන්ට වූ අභිසමය තිබේවා. මහරජානෙනි, තොපට කෙබඳු වූ කාරණයකින් කථා කිරීමට අවකාශ දෙන්නෙම් ද?[2] තෙපි ම මේ කාරණය කියව. මහරජා

1. නො වන්නේ ය.

2. 'තොපට' යනාදි පාඨය ''කතමෙන තෙ පරියායෙන අනුයොගං දම්මි'' යන පාලි පාඨයෙහි පරිවර්තනය වුවත් අදහස පැහැදිලි නො වේ ''කවර ලෙසකින් තොපට ප්‍රශ්න විචාරීම දෙම් ද?'' යනු පාලිපාඨයෙහි අදහස යි.

Non-Commercial Distribution

නෙනි, එහෙයින් ම තොපට කාරණා සියයකින් හෝ දහසකින් හෝ ශත සහස්‍රයකින් හෝ කොටියකින් හෝ සියක්කොටියකින් හෝ කොටි දහසකින් හෝ කොටිශතසහස්‍රයකින් හෝ කියන්නෙමි. නවාංගශාස්තෘ වචනයෙහි යම් කිසි සල්ලෙඛිතාචාරප්‍රතිපත්තිධූතගුණවරාංගනිඃශ්‍රිත වූ ධර්මකථාවෙක් ඇද්ද, ඒ සියලු ම කථාවෝ මේ ධූතාංගප්‍රශ්නයෙහි ම ඇතුළත් වෙත්. මහරජාණෙනි, යම් සේ මිටි උස් සම විසම නො ගොඩ ගොඩ වූ ප්‍රදෙශභාගයෙහි වර්ෂා කරණ ලද්ද වූ ඒ සියලු ම උදකය ඒ ඒ වර්ෂා කළ තැනින් ගලා අවුත් ඇළින් හොයට ගහින් ගොස් මහොදධි වූ මහාසමුද්‍රයට යන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම නවාංගබුද්ධ වචනයෙහි යම් කිසි සල්ලෙඛිතාචාරප්‍රතිපත්තිධූතාංගගුණවරාංග නිඃශ්‍රිත කථාවන් සම්පාදනය කරණ පුද්ගලයන් ඇති කල්හි ඒ සියලු කථාවෝ මේ ධූතාංග ප්‍රශ්නයෙහි සමොසරිත වෙති. මහරජාණෙනි, මේ ප්‍රශ්නයෙහි මාගේ හාත්පසින් ව්‍යක්ත වූ ප්‍රඥාවෙන් කාරණා දක්වීම සමොසරිත වන්නේ ය. ඒ කාරණයෙන් මේ අර්ථය මනා කොට විභාග කරණ ලද වන්නේ ය. විචිත්‍ර කරණ ලද වන්නේ ය. පරිපූර්ණ වන්නේ ය, සිතින් බුහුමන් කරණ ලද වන්නේ ය. මහරජාණෙනි, යම් සේ දක්ෂ වූ සුශික්ෂිත වූ ලියනාචාර්යයෙක් තමාගේ මිත්‍රාමාත්‍යාදීන්ට ලියමනක් අස්වනු කැමැති වූයේ තමාගේ ව්‍යක්ත බැවින් හා ප්‍රඥාවෙන් නොයෙක් කාරණා දක්වීමෙන් ලියමනක් ලියා පරිපූර්ණ කරන්නේ ය. මෙසේ ලියන ලද්ද වූ ඒ ලියමන පරිපූර්ණ ව අනූන ව සම්පූර්ණ වන්නේ ය. එපරිද්දෙන් ම මාගේ ද සර්වාකාරයෙන් ව්‍යක්ත වූ විශදප්‍රඥාවෙන් මේ ප්‍රශ්නයෙහි නොයෙක් කාරණා දක්වීම පැමිණෙන්නේ ය. එහෙයින් මේ අර්ථය මනා කොට විභාග කරණ ලද වන්නේ ය. විචිත්‍ර කරණ ලද වන්නේ ය, පරිපූර්ණ වන්නේ ය, සිතින් බුහුමන් කරණ ලද වන්නේ යි.

''මහරජාණෙනි, **සැවැත්නුවර** අප ලොවුතුරා සර්වඥයන් වහන්සේගේ උපාසක උපාසිකා වූ පස්කොටියක් පමණ ආර්යශ්‍රාවකයෝ ය. ඔවුන් අතුරෙන් තුන්ලක්ෂපණස්සත්දහසක් දෙන අනාගාමිඵලයෙහි පිහිටියාහු ය. ඒ සියල්ලෝ මත් ප්‍රව්‍රජිත නො වූ ගෘහස්ථයෝ ම ය. නැවත ද එම ශ්‍රාවස්තිපුරයෙහි ම **ගණ්ඩම්බවෘක්ෂමූලයෙහි** වැඩ හිඳ කර වදළා වූ යමකප්‍රාතිහාර්යයෙහි දිව්‍යමනුෂ්‍යයන්ගෙන් විසිකොටියක් දෙන මාර්ගඵලාධිගමය කළාහු ය. නැවත **මහාරාහුලොවාදසූත්‍රදෙශනාව** කර වදළ දවස්හි ද, **මහාමංගලසූත්‍රාන්තයෙහි** ද, **සමචිත්තපර්යායසූත්‍රාන්තයෙහි** ද, **පරාභවසූත්‍රාන්තයෙහි** ද, **පුරාභෙදසූත්‍රාන්තයෙහි** ද, **කලහවිවාදසූත්‍රාන්තයෙහි** ද, **චූලබ්‍යූහසූත්‍රාන්තයෙහි** ද, **මහාබ්‍යූහසූත්‍රාන්තයෙහි** ද, **තුවටකසූත්‍රාන්තයෙහි** ද, **ශාරිපුත්‍රසූත්‍රාන්තයෙහි** ද ගණනපථය අතික්‍රාන්ත වූ දිව්‍යමනුෂ්‍යයන්ට ධර්මාභිසමය වූයේ ය. **රාජගෘහනගරයෙහි** ලොවුතුරා **(437)** බුදුන්ගේ උපාසක උපාසිකා වූ ආර්යශ්‍රාවකයෝ තුන්ලක්ෂපණස්දහසෙක. නැවත ඒ රාජගෘහනගරයෙහි ම **ධනපාලහස්තිනාගේන්ද්‍ර** දමනයෙහි අනූකොටියක් ප්‍රාණීහු අධිගමයට පැමිණියාහ. **මගධරට**

Non-Commercial Distribution

දෙලොස්යොදුන් ශිලාතලය මස්තකයෙහි වූ දෙවාලයස්ථානයෙහි වැඩ හිඳ සොළොස්දහසක් බමුණන්ට **පාරායණය** දෙසූ පාරායණසමාගමයෙහි තුදුස්කෙළක් ප්‍රාණීහු අමාමහනිවන් දුටුහ. එම **මගධරට වෙදීය** පර්වතයෙහි **ඉන්ද්‍රශාලා** නම් ගල්ගුහායෙක වැඩ හිඳ **සක්දෙවිඳුහට ශක්‍ර ප්‍රශ්න** සූත්‍රය දෙසූ දවස්හි අසූකෝටියක් පමණ දෙවියෝ අධිගමයට පැමිණියාහ. නැවත ද, **බාරා** ය, **නසී** ය යන ගංගාද්වයකින් ප්‍රතිමණ්ඩිත වූ හෙයින් **බාරානසී** නම් වූ ඍෂීන්ගේ පතනයෙන් **ඉසිපතන** නම් වූ මෘගයන්ට අභයදයක වූ **මිගදය** නම් වූ **ඉසිපතනාරාමයෙහි** වැඩ හිඳ කර වදළ ප්‍රථම ධර්මදෙශනායෙහි අටළොස්කොටියක් බ්‍රහ්මයෝ රහත් වූහ. අප්‍රමාණ වූ දෙවතාවෝ අධිගමයට පැමිණියාහු ය. නැවත **තව්තිසාභවන** යෙහි **පාණ්ඩුකම්බලශෛලාසනයෙහි** වැඩ හිඳ කර වදළ අභිධර්මදෙශනා යෙහි අසූකොටියක් දෙවියෝ අධිගමයට පැමිණියාහු ය. ඒ අභිධර්ම දෙශනාවසානයෙහි **ශක්‍රපුරය** පටන් **සකස්පුර** දෙරටුව දක්වා පිහිටි සත් රුවන් විචිත්‍ර වූ මාණික්‍ය සොපානමාලාවෙන් අනන්ත වූ බුද්ධශ්‍රීයෙන් දිලියෙමින් යට අවීචියෙහි පටන් මත්තෙන් භවාග්‍රය පර්යන්ත කොට සරස ශතසහශ්‍රීලොකධාතුව එකාලොක කෙරෙමින් ඒ තාක් සමස්තලොක වාසීන්ට ලොකවිවරණප්‍රාතිහාර්යයෙන් රූපකායසම්පත් දක්වදක්වා දිව්‍ය බ්‍රහ්මයන් විසින් කරණ ලද අනන්තපූජොත්සව විඳිමින් මංපඩියෙන් මංපඩිය පාපියුම් තබතබා මනුෂ්‍යපථයට වැඩ සකස්පුර ආසන්නයෙහි මාණික්‍යසොපානාසන්නයෙහි වැඩ හිඳ ලොකවිෂය ශ්‍රාවකවිෂය වූ ප්‍රශ්න විචාරා වදරා ධර්මදෙශනා කළ කල ප්‍රසන්න දිව්‍යමනුෂ්‍යයන්ගෙන් තිස් කොටියක් ප්‍රාණීන්ට නිර්වාණාභිසමය වූයේ ය. නැවත තමන් වහන්සේගේ නෑ වූ **ශාක්‍යරජුන්** නිසා **කපිලවස්තුපුරයට** වැඩි ගමනේ **නිග්‍රොධාරාම** යෙන් අහසට වඩිමින් රුවන් සක්මන වැඩ හිඳ වදළ **බුද්ධවංශධර්ම** දෙශනායෙහි හා **චර්යාපිටකදෙශනායෙහි** **මහාසමයසූත්‍රාන්තදෙශනා** යෙහි ද ගණනපථය අතික්‍රාන්ත වූ දිව්‍යබ්‍රහ්මමනුෂ්‍යයන්ට ද නිර්වාණාභි-සමය වූයේ ය. නැවත **සුමනමාලාකාර** සමාගමයෙහි ද, **ගරහදින්න** සමාගමයෙහි ද, **ආනන්ද සෙට්ඨි** සමාගමයෙහි ද, **ජම්බුකාජීවක** සමාගම යෙහි ද, **මණ්ඩූකදෙවපුත්‍ර** සමාගමයෙහි ද, **මට්ටකුණ්ඩලී** දෙවපුත්‍රසමාගම යෙහි ද, **සුලසා නගරසොභිනී** සමාගමයෙහි ද, **සිරිමා** නගරසොභිනී සමාගමයෙහි ද, **පෙසකාරධීතෘ** සමාගමයෙහි ද, **චූළසුභද්‍රා** සමාගමයෙහි ද. **සාකෙතබ්‍රාහ්මණයාගේ** ආදහනදර්ශනසමාගමයෙහි ද, **සුනාපරන්තක** සමාගමයෙහි ද, 'සබ්බදනං ධම්මදනං ජිනාති' යනාදීන් විසඳා වදළ **ශක්‍ර ප්‍රශ්න** සමාගමයෙහි ද, **තිරොකුඩ්ඩ** සමාගමයෙහි ද, **රතනසූත්‍ර** සමාගම යෙහි ද යන මේ පසළොස් සමාගමයෙහි වෙන වෙන ම සුවාසූදහසක් සුවාසූදහසක් ප්‍රාණීන්ට නිර්වාණාභිසමය වූයේ ය.

"මහරජ නෙනි, භාග්‍යවතුන් වහන්සේ යම් තාක් කල් ලොකයෙහි වැඩ සිටීසේක් ද, ඒතාක් කල් **දඹදිවට** නාභිමණ්ඩලාකාරයෙන් පිහිටි
(438) බෝමැඩ වට තුන්සියයක් යොදුන් ප්‍රමාණ ඇති **අන්තොමණ්ඩල**

යෙහි ද සසියක් යොදුන් ප්‍රමාණ ඇති මධ්‍යමණ්ඩලයෙහි ද පශ්චිම දිග් භාගයෙහි **ථූන** නම් බ්‍රාහ්මණග්‍රාමය පටන් පූර්වදිග්භාගයෙහි **කජංගලා** නම් නිගමග්‍රාමාන්තයෙහි **මහාශාලවෘක්ෂය** දක්වා තුන්සියයක් යොදුන් දිග ඇත්තා වූ දකුණුදෙසින් **සෙතකණ්ණික** නම් නියම්ගම පටන් උත්තර දිශායෙහි **උසීරද්ධජ** නම් පර්වතය දක්වා දෙසියපණස්යොදුන් පළල ඇත්තා වූ නවසියයක් යොදුන් වට ඇත්තා වූ **මහාමණ්ඩලයෙහි** ද යන මේ බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ ආර්යශ්‍රාවක චක්‍රවර්තීන්ගේ උත්පත්තිස්ථාන වූ ත්‍රිවිධමණ්ඩලයෙහි බොහෝ සෙයින් වැඩත් ධර්මදෙශනා කරණසේක. එයින් පිටත් **අඟු මගධ කාශි කොශල වැදෑ මල්ල චේතිය සාර්ණ කුරු පඤ්චාල මත්ස්‍ය සූරසේන අස්සක අවන්ති ගන්ධාර කාම්බොජ** යන සොළොස් මහාජනපදයෙහි ද යම් යම් තෙනෙක භාග්‍යවතුන් වහන්සේ තුරිතාතුරිස චාරිකා කොට වැඩ වාසය කර වදළසේක් ද, ඒ ඒ තන්හි බොහෝ සෙයින් දෙදෙන තුන්දෙන සතරදෙන පස්දෙන සියයක් දහසක් ශතසහස්‍රයක් දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද බණ අසා ශාන්තසුඛ ප්‍රණීත වූ උතුම් අමෘතමහානිර්වාණය සිද්ධ කළාහු ය. මහරජානෙනි, යම් ඒ සත්වකෙනෙක් මහණ නො වීම නිවන් ලද්දාහු ද, ඒ සත්වයෝ ගිහියෝ ම ය. ඒ සත්වයෝ ප්‍රව්‍රජිත නුවූවෝ ය. මහරජානෙනි, මේ ගණන් දැක් වූ දිව්‍යමනුෂ්‍යයෝ ද, අනිකුත් නොයෙක් අගාරික වූ කාම භොගී වූ ගෘහස්ථ වූ දෙවතාවෝ කොටිශතසහස්‍රගණනෙක් ශාන්තසුඛ ප්‍රණීත පරමවර අමෘතමහානිර්වාණය සාක්ෂාත් කළාහු ය'' යි වදළසේක.

''යහපත, ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, නුඹවහන්සේ බොහෝ වූ ධර්මරාශියක් වදළසේක. එහෙයින් ඉදින් අගාරික වූ කාමභොගී වූ ශාන්ත වූ පරමාර්ථ වූ නිර්වාණය සිද්ධ කරන්නාහු ය. එසේ කල මේ තෙළෙස්ධුතාංගයෝ කුමන අර්ථයක් සාධන්නාහු ද, ඒ කාරණයෙන් තෙළෙස්ධුතාංගයෝ අකෘත්‍යකර වෙති. ඉදින් ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, මන්ත්‍රෞෂධයෙන් ප්‍රයොජනයක් නැති ව ම ව්‍යාධිහු ව්‍යපශමනය වෙත් නම්, වමනවිරෙචනාදී, ශරීර දුර්වල කරණයෙන් කම් කිම් ද? ඉදින් මිටි පහරින් පරසතුරන් නිග්‍රහ කට හැකි වේ නම්, අසි තෝමර සර ධනු හෝ දඬු පොලු මුගුරුවලින් කම් කිම් ද? ඉදින් ග්‍රන්ථි කුටිල ශුෂිර කණ්ටක ලතා ශාඛාවන් එල්වී ගෙණ මහරුකට නැඟීම වේ නම්, දිග දැඩි හිණිමං සෙවීමෙන් කම් කිම් ද? ඉදින් පෘථිවි ශයනයෙන් ම ධාතු සමනය වේ නම්, යහපත් වූ සුඛස්පර්ශ ඇති මහත් වූ මහාශ්‍රීයහන් සෙවී-මෙන් කම් කිම් ද? ඉදින් අසහාය වූ එකෙක් ම ශංකා භය සහිත වූ විෂම වූ කාන්තාරය තරණයට සමර්ථ වේ නම්, සන්නාහ සන්නද්ධ ව සැරහුනු මහත් වූ මහාසාර්ථවාහසෙනාව සෙවීමෙන් කම් කිම් ද? ඉදින් මහත් නදී විල් දෙයතින් පිහිනා එතෙර වන්නට සමර්ථ වේ නම්, ස්ථිර වූ හේදඬු පාලම් නැව් ඔරු සෙවීමෙන් කම් කිම් ද? ඉදින් තමා සන්තක වූ භොග යෙන් බත් කොට ක්ෂුධාග්නි නිවා බත් කන්නට සමර්ථ වේ නම්, මිත්‍රාමාත්‍යාදීන් සෙවනය කිරීමෙන් හා ප්‍රියතෙපුල් කීමෙන් ද පසු ව හෝ

Non-Commercial Distribution

පෙරටු ව දිවිමෙන් ද කම් කිම් ද? ඉදින් නො සැරූ විලකින් පැන් ලැබේ නම්, ලිං විල් පොකුණු සැරීමෙන් කම් කිම් ද? එපරිද්දෙන් ම (439) ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඉදින් ගිහිගෙයි වසන්නා වූ කාමභොගී වූ ගෘහස්ථයෝ ශාන්ත වූ පරමාර්ථ වූ නිර්වාණය සිද්ධ කෙරෙත් නම්, ධූතාංගගුණවරසමාදනයෙන් කවර ප්‍රයොජනයෙක් දැ?'' යි කීහ. එකල නාගසෙනයන් වහන්සේ:—

**''අට්ඨවීසති ඛො පනිමෙ මහාරාජ ධුතඞ්ගගුණා -පෙ- පත්ථිතානි'' ති**[1]

''මහරජානෙනි, යම් ගුණකෙනෙකුන් කරණ කොට ගෙණ සියලු ම බුදුවරයන් විසින් ධූතාංගයෝ කැමැති වන ලද්දහු ද, ප්‍රාර්ථනා කරණ ලද්දහු ද, විද්‍යමාන වූ මේ ගුණ ඇති මේ ධූතාංගගුණයෝ වනාහි විසිඅට දෙනෙක. කවර නම් විසිඅටගුණයෙක් ද? යත්— මහරජානෙනි, මේ සුගතශාසනයෙහි ධූතාංගය පිරිසිදු වූ ආජීවය ඇතිබව ය, සැපවිපාක ඇති බව ය, නිවරදිබව ය, පරහට දුක් නො දෙනබව ය, නිර්භයබව ය, අනුන් නො පෙළෙනබව ය, එකාන්තාභිවෘද්ධික බව ය, පිරිහීමක් නැතිබව ය, අමායාබව ය, ආරක්ෂාබව ය, පත්පීතය දෙනබව ය, සියලු සත්වයන් දමනය කරණබව ය, සංවරයට හිතබව ය, ශාසනානුරූපබව ය, තෘෂ්ණා නිශ්‍රිත නො වනබව ය, තෘෂ්ණාවෙන් මිදුනබව ය, රාගක්ෂය කරණබව ය, ද්වෙෂක්ෂය කරණබව ය, මොහක්ෂය කරණබව ය, මානප්‍රහාණය කරණ බව ය, ලාමකවිතර්ක සිඳිනබව ය, කාංක්ෂා දුරු කරණබව ය, කුශීතය විධ්වංසනය කරණබව ය, ශාසනානභිරති ප්‍රහාණය කරණබව ය, සියලු ම දුක් සහනය කරණබව ය, අතුල්‍ය ගුණ ඇතිබව ය, අප්‍රමාණ වූ අනුසස් ඇතිබව ය, සර්වසංසාරදුඃඛක්ෂය පිණිස යන ගමන් ඇතිබව ය. මහරජානෙනි, යම් ගුණ කෙනෙකුන් කරණ කොට ගෙණ කාලත්‍රයවර්ති වූ සියලු ම බුදුවරයන් විසින් ධූතාංගයෝ සිතින් කැමැති වන ලද්දහු ද, ප්‍රාර්ථනා කරණ ලද්දහු ද, විද්‍යමාන ගුණ ඇති ඒ මේ අෂ්ටවිංශද්ධූත ගුණයෝ යි.

**''යෙ ඛො තෙ මහාරාජ ධුතඞ්ගගුණෙ සම්මා උපසෙවන්ති, තෙ අට්ඨාරසහි ගුණෙහි සමුපෙතා භවන්ති. -පෙ- තෙ ඉමෙහි අට්ඨාරසගුණෙහි සමුපෙතා භවන්ති'' යි.**[2]

(440) ''මහරජානෙනි, යම් ඒ සංසාරභීරුක වූ ථෙර මජ්ඣිම නවක භික්ෂු කෙනෙක් ක්ලේශධර්මයන් කම්පා කරණ කාරණයෙන් ධූතාංග නම් තෙළෙස්ධූතාංගගුණයන් මනා කොට සෙවනය කෙරෙද් ද, ඒ ආර්යයෝ අටළොස්ගුණයකින් යුක්ත වෙති. කවර නම් අටළොස් ගුණයකින් ද? යත්— ඒ ධූතාංගධරයන්ගේ සර්වඥශාසනයෙහි හැසිරීම සුවිසුද්ධ වන්නේ ය. පූර්වභාගප්‍රතිපදව යහපත් කොට පුරණ ලද

1. සම්පූර්ණ පාලිපාඨය පාලි මිලින්ද පඤ්හයෙහි 281 වන පිටුවෙහි පෙණේ.
2. සම්පූර්ණපාඨය පාලිමිලින්ද පඤ්හයෙහි 281, 282 වන පිටුවල පෙණේ.

Non-Commercial Distribution

වන්නේ ය. කායිකය වාචසිකය යහපත් කොට රක්ෂා කරණ ලද වන්නේ ය. මනස්සමාචාරය සුවිසුද්ධ වන්නේ ය, වීර්යය අතිශයින් ග්‍රහණය කරණ ලද වන්නේ ය, සියලු භය ව්‍යපශමනය වන්නේ ය, සත්කායදෘෂ්ටිය ව්‍යපගත වන්නේ ය, වෛරය වැළකෙන ලද වන්නේ ය, සකල සත්වයන් කෙරෙහි මෛත්‍රිය එළඹ සිටින ලද වන්නේ ය, පමණ දැන වැළඳීමෙන් ආහාරය පරිඥාත වන්නේ ය, සියලු සත්වයන් විසින් ගෞරව කරණ ලද වන්නේ ය, භොජනයෙහි මාත්‍රඥතාව ද ඇති වන්නේ ය, නිදිවර්ජිත කිරීමෙහි නියුක්ත වන ලද වන්නේ ය, ගෘහයක් නැත්තේ ද වන්නේ ය, යම් තෙනෙක එාසු වී නම්, එතැන්හි වාසය කරන්නේ ද වේ. පාපයට ප්‍රතිකූලකාරී වන්නේ ය, විවෙකාරාම වන්නේ ය, නිරන්තරයෙන් අප්‍රමාද වන්නේ ය, මහරජානෙනි. යම් ඒ ථෙරමජ්ඣිම නවක භික්ෂු කෙනෙක් ධූතාංගගුණයන් මනා කොට සෙවනය කෙරෙද් ද, ඒ ආර්යයෝ මේ යථොක්ත වූ අටළොස්ගුණයෙන් සමුපලක්ෂිත වන්නාහු ය.

**''දසඉමෙ මහාරාජ පුග්ගලා ධූතඞ්ගගුණාරහා. කතමෙ දස? සද්ධො හොති හිරිමා ධිතිමා අකුහො අත්ථවසී අලොලො සික්ඛාකාමො දළ්හසමාදානො අනුජ්ඣානබහුලො මෙත්තාවිහාරී. ඉමෙ ඛො මහාරාජ දසපුග්ගලා ධූතඞ්ගගුණාරහා'' යි.**

''මහරජානෙනි, ධූතාංගගුණය පරිහරණයට සුදුසු මේ පුද්ගලයෝ දසදෙනෙක. කවර දසදෙනෙක් ද? යත්— යමෙක් ශ්‍රද්ධාව ඇත්තේ වේ ද, පාපයෙහි ලජ්ජා ඇත්තේ වේ ද, අධික වූ ධෛර්ය ඇත්තේ වේ ද, ජන වඤ්චනයෙහි කුහක ප්‍රයොග නැත්තේ වේ ද, ශාසනාභිවෘද්ධිය පිණිස වසන්නේ වේ ද, චතුර්විධ ප්‍රත්‍යයෙහි ගිජුබවක් නැත්තේ වේ ද, ශික්ෂාකාමී ව වාසය කරන්නේ වේ ද, දෘඪ වූ සමාදන ඇත්තේ වේ ද, කිපිසින් බහුල කොට නැත්තේ වේ ද, සකල සත්වයන් කෙරෙහි පතළ මෛත්‍රී විහරණය ඇත්තේ වේ ද, මහරජානෙනි, මෙ කී දශවිධ වූ පුද්ගලයෝ ධූතාංගගුණ ධාරණයට සුදුස්සෝ යි. මහරජානෙනි, අගාරික සංඛ්‍යාත ගිහිගෙයි වාසි වූ පඤ්චකාමභොගි වූ යම් ඒ ගෘහස්ථ කෙනෙක් ශාන්ත වූ පරමාර්ථ වූ නිර්වාණය සිද්ධ **(441)** කෙරෙද් ද, ඒ සියල්ලෝ ම මීට පූර්ව ජාතියෙහි මේ තෙළෙස්ධූතාංගගුණයෙහි කරණ ලද අභ්‍යාස ඇත්තාහු ද, කරණ ලද ධූතාංගභූමිකර්ම ඇත්තාහු ද වෙති. ඒ ජනයෝ ඒ අතීත යෙහි චාරිත්‍රය ද ප්‍රතිපත්තිය ද සුද්ධ කොට හැසිර මෙසමයෙහි දූන් අද දක්වා ගිහි ව ම වසන්නාහු ද, ශාන්ත වූ පරමාර්ථ වූ නිර්වාණය සිද්ධ කරන්නාහු ය. මහරජානෙනි, දක්ෂ වූ ධනුශ්ශිල්පියෙක් යම් සේ පළමු කොට ම අන්තෙවාසිකයන් ශිල්පශාලායෙහි ලා ධනුප්‍රභෙද ධනු ආරොපණ ග්‍රහණ මුෂ්ටි ප්‍රතිපීඩන අංගුලි ප්‍රණමන පාද තැබීම් ඉගෙණීම් සන්නද්ධ වීම් ඇදීම් සන්ධාරණය කිරීම් ලක නියම කිරීම් හා හැරීමෙහි ද තෘණ පුරුෂ විදමනය ජණක[1] තෘණ විදමනය පිදුරුබිසි විදමනය මත්තිකාරාසි

1. ජනයක

Non-Commercial Distribution

විදමනය දිඹුල්පෝරු විදමනය යනාදී ලක වෙදයෙහි නො හැර හික්මවා රජදරුවන්ගේ සමීපයෙහි භාවිත වූ ශිල්ප දක්වා සිත් ගෙණ ආජඤ්ඤරථ ගජ තුරඟ ධනධාන්‍ය හිරණ්‍ය ස්වර්ණ දසි දස භාර්යා ග්‍රාමවරාදිය ලබන්නෝ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම අගාරික වූ කාමභොගී වූ යම් ගෘහස්ථකෙනෙක් ශාන්තප්‍රණීතපරමාර්ථ වූ නිර්වාණය සිද්ධ කෙරෙද් ද, ඒ සියල්ලෝ ම ඒ ඒ පුරිමජාතියෙහි තෙළෙස්ධුතාංගගුණයෙහි කරණ ලද අභ්‍යාස ඇත්තාහු ද, කරණ ලද ධුතාංග භූමිකර්ම ඇත්තාහු ද වෙති. ඒ ජනයෝ ඒ ජාතියෙහි ම චාරිත්‍රය ද ප්‍රතිපත්තිය ද පිරිසිදු කොට මෙසම යෙහි අද දූන් ගෘහස්ථ ව ම වසන්නා වූ ශාන්ත වූ පරමාර්ථ වූ නිර්වාණය සිද්ධ කරන්නාහු ය. මහරජානෙනි, ධුතාංගගුණයෙහි පූර්වසෙවනයක් නැති ව මෙම ජාතියෙහි අර්හත්ඵලය සිද්ධ කිරීම නො වන්නේ ය. මෙසේ පෙර පුරුදු වූ ධුතාංගගුණ ඇත්තහුට ම උතුම් වූ වීර්යයෙන් උතුම් වූ ප්‍රතිපත්තියෙන් කල්‍යාණමිත්‍ර වූ එබඳු ආචාර්යකෙනෙකුන් කරණ කොට ගෙණ රහත්ඵලය සාක්ෂාත් කිරීම් වන්නේ ය.

‘‘තවද, මහරජානෙනි, යම් සේ ශල්‍යකත්තෘ වූ වෛද්‍යක්‍රියාකාරයෙක් තෙම තමාගේ ආචාර්යවරයා කිසි ධනයකින් හෝ වෘත්තප්‍රතිවෘත්තයකින් හෝ සිත් ගෙණ ගඩු පළන ශස්ත්‍ර ග්‍රහණ ඡෙදන ලිඛන වෙධන හුල් උද්ධරණ ව්‍රණ ධොවන වියලන භෛෂජ්‍යානුලිම්පන වමන විරෙචනානුවාසන ක්‍රියාවන් නො හැර සුශික්ෂිත ව විද්‍යායෙහි කරණ ලද සුශික්ෂිතත්වය ඇති ව කරණ ලද භාවිතා ඇති ව දක්ෂ ව රොග පිළියම් පිණිස රොගාතුරයන් කරා එළඹෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යම් ඒ ගෘහස්ථ අගාරික කාමභොගීහු ශාන්ත වූ පරමාර්ථ වූ නිර්වාණය සිද්ධ කෙරෙද් ද, ඒ සියල්ලෝ ම ඒ ඒ පූර්වජාතියෙහි තෙළෙස්ධුතාංගගුණයෙහි කරණ ලද අභියොග ඇති ව කරණ ලද භූමිකර්ම ඇති ව ඒ ජාතියෙහි ම චාරිත්‍රය ද ප්‍රතිපත්තිය ද පිරිසිදු කොට මෙසමයෙහි අද දූන් දක්වා ගිහි ව ම වසන්නාහු ශාන්ත වූ පරමාර්ථ වූ නිර්වාණය සිද්ධ කරන්නාහු ය. මහරජානෙනි, ධුතාංගගුණයෙන් සුද්ධ නුවූවන්ට ධර්මාභිසමයෙක් නො වන්නේ ය. මහරජානෙනි, යම් සේ උදකයාගේ අසෙවනයෙන් බීජ ජාතීන්ගේ නො හට ගැණීම් වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ධුතාංග ගුණයෙන් සුද්ධනුවූවන්ට ධර්මාභිසමය නො වන්නේ ය. තවද, මහරජානෙනි, යම් සේ නො කරණ ලද කුසල් ඇත්තා වූ නො කරණ ලද ශුභ ක්‍රියාවන් ඇත්තා වූ **(442)** සත්වයන්ට ස්වර්ගයාත්‍රාවෙක් නො වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම ධුතාංගගුණයෙන් විසුද්ධ නො වූවන්ට නිර්වාණාභිසමයෙක් නො වන්නේ ය.

**‘‘පඨවී සමං මහාරාජ ධුතඞ්ගගුණං–පෙ–අපරිමිතමසඞ්ඛෙය්‍යමප්පමෙය්‍යාවෙඨන ච.’’**[1]

1. සම්පූර්ණ පාලිපාඨය පාළි මිලින්ද පඤ්හයෙහි 283 වන පිටුවෙහි පෙණේ.

Non-Commercial Distribution

**(443)** මහරජානෙනි, ධූතගුණය නිර්වාණසම්පත්තිය කැමැත්තවුන්ට ප්‍රතිෂ්ඨාර්ථයෙන් පෘථිවිය සමාන වන්නේ ය, මහරජානෙනි, ධූතගුණය නිර්වාණය කැමැත්තවුන්ට සර්වක්ලේශමලධොවනාර්ථයෙන් නිර්මලතර ජලයක් හා සදෘශ වන්නේ ය, මහරජානෙනි, ධූතගුණය විසුද්ධි කැමැත්තවුන්ට සර්වක්ලේශවනය දවන අර්ථයෙන් මහාවහ්නිස්කන්ධයක් සදෘශ වන්නේ ය. මහරජානෙනි, ධූතගුණය නිවන්සැප කැමැත්තවුන්ට සර්වක්ලේශරජස් චිත්තසන්තානයෙන් පහ කොට ගෙණ යන අර්ථයෙන් චණ්ඩමාරුතයක් හා සදෘශ වන්නේ ය, මහරජානෙනි, විසුද්ධි කැමැත්තවුන්ට ධූතගුණය සර්වක්ලේශව්‍යාධීන් ව්‍යපශමනය කරණ අර්ථයෙන් දිව ඔබෙහෙදක් හා සදෘශ වන්නේ ය, මහරජානෙනි, ධූතගුණය නිවන් කැමැත්තවුන්ට සර්වක්ලේශවිෂ විනාශය කරණ අර්ථයෙන් දිව්‍ය අමෘතයක් හා සදෘශ වන්නේ ය, මහරජානෙනි, ධූතගුණය විසුද්ධි සංඛ්‍යාත නිර්වාණය කැමැත්තවුන්ට සියලු ම ශ්‍රමණගුණධර්මයාගේ උපදනා අර්ථයෙන් ක්ෂේත්‍රයක් සම වන්නේ ය. මහරජානෙනි, ධූතගුණය විසුද්ධි කැමැත්තවුන්ට ප්‍රාර්ථිත වූ මනාපික වූ සකල සම්පත්ති ප්‍රවරයන් දෙන අර්ථයෙන් මනොහර වූ චින්තාමාණික්‍යරත්නයක් වැන්නේ ය. මහරජානෙනි, විසුද්ධි සංඛ්‍යාත වූ නිර්වාණසම්පත් කැමැත්තවුන්ට ධූතගුණය සංසාරසාගරයාගේ පරතෙරට ගෙණ යන අර්ථයෙන් මහනැවක් වන්නේ ය. මහරජානෙනි, විසුද්ධි කැමැත්තවුන්ට ධූතගුණය ජාති ජරා මරණ දුකින් භීතවූවන් නො බාවයි කියා අස්වසන අර්ථයෙන් රක්ෂස්ථානයක් වැන්නේ ය, මහරජානෙනි, විසුද්ධි කැමැත්තවුන්ට ධූතගුණය ක්ලේශදුක්ඛයෙන් පීඩිතවූවන්ට අනුග්‍රහ කරණ අර්ථයෙන් වැදූ මාතෘවෙක් වැන්නේ ය. මහරජානෙනි, සියලු ම ශ්‍රමණගුණය උපදවන අර්ථයෙන් ධූතගුණය විසුද්ධි කැමැත්තවුන්ට පිතෘසම වන්නේ ය, මහරජානෙනි, විසුද්ධි කැමැත්තවුන්ට ධූතගුණය සියලු ම ශ්‍රමණගුණ සොයන්නා වූ අවිසංවාදක අර්ථයෙන් කල්‍යාණමිත්‍රයෙකු වැන්නේ ය, මහරජානෙනි, ධූතගුණය විසුද්ධි කැමැත්තවුන්ට සර්වක්ලේශමලයෙන් ලිප්ත නො වන අර්ථයෙන් පද්මයක් වැන්නේ ය, මහරජානෙනි, ධූතගුණය විසුද්ධි කැමැත්තවුන්ට ක්ලේශදුර්ගන්ධ පහ කරණ අර්ථයෙන් කොකුම් යොන්පුප් තුවරලා තුරුක්තෙල් යන උතුම් සිවුදෑගඳ හා සම වන්නේ ය, මහරජානෙනි, ධූතගුණය විසුද්ධි කැමැත්තවුන්ට අෂ්ටලොකධර්ම නමැති මහාවාතයෙන් කම්පා නො වන අර්ථයෙන් මහාමෙරුපර්වත රාජයා හා සම වන්නේ ය, මහරජානෙනි, ධූතගුණය විසුද්ධි කැමැත්තවුන්ට සර්වස්ථානයෙහි ග්‍රහණ විරහිත මහත් පතළ විස්තාර මහත් වූ අර්ථයෙන් ආකාශය වැන්නේ ය, මහරජානෙනි, ධූතගුණය විසුද්ධි කැමැත්තවුන්ට ක්ලේශමල උසුලා යන අර්ථයෙන් ගංගාවක් වැන්නේ ය. මහරජානෙනි, ධූතගුණය විසුද්ධි කැමැත්තවුන්ට ජාතිකාන්තාරයෙන් හා ක්ලේශවනගහණයෙන් එතර කරණ අර්ථයෙන් සුදෙශික පුරුෂයක්හු



*Non-Commercial Distribution*

හා සදෘශ වන්නේ ය. මහරජානෙනි, ධුතගුණය විසුද්ධි කැමැත්තවුන්ට සර්වභයශූන්‍ය ක්ෂෙම අභයවර ප්‍රවර නිර්වාණමහානුවරට පමුණුවන අර්ථයෙන් මහාසාර්ථවාහයන් හා සදෘශ වන්නේ ය, මහරජානෙනි, **(444)** ධුතගුණය විසුද්ධි කැමැත්තවුන්ට සර්වසංස්කාරයන්ගේ අනිත්‍ය ස්වභාව දක්නා අර්ථයෙන් සුමර්දිත නිර්මලතර ආදසතලයක් හා සදෘශ වන්නේ ය, මහරජානෙනි, ධුතගුණය විසුද්ධි කැමැත්තවුන්ට ක්ලේශ නමැති මුගුරු හී ශස්ත්‍රාදිය ප්‍රතිබාහනාර්ථයෙන් ඵලකායුධයක් හා සමාන වන්නේ ය, මහරජානෙනි, ධුතගුණය විසුද්ධි කැමැත්තවුන්ට ක්ලේශවර්ෂාව හා රාගාග්නි ද්වෙෂාග්නි මොහාග්නි සංඛ්‍යාත ත්‍රිවිධාග්නිසන්තාපය හා සූර්ය තාපය ප්‍රතිබාහන අර්ථයෙන් ඡත්‍රයක් වැන්නේ ය, මහරජානෙනි, ධුත ගුණය විසුද්ධි කැමැත්තා වූ විබුධජනයන්ට කැමැති වන ප්‍රාර්ථිත වන අර්ථයෙන් චන්ද්‍රදිව්‍යරාජයා වැන්නේ ය, මහරජානෙනි, ධුතගුණය විසුද්ධිය කැමැත්තා වූ විබුධජනයන්ට මොහාන්ධකාරය නසන අර්ථයෙන් සූර්යදිව්‍යරාජයා සම වන්නේ ය, මහරජානෙනි, ධුතගුණය විසුද්ධි කැමැත්තවුන්ට අනෙකප්‍රකාර වූ ශ්‍රාමණ්‍යගුණ නමැති උතුම් රත්න ජාතීන්ගේ පහළ වන අර්ථයෙන් හා අපරිමිතඅසංඛ්‍යඅප්‍රමෙයාර්ථයෙන් මහාසමුද්‍රය වැන්නේ ය.

**“එවං ඛො මහාරාජ ධුතඞ්ගගුණං--පෙ—පවරං අග්ගං” යි**[1]

මහරජානෙනි, මෙසේ ධුතගුණය විසුද්ධි කැමැත්තා වූ විබුධජනයන්ට බොහෝ උපකාර ඇත්තේ ය, සර්වක්ලේශපීඩා පරිදාහ දුරු කරන්නේ ය. සියලු භය දුරු කරන්නේ ය, ත්‍රිවිධභව දුරු කරන්නේ ය, පඤ්චචෙතොඛිලය දුරු කරන්නේ ය, රාගමලාදිය දුරු කරන්නේ ය, ශොක දුරු කරන්නේ ය, සර්වසංසාරදුක් දුරු කරන්නේ ය, කාමරාගය දුරු කරන්නේ ය, ද්වෙෂය දුරු කරන්නේ ය, මොහය දුරු කරන්නේ ය, මානය දුරු කරන්නේ ය, සත්කායදෘෂ්ටිය හා සියලු ම මිථ්‍යාදෘෂ්ටීන් දුරු කරන්නේ ය, සියලු ම අකුශලධර්මයන් දුරු කරන්නේ ය, යස පමුණුවන්නේ ය, හිත පමුණුවන්නේ ය, සැප පමුණුවන්නේ ය, ඵාසු කරන්නේ ය. ප්‍රීති කරන්නේ ය, යොගක්ෂෙම කරන්නේ ය, නිරවද්‍ය වන්නේ ය. ධනධාන්‍යපරිග්‍රහයක් නැතිබව ය, නිරවද්‍ය වූ පිඩු සොයන බව ය, දැහැමින් පිඬු වළඳනබව ය, අපට වෙහෙස කළාහ යි රටවාසීන්ගේ කෙලසීමක් නැතිබව ය, උපකරණයෙහි ඡන්දරාගයක් නැතිබව ය, චෞරවිලොපනයෙහි නිර්භයබව ය, රජමහඇමතියන් හා අසංසෘෂ්ට බව ය, සතරදික්හි නො පැකිළෙනබව ය යන අෂ්ටවිධ වූ ශ්‍රමණසැප විපාක ඇත්තේ ය. ශ්‍රමණගුණ රාශියෙක, ශ්‍රමණගුණ ගොඩෙක, අප්‍රමාණ වූ අප්‍රමෙය වූ උතුම් ගුණ ඇත්තේ ය, ප්‍රවර වන්නේ ය, අග්‍ර වන්නේ යි.

1. සම්පූර්ණ පාලිපාඨය මිලිඳු පඤ්හයෙහි 284 වන පිටුවෙහි පෙණේ.

Non-Commercial Distribution

මහරජානෙනි, යම් සේ මනුෂ්‍යයෝ ජීවත්වීමට ආධාර පිණිස භොජනය සෙවනය කෙරෙති, ශරීරයට හිත පිණිස බෙහෙත් සෙවනය කෙරෙති, තමහට උපකාර පිණිස මිත්‍රයන් සෙවනය කෙරෙති, මුහුදින් **(445)** එතර වන පිණිස නැව සෙවනය කෙරෙති. ඇඟ සුවඳ කිරීම පිණිස මල් සුවඳ සෙවනය කෙරෙති, අභය පිණිස නිර්භයස්ථාන සෙවනය කෙරෙති, ප්‍රතිෂ්ඨාව පිණිස පෘථිවිය සෙවනය කෙරෙති, ශිල්ප පිණිස ගුරුන් සෙවනය කෙරෙති, යස පිණිස රජ්ජුරුවන් සෙවනය කෙරෙති, කැමැති දෙය දෙන හෙයින් මාණික්‍යරත්න සෙවනය කෙරෙති. මහරජානෙනි, එපරිද්දෙන් ම සියලු ම ශ්‍රාමණ්‍යගුණ දෙන හෙයින් ආර්යයෝ ධුතගුණය සෙවනය කරන්නාහු ය. තවද, මහරජානෙනි, යම් සේ උදකය බිජු හට ගැණීම පිණිස වේ ද, වහ්නිය දැවීම පිණිස වේ ද, ආහාරය බල ගැණීම පිණිස වේ ද, වැල් බැඳීම පිණිස වේ ද, ශස්ත්‍රය ඡේදනය පිණිස වේ ද, පැන් පිපාස විනාසය පිණිස වේ ද, නිධානය අස්වැසීම් කරණු පිණිස වේ ද, නැව එතර පැමිණීම පිණිස වේ ද, බෙහෙත් ව්‍යාධි ව්‍යපසමනය පිණිස වේ ද, යානාව සැප ගමන් පිණිස වේ ද, නිර්භයස්ථානය භය විනොදනය පිණිස වේ ද, රජතෙම ලොවට ආරක්ෂා පිණිස වේ ද, ඵලකායුධය දඬු පොලු කැට මුගුරු හී ශස්ත්‍ර ප්‍රතිබාහනය පිණිස වේ ද, ආචාර්ය තෙම ශිෂ්‍යානුශාසනාව පිණිස වේ ද, මැනිතොමෝ පුත්‍ර පොෂණය පිණිස වේ ද, ආදසය මුහුණ බැලීම පිණිස වේ ද, අලංකාරය සොභනය පිණිස වේ ද, වස්ත්‍රය හැඳීම පිණිස වේ ද, නිශ්‍රෙණිය නැඟීම පිණිස වේ ද, තරාදිය සදෘශව කිරීම පිණිස වේ ද, මන්ත්‍රය ජප කිරීම පිණිස වේ ද, ආයුධය තර්ජනය ප්‍රතිබාහනය පිණිස වේ ද, ප්‍රදීපය අන්ධකාර විධමනය පිණිස වේ ද, වාතය පරිලාහ නිර්වාපණය පිණිස වේ ද, ශිල්පය ජීවිකාවෘත්ති සාධනය පිණිස වේ ද, භෛෂජ්‍යය දිවි රක්නා පිණිස වේ ද, ආකරය සත්රුවන් ඉපදීම පිණිස වේ ද, රත්නය අලංකාර පිණිස වේ ද, ආඥව නොයිඉක්මවාලීම පිණිස වේ ද, ඉසුරුබව වසහයෙහි පවත්වාලීම පිණිස වේ ද, මහරජානෙනි. එපරිද්දෙන් ම ධුතගුණය ශ්‍රාමණ්‍යබිජු හට ගැණීම පිණිස වන්නේ ය, ක්ලේශමල දැවීම් පිණිස වන්නේ ය, සෘද්ධිබල ගැණීම පිණිස වන්නේ ය, ස්මෘති සංවර බන්ධනය පිණිස වන්නේ ය, විමති විචිකිච්ඡා සිඳීම පිණිස වන්නේ ය, තෘෂ්ණාපිපාසා දුරු කිරීම පිණිස වන්නේ ය, අභිසමය ආශ්වාස හෙතු පිණිස වන්නේ ය, චතුර්විධොඝයෙන් එතරවීම පිණිස වන්නේ ය, ක්ලේශව්‍යාධි ව්‍යපසමනය පිණිස වන්නේ ය, නිර්වාණසැප ප්‍රතිලාභය පිණිස වන්නේ ය, ජාති ජරා ව්‍යාධි මරණ සොක හැඬීම් දුක්ඛදෞර්මනස්‍ය උපායාස යනාදි සංසාර භය දුරු කිරීම පිණිස වන්නේ ය, ශ්‍රමණගුණ රක්ෂාව පිණිස වන්නේ ය, අරති කුවිතර්ක ප්‍රතිබාහනය පිණිස වන්නේ ය, සකල ශ්‍රාමණ්‍යාර්ථානුශාසනාව පිණිස වන්නේ ය, සකල ශ්‍රාමණ්‍යගුණ පොෂණය පිණිස වන්නේ ය, සමථ විපස්සනා මාර්ගඵල නිර්වාණ දර්ශනය පිණිස වන්නේ ය, සකල ලොක ප්‍රිතිථොමිත මහත් වූ මහාසොභාකරණය පිණිස

Non-Commercial Distribution

වන්නේ ය, එක්සියසතිස් මහානරක වැසීම පිණිස වන්නේ ය, ශ්‍රාමණ්‍යාර්ථ නමැති මහාපර්වතශිඛරය මුදුනට නැඟීම පිණිස වන්නේ ය, වංකකුටිල විසම සිත හැරීම පිණිස වන්නේ ය, සෙවිතව්‍යාසෙවිතව්‍ය ධර්මයන් යහපත් කොට සජ්ඣායනය කිරීම පිණිස වන්නේ ය, සර්ව ක්ලේශ ප්‍රතිශත්‍රූන් **(446)** තර්ජනය පිණිස වන්නේ ය, අවිද්‍යාන්ධකාරය විධමනය පිණිස වන්නේ ය, ත්‍රිවිධාග්නි සන්තාප පරිදහ නිර්වාපණය පිණිස වන්නේ ය, සණ්හ සුඛුමශාන්තප්‍රණීතසමාපත්ති උපදවාලීම පිණිස වන්නේ ය, ශාසනික සකල ශ්‍රාමණ්‍යගුණ රක්ෂාව පිණිස වන්නේ ය, සප්තබොද්ධ්‍යංගවර රතනුප්පාදනය පිණිස වන්නේ ය, යොගිජනාලංකාර කරණය පිණිස වන්නේ ය, අනවද්‍ය නිපුණ සියුම් ශාන්තසුව නො ඉක්මවීම පිණිස වන්නේ ය, සකල ශ්‍රාමණ්‍ය ආර්යධර්මය වසභයෙහි පවත්නා පිණිස වන්නේ ය, මහරජානෙනි, මෙසේ මොවුන්ගේ ගුණය අධිගමය පිණිස වන්නේ ය, ඒ මේ එක ම එක ම ධුතගුණයක් ම නිවන් පිණිස වන්නේ ය. මහරජානෙනි, මෙසේ ධුතගුණය අතුල්‍ය වන්නේ ය, අප්‍රමෙය වන්නේ ය, අසම වන්නේ ය, අප්‍රතිසම වන්නේ ය, අප්‍රතිභාග වන්නේ ය, අප්‍රතිශ්‍රෙෂ්ඨ වන්නේ ය, සියලු ගුණයට වඩා ඉතිර සිටියේ ය, ශ්‍රෙෂ්ඨ ව සිටියේ ය, විශිෂ්ට ව සිටියේ ය, අධික ව සිටියේ ය, දික් ව සිටියේ ය, පෘථුල ව සිටියේ ය, පැතිර සිටියේ ය, විස්තෘත ව සිටියේ ය, ගරුක ව සිටියේ ය, බැරැරුම් ව සිටියේ ය, ඉතා මහත් ව සිටියේ යි.

**“යො බො මහාරාජ පුග්ගලො පාපිච්ඡො ඉච්ඡාපකතො–පෙ–පෙතො හුත්වා ආභිණ්ඩමානො මහියා අට්ටස්සරං කරොති”යි**[1]

“මහරජානෙනි, නැති ගුණ පහළ කරණු කැමැති පාපිච්ඡතාවෙන් යුක්ත වූ නැති ගුණ පහළ කිරීම සංඛ්‍යාත ලාමක අදහසින් පෙළෙන ලද්ද වූ ප්‍රත්‍යය නො පිළිගන්නා කෙනෙකුන් මෙන් ගෘහස්ථයන්ට අභව්‍ය වංචාවචන ප්‍රයොගයෙන් ප්‍රත්‍යය බොහෝ කොට උපදවන කුහක ප්‍රයොගයෙන් යුක්ත වූ රෞද්‍ර වූ උදර පොෂණය නිසා ශාසනයෙහි වසන හෙයින් ඖදරික වූ ප්‍රත්‍යය ලාභයෙහි ගිජු වූ යස සංඛ්‍යාත පිරිවර කැමැත්තා වූ ඒ ඒ තන්හි ගුණකථන වශයෙන් පවත්නා කීර්ති කැමැත්තා වූ අර්හත්ධ්වජ ධාරණයට යුතු නො වන්නා වූ ප්‍රතිපත්ති පූරණයට අප්‍රාප්ත වූ ජිනෙන්ද්‍ර ශාසනයට සුදුසු නො වන හෙයින් අනනුච්ඡවික වූ ශ්‍රමණභාව **(447)** යට සුදුසු නො වූ ජිනසුනුභාවයට අප්‍රතිරූප වූ යම් පුද්ගලයෙක් ධුතාංග සමාදන් වේ ද, ඒ පුද්ගලතෙම ද්විගුණ වූ දඬුවමට පැමිණෙන්නේ ය, සියලු ම ගුණධර්මයාගේ නැසීමට පැමිණෙන්නේ ය, දෘෂ්ටධාර්මික වූ ගර්හාවඛිලනය නින්ද පරිභාසය ඉවත දැමීම අසම්භොගය ශාසනයෙන් පිටත්කිරීම ප්‍රතිකූලාකාරයෙන් කරණ බෙලාපාතනය පහ කිරීම ශාසනයෙන් නෙරපීම ලබන්නේ යි, මරණින් මත්තෙහි පරලොවහි ද නරකයෙහි ඉපිද උෂ්ණ කයින

1. පාළිමිලින්දපඤ්හයෙහි 286 වන පිටුවෙහි සම්පූර්ණ පාඨය පෙණේ.

Non-Commercial Distribution

තප්ත සංතප්ත වූ වහ්නිශිඛාජ්වාලමාලායෙන් ආකුල වූ සියක්යොදුන් අවීචිමහානරකයෙහි අනෙකවර්ෂකොටිශතසහස්‍රයෙහි ඌර්ධ්වාධො සරස්හි පෙරළෙන්නා වූ නිරාගින්නෙන් දැවීමෙන් පෙනගත් ශරීර ඇති ව පැසෙන්නේ ය, එයින් මිදී ප්‍රෙතනිකායෙහි උපන ද කෘශ පරුෂ කාලක අංගප්‍රත්‍යංගයන් ඇත්තා වූ සූචිමුඛප්‍රමාණ මත්තෙන් සිදුරු මුඛය ඇති හිස් ඇත්තා වූ ක්ෂුධාවෙන් පීඩිත වූ පිපාසයෙන් වියලුනා වූ විසම භයානක වූ රූපසටහන් ඇත්තා වූ සිඳුණු බිඳුණු කර්ණශ්‍රොතයන් ඇත්තා වූ උන්මීලිත නිමීලිත නෙත්‍රනයනයන් ඇත්තා වූ ව්‍රණගාත්‍ර හා පැසවා කුණු දිය වැහෙන ගාත්‍ර ඇත්තා වූ සකල ශරීරයෙහි නොයෙක් තැනින් කාවදින පණුවන්ගෙන් ආකීර්ණ වූ වාතමුඛයෙහි දිලියෙන්නා වූ අග්නිස්කන්ධයක් මෙන් ඇතුලු ශරීරය ගිනි ගෙණ දිලියෙන්නා වූ හාත්පසින් ගිනි ගෙණ දිලියෙන්නා වූ දෙහ ඇති කිසි රක්ෂාස්ථානයක් නැත්තා වූ කිසි සරණක් නැත්තා වූ, ඉවසිය නො හැකි ප්‍රෙතදුකින් දුක්ඛිත ව හඬන්නා වූ මහ හඬින් හඬන්නා වූ, බැගැපත් හඬින් විලාප කියා හඬන්නා වූ, ආරොදන කාරුණ්‍යරවින් විලාප කියන්නා වූ, නිජ්ඣාමතෘෂ්ණික වූ, ශ්‍රමණවෙශ ධාරණයෙන් ශ්‍රමණමහාප්‍රෙත ව පෘථිවියෙහි ඇවිදිමින් දුඃඛස්වර පතුරු-වන්නේ යි.

"මහරජානෙනි, යම් සේ රාජාභිෂෙකයට අයුක්ත වූ අනනුච්ඡවික වූ රාජ්‍යශ්‍රීප්‍රතිලාභයට සුදුසු නො වූ අප්‍රතිරූප වූ කුලහීන වූ නීචජාති ඇත්තා වූ කිසිවෙක් ක්ෂත්‍රියාභිෂෙකයෙන් රාජ්‍යාභිෂෙකයට පැමිණේ ද, එතෙම හස්තච්ඡෙදනය පාදච්ඡෙදනය හස්තපාදච්ඡෙදනය කර්ණච්ඡෙදනය නාසච්ඡෙදනය, කර්ණනාසච්ඡෙදනය, බිලංගථාලිකවධය සංඛමුණ්ඩිකය රාහුමුඛය ජොතිමාලිකය එරකවත්තිකය චීරකවාසිකය එණෙය්‍යකය බලිසමංසිකය කහාපණකය පලිඝපරිවත්තිකය පලාල පීඨකය රත් වූ තෙලින් ඇඟ වත් කිරීම ය සුනඛයන් ලවා කවාලීම ය, දිවස්හුල නැඟීම ය, කඩුවෙන් හිස සිඳීම ය යනාදි වධ ලබන්නේ ය. අනෙකප්‍රකාර වූ කම්කටුළු අනුභව කරන්නේ ය. කවර කාරණයකින් ද? යත්— රාජ්‍ය කරණයට යුක්ත නො වූ රාජ්‍යප්‍රතිලාභයට ප්‍රාප්ත නො වූ අනනුච්ඡවික වූ රාජ්‍යාභිෂෙකයට සුදුසු නො වූ අප්‍රතිරූප වූ කුලහීන වූ නීචජාති ඇත්තා වූ එතෙම මහත් වූ රාජෛශ්වර්යයස්ථානයෙහි තමන් තැබූ හෙයින් තමන්ගේ සීමාව නැසූයේ ය, එහෙයිනි. මහරජානෙනි, එපරිද්දෙන් ම යම් කිසි පුද්ගලයෙක් ශාසනයට වැද උදරපොෂණය පිණිස පාපිච්ඡතාදි නොයෙක් වංචාවෙන් යෙදී ධුතාංග සමාදන් වේ ද, එතෙම අවීචිමහානරකයෙහි වැටී බොහෝ කලක් දුක්විඳ එයින් මිදී ශ්‍රමණමහාප්‍රෙත ව ඉපිද **(448)** සකලසත්ව භයානක වූ සර්වාංගප්‍රත්‍යංගයෙන් හා නොයෙක් තැනින් කාවදින පුළුවරාසින්ගෙන් ආකීර්ණ ව වාතමුඛයෙහි දිලියෙන මහගිනි කඳක් සෙයින් ඇතුළුශරීරය ඇවිල ගත් ගින්නෙන් දද අනෙකවිලාපයෙන් හඬහඬා පෘථිවියෙහි ඒ ඒ තැන්හි ඇවිදිමින් බැගැපත් ස්වර පතුරුවන්නේ ය.

*Non-Commercial Distribution*

**“යො පන මහාරාජ පුග්ගලො යුත්තො–පෙ–විමුත්තිපණ්ඩර විමල සෙතච්ඡත්තෙන අභිසිඤ්චති” යි.**[1]

මහරජානෙනි, ශ්‍රමණගුණධාරණයට යුතු වූ ප්‍රතිපත්ති පිරීමට ප්‍රයුක්ත වූ, අනුච්ඡවික වූ, ශාක්‍යපුත්‍රභාවයට සුදුසු වූ, ප්‍රතිරූප වූ, අල්පෙශ්ච වූ, සන්තුෂ්ට වූ, විවෙකී වූ, ප්‍රත්‍යයදායක ගෘහස්ථයන් හා සංසක්තයක් නැත්තා වූ, පටන් ගන්නා ලද වීර්ය ඇත්තා වූ, නිවන් පිණිස මෙහෙයන ලද කායජීවිතය ඇත්තා වූ, නැති ගුණ පහළ නො කරන්නා වූ, කළ වරද නො සඟවන්නා වූ, උදරපොෂණකාරී නො වන්නා වූ, ලාභකාමී නො වන්නා වූ, යසකාමී නො වන්නා වූ, කීර්තිකාමී නො වන්නා වූ, ශ්‍රද්ධාව ඇත්තා වූ, ඥාතිභොගපරිහීනතාදි විරහිත ව ශ්‍රද්ධාවෙන් ම පැවිදි වන ලද්ද වූ, ජරාමරණින් මිදෙනු කැමැත්තා වූ, යම් පුද්ගලයෙක් සර්වඥ ශාසනය ස්ථිර කොට ගණිමි යි සිතා ධූතාංගගුණ සමාදන් වේ ද, එතෙම ද්විගුණ වූ පූජාවට සුදුසු වන්නේ ය. දෙවියන්ට ද මනුෂ්‍යයන්ට ද ප්‍රිය වන්නේ ය, මනාප වන්නේ ය, ප්‍රාර්ථිත වන්නේ ය, ස්නානය කොට සළු පැළඳ චන්දනානුලිප්ත වූ පුරුෂයෙක්හට දැසමන් මල්ලිකාදි මල් මෙන් ද, ක්ෂුධාවෙන් පීඩිතයක්හට ප්‍රණීත මධුරතර භොජනයක් මෙන් ද, පිපාසයෙන් පීඩිත වූවක්හට සීතල විමල සුවඳ පැනක් මෙන් ද, විසගත පුරුෂයක්හට උතුම් දිව්‍යඖෂධයක් මෙන් ද, **(449)** ශීඝ්‍ර ගමන් කැමැති පුරුෂයක්හට ආජානෙයසෛන්ධවයන් යෙදූ උතුම් ආජඤ්ඤරථවරයක් මෙන් ද, ධන කැමැති පුරුෂයක්හට මනොහර සිතුමිණිරුවනක් මෙන් ද, රාජ්‍යාභිෂෙකයට පැමිණෙනු කැමැති රාජකුමාරයක්හට ශුභ්‍ර විමලධවලච්ඡත්‍රයක් මෙන් ද, චතුස්සත්‍යධර්මය කැමැතියක්හට අනුත්තර වූ අර්හත්ඵලාධිගමයක් මෙන් ද, දිව්‍යමනුෂ්‍යයන්ට ප්‍රිය වනසේක. මනාප වනසේක, කැමැති වනසේක, ප්‍රාර්ථනීය වනසේක. ඒ ධූතාංගධරයන් වහන්සේට සතරසතිපට්ඨානභාවනාවෝ සම්පූර්ණභාවයට යෙති. සතරසම්‍යක්ප්‍රධානය ද, සතරඍද්ධිපාදය ද, පඤ්චෙන්ද්‍රියය ද, පඤ්චබලය ද, සප්තබොද්ධ්‍යංගයෝ ද, ආර්යඅෂ්ටාංගිකමාර්ගය ද යන ධර්මයෝ භාවනාපරිපූරණයට යෙති. සමථවිදර්ශනාවට පැමිණෙන්නේ ය, අධිගමය හා ප්‍රතිපත්තිය පිරිනැමෙන්නේ ය, සතරශ්‍රාමණ්‍යඵලය ද, සිවුපිළිසිඹියාව ද, ත්‍රිවිද්‍යාව ද, ෂඩභිඥාව ද, සියලු ම ශ්‍රමණධර්මය ද යන සියලු ම ධර්මයෝ ධූතාංගධර ඒ භික්ෂුහට අයිති වන්නාහ. එහෙයින් ඒ ධූතාංගධරයන් වහන්සේ අර්හත්ඵල නමැති පණ්ඩරතර විමල ධවලච්ඡත්‍රයෙන් අභිෂෙකයට පැමිණෙනසේක.

“මහරජානෙනි, යම් සේ උභයකුලපරිශුද්ධතාවෙන් උපන් විශිෂ්ට වංශ ඇත්තා වූ, උභයකුලපරිශුද්ධ වූ රාජකන්‍යාවක ‘දෙවයන් වහන්ස, සියලු රාජකුලයා නුඹවහන්සේට යටත් වූහ’ යි සියලු ක්ෂත්‍රියසමූහයාට

1. පාළිමිලින්දප්‍රශ්නයෙහි 287 වන පිටුවෙහි සම්පූර්ණපාඨය පෙණේ.

Non-Commercial Distribution

පිතෘස්ථානයෙහි පිහිටා දශරාජධර්මය කොපය නො කොට රාජ්‍යශ්‍රී කර වදළ මැනැවැ' යි කියා දක්ෂිණශංඛයෙන් උත්තමාංගයෙහි පැන් වක් කිරීම ය, පුරෝහිතබ්‍රාහ්මණයෙකු ද 'දෙවයන් වහන්ස, සියලු ම බ්‍රාහ්මණයෝ නුඹ වහන්සේට යටත් වූහ. සියලු බ්‍රාහ්මණසමූහයාට පිතෘස්ථානයෙහි පිහිටා දශරාජධර්මයෙන් රාජ්‍යශ්‍රී කර වදළ මැනැවැ' යි කියා රිදීසංඛයෙන් පැන් වක්කිරීම ය, ගෘහපතිශ්‍රෙෂ්ඨයෙකු ද 'දෙවයන් වහන්ස, සියලු ගෘහපතිසමූහයෝ නුඹ වහන්සේට යටත් වූහ. සියල්ලන්ට පිතෘස්ථානයෙහි පිහිටා රක්ෂා කෙරෙමින් දශරාජධර්මයෙන් රාජ්‍යශ්‍රී කර වදළ මැනැවැ' යි කියා ස්වර්ණසංඛයෙන් මස්තකයෙහි පැන් වක්කිරීම ය යන ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක කරණ ලද්ද වූ ක්ෂත්‍රිය මහරජහට රටවැසියන් සහිත වූ නෙගම ජානපදික යොධභට බලප්‍රධානික යෝ උපස්ථානයට එළඹෙන්නාහ. අෂ්ටත්‍රිංශත්‍රාජපිරිස ද, නැටවුවන් හා නෘත්‍යකාරයෝ ද, මුඛමංගලකයෝ ද, සොභනවාචනිකයෝ ද, ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ද, සියලු පාසණ්ඩගණයෝ ද, සමීපයට එළඹෙන්නාහ. පෘථිවියෙහි මඳක් වුවත් පටුනුරතනාකර නගර සුංකස්ථාන නානාදෙශික ඡෙද්‍ය භෙද්‍ය ජනයන්ට යම් අනුශාසනාවෙක් ඇද්ද, ඒ හැම තන්හි අධිපති වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ශාසනානුරූප වූ ප්‍රතිපත්ති පරිපූරණයට යුක්තප්‍රාප්ත වූ යම් කිසි පුද්ගලයෙක් ශාසනාභිවෘද්ධිය පිණිස ධුතාංග සමාදන් වේ ද, එතෙම ද්විගුණයක් පූජාවට සුදුසු වන්නේ ය, දිව්‍යමනුෂ්‍යයන්ට ද ප්‍රිය වන්නේ ය, ලෞකික ලොකොත්තර වූ සියලු ගුණධර්මයට ද හිමි වන්නේ ය, අර්හත්ඵල නමැති පණ්ඩරවිමල ධවලච්ඡත්‍රයෙන් අභිෂෙකප්‍රාප්ත වන්නේ ය.

**(450) "තෙරසිමෙ—පෙ—තස්සාධෙය්‍යා හොන්ති කෙවලා සන්තා සුඛා සමාපත්තියො"** යි[1]

"මහරජානෙනි, යම් ධුතාංගකෙනෙකුන් විසින් වෘද්ධියට පමුණුවන ලද්ද වූ යොගාවචරතෙම නිර්වාණ නමැති මහාසමුද්‍රයට ප්‍රවිෂ්ට ව අනෙක ප්‍රකාර වූ ධර්මක්‍රීඩාවන් ක්‍රීඩනය කෙරේ ද, රූපාරූප අෂ්ටසමාපත්තීන්වලදී ද, ඍද්ධිප්‍රභෙදගතඥනය ද, දිව්‍යශ්‍රොත්‍රධාතුව ද, පරචිත්තවිජානන ඥනය ද, පූර්වෙනිවාසානුස්මෘතිඥනය ද, දිව්‍යචක්ෂුරභිඥනය ද, ආශ්‍රවක්ෂයකරඥනය ද යන ෂඩ්අභිඥවට පැමිණේ ද, ඒ මේ ධුතාංග තෙළෙසක. කවර තෙළෙසෙක් ද? යත්—පාංසුකූලිකාංගය තෙචීවරිකාංගය පිණ්ඩපාතිකාංගය සපදනචාරිකාංගය එකාසනිකාංගය පත්තපිණ්ඩිකාංගය ඛලුපච්ඡාභත්තිකාංගය ආරඤ්ඤිකාංගය රුක්ඛමූලිකාංගය අබ්භොකාසිකාංගය සොසානිකාංගය යථාසන්ථතිකාංගය නෙසජ්ජිකාංගය යි. මහරජානෙනි, පෙර ආසෙවිත නිසෙවිත වූ පුරුදු වූ හැසුරුණා වූ පුරණ ලද්ද වූ මේ තෙළෙස් ධුත

1. සම්පූර්ණ පාළිපාඨය වුව මනා අය පාළිමිලින්ද පඤ්හයෙහි 287 වන පිටුව බැලිය යුතු.

Non-Commercial Distribution

ගුණයෙන් සියලු ම ශ්‍රාමණ්‍යඵලය ලබන්නේ ය, ඒ ධුතාංගධර භික්ෂුහට සර්වක්ලේශවිරමණයෙන් ශාන්ත වූ අර්හත්ඵලසමාපත්ති සැප ඇත්තා වූ සියලු ම අරූපසම්පත්තිහු අයිති වෙත්. එහි පංසුකූලිකංගය නම්:— 'පංසුකූලචීවරං නිස්සාය පබ්බජ්ජා තත්ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො' යි යන මෙයින් 'මහණ, තා ලත් මේ ප්‍රව්‍රජ්‍යාව පාංශුකූල චීවර පිණිස ය. ඒ පාංශුකූල සෙවිමෙහි තා විසින් දිවිහිමියෙන් උත්සාහ කට යුතු ය' යි කියා වදළ සුගතොවාද සිරසින් ගෙණ සසරසයුරෙන් එතෙර වනු කැමැති යොගාවචරයා විසින් 'ගහපති චීවරං පටික්ඛිපාමි' යි කියා හෝ 'පංසුකූලිකංගං සමාදියාමි' යි කියා හෝ මෙයින් එක් වාක්‍යයක් කියා සමාදන් විය යුත්තේ ය. මෙසෙයින් සමාදන් වූ උත්කෘෂ්ටයා විසින් සොහොන්හි දමා ගිය වස්ත්‍රකඩය, සල්පිල්දෙර දමූ වස්ත්‍රකඩය, පුණ්‍යාර්ථීන් විසින් කවුළුදෙරින් වීථියට හෙළූ වස්ත්‍රකඩ ය, කසළගොඩ දමූ වස්ත්‍රකඩ ය, ගර්භමල පිස දමූ වස්ත්‍රකඩ ය, යක්ෂවෙදුන් විසින් හිස් වසා නහා දමා ගිය වස්ත්‍රකඩ ය, නානතොට දමාගිය වස්ත්‍රකඩ ය, මනුෂ්‍යයන් සොහොනට ගොස් අවුත් දමා ගිය වස්ත්‍රකඩ ය, ගින්නෙන් දැ හෙයින් දමූ වස්ත්‍රකඩ ය, සරක් කෑ හෙයින් දමූ වස්ත්‍රකඩ ය, වෙයන් කෑ හෙයින් දමූ වස්ත්‍රකඩ ය, මූසිකයන් කෑ හෙයින් දමූ වස්ත්‍රකඩ ය, අන්තය සිඳුනු **(451)** හෙයින් දමූ වස්ත්‍රකඩ ය, දශාව සිඳුනු හෙයින් දමූ වස්ත්‍රකඩ ය, නැව් නගිනවුන් ධවජය බැඳ ගිය වස්ත්‍රකඩ ය, තුඹස් වසා බලි පූජා කළ වස්ත්‍රකඩ ය, භික්ෂූන් සන්තක සිවුර ය, රජුන් විසින් අභිෂෙකස්ථානයෙහි දමන ලද වස්ත්‍රකඩ ය, ඒ භික්ෂූන්ගේ ඍද්ධිමය සිවුරු ය, මාර්ගයෙහි යමින් සිහි මුළා ව දමා ගිය වස්ත්‍රකඩ ය, වාතයෙන් දුරස්ථානයට ගිය වස්ත්‍රකඩ ය, අනුරුද්ධ ස්ථවිරයන්ට මෙන් දෙවියන් විසින් දෙන ලද සිවුර ය, සමුද්‍ර රැළින් ගොඩලන ලද වස්ත්‍රකඩ ය යන මේ තෙවිසිපාංශුකූලික කෙතින් වස්ත්‍ර ගෙණ සිවුරු කොට වැළඳිය යුත්තේ ය. මෙම සමාදන විධියෙන් සමාදන් වූ මධ්‍යම පාංශුකූලිකයා උදෙසා තුබූ වස්ත්‍ර ගන්නේ ය, මෘදුකයා පාමුල තුබූ වස්ත්‍ර ගන්නේ ය, මේ තුන්දෙනම ගෘහපති සිවුරු ඉවසූ කෙණෙහි ධුතාංගය බිඳෙන්නේ ය.

තෙචීවරිකංගය ද 'චතුත්ථකචීවරං පටික්ඛිපාමි' යි කියා හෝ 'තෙචීවරිකංගං සමාදියාමි' යි කියා හෝ මේ වාක්‍යද්වයෙන් එකක් කියා සමාදන් වූ උත්කෘෂ්ට තෙචීවරිකයා විසින් සිවුරුපිළී ලදින් හූ ඉදිකටු නො ලදින් හෝ සංවිධාන කොට ලන කෙනෙකුන් හෝ නො ලදින් පරිෂ්කාරචොල නමින් අධිෂ්ඨාන කොට තබත් වරද නැත. ගෙත්තම් කොට පඬු රැඳූ තැන් පටන් තබන්නට නො වටී. තබා නම් ධුතාංගසොරා නම් වෙයි. සිවුරු පඬු පොවන කල්හි ද අඳනය හෝ උත්තරාසංගය හෝ පඬු පොවා වෙලා හැඳ සංඝාටිය පඬු පොවාලිය යුත්තේ ය. මධ්‍යමකයා සිවුරු පඬු රඳන කල්හි ඇන්ද යුතු රජනශාලායෙහි 'රජන

Non-Commercial Distribution

සිවුර ය'යි යන සිවුරෙක් ඇත. ඒ සිවුර හැඳ චීවරරජනධොවනාදී කර්මාන්ත කළ යුතුය. මෘදුකයාහට රජනශාලායෙහි සිවුර ද සභාග භික්ෂූන්ගේ සිවුරු ද හැඳ රජනකර්මාන්ත කරන්නට වටී. සභාග භික්ෂූන්ගේ සිවුරු අතරතුර පරිභොග විඳින්ට ද වටී. මෙම තුන්දෙනා ම පුළුල වඩු වියත් දිග මිටි තුන්රියන් අංසකඩය හැර සතරවන සිවුරක් ඉවසූ කෙණෙහි ධුතාංගය බිඳේ.

අතිරෙකලාභං පටික්ඛිපාමි' යි කියා හෝ 'පිණ්ඩපාතිකංගං සමාදියාමි' යි කියා හෝ පිණ්ඩපාතිකංගය සමාදන් වූ උත්කෘෂ්ට මධ්‍යම මෘදුක යන තුන්දෙනා විසින් ම සංඝබත ය, උද්දෙසබත ය, නිමන්ත්‍රණ බත ය, සලාකබත ය, මසින් පක්ෂයෙක දෙන බත ය, පොහොබත ය, පැළවියද දෙන බත ය, ආගන්තුගබත ය, ගමිකබත ය, ගිලානබත ය, ගිලානුපස්ථායකබත ය, විහාරබත ය, ධුරබත ය, වාරබත ය යන මේ තුදුස්බත නො ඉවසිය යුතු ය. ඉදින් 'සංඝ බත් ගණුව' යි යනාදීන් නො කියා 'සඟහු අපගේ ගෙයින් භික්ෂාව ගණිති. තොප ද භික්ෂාව ගණුව' යි කියා භික්ෂා නමින් දෙන ලද්දේ ඉවසන්නට වටී. සඟින් ලැබෙන නිරාමිස සලාක ද වෙහෙර පිසූ බත් ද ඉවසන්ට වටී. භික්ෂාචරියායෙහි ඉදිරියෙන් පස්සෙන් ගෙණා භික්ෂාව ද, පැමිණි දෙර දී පා ගෙණ දෙනුවා ද භොජනශාලාවට පා ගෙණ දුන් භික්ෂාව ද ගන්ට වටී. මධ්‍යම පිණ්ඩපාතිකයා එක දවසකුදු පා බලා මුත් භික්ෂාව බලා නො හිඳින්නේ ය. සරුප්නෙපුලෙන් නවත්වා ලුව වෙහෙර හිඳ පා දී දවසකට ඉවසන්නේ ය, මෘදුක වූ පිණ්ඩපාතිකයා තුන්දවසකට ඉවසන්නේ ය. මේ තුන්දෙනා ම සංඝභත්තාදි අතිරෙකලාභයක් ඉවසූ කෙණෙහි ධුතාංගය බිඳේ.

**(452)** 'ලොලුප්පචාරං පටික්ඛිපාමි' යි කියා හෝ 'සපදානචාරිකංගං සමාදියාමි' යි කියා හෝ සපදානචාරිකංගය සමාදන් වූ සපදානචාරිකයන් විසින් යම් ගමෙක හෝ වීථියක හෝ උවදුරු ඇත් නම් හෝ යම් ගෙයක තුන් දවසක් සිහා කිසින් නො ලැබේ නම්, එගම්වීථී ගෙවල් හැර යන්ට වටී. ඉදින් වෙහෙර දී සඟනට දන් දෙන්නාහු ද, අතර මග එන්නා දැක පා ගෙණ අහර දෙත් නම්, පිළිගන්නට වටී. භික්ෂාචාරවේලායෙහි පැමිණි ගෙවල් නො හැර ම හැමතැන පහයන පුන්සඳක් මෙන් පිළිවෙළින් ම යා යුතු. උත්කෘෂ්ටසපදානචාරිකයා ඉදිරියෙනුදු ඉකුත් ගෙයිනුදු බොජුන්හලට ගෙණවුත් දුන් භොජනය ද නො ගන්නේ ය. සංප්‍රාප්ත ද්වාරයෙහි වනාහි පාත්‍රය ගණුවන්ට පාත්‍රය දෙන්නේ ය. මධ්‍යම සපදන චාරිකයා ඉදිරියෙනුදු ඉකුත් ගෙයිනුදු බොජුන්හලට පාත්‍රය ගෙණදුන් භික්ෂාව ද ඉවසන්නේ ය. මෘදුක සපදානචාරිකයා එක දවසකට පැවරුවා ඉවසන්නේ ය. මේ තුන්දෙනා ම රස තෘෂ්ණාවෙන් ගෙයක් හැර ගෙයකට යන ලොලුප්පචාරය ඉපදවූ කෙණෙහි ධුතාංගය බිඳේ.

'නානාසනභොජනං පටික්ඛිපාමි' යි කියා හෝ 'ඒකාසනිකංගං සමාදියාමි' යි කියා හෝ ඒකාසනිකංගය සමාදන් වූවාහු විසින් ආසන ශාලායෙහි හිඳිනා කල ථෙරාසනයෙහි නො හිඳ 'මේ ආසනය මට පැමිණේ ය' යි සිතා සුදුසු ආසනයක් සලකා ඉන්ද යුතු. ඉදින් මොහු අඩාළ කළ බොජුන් ඇති කල්හි ඇදුරු තෙරහු හෝ උපාධ්‍යාය තෙරහු හෝ අවු නම්, නැඟී සිට වත් කරන්නට වටී. උත්කෘෂ්ටතෙම මඳ වූ බොහෝ වූ හෝ යම් භොජනයෙක් වළඳන්නට අත එවී ද එතැන් පටන් අනික් භොජනයක් ගන්නට නො ලැබේ. ඉදින් මනුෂ්‍යයෝ ගිතෙල් වෙඬරු ආදී තුන් කාලිකයෙන් යමක් දුන්නු නම්, බෙහෙත් පිණිස මුත් ආහාර පිණිස නො වටී. මධ්‍යකතෙම, යම්තාක් පිළිගත් පාත්‍රයෙහි බත් නො ගෙවේ ද, ඒ තාක් අන්‍යසූපව්‍යඤ්ජනාදියක් පිළිගන්නට නො ලැබේ. මෘදුක තෙම යම්තාක් ආසනයෙන් නො නැඟේ ද, ඒතාක් භොජනාදිය පිළිගෙණ වළඳන්නට ලබන්නේ ය. මේ තුන්දෙනාගේ ම නානාසන යෙහි හිඳ භොජනය වැළඳූ කෙණෙහි ධූතාංගය බිඳේ.

'දුතියක භාජනං පටික්ඛිපාමි' යි කියා හෝ 'පත්තපිණ්ඩිකංගං සමාදියාමි' යි කියා හෝ සමාදන් වූ පත්තපිණ්ඩිකයා විසින් කැඳ වළඳන කල යම් කිසි අවුළක් දුන, කැඳ තබා අවුළ වළඳන්නට වටී. ඒ තබා කැඳ වළඳන්නට වටී. මිරිස්අතු ආදී එකතින් ගෙණ වළඳින්ට වටී, යටත්පිරිසෙයින් දෙවනු ව සල් මිලිල පත්‍රයකුදු නො ගත යුතු. උත්කෘෂ්ටයාහට උක්සප හැර සෙසු කසළකුදු හරින්නට නො වටී, බත්කැටි මච්ඡමංස අවුළු ආදිය අතින් දතින් සැතින් සිඳ බිඳ වළඳන්නට නො වටී, මධ්‍යමයාහට එකතින් කඩා වළඳන්නට වටී, මෘදුකයාහට වනාහි පාත්‍රමුවවිටින් ඇතුළු වූ යම් කිසිවක් ඇත, ඒ සියල්ල අතින් දතින් ශස්ත්‍රයෙන් සිඳ බිඳ වළඳන්ට වටී. මේ තුන්දෙනාගේ දෙවෙනි භාජනයක් ඉවසූ කෙණෙහි ධූතාංගය බිඳේ.

'අතිරිත්ත භොජනං පටික්ඛිපාමි' යි කියා හෝ 'ඛලුපච්ඡාභත්තිකංගං සමාදියාමි' යි කියා හෝ සමාදන් වූ ඛලුපච්ඡාභත්තිකයා විසින් උදය වළඳමින් පවාරණ ව නැවැත බොජුන් කැප කරවා ගෙණ නො වැළඳිය යුතු. **(453)** මෙහි 'ඛලු' ය යන පදය ප්‍රතිෂෙධාර්ථයෙහි නිපාතයෙක. පවාරණ වූ මහණහු විසින් පසු ව ලබන ලද බත 'පච්ඡාභත්ත' නම් වේ. ඒ පච්ඡාභත්තයාගේ භොජනය පච්ඡාභත්ත නම් වේ. ඒ පච්ඡාභත්ත භොජනයෙහි පච්ඡාභත්තසංඥ කොට 'පච්ඡාභත්ත ස්වභාව මෝහට ඇත්තේ නු' යි 'ඛලුපච්ඡාභත්තික' නම් වේ. සමාදන වශයෙන් ප්‍රතික්ෂෙප කළ අතිරික්තභොජනයට මේ නමෙක, නොහොත් ඛලු සංඛ්‍යාත වූ එක් පක්ෂියෙක. ඒ පක්ෂිතෙම තුඩින් ඵලයක් ගෙණ ඒ ඵලය වැටුනු කල නැවත අනික් ඵලයක් නො කන්නේ ය. මේ ධූතාංගධරතෙම එබඳු

Non-Commercial Distribution

වූයේ තූ යි 'ඛලුපච්ඡාභත්තික' නම් වී. ඔහුගේ අංගය 'ඛලුපච්ඡාභත්තිකංග ය' යි. උත්කෘෂ්ටයා ප්‍රථම පිඩ වළඳමින් පවාරණය වූයේ දෙවෙනි පිඩ නො වළඳන්නේ ය. මධ්‍යමතෙම යම් භොජනයෙක්හි පවාරණය වූයේ ඒ භොජනය ම වළඳා අන් භොජනයක් නො ගණී. මෘදුකතෙම එම අස්නෙහි ම හිඳ නො නැඟෙනා තාක් දුන් දෙය වළඳයි. මේ තුන්දෙනා ම පවාරණ ව කැප කරවා ගෙණ අතිරික්තභොජනයක් වැළඳූ කෙණෙහි ධුතාංගය බිඳේ.

'ගාමන්තසෙනාසනං පටික්ඛිපාමි' යි කියා හෝ 'ආරඤ්ඤිකංගං සමාදියාමි' යි කියා හෝ එක්තරා වචනයකින් සමාදන් වූ ආරණ්‍යකයා විසින් මිනිසුන් වසන ගම පටන් ද, ගාමන්තසෙනාසනය පටන් ද, දෙකට සනක් තැන් හැර එතැන් පටන් නවවියත් දුන්න වියතක් ගැඹුරු වන සේ නහා එයින් පන්සියයක් දුන්නෙන් අන්තිම වූ ආරණ්‍යයෙහි හැම කල ම වැස අරුණු නැඟිය යුතු, මධ්‍යමයා වැසිසාරමස්හි ග්‍රාමාන්තසෙනස්නෙහි වසන්නේ ය, මෘදුකයා හෙමන්ත ගිම්හ අටමස්හි ග්‍රාමාන්තසෙනාසයෙහි වසන්නේ ය. මෙම තුන්දෙනා ම වනයෙන් අවුත් ග්‍රාමයෙහි බණ අසනා කල ද, අසා යන කල ද අතරමඟ අරුණු නැඟුව ධුතාංගය නො බිඳේ.

'ඡන්නං පටික්ඛිපාමි' යි කියා හෝ 'රුක්ඛමූලිකංගං සමාදියාමි' යි කියා හෝ සමාදන් වූ රුක්ඛමූලිකයා විසින් සීමා අතුර පිහිටි වෘක්ෂය ද, චෛත්‍යවෘක්ෂය ද, ලහටු බසින වෘක්ෂය ද, ආම්‍රපනසාදී ඵලවෘක්ෂය ද, වවුලන් ලගින වෘක්ෂය ද, මහත් සිදුරු ඇති වෘක්ෂය ද, විහාරමධ්‍යයෙහි පිහිටි වෘක්ෂය ද යන මෙ කී රුක් හැර විහාර කෙළවර පිහිටි රුකක් ගත යුත්තේ ය. උත්කෘෂ්ටයා විසින් තමාහට රිසියෙන රුකක් ගෙණ අනුන් ලවා පිළියෙළ කරවා නො ගත යුතු ය. පයින් පරඬලා කසළ පහ කොට ගෙණ විසිය යුතු ය. මධ්‍යමකයා එතැනට පැමිණියවුන් ලවා පිළියෙල කරවා ගෙණ වසන්නේ ය, මෘදුකයා .විසින් ආරාමික සාමණේරාදීන් කැඳවා ගෙණ පිරිසිදු කොට සම කරවා වැලි අතුරුවා පවුරු බඳවා දෙර යොදවා ගෙණ විසිය යුත්තේ ය. වෙහෙර මහත් පූජා දවස් රුක්ඛමූලිකයා විසින් ඒ රුක් මුලින් පහ ව අන් තැනෙක සැඟ වී ඉන්ද යුත්තේ ය. මේ තුන්දෙන ම පොහෝ පවුරුණු ආදී ප්‍රයෝජනයකින් විනා ඡන්න[1] ස්ථානයෙක වාසය කළ කෙණෙහි ධුතාංගය බිඳේ. දූන දූන අන් තැනෙක අරුණු නැඟු ව ධුතාංගය බිඳේ.

'ඡන්නං ච රුක්ඛමූලං ච පටික්ඛිපාමි' යන පදය **(454)** කියා හෝ 'අබ්භොකාසිකංගං සමාදියාමි' කියා හෝ අබ්භොකාසිකංගය[2] සමාදන් විය යුත්තේ ය. ඒ ධුතාංගය පූරණ මහණහු විසින් බණ ඇසීම් ආදී ප්‍රයොජනයක් ඇද්ද, අනුන්ගේ පිරිකර ආදිය ගන්නා ලද්ද ව ද පලසෙවණ ඡන්නයට යන්ට වවී. චන් කෙණෙහි වැසි වයි නම් වැසි වළක්නා

1. විතානච්ඡන්න 2. රුක්ඛමූලිකංගය

Non-Commercial Distribution

තෙක් ද හිඳ යා යුතු. මහලු සඟුන්ගේ පිරිකර ගන්නා ලද්දේ වී නම්, මග දී වැසි ආ නම් මග සිට ශාලාවට යන්ට වටී. තමා අත මහල්ලන්ගේ පිරිකරත් නැත් නම් වේගයෙන් නො ගොස් ප්‍රකෘති ගමනින් ශාලාවට ගොස් වැසි නිමි කල යා යුතු. රුක්ඛමූලිකයාහටත් මෙසේ මැ යි. උත්කෘෂ්ටයා විසින් වෘක්ෂමූල පර්වත ගෘහයන් නිසා වාසය නො කොට අබ්භාවකාශයෙහි සිවුරුකුටියක් කොට ගෙණ විසිය යුතු. මධ්‍යමකයා වෘක්ෂ පර්වත ගෘහයන් නිසා ද දිය හෙළුමෙන් ඇතුළට නො වැද වසන්-නේ ය. මෘදුකයාහට නො සුන් දියකටාර ඇති පර්වතතැලුදු කොළමඬු ද පිටි ගැ පිළී ද එතන තිබූ ගොවියන් හැර ගිය පැල් ද සොහොන් ගෙවුලුදු වටී. මෙතුන්දෙනා ම වාසය පිණිස ඡන්නයකට හෝ වෘක්ෂමූලයකට හෝ වන් කෙණෙහි ධූතාංගය බිඳේ. අප්‍රයොජනය පිණිස වන්නාහු දූන දූන අරුණු නැඟුව ධූතාංගය බිඳේ.

'සුසානං පටික්ඛිපාමි' යි කියා හෝ 'සොසානිකංගං සමාදියාමි' කියා හෝ සමාදන් වූ සොසානිකංගයා විසින් සොහොන්හි සක්මන් මණ්ඩපාදි කොට නො විසිය යුතු. ඇඳ පුටු පණවා නො ඉන්ද යුතු. පැන් නභා නො තැබිය යුතු. බණ කියමින් ද නො ඉන්ද යුතු. අමනුෂ්‍යයන්ට ප්‍රිය වූ තල මැ පිටි ආදියෙන් කළ භොජනය ද දියෙහි ගොඩෙහි මස් ද, කිරිතෙල් සකුරු ආදිය ද නො වැළඳිය යුතු. කුලගෙට නො වැද්ද යුතු. මේ ධූතාංගය මහත් ගරු බැවින් පැමිණි උවදුරක් දුරු කරණ පිණිස තමා වසන වෙහෙර මහතෙරුන්ට හෝ ග්‍රාමභොජකජ්‍යෙෂ්ඨයක්හට හෝ තමා සොහොන්හි වසනබව දන්වා මැදින්යම්හි මහමග හැර කුඩා හසරකින් සොහොනට එළඹ සිටිය මනා තන්හි සිට ඇස් කෙළවරින් දූවෙන මිනී ද, බලු කැණහිල් ආදීන් විසින් කන මිනී ද, මස් කා දමූ ඇට සැකිලි ද, බලබලා භාවනා කොට සක්මන් කෙරෙමින් යකුන් හඬ තළා සොහොන්හි ඇවිදින්නවුන් කිසිවකින් නො තළා මැදුම්යම් ගෙවා සොහොනින් නැඟී වෙහෙරට යා යුතු. එක් දවසකුදු සොහොනට නො යන්නට නො වටී. උත්කෘෂ්ටයා විසින් හැමකල ම දවන මිනීකුණප හා හැඬීම් ඇති සොහොන්හි විසිය යුතු. මධ්‍යමයා විසින් නිති මිනීදැවීම් ද කුණු වැගිරෙණ කුණප දවාලීම් හැඬීම් යන තුණින් එකකින් යුක්ත වූ සොහොන්හි විසිය යුතු. මෘදුකයා දෙළොස්අවුරුද්දකින් යට දූවූ මිනී ඇති සොහොන්හි වසන්නේ ය. මේ තුන්දෙන ම සොහොන්හි එක් රැයකුදු නො ගිය ධූතාංගය බිඳේ.

'සෙනාසනලොලුප්පං පටික්ඛිපාමි' කියා හෝ 'යථාසන්ථතිකංගං සමාදියාමි' කියා හෝ යථාසන්ථතිකංගංය සමාදන් වූවාහු විසින් 'මෙ සෙනස්න තොපට පැමිණෙ' යි කිව එයින් ම සතුටු විය යුතු. අනික් සෙනස්නක් නො පැතිය යුතු. උත්කෘෂ්ටයා තමහට පැමිණි සෙනාසනය

Non-Commercial Distribution

දුර ය යි කියා **(455)** හෝ ඉතා ලඟ ය යි කියා හෝ අමනුෂ්‍යපරිගෘහිත ය යි කියා හෝ නයි ආදීන්ගෙන් උපද්‍රව ඇතැ යි කියා හෝ උෂ්ණ ය යි කියා හෝ සීතල ය යි කියා හෝ විචාරන්නට නො ලැබෙන්නේ ය. මධ්‍යම තෙම විචාරන්නට ලබන්නේ ය. ගොස් බලන්නට නො ලබන්නේ ය. මෘදුකයා ගොස් බලා ඉදින් නො කැමැති වුව, ඒ ඇර අනුන්ට නො පැමිණි සෙනස්නක් ගන්නට ද වටනේ ය. මේ තුන්දෙනාගේ ම සෙනාසන ලොභය උපන් කෙණෙහි ධුතාංගය බිඳේ.

'සෙය්‍යං පටික්ඛිපාමි' කියා හෝ 'නෙසජ්ජිකංගං සමාදියාමි' කියා හෝ නෙසජ්ජිකාංගය සමාදන් විය යුතු. මේ අංගය පූරණ මහණහු විසින් රෑ තුන්යමින් එකක් සක්මන් කට යුතු. සතර ඉරියව්වෙන් හේනා ඉරියව්ව ම නො වටී. උත්කෘෂ්ටයාහට පිට අවුව ද සිවුරෙන් අකවටුව ද යොගිපටිය ද යන මෙහිත් වැතිර හිඳින්නට නො වටී. මධ්‍යමයාහට සිවුරෙන් පිටඅවුව සිවුරෙන් අකවටුව යොගිපටිය යන මෙයින් එකක් වටී. මෘදුකයාහට මෙකී තුණ ද කොට්ටය ද පඤ්චාංගසංඛ්‍යාත වූ එක් දෙසෙකින් පිට ලැල්ල සඳ කළ ආසනය ද සත්තංග සංඛ්‍යාත වූ තුන් දෙසෙකින් ලැලි සඳ කළ ආසනය ද වටී. මේ තුන්දෙන ම සෙය්‍යාව කළ කෙණෙහි ධුතාංගය බිඳෙන්නේ ය. මෙසේ මධ්‍යමොත්කෘෂ්ට හීන වශයෙන් එකුන්සතළිසක් ප්‍රභෙදගත වූ තෙළෙස්ධුතාංග පුරන්නා වූ බුද්ධානුශාසනා කාරක වූ සංසාරභීරුකගුණභූෂණයන් වහන්සේලා ම සියලු ම සර්වඥශාසනික වූ ලෞකිකලොකොත්තර ගුණධර්මයට හිමි වෙත්.

''මහරජානෙනි, යම් සේ මහත් වූ පටුනුගමෙක්හි නිරවශෙෂ කොට අය ගැණීමෙන් යහපත් කොට කරණ ලද සුංක ඇත්තා වූ මහත් ධන ඇති සමුද්‍රනාවිකයෙක්තෙම නො ලත් අමුත් වස්තු උපදවන පිණිස තමාගේ පිරිවර සහිත ව නැවින් මහාසමුද්‍රයට ප්‍රවිෂ්ට ව කැමැති නම් වඟුරටට හෝ තක්කොල රටට හෝ චීනදෙශයට හෝ සොවීරරටට හෝ සෞරාෂ්ට්‍රයට හෝ අලසන්දවට හෝ කොලපටුනට හෝ ස්වර්ණභූමියට හෝ යන්නේ ය. නැවින් හැසිරිය යුතු වූ යම් කිසි අනික් රටකට හෝ යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම පූර්වයෙහි ආසෙවිත වූ නිෂෙවිත වූ පුරුදු වූ හාත්පසින් පුරුදු කරණ ලද්ද වූ හැසුරුණා වූ පුදන ලද්ද වූ පූරණ ලද්ද වූ හාත්පසින් පූරණ ලද්ද වූ මේ තෙළෙස්ධුතාංගයෙන් සියලු ම ශ්‍රමණබව ලබන්නේ ය. සියලු ම ශාන්තසුඛ ප්‍රණීත වූ සමාපත්තීහු ඔහු අයිති වෙත්. තව ද මහරජානෙනි, යම් සේ කෘෂිකාර්මිකපුරුෂතෙම පළමු කොට ක්ෂේත්‍රදෙෂ වූ තෘණ කාෂ්ට ගල්ගෙඩි පහ කොට සීසා වපුට මනා කොට උදක ප්‍රවෙශ කොට පැල් තනා රැක බලා ගොපනය කොට ගොයම් කපා මැඩ ගැණීමෙන් බහුධාන්‍යක වන්නේ ය. යම් කිසි අධන කෘපණ දිළිඳු දුර්ගත ජන කෙනෙක් ඇද්ද, ඒ සියල්ලෝ ම ඔහු

Non-Commercial Distribution

ධාන්‍යක පුරුෂයා අයිති වන්නාහු ය. මහරජානෙනි, එපරිද්දෙන් ම පූර්වයෙහි ආසෙවිත නිෂෙවිතාදීන් භාවිත බහුලීකෘත කරණ ලද්ද වූ මේ තෙළෙස්ධුතාංගයෙන් සියලු ම ශ්‍රමණගුණය ලබන්නේ ය. සියලු ම ශාන්තසුඛප්‍රණීත වූ **(456)** සමාපත්තීහු ඔහු අයිති වෙත්. තවද, මහරජානෙනි, යම් සේ උභයකුල පරිශුද්ධතාවෙන් උපන් විශුද්ධරාජවංශ ඇත්තා වූ ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක වූ ක්ෂත්‍රියමහරජතෙම ඡේද්‍ය භෙද්‍ය ජනානුශාසනයෙහි ඊශ්වර වන්නේ ය. සියලු ජනයන් තමා වසහයෙහි පවත්වන සුලු වන්නේ ය. සියලු ජනපදයට ස්වාමී වන්නේ ය. සියල්ලන් අභිභවනය කොට තමන් කැමැත්තක් කරන්නට හැකි වන්නේ ය. සියලු ම මහාපෘථිවිතලය ඔහු අයිති වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම පූර්වජාතියෙහි ආසෙවනය කළා වූ පුරුදු කළා වූ භාත්පසින් පුරුදු කළා වූ හැසුරුණා වූ ප්‍රතිපත්තිපූජා ලෙසින් හැසුරුණා වූ පරිපූරණය කළා වූ මේ තෙළෙස්ධුතාංගගුණ ඇති මහණතෙම මේ ජිනෙන්ද්‍ර ශාසනවරයෙහි ඊශ්වර වන්නේ ය. සියලුදෙන වසහයෙහි පවත්වන සුලු වන්නේ ය. සියලුදෙනාහට ස්වාමී වන්නේ ය. තමාහට කැමැති දෑ කරණ සුලු වන්නේ ය. සියලු ම ශ්‍රමණගුණයෝ ඔහු අයත් වන්නාහු ය.

"මහරජානෙනි, **වංගන්තබ්‍රාහ්මණයාගේ** පුත්‍ර වූ **උපසෙනස්ථවිරයන්** වහන්සේ සල්ලෙඛ[1] ප්‍රවෘත්තියෙහි හා ධුතගුණයෙහි පරිපූරකාරී වන බැවින් 'විවෙකයෙහි වැඩ වසන බුදුන් ලඟට පිණ්ඩපාතය ගෙණ යන නමක් හැර සෙසු ගිය කෙනෙක් ඇත්නම් පචිති ආපත්ති ය' යි කියා සම්මත කළා වූ **සැවැත්නුවර** සංඝයාගේ කතිකාව නො ගෙණ තමන් වහන්සේගේ සුවිනීත වූ පන්සියයක් පමණ පිරිවර සහිත ව විවෙකයෙහි වැඩ වාසය කර වදරන්නා වූ නරදම්‍යසාරථී වූ ලොවුතුරා බුදුන් කරා එළඹ බුදුන්ගේ ශ්‍රීපාදද්වන්දය සිරසින් වැඳ දෙහොත් නගා එකත්පසෙක හුන්සේක් නො වේ ද? ඒ සර්වඥරාජොත්තමයානන් වහන්සේ ද, ඒ සුවිනීත වූ යහපත් පිරිස බලා වදරා හෘෂ්ට තුෂ්ට ප්‍රමුදිත ඔදවැඩියා වූ සිත් ඇතිසේක්, ඒ පිරිස හා සමග දුක්සැප විචාරමින් කථාසල්ලාපය කොට නිමවා කුරවීකනාද ප්‍රතිභාග වූ අසම්භින්න වූ බ්‍රහ්මස්වරයෙන් මේ මතු පහළ වන මධුර වූ කථාව වදළසේක. 'පාසාදිකා ඛො පනායං උපසෙන පරිසා. කථං ත්වං උපසෙන පරිසං විනෙසී' යි 'උපසෙනය, තොපගේ මේ අන්තෙවාසික පිරිස වනාහි ඉතා ප්‍රසාදවහ වූහ. උපසෙනය, තෙපි කවර ප්‍රකාරයකින් මේ පිරිස හික්මවාලූවා ද?' යි විචාරා වදළසේක. මෙසේ දෙවාතිදෙව වූ දශබලධාරී වූ සර්වඥයන් වහන්සේ විසින් විචාරණ ලද්ද වූ ඒ උපසෙනස්ථවිරතෙම ද විද්‍යමාන වූ ස්වභාව ගුණයෙන් ම භාග්‍යවතුන් වහන්සේට මේ මතු පහළ වන කථාප්‍රවෘත්තිය සැළකළසේක. 'ස්වාමීනි, ලොවුතුරා භාග්‍යවත් සර්වඥරාජොත්තමයානන් වහන්ස, යම්

1. සැහැල්ලුක

Non-Commercial Distribution

කිසිවෙක් මා කරා එළඹ ප්‍රව්‍රජ්‍යාව හෝ නිස හෝ ඉල්වා සිටින්නේ වී නම්, ඔහට 'ඇවැත්නි, මම වනාහි ආරණ්‍යකයෙමි. පිණ්ඩපාතිකයෙමි, පාංසුකූලිකයෙමි, තෛචීවරිකයෙමි. ඉදින් තෙපි ද ආරණ්‍යක වන්නහු නම්, පිණ්ඩපාතික වන්නහු නම්, පංසුකූලික වන්නාහු නම්, තෛචීවරික වන්නහු නම්, මෙසේ වන්නා වූ තා මම පැවිදි කෙරෙමි. නිස දෙන්-නෙමි' යි කියා මෙසේ කියමි. ස්වාමීනි, ඉදින් ඒ පුරුෂතෙම මාගේ වචනය අසා එහි සතුටු (457) වේ ද, ඇලේ ද, මෙසේ මම ඔහු පැවිදි කෙරෙමි. නිස දෙන්නෙමි. ඉදින් සතුටු නො වේ ද, (සිත) නො අලවා ද, ඔහු පැවිදි නො කෙරෙමි. නිස නො දෙමි. ස්වාමීනි, මෙසේ මම පිරිස හික්මවාලමි' යි සැළ කළසේක.

''මහරජානෙනි, මෙසේ ධුතගුණවරසමාදනයෙන් යුක්ත වූ මහණුන් වහන්සේ සර්වඥශාසනවරයෙහි ඊශ්වර වනසේක. සියල්ලන් වසහයෙහි පවත්වන සුලු වන්නහු ය. සියල්ලන්ට ස්වාමී වන්නහු ය. ශාසන ප්‍රතිරූප වූ කැමැති දැ කරණ සුලු වනසේක. ශාසනික සියලු ම ශාන්ත සුව ප්‍රණීත වූ සමාපත්තීහු ඔහු අයිති වන්නාහු ය. මහරජානෙනි, අභිවෘද්ධිපරිශුද්ධශ්‍රෙෂ්ඨජාතයෙන් හට ගන්නා වූ පද්මය යම් සේ ඉතා සිනිඳු වේ ද, මෘදු වේ ද, ලොභනීය වේ ද, සුවඳ ඇති වේ ද, ලොකයාහට ප්‍රිය වේ ද, ප්‍රාර්ථිත වේ ද, ප්‍රශස්ත වේ ද, උදක කර්දමය හා අනුලිප්ත වේ ද, මනා කොට පැමිණි කෙසරුකර්ණිකායෙන් සැරහෙන ලද වේ ද, අනෙකවිධභ්‍රමරගණයා විසින් සෙවනය කරණ ලද වේ ද, සීතලොදකයෙන් වර්ධනය වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම මීට පූර්වජාතියෙහි ආසෙවනය කළා වූ නිෂෙවනය කළා වූ පුරුදු කළා වූ හාත්පසින් පුරුදු කළා වූ හැසුරුණු වූ පිදීම් වශයෙන් හැසුරුණු වූ සම්පූර්ණ කළා වූ මේ තෙළෙස්ධුතාංගගුණයෙන් ආර්යශ්‍රාවකතෙම උතුම් තිස්ගුණධර්මයකින් යුක්ත වනසේක.

**''කතමෙහි තිංසගුණවරෙහි-සිනිද්ධ මුදු මද්දව මෙත්ත චිත්තො හොති-පෙ-ඉමෙහි තිංසගුණවරෙහි සමුපෙතො හොති''** යි.[1]

කවර නම් තිස්ගුණවරයකින් ද? යත්— සිනිඳු මෘදු මොළොක් වූ මෛත්‍රීසිත් ඇති වන්නේ ය, ඝාතික හත විහත ක්ලේශයන් ඇති වන්-නේ ය, නසන ලද දුරු කරණ ලද මානදර්ප ඇති වන්නේ ය, අචල ව දැඩි ව පිහිටියා වූ නිර්වෙමතිකශ්‍රද්ධාව ඇති වන්නේ ය, පරිපූර්ණ වූ සම්පූර්ණ වූ සන්තොෂජනක වූ ලොභනීය වූ රූපාරූපසමාපත්තිලාභී වන්නේ ය, (458) ශීලවරප්‍රවරාතුල්‍යපවිත්‍රසුගන්ධයෙන් ව්‍යාප්ත ව වැඩෙන ලද

1. සම්පූර්ණ පාලිපාඨය පාළිමිලිඤ පඤ්හයෙහි 289 වන පිටුවෙහි පෙණේ.

Non-Commercial Distribution

වන්නේ ය, සකල දිව්‍යමනුෂ්‍යයන්ට ප්‍රිය මනාප වන්නේ ය, ක්ෂීණාශ්‍රව-වරාර්යපුද්ගලයන් විසින් ප්‍රාර්ථිත වන ලද්දේ ය, දිව්‍යමනුෂ්‍යයන් විසින් ප්‍රේමහරිත ව නමස්කාර කරණ ලද්දේ ය, දිව්‍යමනුෂ්‍යයන් විසින් යථා ශක්තීන් පුදන ලද්දේ ය, සුබුද්ධික විබුධ පණ්ඩිතජනයන් විසින් ස්තුත ප්‍රශස්ත කරණ ලද වන්නේ ය, මෙලොව හෝ පරලොව හෝ ලෝකයා හා නො ඇලෙන ලද වන්නේ ය, ඉතා කුඩා වූ අල්පස්වල්ප වරදෙහි දු භය දක්නා සුලු වන්නේ ය, මහත් වූ උතුම් සම්පත් කැමැත්තවුන්ට මාර්ගඵල නමැති උතුම් ධනය සාධනසේක, අරාධනාවෙන් දෙන ලද මහත් ප්‍රණීත ප්‍රත්‍යයට භාගී වනසේක, අනිකෙතසයන වනසේක, ස්වචිත්තයෙන් තොර නො කොට උපනිධ්‍යානය කරණ ලද ධ්‍යාන හා කෙලෙසුන් තවන උතුම් වීර්යයෙන් යුක්ත වූ විහරණය ඇතිසේක, අවුල් හරණ ලද ක්ලේශ ජාල වස්තූන් හා බිඳින ලද්ද වූ භග්න කරණ ලද්ද වූ හකුළුවන ලද්ද වූ සිඳින ලද්ද වූ පඤ්චමභාගතීන් හා පඤ්චනීවරණයන් ඇතිසේක, අකොප්‍ය වූ ලොකොත්තරධර්මයන් ඇතිසේක, ගුණානුභාවයෙන් පමුණුවන ලද දශවිධ ආර්යවාස ඇතිසේක, අනවද්‍ය වූ ප්‍රත්‍යයපරිභොග ඇතිසේක, පඤ්චගතියෙන් මිදුනසේක, එතෙර වන ලද බුද්ධාදී අටතන්හි උපදනා සියලු විචිකිච්ඡාවන් ඇතිසේක, අර්හත්ඵලාධිගමය උපනිධ්‍යානය කරණ ලද ආත්මය ඇතිසේක, දක්නා ලද චතුස්සත්‍යධර්මයන් ඇතිසේක, අචල වූ දෘඪ වූ භයින් ගැලවෙන රක්ෂාස්ථානයට එළඹෙනසේක, අර්හත්මාර්ග ඥාන නමැති ශස්ත්‍රයෙන් මූලොච්ඡින්න කරණ ලද කාමරාගානුශයාදි සත්තානුසයන් ඇතිසේක, සර්වාශ්‍රව ක්ෂයට පැමිණිසේක, ශාන්තසුඛ සමාපත්ති විහරණය බහුල කොට ඇතිසේක, සියලු ම ශ්‍රමණගුණයෙන් උපලක්ෂිත වනසේක, ධූතාංගසෙවනය කළ ආර්යශ්‍රාවකතෙම මේ තිස් ගුණවරයෙන් උපලක්ෂිත වනසේක.

"මහරජානෙනි, සකලලොකාචාර්ය වූ දශබලධාරි වූ සර්වඥයන් වහන්සේ හැර දශසහශ්‍රිලොකධාතුයෙහි වසන්නා වූ සියලු සත්වයන්ට **ශාරිපුත්‍රස්ථවිරයන්** වහන්සේ අග්‍රපුරුෂ වූසේක් නො වේ ද? ඒ සැරියුත් මහාස්ථවිරයන් වහන්සේ ද අප්‍රමෙය වූ අසංඛෙය්‍යගණන් කල්පයෙහි රැස් කරණ ලද කුශලමූලයන් ඇතිසේක්, බ්‍රාහ්මණමහාසාරකුලයෙහි ඉපද ශ්‍රේෂ්ඨ වූ බ්‍රාහ්මණවංශ ඇතිසේක් මනොරම්‍ය වූ පඤ්චකාමසම්පත්තිය ද අනෙකසියදහස්ගණන් වර්‍ධනසම්භාරය ද හැර ප්‍රඥසාරධනය ම විජයධ්වජය කොට නහා ගෙණ පරිබ්‍රාජකවෙශයෙන් දඹදිවතලෙහි නුවණැත්තන් විමසා ඇවිදිමින් **අස්සජීමහතෙරුන්** වදළ සද්ධර්මගාථාව අසා ජිනෙන්ද්‍රශාසනයෙහි පැවිදි ව මේ තෙළෙස්ධූතාංගගුණයෙන් කාය වාක් චිත්තය දමනය කොට ගෙණ අද දූන් දක්වා අනන්තගුණසමන්නාගත වූසේක්, ගෞතම සර්වඥයන් වහන්සේගේ ශාසනයෙහි සද්ධර්ම චක්‍රය නො හැර පවත්වන සද්ධර්මසෙනාධිපති වූසේක. මහරජානෙනි, ධර්මසංගීතිකාරක වූ **මහාකාශ්‍යපස්ථවිරයන්** වහන්සේ විසින් සත්රුවන්

*Non-Commercial Distribution*

භාණ්ඩාගාරයෙක්හි රාජමුද්‍රා තබන මහාමාත්‍යයෙකු මෙන් **(459)** උතුම ධර්මරාශියෙහි **අංගොත්තරනිකාය** ය යි කියා ධර්මමුද්‍රාව තබන ලද්දේ ය. ඒ අංගොත්තරනිකායට අන්තර්ගත වූ එකකනිපාතයෙහි දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, තථාගත වූ බුදුරජ වූ මා විසින් පවත්වන ලද්ද වූ අනුත්තර වූ ධර්මචක්‍රය යමෙක් මනා කොට අනු ව පවත්වා ද, ශාරිපුත්‍රයන් හැර එබඳු වූ අනික් එක ම පුද්ගලයෙකුදු නො දක්නෙමි. මහණෙනි, **ශාරිපුත්‍ර**තෙම තථාගතයන් විසින් පවත්වන ලද්ද වූ අනුත්තර වූ සද්ධර්මචක්‍රය මනා කොට ම අනු ව පවත්වන්නේ ය' යි කියා මේ ධුතගුණය ම ශ්‍රේෂ්ඨබව වදරණ ලද්දේ ය'' යි වදළසේක.

''සාධු, සාධු, ස්වාමීනි, නාගසෙන ස්ථවිරොත්තමයානන් වහන්ස, යම්කිසි නවාංගශාස්තෘවචනයෙක් ඇද්ද, යම් ඒ ලොකොත්තර ක්‍රියාවෙක් ඇද්ද, ලොකයෙහි යම් අධිගම විපුලවර සම්පත්තියෙක් ඇද්ද, ඒ සියල්ල තෙළෙස්ධුතාංගගුණයෙහි ම ඇතුළත් වීමට පැමිණියේ ය'' යි කියා ස්තොත්‍ර කළහ.

**ධුතාංගානිසංසප්‍රශ්නය නිමි.**

---

**නවවැනි වර්ගය නිමියේ ය.**

---

# යොගි කථා ප්‍රශ්නය

නැවත ද ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා යන පඤ්චධර්මයෙන් යුක්ත වූ සකල පෘථිවීතලතිලකායමාන වූ **මිලිඳු** මහරජානෝ සර්වවාදිවාරණ කෙශරින්ද්‍රභූත වූ නාගසෙන ස්ථවිරයන් වහන්සේගේ විචිත්‍රධර්මකථා ප්‍රශ්න ව්‍යාඛ්‍යානයෙන් සර්වඥශාසනය නෛර්යාණික ප්‍රණීතබව දැන සියලු රාජ්‍යශ්‍රීසම්පත් හා ජීවිතයෙහි ආලය හැර අර්හත්ඵලය ම උපදවනු කැමැති ව එයට නිසි ප්‍රතිපත්තිය විචාරණුවෝ ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කොපමණ අංගකෙනෙකුන්ගෙන් සමන්නාගත වූ භික්ෂූන් වහන්සේ අර්හත්ඵලය සිද්ධකරණසේක් ද?'' යි විචාළෝ ය.

එකල නාගසෙන ස්ථවිරපාදයෝ:—

**''ඉධ මහාරාජ අරහත්තං සච්ඡිකාතුකාමෙන භික්ඛුනා, සොරස්සරස්ස එකං අඞ්ගං ගහෙතබ්බං, –පෙ– භමරස්ස ෙව අඞ්ගානි ගහෙතබ්බානී''** යි. [1]

**(461)** ''මහරජානෙනි, මේ ශාසනයෙහි අර්හත්ඵලය සිද්ධ කරණු කැමැත්තා වූ භික්ෂූන් වහන්සේ විසින් සොරස්වරයාගේ එක් අංගයක් ගත යුත්තේ ය. කුක්කුටයාගේ පඤ්චාංගයක් ගත යුත්තේ ය, කලන්දක යාගේ එක් අංගයක් ගත යුත්තේ ය, දිවිදෙනගේ එක් අංගයක් ගත

1. සම්පූර්ණ පාලිපාඨය වුවමනා අය පාළි මිලින්දපඤ්හයෙහි 290 වන පිටුව පටන් බැලිය යුතු.



Non-Commercial Distribution

යුත්තේ ය, දිවියාගේ අංගදෙකක් ගත යුත්තේ ය, ඉදිබුවාගේ පඤ්චාංගයක් ගත යුත්තේ ය, හුණවෘක්ෂයාගේ එක් අංගයක් ගත යුත්තේ ය, ධනුවගේ එක් අංගයක් ගත යුත්තේ ය, කාකයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, වඳුරාගේ අංගද්වයක් ගත යුත්තේ ය, ලාබුලතාවගේ එක් අංගයක් ගත යුත්තේ ය; පද්මයාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, බීජයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, සල්කැලණියගේ එක් අංගයක් ගත යුත්තේ ය, නෞකාවගේ තුන් අංගයක් ගත යුත්තේ ය, නැව් බඳින සිනියගේ අංගද්වයක් ගත යුත්තේ ය, කූපයාගේ එක් අංගයක් ගත යුත්තේ ය, නාවිකයාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, නැව් රක්නා කම්කරුවාගේ එක් අංගයක් ගත යුත්තේ ය, මහාසමුද්‍රයාගේ පඤ්චාංගයක් ගත යුත්තේ ය, මහා පෘථිවියගේ පංචාංගයක් ගත යුත්තේ ය, උදකයාගේ පංචාංගයක් ගත යුත්තේ ය, වහ්නියගේ පංචාංගයක් ගත යුත්තේ ය, වාතයාගේ පංචාංගයක් ගත යුත්තේ ය, පර්වතයාගේ පංචාංගයක් ගත යුත්තේ ය, ආකාශයාගේ පංචාංගයක් ගත යුත්තේ ය, චන්ද්‍රයාගේ පංචාංගයක් ගත යුත්තේ ය, සූර්යයාගේ සප්තාංගයක් ගත යුත්තේ ය, ශක්‍රයාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ චතුරංගයක් ගත යුත්තේ ය, වේයාගේ එක් අංගයක් ගත යුත්තේ ය, බළලාගේ අංගද්වයක් ගත යුත්තේ ය, මූෂිකයාගේ එක් අංගයක් ගත යුත්තේ ය, ගෝනුස්සාගේ එක් අංගයක් ගත යුත්තේ ය, මුගටියාගේ එක් අංගයක් ගත යුත්තේ ය, මහලු ශෘගාලයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, මුවාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, ගවරූපයාගේ චතුරාංගයක් ගත යුත්තේ ය, සූකරයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, හස්තියාගේ පංචාංගයක් ගත යුත්තේ ය, සිංහයාගේ සප්තාංගයක් ගත යුත්තේ ය, සක්වාලිහිණියාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, **(462)** පෙණාහිකා ය යි කියන ලද කැඳැත්තියගේ අංගද්වයක් ගත යුත්තේ ය, මනුෂ්‍යාසර පරෙවියාගේ එක් අංගයක් ගත යුත්තේ ය, බකමූහුණු පක්ෂියාගේ අංගද්වයක් ගත යුත්තේ ය, කැහැරුල් පක්ෂියාගේ එක් අංගයක් ගත යුත්තේ ය, වවුලාගේ අංගදෙකක් ගත යුත්තේ ය, පූඩාවාගේ එක් අංගයක් ගත යුත්තේ ය, සර්පයාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, පිඹුරාගේ එක් අංගයක් ගත යුත්තේ ය, මාර්ගයෙහි දූල් බඳින පන්ථකමකුළුවාගේ එක් අංගයක් ගත යුත්තේ ය, ඵනය ගෙණ ක්ෂීර පානය කරණ ළදරුවාගේ එක් අංගයක් ගත යුත්තේ ය, චිත්‍රකධර ඉදිබුවාගේ එක් අංගයක් ගත යුත්තේ ය, මහාවනයාගේ පංචාංගයක් ගත යුත්තේ ය, වෘක්ෂයාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, මහාමෙඝයාගේ පංචාංගයක් ගත යුත්තේ ය, මාණික්‍යරත්නයාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, මුවවැද්දගේ චතුරංගයක් ගත යුත්තේ ය, මස්කෙවුලාගේ අංගද්වයක් ගත යුත්තේ ය, දඬුවඩුවාගේ අංගද්වයක් ගත යුත්තේ ය, ඝටයාගේ එක් අංගයක් ගත යුත්තේ ය, කාලායසයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, ඡත්‍රයාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, ක්ෂේත්‍රයාගේ-අංගත්‍රයක් ගත යුත්තේ ය, අගදයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, භොජන

Non-Commercial Distribution

යාගේ අංගත්‍රයක් ගත යුත්තේ ය, ධනුශ්ශිල්පියාගේ චතුරංගයක් ගත යුත්තේ ය, රජදරුවන්ගේ අංගසතරක් ගත යුත්තේ ය, දෙරටුපාලයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, දගලෙහි එක් අංගයක් ගත යුත්තේ ය, ප්‍රදීපයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, මයුරයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, අශ්වයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, සුරාසොණ්ඩයාගේ අංගදෙකක් ගත යුත්තේ ය, ඉන්ද්‍රඛීලයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, තුලාවගේ එක් අංගයක් ගත යුත්තේ ය, ඛඩ්ගයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, මත්ස්‍යයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, නයගැති පුරුෂයාගේ එක් අංගයක් ගත යුත්තේ ය, රොගාතුරයාගේ අංගදෙකක් ගත යුත්තේ ය, උම්මත්තයාගේ[1] අංගදෙකක් ගත යුත්තේ ය, ගංගාවගේ අංගදෙකක් ගත යුත්තේ ය, වෘෂභයාගේ එක් අංගයක් ගත යුත්තේ ය, මාර්ගයාගේ අංගදෙකක් ගත යුත්තේ ය, සුංකසායිකයාගේ[2] එක් අංගයක් ගත යුත්තේ ය, චෞරපුරුෂයාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, පක්ෂීන් අනුභව කරන්නා වූ සකුණග්ඝි නම් පක්ෂියාගේ එක් අංගයක් ගත යුත්තේ ය, සුනඛයාගේ එක් අංගයක් ගත යුත්තේ ය, වෛද්‍යාචාරියාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, ගර්භිණියගේ අංගද්වයක් ගත යුත්තේ ය, සෙමරියගේ එක් අංගයක් ගත යුත්තේ ය, කිරලියගේ අංගද්වයක් ගත යුත්තේ ය, පරෙවිධෙනුවගේ තුන් අංගයක් ගත යුත්තේ ය, එක් ඇසක් ඇති පුරුෂයාගේ අංගද්වයක් ගත යුත්තේ ය, කෘෂිකර්මකපුරුෂයාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, ජම්බුක නම් ශෘගාලියගේ එක් අංගයක් ගත යුත්තේ ය, රදවුන්ගේ අළු පෙරණ පෙරහන්කඩෙහි අංගද්වයක් ගත යුත්තේ ය, සැන්දේ එක් අංගයක් ගත යුත්තේ ය, නය සාධකයාගේ තුන් අංගයක් ගත යුත්තේ ය, අනුවිචිනයාගේ එක් අංගයක් ගත යුත්තේ ය, රථාචාර්යයාගේ අංගදෙකක් ගත යුත්තේ ය, භොජකයාගේ අංගදෙකක් ගත යුත්තේ ය, සන්නාලියාගේ **(463)** එක් අංගයක් ගත යුත්තේ ය, නාවිකයාගේ එක් අංගයක් ගත යුත්තේ ය, භෘංගයාගේ අංගදෙකක් ගත යුත්තේ ය.

**දෙසියතිස්හතරඅංගයක් ඇති එසියපහක් පමණ මාතෘකාපද නිමි.**

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'සොරස්වරයාගේ එක් අංගයක් ගත යුත්තේ ය' යි කියා යම් වචනයක් වදළසේක් ද, ඒ කවර එකාංගයක් ගත යුතු ද?" යි විචාළෝ ය. "මහරජානෙනි, යම් සේ සොරස්වරය ඇති ගදුහතෙම සංකාරස්ථානයෙහි ද සතර මංසන්ධියෙහි ද තුන් මංසන්ධියෙහි ද ගාමද්වාරයෙහි ද වීපොතු රාශියෙහි ද යම්කිසි තැනෙක වැද හෙව සයනය කෙරේ ද, නිද්‍රා බහුල නො වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම භාවනායෙහි යෙදෙන්නා වූ යොගාවචර භික්ෂූන් වහන්සේ විසින් තණ ඇතිරියෙහි හෝ පර්ණ ඇතිරියෙහි හෝ දඬුමැස්සෙහි හෝ පෘථිවියෙහි හෝ යම් කිසි තැනක සම්කඩ අතුරා ගෙණ සයනය කළ යුත්තේ ය. නිද්‍රා

1. මතස්ස-පාළි 2. සුංක සායිතයා ගේ

Non-Commercial Distribution

බහුල නො විය යුත්තේ ය. මහරජානෙනි, කොටළුවාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මේ සයනය බහුල නො විය යුතු කාරණය දෙවාතිදෙව වූ අප තිලෝගුරු භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**'කලිඞ්ගරූපධානා භික්ඛවෙ එතරහි මම සාවකා විහරන්ති**
**අප්පමත්තා ආතාපිනො පධානස්මිං'** යි.

'මහණෙනි, දැන් මාගේ ශ්‍රාවකයෝ නිරර්ථක වූ දරකඩ ම හිස තබන කන්වයින් කොට ගෙණ ක්ලේශයන් තවන වීර්යයෙන් යුක්ත ව සම්‍යක්-ප්‍රධාන වීර්යයෙහි අප්‍රමාද ව වාසය කරන්නාහු ය' යි කියා වදාරණ ලද්දේ ය. තවද, මහරජානෙනි, මේ කාරණය **ශාරි** නම් බ්‍රාහ්මණ දෙවීන්ගේ පුත්‍ර වූ සද්ධර්මසෙනාධිපති වූ ථෙරසාමීන් වහන්සේ විසින් ද,

**'පල්ලඞ්කෙන නිසින්නස්ස-ජණ්ණුකෙ නාභිවස්සති,**
**අලං ඵාසු විහාරාය-පහිතත්තස්ස භික්ඛුනො'** යී.

'භාවනානුයොගයට පල්ලංකයෙන් හුන්නහුගේ උභය ජාණුකයෙහි වැසි වැස නො තෙමේ නම්, නිවන් පිණිස මෙහෙයන ලද ආත්මය ඇත්තා වූ භික්ෂුහට සැප විහරණය පිණිස පමණ ය' යි කියා වදාරණ ලද්දේ යි.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'කුකුළාගේ පඤ්චාංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ පඤ්චාංගය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ කුකුළුතෙම සන්ධ්‍යා කාලයෙහි වේලාපස ම ලැග්මට එළඹෙන්නේ ය, විවෙකී වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම සමථවිදර්ශනායොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් ඒ ඒ කාලයට නිසි වූ වෙලාවෙහි ම විහාර චෛත්‍යාංගණ හැමද වැළඳිය යුතු වූ පැන් පරහා නහා තබා ශරීරයෙහි විඩා හැර මදක් සැතපී ශරීරප්‍රතිජග්ගනය කොට පැන් නහාපියා සකසා හැඳ චෛත්‍යාදිය වැඳ වැඩිමහලු භික්ෂූන් දක්නා පිණිස ගොස් සමු ගෙණ කල් වේලායෙහි ජනශූන්‍යාගාරයට ප්‍රවිෂ්ට විය යුත්තේ ය. මහරජානෙනි, කුක්කුටයාගේ මේ පළමු වන අංගය ගත යුත්තේ ය. නැවත ද, මහරජානෙනි, කුකුළු තෙම කල් **(464)** වේලා නො වරදවා ම අලුයම සත්පැයින් අඩ ලා අරුණු බලා හිඳ ලැග්මෙන් නැඟිටී ද, මහරජානෙනි, එපරිද්දෙන් ම භාවනානු-යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් කල් වේලායෙහි ම අරුණට පළමු ව නැඟිට දැහැටි වළඳා උදය ම චෛත්‍යාංගණාදිය හැමද වළඳන පැන් පරිභොජනීය වූ පැන් පරහා නහා තබා ශරීරය ප්‍රතිජග්ගනය කොට සිවුරු හැඳ චෛත්‍ය ප්‍රතිමා වැඳ නැවතත් කල් ඇත ශූන්‍යාගාරයට ප්‍රවිෂ්ට විය යුත්තේ ය. මහරජානෙනි, කුකුළාගේ මේ දෙවෙනි අංගය ගත යුත්තේ ය. නැවත ද, මහරජානෙනි, කුකුළුතෙම පෘථිවිය පයින් ම සාර-සාරා අනුභව කළ යුතු වූ ගොදුරු ගිලින්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම භාවනානුයොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් 'කෙළි

Non-Commercial Distribution

පිණිසත් නො වළඳමි, මද වඩනා පිණිසත් නො වළඳමි, ශරීර අලංකාර පිණිසත් නො වළඳමි, පුරස්ත්‍රීන් මෙන් සැරහීම පිණිසත් නො වළඳමි. යම් තාක් මේ ශරීරයාගේ සිටීම පිණිස ද, සතරඉරියව් පැවැත්වීමෙන් යැපීම පිණිස ද, සාපිපාසාදී දුක් නසන පිණිස ද, ශාසනබ්‍රහ්මචරියානුග්‍රහ පිණිස ද, මෙසේ ආහාරය නො වැළඳීමෙන් වූ පුරාණ වෙදනාව නසමි. ආහාරහත්ථක අලංසාටක භුත්තවමිතක තත්‍රවට්ටක කාකමාසකබමුණන් මෙන් පමණ ඉකුත් කොට වැළඳීමෙන් වන අළුත් වේදනාවන් පමණ දැන වැළඳීමෙන් නො උපදවමි. මාගේ ජීවිතය පැවැත්වීම පිණිස වන්නේ ය. අකැප ලෙසින් නුපන් පස බැවින් නිවැරදිබව ද කර්මස්ථාන මෙනෙහි කිරීමට ආහාර වැළඳීමෙන් සැප විහරණය ද වන්නේ ය' යි[1] මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කොට අනුභව කළ යුතු වූ ආහාරය අනුභව කළ යුත්තේ ය. මහරජානෙනි, මේ කුකුළාගේ තුන්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මේ කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය:—

**"කන්තාරෙ පුත්තමංසං ච-අක්ඛස්සබ්භඤ්ජනං යථා,**
**එවං ආහරි ආහාරං-යාපනත්ථාය මුච්ඡිතො" යි.**

කාන්තාරමාර්ගයෙහි මාර්ගොපකරණ සිඳී දිවි රක්නට අනුභව කරණ පුත්‍රමාංසයක් මෙන් ද, කාන්තාරපථයෙහි පමා ව ගමන් ගත් ගැල් අකුරෙහි තෙල් අලෙපනය කිරීම යම් සේ ද, එසෙයින් ම ක්ෂුධාවෙන් පීඩිත වූයේ ශරීරයාගේ යපීම පිණිස ආහාරය වළඳන්නේ යි. නැවත ද, මහරජානෙනි, කුකුළාට ඇස් ඇත්තේ ද, රාත්‍රියෙහි අන්ධ වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් අනන්ධ වූයේ ම අන්ධයෙකු හා සම විය යුත්තේ ය. අරණ්‍යයෙහි ද ගොදුරුගම්හි ද පිඬු පිණිස හැසිරෙණ කල්හි ද රජනීය වූ රූප ශබ්ද ගන්ධ රසස්ප්‍රෂ්ටව්‍යධර්මයෙහි අන්ධ වූ බධිර වූ මූඪයකු මෙන් විය යුතු ය. රූපශබ්දදිය නිමිත්තග්‍රහණය නො කට යුත්තේ ය. එම රූපාදිය නැවත නැවතත් විමසීමෙන් ව්‍යඤ්ජන ග්‍රහණය නො කට යුත්තේ ය. මහරජානෙනි, මේ කුකුළාගේ සතරඅංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මේ කාරණය **මහාකාත්‍යායන** ථෙර ස්වාමීන් වහන්සේ විසින්:—

**"චක්ඛුමස්ස යථා අන්ධො-සොතවා බධිරො යථා,**
**ජිව්හා වස්ස යථා මූගො-බලවා දුබ්බලොරිව,**
**අථ අත්ථෙ සමුප්පන්නෙ-සයෙථ මතසායිකං"** යි.

**(465)** 'යම් සේ යොගාවචරමහණ ඇස් ඇත්තේ ද අන්ධයෙකු මෙන් විය යුතු ය. ශ්‍රොත්‍රය ඇත්තේ ද බධිරයෙකු මෙන් විය යුතු ය. යම් සේ දිව ඇත්තේ ද ගොලුවෙකු මෙන් විය යුතු ය. බල ඇත්තේ ද දුර්බලයෙකු මෙන් විය යුතු ය. නැවැත අර්ථයක් උපන් කල්හි මනසායිකචිත්තය[2] ම නිවන් අරමුණු කොට ගෙණ සයනය කරන්නේ ය' යි[2] වදාරණ ලදී.

1. මේ පරිවර්තනය අයොග්‍ය ය.
2. 'මනසායික චිත්තය ම' යනාදී පරිවර්තනය සුදුසු නො වේ.

Non-Commercial Distribution

''නැවත ද මහරජානෙනි, කුක්කුටතෙම කැටකැබිලිති දඬු පොලු මුගුරුවලින් හෙළනු ලබන්නේ ද, තමා වසන ස්වකීය ගෘහය නො හරින්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම සිවුරු ගෙත්තම් කරන්නා වූ ද, නවකර්මාන්ත කරන්නා වූ ද, වත්පිළිවෙත් කරන්නා වූ ද, පෙළ හදරන්නා වූ ද, පෙළ කියන්නා වූ ද යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් යොනිසොමනස්කාරය නො හැරිය යුත්තේ ය. මහරජානෙනි, මේ කාරණය වනාහි යොගාවචරයන් වහන්සේගේ ස්වකීයගෘහයෙක. හේ කවරේ ද? යත්— යොනිසොමනස්කාරය යි. මහරජානෙනි, කුක්කුටයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, දෙවාතිදෙව වූ භාග්‍යවතුන් වහන්සේ විසින් ද 'මහණෙනි, භික්ෂූහුගේ ස්වකීය වූ පියන් අයත් වූ සර්වඥපියානන්ට විෂය වූ කිසි ගොචරයෙක් ඇද්ද, හේ කවරේ ද? යත්— සතරසතිපට්ඨානයෝ ය' යි කියා මේ කාරණය වදරණ ලද්දේ ය. මහරජානෙනි, මේ කාරණය සද්ධර්මසෙනාධිපති වූ සැරියුත්මහතෙරුන් වහන්සේ විසින්:—

**'යථා සුපන්තො[1] මාතඞ්ගො-සකං සොණ්ඩං න මද්දති,**
**භක්ඛාභක්ඛං විජානාති-අත්තනො වුත්තිකප්පනං.**

**තථෙව බුද්ධපුත්තෙන-අප්පමත්තෙන වා පන,**
**ජිනවචනං න මද්දිතබ්බං-මනසිකාරවරුත්තමං.'**

'යම් සේ සයනය කරන්නා වූ හස්තිරාජතෙම තමාගේ සොඬ නො මඩින්නේ ය, තමාගේ ජීවිකාවෘත්තිය කරන්නේ ය, භක්ෂ්‍යාභක්ෂ්‍ය දෙක දන්නේ ය, එපරිද්දෙන් ම ත්‍රිවිධ ශික්ෂායෙහි අප්‍රමාද වූ බුද්ධපුත්‍රයන් වහන්සේ විසින් මනසිකාරවරොත්තම වූ ජිනෙන්ද්‍රවචනය දූන දූන නො මැඩිය යුත්තේ ය' යි කියා මෙපවත් වදරණ ලද්දේ ය.''

''භවත් නාගසෙනයන් වහන්ස, 'කලන්දකයාගේ එක් අංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ ලෙහෙනා සතුරු සත්වකෙනෙකුන් ලං වන කල්හි නඟුට පොළාහැර මහත් කොට විද ගෙණ ඒ නඟුටු මුඟුරෙන් ම විරුද්ධසත්වයන් දුරු කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ක්ලේශසතුරුසෙනාව ලං වන කල්හි සතිපට්ඨාන නමැති පොල්ල පොළා ඒ සතිපට්ඨාන පොල්ලෙන් ම සර්වක්ලේශය ම දුරු කට යුත්තේ ය. මහරජානෙනි, ලේනාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මේ කාරණය චූල්ලපන්ථක තෙරුන් වහන්සේ විසින්:—

**''යදා කිලෙසා ඔපතන්ති-සාමඤ්ඤගුණධංසනා,**
**සතිපට්ඨාන ලගුළෙන -හන්තබ්බා තෙ පුනප්පුනං.''-යි.**

---

1 සුමන්තො

Non-Commercial Distribution

**(466)** 'යම් කලෙක ශ්‍රමණගුණ නසන්නා වූ ක්ලේශයෝ ලං ව එද්ද, එකල සතිපට්ඨානපොල්ලෙන් නැවත නැවත ඒ ක්ලේශය නැසිය යුත්තේ ය' යි කියන ලදී.''

''ස්වාමීනි, **නාගසෙනයන්** වහන්ස, 'දිවිදෙනගේ එක් අංගයක් ගත යුත්තේ ය' යි කියා යම් වචනයක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ ද?'' යි විචාළෝ ය.'' මහරජානෙනි, යම් සේ දිවිදෙන එක්වරක් ම දරු ගැබ ගන්නී ය. ඒ දරු ගැබින් ඇට වූ වෙහෙස දුන නැවැත පුරුෂයකු කරා දිවිහිමියෙන් නො එළඹෙන්නි ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ආයතිභවයෙහි ප්‍රතිසන්ධිය, උත්පත්තිය, ගර්භශයනය, චුතිය, මරණින් මිදී යාම ය, ක්ෂය වීම ය, විනාශ වීම ය, එම සංසාරභය, දුර්ගතිභය යන මෙතෙක් දුකින් තමා පෙළෙනබව දැක පුනර්භවයෙහි මම නො පිළිසිඳ ගන්නෙමි' යි කියා යොනිසොමනස්කාරය කට යුත්තේ ය. මහරජානෙනි, දිවිදෙනගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මේ කාරණය දෙවාතිදෙව වූ භාග්‍යවතුන් වහන්සේ විසින් **සුත්‍රනිපාතයෙහි ධනියගොපාලකසූත්‍රයෙහි** වදරණ ලද්දේ ය:—

> **''උසභොරිව ඡෙත්වා බන්ධනානි**
> **නාගො පූතිලතංව දාලයිත්වා,**
> **නාහං පුන උපෙස්සං ගබ්භසෙය්‍යං**
> **අථ චෙ පත්ථයසි පවස්ස දෙව'' යි.**

''බන්ධනයන් සිඳ ගෙණ ගිය වෘෂභයකු මෙන් ද, කිඳි වැලක් ප්‍රදලනය කොට ගිය හස්තිරාජයකු මෙන් ද, ක්ලේශබන්ධනය හැරියා වූ මම නැවත ගර්භසෙය්‍යාවට නො එළඹෙමි. නැවැත ඉදින් පර්ජන්‍යනය, තෝ කැමැත්තෙහි නම් වර්ෂණය කරව.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'දිවියාගේ අංගද්වයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ ශාර්දූලයා අරණ්‍යයෙක තෘණ ගහනයක් හෝ වනගහනයක් හෝ පර්වතගහනයක් හෝ ආශ්‍රය කොට සැඟවී හිඳ මෘගයන් ග්‍රහණය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් අරණ්‍යය ද වෘක්ෂමූලය ද පර්වතය ද කඳුරැලිය ද පර්වතගුහාව ද සුසානය ද මනුෂ්‍යගමනාගමනය විරහිත වූ මහාවනයෙහි වූ ප්‍රාන්තසෙනාසනය ද අබ්භොකාසය ද පලාල පුංජය ද මහත් ශබ්ද විරහිත වූ සෙනාසනය ද මහත්ඝොෂා විරහිත වූ සෙනාසනය ද චණ්ඩමාරුතය විරහිත වූ[1] සෙනාසනය ද මනුෂ්‍යයන්ගේ රහස්ක්‍රියාවට යොග්‍ය වූ සුදුසු වූ විවෙකය ද සෙවනය කට යුත්තේ ය. මහරජානෙනි, විවෙක සෙවනය කරන්නා වූ යොගාවචරයන් වහන්සේ නොබෝ කලකින් ම ෂඩභිඥයෙහි වශීභාවයට පැමිණෙන්නේ ය. මහ

1. 'විජනවාතං' යන්නෙහි පරිවර්තනය සේ යෙදුනු මේ පාඨයෙහි එයින් ලැබෙන අර්ථය නැත. 'ජනසඤ්චාරයෙන් වූ වාතය නැති' යනු එහි තේරුම යි.

Non-Commercial Distribution

රජානෙනි, දිවියාගේ මේ පළමුවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, ධර්මසංගායනා කළ මහාථෙරපාදවරුන් වහන්සේලා විසින් ද 'යම් සේ ශාර්දූල (467) තෙම සැඟ වී හිඳ මෘගයන් අල්වා ගන්නේ ය. එසේ ම විදර්ශනා වඩන්නා වූ භාවනායෙහි යෙදුනා වූ මේ සර්වඥපුත්‍ර වූ යොගාවචර තෙම අරණ්‍යයට වැද ලොකොත්තර වූ අර්හත්ඵලය ගන්නේ ය' යි කියා මෙම කාරණය වදාරණ ලද්දේ ය. නැවැත ද ඉතිරි අංගයන් කියන්නෙමි.

**"යථා මහාරාජ දීපිකො –පෙ– ඉදං මහාරාජ දීපිකස්ස දුතියං අඞ්ගං ගහෙතබ්බං"** යි[1]

"මහරජානෙනි, යම් සේ දීපිකතෙම යම් කිසි වෘෂභාදි සතකු මරා, වම් ඇළයෙන් වැටෙන ලද්දේ වී නම්, තමාගේ දිවි යේ නමුදු ඒ සත්වයා අනුභව නො කොට පලා යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම භාවනානුයොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් ගිහින්ගේ සිත් ගන්නට හුණයටාදිය දීම ය යි කියන ලද වෙළුදනයෙන් හෝ තාලපර්ණ ශාඛාභංගාදි පත්‍රදනයෙන් හෝ දැසමන් රුක් කෙතකී වකුලාදි පුෂ්පදන යෙන් හෝ තාලපනස නාලිකෙරාදි ඵලදනයෙන් හෝ ප්‍රකෘති මැටි හා ඇඟ උළන මැටි දීමෙන් හෝ මහරි සුණු ආදිය දීමෙන් හෝ දැහැටිදඬු ආදිය දීමෙන් හෝ නහනදිය මුව සෝදනදිය දීමෙන් හෝ ජනවංචන ප්‍රයොගයෙහි දක්ෂ වූ චාටුකම්‍යතාවෙන් හෝ පිසු මුං සේ අනුන්ගේ සිත් ගන්නට සැබෑ මද කොට බොරු බොහෝ කොට කියන්නා වූ මුග්ගසූපත්‍යතාවෙන් හෝ ලාභාශාවෙන් ගිහින්ගේ දරුවන් නළවා වැඩීම ය යි කියන ලද පාරිභට්ටකතාවෙන් හෝ පත්හසුන් ගෙණ එගෙන් එගෙට යන ජංඝපෙසනියයෙන් හෝ වෙදකම් කිරීමෙන් හෝ පත්හසුන් පඩුරු ගෙණ යන්නා වූ දූතකර්මයෙන් හෝ කෙත්වත් ආදියෙහි මෙහෙවර ආදියට යන පහීනගමනයෙන් හෝ විවාහමගුල් සම්බන්ධයට කියමන් ගෙණ ඔබිනොබ ඇවිදීමෙන් හෝ තමා ලත් ප්‍රත්‍යය ගිහින්ට දී උන් දෙනු ගැන්ම ය යි කියන ලද පිණ්ඩප්‍රතිපිණ්ඩයෙන් හෝ සිවුපස ලැබ නැවත ඔවුන්ට සංග්‍රහ කිරීමෙන් හෝ ලිං බිම් ගෙබිම් ආදිය දක්වන්නා වූ වාස්තුවිද්‍යාවෙන් හෝ තිථි හෝරා නක්ෂත්‍ර දෙෂාදෙෂ පරීක්ෂා කොට කියන්නා වූ නක්ෂත්‍රවිද්‍යාවෙන් හෝ ශරීරාංග ප්‍රත්‍යංග ලක්ෂණ බලා දෙෂාදෙෂ කියන්නා වූ අංගවිද්‍යාවෙන් හෝ යක්ෂවිද්‍යාදි අන්‍යතර අන්‍යතර වූ විද්‍යාවෙන් හෝ අනන්තවිද්‍යාවකින් හෝ අනන්ත සම්‍යක්සම්බුද්ධ සර්වඥයන් වහන්සේලා විසින් නින්ද කොට හරණ ලද්ද වූ මිථ්‍යාජීවයෙන් උපදවනා ලද (468) භොජනය වම්පාර්ශ්වයට වැටුනු ගවයා නො කන දිවියා මෙන් තමන් වහන්සේගේ දිවි යේ නමුදු නො වැළඳිය යුතු ය. මහරජානෙනි, දිවියාගේ මේ දෙවෙනි අංගය නිවන් පතන යොගාවචරයා විසින් ගත යුත්තේ ය.

---

1. සම්පූර්ණ පාඨය පාලිමිලින්දපඤ්හයෙහි 259 වන පිටුවෙහි පෙණේ.

*Non-Commercial Distribution*

''මහරජානෙනි, සද්ධර්මසෙනාධිපති වූ **ශාරිපුත්‍ර** මහාථෙරසාමීන් වහන්සේ හිරු අස්තංගත කල්හි රාත්‍රිභාගයෙහි බලවත් වූ බඩරුජාවෙක් ඇති ව මහත් වූ දුඃඛවෙදනාවෙන් පෙළෙමින් ගිලන් වූහ. **මහමුගලන්** තෙරුන්වහන්සේ විසින් එ දැක 'වහන්ස, පෙර මෙ රුජා ගත් කල වැළඳූ බෙහෙත් කවරේ ද?' යි විචාරණ ලද්දේ 'ඇවැත්නි, මා ගිහි කාලයෙහි අපගේ මැනියෝ ගිතෙල් මී සකුරු එක් කොට යොද දිය නො මුසු කොට පිසූ කිරිබතක් දෙති. ඒ කිරිබතින් මේ රුජාව සන්සිඳෙන්නේය'යි කියා වාග්භෙදය කර වදළසේක. **මුගලන්**මහතෙරුන් වහන්සේ ද 'වහන්ස, නුඹ වහන්සේගේ හෝ මාගේ හෝ පිණෙක් ඇත්තේ වී නම්, බෙහෙත් කිරිබත ලබම්හ' යි කීද්‍ද ය. එකල එබස් අසා සක්මන් කෙළවර වෘක්ෂයෙහි හුන් දෙවතාවා **මුගලන්**මහතෙරුන් වහන්සේගේ උපාසකකුලයට එළඹ වැඩිමහලු පුත්‍රයාගේ ශරීරයෙහි ආවෙසවෙමින් වෙහෙස කෙළේ ය. එකල ඕහට පිළියම් කරන්නට රැස් වූ නෑයන්ට 'කොල, තෙපි කුමක් කරවූ ද? **සැරියුත්**මහතෙරුන්වහන්සේට ගිතෙල් මී සකුරු එක් කොට කිරිබතක් පිස යවූවහොත් යක්ෂලෙඩ හරිමි' යි වෙවුලා කීයේ ය. ඒ අසා උපාසකවරු 'මහායක්ෂයානෙනි, තෙපි නො කීවත් අපි තෙරුන් වහන්සේට නිරන්තරයෙන් ම දන් දෙම්හ' යි කියා දෙවන දවස් එබඳු වූ කිරිබත් පිස ගෙණ මග බලබලා උන්හ. **මුගලන්**තෙරුන් වහන්සේ ද එදවස් උදය ම නැගී සිට පෙර ඒ පුරුදු වූ උපාසකකුලයට වැඩ වදළසේක. ඒ දැක සතුටින් උපාසකවරු පාත්‍රය ලබා ගෙණ කිරිබත් පුරවා දුන්හ. තෙරුන් වහන්සේත් බත් පිළිගෙණ වඩනාකාර දක්වූසේක. ඒ දැක උපාසකවරු 'වහන්ස, මේ බත වළඳා වදළ මැනැව. අනික් කිරිබත් පාත්‍රයක් දෙම්හ' යි කියා ඒ බත වළඳවා නැවත පාත්‍රය පුරවා කිරිබත් දුන්හ. තෙරුන් වහන්සේ ඒ කිරිබත ගෙණ ගොස් 'වහන්ස, මේ කිරිබත වළඳා වදළ මැනැවැ' යි කියා **සැරියුත්** මහතෙරුන් වහන්සේට පිරිනැමූසේක. ඒ **සැරියුත්**මහතෙරුන් වහන්සේට වාග්භෙදයෙන් ඒ බෙහෙත් කිරිබත් උපන්නේ ය. එවිට සැරියුත්මහතෙරුන් වහන්සේ යහපත් වූ ඒ කිරිබත දැක 'මේ බත කෙසේ උපන්නේ දෝ හෝ?' යි දිවැසින් බලා දෙවතාවා උපාසකකුලයට එළඹ දුක් දී ඉපදවූ බව දැක—

**''වචී විඤ්ඤත්ති විප්ඵාර-උප්පන්නං මධුපායසං,**
**සචේ භුත්තො භවෙය්‍යාහං-සාජීවො ගරහිතො මම.**
**යදිපි මෙ අන්ත ගුණං-නික්ඛමිත්වා බහි චරෙ,**
**නෙව භින්දෙය්‍ය ආජීවං-චජමානොපි ජීවිතං'' යි.**

''ඇවැත්නි, වාග්විඤ්ඤත්තිය පැතිරීමෙන් මට මේ බෙහෙත්කිරිබත උපන්නේ ය. ඉදින් මෙ කිරිබත මම වැළඳූයේ වීම් නම්, මාගේ සම්‍යග් ආජීවය නින්දිත වන්නේ ය. ඉදින් බත් නො ලැබීමෙන් මාගේ බඩවැල **(469)** මුඛයෙන් නික්ම පිටත හැසිරෙන්නේ වී නමුදු මාගේ ජීවිතය හරින්නේ නමුදු සම්‍යග්ආජීවය නො බිඳිමි' යි කියා, 'ඇවැත්නි,

Non-Commercial Distribution

මේ බෙහෙත්ආහාරය අනුභවයට සුදුසු නො වෙයි, පහ කරව' යි කියා ඒ බෙහෙත හැර වදළසේක. ඒ කිරිබතින් ජීවිකා නො කළසේක, මුගලන් මහතෙරුන් වහන්සේ ද, 'මා වැනි සෘද්ධිමත් මහාශ්‍රාවක කෙනෙකුන් ගෙණ ආ බත නො වළඳනසේකැ' යි නො සිතා එකවචනයෙන් ම පාත්‍ර මුවවිට අල්වා ගෙණ එක් පසෙක්හි මුණින් නැමුසේක. එකෙණෙහි ම සැරියුත්මහතෙරුන් වහන්සේගේ බඩරුජාවත් සන්හිඳින. එතැන්පටන් පිරිනිවන් පාන තැන් දක්වා පන්සාළිස්හවුරුද්දක් මුළුල්ලෙහි ඒ රුජාව නො හට ගත්තේ ය' යි කියා මේ කාරණය කියන ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසේනයන් වහන්ස, 'කූර්මයා ය යි කියන ලද පූර්ණකයාගේ පඤ්චාංගයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ පංඤ්චාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ උදකයෙහි හැසිරෙන්නා වූ කූර්මයා ජලයෙහි ම වාසය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් සකලප්‍රාණිභූතපුද්ගලයන් කෙරෙහි විපුල වූ මහත් වූ අප්‍රමාණ වූ අවෛරි වූ නිදුක් වූ හිතානුකම්පි වූ මෛත්‍රිසහගත වූ සිතින් සකලසත්වයන් ඇති සර්වලොකය ස්පර්ශ කොට විසිය යුත්තේ ය. මහරජානෙනි, පූර්ණකයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. නවද, මහරජානෙනි, කූර්මයා උදකයෙහි ඉපිලෙමින් හිස ඔසවා බලා ඉදින් කිසි කෙනෙකුන් දක්නේ නම්, එහි ම ගිලෙන්නේ ය. නැත හොත් 'ඔවුහු මා නො දකිත්ව' යි කියා බලවත් වූ ගැඹුරෙහි ගැලෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් ක්ලේශයන් ලං ව එන කල්හි අනිත්‍යාදි අරමුණු නමැති මහාවිලෙහි ගැලිය[1] යුත්තේ ය. නැවත ක්ලේශයෝ මා නො දකිත්ව' යි කියා දෘඪ කොට ගැඹුරෙහි ගැලිය[1] යුත්තේ ය. මහරජානෙනි, කූර්මයාගේ මේ දෙවන අංගය ගත යුත්තේය. නවද, මහරජානෙනි, කූර්මයා ජලයෙන් නික්ම ගලෙක හෝ දණ්ඩක හෝ හිඳ ඔහුගේ කය සූර්‍ය්‍යතාපයෙන් වියලන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් හිඳිම සිටීම සයනය කිරීම සක්මන් කිරීම ය යන සතර ඉරියව්වෙන් සිත පහ කොට ගෙණ සතර සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍ය නමැති සූර්‍ය්‍යාතපයෙහි සිත තවා වියලිය යුත්තේය. මහරජානෙනි, කූර්මයාගේ මේ තෘතියයාංගය ගත යුත්තේ ය. නවද, මහරජානෙනි, කූර්මයා පෘථිවිය සාරා තමහට විවෙකස්ථානයෙහි වාසය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචර යන් වහන්සේ විසින් ලාභසත්කාර යශස් හැර ජනශූන්‍ය වූ විවෙක වූ වනය ද මහාවනය ද පර්වතය ද කඳුරැළිය ද ගිරිගුහාව ද යන අල්පශබ්ද ඇති අල්පඝොෂා ඇති විවෙකයට පැමිණ විවෙකයෙහි ම වාසයට එළඹිය යුත්තේ ය. මහරජානෙනි, ඉදිබුවාගේ මේ සතරවන වූ අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, වංගන්ත පුත්‍ර වූ උපසෙන ථෙර ස්වාමීන් විසින් ද, 'විවෙකසැප පිණිස නිවන් සොයන භික්ෂූන් වහන්සේ අල්පඝොෂ

1. ගැලුණු

Non-Commercial Distribution

ඇති ව්‍යාලමෘගසෙවිත වූ විවික්ත වූ සෙනාසනය සෙවනය **(470)** කරණ සේකැ' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. නැවත ද, මහරජානෙනි, කූර්මයා ගොචරාදි කෘත්‍යයෙහි හැසිරෙමින් ඉදින් තමහට භය ජනක වූ කිසිවක් දකී ද, එබඳු වූ ශබ්දයක් අසා ද, එකල ඔහුගේ සොඬ පස්වැනි වූ පංචාගයන් තමාගේ ඉබිකබලෙහි සඟවා ගෙණ ශරීරය රක්ෂා කරණුයේ අල්පොත්සාහ ව තුෂ්ණීම්භූත ව සිටින්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ශ්‍රමණධර්මය රක්ෂා කරන්නා වූ යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යධර්ම යන ෂඩාලම්බනයන් ලං වන කල්හි චක්ඛු සොත ඝාණ ජිව්හා කාය මන යන ෂඩ්ද්වාරයෙහි වසා ගත් සංවරශීල නමැති දෙර නො හැර මනස සංවෘත කොට පිහිටුවා ගෙණ හැම තැන ම සිහිනුවණින් විසිය යුත්තේ ය. මහරජානෙනි, කූර්මයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප ලොවුතුරා භාග්‍යවතුන් වතන්සේ විසින් ද සංයුත්සඟියෙහි වූ උතුම් කුම්මොපමසූත්‍රයෙහින් වදරණ ලද්දේ ය—

> **''කුම්මොව අඞ්ගානි සකෙ කපාලෙ**
> **සමොදහං භික්ඛු මනොවිතක්කෙ,**
> **අනිස්සිතො අඤ්ඤමහෙඨයානො**
> **පරිනිබ්බුතො න උපවදෙය්‍ය කඤ්චි''** ති.

''තමාගේ ඉබිකබලෙහි පඤ්චාංගයන් බහා ගෙණ දිවි රකින්නා වූ කූර්මයා මෙන් සංසාරයෙහි භය දක්නා අර්ථයෙන් භික්ෂු නම් වූ යොගාවචරතෙම තමාගේ සිත්හි උපදනා කාමවිතර්කාදීන් ප්‍රථම ධ්‍යානාදියෙහි පිහිටවනුයේ රූපාලම්බනාදිය විරහිත වූයේ පරහට පීඩා නො කරණුයේ ක්ලේශපරිනිර්වාණයෙන් පිරිනිවියේ කිසිවෙකුහට උපවාද නො කරන්නේ යි.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'භූණවෘක්ෂයාගේ එක් අංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ භූණවෘක්ෂය වාතය යම් තැනෙක්හි ද, එහි ම අනු ව යන්නේ ය. අනික් අතකට නැවුව නො දුවන්නේ ය. වාතය හමන දිසාවට භූණවෘක්ෂය නැමෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් යම් නවාංගශාස්තෲශාසනයක් චතුස්සත්‍යාවගමය කළා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලද ද, ඒ නවාංගශාස්තෲවචනය අනු ව ගොස් ශ්‍රමණයන්ට කැප වූ අනවද්‍යයෙහි සිට ශ්‍රමණධර්මය ම සෙවිය යුත්තේ ය. මහරජානෙනි, භූණවෘක්ෂයාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මේ කාරණය සර්වඥපුත්‍ර වූ **රාහුල** ස්ථවිරයන් වහන්සේ විසින් වදරණ ලද්දේ ය:—

> **''නවඞ්ගබුද්ධවචනං-අනුලොමෙන්තාන සබ්බදා**
> **කප්පියෙ අනවජ්ජස්මිං-ඨත්වා 'පායං සමුත්තරිං''** ති,

Non-Commercial Distribution

"මම නවාංගබුද්ධවචනය අනුලොම කොට හැම කල ම ශ්‍රමණයන්ට කැප වූ අනවද්‍යයෙහි පිහිටා අය සංඛ්‍යාත වූ සැපතින් පහ වූ හෙයින් අපාය නම් වූ අපාදූකින් එතෙර වීමි."

**(471)** "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'චාපයාගේ එකාංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ දැ?" යි විචාලෝ ය. "මහරජානෙනි, යම් සේ මුල පටන් අග දක්වා අග පටන් මුල දක්වා පමණින් යුක්ත කොට යහපත් සේ සැස ඔප් නඟන ලද්ද වූ දුන්න ඇද ලූ කල එක සම ව ම නැමෙන්නේ ය. වැඹක් සේ තද නො වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගාවචරයන් වහන්සේ විසින් උපසම්පදාවෙන් දසහවුරුදු වූ පිරී කල් ගිය ස්ථවිරයන් කෙරෙහි ද, දෙතුන් හවුරුදු පිරුණු නවකයන් කෙරෙහි ද, පස්හවුරුදු පිරුණු මධ්‍යමයන් කෙරෙහි ද තමා හා සමවයස් ඇති සමකතුන් කෙරෙහි ද යන මේ සබ්‍රහ්මචාරීන් කෙරෙහි නැමුන යුත්තේ ය. නො ම දැඩි විය යුත්තේ ය. පටිප්ඵරිත නො විය යුත්තේ ය. මහරජානෙනි, දුන්නෙහි මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් **විධුරපූර්ණකජාතකයෙහි:—**

**"චාපොව නූන මේ ධීරෝ-වංසොව අනුලොමයං,**
**පටිලොමං න වත්තෙය්‍ය-සරාජවසතිං වසෙ" යි.**

'සම ව ගා සැදූ දුන්න මෙන් ද, වාතය අනු ව නැමෙන හුණවෘක්ෂය මෙන් ද නුවණැති පණ්ඩිතතෙම පින්වතුන්ට අනු ව නැමෙන්නේ ප්‍රතිලොම ව නො පවත්නේ ය. මෙසේ ඒ නුවණැති පණ්ඩිතතෙම 'රාජවසති ය' යි කියන ලද රාජසෙවය කරන්නේ ය' යි කියා වදාරණ ලදී."

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, කාකයාගේ අංගද්වයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ දැ?" යි විචාලෝ ය. "මහරජානෙනි, යම් සේ කාකතෙම තමහට කවර කෙනෙක් කැට පහරාදීන් උපද්‍රවයක් කෙරෙද් දෝ හො යි යන ආසංකා පරිසංකා ඇති ව ම ගැලවියටි ව උත්සාහ වීර්ය ඇති ව ම හැසිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් පැමිණියා වූ සීලාදිගුණයෙන් පිරිහේ දෝ හො යි යන ආසංකාපරිසංකායෙන් කෙලෙසුන් වැද්ද නො දෙන වීර්යයෙන් වසන ලද චක්ෂුරාදි ෂඩින්ද්‍රියයන් ඇති ව එළඹ සිටින ලද සිහියෙන් යුක්ත ව හැසුරුණ යුත්තේ ය. මහරජානෙනි, මේ කාකයාගේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. නව ද, මහරජානෙනි, කාකතෙම යම් කිසි භොජනයක් දැක ශබ්ද කොට නෑයන් සමග බෙද ගෙණ අනුභව කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යෝගාවචරයන් වහන්සේ විසින් දැහැමින් උපන් හෙයින් ධාර්මික වූ දැහැමින් සෙමින් ලබන ලද්ද වූ යම් ඒ ප්‍රත්‍යයලාභයෙක් ඇද්ද, යටත්පිරිසෙයින් පාත්‍රයට පැමිණියා වූ භොජනමාත්‍රයෙක් ඇද්ද,

Non-Commercial Distribution

එබඳු වූ ලාභයෙන් සිල්වත් වූ සබ්‍රහ්මචාරීන් වහන්සේලා හා සමග 'මෙ පමණ දෙමි. මෙ පමණ නො දෙමි' යි ද සිතන ආමිසප්‍රතිවිභක්තිය ද, 'අසවලාහට දෙමි, අසවලාහට නො දෙමි' යි සිතන පුද්ගලප්‍රතිවිභක්තිය ද යන විවිධ වූ කාරණය හැර හැමතැන ම කරණ වර්ෂා සෙයින් සර්වසාධාරණ වූ ප්‍රතිවිභක්තභොගිතාවෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, කාකයාගේ මේ ද්විතියාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය සද්ධර්මසෙනාධිපති වූ **(472)** **ශාරිපුත්‍ර** ථෙර සාමීන් වහන්සේ විසින් 'ඉදින් කෙලෙසුන් තැවීමෙහි නිරත වූ භික්ෂූහු මට තමන් ලත් ප්‍රත්‍යය පිරිනමති. මම ඒ භොජනය සියලුදෙනාහට බෙද දී එයින් ඉතිරි වූ භොජනයක් වළඳමි' යි කියා වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මර්කටයාගේ අංගද්වයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ ලැග්මට එළඹෙන්නා වූ වානරතෙම විවෙක වූ ඔබනොබ වැලඳ සිටි ශාඛා ඇත්තා වූ භයින් ගැලවිය යුතු රක්ෂාස්ථානයක් වැනි වූ එබඳු වූ අවකාශයෙක්හි මහත් වූ මහාවෘක්ෂයෙක ලැග්මට එළඹෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් ලජ්ජීපෙසල වූ සිල්වත් වූ උගන්නා ලද යහපත් පර්යාප්තිධර්මයන් ඇත්තා වූ බහුශ්‍රුත වූ ධර්මධර වූ සියල්ලන්ට ප්‍රිය වඩන්නා වූ සියල්ලන් විසින් ගෞරව වැඩිය යුතු වූ වැඩ අවැඩ කියන සුලු වූ වචනක්ෂම වූ අවවාද කරන්නා වූ මෙලෝ පරලෝ වැඩ අඟවන්නා වූ මෙලෝ පරලෝ වැඩ දක්වන්නා වූ දක්වාලූ වැඩෙහි සමාදන් කරවන්නා වූ සමාදන් වූ වැඩෙහි සිත තියුණු කරවන්නා වූ එහි ම යහපත යහපතැ යි කියා සිත් ප්‍රසන්න කරවන්නා වූ මෙබඳු කල්‍යාණමිත්‍ර වූ ආචර්ය කෙනෙකුන් ආශ්‍රය කොට වාසය කට යුත්තේ ය. මහරජානෙනි, වානරයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, වානරතෙම වෘක්ෂයෙහි ම හැසිරෙන්නේ ය, සිටින්නේ ය, හිඳින්නේ ය. නිද්‍රාවට පැමිණෙන්නේ ය, එහි ම රාත්‍රියෙහිත් වාසය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් අරණ්‍යාභිමුඛ විය යුත්තේ ය, අරණ්‍යයෙහි ම ස්ථානචංක්‍රමණ නිෂද්‍යා ශයන යන සතර ඉරියව් පැවැත්විය යුත්තේ ය. ග්‍රාමන්තසෙනාසන යෙහි ද, ධ්‍යාන උපදවා අහස සැරිසැරීමට වඩා ආරණ්‍යකසෙනාසනයෙහි නිද්‍රාව කිරීම උතුම් හෙයින් වනයෙහි ම නිද්‍රාවට පැමිණිය යුත්තේ ය. එහි ම සිට සතරසතිපට්ඨාන නමැති අමෘතභොජනය අනුභව කට යුත්තේ ය. මහරජානෙනි, මර්කටයාගේ මේ ද්විතීයාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය සද්ධර්මසෙනාධිපති වූ **ශාරිපුත්‍ර** මහාථෙර ස්වාමීන් වහන්සේ විසින්:—

*Non-Commercial Distribution*

**"චංකමන්තොපි තිට්ඨන්තො–නිසජ්ජා සයනෙන වා,**
**පවනෙ සොභතෙ භික්ඛු–පවනන්තං ච වණ්ණිතං" ති.**

'මහවනයෙහි සක්මන් කරන්නා වූ ද, සිටින්නා වූ ද, නිෂද්‍යාශයනය කිරීමෙන් ද භික්ෂුතෙම හොබිනේ ය. ඒ ගමට දුරු වන්නේ ය, අනන්ත බුදුන් විසින් වර්ණනා කරණ ලද්දේ ය යි' කියා වදරණ ලද්දේ ය."

උද්දාන පද නම්:—

**'ඝොරස්සරො ච කුක්කුටො–කලන්දෙ දීපිනී දීපිකො,**
**කුම්මො වංසො චාපො ච–වායසො අථ මක්කටො' ති.**

**යොගිකථා ප්‍රශ්නයෙහි එක්විසි අංගයක් ඇති ප්‍රථම වර්ගය නිමියේ ය.**

---

(473) "ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ලාබුලතාවගේ එකාංග යක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ ද?" යි විචාළෝ ය. "මහරජානෙනි, යම් සේ ලාබුලතාව තෘණ-යෙක හෝ කාෂ්ටයෙක හෝ ලීයක හෝ සොඬින් එල්වී ගෙණ එයට මත්තෙහි වැඩී යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් අර්හත්ඵලයෙහි වඩින කැමැත්තා වූ සිතින් අනිත්‍යාදි අරමුණෙක එල්වී ගෙණ අර්හත්ඵලයෙහි වැඩුන යුත්-තේ ය. මහරජානෙනි, ලාබුලතාවගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය අප ධම්සෙනෙවි සැරියුත් මහාථෙර ස්වාමීන් වහන්සේ විසින් ද:—

**"යථා ලාපුලතා නාම–තිණෙ කට්ඨෙ ලතාය වා,**
**ආලම්බිත්වා සොණ්ඩිකාහි–තතො වඩ්ඪති උත්තරිං,**
**තථෙව බුද්ධපුත්තෙන–අරහත්තඵලකාමිනා,**
**ආරම්මණං ආලම්බිත්වා–වඩ්ඪිතබ්බං අසෙඛඵලෙ" ති.**

"ලාබුලතා නම් ලිය යම් සේ තෘණයෙක හෝ කාෂ්ටයෙක හෝ ලීයක හෝ සොඬින් එල්වී එයින් ඒ කාරණයෙන් මත්තෙහි වඩින්නේ ය, එසේ ම අර්හත්ඵලය කැමැත්තා වූ බුද්ධපුත්‍රයන් වහන්සේ විසින් ගත් අරමුණෙහි සිතින් එල්වී අශෛක්ෂ වූ රහත්ඵලයෙහි වැඩුන යුත්තේ ය"යි කියා වදරණ ලද්දේ යි."

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'පද්මයාගේ අංගත්‍රයයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගත්‍රය කවරේ ද?"යි විචාළෝ ය. "මහරජානෙනි, යම් සේ ජලයෙහි උපන්නා වූ ජලයෙහි වැඩුනා වූ පද්මය ජලය හා නො ඇලෙන්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් උපාසක කුලයෙහි ද, ශිෂ්‍යගණයා කෙරෙහි ද, ලාභයෙහි ද, යසසෙහි ද, සත්කාර යෙහි ද, සම්මානයෙහි ද, පරිභොග කට යුතු වූ චතුර්විධප්‍රත්‍යයෙහි ද

*Non-Commercial Distribution*

යන හැමතැන්හි ම නො ඇලීමෙන් විසිය යුතු ය. මහරජානෙනි, පද්මයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, පද්මය උදකය කෙරෙන් ඉතා උස් ව නැඟී සිටින්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සියලු ම ලොකය අභිභවනය කොට ඉතා උස් ව නැඟී ලොකොත්තරධර්මයෙහි සිටිය යුත්තේ ය. මහරජානෙනි, පද්මයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, ස්වල්පමාත්‍ර වූ මාරුතය වැදිවැදී හැසිරෙණ ලද පද්මය චලිත වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ශෙෂ ව සිටි අල්පමාත්‍ර වූද ක්ලේශයන් කෙරෙන් සංයම ය යි කියන ලද වැළකීම කට යුත්තේ ය. ස්වල්පමාත්‍ර වූ ද ක්ලේශයන් කෙරෙහි භය දක්නා සුලු ව වාසය කළ යුත්තේ ය. මහරජානෙනි, පද්මයාගේ මේ තුන්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, 'අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු' කියා අප භාග්‍යවත් වූ දෙවාතිදෙව වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ විසිනුත් 'ක්ලේශයන් කෙරෙහි භයින් විහරණය කට යුත්තේ ය' යි යන මේ කාරණය වදරණ ලද්දේ ය'' යි කියා වදළසේක.

**(474)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'බීජයාගේ අංගද්වයයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ මඳ වූ ද, යහපත් වූ වී සරුකෙතෙහි වපුරණ ලද්දේ වර්ෂාව මනා කොට වස්නා කල්හි බොහෝ වී නො හැර ම දෙන්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් රක්ෂා කරණ ලද්ද වූ ශීලය සියලු ම ශ්‍රාමණ්‍යඵලය නො හැර ම දෙන්නේ ය. එපරිද්දෙන් මනා කොට පිළිපැද්ද යුත්තේ ය. මහරජානෙනි, බීජයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, වල් නිමවා මඩ කොට වප් හෙළා පිරිසිදු කළ ක්ෂේත්‍රයෙහි රොපණය කරණ ලද්ද වූ බිජු කල් නො යවා ම හට ගන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ජනශූන්‍යාගාරයෙහි සිට පිරිසිදු කරණ ලද්ද වූ සිත සතිපට්ඨාන නමැති ක්ෂේත්‍රවරයෙහි වහා ම හට ගන්නේ ය. මහරජානෙනි, බීජයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මේ බීජොපමාව බුදුන් මල් අනුරුද්ධ මහාථෙර සාමීන් විසින්:—

**''යථා ඛෙත්ත පරිසුද්ධෙ-බීජං චස්ස පතිට්ඨිතං,**
**විපුලං තස්ස ඵලං හොති-අපි තොසෙති කස්සකං.**
**තථෙව යොගිනො චිත්තං-සුඤ්ඤාගාරෙ විසොධිතං,**
**සතිපට්ඨානඛෙත්තම්හි-ඛිප්පමෙව විරූහති''** යි.

'යම් සේ පිරිසිදු වූ ක්ෂේත්‍රයෙහි බිජු පිහිටන ලද්දේ වේ ද, ඒ ක්ෂේත්‍රයාගේ මහත් වූ ඵල ඇති වන්නේ ය. ගොවියා ද සතුටු කරන්-

Non-Commercial Distribution

නේ ය. එසේ ම ශූන්‍යාගාරයෙහි ම පිරිසිදු කරණ ලද්ද වූ යොගියාගේ චිත්තය සතිපට්ඨානක්ෂේත්‍රයෙහි වහා ම පතළ වන්නේ ය' යි වදාරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, සල්කලණවෘක්ෂයාගේ එක් අංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ මනොඥ වූ දර්ශනය ඇති සාලකල්‍යාණිකාව පස්පොළෝ ඇතුළත්හි ම සියක්රියනක් හෝ ඊට වැඩියක් හෝ වඩින්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සතරශ්‍රාමණ්‍යඵලය ද සිවුපිළිසිඹියාව ද ෂඩ්අභිඥව ද සියලු ම ශ්‍රමණධර්මය ද ශූන්‍යාගාරයෙහි දී ම පරිපූර්ණ කට යුත්තේ ය. මහරජානෙනි, සාලකල්‍යාණියගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, සර්වඥපුත්‍ර වූ රාහුල ස්ථවිරයන් විසින්:—

**''සාලකල්‍යාණිකා නාම-පාදපො ධරණීරුහො,**
**අන්තො පථවියං යෙව-සතහත්ථොපි වඩ්ඪති.**

**යථාකාලම්හි සම්පත්තෙ-පරිපාකෙන සො දුමො,**
**උග්ගංජිත්වාන එකාහං-සතහත්ථොපි වඩ්ඪති.**

**එවමෙව මහාවීර-සාලකල්‍යාණිකා විය,**
**අබ්භන්තරෙ සුඤ්ඤාගාරෙ-ධම්මතො අභිවඩ්ඪයිං'' යි.**

**(475)** 'සර්වඥ පියානෙනි, පෘථිවියෙහි හට ගන්නා වූ සාල කල්‍යාණිකා නම් දෘමෙන්ද්‍රයෙක් ඇතුළු පෘථිවියෙහි ම සියක් රියනකුදු වඩින්නේ ය, එයින් වැඩියකුදු වඩින්නේ ය. මුහු කිරීමෙන් පෘථිවියෙන් උද්ගත වන කල්හි සම්ප්‍රාප්ත වන කල්හි දුර්ලභ වූ දර්ශනය ඇති ඒ දෘමෙන්ද්‍රයා පොළොවින් උඩ නැගී එකදවසින් සියක්රියන් තැන් අහසට වඩින්නේ ය. එපරිද්දෙන් ම ස්වාමීනි, මහාවීර වූ සර්වඥරාජොත්තමයානන් වහන්ස, පෘථිවිය ඇතුළත වැඩෙන සාලකල්‍යාණිවෘක්ෂය මෙන් ම ජනවිවික්ත වූ ශූන්‍යාගාරය ඇතුළත්හි වසමින් සමාධියෙන් වැඩුනෙමි' යි'' කියා මෙම කාරණය බුදුන් සම්මුඛයෙහිත් වදාරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'නෞකාවගේ අංගතුනක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගත්‍රය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ නෞකාතොම බොහෝ වූ දරුසමූහයාගේ එකතු වීම කරණ කොට ගෙණ බොහෝ වූ ජනයන් එතෙර කරන්නී ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ආචාර සමාචාර සීලගුණ වත්ත පටිවත්ත සංඛ්‍යාත බොහෝ වූ ධර්මසමූහයන්ගේ එකතු වීම කරණ කොට ගෙණ දෙවියන් සහිත වූ ලෝවැසිතෙම සසරින් එතෙර කළ යුත්තේ ය. මහරජානෙනි,

Non-Commercial Distribution

නෞකාවගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, නැව බොහෝ වූ රළ ඝොෂාවේගයාගේ පැතිරීම ද සළාවේගය ද ඉවසන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් බොහෝ වූ රාගාදික්ලේශ රළවෙගය ද ලාභසත්කාර යස සිලොක පූජන වන්දනා පරකුලයාගේ නින්ද ප්‍රශංසා සුව දුක් සම්මානාවමානාදී බොහෝ වූ රළවේගය ද ඉවසිය යුත්තේ ය. මහරජානෙනි, නෞකාවගේ මේ ද්විතියාංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, නැව අපරිමිතානන්තාපාර අක්ෂොභිත සුවාසූදහසක් යොදුන් ගැඹුරු වූ ඝෙණඝඩ සේ මහත් වූ මහාසමුද්‍රඝොෂා ඇත්තා වූ තිමි තිමිංගල මකරාදී මහාමත්ස්‍යගණයන්ගෙන් ආකුල වූ මහත් වූ මහාසමුද්‍රයෙහි යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ත්‍රිපරිවර්තයක් හා ද්වාදශාකාරයක් ඇති චතුස්සත්‍යලාභයාගේ ප්‍රතිවෙධයෙහි සිත හැසිර විය යුත්තේ ය. මහරජානෙනි, නෞකාවගේ මේ තුන්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, දෙවාතිදෙව වූ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙම කාරණය සංයුත්සගියෙහි වූ සච්චසංයුත්තකයෙහි වදරණ ලද්දේ ය. 'විතක්කෙන්තා ච බො තුම්හෙ භික්ඛවෙ ඉදං දුක්ඛන්ති විතක්කෙය්‍යාථ'' යනාදීන් ''මහණෙනි, තෙපි යමක් සිතන්නාහු නම්, මේ දුක්ඛසත්‍යය යි කියා සිතවූ. මේ දුක්ඛසමුදයසත්‍යය යි කියා සිතවූ. මේ දුක්ඛනිරොධසත්‍යය' යි කියා සිතවූ. මේ දුක්ඛනිරොධගාමිනිප්‍රතිපදාවය යි කියා සිතවූ ය' යි චතුස්සත්‍යය සිතන සිත ම තියුණු කරවා වදළසේක.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'නාවාලකනයාගේ අංගද්වයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ නැව් නවත්වා ලන්නා වූ 'ලකනකය' යි **(476)** කියන ලද්ද වූ සිනිකඳ මහත් වූ මහා සමුද්‍රයෙහි බොහෝ වූ ඌර්මජාලාවෙන් ආකුල වූ වික්ෂොභිත වූ මහා ජලතලයෙන් නැව වාතයෙන් දිසානුදිසාවට ගෙණ යන්නට නො දෙන්නේ ය, නවත්වන්නේ ය, සිටුවා ලන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් රාග ද්වෙෂ මොහ නමැති තරංග සමූහයන් ඇති මහත් වූ මහාවිතර්කසම්ප්‍රහාරයෙහි චිත්තය වළක්වා ලිය යුත්තේ ය. නවත්වා ලිය යුත්තේ ය, ෂඩින්ද්‍රියයන් විසින් දිශානුදිශාවට ගෙණ යන්නට නුදුන යුත්තේ ය. මහරජානෙනි, නැව් ලකනකයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, නැව් සිටුවා ලන සිනිකඳ නො ඉල්පෙන්නේ ය. සියක්රියන් ගැඹුරු ජලයෙහි ද නැව සිටුවාලන්නේ ය, සිටි ස්ථානයට ම පමුණුවන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ලාභ යස සත්කාර මානන වන්දන පූජනාදි අපචිතියෙහි ලාභාග්‍ර යසාග්‍රයෙහි ද නො ඉල්පුන යුත්තේ ය. ශරීරයාපනමාත්‍රයෙක්හි ම චිත්තය තැබිය යුත්තේ ය.

34

Non-Commercial Distribution

මහරජානෙනි, මේ නැව් ලකනකයාගේ දෙවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය ධම්සෙනෙවි සැරියුත්මහාථෙර ස්වාමීන් වහන්සේ විසින් දː—

**"යථා සමුද්ද ලකනං–න ජලවති න සීදති,**
**තථෙව ලාභසක්කාරෙ–මා ජලවථ විසීදථ" යි.**

'මහාසමුද්‍රයෙහි ලකනය යම් සේ නො ඉල්පේ ද, නො ගැලේ ද, එසේ ම ලාභසත්කාරයෙහි නො ඉල්පෙවු, යැපෙන පමණකට ගැලෙව ය' යි කියා වදරණ ලද්දේ ය.

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'නෞකායෂ්ටියගේ එක් අංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ දැ?" යි විචාළෝ ය.

**"යථා මහාරාජ කූපො රජ්ජුඤ්ච වරත්තඤ්ච ලකාරඤ්ච ධාරෙති.–පෙ–අයං වො අම්හාකං අනුසාසනී" ති.**[1]

"මහරජානෙනි, යම් සේ නැව්කුඹය මහලනුව ද, වරපට ද, රුවල ද ධරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සිහිනුවණින් සමන්නාගත විය යුත්තේ ය. ඉදිරියට යාමෙහි ද, ආපසු යාමෙහි ද, ඉදිරි බැලීමෙහි ද, දිසානුදිසා බැලීමෙහි ද, හස්තපාද හකුළුවා ලීමෙහි ද, දිග හැරීමෙහි ද, සංඝාටිපාත්‍ර සිවුරුධාරණයෙහි ද, පිණ්ඩපාත **(477)** භොජනය අනුභව කිරීමෙහි ද, තර ලා දිය පීමෙහි ද, පූප එලාදිය කෑමෙහි ද, මධුඵාණිතාදිය ලෙවීමෙහි ද, මලමූත්‍රාදි නිලීන ක්‍රියායෙහි ද, ගමනෙහි ද, සිටීමෙහි ද, හිඳීමෙහි ද, නිද්‍රායෙහි ද, නිදි වැළැක්මෙහි ද, කථා කිරීමෙහි ද, තුෂ්ණීම්භාවයෙහි ද යන මෙහි සාර්ථකසම්පජඤ්ඤය සත්ප්‍රායසම්පජඤ්ඤය ගොචරසම්පජඤ්ඤය අසම්මොහසම්පජඤ්ඤය යන චතුර්විධ සම්පජානතාවෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, කූපයාගේ මේ එකාංගය ශාසනික නැන් විසින් ගත යුත්තේ ය.

මහරජානෙනි, දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, අතීතයෙහි කප්ගිනි ගත් රුවන්මෙරක් සේ අනන්ත වූ බුද්ධශ්‍රීයෙන් බබළන්නා වූ අසූරියන් බුදුබඳින් තුන්ලෝ බබුළුවමින් සාර ලක්ෂයක් රහතුන් පිරිවරා ලක්ෂයක් අවුරුදු ලෝ වැඩ කළා වූ **දීපංකර** නම් බුදුරජානෝ ද, එසේ ම අටාසූරියන් බුදුබඳින් මුළුලොව බබුළුවා කොටිලක්ෂයක් රහතන් පිරිවරා ලක්ෂයක් අවුරුදු වැඩ හුන් **කොණ්ඩඤ්ඤ** නම් බුදුරජානෝ ද, සොළසාසංඛ්‍යකප්ලක්ෂයක් පිරූ පාරමිතා ඇති තමන් වහන්සේ මවුකුස උපන් දවස් පටන් දසඑකඩමසක් මුළුල්ලෙහි මෑනියන්ගේ ඇඟින් නික්මුනු ආලොකයෙන් අසූරියන් සැතපෙන ගෙයි පහන් නො නංවා ම අඳුරු දුරු කොට දිලියෙමින් මවුකුසින් බිහිවෙමින්

1. සම්පූර්ණපාඨය පාලිමිලින්දපඤ්හයෙහි 302 වන පිටුවෙහි පෙණේ.

Non-Commercial Distribution

වැඩී විය පැමිණ තිස්දහසක් පුරහනන් පිරිවරා නවදහසක් හවුරුදු රාජ්‍යශ්‍රී විඳ තුන්කොටියක් පුරුෂයන් හා සමග මහබිනික්මන් නික්ම නාගබොධි මූලයෙහි වැඩ හිඳ පස්මරුන් පරාජය කොට ලොවුතුරා බුදු වූ තැන් පටන් දසදහසක් සක්වළ චන්ද්‍රසූර්යයන් කදෝපැණියන් සේ නිෂ්ප්‍රභ කෙරෙමින් රෑ දවල් එකාලොක කොට දිලියෙමින් කොටිලක්ෂයක් රහතන් පිරිවරා අසූරියන් බුදුබඳින් දසදහසක් සක්වළ එකාලොක කොට බබුළුවමින් සද්ධර්මාමෘතපානයෙන් තුන්ලෝවාසීන් පිණවා අසූදහසක් හවුරුදු වැඩ හුන් **මංගල** නම් බුදුරජාණෝ ද, අනූරියන් බුදුබඳින් මුළුලෝ බබුළුවා කොටිලක්ෂයක් රහතන් පිරිවරා අනූදහසක් හවුරුදු වැඩ හුන් **සුමන** නම් බුදුරජාණෝ ද, අසූරියන් බුදුබඳින් නික්මුනු බ්‍යාමප්‍රභාමණ්ඩලයෙන් රෑ දවල් සතරගව්වක අඳුරු දුරු කොට කොටිගණන් රහතන් පිරිවරා සැටදහසක් හවුරුදු වැඩ හුන් **රේවත** නම් බුදුරජාණෝ ද, අටපනස්රියන් බුදුබඳින් තිස්කොටියක් රහතන් පිරිවරා අනූදහසක් හවුරුදු වැඩ හුන් **සොභිත** නම් බුදුරජාණෝ ද, පනස්අටරියන් බුදුබඳින් තිස්දහසක් රහතන් පිරිවරා ලක්ෂයක් හවුරුදු වැඩ හුන් **අනොමදස්සී** නම් බුදුරජාණෝ ද, පණස්අටරියන් බුදුබඳින් කොටියක් රහතන් පිරිවරා ලක්ෂයක් හවුරුදු වැඩ හුන් **පදුම** නම් බුදුරජාණෝ ද, අටඅසූරියන් බුදුබඳින් නික්මුනු බ්‍යාම ප්‍රභාමණ්ඩලයෙන් දෙළොස්යොදුනෙක දිවාරාත්‍රියෙහි අඳුරු දුරු කොට අසූකොටියක් රහතන් පිරිවරා අනූදහසක් හවුරුදු වැඩ හුන් **නාරද** නම බුදුරජාණෝ ද, එසේ ම අටාසූරියන් බුදුබඳින් හැත්තෑලක්ෂයක් රහතන් පිරිවරා ලක්ෂයක් හවුරුදු වැඩ හුන් **පදුමුත්තර** නම් බුදුරජාණෝ ද, අටාසූරියන් බුදුබඳින් සියක්කොටියක් රහතන් පිරිවරා අනූදහසක් හවුරුදු වැඩ හුන් **සුමෙධ** **(478)** නම් බුදුරජාණෝ ද, අටපණස්රියන් බුදුබඳින් කොටිලක්ෂයක් රහතන් පිරිවරා අනූදහසක් හවුරුදු වැඩ හුන් **සුජාත** නම් බුදුරජාණෝ ද, අටාසූරියන් බුදුබඳින් සියක්ලක්ෂයක් රහතන් පිරිවරා අනූදහසක් හවුරුදු වැඩ හුන් **පියදස්සි** නම් බුදුරජාණෝ ද, අසූරියන් බුදු බඳින් නවකොටියක් රහතන් පිරිවරා අනූදහසක් හවුරුදු වැඩ හුන් **අත්ථදස්සි** නම් බුදුරජාණෝ ද, අටාසූරියන් බුදුබඳින් කොටිලක්ෂයක් රහතන් පිරිවරා හවුරුදු ලක්ෂයක් වැඩ හුන් **ධම්මදස්සි** නම් බුදුරජාණෝ ද, සැටරියන් උස බුදුබඳින් නවකෙළලක්ෂයක් රහතන් පිරිවරා ලක්ෂයක් හවුරුදු වැඩ හුන් **සිද්ධාර්ථ** නම් බුදුරජාණෝ ද, සැටරියන් බුදුබඳින් සියක් ලක්ෂයක් රහතන් පිරිවරා ලක්ෂයක් හවුරුදු වැඩ හුන් **තිස්ස** නම් බුදු රජාණෝ ද, පණස්අටරියන් බුදුබඳින් කොටියක් රහතන් පිරිවරා අනූ දහසක් හවුරුදු වැඩ හුන් **ඵුස්ස** නම් බුදුරජාණෝ ද, හාත්පසින් වට අටවිසි ගව්වෙක රෑ දවල් නිති පැතිරෙන්නා වූ බ්‍යාමප්‍රභාමණ්ඩලයෙන් බබළන්නා වූ අටාසූරියන් උස බුදුබඳින් සුවාසූදහසක් මහරහතන් පිරිවරා අසූ දහසක් හවුරුදු වැඩ හුන් **විපස්සි** නම් බුදුරජාණෝ ද, සැත්තෑරියන් උස බුදුබඳින් සැත්තෑදහසක් රහතන් පිරිවරා සැත්තෑදහසක් හවුරුදු වැඩ හුන් **සිඛී** නම් බුදුරජාණෝ ද, සැටරියන් බුදුබඳින් සැත්තෑදහසක් ශ්‍රාවකයන්

*Non-Commercial Distribution*

පිරිවරා සැටදහසක් හවුරුදු වැඩ හුන් **වෙස්සභූ** නම් බුදුරජානෝ ද, සතළිස් රියන් බුදුබඳින් සතළිස්ගව්වෙක බ්‍යාමප්‍රභාමණ්ඩලය පතුරුවා සතළිස් දහසක් ශ්‍රාවකයන් පිරිවරා සතළිස්දහසක් හවුරුදු වැඩ සිටි **කකුසඳ** නම් බුදුරජානෝ ද, තිස්රියන් උස බුද්ධශරීරයෙන් තිස්දහසක් රහතන් පිරිවරා තිස්දහසක් හවුරුදු ලෝ වැඩ හුන් **කොනාගමන** නම් බුදුරජානෝ ද, විසි රියන් බුද්ධශරීරයෙන් විසිදහසක් රහතන් පිරිවරා විසිදහසක් හවුරුදු මුළුල්ලෙහි ලෝවැඩ වඩා වැඩ හුන් **කාශ්‍යප** නම් බුදුරජානෝ ද යන තථාගතයන් විසින් ද 'මහණතෙම සතරසතිපට්ඨාන සංඛ්‍යාත සිහි නුවණින් වාසය කරන්නේ වී නම්, මහණෙනි, තොපට මේ අපගේ අනුශාසනාව ය' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'නියාමිකයාගේ අංගතුණක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගතුණ කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ දික් සුද්ධිය හා උවදුරු බලා නැව හසුරවන්නා වූ[1] නියාමකතෙම දිවාරාත්‍රියෙහි නිරන්තරයෙන් ම අප්‍රමාද ව වීර්ය ප්‍රතිවීර්යය ඇති ව නැව හසුරුවන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් නිරන්තරයෙන් දිවාරාත්‍රියෙහි චිත්තය ප්‍රථමධ්‍යානාදියෙහි පමුණුවා ලමින් අප්‍රමාද ව යොනිසොමනස්කාරයෙන් චිත්තය ප්‍රථමධ්‍යානාදියෙහි පමුණුවා ලිය යුත්තේ ය. මහරජානෙනි, මාමිනිශාස්ත්‍රකාරයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, දෙවාතිදෙව වූ අප මහා භාග්‍යවතුන් වහන්සේ විසින් ධම්මපදයෙහි:—

> **''අප්පමාදරතා හොථ-සචිත්තමනුරක්ඛථ,**
> **දුග්ගා උද්ධරථත්තානං-පඞ්කෙ සන්නොව කුඤ්ජරො''** යී.

**(479)** 'මහණෙනි, 'ස්මෘතිඅවිප්‍රවාසය' යි කියන ලද නො පමාබවෙහි ඇලෙවු. රූපාදිනානාලම්බනයෙහි දිවන්නා වූ තොපගේ සිත එයින් වළකා මනා කොට රකිවු. ගැඹුරු මඩෙහි ගැලුනු ඇතු අතින් පයින් වෑයම් කොට ඒ මඩින් ගොඩ නැංගා මෙන් ක්ලේශමඩෙහි ගැලී ගිය තොප ඒ කෙලෙස්දුදුළෙන් යොනිසොමනස්කාරයෙන් යුක්ත වූ වීර්යය කොට ගොඩ නැඟෙවු' කියා මෙම කාරණය වදරණ ලද්දේ ය. තවද, මහරජානෙනි, මාමිනිශාස්ත්‍රකාරයා විසින් මහාසමුද්‍රයෙහි යම් කිසි යහපතක් හෝ නපුරක් හෝ ඇත් නම්, ඒ සියල්ල ම දන්නා ලද්දේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යෝගී වූ යොගාවචරයා විසින් කුසලාකුසලය ද සාවද්‍යානවද්‍යය ද හීනප්‍රණීතය ද, කෘෂ්ණශුක්ලප්‍රතිභාගය ද යන සියල්ල දැන ගත යුත්තේ ය. මහරජානෙනි, මාමිනිශාස්ත්‍රකාරයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මාමිනිශාස්ත්‍රකාර තෙම 'අන් කිසිවෙක් යන්ත්‍රය නො අල්ව' යි කියා යන්ත්‍රයෙහි මුද්‍රිකාව දේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් 'පව්වූ වූ

1. කරකවන්නා වූ

Non-Commercial Distribution

කිසියම් අකුශලවිතර්කයක් නො සිතව' යි කියා තමාගේ ස්වකීය චිත්ත යෙහි සංවරශීල නමැති මුද්‍රිකාව දිය යුත්තී ය. මහරජානෙනි, මාමිනි ශාස්ත්‍රකාරයාගේ මේ තුන්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, දෙවාතිදෙව වූ භාග්‍යවතුන් වහන්සේ විසින් **සංයුත්තනිකායවරයෙහි** 'මහණෙනි, පව්ටු වූ අකුශලවිතර්කයන් නො සිතවූ. හේ කවර අකුශල විතර්ක කෙනෙක් ද? යත්— කාමවිතර්කය, ව්‍යාපාදවිතර්කය, විහිංසා විතර්කය' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'නැව් පිළියම්කාරයාගේ එක් අංගයක් ගත යුත්තේ ය' යි කියා යම් අංගයක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ නැව සන්ධි සිදුරු විවරාදිය බලා පිළියම් කරන්නා වූ කර්මකාරතෙම 'බත්බැළයා වූ මම මේ නැවෙහි කර්මාන්ත කෙරෙමි. මේ නැව් නිසා මම බත් වැටුප් ලබමි. මා විසින් ප්‍රමාදයක් නො කට යුත්තේ ය. අප්‍රමාදයෙන් ම මා විසින් මේ නැව පිළියම් කිරීම් වශයෙන් ඉසිලිය යුත්තේ ය' යි කියා නිරන්තරයෙන් මෙසේ සිතන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් නිරන්තරයෙන් ම මෙසේ සිතිය යුත්තේ ය:— 'මම වනාහි මේ ස්තබ්ධලක්ෂණ වූ පඨවිධාතුව ය, ද්‍රවලක්ෂණ වූ ආපොධාතුව ය, උෂ්ණලක්ෂණ වූ තෙජොධාතුව ය, චලනලක්ෂණ වූ වායොධාතුව ය යන සතරමහාභූතයන්ගෙන් ජනිත වූ ශරීරය සම්මර්ශනය කෙරෙමින් නිරන්තරයෙන් අප්‍රමාද ව එළඹ සිටින ලද සිහි ඇති ව සිහිනුවණින් යුක්ත වූයේ සන්හුන්නෙම් එකඟ වූ සිත් ඇති ව 'ජාති ජරා ව්‍යාධි මරණ සොක හැඬීම් දුක් දෙම්නස් සිත්තැවිලි යනාදියෙන් මිදී යෙමි' යි සිතා එක්වන් අප්‍රමාදය කට යුත්තේ ය. මහරජානෙනි, කර්මාන්තකාරයාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය සද්ධර්මසෙනාධිපති වූ **සැරියුත්මහාථෙර ස්වාමීන් වහන්සේ විසින්:—**

**''කායං ඉමං සම්මසථ-පරිජානාථ පුනප්පුනං,**
**කායෙ සභාවං දිස්වාන-දුක්ඛස්සන්තං කරිස්සථ'' ති.**

**(480)** 'සබ්‍රහ්මචාරිනි, මේ ශරීරය සතරමහාභූතික වශයෙන් සම්මර්ශනය කරවූ. නැවත නැවතත් පිරිසිඳ අවබොධය කරවූ. ශරීරයාගේ අනිත්‍යාදිස්වභාවය ද එකාන්ත දුක්ඛබව ද දැක සියලු ම සංසාරවෘත්ත දුක්ඛයාගේ කෙළවර කරවූ' කියා වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මහාසමුද්‍රයාගේ පඤ්චාංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ පඤ්චාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ මහාසමුද්‍රය මළා වූ කුණපය හා සමග නො වසන්නේ ය, පහ කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයන් වහන්සේ විසින් රාග ද්වෙෂ මොහ මාන දෘෂ්ටිය ද, අනුන්ගේ ගුණමකුබව ද, යුගග්‍රාහලක්ෂණ වූ පලාසය ද, ඊර්ෂ්‍යාව ද, මාත්සර්යය ද, කළ වරද සඟවන මායාව ද, නැති

ගුණ පහළ කරණ සඨබව ද, වඤ්චාප්‍රවෘත්ති ඇති කුටිලත්වය ද යන විෂම දුශ්චරිත ක්ලේශමලය හා සමග නො වැසිය යුත්තේ ය. මහරජානෙනි, සමුද්‍රයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මහා සමුද්‍රය මුක්තාමාණික්‍ය වෛඩූර්ය ශංඛ ශිලා ප්‍රවාල ස්ඵටික ප්‍රභෘති වූ විවිධ රත්නරාශීන් ධරන්නේ ය, ඉවසන්නේ ය, මූහුදින් පිටත නො විසුරුවන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් මාර්ගඵල ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්ති විදර්ශනාභිඥදි විවිධ වරගුණරත්නයන් පැමිණීම වශයෙන් ගෙණ සිතින් ඉසිලිය යුත්තේ ය, සිතින් පිටත් කොට අසජ්ජනයන් කෙරෙහි නො පතළ කළ යුත්තේ ය. මහරජානෙනි, මහාසමුද්‍රයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මහාසමුද්‍රයතෙම මහත් වූ තිමි තිමිංගලය තිමිර පිංගලය යනාදි මහාභූතයන් සමග දිවිහිමියෙන් ම එක් ව වසන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් අල්පෙච්ඡ වූ සන්තුෂ්ට වූ ධුතාංගවාදි වූ සැහැල්ලුප්‍රවෘත්ති ඇත්තා වූ ආචාරසම්පන්න වූ පාපයෙහි ලජ්ජා ඇත්තා වූ පෙසල වූ ගෞරව වැඩිය යුතු වූ ශීලකථාදිය කියන්නා වූ වචනක්ෂම වූ දුටු වරදින් චොදනා කරන්නා වූ පාපයට ගර්හා කරන්නා වූ කරුණාපූර්වාංගම ව අවවාද කරන්නා වූ කළ වරදට අනුශාසනා කරන්නා වූ අර්ථ විඥපනය කරවන්නා වූ මෙලෝපරලෝ වැඩ දක්වන්නා වූ දක්වාලූ වැඩෙහි සමාදන් කරවන්නා වූ සමාදන් වූ පිළිවෙත්හි සිත තියුණු කරවන්නා වූ එහි ම 'යහපත, යහපතැ' යි කියා සිත ප්‍රසන්න කරවන්නා වූ එහෙයින් ම කල්‍යාණමිත්‍ර වූ සබ්‍රහ්මචාරී වූ ආචාර්ය කෙනෙකුන් ආශ්‍රය කොට වැසිය යුත්තේ ය. මහරජානෙනි, මහාසමුද්‍රයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මහාසමුද්‍රයතෙම අඵත වැස්සා වූ බොහෝ වූ ජලයෙන් සම්පූර්ණ වූ ගංගා යමුනා අචිරවතී සරභූ මහී යනාදි සියදහස්ගණන් ගංගාජලයෙන් හා අහසින් වසින අනන්තජලධාරායෙන් පිරෙණ ලද්දේ ද, තමාගේ ස්වකීය වෙරළ අහලකුදු නො ඉක්මවන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් ලොකයාගේ ලාභසත්කාර කීර්ති ප්‍රශංසා වන්දන මානන පූජා පිණිස සිත උඩඟු ව තමාගේ දිවි යේ නමුදු දුන දුන ශික්ෂාපදව්‍යතික්‍රමණය නො කට යුත්තේ ය. **(481)** මහරජානෙනි, සමුද්‍රයාගේ මේ සතරවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය හුදෙක් මම ම කියන්නෙම් නො වෙමි. අප සනරාමර ලොකස්වාමී වූ දෙවාතිදෙව වූ භාග්‍යවතුන් වහන්සේ විසින් ද:—

**"සෙය්‍යථාපි මහාරාජ, මහාසමුද්දො ඨිතධම්මො, වෙලං නාතික්කමති, එවමෙව ඛො, මහාරාජ, යං මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං, තං මම සාවකා ජීවිතහෙතුපි නාතික්කමන්ති"** යි.

'මහරජ, යම් සේ ඨිත ස්වභාව ඇති මහාසමුද්‍රය වෙරළ නො ඉක්මවා ද, මහරජ, එපරිද්දෙන් ම ශ්‍රාවකයන්ට මා විසින් යම් ශික්ෂාපදයක් පණවන

*Non-Commercial Distribution*

ලද ද, ඒ ශික්ෂාපදය මාගේ ශ්‍රාවකයෝ තමන්ගේ දිවි පිණිසත් නො ඉක්මවති' යි කියා වදාරණ ලද්දේ ය. තවද, මහරජානෙනි, මහාසමුද්‍රය ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී ආදී සියලු ම ගංගාජලයෙන් හා අහසින් වසින අනන්තජලධාරාවෙන් නො පිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් පෙළ කියවා ගැණීම ය, එහි අර්ථකථා ඇසීම ය, ධර්මශ්‍රවණය කිරීම ය, ඇසූ දහම් ධාරණය කිරීම ය, අර්ථවිනිශ්චය කිරීම ය, අභිධර්මය ඉගැන්ම ය, විනය ඉගැන්ම ය, දුඩි වූ සූත්‍රාන්ත ඉගැන්ම ය, විග්‍රහපද ඉගැන්ම ය, සමාසපද ඉගැන්ම ය, සන්ධිපද ඉගැන්ම ය, ආඛ්‍යාතවිභක්ති ඉගැන්ම ය, නාම විභක්ති ඉගැන්ම ය යනාදියෙන් යුක්ත වූ නවාංගශාස්තෘශාසනවරය බොහෝ සෙයින් ශ්‍රවණය ධාරණය කරන්නාහු විසිනුදු ඇතැ යි කියා තෘප්තියට නො පැමිණිය යුත්තේ ය. මහරජානෙනි, මහාසමුද්‍රයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ භාග්‍යවතුන් වහන්සේ විසින් සුතසෝමජාතකයෙහි වදාරණ ලද්දේ ය:—

**''අග්ගී යථා තිණකට්ඨං ඩහන්තො**
**න තප්පතී සාගරො වා නදීහි,**
**එවං හි මෙ පණ්ඩිතා රාජසෙට්ඨ**
**සුත්වා න තප්පන්ති සුභාසිතෙන'' යි**

''පොරිසාදරජහට 'භවත් රාජශ්‍රෙෂ්ඨයෙනි, තෘණකාෂ්ඨ දවන්නා වූ වහ්නිය යම් සේ තෘප්තියට නො යේ ද, ගංගාජලයෙන් සමුද්‍රය නො පිරේ ද, එසෙයින් ම මාගේ සුභාෂිතය අසා පණ්ඩිතයෝ තෘප්තියට නො යන්නාහු ය.''

---

උද්දාන පද නම්:—

**ලාපුලතා ච පදුමං–බීජං සාලකල්‍යාණිකා**
**නාවා ච නාවාලග්ගනං–කූපො නියාමකො තථා**
**කම්මකාරො සමුද්දො ච–වග්ගො තෙන පවුච්චති.**

දෙවිසිඅංගයක් ඇති දෙවන වර්ගය නිමි.

---

**(482)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'පෘථිවියගේ පඤ්චාංග යක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ පඤ්චාංගය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ මහාපෘථිවි තොම ඉෂ්ට වූ කපුරු කළුවැල් තුවරලා චන්දනකුංකුමාදිය විසුරුවන කල්හි යම්බඳු වී ද, පිත් සෙම් සැරව ලේ ඩහදිය මේදතෙල් කෙළ සොටු සඳමිදුළු මූත්‍ර අසූචි යනාදි අනිෂ්ටවස්තු බහා ලීමෙහිත් එබඳු ම වේ ය.

Non-Commercial Distribution

මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් ඉෂ්ටානිෂ්ට වූ ලාභාලාභයෙහි ද යසායසයෙහි ද නින්දප්‍රශංසායෙහි ද සුඛදුක්ඛයෙහි ද යනාදි හැමතැන්හි ම එකාකාර වූ සමාධිගුණයෙන් ම යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, පෘථිවියගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය.

තවද, මහරජානෙනි, මහාපෘථිවිතොමෝ පහ වූ ආභරණසැරහීම් ඇත්තී තමාගේ පෘථිවිගන්ධයෙන්ම වැඩෙන ලද්දී ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් පහ කරණ ලද ආභරණ හා ශරීරමණ්ඩනයෙන් ඇති ව තමාගේ චතුපාරිශුද්ධිශීලගන්ධයෙන් හා වැඩීමෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, පෘථිවියගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය.

තවද, මහරජානෙනි, මහාපෘථිවිතොමෝ අතුරක් නැත්තී ය. සිදුරක් නැත්තී ය. සුසිරයක් නැත්තී ය. බහල වූවා ය. ඝන වූවා ය. විස්තීර්ණ වූවා ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් අතුරු නැත්තා වූ නො කඩ වූ සිදුරු නො වූ අසුසිර වූ බහල වූ ඝන වූ විස්තීර්ණ වූ පිරිසිදු ශීලයෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, පෘථිවියගේ මේ තෘතියාංගය ගත යුත්තේ ය.

තවද, මහරජානෙනි, මහාපෘථිවීතොමෝ ගාම නිගම නගර ජනපද වෘක්ෂ පර්වත ගංහා වැව් පොකුණු මෘග පක්ෂි මනුෂ්‍ය නරනාරී ජනසමූහයා ධරන්නී ද අකුසීත වන්නී ය. මහරජානෙනි, එපරිද්දෙන් ම පරහට අවවාද කරන්නා වූ ද අනුශාසනා කරන්නා වූ ද අර්ථධර්මය අවබොධය කරන්නා වූ ද මෙලෝ පරලෝ වැඩ දක්වන්නා වූ ද දක්වාලූ වැඩෙහි සමාදන් කරවන්නා වූ ද සමාදන් වූ වැඩෙහි සිත තියුණු කරවන්නා වූ ද ඒ පිළිවෙත්හි ම 'යහපත, යහපතැ' යි කියා සිත ප්‍රසන්න කරවන්නා වූ ද යොගී වූ මහණුන් වහන්සේ විසින් පරහට ධර්මදෙශනා කිරීමෙහි අකුසිත විය යුත්තේ ය. මහරජානෙනි, පෘථිවියාගේ මේ සතරවන අංගය ගත යුත්තේ ය.

තවද, මහරජානෙනි, මහපෘථිවිතොමෝ හිතාහිතයන් කෙරෙහි දයා ක්‍රොධ දෙකින් මිදුනා ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් දයා ක්‍රොධ දෙකින් මිදුනා වූ පෘථිවිය හා සම වූ සිතින් වාසය කළ යුත්තේ ය. මහරජානෙනි, පෘථිවියගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, අනේපිඩුසිටානන්ගේ දුහිතෘ වූ චූලසුභද්‍රා නම් සිටු දියනියන් සාකෙත නුවර කාලක නම් සිටානන්ගේ පුත්‍රයාහට සරණ ගිය දවස් කාලක නම් සිටානෝ, 'මපුතනුවන්ගේ සරණමගුලෙහි පළමු කොට ම මාගේ රහතුන් වළඳවමි' යි සිතා නොයෙක් දෑ පිළියෙල කරවා පන්සියයක් පමණ අචෙලකයන්ට ආරාධනා කොට වඩා හිඳුවා 'මා යෙහෙළිනියෝත් මොබ අවුත් මේ රහතුන් වැඳ පුද පින් ගණුව' යි කියා යවූහ. එකළ චූළ (483) සුභද්‍රාවෝ ද රහතුනැ යි

යන බස අසා වහා ම අවුත් නිඃශ්‍රීකදර්ශනය ඇති නිර්ලජ්ජී වූ තිරශ්චීන රැළක් සෙයින් බත් කැමට සැදිහුන් පන්සියයක් අචෙලකයන් දුක මහත් වූ ලජ්ජාවට පැමිණ 'අහෝ'! මොහු කුමන රහත්හු ද? මොවුන්ගේ අබ්භ්‍යන්තරයෙහි ලජ්ජාවෙක් නම් නැත. පිටත්හි භයෙක් නම් නැතැ'යි යනාදීන් නින්ද කොට කෙළ දමා තමා වසන ගෙට ම ගොස් වන්හ. එකල මිථ්‍යාවෝ (?) කිපි 'මහසිටාණෙනි, මෙබඳු වූ කාලකණ්ණි කෙල්ලක් කොයින් ලද්දේ ද? කිමෙක්ද මුළු මහත් දඹදිව සිස් වී දැ?' යි යනාදීන් සිටානන්ට නින්ද කළාහු ය. එකල සිටානන් 'අනේ! වහන්සේවරුනි, ඉනා බොළඳ වූ තැනැත්තියගේ නො දන කී බසෙහි උරණ නො වන්නේ ය' යි සිත් තනා ඔවුන් යවා චූළසුභද්‍රාවන් ලඟට ගොස් 'අම්ම, චූළසුභද්‍රා වෙනි, මුළුලොවට පින්කෙත් වූ තමන් වැඳ පිදූවන්ට නිවන් සැපත් දෙන්නා වූ වස්ත්‍රකඩයෙහිත් ආලයක් නො කොට කෙලෙසුන් කෙරෙන් දුරු ව වසන්නා වූ රහතන් කුමක් පිණිස ලජ්ජා කොට ආ නියා දැ?' යි විචාළ කල්හි 'මයිලනුවන් වහන්ස, රහත්හු නම් මෙබඳු වූ අලජ්ජී නො වෙති. මහපොළව මෙන් විපුල වූ ගුණ ඇත්තාහු ය' යි කී කල 'මා යෙහෙළිනි, ඒ නුඹගේ රහත්හු කෙබඳු'නියා දැ?' යි කියා කාලකසිටානන් විසින් විචාරණ ලද්ද වූ, ස්වකීය වූ ශ්‍රමණයන් ප්‍රකාශ කොට කියන්නා වූ මාර්ග-ඵලලාභි වූ චූළසුභද්‍රා නම් උපාසිකාවන් විසින්—

> **"එකං චෙ බාහං වාසියා–තච්ඡෙය්‍ය කුපිතමානසො,**
> **එකං චෙ බාහං ගන්ධෙන–ආලිම්පෙය්‍ය පමොදිතො.**
>
> **අමුස්මිං පටිඝො නත්ථි–රාගො අස්මිං න විජ්ජති,**
> **පඨවීසමචිත්තා තෙ–තාදිසා සමණා මම"** යි.

යනුවෙන් 'මයිලනුවන් වහන්ස, ඉදින් කිපිසිත් ඇත්තා වූ කිසිවෙක් එක් බාහුවක් වෑයෙන් සස්නේ ය. ඉදින් සතුටු සිත් ඇත්තා වූ කිසිවෙක් එක් බාහුවක් සුගන්ධයෙන් ආලෙපනය කරන්නේ ය. එසේ කරන්නාහු කෙරෙහි ක්‍රොධයෙක් නැත්තේ ය. චන්දනානුලෙපනාදියෙන් සෙත් කරන්නාහු කෙරෙහි ඇල්මකුත් නැත්තේ ය. ඒ රහත්හු පෘථිවිය සමාන වූ සිත් ඇත්තාහු ය. මාගේ ශ්‍රමණයෝ එබඳු වූහ.' යි කියා මේ පෘථිවි සමාන වූ ගුණය කියන ලද්දේ ය."

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, උදකයාගේ පඤ්චාංගකෙනෙ-කුන් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද. ඒ ගත යුතු වූ පඤ්චාං-ගය කවරේ දැ?'යි විචාළෝය. "මහරජාණෙනි, යම් සේ උදකය වැව් පොකුණු ආදියෙහි මනා ව ම පිහිටන ලද්දේ ය. කම්පා නො වන්නේ ය. නො කැලඹෙන්නේ ය. එහෙයින් ස්වභාවෙන් ම පිරිසුදු වන්නේ ය. මහ-රජාණෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් ලාභසත්-කාර උපදවාලීම පිණිස 'යමෙක් තොපගේ සිවුපසය පරිභොග කෙරේ ද. එතෙම රහත් ය' යි යනාදී දයකයන් ලං කොට ගෙණ කථා

Non-Commercial Distribution

කිරීමය, ප්‍රාසාදික වූ ඊර්‍ය්‍යාපථයකින් යුක්ත ව හිඳීම ය, ප්‍රත්‍යය නො පිළි ගන්නාක් මෙන් ප්‍රතික්ෂෙප කිරීම ය යන ත්‍රිවිධ කුහන වස්තුවෙන් තමා ලොකයා සිත් විස්මයපත් කර (484) වනබව ය, ලාභසත්කාර කැමැති ව යම් සෙ දයකයා කිසිවක් දේ ද, එසෙ තමන්ගේ දයකයා හෝ උසස් කොට කථා කරන්නා වූ ලපනබව ය, ලාභසත්කාර කැමැති ව ප්‍රත්‍යය දෙන සංඥාව අනුන්ට සඳහන් කරවන්නා වූ කායවාක්කර්මය ඇති නෛමිත්තකබව ය, ගුණාගුණ කීමෙන් අනුන්ගේ සිත් සුණු කොට මිරිකා ලාභසත්කාර උපදවන්නා වූ නිෂ්පෙසිකබව ය යන කුහන ලපන නෛමිත්-තක නිෂ්පෙසිකබව ය, පහ කොට යහපත් කොට පිහිටන ලද්ද වූ කම්පා නො වන ලද්ද වූ නො කැළඹෙන ලද්ද වූ ස්වාභාවයෙන් ම පිරිසිදු වූ ආචාරශීලයෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, උදකයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, උදකය ශීතලභාවයෙන් යුක්ත ව සිටියේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් හිතාහිතසකලසත්වයන් කෙරෙහි ක්ෂාන්ති මෛත්‍රීදයාසම්පන්න වූ හිතෛසි ව අනුකම්පාවෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, උදකයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, උද-කය අශුචිකර්දමාදිය සොධා සකල ජනයන් පවිත්‍ර කරන්නේ ය. මහරජා-නෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් ග්‍රාමයෙහි හෝ අරණ්‍යයෙහි හෝ පිරිසිදු සහමැද උක්කුටුකයෙන් හිඳ දෙහොත් නභා වැඳ ගෙණ 'උපජ්ඣායො මෙ භන්තෙ හොහි' යන වාක්‍යයෙන් 'වහන්ස, මට නුඹ වහන්සේ උපාධ්‍යාය වුව මැනැවැ' යි තුන් යළක් කියා ප්‍රතිඥ ගෙණ 'අජ්ජතග්ගෙදනි ථෙරො මය්හං භාරො. අහම්පි ථෙරස්ස භාරො' යන වාක්‍යයෙන් 'දූන් අද පටන් තෙරුන් වහන්සේ මට භාර ය. මමත් තෙරුන් වහන්සේට භාර ය'යි කියා උපසම්පදමාළකයෙහි දී භාරලත් උපා-ධ්‍යායයන් වහන්සේ කෙරෙහි ද, උපසම්පද කර්මවාක්‍යය කියා උපසම්පද කළ කර්මවාචාචාරීන් කෙරෙහි ද, ධර්මය පුහුණු කරවන ධර්මාචාරීන් කෙරෙහි ද, නිසදයක ආචාරීන් කෙරෙහි ද, ගුරුන් සම වූ ආචාර්යමාත්‍ර සබ්‍රහ්මචාරීන් කෙරෙහි ද, හැමතැන්හි ම චොදනා කිරීමට අවකාශකාරී ව අධිකරණ විරහිත යුත්තේ ය, කායවාක්සමාචාරයෙන් සියල්ලන් සිත් ප්‍රසන්න කළ යුත්තේ ය. මහරජානෙනි, උදකයාගේ මේ තුන්වන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, උදකය සකලජනයන් විසින් ප්‍රාර්ථිත වන ලද්දේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් අල්පෙච්ඡ සන්තුෂ්ට පවිවිත්ත පටිසල්ලානගුණයෙන් නිරන්තරයෙන් ම සනරාමරසකලලොකයා විසින් ප්‍රාර්ථනීය විය යුත්තේ ය. මහරජානෙනි, උදකයාගේ මේ චතුර්ථාංගය ගත යුත්තේ ය. තවද, මහ-රජානෙනි, උදකයා කිසිවක්හට අහිතක් නො පිහිටු වන්නේ ය. මහ-රජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් කයින් වචසින් මනසින් පරහට භණ්ඩන කලහ විග්‍රහ විවාද සිස් ව කිපිම් ආදී නො සතුටු උපදවන්නා වූ නපුරුක්‍රියාවක් නො කට යුත්තේ ය. මහරජානෙනි,

Non-Commercial Distribution

ආපයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් **කණ්හ ජාතකයෙහි:—**

> **''වරං චෙ මෙ අදො සක්ක-සබ්බභූතානමිස්සර,**
> **න මනො වා සරීරං වා-මංකතෙ සක්ක කස්සචි,**
> **කදාචි උපහඤ්ඤෙථ-එතං සක්ක වරං වරෙ'' යි.**

**(485)** 'ශ්‍රීමහාබොධිසත්වයන් වහන්සේ කලෙක බරණැස බ්‍රාහ්මණ කුලයෙක ඉපිද වැඩි විය පැමිණ අපරිමිතධනසැපත් හැර සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව හිමවත් වැද උග්‍රතපස් කෙරෙමින් ධ්‍යාන උපදවා **ඉන්ද්‍රවාරුණී** නම් නමඩනරුකක් මුල ම හිඳ ඒ තුර ඵල මල් සුඹුළු පත්‍ර දතින් සිඳ වළඳමින් පරමඅල්පෙච්ඡතාවෙන් වසන කල ඒ ගුණමහිමයෙන් සක් දෙව්දු හුන් සලස්න හුණු ව අවුත් බණ අසා අතිප්‍රසන්න ව දසනඛ-සමොධානයෙන් නමස්කාර කෙරෙමින් 'ස්වාමීනි, නුඹ වහන්සේට කැමති වරයක් ගෙණ වදළ මැනැවැ' යි කී කල්හි 'ශක්‍රදෙවෙන්ද්‍රයෙනි, ඉදින් තෙපි මට වරයක් දෙන්නහු නම්, සකලසත්වයන් කෙරෙහි ක්‍රොධ නො කිරීම ය, ද්වෙෂ නො කිරීම ය, අනුන් සතු වස්තුවෙහි ලොභ නො කිරීම ය, තමා සන්තක වූ අවිඤ්ඤාණකසවිඤ්ඤාණකවස්තුවෙහි ස්නෙහ නො කිරීම ය, මේ වනයෙහි වසන්නා වූ මට අන්තරායකර වූ ව්‍යාධියෙක් නූපදිව යි යන මේ වර මට දෙව' යි කියා වර ඉල්ලූ කල **'කෘෂ්ණපණ්ඩිත** යෙනි, තොපට කී තාක් වර දිනිමි. තවත් තොපට වරයක් දෙමි' යි කීහ. එබස් අසා මහාබොධිසත්වයෝ වරයක් ගන්නා සේක්, 'සකලප්‍රාණී භූතයන්ට ඊශ්වර වූ ශක්‍රදෙවෙන්ද්‍රයෙනි, තෙපි මට කැමැති වර දුන්නාහ. ඉදින් තවත් වරයක් දෙනු කැමැත්තේ වී නම්, ශක්‍රදෙවෙන්ද්‍රයෙනි, මා නිසා මට අනර්ථ කැමැති වූ මනොද්වාර කායද්වාර වාක්ද්වාර යන ත්‍රිවිධද්වාරය කිසි සත්වයක්හට කිසි කලෙකත් දශඅකුශලකර්මපථය කිරීම් වශයෙන් නො සැටෙන්නේ වේ ද, ශක්‍රදෙවෙන්ද්‍රයෙනි, මේ වරය මට උතුම් වන්නේ ය' යි කියා මේ තුන්දෙරින් පවක් නො කරණ වරය ගත්සේකැ' යි කියා වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'වහ්නියගේ පංචාංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ පංචාංගය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ වහ්නිය තෘණ කාෂ්ඨ ශාඛා පත්‍ර දවා ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් තමාගේ චක්ෂුශ්‍රොත්‍රාදී ආධ්‍යාත්මික වූ හෝ රූප ශබ්දදී බාහිරක වූ හෝ ඉෂ්ටානිෂ්ට අරමුණු වඩන්නා වූ යම් ඒ ක්ලේශ ධර්මකෙනෙක් ඇද්ද, ඒ සියලු ම ක්ලේශධර්මයන් නවමහාවිදර්ශනා ඥානාග්නියෙන් දැවිය යුත්තේ ය. මහරජානෙනි, වහ්නියගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, යම් සේ වහ්නිය කිසි කෙනෙකුන්ට දයාවක් නැද්ද, කරුණාවක් නැද්ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ

Non-Commercial Distribution

මහණුන් වහන්සේ විසින් රාගද්වෙෂාදි සියලු ම ක්ලේශයන් කෙරෙහි කරුණාවෙක් දයාවෙක් නො කට යුත්තේ ය. මහරජානෙනි, වහ්නියගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, යම් සේ වහ්නිය සීත නසා ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් සකලක්ලේශයන් තවන්නා වූ වීර්යසන්තාපාග්නි උපදවා ගෙණ සකලක්ලේශයන් නැසිය යුත්තේ ය. මහරජානෙනි, වහ්නියගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, වහ්නිය සියල්ලන් කෙරෙහි දයාක්‍රොධදෙකින් මිදී උෂ්ණ උපදවන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ **(486)** මහණුන් වහන්සේ විසින් සකලසත්වයන් කෙරෙහි දයා ක්‍රොධ දෙකින් මිදුනා වූ වහ්නිය හා සම වූ සිතින් වාසය කළ යුත්තේ ය. මහරජානෙනි, වහ්නියගේ මේ සතර වන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, වහ්නිය ඝනතරතිමිරාන්ධකාරය දුරු කරන්නේ ය. මනොහර වූ ආලොකය දක්වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් චතුස්සත්‍යප්‍රතිච්ඡාදක වූ අවිද්‍යාන්ධකාරය දුරු කොට විපස්සනාඥාණ මනොමයිද්ධි ආදී වූ අෂ්ට විද්‍යාඥානාලොකය දක්විය යුත්තේ ය. මහරජානෙනි, වහ්නියගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මේ තෙජොපමාව තමන් වහන්සේගේ පුත්‍ර වූ රාහුලස්ථවිරයන් වහන්සේට අවවාද කරන්නා වූ දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින්:—

> **"තෙජොසමං, රාහුල, භාවනං භාවෙහි, තෙජොසමං හි තෙ රාහුල භාවනං භාවයතො අනුප්පන්නා චෙව අකුසලා ධම්මා න උප්පජ්ජන්ති උප්පන්නා ච අකුසලා ධම්මා චිත්තං න පරියාදාය ඨස්සන්ති."**

යන මෙයින් 'රාහුලයෙනි, තෙපි තෙජොසම වූ භාවනාව භාවනා කරව. රාහුලයෙනි, තෙජොසම ව භාවනා වඩන්නා වූ තොපට නූපන්නා වූ අකුශලධර්මයෝ නො උපදිත් ම ය. උපන්නා වූ අකුශලධර්මයෝ ද සිත වැලඳ නො සිටිති. සිතින් පහ ව යෙති' යි කියා වදාරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, වාතයාගේ පඤ්චාංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ පංචාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ වාතය සුපුෂ්පිත වනෂණ්ඩය අතුරට මනා ව හමන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් අර්හත්ඵලසමාපත්ති නමැති ප්‍රවරකුසුමයෙන් සුපුෂ්පිත ව සැරහුනා වූ දසකසිණාරමුණු නමැති මහාවනයෙහි සිත රමණය කට යුත්තේ ය, ඇලිය යුත්තේ ය. මහරජානෙනි, මේ වාතයාගේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, වාතය භූමියෙහි හට ගත්තා වූ වෘක්ෂසමූහයන් මර්දනය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම සසරභයින් වනාන්තරගත වූ චෙතනාව ය, ස්පර්ශය, මනස්කාරය යනාදී සර්වසංස්කාරප්‍රවෘත්තීන්ගේ තත්ත්වය සොයන්නා වූ

Non-Commercial Distribution

යොගී වූ මහණුන් වහන්සේ විසින් සර්වක්ලේශමථනය කළ යුත්තේ ය. මහරජානෙනි, වාතයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, වාතය අහස හැසිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සතරමග ය, සතර ඵල ය, නිර්වාණ ය යන නවලොකොත්තර සද්ධර්මයෙහි සිත හසුරුවා ලිය යුත්තේ ය, සංචාරණය කරවාලිය යුත්තේ ය. මහරජානෙනි, වාතයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, වාතය ඒ ඒ සුගන්ධය නො හැර උසුලන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් තමාගේ සීලසුගන්ධය ප්‍රීතිසිතින් අනුභව කළ යුත්තේ ය. මහරජානෙනි, වාතයාගේ මේ සතර වැනි අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, වාතය කිසි **(487)** ආලයක් නැත්තේ ය, ගෙයක නො වසන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් නිරාලය ව අනිකෙතවාසී ව මිත්‍රසන්ථව විරහිත ව හැම තැන ම මිදුනා වූ සිතින් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, වාතයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාති දෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් **සූත්‍රනිපාතයෙහි:—**

**''සන්ථවාතො භයං ජාතං–නිකෙතා ජායතී රජො,**
**අනිකෙතමසන්ථවං–එතං වෙ මුනිදස්සනං''** යි.

'මිත්‍රසන්ථවයෙන් භය උපදනේ ය, ගෘහය නිසා ක්ලේශරජස් උපදනේ ය. එසේ හෙයින් ගෘහවාසයක් නැතිබව හා ඇල්මක් නැති බව ද යන මේ කාරණද්වයය එකාන්තයෙන් ම සර්වඥමුනීන් විසින් නිවැරදි වසයෙන් දක්නා ලද්දේ ය' යි කියා වදාරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'පර්වතයාගේ පඤ්චාංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදාළසේක් ද, ඒ ගත යුතු වූ පඤ්චාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, පර්වතය යම් සේ අචල වී ද, නිශ්චල වී ද, කම්පා නො වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සම්මානයෙහි ද, අවමානයෙහි ද, සත්කාරයෙහි ද, අසත්කාරයෙහි ද, ගරුකාරයෙහි ද, අගරුකාරයෙහි ද, යසසෙහි ද, අයසෙහි ද, නින්දයෙහි ද, ප්‍රශංසායෙහි ද, සුවයෙහි ද, දුඃඛයෙහි ද, ඉෂ්ටානිෂ්ට වූ රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යධර්ම යන හැම තන්හි ද ඇලුන මනා තන්හි නො ඇලුන යුත්තේ ය. චිත්තදූෂණය කළ මනා තන්හි චිත්ත දූෂණය නො කළ යුත්තේ ය. මුළා විය යුතු තන්හි මුළා නො විය යුත්තේ ය, කම්පා නො විය යුත්තේ ය, චලිත නො විය යුත්තේ ය, මහාඝන ශෛල පර්වතය මෙන් නිශ්චල විය යුත්තේ ය. මහරජානෙනි, පර්වතයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාති දෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**''සෙලො යථා එකඝනො–වාතෙන න සමීරති,**
**එවං නින්දපසංසාසු–න සමිඤ්ජන්ති පණ්ඩිතා''** යි.

*Non-Commercial Distribution*

'රන්ධ්‍රපටල විරහිත වීමෙන් ඒකඝන වූ පාංශුවිරහිත වූ ශෛල පර්වතයතෙම සතර දිගින් හමන ප්‍රචණ්ඩවාතයෙන් යම් සේ කම්පා නො වේ ද, එපරිද්දෙන් ම නුවණැති පණ්ඩිතයෝ නින්ද ප්‍රශංසාදි අෂ්ට ලොකධර්මයෙහි කම්පා නො වන්නාහු ය' යි කියා වදරණ ලද්දේ ය. තවද, මහරජානෙනි, පර්වතයතෙම ස්තබ්ධ වන්නේ ය. කිසිවක් හා මිශ්‍ර නැත්තේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ධ්‍යානොපාය දෙක්හි යෙදෙන හෙයින් යොගී නම් වූ යොගාවචරයා විසින් සංසෘෂ්ටිවිරහිත ව ස්තබ්ධ විය යුත්තේ ය. කිසිවකු හා සංසර්ගය නො කට යුත්තේ ය. මහරජානෙනි, පර්වතයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. මෙම කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**(488) "අසංසට්ඨං ගහට්ඨෙහි-අනාගාරෙහි චූභයං,**
**අනොකසාරිං අප්පිච්ඡං-තමහං බෲමි බ්‍රාහ්මණං" යි.**

'මහණෙනි, ගිහිමිනිසුන් හා ද, ප්‍රව්‍රජිතයන් හා ද යන දෙපක්ෂයෙහි ඇත්තවුන් හා දර්ශනසංසර්ගය ශ්‍රවණසංසර්ගය පරිභොගසංසර්ගය කාය සංසර්ගය සමුල්ලපනසංසර්ගය යන පඤ්චවිධසංසර්ගයක් නැත්තා වූ ආලය සඤ්චාරණයක් හෝ තෘෂ්ණා නමැති ගෘහයෙහි හැසිරීමක් නැත්තා වූ චතුර්විධප්‍රත්‍යයෙහි ගිජුකමක් නැති හෙයින් අල්පෙච්ඡ වූ ඒ ආර්ය ශ්‍රාවකයා 'මම බ්‍රාහ්මණයා යි කියමි' යි කියා වදරණ ලද්දේ ය. තවද, මහරජානෙනි, ගල්පර්වතයෙහි මූලබීජ ය, ඛන්ධබීජ ය, ඵලුබීජ ය, අග්ගබීජ ය, බීජබීජ ය යන පඤ්චබීජජාතීහු නො හට ගන්නාහු ය. මහරජානෙනි, එපරිද්දෙන් භාවනා මාර්ගයෙහි යෙදෙන්නා වූ යොගාවචරයා විසින් තමාගේ සිත්හි ක්ලේශයන් නො හට ගන්වාලිය යුත්තේ ය. මහරජානෙනි, පර්වතයාගේ මේ තුන්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, පෙර කළ පිණින් කනකරජතමාණික්‍යාදියෙන් අලංකෘත වූ දිව්‍යතොරණයක් මෙන් ද, නීලාදීනානාවර්ණවිචිත්‍රවිත්‍ර කර්මාන්තයෙන් නිර්මිත වූ වස්ත්‍රයක් මෙන් ද, අතිසොභමාන වූ රූපයක් ඇති බැවින් සුභූති නම් වූ ථෙර ස්වාමීන් වහන්සේ විසින්:—

**"රාගූපසංහිතං චිත්තං-යදා උප්පජ්ජතෙ මම,**
**සයමෙව පච්චවෙක්ඛිත්වා-එකග්ගො තං දමෙමහං.**

**රජ්ජසී රජනීයෙසු-දුස්සනීයෙසු දුස්සසි,**
**මුය්හසේ මොහනීයෙසු-නික්ඛමස්සු වනා තුවං.**

**විසුද්ධානං අයං වාසො-නිම්මලානං තපස්සිනං,**
**මා ඛො විසුද්ධං දූසෙසි-නික්ඛමස්සු වනා තුවං' යි.**

'යම් කලෙක්හි මට රාගනිශ්‍රිත වූ සිතක් උපදනේ ද, එකල තෙමේ ම ප්‍රත්‍යවෙක්ෂා කොට බලා 'එම්බල සුභූතිය, තෝ බාලජනයන් විසින් ඇලිය යුතු වූ රූපශබ්දදියෙහි ඇලෙන්නෙහි ද? චිත්තදූෂණය විය යුත්තෙහි චිත්තදූෂණය වන්නෙහි ද? මුළා විය යුතු තන්හි මුළා වන්නෙහි ද?

*Non-Commercial Distribution*

එසේ කල තෝ ආර්යයන්ගේ වනවාසයෙන් නික්ම යව' යි කියා ද, 'රාගාදික්ලේශයන් තවන්නා වූ නිර්මලශීලි වූ ක්ලේශමලාගමනයෙන් විශුද්ධ වූ ආර්යයන්ගේ මේ වාසයෙක. තෙපි සුවිසුද්ධ වූ මේ වනවාසය ක්ලේශපාපවිතර්ක සිතා නහමක් (දූෂණය කරව) මේ වනවාසයෙන් නික්ම යව' යි කියා ද 'එකලා වූ මම ඒ රාගනිශ්‍රිත වූ සිත දමනය කෙරෙමි'යි කියා මෙම කාරණය කියන ලදී. නවද, මහරජානෙනි, පර්වතරාජයා ඉතා උස් ව ගියේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගි වූ යොගාවචරයා විසින් නවමහාවිදර්ශනාඥානයෙන් ඉතා උස් විය යුත්තේ ය. මහරජානෙනි, පර්වතයාගේ මේ සතරවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින්:—

(489) **''පමාදං අප්පමාදෙන–යදා නුදති පණ්ඩිතො,**
**පඤ්ඤාපාසාදමාරුය්හ–අසොකො සොකිනිං පජං**
**පබ්බතට්ඨොව භුම්මට්ඨෙ–ධීරො බාලෙ අවෙක්ඛති''** යි.

'පණ්ඩිත වූ ආර්යශ්‍රාවකතෙම යම් කලෙක්හි කුශලධර්මයෙහි ස්මෘති සම්පන්න වූ අප්‍රමාදභාවයෙන් කුශලධර්මයෙහි සිහි මඳ ව වාසය කිරීම ය යි කියන ලද ප්‍රමාදබව දුරු කෙරේ ද, නොහොත් පුරාණ ජලයට අවකාශ නො දී අවුත් අවුත් වදනා ජලය මෙන් ප්‍රමාදයට අවකාශ නො දී මැඩ ගෙණ අප්‍රමාදය පවත්වන්නේ වේ ද, එකල්හි හිණිමගින් පහයට නැඟෙන්නක්හු මෙන් දිවස් ලැබීමට නිසි පිළිවෙත් පිරීමෙන් අභිඥා සංඛ්‍යාත ප්‍රඥා නමැති ප්‍රාසාදයට නැඟී අනාගාමිමාර්ගයෙන් උපුටා පහ කරණ ලද සොකසල්ලය ඇති බැවින් අසොක වූ ප්‍රඥාසම්පන්න වූ ක්ෂීණාශ්‍රවතෙම නො උපුටා හරණ ලද සොකසල්ලයන් ඇති හෙයින් චුත වන්නා වූ ද, උපදින්නා වූ ද සොක සහිත වූ සත්වසමූහයා දිව ඇසින් බලන්නේ ය. කුමක් මෙන් ද? යත්— බිම සිටියවුන් සුව සේ බලන්නා වූ පර්වතය මුදුනෙහි සිටි එකක්හු මෙන් අසමුච්ඡින්න වූ සංසාරවෘත්ති බීජ ඇති චුත වන උපදින බාලජනයන් දිව ඇසින් සුව සේ දක්නේ ය යි කියා ඥාණයෙන් උස් විය යුත්තේ ය' යි යන මේ කාරණය වදරණ ලද්දේ ය. නව ද, මහරජානෙනි, පර්වතය උඩඟු නො වන්නේ ය, යටත් නො වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගි වූ යොගාවචරයා විසින් ලාභාලාභ දෙක්හි උන්නතාවනතයක් නො කට යුත්තේ ය. මහරජානෙනි, පර්වතයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, උඩඟු නො වන මෙම කාරණය සකසමයවාදී වූ ශ්‍රමණයන්ගේ ගුණ කියන්නා වූ චූළසුභද්‍රා නම් උපාසිකාව විසින්:—

**''ලාභෙන උන්නතො ලොකො–අලාභෙන ච ඔනතො,**
**ලාභාලාභෙන එකට්ඨා–තාදිසා සමණා මම''** යි.

Non-Commercial Distribution

''මයිලනුවන් වහන්ස, මේ ලෝවැසිතෙම ලාභයෙන් උඩඟු වන්නේ ය, අලාභය කරණ කොට ගෙණ ද, ඔනත වන්නේ ය, යම් කෙනෙක් ලාභාලාභදෙකින් ඒකාකාර ව සිටියාහු නම්, මාගේ ශ්‍රමණයෝ එබඳු ය'යි කියන ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ආකාශයාගේ පඤ්චාංගයක් ගත යුත්තේ ය' කියා යමක් වදාළසේක් ද, ඒ ගත යුතු වූ පංචාංගය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ආකාශය යම් සේ සර්වප්‍රකාරයෙන් ම ග්‍රහණයක් නැත්තේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සර්වප්‍රකාරයෙන් ම ක්ලේශයන් විසින් ග්‍රහණවිරහිත විය යුත්තේ ය. මහරජානෙනි, ආකාශයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. නව ද, මහරජානෙනි, ආකාශය ශීලභූෂණසෘෂිගණ තාපස යක්ෂ සකුණගණයා විසින් හැසිරෙණ ලද්දේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් 'අනිත්‍ය ය, දුඃඛ ය, අනාත්ම ය' යි කියා සංස්කාරධර්මයෙහි සිත සංචාරණය කරවා ලිය යුත්තේ ය. මහරජානෙනි, ආකාශයාගේ **(490)** මේ දෙවන අංගය ගත යුත්තේ ය. නව ද, මහරජානෙනි, ආකාශය ආස්වාද නො කට යුතු[1] වූයේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් සියලු ම භවසංසාර ප්‍රතිසන්ධියෙහි තමාගේ සිත කලකිරුවා ලිය යුත්තේ ය. සියලු ම භවයෙහි සැප ආස්වාදයෙක් නො කට යුත්තේ ය. මහරජානෙනි, ආකාශයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. නව ද, මහරජානෙනි, ආකාශය අනන්ත වූයේ ය, අප්‍රමාණ වූයේ ය, අප්‍රමෙය වූයේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් අනන්ත වූ ශීලගුණයෙන් හා අපරිමිත වූ ඤාණයෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, ආකාශයාගේ මේ සතර වන අංගය ගත යුත්තේ ය. නව ද, මහරජානෙනි, ආකාශයතෙම කිසිවෙක ලග්න නො වූයේ ය, නො ඇලෙන්නේ ය, නො පිහිටියේ ය, පළිරොධ විරහිත වූයේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් උපාසකකුලයා කෙරෙහි ද, ශිෂ්‍යගණයා කෙරෙහි ද, ලාභයෙහි ද, ආවාසයෙහි ද, පළිරොධ ලද මනා තන්හි ද, ප්‍රත්‍යයෙහි ද, සර්වක්ලේශයන් කෙරෙහි ද යන මේ සර්වස්ථානයෙහි ම අලග්න විය යුත්තේ ය, අනාසත්ත අපළිබුද්ධ අප්පතිට්ඨිත විය යුත්තේ ය. මහරජානෙනි, ආකාශයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, තමන් වහන්සේගේ පුත්‍ර වූ රාහුල ස්ථවිරයන් වහන්සේට අවවාද කරන්නා වූ දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**''සෙය්‍යථාපි රාහුල ආකාසො න කත්ථචි පතිට්ඨිතො-පෙ-න පරියාදාය ඨස්සන්ති''** යි[2]

1. ආසාව නැසිය යුතු.
2. පාළිමිලින්දපඤ්හයෙහි 310 වන පිටුවෙහි සම්පූර්ණ පාඨය පෙණේ.

Non-Commercial Distribution

රාහුලය, යම් සේ ආකාශය කිසි තැනක නො පිහිටන ලද වේ ද, රාහුල ය, තෝ එපරිද්දෙන් ම ආකාශය සම වූ භාවනාව වඩව. රාහුලය, ආකාශය සම වූ භාවනා වඩන්නා වූ තාගේ උපනුපන් මනාපිකස්පර්ශයෝ චිත්තය වැළඳ ගෙණ නො සිටින්නාහු ය' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'චන්ද්‍රදිව්‍යරාජයාගේ පංචාංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදාළසේක් ද, ඒ ගත යුතු වූ පංචාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ චන්ද්‍රදිව්‍යරාජතෙම ශුක්ලපක්ෂයෙහි උදවෙමින් දවසින් දවස වැඩි වැඩියක් වඩින්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ආචාරශීල ගුණ වත්පිළිවෙත්හි ද, ආගම අධිගම දෙක්හි ද, විවේකවිහරණයෙහි ද සතර සතිපට්ඨානයෙහි ද, ඉන්ද්‍රියයෙහි ගුප්තද්වාරතායෙහි ද, භොජනයෙහි මාත්‍රඥතායෙහි ද, ජාගරියානුයොගයෙහි ද යන මෙකී තන්හි දවස් පතා වැඩිවැඩියකින් වැඩුන යුත්තේ ය. මහරජානෙනි, චන්ද්‍රදිව්‍යරාජයාගේ මේ පළමු වන අංගය නිවන් සොයන යොගාවචරයා විසින් ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, චන්ද්‍රදිව්‍යරාජතෙම මහත් වූ සිසිරගුණයෙන් අධිපති වූයේ ය. මහරජානෙනි, එපරිද්දෙන් යොගී වූ යොගාවචරයා විසින් 'රහත් ව මුත් නො පසු බස්නෙමි'යි යන මහත් වූ ඡන්දයෙන් අධිපති විය යුත්තේ ය. මහරජානෙනි, **(491)** චන්ද්‍රයාගේ මෙ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, චන්ද්‍රදිව්‍යරාජතෙම රාත්‍රියෙහි ම හැසිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචර මහණහු විසින් විවේකවිහරණයෙන් ම යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, චන්ද්‍රයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, චන්ද්‍රදිව්‍යරාජතෙම තමාගේ එකුන්පණස්යොදුන් විමානය ම ධ්වජය කොට ඇත්තේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් තමාගේ සතරසංවරශීල නමැති කෙතුවෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, චන්ද්‍රයාගේ මේ සතර වන අංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, චන්ද්‍රදිව්‍යාරජතෙම කිසි කෙනෙකුන් විසින් ආරාධනා නො කරණ ලද්දේ ප්‍රාර්ථනා නො කරණ ලද්දේ තෙමේ ම උද වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ආරාධනා ප්‍රාර්ථනා නැතුව ම උපාසකකුලයා කරා එළඹිය යුත්තේ ය. මහරජානෙනි, චන්ද්‍රයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම චන්ද්‍රොපම වූ කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් සංයුත්සඟිවරයෙහි:—

**''චන්දූපමා භික්ඛවෙ කුලානි උපසංකමථ, අපකස්සෙව කායං අපකස්ස චිත්තං නිච්චං නවෙව කුලෙසු අප්පගබ්භා සෙය්‍යථාපි පුරිසො ගම්භිරුදපානං වා පසෙය්‍ය පබ්බත**



Non-Commercial Distribution

**විසමං වා නදීවිදුග්ගං වා අපකස්සෙව කායං අපකස්ස චිත්තං, එවමෙව ඛො චන්දූපමා භික්ඛවෙ කුලානි උපසංකමථ අපකස්සෙව කායං අපකස්ස චිත්තං නිච්චං නවෙව කුලෙසු අප්පගබ්භා'' යි.**

යනුවෙන් 'මහණෙනි, තෙපි චන්ද්‍රොපමාවෙන් නිරන්තරයෙන් ම හැකුළුනා වූ කයින් හැකුළුනා වූ සිතින් තමා විසින් භික්ෂාටනයට එළඹෙන ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි කුලයෙහි කයින් නො සරුප් කිරීම ය යි කියන ලද කායප්‍රගල්භය ද, බසින් නො සරුප් තෙපුල් බිණීම ය යි කියන ලද වාක්ප්‍රගල්භය ද, මනසින් අනෙකප්‍රකාර වූ කාමවිතර්කාදිය සිතීම යයි කියන ලද අනෙකවිධ වූ මනඃප්‍රගල්භය ද යන ත්‍රිවිධ ප්‍රගල්භයන් නැති ව අළුත එළඹෙන කෙනෙකුන් මෙන් ක්ෂත්‍රිය බ්‍රාහ්මණගෘහපත්‍යාදි උපාසක කුලයන් කරා එළඹෙවු, යම් සේ පුරුෂයෙක් හැකුළුනා වූ කයින් හැකුළුනා වූ සිතින් ගැඹුරු වූ ලිඳ පැනක් හෝ දක්නේ වේ ද, විෂම වූ පර්වතප්‍රපාතයක් හෝ දක්නේ වේ ද, භයානක වූ නදීදුර්ගයක් හෝ බලන්නේ වේ ද මහණෙනි, එපරිද්දෙන් ම චන්ද්‍රූපමාවෙන් නිරන්තරයෙන් හැකුළුනා වූ කයින් හැකුළුනා වූ සිතින් උපාසකකුලයෙහි ප්‍රගල්භයක් නැතු ව අළුත එළඹෙන කෙනකුන් මෙන් දයකකුලයන් කරා එළඹෙවු' කියා වදරණ ලදූ'' යි කියා වදළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'සූර්යදිව්‍යරාජයාගේ සප්තාංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ සප්තාංගය කවරේ දූ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, සූර්යදිව්‍යරාජතෙම යම් සේ සියලු ම උදකය වියලවා ක්ෂය කෙරේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා (492) විසින් සර්වක්ලේශයන් නිරවශෙෂ කොට වියලා ක්ෂය කළ යුත්තේ ය. මහරජානෙනි, සූර්යයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, සූර්යදිව්‍යරාජතෙම සනතර තිමිරාන්ධකාරය දුරු කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් යොගී වූ යොගාවචරයා විසින් සියලු ම රාගාන්ධකාරය ද්වෙෂාන්ධකාරය මොහාන්ධ කාරය මානාන්ධකාරය දෘෂ්ට්‍යන්ධකාරය ක්ලේශාන්ධකාරය යන සියලු ම දුශ්චරිතාන්ධකාරය දුරු කළ යුත්තේ ය, මහරජානෙනි, සූර්යයාගේ මේ ද්විතීයාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, සූර්යදිව්‍යරාජතෙම නිරන්තරයෙන් ම හැසිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් නිරන්තරයෙන් යොනිසො-මනස්කාරය කළ යුත්තේ ය. මහරජානෙනි, සූර්යයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, සූර්යදිව්‍යරාජතෙම සහස්‍රරශ්මි මාලාවක් ඇත්තේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාව-චරයා විසින් සිතින් ග්‍රහණය කරණ ලද අරමුණු නමැති මාලාවෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, සූර්යයාගේ මේ සතර වන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, සූර්යදිව්‍යරාජතෙම මහාජනසමූහයා

Non-Commercial Distribution

සන්තාපනය කෙරෙමින් හැසිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ආචාරශීල ගුණවන්ත ප්‍රතිපත්තියෙන් හා ධ්‍යානවිමොක්ෂ සමාධි සමාපත්ති ඉන්ද්‍රිය බල බොධ්‍යංගය සතිපට්ඨාන සම්‍යක්ප්‍රධාන ඍද්ධිපාදයෙන් දෙවියන් සහිත වූ ලෝවැසියා ම සන්තාපනය කළ යුත්තේ ය. මහරජානෙනි, සූර්යයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, සූර්යදිව්‍යරාජතෙම **රාහුඅසුරෙන්ද්‍රයා** හට භයින් භීත ව හැසිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් දුශ්චරිත විසින් ද දුර්ගති විසින් ද විෂම වූ කාන්තාරගත විසින් ද ජාත්‍යන්ධ බධිරාදි විපාකාවරණ ගත විසින් ද විවස ව පතිත වන්නා වූ සංජීවාදි නරක විසින් ද ක්ලේශජාලයෙන් වැලඳ සිටින ලද්ද වූ ද ශාශ්වතොච්ඡෙදදි දෘෂ්ටිසමූහයෙන් වැසෙන ලද්ද වූ මිථ්‍යාපථයට පනිත ලද්ද වූ ද මිථ්‍යාමාර්ගයෙහි පිළිපන්නා වූ ද සංසාරගත අනන්ත සත්වයන් දැක සිත්හි ඒ උපන් මහාසංවෙගභයින් තමාගේ සිත සසර කලකිරවා ලිය යුත්තේ ය. මහරජානෙනි, සූර්යයාගේ මේ සවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, සූර්යදිව්‍යරාජතෙම නොයෙක් යහපත් නපුරු රූපයන් දක්වා ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ඉන්ද්‍රියබල බොද්ධ්‍යංග සතිපට්ඨාන සම්‍යක්ප්‍රධාන ඍද්ධිපාදදී ලෞකිකලොකොත්තර ධර්මයන් දක්විය යුත්තේ ය. මහරජානෙනි, සූර්යදිව්‍යරාජයාගේ මේ සප්තමාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය වංගීස නම් මහතෙරහු විසින්:—,

> **''යථාපි සුරියො උදයන්තො–රූපං දස්සෙති පාණිනං,**
> **සුචිං ච අසුචිං චාපි–කල්‍යාණං චාපි පාපකං.**
> **තථාපි භික්ඛු ධම්මධරො–අවිජ්ජාපිහිතං ජනං,**
> **පථං දස්සෙති විවිධං–ආදිච්චො වුදයං යථා'' යි**

**(493)** 'යම් සේ උද වන්නා වූ සූර්යදිව්‍යරාජතෙම පවිත්‍ර වූ ද, අපවිත්‍ර වූ ද, යහපත් වූ ද, නපුරු වූ ද, නීලපීතාදීරූපයන් ප්‍රාණීන්ට දක්වා ද, එසෙයින් ම සද්ධර්මධරභික්ෂූන් වහන්සේ අවිද්‍යාවෙන් වැසෙන ලද්ද වූ ජනයන්ට උදවන්නා වූ සූර්යයා යම් සේ ද, එමෙන් අනෙකප්‍රකාර වූ ආර්යමාර්ගය දක්වන්නේ ය' යි කියා වදාරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ශක්‍රදෙවෙන්ද්‍රයාගේ අංගත්‍රයයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගත්‍රයය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ **ශක්‍රදෙවෙන්ද්‍ර**තෙම එකාන්තයෙන් ම ස්වකීය ශක්‍රසම්පත්තියෙහි පිහිටියේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් එකාන්තයෙන් ම තමන්ගේ විවෙකසැපතෙහි ආලයෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, ශක්‍රයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද මහරජානෙනි, ශක්‍රදෙවෙන්ද්‍ර

Non-Commercial Distribution

ඒනම තමාගේ **තව්තිසාදිවාලොක** වාසී වූ දෙවියන් දැක ප්‍රියවචනාදීන් සංග්‍රහ කරන්නේ ය, සන්තොෂ උපදවන්නේ ය, මහරජානෙනි, එපරිද්දෙන්ම යොගී වූ යොගාවචරයා විසින් කුශලධර්මයෙහි නො හැකුළුනා වූ අනලස් වූ ශාන්ත වූ සිත ප්‍රග්‍රහණය කට යුත්තේ ය, සන්තොෂ උපදවා ලිය යුත්තේ ය. පටන් ගත යුත්තේ ය, උත්සාහ කළ යුත්තේ ය, වීර්ය කළ යුත්තේ ය. මහරජානෙනි, **ශක්‍රයාගේ** මේ දෙවන අංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, අනන්ත ශක්‍රසම්පත්තියෙහි සිත් අලවා වසන්නා වූ **ශක්‍රදෙවෙන්ද්‍රයා**හට කලකිරීමෙක් නො උපදනේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ශූන්‍යාගාර යෙහි අනභිරතියෙක් නො උපදවා ලිය යුත්තේ ය. මහරජානෙනි, ශක්‍රයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය සොභන වූ රූපසොභාවක් ඇති **සුභූති** නම් මහතෙරහු ලොවුතුරා බුදුන්ගේ සම්මුඛයෙහි:—

**'සාසනෙ තෙ මහාවීර-යතො පබ්බජිතො අහං**
**නාභිජානාමි උප්පන්නං-මානසං කාමනිස්සිතං.'**

යන මේ ගාථාවෙන් 'ස්වාමීනි, මහාවීර වූ ලොවුතුරා බුදුරජානෙනි, ඔබ වහන්සේගේ මේ බුද්ධශාසනයෙහි මම යම් (තැනක පටන්) ගිහිගෙයින් නික්ම ප්‍රව්‍රජිත වීම් ද, එතැන් පටන් සිත්හි උපන්නා වූ කාමනිශ්‍රිත වූ සිතක් මම අද දක්වා නො දන්නෙමි. අප්‍රමාද ව ම ශූන්‍යාගාරයෙහි ම අභිරමණය කෙළෙමි' යි කියා සැළකළසේක.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'චක්‍රවර්තිමහරජානන් වහන්සේගේ චතුරංගයක් ගත යුත්තේ ය' යි කියා යම් වචනයක් වදාළසේක් ද, ඒ ගත යුතු වූ චතුරංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ චක්‍රවර්තිමහරජානෝ දාන ප්‍රියවචන අර්ථචර්යා සමානාත්මතා යන සතරසංග්‍රහවස්තුවෙන් සතිස්යොත්නෙක පැතිර සිටිනා ජනයාගේ සිත් ගන්නෝ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් මුහුදුතෙර දක්වාත් පැතිර සිටි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවුවණක් පිරිසගේ සිත් ගත යුත්තේ ය. ධර්මයෙන් අනුග්‍රහ කට යුත්තේ ය. **(494)** පර්යාප්තිප්‍රතිපත්තියෙහි 'යහපත, යහපතැ' යි කියා සිත් ප්‍රසන්න කරවා ලිය යුත්තේ ය. මහරජානෙනි, චක්‍රවර්ති මහරජානන්ගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, චක්‍රවර්තිමහරජානන්ගේ ආඥාව පවත්නා වූ විජිතයෙහි ගම් පහරණ සොරු නො නඟින්නාහ. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් තමන්ගේ චිත්තසන්තානයෙහි කාමරාග ව්‍යාපාද විහිංසාවිතර්කයන් නො උපදවා ලිය යුත්තේ ය. මහරජානෙනි, චක්‍රවර්තිමහරජානන්ගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් **ධර්මපදයෙහි:—**

*Non-Commercial Distribution*

**''විතක්කූපසමෙ ච යො රතො-අසුභං භාවයතී සදා සතො,**
**එස ඛො ව්‍යන්තිකාහිති-එසච්ඡෙජ්ජති මාරබන්ධනං'' යි.**

'යම් මහණෙක් කාමවිතර්කාදි ත්‍රිවිධ විතර්කයන්ගේ ව්‍යපසමන ය' යි කියන ලද උද්ධුමාතකාදි දශඅශුභාලම්බනයෙහි උපන් ප්‍රථමධ්‍යාන යෙහි ඇලුනේ වේ ද, හැම කල්හි ම සිහි ඇති වූයේ ඒ අශුභධ්‍යානය උපදවා වඩා ද, මෙම මහණ වනාහි භවත්‍රයෙහි උපදිනා 'නිකාන්ති ය' යි කියන ලද තෘෂ්ණාව පහ කරන්නේ ය. නසන්නේ ය. මේ මහණතෙම ත්‍රෛභූමිකවෘත්ත සංඛ්‍යාත මාරබන්ධනය අර්හත්මාර්ගඥාන නමැති ශස්ත්‍රයෙන් කපන්නේ ය' යි කියා වදාරණ ලද්දේ ය. තවද, මහරජාණෙනි, චක්‍රවර්තිමහරජානෝ සතරමහාද්වීපයෙහි සත්වයන්ගේ යහපත් පවිටු ක්‍රියාවන් විමසමින් දවස දවස මේ සක්වළ මහාසමුද්‍රය කෙළවර කොට ඇති මහාපෘථිවිය නිශ්‍රිත වූ ජනයන්ට අනුශාසනා කරන්නාහු ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් දවසක් දවසක් පාසා ම කායකර්මය වචීකර්මය මනඃකර්මය යන තුන් තැනින් වරදක් නැත්තා වූ 'මට කිමෙක් ද, දවස පසු වේ දෝ හෝ?' යි කියා ප්‍රත්‍ය-වෙක්ෂා කට යුත්තේ ය. මහරජාණෙනි, චක්‍රවර්ති මහරජානන්ගේ මේ තෘතියාංගය ගත යුත්තේ ය. මහරජාණෙනි, මෙම කාරණය දෙවාති දෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් **එකුත්තුරික** නම් වූ **අංගොත්තර සඟියෙහි**– 'කථං භූතස්ස මෙ රතතින්දිවා වීතිපතන්ති'ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං' යනාදීන් 'මහණෙනි, ගිහිගෙය හැර සසුන් වැද මහණ වූවාහු විසින් 'හිසකේ දැළිරවුළු කපා මුඩු වීමෙන් ශරීර වෛවර්ණයට ද, නොයෙක් වර්ණවත් වූ වස්ත්‍රාදිය හැර එකවර්ණවස්ත්‍ර නොයෙක් තැනින් සිඳ ගොතා පඬු රඳා වර්ණ විකාර කොට වලඳමින් පරිෂ්කාර වෛවර්ණයට ද යන මේ දෙවැදෑරුම් වූ විරූපබවට පැමිණියේ විමි' යි කියා එක්වන් සැලකිය යුත්තේ ය. 'සතරපසයෙන් මාගේ දිවි පැවැත්වීම අනුන් පිළිබඳ ය' යි කියා ද, 'මා විසින් ගිහින්ගේ ගමනාකාර යෙන් අනික් ගමනාකාරයෙක් කට යුතු ය යි කියා ද, 'කිමෙක් ද, මාගේ සිත ශීලයෙන් තාගේ සිල් නො පිරිසිදු ය' යි පරිභව නො කෙරේ දෝ හෝ' යි කියා ද, 'කිමෙක් ද, මට නුවණැති සබ්‍රහ්මචාරින් වහන්සේලා මාගේ සිල් විචාරා ශීලයෙන් පරිභව නො බෙණෙද් දෝ හෝ' යි කියාද, 'ප්‍රිය වූ මනාප වූ හැම නෑ මිත්‍රාදීන් කෙරෙහි මාගේ ජාතියෙන් නානාභාවය හා මරණින් විනාභාවය' යි කියා ද, **(495)** 'කර්මය පිළිබඳ කොට ඇත්තෙමි. කර්මය හිමි කොට ඇත්තෙමි. කර්මය උත්පත්තියට කාරණා කොට ඇත්තෙමි. කර්මය ම බන්ධු කොට ඇත්තෙමි. කර්මය ම පිළිසරණ කොට ඇත්තෙමි. යහපත් වූ හෝ පවිටු වූ හෝ කායවාක් මනස් යන තුන්දෙරින් යම් පුණ්‍යාපුණ්‍යකර්මයක් කෙරෙම් ද, ඒ කළ කර්මයට හිමි වෙමි' යි කියා ද, 'කිමෙක් ද, රෑ දහවල් වත්පිළිවෙත් පිරී-මෙන් හෝ බණ හැදෑරීමෙන් හෝ කර්මස්ථානයෙහි යෙදීමෙන් හෝ

Non-Commercial Distribution

කෙසේ වූ මට ය් දහවල්හු ඉක්මෙද් දෝ හො ?'යි කියා ද, 'කිම හෝ? මම ජනශූන්‍යාගාරයෙහි සතරඉරියව්වෙන් එකලා ව ඇලෙම් දෝ හෝ' යි කියා ද, 'මාගේ ඇතුළ සතන්හි උතුරුමිනිස්ධර්මකෙනෙක් ඇද්දෝ හෝ' යි, 'ආයර්‍යඥනදර්ශනයට පොහොසත් වූ විශෙෂයෙක් ලබන ලද්දේ දෝ හො ?'යි, 'ඒ මම මරණකාලයෙහි සබ්‍රහ්මචාරීන් විසින් නිර්වාණ ධර්මය ලද්දේ ද? යි විචාරණ ලදුයෙම් කර බා නො හිඳීම් දෝ හො ?' යි කියාද, මේ යථොක්ත වූ දශධර්මයන් ගිහිගෙය හැර මහණ වූවාහු විසින් එක්වන් සැලකිය යුත්තේ ය' යි කියා මේ ත්‍රිවිධ වූ සමාචාරය වදරණ ලද්දේ ය. තවද මහරජානෙනි, චක්‍රවර්තිමහරජානන්ගේ රාජ්‍යාභ්‍යන්තර වූ ද 'බාහිර වූ ද ආරක්ෂාතොමෝ මනා කොට පිහිටන ලද්දේ ය, සුසංවිහිත වූයේ ය.. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් චක්ෂුශ්ශ්‍රොත්‍රාදී අභ්‍යන්තර වූ ද' රූපශබ්දදි බාහිර වූ ද ක්ලෙශයන්ට වැද්ද නො දෙන්නා වූ ආරක්ෂා පිණිස සිහි නමැති දෙරටුපාලයා තැබිය යුත්තේ ය. මහරජානෙනි, චක්‍රවර්තිමහරජානන්ගේ මේ සතර වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් ද වදරණ ලද්දේ ය. කෙසේ ද? යත්--

**''සතිදොවාරිකො භික්ඛවෙ අරියසාවකො අකුසලං පජහති. කුසලං භාවෙති. සාවජ්ජං පජහති. අනවජ්ජං භාවෙති. සුද්ධමත්තානං පරිහරති.''** යි.

'මහණෙනි, ස්මෘතිය ද්වාරපාලයකු කොට ඇති ආයර්‍යශ්‍රාවකතෙම අකුසල් දුරු කරන්නේ ය. කුශලධර්මය වඩන්නේ ය. සාවද්‍යධර්මය දුරු කරන්නේ ය. නිරවද්‍යධර්මය වඩන්නේ ය. දුශ්චරිතවිරමණයෙන් පිරිසිදු වූ සිත පරිහරණය කරන්නේ ය.' යි කියා වදළසේක.''

---

මෙහි උද්දනපද නම්:—

**'පඨවි ආපො ච තෙජො ච-වායො ච පබ්බතෙන ච,**
**ආකාසො චන්දසුරියා ච-සකො ච චක්කවත්තිනා.'**

**එකුන්පණස්අංගයකින් යුක්ත වූ තෘතියවර්ගය නිමියේ ය.**

---

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'වේයාගේ එක් අංගයක් ගත යුතු ය' යි කියා යම් වචනයක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ ද ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ උපචිකා නම් වූ වේයා මත්තෙන් (496) සෙවෙණි කොට ගෙණ තමන් වසා ගෙණ ගේ යටින් ම ගොදුරු පිණිස හැසිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ශීලසංවරය සෙවෙණි කොට ගෙණ සිත වසා ගෙණ සංවරශීල සෙවෙණිය යටින් පිඩු පිණිස හැසුරුණ යුත්තේ ය. මහරජානෙනි,

Non-Commercial Distribution

ශීලසංවර සෙවෙණිය කරණ කොට ගෙණ යොගී වූ මහණුන් වහන්සේ සියලුම සංසාරභය ඉක්මවනසේක. මහරජානෙනි, වේයාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය වංගන්තපුත්‍ර වූ උපසෙන ස්ථවිරයන් වහන්සේ විසින්-

**''සීලසංවර ඡදනං-යොගී කත්වාන මානසං,**
**අනුපලිත්තො ලොකෙන-භයා ච පරිමුච්චති'' යි.**

'යොගීන් වහන්සේ සිත ශීලසංවර සෙවෙණිය කොට ගෙණ ලොකයා හා නො ඇලී සියලු ම භයින් මිදෙන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'බිළාරයාගේ අංගද්වයක් ගත යුත්තේ ය' ය යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ ද?'' යි විචාළෝ ය ''මහරජානෙනි, යම් සේ බිළාරතෙම පර්වත ගුහාදියට ගියේ ද, වෘක්ෂබිලාදියට ගියේ ද, 'හම්මියන්තර ය' යි කියන ලද පිට බරාඳ ඇති උඩුමහල්ප්‍රාසාද ඇතුළට ගියේ ද, අනුභවයට නිසි වූ මූෂිකයකු ම සොයන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම ගම්දෙරට ගියා වූ ද, අරණ්‍යයට ගියා වූ ද, ජනවිවෙකයට ගියාවූ ද, යොගී වූ මහණුන් වහන්සේ විසින් සතතයෙන් සමිතයෙන් අප්‍රමාද ව කායගතාසතිභොජනය ම සොයා ගත යුත්තේ ය. මහරජානෙනි, බළලාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, බිළාරතෙම දෙයත් තබා හිඳීමෙන් මූෂිකාදී ගොදුරු සොයන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින්-

**''ඉමෙසු යෙව පඤ්චසුපාදානක්ඛන්ධෙසු-පෙ-ඉති විඤ්ඤාණස්ස අත්ථගමො''ති**[1]

'මෙසේ රූපය විසිඅට වැදෑරුම් වෙයි. ඒ විසිඅට වැදෑරුම් වූ රූපයාගේ මෙසේ අවිද්‍යාදිසමුදයන්ගේ වශයෙන් පඤ්චප්‍රකාර උත්පත්තිය වන්නේ ය. අවිද්‍යාදීන්ගේ පඤ්චප්‍රකාර නිරොධයෙන් මෙසේ රූපයාගේ අස්තංගමය වන්නේ ය. මෙසේ එකොළොස්තන්හි සිටි රූපයන් නිසා පවත්නා සුඛදුඃඛොපෙක්ෂා සංඛ්‍යාත වෙදනාත්‍රය වන්නේ ය. මෙසේ අවිද්‍යාදිසමුදයයන්ගේ වශයෙන් පඤ්චප්‍රාකාර වූ වෙදනාවගේ උත්පත්තිය වන්නේ ය. මෙසේ අවිද්‍යානිරොධාදි වශයෙන් වෙදනාවගේ අස්තංගමය වන්නේ ය. මෙසේ නීල පීතාදි අරමුණ ඇඳින ගැන්ම ස්වභාව කොට **(497)** ඇති සංඥාව වන්නේ ය. මෙසේ අවිද්‍යාදීන්ගේ පහළ වීමෙන් පඤ්චප්‍රකාර සංඥාවගේ පහළ වීම වන්නේ ය. මෙසේ අවිද්‍යානිරොධාදි වශයෙන් පඤ්චප්‍රකාරයෙන් සංඥාවගේ අස්තංගමය වන්නේ ය. මෙසේ චෙතනා ඵස්සාදී පණසක් පමණ චෛතසිකයෝ සංස්කාර නම් වෙති.

1. පාළිමිලිඤ්ඤපඤ්හ 314 වන පිටුව

*Non-Commercial Distribution*

මෙසේ අවිද්‍යාදිසමුදයයන්ගේ වශයෙන් පඤ්චප්‍රකාරසංස්කාරයන්ගේ උත්පත්තිය වන්නේ ය. මෙසේ අවිද්‍යානිරොධාදි වසයෙන් පඤ්චප්‍රකාරයෙන් සංස්කාරයන්ගේ අස්තංගමය වන්නේ ය. මෙසේ සොමනස්ය සහගතාදි ඒකානුවක් පමණ කුශලාකුශලප්‍රතිසන්ධිවිඥානචිත්තය වන්නේ ය. මෙසේ අවිද්‍යාදි සමුදයයන්ගේ වශයෙන් පඤ්චප්‍රකාරවිඥානයාගේ පහළ වීම වන්නේ ය. මෙසේ අවිද්‍යානිරොධාදි වසයෙන් පඤ්චප්‍රකාර විඥානයාගේ අස්තංගමය වන්නේ ය යි මේ පඤ්චොපාදනස්කන්ධයන් කෙරෙහි ම උදයව්‍යය දර්ශනඥානයෙන් යෙදී වාසය කළ යුත්තේ ය.'

**"තත්ථ කතමො රූපක්ඛන්ධො? යංකිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා අභිසංඛිපිත්වා අයං වුච්චති රූපක්ඛන්ධො."**

'එහි රූපස්කන්ධය නම් කවරේ ද? යත්— යම් කිසි අතීතානාගත ප්‍රත්‍යුත්පන්නරූපයෙක් ඇද්ද, අධ්‍යාත්මිකරූපයෙක් ඇද්ද, බාහිර වූ රූපයෙක් ඇද්ද, ඖළාරික වූ රූපයෙක් ඇද්ද, සියුම් වූ රූපයෙක් ඇද්ද, හීන වූ රූපයෙක් ඇද්ද, ප්‍රණීත වූ රූපයෙක් ඇද්ද, දූර වූ රූපයෙක් ඇද්ද, සමීප වූ රූපයෙක් ඇද්ද යන මේ එකොළොස් තන්හි සිටි ඒ රූපය ඒකරාශි කොට එකට බහා ලමින් මේ රූපස්කන්ධය' යි කියනු ලැබෙයි. ඒ උත්පත්ති වශයෙන් එකාදශස්ථානයෙක සිටියා වූ රූපස්කන්ධය පඨවි ධාත්වාදී විසින් 'පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු චක්ඛු සොත ඝාණ ජිව්හා කාය රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ඉත්ථත්ත පුරිසත්ත හදයවත්ථු ජීවිතින්ද්‍රිය ආකාසධාතු කායවිඤ්ඤත්ති ලහුතා මුදුතා කම්මඤ්ඤතා උපචය සන්තති ජරතා අනිච්චතා ය' යි කියා විසිඅට වැදෑරුම් වේ. එහි පඨවිධාතුව ද 'ඉසකේ ලොම් නිය දත් සම් මස් ඇට නහර ඇටමිදුළු වකුගඩු හෘදයවස්තු අක්මා දලබු බඩදිව පපු බඩවැල් අතුණුබහන් උදර අසුචි හිස්මිදුලු ය' යි කියා විසි කොට්ඨාසයෙක. ද්‍රව ලක්ෂණ වූ ආපොධාතුව ද 'පිත් සෙම සැරව රුධිර ඩහදිය මේදතෙල් කඳුළු වුරුණුතෙල් කෙළ සොටු සඳමිදුලු මූත්‍ර ය' යි කියා දෙළොස් කොට්ඨාසයෙක. 'මාංසයක් කුණු නො වන සේ ලූ ලුණක් මෙන් මේ ශරීරය කුණු විය නො දී පවත්නා උෂ්ණගතියෙක් ඇද්ද, හෙවත් යම් තෙජො ගුණයකින් මේ ශරීරසන්තානය සොකපරිදෙවාදිය ඇති වූ කල තැවේ ද, යම් තෙජො ගුණයකින් මේ ශරීරය දවා ද, යම් තෙජොගුණයකින් ශරීරය ජරාවට පැමිණේ ද, යම් තෙජොගුණයකින් කෑ බී අනුභව කළ රස විඳ ගත් සියලු ආහරජාතීහු පැසෙද් ද' යන මේ සතරකොට්ඨාසය ඇතුළු වූ යම් උෂ්ණ ගතියෙක් ඇත් නම්, හේ තේජොධාතු නම් වේ. මේ ශරීරය 'දරදණ්ඩක් මෙන් සිටිය නො දී **(498)** ඒ ඒ ක්‍රියාවෙහි පවත්වන්නා වූ යම් වායු ගුණයෙක් ඇද්ද, හෙවත් දෙපතුල පටන් සිරස දක්වා පවත්නා ඌර්ධ්වංගම

*Non-Commercial Distribution*

නම් වාත ය, සිරස පටන් දෙපතුල දක්වා පවත්නා අධොගම නම් වාත ය, කුක්ෂිගත ව බඩවැල පිට හැසිරෙණ කුච්ඡිසය නම් වාත ය, බඩවැල ඇතුළත හැසිරෙණ කොට්ඨාසය නම් වාත ය, දෙඅත් දෙපා ආදී වූ අංග ප්‍රත්‍යංගයන් ඇසුරු කරණ අංගමංගානුසාරි නම් වාත ය, ඉහළ පහළ නඟන බහන ආශ්වාස ප්‍රශ්වාස නම් වාත ය' යන මේ ෂඩ්විධ වාතය ප්‍රධාන කොට ඇති මේ ශරීරය ගමන පවන භොජනාදි සියලු ක්‍රියාවෙහි ම පවත්වන යම් ශක්තිගුණයෙක් ඇත් නම්, හේ වායොධාතු නම් වෙයි යන මේ සතරමහාධාතුහු ද නීල පීතාදී රූපදර්ශනයට කාරණ වූ චක්ෂුඃප්‍රසාදය ද, භෙරි වීණා මෙඝ ගර්ජනාදි ශබ්ද ශ්‍රවණයට කාරණ වූ ශ්‍රොත්‍රප්‍රසාදය ද, සුගන්ධදුර්ගන්ධාදිය ආඝ්‍රාණයට කාරණ වූ ඝ්‍රාණප්‍රසාදය ද, ආහාරපානාදී රසාස්වාදයට කාරණ වූ ජිහ්වාප්‍රසාදය ද, වස්ත්‍රාභරණ ස්ත්‍රීපුරුෂාදී ස්පර්ශග්‍රහණයට කාරණ වූ කායප්‍රසාදය ද යන ප්‍රසාදරූපපස ද, චක්ෂුසට ගොචර වූ රූපාලම්බනය ද, ශ්‍රොත්‍රයට ගොචර වූ ශබ්දලම්බනය ද, ඝ්‍රාණයට විෂය වූ ගන්ධාලම්බනය ද, දිවට විෂය වූ රසාලම්බනය ද, කායෙන්ද්‍රියට විෂය වූ ස්පර්ශාලම්බනය ද යන විෂයරූපපස ද, ස්ත්‍රීභාවය පුරුෂභාවය මනොධාතු මනොවිඥ්ඤාණධාතූන්ට ආධාර හෘදයවස්තුව ය, දෙහස්ථිතියට කාරණ වූ රූපජීවිතෙන්ද්‍රිය ද, දෙකන් සිදුරු නාසාබිල මුඛද්වාර උගුර මල මූත්‍ර මාර්ගයෝ ය යන අටසිදුරු හා කන බොන දෙය පිහිටන උදරපටල ය යන මේ නවය ප්‍රධාන කොට ඇති මේ ශරීරයෙහි යම් සිදුරුබවෙක් වී නම්, හේ ආකාශධාතු නම් වේ. වායු ධාත්වධික චිත්තජමහාභූතයන්ගේ 'ආකාරවිශෙෂ ය' යි කියන ලද කයින් අභිප්‍රාය අඟවන්නා වූ කායවිඥ්ඤප්තිය ද, පෘථිවිධාත්වධික චිත්තජමහාභූතයන්ගේ 'විකාර ය' යි කියන ලද සවිඥ්ඤාණක ශබ්ද සංඛ්‍යාත වචනයෙන් ඒ ඒ අභිප්‍රාය අඟවන්නා වූ ද, තෙමේත් ඇඟෙනු ලබන්නා වූ ද, වාග්විඥප්තිය ද, දවසක් මුළුල්ලෙහි ගින්නෙන් රත් වූ යකඩකඳක් මෙන් 'ශරීරයාගේ සැහැල්ලුබව ය' යි කියන ලද ලඝුත්වය ද, සුමර්දිතචර්මයක් මෙන් 'නො දැඩිබව' ය යි කියන ලද රූපමෘදුත්වය ද, යහපත් කොට ගින්නෙන් තැවූ ස්වර්ණයක් මෙන් ශරීරයෙන් කට යුතු වූ 'ක්‍රියාවට අනුකූලබව ය' යි කියන ලද රූපකර්මණ්‍යතාව ද, ගඟබඩ කැපූ කූපයාගේ පරිපූර්ණ උදකොද්ගමනය මෙන් එකාදශරූපායතනයන්ගේ මතුමත්තෙහි උත්පත්ති වශයෙන් 'අභිවෘද්ධි ය' යි කියන ලද උපචය ද, පරිපූර්ණ වූ කූපයෙන් පිටත ඉතිරී යාමක් මෙන් උක්තක්‍රමයෙන් උපදින රූපයන්ගේ නැවැත නැවැතත් ප්‍රබන්ධොත්පත්ති වශයෙන් 'ප්‍රවෘත්ති ය' යි කියන ලද සන්තතිය ද, රූපයන්ගේ උත්පාදවස්ථානයෙන් මත්තෙහි ජීර්ණ ව 'භංගාභිමුඛාවස්ථාව ය' යි කියන ලද ජරතාව ද, 'රූපයන්ගේ පරිභෙද ස්වභාව වූ 'අනිච්චතාව' දැ යි යන මේ අටවිසිරූපයෝ රුප්පණාර්ථයෙන් රූපනම්වේ. රාශි අර්ථයෙන් රූපස්කන්ධ නම් වේ.

වෙදනාස්කන්ධය නම්:— එම එකොළොස්තන්හි සිටියා වූ රූපයට ඉෂ්ටාලම්බනයෙක් වී නම් සැපවෙදනා වෙයි. අනිෂ්ටාලම්බනයක් වී නම් දුඃඛවෙදනා වෙයි. මධ්‍යස්ථඅරමුණෙක් වී නම් උපෙක්ෂාවෙදනා වෙයි. **(499)** නොහොත් 'චක්ඛුසම්ඵස්සජා වෙදනා' යනාදි විසින් දක්වූ සවැදෑරුම් වූ ත්‍රිවිධවෙදනාව මනාප වූ රූපය දැක සැපවෙදනා උපදී. අමනාප වූ රූපය දැක දුඃඛවෙදනා උපදී. ප්‍රියාප්‍රිය විරහිත වූ භූමි පර්වත කැට කැබිලිති ආදි මධ්‍යස්ථරූප දැක උපෙක්ෂාවෙදනාව උපදී. මෙසෙයින් මනාපශබ්දය අසා මනාපගන්ධය ආඝ්‍රාණය කොට මනාපරසය වළඳා සවිඤ්ඤාණක අවිඤ්ඤාණක ප්‍රියවස්තු ස්පර්ශ කිරීමෙන් මනාප දෙය සිතීමෙන් සැපවෙදනා උපදී. අමනාපවස්තු සිතීමෙන් දුක්ඛවෙදනා උපදී. මනාප අමනාප විරහිතචින්තාවෙන් උපෙක්ෂාවෙදනා උපදී. මෙසේ විස්තාරයට ගියා වූ චක්ෂුරාදිසදෙරින් උපදනා වෙදනාව වෙදනා-ස්කන්ධ නම් වෙයි.

සංඥාස්කන්ධය නම්:— ඇසින් දුටු නීලපීතාදි රූපයන්, 'මේ අසවල් රූපය' යනාදී වසයෙන් හැඳිනීම ය, එසේ ම කණින් ඇසූ භෙරි වීණා මෘදංගාදිශබ්දයන් වෙන් වෙන් කොට හැඳිනීම ය, නාසයෙන් ආඝ්‍රාණය කළ සුගඳ දුගඳ වෙන් වෙන් කොට හැඳිනීම ය, දිවින් විඳි රසයන් 'මේ ලුණුරස ය, මේ ඇඹුල්රස ය, මේ පැණිරස ය, මේ කිරිරස ය, මේ තෙල් රස ය' යනාදි වසයෙන් වෙන් වෙන් කොට හැඳිනීම ය, කයින් ස්ප්‍රෂ්ටව්‍යය ස්පර්ශ කොට 'මේ සැපස්පර්ශ ය, මේ දුඃඛස්පර්ශ ය' යනාදි වසයෙන් තේරුම් කොට හැඳිනීම ය, මනසින් ධර්මයන් චින්තනය කොට 'මේ අසවල් දේ ය, මේ අසවල් දේ ය' යනාදි වසයෙන් වෙන් වෙන් කොට හැඳිනීම ය යන මේ ෂඩ්විධ වූ සංඥාව සංඥාස්කන්ධ නම් වේ.

සංස්කාරස්කන්ධය නම්:—

**"සඞ්ඛාරො චෙතනා ඵස්සො–මනසිකාරොයුසංයිති,**
**තක්කො චාරො ච වායාමො–පීති ඡන්දාධිමොක්ඛකො.**

**සද්ධා සති හිරොත්තප්පං–චාගො මෙත්තා මතී පුන,**
**මජ්ඣත්තතා ච පස්සද්ධි–කායචිත්තවසා ද්වෙ.**

**ලහුතා මුදු කම්මඤ්ඤ–පාගුඤ්ඤ උජ්ජුතා තථා,**
**දයා මුදු සම්මාවාචා–කම්මන්තාජීව සංවරො.**

**ලොභො දොසො ච මොහො ච–දිට්ඨි උද්ධච්චමෙව ච,**
**අහිරිකමනොත්තප්පං–විචිකිච්ඡිතමෙව ච.**

**මානො ඉස්සා ච මච්ඡෙරො–කුක්කුච්චං ථිනමිද්ධකං**
**ඉති එතානි පඤ්ඤාස–සංඛාරක්ඛන්ධ සඤ්ඤිතා."**

*Non-Commercial Distribution*

යනු හෙයින් ප්‍රථම කොට උදැසන්හි ගිත්ති ආදියෙහි පැතිර වැද ස්පර්ශ වන අවුරශ්මියක් සේ ප්‍රථම කොට චක්ෂුඃශ්‍රොත්‍රාදීන් රූපශබ්දාදිය දැක අසා ඒ ඒ අරමුණු හා ගැටෙන ආකාරයෙන් පවත්නා වූ ස්පර්ශය ද, ගොවියෙක් තමන් යහළුවන් දෙපණස්දෙනෙකුන් සමග සීසෑම් ගොයම් කැපීම් ආදියකට තමන් කුඹුරට ගියේ සෙසු දෙපණස්දෙනාට වඩා ඕනෑකමින් මහත් උත්සාහයෙන් යෙදී ඒ ඒ කට යුතු කෙරේ ද, එපරිද්දෙන් සෙසු දෙපණස්ධර්මයන්ට වඩා මහත් උත්සාහවත් ලක්ෂණයෙන් යුක්ත ව **(500)** ඒ සියලු ධර්මයන් විසිර යා නො දී ආරම්මණයෙහි හසුරුවන්නා වූ චේතනාව ද, ආජානීයඅශ්වයන් මෙහෙයන්නා වූ සාරථියෙකු මෙන් සහජාත ධර්මයන් ආලම්බනාභිමුඛ කොට මෙහෙයන්නා වූ මනස්කාරය ද, උත්පලාදීන්ට ජලය මෙන් සහජාතඅරූපධර්ම පරිපාලනයෙහි ආධිපත්‍යය කරණ ආයු සංඛ්‍යාත ජීවිතේන්ද්‍රිය ද, යුද්ධමණ්ඩලයකට මහානරේන්ද්‍රයකු පිරිවරා ගෙණ ගිය සෙනඟක් ඒ මහරජ්ජුරුවන් වහන්සේ වැඩිය වැඩිය තැනකට ම යෙද්ද, ඒ සියලු සෙනඟ එකරාසි කිරීමට ප්‍රධාන වූ නරේන්ද්‍රයන් සේ ඵස්සාදි සෙසු සියලු ධර්මයන් විසිර යා නො දී එක් ආරම්මණයෙක සම්පිණ්ඩනය කරණ චිත්තෛකාග්‍රතාව ද, ඝණ්ටාරයෙහි ප්‍රථම කොට වදින පහරක් මෙන් අරමුණට ප්‍රථම කොට චිත්තය නැඟීම ලක්ෂණ කොට ඇති විතර්කය ද, ඒ පහරින් නැංහා වූ රාවය ඝණ්ටාරයෙහි පවත්නා සේ විතර්කයෙන් අරමුණට නැඟුන චිත්තයාගේ නැවැත නැවැත පවත්නා ලක්ෂණ ස්වභාව වූ විචාරය ද, සියලු කට යුතු කෘත්‍යයෙහි පසු බට නො වන යොධභටයකු සේ හැම ක්‍රියායෙහි උත්සාහලක්ෂණය වූ වීර්යය ද, පැන් නැති ග්‍රීෂ්මකාලයෙහි කාන්තාරමාර්ගයෙහි පිපාසායෙන් මිරිකියන පුරුෂයක්හට පස්පියුමෙන් ගැවසුන සිහිල්පැන් දැක උපදනා චිත්ත පිණවීම් සේ ඉෂ්ටාලම්බනයෙහි උපදනා චිත්තප්‍රීතිය ද, ආලම්බනග්‍රහණයෙහි සිතින් අත දිගු කරන්නාක් මෙන් කත්තුකම්‍යතා ලක්ෂණ වූ ඡන්දය ද, නිශ්චල වූ ඉන්ද්‍රඛීලයක් මෙන් අරමුණෙහි සන්නිට්ඨාන ලක්ෂණ වූ අධිමොක්ෂය ද, චක්‍රවර්තීන්ගේ චතුරංගිණීසෙනා ගමනින් කැලඹී ගිය ජලයක් ප්‍රසන්න කරණ උදකප්‍රසාදකමාණික්‍යරත්නයක් මෙන් ලොභාදිචිත්තක්ලේශයන් පහදවන ලක්ෂණ වූ ශ්‍රද්ධාව ද, මහරජක්හට කළ මනා නො කළ මනා සියලු ම කට යුතු සඳහන් කරවන විශ්වාස අමාත්‍යයකු සේ අකුසලධර්මයන් හරිණ සේ කුසලධර්මයන් කරණ සේ සිහි කරණ ලක්ෂණ වූ ස්මෘතිය ද, අකුශලක්‍රියාවෙහි ලජ්ජා ස්වභාව වූ හිරිය ද, අකුශලක්‍රියායෙහි භය ස්වභාව වූ ඔත්තප්පය ද, පියුම් පත්‍රයෙක්හි පතිත ජලබින්දුවක් සේ දුටු ඇසූ කිසි අරමුණෙක ඇලීම නො කරන්නා වූ අලොභය ද, අනුකූලමිත්‍රයකු සේ අවිරුද්ධ ස්වභාව වූ අද්වේෂය ද, අන්ධකාරයෙහි රූපයන් ප්‍රකාශ කරණ ප්‍රදීපයක් සේ අවිද්‍යාන්ධකාරය විධමනය කොට සියලු හොඳ නො හොඳ ප්‍රකාශ කරණ ලක්ෂණ වූ ප්‍රඥාව ද, සම්ප්‍රයුක්තචෛතසිකධර්මයන් ස්වකීය කෘත්‍යයෙහි සම්ප්‍රවර්තනයට හෙතු වූ තත්‍රමධ්‍යස්තාව ද, වෙදනාදි ස්කන්ධත්‍රය-

*Non-Commercial Distribution*

යාගේ දරථ ය යි කියන ලද උද්ධතාදික්ලේශයන් සන්හිඳුවන කාය-ප්‍රශ්‍රබ්ධිය ද, විඥනස්කන්ධයාගේ දරථ ය යි කියන ලද උද්ධතාදී ක්ලේශයන් සන්හිඳුවන චිත්තප්‍රශ්‍රබ්ධිය ද, වෙදනාදි ස්කන්ධත්‍රයයාගේ දනශීලාදි පුණ්‍යකර්මයෙහි අයොග්‍යතා ය යි කියන ලද කාමච්ඡන්දදික්ලේශයන් සන්හිඳුවන කායලහුතාව ද, විඥනස්කන්ධයාගේ ගරුභාවය යි කියන ලද ථිනමිද්ධාදික්ලේශයන් සන්හිඳුවන චිත්තලහුතාව ද, වෙදනාදි ස්කන්ධත්‍රයයාගේ ස්තබ්දභාවය යි කියන ලද දෘෂ්ටිමානාදීන් සන්හිඳුවන කායමෘදුත්වය ද, විඥනස්කන්ධයාගේ ස්තබ්ධභාවය යි කියන ලද දෘෂ්ටි මානාදීන් සන්හිඳුවන චිත්තමෘදුත්වය ද, වෙදනාදිස්කන්ධත්‍රයයාගේ ද, දනශීලාදිපුණ්‍යකර්මයෙහි අයොග්‍යතා ය යි කියන ලද කාමච්ඡන්දදි ක්ලේශයන් **(501)** සන්හිඳුවන කායකර්මණ්‍යතාව ද, විඥනස්කන්ධයාගේ දනශීලාදි පුණ්‍යකර්මයෙහි අයොග්‍යතා ය යි කියන ලද කාමච්ඡන්දදීන් සන්හිඳුවන චිත්තකර්මණ්‍යතාව ද, වෙදනාදිස්කන්ධත්‍රයාගේ ගෙලඤ්ඤ ය යි කියන ලද අස්සද්ධි ආදීන් සන්හිඳුවන කායප්‍රාගුණ්‍යතාව ද, විඥනස්-කන්ධයාගේ ගෙලඤ්ඤ ය යි කියන ලද අස්සද්ධි ආදීන් සන්හිඳුවන චිත්තප්‍රාගුණ්‍යතාව ද, කායසංඛ්‍යාත වූ වෙදනා සංඥ සංස්කාර යන ස්කන්ධත්‍රයයාගේ කුටිලභාවකර වූ මායාසාඨෙය්‍යාදි අකුශලයන් සන්හිඳු වන කායඍජුත්වය ද, විඥනස්කන්ධයාගේ වංකස්වභාව ය යි කියන ලද මායා සාඨෙය්‍යාදි අකුසල් සන්හිඳු වන චිත්තඍජුත්වය ද, දුඃඛිතසත්ව යන්ගේ දුක් පහ කරණු කැමැත්තා වූ කරුණාව ද, පරලාභසත්කාර කීර්ති ප්‍රශංසායෙහි මොදන ලක්ෂණ වූ මුදිතාව ද, බොල් සුළගේ හැර වී රුස් කරණ ගොවියකු සේ මුසාවාදදිය දුරු කොට වාක්සත්‍යය පැවැත් වීම් ලක්ෂණ වූ සම්‍යග්වචනය ද, අසුචි මලමූත්‍රාදිය අත ගානා ලදරුවකු සේ නො කොට කළ මනා සාරවත් කට යුතු ම කරණ ප්‍රඥවන්තයකු සේ යහපත් කායකර්ම ස්වභාව වූ සම්‍යක්කර්මාන්තය ද, රත්රන් දවා පිරිසිදු කරණ ස්වර්ණකාරයකු සේ ජීවිකාව පිරිසිදු කිරීම් ලක්ෂණ කොට ඇති සම්‍යක්ආජීවය ද, රූපශබ්දදියෙහි පඤ්චෙන්ද්‍රියන්ගේ ඇලීම ලක්ෂණ කොට ඇති ලොභය ද, දණ්ඩෙන් ගැසූ නයකු කිපෙන්නා සේ කිපීම ලක්ෂණ කොට ඇති ද්වෙෂය ද, චතුස්සත්‍යය නො දන්නා මොහය ද, 'මෙලෝ නැත, පරලෝ නැත' යනාදීන් ගන්නා මිථ්‍යාදෘෂ්ටිය ද, සිත නො සන්සුන්බව ලක්ෂණ වූ උද්ධච්චය ද, ග්‍රාමශූකරයා අසුචියට කැත නැත්තා සේ පාපයට ලජ්ජා නැතිබව ලක්ෂණ වූ අහිරිකය ද, ප්‍රදීපයට සලභයා නො බාව පතින්නා සේ පාපයට භය නැතිබව ලක්ෂණ වූ අනොත්තප්පය ද, බුද්ධ ධර්ම සංඝ ශික්ෂා පූර්වාන්ත අපරාන්ත පූර්වාපරාන්ත ඉදප්පච්චයතා යනාදි ප්‍රතීත්‍යසමුත්පන්නධර්මය යන අට තැන සැක සිතන්නා වූ විචිකිච්ඡාව ද, 'මම සියල්ලන්ට වැඩිතරමැ' යි සිතන්නා වූ මානය ද, අනුන් කෙරෙහි කරණ ඊර්ෂ්‍යාව ද, 'තමාගේ සියලු ඓශ්වර්ය වෙන කෙනෙකුන්ට නො වේව' යි සිතන්නා වූ මාත්සර්යය ද, කළ නො කළ දෙයෙහි තැවීම් ලක්ෂණ වූ කුක්කුච්චය ද, චිත්තය හැකිළීම

Non-Commercial Distribution

ලක්ෂණ වූ ථීනය ද, කාය අකර්මණ්‍ය ලක්ෂණ වූ මිද්ධය ද යන මේ ගාථා නිර්දිෂ්ට පණ්ඨර්මයෝ වනාහි සංස්කාරස්කන්ධය නම් වේ.

විඥනස්කන්ධය නම්:— ඇසෙහි උකුණුහිසක් ප්‍රමාණ වූ අභිමුඛ ගත රූපයන් දක්නා චක්ෂුඃප්‍රසාදයෙන් දුටු නීලපීතාදිවර්ණයන් දැන ගන්නා චක්ෂුර්විඥනය ද, ශ්‍රොත්‍රයෙහි සිහින් තඹමුන්දක් ප්‍රමාණ වූ රොමයෙන් නොයෙක් ශබ්ද අසා දැන ගන්නා වූ ශ්‍රොත්‍රවිඥනය ද, නාසිකාවෙහි එළුවන්ගේ පියවර සටහන් බඳු වූ සුගඳ දුගඳ අසන්නා වූ ඝ්‍රාණප්‍රසාදයෙන් ගන්ධාඝ්‍රාණය කොට දැන ගන්නා වූ ඝ්‍රාණවිඥනය ද, දිවෙහි මහනෙල් මල් පෙත්තකට බඳු වූ සටහන් ඇති නොයෙක් රස විඳින්නා වූ ජිව්හා ප්‍රසාදයෙන් රසය විඳ දැන ගන්නා වූ ජිහ්වාවිඥනය ද, කයින් ලැබූ ස්පර්ශය දැන ගන්නා වූ කායවිඥනය ද, සිතින් සිතූ නොයෙක් සිතිවිලි දැන ගන්නා වූ මනොවිඥනය ද යන මේ ෂඩ්විධ වූ විඥනය ද, සතරඅපායෙහි පිළිසිඳ **(502)** ගන්නා වූ අකුශලවිපාක අහෙතුකමනොවිඥනධාතු චිත්තය ද, මිනිස්ලොව ජාත්‍යන්ධ බධිර උමතු ගොළු බිහිරි ආදි සත්වයන් පිළිසිඳ ගන්නා වූ කුශලවිපාක අහෙතුකමනොවිඥනධාතුචිත්තය ද, දෙවියන් හා මිනිස්ලොව පින්වත් සත්වයන්ගේ පිළිසිඳ ගැණීමට හේතු වූ සහෙතුක කාමාවචරවිපාකසිත් අට ද, රූපිබ්‍රහ්මලොකයෙහි පිළිසිඳ ගැණීමට හේතු වූ රූපාවචර විපාකසිත් පස ද, අරූපිබ්‍රහ්මලොකයෙහි උපදවන අරූපාවචර විපාකසිත් සතර ද, 'සොමනස්ස සහගතං දිට්ඨිගතසම්පයුත්තමසංඛාරික මෙකං, සසංඛාරික මෙකං' ඉෂ්ටානුභවලක්ෂණ කොට ඇති සොමනස්ස සහ ගියා වූ අනිත්‍යතාදි ධර්මස්වභාව හැර නිත්‍ය සුබ ස්වභාදි වසයෙන් විපරීත වූ මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත වූ තමා විසින් හෝ අන්‍යයන් විසින් හෝ කරණ ලද පූර්වප්‍රයොග විරහිත හෙයින් අසංඛාරික වූ එක් අකුශල චිත්තයෙක, තමා විසින් හෝ අන්‍යයා විසින් හෝ කරණ ලද පූර්වප්‍රයොග සහිත වූ හෙයින් සසංඛාරික වූ එක් අකුශලචිත්තයෙක, සොමනස් සහගියා වූ කාමයෙහි ආදිනවයෙක් නැතැ යි යනාදීන් ගත් මිථ්‍යාදෘෂ්ටිය හා අමිශ්‍ර වූ අනික් කෙනෙකුන් විසින් උත්සාහයක් නැති ව ස්වභාව තීක්ෂණ වූ සිතින් ම කාමසෙවනාදිය කරණ කල උපදනා අසංඛාරික වූ එක් අකුශලචිත්තයෙක, එසේ ම සොමනස් සහගියා වූ මිථ්‍යාදෘෂ්ටිය හා අමිශ්‍ර වූ අන්‍යොත්සාහ සහිත වූ සිතින් කාමසෙවනාදිය හෝ දෘෂ්ටමංගලාදිය හෝ සාර ය යි ගන්නා කල උපදනා සසංඛාරික වූ එක් අකුශලචිත්තයෙක, මධ්‍යස්ථානුභව ලක්ෂණ වූ උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදදිභාවයට ගියා වූ විපරීතමිථ්‍යාදෘෂ්ටියෙන් සම්ප්‍රයුක්ත වූ එක් අසංඛාරිකඅකුශල චිත්තයෙක, එසේ ම සසංඛාරික වූ එක් අකුශලචිත්තයෙක, උපෙක්ෂා සහගත වූ විපරීතමිථ්‍යාදෘෂ්ටිය හා මිශ්‍ර නො වූ අසංඛාරික වූ එක් අකුශල චිත්තයෙක, උපෙක්ෂාසහගත වූ විපරීත වූ මිථ්‍යාදෘෂ්ටිය හා මිශ්‍ර නො වූ එක් සසංඛාරිකඅකුශලචිත්තයෙක යන මේ ලොභ සහගත වූ අකුශල චිත්තයෝ අටදෙන ද, අනිෂ්ටානුභව ලක්ෂණ වූ මානසිකදුඃඛවෙදනාව

සහගත වූ චණ්ඩස්වභාව වූ අරමුණෙහි ඝැටෙමින් උපදනා ප්‍රතිඝයෙන් සම්ප්‍රයුක්ත වූ අසංඛාරික වූ එක් අකුශලචිත්තයෙක, එසේ ම දෙම්නස් සහගත වූ ප්‍රතිඝයෙන් සම්මිශ්‍ර වූ සසංකාරික වූ එක් අකුශලචිත්තයෙක යන මේ ද්වේෂසහගතචිත්තයෝ දෙදෙන ද, උපෙක්ෂා සහගියා වූ බුද්ධාදි අටතැන්හි ඇද්ද නැද්දෝ හෝ යි උපදනා සංශයලක්ෂණ වූ විචිකිච්ඡාවෙන් සම්ප්‍රයුක්ත වූ එක් අකුශලචිත්තයෙක, ආලම්බනයෙහි නො සන්සුන්බවය යි කියන ලද උද්ධච්චය හා එකොද්පාදදිප්‍රකාරයෙන් යුක්ත වූ එක් අකුශලචිත්තයෙක යන මොමුය්හචිත්තයෝ දෙදෙන ද යන මෙකී දෙලොස්අකුශලචිත්තයෝ ද, උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදදිභාවයට ගියා වූ රුපදර්ශනයට කාරණ වූ චක්ෂුඃප්‍රසාදය ආශ්‍රය කොට පවත්නා චක්ෂුර්විඥනය ද, එසේ ම උපෙක්ෂාසහගත වූ ශබ්දශ්‍රවණයට හෙතු වූ ශ්‍රොත්‍රප්‍රසාදය ආශ්‍රය කොට පවත්නා වූ ශ්‍රොත්‍රවිඥනය ද, ගන්ධාඝ්‍රාණයට කාරණ වූ ඝ්‍රාණප්‍රසාදය ආශ්‍රය කොට පවත්නා වූ ඝ්‍රාණවිඥනය ද, රසාස්වාදයට හෙතු වූ ජිව්හාප්‍රසාදය ආශ්‍රය **(503)** කොට පවත්නා ජිහ්වාවිඥනය ද, ස්ප්‍රෂ්ටව්‍යස්පර්ශයට හෙතු වූ කායප්‍රසාදය ආශ්‍රය කොට පවත්නා දුඃඛසහගත වූ කායවිඥනය ද, උපෙක්ෂා සහගියා වූ රූපාදීන් පිළිගණිමින් උපදනා සම්පටිච්ඡන්නචිත්තය ද, උපෙක්ෂා සහගියා වූ රූපාදීන් තීරණය කෙරෙමින් උපදනා සන්තිරණචිත්තය ද යන මෙ අකුශලවිපාකචිත්තයෝ සත්දෙන ද, උපෙක්ෂා සහගත වූ රූපදර්ශනයට හෙතු වූ චක්ෂුඃප්‍රාසදය ආශ්‍රය කොට පවත්නා වූ චක්ෂුර්විඥනය ද, එසේ ම ශ්‍රොත්‍රවිඥනය ද, ඝ්‍රාණවිඥනය ද, ජිව්හාවිඥනය ද, ඉෂ්ට වූ කාය චිත්ත සැප සහගත වූ කායවිඥනය ද, උපෙක්ෂාසහගත වූ රූපාදි අරමුණු පිළිගන්නා වූ සම්පටිච්ඡන්නචිත්තය ද එසේ ම පිළිගත් රූපශබ්දදි අරමුණු විමසන්නා වූ සන්තීරණචිත්ත ය යි කියන ලද කුශලවිපාක අහෙතුක මනොවිඤ්ඤාණධාතුව ද, සෞමනස්‍යසහගත වූ සැපවෙදනා ඇති සන්තීරණචිත්තය ද යන මේ අෂ්ටවිධ වූ කුශලවිපාක අහෙතුකචිත්තයෝ ද, උපෙක්ෂාසහගත වූ චක්ෂුරාදි පඤ්චද්වාරයෙහි වැදගත් රූපාදී අරමුණට චිත්තසන්තතිය යොමු කරණ පඤ්චද්වාරාවර්ජනචිත්තය ද, උපෙක්ෂා සහගත වූ මනොද්වාරයට හමු වූ රූපාදී අරමුණට චිත්තසන්තතිය යොමු කරණ මනොද්වාරාවර්ජනචිත්තය ද, සොම්නස් සහගියා වූ අනෞදරික ආලම්බනයෙහි රහතුන්ට සිනා උපදවන හසිතොත්පාදචිත්තය ද යන මේ අහෙතුකක්‍රියාසිත් තුණ ද, අකුශලවිපාක කුශලාහෙතුකවිපාක ක්‍රියා භෙද වශයෙන් දක් වූ මේ සමතිස්චිත්තයෝ ද, නිර්මලානිසංස දක්නා බැවින් හා විශුද්ධ ශ්‍රද්ධා දෘෂ්ටි ප්‍රත්‍යය ප්‍රතිග්‍රාහකාදි සම්පත්තියෙන් මානසිකසුඛවෙදනාව හා එකොත්පාදදිභාවයෙන් සොම්නස්සහගත වූ නිරවද්‍ය ශිල්ප ග්‍රහණ ධාරණ ක්ලේශයන්ගේ දූරීභාව ඉන්ද්‍රිය පරිපාකයෙන් ද යි යනාදි කාරණයෙන් ඤාණය හා සම්ප්‍රයුක්ත වූ අනික් කෙනකුන් විසින් උත්සාහයක් නැති ව ස්වභාව තීක්ෂණ වූ සිතින් ම දනශීලාදි පින් කරණ කල උපදනා අසංඛාරික වූ එක් කුශලචිත්තයෙක, සොම්නස්

Non-Commercial Distribution

සහගත වූ ඥාණය හා සම්ප්‍රයුක්ත වූ 'දන් දෙව, පින් කරව' යනාදීන් අනෝත්සාහ සහිත වූ සිතින් දනාදි පින් කරණ කල උපදනා සසංඛාරික එක් කුශලචිත්තයෙක, ඉෂ්ටානුභවලක්ෂණමානසික සුඛවෙදනාදි කාරණ යෙන් සොම්නස් සහගත වූ දෙමවුපියන්ගේ පුණ්‍යක්‍රියාදර්ශනයෙහි සංජාත පරිචය ඇති බාලදරුකයෝ භික්ෂූන් දැක සොම්නස් උපදවා වහා දිව ගොස් අත තුබූ කිසිවක් දෙද් ද, වඳිද් ද, එකල ඔවුන්ට සොම්නස් සහගත වූ ඥානවිප්‍රයුක්ත වූ අසංඛාරික වූ කුශලචිත්තයෙක් උපදනේ ය. විශුද්ධ ශ්‍රද්ධාබුද්ධිසම්පන්න සත්පුරුෂජනයන් ධාතු පෙතිපිළිම සඟුරුවන් දැක තමන් දරුවන් ලං කොට 'පුතණ්ඩ, අප බුදුරුවන් වඳුව, පුදව' යනාදීන් උත්සාහිත වූවාහු සතුටු ව, වඳිද්ද, පුදද් ද, එකල සොම්නස්සහගත වූ ඥානවිප්‍රයුක්තසසංඛාරික වූ කුශලචිත්තයෙක් උපදනේ ය. උපෙක්ෂා සහගත වූ ඥානය හා සම්ප්‍රයුක්ත වූ අසංඛාරික වූ එක් කුශලචිත්තයෙක, සසංඛාරික එක් කුශලචිත්තයෙක, උපෙක්ෂා සහගත වූ ඥානය හා අසම්මිශ්‍ර වූ අසංඛාරික එක් කුශලචිත්තයෙක, සසංඛාරික එක් කුශලචිත්තයෙක, බලවත් ශ්‍රද්ධාය විශුද්ධදෘෂ්ටිය යන ආනිසංසදර්ශනය ද, ප්‍රත්‍යය ප්‍රතිග්‍රාහක යන සොම්නස් ඉපදීමට හෙතු වූ මේ සතරඅර්ථවිකල්පයෙහි ම සොම්නස් **(504)** රහිත වූ සිත් ඇති වෙද් ද, එකල මෙ කී සතර සිත උපෙක්ෂාසහගත වූ උපදනේ ය යන මේ කාමාවචරකුසල්සිත් අට ද 'සොමනස්ස සහගතං' යනාදි මෙකී ක්‍රමයෙන් ම දක් වූ කාමාවචර සහෙතුකකුශලවිපාකසිත් අටෙක, කාමාවචර සහෙතුක ක්‍රියාසිත් අටෙකැ යි කියා කාමාවචර කුසල්සිත් සූවිස්සෙක, විතක්ක විචාර ප්‍රීති සුඛෙකාග්‍රතා සහිත වූ ප්‍රථමධ්‍යානකුශලචිත්තය ද, විචාරප්‍රීතිසුඛෙකාග්‍රතා සහිත වූ ද්විතීයධ්‍යානකුශලචිත්තය ද, ප්‍රීතිසුඛෙග්‍රතා සහිත වූ තෘතීයධ්‍යාන කුශලචිත්තය ද, සුඛෙග්‍රතා සහිත වූ චතුර්ථධ්‍යාන කුශලචිත්තය ද, උපෙක්ඛෙකග්ගතා සහිත වූ පංචමධ්‍යානකුශලචිත්තය ද, මෙසේ යථොක්ත ක්‍රමයෙන් ම විපාකසිත් පසෙක, ක්‍රියාසිත් පසෙකැ යි රූපාවචරසිත් පසළොසෙක, අරූපාවචර කුසල්සිත් සතරෙක, විපාකසිත් සතරෙක, ක්‍රියාසිත් සතරෙකැ යි දෙළසෙක් වේ. 'සොතාපත්ති මග්ගචිත්ත' යනාදි දෙශනානුක්‍රමයෙන් මාර්ග සිත් සතරෙක, ඵලසිත් සතරෙකැ යි ලොකොත්තර සිත් අටෙක් වේ. යන මේ එකුන්අනූවක් පමණ චිත්ත විඥනස්කන්ධ නම් වෙයි. සියලු සංසාරදුක් ගන්නා වූ මේ යථොක්ත වූ පඤ්චස්කන්ධයන් කෙරෙහි ම රූපාදි පඤ්චස්කන්ධයන්ගේ උත්පත්තිය හා ක්ෂය භංගාදි විනාසය දක්නා සමපණස්විධ වූ උදයව්‍යානුදර්ශන ඥනයෙන් යුක්ත ව වාසය කළ යුත්තේ ය.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මීයාගේ එක් අංගයක් ගත යුතු ය' යි කියා යමක් වදාළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ ද?''යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ මූෂිකතෙමේ ඔබිනොබ හැසිරෙමින් අනුභවයට නිසි වූ ආහාරයක් පතමින් ම හැසිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ඔබිනොබ

හැසිරෙමින් යොනිසොමනස්කාරය පැතීමෙන් ම යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, උන්දුරයාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම ගුණාංගය **වංගන්තපුත්‍ර** වූ **උපසෙනස්ථවිරයන්** වහන්සේ විසින්:—

**"ධම්මසීසං කරිත්වාන–විහරන්තො විපස්සකො,**
**අනොලීනො විහරති–උපසන්තො සදා සතො" යි.**

'හැම කල්හි සිහි ඇත්තා වූ සන්හුන්නා වූ විදර්ශක භික්ෂුතෙම ප්‍රඥ ප්‍රධාන කොට ගෙණ වාසය කෙරෙමින් කාමරාගාදියෙහි නො ඇලී වාසය කරන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය."

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ගෝනුස්සාගේ එක් අංගයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ දැ?"යි විචාළෝ ය. "මහරජානෙනි, යම් සේ තමාගේ නඟුට ම ආයුධයක් කොට ඇති ගෝනුසුතෙම ඒ නංගුලායුධය ම ඌර්ධව කොට නගා ගෙණ හැසිරෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ඥාණායුධයෙන් ම යුක්ත විය යුත්තේ ය. ඥාණායුධය ම ඌර්ධව කොට නගා ගෙණ වාසය කළ යුත්තේ ය. මහරජානෙනි, ගෝනුස්සාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය **වංගන්තපුත්‍ර** වූ **උපසෙන** ස්ථවිරයන් වහන්සේ විසින් ම:—

(505) **"ඤාණඛග්ගං ගහෙත්වාන–විහරන්තො විපස්සකො,**
**පරිමුච්චති සබ්බභයා–දුප්පසහො ච සො භවෙ" යි.**

'ඥානඛඩ්ගය ගෙණ විහරණය කරන්නා වූ විදර්ශකභික්ෂුතෙම සියලු ම සංසාර භයින් මිදෙන්නේ ය. ඒ යොගාවචර භික්ෂුතෙම කිසිවකු විසින් මැඩ ලිය නො හැකි වන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය."

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මුගටියාගේ එක් අංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ දැ?" යි විචාළෝ ය. "මහරජානෙනි, යම් සේ නාගයන් හා යුද්ධයට එළඹෙන්නා වූ මුගටිතෙම බෙහෙතින් ශරීරය ව්‍යාප්ත කොට ගෙණ නයින් අල්වා ගන්නට එළඹෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ක්‍රොධබහුල ව කලහවිග්‍රහවිවාදවිරොධයෙන් වෑඩුනා වූ ලොකයා කරා එළඹෙන කල්හි සිසිරතර මෛත්‍රී බෙහෙතින් සිත ගල්වා ගත යුත්තේ ය. මහරජානෙනි, මුගටියාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය සද්ධර්ම සෙනාධිපති වූ අනුබුද්ධ වූ **ශාරිපුත්‍රමහාථෙර** සාමීන් වහන්සේ විසින් ද:—

**"තස්මා සකං පරෙසම්පි–කාතබ්බා මෙත්තභාවනා,**
**මෙත්තචිත්තෙන ඵරිතබ්බං–එතං බුද්ධාන සාසනං" යි.**

*Non-Commercial Distribution*

'ක්ෂණමාත්‍රකාලයකුදු මෛත්‍රීභාවනා කළාහට සසර අනන්ත සම්පත් දෙන්නේ ය. ඒ කාරණයෙන් තමන් සම්බන්ධි වූ ස්වකීය ජනයා කෙරෙහි ද, අනුන් කෙරෙහි ද මෛත්‍රීභාවනා කළ යුත්තේ ය. ඌර්ධවාධොසරස යන සමස්තලොකය මෛත්‍රීසිතින් ස්පර්ශ කළ යුත්තේ ය. හිතාහිත සකල සත්වයන් කෙරෙහි මෛත්‍රී පතුරුවන්නා වූ මේ කාරණය නම් කාලත්‍රයවර්ති වූ අනන්ත සර්වඥයන් වහන්සේලාගේ අනුශාසනාවෙකැ' යි කියා වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මහලු ශෘගාලයාගේ අංගද්වයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ මහලු ශෘගාලතෙම යම්කිසි භොජනයක් ලැබ පිළිකුල් නො වී ම හැකි තාක් අනුභව කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් පිණ්ඩපාත භොජනය ලැබ පිළිකුල් නො වී ම ශරීරය යැපෙන පමණක් වැළඳිය යුත්තේ ය. මහරජානෙනි, මහලු ශෘගාලයාගේ මේ පළමුවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය **මහකාශ්‍යපස්ථවිරයන්** වහන්සේ විසින්:—

**''සෙනාසනම්හා ඔරුය්හ-ගාමං පිණ්ඩාය පාවිසිං,**
**භුඤ්ජන්තං පුරිසං කුට්ඨිං-සක්කච්චං තං උපට්ඨහිං.**
**සො මෙ පක්කෙන හත්ථෙන-ආලොපං උපනාමයි,**
**ආලොපං පක්ඛිපන්තස්ස-අංගුලි පෙත්ථ ඡිජ්ජථ.**
**කුඩ්ඩමූලඤ්ච නිස්සාය-ආලොපං පරිභුඤ්ජිහං,**
**භුඤ්ජමානෙව භුත්තෙ වා-ජෙගුච්ඡං මෙ න විජ්ජති''** යි.

**(506)** යනුවෙන් 'ඇවැත්නි, මම අලුයම නැඟී සිට කළමනා වතාවත් කොට නිමවා පාසිවුරු ගෙණ සෙනාසනයෙන් බැස පිඬු පිණිස ගම්දෙරට ගියෙමි. එකල ඒ ගම්හි සර්වජනප්‍රතිකූල්‍ය වූ ඉතා නපුරු වූ කුෂ්ටරොගය කින් පෙළිපෙළී දුක් විඳමින් අනුභව කළ යුතු භොජනයක් ලදින් ඒ භොජනය අනුභව කෙරෙමින් හුන් කුෂ්ටරොගිපුරුෂයා දැක ඔහුට වැඩක් සාධනු පිණිස භික්ෂාචර්යාවතින් සකසා ඔහු කරා ගොස් පෙණෙන සේ ලඟ සිටියෙමි. ඒ කුෂ්ටරොගියා මා දැක ප්‍රසන්න ව අනික් පිදිය යුතු වූ දනක් නො ලදින් තමන් අනුභව කෙරෙමින් හුන් බතින් පිඩක් කුණු වූ අතින් ගෙණ මාගේ පාත්‍රයට පිරිනමා ලී ය. ඒ බත්පිඩ පාත්‍රයෙහි බහා ලන කල්හි ඔහුගේ කුණු වූ අත ඇඟිල්ලක් සිඳී පාත්‍රයෙහි වැටුනේ ය. මම ද ඔහුට අනුකම්පාවෙන් ඒ භොජනය ගෙණ ඊට නුදුරු ගෙබිත්තියක් නිසා පිහිටි සෙවණක හිඳ ඒ කුණු වූ ඇඟිලිකඩ ඉවත දමා ඒ බත්පිඩ පස්විකා වැළඳිමි. ඒ බත්ආලොපය වළඳන කල්හි ද, වැළඳූ කල්හි ද ශරීරයාගේ ස්වභාව සිතන්නා වූ මට පිළිකුලෙක් නො වූයේ ය' යි කියා වදරණ ලද්දේ ය. තවද, මහරජානෙනි, මහලු ශෘගාලතෙම භොජනයක්



Non-Commercial Distribution

ලැබ 'රූක්ෂ දේ හො?' යි ප්‍රණීත දේ හො?' යි කියා නො සොයන්-නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් පිණ්ඩපාතභොජනයක් හෝ සංඝභත්තාදි අතිරෙකලාභයක් හෝ ලැබ 'රූක්ෂ දේ හො?' යි කියා හෝ, ප්‍රණීත දේ හො?' යි කියා හෝ 'යහපත් දේ හො?' යි කියා හෝ 'නපුරු දේ හො?' යි කියා හෝ නො විමසිය යුත්තේ ය. ලද දෙයකින් ම සතුටු විය යුත්තේ ය. මහරජානෙනි, මහලු ශෘගාලයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය වංගන්තපුත්‍ර වූ උපසෙන ස්ථවිරයන් වහන්සේ විසින්:—

**''ලූඛෙන පිච සන්තුස්සෙ-නාඤ්ඤං පත්ථෙ රසං බහුං,**
**රසෙසු අනුගිද්ධස්ස-ඣානෙ න රමතී මනො,**
**ඉතරීතරෙන සන්තුට්ඨො -සාමඤ්ඤං පරිපූරති' යි.**

'මහණ වනාහි රූක්ෂයෙනුදු සතුටු වන්නේ ය. බොහෝ වූ අනික් රසයක් ප්‍රාර්ථනා නො කරන්නේ ය. රසයෙහි ගිජු වූවාහුගේ සිත ධ්‍යානයෙහි නො ඇලෙන්නේ ය. ඉතිරීතරප්‍රත්‍යයෙන් සතුටු වන්නා වූ මහණතෙම ශ්‍රමණගුණය සම්පූර්ණ කරන්නේ යැ' යි කියා වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මෘගයාගේ අංගතුණක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගත්‍රය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ මෘගතෙම දහවල් අරණ්‍යයෙහි සැහැවී වසන්නේ ය. රාත්‍රියෙහි මරණ භයින් අභ්‍යවකාශ වූ එළියෙහි වාසය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාව-චරයා විසින් දහවල් ජනශූන්‍ය වූ අරණ්‍යයෙහි වාසය කළ යුත්තේ ය. රාත්‍රියෙහි සංසාරදුක් මෙනෙහි කෙරෙමින් අභ්‍යවකාශයෙහි සක්මනින් කල් යැවිය යුත්තේ ය. මහරජානෙනි, මෘගයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය ලොකාලොකදිවාකර වූ දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් **ලොමහංසන පර්යායයෙහි-**

**(507) ''සො ඛො අහං සාරිපුත්ත යා තා රත්තියො-පෙ-දිවා අබ්භොකාසෙ, විහරාමි රත්තිං වනසණ්ඩෙ'' යි**[1]

යනුවෙන් **'ශාරිපුත්‍රයෙනි,** දුෂ්කරක්‍රියා පුරන්නා වූ ඒ මම වනාහි ඉතා ශීත ඇත්තා වූ හෙමන්තික වූ යම් රාත්‍රියෙක් ඇද්ද, නවම්මස අන්තිම සතර දවස හා මැදින්දිනයෙහි ප්‍රථම සතරදවස ය යන අන්තරට්ඨකයෙහි ද, පිනි වැටෙන කාලයෙහි ද යන එබඳු රාත්‍රියෙහි අබ්භොකාසයෙහි වාසය කෙරෙමි. දහවල් වනගහනයෙහි වාසය කෙරෙමි. ග්‍රීෂ්මඍතුයෙහි වූ කෙළවරමාසයෙහි දවහල් අබ්භොකාසයෙහි වාසය කෙරෙමි. රාත්‍රියෙහි වනගහනයෙහි වාසය කෙරෙමි' යි කියා වදරණ ලද්දේ ය. තවද,

1. පාළිමිලින්දපඤ්හ 316 පිටුව හෝ මැදුම්සඟයෙහි මහාසීහනාද සූත්‍රය
1. දිපියනක්ඛු

මහරජානෙනි, මෘගතෙම ශස්ත්‍රයක් හෝ හීසැරයක් හෝ තමාගේ කයට ලං ව එන කල්හි රවටන්නේ ය, පලා යන්නේ ය, ශරීරයට වැද්ද නො දෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ක්ලේශයන් ලං ව එන කල්හි රැවටිය යුත්තේ ය. පලා ගිය යුත්තේ ය. ඒ චිත්තයට වැද්ද නුදුන යුත්තේ ය. මහරජානෙනි, මෘගයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. නවද, මහරජානෙනි, මෘගතෙම මිනිසුන් දැක 'නැවැත මනුෂ්‍යයෝ මා නො දකිත්ව' යි සිතා යම් ඒ දෙසකට පලා යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ඩබර විග්‍රහ විවාදශීලි වූ පුද්ගලයන් ද, දුශ්ශීල පුද්ගලයන් ද, ප්‍රතිපත්ති පූරණයෙහි කුසීත වන පුද්ගලයන් ද, ක්‍රීඩා ප්‍රසෘත ජනසංගණිකාකාමී පුද්ගලයන් ද දැක 'අහෝ! මේ ප්‍රමාදකාමී වූ පුද්ගලයෝ මා නො දකිත්ව' යි කියා ද, 'මම ද ඒ පුද්ගලයන් නො දකිම්' යි සිතා ද යම් ඒ කැමැති දෙසකට පලා ගිය යුත්තේ ය. මහරජානෙනි, මෘගයාගේ මේ තුන්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය ධම් සෙනවි **සැරියුත්**මහතෙර සාමීන් විසින්—

**''මා මෙ කදාචි පාපිච්ඡො-කුසීතො හීනවීරියො,**
**අප්පස්සුතො අනාචාරො-සම්මතො කත්ථචි අහු''යි.**

කිසි කලෙකත් පවිටු අදහස් ඇත්තා වූ කුසීත වූ පසු බට වීර්‍ය්‍ය ඇත්තා වූ අල්පශ්‍රැත වූ අනාචාරී වූ ද යන කිසිවෙක සමානබවෙක් මට නො වේව' යි කියා මෙම කාරණය වදාරණ ලද්දේ ය.''

'ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ගොරුපයාගේ චතුරංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ චතුරංගය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ ගොරූප සංඛ්‍යාත වූ වෘෂභතෙම තමා වසන ගෙය නො හරින්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් 'මේ චතුර්මහාභූතික වූ ශරීරය අනිච්චුච්ඡාදන පරිමද්දන භෙදන විකිර්ණ විද්ධංසන ස්වභාව ඇත්තේ ය' යි කියා ස්වකීය වූ ශරීරය නො හැරිය යුත්තේ ය. මහරජානෙනි, ගොරූපයාගේ මේ පළමුවන අංගය ගත යුත්තේ ය. නවද, මහරජානෙනි, වෘෂභතෙම බර උසුලන්නට දිය යුත්තක්හු **(508)** නැති බැවින් ආදින්නධුර වූයේ ය. සුවදුක් දෙකින් ධුරය උසුලන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ආදින්නබ්‍රහ්මචරියායෙන් සුවදුකින් ජීවිතපර්‍ය්‍යවසානය දක්වා දිවි කෙළවර කොට බ්‍රහ්මචර්‍ය්‍යය හැසුරුණ යුත්තේ ය. මහරජානෙනි, වෘෂභයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. නවද, මහරජානෙනි, වෘෂභතෙම මහත් වූ ආලයෙන් අතෘප්තික ව ආඝ්‍රාණය කෙරෙමින් පැන් බොන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ආචාර්‍ය්‍යොපාධ්‍යායවරයන්ගේ අනුශාසනා ආලයෙන් ප්‍රෙමයෙන් ප්‍රසාදයෙන් අතෘප්තික ව ආඝ්‍රාණයෙන් පිළිගත යුත්තේ ය. මහරජානෙනි, වෘෂභයාගේ මේ තෘතියාංගය ගත

Non-Commercial Distribution

යුත්තේ ය. තවද, මහරජානෙනි, වෘෂභතෙම යම් කිසිකෙනෙකුන් විසින් උසුලවනු ලබන්නේ ම උසුලන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ථෙර නවක මධ්‍යම භික්ෂූන්ගේ ද ගෘහස්ථ උපාසකඋපාසිකාවන්ගේ ද අවවාදනුශාසනාතොමෝ මස්තකයෙන් පිළිගත යුත්තේ ය. මහරජානෙනි, වෘෂභයාගේ මේ සතරවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය සුගතවර සද්ධර්මසෙනාධිපති වූ ශාරිපුත්‍රමහාථෙර ස්වාමීන් වහන්සේ විසින්—

**''තදහු පබ්බජිතො සන්තො-ජාතියා සත්තවස්සිකො,**
**සොපි මං අනුසාසෙය්‍ය-සම්පටිච්ඡාමි මත්ථකෙ.**

**තිබ්බං ඡන්දඤ්ච පෙමඤ්ච-තස්මිං දිස්වා උපට්ඨපෙ,**
**ඨපෙය්‍යාචරියට්ඨානෙ-සක්කච්ච තං පුනප්පුනං''** යි

'මනුෂ්‍යජාතියෙන් සත්හවුරුදු වූ සත්පුරුෂගුණයෙන් යුක්ත වූ එදවස්හි ම පැවිදි වූ ඒ ළදරු සාමණෙරතෙම ද මට ධර්මයෙන් අනුශාසනා කරන්නේ වී නම්, මම මාගේ ශිරොමස්තකයෙන් පිළිගන්නෙමි යි. ඒ සුගතොවාදකාරී පුද්ගලයා කෙරෙහි මම බලවත් වූ ඡන්දය ද ප්‍රෙමය ද උපදවමි. ඔහු දැක නැවැත නැවැතත් සකස් කොට ම ආචාර්‍ය්‍යස්ථානයෙහි තබන්නෙමි' කියා වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ශූකරයාගේ අංගද්වයයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, ශූකරතෙම යම් සේ ග්‍රීෂ්මයෙන් හුණු ව ගියා වූ රත් ව ගියා වූ ග්‍රීෂ්මකාලය පැමිණි කල්හි ජලය කරා එළඹෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ද්වෙෂයෙන් චිත්තය කැලඹී ගැටී භ්‍රාන්ත ව කලකිරී හුණු වූ කල්හි ශීතලප්‍රණීත වූ මෛත්‍රීභාවනාව කරා එළඹිය යුත්තේ ය. මහරජානෙනි, හූරාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, ශූකරතෙම මඩ මිශ්‍ර වූ ජලය කරා ගොස් නාසිකාවෙන් පෘථිවිය සාරා ඔරුවක් මෙන් කොට ගෙණ ඒ මඩඔරුවෙහි සයනය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සිත්හි ශරීරය තබා ගෙණ අනිත්‍යාදි එක්තරා අරමුණු අතුරකට යාමෙන් සයනය කළ යුත්තේ ය. මහරජානෙනි, ශූකරයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය පිණ්ඩොලභාරද්වාජ නම් මහතෙරහු විසින්–

(509) **''කායෙ සභාවං දිස්වාන-විචිනිත්වා විපස්සකො,**
**එකාකියො අදුතියො-සෙති ආරම්මණන්තරෙ''** යි.

'එකලා වූ දෙවෙනි කෙනෙකුන් නැත්තා වූ විදර්ශකභික්ෂුතෙම ශරීරයෙහි අනිත්‍යාදි ස්වභාවය සොයා දැක අරමුණු අතුරෙහි සයනය කරන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය.''

Non-Commercial Distribution

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'හස්තිරාජයාගේ පඤ්චාංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදාළසේක් ද, ඒ ගත යුතු වූ පඤ්චාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ හස්තිරාජතෙම නම් මාර්ගයෙහි යමින් සිට ම පෘථිවිය ප්‍රදලනය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචර මහණහු විසින් තමාගේ ශරීරය ධාත්වාදිවශයෙන් සම්මර්ශනය කිරීමෙන් ම සර්වක්ලේශයන් ප්‍රදලනය කළ යුත්තේ ය. මහරජානෙනි, හස්තියාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, හස්තිරාජතෙම සියලු ශරීරයෙන් ම කරකැවී බලන්නේ ය. ඍජුව ම බලන්නේ ය. කරකවා දිශානුදිශාවන් නො බලන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ගෙල කරකවා නො බලා සියලු ශරීරයෙන් ම කැරකැවී බැලීමෙන් යුක්ත විය යුත්තේ ය. කරකැවීකරකැවී දිශානුදිශාවන් නො බැලිය යුත්තේ ය. උඩ නො බැලිය යුත්තේ ය. ඉතා අධොමුඛ ව නො බැලිය යුත්තේ ය. වියදඬු පමණ දුර බැලීමෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, හස්තියාගේ මෙ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, හස්තිරාජතෙම නිබඳ වූ සයනයක් නැත්තේ ය. වනයෙහි ඒ ඒ තැන ගොදුරු පිණිස ඇවිද පළමු සිටි ඒ ප්‍රදෙශයට ම වාසය පිණිස නො යන්නේ ය. එකස්ථානයෙක නිත්‍ය වූ ප්‍රතිෂ්ඨායෙක් නැත්තේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයානන් වහන්සේ විසින් අනිබඬසයන යෙන් යුක්ත විය යුත්තේ ය. නිරාලයෙන් ම පිඬු පිණිස ගිය යුත්තේ ය. ඉදින් විදර්ශනා පූරණ යොගාවචරතෙම මනොඥ වූ ප්‍රතිරූප වූ යහපත් වූ ප්‍රදෙශභාගයක් හෝ වෘක්ෂමූලයක් හෝ ගුහාවක් හෝ ගල්ගෙවල් සේ නැමී තිබෙන පබ්භාරයක් හෝ දක්නේ වී නම්, එහි ම වාසයට එළඹිය යුත්තේ ය. නිත්‍යප්‍රතිෂ්ඨායෙක ආලයෙක් නො කළ යුත්තේ ය. මහරජානෙනි, හස්තියාගේ මේ තුන්වන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, හස්තිරාජතෙම ජලයට පැමිණ පවිත්‍ර විමල සීතල ජලයෙන් සම්පූර්ණ වූ කුමුදුප්පල පදුම පුණ්ඩරීකයෙන් සැදුම් ලද්ද වූ මහත් වූ මහ පියුම්විලකට බැස උතුම් වූ හස්තික්‍රීඩාවන් කෙළින්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් පවිත්‍ර විමලාතිප්‍රසන්න අනාවිලසද්ධර්මවරජලයෙන් සම්පූර්ණ වූ අර්හත්ඵල නමැති ප්‍රවරකුසුම යෙන් සැදුම් ලද්ද වූ සතරසතිපට්ඨාන නමැති මහත් වූ මහාපුෂ්කරණියට බැස චතුස්සත්‍යඥානයෙන් සර්වසංස්කාරධර්මයන් කම්පා කළ යුත්තේ ය. විශෙෂයෙන් ම කම්පා කළ යුත්තේ ය. යොගාවචරයන්ගේ විමුක්ති ක්‍රීඩාව කෙළිය යුත්තේ ය. මහරජානෙනි, හස්තියාගේ මේ සතරවන අංගය යොගාවචරයා විසින් ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, හස්තිරාජතෙම සිහියෙන් පය නඟන්නේ ය. **(510)** සිහියෙන් ම පය තබන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගාවචර භික්ෂූහු විසින් සිහියෙන් නුවණින් යෙදී පය නැඟිය යුත්තේ ය. සිහියෙන් නුවණින් යෙදී පය තැබිය යුත්තේ ය. ඉදිරියට යාමෙහි ආපසු යාමෙහි හස්තපාද හකුළුවා

*Non-Commercial Distribution*

ලිමෙහි දික් කිරිමෙහි යනාදි හැම තැන්හි ම සිහිනුවණින් යුක්ත විය යුත්තේ ය. මහරජාණෙනි, හස්තියාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජාණෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් සංයුත්සඟිවරයෙහි:—

**''කායෙන සංවරො සාධු–සාධු වාචාය සංවරො,**
**මනසා සංවරො සාධු–සාධු සබ්බත්ථ සංවරො,**
**සබ්බත්ථ සංවුතො ලජ්ජී–රක්ඛිතොති පවුච්චති'' යි.**

යන ගාථාවෙන් 'කායද්වාරයට හසු වන ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයට සිත නො දුවන විසින් කයින් සිත රැක්ම යහපත. මුසාවාදදිය නො කියන විසින් වචනයෙන් සිත රැක්ම යහපත. මනොද්වාරයට හසුවන අභිධ්‍යා ව්‍යාපාදදිය නො සිතන විසින් තමාගේ සිත රැක්ම යහපත. චක්ෂුරාදි සදෙර ම රැක්ම යහපත. චක්ෂුරාදි සියල්ලෙහි ම සංවෘත වූ ලජ්ජීමහණ තෙම ත්‍රිවිධ වූ ශික්ෂාව ම රක්නේ ය' යි කියා වදරණ ලද්දේ ය.

උද්දනපද නම්:—

**උපචිකා බිලාරො ච–උන්දූරො විච්ඡිකෙන ච,**
**නකුලො සිඟාලො මිගො–ගොරූපො වරාහො හත්ථිනා දසාති.**

**දෙව්සිඅංගයක් ඇති සතරවන වර්ගය නිමියේ ය.**

---

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'කෙසරසිංහරාජයාගේ සප්තාංග යක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ සප්තාංගය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජාණෙනි, යම් සේ සිංහ රාජතෙමේ නම් ශ්වෙතපද්මයක් සේ සර්වාංගය ශ්වෙත විමල පරිශුද්ධ ශුභ්‍රවර්ණ ඇත්තේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් මාර්ගඵලාධිගම ප්‍රාප්ත විමෙන් පහ වූ කුකුස් ඇති ශ්වෙත විමල පරිශුද්ධ ශුභ්‍ර වූ චිත්තයෙන් යුක්ත විය යුත්තේ ය. මහරජාණෙනි, සිංහරාජයාගේ මේ පළමුවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජාණෙනි, සිංහරාජතෙම දක්ෂ වූ යාත්‍රා ඇති සතරපයක් ඇත්තේ ය. නොහොත් වික්කන්තචාරී වූ සතරපාදයන් ඇත්තේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් චතුර්විධ වූ ඍද්ධිපාද නමැති චතුෂ්පාදයෙන් යුක්ත විය යුත්තේ ය. මහරජාණෙනි, සිංහයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජාණෙනි, සිංහරාජතෙම අභිරූප වූ යහපත් කෙසරසමූහයන් ඇත්තේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් අභිරූප වූ යහපත් සීල නමැති කෙසරසමූහයෙන් යුක්ත විය යුත්තේ ය. මහරජාණෙනි, සිංහයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. තවද, මහරජාණෙනි, සිංහරාජතෙම තමාගේ ජීවිතය විනාස වේ නමුදු කිසිවක්හට **(511)** යටත් නො වන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් චීවර පිණ්ඩපාත සෙනාසන

Non-Commercial Distribution

ගිලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයන්ගේ ක්ෂය වීමෙහි ද කිසිවක්හට ප්‍රත්‍යය පිණිස යටත් නො විය යුත්තේ ය. මහරජානෙනි, සිංහයාගේ මේ සතරවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, සිංහරාජ තෙම සපදානයෙන් ලත් දඩයමක් ම අනුභව කරන්නේ ය. යම් තැනෙක්හි මෘගයෙක් වැටුනේ නම්, එහි ම සිට හැකි තාක් අනුභව කරන්නේ ය. අනික් උතුම් මධුර මසක් සොයා නො යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සපදානචර්යායෙන් ම ලත් භොජනයක් ම වැළඳීමෙන් යුක්ත විය යුත්තේ ය. අනික් මිහිරි ආහාර ලැබෙන කුලයන් නො සෙවිය යුත්තේ ය. භික්ෂාචර්යාවතින් පැමිණි පළමු ගෙය හැර අනික් කුලගෙයක් සොයා නො ගිය යුත්තේ ය. අනික් මධුරභොජනයක් සොයා නො ගිය යුත්තේ ය. යම් කුලයෙක්හි පිඩු ලබන ලද්දේ නම්, ඒ කුලයෙහි භොජනය ම නො හැර ශරීරය යැපෙන පමණ වැළඳිය යුත්තේ ය. අනික් උතුම් භොජනයක් නො සෙවිය යුත්තේය. මහරජානෙනි, සිංහයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, සිංහරාජතෙම සඟවා තබා අනුභව නො කරණ හෙයින් අසන්නිධිභක්ෂිය එක්වරක් මස් අනුභව කොට ඒ මස්පොළට නැවත නො යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාව-චරයා විසින් අසන්නිධිකාරපරිභොගයෙන් යුක්ත විය යුත්තේ ය, මහ-රජානෙනි, සිංහයාගේ මේ සවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජා නෙනි, සිංහරාජතෙම භොජනයක් නො ලද්දේ ද, නො තැවෙන්නේ ය, භොජනයක් නො ලද්දේ ද. ආහාරතෘෂ්ණා ග්‍රථනයෙන් නො ගෙතී ආහාර තෘෂ්ණාවෙන් මූර්ඡා නො වී ආහාර තෘෂ්ණාවෙහි නො ගැලී අනුභව කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් භොජනයක් නො ලදින් නො තැවුන යුත්තේ ය, භොජනයක් ලද්දේ ද, තෘෂ්ණාග්‍රථනයෙන් නො ගෙතී තෘෂ්ණාවෙන් මූර්ඡා නො වී තෘෂ්ණාවෙහි නො ගැලී ආදීනව දකීමෙන් 'නිස්සරණමුඛ්‍ය වූ බ්‍රහ්මචර්යානු-ග්‍රහ පිණිස'ය යනාදී වූ ප්‍රත්‍යවෙක්ෂාඥනයෙන් යුක්ත ව වැළඳිය යුත්තේ ය. මහරජානෙනි, සිංහරාජයාගේ මේ සත්වන අංගය ගත යුත්තේ ය. මහ-රජානෙනි, **මහාකාශ්‍යපස්ථවිරයන්** වහන්සේට ප්‍රශංසා කර වදරන්නා වූ දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් **සංයුත්සඟිවරයෙහි:—**

> **"සන්තුට්ඨායං කස්සපො ඉතරීතරෙන පිණ්ඩපාතෙන, -පෙ- නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති"** යි.[1]

'මේ කාශ්‍යපස්ථවිරතෙම හීන වූ ද, ප්‍රණීත වූ ද, මද වූ ද, බොහෝ වූ ද තමා ලද පිණ්ඩපාතයෙන් සතුටු වන්නේ ය. උක්තප්‍රකාර වූ ඉතරීතරපිණ්ඩපාතසන්තොසයෙහි ද අනුන්ට ගුණ වර්ණනා කොට කියන සුලු ය. **(512)** පිණ්ඩපාතය කරණ කොට ගෙණ ශ්‍රමණයන්ට සුදුසු නො වන්නා වූ එක්විසි අන්වෙසනයට නො පැමිණෙන්නේ ය. පිණ්ඩ-පාතය නො ලබන ලද්දේ ද, නො තැවෙන්නේ ය. පිණ්ඩපාතය ලබන

1. පාළිමිලින්දපඤ්හ 320

Non-Commercial Distribution

ලද්දේ ද, තෘෂ්ණාග්‍රථනයෙහි නො ගෙතී තෘෂ්ණාවෙන් මූර්ඡා නො වී තෘෂ්ණායෙහි නො ගැලී ආදීනව දක්නා සුලු ව ප්‍රත්‍යවෙක්ෂාඥානයෙන් සමන්විත ව වළඳන්නේ ය' යි කියා මෙම කාරණය වදාරණ ලදී.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'සක්වාලිහිණියාගේ අංගත්‍රයයක් ගත යුත්තේ ය' යි කියා යම් වචනයක් වදාළසේක් නො වේ ද, ඒ ගත යුතු වූ අංගත්‍රය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ සක්වා-ලිහිණියා තමාගේ දිව්හිමියෙන් ම අඹුව හැර වෙන් නො වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් දිව්හිමියෙන් ම යොනිසොමනස්කාරය නො හැරිය යුත්තේ ය. මහරජානෙනි, සක්වා-ලිහිණියාගේ මේ පළමුවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, සක්වාලිහිණිතෙම දියසෙවෙල්, දියපරඬල් අනුභව කරන්නේ ය. ඒ ආහාරයෙන් ම සන්තොසයට පැමිණෙන්නේ ය. ඒ සන්තොසය කරණ කොට ගෙණ බලයෙන් ද, වර්ණයෙන් ද නො පිරිහෙන්නේ ය. මහරජා-නෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් යථාලාභසන්තොසය කට යුත්තේ ය. මහරජානෙනි, යථාලාභයෙන් සතුටු වන්නා වූ යොගී වූ මහණතෙම ශීලයෙන් නො පිරිහෙන්නේ ය, සමාධියෙන් නො පිරි-හෙන්නේ ය, ප්‍රඥාවෙන් නො පිරිහෙන්නේ ය, අර්හත්ඵලවිමුක්තිඥාන දර්-ශනයෙන් නො පිරිහෙන්නේ ය, සියලු ම ලෞකිකලොකොත්තර කුශල ධර්මයෙන් නො පිරිහෙන්නේය. මහරජානෙනි, සක්වාලිහිණියාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, සක්වාලිහිණි තෙම ප්‍රාණහිංසාව නො කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් පරහිංසා වධබන්ධන පිණිස දඬු මුගුරු වැල් බාන් ඛඩ්ග කුන්තාදී ශස්ත්‍ර නො ගෙණ ප්‍රාණඝාතයෙහි මහත් වූ ලජ්ජා ඇති ව සකල සත්වයන් කෙරෙහි කරුණා මෛත්‍රී ඇති ව සියලු ම ප්‍රාණිභූතයන් කෙරෙහි හිතයෙන් අනුකම්පාවෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, චක්‍රවාකයාගේ මේ තුන්වන අංගය ගත යුත්තේ ය. මහ-රජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප ලොවුතුරා බුදුන් විසින් **චක්කවාකජාතකයෙහි:—**

**''යො න හන්ති න ඝාතෙති—න ජිනාති න ජාපයෙ,**
**අහිංසා සබ්බභූතෙසු—වෙරං තස්ස න කෙනචි''** යි.

'යමෙක් අනුන්ට හිංසා නො කෙරේ ද, අනුන් නො නසා ද, පැරදවීම් වසයෙන් ජය නො ගණී ද, අර්ථහානි නො කරවා ද, සකල ප්‍රාණිභූතයන් කෙරෙහි හිංසාචෙතනාවක් නැද්ද, ඔහුගේ කිසි කෙනකුන් හා වෛර-යෙක් නැතැ' යි කියා වදාරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'කැඳැත්තියගේ අංගදෙකක් ගත යුත්තේ ය' යි කියා යමක් වදාළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ කැඳැතිපක්ෂිණී තොමෝ තමාගේ **(513)** ස්වාමිපුත්‍ර වූ කැඳැත්තහු කෙරෙහි ඊර්ෂ්‍යාවෙන්

*Non-Commercial Distribution*

පැටවුන් පොෂ්‍ය නො කරන්නී ය. 'මේ කැඳැත්තහු නිසා මේ දරුවෝ උපන්නාහ' යි සිතා කැඳැත්තහුගේ පත්‍ර ඇගේ කුඩින් උපුටා හැර එම රුක්සිදුර ම හිඳුවා පැටවුන් මෝරණ තුරු වනයෙන් ගොදුරු ගෙණවුත් දෙන්නී ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් තමාගේ චිත්තයෙහි ක්ලේශයන් උපන් කල්හි සිත කෙරෙහි ඊර්ෂ්‍යා කළ යුත්තේ ය. සතරසතිපට්ඨාන ධර්මයන් සතරසංවරශීල නමැති වෘක්ෂබිලයෙහි මනා කොට ප්‍රක්ෂේප කොට මනොද්වාරයෙහි කායගතාසතිභාවනා වැඩිය යුත්තේ ය. මහරජානෙනි, පෙණාහිකාවගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. නවද, මහරජානෙනි, කැඳැත්තිය දහවල් ගොදුරු පිණිස වනයෙහි හැසිර සවස තමාගේ ආත්මාරක්ෂාව පිණිස පක්ෂිසමූහයා කරා එළඹෙන්නී ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් කාමසංයොජනාදීන්ගේ මිදීම පිණිස එකලා වූ විවෙකය සෙවනය කළ යුත්තේ ය. රාත්‍රියෙහි ඒ විවෙකකාලය නො ලබන මහණහු විසින් පරාපවාදභය රක්ෂා කරණ පිණිස සංඝයා මැදට බැස සංඝරක්ඛිතයෙකු විසින් වාසය කළ යුත්තේ ය. මහරජානෙනි, කැඳැත්තියගේ මේ දෙවෙනි අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, ශතසහශ්‍රීලොකධාතුව තමාගේ ශරීරාලොකයෙන් එකාලොක කරණයට සමර්ථ වූ **සහම්පතී** නම් මහාබ්‍රහ්මරාජයා විසින් භාග්‍යවත් වූ ලොවුතුරා බුදුන්ගේ සමීපයෙහි දී:—

> **"සෙවෙථ පන්තානි සෙනාසනානි**
> **චරෙය්‍ය සංයොජනවිප්පමොක්ඛා,**
> **සචෙ රතිං නාධිගච්ඡෙය්‍ය තත්ථ**
> **සඞ්ඝෙ වසෙ රක්ඛිතත්තො සතීමා"** යි.

යන මේ ගාථාව කියා තමාගේ දෙළොස්ගවු උස ඇති මැණික් ඔටුන්නෙන් සැදුම් ලත් අටසාළිස්ගවු උස ඇති බ්‍රාහ්මාත්මභාවය ඉන්ද්‍රධනුවක් සේ බුදුන් දසාවට නමා අහස්හි නිර්මිත වූ පෘථිවීතලයෙහි දකුණු දණමඬල හැන දෙහොත් මුදුන් තබා ගෙණ 'ස්වාමීනි, ලොවුතුරා බුදුරජානෙනි, මේ සර්වඥශාසනයෙහි පැවිදි ව ස්මෘතියගේ අවිප්‍රවාසයෙන් යුක්ත වූ රක්ෂා කරණ ලද සුශීලාත්මය ඇත්තා වූ ශ්‍රමණයන් වහන්සේ නරනාරී ජන ගොෂ්ඨී විරහිත වූ ග්‍රාමයට දුනු පන්සියයෙන් තුදුරු වූ පන්තසෙනා-සනයන් භජනය සෙවනය කරන්නෝ ය. කාමාදි දසසංයොජනයෙන් මිදෙන පිණිස නිර්මල වූ ප්‍රතිපත්තියෙහි හැසිරෙන්නෝ ය. ඉදින් ඒ පන්ත-සෙනාසනයෙහි ආලයට නො පැමිණෙන්නාහු වී නම් සංඝයා කෙරෙහි වසන්නෝ ය' යි කියා මේ කාරණය කියන ලද්දේ ය."

"ස්වාමීනි නාගසෙනයන් වහන්ස ගෘහපරෙවියාගේ එකාංගයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ ද?" යි විචාළෝ ය. "මහරජානෙනි, යම් සේ ගෘහපරෙවිතෙම

Non-Commercial Distribution

මනුෂ්‍යයන්ගේ ගෘහයෙහි වසනුයේ ඒ මනුෂ්‍යයන්ගේ කිසි භාණ්ඩයකට නිමිත්තග්‍රහණයක් නො කරන්නේ ය. පක්ෂිසංඥ බහුල ව මධ්‍යස්ථ ව වසන්නේ ය. මහරජානෙනි **(514)** එපරිද්දෙන් ම පරකුලයට එළඹුනා වූ යොගී වූ යොගාවචරයා විසින් ඒ කුලයෙහි ස්ත්‍රීන්ගේ ද, පුරුෂයන්ගේ ද ඇඳෙක හෝ පුටුවෙක හෝ වස්ත්‍රයෙක හෝ ආභරණයෙක හෝ උප-භොගවස්තුවෙක හෝ පරිභොගවස්තුවෙක හෝ සාලිමංසොදනාදී භොජනවිකෘතියක හෝ නිමිත්තග්‍රහණය නො කළ යුත්තේ ය. මධ්‍යස්ථ විය යුත්තේ ය, ශ්‍රමණසංඥව ඉපද විය යුත්තේ ය. මහරජානෙනි, ගෘහ පරෙවියාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් **චුල්ලනාරද** ජාතකයෙහි:—

> **"පවිසිත්‍වා පරකුලං-පානෙසු භොජනෙසු වා,**
> **මිතං ඛාදෙ මිතං භුඤ්ජෙ-න ච රූපෙ මනං කරෙ"** යි.

'පරකුලයට ගොස් ඔවුන්ගේ පානවර්ගයෙහි ද, භොජනයෙහි ද, ආලයක් නිමිත්තග්‍රහණයක් නො කොට පමණින් යුක්ත ව අනුභව කෙරෙමි, පමණින් යුක්ත ව වළඳමි, ස්ත්‍රීරූප ධන ධාන්‍ය වස්ත්‍රාභරණාදි රූපයෙහි ආලය සිතක් නො කෙරෙමි' යි කියා වදාරණ ලද්දේ ය."

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'බකමූහුණු පක්ෂියාගේ අංග දෙකක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ ද?" යි විචාළෝ ය. "මහරජානෙනි, බකමූහුණු පක්ෂිතෙම කාකයන් හා ප්‍රතිවිරුද්ධ ය, කාකයන් තලයට ගොස් රාත්‍රියෙහි බොහෝ වූ කාකයන් නසන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් නුනුවණ හා ප්‍රතිවිරුද්ධබව කට යුත්තේ ය. එකලා ව රහස් ව හිඳ නුනුවණ මර්දනය කළ යුත්තේ ය, සහමුලින් සිඳ හළ යුත්තේ ය. මහරජානෙනි, උලූකයාගේ මේ පළමුවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, බකමූහුණු පක්ෂිතෙම එකලා ව විවෙක ව හිඳිනේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් විවෙකයෙහි ඇලුමෙන් විවෙකාරාමයෙන් යුක්ත විය යුත්තේ ය. මහ-රජානෙනි, උලූකයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය, වදාරණ ලද යි මෙම කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් **සංයුත් නිකායවරයෙහි** :—

> **"ඉධ භික්ඛවෙ භික්ඛු පටිසල්ලානාරාමො පටිසල්ලානරතො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනිපටිපදාති යථාභූතං පජානාති"** යි.

*Non-Commercial Distribution*

''මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවෙකාරාම ව විවෙක යෙහි ඇලුනේ මේ දුකැ යි කියා තත් වූ පරිද්දෙන් දනියි. මේ දුක් ඉපදීම ය යි කියා තත් වූ පරිද්දෙන් දනී. මේ දුක් නිරුද්ධවීම ය යි කියා තත් වූ පරිද්දෙන් දනී. මේ දුක් නිරොධගාමිනී ප්‍රතිපදව ය යි කියා තත් වූ පරිද්-දෙන් දන ගන්නේ යි.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ශතපත්‍රධාරී වූ කැරල් පක්ෂියාගේ එක් අංගයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ කැරල් පක්ෂිතෙම **(515)** තමාගේ කැරල්ශබ්දයෙන් හඬා අනුන්ට වන සැපතක් හෝ භයක් හෝ කියන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් පරහට ධර්මදෙශනා කිරීමෙන් එක්සියසතිස්මහ නරකයෙහි නරකදුඃඛය ඉතා භය වසයෙන් දක්වා ලිය යුත්තේ ය. තෘෂ්ණාපගත වූ නිර්වාණය ක්ෂෙමවශයෙන් අභයවශයෙන් දක්වා ලිය යුත්තේ ය. මහරජානෙනි, ශතපත්‍රයාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය **පිණ්ඩොලභාරද්වාජ** නම් මහතෙරුන් වහන්සේ විසින්:—

**''නිරයෙ භයං සන්තාසං-නිබ්බානෙ විපුලං සුඛං,**
**උභයානෙතානි අත්ථානි-දසෙතබ්බානි යොගිනා'' ති.**

'යොගාවචර භික්ෂූහු විසින් සත්වයන්ට නරකයෙහි භය ද, නිර්වාණ යෙහි මහත් වූ සැපය ද යන මේ උභයාර්ථයන් දක්වා ලිය යුත්තේ ය' යි කියා වදාරණ ලද්දේ යි.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'වවුල් පක්ෂියාගේ අංගදෙකක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, වවුල්පක්ෂිතෙම මිනිසුන්ගේ ගෘහයට ප්‍රවෙශ ව ඔබිනොබ සඤ්චාරණය කොට නික්ම යන්නේ ය. ඒ ගෘහයෙහි පළිබොධ නො වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ගමට පිඩු පිණිස ගොස් සපදනචර්යාවෙන් හැසිර ප්‍රතිලබ්ධ ලාභයෙන් වහා ගමින් නික්මුන යුත්තේ ය, එහි පළිබොධ නො විය යුත්තේ ය. මහරජානෙනි, වග්ගුලියාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, වග්ගුලිතෙම අනුන්ගේ ගෙයි වසමින් ඔවුන්ට කිසි හානියක් නො කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ක්ෂත්‍රියබ්‍රාහ්මණගෘහපත්‍යාදී උපාසක කුලයට එළඹ ඉතා බොහෝ කොට ඉල්වීමෙන් හෝ කායවචීවිඤ්ඤත්ති බහුලතාවෙන් හෝ ඉතා බොහෝ වූ කථාවෙන් හෝ සමාන වූ සුඛදුඃඛ-තාවෙන් හෝ ඒ ගෘහස්ථයන්ට කිසි විපිළිසරයක් නො කට යුත්තේ ය. ඔවුන්ගේ මුල් කට යුතු නො පිරිහෙළිය යුත්තේ ය. ඔවුන්ට සර්ව-ප්‍රකාරයෙන් ම මෙලොවින් පරලොවින් අභිවෘද්ධියක් ම සිතිය යුත්තේ ය.

මහරජානෙනි, වග්ගුලියාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ සනරාමරලොකගුරු වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් දීර්ඝනිකායෙහි වූ ලක්ෂණ සූත්‍රාන්තයෙහි:—

''සද්ධාය සීලෙන සුතෙන බුද්ධියා
චාගෙන ධම්මෙන බහූහි සාධුහි,
ධනෙන ධඤ්ඤෙන ච ඛෙත්තවත්ථුනා
පුත්තෙහි දාරෙහි චතුප්පදෙහි ච.

ඤාතීහි මිත්තෙහි ච බන්ධවෙහි
බලෙන වණ්ණෙන සුඛෙන චූභයං,
කථං න හායෙය්‍යුං පරෙති ඉච්ඡති
අත්ථස්සමිද්ධිං ච පනාභිකඞ්ඛති'' යි.

(516) 'මහණෙනි, අතීතයෙහි බුද්ධකාරකධර්මයන් පූරණය කරන්නා වූ මහබොධිසත්වතෙම 'අහෝ! සනරාමරසකලලොකවාසී වූ සියලු සත්වයෝ ම ඔක්කප්පනශ්‍රද්ධා ය, ප්‍රසාදශ්‍රද්ධා ය යන ශ්‍රද්ධාද්වයෙන් හා පඤ්චශීල, දශශීලයෙන් හා ධර්මය ඇසීමෙන් හා අතිදක්ෂ වූ සියුම් ප්‍රඥාවෙන් හා වස්තුපරිත්‍යාගයෙන් හා ලෞකිකගුණධර්මයෙන් හා අනිකුත් නො කී බොහෝ වූ උත්තමගුණධර්මයෙන් හා මුක්තාමාණික්‍යහිරණ්‍ය ස්වර්ණාදිධනයෙන් හා හැල් මහවී ආදි ධාන්‍යයෙන් හා සරු වූ ක්ෂේත්‍ර වාස්තුයෙන් හා සුවච කීකරු පුණ්‍යවත් පුත්‍රයන්ගෙන් හා අඛණ්ඩිතාචාර ඇති ස්ත්‍රීන්ගෙන් හා වාරණ තුරඟ ගවාදි චතුෂ්පදිකයන්ගෙන් හා මවු පිය දෙපක්ෂයෙහි නෑයන්ගෙන් හා සුවදුක්හි සිත් සේ පවත්නා මිත්‍රයන් ගෙන් හා ආත්මය සේ පවත්නා බන්ධුවර්ගයාගෙන් හා ශරීරබල ඥානබලයෙන් හා ශරීරවර්ණගුණවර්ණයෙන් හා කාය චිත්ත සුවයෙන් ද යන මෙ කී ශ්‍රද්ධාදියෙන් කෙසේ නම් දෙලොවින් ම නො පිරිහෙද්දෝ හෝ යි සිතින් කැමැති වන්නේ ය, සිතන්නේ ය, සර්වාර්ථසිද්ධියගේ සමෘද්ධිය කැමැති වන්නේ ය' යි කියා වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'කුඩැල්ලාගේ එක් අංගයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ රක්තපායාහස්තපාදදි තැනෙක්හි එල්වී ගණී ද, එහි ම දූඩි ව එල්වී ලේ නො නමා බොන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් යම් අරමුණෙක්හි සිත ඇලුනේ වේ ද, ඒ අරමුණ ම නීලපීතාදි වර්ණ වශයෙන් ද, හ්‍රස්වදීර්ඝාදි සටහන් වශයෙන් ද, දක්ෂිණොත්තරාදි දික් වශයෙන් පිහිටි අවකාශස්ථාන වශයෙන් ද, පරිච්ඡෙද වශයෙන් ද, ස්වභාව වශයෙන් ද, ලක්ෂණ වශයෙන් ද දූඩි කොට සිත පිහිටුවා ගෙණ එම අරමුණ කරණ කොට ගෙණ අර්හත්ඵල නමැති අමෘතරසය බීම[1] කළ යුත්තේ ය.

1. නොවාහි ම

Non-Commercial Distribution

මහරජානෙනි, ජලූකයාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය අනුරුද්ධමහාථෙර ස්වාමීන් විසින්:—

**"පරිසුද්ධෙන චිත්තෙන-ආරම්මණෙපතිට්ඨාය,**
**තෙන චිත්තෙන පාතබ්බං-විමුත්තිරසමසෙචනං" යි**

"පිරිසිදු වූ සිතින් අරමුණෙහි පිහිටා ඒ නිශ්චල වූ සිතින් අසෙචන වූ (නො වාහින්නා වූ) අර්හත්ඵලරසය පානය කට යුත්තේ ය' යි කියා වදාරණ ලද්දේ ය."

'ස්වාමීනි. නාගසෙනයන් වහන්ස, 'සර්පයාගේ අංගත්‍රයයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගත්‍රය කවරේ දැ?" යි විචාළෝ ය. "මහරජානෙනි, සර්පතෙම යම් සේ හෘදයෙන් ම යේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් ප්‍රඥ නමැති හෘදයෙන් ම යා යුත්තේ ය. මහරජානෙනි, ප්‍රඥවෙන් ම හැසිරෙන්නා වූ මහණුන් වහන්සේගේ චිත්තය චතුස්සත්‍යාවබොධ යෙහි ම හැසිරෙන්නේ ය. **(517)** මොහය දුරු කරන්නේ ය. සලක්ෂණය වඩන්නේ ය. මහරජානෙනි. සර්පයාගේ මේ පළමුවන අංගය ගත යුත්තේ ය. තවද මහරජානෙනි, හැසිරෙන්නා වූ සර්පතෙම ඖෂධ වෘක්ෂාදිය හැර ඉවතින් නික්ම යන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් කායදුශ්චරිතාදිය දුරු කිරීමෙන් යුක්ත ව හැසුරුණ යුත්තේ ය. මහරජානෙනි, සර්පයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, සර්පතෙම මිනිසුන් දැක භයින් තැති ගන්නේ ය. සොක කරන්නේ ය. ගැලවී යන්ට සිතන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ලාමකවිතර්කයන් සිතා 'අහෝ! මා සිතූ සේ නපුරැ' යි කියා අරති උපදවා තැවුන යුත්තේ ය, ශොක කළ යුත්තේ ය. 'මා විසින් ප්‍රමාදයෙන් මේ දවස ඉක්මවන ලද්දේ ය. අෂ්ටදුෂ්ටක්ෂණයෙන් විනිර්මුක්ත වූ ඉකුත් වූ දවස නැවත ලැබ ගන්නට නො හැක්කෙමි' යි කියා එක්වන් සිතිය යුත්තේ ය. මහරජානෙනි, සර්පයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය භල්ලාටියජාතකයෙහි අඹුසැමි යන කිඳුරන් දෙදෙනා විසින් කියන ලදී:—

**"යමෙකරත්තිං විප්පවසිම්හලුද්ද**
**අකාමකා අඤ්ඤමඤ්ඤං සරන්තා,**
**තමෙකරත්තිං අනුතප්පමානා**
**සොචාම සා රත්ති පුන න හෙස්සති"** යි.

"අප මහාබොධිසත්වයන් වහන්සේ බරණැස භල්ලාටිය නම් රජ ව මාංසලොභයෙන් රාජ්‍යය ඇමැතියන්ට භාර කොට සුශික්ෂිත වූ සුනඛයන් හා දුනු හී ගෙණ වන වැද ඒ ඒ තැන ඇවිදිමින් ඔවුනොවුන් වැලඳ ගෙණ වියෝ දුකින් හඬන කිඳුරන් දෙදෙනා දැක සෝකපත් ව හඬන

Non-Commercial Distribution

කරුණු විචාළ භල්ලාටිය රජහට ඊට කරුණු කියන කිඳුරෝ:— 'මේ වනයෙහි බල්ලන් හා දුනු හී ගෙණ ඇවිදින පින්වත් වූ වැද්දනුවෙනි, පෙර අපි එක් දවසක් ඔවුනොවුන් නො කැමැති ව ම ඔවුනොවුන් සිතින් සිහි කෙරෙමින් යම් එක රාත්‍රියක් වෙන් ව වාසය කළමෝ ද, ඒ එක් රාත්‍රිය මූළුල්ලෙහි වියෝ දුකින් තැවුනා වූ අපි එබඳු වූ රාත්‍රියෙක් නැවත අපට නො වන්නේ ය' යි කියා වියොගයෙන් ඉකුත් වූ රාත්‍රිය අරභයා සොක කරම්හ' යි කියා දූන්වූවාහු ය'' යි වදාළසේක.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'පිඹුරාගේ එකාංගයක් ගත යුතු ය' යි කියා යමක් වදාළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ ද ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, පිඹුරුතෙම මහත් වූ මහාදීර්ඝශරීරයක් ඇත්තේ ය, බොහෝ දවසක් ආහාරයක් නො ලැබ අඩු වූ දීර්ඝොදරයක් ඇත්තේ ය, ඉතා දිළිඳු වූයේ ය, බඩ පුරා ආහාරයක් නො ලබන්නේ ය, අපරිපූර්ණ වූ ආහාර ඇත්තේ ය. යම් තාක් ශරීරය යැපෙන මාත්‍ර වූ මඳ වූ ආහාරයකින් ම යැපෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම නො පිළිගෙණ තමා විසින් ම ගෙණ වැළඳීමෙන් වැළැක්කා වූ අනුන් විසින් දුන් දෙයක් ම සිතින් කැමැති වන්නා වූ පරපිණ්ඩයට ම එළඹෙන ලද්ද වූ භික්ෂාචාර්යායෙහි ම (518) නියුක්ත වූ යොගී වූ මහණුන් වහන්සේට උදරය පිරීමට සෑහෙන්නා වූ නිවැරදි වූ ආහාරය අතිදුර්ලභ වන්නේ ය. එතෙකුදු වුවත් සසරදුක් ගෙවනු කැමැති වූ නිර්වාණාර්ථ වශිකා වූ ශ්‍රද්ධාවත් මහණුන් වහන්සේ විසින් දැහැමින් ලද්ද වූ භොජනයෙහිත් ගිජු නො වී එක්වන් පස්විකා යපෙන පමණක වළඳා සතර පස්පිඩක් නො වළඳා ඒ අවශෙෂ වූ අඩුව පැන් වැළඳීමෙන් පුරවා ගෙණ ශ්‍රමණධර්මය ම සම්පූර්ණ කොට පිරිය යුත්තේ ය. මහරජානෙනි, පිඹුරාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය සද්ධර්මසෙනාධිපති වූ සැරියුත්මහාථෙර ස්වාමීන් විසින්:—

''අල්ලං සුක්ඛං ව භුඤ්ජන්තො–න බාළ්හං සුහිතො සියා,
ඌනූදරො මිතාහාරො–සතො භික්ඛු පරිබ්බජෙ.
චත්තාරො පඤ්ච ආලොපෙ–අභුත්වා උදකං පිවෙ,
අලං ඵාසුවිහාරාය–පහිතත්තස්ස භික්ඛුනො'' යි.

'තෙත් වූ ආහාර ද, ශුෂ්ක වූ ආහාර ද කමින් ඉතා දැඩි කොට කුක්ෂිය සම්පූර්ණකාරී නො වන්නේ ය, එසෙයින් යුක්ත ව ආහාර ගන්නා වූ ඌනොදරය ඇති ස්මෘතිසම්පන්න මහණතෙම සතරපස්පිඩක් නො වළඳා පැන් පානය කරන්නේ ය. නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇති මහණහට සැපවිහරණය පිණිස එපමණ ඇතැ' යි වදරණ ලදී.''

Non-Commercial Distribution

උද්දානපද නම:—

**කෙසරිවක්කවාකො ච-පෙණාහිසරකපොතකො,**
**උලූකො සතපත්තො ච-වග්ගුලී ච ජලූකිකා,**
**සප්පො අජගරෝ චෙව-වග්ගො තෙන පවුච්චති.''**

**තෙවිසිඅංගයක් ඇති පස්වන වර්ගය නිමියේ ය.**

---

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මාර්ගයෙහි දැල් බැඳ සිටින්නා වූ පන්ථමර්කටකයාගේ එක් අංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළ සේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ දැ?''යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ පන්ථමර්කටකතෙම මාර්ගයෙහි මර්කටක දැලින් වියනක් කොට බැඳ ගෙණ සැහවී හිඳී ද, ඉදින් ඒ මකුළුදැලෙහි කෘමියෙකු හෝ මැස්සෙකු හෝ පළහැටියෙකු හෝ ඇලුනේ වී නම්, වහා අවුත් ඔහු අල්වා ගෙණ අනුභව කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම භාවනායෙහි යෙදී වසන මහණුන් වහන්සේ විසින් චක්ෂුශ්‍රොත්‍රාදි ෂඩ්ද්වාරයෙහි සතරසති-පට්ඨාන නමැති දැල් වියන් බැඳ ගෙණ විවෙකයෙහි සැහවී හිඳ ඉදින් ඒ දැලෙහි ක්ලේශයන් නමැති මක්ෂිකාදීහු බැඳුනාහු නම්, වහා ම ඒ ක්ලේශයෝ උපන් තන්හි ම නැසිය යුත්තෝ ය. මහරජානෙනි, පන්ථ මකුළුවාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය අනුරුද්ධස්ථවිරයන් වහන්සේ විසින්:—

**(519) ' චිත්තං නියමෙ ඡසු ද්වාරෙසු-සතිපට්ඨානවරුත්තමෙ,**
**කිලෙසා තත්ථ ලග්ගා චෙ-හන්තබ්බා තෙ විපස්සිනා''යි.**

''චිත්තය වූත විසින් චක්ෂුශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිව්හා කාය මන යන ෂඩ්-ද්වාරයෙහි උතුම් වූ සතරසතිපට්ඨාන දැල් නහා විවෙකයෙහි සිටි කල්හි ඉදින් ක්ලේශයෝ ඒ සතිපට්ඨානජාලයෙහි ඇලුනාහු නම් විදර්ශක භික්ෂූහු විසින් ඒ ක්ලේශයෝ නැසිය යුත්තාහු ය' යි වදරණ ලද්දේ ය.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ථනය වැළඳ ගෙණ ක්ෂීර පානය කරන්නා වූ ථනසිත දරකයාගේ එක් අංගයක් ගත යුත්තේ ය' යි කියා වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ දැ?'' යි විචාළෝ ය. මහ-රජානෙනි, යම් සේ ථනසිත ළදරුතෙම තමාගේ අර්ථයෙහි ම ඇලෙන්-නේ ය. කිරි පිණිස ම හඬන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් තමාගේ ස්වකීය අර්ථයෙහි ම ඇලුන යුත්තේ ය. උද්දෙස ප්‍රතිපෘච්ඡා සම්‍යක් ප්‍රයොග පවිවෙක ගුරුසෙවන කල්‍යාණමිත්‍රසෙවනය යන්නාදි සර්වස්ථානයෙහි ද ච ස්සත්‍යය දක්නා වූ ඥාණයෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, ථනසිතදරකයාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය සර්වමාර-ථාරණකෙශරින්ද්‍රභූත වූ දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින්

Non-Commercial Distribution

දීර්ඝනිකායෙහි වූ උතුම් පරිනිර්වාණසූත්‍රාන්තයෙහි 'ඉංඝ තුම්හෙ ආනන්ද සද්ත්ථෙ ඝටථ. සද්ත්ථෙ අනුයුඤ්ජථ. සද්ත්ථෙ අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරථ' යි යනුවෙන් 'ආනන්දයෙනි, තෙපි සද්ත්ථ සංඛ්‍යාත වූ අර්හත්ඵලයෙහි ව්‍යායාම කරවු. ආචාර්යවත් උපාධ්‍යාය වත් සෙනාසනවත් යනාදී වත් නො පිරිහෙළා කිරීමෙන් අර්හත්ඵලයෙහි ම නො හැර වීර්යය කරවු, එහි ම යෙදෙවු, අර්හත්ඵලය උපදවා ගැණීම පිණිස අර්හත්ඵලයෙහි ම කායචිත්තවීර්යයෙන් අප්‍රමාද ව කෙලෙසුන් තවන වීර්යයෙන් යුක්ත ව නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇති ව වාසය කරවු' කියා වදරණ ලද්දේ ය.'' 'ඉංඝ' යනු චොදනාර්ථයෙහි නිපාතපදයයි.

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'චිත්‍රකධර කූර්මයාගේ එක් අංගයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ චිත්‍රකධර කූර්ම තෙම උදකභයින් උදකය දුරු කොට ගොඩ හැසිරෙන්නේ ය. ඒ උදක වාසය හැරීමෙන් තමාගේ ආයුෂයෙන් නො පිරිහෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සුචරිතධර්ම විෂයෙහි ස්මෘතිවිප්‍රවාසය යි කියන ලද ප්‍රමාදභාවයෙහි භය දැකීමෙන් යුක්ත විය යුත්තේ ය. සුචරිතධර්මවිෂයෙහි ස්මෘතිඅවිප්‍රවාස ය යි කියන ලද අප්‍රමාදභාවයෙහි ආත්මාර්ථ පරාර්ථ සාධක හෙයින් ගුණවිශෙෂ දැකීමෙන් යුක්ත විය යුත්තේ ය. ඒ ප්‍රමාදයෙහි දක්නාසුලු වීමෙන් සියලු ම ශ්‍රමණගුණයෙන් නො පිරිහෙන්නේ ය. අමෘතමහානිර්වාණයාගේ සමීපයට පැමිණෙන්නේ ය. මහරජානෙනි, චිත්‍රකධර කූර්මයාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මේ කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මපදයෙහි:—

(520) ''අප්පමාදරතො භික්ඛු-පමාදෙ භයදස්සි වා,
අභබ්බො පරිහානාය-නිබ්බාණස්සෙව සන්තිකෙ'' යි.

'අප්‍රමාදභාවයෙහි ඇලුනා වූ හෙවත් නො පමා ව වසන්නා වූ නරකොත්පත්තියට කාරණා වූ ප්‍රමාදයෙහි ම භය දක්නා වූ හෙවත් නරකොත්පත්‍යාදියට කාරණා වූ හෙයින් ප්‍රමාදය භය විසින් දක්නා වූ මහණතෙම සමථවිදර්ශනාධර්මයෙන් මාර්ගඵලාධිගමයෙන් පිරිහීමට අයොග්‍ය වූයේ ක්ලේශනිර්වාණයට ද, අනුපාදපරිනිර්වාණයට ද සමීප යෙහි ම වන්නේ ය' යි කියා වදරණ ලදී.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මහවනයාගේ පඤ්චාංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ පංචාංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ මහාවනය නම් අසුචිවන්ත ජනයන් මුවහ කොට වසන්නේ ය. මහරජානෙනි, එපරිද් දෙන් ම යොගාවචර මහණුන් වහන්සේ විසින් අනුන්ගේ අපරාධය දෙෂය පතළ නො කොට වැසිය යුත්තේ ය. විවෘත නො කට යුත්තේ ය.

Non-Commercial Distribution

මහරජානෙනි, මහවනයාගේ මේ ප්‍රථම අංගය ගත යුත්තේ ය. තවද මහරජානෙනි, මහවනය බොහෝ වූ නොයක් ජනයන්ගෙන් ශූන්‍ය වූයේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් රාග ද්වෙෂ මොහ මාන දෘෂ්ටි සමූහයෙන් ද, සර්වක්ලේශයෙන් ද ශූන්‍ය විය යුත්තේ ය. මහරජානෙනි, මහවනයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මහවනය ජනසම්බාධ විරහිත ව විවෙක වූයේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් අනාර්ය වූ, ලාමක වූ අකුශලධර්මයෙන් විවෙක විය යුත්තේ ය. මහරජානෙනි, මහවනයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මහවනය යහපත් වූයේ ය, පිරිසිදු වූයේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සත්හිඳී පිරිසිදු විය යුත්තේ ය. ප්‍රහීණ වූ, මානයෙන් ප්‍රහීණ වූ ගුණමකු බැවින්[1] යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, මහවනයාගේ මේ සතරවන අංගය ගත යුත්තේ ය. තවද මහරජානෙනි, මහවනය උත්තම ජනයන් විසින් සෙවනය කරණ ලද්දේ ය. පසස්නා ලද්දේ ය, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා උත්තම වූ ශීලගුණව්‍රතසමාදානයෙන් මාර්ගඵලලාභී වූ ආර්යජනයන් විසින් නිත්‍යසෙවනය කරණ ලද්දෙකු විය යුත්තේ ය. ආර්යයන් විසින් පසස්නා ලද්දෙකු විය යුත්තේ ය. මහරජානෙනි, මහ වනයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් සංයුත්සඟි වරයෙහි:—

**''පවිවිත්තෙහි අරියෙහි - පහිතත්තෙහි ඣායිහි,**
**නිච්චං ආරද්ධවිරියෙහි - පණ්ඩිතෙහි සහාවසෙ''යි.**

'නිරන්තරයෙන් විවෙකවාසී වූ නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇත්තා වූ ආලම්බනොපනිධ්‍යානාදි ධ්‍යාන වඩන්නා වූ පටන් ගන්නා ලද වීර්‍ය්‍ය ඇත්තා වූ පණ්ඩිත වූ ආර්‍ය්‍යයන් හා සමග වාසය කරන්නේය' යි කියා වදාරණ ලදී.''

**(521)** ''ස්වාමීනි, නාගසෙනයන්වහන්ස, 'වෘක්ෂයාගේ අංගත්‍රයෙක් ගත යුත්තේ ය' යි කියා යමක් වදාළසේක් ද, ඒ ගත යුතු වූ අංගත්‍රය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ වෘක්ෂය නම් පුෂ්පඵල ධරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් තමාගේ සිත් නමැති වෘක්ෂයෙහි හට ගත්තා වූ විමුක්ති පුෂ්ප ය යි කියන ලද පඤ්චස්කන්ධාදිධර්මයන් අනිත්‍ය දුඃඛ අනාත්ම කොට බලා විදර්ශනාඥානයෙන් අවිද්‍යාදික්ලේශයන් එබූ හෙයින් තදංගවිමුක්තිය ද, විතර්ක විචාර ප්‍රීති සුඛ චිත්තෙකාග්‍රතා ය යන මේ පස් දෙනා කාමච්ඡන්ද ව්‍යාපාද ථිනමිද්ධ උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡා යන පඤ්චනීවරණයෙන් ඔබා ප්‍රථමධ්‍යානාදි අෂ්ටසමාපත්තියට පැමිණි

1. ෂඩින්ද්‍රියයෙන්



Non-Commercial Distribution

හෙයින් විෂ්කම්භණ නම් වූ විමුක්තිය ද, සත්කායදෘෂ්ටිය විචිකිච්ඡාය සීලබ්බතපරාමාස ය යන තුණ හා දෘෂ්ට්‍යානුසය විචිකිච්ඡානුසය යන දෙක හා දෘෂ්ටිසංයොජනය විචිකිච්ඡාසංයොජනය සීලබ්බතපරාමාස සංයොජනය යනාදි ක්ලේශයන් කැඩූ සෝවාන්මාර්ගය ද, කාමරාගය හා ව්‍යාපාදය හා කාමරාගානුසය හා පටිඝානුසය හා කාමරාගසංයොජනය පටිඝසංයොජනය යන මෙකී අකුසල් තුනී කළා වූ සකෘදගාමීමාර්ගය ද, කාමරාගය ව්‍යාපාදය යන දෙක හා කාමරාගානුසය පටිඝානුසය යන දෙක හා කාමරාගසංයොජයනය පටිඝසංයොජනය යන මෙකී ක්ලේශයන්ගේ සිටීම නැති කොට කැඩූ අනාගාමීමාර්ගය ද, රූපරාගය, අරූපරාගය, මානය, උද්ධච්චය අවිජ්ජාය, භවරාගානුසය, මානානුසය, අවිජ්ජානුසය, භවරාගසං-යොජනය, මානසංයොජනය, අවිජ්ජාසංයොජනය, ඊර්ෂ්‍යාසංයොජනය, මච්ඡරිය සංයොජනය යනාදි වූ අනන්තක්ලේශයන් කැඩූ රහත්මාර්ගය ද, මෙ සතර මගින් සකලක්ලේශයන් සිටීම නැති කොට කැඩූ හෙයින් මේ සමුච්ඡෙද නම් විමුක්තිය ද, ඒ මගින් ක්ලේශයන් කඩා සන්හුන්නා වූ සතරඵලචිත්ත සංඛ්‍යාත වූ පටිප්පස්සද්ධිවිමුක්තිය ද, කාමභව රූපභවාදි ‘නවභවයෙන් ද පඤ්චමහාගතියෙන් ද චතුර්විධයොනියෙන් ද සප්තවිධ විඥානස්ථිතියෙන් ද නවසත්තාවාසයෙන් ද වෙන් වූ අනවරාග්‍ර වූ සංසාරය හා නො හැනී සිටියා වූ අජරාමර වූ ශාන්ත වූ අමාමහානිර්වාණ සංඛ්‍යාත නිස්සරණවිමුක්තිය ද යන තදංග විෂ්කම්භණ සමුච්ඡෙද පටිප්පස්සද්ධි නිස්සරණවිමුක්ති යන පඤ්චවිමුක්ති නමැති පුෂ්ප හා සතරශ්‍රාමණ්‍යඵල ධරණ විසින් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, වෘක්ෂයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, වෘක්ෂයතෙම තමාගේ සමීපයට එළඹියා වූ ප්‍රවිෂ්ට වූ ජනයන්ට විඩා හැර හිඳීම පිණිස සෙවන දෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණුන් වහන්සේ විසින් තමාගේ සමීපයට එළඹුනා වූ ප්‍රවිෂ්ට වූ පුද්ගලයන්ට ආමිෂසංග්‍රහ යෙන් හෝ ධර්මසංග්‍රහයෙන් හෝ සංග්‍රහ කට යුත්තේ ය. මහරජානෙනි, වෘක්ෂයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, වෘක්ෂයතෙම තමාගේ ඡායාව වෙනස් නො කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණහු විසින් හිතාහිත වූ සකල ප්‍රාණිභූතයන් කෙරෙහි සිතින් වෙනස් බවෙක් නො කට යුත්තේ ය. **(522)** ‘කිමෙක් ද? මේ ලොකවාසී සියලු සත්වයෝ ම අවෛරී ව නිදුක් ව නිරොගී ව සුවපත් වූ තමන් පරිහරණය කෙරෙත් නම් මැනැවැ’ යි කියා වෛරවධක පස-මිතුරන් කෙරෙහි ද, තමහට හිත කැමැති බන්ධුමිත්‍රාදීන් කෙරෙහි ද වෙනස් නො වූ සම වූ මෛත්‍රීභාවනාව කළ යුත්තේ ය. මහරජානෙනි, වෘක්ෂයාගේ මේ තෘතියාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය සද්ධර්මසෙනාධිපති වූ **ශාරීපුත්තමහාථෙර ස්වාමීන් වහන්සේ** විසින්—

Non-Commercial Distribution

**“වධකෙ දෙවදත්තම්හි–චොරෙ අංගුලිමාලකෙ,**
**ධනපාලෙ රාහුලෙ චෙව–සබ්බත්ථ සමකො මුනි” යි.**

‘**දෙවදත්තමහතෙරහු** මහාබොධිසත්වයන් වහන්සේට **සේරිවාණිජ** ජාතකයෙහි රන්තලියට බැඳී වෛරයෙන් පස්කපක් මුළුල්ලෙහි **ධර්මපාල** ජාතකාදි නොයෙක් ජාතිශතසහස්‍රයෙහි වධ කොට අවුත් දූන් බුදු වන ජාතියෙහි තමන් වහන්සේට නෑ වත් ලඟ පැවිදි වත් පෙර වෛරයෙන් යෙදී බුදුකමත්, ගුරුකමත්, නෑකමත් සලකා ගත නො හී ‘බුදුන් මරා බුද්ධරාජ්‍යය ගණිමි’ යි සිතා බුදුන් විද මරන්නට දුනුවායන් යෙදීමෙන් ද, **ගිජ්ඣකූටපර්වතයෙහි** එකලා ව සක්මන් කරණ බුදුන් හිසට ගලක් පෙරළීම් ආදී වූ අනෙකප්‍රකාර ක්‍රෑරතර වධ ප්‍රයොග යෙදූහ. ඒ ජාතිවෛරී වූ ඒ **දෙවදත්තමහතෙරහු** කෙරෙහි ද, ගුරුන් බස් ගෙණ ‘ඇඟිලිමාලාවෙන් ගුරුන් පුදමි’ සිතා කඳු කඩවත් මාර්ග රැක හිඳ දුටුදුටුවන් මරා ඇඟිලි කපා ගොතා ගණිමින් **අංගුලිමාල** යක්ෂයෙකැ යි යන නමින් ප්‍රසිද්ධ ව දඹදිව විනාස කෙරෙමින් ඇවිදිනා කල්හි දිනෙක ඔහුගේ වැදූ මැනියන් අත කපා ඒ පාපයෙන් අපායභාගී වන පරිදි දැක ඒ අසා ‘අපාදූකින් මුදමි’යි ඔහු කෙරෙහි කළ මහාකරුණාවෙන් වැඩ වදළ ලොවුතුරා බුදුන් දැක ‘නො දුව මහණ’ යි කියකියා සුගත්ඇඟිලි කපන්නට පැන්නූ **අංගුලිමාල** නම් මහසොරහු කෙරෙහි ද, අඥාන වූ දෙවදත්තසංසර්ගදෙෂයෙන් **අජාත-ශත්‍රැ** නම් නරෙන්ද්‍රයන් විසින් සුරා සොළොස්කළයක් පොවා මත් කොට බුදුන් වඩනා පෙර මහට හළ රාමදින් මත් ව ඇත්හල සිඳ බිඳ සුණුවිසුණු කොට පියා යදම් රැහැන් මකුළුහු විවරත් සරු නො කොට කඩා ගෙණ දුටු දුටු තැන හැන මැරූ ගව මිනිසුන්ගේ ලෙහෙයෙන් රිදී කඳන් වැනි ශ්වේතදන්තයන් රත්පැහැ කෙරෙමින් අලාතචක්‍ර වන් රතැස් බමබමා කප්ගින්නක් සේ සකලසත්ව භයානක වූ රූපයෙන් සෙණහඩක් සේ ගුගුරා පියා **රජගහනුවර** පෙරළන්නාක් මෙන් එකකොලාහල කෙරෙමින් තමන් වහන්සේ හැන මරන්නට පැන්නූ **ධනපාල** නම් **නාලාගිරිහු** කෙරෙහි ද, අනන්තජාතියෙහි තමන් වහන්සේගේ පාරමිතාධර්මයන් සම්පූර්ණ කරවා ලීමට සහාය ව අවුත් දූන් බුදු වන ජාතියෙහිත් ඖරසපුත්‍රභාවයට පැමිණ බුදුන් **කිඹුල්වත්පුරයට** වැඩ විසිදහසක් රහතන් පිරිවරා ගෙපිළි-වෙළින් පිඩු සිඟන කල **යසොධරාදෙවීන්ගේ** බසින් බුදුන් කරා ගොස් සිවුරු කොණ අල්ලා ගෙණ බුදුන් මුහුණ බලබලා බුදුන්ගේ පතුල් ලඟ තමන්ගේ පතුල් තබමින් ලක්ෂණ බලබලා ප්‍රියතෙපුල් කියමින් දයාදසම්පත් ඉල්ලූ **රාහුල** **(523)** නම් කුමාරරත්නය කෙරෙහි ද යන මේ හිතාහිත සකල ජනයන් කෙරෙහි ම කරුණා නිධාන වූ සර්වඥයන් වහන්සේ ‘තරාදිය උතුවක් මෙන්, එකාකාරයෙන් සම වූ කරුණාමෛත්‍රී සිත් ඇතිසේකැ’ යි කියා වදරණ ලදී.”

"ස්වාමීනි, නාගසෙනයන්, වහන්ස, 'මෙඝයාගේ පඤ්චාංගයක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ පඤ්චාංගය කවරේ දැ?" යි විචාළෝ ය. "මහරජානෙනි, යම් සේ මෙඝය උපන්නා වූ රජස්ජාලය සන්හිඳුවන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් උපන්නා වූ කෙලෙස් රජස්ජාලය සන්හිඳුවා ලිය යුත්තේ ය. මහරජානෙනි, මෙඝයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මහාමෙඝය මහාපෘථිවියෙහි උෂ්ණ නිවා ලන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් මෛත්‍රීභාවනාව වැඩීමෙන් දෙවියන් මිනිසුන් සහිත වූ ලොකයෙහි ක්‍රොධ නමැති උෂ්ණය නිවාලිය යුත්තේ ය. මහරජානෙනි, මෙඝයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මහාමෙඝය සියලු ම බීජ ජාතීන් හට ගන්වාලන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සියලු සත්වයන්ට ශ්‍රද්ධාව උපදවා දී ඒ ශ්‍රද්ධාබීජය දිව්‍යසම්පත්තියෙහි ද, මනුෂ්‍යසම්පත්තියෙහි ද, බ්‍රහ්මසම්පත් හා පරමාර්ථ වූ අමෘතමහානිර්වාණසම්පත්තියෙහි ද යන ත්‍රිවිධ සම්පත්තියෙහි රොපණය කළ යුත්තේ ය. මහරජානෙනි, මෙඝයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මහාමෙඝයතෙම හෙමන්ත, ග්‍රීෂ්ම, වස්සානය යන ඍතුවකින් පැන නැඟී පෘථිවිතලයෙහි හට ගත්තා වූ තෘණ වෘක්ෂ ලතා වනලැහැප් ඖෂධජාති වනජ්‍යෙෂ්ඨ වෘක්ෂ යනාදිය රක්ෂා කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් යොනිසොමනස්කාරය උපදවා ගෙණ ඒ යොනිසොමනස්කාරයෙන් සියලු ම ශ්‍රමණධර්මය රක්ෂා කට යුත්තේ ය. මහරජානෙනි, සියලු ම කුශලධර්මයෝ යොනිසොමනස්කාරය මුල් කොට ඇත්තාහු ය. මහරජානෙනි, මෙඝයාගේ මේ සතරවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මහාමෙඝයතෙම වර්ෂා කෙරෙමින් ගංගා වැව් පොකුණු ඇළ කඳුරු පෘථිවි පැළී විවර වූ පදර විල් හෙබ ලිං නිරන්තර උදක ධාරාවෙන් පරිපූර්ණ කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සුගතාගමපර්යාප්තියෙන් සද්ධර්ම නමැති මහ මෙඝය තුන්ලෝ පුරා වර්ෂා කරවා නිර්වාණාධිගමය කැමැත්තා වූ දිව්‍ය මනුෂ්‍යයන්ගේ සිත් පුරවාලිය යුත්තේ ය. මහරජානෙනි, මහාමෙඝයාගේ මේ පස්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, සද්ධර්මසෙනාධිපති වූ ශාරිපුත්‍රමහාථෙර සාමීන් වහන්සේ විසින්:—

**"බොධනෙය්‍යං ජනං දිස්වා- සතසහස්සෙපි යොජනෙ,**
**ඛණෙන උපගන්ත්වාන- බොධෙති තං මහාමුනී"යි.**

'මහාමුනීන්ද්‍ර වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ සියදහස් ගණන් යොදුනෙන් ඔබ්බෙහි ද නිවන් අවබොධය කළ යුතු වූ විනෙය්‍ය ජනයා දැක (524) ක්ෂණයකින් ලඟට වැඩ ඒ කෘතපුණ්‍යවත් වූ ජනයාට අමෘතමහානිර්වාණය අවබොධ කරවා වදරණසේකැ' යි කියා මෙම කාරණය වදරණ ලද්දේ ය."

Non-Commercial Distribution

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මාණික්‍යරත්නයාගේ අංගත්‍රයෙක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගත්‍රය කවරේ ද?" යි විචාළෝ ය. "මහරජානෙනි, යම් සේ මාණික්‍යරත්නය ඒකාන්ත පරිශුද්ධ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ඒකාන්තයෙන් ම පිරිසිදු වූ ආජීවපාරිශුද්ධිශීලයෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, මාණික්‍යරත්නයාගේ මේ පළමුවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මාණික්‍යරත්නය කිසිවක් සමග මිශ්‍ර නො වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් පාපයන් හා ද, පාපමිත්‍රයන් හා ද මිශ්‍ර නො විය යුත්තේ ය. මහරජානෙනි, මාණික්‍යරත්නයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මාණික්‍යරත්නය ජාතිරත්න හා යොදනු ලැබෙයි. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් මාර්ගස්ථ ඵලස්ථ සෙඛඵල සමංගී වූ උත්තමවරජාතිමත් ආර්යයන් හා සමග වාසය කළ යුත්තේ ය. සෝවාන් සකෘදගාමී අනාගාමී අර්හත් ත්‍රෛවිද්‍ය ෂඩභිඥය යන ශ්‍රමණමාණික්‍යරත්නයන් හා සමග දිවිහිමියෙන් ම වැසිය යුත්තේ ය. මහරජානෙනි, මාණික්‍යරත්නයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින් **සුත්‍රනිපාතයෙහි:—**

**"සුද්ධාසුද්ධෙසු සංවාසං–කප්පයවෙහා පතිස්සතා,**

**තතො සමග්ගා නිපකා–දුක්ඛස්සන්තං කරිස්සථ"** යි.

'මහණෙනි, ශීලාදිගුණයෙන් පිරිසිදු වූ ඔවුනොවුන් කෙරෙහි ගෞරව ඇත්තා වූ තෙපි ශීලාදිගුණයෙන් සුද්ධවූවන් හා ඒකකර්මාදි සමානවාසය කරවු. එහෙයින් තෙපි සුද්ධ ව සුද්ධ වූවන් හා මෙසේ සංවාසය කරණ විසින් සමග ව ක්‍රමයෙන් නුවණ මුහු කළා වූ තෙපි සියලු වෘත්තදුඃඛාදි දුඃඛයාගේ කෙළවර කරවු' කියා වදරණ ලදී."

"ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'මෘගයන් නසා ජීවත් වන්නා වූ මාගවිකයාගේ චතුරංගයක් ගත යුතු ය' යි කියා යමක් වදළ සේක් ද, ඒ ගත යුතු වූ චතුරංගය කවරේ ද?" යි විචාළෝ ය. "මහරජානෙනි, යම් සේ මුවවැද්දහුගේ නිද්‍රා අල්ප වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සමථවිදර්ශනායෙහි යෙදීමෙන් හා සක්මන් කිරීම් වසයෙන් අල්පනිද්‍රාවෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, මුව වැද්දගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මුවවැද්දහු තමාගේ සිත මෘගයන් ග්‍රහණය කිරීමෙහි ම උපනිබන්ධනය කරන්නේ ය. පමුණුවන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ඒකාහමත, ද්වීහමත, උද්ධුමාතකාදි අරමුණෙහි තමාගේ සිත පමුණුවා ගත යුත්තේ ය. **(525)** අනුබැඳ ගත යුත්තේ ය, මහරජානෙනි, මුවවැද්දගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි,

Non-Commercial Distribution

මුවවැදිතෙම තමාගේ මෘගඝාතනකෘත්‍යයට කල් දන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ‘මේ විවෙකයට කල් වන්නේ ය, මේ විවෙකයෙන් නික්මීමට කල් වන්නේ ය’ යි කියා තමාගේ විවෙකවාසයට කල් දැන ගත යුත්තේ ය. මහරජානෙනි, මුව වැද්දගේ මේ තුන්වන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, මුවවැදිතෙම මෘගයන් දැක ‘මොහු ලබමි’ යි කියා සතුටු උපදවා ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් උපචාර අර්පණා කසිණාලොකාදිය දැක ‘මාර්ගඵලාධිගමවිශෙෂයට පැමිණෙන්නෙමි’ යි කියා සන්තොස උපදවා ලිය යුත්තේ ය. අරමුණෙහි අභිරමණය කළ යුත්තේ ය. මහරජානෙනි, මුවවැද්දගේ මේ සතරවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය **මොඝරාජ** නම් මහතෙරුන් වහන්සේ විසින් ද:—

**“ආරම්මණෙ ලභිත්වාන–පහිතත්තෙන භික්ඛුනා,**
**භිය්‍යො හාසො ජනෙතබ්බො–අධිගච්ඡිස්සාමි උත්තරිං”යි.**

‘නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇති භින්නක්ලේශයන් ඇති භික්ෂූහු විසින් අරමුණු ලැබ ‘උත්තරිසංඛ්‍යාත අධිගමයට පැමිණෙමි’ යි කියා බොහෝ සන්තොස උපදවා ලිය යුත්තේ ය’ යි කියන ලදී.”

“ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ‘බිළීකටුවෙන් මසුන් මරා ජීවත් වන්නහුගේ අංගද්වයක් ගත යුත්තේ ය’ යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ දැ?” යි විචාළෝ ය. “මහරජානෙනි, යම් සේ ඒ බාළිසික තෙම බළිසයෙන් මසුන් ගොඩ අදින්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණහු විසින් නවමහාවිදර්ශනා ඥානයෙන් අධිගමශ්‍රාමණ්‍යඵලයන් කෙලෙස් මුහුදින් ගොඩ නඟා ඇද්ද යුත්තේ ය. මහරජානෙනි, බාළිසිකයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, බාළිසිකතෙම ක්ෂුද්‍ර වූ සතකු නසා බිළිය අමුණා ගෙණ මහත් වූ මස්ලාභයට පැමිණෙන්නේ වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ මහණහු විසින් ස්වල්ප වූ ලොකාමිෂ-මාත්‍රය හැරිය යුත්තේ ය. මහරජානෙනි, ලෞකික වූ සැප ආස්වාදය යි කියන ලද ලොකාමිෂමාත්‍රය හැර යොගී වූ මහණුන් වහන්සේ මහත් වූ ශ්‍රාමණ්‍යඵලයට පැමිණෙන්නේ ය. මහරජානෙනි, බාළිසිකයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය **රාහුල** මහාථෙර සාමීන් වහන්සේ විසින්:—

**“සුඤ්ඤතං ච නිමිත්තං ච–විමොක්ඛං චාප්පණිහිතං,**
**චතුරො ඵලෙ ඡළභිඤ්ඤා–චජිත්වා ලොකාමිසං ලභෙ.”**

‘ශ්‍රමණතෙමේ ලොකාමිෂ සංඛ්‍යාත වූ පඤ්චකාමසැපය හැර ශූන්‍යතාවිමොක්ෂය ද, අනිමිත්තවිමොක්ෂය ද, අප්‍රණිහිතවිමොක්ෂය ද, චතුර්විධ මාර්ගඵල ද, ෂඩ්අභිඥාව ද යනාදි ලොකොත්තරධර්මයන් ලබන්නේ ය’ යි කියා වදරණ ලදී.”

*Non-Commercial Distribution*

**(526)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'වඩුවාගේ අංගද්වයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ වඩුතෙම දලිනූල අනුලොම් කොට දූවය සහී ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සර්වඥශාසනය වදළ ක්‍රමයෙන් ම අනුලොම් කොට ගොස් සතරසංවරශීල නමැති මහාපෘථිවියෙහි සිට ශ්‍රද්ධා නමැති හස්තයෙන් ප්‍රඥ නමැති වෑය ගෙණ රාගාදික්ලේශයන් සැස්ස යුත්තේ ය. මහරජානෙනි, වඩුවාගේ මේ ප්‍රථමාංගය මහණුන් වහන්සේ විසින් ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, වඩුතෙම වෘක්ෂයෙහි සුඹුලු එල[1] පහ කොට අරටුව ම ගණී ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් 'ඒ ජීවිතය ම ශරීරය' යි කියා ගන්නා දෘෂ්ටිය ද, 'ඒ ජිවිතය අනිකෙක, ශරීරය අනිකෙකැ' යි කියා ගන්නා දෘෂ්ටිය ද, 'ඒ අප කී වාදය ම උත්තම ය, සෙස්ස බොරු ය' යි කීම ද, 'මෙසේ කරව' යි කියා පරවිධාන විරහිත වූ දුකින් මිදීමට අයොග්‍ය වූ පුරුෂවීර්යයෙන් ලැබිය යුතු එල නසන හෙයින් පුරුෂවික්‍රමයක් නො වන්නා වූ ශ්‍රෙෂ්ඨයන්ගේ විසීමක් නො වන්නා වූ සකල සත්වයන්ට අනර්ථ සැදීමෙන් සත්වවිනාශය කරන්නා වූ නවසත්වාවාසයෙහි සත්වජනනය කරන්නා වූ සර්වසංස්කාරයන්ගේ ශාස්වතය වඩන්නා වූ ශාශ්වතදෘෂ්ටිය ද,[2] 'මරණින් මත්තේ නැතැ' යි කියා ගන්නා උච්ඡෙද දෘෂ්ටිය ද, 'යමෙක් කායදුශ්චරිතාදිය කෙරේ ද ඔහු ම විපාක විඳින්නේ ය, අනිකෙක් කායදුශ්චරිතාදිය කරන්නේ ය, අනිකෙක් විපාක විඳින්නේ ය' යි කියා කර්මඑල දක්නා දෘෂ්ටීහු ද, ක්‍රියාඑලවාදිදෘෂ්ටිහු ද යන මෙසේ මෙබඳු වූ දෘෂ්ටිහු ද, අනිකුදු විවාදමූලික වූ දෙසැටදෘෂ්ටීන් ද දුරු කොට හැර සර්වසංස්කාර ප්‍රවෘත්තීන්ගේ ස්වභාවය පරමශූන්‍ය කළ මනා වීර්ය විරහිත වූ සත්වසංඥ විරහිත වූ ස්ථාන වර්ණ විසින් අවිද්‍යමාන වූ සාර වූ අමෘතමහානිර්වාණය ගත යුත්තේ ය.[2] මහරජානෙනි, වඩුවාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ විසින් සූත්‍රනිපාතයෙහි:—

> **''කාරණ්ඩවං නිද්ධමථ–කසම්බුඤ්චාපකස්සථ,**
>
> **තතො පලාපෙ වාහෙථ–අස්සමණෙ සමණමානිනෙ.**
> **නිද්ධමිත්වාන පාපිච්ඡෙ–පාපආචාරගොචරෙ,**
>
> **සුද්ධාසුද්ධෙහි සංවාසං–කප්පයව්හො පතිස්සතා,**
> **තතො සමග්ගා නිපකා–දුක්ඛස්සන්තං කරිස්සථා''** ති.

යනුවෙන් 'මහණෙනි, කසළක් වැනි ඒ පුද්ගලයා නිරාලය ව දමන කසළක් මෙන් ඉවත දමවු, ඔජා පෙළා ගත් කාෂ්ඨයක් මෙන් ද, වසල්ලක් වැනි ඔහු වැලිත් ක්ෂත්‍රියාදි උත්තමයන් මධ්‍යයට වන් බීදී වැගිරෙණ

1. එලපනය 2. මේ කොටසෙහි පරිවර්තනය වැරදි සහිත ය.

Non-Commercial Distribution

කුෂ්ඨරෝග ඇති චණ්ඩාලයකු මෙන් පිටිකර ගෙණ පහ කරවූ. සංඝාරාමය නම් සිල්වතුනට ම නිසි ය.[1] එහෙයින් පරමාර්ථයෙන් සමිතපාපයක් නැති හෙයින් ශ්‍රමණ නුවූ ශ්‍රමණවෙශමාත්‍රයකින් ම 'අපි ශ්‍රමණයම්හ' යන සිත් ඇති සුවඳ රත්හැල් මධ්‍යගත සාල් නැති බොල් මෙන් අභ්‍යන්තර **(527)** යෙහි ශීලසාරයක් නැති දුශ්ශීල වූ ශ්‍රමණ බොල් ගසා හැර පියවූ. නැති ගුණ පවසන[2] ලාමක අදහස් ඇති හෙයින් පාපිච්ඡ වූ කයින් ශික්ෂාපදව්‍යතික්‍රමණය කිරීම් ආදී වූ ලාමක ආචාර හා වෙශ්‍යාදිලාමකගොචරස්ථානයට නිතර එළඹීමෙන් පාපආචාර ගොචර ඇති දුශ්ශීල අලජ්ජීන් නිරාලය ව දමන කසළක් මෙන් ශාසනයෙන් පිටත් කොට හැර ශීලාදිගුණධර්මයෙන් පිරිසිදු වූ ඔවුනොවුන් කෙරෙහි ගෞරව ඇත්තා වූ ශීලාදිගුණයෙන් සුද්ධ වූවන් හා එකකර්ම එකුද්දෙස සමසික්ඛතාදීන් දක්වන ලද සමානසංවාස කරවූ. එහෙයින් තෙපි සුද්ධ ව සුද්ධයන් හා මෙසේ සංවාසය කරණ විසින් ශීලදෘෂ්ටිසාමන්‍යතායෙන්[3] එක් ව සමග ව එක් වූ ක්‍රමයෙන් නුවණ මුහු කළා වූ තෙපි සියලු ජාත්‍යාදිදුඃඛාදි දුඃඛයාගේ කෙළවර කරවූ' කියා වදාරණ ලදී.''

උද්දානපද නම්:—

**'මක්කටො දාරකො කුම්භො–චණ්ඩ‍ං රුක්ඛො ච පඤ්චමො,**
**මෙඝො මණි මාගවිකො–බාළිසී තච්ඡකෙන චා ති.'**

**සත්විසිඅංගයක් ඇති සවන වර්ගය නිමියේ ය.**

---

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ඝටයාගේ එකාංගයක් ගත යුතු ය' යි කියා යමක් වදාළසේක් ද, ඒ ගත යුතු වූ එකාංගය කවරේ දැ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ සම්පූර්ණ වූ කුම්භය නො සැලේ ද, ශබ්ද නො කෙරේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සුගතාගමයෙහි ප්‍රතිවෙධයෙහි පර්යාප්තියෙහි සතරශ්‍රාමණ්‍ය ඵලයෙහි පරතෙරට පැමිණ නො සැලුන යුත්තේ ය, උඩඟු ශබ්ද නො කළ යුත්තේ ය, ඒ කෙළ පැමිණීම් කරණ කොට ගෙණ මානයක් නො කළ යුත්තේ ය, අහංකාරකමක් නො දක්විය යුත්තේ ය, පහ කරණ ලද මානයෙන් පහ කරණ ලද දර්පයෙන් අප්‍රිය නො වන වචනයෙන් අත්තුක්කංසන වසයෙන් තමහට ස්තුති නො කිරීමෙන් ඍජුකමින් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, කුම්භයාගේ මේ එකාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ සනරාමර ලොකෙකනායක වූ අප ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ විසින් **සූත්‍රනිපාතයෙහි** වූ **නාලක සූත්‍රයෙහි:—**

**''යදූනකං තං සණති[4]–යං පූරං සන්තමෙව තං,**
**රිත්තකුම්භූපමො බාලො–රහදො පූරොව පණ්ඩිතො''** යි.

---

1. නිස්සහ 2. පතන 3. ශ්‍රාමණ්‍යයෙන් 4. සන්ති .

Non-Commercial Distribution

'යම් ඝටයක් අසම්පූර්ණ ද, ඒ ඝටය ශබ්ද කරන්නේ ය, යම් ඝටයක් සම්පූර්ණ ද, ඒ ඝටය ශබ්ද නො කිරීමෙන් ශාන්ත ම ය. එමෙන් ආත්මාර්ථපරාර්ථ නසන්නා වූ අඥානතෙම සිස් වූ කුම්භයට බඳු වූ උපමා ඇත්තේ ය. ආත්මාර්ථ පරාර්ථ–උභයාර්ථ සාධන්නා වූ පණ්ඩිත තෙම අනන්තජලයෙන් සම්පූර්ණ වූ රහද සංඛ්‍යාත වූ මහාසමුද්‍රය මෙනි' යි කියා වදරණ ලදී.''

**(528)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'කාලායසයාගේ අංග ද්වයයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ දැ ?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ කාලායස සංඛ්‍යාත වූ යකඩින් කළ ශස්ත්‍ර විශෙෂයතෙම මනා කොට පණ පොවන ලද්දුයේ වෘක්ෂලතාදිය සිඳීමෙහි පැමිණෙන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන්ම යොනිසොමනස්කාරයෙහි සමාහිත කොට පිහිටුවන ලදද් වූ යොගී වූ යොගාවචරයාගේ සිත සමථ විදර්ශනාදියෙහි පැමිණේ. මහරජානෙනි, කාලායසයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. නවද, මහරජානෙනි, කාලායසතෙම නිවීම්[1] වසයෙන් වරක් බුන් ජලය නැවැත නො වමාරන්-නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් ඒ සුගත තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධසර්වඥරාජොත්තමයානන් වහන්සේ මහෙශාඛ්‍ය වූසේකැ යි කියා ද, ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සද්ධර්මය මනා කොට වදරණ ලදැ යි කියා ද, සංඝයා වහන්සේ මනා ව පිළිපන්සේකැ යි කියා ද, වරක් උපන්නා වූ යම් ප්‍රසාදයෙක් ඇද් ද, ඒ ප්‍රසාදය නැවැත නො ම වමනය කළ යුත්තේ ය. 'රූපය අනිත්‍ය ය, වෙදනාව අනිත්‍ය ය, සංඥාව අනිත්‍ය ය, සංස්කාරය අනිත්‍ය ය, විඥ්ඥාණය අනිත්‍ය ය' යි කියා වරක් උපන්නා වූ යම් ඥාණයෙක් ඇද්ද, ඒ ඥාණය නැවැත නො ම වමනය කළ යුත්තේ ය. මහරජානෙනි, යකඩ විකෘතියගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මේ කාරණය දෙවාතිදෙව වූ අප භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**''දස්සනම්හි පරිසොධිතෙ [2]නරො**
**අරියධම්ම[3] නියතො විසෙසගුණං[4]**
**පවෙධති[5] අනෙකභාගසො–**
**සබ්බසො ච ඛුඛභාවමෙව[6] සො'' ති.**

'කාය චිත්ත වීර්ය කරණ විසින් නිර්වාණාභිලාෂීන්ගේ මාර්ගඵල සංඛ්‍යාත වූ දර්ශනය පිරිසිදු කල්හි ආර්යධර්මයෙහි නියත වූ ඒ සත්ව තෙම අනෙකප්‍රකාරයෙන් ද, සර්වප්‍රකාරයෙන් ද විශෙෂ සංඛ්‍යාත නිර්වාණධර්මය ප්‍රතිවෙධ කරන්නේ ය' යි කියා වදරණ ලදී.[7]''

1. නිවීන් 2. පරිසොධිතො–පාළි මිලින්දපඤ්හ 3. අරියධම්මෙ–පාළිමිලින්දපඤ්හ
4. විසෙසගු–පාම්ප 5. න පවෙධති–පාම්ප 6. ඛුඛභාවානමෙව–පාම්ප
7. මේ පරිවර්තනයෙහි වැරදි තැන් තිබෙතැයි හැඟේ.

Non-Commercial Distribution

''ස්වාමීනි, නාගසෙනයන වහන්ස, 'ධවලඡත්‍රයාගේ අංගත්‍රයයෙක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගත්‍රය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජාණෙනි, යම් සේ ඡත්‍රය ජනයන්ගේ මුදුන්හි ම උඩ හැසිරෙන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම යොගාවචරමහණහු විසින් ක්ලේශයන්ගේ මුදුන්හි උඩ හැසිරීමෙන් යුක්ත විය යුතු ය. මහරජාණෙනි, ඡත්‍රයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජාණෙනි, ඡත්‍රය මුදුන්හි ම කර්ණිකාව ආධාර කොට ඇති වන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් යොනිසොමනස්කාරය ආධාර කොට ඇති විය යුත්තේ ය. මහරජාණෙනි, ඡත්‍රයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජාණෙනි, ඡත්‍රය වාත ආතප මෙඝ වර්ෂා නසන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් අනෙකප්‍රකාර වූ දෘෂ්ටි ඇති ප්‍රචුර වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ නානාමත නමැති **(529)** චණ්ඩමාරුත හා රාගද්වෙෂ මොහාග්නි සංඛ්‍යාත ත්‍රිවිධාග්නි නමැති සූර්යාතප තැවීම් හා සර්වක්ලේශ වර්ෂාව නැසිය යුත්තේ ය. මහරජාණෙනි, ඡත්‍රයාගේ මේ තුන්වන අංගය ගත යුත්තේ ය. මහරජාණෙනි, මෙම කාරණය සද්ධර්මසෙනාධිපති වූ **ශාරිපුත්‍ර**මහාථෙර සාමීන් වහන්සේ විසින්:—

**''යථාපි ඡත්තං විපුලං-අච්ඡිද්දං ථිරසංහතං,**
**වාතාතපං නිවාරෙති-මහති දෙවවුට්ඨියො**
**තථෙව බුද්ධපුත්තොපි-සීලඡත්තධරො සුචි,**
**කිලෙසවුට්ඨිං වාරෙති-සන්තාපතිවිධග්ගයො.''** යි.

''යම් සේ ස්ථිර කොට කර්ණිකායෙහි හමුනා කරණ ලද්ද වූ අච්ඡිද්‍ර වූ මහත් වූ ඡත්‍රය වාතාතප හා මහත් වූ මෙඝවර්ෂාවන් වළක්වා ද, එසේ ම පවිත්‍ර වූ චතුර්විධ වූ ශීලච්ඡත්‍රය ධරන්නා වූ සර්වඥපුත්‍රතෙම සකල සත්වයන් තවන්නා වූ ත්‍රිවිධාග්නිය හා ක්ලේශවර්ෂාව වළක්වන්නේ ය'යි කියා වදරණ ලදී.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ක්ෂෙත්‍රයාගේ අංගත්‍රයයෙක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගත්‍රය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජාණෙනි, යම් සේ ක්ෂෙත්‍රය දිය ඇළින් යුක්ත වන්නේ ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචර මහණහු විසින් මේ බුද්ධශාසනක්ෂෙත්‍රයට සුචරිත වත්පිළිවෙත් නමැති දියඇළින් යුක්ත විය යුත්තේ ය. මහරජාණෙනි, ක්ෂෙත්‍රයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජාණෙනි, ක්ෂෙත්‍රය නියරවියලින් යුක්ත වන්නේ ය. ඒ නියර බැඳ නියරින් උදකය රැක මනුෂ්‍යයෝ ධාන්‍යය පැසවා ගන්නාහු ය. මහරජාණෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචර මහණහු විසින් ශීලය හා ලජ්ජාව ද නමැති නියරින් ශ්‍රමණ ගුණය රැක සතරශ්‍රාමණ්‍යඵල නමැති අග්‍රඵල පැසවා ගත යුත්තේ ය. මහරජාණෙනි, කෙදරයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද,

*Non-Commercial Distribution*

මහරජානෙනි, ක්ෂෙත්‍රය ශස්‍යඵල නැඟීමෙන් යුක්ත වන්නේ ය, ගොවියාට සන්තෝස උපදවන්නේ ය, වපුරණ ලද්ද වූ මද වූ බිජු ද බොහෝ වූ ඵල දෙන්නේ ය, බොහෝ වූ බිජු වපුරණ ලද්දේ වී නම් අප්‍රමාණ ව ලක්ෂ ගණන් හමුණු ඇති වන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචර මහණහු විසින් මහත් වූ ඵල දෙන්නා වූ ආනිසංස නැඟීමෙන් යුක්ත විය යුත්තේ ය. යම් සේ මඳක් දෙන ලද්දේ බොහෝ වූ ආනිසංස ඇති වේ ද, බොහෝ දෙන ලද්දේ අප්‍රමාණ වූ ආනිසංස ඇති වේ ද, එමෙන් ම දයකයන්ට සන්තොස උපදවාලීමෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, කෙදුරයාගේ මේ තුන්වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය කියන ලද මැ යි, විනයධර තැන් කෙරෙහි අග්‍ර වූ උපාලිමහතෙරහු විසින්:—

**''ඛෙත්තූපමේන භවිතබ්බං-උට්ඨානවිපුලදායිනා,**
**එස ඛෙත්තවරො නාම-යො දදාති විපුලං ඵලං'' යි.**

''පැන නඟින ලද විපුල ඵල දෙන්නා වූ ක්ෂෙත්‍රයක් මෙන් විය යුත්තේ ය. යම් සංඝරත්නයෙක් තෙම දයකයන්ට විපුල ඵල දේ ද, ඒ මේ සංඝරත්නය තෙම උතුම් වූ ක්ෂෙත්‍රය නම් වේ.''

**(530)** ''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, ෙභෙෂජ්‍යයාගේ අංගද්වයයෙක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගද්වය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ ෙභෙෂජ්‍යයෙහි කෘමීහු නො හට ගණිද්ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් තමාගේ සිත්හි රාගාදි ක්ලේශයන් නො හට ගන්වා ගත යුත්තේ ය. මහරජානෙනි, ෙභෙෂජ්‍යයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, ෙභෙෂජ්‍ය තෙම සර්පයන් දෂ්ට කිරීමෙන් වන් දෂ්ටවිෂය ද, ස්පර්ශ කිරීමෙන් වන් ස්පෘෂ්ටවිෂය ද, දැකීමෙන් වන් දෘෂ්ටවිෂය ද, විෂ මිශ්‍ර දෑ අනුභව කිරීමෙන් වන් අශිතවිෂය ද, බොන දෑ බීමෙන් වන් පීතවිෂය ද, කඩා කෑ යුතු දෑ කෑමෙන් වන් ඛායිතවිෂය ද, ලේහ කළ යුතු විෂමිශ්‍ර දෙය ලේහ කිරීමෙන් වන් සායිතවිෂය ද යන සියලු ම විෂ නසන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සකල සත්වයන් විෂ මත් කොට නසන්නා වූ රාග ද්වෙෂ මොහ මාන දෘෂ්ටි නමැති සියලු විෂය නැසිය යුත්තේ ය. මහරජානෙනි, ෙභෙෂජ්‍යයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය දෙවාතිදෙව වූ අප ලොවුතුරා භාග්‍යවතුන් වහන්සේ විසින්:—

**''සඞ්ඛාරානං සභාවත්ථං-දට්ඨුකාමේන යොගිනා,**
**අගදෙනෙව හොතබ්බං-කිලෙසවිසනාසනෙ'' යි.**

Non-Commercial Distribution

'සර්වසංස්කාරප්‍රවෘත්තීන්ගේ අනිත්‍යදුඃඛාදිස්වභාවාර්ථය දක්නා කැමැත්තා වූ යොගාවචරයා විසින් සර්වක්ලේශවිෂ විනාශ කරන්නා වූ කර්මස්ථාන සිත්හි කිරීම සංඛ්‍යාත වූ ෛභෂජ්‍යය හා සමග ම සයනය කළ යුත්තේ ය,[1] යි කියා වදරණ ලද්දේ යි.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'භොජනයාගේ අංගත්‍රයයෙක් ගත යුත්තේ ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ අංගත්‍රය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ භොජනය සියලු සත්වයන්ට ආධාර වේ ද, මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සියලු ම සත්වයන්ට ආර්යඅෂ්ටාංගිකමාර්ගාධාර යෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, භොජනයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, භොජනය සියලු සත්වයන්ගේ බල වඩන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් පුණ්‍යයාගේ වැඩීමෙන් වැඩුන යුත්තේ ය. මහ-රජානෙනි, භොජනයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තව ද, මහරජානෙනි, භොජනය සියලු ම සත්වයන් විසින් මනා ව ම ප්‍රාර්ථනා කරණ ලද්දේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සනරාමරසමස්තලොකවාසීන් විසින් මනා ව ප්‍රාර්ථනා කිරීමෙන් යුක්ත විය යුත්තේ ය. මහරජානෙනි, භොජනයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය **මහාමොග්ගල්ලායන** ස්ථවිරයන් වහන්සේ විසින්:—

**''සංයමෙන නියමෙන-සීලෙන පටිපත්තියා**
**පත්ථිතෙන භවිතබ්බං-සබ්බලොකස්ස යොගිනා'' යී.**

**(531)** 'යොගාවචර භික්ෂූහු කාය වාචා සංයමයෙන් ද, ධූතව්‍රත සමාදානයෙන් ද, චතුර්විධශීලයෙන් හා ප්‍රතිපත්තියෙන් ද සමස්ත ලොක වාසීන් විසින් ප්‍රාර්ථනා කරණු ලබන්නෙකු විය යුතු ය' යි කියා වදරණ ලදී.''

''ස්වාමීනි, නාගසෙනයන් වහන්ස, 'ධනුර්ධරයාගේ චතුරංගයක් ගත යුතු ය' යි කියා යමක් වදළසේක් ද, ඒ ගත යුතු වූ චතුරංගය කවරේ ද?'' යි විචාළෝ ය. ''මහරජානෙනි, යම් සේ හී සැරයන් හරින්නා වූ ධනුර්ධරතෙම පාදද්වන්දය පෘථිවියෙහි දෘඪ කොට පිහිටුවන්නේ ය, දෙදණ විකල නො කරන්නේ ය, සැරකලාපය කටිසන්ධියෙහි එල්වා ගන්නේ ය, සකල ශරීරය තද කරන්නේ ය, උභයහස්තයෙහි සන්ධිස්-ථානයෙහි වැර කොට උඩ නහන්නේ ය, මීට දෘඪ කොට මිරිකන්නේ ය, ඇඟිලි හැසවන්නේ ය,[2] ග්‍රීවය ප්‍රග්‍රහණය කරන්නේ ය, දෙඇස හා මුඛය වසා ගන්නේ ය, සිත ඍජු කරන්නේ ය, 'ලක විදිමි' යි කියා සන්තොෂ

1. ''සෙ තබ්බං'' යන්නෙහි තේරුම 'සයනය කළ යුත්තේ ය' යන්න නො ව විය යුත්තේ ය යන්නයි. 2. හසුරුවන්නේ ය.

Non-Commercial Distribution

උපදවන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචර භික්ෂූහු විසින් සිල් නමැති මහාපෘථිවියෙහි වීර්ය නමැති පාදය පිහිටුවා ලිය යුත්තේ ය, ක්ෂාන්ති සුවචද්වය අවිකල කට යුත්තේ ය, ආයතිසංවරයෙහි සිත තැබිය යුත්තේ ය, කායවාචාසංයමයෙහි හා ධුතව්‍රතසමාදන යෙහි ආත්මය පමුණුවාලිය යුත්තේ ය, ඉච්ඡාමුච්ඡා යන තෘෂ්ණාමොහද්වය පීඩිත කළ යුත්තේ ය, යොනිසොමනස්කාරයෙහි සිත හැසවා[1] ලිය යුත්තේ ය, වීර්ය දෘඪ කොට ගත යුත්තේ ය, චක්ෂුඃශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිව්හා කාය මනස් යන සදෙර වසා ගත යුත්තේ ය. ස්මෘති උපදවා ගත යුත්තේ ය. සර්වක්ලේශයන් මාර්ගඥාන නමැති නාරාචයෙන් විද නසමී යි කියා සන්තොස උපදවා ලිය යුත්තේ ය. මහරජානෙනි, ඉස්සාසයාගේ මේ ප්‍රථමාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, ධනුර්ධරතෙම නාරාච සංඛ්‍යාත හීතලයාගේ ඇද වංක කුටිලත්වය ඍජු කරණය පිණිස ආලකය පරිහරණය කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් චාතුර්මහාභූතික වූ මේ ශරීරයෙහි සතිපට්ඨාන නමැති ආලකය වංක ජිම්හ කුටිල චිත්තයාගේ ඇද හැර ඍජු කරණ පිණිස පරිහරණය කළ යුත්තේ ය. මහරජානෙනි, ඉස්සාසයාගේ මේ දෙවන අංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, ධනුර්ධරතෙම ලක විදීමෙහි අභ්‍යාස කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් මේ මනුෂ්‍යශරීරයෙහි අභ්‍යාස කළ යුත්තේ ය.

**''කථං මහාරාජ යොගිනා යොගාවචරෙන ඉමස්මිං කායෙ උපාසිතබ්බං – අනිච්චතො උපාසිතබ්බං, -පෙ- ඉදං මහාරාජ ඉස්සාසස්ස තතියං අඞ්ගං ගහෙතබ්බං.[2]''**

**(532)** ''මහරජානෙනි, යොගී වූ යොගාවචරයා විසින් ශරීරයෙහි කවර ප්‍රකාරයකින් අභ්‍යාස කළ යුත්තේ ද? යත්:— මහරජානෙනි, රූපාදි පඤ්චස්කන්ධය අනිත්‍ය වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය. වින්ද නො හැකි නොයෙක් සංසාරදුක් වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය. තෙමේ ද තමහට අස්වාමික වන බැවින් අනාත්ම වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය. ජ්වරාතිසාරමධුමෙහාදි නොයෙක් රොගයට ආකර බැවින් රොග වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය. නොයෙක් තැනින් සිදී බිදී කුණුදිය වැහෙන අසාධ්‍ය ගඩුවක් වැනි බැවින් ගණ්ඩ වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය. අසහන වූ අන්තොපීඩාජනක බැවින් සල්ල වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය. නොයෙක් අවැඩ ගර්භා විඳුවන බැවින් අඝ වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය. නොයෙක් ආබාධයට ආසන්න බැවින් ආබාධ වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, තමන් වසඟ නො වන බැවින් පරවශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, ව්‍යාධි ජරා මරණින් විනාස වන බැවින් පලොක වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, නොයෙක් වැසන එලවන බැවින් ඊති වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, සර්වොපද්‍රවයට

1. හසුරුවා

2. පාමිප-333 පිටුව

Non-Commercial Distribution

කාරණ බැවින් උපද්‍රව වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය. උත්පත්ති ප්‍රවෘත්ති ආදි වූ සියලු භයට ආකර බැවින් භය වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය. අනෙකඅනර්ථයන් විසින් අනුබඳනා ලද බැවින් උපසර්ග වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, ලාභාලාභාදී අෂ්ටලොකධර්මයෙන් කම්පිත වන බැවින් චල වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, උපක්‍රමාදියෙන් මරණයට පැමිණෙන ස්වභාව ඇති බැවින් පභංග වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, ස්ථිර ව නො පවත්නා බැවින් අද්ධුව වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, ගැලවිය හැකි ක්ෂෙමස්ථානයක් නො ලැබිය හැකි බැවින් අත්තාණ වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, සැඟවෙන්නට සුදුසු නො වන බැවින් ඇලෙන වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, සියලු භයට පිහිටක් නැති බැවින් අසරණ වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, ස්වභාව වශයෙන් ම අසරණීභූත වන බැවින් අසරණීභූත වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, ධ්‍රැව සුඛ සුභ ආත්මභාව ය යි සිතා ගත් කල්හි සිස් බැවින් රික්ත වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, සිස් බැවින් ම තුච්ඡ වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, ස්වාමිකාරක විරහිත බැවින් ශූන්‍ය වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, සුඛසාරත්ව විරහිත **(533)** බැවින් අසාර වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, සියලු දුකට මුල් බැවින් අඝමූල වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, මිත්‍රවධකයෙකු මෙන් විශ්වසාත්වය නසන බැවින් වධක වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, සංසාරප්‍රවෘත්තිය නොයෙක් දුඃඛාදීනව බැවින් ආදීනව වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, ජරා මරණ දෙකින් පෙරළෙන බැවින් විපරිණාමධර්ම වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, විගත අභිවෘද්ධි ඇති බැවින් විභව වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, සර්වාශ්‍රවයන්ට ආසන්න කාරණ බැවින් සාසව වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, අවිද්‍යාදි හෙතුප්‍රත්‍යයයන් විසින් උපදවන බැවින් සංඛත වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, මෘත්‍යුමාර ක්ලේශමාරයන්ට ආහාරය වූ බැවින් මාරාමිස වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, ජාතිධර්ම වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, ජරාධර්මවශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, ව්‍යාධිධර්ම වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, මරණධර්ම වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, සොකයට කාරණ බැවින් ශොකධර්ම වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, පරිදෙවයට හේතු බැවින් පරිදෙවධර්ම වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, උපායාසයට කාරණ බැවින් උපායාසධර්ම වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, තෘෂ්ණා දෘෂ්ටි ආදි අකුශලයන් විසින් කෙලෙසන බැවින් සංක්ලේශධර්ම වශයෙන් අභ්‍යාස කට යුත්තේ ය, මහරජානෙනි, මෙසේ යොගී වූ යොගාවචරයා විසින් මේ සතරමහාභූතික ශරීරය අභ්‍යාස කට යුත්තේ ය. මහරජානෙනි, ඒ ඉස්සාසයාගේ මේ තෘතීයාංගය ගත යුත්තේ ය. තවද, මහරජානෙනි, ධනුර්ධරතෙම ධනුශ්ශිල්පය සවස උදය පුරුදු කරන්නේ ය, අභ්‍යාස කරන්නේ ය. මහරජානෙනි, එපරිද්දෙන් ම යොගී වූ යොගාවචරයා විසින් සවස උදය ධ්‍යාන අරමුණු අභ්‍යාස

Non-Commercial Distribution

කට යුත්තේ ය. මහරජානෙනි, ඉස්සාසයාගේ මේ සතර වන අංගය ගත යුත්තේ ය. මහරජානෙනි, මෙම කාරණය සද්ධර්මසෙනාධිපති වූ **ශාරිපුත්‍ර**මහාථෙර සාමීන් වහන්සේ විසින්:—

**"යථා ඉස්සාසකො නාම-කායං පාතං උපාසති,**
**උපාසනං හ රිඤ්චන්තො-ලභතී භත්තවෙතනං.**
**තථෙව බුද්ධපුත්තොපි-කරොති කායුපාසනං,**
**කායුපාසනං න රිඤ්චන්තො-අරහත්තමධිගච්ඡති"** යි.

යම් සේ ධනුශ්ශිල්පී නම් සවස උදය ශිල්පය අභ්‍යාස කරන්නේ ය, අභ්‍යාසය නො හරිමින් බත් පැන් ලබන්නේ ය, එසේ ම සර්වඥපුත්‍රතෙම ශරීරය අනිත්‍යාදී වශයෙන් අභ්‍යාස කරන්නේ ය, ඒ අභ්‍යාසය නො හරිමින් අර්හත්ඵලයට පැමිණෙන්නේ ය' යි කියා වදාරණ ලදී."

**පස්වැනි වූ ඉස්සාස ප්‍රශ්නය නිමි.**

---

මෙසේ දෙවිසිවර්ගයකින් ප්‍රතිමණ්ඩිත වූ ෂට්විධ වූ ප්‍රශ්නකාණ්ඩයෙහි දෙසියසැටදෙකක් පමණ ප්‍රශ්නයෝ
මේ ප්‍රකරණයෙහි අවිනාස ව ආවාහු ද, ඒ මේ මිලින්දප්‍රශ්නය නම්
**ශ්‍රී සද්ධර්මාදසය නිමි.**

---

# නිගමනය

**(534)** මේ සිංහල ප්‍රකරණයට නො පැමිණියා වූ ප්‍රශ්නයෝ දෙසාළිසෙකි. මේ ප්‍රකරණයෙහි පැවැත ආවා වූ ද, නො ආවා වූ ද සියලු ම ප්‍රශ්න එක් කළ කල තුන්සියසතරෙකි. ඒ සියලු ම ප්‍රශ්න **මිලින්දප්‍රශ්නය** කියා සංඛ්‍යාවට යෙති.

මෙසේ නරෙන්ද්‍ර-යතීන්ද්‍ර දෙදෙනාගේ ප්‍රශ්නපෘච්ඡාවිසර්ජනාවසාන යෙහි ජලපොළොව අවසන් කොට දෙලක්ෂසතලිස්දහසක් ඝනකඩ ඇති මේ මහාපෘථිවිය ෂට්ප්‍රකාරයෙන් කම්පා වී ය. අහස විදුලි පැහැර ගියේ ය. සදෙව්ලොව දෙවියෝ දිව්‍යමල්වර්ෂා කළාහු ය. පසළොස් බඹලෝ බ්‍රහ්මයෝ සාධුකාර දුන්හ. මහාසමුද්‍රය මහාමෙඝගර්ජනාවක් මෙන් මහාඝොෂා කෙරෙමින් ගියේ ය. එකල ඒ ආශ්චර්ය දුටුවා වූ පන්සියයක් පමණ මඟුල්මහඇමතියන් ඇතුළු වූ සාගල්පුර වාසීහු ද, අන්තඃපුරබිසෝවරු ද දෙහොත් මුදුන් ගෙණ සාධුකාර දෙමින් **නාගසෙන** ස්ථවිරොත්තමයානන් වහන්සේගේ ශ්‍රී පාදද්වන්ද්වය වැඳ වැතිර ගියාහු ය. ඒ ආශ්චර්ය දැකීමෙන් අතිශයින් ප්‍රමුදිත වූ සිත් ඇත්තා වූ අතිශයින් සුමර්දිතමානසහිත සිත් ඇත්තා වූ සර්වඥශාසනයෙහි සාරත්වය දක්නා නුවණැත්තා වූ රත්නත්‍රයෙහි කිසි කාංක්ෂාවක් නැත්තා වූ කිසි දෘෂ්ටි

Non-Commercial Distribution

අවුලක් නැත්තා වූ කිසි දඬිකමක් නැත්තා වූ මිලිඳුමහරජානෝ බුද්ධශාසනයෙහි සිත සෘජු ව ගෙණ නාගසෙනස්ථවිරොත්තමයානන් වහන්සේගේ ගුණයෙහි ද, ඊර්යාපථයෙහි ද අතිප්‍රසන්න ව, විස්සත්ථ ව, රාජ්‍ය සැපතෙහි නිරාලය ව, පහ වූ මානදර්ථ ඇති ව, සිත නො සන්සුන්බව ය යි කියන ලද උද්ධච්චයෙන් එතෙර ව මෙසේ කීහ:— ''සාධු, සාධු! ස්වාමීනි, නාගසෙනස්ථවිරොත්තමයානන් වහන්ස, සර්වඥවිෂය වූ බොහෝ ප්‍රශ්න නුඹ වහන්සේ විසින් විසඳන ලද්දේ ය. මේ ගෞතමසර්වඥශාසනයෙහි සද්ධර්මසෙනාධිපති වූ ශාරිපුත්‍රථෙර සාමීන් වහන්සේ හැර ප්‍රශ්න විසඳීමෙහි නුඹ වහන්සේ හා සදෘශ වූ අනික් සමර්ථ කෙනෙක් නැත. ස්වාමීනි, නාගසෙනස්ථවිරොත්තමයානන් වහන්ස, නුඹ වහන්සේ වෙහෙසා බොහෝ සේ ප්‍රශ්න විචාළෙමි. ඒ මාගේ වරද මට ක්ෂමා කර වදළ මැනැව. ස්වාමීනි, මාගේ නාගසෙනස්ථවිරොත්තමයානෙනි, අද මෙතැන් පටන් මාගේ දිවිහිම්යෙන් තුණුරුවන් සරණ ගියා වූ උපාසකයෙකැ යි කියා මා ධරා වදළ මැනැවැ'' යි කීහ.

මිලිඳුමහරජානෝ එකල පන්සියයක් අමාත්‍යයන් හා සමග නැවැත නැවැතත් නාගසෙනස්ථවිරොත්තමයානන් ආශ්‍රය කොට වැඳ පුද බොහෝ වස්තු වියදම් කරවා මිලිඳු නම් මහාවිහාරයක් කරවා නාගසෙනස්ථවිරයන් වහන්සේට පුද නාගසෙනස්ථවිරයන් වහන්සේ ප්‍රධාන කොට ඇති සියක් කෝටියක් පමණ මහරහතන් වහන්සේට සිවුපසයෙන් උපස්ථාන කළාහු ය. මෙසේ නාගසෙනස්ථවිරොත්තමයානන් වහන්සේ සර්වඥවිෂයානුකූල වූ ප්‍රශ්න ව්‍යාකරණයෙහි අතිප්‍රසන්න වූ මිලිඳුමහරජානෝ සිතන්නාහු 'මාගේ තිලෝගුරු සර්වඥරාජොත්තමයානන් වහන්සේ ධරමාණකාලයෙහි එක ම ධර්මදෙශනාවක් ඇසුවා වූ පොක්ඛරසාතිය, රට්ඨපාල, ජොතිය, අනුරුද්ධාදි මහෝත්තමයෝ පෘථිවිය සමාන ධන සැපත් හැර මහණ ව සිල් පුරා සංසාරසාගරයෙන් එතෙර වූහ. 'මම වූ කලී සුවාසූදහසක් ධර්මස්කන්ධය මාගේ ශ්‍රොත්‍රපථයෙන් ස්පර්ශ කෙරෙමින් බුද්ධශාසනයෙහි මහණ නො වීම් නම්, සසරින් කෙසේ එතෙර **(535)** වෙම් දැ?, යි සිතා තමාගේ වැඩිමහලු රාජකුමාරයාහට රාජ්‍යය පාවාදී අගාර සංඛ්‍යාත ගිහිගෙයින් නික්ම බුද්ධශාසනයෙහි පැවිදි ව කෘත්‍යාධිකාර ඇති බැවින් විදර්ශනා වඩා සිවුපිළිසිඹියාපත් රහත් වූසේකි. එයින් කීහ:—

**''එවං විසජ්ජිතෙ පඤ්හෙ-නාගසෙනෙන ධීමතා,**
**පීතියා නච්චමානාව-වසුධා කම්පිතා අනෙකධා.**
**දෙවා සබ්බෙ ච බ්‍රහ්මානො-නාගා යක්ඛා ච මානුසා,**
**සාධුකාරං පවත්තෙනසුං-තදා සන්තුට්ඨමානසා.**
**රාජා රජ්ජසිරිං දත්වා-රාජපුත්තස්ස අත්තනො,**
**සාසනෙ පබ්බජිත්වාන-අරහත්තමපාපුණී'' යි.** [1]

1. මේ ගාථා මුද්‍රිත පාලි මිලින්දපඤ්හයෙහි නො පෙණේ.

Non-Commercial Distribution



මිලිඳු රජතුමා බුදුසස්නෙහි පැවිදි වීම. (593 පිටුව)

Non-Commercial Distribution

මෙසේ දැහිණොපෙන්ද්‍ර ඉන්ද්‍රිරි චන්ද්‍රශෙඛර එර්ණන්දදි සමස්ත ලොකෙන්ද්‍ර වන්දිත පාදරවින්දද්වත්දෙවාපශොභිතාර්හත් සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන් වහන්සේ පන්සාළිස් අවුරුද්දක් මුළුල්ලෙහි බුද්ධරාජ්‍යශ්‍රී කෙරෙමින් සර්පසංවත්සරයෙහි වෙසක්මස පුරපසළොස්වක් ලත් අහහරුවාද අලුයම් වේලෙහි පිරිනිවන් පෑ වදළා වූ මූෂික වෘෂභ ව්‍යාඝ්‍ර ශශ නාග සර්ප අශ්ව අජ කපි කුක්කුට ශොණ සූකරාඛ්‍ය ද්වාදශවිධ වූ සුගත්වර්ෂයෙන් දෙදස්තුන්සියවිස්සට පැමිණි මෙම කපිසංවත්සරයෙහි ශ්‍රීදෙහයෙන් භාස්කරානුසාරි ව ස්වර්ණවර්ණබුදුරැස් විහිදෙන හෙයින් අංගීරස නම් වූ ලොවුතුරා බුදුන්ගේ ශාසනය මනා ව පිහිටියා වූ සොභන වූ කායගමන් ඇති ධරමාණ වූ සුගතොත්තමයානන් වහන්සේ ලංකාද්වීපවාසි වූ ගෘහස්ථප්‍රව්‍රජිත සකලජනයන් සඳහා වැඩි තුන්තරා ගමනින් සොභමාන වූ මෙම ශ්‍රී ලංකාද්වීපයෙහි නිත්‍ය බෘන්දරකනිකරොත්සව ක්‍රීඩාප්‍රසෘතස්වර්ගකණ්ඩයක් මෙන් සකල සම්පත්තීන් බබලන මනොරම්‍ය වූ සෙංඛණ්ඩ නම් වූ පුරප්‍රවරයෙහි විජයභූපාල ප්‍රභෘති වූ ලක්දිව රජ කළ එක්සියසැටසත්රජතුමානන්ට ඉක්බිති ව රජ පැමිණි කීර්ති ශ්‍රී රාජසිංහ නම් ද්වීපචක්‍රවර්තිහු ලොකශාසනද්වය තමන් දිවි මෙන් රක්ෂා කරති. එයින් කීහ:—

සම්බුඬරජ පරිනිබ්බුත වෙසහසෙස
තීතෙ සතාතාය පිවෙ පන වීසවසෙස,
රමෙම වරඞ්ගිරසසාසනසුපපතිටෙඨ
ලංකාය සොගතසමාගතසොභමානෙ.
සෙඞ්ඛණ්ඩ නගරෙ රමෙම–සගගඛණ්ඩංව භාසුරෙ,
කිත්තිසසිරිරාජසීහෙ–පාලෙනෙත ලොකසාසනං'' යි.[1]

තවද, සර්වඥශාසන නමැති නභස්තලයට පද්මබන්ධු වූ සූර්යදිව්‍ය රාජයා වැනි වූ ශාශ්වතොච්ඡෙදද්‍යනෙකවාදීන් නමැති ගජේන්ද්‍ර කුම්භස්ථල විදරණය කොට ජයග්‍රහණයට කෙසරසිංහරාජයක්හු වැනි වූ නානාවිධ වෛරීසමූහ නමැති එණින්ද්‍රග්‍රහණයට සුපර්ණරාජයක්හු වැනි වූ ප්‍රඥගොචර වූ අනෙකශතසහස්‍රයතිනිකර පරිවෘත ධූතව්‍රතශීලාභරණ භූෂිත වූ වැලිවිට සරණංකර නම් සංඝරාජ ධුරන්ධරොත්තමයානන් වහන්සේ ජිනෙන්ද්‍රශාසනය සුද්ධ කෙරෙමින් බබළනසේක. එයින් කීහ—

''සම්බුඬ සාසන නභම්බුජ බන්ධු රාජා
වාදිගජින්ද ජිතකෙසර සීහරාජා
වෙරිසමූහ භුජගින්ද විහංගරාජා
රාජෙති ධීර සරණඞ්කර සඞ්ඝරාජා'' යි.

(536) ඒ සංඝරාජොත්තමයානන්ගේ අතිශයාග්‍රශිෂ්‍ය වූ ගම්භීර වූ සමුද්‍රජලස්කන්ධය මෙන් ධරණ ලද ඡන්දස්ව්‍යාකරණාදි ශාස්ත්‍රරාශියක් ඇත්තා වූ අත්තරග්‍රාම වාසි වූ භණ්ඩාර රාජගුරු නාමද්වයයෙන් ප්‍රසිද්ධ වූ

1. මේ ගාථාවන්හි වැරදි තිබේ.



Non-Commercial Distribution

පණ්ඩිතොත්තමයාගේ අග්‍රශිෂ්‍ය වූ සුමංගල ස්ථවිර නමෙක් වී. සද්ධර්ම නමැති සිංහතෛලධාරණයට හෙමභාජනයක් හා සදෘශ වූ රත්නත්‍රයෙහි ඇලුනා වූ පිටකත්‍රයෙහි දක්ෂ වූ ඡන්දස් නිරුක්ති ශාස්ත්‍රයෙහි පරතෙරට පැමිණියා වූ වජ්‍රොපම වූ තීක්ෂණ නුවණැති නිරන්තරයෙන් රාජානුශාසනා කරන්නා වූ සීනටිකුඹුරේ සුමංගල නම් යතීන්ද්‍රතෙම ඒකාන්තයෙන් ම මහාසාගරය මන්දරපර්වතයෙන් මථනය කරන්නාක් මෙන් ද, කැමැති පරිද්දෙන් ම ඝනතර සකල පෘථිවීතලය පෙරළන්නාක්හු මෙන් ද සර්වභාෂා මූලික වූ මාගධිකභාෂාවෙන් පූර්වාචාරීන් විසින් ප්‍රකරණාරූඪ කොට තබන ලද්ද වූ සද්ධර්මාමෘතරසයෙන් යුක්ත වූ ඝනතරපට්වත ප්‍රතිච්ඡන්න වස්තුවක් මෙන් දුර්දර්ශනීය සුන්දරතර ප්‍රීතජනක අර්ථසමූහයක් ඇත්තා වූ අර්ථ ධර්ම ප්‍රසන්න ගම්භීරත්වයෙන් ගම්භීර වූ මිලින්දප්‍රශ්නය නම් වූ ප්‍රකරණය ඒ මාගධික නම භාෂාවෙන් පෙරළා තමාගේ විශුද්ධබුද්ධිය කරණ කොට ගෙණ සමස්තජනකර්ණාමෘතරසායන වූ ග්‍රන්ථ විශෙෂ වූ මේ සද්ධර්මාදශ නම වූ ප්‍රකරණය සිංහල දෙශභාෂාවෙන් කෙළේ යි. එයින් කීහ:—

"තස්සග්ගසිස්සො වර අත්තරගාම වාසී
භණ්ඩාර රාජගුරු නාම පසිද්ධමාසී,
ගම්භීර සින්ධුරිව ධාරිත සත්ථරාසි
තස්සග්ග සිස්සපි සුමඞ්ගලථෙරමාසි.

සද්ධම්මසීහ තෙලස්ස-හෙම භාජන සන්නිභො,
රතනත්තය ආසත්තො-පිටකත්තයපාටවො

ඡන්දො නිරුත්ති පාරප්පත්තො-ජිතෙතා වජිර බුද්ධිකො,
රාජානුසාසකො නිච්ච-යො සො යති සුමඞ්ගලො.

මන්දරගිරිනා සාමං-මථිතං විය සාගරං,
කාමං එව පරිවත්තෙන්තො-සකලං ඝනමෙදිනිං.

ථපිතං මූලභාසාය-ධම්මාමතරස සඤ්ඤුතං,
ඡන්නපසන්නං ගම්භීරං-දුද්දසං අත්ථජාලිනං.

අකා සීහළභාසාය-විසෙසං සුද්ධබුද්ධියා,
සද්ධම්මාදාසකං එතං-සොතාමත රසායනං"න්ති.[1]

සීනටිකුඹුරේ සුමංගල නම් තෙරහු කළ
ශ්‍රී සද්ධර්මාදශය නිමි.

---

## සිද්ධිරස්තු

---

ඉදං මුනින්ද සද්ධම්ම-ගණ්ණ නෙතා යං මයා
සම්භතං අනුමොදන්තු-පුඤ්ඤං දෙවා නරාසභා,

---

1. මේ ගාථා ද වැරදි සහිත ය.

Non-Commercial Distribution

# මිලින්දප්‍රශ්න ගැටපද විවරණය

**අකථාව ම ය** ($69^{5}$) = කථාවක් නැති බව ම ය;

**අකර්තව්‍ය** ($76^{6}$) = නො කට යුතු;

**අකර්මජ** ($369^{18}$) = කර්මයෙන් නූපන්;

**අකර්මණ්‍ය** ($472^{22}$) = කර්මයට නුසුදුසු, අලස;

**අකාමකරණීයයෝ** ($328^{8}$) = නො කැමැත්තෙන් කටයුත්තෝ;

**අකාලික** ($135^{37}$) = සුදුසු කාලයට අයත් නො වූ;

**අකිංචන** ($295^{19}$) = කිසිවක් නැති, නිර්ධන;

**අකිඤ්චනස්වභාව** ($482^{21}$) = කිසිවක් නැති ගතිය;

**අකෘත්‍යාකර** ($493^{25}$) = නො කට යුතු කාරණ;

**අඛණ්ඩකාරී** ($111^{14}$) = නො කඩ කොට කරණ;

**අගද** ($447^{9}$) = බෙහෙත්;

**අගාරික වූ** ($493^{18}$) = ගිහිගෙයි වූ;

**අග්‍රදක්ෂිණීය** ($301^{32}$) = අග්‍ර පූජාවන්ට සුදුසු;

**අංගජාතය** ($149^{3}$) = රහසඟ;

**අංගපාල** ($318^{5}$) = ශරීරාරක්ෂක;

**අංගමංගානුසාරී** ($553^{4}$) = අවයවයන්හි හැසිරෙණ;

**අංගුලි ප්‍රණාමන** ($495^{31}$) = ඇඟිලි නැමීම;

**අඟුරුමස්** ($385^{35}$) = අඟුරුවලින් පිළිස්සූ මස්;

**අචිත්තක සමුට්ඨාන** ($365^{10}$) = කල්පනා කොට ශික්ෂාපදය උල්ලංඝනය කිරීමක් නැති ව ඇති වන;

**අචින්තිකෘත** ($307^{31}$) = සකස් කොට නො කළ;

**අචේතන** ($220^{9}$) = චේතනා නැති;

**අචේලකයන්ට** ($536^{35}$) = නිර්වස්ත්‍ර තවුසන්ට;

**අජටාකාශ** ($79^{3}$) = ජටා හෝ අවුල් නැති හිස් අහස;

**අජපථයෙහි** ($404^{16}$) = එළුවන්ට පමණක් යා හැකි දුර්ගම මග;

**අජිනචර්මය** ($259^{12}$) = අඳුන් දිවිසම;

**අජ්ඣොත්ථරණය** ($474^{2}$) = වසා පැතිර සිටීම, මැඩීම;

**අජ්ඣොසිත** ($89^{9}$) = ගැලුනු;

**අඥාතතායෙහි** ($7^{31}$) = නො දත් කමෙහි;

**අඤ්ජලිය කොට** ($261^{23}$) = ඇඳිලි බැඳ;

**අඤ්ඤමඤ්ඤූපනිස්සිත** ($58^{11}$) = ඔවුනොවුන් ඇසුරු කළ;

**අට්ටාල** ($463^{19}$) = අටල්ල, මුර ගෙය;

**අණවන්නෝ** ($67^{20}$) = නියම කරන්නෝ;

**අණ්ඩජ** ($368^{13}$) = බිජුවටින් උපදනා;

**අතැඹුල** ($335^{35}$) = අත්ලෙහි වූ නෙල්ලි ගෙඩිය;

**අතික්‍රාන්ත** ($1^{13}$) = ඉක්මුනු;

**අතිගම්භීර** ($17^{14}$ = ඉතා ගැඹුරු, අවබෝධයට දුෂ්කර;

**අතිතිඛිණ** ($401^{26}$) = ඉතා සියුම්;

**අති ප්‍රවර** ($401^{20}$) = ඉතා උතුම්;

**අතිප්‍රසන්න ව** ($33^{8}$) = ඉතා පැහැදී;

**අතිභාරිත** ($401^{29}$) = ඉතා බර;

**අතිමනොඥ** ($38^{23}$) = ඉතා සිත්කලු;

**අතිසංචාරයෙන්** ($401^{9}$) = අධික හැසිරීමෙන්;

*Non-Commercial Distribution*

**අති සුඛුම** (100[7]) = ඉතා සියුම්;

**අති සූක්ෂ්ම ස්ථානාස්ථාන ගත** (2[3]) = ඉතා සියුම් තැනට නෙ තැනට පැමිණ;

**අතුණු බහනින්** (387[27]) = බඩවැලින්;

**අතුලාප්‍රඥාවතුන්** (134[35]) = අසමාන නුවණැත්තන්;

**අතෘප්තික ව** (563[33]) = නො සෑහී;

**අතෙකිච්ඡ** (484[16]) = පිළියම් රහිත;

**අත්තවාදූපාදනය** (79[33]) = දැඩි කොට ගත් ආත්මවාද දෘෂ්ටිය;

**අත්තානුවාදදෘෂ්ටි** (179[26]) = ආත්මයක් ඇතැ යි ගන්නා දෘෂ්ටිය (මෙය ආත්මානුවාද දෘෂ්ටි විය යුතු);

**අත්තුක්කංසන** (584[24]) = තමා උසස් කොට කියා පෑම, ආත්ම වර්ණනාව;

**අත්පසට** (365[30]) = සමීපයට;

**අත් පා මල** (391[8]) = අත් පා බැඳි මලපුඩු;

**අත්‍යර්ථයෙන්** (264[24]) = ඒකාන්ත යෙන්;

**අදක්ෂිණාර්හ** (327[25]) = දක්ෂිණාවට නුසුදුසු;

**අදර්ශනයට** (84[38]) = නො පෙණීමට;

**අදෘශ්‍යාඤ්ජන** (6[13]) = යම් කිසිවක ආලෙප කිරීමෙන් එය නො පෙ-ණෙන්නට සලස්වන අඳුන;

**අද්ධානය** (58[17]) = දීර්ඝ මාර්ගය;

**අර්ථචර්යා** (548[22]) = හිත වැඩෙහි හැසිරීම;

**අර්ථ විවරණය** (4[30]) = තේරුම පැහැදිලි කිරීම;

**අධඃ ශීර්ෂ කොට** (209[10]) = හිස යටිකුරු කොට;

**අධිකාර** (114[22]) = අධික වූ ක්‍රියා;

**අධිගම අන්තර්ධානය** (161[27]) = මාර්ගඵලාවබොධය නැති වීම;

**අධිගමධාරී** (288[3]) = මග පල දරණ;

**අධිගමය** (42[16]) = අවබොධය;

**අධිවාසනක්ෂාන්තිය** (139[7]) = ඉවසීම නමැති ක්ෂමාව;

**අධොගලිත** (392[1]) = පහතට එල්ලෙන;

**අධ්‍යාචාරය** (152[24]) = මෙවුන්දම් සෙවීම;

**අනාගාරිය** (103[29]) = ගෙයක් නැති, ගිහි නුවූ;

**අනන්තපුණ්‍ය නිර්මිත වූ** (339[13]) = අපමණ පිණින් මැවුනු;

**අනභිරතියෙක්** (548[10]) = නො ඇල්මෙක්;

**අනවද්‍යගොචරයෙහි** (482[37]) = නිවැරදි තන්හි හෝ අරමුණෙහි;

**අනවරාග්‍ර** (578[17]) = කෙළවර නැති;

**අනාගාමිඵලයට** (41[36]) = කාම භාවයෙහි උත්පත්තිය ගෙණ දීමේ ශක්තිය සම්පූර්ණයෙන් සිඳ දැමූ අනාගාමිමාර්ග සිතේ විපාක සිතට;

**අනාපත්ති** (194[34]) = ඇවැත් නැති;

**අනාවරණඥාන** (304[25]) = ආවරණ යක් නැති ව නො පැකිල පවත්නා නුවණ;

**අනාවරණීය** (192[14]) = වැළැක් විය නො හැකි;

**අනිකෙතවාසී** (266[23]) = ගෙයක නො වසන;

**අනිකෙතසයන** (512[9]) ගෙයක නො නිදන;

Non-Commercial Distribution

**අනිබද්ධසයනයෙන්** (665[19]) = නිතර නො නිදීමෙන්;

**අනිමිත්තකෘතදිශා** (233[7]) = අනියමිත දෙස;

**අනිලජලප්‍රවෙශයෙන්** (138[24]) = සුලඟ හා ජලය ඇතුල්වීමෙන්;

**අනිෂ්ටානුභව** (557[36]) = අනිටු අරමුණෙහි රස විඳීම;

**අනීකස්ථ පාරිෂද්‍ය ජනයා** (362[28]) = බල ඇණි පිරිස;

**අනීතික** (434[7]) = උපද්‍රව (පීඩා) රහිත;

**අනුගාමික** (289[38]) = අනුව යන;

**අනෘතුජ** (369[19]) = සෘතුවෙන් නූපන්;

**අනුනයප්‍රතිඝයෙන්** (203[14]) = ආශාවෙන් හා ක්‍රොධයෙන්;

**අනුපකාරි ව** (269[26]) = උපකාර නො කරන්නෝ ව;

**අනුපද්‍රව** (453[2]) = උවදුරු නැති;

**අනුපම** (191[11]) = උපමා රහිත;

**අනුපාදනිර්වාණය** (76[23]) = භවයෙහි උත්පත්තිය නො ගෙණ නිවණට පැමිණීම;

**අනුපාදිශෙෂපරිනිර්වාණය** (37[34]) = උපාදි නම් වූ පඤ්චස්කන්ධය ඉතිරි නුවූ නිවණ, රහතුන් වහන්සේ කෙනෙකුන් පිරිනිවී-මෙන් වන නිවණ;

**අනුව්‍යංජන** (87[3]) = දෙතිස් මහාපුරුෂ ලක්ෂණයන්ට දෙවනු ව සිට ලක්ෂණ ප්‍රකාශක කුඩා ලකුණු;

**අනුමාර්ජනය** (105[29]) = නැවත නැවත විමසීම;

**අනුලිප්ත** (511[18]) = නො තැවරුණු, නො ගැවුනු;

**අනුසයයෙක්** (52[11]) = සිතෙහි ලැග ගෙණ පවත්නා ප්‍රත්‍යය, ලැබුනු විට නැගී සිටින, කාමරාග ප්‍රතිඝාදි ක්ලේශ කෙනෙක්;

**අනූන** (199[27]) = නො අඩු;

**අනෙකප්‍රකාරවරභාණ්ඩ පරිපූරිත** (2[24]) = නොයෙක් ආකාර උතුම් බඩුවලින් පුරවන ලද;

**අනෙක ප්‍රකාර වස්ත්‍රාපණයෙන්** (3[6]) = නන් අයුරු වූ රෙදි සාප්පුවලින්;

**අනොත්තප්පය** (556[34]) = පවට නො බිය බව;

**අනෞදරික** (558[30]) = දළ නො වූ;

**අනෞපමෙය්‍ය** (401[36]) = උපමා රහිත;

**අනෝරපාර** (448[26]) = මෙතෙර එතෙර නැති;

**අන්තඃපුර** (2[23]) = රජබිසෝවරුන් වසන ඇතුළු මාලිගාව, ඇතුළු නගරය;

**අන්තරට්ඨකය** (562[26]) = අතර දින අට;

**අන්තරායකාරීහු** (388[3]) = අන්තරාය කරන්නෝ;

**අන්තර්ධාන ව** (9[28]) = අතුරුදන් ව;

**අන්තිම දෙහධාරි** (287[17]) = අන්තිම සිරුර දරණ (නැවත නූපදනා බැවිනි);

**අන්තෙවාසිකයා** (110[11]) = ආචාර්යයන් යටතෙහි වසන්නා;

**අන්ධකාර වන ගහනයෙහි** (263[4]) = අඳුරු ඝන කැලෑවෙහි;

**අන්‍යථාත්වයක්** (281[12]) = වෙනස් වීමක්;

**අන්‍යදෘෂ්ටිකයකු** (26[10]) = බුද්ධා-ගමෙන් පිටත් බාහිර ආගම් අදහන්නෙකු;

Non-Commercial Distribution

අන්‍යොපදෙශවිරහිත ව (322[14]) = අනුන්ගේ උපදෙශයක් නැති ව;
අන්වෙෂණයට (483[30]) = සෙවීමට;
අපගත (410[27]) = ඉවත් වූ;
අපරිමිතජලධාරි (412[22]) = අපමණ දිය දරණ;
අපරිමිතානන්තාපාර (529[7]) = පරතෙර රහිත;
අපිස් (286[20]) = ආසා රහිත;
අපුනරාවර්තික (341[23]) = පෙරළා නො එන්නෝ;
අප්පවාරිතසංඥවෙන් (365[33]) = නො පවරන ලද ය යන හැඟීමෙන්;
අප්‍රතිපුද්ගල (325[21]) = විරුද්ධ හෝ සමාන පුද්ගලයෙකු නැති;
අප්‍රතිභාග (325[20]) = අසමාන;
අප්‍රතිම (325[20]) = ප්‍රතිමා රහිත, අසමාන;
අප්‍රවෘත්තියගේ (255[24]) = නො පැවැත්මේ;
අබ්භොකාසිකංගය (503[31]) = එළිමහන් තැන විසීම නමැති ධූතංගය;
අබ්‍යන්තරය (431[16]) = ඇතුළ;
අබ්‍යවකාශයෙහි (508[6]) = එළිමහන් තැනෙහි;
අභාවිතචිත්තයන් (99[16]) = නො වඩන ලද සිත්;
අභිඥපාරමිතාවට (482[36]) = උතුම් ඥනයෙහි කෙළවරට;
අභිනන්දනය (241[15]) = සතුටු වීම;
අභිනිහාර (288[35]) = ප්‍රාර්ථනා;
අභිභවනය (160[14]) = මැඩ පැවැත්වීම;
අභිමානයෙන් (25[34]) = අහංකාරයෙන්;
අභිරතිය (440[7]) = ආශාව;
අභිවාදනය (9[33]) = වැඳීම;
අභිවෘද්ධි පරිශුද්ධ ශ්‍රෙෂ්ඨජානයෙන් (511[16]) = වැඩීමෙන් පිරිසිදු උසස් ඉපැත්මෙන්;
අභිසංඛරණ (71[33]) = සකස්කිරිම;
අභිසමය අන්තරාය (353[15]) = අවබොධයට උපද්‍රව;
අභෙද්‍ය (197[13]) = නො බිඳියහැකි;
අභ්‍රවලාහක (319[14]) = මෙඝයට අධිපති දෙවියා;
අමාතෘ (290[38]) = නො මැනියන්;
අමූලික (249[19]) = මුල්රහිත (බොරු;
අයම්විතරින් (407[12]) = දිග පළලින්;
අයොනිසොමනස්කාර (237[21]) = නුනුවණින් මෙනෙහි කිරීම;
අයොමය (255[4]) = යකඩින් කළ;
අරති සිත් (410[31]) = නො ඇලෙන සිත්;
අර ද (324[21]) = ගරාදි ද;
අරහත්ත ඝාතනය (285[34]) = රහතුන් නැසීම;
අරුණු (12[16]) = පිණ්ඩපාතය සඳහා භික්ෂූන් ගෙදරට වැඩි වීට ගෙයි පිදිය යුතු ආහාර නැති කල්හි 'නැතැ' යි යන වචනය කියන්ට මැළි වූ ගෙහිමියන් අහර නැති බව හඟවන පිණිස පුරාතනයෙහි ව්‍යවහාර කළ වචනයක්;
අර්ධරාත්‍රිය (377[28]) = මධ්‍යම රාත්‍රිය;
අර්හත්ඵලයට (41[36]) = අර්හත් මාර්ගචිත්තයට අනතුරු ව ඇති වන ඒ චිත්තයෙහි විපාක සිතට;
අර්හත්ඵලවිමුක්ති (476[15]) = රහත්ඵලයට පැමිණ සියලු කෙලෙසුන් ගෙන් හා සසර දුකින් මිදීම;
අර්හධවජ (355[3]) = සිවුර, රහතුන්ගේ කොඩිය හෙවත් ලකුණ;

Non-Commercial Distribution

**අලග්න** (544[30]) = නො ඇලුනු;
**අලජ්ජියා** (305[7]) = ලජ්ජා නැත්තා (නැවත නැවත ඇවතට පැමිණෙන්නා);
**අලාතචක්‍ර** (579[21]) = අඳුරෙහි පෙනෙල්ලක් වේගයෙන් කරකවන විට පෙණෙන ගිනි රෝදය;
**අල්පරජස්ක** (319[9]) = මඳ කෙලෙස් ඇති;
**අල්පශ්‍රැත වූ** (563[17]) = නුගත්;
**අල්පාබාධික** (289[14]) = නිරෝගී;
**අල්පෙශාඛ්‍ය** (75[4]) = අප්‍රධාන;
**අල්ලක් සාත්** (337[17]) = අල්ලක් පමණත්;
**අල්ලචර්ම** (86[6]) = තෙත් සම;
**අවක්‍රාන්ති** (148[7]) = බැස ගැණීම, පිහිටීම;
**අවධ්‍යස්වරූප හෙයින්** (298[9]) = නො නැසිය යුතු ස්වභාව ඇති හෙයින්;
**අවස්සුත** (205[7]) = වැගුරුණු;
**අවික්ෂිප්තචිත්තයෙන්** (107[9]) = නො විසුරුණු සිතින්;
**අවික්ෂිප්ත ව** (350[21]) = නොයෙක් අරමුණුවල යෙදුනු සිත් නැති ව;
**අවිඥ්ඥාණක සවිඥ්ඥාණක** (539[14]) = සිත ඇති නැති;
**අවිද්‍යාධ්‍යානයට** (7[23]) = මෝඩකම නමැති ධ්‍යානයට;
**අවිද්‍යාව** (61[14]) = මොහය;
**අවිලංඝනීය** (3[26]) = ඉක්මවිය නො හැකි;
**අවිශද** (197[8]) = නො පැහැදිලි;
**අවිසංවාදක** (497[26]) = නො රවටන;
**අවිසාරද** (25[18]) = නිර්භය නො වන;
**අව්‍යාකෘත** (52[27]) = කුශලාකුශල වශයෙන් ප්‍රකාශ නො කළ විපාක සිත් හා ක්‍රියා සිත්;
**අව්‍යාධිකයෝ** (344[29]) = ලෙඩ නැත්තෝ;
**අශික්ෂිත** (265[19]) = නො හික්ම වන ලද (ගිලෑ නො කරණ ලද);
**අශීතිවර්ෂයෙහි** (1[7]) = අසූ වියෙහි;
**අශීත්‍යනුව්‍යංජන ලක්ෂණ** (311[39]) = සිරුරෙහි අසූවක් කුඩා ලක්ෂණ;
**අශුභාලම්බනයෙහි** (549[2]) = අසුබ අරමුණෙහි;
**අශෙෂ වචනයෙක** (284[6]) = අර්ථය ඉතුරු නො වූ වචනයෙකි;
**අශෛක්ෂ වූ** (526[17]) = රහත් වූ; (හික්මුම අවසන් කළ);
**අශ්‍රද්ධික** (343[38]) = ශ්‍රද්ධා රහිත;
**අෂ්ටදුෂ්ටක්ෂණයෙන්** (573[23]) = පින් කළ නො හැකි කාල අටෙන්;
**අෂ්ටවිද්‍යා** (46[1]) = විදර්ශනා ඥාන, මනොමය සෘද්ධි, සෘද්ධිවිධ ඥාන, දිව්‍යශ්‍රොත්‍ර, පරචිත්ත විජානන, පූර්වෙනිවාසානුස්මෘති, දිව්‍යචක්ෂුර්, ආශ්‍ර ව ක්ෂය යන ශ්‍රෙෂ්ඨ ඥාන අට;
**අෂ්ට විංශති ගුණගණාංගයකින්** (279[6]) = ගුණාංග විසි අටකින්;
**අෂ්ටවිංශද්** (494[24]) = අටවිසි;
**අෂ්ටවුතපද** (106[14]) = මිලිඳු රජතුමා සත් දවසක් පිරූ ගුණ අට;
**අෂ්ටොත්තරශත** (79[27]) = අටක් අධික සියය, 108;
**අසංසර්ග කථා** (488[9]) = නො එක් වීම, (එකලා බව) පිළිබඳ කථා;
**අසංසෘෂ්ට** (334[4]) = අමිශ්‍ර (සංසර්ග රහිත);
**අසංඛත** (363[8]) = ලොකොත්තර. (හෙතුවකින් පිළියෙල නො වූ);
**අසඤ්චලිත** (301[14]) = නො සැලුනු;
**අසනි** (401[8]) = හෙන;

Non-Commercial Distribution

**අසන්නිධිභක්ෂි** (567[16]) = තබා ගෙණ නො වළඳන්නේ;

**අසම** (191[11]) = සමානයෙකු නැති;

**අසමසම** (325[19]) = අසමයන්ට සම;

**අසමුච්ඡින්න** (543[22]) = නො සිඳින ලද;

**අසම්භීත ව** (23[8]) = නො බිය ව;

**අසරණීභූත** (413[6]) = පිහිටක් නැති;

**අසාමයික** (431[2]) = කාලයෙහි නොවන (අකාල):

**අසාරූප්‍ය** (86[30]) = නුසුදුසු, අයොග්‍ය;

**අසුචිසංකස්සරසමාචාර** (209[23]) = අපිරිසිදු සැක සහිත හැසිරීම්;

**අස්තගිරි පර්වතය** (85[2]) = බස්නාහිර දිග ඇතැයි සැලකූ කන්ද, ඉර බැස යන තැන;

**අස්ථානයට** (422[9]) = නො පැමිණිය යුතු තැනට;

**අස්ථි** (98[29]) = ඇට;

**අස්ථිචර්මමාත්‍ර වූ** (339[30]) = ඇට සම් පමණක් වූ;

**අස්වසා** (111[7]) = සනසා;

**අස්සද්ධි** (556[14]) = ශ්‍රද්ධා රහිත බව;

**ආකඩ්ඪනය** (272[24]) = ඇදීම;

**ආකුලාකුල** (296[24]) = වෙසෙසින් අවුල්;

**ආකොටනය** (435[18]) = ගැසීම;

**ආගමධාරී** (288[3]) = පර්යාප්ති ධර්මය දරණ;

**ආඝාතනයෙහි** (131[23]) = වරද කරුවන්ට වධ දෙන තැන;

**ආඝ්‍රාණය** (65[14]) = නැහැයෙන් ගඳ සුවඳ දැන ගැණීම;

**ආචාර්යමුෂ්ටි** (177[11]) = ගුරු වරයා අතෙහි ම තබා ගත යුතු ධර්මශාස්ත්‍රසාරය;

**ආජඤ්ඤරථ** (496[2]) = සාරථියාගේ අදහස් අනු ව ක්‍රියා කරණ උතුම් අසුන් යෙදූ රිය;

**ආජීවය** (494[11]) = දිවි පැවැත්ම;

**ආජීව පාරිශුද්ධි ශීලයෙන්** (581[5]) = වැරැදි ආජීවයෙන් වෙන් ව යහපත්සේ ජීවිකාව කිරීම්වූ ශීලය;

**ආඬුවක්‍රය** (131[19]) = අණසක, රෝදයක් මෙන් අවට පැතිරෙණ අණ;

**ආතපය** (63[25]) = අව්ව;

**ආත්ම පරොපක්‍රමයකින්** (437[5]) = තමන්ගේ හෝ අනුන්ගේ උපක්‍රමයකින්;

**ආදසය** (63[31]) = කැටපත; කන්නාඩිය;

**ආදිකර්මික** (68[35]) = පළමු වරට කරණ;

**ආදින්නධුර** (563[28]) = ගත් විය දඬු ඇත්තේ;

**ආදීනවයක්** (86[29]) = දෙෂයක්;

**ආධිපත්‍යය** (59[11]) = අධිපති බව;

**ආධ්‍යාත්මික** (60[18]) = සිතෙහි පවත්නා;

**ආනාපානසති** (466[1]) = ආශ්වාසය හා ප්‍රශ්වාසය අරමුණු කොට පවත්වන සිහිය;

**ආනෙඤ්ජසමාධිය** (477[28]) = අරූපාවචර සමාධිය;

**ආපදර්ථයක්** (111[20]) = විපතෙහි දී අවශ්‍ය අර්ථයක්;

**ආපාථගත** (426[11]) = ඉදිරිපත් වූ;

**ආපොසාරුව** (58[5]) = ආපො රසය, දිය ගතිය;

**ආභිදෙසික** (418[15]) = පිළුණු,

**ආභොගයෙක්** (115[15]) = කල්පනා වෙක්;

**ආභොගමනසිකාරය** (38[31]) = සිතා බැලීම;

Non-Commercial Distribution

ආමය ($472^{12}$) = නො පැසුනු ආහාර රසය;
ආමසනය (435) = ස්පර්ශ කිරීම, අතගෑම;
ආමිසදාන ($362^{23}$) = සිවුපසය දීම;
ආමිසප්‍රතිවිභක්තිය ද ($525^{2}$) = සිවුපසය බෙදීම ද;
ආම්‍රෝද්‍යාන ($223^{12}$) = අඹ උයන;
ආයතිසංවරයෙහි ($589^{3}$) = මතු හික්මීමෙහි;
ආයාචන ($156^{4}$) = ඉල්ලීම;
ආයාම ($406^{28}$) = දිග;
ආයුසංවත්තනික වූ ($224^{5}$) = ආයුෂ පැවැත්මට හෙතු වූ;
ආයුසංස්කාර ($142^{6}$) = නාමරූප යන් සකස් කරණ ජීවිතෙන්ද්‍රිය;
ආරාමිකයෙක්මි ($9^{36}$) = ආරාමයෙහි මෙහෙ කරන්නෙක්මි;
ආරොදන ($501^{14}$) = වැලපීම;
ආර්ය අෂ්ටාංගික මාර්ගය ($502^{25}$) = බුද්ධාදි ආර්යයන්ට අයත් සම්මා දිට්ඨි, සංකප්ප, වාචා, කම්මන්ත, ආජීව, වායාම, සති, සමාධි යන අංග අටක් ඇති මාර්ගය;
ආර්යවීථි ($117^{23}$) = ආර්යයන් ගිය මාර්ගය හෝ ක්‍රියා කළ ක්‍රමය;
ආර්යොපවාද ($154^{8}$) = ආර්යයන්ට අපවාද කිරීම හෝ ආක්‍රොශ පරිභව බිණීම;
ආලකය ($689^{13}$) = ඊ ඇද අරිණ උපකරණය;
ආලම්බන ($151^{4}$) = එල්බෙන දෙය;
ආලම්බනොපනිධ්‍යානාදි ($482^{17}$) = ධ්‍යාන භාවනා ආදි;
ආලෙපනය ($537^{21}$) = ගැල්වීම;
ආලොපයෙහි ($315^{27}$) = පිඩුවෙහි;
ආවරණයක් ($450^{9}$) = වැස්මක්;
ආවර්ජන ($5^{8}$) = මෙනෙහි කිරීම;
ආවෙඨනය ($34^{8}$) = වෙළීම;
ආවෙසනය ($300^{30}$) = නිවස;
ආශිවිෂයෙකු ($272^{36}$) = සර්පයෙකු;
ආශ්චර්යාද්භූත වූ ($12^{3}$) = පුදුම වූ;
ආශ්වාසප්‍රශ්වාසයෝ ($37^{4}$) = ඇතුළට ඇද ගන්නා වාතය හා පිටත නික්මෙන වාතය;
ආසංකාපරිසංකායෙන් ($524^{27}$) = සැකයෙන් හා මහත් සැකයෙන්;
ආසෙවිත ($509^{29}$) = ලඟට පැමිණ සෙවුනා ලද;
ආස්තරණය ($247^{36}$) = ඇතිරිල්ල;
ආස්වාදයක් ($334^{23}$) = රස විඳීමක්;
ආහවචපද ($182^{6}$) = සම්බුද්ධ දෙශිත සූත්‍රය;
ඇලි ඇතු ($382^{8}$) = සුදු ඇතා;
ඇළකඳුරෙන් ($41^{11}$) = දියෙන් හැරී ගිය ඇළ;
ඉතරිතර ($562^{11}$) = ලැබෙන පරිදි;
ඉන්ද්‍රඛීලයක් ($555^{26}$) = නුවර දෙරටුවෙහි පිහිටවූ කණුවක්;
ඉන්ද්‍ර ධනුවක් සේ ($569^{21}$) = දේදුන්නක් සේ;
ඉන්ද්‍ර නීල මාණික්‍යරත්න ගුළ ප්‍රතිභාග ($270^{3}$) = උතුම් ඉඳු නිල්මිණි ගුළියක් වැනි;
ඉන්ද්‍රියසංවර ශීලය ($473^{29}$) = ඇස් ආදි ඉඳුරන් හික්මවා ගැනීම නමැති ශීලය;
ඉරියාපථය ($13^{11}$) = ඉරියව්ව;
ඉලුක්කෝලයෙන් ($477^{13}$) = තෝමරයෙන්;
ඉෂ්ටානුභවලක්ෂණ ($559^{3}$) = ඉෂ්ටාලම්බනයෙහි රස විඳීම ලක්ෂණ කොට ඇති;
ඉහාත්මභාවයෙහි ($438^{34}$) = මෙ අත්බැව්හි;

**ඊර්ෂ්‍යා ප්‍රකෘති ව** (190$^{30}$) = ස්වභාවයෙන් නො ඉවසීම ගති යෙන් යුක්ත ව;
**ඊශ්වර** (57$^{20}$) = ප්‍රධාන;
**උක්කා** (102$^{31}$) = පන්දම, හුළු එළිය;
**උච්ඡාදන** (328$^{6}$) = ඉලීම;
**උච්ඡේදදෘෂ්ටිය** (683$^{19}$) = මරණින් මතු උත්පත්තියක් නැතැ යි යන කල්පනාව;
**උතුනි** (148$^{22}$) = මල්වර වූ ස්ත්‍රී;
**උතුපරිණාමජ** (165$^{15}$) = සෘතු වෙනස් වීමෙන් හට ගත්;
**උතුවක් මෙන්** (579$^{33}$) = තරාදි තටුවක් මෙන්;
**උත්තරිතර** (287$^{16}$) = වඩා උසස්;
**උත්තාන** (420$^{12}$) = උඩුකුරු;
**උත්තානසෙය්‍යක** (47$^{9}$) = උඩු කුරු ව නිදන්නා;
**උත්තානී** (196$^{27}$) = ප්‍රකට වූ;
**උත්‍රාස** (280$^{35}$) = තැති ගැණුම;
**උදක ඝට** (358$^{13}$) = දිය කළ;
**උදක වික්බල්ල** (440$^{33}$) = දිය සහිත මඩ වගුරක්;
**උදක ප්‍රසාද මාණික්‍ය රත්නය** (41$^{15}$) = සක්විති රජුන්ට අයත් දිය පහදවන මිණිරුවන;
**උදකවාහක** (224$^{27}$) = ගහ;
**උදරාර්ථය පිණිස** (249$^{6}$) = බඩ වැඩුම පිණිස;
**උදයත්ථගාමිනිප්‍රඥ** (160$^{34}$) = උදයව්‍යය අවබොධ කරණ ප්‍රඥව;
**උදයව්‍යයානුදර්ශන** (559$^{33}$) = ඉපදීම හා විනාශය නැවත නැවත බැලීම;
**උදන** (80$^{27}$) = ප්‍රීති වාක්‍ය;
**උදිතොදිත** (299$^{2}$) = ඉතා උසස්;
**උද්දෙසක** (195$^{3}$) = කියන, දක්වන;
**උද්දෙසප්‍රතිපෘච්ඡා** (575$^{24}$) = ඉගෙණීම හා ප්‍රශ්න කිරීම;
**උඩතාදී** (556$^{1}$) = නො සන්හුන් බව ආදී;
**උද්ධුමාතක** (466$^{4}$) = පිළිකුල් වූ ඉදිමී ගිය මළ සිරුරු;
**උද්‍යානයාත්‍රායෙහි** (336$^{3}$) = උයන් ගමනෙහි දී;
**උද්වෙගයට** (28$^{32}$) = කලකිරීමට;
**උනු සත්හවුරුදු** (439$^{27}$) = සත්හවුරුද්දට අඩු;
**උන්දුරයාගේ** (560$^{2}$) = මීයාගේ;
**උන්නතාවනතයක්** (543$^{27}$) = ‘උසස් වෙමි, පහත් වෙමි’ යන අදහසක්, සතුට හා අසතුට;
**උපගණ්හන** (44$^{18}$) = ලං කර ගැණීම;
**උපඝාතයෙන්** (436$^{21}$) = උවදුරෙන්;
**උපචය** (553$^{31}$) = වැඩීම, රැස්වීම;
**උපචිකා** (550$^{23}$) = වේයා;
**උපධි රහිත වූ** (487$^{3}$) = සත්වයන් සංසාරයෙහි නවත්වන කාම, ස්කන්ධ, ක්ලේශ, අභිසංස්කාර යන හතර නැති;
**උපනික්ෂෙප** (91$^{19}$) = ලහ තැබීම;
**උපශාන්ත** (114$^{12}$) = සන්හුන්;
**උපසංහරණය** (160$^{23}$) = පැමිණවීම;
**උපස්තම්භන** (42$^{30}$) = රුකුල් දීම;
**උපාදන** (38$^{21}$) = දැඩි ලෙස ගැණීම;
**උපාධ්‍යායයන් වහන්සේ** (17$^{26}$) = වරද නිවරද දක්වා අවවාද දෙන ආචාර්යයන් වහන්සේ;
**උපායන** (422$^{9}$) = තෑගි;
**උපායාස** (79$^{30}$) = දැඩි සිත් තැවුල;
**උපෙක්ෂක ව** (383$^{29}$) = මැදහත් ව;
**උත්පාදට්ඨිතිභංගය** (471$^{12}$) = ඉපැද්ම, පැවැත්ම හා විනාශය;

Non-Commercial Distribution

**උභතොකොටික ප්‍රශ්නය** (113$^{30}$) = 'මෙය මෙසේ කීවොත් මේ දොෂය වෙයි, එසේ නො කියා මෙසේ කීවොත් මේ දොෂය වෙයි, කිය හැකි කෙලෙසකින් වත් බේරුමක් නැති ගැටලු ප්‍රශ්නය;

**උභයකර්ණච්ඡිද්‍රයෙන්** (338$^{21}$) = දෙකන් සිදුරෙන්;

**උභයකුලපරිශුද්ධතාවෙන්** (502$^{32}$) = මවු පිය දෙපසෙහි පිරිසිදු බවෙන්;

**උභය ජානුකයෙහි** (516$^{9}$) = දෙදණෙහි;

**උරච්ඡදන ධාරණතායෙනුදු** (335$^{4}$) = සිවුර දරණ බැවිනුදු; (පපුව වසන හෙයින් සිවුර උරච්ඡදන නම්.)

**උලූක** (395$^{24}$) = බකමූණු.

**උෂ්ණාභිතප්ත** (115$^{37}$) = උෂ්ණයෙන් තැවුනු;

**ඌර්මිවේගය** (486$^{19}$) = රළ වේගය;

**ඌර්ධ්වංගම** (552$^{33}$) = උඩට යන;

**ඌර්ධ්වපාද** (209$^{10}$) = උඩුකුරු වූ පා ඇති;

**ඌර්ධ්වමුඛ** (146$^{7}$) = උඩුකුරු මුහුණ ඇති;

**ඌර්ධ්වාධොසරස** (561$^{3}$) = උඩ යට හරහ;

**ඌර්මි ජාලාවෙන්** (529$^{25}$) = රළ සමූහයෙන්;

**ඍද්ධිපාද** (547$^{4}$) = ඍද්ධියට ආධාර වන ඡන්ද, චිත්ත, වීරිය, විමංසා යන සතර;

**ඍතුත්‍රයට** (336$^{1}$) = හෙමන්ත, ගිම්හාන, වස්සාන යන ඍතු තුණට;

**ඍතුපරිවර්තනයෙන්** (437$^{5}$) = ඍතු පෙරළීමෙන්;

**ඍෂිප්‍රව්‍රජ්‍යා** (150$^{24}$) = තවුස් පැවිද්ද;

**එකලා ව ම** (260$^{24}$) = තනිව ම;

**එක්වන්** (372$^{14}$) = නිතර;

**එකදෙශමාත්‍රයක්** (447$^{4}$) = එක් කොටසක් පමණක්;

**එකනින්නාද** (337$^{29}$) = එකම නාදයෙන් පිරුණක්;

**එකපදිකමාර්ග** (386$^{2}$) = එක් අයෙකුට පමණක් යා හැකි පටු අඩිපාර;

**එකබුද්ධ ධාරණීය ය** (323$^{15}$) = එක් බුදුවරයෙකු දැරීමට සුදුසු ය;

**එකශ්‍රැතියෙන්** (26$^{5}$) = එක් වරක් ඇසීමෙන්;

**එකංසව්‍යාකරණීය** (177$^{25}$) = එකාන්තයෙන් පිළිතුරු දියයුතු;

**එකාදශස්ථානයක** (552$^{15}$) = එකොළොස් තැනක;

**එකාන්තාභිවෘද්ධික** (494$^{13}$) = එකාන්තයෙන් වැඩ සාදන;

**එකාසනිකාංගය** (288$^{12}$) = දවසට එක් වරක් වැළඳීමේ අංගය;

**එකාහමත** (581$^{33}$) = මැරී එක් දවසක් වූ;

**එකීභාවයට** (73$^{22}$) = එක්වීමට;

**එකුන්තිස්** (336$^{2}$) = විසිනව;

**එකුන් අනූවක්** (559$^{30}$) = අසූනවයක්;

**එකොද්දෙශයෙන්** (22$^{11}$) = එකම වරක් කියවා ගැනීමෙන්;

**ඔට්ඨපදකාර** (339$^{17}$) = ඔටුපයක් වැනි;

**ඔඤ්ඤාත** (310$^{16}$) = පහත් කොට දන්නා ලද;

**ඔදරික වූ** (500$^{25}$) = සිය බඩ පුරවා ගැනීම පමණක් සිතන;

**ඔනත** (45$^{26}$) = නැමුනු, යටත්;

**ඔනමන** (140$^{9}$) = නැමීම;

**ඔනාහයෙක්** (428$^{19}$) = බැඳීමක්;

Non-Commercial Distribution

ඖපපාතික (152[11]) = ගැබෙහි පිළිසිඳ ගැණීම ආදිය නැති ව එකවරට ම අංග සම්පූර්ණ ව උපන්;
ඔභාසන (45[26]) = බැබළීම;
ඔලිගල්ලය (296[29]) = කුණුවල;
ඔසාරණ (484[17]) = ඇතුළත් කර ගැණීම;
ඔළාරික (57[36]) = දළ මහත්;
ඖපක්‍රමිකයෙන් (433[20]) = උප-ක්‍රමයෙන් වූ දෙයින්;
ඖරස (379[30]) = කුස උපන්;
කක්ෂපුටවණිග් ජන සමූහයා (3[10]) = කිසිල්ලෙහි බඩු පොදිය ගන්වා ගෙණ ඇවිදින වෙළඳ සමූහයා;
කක්ෂලොමයන් (200[28]) = කිසිල්ලෙහි ලොම්;
කටුමිකා (90[31]) = කෘත්‍රිමිකා, අනුන් විසින් ඇති කළ;
කටු සැමිටියෙන් (267[2]) = කටු සහිත කසයෙන්;
කතකරණීයයා (170[4]) කරණ ලද කටයුතු ඇත්තා;
කන්තුකම්‍යතා (555[25]) = කරණු කැමති බව;
කථාභිඥ්ඥාණ (91[14]) = කථාව සිහි කරවීම;
කථාසල්ලාප (7[9]) = එක් ව කරණ කථාව;
කදෝපැණියන් (531[4]) = කලා-මැදිරියන්;
කනක (88[2]) = රන්;
කන්දර (3[27]) = කඳුවල දිය නැවති තිබෙන තැන;
කන්වයින් (516[5]) = කොටට;
කපි නිද්‍රාවට (427[8]) = වඳුරු නින්දට;
කප්ගින්නක් සේ (579[22]) = කල්පාන්තයෙහි හටගත් ගින්නක් මෙන්;
කප්පක පුරුෂ තෙම (282[29]) = සරහන පුරුෂයා; (කපුවා)
කබලිංකාහාරය (340[9]) = පිඩු වශයෙන් බුදින ආහාරය;
කමඩලාවෙන් (390[28]) = කෙණ්ඩියෙන්;
කඹුරුසමින් (140[15]) = ගිනිඅඟුරු වළට පිඹින මයිනහමින්;
කර්කශ විපාක (278[16]) = කටුක විපාක;
කර්ණරසායන (2[4]) = කණට මිහිරක් එළවන;
කර්ණලතායෙහි (296[16]) = කන් පෙත්තෙහි;
කර්ණිකාව (586[7]) = කෙමිය;
කර්මබහුල (10[24]) = කටයුතු අධික;
කර්මවිපාකජ (167[3]) = කර්ම විපාකයෙන් උපන්;
කර්මසාදෘශ්‍යයෙන් (432[24]) = කර්මයට සමාන බැවින්;
කර්මස්ථාන මිලයෙන් (478[19]) = කමටහන් නැමැති මිලයෙන්;
කර්මාරපුත්‍ර (121[15]) = කඹුරුපුත් (ලෝකුරු);
කර්මාවරණය (185[11]) = කර්ම සංඛ්‍යාත ආවරණය; මාර්ග ඵල ලැබීමට බාධක වන පඤ්චානන්තර්ය කර්ම;
කලත්‍ර (392[37]) = භාර්යා;
කලන්දකයාගේ (513[26]) = ලේනාගේ;
කලලරූපය (47[17]) = මවුකුස උපදින ලදරුවාගේ පළමු ව ඇතිවන ඉතා කුඩා රූපය;
කලල් කඩක් (412[31]) = කලාල කැබෙල්ලක් (පැදුරක්);
කලාපග්‍රහණය කොට (375[16]) = මිටි (සමූහ) වශයෙන් ගෙණ;

Non-Commercial Distribution

**කලියුගයෙහි** ($162^{10}$) = කල්පයෙහි අධර්ම බහුල වූ සතර වැනි භාගයෙහි;

**කලිරච්ඡෙදයෙන්** ($250^{16}$) = හුණ ආදි ගොබයක් සිඳින්නාක් මෙන්;

**කල්‍යාණ ධර්ම සමන්නාගත වූ** ($399^{31}$) = යහපත් දහමින් යුත්;

**කසළකුදු** ($506^{20}$) = රොඩු ද;

**කස්සක** ($185^{25}$) = ගොවියා;

**කළු හමු** ($368^{28}$) = කළු තණ නම් ධාන්‍ය වර්ගය;

**කාකස්වර** ($99^{7}$) = කවුඩු හඬ, එබඳු රළු හඬ ඇති;

**කාංක්ෂා විමතිපථයන්** ($303^{6}$) = සැක විමති සහිත කරුණු;

**කාංක්ෂාවිනොදනය** ($8^{25}$) = සැක දුරුකිරීම;

**කාංක්ෂාස්ථාන** ($105^{9}$) = සැක තැන්;

**කාණකච්ඡපොපමාවක්** ($275^{28}$) = කණ කැස්බෙකු උපමා කිරීමක්;

**කාමතෘෂ්ණා** ($57^{28}$) = ඉෂ්ට රූපාදිය පැතීම් වශයෙන් පවත්නා ලොභය;

**කාමනිශ්‍රිත වූ** ($548^{16}$) = කාම ඇසුරු කළ;

**කාමුම්මත්තක ව** ($297^{28}$) = කාමයෙන් උමතුව;

**කාමූපදන** ($79^{32}$) = දැඩි වශයෙන් වූ කාමතෘෂ්ණාව;

**කාමූපාදනාදී චතුර්විධ උපාදන** ($59^{24}$) = කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද යන දැඩි ලෙස ගන්නා සතර වැදෑරුම් ක්ලේශ සතර;

**කාමෙසනා** ($139^{11}$) = කාම වස්තූන් සෙවීම;

**කාමොඝාදි චතුර්විධ ඔඝ** ($42^{22}$) = කාමොඝ, භවොඝ, දිට්ඨොඝ, අවිජ්ජොඝ යන සත්වයන් සසරෙහි ගල්වන මහ ගංවතුර සතරක් වැනි කෙලෙස් සතර;

**කායඅකර්මණ්‍ය ලක්ෂණ** ($349^{15}$) = නාම කායය ක්‍රියාවන්ට නුසුදුසු වීම ලක්ෂණ කොට ඇති;

**කායඍජුත්වය** ($556^{18}$) = නාම කයේ ඍජු බව;

**කායකුසීත ව** ($312^{14}$) = අලස කය ඇති ව;

**කායගතාසති** ($343^{31}$) = කය අනුව ගිය සිහිය;

**කායප්‍රගල්භය** ($546^{4}$) = කයෙහි දරදඬු ගතිය;

**කායප්‍රශ්‍රබ්ධිය** ($556^{1}$) = නාම කයේ සන්සුන් බව;

**කායප්‍රාගුණ්‍යතාව** ($556^{14}$) = නාමකයේ ප්‍රගුණ බව;

**කායලඝුතාව** ($556^{5}$) = නාම කයේ සැහැල්ලු බව;

**කායවාක්සමාචාරයෙන්** ($538^{29}$) = කය, වචන දෙකේ මනා හැසිරීමෙන්;

**කායවාචාවිඤ්ඤත්තියට** ($483^{29}$) = කයින්, වචනයෙන් ඇඟවීමට;

**කායවිඤ්ඤාණය** ($31^{29}$) = කය ඇසුරුකර උපදිනා සුඛ සහගත හෝ දුඃඛසහගත සිත් දෙක;

**කායික** ($51^{36}$) = කය පිළිබඳ;

**කායිකාබාධ** ($167^{31}$) = කයෙහි හටගත් රොග;

**කාරුම්භක** ($347^{34}$) = වල් පැළෑටි විශෙෂයක්;

**කාලත්‍රයවර්ති** ($494^{22}$) = තුන් කල්හි පවත්නා;

**කාලායස** ($585^{9}$) = යකඩ;

**කාලික** ($506^{9}$) = කාලයට අයත්;

**කාෂ්ට** ($433^{8}$) = දර;

**කාෂ්ට ද්වයක්** ($457^{16}$) = වියලි ලී දෙකක්;

Non-Commercial Distribution

කැකුලම් සා (310[38]) = කැකුලමට සාලා;
කිරි පිරක් (289[9]) = කිරි දහරක්;
කීර්තනය (174[16]) = කීම;
කුකුස් (314[24]) = සැක;
කුක්කුට බීජයක් (269[17]) = කුකුළු බිත්තරයක්;
කුක්කුච්චය (556[39]) = පසුතැවිල්ල;
කුටිලභාවකර (556[17]) = වක් බව කරණ;
කුඩු පූවක් (137[20]) = හාල් කුඩු වලින් පිසූ කැවුමක්;
කුපිත (346[23]) = කැකැරුණු;
කුත්ථකිපිල්ලිකබිලාදි (365[4]) = කඩි කුහුඹු බිල් ආදි;
කුම්භකාරයා (62[32]) = මැටි බඳුන් සාදන්නා;
කුම්භය (584[18]) = කළය;
කුරවීකනාද (510[29]) = කොවුල් හඬ;
කුලප්‍රසූත (299[2]) = කුලයෙහි උපන්;
කුශලකාරිහු (264[30]) = කුසල් කරන්නාහු;
කුශලසම්භාරය (190[7]) = පින් රැස;
කුශලාර්ථීන් (355[18]) = කුසල් කැමැත්තවුන්;
කුශලාලොකය (478[16]) = කුසල් නමැති එළිය;
කුශලී (265[4]) = කුසල් ඇති;
කුශීතය (494[18]) = අලසය;
කුළුගෙණ (314[4]) = මතුපත් කොට (මුදුනෙහි තබා);
කූපාදිය (95[3]) = ළිං ආදිය;
කූර්මයා (522[9]) = ඉබ්බා;
කෘතකෘත්‍යතාව (476[33]) = කරණ ලද සිවුමග කට යුතු ඇති බව;
කෘපණ (509[37]) = දීන, බැගෑපත්;
කෙතකී (489[5]) = වැටකේ;
කෙදරයෙහි (435[32]) = කෙතෙහි, කුඹුරෙහි;
කෙසරුකර්ණිකායෙන් (511[19]) = රේණු හා මොට්ටුවෙන්;
කෙළතොලු (346[37]) = දෙඩමලු;
කොක්නාවෝ (368[21]) = වෘකයෝ;
කොතුහල (6[24]) = කුහුල්;
කොතුහලමංගලික (112[7]) = උදෑසන සුභසම්මතයන් දැකීම, ඇසීම, ගමනක් යන විට ශුභ නිමිත්තයන් හමුවීම යන ආදියෙන් ඵල ලැබෙතැ යි විශ්වාස කරන්නා;
කොදෙව් (336[28]) = කුඩා දූපත්;
කොපය (192[26]) = වෙනස්;
කොමුපිඩු (137[10]) = යවසාලින් කළ ආහාරයකි;
කොමුපිළි (368[25]) = කොමු ගසෙහි කෙඳිවලින් වියූ වස්ත්‍ර;
කොළමඩු (508[8]) = කොළ වලින් තැනූ මඩු.
ක්‍රයවික්‍රය (3[31]) = මිල දී ගැණිම හා විකිණීම;
ක්‍රීඩාප්‍රසෘත ව (394[19]) = ක්‍රීඩා වන්හි ඇලී;
ක්ලේශපරිනිර්වාණයෙන් (523[19]) = කෙලෙස් පිරිනිවීමෙන්, කෙලෙසුන් නැසීමෙන්;
ක්ලේශපාපවිතර්ක (543[4]) = කෙලෙස් වැඩෙන ලාමකකල්පනා;
ක්ලේශබන්ධනයෙන් (281[25]) = කෙලෙස් බැඳුමෙන්;
ක්ලේශමලාපගමනයෙන් (543[2]) = කෙලෙස් මල බැහැර වීමෙන්;
ක්ලේශව්‍යපශමන (205[9]) = කෙලෙස් සංහිඳෙන;
ක්ලේශාවරණය (188[28]) = මාර්ග ඵල වසා ලන කෙලෙස්. නියත මිථ්‍යාදෘෂ්ටිය;
ක්ලේශොපධි (472[32]) = අපාය දුකට හෙතුවන ලොභාදිය;

Non-Commercial Distribution

**ක්ෂයභංගාදි** (559[33]) = ගෙවීම, බිඳීම ආදි;
**ක්ෂාර** (255[6]) = කාරම්;
**ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපද** (162[6]) = කුඩා වූ සහ ඊට වඩා කුඩා වූ ද ශික්ෂාපද;
**ක්ෂුධාග්නි** (493[38]) = සාගින්න;
**ක්ෂුධාවෙන්** (76[9]) = බඩගින්නෙන්;
**ඛඩගය** (97[4]) = කඩුව;
**ඛඩග ධරා** (268[18]) = කඩු දරා;
**ඛණ්ඩඵුල්ල පටිසංඛරණ** (361[15]) = කැඩුම් බිඳුම් අළුත්වැඩියා කිරීම;
**ඛන්ධසාඛා පලාස සම්පන්න වූ** (350[30]) = කඳ අතු කොළ යුත්;
**ඛන්ධාවාරයට** (387[23]) = කඳවුරට;
**ඛලිත** (111[22]) = පටලැවුනු;
**ඛලුපච්ඡාභත්තිකංගය** (503[30]) = භොජන පවාරණය කොට නැවත අතිරිත්ත කරවීමෙන් කැප කරවා ගත් හෝ ගිලනෙකු ඉතිරි කළ හෝ බොජුන නො වළඳන භික්ෂූහු ගේ එසේ නො වැළඳීම නමැති ධුතංගය;
**ඛාණුකණ්ටකකඨලාදි** (232[11]) = කණු කටු කැබිලිති ආදි;
**ඛිපනය** (51[13]) = දැමීම;
**ඛිප්පාභිඤ්ඤ** (361[28]) = වහා නිවන් අවබොධ කරණ;
**ඛෙලපාතනය** (500[33]) = කෙල ගැසීම;
**ගගනානුගත** (378[31]) = අහසට නැඟුණේ;
**ගණනපථය** (24[18]) = ගණන් මාර්ගය, ගණනෙන් දක්විය යුතු තරම් ප්‍රමාණය;
**ගණසංගණිකා දෙශයෙන්** (270[7]) = සමූහයා හා එක් ව විසීමේ දෙෂයෙන්;
**ගණාචාර්ය** (6[29]) = සමූහයාට ගුරු වූ;
**ගණ්ඨිතයෙක** (197[9]) = තද ගැටයෙකි;
**ගද්‍රභ** (515[31]) = කොටළු;
**ගන්ධාපනය** (463[26]) = සුවඳ ද්‍රව්‍ය විකුණන වෙළඳ සැල;
**ගමනපථ** (435[22]) = ගමන් මග;
**ගාමඝාතකයෝ** (417[5]) = ගම් පහරන්නෝ;
**ගැලක්** (68[13]) = කරත්තයක්;
**ගැල් නාභි** (406[16]) = රථයේ බොස්ගෙඩිය;
**ගැල් සාර්ථවාහයකු** (253[14]) = ගැල් පදවන්නකු;
**ගිරිශිඛර** (280[32]) = කඳු මුදුන්;
**ගුත්තියෙන්** (313[32]) = රැකීමෙන්;
**ගුප්තද්වාරතායෙහි ද** (545[12]) = රැකි දොරටු ඇති බැවිහි ද;
**ගුළ්හ** (293[26]) = සැඟවුනු;
**ගෘහවාස්තු** (172[13]) = ගෙබිම;
**ගෘහසම්මාර්ජන** (444[7]) = ගේ හැමදීම;
**ගෘහස්ථ ප්‍රව්‍රජිත සජ්ජනයන් ගෙන්** (4[17]) = ගිහි පැවිදි සත්පුරුෂයන් ගෙන්;
**ගෙලඤ්ඤය** (556[15]) = ගිලන්බව;
**ගෙහනිශ්‍රිත** (53[23]) = ගෙය ඇසුරු කළ තෘෂ්ණා සහගත;
**ගොනැස්** (45[12]) = ගෙයි වහලෙහි යොදන වක් වූ ලීය, පරාලය;
**ගොපනය** (482[2]) = රැකීම;
**ග්‍රථනයෙන්** (567[25]) = ගෙතීමෙන්;
**ග්‍රන්ථිස්ථානය** (158[22]) = ගැටලුතැන;
**ග්‍රහණයක්** (196[5]) = ගැණීමක්;
**ග්‍රහණවිරහිත** (544[10]) = ගැණීම් නැති;
**ග්‍රාමජ්‍යෙෂ්ඨයා** (181[18]) = ගමෙහි ප්‍රධානයා;

*Non-Commercial Distribution*

**ග්‍රාමභොජක ජ්‍යෙෂ්ඨයක්හට** (508[20]) = ප්‍රධාන ගම්මුලාදෑනියෙකුට;

**ග්‍රාමික** (101[6]) = ගම්වැසි;

**ග්‍රීෂ්මාභිතප්ත** (447[30]) = උෂ්ණයෙන් ඉතා තැවුනු;

**ඝට්ටනය** (70[5]) = ගැටීම;

**ඝනතර තිමිරාන්ධකාරය** (441[9]) = ඉතා තද අඳුර;

**ඝනතර පර්වත ප්‍රතිච්ඡන්න** (594[10]) = ඉතා ඝන පර්වතයකින් වැසුනු;

**ඝනාන්ධකාරයෙහි** (46[6]) = තද අඳුරෙහි;

**ඝාතනය** (237[37]) = නැසීම;

**චකිත වන්නේ ය** (350[6]) = තැතිගන්නේ ය.

**චංක්‍රමණ** (525[29]) = සක්මන;

**චතුරංගිණී සෙනාවෙන්** (2[27]) = ඇත්, අස්, රිය, පාබල යන අවයව සතරක් ඇති සෙනාවෙන්;

**චතුර්මහාභූතික වූ** (563[23]) = සතර මහා භූතයන්ගෙන් හට ගත්;

**චතුර්විධ ආහාර** (313[15]) = ඛාද්‍ය, භොජ්‍ය, ලෙය්‍ය, පෙය්‍ය;

**චතුර්විධ ඍද්ධිපාදයෙහි** (482[32]) = ඡන්ද, චිත්ත, වීරිය, විමංසා යන සතරෙහි;

**චතුර්විධ යොනි** (518[16]) = අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ, ඔපපාතික යන ඉපදීම් සතර;

**චතුර්විධ ශීලස්කන්ධයෙහි** (333[1]) = ප්‍රාතිමොක්ෂ, ඉන්ද්‍රිය සංවර, ආජීවපාරිශුද්ධි, ප්‍රත්‍යය සන්නිශ්‍රිත යන සිවුවැදෑරුම් ශීලයෙහි;

**චතුර්වෛශාරද්‍ය** (85[4]) = සර්වඥබව, ක්ෂීණාශ්‍රව බව, නෛර්යානික ධර්මයන් දන්නා බව, අන්තරයාකර ධර්මයන් දන්නා බව යන සතරෙහි නිර්භය භාවය;

**චතුස්සත්‍ය ධර්මයන්** (46[13]) දුඃඛ, සමුදය, නිරොධ, මාර්ග යන සත්‍යධර්ම සතර.

**චතුස්සත්‍යප්‍රතිච්ඡාදක** (463[12]) = සිවුසස් වසන;

**චතුස්සාගර** (483[20]) = සිවු සයුර;

**චන්දන කුංකුමාදිය** (535[23]) = සඳුන් කොකුම් ආදිය;

**චපලතාවෙන්** (109[18]) = චංචල භාවයෙන්;

**චාටු කම්‍යතාවෙන්** (520[16]) = රැවටීමෙන්;

**චාපයාගේ** (524[4]) = දුන්නේ;

**චිකිත්සාකාර** (218[30]) = වෛද්‍ය;

**චිත්ත දූෂණය** (541[29]) = සිත කිලිටිවීම;

**චිත්තවික්ෂෙපයට** (77[3]) = සිත් කැලඹුමට;

**චිත්ත විතර්කයෙක්** (281[16]) = සිත්හි කල්පනාවෙක්;

**චිත්තසන්තානයෙහි** (475[10]) = චිත්ත පරම්පරාවෙහි;

**චින්තාමාණික්‍යරත්නයාගේ** (333[24]) = සිතූ පැතූ සැපත් දෙන මැණිකෙහි;

**චිත්‍රකාරයන්** (270[5]) සිත්තරුන්;

**චිත්‍රකථී** (27[10]) = විසිතුරු කථා ඇති;

**චෙතොපණිධි** (156[28]) = චිත්ත ප්‍රාර්ථනාව;

**චෙතොවශිප්‍රාප්ත** (438[30]) = සිත වසහ කර ගැණීමට පැමිණි;

**චෞරවිලොපනයෙහි** (498[31]) = සොරුන් නැසීමෙහි;

**ඡත්‍රසලාකා** (304[19]) = සැත් හිරවු (කුඩ නත)

**ඡන්දරාගය** (174[14]) = තද ආශාව;

Non-Commercial Distribution

**ජන්තස්ථානයෙක** ($507^{29}$) = සෙවිලි කළ තැනක;

**ඡවිරාග** ($332^{27}$) = සිවියෙහි (සමෙහි) පාට;

**ඡායූපමාව** ($33^{30}$) = සෙවනැල්ල සමාන කිරීම;

**ඡින්න වෘක්ෂ පතනාකාරයෙන්** ($226^{8}$) = කැපූ ගසක් වැටෙන අයුරින්;

**ඡින්නතාල වෘක්ෂයක්** ($176^{32}$) = සිඳින ලද තල් ගසක්;

**ඡේද්‍ය භේද්‍ය** ($510^{6}$) = සිඳිය යුතු-බිඳිය යුතු (දඬුවම්කළ යුතු);

**ජංඝපෙසනියෙන්** ($520^{20}$) = පණිවුඩ ගෙණ යැමෙන්;

**ජඨරාග්නි** ($224^{15}$) = ආමාශ ගත ගින්න;

**ජඩ මූඪ තෙම** ($342^{32}$) = චපල වූ මෝඩ තැනැත්තේ;

**ජනරඤ්ජනය** ($105^{5}$) = ජනයා සතුටු කිරීම;

**ජනවංචන ප්‍රයොගයෙහි** ($520^{15}$) = ජනයා රවටන ක්‍රියායෙහි;

**ජන විවික්ත** ($107^{26}$) = ජනයා ගෙන් තොර;

**ජනශුන්‍යාගාරයෙහි** ($550^{2}$) = ජනයා නැති ගෙහි;

**ජන සංගණිකාකාමී** ($563^{10}$) = ජනයා හා එක්වනු කැමැති;

**ජනහෘෂ්ට** ($305^{13}$) = ජනයන් සතුටු කළ;

**ජම්භීර** ($384^{22}$) = දෙඩම්;

**ජලචර** ($140^{20}$) = දියෙහි හැසිරෙණ;

**ජලජ** ($234^{16}$) = දියෙහි හට ගත්;

**ජල සළායෙන්** ($254^{19}$) = දිය සුළියෙන්;

**ජලස්නානය** ($5^{30}$) = වතුර නෑම;

**ජලාබුජ** ($368^{13}$) = දලබුවෙන් (මවුකුස) උපදින;

**ජවනිකා** ($416^{8}$) = තිර;

**ජාගරියානුයොගයෙහි ද** ($545^{13}$) = නිදි දුරු කිරීමෙහි ද;

**ජාතභූමිය** ($95^{29}$) = උපන් බිම;

**ජාතිස්මරණ නුවණ** ($91^{23}$) = පෙර ජාතීන් සිහි කරණ නුවණ;

**ජින දෙශනාව** ($40^{25}$) = බුද්ධ දෙශනාව;

**ජිනසුනුභාවයට** ($500^{29}$) = බුද්ධපුත්‍රභාවයට;

**ජීර්ණභාවයට** ($77^{24}$) = දිරීමට;

**ජිර්ණව ගිය හෙයින්** ($289^{34}$) = දිරා ගිය හෙයින්;

**ජීවිකාවෘත්තියෙහි** ($89^{12}$) = ජීවත් වීමෙහි;

**ජෙට්ඨාපචායන ධර්මය** ($269^{10}$) = වැඩිහිටියන් පිදීමේ ගුණය;

**ජොතිපාසාණය** ($63^{25}$) = සූර්ය රශ්මියට ඇල්లූ විට ගිනි උපදවන ගල් විශෙෂ; පළිඟු ගල;

**ජ්වලිතප්‍රජ්වලිත වූ** ($299^{33}$) = දූල්වුනු. වෙසෙසින් දූල්වුනු;

**ඥානඛඩ්ගය** ($560^{17}$) = නුවණ නමැති කඩුව;

**ඥාණ සම්ප්‍රයුක්ත චිත්තයෙන්** ($464^{32}$) = ඥාණය හා යෙදුනු සිතින්;

**ඩබරවිග්‍රහ විවාදශීලී වූ** ($563^{9}$) = ස්වභාවයෙන් කලකොලාහල කරණ;

**ඩා සෙලවෙන** ($338^{18}$) = දහඩිය දමන;

**ඨපනියප්‍රශ්න** ( — ) = පිළිතුරු නො දී තැබිය යුතු ප්‍රශ්නය;

**ඨාන චංකමික** ($288^{10}$) = සිටීම සක්මන යන ඉරියව්වලින් යුත්;



Non-Commercial Distribution

තත් කෘත්‍ය සාධක (359$^{3}$) = ඒ කට යුතු සිද්ධ කරණ;
තත්‍රමධ්‍යස්ථතාව (555$^{39}$) = මැදහත් බව;
තථාගතප්පවෙදිත (282$^{18}$) = බුදුන් විසින් පැවසූ;
තෘණොදකය (239$^{9}$) = තණ හා දිය;
තර්පණය (305$^{2}$) = සතුටු කිරීම;
තළාකයෙහි (160$^{7}$) = විලෙහි;
තසිත (447$^{29}$) = පිපාසිත;
තාල පනස නාලිකෙරාදි (520$^{13}$) = තල් කොස් පොල් ආදි;
තාලම්පට (70$^{8}$) = කයිතාලම්;
තාලවණ්ටයකින් (115$^{21}$) = විජිනි පතකින්;
තින්දුක (265$^{30}$) = තිඹිරි;
තිඹිරිගෙයක් (323$^{14}$) = වැදුම් ගෙයක් (සූතිකාගාරයක්);
තිරශ්චීන (439$^{11}$) = තිරිසනා;
තිලකවාදීන් (66$^{4}$) = ශ්‍රෙෂ්ඨ වාදීන්;
තිලකායමාන (513$^{16}$) = තිලකයක් වැනි;
තිලෝගුරු (1$^{1}$) = කාම-රූප-අරූප හෝ ස්වර්ග-මානුෂ-පාතාල යන තුන්ලොවට ආචාර්ය වූ;
තික්ෂණ (1$^{14}$) = තියුණු;
තීර්ථකයන්ට (5$^{16}$) = මිසදිටුවන්ට;
තීර්ථායතනයෙහි (268$^{27}$) = තීර්ථකශාසනයෙහි;
තුංග (351$^{8}$) = උස්;
තුවඡ (341$^{30}$) = හිස්;
තුරිතාතුරිත චාරිකා (493$^{12}$) = ඉක්මන් - නො ඉක්මන් චාරිකා;
තුරුක් තෙල් (497$^{30}$) = සුවඳ වර්ගයක්;
තුලාකූට (402$^{17}$) = හොර තරාදියෙන් කිරා දීම;
තුලාවගේ (515$^{7}$) = තරාදියේ;
තෘප්තියට (535$^{12}$) = සෑහීමට;
තෙල අසුන් (384$^{11}$) = අර (ඔය) අශ්වයන්;
ත්‍රිධාප්‍රභින්න වූ (406$^{27}$) = තුන් අයුරකින් බිඳුනු (තුන් තැනකින් බිඳුනු);
ත්‍රිපරිවර්තයක් (529$^{11}$) = වට තුනක්;
ත්‍රිපිටක (22$^{17}$) = සූත්‍ර - අභිධර්ම- විනය යන බුද්ධ වචනය;
ත්‍රිමද ගලිත ( — ) = දෙකන්- පුල්ලිංග යන තුන් තැනින් මද ගලන;
ත්‍රිවිද්‍යාධර (173$^{32}$) = පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ- දිව ඇස - ආශ්‍රවක්ෂය කරණ නුවණ යන ඤාණ තුන දරණ;
ත්‍රිවිධ කුශල කෘත්‍යය (70$^{24}$) = දන - ශීල - භාවනා යන තුන් වැදෑරුම් පුණ්‍ය ක්‍රියා;
ත්‍රිවිධ තෘෂ්ණාවන් (481$^{2}$) = කාම-භව-විභව යන ආසා;
ත්‍රිවිධ බොධි (458$^{25}$) = බුද්ධ බොධි - පච්චෙක බොධි - ශ්‍රාවක බොධි යන තුන;
ත්‍රිවිධ වූ රොගුප්පත්ති (342$^{26}$) = වා - පිත් - සෙම් යන රෝග ඉපැන්මේ හේතුන් තුන;
ත්‍රිවිධ ශික්ෂායෙහි (322$^{28}$) = අධිසීල - අධිචිත්ත - අධිපඤ්ඤා යන ශික්ෂා තුනෙහි;
ත්‍රෛලොක (45$^{1}$) = තුන්ලොව;
ත්වච (368$^{30}$) = පොත්ත;
ථලජ (234$^{16}$) = ගොඩ හටගත්;
ථලයෙහි (400$^{3}$) = ගොඩබිම;
ථනයිත (575$^{19}$) = කිරි බොන;
ථාම (440$^{17}$) = ශක්ති;
ථිනය (557$^{1}$) = සිතේ මැලි ගතිය;
ථිරාථිර බව (251$^{30}$) = ශක්තිය ඇති නැති බව;

Non-Commercial Distribution

ථුතිථොමිත (499[39]) = ස්තුතියෙන් ස්තුති කරණ ලද;
ථෙය්‍යසංවාසක ( — ) = පැවිද්දට හානි පැමිණ ද පැවිද් දෙකු මෙන් පෙණී සිටින්නා;
දක්ඛිණීය (402[8]) = දීමට සුදුසු;
දඟ හැරීම (310[31]) = ගැට හැරීම;
දණ්ඩ ප්‍රාප්ත (54[36]) = දඬුවමට පැමිණි;
දණ්ඩන භයින් (190[26]) = දඬුවමට බියෙන්;
දන්ත කඩක් (270[13]) = දත් කැබෙල්ලක්;
දරථ ( — ) = පීඩාව, වෙහෙස;
දර්පයෙන් (584[24]) = ආඩම්බර යෙන්;
දසකසිණාරමුණු (540[29]) = පඨවි, අපො, තෙජො, වායු, නීල, පීත, ලොහිත, ඕදත, ආකාස, ආලොක යන කසිණ අරමුණු දශය;
දසනඛ සමොධානයෙන් (539[8]) = නිය දසය එක් කිරීමෙන්, දෙ අත් එක් කිරීමෙන්);
දනනිස්සන්දඵල (140[5]) = දනය හෙතු කොට ගෙණ වූ යහපත් විපාකය;
දනව (368[16]) = අසුර විශෙෂයක්;
දනසෙතුසංක්‍රමණයෙන් (307[13]) = දන නමැති ඒදඬු-පාලම් වලින්;
දනොපකරණ (35[34]) = දනය පිණිස වුවමනා කරණ ද්‍රව්‍ය;
දයාද පුත්‍ර (291[3]) = උරුම ලබන පුත්‍රා;
දර පිඹුරු (383[25]) = දර නම් වූ පිඹුරා;
දඝින්වයට (193[8]) = දඝියක බවට;
දික්ශුද්ධිය (532[13]) = දිශාවන්හි පිරිසිදු බව, උතුර ආදි දිශාවන් නිසි සේ විනිශ්වය කර ගැණීම;
දියත්තක් (47[18]) = දිය ටිකක්;
දිවස්හුල (255[13]) = මහාපරාධ කළ ජීවතුන් තබන හුල;
දිව්‍යචක්ෂුරභිඥනය (286[12]) = දිවැස;
දිව්‍යශ්‍රොත්‍රධාතුව (9[44]) = දෙවි යන්ගේ කණ වැනි, ඈත සියුම් ශබ්ද පවා ඇසිය හැකි, පිත්තශ්ලේෂ්මාදීන් පීඩිත නො වූ, ධ්‍යානාදි බලයෙන් නිපන් විශිෂ්ට ඥනය;
දීපික (520[7]) = දිවි;
දුඃඛනිරොධාර්යසත්‍යය (470[16]) = දුක් නැති කිරීමට හෙතුවන නිර්වාණය වූ ආර්ය සත්‍යය;
දුදුළෙන් (532[26]) = දූර්ගයෙන්;
දුප්පසහ (10[3]) = මැඩ පැවැත්විය නො හැකි;
දුමස්දළු (133[29]) = කුණු වූ මස් දළු;
දුරනුබොධ (4[30]) = අවබොධ කට නො හැකි;
දුරාසද (10[2]) = ළං විය නො හැකි;
දූර්ගත (509[37]) = දුගී;
දුර්දර්ශන (317[37]) = දක්නට අපහසු බව;
දුර්දර්ශනීය (594[10]) = දැකීම අපහසු;
දුර්වලග්‍රහණික වූ (364[5]) = අහර පැසවන ගින්න අඩු;
දුෂ්ශීල භයංකර වූ (210[13]) = දුශ්ශීලයන්ට බියකරු වූ;
දුෂ්කරක්‍රියා (338[15]) = කිරීමට අපහසු ක්‍රියා;
දුෂ්ප්‍රතිපන්න (304[22]) වැරැදි සේ පිළිපන්;
දුෂ්ප්‍රතිවෙධභාවය (345[28]) = අවබොධයට අපහසු බව;
දුහුල් (314[7]) = සිහින් වස්ත්‍ර;
දෘෂ්ටධර්මයෙහිත් (297[1]) = මෙ ලොවත්;

**දෘෂ්ටධර්මසුඛවෙදනීය** (136[35]) = මෙ අත්බැව්හිම සැප වින්දහැකිවූ;
**දෘෂ්ටිජාල** (113[9]) = මිථ්‍යා දෘෂ්ටි නමැති දැල;
**දෘෂ්ටිවාදයෙන්** (17[38]) = ආගම ධර්මයන් පිළිබඳ වාදයෙන්;
**දෙකටසනක් තැන්** (507[10]) = හඩ සණ දෙකක් පමණ තැන්;
**දෙගං භිත්ති** (223[11]) = ගඟේ ඉවුරු දෙක;
**දෙපක්ෂයෙන්** (338[17]) = දෑළෙන්;
**දෙපත්ලස** (262[30]) = දෙපතුල ලඟ;
**දෙවාතිදෙව වූ** (281[20]) = දෙවියනට ද වඩා ශ්‍රෙෂ්ඨ දෙවි වූ;
**ද්‍රැමෙන්ද්‍රයා** (528[17]) = වෘක්ෂ රාජයා (උතුම් ගස);
**ද්විපදෙත්තම** (460[17]) = දෙපා ඇත්තන්ට උතුම බුදුරජ;
**ධනභොගසාරයෙන්** (19[14]) = ධනයෙන් හා පරිභොග කට යුතු වස්තුසාරයෙන්;
**ධනුශ්ශිල්පයෙහි** (76[21]) = දුන්නෙන් විදීම උගන්වන ශාස්ත්‍රයෙහි;
**ධමකයෝ** (36[37]) = පිඹින්නෝ;
**ධර්මචර්යා** (24[6]) = ධර්මයෙහි හැසිරීම, සුචරිත ක්‍රියා;
**ධර්මචින්තාවන්** (60[29]) = ධර්මාලම්බන සිතීම්;
**ධර්මද්වීපගති පරායණ** (355[13]) = දහම් නමැති පිහිට;
**ධර්මතාව** (113[23]) = ස්වභාවය;
**ධර්මසන්තතිය** (48[5]) = ධර්ම පරම්පරාව;
**ධර්මාභිසමය** (24[11]) = ධර්මාවබොධය;
**ධවලච්ඡත්‍රය** (459[34]) = සේසත;
**ධාත්වධික** (553[20]) = ධාතු අධික;
**ධාර්මිකාපණිකයෝ** (485[26]) = දැහැමි වෙළෙන්දෝ;
**ධුතාංගභූමිකර්ම** (495[26]) = ධුතාංගයනට ආධාර වූ කර්ම;
**ධුතාංගයන්** (24[27]) = කෙලෙස් කම්පා කිරීමට ඉවහල් වන පංසුකූලිකාංගාදි තෙළෙස් කරුණු;
**නගර ගුත්තිකයෝ** (485[19]) = නගර ආරක්ෂකයෝ;
**නගර ජෝතිකයෝ ය** (484[6]) = නගරය බබුළුවන්නෝ ය, (පහන් දල්වන්නෝ);
**නගර වඩ්ඪකී** (462[30]) = නුවර වඩුවා, නගරයක් නිසි සේ බෙද සාදන ශිල්පියා;
**නගුලිස** (313[10]) = නඟුලෙහි වියගහ සවි කරණ ලිය;
**නංගල බලි කර්මය** (311[19]) = නඟුලට හෝ ඊට අධිපති දේවතාවාට පිදේනි දීම;
**නංගුලායුධය** (560[11]) = නගුල නමැති අවිය;
**නදී දුර්ගයක්** (546[10]) = ගඟක යෑමට අපහසු තැනක්;
**නභස්තලයෙහි** (407[16]) = අහස් තලයෙහි;
**නරදම්‍යසාරථී** ( — ) = දමනය කට යුතු පුරුෂයන් හික්මවන;
**නරාවලෙක** (265[31]) = ඉතා ගැඹුරු දුගඳ හමන වළෙක්හි;
**නරොරග** (40[127]) = (නර-උරග) මිනිස්, සර්ප;
**නව ආඝාත වස්තු** (240[7]) = ක්‍රොධය ඉපදීමට ආධාර වන 'මෙ තෙම මට අනර්ථ කෙළේ ය. කරයි, කරන්නේ ය'— යන ලෙසින් තමා පිළිබඳ තුණක් ද, එසේ ම තමාගේ හිතවතුන් පිළිබඳ තුණක් ද, 'මෙ තෙම

Non-Commercial Distribution

මාගේ සකුරනට යහපත කෙළේ ය, කරයි, කරන්නේ ය, යන ලෙසින් තුණක් ද යි මෙසේ නව වැදැරුම් අදහස්;

**නව උපොසථය** ($355^{16}$) = පුර අව දෙ පක්ෂයෙහි පස්වැනි, අටවැනි, තුදුස්වැනි, පසළොස්වැනි තිථි ලත් පොහෝ දවස් අට හා පටිජාගරණ උපොසථ දින ද යන නවය නොහොත් චාතුද්දසී, පඤ්චදසී, සාමග්ගි සහ පොහෝ, ගණ පොහෝ, පුඟුල් පොහෝ, සුත්තුද්දෙස උපොසථ, පාරිසුද්ධි උපොසථ, අධිට්ඨාන යන නවය;

**නවසත්තාවාස** ($583^{17}$) = සත්වයන් වසන නානත්තකාය නානත්තසඤ්ඤී, නානත්තකාය එකත්තසඤ්ඤී, එකත්තකාය නානත්තසඤ්ඤී, එකත්තකාය එකත්තසඤ්ඤී යන සතර ද, අරූපලොක සතර ද, ආසඤ්ඤ සත්තය ද යි යන ස්ථාන නවය;

**නව සලිලයෙන්** ($145^{26}$) = අළුත් වතුරෙන්;

**නවාංගශාස්තෘ ශාසන** ($4^{6}$) = සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන අංග නවයක් ඇති බුදු සසුන;

**නහමක් කරවූ** ($408^{16}$) = නො කරවූ;

**නහාපන** ($328^{6}$) = නැහැවීම;

**නානාදෙශානීත** ($3^{6}$) = නොයෙක් රටවලින් ගෙණෙන ලද;

**නාභි පරාමර්ශනය** ($258^{26}$) = නැබ පිරිමැදීම;

**නාභි මණ්ඩලාකාරයෙන්** ($492^{38}$) = නැබ මඬුල්ලක අයුරින්;

**නාමරූප** ($54^{16}$) = චිත්ත චෛතසික හා රූපය;

**නාරංග** ($384^{22}$) = නාරං;

**නාවාලකනයාගේ** ($529^{21}$) = නැව නවත්වන නැංගුරමේ;

**නාළිකාදියෙන්** ($445^{13}$) = නැළි ආදියෙන්;

**නික්ලේශී** ($38^{18}$) = කිලෙස් නැති;

**නිග්‍රහ** ($12^{29}$) = නින්දාව;

**නිචිත** ($190^{9}$) = රැස් කරණ ලද;

**නිදිවර්ජිත** ($444^{21}$) = නින්ද දුරු කිරීම;

**නිපුණ** ($317^{37}$) = සියුම්;

**නිමන්ත්‍රකයකු** ($278^{12}$) = කැඳවන්නකු;

**නිමුජ්ජනය** ($141^{5}$) = ගැලීම;

**නිමෙසන්තරය** ($250^{34}$) = ඇසිපිය හෙලන තරම් කාලයක අතර;

**නිම්නස්ථාන** ($433^{26}$) = පහත්තැන්;

**නිරග්ගික** ($453^{14}$) = ගින්නක් නැති;

**නිරපෙක්ෂක ව** ($481^{6}$) = බලාපොරොත්තු රහිත ව;

**නිරවද්‍ය දර්ශනය** ($283^{17}$) = නිවැරදි දැකීම;

**නිරවශෙෂ** ($147^{21}$) = ඉතුරු නැති;

**නිරාමිස** ($505^{16}$) = ආමිස නැති, යාවකාලිකය හැර සෙසු පාන වර්ග හා ගිතෙල් ආදි දේ;

**නිරිසත්වයෝ** ($77^{16}$) = නරකයෙහි උපන් සත්වයෝ;

**නිරුත්තර** ($81^{20}$) = තමාට වඩා ශ්‍රෙෂ්ඨයකු නැති;

**නිරොධසමාපත්තිය** ($11^{14}$) = චිත්තනිරොධයට පැමිණීමේ සමවත, අනාගාමීන් සහ රහත්හු ඉහාත්මභාවයෙහි නිවන්සුව විඳිනු සඳහා සමවදින සමාපත්තිය;

Non-Commercial Distribution

**නිර්ගාථක** ($210^{16}$) = ගාථා රහිත;
**නිර්ගණ්ඨි** ($299^{35}$) = නික;
**නිර්ජට නිර්ගුම්බ** ($1^{23}$) = අවුල් නැති;
**නිර්මල ධවලච්ඡත්‍රය** ($304^{27}$) = පිරිසිදු සේසත;
**නිර්වාණාර්ථ වශික වූ** ($574^{19}$) = නිවන් නමැති ප්‍රයෝජනයට වසහ වූ;
**නිර්වාපණය** ($447^{7}$) = නිවීම;
**නිර්වෙඨනය** ($34^{9}$) = වෙළුම් මිදීම, අර්ථය තෝරා දීම;
**නිර්වෙමතික ශ්‍රද්ධාව** ($511^{29}$) = සැක රහිත ශ්‍රද්ධාව;
**නිල කොට** ($268^{24}$) = විධාන කොට;
**නිවෙසනය** ($104^{9}$) = ගෙය;
**නිශ්‍රිත** ($549^{10}$) = ඇසුරු කළ;
**නිශ්‍රෙණිය** ($499^{20}$) = ඉණිමග;
**නිශ්‍රීක දර්ශනය** ($537^{1}$) = ශොභා රහිත නින්දිත දැකීම;
**නිෂද්‍යා** ($525^{29}$) = හිඳීම;
**නිෂෙවිත** ($509^{50}$) = නිතර සෙවුනා ලද;
**නිෂ්ඨා** ($169^{19}$) = අවසන් කිරීම;
**නිෂ්පර්යාය වචනයෙක** ($284^{6}$) = අනික් ක්‍රමයක් නැති එකාන්ත වචනයෙකි.
**නිසදයක** ($538^{27}$) = නිස දෙන;
**නිස්තෙජස්ක ව** ($36^{6}$) = තෙජස (ආනුභාව) නැති ව;
**නිස්සරණය** ($456^{16}$) = කෙලෙසුන් ගෙන් ගැලවීම, නිවණ;
**නිවාසනයක්** ($21^{15}$) = මිටි අඳුනක්;
**නීලොත්පලදලාකාර** ($215^{19}$) = නිලුපුල් පෙති වැනි;
**නුහුනුවෝ** ($403^{4}$) = නොහැක්කෝ;
**නෛමිත්තක බව ය** ($538^{7}$) = කයින් හෝ වචනයෙන් යමක් අඟවන ගතිය;
**නෙයියාඩම** ($416^{6}$) = නැටුම්;
**නෛර්යාණික** ($484^{28}$) = නිවණට පමුණුවන;
**නෛෂ්ක්‍රම්‍ය** ($54^{5}$) = නික්මීම;
**නො සරුප්** ($375^{19}$) = නුසුදුසු, (නො ගැළපෙන);
**පක්ෂ ග්‍රහණය** ($325^{3}$) = පක්ෂයක් ගැණීම;
**පග්සරණය වන්නේ ය** ($231^{24}$) = වැගිරෙන්නේ ය;
**පර්ජන්‍යය** ($519^{18}$) = මෙඝය;
**පඤ්චකාමයෙහි** ($30^{29}$) = රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන කාමවස්තු පසෙහි;
**පඤ්ච චෙතොඛිල** ( — ) = බුද්ධ, ධම්ම, සංඝ, සික්ඛා යන කරුණු සතර පිළිබඳ සැක හා සබ්‍රහ්මචාරීන්ට කිපීම ද යන සිතට උල් වැනි කරුණු පස;
**පඤ්චනීවරණයන්** ($40^{32}$) = කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන සිතේ දියුණුව වසා දමන ධර්ම පස;
**පඤ්චමහා ගංගාවෝ** ($81^{27}$) = ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන ගංගා පස;
**පඤ්චමහාගතීන්** ($512^{13}$) = නරක, ප්‍රෙත, තිරශ්චීන, මනුෂ්‍ය, දෙව යන ගති පස;
**පඤ්චවිධභෙදය මණ්ඩලයෙහි** ($1^{15}$) = සංස්කාර, විකාර, ලක්ෂණ, නිර්වාණ, ප්‍රඥප්ති යන පස් වැදෑරුම් වූ දතයුතු ධර්ම විෂයෙහි;
**පඤ්චවිමුක්ති** ($43^{27}$) = තදංග, විෂ්කම්භණ, සමුච්ඡේද, ප්‍රති ප්‍රශ්‍රබ්ධි, නිස්සරණ යන විමුක්ති පස;

Non-Commercial Distribution

**පඤ්චානන්තරිය** ($30^{31}$) = මවු මැරීම, පියා මැරීම, රහතන් මැරීම, බුදුන්ගේ ඇඟින් ලේ සෙලවීම, සංඝයා භෙද කිරීම යන අනන්තර ජාතියෙහි විපාක දෙන කර්ම පස;

**පටිපාටිය** ($60^{24}$) = පිළිවෙළ;

**පටිප්ඵරිත** ($524^{14}$) = විරුද්ධ ව පැතුරුණු;

**පටිප්පස්සම්භනය** ($464^{37}$) = සංසිඳීම;

**පටිභාන** ($99^{24}$) = වැටහීම;

**පටියත්තමය** ($340^{24}$) = පිළියෙළ වූයේ ම ය;

**පටිසන්ථාරමාත්‍රයක්** ($13^{4}$) = පිළිසඳර පමණක්;

**පටිසල්ලාන** ($170^{5}$) = විවේකය;

**පටුන්නගමෙක්හි** ($509^{22}$) = නොයෙක් දෙසින් වෙළෙඳුන් පැමිණෙන ගමක, නගරයක;

**පණ්ඩකයා** ($109^{1}$) = නපුංසකයා;

**පණ්ඩර** ($346^{12}$) = සුදු (පිරිසිදු);

**පතිරූපදෙස** ($109^{34}$) = යොග්‍ය දෙශය;

**පත්කොට** ($227^{15}$) = නවා;

**පත්තක්ඛන්ධ** ($7^{21}$) = යටට නැමුනු කර ඇති, අධො මුඛ වූ;

**පත්ථිත ය** ($494^{14}$) = පතන ලද ය;

**පදලනයකර** ($412^{33}$) = පළා;

**පනාමය** ($238^{24}$) = අපනාමය, නෙරපීම;

**පන්ථමර්කටකයාගේ** ($575^{2}$) = මඟ දැල් බඳින මකුළුවාගේ;

**පපටිකා** ($232^{2}$) = පතුර;

**පබ්බාජන** ($274^{4}$) = නෙරපීම, පිටමං කිරීම;

**පබ්භාර** ($45^{23}$) = නැමුනු;

**පබ්භාරයක්** ($565^{23}$) = ගුහා වක්;

**පරචිත්ත විජානන ඥානය** ($286^{12}$) = අනුන් සිත් දැනීමේ නුවණ;

**පරදුක්ඛාපනයෙන්** ($400^{31}$) = අනුන්ගේ දුක් බැහැර කිරීමෙන්;

**පරමව්‍යාධියෙන්** ($342^{29}$) = දරුණු රොගයකින්;

**පරමසණ්හසුඛුම** ($346^{38}$) = ඉතාමත් සිහින්, සියුම්;

**පරමාර්ථය** ($37^{30}$) = උසස් බලාපොරොත්තුව;

**පරවාදිභ කුම්භ විදරණ කෙශරීන්ද්‍ර භූත** ($111^{32}$) = විරුද්ධවාදී නමැති හස්තීන්ගේ කුඹු පැළීමෙහි සිංහරාජයකු වැනි;

**පරශත්‍රු පීඩාවක්** ($2^{20}$) = පරසතුරු උවදුරක්;

**පරාපවාදයෙක්** ($103^{17}$) = අනුන් කරණ දොෂාරොපණයෙක්;

**පරාමර්ශනය** ($147^{25}$) = ස්පර්ශ කිරීම;

**පරාංමුඛවීම නම** ($266^{3}$) = අහක බලා ගතිම නම්;

**පරික්ෂෙප** ($416^{8}$) = වටකිරීම;

**පරිචාරක** ($299^{18}$) = පිරිවරා හැසිරෙණ මෙහෙකාර;

**පරිඥත** ( — ) = හොඳින් දන්නා ලද;

**පරිඤ්ඤෙය්‍යා** ($80^{8}$) = පිරිසිඳ දත යුතු;

**පරිත්ත අප්ප ලොක** ($440^{39}$) = ඉතා මඳ;

**පරිදහ** ($498^{19}$) = දූවිල්ල;

**පරිපාකය** ($52^{14}$) = මෙරීම, සම්පූර්ණ වීම;

**පරිභව** ($12^{12}$) = නින්දා;

**පරිභූත වන්නේ ය** ($308^{31}$) = පරිභව කරණ ලද්දෙක් වන්නේය;

**පරිභොග** ($25^{1}$) = අනුභවය, පාවිච්චිය;

**පරිමර්දන** ($328^{6}$) = පිරිමැදීම;

**පරියායවචන** ($100^{10}$) = සමානාර්ථ ඇති වචනය;

Non-Commercial Distribution

**පරිවර්තනය** ($146^{23}$) = පෙරළීම;

**පරිළාභ** ($115^{20}$) = දැවීම;

**පරිහරණය** ($85^{31}$) = පවත්වාගැණීම;

**පර්ණශාලා ප්‍රවෙශය** ($264^{6}$) = පන්සලට පිවිසීම;

**පර්ණාකාර** ($422^{9}$) = පඬුරු;

**පර්‍ය්‍යන්ත** ($173^{29}$) = කෙළවර;

**පර්‍ය්‍යාය වචන** ($220^{19}$) = සමාන අර්ථ ඇති වචන;

**පර්වතශිඛර** — ) = කඳු මුදුන;

**පලාලපුංජය** ($519^{21}$) = පිදුරු කැටිය;

**පලුග්ග** ($293^{26}$) = ළවසෙසින්, බිඳීගිය;

**පවිවිත්ත** ( — ) = අතිශය විවෙකයෙන් යුත්;

**පසළොස්චරණ ධර්මයන්** ($29^{19}$) = උත්තම ශීලය; ඉන්ද්‍රිය සංවරය, භොජනමාත්‍රඥත්වය, නිද්‍රා වර්ජනය, ශ්‍රද්ධාව, හ්‍රීය, අපත්‍රපාව, බහුශ්‍රැතත්වය, පරාක්‍රමය, ස්මෘතිය, ප්‍රඥාව, ධ්‍යාන සතර යන ධර්ම පසළොස;

**පසුඝාතන ගල රුධිර** ($296^{36}$) = සිවුපාවුන් නැසීමෙන් උන්ගේ ගෙලේ ලේ;

**පස්කඳ** ($31^{15}$) = රූප, වෙදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පස;

**පස්පලවතින්** ($37^{14}$) = බුලත් විටට ගන්නා කපුරු, තකුල්, නාරං පොතු, ලමහ, (කරාබු නැටි) ඉඟුරු යන ද්‍රව්‍ය පසින්;

**පස්මරුන්** (—) = පඤ්චමාරයන්, බන්ධ – ක්ලේශ – අභිසංඛාර මච්චු. දෙවපුත්ත යන මොහු පඤ්චමාරයෝ ය;

**පස්මුල්** ($50^{31}$) = බෙලි, මිදි, තොට්ල, පළොල්, ඇද්දෙමට යන මුල් පස හෝ එලබටු, කටුවැල්බටු, අස්වැන්න, පුස්-වැන්න, ගොකටු යන මුල් වර්ග පස;

**පස්විකා** ($313^{16}$) = ප්‍රත්‍යවෙක්ෂා කොට (ප්‍රයොජනය නුවණින් සලකා);

**පළිබොධ** ($14^{33}$) = උවදුරු, හිරිහැර;

**පළිරොධ විරහිත** ($544^{26}$) = කරදර නැති.

**පාංශු විරහිත** ($542^{1}$) = පස් නැති;

**පාණිප්‍රහාරයෙහි** ($250^{14}$) = අතින් පහර දීමෙහි;

**පානීයාහරණ** ($444^{7}$) = පැන් එළවීම;

**පාබල සෙනාව** ($41^{8}$) = අශ්වාදීන් පිට නො නැඟී යුද භට සේනාව;

**පාරිහට්ටකතාවෙන්** ($520^{19}$) = දරුවන් නැලවීම ආදි මෙහෙ කිරීමෙන්;

**පාරිභොගික** ($114^{3}$) = පරිභොගයට (පාවිච්චියට) අයත්;

**පාවුස්සික** ($136^{3}$) = වර්ෂා කාලයට අයත්;

**පාෂාණවර්ෂා** ($436^{30}$) = ගල් වැසි;

**පාසය** ($186^{35}$) = මලපුඩුව;

**පැපත නගා** ($282^{31}$) = පැහැ ගන්වා (ලක්ෂණ කොට);

**පිටඅටුව** ($509^{11}$) = හේත්තුවන ලෑල්ල;

**පිටකත්‍රයධාරි** ($4^{24}$) = සූත්‍ර-අභිධර්ම-විනය යන පිටකත්‍රය දරණ;

**පිටිතොල හයා** ($218^{20}$) = අත් පිටු පස තබා;

**පියුම්සර** ($393^{29}$) = පියුම්විල්හි

Non-Commercial Distribution

පිරිවහාපියන්නට $(16^{30})$ = කට පාඩමින් කියන්නට;
පිහිත $(245^{24})$ = වසන ලද;
පිළිසඳර කථා $(30^{6})$ = සතුටු සාමීචි කථාව;
පිළිසරණ $(75^{28})$ = පිහිට;
පිළිකට්ටු $(37^{16})$ = රෙදි පොදිය;
පියසප්පි $(277^{26})$ = පිලා, අත් පා කොරා;
පිණනය $(424^{8})$ = පිණවීම;
පුක්කුසයෝ $(8^{5})$ = මලමූත්‍රාදි අශුචි බැහැර දමන්නෝ;
පුරාණදුතියිකා $(149^{7})$ = පරණ භාර්යාව;
පුරුෂකාර $(114^{18})$ = පුරුෂ වීර්යයෙන් කට යුතු ක්‍රියාව;
පුලවරාගින්ගේ $(501^{36})$ = පණු කැලන්ගෙන්;
පූර්වකුශල කර්මය $(4^{35})$ = අතීත අත්බැව්හි කළ පින්කම;
පූර්වකෘතපුණ්‍යතාවකින් $(438^{33})$ = පෙර කළ පින් ඇති බවකින්;
පූර්වජිනානුශාසනා ප්‍රවෙණි වංශය $(303^{20})$ = පෙර බුදුවරයන්ගේ අනුශාසනා පිළිවෙළ;
පූර්වභාග ප්‍රතිපදව $(494^{31})$ = මුල් ප්‍රතිපත්තිය;
පූර්වයොගය $(5^{2})$ = පළමු යෙදීම;
පූර්වවාසනා බලයෙන් $(14^{8})$ = පෙර පුරුදු බෙලෙන්;
පූර්වලිඛිත $(93^{3})$ = පෙර ලියන ලද;
පූර්වාචාර්යයන් $(29^{27})$ = පෙර සිටි ආචාර්යවරයන්;
පූර්වනුශාසනාප්‍රවෙණි වංශය $(303^{18})$ = පරම්පරාගත පැරැණි අනුශාසනා;
පූර්වාහ්නසමයෙහි $(19^{29})$ = පෙරවරු කාලයෙහි;
පූර්වෙනිවාසානුස්මෘතිඥනය $(286^{13})$ = පෙර විසූ කඳ පිළිවෙළ සිහි කිරීමේ නුවණ;
පෘච්ඡාවිසර්ජනද්වයයෙන් $(2^{8})$ = ප්‍රශ්න - විසඳීම් දෙකින්;
පෘථිවීචලනය $(135^{2})$ = පොළොව සෙලවීම;
පෘථිවී ප්‍රදලනය කොට $(335^{24})$ = පොළොව පලා ගෙණ;
පාංශුලාංගණ $(460^{33})$ = පළල් මිදුල්;
පෙණාහිකාවගේ $(569^{8})$ = කැඳැත්තාගේ;
පෙයා $(442^{26})$ = පිය යුතු;
පෙසකාර ධීතු $(492^{31})$ = පෙහෙර දුව (රෙදි වියන්නාගේ දුව);
පෙහෙරුන් $(327^{12})$ = රෙදි වියන්නන්;
පෙළාන්තරගත $(28^{28})$ = පෙට්ටිය ඇතුළට ගිය;
පොකුරු පතකින් $(389^{27})$ = නෙළුම් කොළයකින්;
පොත්ථකනිබන්ධ $(91^{18})$ = පොත්හි ලියා තැබීම;
පොථනය කරන්නේ ය $(392^{20})$ = තළන්නේ ය;
පොථිත $(243^{16})$ = තලන ලද;
පොරොත්තු $(21^{5})$ = නැවැත්වීම;
පෞර්ණමී $(378^{27})$ = පසළොස්වක;
ප්‍රග්‍රහණය $(588^{32})$ = එසවීම;
ප්‍රචණ්ඩ $(350^{31})$ = ඉතා සැඩ;
ප්‍රජා $(304^{12})$ = සත්වයා;
ප්‍රඥප්ති ව්‍යවහාරය $(30^{15})$ = පැණවීම් වචනය, නාමය;
ප්‍රඥනෙත්‍රය $(257^{2})$ = නුවණ නමැති ඇස;
ප්‍රඥවිචයබොධ්‍යංගය $(97^{7})$ = ප්‍රඥව රැස් කරණ ධම්මවිචය නම් බොධ්‍යංගය;
ප්‍රණිධි $(474^{22})$ = ප්‍රාර්ථනාව;

Non-Commercial Distribution

ප්‍රතිකූල්‍ය (432[8]) = පිළිකුල් කටයුතු;
ප්‍රතිකූලකාරී (495[10]) = විරුද්ධ ක්‍රියා කරණ;
ප්‍රතිඝයෙන් (558[1]) = ද්වේෂයෙන්;
ප්‍රතිච්ඡන්න (108[4]) = වැසුනු;
ප්‍රතිපක්ෂ පසමිතුරන් (2[20]) = විරුද්ධකාරයන්;
ප්‍රතිබාල්හතාවෙනුත් (429[31]) = විරුද්ධතාවෙනුත්;
ප්‍රතිබාහනය (94[37]) = වැළැක්වීම;
ප්‍රතිමණ්ඩිත (312[1]) = යුක්ත;
ප්‍රතිවචන (445[28]) = පිළිතුරු;
ප්‍රතිවිභක්තභොගිතාවෙන් (525[5]) = බෙදා වැළඳීමෙන්;
ප්‍රතිවේධය (484[27]) = අවබොධය;
ප්‍රතිවේධ ධර්මයන් (191[12]) = අවබොධ වූ ධර්මයන්;
ප්‍රතිශත්‍රූන් (500[5]) = සතුරන්;
ප්‍රතිෂ්ඨා (115[2]) = පිහිට, උපකාරය;
ප්‍රතිෂ්ඨාන (39[19]) = පිහිටීම;
ප්‍රතිසන්ධි විඥාන චිත්තය (552[4]) = උත්පත්තිය සිදු කරණ සිත;
ප්‍රතීත්‍යසමුත්පාද චක්‍රය (60[18]) = රෝදයක් වැනි වූ සංස්කාරාදි ඵලයන් උපදවන අවිද්‍යාදි හෙතු රාශිය;
ප්‍රත්‍යන්ත (7[29]) = පිටිසර;
ප්‍රත්‍යවෙක්ෂා (20[13]) = කල්පනා කිරීම;
ප්‍රත්‍යුත්ථානයෙන් (444[6]) = ගෞරව පිණිස ආසනයෙන් නැගී සිටීමෙන්;
ප්‍රත්‍යෙකබොධි (133[7]) = පසේ බුදු වීම;
ප්‍රථම බොධිමූලයෙහි (113[15]) = බුදු වීමෙන් පසු පළමු එක්විසි අවුරුදු කාලයෙහි;
ප්‍රදලනය (2[11]) = පැළීම, දුරු කිරීම;
ප්‍රබන්ධොත්පත්ති (553[33]) = පරම්පරා වශයෙන් ඉපැත්ම;
ප්‍රභෘති (318[6]) = ආදී;
ප්‍රමුදිතජනක වන්නාහ (348[16]) = සතුට උපදවන්නාහ;
ප්‍රයොග හීන (414[11]) = උත්සාහ රහිත;
ප්‍රවරගණින්ද්‍රභූත වූ (217[3]) = උතුම් සමූහයකට ස්වාමී වූ;
ප්‍රවරඤාණපජ්ජොතය (148[18]) = උතුම් නුවණ නමැති පහන;
ප්‍රශස්‍යතර වූ (329[7]) = අතිශයින් ප්‍රශංසා කට යුතු;
ප්‍රස්‍රවණ වන්නේ ය ( — ) = වැස්සෙන්නේ ය;
ප්‍රහාණය (94[10]) = දුරු කිරීම;
ප්‍රාණජීවය (65[26]) = ප්‍රාණ නමැති ජීවය;
ප්‍රාතිමොක්ෂ ශීලස්කන්ධය (40[21]) = භික්ෂූන්ගේ හික්මීමට පැණවූ ශික්ෂාපද රැකීමෙන් වන ශීල සමූහය;
ප්‍රාතිහාර්‍ය (437[32]) = පෙළහර;
ප්‍රාන්තසෙනාසනය (519[27]) = වනයෙහි ඉතා ඈත සෙනසුන;
ප්‍රාර්ථනීය (3[8]) = පැතිය යුතු;
ප්‍රාර්ථිත වූ (335[35]) = ප්‍රාර්ථනා කරණ ලද;
ප්‍රාසාදහිරුළු ව (410[14]) = පහයට නැඟී;
ප්‍රාසාදික (256[12]) = පැහැදීම;
ප්‍රීතිජනනය (450[19]) = ප්‍රීතිය ඉපදවීම;
ඵනින්ද්‍රග්‍රහණයට (593[21]) = නාගරාජයා ගැණීමට;
ඵලපිණ්ඩයෙක් (361[34]) = ගෙඩියක්;
ඵලසමංගියෝ ය (480[3]) = ඵලයෙන් යුක්තයෝ ය;

Non-Commercial Distribution

**එලාපණකයෝ** (484[33]) = පලතුරු වෙළෙන්දෝ;

**ඵේණමාලාකුල** (357[35]) = පෙණ සමූහයෙන් අවුල්;

**බධිරයෙකු** (517[29]) = බිරෙකු;

**බලිවර්දයන්ගේ** (313[19]) = ගවයන්ගේ;

**බලිසයෙන්** (582[19]) = බිළියෙන්;

**බලිසයනය** (47[7]) = උඩුකුරු ව නිද ගැණීම;

**බහුලීකෘත** (256[2]) = බහුල වශයෙන් කළ;

**බහුශ්‍රැතයන්** (2[19]) = බොහෝ ඇසූ පිරූ තැන් ඇති අය, උගතුන්;

**බාළිසික තෙම** (582[19]) = බිලි බාන්නා;

**බාහිත** (287[14]) = බැහැර කළ;

**බිම්බොහන** (249[22]) = කොට්ට;

**බිළාරයා ගේ** (551[8]) = බළලාගේ;

**බීජගාම** (39[24]) = පැළවන ඇට ආදී දේ;

**බුදනු සිහි** (93[19]) = බුදුගුණ නැවත නැවත සලකන සිහිය;

**බුද්ධකෘත්‍යයන්** (1[6]) = බුදුකෙනෙකුන් විසින් කළ යුතු වැඩ;

**බුද්ධගතාසතිය** (93[18]) = බුද්ධගුණ නැවත නැවත සලකන සිහිය;

**බුද්ධාන්තරයක්** (6[3]) = බුදුවරුන් දෙනමක් අතර කාලයක්;

**බොජ්ඣංග** (39[20]) = බෝධි නම් වූ මාර්ගඥානයන්ට කාරණාව සිටින සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන ධර්ම සමූහය;

**බෝධ්‍යංගය** (547[3]) = බොජ්ඣංග ධර්ම;

**බ්‍යාමප්‍රභාව** (87[19]) = බුදුරදුන් අවට විහිදෙන බඹයක් පමණ ආලෝකය;

**බ්‍රහ්මලොකූපගත වූ සේක** (298[1]) = බඹලොව උපන් සේක;

**බ්‍රාහ්මණ වර්ණයෙන්** (393[14]) = බමුණු වෙසින්;

**භක්තකෘත්‍යය** (13[14]) = බත්කිස, අහර වැළඳීම;

**භක්ෂ්‍යාභක්ෂ්‍ය** (518[16]) = කෑ යුතු නො කෑ යුතු;

**භංගාභිමුඛාවස්ථාව** (553[35]) = බිඳීමට එළඹුණු අවස්ථාව;

**භජනය** (43[31]) = සෙවනය කිරීම;

**භණ්ඩණ කලහ විග්‍රහ** (538[38]) = දබර, කෝලාහල;

**භය සන්ත්‍රාස** (279[31]) = බිය තැතිගැණුම්

**භවත්‍රයෙහි** (336[4]) = කාම, රූප, අරූප යන තුන් භවයෙහි;

**භවාග්‍රය** (487[4]) = භවයේ කෙළවර (නෙවසඤ්ඤානාසඤ්ඤායතනය);

**භාගිනෙය්‍ය** (275[35]) = බෑනා;

**භාගී** (512[9]) = කොටස් කරුවෙක්;

**භාරිත වූ** (440[27]) = භාර ඇති;

**භාවිත** (44[14]) = වැඩූ;

**භාවිතාවක්** (350[3]) = දියුණු කිරීමක් (පුරුදු කිරීමක්);

**භාස්කර** (593[8]) = සූර්යයා;

**භික්ෂාටනය** (285[2]) = පිඬු පිණිස හැසිරීම;

**භින්න ජීවක සංඛ්‍යාවට** (307[32]) = බිඳින ලද ද්වි පැවතුම් ඇත්තෙක යන ගණනට;

**භූතගාම** (39[26]) = ගස්වැල් ආදිය;

**භෙරිමුඛ** (358[36]) = බෙර ඇහැ;

**භෛෂජ්‍යය** (448[1]) = බෙහෙත;

**භෛෂජ්‍යක්‍රියා** (289[8]) = බෙහෙත් කිරීම;

**භෛෂජ්‍යානුලිම්පන** (496[18]) = බෙහෙත් ගැල්වීම;

Non-Commercial Distribution

**භොගව්‍යසන** (254[14]) = සම්පත් නැසීම;

**භොජනීය** (89[16]) = අනුභව කටයුතු;

**භ්‍රමණ කණ්ටකයෙන්** (339[26]) = බුරුම කටුවෙන්;

**භ්‍රාතෘන්** (268[30]) = සහොදරයන්;

**භ්‍රාන්ත** (296[25]) = භ්‍රමණය වූ (එක් අරමුණක නො පවත්නා);

**භ්‍රූයුග්මය** (153[33]) = දෙ බැම;

**මච්ඡවිලොපනයෙහි** (240[32]) = මසුන් ඇල්ලීමෙහි;

**මණ්ඩලමාලක** (20[15]) = මණ්ඩලාකාර වූ ධර්මශාලාව;

**මධුපටලයක්** (274[1]) = මීවදයක්;

**මධුඵාණිතාදියෙන්** ( — ) = මීපැණි – උක්සකුරු ආදියෙන්;

**මධුරධ්වනි මෘදංග** (410[18]) = මිහිරි හඬ ඇති මිහිඟු බෙර;

**මධුර ස්වර ගර්ජනා** (26[31]) = මිහිරි හඬින් කරණ ඝොෂාව;

**මනස් සමාචාරය** (495[2]) = සිතේ හැසිරීම;

**මනාපික** (545[3]) = මන වඩන;

**මනුෂ්‍යලොකොත්පත්තිය** (10[17]) = මිනිස්ලොවෙහි ඉපදීම;

**මනොප්‍රණිධානය** (335[13]) = සිතින් ප්‍රාර්ථනා තැබීම;

**මනොනන්දනීය** (72[34]) = සිත සතුටු කිරීමට සමර්ථ;

**මනොවිඤ්ඤාණය** (66[15]) = ද්වි පඤ්ච විඤ්ඥාණය හා මනො ධාතු ත්‍රිකය ද හැර ඉතිරි සිත් හැත්තෑ හය හෝ එකසිය අට;

**මන්ත්‍රයන්** (13[28]) = ශාස්ත්‍ර, විද්‍යා;

**මහාභොගීහ** (75[5]) = මහත් වූ භොග ඇත්තෝ ය;

**මන්දයුෂ්කයෝ** (75[1]) = අඩු ආයුෂ ඇත්තෝ;

**මයූර පිඤ්ජයක්** (311[35]) = මොනර පිල් කලඹක්;

**මරණ පරායණ ව** (260[15]) = මරණය පිහිට කොට;

**මරණාන්තිම** (57[7]) = මරණය කෙළවර කොට ඇති;

**මර මරා** (393[37]) = තළ තළා;

**මර්කටයාගේ** (525[11]) = වඳුරාගේ;

**මල්දරා** (337[22]) = මල් දහර (මල් වැසි);

**මසලු** (419[28]) = මාසයෙන්, කපන;

**මහ කරුණා සමාපත්ති ඥාණය** (125[9]) = මහා කරුණාව අරමුණු කොට ඉපැදවූ ධ්‍යානයට පැමිණීම;

**මහාඝනශෛලපර්වතය** (541[31]) = තනි ගල් කන්ද;

**මහා චතුෂ්පද ඝාතක වූ ආශී විෂයකු** (296[25]) = සිවුපාවුන් නසන මහා සර්පයකු;

**මහානාගයෝ** (104[32]) = මහා ශ්‍රෙෂ්ඨයෝ (මෙහි නාග ශබ්දය ශ්‍රෙෂ්ඨාර්ථයෙහි ය);

**මහාපුණ්‍ය භක්ත පරිවෙශනයකට** (343[15]) = පිණට බත් කෑ හැකි තැනකට (මහ දන්සැලකට);

**මහාපුෂ්කරණියට** (565[31]) = මහා පොකුණට;

**මහාවහ්නිස්කන්ධය** (144[31]) = මහ ගිනිකඳ;

**මහාවිතර්කසම්ප්‍රහාරයෙහි** (529[29]) = මහ විතර්කයන්ගේ යුද්ධයෙහි;

**මහ සාර්ථවාහ සෙනාව** (493[35]) = මහත් තවලම් පිරිස;

**මහෙශාඛ්‍ය** (5[22]) = ශ්‍රෙෂ්ඨ;

**මහොදරය** (387[26]) = මහබඩ;

**මාගවිකයාගේ** (581[25]) = මුව වැද්දගේ;

*Non-Commercial Distribution*

**මාතෘඝාතක** (439[14]) = මව මැරූ තැනැත්තා;
**මාත්‍රඥතාවය** (495[7]) = පමණ දන්නා බව;
**මාත්සර්ය** (533[36]) = මසුරු;
**මානකූට** (402[17]) = හොර මිනුම්;
**මාතිකා** (423[13]) = ඇළ (කාණුව);
**මාරවාරණ කෙශරීන්ද්‍රභූත වූ** (216[27]) = මාර නමැති ඇතුට කෙශර සිංහයෙක් වූ;
**මාමිනිශාස්ත්‍රකාරයා** (532[19]) = නැව් පැදවීමේ ශාස්ත්‍රය දන්නා;
**මිත්‍ර සන්ථව** (541[17]) = මිතුරන් හා එක්වීම;
**මිථ්‍යාප්‍රතිපන්න** (203[8]) = වැරැදි සේ පිළිපන්;
**මිද්ධය** (557[1]) = චෛතසික යන්ගේ මැලි ගතිය;
**මිනිස්පථය** (270[10]) = මිනිසුන් වසන පෙදෙස;
**මිහිමඩල** (—) = පොළොව;
**මුක්ත කෙශී** (410[28]) = මිදූ කෙස් ඇති;
**මුග්ගසූපාතාවෙන්** (520[17]) = මුං ඇට ව්‍යඤ්ජනය සේ සැබෑ - බොරු මුසු කථාවෙන්;
**මුඤ්චනයෙන්** (3[30]) = මිදීමෙන්;
**මුට්ඨස්සතිය** (471[25]) = මුළා සිහිය;
**මුණ්ඩක වාදයෙන්** (298[14]) = හිස මුඩුකළ තැනැත්තා ය යන කථාවෙන්;
**මූර්ඡිත ව** (256[17]) = සිහි මුළාව;
**මූලබීජ** (501[11]) = පැළවීමේ ශක්තිය ඇති අල හා මුල්;
**මූලොච්ඡින්න** (280[30]) = මුලින් ම සිඳින ලද;
**මෘත්‍යුයෙහි** (435[7]) = මරණයෙහි;
**මෘදංගාදි** (554[16]) = මිහිඟුබෙර ආදී;
**මෘදුක** (505[9]) = මෘදු වූ, තද නො වූ;
**මෙණ්ඩකයා** (69[36]) = බැටළුවා;
**මෙර සා** (480[26]) = මේරු පර්වතය පමණ;
**මෛත්‍රීසමංගී** (256[9]) = මෛත්‍රියෙන් යුත්;
**මොඝපුරුෂ** (217[12]) = හිස් පුරුෂයා;
**මොහනීයයෙහි** (440[6]) = මුළාව ඇති කරණ දෙයෙහි;
**මොහාන්ධකාරය** (2[1]) = මෝඩකම නමැති අඳුර;
**මෝචිට** (337[28]) = ගැටිය;
**යගුළිය** (454[23]) = යකඩ ගුළිය;
**යථාශක්තීන්** (26[30]) = ශක්තිය ඇති පරිද්දෙන්;
**යථාස්ථානයට** (332[20]) = නිසිතැනට;
**යන්ත්‍රමාරුවකින්** (166[21]) = යන්ත්‍රයෙහි වාරුව හෝ උපකරණයකින්;
**යමකප්‍රාතිහාර්යය** (126[27]) = බුදුරජානන් වහන්සේ විසින් දක්වූ ශරීරයෙහි එක් එක් රොමයකින් ගිනි කඳක් හා දිය කඳක් ද එකවර නිකුත්වන සේ පෙණුනු මහාප්‍රාතිහාර්යය;
**යවලාවකයන්** (39[1]) = යව කපන්නන්;
**යාවයොගී** (287[15]) = ත්‍යාගශීලී;
**යුගග්‍රාහලක්ෂණ** (533[35]) = එකට එක කිරීම හෝ කීම ලක්ෂණ කොට ඇති;
**යුද්ධමුණුවල්** (347[9]) = යුද පෙරමුණු;
**යොගාවචර** (39[8]) = භාවනාවෙහි යෙදුනු තැනැත්තේ;
**යොනකසුබුම්මාලිනී** (78[17]) = යොනක දෙශවාසී සියුමැලි කාන්තාව;
**යොනිසොමනස්කාරය** (38[25]) = නුවණින් මෙනෙහි කිරීම;

*Non-Commercial Distribution*

**රක්තකම්බිලිය** (21$^{38}$) = රතු ලොම්මය වස්ත්‍රය;
**රක්තචන්දනසාරාන්තරයෙහි** (348$^{24}$) රත්හඳුන් අරටුව තුළ;
**රක්තපායා** (572$^{21}$) = පූඩාවා (කුඩැල්ලා);
**රජනිය** (440$^{5}$) = ඇලුම් කටයුතු;
**රජස් මල කර්දම** (342$^{3}$) = දූවිලි-අසුචි-මඩ;
**රජොජල්ලයන්** (344$^{12}$) = දූවිලි හා දූලි;
**රතනුප්පාදනයෙන්** (500$^{9}$) = රුවන් ඉපදවීමෙන්;
**රථපඤ්ජරය** (31$^{36}$) = රියමැදිරිය;
**රන්ඉද්ද** (385$^{36}$) = රනින් කළ කූර;
**රන්ධ්‍ර කොට** (480$^{23}$) =සිදුරු කොට;
**රන්බාපත** (336$^{6}$) = රනින් කළ බාපත, (බාපත නම් උළුවස්සේ උඩ හරස් ලිය යි);
**රන්නිෂ්කදහයක්** (390$^{20}$) = රන් කාසි දහසක්;
**රසකාරක** (315$^{28}$) = අරක්කැමි;
**රාජකෘත්‍යසංවිධානයෙහි** (3$^{33}$) = රාජකාර්යයන් පිළියෙළ කිරීමෙහි;
**රාජසුඛමාල** (31$^{25}$) = රජ හෙයින් සියුමැලි;
**රාජූපජීවික** (318$^{6}$) = රජු වෙත ජීවත්වන;
**රාත්‍ර්‍යවශෙෂය** (104$^{16}$) = රාත්‍රිය පිළිබඳ ඉතුරු කොටස;
**රුහැණි ව** (386$^{24}$) = කිපී;
**රිදීසංඛයෙන්** (503$^{6}$) = රිදීයෙන් කළ හක්ගෙඩියෙන්;
**රුප්පණාර්ථයෙන්** (553$^{36}$) = වෙනස්වන (නැසෙන) අරුතින්;
**රූක්ෂ** (562$^{1}$) = රළු;
**රොගුප්පාදක** (222$^{2}$) = රොග උපදවන;
**රොපණය** (54$^{32}$) = වැවීම;
**ලක** (588$^{33}$) = ඉලක්කය;
**ලක්ෂණොපනිධ්‍යානාදි** (482$^{18}$) = අනිත්‍යත්වාදි ත්‍රිලක්ෂණයන් සල-කන විදර්ශනාභාවනාව ආදි;
**ලංඝනය** (98$^{18}$) = පැනීම;
**ලජ්ජාවිච්ඡෙදනී** (146$^{18}$) = ලැජ්ජාව සිඳ දමන්නී;
**ලජ්ජිපෙසල** (525$^{17}$) = ලජ්ජා ඇති, ප්‍රියශීලි, (සිල්වත්);
**ලතු** (47$^{18}$) = ලාකඩ;
**ලවණරස** (75$^{11}$) = ලුණුරස;
**ලහුකපරිවර්තන** (18$^{17}$) = සැහැල්ලු පැවැත්ම;
**ලාබුලතාවගේ** (526$^{4}$) = ලබුවැලේ;
**ලාභාග්‍ර යොශොග්‍ර ප්‍රාප්ත විය** (290$^{19}$) = ලාභයෙන් - යශසින්- අගතැන් පැමිණියේ විය;
**ලාමක** (191$^{13}$) = පහත්;
**ලාමකවිතර්ක** (494$^{18}$) = පහත් අදහස්;
**ලාස්ස** (121$^{11}$) = නැළි හතර;
**ලැවගින්නක්** (244$^{20}$) =වනයෙහි අතු ගැටීමෙන් හටගන්නා ගින්න;
**ලිංගඅන්තර්ධානය** (161$^{26}$) = ශ්‍රමණවෙශය අතුරුදහන් වීම;
**ලිංගත්ථෙන භාවයට** (363$^{25}$) = මහණවෙස සොරකම් කළ බවට;
**ලිප්ත** (497$^{27}$) = ආලේප කළ;
**ලුග්ග** (293$^{26}$) = නැසුනේ;
**ලුඤ්චනය** (326$^{29}$) = සිඳීම;
**ලුද්ධතර** (176$^{8}$) = ඉතා ලොභි වූ;
**ලූලීන** (358$^{15}$) = සැලඹුනේ;
**ලූඛචීවරයෝ** (481$^{8}$) = රළු සිවුරු;
**ලෙඛනීය වූ බෙහෙත්** (218$^{33}$) = දෙස් සිඳීමට සුදුසු බෙහෙත්;
**ලෙඩ්ඩු** (352$^{21}$) = ගල්කැට;
**ලෙය්‍ය** (442$^{26}$) = ලෙවිය යුතු;

Non-Commercial Distribution

**ලොකපාලයන්** (27$^{22}$) = ලොව රකින්නන්;

**ලොකාන්තරික මහා නරක** (335$^{27}$) = ලොක තුනක් අතර ඇති නරකය;

**ලොකාමිය** (53$^{31}$) = පස්කම් සැප;

**ලොකායත මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රය** (13$^{37}$) = ලොකයෙහි පැතිර ගිය විතණ්ඩ ශාස්ත්‍රය හා මහා පුරුෂ ලක්ෂණ ප්‍රකාශක ශාස්ත්‍රය, ස්වමතය ඔප්පු කිරීමෙන් පමණක් පරමත ඛණ්ඩණය උගන්වන ශාස්ත්‍රය හා උච්ඡෙදවාදය ද ලොකායතන ශාස්ත්‍ර නම් වේ.

**ලොකුත්තර** (100$^{11}$) = ලෙව එතර කරණ හෝ ලොවින් එතර වූ;

**ලොමහර්ෂණය** (2$^{5}$) = ලොමු දහගැණීම, ලොම් කෙළින් සිටීම;

**ලොහිතචන්දන** (450$^{33}$) = රත්හඳුන්;

**ලොහිතපක්ඛන්දිකා** (164$^{18}$) = ලේ අතීසාරය;

**ලොහිතුප්පාදක** (439$^{15}$) = බුදුන්ගේ ශරීරයෙන් ලේ නික්මවන්නා;

**වකුල** (489$^{6}$) = මූනමල්;

**වග්ගුලියාගේ** (571$^{27}$) = වවුලාගේ;

**වජ්‍රොපම** (53$^{16}$) = වජ්‍රයකට දියමන්තියකට සම න උපම ඇති;

**වඤ්චාප්‍රවෘත්ති** (534$^{1}$) = රැවටිලි පැවතුම්;

**වට්ටංගුලාදි** (311$^{39}$) = වට ඇඟිලි ආදී;

**වට්ටනාවලිය** (339$^{18}$) = ගුළි මාලය, නවගුණවැල;

**වඩබාග්නිය** (99$^{36}$) = මුහුදෙහි ඇතැයි සැලකෙන වෙළඹකගේ මුඛය වැනි ගිනිදළව;

**වණ්ණච්ඡවි** (418$^{14}$) = තුවාලයේ සිවිය (හම);

**වණපොත්** (16$^{26}$) = කටපාඩම්;

**වතිප්‍රකාර** (361$^{29}$) = වැට පවුරු;

**වධ්‍යයා** (420$^{28}$) = වධ කට යුත්තා (දඬුවම් දියයුත්තා);

**වනෂණ්ඩය** (540$^{26}$) = වනලැහැබ;

**වප්‍රට** (312$^{21}$) = වපුරා;

**වරප්‍රවරානර්ඝ** (484$^{23}$) = ඉතා වටිනා;

**වරභවන ඝනසහස්‍රයෙන්** (2$^{27}$) = උතුම් ප්‍රාසාද ලක්ෂ ගණනින්;

**වර්ණ පාදබන්ධන** (229$^{18}$) = අකුරු හා පද බැඳුම්;

**වශිප්‍රාප්ත වූ** (198$^{10}$) = යටතට පැමිණි;

**වශීභාවප්‍රාප්ත** (286$^{15}$) = වසඟ බවට පැමිණි;

**වස්තුපුටයන්** (3$^{17}$) = බඩුපොදි;

**වස්ත්‍ර ගුහ්‍යය** (211$^{23}$) = රහසඟ;

**වස්සිකා** (347$^{19}$) = සමන්මල්;

**වහ්නිසන්තාප** (357$^{9}$) = ගින්නෙන් තැවීම;

**වාක් ප්‍රණිධානය** (335$^{14}$) = වචනයෙන් ප්‍රාර්ථනාව තැබීම;

**වාග්භෙදය කර** (309$^{20}$) = වචනය බිඳ (වචනයෙන් කියා);

**වාචුග්ගත** (13$^{31}$) = කටපාඩම් කිරීම;

**වාතපානය** (64$^{12}$) = කවුළුව;

**වාතසමුට්ඨාන** (164$^{34}$) = වාතයෙන් හට ගැණීම ඇති;

**වාතාතප** (357$^{13}$) = (වාත ආතප) සුළං අවු;

**වාදමර්දනය** (490$^{11}$) = වාද මැඩීම;

**වාමග්‍රාහී** (423$^{7}$) = වරදවාගත්තෝ (අනාදරයෙන් ගත්තෝ);

**වාරණ තුරඟ** (572$^{12}$) = ඇත් අස්;

**වාලරජ්ජුව** (206$^{2}$) = ලොම් රැහැන;

**වාලවෙධිරූපීන්** (256$^{33}$) = රොමයන් දෙපළු වන සේ විදීමෙහි දක්ෂයන්;

**වාස්තුවිද්‍යාවෙන්** (520$^{25}$) = ගෙබිම් ශාස්ත්‍රයෙන්;

Non-Commercial Distribution

**වැසිසළු සිවුරක්** (326[15]) = වැසි කාලයෙහි ප්‍රයොජන ගණු ලබන වස්සික සාටිකා සිවුරක්;

**වැහැටි සිවුර** (259[11]) = රුක් පට්ටාවලින් කළ සිවුර;

**විකිරෙන්නේය** (323[20]) = විසිරෙන්නේ ය;

**විකුණ ගන්නා** (408[9]) = මිලදීගන්නා;

**විකොපනය** (367[6]) = කැඩීම, බිඳීම;

**වික්ෂිප්ත** (296[23]) = විසුරුණු;

**විචාරය** (72[25]) = චිත්තචෛතසික යන් අරමුණෙහි හසුරු වන චිත්තගතිය;

**විචිත්‍රවිතාන** (413[7]) = විසිතුරු වියන්;

**විජයධවජය** (512[32]) = ජයකෙ ඩිය;

**විජානන** ( — ) = දැන ගැණීම;

**විජිනිපත්‍රය** (—) = පවන් අත්ත;

**විජ්ජුල්ලතාවෙන්** (26[32]) = විදුලියෙන්;

**විඤ්ඤත්තියට** (306[17]) = (වචනයෙන්) හැඟවීමට, ඉල්ලීමට;

**විතර්කය** (72[18]) = චිත්තචෛතසික ධර්මයන් අරමුණට නංවන චිත්ත ගතිය;

**විදර්ශනා** (20[13]) = ලොකය අනිත්‍ය-දුඃඛ-අනාත්ම වශයෙන් සැලකීම;

**විදුරෙන්** (485[31]) = දියමන්තියෙන්;

**විද්වජ්ජන වූ** (399[16]) = පණ්ඩිත වූ;

**විද්‍යාධර** (265[11]) = දෙව විශෙෂයක්;

**විද්‍යාධරයකු** (187[10]) = විද්‍යාබලයෙන් අහසින් ගමන් කරන්නෙකු;

**විධමනය** (323[20]) = නැසීම;

**විධූපන** (166[66]) = හතරැස් පවන්පත;

**විධ්වංසනය** (4[23]) = විනාශ කිරීම;

**විනයනය** (311[30]) = හික්මවීම;

**විනයභාව** (549[29]) = වෙන්වීම;

**විනිපාත** (71[21]) = අවසඟ ව වැටෙන දුක් බහුල තැන;

**විපරීත** (355[19]) = පෙරළුනු (වෙනස් වූ);

**විපාකූපභොගී** (368[12]) = විපාක විඳින;

**විපිළිසර** (424[39]) = පසුතැවිලි;

**විබුධ** (512[4]) = නුවණැති;

**විභජනය** (75[29]) = බෙදීම;

**විමල** (342[1]) = පිරිසිදු;

**විමලාතිප්‍රසන්න අනාවිල** (565[29]) = පිරිසිදු - පහන් - නොකැලඹුනු;

**විමුක්තික්‍රීඩාව** (565[33]) = කෙලෙසුන් ගෙන් මිදීම නමැති ක්‍රීඩාව;

**විමුක්ති ඥාන දර්ශන** ( — ) = ප්‍රත්‍යවෙක්ෂාඥානය;

**විමොක්ෂ වශයෙන්** (303[37]) = කෙලෙසුන් ගෙන් මිදීම වශයෙන්;

**විරමණයෙන්** (484[2]) = වෙන් වීමෙන්;

**විරූහණාර්ථයෙන්** (313[5]) = පැළවෙන අරුතින්;

**විලොකනය කෙරෙමින්** (335[21]) = බලමින්;

**විවරයකට** (184[27]) = සිදුරකට;

**විවික්ත වූ** (483[32]) = විවෙකී වූ;

**විශද** ( — ) = පිරිසිදු;

**විශුද්ධදෘෂ්ටිය** (559[15]) = පිරිසිදු දැකීම;

**විශුද්ධතර** (348[36]) = ඉතා පිරිසිදු;

**විශුද්ධශ්‍රද්ධාදෘෂ්ටි** (558[34]) = පිරිසිදු ශ්‍රද්ධාව හා දෘෂ්ටිය;

**විෂපීත** (259[4]) = විෂ පොවන ලද;

**විෂම චෙතනාවකින්** (295[12]) = වැරැදි අදහසකින්;

**විසංඥ ව** (396[2]) = සිහි නැති ව;

**විසභාග** (91[14]) = සමාන නො වූ, වෙනස්;

**විසිමුන්දෙක්** (311[11]) = මුදු විස්සක්;

**විස්තීර්ණ** (118[1]) = පැතුරුණු;

**විස්තාර** (401[29]) = පැතුරුණු;

**විස්ඵුරණයෙන්** (357[1]) = පැතිරීමෙන්;

Non-Commercial Distribution

**විස්සත්ථ ව** (592[3]) = විශ්වාසී ව, සැක නැති ව;
**වීර්‍යධ්වජ** (481[7]) = වීර්ය නමැති කොඩිය;
**වීර්ය ධුරධෞරය්හ** (313[23]) = වීර්ය නැමැති ධුරය උසුලන්නා;
**වීර්‍යසන්තාපාග්නි** (540[5]) = වීර්ය නමැති තවන ගිනි;
**වෘක්ෂාග්‍රයට** (266[2]) = ගස මුදුනට;
**වෘෂ්ටිය** (196[16]) = වැස්ස;
**වේදත්‍රය** (266[26]) = ඍච්-යජුෂ් සාමන් යන වේද තුණ;
**වෙමත්තතාව** (409[19]) = වෙනස් බව;
**වෛයාකරණ ෂළංගශාස්ත්‍ර** (321[22]) = ව්‍යාකරණ ඇතුළු ශාස්ත්‍රාංග සය, ව්‍යාකරණ-ශික්ෂා-කල්ප-නිරුක්ති ඡන්දස් - ජ්‍යොතිෂ් යන සය;
**ව්‍යතික්‍රමණය** (204[37]) = කැඩීම;
**ව්‍යවස්ථානය** (102[8]) = නියම කිරීම; පිරිසිඳීම,
**ව්‍යාඛ්‍යානයෙන්** (513[18]) = විස්තර කිරීමෙන්;
**ව්‍යාධිය** (51[1]) = රොගය;
**ව්‍යාපාද විතර්ක** (464[9]) = ක්‍රොධ සහගත කල්පනා;
**ව්‍යාපෘත** (485[18]) = යෙදුනු;
**ව්‍යාප්ත වූ** (264[1]) = පැතුරුණා වූ;
**ව්‍යායාමයෙන්** (62[18]) = උත්සාහයෙන්;
**ව්‍යාලමෘගනිසෙවිත** (523[1]) = නපුරු සතුන් විසින් ඇසුරු කළ;
**ශඨ** (279[16]) = කපටි;
**ශතපුණ්‍යාධරත්වාදි** (253[37]) = පින් ලකුණු සියයක් දැරීම් ආදි;
**ශත්‍රුමථනය** ( — ) = සතුරන් මැඩීම;
**ශමචර්යා** (24[6]) = කෙලෙස් සංසිඳවීම පිණිස වූ ධාර්මික පැවැත්ම;
**ශරීර පටිජග්ගනයෙහි** (315[37]) = ශරීර පොෂණයෙහි;
**ශරීරායාසයෙන්** (223[19]) = ශරීරයෙහි පීඩාවෙන්;
**ශස්ත්‍රයෙන්** (549[7]) = ආයුධයෙන්;
**ශස්ත්‍රවේගප්‍රතිපීඩිත වන ලද ව** (435[28]) = අවි පහරින් පෙළී;
**ශස්‍යොද්ධරණ** (436[39]) = උගුළන හෝ කපන;
**ශාර්දූලයා** (519[22]) = දිවියා;
**ශාලාවනොද්‍යානයෙහි** (1[8]) = සල් උයන්හි;
**ශාසනප්‍රතිරූප** (511[13]) = ශාසනයට ගැළපෙන;
**ශාසනානභිරති** (494[19]) = සස්නෙහි නො ඇල්ම;
**ශාසනායුඃප්‍රවේණිය** (161[30]) = ශාසනයාගේ ආයු පරම්පරාව;
**ශාශ්වත** (177[5]) = හැම කල්හි පවත්නා;
**ශික්ෂණය** (38[9]) = පුහුණු කිරීම;
**ශික්ෂාපදව්‍යතික්‍රමණය** (534[30]) = සික පද මැඩීම;
**ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කොට** (210[18]) = ශික්ෂා ප්‍රතික්ෂෙප කොට;
**ශිරොමස්තක** (437[28]) = හිස මත;
**ශීල ගොපනය** (383[32]) = සිල් රැකීම;
**ශීලභූෂණසාමිගණ** (544[11]) = සිල් බරණින් සැරසුනු සෑමි සමූහයා;
**ශුක්ලපක්ෂාභිවර්ධමාන** (380[35]) = පෙරපස වැඩෙන;
**ශුෂ්කවලාහක ගර්ජනා** (229[28]) = වැසි නැති ගෙරවුම් හඬ;
**ශුෂ්ක විදර්ශක** (367[15]) = හුදු විදර්ශනාව පමණක් උපදවා ක්ලේශක්ෂය කළ අභිඥාදිය නැති රහතන් වහන්සේ;
**ශුෂ්ක වූ** (574[26]) = වියළි;



Non-Commercial Distribution

**ශූන්‍ය** (—) = හිස්;

**ශූන්‍යාගාරයෙහි** (528$^{2}$) = හිස් ගෙහි;

**ශූන්‍යතා ප්‍රතිසංයුක්ත** (20$^{6}$) = හිස්බව පළ කෙරෙණ කථාවෙන් යුක්ත;

**ශෘංග** (36$^{35}$) = අඟ;

**ශෘංගිවෙර** (73$^{16}$) = ඉඟුරු;

**ශෛක්ෂ්‍යයෝ ය** (480$^{3}$) = රහතුන් වහන්සේ හැර සෙසු මග ඵල ලාභීහු හික්මෙන හෙයින් ශෛක්ෂයෝ ය;

**ශෝත්‍රය** (442$^{23}$) = කණ;

**ශෝභන** (83$^{29}$) = හොබනා, යහපත්;

**ශ්‍රමනකවාදයෙන්** (298$^{20}$) = නින්දිත ශ්‍රමණයා යන කථාවෙන්;

**ශ්‍රමණප්‍රතිපද වචනයෙක** (284$^{9}$) = පැවිද්දන්ගේ ප්‍රතිපත්තිය පැවසෙන වචනයෙකි;

**ශ්‍රමණසාරූප්‍ය** (284$^{10}$) = ශ්‍රමණයන්ට ගැළපෙන;

**ශ්‍රමණානුච්ඡවික** (—) = ශ්‍රමණයන්ට සුදුසු;

**ශ්‍රවණප්‍රගුණධාරණයෙන්** (4$^{25}$) = ඇසීම – පුහුණුකිරීම – දැරීම යන මෙයින්;

**ශ්‍රොතාපත්තිඵලයට** (41$^{35}$) = සොතාපත්තිමග්ග සිතට අනතුරුව ඇති වන ඒ චිත්තයෙහි විපාක සිතට;

**ශ්‍රොතෘජනමනඃප්‍රසාදජනක වූ** (4$^{34}$) = අසන ජනයන්ගේ සිත්හි සතුට උපදවන්නාවූ;

**ශ්වෙතවර්ණ ප්‍රාකාර පංක්තියෙන්** (2$^{22}$) = සුදු පවුරු පෙළින්;

**ෂට්විධ වූ සංඥව** (554$^{33}$) = සවැදෑරුම් හැඟීම;

**ෂඩභිඥලාභිත්වයෙන්** (1$^{18}$) = ඉද්ධිවිධ, දිබ්බසොත, පරචිත්ත විජානන, පුබ්බෙනිවාසානුස්සති, දිබ්බචක්ඛු, ආසවක්ඛය යන ඥාණ සය ලැබීමෙන්;

**ෂඩායතනයන්** (59$^{8}$) = චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන යන ආයතන සය;

**ෂඩ් අසාධාරණ ඥානයෙන්** (288$^{21}$) = අන්‍යයන් හා සාධාරණ නො වූ ඥාන සයකින්;

**සංයුක්ත** (112$^{33}$) = එකට යෙදුනු;

**සංවෘත** (483$^{2}$) = වසන ලද;

**සංවෘති දෙවියන්** (192$^{8}$) = දෙවියනැ යි සම්මත වූ රජුන්;

**සංසක්තයක්** (502$^{3}$) = ඇලීමක්;

**සංසන්දනය** (159$^{10}$) = ගැළපීම;

**සංසාරභීරුක ගුණභූෂණ** (509$^{18}$) = සසරට බිය වන ගුණ නමැති අබරණ ඇති;

**සංසෘෂ්ටි විරහිත** (542$^{7}$) = සංසර්ග රහිත;

**සංසෙදජ** (368$^{13}$) = කුණු ආදියෙහි තෙතමනින් උපදනා;

**සංස්කාර ධර්ම** (61$^{25}$) = හේතු වලින් හටගන්නා දෙය;

**සංස්කාර විපරිණාම** (313$^{26}$) = හේතුවෙන් හටගත් ධර්මයන්ගේ වෙනස් වීම;

**සකල නගරාංග ශ්‍රී සමෘද්ධි සම්පන්න ශ්‍රී වර්ධන පුරයට** (4$^{4}$) = සියලු නගරාවයවයන් ගෙන් සැදුම් ලත් ශ්‍රී වර්ධන පුර නැමැති නගරයට;

**සකලිකා** (164$^{17}$) = කැබැල්ල, ගල්පතුර;

**සකෘදගාමි ඵලයට** (41$^{35}$) = කාම භවයෙහි එක් වරකට වඩා උත්පත්තිය ගෙණ දීමේ ශක්තිය සිඳ දැමූ සකෘදගාමි මග්ග සිතේ විපාක සිතට;

**සක්ඛරා** (255$^{19}$) = ගල්කැට;

Non-Commercial Distribution

**සක්ලේශයාහට** (233[28]) = ක්ලේශ සහිතයාහට;
**සගයෙනි** (6[26]) = යහළුවෙනි;
**සංකාරස්ථානයෙහි** (515[31]) = කසළ ගොඩෙහි;
**සංකුපථයෙහි** (404[17]) = උල් සවිකර එහි බැඳි රැහැන්හි එල්ලී යා යුතු පර්වත මාර්ගයෙහි;
**සංඛලිකබන්ධනයෙන්** (183[33]) = හැකිල්ලෙන් (මාංචුවෙන්) බැඳීමෙන්;
**සඟල සිවුර** (223[9]) = දෙපට සිවුර;
**සංඝාටි** ( — ) = දෙපට සිවුර;
**සංඥා** (32[29]) = හැඳිනීම;
**සජොතිභූත** (97[37]) = දැල්වෙන;
**සජ්ඣායනා** (35[9]) = පාඩම් කීම;
**සංජානන** (71[1]) = හැඳින ගැණීම;
**සණ්ඨාන** (410 = සටහන
**සණ්හ සුඛුම ශාන්ත ප්‍රණීත සමාපත්ති** (500[7]) = ඉතා සියුම් ශාන්ත වූ උතුම් ඵල සමවත්;
**සතර ඍද්ධිපාදයෝ** (43[24]) = ඍද්ධියට අත්තිවාරම වන ඡන්ද – චිත්ත – විරිය – විමංසා යන සතර;
**සතර සතිපට්ඨානයෝ** (43[23]) = කාය, වේදනා, චිත්ත, ධම්ම යන සිහිය පිහිටුවිය යුතු ධර්ම සතර;
**සතර සංග්‍රහ වස්තු** (105[4]) = දන, ප්‍රිය වචන, අර්ථචර්යා, සමානාත්මතා යන සතර;
**සතසහස්‍රරාව** (17[3]) = සිය දහස් නාද;
**සති සම්මොසය** (414[35]) = සිහි මුළාව;
**සතෙකිච්ඡ** (484[16]) = පිළියම් සහිත;
**සතොස්** (286[20]) = ලත් දෙයින් සතුටුවීම;
**සත්කායදෘෂ්ටිය** (317[27]) = ආත්මයක් ඇත යන දෘෂ්ටිය;
**සත්තුපලද්ධියෙක්** (369[7]) = සතෙකු-පුද්ගලයෙකු ලැබීමෙක්;
**සත්ප්‍රායසම්පජඤ්ඤය** (530[19]) = කටයුත්තක් කිරීමේ දී එහි හොඳ නොහොඳ සලකා බැලීම;
**සත්වකාය පරියාපන්න වූ** (28[19]) = සත්ව සමූහයාට ඇතුළත් වූ;
**සදන්හල්** (382[4]) = දනශාලා සය;
**සද්ධර්මාමෘතවර්ෂාවෙන්** (26[33]) = සදහම් අමා වැස්සෙන්;
**සද්ධින්ද්‍රිය** (39[36]) = සහජාත ධර්මයන්ට ප්‍රධාන වූ ශ්‍රද්ධාව;
**සනරාමරසකල ලොකය** (538[34]) = දෙව් මිනිසුන් සහිත සියලු ලොකය;
**සන්** (337[34]) = සංඥා;
**සන්තර්පණය** (26[34]) = මනාකොට පිණවීම;
**සන්තර්පිත** (488[7]) = තෘප්ත;
**සන්තාපනය** (574[1]) = තැවීම;
**සන්තිකයට** (28[2]) = සමීපයට;
**සන්ත්‍රාසය** (184[1]) = තැතිගැණුම;
**සන්දන** (146[7]) = ගලා බැසීම;
**සන්ධාරණ** (495[32]) = මනා, දැරීම;
**සන්නාසියා** (168[38]) = ගිහිගෙය හැර ගිය තාපසයා, පරිබ්‍රාජකයා;
**සන්නිපාත** (148[13]) = එක්තැන් වීම;
**සන්නිපාතිකයෙන්** (437[4]) = තුන් දෙස් කිපීමෙන්;
**සන්නිහිත** (457[29]) = තැන්පත් කළ;
**සපදනචාරි** (483[33]) = ගෙපිළිවෙළින් පිඩු සිඟන;

Non-Commercial Distribution

**සපදානචාරිකාංගය** (503[30]) = ගෙපිළිවෙළින් පිඬු සිඟීම නමැති ධුතාංගය;
**සප්ත පදව්‍යතිහාරාවසානයෙහි** (335[28]) = පියවර සතක් යෑමෙන් පසු;
**සප්තප්‍රතිෂ්ඨිත** (406[27]) = පා සතර-සොඬ-වලග-රහසඟ යන අවයව සත බිම පිහිටි;
**සප්තභූමක** (291[12]) = සත්මහල්;
**සප්තවිධ රත්නයෙන්** (336[26]) = චක්‍ර-හස්ති-අශ්ව-මණි-ස්ත්‍රී-ගෘහපති-පරිණායක යන රත්නයනෙන්;
**සබ්බට්ඨක** (418[20]) = සියල්ලෙන් අට බැගින්;
**සභෙදන වූ** (359[20]) = මද බිඳීම සහිත;
**සභ්‍යජනයන්ගෙන්** (3[4]) = සාමාජිකයන්ගෙන්;
**සමක තැන්** (524[12]) = සමාන අය;
**සමංගීභූත** (57[22]) = යුක්ත වූ;
**සමජ්ජදන** (402[15]) = මුදල් අය නොකර නෘත්‍ය දක්වීම;
**සමත්‍රිංශත් පාරමීධර්මයන්** (1[4]) = පෙරුම්දම් තිස, 1 දන, 2 සිල. 3. නෙක්ඛම්ම, 4. පඤ්ඤ, 5. විරිය, 6. ඛන්ති, 7. සච්ච, 8. අධිෂ්ඨාන, 9. මෙත්තා, 10. උපෙක්ඛා, යන දශය, පාරමී - උපපාරමී - පරමත්ථ පාරමී වශයෙන් සමතිසෙකි;
**සමන්තචක්ඛු** (132[21]) = සමතැස්, සර්වඥයන් වහන්සේ;
**සමථභාවනා** (43[26]) = සමාධිභාවනා;
**සමන්විත ව** (57[22]) = යුක්ත ව;
**සමස්ත ගුණගණාභරණ විභූෂිත වූ** (4[14]) = සියලු ගුණ සමූහ නමැති ආභරණයන් ගෙන් අලංකෘත වූ;
**සමස්තරිපු** (3[26]) = සියලු සතුරන්;
**සමස්තාරිෂ්ටපාපාන්ධකාරය** (4[23]) = සියලු අයහපත් පාප නැමැති අඳුර;
**සමාධින්ද්‍රිය** (39[36]) = සහජාත ධර්මයන්ට ප්‍රධානවන චිත්තෛකාග්‍රතාව
**සමාන සංවාසය** (128[28]) = එක් ව විනයකර්ම කිරීම නමැති වාසය;
**සමාධිය** (45[6]) = සිතේ එකඟකම;
**සමාධි ස්තම්භයෙහි** (350[18]) = එකඟ බව නමැති කණුවෙහි;
**සමීපාපනයකින්** (327[10]) = ළඟ වෙළඳ සැලකින්;
**සමුදයධර්ම** (20[8]) = හේතුවක් මුල්වීමෙන් හටගන්නා ධර්ම;
**සමුල්ලපන සංසර්ගය** (542[13]) = එක් ව කථා කිරීම නමැති සංසර්ගය (ගැටීම);
**සමූහනනය** (175[6]) = නැසීම, ඉගිල්ලීම;
**සමොසාරිත** (491[12]) = ඇතුළත්;
**සම්‍යග්දෘෂ්ටික** (112[7]) = නිවැරදි දැකීම ඇත්තා;
**සම්පක්ඛන්දන** (40[30]) = පිවිසීම;
**සම්පජානකාරී** (416[17]) = නුවණින් සලකා බලා ක්‍රියා කරණසුලු;
**සම්පජාන මුසාවාදය** (250[19]) = දැන දැන බොරුකීම;
**සම්පරිවර්තනය** (350[5]) = හැම අතට පෙරළීම;
**සම්ප්‍රජානන ප්‍රඥවෙන්** (52[19]) = මනා සේ දැනගන්නා නුවණින්;
**සම්ප්‍රදලනය** (18[6]) = පළා දැමීම, විනාශ කිරීම;
**සම්ප්‍රසාදන** (40[31]) = පැහැදවීම;
**සම්බාධ වූ** (332[27]) = කරදර සහිත වූ;
**සම්භව** (50[26]) = හට ගැනීම;
**සම්භව වන බව** (337[1]) = ලැබෙන බව;
**සම්ම** (60[7]) = කයිතාළම;

Non-Commercial Distribution

**සම්මත්තකාරි** (247[3]) = යහපත් බව කරණ;
**සම්‍යක් ප්‍රතිපත්තියෙහි** (454[11]) = යහපත් පිළිවෙතෙහි;
**සරාජික** (399[13]) = රජුන් සහිත;
**ස්වර්ණ පෙලාන්තරයෙහි** ( — ) = රන්පෙට්ටිය තුළ;
**සර්වක්ලේශ ශත්‍රු මථනයට** (355[2]) = සියලු කෙලෙස් නමැති සතුරන් මැඩීමට;
**සර්වජන ප්‍රතිකූල්‍ය** (561[19]) = සියලු දෙනාට පිළිකුල්;
**සර්වඥ සූර්ය දිව්‍යරාජයාගේ** (54[10]) = තථාගත නමැති හිරු දෙව් රජුගේ;
**සර්වඥතාඥනය** (139[26]) = සියල්ල දන්නා නුවණ;
**සර්වගෘහාදනය** (250[16]) = ගෙය සහිත සියල්ල ගැණීම;
**සර්වභවාභවගතියෙහි** (303[27]) = සියලු උස් පහත් භවයෙහි හා දිව්‍යාදි ගතියෙහි;
**සර්වවාදි වාරණ කෙශරීන්ද්‍රභූත** (513[16]) = සියලු වාදී නමැති ඇතුන්ට සිංහරාජයෙක් වූ;
**සර්වශාස්ත්‍රාර්ණවපාරගත** (3[35]) = සියලු ශාස්ත්‍ර නමැති සාගරයාගේ පරතෙරට ගිය;
**සර්වශිලාචාර සම්පන්න** (396[31]) = සියලු යහපත් පැවතුම්වලින් යුත්;
**සර්වාර්ථසිද්ධි කාරක** (362[8]) = සියලු යහපත කරණ;
**සර්වාන්තරායයෝ** (186[16]) = සියලු උවදුරු;
**සර්වාපණය** (478[23]) = සියල්ල ඇති වෙළඳ සැල;
**සර්ව සංස්කාර ප්‍රවෘත්තීන්ගේ** (540[34]) = සියලු සංස්කාරයන්ගේ පැවැත්මේ;
**සලභයා** (556[33]) = පළඟැටියා;
**සල්කැළණියගේ** (514[6]) = ශාලකල්‍යාණී වෘක්ෂයාගේ;
**සල්ලෙඛිකාචාර** (308[18]) = කෙලෙස් සිඳින පැවතුම්;
**සල්ලෙඛිතාචාර** (491[4]) = කෙලෙස් කපා ලන හැසිරීම්;
**සසංස්කාරික කුශලචිත්ත** (5[29]) = තමා විසින් හෝ අනුන් විසින් කළ පසුබැසීම් ආදි පූර්වයොග ඇති කුසල් සිතෙන්;
**සහජාත ධර්මයන්** (555[9]) = එකට උපන් ධර්මයන්;
**සහඹු ව** (332[8]) = භාර්යාව සහිත ව;
**සහල්ලෙක** (162[31]) = උඩ හල්ලෙක, ද්‍රව්‍ය දමා උඩ එල්ලා තබන කූඩය;
**සහස්‍ර කිරණයාගේ** (489[29]) = සූර්යයාගේ;
**සළාවේගය** (529[2]) = සුළියේ වේගය;
**සාකච්ඡාවට** (29[23]) = කථාබස් කිරීමට;
**සාකටික** (77[1]) = ගැල් පදවන්නා;
**සාක්ෂාත්** (449[8]) = ප්‍රත්‍යක්ෂ;
**සාර්ථක සම්පජඤ්ඤය** (530[18]) = කටයුත්තක ප්‍රයොජන සහිත බව සලකා බැලීම;
**සාදියනා** (115[36]) = ඉවසීම;
**සාන්දෘෂ්ටික** (455[24]) = මෙ ලොවට අයත්;
**සායනය** (64[35]) = රස දැනීම;
**සායිත** (587[25]) = රස බැලූ;
**සාවද්‍ය ධර්මයන්** (43[14]) = සදොස් ධර්මයන්;
**සාවද්‍යානවද්‍ය** (532[31]) = වරද සහිත-රහිත, වැරදි-නිවැරදි;
**සාරග්‍රහණයකට** (455[4]) = සාර යයි ගැණීමකට;

සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් (1[3]) = ලක්ෂයක් අධික කොට ඇති අසංඛ්‍ය කල්ප සතරක්;
සැණකෙළියෙන් (335[31]) = උත්සව ක්‍රීඩායෙන්;
සැපවිහරණය (18[33]) = සුව සේ විසීම;
සැර පහර (261[28]) = ඊ පහර;
සිගාවරල (338[1]) = කෙස්වැටිය;
සිගාලයකු (28[24]) = හිවලෙකු;
සිනිකඳ (529[24]) = නැංගුරම;
සිලාඝට්ටනයෙන් (233[4]) = ගල් ගැටීමෙන්;
සිලොක (529[4]) = කීර්තිය;
සිවුපිළිසිඹියායෙහි (1[19]) = අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන යන සතර පිළිබඳ ඤාණයන්හි;
සිමා අතුර (—) = සීමාව අතර;
සුංක (509[23]) = අයබද්ද;
සුංකස්ථාන (503[15]) = බදු ගෙවිය යුතු ස්ථාන;
සුකෘත දුෂ්කෘත කර්ම (7[33]) = යහපත් කොට හා නපුරු කොට ද කරණ ලද කර්ම, කුසල්-අකුසල්;
සුගතාගම (459[5]) = බුද්ධධර්මය;
සුගතවර ධර්ම සෙනාධිපති වූ (564[6]) = උතුම් බුදු දහමට සෙනෙවි වූ;
සුගතොවාදකාරි (564[11]) = බුදුන්ගේ අවවාද කරණ;
සුගන්ධාපණයෝ (484[37]) = සුවඳ වෙළඳ සැල්;
සුගෘහීත (318[11]) = තදින් අල්වාගත්;
සුනිර්වෙඨනය (196[26]) = මනා කොට ලිහීම;
සුන්දරගුණ නිධාන (102[27]) = යහපත් ගුණයන්ට නිධානයක් වැනි;
සුභාෂිතය (535[18]) = යහපත් වචනය;
සුමර්දිත චර්මයක් (553[26]) = මොනවට පදම් කළ හමක්;
සුරාසොණ්ඩ (108[31]) = මත් පැනෙහි ලොල් අය;
සුවඳ පසඟුල් (383[6]) = සුවඳ කල්කාදියෙන් ඇඟිලි පස සිටින සේ සටහන් කිරීම;
සුසණ්ඨිත (301[14]) = මනාව පිහිටි;
සුහිත (345[8]) = අනුභවයෙන් සෑහීමට පත්;
සුහුරුබඩු (132[28]) = මාමාගේ පුතා, මස්සිනා;
සූක්ෂ්ම (1[22]) = සියුම්;
සූචි මුඛ ප්‍රමාණ (501[5]) = ඉදි කටු අග පමණ;
සුත්ඵුල්ල පද්මයක් (461[3]) = මනා ව පිපුනු පියුමක්;
සූත්‍රදශාතිරෙකශත (105[12]) = දශයක් අධික කොට ඇති සූත්‍ර සියය, 110;
සූදයෙක් (356[13]) = අරක්කැමියෙක්;
සේතුවට (251[30]) = ඒදණ්ඩට;
සෙවිතව්‍යධර්ම (43[29]) = සේවනය කටයුතු ධර්ම;
සෛන්ධවයන් (28[9]) = සින්ධු නදී තීරයෙහි උපන් අශ්වයන්;
සොකසල්ලය (543[19]) = සෝක නමැති හුල;
සොතයෙන් (—) = කණින්;
සොපාන මාලාවෙන් (492[14]) = තරප්පු පේළියෙන්;
සොම්නසින් (104[25]) = සතුටින්;
ස්තබ්ධ (542[7]) = තද;
ස්ථානොචිතප්‍රඥ (105[4]) = (ස්ථාන+උචිත) තැනට සුදුසු නුවණ;
ස්ථානොත්පත්තිකප්‍රඥ (5[27]) = තැනට සුදුසු පරිදි උපන් නුවණ;
ස්නේහනීය වූ (218[38]) = තෙත් කටයුතු වූ;

Non-Commercial Distribution

**ස්ප්‍රෂ්ටව්‍යය** (554[19]) = ස්පර්ශ කටයුතු දෙය;
**ස්මෘතිසම්පන්න** (543[11]) = සිහියෙන් යුක්ත;
**ස්වර්ගගාමී** (134[6]) = දෙව් ලොවට යන;
**ස්වර්ණකදලිස්කන්ධයක්** (396[2]) = රන් කෙසෙල් කඳක්;
**ස්වර්ණකාරයෙකු** (101[8]) = රන්කරුවෙකු;
**ස්වර්ණභිංකාරය** (382[12]) = රන් කෙණ්ඩිය;
**ස්වරණභාණ්ඩාගාර** (3[14]) = රන් බඩු ගබඩා;
**ස්වර්ණාංකුරද්වයයක්** (3[39]) = රන් පැළ දෙකක්;
**ස්වල්පවචනීය** (302[7]) = සුළු යයි කිය යුතු;
**ස්වසන්තානය** (416[13]) = සිය සිත් පරම්පරාව;
**ස්වහස්තයෙන්** (15[24]) = සියතින්;
**හලාහල** (144[38]) = නපුරු විෂ;
**හසරකින්** (508[22]) = මගකින්;
**හස්තාංගුලි** (404[26]) = අතේ ඇඟිලි;
**හස්තපාද කුකුස්** (314[24]) = අත් පා විකාර;
**හස්තපාදච්ඡේදනය** (132[2]) = අත් පා සිඳීම;
**හස්තමුද්‍රා ශාස්ත්‍රය** (68[32]) = අතින් යම් යම් ලකුණු දක්වීමෙන් අන්‍යයන්ට සිය අදහස ඇඟවීමට උගන්වන ශාස්ත්‍රය;
**හස්ත්‍යශ්ව රථ පත්ති** (45[21]) = ඇත්-අස්-රිය-පාබල;
**හිමගිරි ශිඛර** (2[26]) = හිමාලය පර්වත මුදුන;
**හිනි ගැට** (426[35]) = ඉන්නෝ;
**හීකාරයෝ** (423[24]) = ගොවියෝ;
**හීනායුෂ්කයා** (186[2]) = ගෙවුනු ආයු ඇත්තා;
**හීලිත** (308[30]) = නින්දිත;
**හීවැලක්** (290[19]) = නඟුල අග සවිකරණ යකඩ පතුරක්;
**හුණ ලැල්ලක්** (364[13]) = උණ ලැල්ලක්;
**හෘදය පරිලාහය** (447[6]) = ලෙහි දැවිල්ල;
**හෘෂ්ට තුෂ්ට ප්‍රමුදිත** (510[27]) = තුටු පහටු, ප්‍රීතිමත්;
**හෙප් සර සරිතාදියෙහි** (357[15]) = පොකුණු-විල්-ගංගාදියෙහි;
**හෙම භාජනයක්** (594[2]) = රන් බඳුනක්;
**හෙව** (262[26]) = වැටි;

මිලින්ද ප්‍රශ්නයෙහි ගැටපද විවරණය නිමි.

Non-Commercial Distribution

# උපග්‍රන්ථය

## සංඥා නාමානුක්‍රමණිකාව


අංගමමන 3
අංගුලිමාල 132, 184, 362, 579
අංගොත්තරනිකාය 479, 513 549
අඟහරුවාද 1
අඟු 493
අචිරවතිය 81, 136, 535
අච්චුත 387
අජපාල 319
අජවීථි 376
අජාතශත්‍රු 424, 579
අජිත කෙසකම්බල 6
අතුල 375
අන්තරගාම 3
අත්ථදස්සි 531
අධර්ම 271
අනන්තකාය 35, 36, 37
අනඳ 280
අනාගතවංශය 479
අනුපිය 338
අනුරුද්ධ 128, 527, 573, 575
අනේපිඩු සිටු 536
අනොතත්ත 412
අනොමදස්සි 289, 531
අනොමා 337
අන්තොමණ්ඩල 492
අපණ්ණකජාතක 105, 272
අපරගොයාන 377
අපරන්ත 419, 461
අමරා 276, 277, 278, 279, 308
අමිත්තතාපා 386
අම්බජාතකය 265
අම්බපාලි ගණිකා 154
අලසන්දව 95, 458, 509
අවන්ති 493
අසුරෙන්ද්‍ර 547
අසොකාරාම 20, 21
අස්සක 493
අස්සගුත්ත 9, 10, 11, 18, 19, 20
අස්සජී 512
ආටානාටිය 184
ආනන්ද 91, 105, 117, 128, 158
159, 172, 173, 175, 177, 195,
221, 222, 223, 225, 226, 227, 240,
ආනන්දසෙට්ඨි 492
ආපණ 214
ආමලකාරාමය 240
අමාලකී 240
ආයුපාල 23, 24, 25
ආලකමන්ද 3
ආලසන්දවෙර් 461
ආළාර කාලාම 320, 322, 338
ඇසළ මස 376
ඉතිවුත්තක 105, 479
ඉන්ද්‍ර 4, 27
ඉන්ද්‍රවාරුණී 539
ඉන්ද්‍රශාලා 492
ඉසිපතනාරාම 24, 492
ඉසිසිංග 148, 150
එකනාලක 310
එකරාජ 272
එකසාටකබමුණු 137, 418
එකුත්තුරික 549
උක්කට්ඨා 153
උක්කා 102
උතුරුකුරු දිවයින 3, 98, 377
උදයි 149
උදිච්ච 321
උදෙනි 137, 418, 461
උද්දකරාම 322, 338
උපචාර 268


*Non-Commercial Distribution*

උපසෙන 510, 522, 551, 560
උපාලි 4, 128,
උපෙන්ද්‍ර 4
උම්මග්ග ජාතක 278
උරුවෙලා 322, 338
උසීරද්ධජ 493
ඌහා 81
කකුත්ථා 223
කකුදකාත්‍යායන 6
කකුසඳ 532
කජංගලා 11, 14, 493
කණ්ඩරග්ගි 375
කණ්ඩරී 277
කණ්හජාතක 539
කථා වස්තු 16
කන්ථක 336
කපිල 268, 269, 375
කපිලවස්තු පුර 327, 492
කර්මාරපුත්‍ර 221
කලන්දකපුත්‍ර 217, 218
කලසී 96
කලාබු 266
කලිඟුරට 157, 382, 386
කලියුග 162
කසයින් 137
කසීභාරද්වාජ 310, 311, 312, 314
කාම්බෝජ 493
කාරම්භිය 268
කාලක 537
කාලිංග භාරද්වාජගොත්‍ර 353
කාලිංග 353
කාශ්මීර 96, 458, 461
කාශ්‍යප 5, 138, 153, 239, 289
298, 300, 301
කාළදෙවල 335
කින්නරා 277
කිම්බිල 128
කිඹුල්වත් 381, 579
කිසවච්ඡ 157
කීර්ති ශ්‍රී රාජසිංහ 4
කුණාලජාතක 277
කුදුගොත්සගි 479
කුමාර කාශ්‍යප 148, 149, 150
කුම්මොපමසූත්‍ර 523
කුරු 493
කුසිනාරා 1, 222
කෘෂ්ණ 539
කෘෂ්ණජිනා 139, 380, 382, 384 389
390, 391, 392, 393, 395
කෙණිය 214
කෙතුමතී 9, 10, 385
කෛලාසකූට 270, 385
කොණ්ඩඤ්ඤ 530
කොලපටුන 509
කොසඹෑ 290, 291
කොසොල් රජ 137, 141, 153,
418, 419
කොසොල් රට 204
කොටුම්බර දෙශ 461
කොනාගමන 532
කොගල 493
කොසලසංයුත්තක 284
කෝසිය ගොත්‍ර 151
ක්ෂාන්තිවාදී 267
ඛණ්ඩහාල 272
ඛත්තා 408, 409
ඛන්ධ පිරිත 184
ඛුජ්ජුත්තරා 91
ගංගා 1, 136, 255, 442, 535
ගණ්ඩම්බ 491
ගන්ධමාදන 262, 263, 385
ගන්ධාර 458, 461, 493
ගරහදින්න 492
ගිජ්ඣකූට 166, 252, 579
ගුත්තිල 137, 417
ගොපාල මාතා 137, 418
ගෞතම 136, 138, 312, 314
327, 357, 375

*Non-Commercial Distribution*

ගොවීථී 376
ඝටීකාර 300, 301
චක්කවාක ජාතක 568
චක්ඛුපාල 288
චන්ද 272
චන්ද්‍රගුප්ත 418
චන්ද්‍රභාගා 136
චන්ද්‍රවතී 296, 297
චර 268
චර්යාපිටක 382, 384, 390 397,
398, 405, 479, 492
චාතුමා 240
චාතුමෙය්‍යක 282, 283,
චාතුම සූත්‍ර 242
චතුර්මහාරාජික 376
චිඤ්චාමාණවිකා 120
චීනමිලාත 458, 461
චුන්ද 221, 222, 223. 224, 315
චුල්ලනන්දිය 267
චුල්ලනාරද ජාතක 570
චුල්ලපන්ථක 213, 518
චූලනිර්දෙශය 479
චූලබ්‍යූහ සූත්‍ර 491
චූලමහානිද්දෙශ 105
චූලසුභද්‍රා 492, 536, 537, 543
චෙතපුත්‍ර 387
චෙතිය රජ 268, 269, 381, 384
385, 394, 398, 493
ඡද්දන්ත 266, 298
ඡන්න 336, 337
ජවක 265
ජම්බුකාජීවක 492
ජම්බුද්වීප 8, 18, 23, 32, 271
ජයතුරා 141, 380, 382, 384
387, 396, 398, 408,
ජාලිය 139, 380, 382, 388, 389
390, 391, 395, 399, 408
ජූජක 141, 379, 386, 387, 388
389, 392, 393, 397
ජොතිපාල 298, 299, 300
තක්කොල රට 509
තච්ඡක 268
තවුතිසා 9, 10, 11, 492, 548
තිමි 529
තිමිංගල 529
තිරොකුඩ්ඩ 492
තිස්ස 153, 531
තුවටක සූත්‍ර 105, 491
තුසිත 250
ථූන 493
ථෙරිගාථා 105, 479
දක්ෂිණ ගිරි 310
දක්ෂිණාවිභංග සූත්‍ර 330, 355
දණ්ඩකාරණ්‍යය 157
දම්පියා 105, 479
දඹදිව 377, 418, 492, 537, 579
දරම්ටිපළ ධර්මරක්ෂිත 4
දනව 187
දිට්ඨමංගලිකා 148
දින්න 65
දිවාකර වික්‍රමසිංහ රාජපක්ෂ 3
දීපංකර 286, 335, 530
දීර්ඝනිකාය 479, 572, 576
දුකූලතාපස 147, 150, 152
157, 258
දුටුගැමුණු 1
දුන්නිවිට්ඨ 386
දුම්මෙධජාතක 265
දෙවදත්ත 120, 128, 130, 132, 134
166, 196, 231, 233, 265, 267
274, 275, 276, 286, 579
දෙවමන්ත්‍රී 27, 28, 29, 35, 36,
ධජ 321
ධජග්ගපිරිත 184
ධනපාල 132, 280, 491, 579
ධනිය 239, 240, 519
ධන්වන්තරි 375
ධම්මක්ඛන්ධ 4

*Non-Commercial Distribution*

ධම්මදස්සි 531
ධම්මපද 532
ධම්මරක්ඛිත 20, 22
ධම්මසංගණී 16
ධම්සෙනෙවි සැරියුත් 530
ධර්මගිරි 246
ධර්මචක්‍රසූත්‍ර 24
ධර්මජාතක 271
ධර්මදයාද සූත්‍ර 329
ධර්මපද 548, 576
ධර්මපාල 274, 579
ධර්මාශෝක 1, 145
ධාතු කථා 16
නන්ද 213, 327
නන්දක 119, 120
නන්දගුත්ත 418
නන්දිය 267
නර්මද නදී 487
නසී ගහ 492
නාගදිවයින 163
නාගවීථි 376
නාගසේන 1, 2, 3, 4, 11, 13, 14, 15, 16, 17, 18, 19, 20 21, 22, 26, 27, 28 29, 30, 31, 32, 33, 34, 35, 36, 37 38, 39, 40, 42, 43, 45, 46, 47, 48, 49, 51, 52, 54, 57, 58, 59, 60, 61 108, 109 112, 113, 120, 121 ආදී
නාරද 375, 396, 531
නාලක 105
නාලාගිරි 280, 579
නාලික 385
නිකුම්බදේශය 458
නිගණ්ඨනාථ පුත්‍ර 6
නිග්‍රෝධමෘගජාතක 272
නිග්‍රෝධාරාම 327, 492
නිමි 137, 417
නෙත්ති 82
පචිති 105
පඤ්චසාලක 189, 190, 191, 192
පඤ්චාලදේශ 493
පට්ඨාන 16
පඨවිජය 271
පණ්ඩරක 268
ප්‍රතිසම්භිද 479
පදුම 531
පදුමුත්තර 289, 531
පරනිර්මිත වශවර්ති 336
පරාභව සූත්‍ර 491
පරිනිර්වාණ සූත්‍ර 172, 576
පරිවාර 105
පලාල පුංජකයෝ 479
පලාසජාතක 216
පස්වග මහණුන් 333
පාටලිපුත්තක 21
පාණ්ඩව 322, 338
පායාසිරාජඤ්ඤ 253
පාරායණය 492
පාරිකා 147, 150, 152, 156
පාරාජික 105
පැවා 222
පැළලුප් 20, 21, 145, 153
පිණ්ඩා 382, 385
පිණ්ඩොලභාරද්වාජ 564, 571
පියදස්සි 531
පිළියක් 256, 259, 261, 262, 264
පුණ්ණා 137
පුද්ගල ප්‍රඥප්තිය 16
පුරාභෙද සූත්‍ර 491
පුලිනතීර 487
පූරණකාශ්‍යප 6, 7
පූර්ණභද්‍ර 246
පූර්ණ සිටු 137, 418
පූර්ව විදෙහ 377
පූර්වකාත්‍යායන 375
පෘථිවි විජය 271
පෙසකාරධීතු 492
පොක්ඛරසාතිය 153

*Non-Commercial Distribution*

පෝරිසාද 535
පොෂ්කර 353
පොෂ්කරාරාම 4
ප්‍රජාපති 27
ප්‍රේතවස්තු 479
ඵන්දනජාතක 220
ඵුසති 380, 384, 398
ඵුස්ස 531
බක්කුල 287, 389, 291
බරණැස් නුවර 24, 150, 188, 260
265, 266, 271, 272,
277, 289, 290, 296, 297
බහුධාතුකසූත්‍ර 322
බහුසොදරි 262
බින්දුමතී 145, 146
බුද්ධවංශ 479, 492
බ්‍රහ්මදත්ත 265
භගු 128
භණ්ඩාර රාජගුරු විද්‍යාරත්න 3
භද්දිය 128
භද්‍රසාල 418
භාරත 229
භාරද්වාජ 220, 310
භාරුකච්ඡ 461
භල්ලාටිය ජාතක 573
භල්ලාටිය රජ 573, 574
මංකුර 35
මක්ඛලිගොසාල 6, 7, 8
මගධ රට 265, 310, 461
491, 493
මංගල 105, 531
මට්ටකුණ්ඩලි 492
මණ්ඩව්‍ය 148, 150
මණ්ඩුකදෙව 492
මත්ස්‍ය 493
මද්‍රරාරට 461
මද්‍රිදේවී 380, 382, 383, 386, 388
393, 394, 495, 396, 397,
399, 405
මධුරසතිර්ථග්‍රාම 4
මධ්‍යමනිකාය 177, 329, 355
මධ්‍යමණ්ඩල 493
මන්ති 321
මයූරජාතක 186
මල්ල 1, 225, 493
මල්ලිකා 418
මහකෙල 3
මහමුගලන් 238, 243, 309, 521
මහවග 105
මහාඋදයි සූත්‍ර 285
මහාකාත්‍යායන 418, 517
මහාකාශ්‍යප 176, 448, 512
561, 567
මහාජනක 415
මහා නිර්දෙශය 479
මහාපථවී 265
මහාපණාද 157
මහාපද්‍රම 272, 273
මහාපන්ථක 213
මහාපුණ්ණම 105
මහා ප්‍රජාපතී ගොතමී 326, 327
මහාබ්‍යුහසූත්‍ර 491
මහාමංගල සූත්‍ර 24, 491
මහාමන්ධාතු 137, 417
මහාමහින්ද 1
මහාමහී 239
මහාමහීපති රජ 265
මහාමායා 326, 327, 335
මහාමොග්ගල්ලායන 588
මහාරාහුලොවාද 491
මහාවරුණ 153
මහාසමය 24, 492
මහාසම්මත 4, 268, 335
මහාසුදර්ශන 226
මහාසේන 9, 10, 12
මහී 81, 136, 239, 535
මහෞෂධ 277, 278, 279
මාණවගාමික 329

Non-Commercial Distribution

මාගන්දිය 442
මාතංග ඍෂි 147
මාතංගාරණ්‍ය 157
මාරදිව්‍යපුත්‍ර 172, 191, 192, 193, 325, 336
මාලාකාර 137
මාලුංක්‍යපුත්‍ර ථෙර 177
මාලුංක්‍යවාද සූත්‍ර 177
මැදුම්සඟි 479
මිගදය 492
මිගසම්මතා 259
මිලාත 458
මිලිඳු 1, 2, 3, 4, 6, 7, 8, 9, 10, 11, 17, 18, 23, 25, 27, 28, ආදී
මුගලන් 238, 240, 243, 521, 522
මුචලින්ද 386
මෙධ්‍යාරණ්‍යය 157
මෛත්‍රෙය 195
මොග්ගලිපුත්තතිස්සථෙර 1
මොඝරාජ 214, 582
මොර පිරිත 184
මොලියසීවක 167, 168,
යක්ෂ්ඤය 321
යම 27
යමක 16
යමුනා 81, 136, 535
යවන දෙශය 458, 461
යශොධරා 132, 335, 336,
යුගන්ධර 9, 376
යොනකදෙශ 2, 458
රක්ඛිතතල 9, 11, 17, 22
රජගහ 279, 310, 329, 338,
රතනසූත්‍ර 105, 184, 492
රාජගෘහ 280, 491
රාජායතන 163
රාම 321
රාහුඅසුරෙන්ද්‍ර 378, 547
රාහුල 132, 336, 523, 528, 545, 582
රාහුලොවාදසූත්‍ර 24
රුවන්වැලිමහාසෑය 163
රුරු 269
රේවත 531
රොහණ 11, 12, 14, 15, 16, 17
ලක්ඛණ 321
ලංකා 4
ලක්දිව 4
ලටුකික 271
ලාඩදෙශ 226
ලොමසකාශ්‍යප 294, 295, 296 297
ලොමහංසන පර්යාය 562
වංකගිරි 384, 385, 386, 387, 398
වංගන්තබ්‍රාහ්මණ 510, 522, 551, 560, 562
වංගීස 547
වගුරටට 509
වත්තනිය 14, 16, 18
වරුණ 27
වශවර්ති 336
වායුස්සපුත්‍ර 187
වැද්ද 493
විජම්භ වස්තුව 16
විජය 226
විජයොත් ප්‍රාසාද 4
විධුර 271, 524
විපස්සි 289, 531
විපුල පර්වත 329, 385, 387
විභංග 16
විමලකොණ්ඩඤ්ඤ 154
විමානවස්තු 479
විශාලාමහනුවර 154, 194
විසා 1
වෙසඟ 1
වෙත්‍රවතී 136
වෙදල්ල 105
වෛදෙහරට 239
වෙපුල්ල පර්වත 265, 293
වෛයාකරණ 105, 167


Non-Commercial Distribution

වෙරඤ්ජා 315
වෙස්සන්තර 135, 136, 138, 139
141, 335, 379, 381, 382, 384
385, 386, 387, 388, 389, 396
398, 399, 401, 402, 403, 404
405, 406, 407, 408
වෙස්සභූ 532
වෛජයන්ත 140
වෛශ්‍රවණ 3
ශක්‍රදෙවේන්ද්‍ර 9, 10, 147, 150
151, 156, 226, 296, 301, 321
325, 381, 385, 396, 539, 547
ශක්‍ර ප්‍රශ්න 105, 492
ශක්‍ර භවන 9, 137, 296
ශරණංකර 4
ශාක්‍ය 241, 312, 418, 492
ශාරි 516
ශාරිපුත්‍ර 52, 217, 238, 241, 281
309, 363, 381, 448, 491, 513
521, 525, 560, 562, 564, 578
580, 593
ශීලව හස්ති 270
ශ්‍රමණකොලඤ්ඤ 353
ශ්‍රී දන්තධාතු මන්දිර 4
ශ්‍රී ලංකාද්වීප 3, 226
ශ්‍රීවර්ධනපුර 4
ශ්වෙත පර්වත 329
සංකිච්ච 148, 150
සංඛාරභාජනීය සූත්‍ර 105
සංඛෙය්‍ය පිරිවෙණ 23, 27
සංජය බෙල්ලට්ඨිපුත්‍ර 6
සංයුත්ත නිකාය 105, 533
සංයුත් සඟි 42, 167, 329, 479
523, 529, 545, 566, 567, 577
සකස්පුර 492
සච්චබද්ධ 487
සච්චසංයුත්තකය 529
සට්ඨිස්සර 133
සඳමහරජ 380, 381, 382, 389
398, 408, 409
සබ්බදැයී 271
සබ්බදින්න 35, 36
සබ්බමිත්ත 321
සමචිත්තපරියාය සූත්‍ර 24, 491
සමන්තකූට 487
සය්හ 296, 297
සරභූ 81, 136, 535
සරස්වතී 136
සහම්පතී 241, 282, 319, 569
සාකෙත 492, 536
සාබ 272
සාගලපුර 1, 3, 6, 9, 10, 23 96, 371
සාධීන 137
සානුපර්වත 385, 388
සාම 147, 148, 150, 156, 157, 256
සාර්ණ 493
සැරියුත් 113, 119, 137, 240
275, 276, 309, 310, 329, 418
518, 521, 526, 533, 563, 574
සැවැත්නුවර 491, 510
සිංහබාහු 226
සිඛී 531
සිද්ධාර්ථ 87, 214, 335, 336, 337
581, 531, 339
සින්ධු 136
සියාම් දෙශ 4
සිරිමා 492
සිවිරජ 146, 147
සිවිරට 380, 381, 385
සිලවනාගරාජ ජාතක 270
සීවක 167, 168
සුජාත 531
සුජාතා 222, 315
සුතසෝම ජාතක 535
සුදත්ත 321
සුදින්න 217, 218

*Non-Commercial Distribution*

සුද්ධෝදන 132, 312, 321, 327, 335, 339, 410, 416
සුනාපරන්තක 492
සුප්පියා 137, 418
සුප්‍රබුද්ධ 120
සුභ 75
සුභද්‍ර 158, 159, 163, 226
සුභූති 542, 548
සුභෝජ 321
සුමන බුදුරජ 531
සුමනමාලාකාර 137, 492
සුමිත්ත 153
සුමේධ 531
සුයාම 27, 321
සුරපරිවර 268
සුලසානගර 492
සුලුවග 105
සුත්තනිපාත 105, 479, 519, 541, 581, 583, 584
සූරසේන 493
සෙතකණ්ණික 493
සෙරිවාණිජ 166, 579
සෙල 211, 214, 216, 236, 302
සොනුත්තර 11, 12, 13, 298
සොභන 393
සොභිත 531
සොවීර රට 509
සෞරාෂ්ට්‍ර 509
ස්වර්ණභූමි 509
හංසවතී 289
හිමගිරි 2
හිමවත් 11, 255, 407, 539
හිමාලය 9, 11, 22, 136, 266, 267, 270, 286, 289, 296, 329, 371, 381, 383, 394, 396, 397, 407, 487
හිරණ්‍යවති 225
හිල්මස 378
හෙලදිව 4

මිලින්දප්‍රශ්න උපග්‍රන්ථය නිමි.

---

*Non-Commercial Distribution*